පි: සාමාන්‍යයෙන් සෙනඟ අඩු පල්ලියක වැරදුනත් කමක් නැහැ කියලා තෝලුව් කරන්න දෙනවා බය හිතෙනවා ඉස්සෙල්ලාහම ගියාහම චකිතයක් වගේ ඇති වෙනවා ඒවා නැති කරන්න ඒ වගේ තැන් වල දී දෙනවා. මසුරා වලට ගියාහම එතන භාන්ඟ කිවානම් තෝලුව් කරන්න දෙනවා. මට තමයි අමාරු කෙනෙකුට හිටියේ. අනිත් අය ඔක්කෝම ප්‍රගුණ වෙච්චි අය. මම ඒ ගොල්ලෝන්ට වඩා ඉස්සර වුණා.

ප්‍ර: දැන් මොක්කද ඔබ වහන්සේ ඒකෙන් අදහස් කරන්නේ? මම ඒගොල්ලන්ට වඩා ඉස්සර වුණා කියලා?

පි: ඉස්සර වුණා කියන්නේ දැන් ලොකු අවස්ථා වල දී මට වන්දනය කරන්න දෙනවා.

ප්‍ර: වන්දනය කරන්න දෙනවා?

පි: දෙනවා.

ප්‍ර: ඇයි ඒ ඔබ වහන්සේ කොහොමද ඒ විශ්වාසය දිනා ගත්තේ?

පි: මම ගෙදර විවාහ වෙච්චි උපාසක අම්මා කල්එළිය අරාබි කොලේජ් එකේ මවුලවිට ඉගෙන ගත්ත කෙනෙක්.

ප්‍ර: එහෙමයි.

පි: සිංහල මාධ්‍ය ඉගෙන ගත්ත කෙනෙක්. එයාත් ඉස්ලාමයට ගිය කෙනෙක් එතන මට මම හොයලා බලලා තමයි ඒ දේ කරේ ඒ පවුලේ ඔක්කොමලා මවුලවිලා. ඒ උපාක අම්මාත් හවුලි ආරාබි කොලේජ් එකේ සිංහල කුරාන් කරපු. එයාගෙන් තමයි මම ගොඩාක්ම නිවසින් අපේ සංවිධානයටත් දන්නේ නැහැ මම මෙච්චර දුර ගිහිල්ලා තියනවා කියලා ඉගෙනීම.

ප්‍ර: මොකක්ද මේ සංවිධානය ?

FAIR COMMENT
BY JEZEEM

පි: තබ්ලික් ජමාද් සංවිධානය දන්නේත් නැහැ මම කුරානය මෙච්චර දුර ඉගෙනගෙන තියෙනවා කියලා. මම මේක නිවසින් තමයි ඉගෙන ගත්තේ. ඒගෝල්ලන්ට මම එච්චර දුරට ගියා කියලා පෙන්නුවේ නැහැ. ඒ වුණාට තෝලුහු වල දී මං ඉහළින් හිටියා. මොක ද පාන්දර ඒගොල්ලෝ බාංග කියනකොට අපි 5.20ට බාංග කියන්නේ කියලා. මං 4.30ට පල්ලියේ.

ප්‍ර: අනිත් අයට ඉස්සෙල්ලා ඔබ වහන්සේ යනවා?

පි: යනවා. ගිහිල්ලා පල්ලිය අතු ගාලා සුද්ද කරලා උඩ ටැංකියේ වතුර උඩ ටැංකි වලත් තියෙනවා. නීතියක් ගඳ, සුවඳ, වර්ණය කුල්ලුතුල් ප්‍රමාණය කියලා ඒවා මුස්ලිම් අය නොදන්න දේවල් ඒවා මම ඉගෙන ගත්තා.

ප්‍ර: කොහොමද ඔබ වහන්සේ ඒවා ඉගෙන ගත්තේ?

පි: ඒවා පොත් වලින් තමයි ඉගෙන ගත්තේ.

ප්‍ර: පොත් වලින් ඒවා කියවලා ඉගෙන ගත්තේ?

පි: ඔව්. ඒකේ වර්ණය සහ ගඳ සුවඳ බලන්න ඕනි ඒක සුදුසුද කියලා ඒකේ කුල්ලුතුල් ප්‍රමාණය ලීටර් 222කට ඉහළින් තියෙන්නෙ ඕනි. සමූහයක් එක්කලා අර මුණ හොදලා ඔළු කරන්නේ ඒ කුල්ලුතුල් ප්‍රමාණය ඒකට කියන්නේ කුල්ලුතුල් කියලා. ඒ ප්‍රමාණයක් මේකේ තියෙන්න ඕනි. ඒ වගේ සියලුම දේවල් එකින් එකට ඉගෙන ගෙන එකපාරටම මේකේ අන්ත වාදයට රිංගන්න බැහැ.

ප්‍ර: ඔබ වහන්සේ දැන් ඔය දේශනා කිරීම් ගැන කිව්වා නේ. එතකොට අන්තවාදය පිළිබඳව දේශනා කිරීම් කොයි විදිහට ද සිද්ධ වුණේ ස්වාමීන් වහන්ස?

පි: ඒකට මාව විශේෂ පුහුණුවකට දැම්මා. මොකද ඒ ගොල්ලොන්ට වාසියක්

ප්‍ර: මොකක්ද මේ අන්තවාදය කියන්නේ?

පි: මෙරට ඇල්ලීම.

ප්‍ර: ඒ කියන්නේ ශ්‍රී ලංකාව ඇල්ලීම.

පි: ශ්‍රී ලංකාව ඒගොල්ලොන්ගේ මුස්ලිම් රාජ්‍යක් බවට පත්කිරීම. කිසිම කාෆිර්වරයෙක් මේකේ ඉන්න බැහැ.

ප්‍ර: දැන් මේ ලෝකයේ ගොඩක් රටවල් තියනවනේ?

පි: ඔව්.

ප්‍ර: ඇයි එතකොට මේ ශ්‍රී ලංකාව ගැන මේ ගොල්ලෝ මේ කතා කරන්නේ?

පි: ශ්‍රී ලංකාව ගැන කතා කළේ මේකේ තියනවා මේ ගොල්ලොන්ට අවශ්‍ය කරන වස්තූන්. එකක් මේක පාකිස්ථානයෙන් ඇවිල්ලා කළේ තබ්ලික් එකෙන් නෙවෙයි කළේ තවුහිද් එකෙන්. තවුහිද් එකෙන් කරේ.

ප්‍ර: එහෙමයි.

FAIR COMMENT
BY JEZEEM

පි: ඒ ගොල්ලෝ පාෂාණ වර්ගයක් හෙව්වා මේකේ හෙව්වා මඩකලපුවේ ගුවන් යානා නිෂ්පාදනය කරන්න පුළුවන් රේඩාර් පද්ධතියට නොවදින දුර්ලභ පාෂාණ වර්ගයක් මේ ලංකාවේ තියනවා කියලා.

ප්‍ර: කවුද අපේ හාමුදුරුවනේ ඒක හෙව්වේ?

පි: ඒක පාකිස්ථානයෙන් ඇවිත් තමයි ලංකාවේ පර්යේෂණ කළේ.

ප්‍ර: ඒ කියන්නේ මුස්ලිම් ජාතිකයන්?

පි: එහෙමයි. මේක මඩකලපුවේ තමයි පරීක්ෂණය කළේ. මේක අපේ මසුරා එකට ආව දෙයක්. මේක අපි හිටපු නිකායේ සම්බන්ධ නැහැ. අර නිකායේ දේවල් ඔක්කෝම එනවා. එතකොට එතනම ගොඩ ගන්න ලංකාවේ ප්ලේන් හදන්න ආපු පාෂාණ වර්ගයක් ගොඩඅරගෙන ලංකාවේ පිටරටට අලෙවි කරන අලෙවි කරනවා. ඒ ප්‍රදේශයේ තමයි මේ පරීක්ෂණය ඒ ගොල්ලෝ කරලා තියෙන්නේ. පාකිස්ථානය කොටස් වශයෙන් තමයි පොළව ස්කෑන් කරන යන්ත්‍රය ගෙනල්ලා තියෙන්නේ.

ප්‍ර: ඔබ වහන්සේ කොහොමද ඔය කරුණු දන්නේ?

පි: මේක අපේ මසුරා වල දී අනුන්ගේ ඕපදූපත් හොයනවා.

ප්‍ර: ඒ සාකච්ඡා වල දී ඔබ වහන්සේට දැන ගන්න ?

පි: අනිත් නිකායන්වල දේවල් හොයනවා. ඒ කියන්නේ අපිට වඩා මහ අමීර්ලාට එනවා. මහා අමීර්ලා අපේ අනිත් අනුෂ් අමීර් කියලා එයා තමයි මට හිටිය අමීර්. එයාගේ ෆොටෝ එහෙම මා ගාව තියනවා. අනෂ් අමීර්ට ඒ ගොල්ලෝ කිව්වාහම ඒගොල්ලෝ අපිට සාකච්ඡා වලට මසුරා වලට ගියාහම ඒ අවසානය දී අපේ රාජකාරිය ඉවර වෙලා අපි ඕවා කතා කරනවා.

ප්‍ර: එහෙමයි.

පි: තවුහිද් එකයි තබ්ලික් එකයි ඒවා . මම තමයි ඒවා ඇදලා ගන්නේ.

ප්‍ර: එහෙමයි . ඒ කියන්නේ ඔබ වහන්සේ කියන්නේ මේ රටේ සිදු වෙන සියලුම දේවල් හැම තැනම සිදු වෙන දෙවල් ඔය පල්ලි වල කරන සාකච්ඡා වලදී සාකච්ඡා වෙනවා?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට ඔබ වහන්සේලාගේ නිකාය විතරක් නෙවෙයි. අර ෂියා මුස්ලිම්වරුන්ගේ නිකාය පිළිබඳවත් සාකච්ඡා කිරීමක් කරනවා.

පි: ඔව්.

ප්‍ර: එතකොට ඒ අවස්ථාවේ දී ඔය දේශපාලන තත්ත්වය පිළිබඳව රටේ ඒ වගේ දෙවල් පිළිබඳවත් සාකච්ඡා කරනවද අප හාමුරුවනේ නැත්නම් රටේ තියන අපි හිතමු උදාහරණයක් හැටියට කිව්වොත් රටේ යම් චංචලභාවයක් තියනවානම්, දේශපාලන අස්ථාවරයක් තියනවානම්

Resident Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඒවගේ දේවලුත් ඔබ වහන්සේ හිටපු ඔය සාකච්ඡා වල දී සාකච්ඡා වුණාද?

පි: ඒවාට මේ සෑම දෙයකටම කණ්ඩායම් ඉන්නවා. ඉඩම් අල්ලන්න කණ්ඩායමක් ඉන්නවා. ඒ වගේ කණ්ඩායම් මේකට බෙදිලා ඉන්නවා.

ප්‍ර: කවුද ඒවා පත් කරන්නේ?

පි: ඒවා පත් කරන්නේ එරියා පුරුප්පවරු උලමාවරු උසස් උසස් දෙවල් වලට උලමාවරු ගන්නවා.

ප්‍ර: කවුද අපේ හාමුදුරුවනේ උලමාවරු කියන්නේ?

පි: උලමාවරු කියන්නේ දැන් ෂාෆ් ඉඳලා ඉහළටම ගිය කෙනා තමයි ඒකෙන් ඉක්මවා ගිය කෙනා තමයි උලමාවරුන් කියන්නේ.

ප්‍ර: ඒ කියන්නේ ඉන්න ඉහළම?

පි: ඉහළම මහ නායක හාමුදුරුවෝ වගේ තමයි ඉහළම තනතුරු වල ඉන්න අය උලමා. එතකොට මැඩම් අහපු ටිකෙන් කියන්න තියෙන්නේ මේකයි. මට ඒක තව පාරක් චුට්ටක් කියන්න පුළුවන් ද දැන් අහපු ටික?

ප්‍ර: දැන් ඔබ වහන්සේගෙන් මම ඇහුවේ දැන් ඔබ වහන්සේ කිව්වානේ ඔය මසුරාවල දී යම් යම් දේවල් සාකච්ඡා කරනවාය කියලා.

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔබ වහන්සේ ඒ වගේම දැන් කිව්වා සුන්නි මුස්ලිම් ඒ නිකාය ගැන විතරක් නෙවෙයි ෂියා මුස්ලිම් නිකායෙත් සිද්ධ වෙන්නේ මොනවද කියන එක පිළිබඳව සාකච්ඡා කරනවා කියලා?

පි: ඔව්.

ප්‍ර: එතකොට මම ඔබ වහන්සේගෙන් ඇහුවේ ඒ අනිත් නිකායන් ගැන බලන විදිහටම රටේ යම් ආකාරයක චංචල ස්වභාවයක් තියෙනවානම්?

පි: ඔව්

ප්‍ර: ඒ වගේම දේශපාලන අස්ථාවරත්වයක් තියෙනවානම් ඒ පිළිබඳවත් ඔබ වහන්සේලා ඒ කියන්නේ ඒ මසුරා වල දී සාකච්ඡා කිරීමක් කෙරෙනවාද?

පි: කෙරෙනවා.

ප්‍ර: සහ ඔබ වහන්සේ සහභාගී වුණ සාකච්ඡා වල දී එහෙම සිද්ධ වෙලා තියෙනවද?

පි: එහෙම සිද්ධ වෙනවා. දැන් අපි 3.30ට තමයි අල්කා මසුරා වලට යන්නේ.

ප්‍ර: එහෙමයි.

පි: ඊට පස්සේ ඒරියා මසුරා වලට ඊළඟ දවසේ යන්නේ. ඉරිදා වලට තමයි මේව්වා කරලා තියෙන්නේ එතකොට ඒරියා මසුරා වල දී ගොඩක් කට්ටිය හම්බවෙනවා. හැමතැනම කට්ටිය එනවානේ. අමීර්ලා. අපි

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

20ක් 22ක් වගේ එකතු වෙනවා. මසුරා එකට ඒකට අපි සෙනඟ ගැවසෙන්නේ නැති පාළු ස්ථානයක පල්ලියක තමයි අපි ලෑස්ති වෙන්නේ. ඒකට අපි සිකුරිටි 2ක් දානවා.

ප්‍ර: සෙනඟ ගැවසෙන්නේ නැති තැන් කොහොමද?

පි: ඒ කියන්නේ මුස්ලිම් ගම්මාන තියනවා. ඒරියා එකට අයත් ගෙවල් සාමාන්‍යයෙන් 25ක්, 30ක් විතර වගේ තියෙන ස්ථාන එතකොට ඒ තැන් වලට මුස්ලිම් අය ආවට අවුලක් නැහැ.

ප්‍ර: එහෙමයි.

පි: සිංහල අය ගැවසෙන්නේ නැති, ගොඩක් තැන් තියනවා සිංහල ගෙවල් පල්ලි මිදුලෙන් පැනලා යන අය ඉන්නවා. ඒ වගේ තැනක් නැතිව අපි අර ගන්නවා. ඒරියා මසුරා වල දී අපි සන්නද්ධ වෙලා තමයි කරන්නේ. සිකුරිටි දෙන්නෙක් අපේ දානවා.

ප්‍ර: එහෙමයි.

පි: අපේ ඉන්න දෙන්නෙක් සිකුරිටි දානවා. ඒක ලොකු අමීර් පොඩි අමීර් කියලා නැහැ. කවුරු හරි දෙන්නෙක් නැඟිටින්න කිව්වාහම සිකුරිටි දෙන්නෙක් ලොකු අමීර්ලාත් නැඟිටිනවා. පෙලක් වේලාවට අපි අමීර් ඉන්නවා ඕනෙ වෙන කවුරුහරි යන්න කියලා ඒ වගේ කරනවා. ඒ වේලාවේ දී දේශපාලන අස්ථාවරත්වය දේශපානයේ තියෙන දුර්වලකම් කතා වෙනවා අවසානයේ දී. දේශපාලනයේ මේ විදිහට තමයි දේශපානය ගන්නේ. ඒ ගොල්ලන්ගේ දුර්වලකම් හොයනවා.

ප්‍ර: එහෙමයි.

පි: ඒගොල්ලෝ මනුස්සයෙක් එක්ක කතා කරාහම පැය 2ක් කතා කරද්දි මුස්ලිම්වරයෙක්ගේ දැනුම තියෙනවා ඒයාගේ දුර්වල තැන හොයා ගන්න. ඒයාගේ දුර්වල මොන දේට ද කියලා. එයා කාමයට ලොල් වෙච්චි කෙනෙක් ද එයා මත්වලට ලොල් වෙච්චි කෙනෙක් ද එයා ධනයට ලොල් වෙච්චි කෙනෙක්ද එයා දේපළවලට ලොල් වෙච්ච කෙනෙක්ද කියලා ඒ ගොල්ලෝ ක්ෂණික හොයා ගන්නවා. මේ බාල්දි කොකු ඇඟිදින්න එන යකඩ ගන්න එන වෙළෙන්දාත් අපිට වඩා ගොඩක් බුද්ධියෙන් ඉහළ උදවිය ඒගොල්ලොන්ගේ ඉන්නේ. ඒගොල්ලොන්ගේ බුද්ධි මට්ටම පුංචි කාලයේ ඉඳලා නිර්මාණය කරනවා. මේ දේශන වලින්. ඒ ගොල්ලෝ අමුතුම පැත්තකට හරවලා තියෙන්නේ. ඒගොල්ලන්ව ඒ වේලාවේ දී දේශපාලඥයින්ගේ තියෙන දුර්වලකම් එතැන එකඟ කියවෙනවා. දැන් ලංකාවට ගොඩාක්ම ප්‍රසිද්ධියේ කියන්නම් බැසිල් රාජපක්ෂ මහත්තයාව අන්දගෙන තමයි ලංකාවට මැලේසියාවෙන් ආයුධ ගෙනාවේ. ඒවා කතා වෙනවා.

ප්‍ර: ඒ මොන වකවානුවේ ද අප හාමුදුරුවනේ?

FAIR COMMENT
BY JEZEEM

පි: ඒක අපේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පළමුවෙනි රජයේ කාලයේ.

ප්‍ර: ඒ කියන්නේ 2015ට ඉස්සර වෙලා?

පි: ඔව්. එතකොට

ප්‍ර: කොහාටද ඕවා ගෙනාවේ?

පි: ඒවා ගෙනාවේ මල්වානේ යාඩ් එයාගේ තියෙනවා විශාල ස්මයිල් හජ්ජියා කියන්නේ විශාල මහ පරිමාණයේ ව්‍යාපාරිකයෙක්.

දැන් වේලාව: ප.ව. 2.50

මෙතැන් සිට: සචිනි මෙනෙවිය.

පෙර සටහන් ල/ලේ - සචිනි මෙය.

මෙතැන් සිට ල/ලේ - යමුනා දසනායක මිය.

වේලාව : 3.20 යි.

ප්‍ර : ඔබ වහන්සේ කිව්වා මේ

පි : ෆෝන් ගෙනියන්න බෑ ඔක්කොම මරකස් එකේ ලොකර් තියෙනවා ලොකර් වල දාලා යන්න ඕන සාමාන්‍ය නෝර්මල් ෆෝන් එකක් නම් අරගෙන යන්න පුළුවන් රෙකෝඩින් අරවා මේවා ෆෝන් කොහොමත් අපිට පාවිච්චි කරන්න තහනම් පෑනකුයි පොඩි පොතකුයි දෙනවා ජමාත් එකේ විස්තර ලියාගෙන එන්න ඕන ඊට අමතරව කිසිදෙයක් ලියන්න බෑ ඒවා ගෙනල්ලා ජමාත් එකට එතන ඉන්න සහභාගි කෙනකුට දෙන්න ඕන ඒ පොත අමීර්ට දුන්නට පස්සේ අමීර් තව ඒක දීලා ඒගොල්ලෝ බලනවා ජමාත් එකේ ගිහිල්ලා මම කරපු වැඩ ටික කරන්න මම ඒලාම් කරලා තියෙනවා,බයන් කරලා තියෙනවා,කිතුමත් එකේ ඉදලා තියෙනවා දවස් මෙච්චරක් මම කරපු ටික ලියනවා ලියලා ඉවරවෙලා එතකොට දව්වත් එක දීලා ආගමට කෙනෙක් ගත්තාම දව්වත් එක කියන්නේ ඉස්ලාම් ගැන කියලා දීලා ආගමට ගත්තානම් කෙනෙක් ඒවා ලියන්න මම ඒවට ගියේ නෑ පල්ලියට එන් නැති මුස්ලිම් උදවිය පල්ලියට ගෙන්නගෙන ජමාත් එකකට අරගෙන ආපු ඒවා තියෙනවා දවස් හතලිහේ ජමාත් එකට එයාව

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කතිකා කරලා කතිකා කරලා එයාව ජමාත් එක ඉවරවෙනකොට මරකස් එකකට දවස් හතලිහකට ගෙනාපු ඒවා තියෙනවා ඉතින් ඒවා තමයි ලියාගන්න පුළුවන් ඊට අමතර ත්‍රීඩේට් ජමාත් ටික ගියාට පස්සේ අපේ ගේ වෙක් කරා දෙපාරක් ඒගොල්ලෝ

ප්‍ර : ඇයි ඒ?

පි : මම මේ සංවිධානය සම්බන්ධව මොනවා හරි ලියකියවිලි හදාගෙන ඉන්නවද කියලා

ප්‍ර : ඒ කියන්නේ ඔබ වහන්සේ ගැන සැක කරාද ඒගොල්ලෝ?

පි : ඔව් මාව සැක කරලා වත්තල පල්ලියේ මසුරා එකක් තියෙනවා කියලා එව්වා නෑ පළවෙනි විල්ල එක ගියාට පස්සේ ඊට පස්සේ තමයි මට අර සියළුම පහසුකම් හදලා තියෙන්නේ එතනින් තමයි අන්තවාදය දුන්නේ ඒ කියන්නේ අවුරුදු හතරක්,පහක් විතර ගියාට පස්සේ තමයි නඩුත් ඉවර කරේ එතනින් තමයි.

ප්‍ර : ඒ කියන්නේ පළවෙනි විල්ල එක ගියාට පස්සේ තමයි ඔය නඩු අවසාන කරලා ළමයින්ට ස්කෝලත් හදලා දුන්නේ?

පි : පළවෙනි විල්ල එක ගියාට පස්සේ ඔව් ගේ ඔක්කොම කරලා දුන්නේ එතනින් පස්සේ

ප්‍ර : එතකොට ගෙවල් පරීක්ෂා කරන්න ආවේ?

පි : ගෙවල් පරීක්ෂා කරන්න මම මාව යැව්වා ඒගොල්ලන්ගේ නිවසක භාර්යාවට ඉන්න පුළුවන් කිව්වා මම කිව්වා නෑ එයා අම්මලා දිහා යනවා එයත් එහේ යන්න ඉන්නේ එයා එහේ යනවා මට වත්තල පල්ලියට යන්න කිව්වා. මම කල්පනා කළා වත්තල පල්ලියට යන එක මොකක් හරි මේ ගොල්ලන්ගේ තියෙනවා හොර වැඩක් මොකද භාර්යාව ඒගොල්ලන්ගේ ගෙදරක තියන්න කිව්වනේ මම කිව්වා නෑ එයා ගෙදර යනවා අම්මලා ගෙදර කහටඕවිට ඊට පස්සේ මම දොර වහද්දි ඉරටු කෑල්ලක් තියලා තමයි වැහුවේ.

ප්‍ර : ඇයි ඒ?

පි : දොර ඇරියොත් කාටහරි අහුවෙන්න

ප්‍ර : ආ..... වැටෙනවනේ

පි : ඔව් මම උපාසක අම්මා ගෙදර ගිහින් බස්සලා ඇවිල්ලා ඊට අමතරව මම පොතක නිකන් පොඩි පොඩි සටහන් ටිකක් තිබුනා මගේ ත්‍රීවිල් එකේ නම්බරේ,ලයිසන් ඉන්ෂුවරන්ස් වල ඒවගේ අයිඩින්ටි කාඩ් නම්බර්,ෆෝන් නම්බරේ ඒවා ලියලා තිබුනා ඒක උඩින් මම බ්ලේඩ් තල කැලි තුනක් කඩලා තිබ්බා. ගෙට ඇතුල්වෙන තැන ඉස්තෝප්පු කාමරේ මගේ ඔෆිස් එකවගේ තිබුනේ ඒකේ මම ටේබල් එකක් දාගෙන තිබුනා. ඒකේ කුරාන්

FAIR COMMENT — BY JEZEEM —

ඔය පොත් ටික ඔක්කොම ලස්සනට තියලා ඒකට මම කර්ටන් එකක් දාලා තිබුනේ එකේ මං අර බීඩි ඔතන ගෙයක් තියෙනවා එයාගෙ අර හයිය නැති නූල් ගෙනෙල්ලා ටින්ටස් ඇණ දෙකක් ගහලා එතනින් මන් නූලක් ඇද්දා කෙනෙක් ගියොත් ඒවගේ ගොඩාක් ඇතුලට ගියොත් හොයාගන්න පුළුවන් විදියට මම නිර්මාණය කරලා තමයි ගෙදරින් ගියේ උදේ මම ආව හැටියේ ගෙය බැලුවා ඉරටු කෑල්ල වැටිලා දොර ඇරලා තියෙනවා ඉරටු කෑලි දෙක තුනක්ම තිබ්බා එකක් නම් හිරවෙලා තිබ්බා මම දොර ඇරියත් වැටුන් නෑ අනිත් ඒවා බිමට වැටුනා ඒවා. එතන අර නූල කැඩිලා මෙහෙම පොත් ටික ඇදලා තිබුණා බ්ලේඩ් තල කැලි මම කඩලා තිබ්බා පොත උඩින් පොත පෙරලලා තියෙනවා ඒගොල්ලො මාව වෙක් කළා මම කිසිම දෙයක් ලිව්වේ නෑ එතනින් කිසිමදෙයක් මම සඳහන් කළේ නෑ. එතනත් මම අර ඩිස්ලින්ලරාච්ර හීම් අරාබි භාෂාවෙන් ලස්සනට ලියලා මාෂා අල්ලාහ් කියලා ලියලා ඒවා පාට කරලා නිකන් පොඩි මෙව්වා එකක් තමයි හදලා තිබුනේ එහෙම පොතේ අර මොහොමඩ් හසන් කියලා ගහලා තිබිච්චි හින්දා ඒගොල්ලෝ ඒ පොත් ටික ඇදලා බලලා යට තිබිච්චි පොත ඇරගෙන බලලා කොපි පොතක් අනිත් ඒවා ඔක්කොම අච්චු පොත් නබිලාගේ අර සහභා චරිත ඒ පොත් තමයි එතන තිබුණේ ඒ පොත මේ අය වෙක් කරලා තිබ්බා

ප්‍ර : අතින් ලියපු එක වෙක් කෙරුවා

පි : ඔව් මුළු ගේම වෙක් කරලා තිබ්බා

ප්‍ර : ඇයි ඔබ වහන්සේ ගැන එහෙම සැකයක් ඇති වෙලා තියෙන්නේ?

පි : එහෙම සංවිධාන දේවල් හොයාගෙන එනවද කියන්න බෑනේ CID ද මොනවද

ප්‍ර : ඒ නිසා ඔබවහන්සේ ගැන පරීක්ෂාවක් කරා

පි : ඔව්.මම පුංචි කාලේ ඉදලා ආව කෙනෙක් නෙවෙයිනේ මොකද අපේ අනන්‍යතාවයක් හෙව්වේ නැනේ ඒ ගොල්ලෝ අපේ ගෙවල් වල ගිහිල්ලා අපේ දැන් පොලිසියේ වෙක් කරනවා වගේ ගෙවල්වල ගිහිල්ලා අනන්‍යතාවය ඔප්පු කරන්න මොකුත් නැනේ

ප්‍ර : එහෙමයි.

පි : මම නිකන්ම ආගමට ආවා එහෙමනේ වුනේ ඒක හින්දා මම ගැන ගොඩක් සෝදිසි කළා .

ප්‍ර : මම ඔබ වහන්සේගෙන් දැන් මීට ඉස්සෙල්ලාත් ඒක ඇහුවා ස්වාමීන් වහන්ස. මේ රජයේ ආයතන වල ඔය සංවිධානයට

FAIR COMMENT
BY JEZEEM

අයත් අය ඉන්නවද කියලා උදාහරණයක් විදියට ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය?

පි : ඉන්නවා.

ප්‍ර : ඔබ වහන්සේට කියන්න පුළුවන්ද භික්ෂු ශාසනේ ඔබ වහන්සේ දන්න විදියට එවැනි සංවිධානයට අයත් අය ඉන්නවද කියලා ඔබ වහන්සේ දන්නවද?

පි : ඔව්.මේක මේකට සාක්ෂි නිසියාකාරව සාක්ෂි නෑ නිසියාකාර සාක්ෂි නෑ මේකට මට Translate කරපු මවුලවි කෙනෙක් ඉන්නවා මහ මර්කස් එකේ මල්වාන උඩවිටිහල මල්වාන රක්ෂපානේ මහ මර්කස් එකේ තියෙන දේශන මට අරාබි භාෂාවෙන් තිබුනා මොන භාෂාවෙන් තිබුනද විදේශිකයෝ ඇවිත් දේශන කරනවා ඒවා තේරුම් කරලා දුන්න Translate කරපු මවුලවි කෙනෙක් හිටියා එයා ත්‍රිපිටකය සම්පූර්ණම නිම කරපු මවුලවි කෙනෙක්. එයා ස්වාමීන් වහන්සේලත් එක්ක ධර්ම සාකච්ඡා වලට පවා යන කෙනෙක්. එයා අපේ පරම්පරාවේ සීයලා එහෙම ටිකක් අදුරන කෙනෙක්. එතකොට ඒගොල්ලෝ මම ඉද්දි කවදාවත් ඇස් දෙකට දැක්කෙ නෑ එකසිය හැට ගානක් භික්ෂුවහන්සේලා නිර්මාණය කරලා සම්බුද්ධ ශාසනය ඇතුලට දාලා තියෙනවා ඒක අපේ මහනායක ස්වාමීන්වහන්සේලාව හොයලා බලන්න ඕන අනන්‍යතාවය මේ අලුත මහන කර ගත් අයගේ

ප්‍ර : අනන්‍යතාවය

පි : අනන්‍යතාවය බලන්න ඕන මේගොල්ලො කවුද කින්ද මන්ද කියලා. දැන් උඩමළුවේ තියෙනවා මෙව්වා එකක් කිසිම දෙයක් හොයන්නේ බලන් නෑ ඒගොල්ලන්ට සහතික ඕන දෙයක් අයිඩින්ටි කාඩ්,උප්පැන්න සහතික ඕන දෙයක් හදන්න පුළුවන්.

ප්‍ර : කාටද?

පි : මුස්ලිම් අයට ඒගොල්ලෝ හරී දක්ෂ අය. පන පිටින් ඉන්න මිනිහටත් මරණ සහතිකය හදන මිනිස්සු. ඒවගේ කට්ටිය ඒ ගොල්ලෝ. ඒ වගේ නිර්මාණ ඒගොල්ලෝ කරනවා

ප්‍ර : එහෙමයි

පි : ඕ... ඉතින් මම ඒවා හොයන්න මම ඒ වගේ හොයන්න දේවල් වලට චුට්ටක් සහභාගි වෙලා තියෙනවා මේ ගොල්ලෝ කරන වැඩ හොයන්න

ප්‍ර : එහෙමයි.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : එතකොට එහෙම උඩමළුව ගත්තොත් ස්වාමීන්වහන්සේ කෙනෙක් නිර්මාණය කරගන්න ඒගොල්ලෝ මහනායක ස්වාමීන් වහන්සේලා කුලියට ගත්තොත් **15000/=** ක් විතර දෙන්ඩ වෙනවා ස්වාමීන්වහන්ස කෙනෙක් මහන කරගත්තට පස්සේ ආතනාත කරගන්න ඒගොල්ලන්ගේ අතුපතු ගාන්න අරව මේවා කරගන්න කිසිදෙයක් ඕනේ නැ හම්බෙන දානය පිරිකරයි එයා ෂේප් කර ගත්තැහැකි කියන එක මතයට ඒ කෙනා කවුද කියලා හොයන් නැ ආව හැටිය මහන කර ගන්න අය ඉන්නවා

ප්‍ර : ඔබවහන්සේ කියන්නේ ඊට වඩා සුපරික්ෂාකාරි වෙන්න ඕන බුද්ධ ශාසනයට ඇතුළත් කර ගන්න කොට

පි : ඔව්.මොකද මගෙන් කිසිදෙයක් ඇහුවේ නැ මහණ කරගන්න. අන්තිමට මට මෙතන ගමනක් යන්න ඕන නිසා මම අපේ අත්තනගල්ලේ විශේෂ පුද්ගලයෙක්ව නායක හාමුදුරුවන්ගේ කෝල් නම්බර් එක දීලා කතා කෙරෙව්ව. කතා කෙරෙව්වට පස්සේ තමා නායක හාමුදුරුවෝ කවද්ද මහන වෙන්න ඕන කියලා ඇහුවා මන් කිව්වා වෙසක් පෝය දවසෙනම් හොඳයි කියලා. මන් **2017** සිංහල අවුරුද්ද **18** වෙනිදා යන්නේ ඊළඟ මාසේ වෙසක් මාසේ **10** වෙනිදා මහන වෙනවා චුට්ට කාලයයි. පන්සලේ දවස් දෙකයි මම ඉන්නේ. හරි නම් හය මාසයක් පන්සලේ ඇබිත්තියා වශයෙන් තියාගෙන ඉදලා තමයි එයා ගැන හොයලා බලලා තමයි නායක හාමුදුරු කෙනෙක් මහණ කරන්න ඕනේ නීතිය අනුව. මාව දවස් දෙකයි පන්සලේ තිබ්බේ.

ප්‍ර : ඒ කියන්නේ ඔබ වහන්සේ කියන්නේ ඒවා විධිමත් වෙන්න ඕනේ මීට වඩා ?

පි : විධිමත් වෙන්න ඕනේ ශාසනයට ඇතුල් වෙලා තියෙනවා ගොඩක්.

ප්‍ර : මම ඔබ වහන්සේගේ අවධානය යොමු කරන්න කැමති අර ඔබ වහන්සේ කිව්වානේ යම් අවස්ථාවකදී අර මල්වානේ හජ්ජියාර් විසින් එහෙමයි සමාවෙන්න. මල්වානේ හජ්ජියාර් විසින් ස්වාමිනි යම් ආයුධ ගෙන්නුවායි කියලා ?

පි : ඔව්.

ප්‍ර : ඒ සඳහා බැසිල් රාජපක්ෂ මහත්මයාව ඒ වගේම ඒ අවස්ථාවේ දී ඒක ආපසු සකස් කරලා අහනවා මල්වානේ හජ්ජියාර් මැලේසියාවෙන් ආයුධ වගයක් ගෙන්නුවා කියලා ඔබ වහන්සේ කිව්වා .

පි : හ්ම්

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : බැසිල් රාජපක්ෂ මහත්මයාගේ නමත් ඔබ වහන්සේ ඒ අවස්ථාවේ දී සඳහන් කෙරුවා.

පි : හ්ම්

ප්‍ර : ඔය ආයුධ ගෙන්වීමට බැසිල් රාජපක්ෂ මහත්මයාට යම් සම්බන්ධතාවයක් තියෙනවා ද?

පි : මේක බැසිල් රාජපක්ෂ මහත්මයා නොදැනුවත්ව කරපු දෙයක් . බැසිල් රාජපක්ෂ මහත්මයාගේ විශ්වාසය දිනා ගෙන මෙන්න මේ ආකාරයට ඉස්මයිල් හජ්ජියාර්ගේ ක්‍රියාව මම ටිකක් පැහැදිලි කරලාදෙන්න අපේ මේ

ප්‍ර : ඔව් ගරු කොමිෂන් සභාවේ

පි : ඔව් ගරු කොමිෂන් සභාවේ අපේ වැදගත් උගත් බුද්ධිමත් මහත්වරුන්ට මේ ටික මම තෝරලා දෙන්නම් . රුවන් ජයවික්‍රම කියන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ රුවන් මහත්මයා කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ

ප්‍ර : රුවන් ජයවික්‍රම නෙවේ අපේ හාමුදුරුවෝ ?

පි : ඔව්

ප්‍ර : රුවන් විජේවර්ධන ?

පි : ඔව් රුවන් විජේවර්ධන අපි

ප්‍ර : ඔබ වහන්සේගේ ඥාතීයෙක් ?

පි : ඔව් මම අයියා කියලා තමා එයාට කතා කළේ . ඥාතීයෙක් නෙවේ මිත්‍රයෙක්

ප්‍ර : මිත්‍රයෙක්?

පි : මගේ මාමා තමා හිටපු අමාත්‍යතුමා

ප්‍ර : අනිත් සුරවිමල රාජපක්ෂ මහත්මයා

පි : සුරවිමල රාජපක්ෂ මහත්මයා මගේ මාමා ඔව් අමාත්‍යතුමා මෙයා මගේ හරි හිතවතෙක් එයාට එක්සත් ජාතික පක්ෂයේ ඔය තත්වයයට එන්න උදව් කළේ ඉස්මයිල් හාජ්ජියාර් මහත්මයා .

ප්‍ර : එතකොට ඒ කියනේන් මේ ඇවිල්ලා

පි : මෙයා පොදු පෙරමුණේ

ප්‍ර : එක්සත් ජාතික පක්ෂයේ දෙන්නෙක්ට තමා උදව් කළේ .

පි : උදව් කළේ ඒ කියන්නේ රුවන් මහත්මයාටයි ඉල්ෆාන් මන්ත්‍රී ඉස්මයිල් හාජ්ජියාර් මේ දෙන්නාට උදව් කරලා රුවන් මහත්මයාටයි

ප්‍ර : ඒ කියන්නේ යූ.එන්.පී

පි : යූ.එන්.පී

ප්‍ර : එක්සත් ජාතික පක්ෂය

President's Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

පි : එක්සත් ජාතික පක්ෂය එයාට උදව් කළා.

ප්‍ර : උදව් කළා.

පි : බැනර් කටඅවුට් වාහන ඔක්කොම ඉස්මයිල් හාජ්ජියාර් තමා වියදම් කළේ .

ප්‍ර : ඡන්දේට

පි : ඉල්ෆාන් කියලා හිටියා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී එයා පළාත් සභාවට ඉල්ලුවා

ප්‍ර : මොන පක්ෂයෙන් ද ?

පි : යු.එන්.පී.

ප්‍ර : යු.එන්.පී.

පි : යු.එන්.පී. එකෙන් එයාටත් සම්පූර්ණයෙන් වියදම් කළේ ඉස්මයිල් හජ්ජියාර් සහ පරණ මාළු මාකර්ට් එක ගෑස්පහ හන්දියේ එකේ සම්පූර්ණයෙන් පේර ටොෆි ඇපල් ටොෆි පේර ටොෆි ගෙන්නපු හල්වාන් හජ්ජියාරුයි දෙන්නා එක්කලා ඉල්ෆාන්ට ගොඩක් උදව් කළා ඒ ඡන්දෙට

ප්‍ර : එහෙමයි.

පි : ඒ පිටම මහින්ද රාජපක්ෂ මහත්මයාලාගේ කාන්තා බලමුළු එක තිබුණා විශේෂ රැස්වීමක්

ප්‍ර : එහෙමයි

පි : ඒකට පල්ලි දැනුවත් කරලා පොඩි තුන්ඩු කැලි දීලා සීල් ගහලා හාල් ලොරියක් දෙකක් ගෙනල්ලා තිබ්බා සදකා දෙනවා මෙහෙම එන්න කියලා.

ප්‍ර : මොනවාද දෙන්නේ ?

පි : සදකා

ප්‍ර : සදකා . ඒ සදකා කියන්නේ මොකක් ද?

පි : සදකා කියන්නේ දුප්පත් අයට දෙන උදව් .

ප්‍ර : ඔව්

පි : සදකාරකත් කියලා තියෙනවා

ප්‍ර : ඒ මොන කාලේද අපේ හාමුදුරුවනේ ?

පි : ඒක මහින්ද මහත්මයාගේ රජයේ කාලේ අපි ගත්තේ .

ප්‍ර : ඒ කියන්නේ 2015 වසරට පෙර?

පි : ඔව්. ඔව්. රජය කාලේ ඊට පස්සේ මම හිටියේ ඒකේ එන අයගේ

ප්‍ර : දැන් ඔබ වහන්සේ කිව්වානේ දේශපාලනයට මැතිවරණයට උදව් කෙරුවා කියලා?

පි : ඔව්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඔය මහ මැතිවරණයට ද ඒ උදව් කළේ නැත්නම් ජනාධිපතිවරණයට ද උදව් කළේ ?

පි : ඒක මහමැතිවරණයට තමයි රුවන් මහත්මයාට උදව් කළේ. ඔව් මහමැතිවරණයට .

ප්‍ර : වකවානුවක් ඔබ වහන්සේට මතකයිද දන්නේ නෑ.

පි : ගොඩක්ම ලිව්වේ නෑ ලියන්න බෑ මේ කිසි දෙයක් ලියන්න බෑ ඒකයි මම කිව්වේ කිසිම දෙයක් ලිව්වා නම් මට එන්න හම්බෙන්නෙත් නෑ මෙතෙන්ට කවදාවත් (ස්වාමීන් වහන්සේ සාක්ෂි දෙමින් සිනාසෙයි) ඒ සංවිධානයට

ප්‍ර : නමුත් ඔබ වහන්සේට මතකයි **2015** වසරට පෙර කියලා?

පි : ඔව් එතකොට ඒ ආවේ වාහන ආවේ පිළිවෙළට නොම්බර මහින්ද මහත්මයාලාගේ වාහන කළු කාර් ආවේ දැන් **2832**

ප්‍ර : කොහේට ද ආවේ ?

පි : ඉස්මයිල් හජ්ජියාර්

ප්‍ර : ඔව්

පි : **2238** නම් **2239**

ප්‍ර : ඔබ වහන්සේ හිටියේ කොහේද එතකොට

පි : මම ඉස්මයිල් හජ්ජියාර්ගේ ගෙදර හිටියේ .

ප්‍ර : එතකොට ඔබ වහන්සේ දැක්කා මේක?

පි : මේකට සංවිධානයට සහභාගි වුණා මං

ප්‍ර : එහෙමයි . මහින්ද මහත්මයා කියලා කියන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා කියන්නේ වර්තමාන ගරු අගමැතිතුමා?

පි : ඔව් අගමැතිතුමාගේ බැසිල් රාජපක්ෂ මහත්මයාගේ නෝනා ආවා මහින්ද මහත්මයාගේ නෝනා ආවා. ඒ කාන්තා බල සංවිධානයේ ගොඩක් කට්ටිය ආවා. එතකොට මුස්ලිම් සියළුම මල්වානේ ඉන්න සියළුම අස්සක් මුල්ලක් නෑර මුස්ලිම් කාන්තාවෝ ටික මේකට ආවා

ප්‍ර : එහෙමයි

පි : එතකොට එක පවුලේ එක ගෙදරක පවුල් තුන හතර ඉන්නවා එක ගෙදරින් තුන් හතර දෙනා වගේ සිංහල ගම්මානවල ඉල්ෆාන් මන්ත්‍රී මාපිටිගම උලහිටිවලට එහා මල්වානේ මාපිටිගම කනුකැටිය ඉන්න අවට ඉන්න මුස්ලිම් කට්ටිය චුට්ටක් ඉන්නවා සිංහල අය සම්බන්ධ වුණා. ඒ සිංහල අයටත් දුන්නා අර කාඩ් .

ප්‍ර : දැන් පොඩ්ඩක් මම ඔබ වහන්සේට බාධා කරනවා. දැන් ඔබ වහන්සේ ඉස්සෙල්ලා කිව්ව පිළිතුර අනුව උදව් කරපු දෙන්නාම යු.එන්.පී. එකේ ?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : යු.එන්.පී

ප්‍ර : එතකොට දැන් ඔය මහින්ද මහත්මයාගේ නෝනා ආවා කියලා කිව්වා බැසිල් රාජපක්ෂ මහත්මයාගේ නෝනා ආවා කිව්වා එතකොට ඒ ගොල්ලෝ යු.එන්.පී නෙවෙයි නේ?

පි : නෑ . එතකොට දැන් මෙයා පොදු පෙරමුණට ආවා

ප්‍ර : ඒ කියන්නේ හජ්ජියාර් මේ දෙපැත්තම

පි : හජ්ජියාර් දෙපැත්තම මේවා වුණා. ඒ කියන්නේ අරහෙන් හරි මෙහෙන් හරි දැන් රුවන් මහත්මයා ආවහාම ඒ පැත්තෙන් එයාට කර ගත්ත හැකි.

ප්‍ර : එහෙමයි.

පි : මෙහෙන් ඉල්ෆාන් දැම්මොත් එහෙන් කර ගත හැකි. මේයා මහින්ද මහත්මයා මෙහෙන් කරගන්නවා. එතකොට අනිත් ඉන්න සියළුම දේශපලඥයෝ මෙහේ එනවා පාටි වලට එයාගේ කෑම බීමට . අනිත් දේශපලඥයෝ ඔක්කොම මල්වානේට එනවා.

ප්‍ර : ඔබ වහන්සේ කොහොමද දන්නේ ?

පි : මම ඒ ගොල්ලොත් එක්ක කෑමට ඉදලා තියෙනවා . මම රවුෆ් හකීම් මහත්මයා එක්ක කෑමට ඉදලා තියෙනවා . ඒවට මට ආරාධනා කරපු සිංහල මනුස්සයෙක් එයා ගාව වැඩ කරනවා . එයා තමයි කියන්නේ අද සාප්පාඩුවක් තියෙනවා එනවා ඇමතිතුමා එහෙම හසන්ටත් එන්න කිව්වා .

ප්‍ර : අපේ හාමුදුරුවනේ දැන් ඒ දේශාපලඥයෝ ඒ දැන් රවුෆ් හකීම් මහත්මයාත් මුස්ලිම් නේ ?

පි : ඔව්.

ප්‍ර : එතකොට හජ්ජායාරුත් මුස්ලිම්නේ ?

පි : ඔව්.

ප්‍ර : ඉතින් එගොල්ලෝ සම්බන්ධ වීමේ එකට ආහාර ගැනීමේ ප්‍රශ්නයක් නැනේ ?

පි : ඒක ප්‍රශ්නයක් නෑ. ආහාර අරන් අන්තිමට

ප්‍ර : ඔව්

පි : අල්මුබාරක් ඉස්කොලේ ඒ ගොල්ලන් ආව වාහන ටික ලස්සනට ගහනවා වටේට. ගහලා ගාඩ් එකට දානවා හතර දෙනෙක් මැද මේගොල්ලෝ ඉඳගෙන මසුරා එකක් තියෙනවා . එළිපිට මසුරා අර සිකුරාදාට පල්ලියේ මේවුවා බයන් එක වගේ මේ ගොල්ලෝ ඒ ආවේ ඔක්කොම මේකට තන්සර් එනවා

ප්‍ර : කවුද තන්සර් කියන්නේ ?

FAIR COMMENT
BY JEZEEM

පි : තන්සර් කියන්නේ තිහාරියේ ඉන්න ලොකුම දුම්කොළ සම්බන්ධ තන්සර් හජ්ජියාර් . නොලිමිට් එනවා .

ප්‍ර : නොලිමිට්?

පි : ඔව්. Expo Lanka ලංකා එනවා.

ප්‍ර : ඔව්

පි : ඇල්ලේ කම්පැනි ලොකු අයිතිකාරයා එනවා . ඔය වගේ විශාල හජ්ජියාර්ලා ටිකක් මෙතනට ඇවිල්ලා ඔය කට්ටිය තමා ගහූර් සර් ඔතන ඉන්නවා .

ප්‍ර : ඔව්. අර මහ අධිකරණ විනිශ්චයකාරවරයා

පි : මහ අධිකරණ විනිශ්චයකාරවරයා

ප්‍ර : අර පොඩි එක්කෙනා නේද?

පි : ඔව් එයා අනිවායේන්ම ඉන්නවා මේ දේවල් වලට එතකොට ලාෆිර්

ප්‍ර : පොලිසියේ මහත්වරු කවුරුත් හිටියාද ?

පි : (සාක්ෂිකරු සිනාසෙමින් පිළිතුරු දෙයි) ඒවා තහනම් ඒවා රැල්ස් විදිහට කියන්න බෑ මැඩම් ඒක දැනුවත් කරන තැනක් තියෙනවා එතන තමයි දැනුවත් කරන්න වෙන්නේ

ප්‍ර : එතකොට අර

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා මගින්</u>

ප්‍ර : කොමිෂන් සභාව ඉදිරියේ කියන්න.

පි : ඒක මට මහත්මාණනි මේකේ කරුණු ටිකක් තියෙනවා කරුණු 04 ක් තියෙනවා ඒක ජනාධිපතිතුමාට පමණක් තමයි මම තීරණය කළේ කියන්න.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය මගින්</u>

ප්‍ර : ඔබ වහන්සේට අපේ කොමිෂන් සභාවේ ගරු සභාපතිතුමාට රහසිගතව කියන්න පුළුවන්ද ?

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය මගින්</u>

ප්‍ර : මීට පෙර අවස්ථාවල් වලදී ස්වාමින් වහන්සේ

පි : ඒක පුද්ගලිකව

ප්‍ර : එහෙමයි ස්වාමින් වහන්සේ පෙර අවස්ථාවල් වල කාදිනල් තුමාත් ඒ වගේ පෞද්ගලිකව අපේ ගරු සභාපතිතුමාට යම් යම් කරුණු

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පිළිබඳ දැනුම් දීමක් කළා. ඒ නිසා ඔබ වහන්සේටත් එහෙම හැකියාව තිබෙන බව තමයි ගරු කොමිෂන් සභාවේ සාමාජික මහත්ම මහත්මීන් කියන්නේ .

පි : මොකද මම ගොඩක් මහන්සි වුණා මේක මේ මෙතෙන්ට එවෙන්න

ප්‍ර : එහෙමයි.

පි : මුලින්ම ඒක චුට්ටක් මේ විද්‍යුත් මණ්ඩලය දැනුවත් කළ හැකි. මුලින්ම මම ආරක්ෂක ලේකම් කාර්යාලයේ තමා පාස්කු ප්‍රහාරය වැළකුන්නේ නැති හින්දා ඇන්ට්‍රි එක දාන්නේ එහි.

ප්‍ර : ඒ කොයි කාලේ ද ?

පි : මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ මැයි මාසේ වගේ ඒකට එන්නේ නොරොච්චෝලේ පොලිසියේ සාමාන්‍යය පොලිස් නිළධාරී මහත්වරු ටිකක් .

ප්‍ර : ඒ කියන්නේ ආරක්ෂක ලේකම් කාර්යාලයට ඔබ වහන්සේ පැමිණිල්ල කරපුවහාම නොරොච්චොලේන් තමා එන්නේ ?

පි : ඔව්.

ප්‍ර : ඇයි නොරොච්චොලෙන් එන්නේ?

පි : නොරොච්චෝලේ රාළහාමිලා දෙන්නෙක් ඇවිල්ලා තමා මගෙන් විමර්ශනයක් කළේ .

ප්‍ර : ඔබ වහන්සේ නොරොච්චොලේ හිටියාද ?

පි : මම කල්පිටියේ ශ්‍රී වාළුකාරාම විහාරස්ථානයේ විහාරාධිපති හාමුදුරුවෝ මම . මගේ පන්සල ඒක මට ලියකිවිලි ඇතිව මට පුජා කරපු බැදිඔයේ දේශන හාමුදුරුවෝ පුජා කරපු පන්සල ඒක අක්කර හතර හමාරක ලොකු පන්සලක් .

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා මගින්</u>

ප්‍ර : ස්වාමීන් වහන්සේ පොලිස් නිළධාරීන් ගැන කියනකොට හිටපු වැදගත් වෙනවා තමන්ට ඒ නිසා මේ සාක්ෂිය පසුව පෞද්ගලිකව දෙන්න කියලා ඉල්ලා සිටින්නේ .

පි : එහෙමයි.

ප්‍ර : ඒ ගැන හිතලා බලන්න .

පි : එහෙමයි අපේ මහත්තයෝ

****

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය මගින්</u>

ප්‍ර : ඔබ වහන්සේ ඒ ගරු සභාපතිතුමාට විතරයි එතකොට කියන්නේ.

FAIR COMMENT
BY JEZEEM
Presidential Secretary's Copy

පි : ඔව්.

ප්‍ර : ඒ පිළිබඳව එතුමා ඉවර වුනාහම මේ වේලාවේ නෙවෙයි

පි : ඒ විදිහ ඊට පස්සේ ඔවාගේ ඔවාගේ කියලා කියලා මා ගාව තියෙනවා නොම්බර 100 කට වැඩිය තියෙනවා මේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ගුවන් හමුදාපතිතුමාගේ ඉදලා සියළුම බුද්ධි අංශයේ සියළුම කෙනාගේ නම්බර් ටික මම හොයා ගත්තා .

ප්‍ර : ඇයි ඔබ වහන්සේ එහෙම තියා ගෙන ඉන්නේ.

පි : එහෙම මං හෙව්වා මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ කතා කරලා කතා කරලා මේ හැම කෙනාටම කියනවා මේක සාර්ථක වුණේ නෑ. පැය විසි ගානක් සී.අයි.ඩී. එකට දෙනවා එතනින් මේක හිර වෙනවා පොලිස් ඕගනයිෂේෂන් එකට දෙනවා .

ප්‍ර : ඒකෙන් ඔබ වහන්සේ අදහස් කරනවාද මේ පිළිබඳ රහස් පොලිසියටත් කට උත්තරයක් දුන්නා කියලා ? පැමිණිල්ලක් ද කළේ කටඋත්තරයක් ද දුන්නේ .

පි : මම අන්තිමට පොලිස් ඕගනයිසේෂන් එකට ඒ කියන්නේ සංවිධානාත්මක අපරාධ නිවාරණ ඒකකයේ මහත්මයෙකුට මම දෙරණෙන් ඒ මහත්මයාව අඳුර ගෙන එහි ඇවිල්ලා දෙරණ මාධ්‍යවේදීයෙක් සම්බන්ධ කර ගෙන තමයි මම ඒ මහත්මයාව හොයාගන්නේ. ඒ ඇවිල්ලා එගොල්ලොන්ට ප්‍රකාශයක් ඉදිරිපත් කරනවා . පැයක් විතර කරන කොට කියනවා මේක ගොඩක් සීරියස් අපි මේක දාමු වෙන තැනකට කියලා . ඊට පස්සේ ඩී.අයි.ජී. මහත්මයාට දානවා ඩී.අයි.ජී. මහත්මයා දානවා නියෝජ්‍ය පොලිස්පතිතුමාගාවට

ප්‍ර : එහෙමයි .

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා මගින්</u>

ප්‍ර : කවුද නම් කියන්නේ නැද්ද ?

පි : වෙලගෙදර මහත්මයා තමයි මෙහෙම මාව අරන් යන්නේ. මං ඉතුරු නිළධාරී මහත්වරුන්ගේ නම් දන්නේ නෑ. ඕ.අයි.සී. මහත්මයා වෙලගෙදර මහත්මයා

ප්‍ර : එහෙමයි

පි : වෙලගෙදර මහත්මයා .

ප්‍ර : කොහේ ඉදන්ද අරන් යන්නේ .

පි : පිට කොටුවට මම එනවා ඒ ගොල්ලො මාව එක්ක ගෙන එනවා ගිහිල්ලා ඇවිල්ලා එහි කට උත්තරය දෙන කොට ඒ ගොල්ලො

FAIR COMMENT BY JEZEEM

කියනවා මේක අපිට වඩා ඉහළ තැනකට යන්න ඕනී කියලා තමයි අරගෙන ගිහිල්ලා සී.අයි.ඩී. එකේ ඕ.අයි.සී මාරසිංහ මහත්මයාට මම දවස් දෙක හමාරක ප්‍රකාශයක් ඉදිරිපත් කළා. ඒකේ මම ගොඩක් විශේෂ දෙයක් විශේෂ දේවල් මේ සමානව තමා දුන්නේ මේකෙනුත් මම අඩු කරපුවා තිබ්බා එතන. මම දෙවැනි ප්‍රකාශය මගෙන් ගන්නේ නොරොච්චෝලේ රාළහාමිලා ආවාට පස්සේ පුත්තලම අපරාධ විමර්ශන අංශයෙන් තමයි ගන්නේ. එතනින් භාගයක් ගන්න කොට එතනට මුස්ලිම් දෙන්නෙක් ඇවිල්ලා අහනවා සර් අපේ වැඩේ හරිද කියලා. මම ඒක තමයි මේ කර කර ඉන්නේ කියලා මාව පවා දෙන්න යනවා එතෙන්දී. මම Toilet එකට යන්නම් සර් කියලා මම එළියට බැහැලා මම ඒ පැන්න පාර තමා මේ පන්සල් ගානේ ඇවිද ඇවිද ඉන්නේ එතනින් මාව පාවා දෙන්න ගියා. ඊට පස්සේ OIC මාරසිංහ මහත්මයා විමර්ශනය කරන වේලාවේ මට කෝල් එකක් එනවා මේ ෆෝන් එකට . මම ඇහුවා කොහෙන්ද කියලා අපේ මේ පුත්තලමේ විමර්ශනය කරපු එකේ මේ ඔබ වහන්සේගේ විමර්ශනය ගොඩක් සාර්ථකයි කිව්වා ඒ කියපු දේවල්. ඒවා සාර්ථකයි ඉතුරු ටික ගන්න ඕනේ එන්න කිව්වා. මම කිව්වා මේ මහත්මයාත් එක්ක කතා කරන්නකෝ කියලා ඕ.අයි.සී. මාරසිංහ සර්ට මම දෙනවා ෆෝන් එක .

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අජේෂා ජිනසේන මෙනවිය මගින්</u>

ප්‍ර : ඒ කියන්නේ සී.අයි.ඩී. එකෙන්

පි : සී.අයි.ඩී. එකෙන් එයා කතා කරලා කියනවා එයා මගේ බැජියෙක් එයා එයත් බලන කොට ඕ.අයි.සී. මහත්මයා එයා විනාඩි 20 ක් ඇතුළත එතනට එනවා . එතනට ආව වේලාවේ එතන ඉන්නවා සී.අයි.ඩී. එකේ මැඩම් කෙනෙක් . මේ මැඩම්ගේ හැඩ හුරුව වගේ ටිකක් පොඩි මැඩම් කෙනෙක් . එයා ඉංග්‍රීසියෙන් කියනවා ස්වාමීන් වහන්සේගේ විමර්ශනය අනුව ඕගොල්ලෝ නෝට් එකේ ඉන්නේ ඕගොල්ලෝ බිංදුවේ ඉන්නේ . එයා පැය භාගයක් තමා එතන විමර්ශනයේ හිටියේ එහෙම කියලා යනවා එතන. ඊට පස්සේ අර සර් ආවට පස්සේ මම කියනවා විමර්ශනයේ ඉතුරු ටික දීලා තියෙන්නේ මේ ටයිප් කරලා කොළ තියෙනවා මම අත්සන් කරලා තියෙන මෙහෙන් ඒක ගනුදෙනු කර ගන්න මම දැන් දවස් 03 ක් තිස්සේ කොළඹ ඉන්නවා මම යන්න ඕනී කියලා . ඊට පස්සේ ඒකවත් එතනින් හරි ගියේ නෑ. ඊට පස්සේ තමා මගේ

FAIR COMMENT BY JEZEEM

FaceBook එකට වීඩියෝ එකක් හදලා දාන්නේ ඡන්දේ නතර කරන්න දෙන්න එපා ඡන්දේ රටේ ලොකු විපරියාසයක් තියෙනවා කළු කොඩිදාලා ඡන්දේ තහනම් කරන්න ඒක මම හොයන්නේ ඒක දාලා ගෝඨාභය මහත්මයාගේ ප්‍රධාන ආරක්ෂක ලේකම් මේ ආරක්ෂක මහත්මයා. එයා මට කතා කරලා අහනවා හාමුදුරුවනේ මොකක්ද මේ දාන්නේ මං එයාගේ මැසෙන්ජර් වලට දැම්මා

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා මගින්</u>

ප්‍ර : මොකක් ද නම ?

පි : එයාගේ නම නම්බර් එක තියෙනවා මෙන්න මේ මහත්මයා මැඩම් එයා ඉන්නවා මේ අපේ යුධ හමුදා උසස් නිළධාරී මහත්වරුන් එක්ක එයා ඉන්නවා .

ප්‍ර : එයා හමුදාවේ මහත්මයෙක් ද?

පි : යුධ හමුදාවේ කර්නල් මහත්මයෙක් . බ්‍රිගේඩියර් හරි බණ්ඩාරගම ගම . මේ ඉන්නේ ඒ මහත්මයා මැඩම්. ෆොටෝ තියෙනවා. මේ තියෙන්නේ මැඩම්

****

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අජේෂා ජිනසේන මෙනවිය මගින්</u>

ප්‍ර : ස්වාමීන් වහන්සේ මේ කොයි එක්කෙනා ද දන්නේ නෑ?

පි : මේ අත් දෙක පිටුපස්සට බැඳෙගෙන ඉන්නේ . මෙයාගේ සම්පූර්ණ ෆොටෝ එකක් මම දෙන්නම්කෝ මෙතන ගෝඨාභය මහත්මයාත් එක්ක ඉන්න ෆෝටෝ එකක් තියෙනවා එයාගේ . මේ ඉන්නේ මහත්මයා මෙතන . මෙන්න මේ මහත්මයා . මේ ඉන්නේ මෙන්න මේ මහත්මයා මේ නිල් පාට ඇඳලා ඉන්නේ . එයා තුන් හතර පොළකම ඉන්නවා .

ප්‍ර : නිල් පාට ඇඳල ඉන්න එක්කෙනා .

පි : නිල් පාට ඇඳල ඉන්න එක්කෙනා. නාමල් රාජපක්ෂ මහත්මයා එහෙම ඉන්නේ . තව ඉන්නවා මෙතන ගෝඨාභය මහත්මයා එක්ක ගෝඨාභය මහත්තයාගේ ලෝයර් මහත්මයා ඔව්.මේ ඉන්නේ මෙතන ගෝඨාභය සර් ළඟ ඉන්නේ .

ප්‍ර : මෙතන පිටිපස්සේ ඉන්න එක්කෙනා .

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මෙයා ද ?

පි : කර්නල් කෙනෙක් . මම කසාප රජමහා විහාරයේ ඉදද්දි කොළඹ ඉදන් ඇවිත් මාව හම්බ වෙලා කතා කළා එයා. ඊට පස්සේ මම එයාට මැසෙන්ජර් වලින් කිව්වා මම ඡන්දේ නතර කරනවා කියලා . ඊට පස්සේ

ප්‍ර : මොහාන්

පි : මොහාන් මහත්මයා මොහාන් සිල්වා ඇයි ඕකේ ඉන්න ලෝයර් මහත්මයාත් අඳුරනවා එයත් මා එකක් කතා කළා. එකේ ලෝයර් කෙනෙක් ඉන්නවානේ. ලෝයර් මහත්මයෙක්. එයත් මා එක්ක කතා කළා. එයා කිව්වා නිවන් දැකීමත් අන්තවාදයක් කියලා එයාගේ දැනුමෙන් .ලෝයර් මහත්මයා අපි ගත්තා ලෝයර් මහත්මයයි , මමයි උතුවන්කන්දේ නායක හාමුදුරුවෝ ඉන්නේ කැම්පස් එකේ උගන්වන අපි එහේ පොඩි සාකච්ජාවක් තිබුණා. ඔය ලෝයර්ගේ එකම වචනයෙන් නතර කළා හාමුදුරුවෝ ලෝයර් මහත්මයා කිව්වා හාමුදුරුවනේ කඩුවක් මොකක්ද නිවන් දැකීමත් අන්තවාදයක්නේ කියලා . මම කිව්වා මම නම් තාම සාමණේර හාමුදුරු නමක් මේ ඉන්නේ මහා නායක ස්වාමීන් වහන්සේ කෙනෙක් මේ විශ්ව විද්‍යාලයේ උගන්වන මම කිව්වා ඔබතුමාගේ දැනුමයි මගේ දැනුමයි සසඳන්න බෑ කියලා අපි මේක නතර කරමු කාලේ නාස්ති කරන්න අවශ්‍ය නෑ කියලා . හාමුදුරුවොත් කිව්වා ස්වාමීන් වහන්සේගේ වචනේ හරි එහෙනම් ඔබතුමාලා යන්න කිව්වා .

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මහතා මගින්</u>

ප්‍ර : ඒ කොයි කාලේ ද ?

පි : දැන් මාස

ප්‍ර : මේ ප්‍රහාරයෙන් පස්සේ ද?

පි : ප්‍රහාරයෙන් හය වෙනි මාසේ වගේ

****

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය මගින්</u>

ප්‍ර : ඒ කියනේන් ඔබ වහන්සේ මේ කියන්නේ මේ ප්‍රහාරයෙන් පස්සේ ඔබ වහන්සේ දන්න තොරතුරු මේ රටේ යම් වැදගත් ස්ථානවලට බලධාරීන් වෙත ලබා දෙන්න ඔබ වහන්සේ විසින් යම් යම් පියවර

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගත්තාට ඒවා හැම එකක්ම වගේ එක්කෝ ඒ ගොල්ලෝ පියවරක් ගත්තේ නෑ

පි : නෑ

ප්‍ර : නැත්නම් ඒවා නිසා ඔබ වහන්සේට පෞද්ගලිකව යම් ආකාරයක තර්ජන සහ අලාභ වීම් සිදු වුණා කියලා ?

පි : ඔව් මම දැන් අවුරුදු දවස් දෙකක් නම් කමක් නෑ අවුරුදු 16 ක් 17 ක් මේකේ ඉදලා සියළුම විස්තර දැන ගෙන ඇවිල්ලා හොයා ගත්තාට වඩා මහන්සි වෙන්න ඕනේ මේක කියන්න . මේ මාස 8 ට පුදුමාකාර වෙහෙසක් දැරුවේ නොකියපු කෙනෙක් නෑ. දැන් මේක පොලිසියට ගිහිල්ලා කියන්න බෑ ඒක නිසා තමයි අපේ මහ නායක ස්වාමීන් වහන්සේලාට ඔය මහත්තුරු හොයා ගත්තා කියන්නේ බොහොම අමාරුවෙන් හොයා ගත්තේ ඔය මහත්තුරු.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා මගින්</u>

ප්‍ර : මාරසිංහ මහත්මයාට ප්‍රකාශයක් දීලා ඒක විමර්ශනය කරන ඒක සටහන් කර ගත්තා ද?

පි : ඒක ගත්තා

ප්‍ර : සී.අයි.ඩී. එකෙන්

පි : ඒක අරගෙන ඊට පස්සේ දැන් මේකට කිසි දෙයක් වෙන්නේ නෑ මම දැන් ඡන්දේ නතර කරන්න කියලා දැම්මානේ මේවුවා එක

ප්‍ර : එහෙමයි

පි : ඒ දැම්මට පස්සේ මහත්මයා කියනවා ඕක දාන්න එපා හාමුදුරුවනේ ඔබ වහන්සේ

ප්‍ර : මොහාන් මහත්මයා කියනවාද ?

පි : මොහාන් මහත්මයා කියනවා ඔබ වහන්සේ හිර කරයි කියලා මම කිව්වා එහෙනම් මහත්මයා අහන්න සී.අයි.ඩී. එකේ අහවල්ලුන්ගෙන් මම දුන්න විමර්ශනයට මොකද වුණේ කියලා ඒක කුණු කුඩේද කියලා අහලා කියන්න කිව්වා . ඊට පස්සේ එයා කිව්වේ මොකක් ද දන්නවා ද පැය භාගයකට පස්සේ කිව්වා ඒ මහත්මයා කිව්වා ඔබ වහන්සේ ප්‍රසිද්ධියට පත් වෙන්න මේ කරන රහපෑමක් කියලා ආරක්ෂක අංශයෙන් කිව්වා කියලා . ඊට පස්සේ මම ටක්ගාලා අපේ දැන් අරාබි දන්න ඒ මහත්මයා

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය මගින්</u>

ප්‍ර : එහෙමයි

FAIR COMMENT BY JEZEEM

පි : අපිත් එකක් සම්බන්ධයිනේ

ප්‍ර : දිනේෂ් රණසිංහ

පි : දිනේෂ් මහත්මයාගෙන් මම ඇහුවා මහත්මයා මට එක උත්තරයක් දෙන්න කිව්වා. ඇහුවා මොකක් ද කියලා. ඔබ වහන්සේලාට මං කිව්වා ඔබතුමාලාට මේ ආරක්ෂක අංශයේ වැඩ කරන කොට දත්මිටි කන තැන් තියෙනවා ද කියලා ඇහුවා . එපමණයි අපේ හාමුදුරුවනේ කිව්වා . ඒකෙන් මම තොර ගත්තා . ඊට පස්සේ මම වෙලගෙදර මහත්මයාගෙන් ඇහුවා මහත්මයාලා ගිහිල්ලා ගිහිල්ලා මඟදී නවතින තැන් තියෙනවා නේද මහත්මයා ඔව් හාමුදුරුවනේ .

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා මගින්</u>

ප්‍ර : ඒ වෙලගෙදර කියන්නේ පොලිස් පරීක්ෂකවරයෙක්

පි : ඒ පොලිස් පරීක්ෂක මහත්මයා සංවිධානාත්මක අපරාධ විමර්ශන එකේ . ඒ වචන දෙකෙන් තමයි මම මේක ඇතුළේ නම්බර් පට පට ගාලා ගුවන් හමුදාපතිතුමාගේ නම්බරේ හොයා ගත්තා ගුවන් හමුදාපතිතුමාගෙන් ප්‍රධාන බුද්ධි අංශ නායකයෙකුට කතා කළා . ගොඩක් අයට මම මේකෙන් කතා කළා.

ප්‍ර : ස්වාමීන් වහන්සේ කොහොමද බුද්ධි අංශ නායකයෝ සේරම සම්බන්ධතා තියෙන්නේ නිතරම හොඳින්? ඒ කියන්නේ මීට කලින් ඉදන් බුද්ධි අංශය එක්ක සම්බන්ධතාවයක් තිබිලා තියෙනවා ද?

පි : නෑ මම 1919 ට අමතලා මම සරණ පදනමේ විධායක අධ්‍යක්ෂ ඒක ජාත්‍යන්තර පදනම මගේ පදනම නායක හාමුදුරුවෝ මට පැවිදි කරපු මහා නායක හාමුදුරුවෝ තමයි උතුරු මැද පළාතේ ප්‍රධාන සංඝ නායක හාමුදුරුවෝ මට මේ පදනම ඇරලා දුන්නේ . මම මේකේ දහම් පාසල් වල කිරි බිස්කට් තේ දෙන්න තමයි මම මේක සංවිධානය කළේ ඒක අත ඇරියා මම මේක අරගත්තේ මට අවශ්‍ය කරන නිසා. ඒකේ විධායක අධ්‍යක්ෂ හාමුදුරුවෝ කිව්වම ඒගොල්ලෝ ගහලා බලනවා සරණ පදනම ඒක බලලා හරි නම්බර් ඔක්කොම තියෙන මේ නම්බර් එකෙන් තමයි කතා කළේ . මට ගුවන් හමදාපතිතුමාට චුට්ටක් කතා කරන්න ඕනේ කිව්වාහම ඒ ගොල්ලො දෙනවා. ගුවන් හමුදාපතිතුමාට මම කිව්වා මේ ආකාරයට මේ ප්‍රශ්නයක් තියෙනවා මේක විසඳගන්න කවුරුහරි හොඳ නිළධාරී මහත්මයෙක් හොයලා දෙන්න මම මේ සම්බන්ධව දන්නවා කියලා වැඩි විස්තර කිව්වේ නෑ එයා කිව්වා බුද්ධි අංශයේ ඉහළම නිළධාරී මහත්මයෙක් දෙන්නම් කියලා.

FAIR COMMENT
BY JEZEEM

එයාගේ හතේ ඉලක්කම් හතරේ ඉලක්කම් වගේ තමා එයාගේ තියෙන්නේ නම්බර් මම පොතක ලියලා ඇති ගෙනාවේ නෑ පන්සලේ .

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය මගින්</u>

ප්‍ර : ඒ කියන්නේ ගුවන් හමුදාවේ බුද්ධි අංශයේ ?

පි : නෑ ගුවන් හමුදාවේ මහත්මයෙක් බුද්ධි අංශයේ එක්කෙනෙක් මට කතා කරලා දුන්නා . ඒ විදිහට මේ කතා කරන මහත්මයාත් අපි හොයා ගත්තේ ඒ විදිහට. ජාතික ආරක්ෂාව උදෙසා මම ඒකට සහභාගි වුණා. ඒකේ මට මැසේජ් එන්න පටන් ගත්තා. ඒ නම්බර් වලින් තමා මම ගොඩාක්ම ජාතික ආරක්ෂාව උදෙසා එන නම්බර් ඔක්කොම මේ ආරක්ෂක අංශයේ කට්ටියගේ නම්බර් තියෙනවා. ඒ නම්බර් වලින් තමයි මම මේ මහත්වරුන්ට කතා කරලා කතා කරලා මේක හොය ගත්තේ . ඒ මගේ දැනුම අනුව තමයි මම මේ විදිහට උත්සහ කරලා හොයා ගත්තේ. 1919 න් ගොඩක් නම්බර් මම හොයා ගත්තා . එතකොට 1515 ගැහුවහාම ගුවන් හමුදා එකට වැඩ කරන්නේ . මම මේ නිකම් ෆෝන් එක අතේ තියන් 1515 ගහලා බැලුවහාම ඉංග්‍රීසියෙන් කතා කරලා ගුවන් හමුදා මුලස්ථානයද කියලා ඇහුවා මම ටක් ගාලා කිව්වා මම මේ විධායක අධ්‍යක්ෂ හාමුදුරුවෝ මේ අහවල් පදනමේ මට ගුවන් හමුදාපතිතුමාට චුට්ටක් කතා කරන්න ඕනේ කියලා . මම එතුමා දැනුවත් කළා අන්තවාදය පිළිබඳ ගොඩක් දේවල් මා ගාව තියෙනවා මට මේකට හොඳ රටට ආදරය කරන නිළධාරී මහත්මයෙක් කතා කරලා දෙන්න කියලා . ඊට පස්සේ මේ මහත්මයා මහ ඇරියා එයා බුද්ධි අංශේ උසස් නිළධාරී මහත්මයෙක් .

ප්‍ර : ඒ කියන්නේ ඉන්ටිලිජන්ස් එකේ එක්කෙනා තමා මහ ඇරියේ

පි : ඔව් එයා මහ ඇරියා. ඊට පස්සේ තමා මම මේ මාරසිංහ මේ අපේ පොලිස් ඕගනයිසේෂන් වෙලගෙදර මේ මහත්තයගෙනුයි අහල තමයි

ප්‍ර : මේ මහත්මයා කියන්නේ ?

පි : දැන් අරාබි දන්න අපේ මහත්මයා

දැන් වේලාව : 03.40 යි.

මෙතැන් සිට : ධම්මිකා මිය.

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් ගැනීම යමුනා මිය විසින්ය.
වේලාව : ප.ව.3.50 යි.
මෙතැන් සිට වාර්තා කරන්නේ ධම්මිකා මිය විසින්ය

<u>අතිරේක සොලිසිටර් ජනරාල්වරිය විසින්:</u>

ප්‍ර : දිනේෂ් රණසිංහ මහත්මයා?

පි : දිනේෂ් රණසිංහ මහත්මයා. ඉන්පස්සේ මට ඕන වෙලා තිබුණා Photo ටිකක්. මම දෙරණ මාධ්‍ය මා එක්ක හිතවත් වුණා මුලින්ම. ඒකේ උකුස්සා වැඩසටහනේ මාධ්‍යවේදී මහත්මයාට මම කිව්වා මට මෙන්න මේ Photo ටික එවන්න කියලා. එයා මට අවශ්‍ය කරන Photo ටිකක් එයා එව්වා. හොයලා බැලුවහම මේ අය මාත් එක්කත් මසුරාවලට හිටපු අය ඉන්නවා මේ බුද්ධි අංශයේ අපේ.

ප්‍ර : ඔබ වහන්සේ ඒ පින්තූර දැකලා තමයි ඒක තෝර ගත්තේ?

පි : තෝරා ගත්තේ. එතකොට හිටියේ තොප්පියක් දාලා, සුදු ෂර්ට් එකක් ඇඳලා, සරමක් ඇඳලා හිටියේ. එහෙම අය දැන් Uniform ඇඳපු අයත් ඉන්නවා මේකේ.

ප්‍ර : එතකොට ඔබ වහන්සේ ඒ පදනම මත තමයි කියන්නේ මේ බුද්ධි අංශවල ....?

පි : ඒ පදනම මත තමයි මේ කට්ටිය මේකේ හිටියා. මොකද එකක් තිබුණා කල්පිටියේ අපි දූපතක මසුරා එකක් තිබුණා. මම ඒකේ මල්වාන හසන් කියලා ගහලා ආවා. විශාල ගහක්. ඒකේ අත්තක් මේ මේ වගේ පළලයි අතු පොළොව වගේ ගිහිල්ලා තියෙන්නේ. ඒකේ මම නම කොටලා ආවා මල්වාන හසන් කියලා. ලංකාවේ ගිය ගොඩක් කට්ටියගේ නම් කොටලා එනවා, ගලක් අරගෙන අර අත්තේ කෙටුවහම මේක නම කොටනවා. මම නම කොටලා ආවා. ඒකේ මසුරා එකක් තිබුණා. ඒකේ හිටියා, එයාගේ මම නම හෙළි කරන්නම්. එයා හිටියේ එයා රථවාහන අංශයේ හිටපු, එයා නිකම් හරියට බීපු මිනිහෙක් වගේ තමයි ඉන්නේ. කළු හීන්දැරි එක්කෙනෙක්, නිලධාරියා. එයාගේ නම ලාෆිර්. ලාෆිර් හරි කාදර් හරි. රථ වාහන අංශයේ හිටපු උසස්ම නිලධාරියෙක් එයා.

ප්‍ර : තනතුර ඔබ වහන්සේ දන්නවද?

FAIR COMMENT
BY JEZEEM

පි : මම හිතන්නේ DIG මහත්මයෙක් වෙන්න ඕන. ඒ වගේ තත්ත්වයක කෙනෙක් වෙන්න ඕන.

ප්‍ර : ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙක්. SSP කෙනෙක්?

පි : ඔව්. ඒ වගේ කෙනෙක් තමයි. එයා අපිත් එක්ක, එයා කොහොමත් නිකම් මත්පැන් බීපු කෙනෙක් වගේ නිකම් මෙහෙම මැලවිලා වගේ ඉන්නේ. එයා **2010, 11** වගේ තමයි එයා ඉඟුරුකඩේ හන්දියෙන් තමයි එයාගේ වාහනයෙන් අපි ගියේ. අපි මරකස් එකට ගිහිල්ලා, මරකස් එකෙන් කල්පිටි යනකොට තමයි ඉඟුරුකඩේ හන්දිය තියෙන්නේ ඔය කැළණි බලාගාරයට මෙහායින් අර ටයර් කඩ එහෙම තියෙන්නේ. ඒ හරියෙන් තමයි වාහනයට අපේ Change වුණේ.

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : තවමත් ඒ නිලධාරියා ඉන්නවාද?

පි : නැහැ. Retired.

ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා විසින් :

ප්‍ර : ඔබ ඔය ලාෆීර් නිලධාරීවරයාගේ නම සඳහන් කෙරුවේ ඔබ මල්වානේ අර රැස්වීමට සහභාගී වෙලා, ගහේ මල්වානේ හසන් කියලා කොටලා ආවට පස්සේ ඔහු ඒක දැකලා ඔබට කථා කෙරුවා කියලානේ ඔබ දැන් කිව්වේ?

පි : නැහැ නැහැ. අපි ගියා මසූරා එකට. මේ දූපතේ තමයි මේ මසූරා එක තිබුණේ. ඒක තට්ටු දෙකට ගහපු පල්ලියක උඩ තට්ටුවේ වැඩ ඉවර නැහැ. මේක කැළේ වගේ තියෙන්නේ මේ පල්ලිය. ලෑලිවලින්, සිමෙන්තිවලින් දෙකෙන්ම ගහලා තියෙනවා. හරිම නිකම් භයංකාර තැනක් වගේ මේ තැන. කිසිම මනුස්සයෙක් නැහැ. පවුල් **12** ක් වගේ තමයි මේ දූපත ඇතුළේ ඉන්නේ. පවුල් **12** ක් **15** ක් හිටියට පල්ලි දෙකක් මේකේ තියෙනවා.

<u>අතිරේක සොලිසිටර් ජනරාල්වරිය විසින්:</u>

ප්‍ර : ඒ දූපතට නමක් තියෙනවද අපේ හාමුදුරුවනේ?

පි : ඒ දූපත හොයා ගන්න පුළුවන් මට.

ප්‍ර : කල්පිටියේ?

පි : කල්පිටිය.

FAIR COMMENT BY JEZEEM

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ස්වාමීන් වහන්ස මසුර එකකට ඕනම මුස්ලිම් ජාතිකයෙකුට ආගමට යන්න පුළුවන් නේද?

පි : මසූරා අපේ මහත්මයා දෙක තුනක් තියෙනවා.

ප්‍ර : ලාෆිර්?

පි : ඔව්. මසූරා කියන්නේ දැන් මේ තබිලික් එකේ මසූරා කියන්නේ සම්පූර්ණම අන්තවාදී මසූරා. ඊට අමතරව සිකුරාදට තියෙනවා මෙහෙම. සිකුරාදට තියෙනවා පල්ලියේ ඒවත් වෙනම තියෙනවා. පල්ලියේ මුදල් සම්බන්ධව, අරවා මේවා, ඒවා අඩුපාඩු. ඒවා සාකච්ඡා කරන ඒවා වෙනම තියෙනවා. ඒක අපිට අදාළ නැහැ. ඒක පල්ලියේ Board Meeting එකක් තියෙනවා. ඒ පල්ලියේ Board එකේ තමයි ආගමික දේවල් කථා කරන්නේ. දැන් අමීර්ලා, අමීර්ෂාප්පලා ඒවට යන්නේ නැහැ. පල්ලියේ Board Meeting එකක් වෙනම ඉන්නවා. පල්ලියේ Board එකේ කට්ටිය තමයි ඒවා සාකච්ඡා කරන්නේ. ඒක මහ පල්ලියේ සිකුරාදට පස්සේ ඒගොල්ලෝ ඒ මහ පල්ලියේ කරන දේවල් ඒක. ඊට අමතරව මේ ජමාත් කියලා, සම්පූර්ණ ජමාත් සංවිධානය තමයි මර්කස් එකෙන් අපි එදා ගියේ. යනකොට තමයි ඒ නිලධාරී මහත්මයා ගොඩ වුණේ අපේ වාහනයට. අපි ඩොල්ෆින් එකක ගියේ. ඒකට ගොඩ වුණා. එයා කාර් එකක ඇවිල්ලා තමයි Change වුණේ මේකට. එයා Call කළා අපේ අමීර්ට. ඊට පස්සේ ඉඟුරුකඩේ හන්දියේදී තමයි වාහනයට ඉස්සර කරලා නතර කරලා අපේ වාහනයට නැග්ගා. එයාගේ වාහනය යැව්වා. අපි ඒ ගිහිල්ලා ඒ මසූරා එකට දවස් තුනක් අපි එහේ හිටියා. ඒ ඉන්න අතර තමයි අර නිදහස් ලැබිච්ච වෙලාවේ ඒ ගහේ අත්තක ගිහිල්ලා මම නම කොටලා ආවේ.

ප්‍ර : ගහේ අත්තක?

පි : ඔව්. ගහේ අත්තක.

ප්‍ර : කොහේද?

පි : ඒ කල්පිටිය දූපතේ.

ප්‍ර : තාමත් තියෙනවද ඒක?

පි : තාමත් ඒ දූපතත් තියෙනවා. ඒ ගහත් තියෙනවා. ලංකාවේ ගොඩාක් කට්ටියගේ නම් කොටලා තියෙනවා ඒකේ.

ප්‍ර : ඔබ වහන්සේගේ නමත් කොටලා තියෙනවද?

FAIR COMMENT
BY JEZEEM

පි : මම මල්වාන හසන් කියලා මගේ නම තිබුණේ. මල්වාන හසන් කියලා මමත් කොටලා ආවා ඒකේ.

ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා :

ප්‍ර : ඒ අවස්ථාවේදී ඒ නම කෙටීම සම්බන්ධයෙන් කවුරු හරි එපා කියලා කිව්වාද?

පි : නැහැ නැහැ. ඒකේ ගොඩක් කට්ටිය නම් කොටලා තියෙනවා.

ගරු අදිකාරී මහත්මිය :

ප්‍ර : ඒක මොන අවුරුද්දෙ ද ස්වාමීන් වහන්සේ වුණේ?

පි : මේක **2008** වගේ.

<u>අතිරේක සොලිසිටර් ජනරාල්වරිය විසින්:</u>

ප්‍ර : ඔබ වහන්සේ දැන් ඔය පල්ලිවලට ගිහිල්ලා පුජකයෙක් විදිහට කටයුතු කෙරුවයි කියලා කිව්වනේ දේශකයෙක් විදිහටත්, අමීර්වරයෙක් විදිහටත්?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ වහන්සේට කියන්න පුළුවන්ද ඔය යාඥා කරන අවස්ථාවල්වලදී,අපිට ඇහෙනවනේ ලවුඩ ස්පීකර්ස්වලින් ඒගොල්ලෝ යාඥා කරනවා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ යාඥා කරන විලාසය මගින් යම් පණිවිඩ දීමක් එහෙම සිදුවෙනවද ප්‍රජාවට?

පි : සිදු වෙනවා. දැන් මෙන්න මේ ආකාරයට මේකේ වෙන්නේ. යාඥාව වෙනයි. සලවත්බාංගෝ වෙනයි.

ප්‍ර : සලවත්බාංගෝ?

පි : ඔව්. සලවත් කියලා බාංගෝ කියනවා. බාංගෝවලින් මෙන්න මේ නිවේදනය කරන්නේ. ඕනම මොහොතක දැන් මාවනැල්ලේ පල්ලියට ගහපු වෙලාවේ තමයි මේ විදියට මම මේක හොයා ගත්තේ. බාංගෝ කියන ආකාර තුනක් තියෙනවා. දැන් අල්ලා හු අක්බාර් කියලා කෑ ගහන්නේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : බාංගෝ කියන්නේ කොයි වෙලාවටද?

පි : බාංගෝ කියන්නේ දැන් උදේ සුභෝවලට කියනවා. සුභෝවලට කියනවා. ලුහර්, අසර් මහරික්, මිසර් පස් විදිහටම කියනවා. සුභහෝවලට විශේෂ එකක් කියනවා. අස්සලාතු හයිරන් මිරන්නන්.

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ස්වාමීන් වහන්සේට ඒ කියන ක්‍රමයට කියන්න පුළුවන්ද?

පි : කියන්න පුළුවන්.

ප්‍ර : ඒ එක එක පියවරෙන් පියවරට ?

පි : ඔව්. අල්ලා හු අක්බර් අල්ලා හු අක්බර්
(සාක්ෂිකරු තාලෙට කියයි)

ප්‍ර : ඒ මොකද්ද?

පි : ඒ කියන්නේ දෙවියන් අති ශ්‍රේෂ්ඨයි, දෙවියන් අති ශ්‍රේෂ්ඨයි කියලා. ඒක අර බාංගෝ කිය කියා මම ඒකයි අර මහත්මයා හෙව්වේ. මහත්මයා හිටියා නම් තේරුම කියලා දෙන්න.
අල්ලා හු අක්බර් අල්ලා හු අක්බර්.
අස්සදු අල්ලා ඊලාහ ඉල්ලල්ලා
අස්සදු අල්ලා ඉලාහ ඉල්ලල්ලා
අස්සදු අන්න මොහොම්මද රසෝ රුල්ලා
අස්සදු අන්න මොහොම්මද රසෝ රුල්ලා.
මෙතන තමයි වැදගත්කම තියෙන්නේ.
හයියලසලා, හයියලසලා,
ඒ කැඩිල්ල තියෙනවනේ.
හයියියලසලා, හයියියලසලා,
ඒක රහසක්.
විගහට පල්ලියට එන්න. බාංගෝ කියන වෙලාවට ගෙදර සද්ද කරන්න දෙන්නේ නැහැ. සතම් පෝඩු වා බාංගෝ සොල්ලුංග මොකද්ද කියන්නේ කියලා අහන්න.

<u>අතිරේක සොලිසිටර් ජනරාල්වරිය විසින්</u>:

ප්‍ර : පණිවිඩය මොකද්ද කියලා?

President's Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

පි : පණිවිඩය මොකද්ද කියලා. ඕනම ගෙදරක කෑ ගහන්න දෙන්නේ නැහැ ළමයින්ට. කෑ ගහන්න එපා බාංගෝ කියනවා කියලා අර ඒ කැඩිහිල්ල හයියියලල්පලා, හයියියලල්පලා එහෙම.

ප්‍ර : මොකද්ද ඒ පණිවිඩය අපේ හාමුදුරුවනේ?

පි : ඒ කියන්නේ පල්ලියට දැන් මහරිබ් එක කිව්වා නම් ඉසා එකට පල්ලියට කට්ටියට එන්න ඕන. දැන් ගෙදර මනුස්සයා ගියා නම් ගෙදර උන්දෑ දන්නවා අර පැත්තේ පල්ලියක් ඇහෙන්නේ නැහැ. එයාට Call එකක් එනවා විජහට එන්න පල්ලියට යන්න ඕන. එතකොට එයාට කියන්නේ නැහැ විස්තර. එයා දන්නවා බාංගෝ කියලා මොකක් හරි කියලා. ඉසා එකට පල්ලියට යන්න ඕන අනිවාර්යයෙන් එන්න.

ප්‍ර : ඒ කියන්නේ කැඳවීමක් කරනවා?

පි : කැඳවීමක් කරනවා. ඊළඟට ක්ෂණික ගෙන්න ගන්න. අල්ලාහු අක්බර් කියලා ඇදලනේ කියන්නේ. මේක අදින්නේ නැහැ. අල්ලාහු අක්බර් අල්ලාහු අක්බර් කියලා එක පාරට කෑගහලා කියන්නේ ඒක. අල්ලාහු අක්බාර් අල්ලාහු අක්බර් කියලා ක්ෂණිකව කියාගෙන යන්න ඕන. විනාඩි හතක් කියන එක විනාඩි තුනකට කියනවා. බලනවා ටක් ගාලා පල්ලියේ ඕන කරන සීමාවට ඇහෙන්න තමයි මේ බාංගෝ කියන්නේ. මුස්ලිම් ඉන්නවා නම් ඔක්කෝටම ඇහෙන්න ඕන.

<u>ගරු විනිසුරු රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : එතකොට මේ මුස්ලිම් කට්ටිය මොකද කරන්නේ?

පි : මුස්ලිම් කට්ටිය ටක් ගාලා පල්ලියට එනවා. එතකොට පල්ලියක අසරත්, සෑම පල්ලියකම අසරත් කෙනෙක්, අසරත් කියන්නේ මවුලවී. මවුලවීව Messenger වලින් හරි මොකක් හරි දෙයකින් මරකස් එකෙන් හරි උලමාවරු හරි කවුරු හරි මවුලවීව දැනුවත් කරලා තියෙන්නේ. පල්ලිය වැඳලා ඉවර වෙච්ච හැටියේ කියනවා දෙන්නෙක් දෙපැත්තේ දාන්න බලන්න. මවුලවී ටක් ගාලා නැගිටලා කියනවා මෙන්න මෙහෙම සිද්ධියක් මේකේ තියෙනවා කියලා. ඒ සිද්ධිය අවශ්‍ය දේ කියනවා. ටක් ගාලා මසුරා රෑට ලංකාවම මසුරා කරන්න. මොකක් හරි දැන් අපිට හදිස්සියේ ගහන්නත් ඒ විදිහට තමයි. හෙට පාන්දර ගහන්න ඕන නම් ඉසා එකේදී කියන්නේ ලැහැස්ති වෙයව් ගහන්න කියලා.

ප්‍ර : එහෙම කරපු අවස්ථා තියෙනවද?

Presidential Secretariat Copy
FAIR COMMENT
BY JEZEEM

පි : එහෙම තමයි අවසාන ඒගොල්ලන්ගේ මෙහෙයුම් ටික කරන්න යන්නේ. මම ඒකයි කිව්වේ, අවසාන ඒගොල්ලන්ගේ අවසානයක් තියෙනවනේ. ඒ ටික ගන්න තමයි සර් මම මෙච්චර කාලයක, නැත්නම් මම 2012 දී අයින් වෙන්න බැලුවා. පනින්න බැලුවේ. මම කල්පනා කලා මේකේ අවසාන අරමුණ මොකද්ද කියලා හොයාගෙන කරපු එකේ වැඩක් නැහැනේ. අර කොස් ගෙඩියක් පැහුනට පස්සේ කඩන්නේ නැතුව මගදී කැඩුවට පස්සේ කන්නත් නැහැ, ගහටත් නැහැ, බඩටත් නැති දෙයක් වගේ තමයි මම ඒ කාලේ ආවානම් වෙන්නේ. ඉදිරි අරමුණු හොයා ගන්න. ඉදිරි අරමුණ තමයි මම කිව්වේ මේක තනි කෙනෙකුට කියන්න, ඒක ජනාධිපතිතුමා දැනුවත් කළොත් තමයි හොඳ. ඒ වුනාට මම කොමිෂන් සභාවේ අපේ සර්ට ඒ ටික පුද්ගලිකව, අනිත් අය මොකුත් අමනාප හිතන්න එපා. මේක රහසක්. දෙන්නෙක් අතර රහසක් නැහැ. මම තනියම මේක ගෙනාපු නිසා තමයි මෙච්චර සාර්ථකත්වයක් තියෙන්නේ. මේකට තව කෙනෙක් හවුල් වුණා නම් බිරිඳවත් හවුල් කර ගත්තේ නැහැ. මම තනියෙම තමයි මේ දේවල් කළේ. ගොනා සහ පිදුරු සේ මම මේ ටික ඉතිං කළා.

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා :

ප්‍ර : ඔබ වහන්සේ මීට පෙර ඉස්මයිල් හාජ්ජියාර් ගැන කථා කරනකොට ප්‍රකාශ කෙරුවා ඉස්මයිල් හාජ්ජියාර් තමයි සහරාන්ට අවසාන කාලයේදී ආරක්ෂාව සැපයුවේ කියලා?

පි : ඔව්. 2014 වගේ.

ප්‍ර : ඒ කාලසීමාවයි, ඒ කරපු ක්‍රියාකාරකම් පිළිබඳව තව විස්තර කරන්න පුළුවන්ද ඔබ වහන්සේට?

පි : පුළුවන්. මම එයත් එක්ක තිබුණු ඇසුර. සම්බන්ධතා කියන්නේ මුලින්ම මම මේ සීතම්බි කියලා කෙනෙක්ගේ පොඩි මගේ රාජකාරියකට නිවසක් ගන්නවා. මම පොඩි ව්‍යාපාරයක් පටන් ගන්නවා හෝල් එකක වගේ ස්ටෝරුවක් වගේ. ඒකට ලයිට් දෙන්නේ එයාගේ මස්සිනා. සුක්රි හාජ්ජියාර්. එයා විශාල ප්‍රමාණයේ බිස්නස් කරන කෙනෙක්. එයා අයන් ගාණකින් රෙදි මදිනවා. අයන් හතකින් අටකින්. වොෂින් මැෂින් අරවා මේවා ගොඩාක් එයාගේ කරන්ට් එක වැය වෙනවා. මම එක ලයිට් එකයි දාලා තියෙන්නේ. හය දාහක ලයිට් බිල්. තුන්දාහක් මට ඉල්ලුවා. මම රණ්ඩු වෙලා මේ මනුස්සයට පහරක් ගහනවා. ගැහුවට පස්සේ මෙයා අර වයර් එක ගලවලා වීසි කරනවා. ඊට පස්සේ

FAIR COMMENT BY JEZEEM

තමයි ඉස්මයිල් හාජ්ජියාර් මට මුලින්ම හඳුන්වලා දෙන්නේ. ඒකට එක්කගෙන යන්නේ මාව හුසේන් කියලා. එයාට කදිරා කියලා තමයි කියන්නේ කට්ටිය. එයාත් මම හිටිපු ස්කීම් එකේම ගෙයක් එයාට දීලා තිබුණා නිලා ෆවුන්ඩේෂන් එකෙන් එයා එක්කගෙන ගිහිල්ලා කියනවා හයන් අපේ ජමාත් එකේ ගොඩක් වැඩ කරන කෙනෙක්. අමීර්ෂාප් කෙනෙක්. මෙයාට මේ ජෙනරේටරයක් ගෙනියන්න ආවේ කියලා. එතකොට මගෙන් අහනවා ගම කොහේද. මම කියනවා මම හංවැල්ල කියන්නේ නැහැ. මාපිටිගම අපේ සීයා කෙනෙක් ඉන්නවා. එයා හරි ප්‍රසිද්ධයි. කොරනේලිස් අප්පුහාමි කියලා. කොරනේලිස් අප්පුහාමි අපේ සීයා කෙනෙක් කියලා. ආ... ලොකු දෙයක් මෙහෙමයි. අමීර්ද මම කිව්වා අමීර්ෂාප් කියලා. ජෙනරේටරයක් ඕන එකක් තෝර ගන්න කියලා. මම රුපියල් පහලොස් දාහක් අතේ තිබුණා. මම කිව්වා මගේ අතේ පහලොස් දාහයි තියෙන්නේ. කීයක් වෙයිද දන්නේ නැහැ. සල්ලි එපා ඕක අරන් යන්න කිව්වා. ඒකේ ගාණ ගහලා තිබුණේ 22,000 ක්. ඒක විකුණුවේ 22,000 කට. මට ඒක නිකම් අරන් යන්න කිව්වා. එතනින් තමයි අපි දෙන්නගේ සම්බන්ධය ඇති වෙන්නේ. ඊට පස්සේ හුසේන්ගේ අතේ මාස තුනක් විතර ගිහිල්ලා මට රුපියල් 30,000/- ක් එවනවා මේක හයන්ට දෙන්න කිව්වා ඉස්මයිල් හාජ්ජියාර් කියලා.

ප්‍ර : ඇයි ඒ?

පි : ඒක තමයි. ඊට පස්සේ ඒ විදියට එව්වා. එවලා ඊට පස්සේ ආයේ රුපියල් 15,000/- ක් එයා අතේ එවනවා. එයාගේ අතේ තමයි මේ සල්ලි එව්වේ. ඊට පස්සේ ආයේ එයාගේ අතේ පණිවිඩයක් මට ඉස්මයිල් හාජ්ජියාර් සාප්පාට්ටුවකට එන්න කියලා කෑමකට. එතකොට එතන හිටියා පකිස්තාන් කට්ටියක්.

ප්‍ර : කොහේද හිටියේ?

පි : ඉස්මයිල් හජ්ජියාර්ගේ ගෙදර. නෝනලා ගිහිල්ලා මක්කම. නෝනලා මක්කම ගිහිල්ලා. ඒගොල්ලෝ නිතරම මක්කම යනවා. අවුරුද්දකට දෙපාරක් තුන්පාරක් නෝනලා මක්කම යනවා ඒගොල්ලෝ. මක්කම ගිහිල්ලා. ඊට පස්සේ ඒ කට්ටියත් එක්ක කෑමකට. එතන හිටියා අරාබි භාෂාවෙන් මම ගැන මෙයා අහවලා කියලා තේරුම් කරලා දෙන්න අරාබි දන්න පිරිමි ළමයෙක්. ඊට පස්සේ එහෙම කිව්වට පස්සේ මාව ඇවිල්ලා සලාම් දුන්නා, සලාම් දුන්නා කියන්නේ අස්සලාම් මලේකුම් එහෙම නෙමෙයි මුසාබා කරලා. මුසාබා කරලා කියන්නේ

HAIR COMMENT BY JEZEEM

මෙහෙම ඇඟ අල්ලගෙන දෙපැත්ත මෙව්වා කරගෙන සලාම් දෙන එක තමයි මුසාබා කියන්නේ. ඒක තමයි ඒ ඉස්ලාමයේ ඉස්තරම්ම විදිහට පිළිගැනීම. මුසාබා කරලා. අර අපි අවුරුද්දට ...,

ප්‍ර : රාමසාන්වලට එහෙම?

පි : ඔව්. රාමසාන්වලට අර පෙන්වන්නේ. ඒ විදිහට මුසාබා කරලා ලෙහෙසියකට සලාම් දෙන්නේ නැහැ. අස්සලාම් මලේකුම් කියලා අත දෙනවා විතරයි. ඒ විදිහට මුසාබා කරලා, ඉතිං මං ගැන මොනවා හරි ඒගොල්ලෝ කිව්වා. ඒ කියපු භාෂාවෙන්, මට භාෂාව තේරුණේ නැහැ ඒ වෙලාවේ. කිව්වේ, මේ රටේ මහා ජාතියේ පුද්ගලයෙක්. මේ ඉස්ලාමයට කැමති වෙලා, අපේ නායකත්වයක් දරලා ලොකු සේවයක් කරන කෙනෙක්. එදා මට රුපියල් **50,000/-** ක් ඒ කට්ටිය එකතු කරලා ඒගොල්ලන්ගේ සඳකාවක්, හසන් ගෙනල්ලා ඇන්ලොප් එකක දාලා දෙනවා මට. මම ඒක වියදම් කරන්නේ නැහැ. මගේ තාත්තගේ මළ ගෙදරට මම පෙට්ටියක් අරන් දෙන්නේ ඒ සල්ලිවලින්. මම ඒක ගත්තේ නැහැ. තාත්තා අසනීප වෙලා හිටියේ ඒ වෙලාවේ. තාත්තාගේ මළ ගෙදරට පෙට්ටියක් අරගන්න ඒක ගෙදරට දුන්නා අම්මාට ගන්න කියලා. ඉතිං එහෙම මට උදව් කළා. ඒ වගේ ගොඩාක් කෑම බීමවලට, ඒ රටවල්වලින් ආවහම ඉස්මයිල් හාජ්ජයාර් ඒ අතර මට ඉතිං ඒ අමතරවත් සල්ලි දීලා තියෙනවා. දැන් ඔය හාල් බෙදෙන දවසෙත් තුණ්ඩු ටික ගත්තෙ මම. කාඩ්බෝඩ් පෙට්ටියක් තිබුණා. තුණ්ඩු අරගෙන ඒකට තමයි මම දාන්නේ. එතනින් හාල් මිටිය දෙනවා, මම තුණ්ඩු අරගෙන දානවා.

ප්‍ර : අර බැසිල් රාජපක්ෂ මහත්මයාගෙයි, මහින්ද රාජපක්ෂ මහත්මයාගෙයි භාර්යාවන් ආවා වෙලාවේ?

පි : ඔව්. නිතරම එතනට යන්නේ නැහැ. අවශ්‍යතාවයක්, එයා කථා කළොත් මම යනවා. ඊට අමතරව මට හිතුනොත් මම ඔය රවුමක් දාලා යනවා. ළමයත් එක්ක ගියත්, ඒත් රුපියල් හාර පන්දාහක් ළමයාගේ සාක්කුවට දානවා මොනවා හරි ඉස්කෝලේ යන්න ගන්න කියලා. ළමයි තුන් දෙනා ගියොත් තුන් දෙන්නාටම, දෙන්නටම, ළමයි දෙන්නටම, මටත් සාක්කුවට සල්ලි දානවා එයා. කවදාකවත් ඉල්ලලා නැහැ ඒගොල්ලන්ගෙන්. ඒකයි කියන්නේ මම කාගෙන්වත්, අපේ අමීර්ලා කියන්නේ කාගෙන්වත් ඉල්ලන්නේ නැහැ. ඉස්ලාමියට ගොඩාක් අපේ

FAIR COMMENT — BY JEZEEM

සිංහල අය ගිහිල්ලා තියෙන්නේ උන්ගෙන් යැපෙන්න, උන්ගෙන් ජීවත් වෙන්න. ඒ මිනිස්සුන්ට කියන්නේ පිච්ච කාරම් මවුලා ඉස්ලාම් කියලා. ඒ කියන්නේ හිඟන මවුලා ඉස්ලාම් කියලා තමයි කියන්නේ. පිච්ච කාරම් වත්ත කියලා සිංහල මිනිස්සු ආගමට අරගෙන තියෙනවා සී.අයි.එස්. එකේ. ඒකට පිච්චකාරම් වත්ත කියන්නේ, හිඟන්නෝ ඉන්න වත්ත කියලා. අපේ සිංහල මිනිස්සුන්ට ඒ විදිහට කියනවා පාච්චල් කරනවා. පිච්චකාරම් වත්ත කියලා. කතෝලික, බෞද්ධ, හින්දු ඔක්කොම ඉන්නවා, කතෝලික පියතුමාලා හිටන් ඉන්නවා ආගමට ගිය අය, කතෝලික පියතුමෙකුත් ඉන්නවා.

ප්‍ර : මුස්ලිම් ආගමට ගිය?

පි : ඉස්ලාම් ආගමට ගිය.

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා :

ප්‍ර : ගරු ස්වාමීන් වහන්සේ නැවතත් ඔබ වහන්සේගේ අවධානය යොමු කරනවා ඉස්මයිල් හාජ්ජියාර් සහ සහරාන් අතර තියෙන සම්බන්ධතාවය?

පි : සහරාන් එතකොට ඔය වගේ ගොඩාක් ඇඟ කඳ තිබුණේ නැහැ සාමාන්‍ය පුද්ගලයෙක්. රැවුල වවලා තිබුණේ නැහැ. සිංහල විදිහට තමයි එයාගේ රූපය තිබුණේ. ඉස්මයිල් හාජ්ජියාර්ගේ Yard එකක් තිබුණා. මේක තිබුණේ වැලිවේරිය රතුපස්වලට කිට්ටුව. ඒකේ කාමරයක් තිබුණා නේවාසිකව ඉන්න ටිකක් හොඳ ඉස්තරම් වගේ කාමරයක්. මට එතනදී සහරාන්ව මුණ ගැහිලා තියෙනවා. එතකොට සහරාන් එක්ක හිටපු තව පුද්ගලයෙක් මේකේ ඉන්නවා.

<u>අතිරේක සොලිසිටර් ජනරාල්වරිය විසින්:</u>

ප්‍ර : මොන අවස්ථාවේදීද ඔබ වහන්සේට මුණ ගැහුණේ?

පි : මෙයා මුණ ගැහුණේ, මෙයා උලහිටිවලේ ආවා අපේ පල්ලියට මේ දෙන්නම. සහරානුයි මෙයයි ආවා. මෙයා මල්වානේ ඉස්මයිල් හාජ්ජියාර් එක්ක සම්බන්ධ කෙනෙක් අපේ පල්ලියට මේ සහරාන් එක්ක ආවා මයියවාඩි පල්ලියට.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

(සාක්ෂිකරු විසින් ෆෝන් එකක සටහන් වී ඇති ඡායාරූප කිහිපයක් පෙන්වා සිටී)

මැඩම් මේ මෙතන ඉන්න මම ලොකු කරලා දෙන්නම්. මේ ඉන්නේ මගේ අමීර් තමයි කිරිබත් කන්නේ. මේ ඉස්මයිල් හාජ්ජියාර්. මේ මට වඩා ඉහළට හිටිය අමීර්, මාත් එක්ක එකට වැඩ කරපු අමීර්.

ප්‍ර : මේ හකීම් මහත්මයා නෙවෙයිද?

පි : මේද.

ප්‍ර : ඔව්?

පි : නැහැ මේ ඉස්මායිල් හාජ්ජියාර්. මේ ගම්පහ දිස්ත්‍රික්කයේ ඉන්න, මේ තියෙන්නේ, එයාගේ ....,

ප්‍ර : මේ හකීම් මහත්මයා නෙවෙයිද?

පි : නැහැ. ඒ Shape එකම තමයි. මේ ටික මැඩම් කියවන්නකෝ.

(අතිරේක සොලිසිටර් ජනරාල්වරිය එහි සටහන් වී ඇති කොටසක් කියවා සිටී)

ප්‍ර : ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ජයග්‍රහණය හා නව අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ උපන්දිනය සමරමින් ගම්පහ දිස්ත්‍රික් මුස්ලිම් සම්මේලනයේ භාණ්ඩාගාරික අල්හාජ් එම්.එම්.ඒ. ඉස්මයිල් මහතා ඇතුළුව මල්වානේ උලහිටිවල මුස්ලිම් ජනතාව විසින් ඊයේ 24 වෙනිදා, ... ගියානේ අපේ හාමුදුරුවනේ.

පි : තවුහිද් එකේ යූ.ඩී. කියලා එක්කෙනෙක් ඉන්නවා. එයා මෙතන ඉන්නවා. මේ ඉන්නේ මෙන්න මෙයා තමයි සහරාන් එක්ක මේ තියෙන්නේ මෙන්න මෙතන මුහුණ. සහරාන් එක්කලා ළඟම හිටපු කෙනෙක් තමයි මෙයා. මෙයාගේ සහරාන්ගේ මුහුණම තමයි තියෙන්නේ.

ප්‍ර : තවම ඉන්නවා එයා නේද ස්වාමීන් වහන්ස?

පි : තවම එයා ඉන්නවා මල්වානේ.

ප්‍ර : එයාට පුහුණුවක් දීලා තියෙනවද දන්නේ නැහැ නේ ස්වාමීන් වහන්සේ?

පි : ඒකනම් කියන්න, ඒගොල්ලන් ගොඩාක් අර යතාර්ථය අවුස්සන්න අපට අපහසුයි ගන්න.

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා විසින්</u>:

ප්‍ර : එයාගේ නම මොකක්ද?

පි : ඔය ඉන්නේ එක්කෙනාගේ නම ජීබ්රි වගේ මෙයාගේ නම.

FAIR COMMENT
BY JEZEEM

(අතිරේක සොලිසිටර් ජනරාල්වරිය භාෂණ පරිවර්ථක ලවා එම පින්තූරය කොමිෂන් සභාවේ සාමාජික විනිසුරුවරුන්ට පෙන්වා සිටි)

ප්‍ර : සහරාන්ව තමන්ට හම්බ වෙලා තියෙනවද?

පි : ඔව්.

ප්‍ර : සහරාන්ගේ කටයුතු ගැන තමන් දන්නවද?

පි : සහරාන්ගේ ඒ ටික තමයි දන්නේ ඉස්මයිල් හාජ්ජියාර් එක්කලා ඇසුරු කලා. දවස් 2 ක් මම දැකලා තියෙනවා. මොකද මම හිටපු නිකායට අයත් එකක් නෙමෙයිනේ මේක තවුහිද් එකේනේ. තවුහිද් එකේ ඒවා අපිට ඇතින් තමා හම්බ වෙන්නේ. ඔය ඉස්මයිල් හාජ්ජියාර් ලඟින් ආශ්‍රය කලා. නවුෆර්නානා ආශ්‍රය කලා. අමීර් හාජ්ජියාර් ආශ්‍රය කලා. ඒගොල්ලන්ගෙන් තමයි මේ තවුහිද් එක ගැන දැන ගත්තේ.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා විසින්:</u>

ප්‍ර : ගරු ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ ඇම්බියුලන්ස් රථයක් ගැන ප්‍රකාශයක් කෙරුවා?

පි : ඔව්.

ප්‍ර : සහරානුයි, ඉස්මයිල් හාජ්ජියාර් සම්බන්ධයෙන්?

පි : නැහැ ඒ ඉස්මයිල් හාජ්ජියාර් නෙමෙයි. ඒක සහාබ් එකේ නායකයා මරදානේ ලපර් හාජ්ජියාර්. ලපර් හාජ්ජියාර්ගේ ඇම්බියුලන්ස් නිතරම ඉස්මයිල් හාජ්ජියාර් දිහාවට යන්නේ නැහැ. මේ සහරාන් හිටපු කාලේ ඉස්මයිල් හාජ්ජියාර්ලගේ දිහාට ලපර් හාජ්ජියාරුත් තවුහිද් එකේ ඉන්නේ. කොළඹ දිස්ත්‍රික්කයේ හිටපු නායකයා. දැනටත් ඉන්න නායකයා. ලපර් හාජ්ජියාර්. දැන් ඉන්නවද නැද්ද දන්නේ නැහැ ලපර් හාජ්ජියාර් සහාබ් එකේ. ඒත් 3,4 දෙනෙක් තමයි මල්වානේ ඉන්න තවුපික් එකට සම්බන්ධ ඔය කට්ටිය ඔක්කොම සහරාන් එක්කලා සම්බන්ධ කට්ටිය තමයි.

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා විසින්:</u>

ප්‍ර : නායකයා කිව්වේ මොකේ නායකයාද? තවුහිද් සංවිධානයේ නායකයාද?

පි : තවුපික් එකේ කොළඹ දිස්ත්‍රික් නායකයා තමයි ලපර් හාජ්ජියාර් කියන්නේ. එයාගේ තමයි සහාබ් කියන අන්තවාදී ආයතනය.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඒකේ සම්පූර්ණ කරන්නේ යුධ පුහුණුව හිටන් උඩ තට්ටුවේ පෙන්නනවා ලොකු තිර දාලා.

ප්‍ර : කොහේද?

පි : මරදානේ.

<u>අතිරේක සොලිසිටර් ජනරාල්වරිය විසින්:</u>

ප්‍ර : මරදානේ කොයි හරියේද අපේ හාමුදුරුවනේ?

පි : මරදානේ බෝගහ තියෙන්නේ ඇතුල් පැත්තට යන. මරදාන පාස් කරලා ඉස්සරහාට පුංචි බොරැල්ලේ. පුංචි බොරැල්ලේ තියෙන්නේ වම් අත පැත්තට බොරැල්ල පැත්තට වෙන්නට බෝගහ ගාවින් ඇතුල් පැත්තට යන්න Prision එක පැත්තට. එතනින් චුට්ට දුරක් ගිය හැටිය තට්ටු දෙකේ බිල්ඩිං එකේ 3 වන තට්ටුවේ ද කොහේද තියෙන්නේ. ඒකේ දේශන ශාලාවක් වගේ

ප්‍ර : අර ඉස්සර පාස්පෝට් ඔෆිස් එක නේද?

පි : ඔව්. හෝල් එකක් වගේ මේකේ තියෙන්නේ. මම විවාහ වෙලා හිටිය උපාසකම්මව තවුහිද් එකේ ලපර් හාජ්ජියාර්ලාත් එක්ක තමා තිබ්බේ. ඒගොල්ලන්ගේ Subject එකේ තිබ්බේ. එයාගෙන් ගන්න මේ අවස්ථාවේදි ගොඩක් දේවල් තියෙනවා. මාත් එක්ක ටිකක් අමනාප වෙලා තිබුනේ. දැන් ටිකක් හොඳයි. දැන් කතා කරනවා. ඉතින් එතන එයාගෙන් ගන්න තියෙනවා. එයා මම තවුහිද් එකේ තමයි යැව්වේ. අවුරුදු 16 ක් 17 ක් මේකේ ලේකම්කම්, සභාපතිකමුත් මේකේ දරලා තියෙනවා. එයාගේ පැත්ත මම තව ඇවිස්සුවේ නැහැ. ඒක එයාව අනන්‍යතාවයක් නොකර මම එයාගෙන් ගන්න ඕන පොලිසිය අරේ මෙහේ එතනට ගියොත් ලොකු සැකයක් හිතෙනවා. දරුවෝ දෙන්නෙක් ඉන්නවා. දරුවෝ විනාශ කරන්න ඉඩ තියෙනවා ඒගොල්ලෝ. මේ සංවිධානයේදි පළිගන්න ඉඩ තියෙනවා. ඒක නිසා එයාගෙන් මට උදව් ගන්නවා මිසක් මට එයාව ආරක්ෂක පැත්තට යොමු කරන්න අපහසුයි. එයාගෙන් ගන්න පුළුවන් හරිය මට එයාගෙන් ගන්න පුළුවන්. විශ්වාසයක් ඇතුව නෙමෙයි ලාභයක් ඇතුව නෙවෙයි රටට ප්‍රයෝජනයක් ඇතුව.

ගරු කොමිෂන් සභාව **2019.12.17** වන දින ප.ව. **2.00** ට රැස්වීමට නියමිතයි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2019.12.17 වේලාව :- ප.ව. 2.40

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. හිටපු ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය සමඟ රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතීඥ සංජීව දිසානායක මහතා පෙනී සිටී.
* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ කෞෂි දේවනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

හංවැල්ලේ සද්ධාශීල හිමියන්ගෙන් නැවත සාක්ෂි විමසීම සිදු කරයි.

(සාක්ෂිකරු ප්‍රතිඥා දෙයි)

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතීඥ අයේෂා ජිනසේන මෙනවිය :

ප්‍ර : ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ පසුගිය අවස්ථාවේදී මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා, ඔබ වහන්සේ මේ ලෝකයේ තිබෙන ෂියා සහ සුන්නි කියන ඉස්ලාම් ආගමේ නිකායන් දෙකෙන් සුන්නි නිකායේ තබ්ලික් ජමාද් අංශයට බැඳිලා, ඉස්ලාම් ආගම වැළඳගෙන ඒ සංවිධානයේ කටයුතු කරනු ලැබුවාය කියලා. ඒ වගේම ඒ තබ්ලික් ජමාද්හි ඔබ වහන්සේ අමීර්වරයෙක්ගේ තත්ත්වය දක්වා උසස් වූ තනතුරක් දරනු ලැබුවාය කියලත් සඳහන් කරනු ලැබුවා නේද?

පි : ඔව්.

ප්‍ර : එහෙම නම් මම ඔබ වහන්සේගෙන් තව වැඩිදුර පැහැදිලි කර ගැනීම සඳහා පසුගිය අවස්ථාවේදී අහන ලද ප්‍රශ්න කිහිපයක් නැවත යොමු කරන්නට කැමතියි. ඔබ වහන්සේ සඳහන් කෙරුවනේ ජමාද් පිළිබඳව. ජමාද් තුනක් තියෙනවා කියලා කිව්වා. එකක් දින තුනේ ජමාද් කිව්වා. දෙවෙනි එක දින හතළිහේ විල්ලා ජමාත් කිව්වා. එතකොට තුන්වෙනි එක දින එකසිය විස්සේ ෆයිසර් ජමාත් කියලා කිව්වා. ඔබ වහන්සේට පැහැදිලි කරන්නට පුළුවන්ද මේ ජමාත් පවත්වන අතරතුරදී අන්තවාදය පිළිබඳව දේශනා කිරීමක් සිදු කරනවද කියලා?

පි : දේශනාවක් සිදු කරනවා.

ප්‍ර : එය කෙරෙන්නේ කොහොමද කියලා පැහැදිලි කරන්නට පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට?

පි : ඒක දේශනාවකින් සඳහන් කරන්නද. තේරුම ඇතුව සඳහන් කරන්නද.

ප්‍ර : ස්වාමීන් වහන්ස තේරුම සහිතව පැහැදිලි කරනවා නම් වඩා සුදුසුයි?

පි : ඒක මේ ආකාරයට තමයි සිදු වෙන්නේ. මුස්ලිම්, කාෆීර් කියන දෙක ඒගොල්ලෝ තේරුම් කරලා දෙනවා. මුස්ලිම් සියලුම දේ දෙවියන් කෙරෙහි බැඳීම ඇතුව තමයි කරන්නේ. ඒගොල්ලෝ දරුවෙක් මේ ලෝකයට බිහි කරද්දිත් ඒ කියන දුවා සූරා කියලා තමයි ඒ දරුවා සාලිහාන් දරුවෙක් බවට පත් වෙනවා කියලා ඒගොල්ලෝ කියන්නේ. අනිත් දරුවෝ සාලිහාන් නොවේ.

ප්‍ර : අනිත් දරුවෝ කියලා කියන්නේ මුස්ලිම් නොවන දරුවෝ?

පි : ඒ කියන්නේ කාෆීර් දරුවෝ. මුස්ලිම් නොවන දරුවෝ සාලිහාන් දරුවෝ නෙමෙයි. ඔය දරුවන්ට කියන්නේ අර සැඩෝලා, සක්කිලි, රොඩී ළමයි කියන බවට තමයි පත් වෙන්නේ.

FAIR COMMENT — BY JEZEEM

ඒගොල්ලන්ගේ දරුවෝ, ඒගොල්ලෝ ඒ දැන් මේක මට වාචා සංවරෝ නෙමෙයි මා ස්වාමීන් වහන්සේ නමක්. ඒක කියන්න වෙනවා. ඒගොල්ලෝ සන්සන්දනයේ යෙදෙනකොට ස්ත්‍රියකට මෝචනය වෙනකොට, පිරිමියෙකුට ඒ සිදුවීම වෙනකොට ඒගොල්ලෝ අල්ලාහ්ට දුවාවක් ප්‍රාර්ථනාවක් කරලා තමයි ඒගොල්ලෝ දරුවෙක් මේ ලෝකයට බිහි කරන්නේ. ඒකට සාලිහාන් දරුවා කියලා කියන්නේ. ඒ වගේ සියලුම දේවල්වලට ඒගොල්ලන්ගේ දෙවියන්ට අවනත වෙලා. දැන් Toilet එකට යද්දිත් ඒගොල්ලෝ ....,

ප්‍ර : ඔබ වහන්සේ පහුගිය අවස්ථාවේදී ඒ ගැන පැහැදිලි කෙරුවා?

පි : ඔව් පැහැදිලි කළා. ඒ වගේ සියලුම දේවල්වලට දෙවියන්ට කියන දුවා ප්‍රාර්ථනා තිබුණා. පල්ලියට ගොඩ වෙනකොට, ගෙදරට ගොඩ වෙනකොට, නිදා ගන්නකොට සෑම දේකටම දෙවියන්ට කියලා.

ප්‍ර : එතකොට මා කිව්වෝතින් නිවැරදිද ස්වාමීන් වහන්ස, දැන් මුස්ලිම් නොවන අනෙක් සියලුම දෙනා කෆීර් කියලා ඔවුන් හඳුන්වනවා කියලා?

පි : ඔව්. කාෆීර් කියලා.

ප්‍ර : කාෆීර් කියලා හඳුන්වනවා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ කාෆීර්වරු මේ ලෝකයේ සිටිය යුතුද නැද්ද කියන එක පිළිබඳව කුරානයේ යමක් කියලා තියෙනවද කියන්න ඔබ වහන්සේ දන්නවාද?

පි : කුරාන් ආයත්වල මේක නැහැ. කුරාන් කුරාන් ආයත්, කුරාන් ආයත්වල නැහැ. මේක නබී හදීස්වලත් නැහැ. මේක යුදතාලීන් තාලීන් යුදතාලීන් එකට තමයි මේක අරන් තියෙන්නේ. ඔවුන්ගේ හුස්ම අපට වදින්නවත් තහනම්.

ප්‍ර : එතකොට ඔබ වහන්සේ දැන් තුනක් කිව්වනේ?

පි : ඔව්.

ප්‍ර : එකක් තමයි කුරාන් කුරාන් ආයත්, හදීස්?

පි : ඔව්. නබී හදීස්.

ප්‍ර : නබී හදීස් සහ යුදතාලීන්.

පි : ඔව් සහබා සහබා චරිත, නබී නබී චරිත තියෙනවා. මේක යුදතාලීන් එකට මේක අරන් තියෙන්නේ. රහසිගතව තියෙන .....

ප්‍ර : එතකොට අර පළමුවෙන්ම කියපු කුරාන් ආයත් කියන එකෙන් අදහස් කරන්නේ මොකද්ද?

FAIR COMMENT BY JEZEEM

පි : කුරානයේ තේරුම.

ප්‍ර : කුරානයේ තේරුම?

පි : ඔව්.

ප්‍ර : ඒකේ නැහැ මේ ....?

පි : ඒකේ අන්තවාදයක් පතුරුවන ....,

ප්‍ර : පිළිබඳව සඳහන් කරන්නේ නැහැ ඔබ වහන්සේ කියන්නේ?

පි : ඔව්. නබිවල හදීස්වල ටිකක් තියෙනවා. නබි කියන්නේ යුද, යුද කියන්නේ අන්තවාදය.

ප්‍ර : ඔබ වහන්සේ පසුගිය අවස්ථාවේ කිව්වා නබිවරු 1399 ක් අල්ලාහ් විසින් මවනු ලැබුවාය. ඒ ඔක්කොම නොමඟ ගිය නබිවරුය කියලා. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ, ඒ වගේම අපේ ගෞතම බුදු රජාණන් වහන්සේ, ඒ ආගමික ශාස්තෘන් ඉස්ලාම් ආගමේ හඳුන්වන ආකාරයට නොමඟ ගිය නබිවරුන්ය කියලා කිව්වා?

පි : ඔව්.

ප්‍ර : එතකොට මේ අවසාන නබිවරයා තමයි අල්ලාහ් අවශ්‍ය විදියට නිර්මාණය කරන ලද නබිවරයා විදියට පිළි ගන්නේ?

පි : ඔව්. අවසන් නබි නායකයා.

ප්‍ර : එතකොට ඔහු ප්‍රකාශ කරපු දේවල්ද මේ නබි හදීස් කියලා කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : නබි හදීස් කියන්නේ ඔහු විසින් ප්‍රකාශ කරන ලද දේවල්?

පි : නබි විසින් දෙවියන්ට අමතරව, නබි විසින් කරපු දේවල්. ඒවා සුන්නත් කියනවා, හදීස් කියනවා. ඒ දේවල් නබි ප්‍රකාශ කරපු දේවල් දෙවියන්ට අමතරව.

ප්‍ර : එතකොට අර යුදතාලීන්?

පි : යුදතාලීන් එක සම්පූර්ණම නබිගේ නිර්මාණයක්.

ප්‍ර : නබිගේ නිර්මාණයක් යුදතාලීන්. ඒ යුදතාලීන් කියන එකේ තේරුම මොකද්ද?

පි : නබි සහ මේකට ඉන්නවා නබිට උදව් කරපු කෙනෙක් ඉබ්‍රාහිම්.

ප්‍ර : ඉබ්‍රාහිම්?

පි : ඔව්.

ප්‍ර : ඒ ඉබ්‍රාහිම් කියන්නේ කවුද ස්වාමීන් වහන්ස? ඇයි ඔබ වහන්සේ කියන්නේ නබිට ඉබ්‍රාහිම් උදව් කරා කියලා?

පි : ඉබ්‍රාහිම් උදව් කළේ මේ ආකාරයට.

ප්‍ර : ඉබ්‍රාහිම් කියන්නේ කවුද කියලා පැහැදිලි කරලා, ස්වාමීන් වහන්ස ඒක කියන්න?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඉබ්‍රාහිම් කියන්නේ පෙළක් තැන්වල සඳහන් කරනවා ඔහු නබි කෙනෙක් කියලා. නබි කෙනෙක් නම් ඔහුට දුවා ප්‍රාර්ථනාවක්, සෑම කෙනෙක්ම කරන දුවා ප්‍රාර්ථනාවක් ඔහුට කරන්න බැහැ. මොකද දෙවියන්ට අවනත වූ කෙනා අපාගත වෙනවා. දැන් ගෞතම බුදු රජාණන් වහන්සේ අපාගත වුණා කියලා තියෙන්නේ.

ප්‍ර : දෙවියන්ට අවනත වූ කෙනා අපාගත වෙනවා?

පි : දෙවියන්ට අවනත නොවූ කෙනා.

ප්‍ර : නොවූ කෙනා අපාගත වෙනවා?

පි : අපාගත වෙනවා. එතකොට නබිවරු සියලුම දෙනා අල්ලාහ්ට අවනත වෙලා නැහැ. මහම්මන් නබි සල්ලල්ලාහු, අලේවසන් තමයි අවනත වෙච්ච කෙනා. නබි නායකතුමා. අනෙක් අය නොමඟ ගිය අය. එතකොට දැන් ඔහුට ස්වර්ගය දෙන්න කියලා මෙන්න මේ ආකාරයට, මම ඒක සඳහන් කරන්නද.

ප්‍ර : එහෙමයි?

පි : ඒකේ ඉස්සරලම තබ්බීර් බැඳලා. ඒ සූරා කියලා ඒ රකාත් අඳලා ඔක්කොම කරලා අවසානයේදී ....,

ප්‍ර : ස්වාමීන් වහන්ස, දැන් ඔබ වහන්සේ කියන ඉරියව් සහ ඒ කරන චාරිත්‍ර පිළිබඳව මේ ගරු කොමිෂන් සභාවට ටිකක් පැහැදිලි කෙරුවෝනීන් තේරුම් ගන්න පහසුයි?

පි : දැන් ඉස්සරලාම පල්ලියේ බාංගෝ කියනවා. ඒ ගියාට පස්සේ ....,

ප්‍ර : බාංගෝ කියන්නේ අපේ භාමුදුරුවනේ?

පි : බාංගෝ කියන්නේ අල්ලාහු හොබ්බරල්ලා හොබ්බරල්ලා කියලා පල්ලියේ කෑ ගහන්නේ. ඒක සම්පූර්ණයෙන්ම කියන්න ඕන නම් කියන්නම්. ඊට පස්සේ තමන්ගේ වෙලාවක් තියෙනවා, Time table එකක් තියෙනවා. දැන් 4.32 ට වන්දන්න. 4.32 ට මවුලවී පොඩි කථාවක් කරනවා පල්ලියේ. මෙහෙම කියලා පොඩි සද්දයක් දැම්මහම ළඟ ඉන්න කෙනා ගිහිල්ලා ඉකාමත් කියන්න ඕන. ඉකාමත් කියනවා කියන්නේ මේ කට්ටියට එන්න අරාධනා, අල්ලාහු අක්බර් ඒක ඇදලා කියන්න, හයියෙන් කියන්න. (අරාබි භාෂාවෙන් ප්‍රකාශ කර සිටී.)

ප්‍ර : දැන් ඒ ප්‍රකාශය කරනවා?

පි : ඔව්. කතිමාන්සලා කියන්නේ එන්න කියලා කියනවා වන්දනය කරන්න. එතකොට වන්දනය කරනවා. වන්දනය කරලා, ඒ වන්දනය සම්පූර්ණයෙන්ම ඉවර කරලා අවසානයට සලාම් දෙන තැනක් තියෙනවා. සලාම් දෙන්න ඉස්සරලා ....,

ප්‍ර : සලාම් දෙනවා කියන්නේ අපේ භාමුදුරුවනේ?

පි : සලාම් දෙනවා කියන්නේ ඒ සලාතය අවසන් කරනවා.

President's Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සලාතය, මේ වැදීම අවසන් කරනවා?

පි : ඒ අවසන් කරන්න ඉස්සරලා මෙන්න මේ විදියට ඒගොල්ලෝ දුවා ප්‍රාර්ථනාවක් කරනවා ඉඳගෙන, අර එරමිණියා ගොතාගෙන ඉඳගෙන මේ ඇඟිල්ල මේ විදිහට තියාගෙන ....,

ප්‍ර : ඒ කියන්නේ මහපට ඇඟිල්ලද?

පි : දබර ඇඟිල්ල. දබර ඇඟිල්ල තියාගෙන තවුහිද් කට්ටිය මෙහෙම මෙහෙම කර කර කියන්නේ. මේක මම දැන් කියන්නම්. (දබර ඇඟිල්ල කරකවමින් නිරූපණය කරයි) ඇඟිල්ල හොලව හොලව කරන එක තවුහිද් සියාම් මුස්ලිම්, සුන්නි මුස්ලිම් හොයා ගන්නේ මේකෙන්. මේ සුන්නි මුස්ලිම් මේක කරන්නේ නැහැ සියාම් මුස්ලිම්. සුන්නි මුස්ලිම් මෙහෙම කරලා නමන තැනක් තියෙනවා. මම දැන් ඒක කියලා පෙන්වන්නම්. (අරාබි භාෂාවෙන් ප්‍රකාශ කර සිටී.) ඒ ටිකේ අන්තවාදයක් නැහැ. දැන් මෙතන තියෙනවා අන්තවාදයක්.

ප්‍ර : දැන් ඔබ වහන්සේ ඔය දැන් ප්‍රකාශ කෙරුවේ ස්වාමීන් වහන්ස අර කරන දේශනාවක්.

පි : දේශන. ඒක දුවා ප්‍රාර්ථනාවක්.

ප්‍ර : ඒ දුවා ප්‍රාර්ථනාවක්.

පි : ඔව්. එතකොට ඉබ්‍රාහිම් කියන්නේ වසර 17 ක් දරුවෝ නැතුව ඉඳලා දරුවෙක් ලැබෙනවා. අල්ලාහ් කිව්වා කියලා ඒ දරුවාගේ බෙල්ල කපන්න එයා ඉදිරිපත් වෙනවා. එනම් මට මගේ දරුවාගේ බෙල්ල කපන්න පුළුවන් නම් නුඹලාට කාෆිර්ලාගේ බෙල්ල කපන්න බැරි ඇයි කියන එක යුදතාලීන් එකට ඇතුල් කරලා තියෙනවා. ඒ දුවා එක මෙහෙමයි. මොහොම්මද් නබි සල්ලල්ලාහු අලීවා සල්ලන්තුමාටද එතුමාගේ පවුලේ අයටද ඉබ්‍රාහිම්ටද, ඉබ්‍රාහිම්ගේ පවුලේ අයටද ස්වර්ගය දෙනවා මෙන් මටද මගේ පවුලේ අයටද ස්වර්ගය ලබා දෙන්න. එතකොට ඉබ්‍රාහිම්ට, එතන අන්තවාදයක් තියෙනවා.

ප්‍ර : එහෙමයි?

පි : ඉබ්‍රාහිම් තමන්ගේ දරුවගේ බෙල්ල කපන්න, වසර 17 කට පස්සේ දරුවෙක් ලැබෙන්නේ විවාහ වෙලා. දෙවියන් කිව්වා කියලා දරුවාගේ බෙල්ල කපන්න ....,

ප්‍ර : ඒ කැපුවාම මැරෙනවද ස්වාමීන් වහන්ස?

පි : නැහැ. ඒක මුවහත නැති කඩුවක් අරන් බෙල්ලේ අතුල්ලනවා. ඊට පස්සේ ඔහු ඒ කඩුව මාරු කරනවා. මිනිසාට හොරෙන් මිනිසා ඉදිරිපිට කපන්නේ, මාරු කරලා, ඒ කඩුව අරගෙන කැපෙන්නේ නැහැ කියලා ගලක ගැහුවාම කඩුව, යකඩ කඩුව ගලේ කෑල්ලක්

FAIR COMMENT — BY JEZEEM

කඩලා ගිහිල්ලා, කඩලා ගියා කියලා තමයි මේගොල්ලෝ කරන්නේ. එතන තියෙන්නේ බොරු මෙව්වා එකක්. මිනිසා නිර්මාණය කරන්න හදපු දෙයක් තමයි මේ යුදතාලීන් එකට ඇතුල් වෙලා තියෙන්නේ. යුදතාලීන් එක මම සම්පූර්ණම, ඒකට කියන්නේ පාරාහනය කරනවා කියලා.

ප්‍ර : පාරාහනය කරනවා?

පි : ඔව්. අරාබියෙන් කියන්නේ දැන් කුරාන් පාරාහනය කරනවා. ඒ වගේ යුදතාලීන් එකත්, මේක අරාබියේ තියෙන්නේ. එක මම පාරාහනය කළා.

ප්‍ර : ඒ අනුව, ඒ දැනුම අනුව තමයි ඔබ වහන්සේ මේ ගරු කොමිෂන් සභාවට කරුණු කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ කියන්නේ මේ ඉබ්‍රාහිම් මේ ආකාරයට තමන්ගේ දරුවාගේ බෙල්ල කපන්නට කියලා අල්ලාහ් විසින් ඔහුට නියෝග කරාය කියලා ජනතාවට කියලා ජනතාවගෙන් ප්‍රශ්න කරනවා මට ඒ වගේ කියලා මම එහෙම කරනවා නම්, ඇයි නුඹලාට බැරි මේ කාෆීර් ...?

පි : කාෆීර්වරුව කපන්න කියලා.

ප්‍ර : කපන්න කියලා?

පි : ඔව්. ඒ විදියට තමයි මුලින්ම (අරාබි භාෂාවෙන් ප්‍රකාශ කර සිටී.) ඒ කියන අයව යුධ පුහුණුව සඳහා ඒගොල්ලන්ව ඊමානය සදා තියෙන්නේ කියන එක තමයි ඒකෙන්.

ප්‍ර : ඒ කපන්නේ ඇයි ස්වාමීන් වහන්ස ඒ කියන්නේ, මදකට තුවාල කරන්නද නැත්නම් ගැඹුරු වශයෙන් තුවාල කරන්නද එහෙම නැත්නම් ඒ අයව මරා දමන්නද?

පි : ඒ අය මරා දමන්න. ඒ කියන්නේ සියලුම කලීමා නොකිව්ව, ඒ කියන්නේ කලීමා තියෙනවා පහක්. එකක් ලාහි ලාහි ලල්ලා මොහොම්මද රසුල්ලා.

ප්‍ර : කලිමා කියන්නේ මොකද්ද ස්වාමීන් වහන්ස?

පි : කලීමා කියන්නේ ඉස්ලාමය මම අල්ලා පිළිගන්නවා. දැන් මෙහෙම කියන්නේ ලාහිලාහි ඉල්ලල්ලා මොහොම්මද රසුල්ලා (අරාබි භාෂාවෙන් ප්‍රකාශ කර සිටී.) දෙවියන් නොමැත එක් දෙවියෙක් ඇත.

ප්‍ර : පහක්ද හතරක්ද ස්වාමීන් වහන්ස?

පි : කලීමා පහක් තියෙනවා.

ප්‍ර : පහක්ද තියෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. මේ විදියට තියෙන්නේ. දෙවියන් නොමැත එක් දෙවියෙක් ඇත. මොහොම්මද් නබි සල්ලල්ලාහු අලේව සල්ලන්තුමා අවසාන වක්‍යවරයා බව මා පිළිපදිමි කියන එකට. දෙවන කලීමාව (අරාබි භාෂාවෙන් ප්‍රකාශ කර සිටී.) ඔය වගේ කලීමා ඉතිං ගොඩක් තියෙනවා. එක කලීමාවක් කිව්වත් එයා මුස්ලිම්. ලාහිලල්ලා මොහම්මද රසුල්ලා කිව්වහම ඔහු මුස්ලිම්. දැන් අර ජමාද් එකට ගන්නවා, ජමාද් එකේ ගස්ති යනකොට තුංමං හන්දියේ ...,

ප්‍ර : ගස්ති යනවා කියන්නේ?

පි : ගස්ති යනවා කියන්නේ මිනිසා දැනුවත් කරන්න, මිනිසා මේකට ගෙන්න ගන්න යන ගමන දැනුවත් කිරීමට. ඒ යනකොට තුංමං හන්දියකින් යනකොට මේ කලීමාව සිතින් කියවිය යුතුයි. දෙවන කලීමාව කියවිය යුතුයි. එතන ඒගොල්ලෝ කියනවා සෙයිතාන් වැඩ සිටිනවා කියලා. සෙයිතාන් ඉවත් කිරීමට කියන කලීමාව, දැන් ඔබතුමියලා දන්න සෙයිතාන් රජයෙන් කියලා සෙයිතාන් ඉවත් කරනවා. ඊට අමතරව ගස්ති යනවිට සෙයිතාන්ව ඉවත් කිරීමට මේ දෙවන කලීමාව කියවිය යුතුයි කියන එක තමයි ඒගොල්ලෝ කියන්නේ මේ කලීමාව කියවිය යුතුයි.

ප්‍ර : ස්වාමීන් වහන්ස, දැන් ඔය කලීමායි, ඉස්ලාමීය සිද්ධාන්තයි අතර යම් සම්බන්ධතාවයක් තියෙනවද නැත්නම් ඒවා එකට එකක් වෙනස් ඒවාද?

පි : ඒක ඇවිත් ඉස්ලාමයට මා අවනත වූ පරිදි තමයි මෙතන තියෙන්නේ. මා දෙවියන්ට අවනත වූවා. දෙවියන්ගේ වහලා වූවා.

ප්‍ර : ඒක තියෙන්නේ සිද්ධාන්තයේද නැත්නම් කලීමාවේද?

පි : කලීමාවේ. කලීමාවේ තියෙන්නේ දෙවියන්ගේ වහලා වූවා, නබීගේ උම්මත්තයා වූවා කියන එක.

ප්‍ර : එහෙමයි?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඉස්ලාමය සිද්ධාන්ත කියෙන්නේ මොනවද ඔබ වහන්සේ ඒ ගැන දන්නවාද?

පි : ඉස්ලාමය සිද්ධාන්තය.

ප්‍ර : මතක නම් විතරක් කියන්න ස්වාමීන් වහන්ස?

පි : ඉස්ලාමය සිද්ධාන්ත මෙන්න මේ ආකාරයට තියෙනවා. ඉස්ලාමය ගොඩ නැගුණු සිද්ධාන්ත තියෙනවා. ඒක කුළුණු පහකින් ගොඩ නැගුණා කියලා තමයි තියෙන්නේ.

ප්‍ර : ඒකේ තියෙනවද ස්වාමීන් වහන්ස දෙවියන් ප්‍රතික්ෂේප කරන උන් නැති කිරීමෙන් පසුව ඉස්ලාම් ආගමිකයින් සිය යුතුකම් වන

FAIR COMMENT BY JEZEEM

නෝම්බි, සකාත්, හජ් වැනි දෑ සිදු කළයුතු බවත්, ඉස්ලාමිකයින්ගේ මුල් කරුණ ජිහාදය බවත්?

පි : ඔව්. ජිහාදය අනිවාර්යයෙන්ම ....,

ප්‍ර : මොකද්ද ඒ ජිහාදය කියන්නේ?

පි : ජිහාදය කියන්නේ ඒක දැන් නවීන ක්‍රමයට එක එක විදියට ඒක හදාගෙන තියෙනවා නවීන ක්‍රමයට. ජිහාදය අපිට තේරුම් කරලා දීලා තියෙන්නේ, දැන් තබ්ලික් එකේ තේරුම් කරලා තියෙන්නේ ඉස්ලාමය යනු මුස්ලිම්වරුන්ට පමණක් නොවේ. ඉස්ලාමය මුස්ලිම්වරුන්ට පමණක් නොවේ. අන් ආගම්කරුවන් නොමරා ඉස්සරලාම තමන්ගේ ක්‍රියාවෙන් සහ ඔවුන්ට පෙන්වීමෙන් ඔවුන් ගත යුතුයි. නැති වුණොත් අවසානයේ තමයි මොවුන් ඝාතනය කළ යුත්තේ. ඒ කියන්නේ කියාමද්දිමයට පෙර මුළු ලෝකයම ඉස්ලාම් විය යුතුයි. මුළු ලෝකයම අන් ආගම් අයින් විය යුතුයි. කියාමද්දිමයට පෙර මුළු ලෝකයෙන්ම අල්ලාහු අක්බර් කියන හඬ මේ භූමිය, මේ භූමියට ඇසිය යුතුයි.

ප්‍ර : ඒ කියන්නේ මුළු ලෝකය ධාතුව පුරා?

පි : ධාතුව පුරාම. එතකොට මෙතනින් ඊළඟ තැනට ඇහෙනවට සීමාවට ඔබ පල්ලි සැකසිය යුතුයි. ලෝකයේ එකම වෙලාවට ජලයේ හැර ගොඩබිම්වල අල්ලාහු අක්බර් කියන හඬ තිබිය යුතුයි කියාමද්දමයට පෙර. ඒක මුස්ලිම්වරයාට නබි දුන්නු අවසානම දේ. මා ඒ අවසාන දේශනාවේදී දීපු දේ මා නුඹලාට මා අල්ලා කියපු සියලුම දේ පැවසුවා. නුඹලා මෙතනින් ඉදිරියට අරගෙන යා යුතුයි කියන එක තමයි එතන තියෙන්නේ.

ප්‍ර : ඒක තමයි ජිහාදය කියලා කියන්නේ?

පි : ජිහාදය ඒක තමයි තේරුම. ඕක වෙනස් වෙනස් ආකාරයට ජිහාදය පතුරවලා තියෙනවා.

ප්‍ර : එහෙමයි. දැන් ස්වාමීන් වහන්ස, ඔය ඔබ වහන්සේ කියන අන්තවාදී සංවිධානයේ පරමාර්ථ මොනවාද?

පි : ඒ පරමාර්ථයත් මා දැන් මුලින් සඳහන් කළ, මීට පෙර සඳහන් කළ ලෝකයම හලාල් මිසක් හරාම් අයින් කළ යුතුයි.

ප්‍ර : හලාල් කියන්නේ මොකද්ද? හරාම් කියන්නේ මොකද්ද?

පි : හලාල් කියන්නේ අල්ලාහ් අපට ඒ කියන්නේ මුස්ලිම් අයට සුදුසුයි කිව්ව දේ. හරාම් කියන්නේ එපා කිව්ව දේ. අපේ බුදු දහමේ තියෙනවා හොඳ තමයි බුදු රජාණන් වහන්සේ දේශනා කළේ. නරක තමයි එපා කිව්වේ. ඒ වගේ ඒගොල්ලෝ කියන්නේ හලාල් හරාම් කියන්නේ අල්ලාහ් හලාල් කරපු දේවල්. ඒගොල්ලෝ මාළුවා මේ ආකාරයට කියනවා. සෑම සත්වයෙක්ගේම පණ

LEAK COMMENT BY JEZEEM

තියෙන සතෙක්ගේම කලීමා කියලා කපන්න එපෑ. බිස්මිල්ලා අල්ලාහු ඔබ්බර් කියලා තමයි වතුර පොවලා කපන්න ඕන. සතා පරීක්ෂණය කරන්න ඕන. දැන් හරකෙක් නම් කුර ලෙඩ තියෙනවද, හංවඩු ගහපු බැහැ, නහය විදපු සතෙක් බැහැ. ඒවා තියෙනවා. කුරාන් ආයත්වල තියෙනවා. ඒවා කුරාන් ආයත්වල තියෙන ඒවා. සතෙක්ගේ හංවඩු ගහන්න බැහැ, කුර කැඩෙන්න බැහැ, අන් කැඩෙන්න බැහැ, කං කපලා තියෙන්න බැහැ ඒ වගේ නීති තියෙනවා. ඒවා කෙරෙන්නේ හජ්ජීවලට කපන සත්තුන්ගේ විතරයි. මස් කඩවල කපන සත්තු නොයෙක් නරක සත්තු කපනවා ඒගොල්ලෝ කුරුබාන්.

ප : එතකොට ස්වාමීන් වහන්ස කුරුබාන් කටයුතු සඳහා සතුන් මිලදී ගන්නකොට පිළිපදින්න ඕන කරුණු එහෙම යමක් තියෙනවද?

පි : ඒ ගැන නම් දැනුමක් නැහැ.

ප : ඔබ වහන්සේ දන්නේ නැහැ?

පි : නැහැ.

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප : ඔබ වහන්සේ පසුගිය අවස්ථාවේදී මේ ගරු කොමිෂන් සභාවේ සාක්ෂි දෙන ගමන් සඳහන් කෙරුවා, ඉතාම කුඩා අවදියේදී ඔබ වහන්සේගේ අවධානය යොමු වුණා කියලා හැකි හැම අවස්ථාවකදීම මේ ලංකාවේ ඉඩම් මිලදී ගැනීමට කටයුතු කිරීමට උපදෙස් දුන්නාය, දීලා තියෙනවාය කියලා මේ මුස්ලිම් ජනතාවට ඉඩම් ගන්න නේ?

පි : ඔව්.

ප : ඒ කරලා ඒවා අත්පත් කර ගන්න. එතකොට ස්වාමීන් වහන්ස ඔබ වහන්සේට මතකයිද ඔබ වහන්සේ යම් අවස්ථාවකදී ඉන්දියාවට වැඩියා පැවිදි වීමෙන් පසුව?

පි : ඔව්.

ප : 2019 මුල තමයි ඔබ වහන්සේ නැවත ලංකාවට පැමිණියේ?

පි : ඔව්.

ප : එතකොට ඔබ වහන්සේ ඉන්දියාවට වැඩියේ කවදද?

පි : මම 2018 දෙසැම්බර් 19 හරි 18 වගේ හරි තමයි වැඩියේ.

ප : වැඩියේ?

පි : ඔව්.

ප : ඒ මොකටද ස්වාමීන් වහන්ස වැඩියේ?

පි : අපේ ස්වාමීන් වහන්සේලා හතර නමක් වැඩියේ භාවනාවකට.

ප : භාවනාවකට?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : ඔබ වහන්සේලා හිමාලයටද වැඩියේ?

පි : ඔව්. රිෂිකේසි කියන්නේ හිමාලය පාමුලට.

ප්‍ර : රිෂිකේසි වලට?

පි : රිෂිකේසි වලට.

ප්‍ර : රිෂිකේසි කියන්නේ හිමාලය පාමුලද?

පි : හිමාලය පාමුල. රිෂිකේසිවලට ටිකක් එහා යන්න ඕන. රිෂිකේසි තමයි ...,

ප්‍ර : රිෂිකේසිවල තමයි ඔබ වහන්සේලා හිටියේ?

පි : අපි ඒ සීමාවට ගියා. ඒ හරියට කියන්නේ රිෂිකේසි කියලා තමයි.

ප්‍ර : හොඳයි. ඔබ වහන්සේලා එහේ කවදා වෙනකම් භාවනා කරාද?

පි : අපි දවස් දාහතක් විතර වගේ භාවනා කළා.

ප්‍ර : නැවත ලංකාවට පෙරළා වැඩියේ එතකොට කොයි කාලේද?

පි : ජනවාරී 09 වගේ තමයි මතක.

ප්‍ර : කොහාට වැඩලද වැඩියේ?

පි : අපි දිල්ලියේ ඉඳලා කෝච්චියේ වැඩියා චෙන්නායිවලට.

ප්‍ර : චෙන්නායිවලට?

පි : ඔව්.

ප්‍ර : චෙන්නායිවල ඔබ වහන්සේලා කොහෙද නැවතිලා හිටියේ?

පි : චෙන්නායිවල මාෂා හොටෙල් එකේ.

ප්‍ර : මාෂා හෝටලයේ හිටියා?

පි : ඔව්.

ප්‍ර : ඒ ඉන්නකොට ඔබ වහන්සේලා ඒ හෝටලයෙන් එළියට ඇවිල්ලා අහළ පහළ සක්මන් කෙරුවද නැත්නම් කඩ සාප්පුවලට ගියාද?

පි : මම අපේ පොඩි ස්වාමීන් වහන්සේලාට කවකටු පෙට්ටි, දහම් පාසල් ළමයින්ට ටොෆි මම එපමණයි අරගෙන ආවේ. පොඩි හෙලිකොප්ටර් දෙකක් පොඩි දෙන්නට නායක හාමුදුරුවන්ට හොරෙන් ගේන්න කිව්වා රිමෝට් දෙකක්. ඒවා හොයන්න මම ඇවිද්දා.

ප්‍ර : පොඩි ස්වාමීන් වහන්සේලාට?

පි : ඔව්. පොඩි ස්වාමීන් වහන්සේලා කියන්නේ අවුරුදු 7 යි, 15 යි වගේ දෙන්නෙක් ඉන්නේ. ඒ දෙන්නට ඒ දෙක මම ගේන්න ඇවිද්දා. ඒ වෙලාවේ තමයි මට මේ පුද්ගලයා ....,

ප්‍ර : මොකද වුණේ ස්වාමීන් වහන්සේ ඒ ඇවිදින අවස්ථාවේදී?

පි : ගොඩක් පුද්ගලයෝ නායක හාමුදුරුවෝ මට උපදෙස් දුන්නා. ඔබ වහන්සේට දැනුම තියෙනවා, ඉන්දියාවේ නඩ තියෙනවා, නඩ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගොඩක් ඉන්නවා එන්න බලාගෙන ඉන්දියාවේ. ඉතිං ඔබ වහන්සේට පුළුවන් මේ නඩ අරගෙන එන්න. ටිකක් ඇවිදින්න කියලා.

ප්‍ර : උපදෙස් ලැබුණා?

පි : ඔව්. දිනත් තියෙන නිසා. ඊට පස්සේ මම ඉතිං හැමතැනම ඇවිද්දා. ඒ ඇවිදිනකොට මුස්ලිම් අය හම්බ වුණහම ලංකාවේ අයද හොයා ගන්න, මම බුද්ධි අංශයේ හිටියේ නැහැ. ඒ වුණාට බුද්ධි අංශයේ කට්ටිය ඉන්නවා, බුද්ධි අංශයේ කට්ටිය කරන නම දන්නවා මම සහභාගී වෙලා ....,

ප්‍ර : නම දන්නවා කියන්නේ?

පි : ඒ කියන්නේ බුද්ධි අංශයේ කට්ටිය කරන ක්‍රියා ටික දන්නවා. එතකොට අම්මා, මාමී ඒ වගේ තමයි.

ප්‍ර : ඒ මොනවද ස්වාමීන් වහන්ස අම්මා, මාමී කියලා සඳහන් කරන්නේ?

පි : ඒ කියන්නේ ඉස්ලාම් තබ්ලික් ජමාද්හි ඉන්න ඒක වෙනම අපිට ඒවට සහභාගී වෙන්න හම්බ වුණේ නැහැ. මල්වානෙත් ටිකක් ඉන්නවා බුද්ධි අංශ. බුද්ධි අංශ අයව තමන්ගේ ගමේ අයව තමන් හඳුන්වලා දෙන්නේ නැහැ. එයා බුද්ධි අංශයේ කියලා සංවිධානයේ නායකයෝ හඳුන්වලා දෙන්නේ නැහැ අපිට. අපිට පිට අය හඳුනාගන්න පුළුවන්. ඕනම පිට කෙනෙක් හඳුනාගන්න විදිහ තමයි ඒ දෙක. එතකොට අංක දීලා තියෙනවා. අංක 9, 3, 11 ඒ වගේ අංක දීලා තියෙනවා.

ප්‍ර : ඒ හඳුනා ගැනීමේ කේත?

පි : ඔව් කේත. ඊට පස්සේ කථා කර ගත්තැහැකි. ඉතිං මම එහාට යනකොට ....,

ප්‍ර : ස්වාමීන් වහන්ස මේ මදෙහි කියන වචනය ඒ කේතවලට අයිති වෙනවද?

පි : ඒක කේතවලට මදෙහි කියන වචනය අයිති වෙනවා. ඒක තබ්ලික් නෙමෙයි. ඒක තවුහිද් එකේ යන දෙයක්. ඒකේ තියෙනවා ගොඩාක්. ඒ පසුපස ගොඩක් අපි හමා ගියේ නැහැ. දැන් අර තබ්ලික් එකේ කෙනෙක් හඳුනා ගැනීමට තමයි අම්මා, මාමී. දැන් මම අම්මා කිව්වහම එයා මෙහෙම කරලා (අත්පුඩි ගසයි) ඔහොම කරලා ගහලා ගියා.

ප්‍ර : ඒ මොකද ස්වාමීන් වහන්සේ එහෙම අත්පුඩි ගසන්නේ?

පි : ඒ කියන්නේ හරි කියන එක. එයා සිග්නල් එකක් දෙන්නේ.

ප්‍ර : හඳුනා ගැනීමේ ප්‍රතිචාර දැක්වීමක්?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. ඊට පස්සේ Phone එකෙන් තමයි එයා නැවතිලාද කියලා බලන්නේ. යන ගමන් Phone එකෙන් බලනවා.

ප්‍ර : හැරිලා බලන්නේ නැහැ?

පි : නැහැ. හැරිලා බලන්නේ නැහැ. එයා නැවතිලාද කියලා Phone එක ඇල්ලුවාම එයා නැවතුනහම එයාට එන්න කියලා මෙහෙම කරනවා. එයා ඊට පස්සේ අපේ පස්සේ එනවා.

ප්‍ර : එහෙම තමයි කෙරෙන්නේ ඒක?

පි : ඔව්. ඊට පස්සේ ඇවිත් මොකද මම තව ස්වාමීන්, තනියෙම නෙමෙයි රෑ වැඩියේ. බදුල්ලේ ආරියවංශ ස්වාමීන් වහන්සේත් එක්කලා?

ප්‍ර : ඒ දවසේ වේලාව කීයට විතර ඇද්ද?

පි : එතකොට ඇති 2.30 ට විතර.

ප්‍ර : හැන්දෑවේ?

පි : ඔව්. දවල් දානය අරගෙන, අපිට රෑ 12කුත් ගාණට Flight එක තියෙන්නේ. ඒ වෙලාවේ තමයි මම එළියට බැස්සේ. පස්සේ මම අර ස්වාමීන් වහන්සේව හෝටලයට ගෙනල්ලා, එයාට යන්න කියලා පෙන්වලා, එතකොට මම අරයාට නවතින්න කිව්වා, හෝටලයේ ගේට් එක ගාව නතර වුණා. මේක මහා බෝධි සමාගමේ පන්සලට අල්ලපු හොටෙල් එක. පන්සලේ ඉඩ තිබුණේ නැහැ අපිට ඉන්න. ඉන් පස්සේ එයා එතන හිටියහම මම මෙයාව Lift එකට නග්ගලා ඒ හාමුදුරුවන්ව, එයා ටිකක් එහේ මෙහේ ඇවිදපු නැති කෙනෙක්.

ප්‍ර : ස්වාමීන් වහන්සේ?

පි : ඔව්. එයාව දාලා මම එනකොට අරයා ඉන්නවා. ඊට පස්සේ කථා කරා එයත් එක්කලා.

ප්‍ර : දැන් ඔබ වහන්සේ යම් පුද්ගලයෙක් ගැන කිව්වනේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ පුද්ගලයා ගැන ඔබ වහන්සේගේ හිතේ කොහොමද එක පාරට කල්පනාවක් ඇති වුණේ එයත් එක්ක කථා කරන්න ඕන නැත්නම් සම්බන්ධතාවයක් ඇති කර ගන්න ඕන. අපි නිකම් පිටරටදී මනුස්සයෙක් දැක්කට එහෙම කථා කරන්නේ නැහැනේ ස්වාමීන් වහන්ස?

පි : ඔව්. ඈත තියා දැක්කහම, එන කට්ටිය බලාගෙන ගියහම මෙයා ලංකාවේ කෙනෙක්ගේ හැඩ රුව තියෙනවා. තබ්ලික් කෙනෙක් කියලා හඳුනා ගැනීමේ හැකියාව මට තියෙනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ ඔබ වහන්සේ අර ඉස්ලාම් ආගම වැළඳගෙන, ඒ නිකායේ කටයුතු කිරීමේ අත්දැකීමක් ....?

පි : කටයුතු කරපු නිසා ඒක නිකම් අර පුසුබට හොයා ගන්න පුළුවන් වගේ ඒකට තියෙනවා පොඩි ඉවක් එතන. ඕනම කෙනෙක් ....,

ප්‍ර : ඒක ඔබ වහන්සේට තියෙනවා?

පි : ඔව්. මේ තබ්ලික්, මේ තවුහිත්, මේ තක් කියා ඕනම කෙනෙක් මට හඳුනා ගන්න පුළුවන් මුස්ලිම් කෙනෙක් දැක්කහම. ඒගොල්ලන්ගේ යන රටාවක් තියෙනවා. මුස්ලිම් තබ්ලික් එකේ වැඩිය දහලන්නේ නැහැ. හරි සීරුවෙන්, හරිම අමුතු විදිහකට ස්වාමීන් වහන්සේ කෙනෙකුට තියෙන බැල්ම තමයි තියෙන්නේ. විය ගහක දුර ප්‍රමාණය තමයි ඒගොල්ලෝ බලන්නේ. ඒ කියන්නේ කිසි බයක් හිතේ නැතිව යන විදිහට තමයි පෙන්නුම් කරන්නේ.

ප්‍ර : අනිත් පුද්ගලයාගේ හිතේ බයක් ඇති වෙන්නේ නැති විදිහට?

පි : නැහැ. තමන් කිසි බයක් නැතුව, තමන් අසරණ අහිංසක මිනිහෙක් විදිහට තමයි ඒ ප්‍රමාණයක් දුරට බලාගෙන යන්නේ. එතකොට කිසි කෙනෙක් සැක හිතන්නේ නැහැ. වටපිට බල බල යන්නේ හොරා කියලා කවුරුත් දන්නවා ඒගොල්ලෝ කියනවා. හොරා තමයි වටපිට බල බල යන්නේ කියලා. මමත් ඉතිං යන ගමන් චූට්ටක් හිමිහිට ඇස් උස්සලා බලනවා ඈත කවුද එන්නේ කියලා. ඒ මේ පුද්ගලයෙක් හඳුනා ගන්න. මොකද මට ලංකාවේදී කථා කරන්න බැහැ වීවරයක් දාගෙන. පිටරටදී කථා කරන්න පුළුවන්. ලංකාවේදී කථා කළොත් අහු වෙනවා. පිටරටක ගියහැකි වෙස් වළාගෙන පිටරටවලට යන අය විදියට. ඔය ස්වාමීන් වහන්සේලා ගොඩක් අය ඉන්නවා ඉස්ලාමයෙන් ශාසනයට ඇතුල් වෙලා. ස්වාමීන් වහන්සේලා ලෙස වෙස් වළාගත්ත අන්තවාදීන්.

ප්‍ර : ඒ කියන්නේ මුස්ලිම් ජාතියේ කට්ටිය.....?

පි : මුස්ලිම් අන්තවාදීන් ශාසනයට ඇතුල් වෙලා තියෙනවා, අපේ සම්බුද්ධ ශාසනය ඇතුළේ සියලුම රහස් ඒගොල්ලන්ට දෙනවා.

ප්‍ර : ඒගොල්ලෝ ශාසනයට ඇතුල් වෙලා?

පි : රාජ්‍ය බුද්ධි අංශයට ඇතුල් වෙලා ඉන්නවා, ශාසනයට ඇතුල් වෙලා ඉන්නවා, රාජ්‍ය ආයතනවලට ඇතුල් වෙලා ඉන්නවා.

ප්‍ර : දැන් මම ඔබ වහන්සේව ඉන්දියාවේ තැනට නැවත මතක් කළොත්, එතකොට ඔබ වහන්සේ කියනවා දැන් අර හැඩහුරුකමින් ඔබ වහන්සේට අවබෝධ වුණා කියලා මෙයා ලංකාවේ කෙනෙක් සහ තවුහිද් එක්කෙනෙක් කියලා ....?

FAIR COMMENT
BY JEZEEM

පි : නැහැ තබ්ලික්.

ප්‍ර : තබ්ලික් කියලා හඳුනා ගත්තා?

පි : ඔව්.

ප්‍ර : එතකොට තමයි ඔබ වහන්සේ මොකද කළේ?

පි : මම ඊට පස්සේ එයාව දාලා ආවට පස්සේ මගෙන් ඇහුවා මොකද ඔය කියලා?

ප්‍ර : නැහැ. ඔබ වහන්සේ යමක් කියලා නෙමෙයිද අවධානය යොමු කර ගත්තේ ඔහුගේ?

පි : ඒ විදිහට කථා කරලා තමයි එයාව ගෙන්න ගත්තා.

ප්‍ර : නැහැ. නිකම් අසුරු කරලද නැත්නම් මොනවා හරි වචනයක් කියලද?

පි : නැහැ. ඊට පස්සේ අංක සඳහන් කරා.

ප්‍ර : ඒක ගරු කොමිෂන් සභාවට කියන්න?

පි : ඊට පස්සේ මම තුන කිව්වහම එයා නවය කිව්වා. ඒ වගේ අංක අපේ එක එක අංක තියෙනවා. ඒ අංක ඕන එකක් භාවිතා කළහැකි අපට. ඒ විදිහට කිව්වහම දෙන්නා හඳුනා ගත්තා. එංග මහල්ලා කියලා ඊට පස්සේ කිව්වා.

ප්‍ර : ඔබ වහන්සේ අම්මා කියන වචනයක් පාවිච්චි කළාද?

පි : ඔව්. මුලින්ම අම්මා. මම මුලින් ඒක සඳහන් කළා. අම්මා කිව්වහම එයා මේ විදිහට (අතින් සංඥා කරයි) තට්ටු කළා. ඊට පස්සේ Number Three කිව්වහම Nine කිව්වා. ඒ විදිහට අපි එතන අපේ විශ්වාසය ගොඩාක් යන්නේ නැහැ. මේ තබ්ලික් ජමාද්වල ගොඩාක් යන්නේ නැහැ. එංග මහල්ලා කිව්වහම ඒක කවුරුත් දන්නේ නැහැ. එංග මහල්ලා කිව්වහම දැන් මයියවාඩි පල්ලිනම්, පල්ලා පල්ලි මහල්ලා කිව්වා නම් පල්ලා පල්ලි මහල්ලා. පෙරිය පල්ලි මහල්ලා ....,

ප්‍ර : එංග මහල්ලා පල්ලි කියන්නේ ඔබ මොන පල්ලියේද කියලා අහන්නේ?

පි : ඔව්. එංග පල්ලි, ඊට පස්සේ මම කිව්වා මම මයිලවාඩි .....,

ජ්ර : මයිලවාඩි පල්ලියේ කියන එක කිව්වා.

පි : මයිලවාඩි මහල්ලා, පල්ලියේ නෙමෙයි.

ප්‍ර : ඔව්. මහල්ලා?

පි : දැන් පල්ල පල්ලි මහල්ලා කියන්නේ පල්ලෙහා පල්ලියේ මහල්ලා එක කියලා. පෙරිය පල්ලි මහල්ලා, සින්න පල්ලි මහල්ලා ඒ වගේ එක එක තියෙනවා. එතකොට අපේ එංග

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මහල්ලා කිව්වහම අපි පිළිතුරු දුන්නහම එතනින් එහා අපේ විශ්වාසය ගොඩ නැගිලා තියෙනවා.

ප්‍ර : ඊට පස්සේ ඔබ වහන්සේ ගිහිල්ලා මොකද කළේ?

පි : මම ඊට පස්සේ මම එයාලා හඳුන්වලා දෙන්න, ඉස්ලාතික වන්දීකර මවුලා ඉස්ලාම් කියලා. ඉන් පස්සේ මම ....,

ප්‍ර : ඒ අහපු භාෂාව ගැන කියලා ස්වාමීන් වහන්ස සිංහලෙන් තේරුම කියන්න?

පි : මගෙන් එංග මහල්ලා කියලා ඇහුවහම මම මයියවාඩි මහල්ලා කියලා කිව්වා.

ප්‍ර : එහෙමයි?

පි : ඉන් පස්සේ මගෙන් ඇහුවා චීවරය දිහා බලලා මොකද කියලා.

ප්‍ර : කවුද ඇහුවේ මේ?

පි : ඒ මුසම්මිල් ඇහුවේ. එතකොට නම දන්නේ නැහැ.

ප්‍ර : කවුද මේ මුසම්මිල් කියන්නේ?

පි : මුසම්මිල් කියන්නේ මාත් එක්ක හම්බ වෙච්ච පුද්ගලයා.

ප්‍ර : එහෙයි.

පි : ඊට පස්සේ ....,

ප්‍ර : කොයි වෙලාවෙද ඔහු මුසම්මිල් කියලා ඔබ වහන්සේ දැන ගත්තේ? ඔහුගේ නම මුසම්මිල් කියලා කොයි වෙලාවෙද ඔබ වහන්සේ දැන ගත්තේ?

පි : අපි බීම එතන කඩයකට ගියා. ඒ කියන්නේ ඒ කඩේට ගියහම ඒ කඩේ මුදලාලි හොඳට අඳුරනවා. මම උදේත් ඒ කඩේට ගිහිල්ලා ආවේ. දෙළුම් ගාන අහලා රුපියල් අනූවයි කිව්වා දෙළුම්. ඊට පස්සේ හවසට ගන්න හිටියේ. එයාට සිංහල පුළුවන් හොඳට. හවසට ලොකු දෙළුම් එනවා කිව්වා. පොඩි දෙළුම් තිබුණේ. ඉන් පස්සේ ඒ කඩේට තමයි ගියේ මෙයා. වාංගෝ කියලා එක්කගෙන ගියා. ගිහිල්ලා අර මුදල් දැක්කහම අස්සලා මලේකුම් කිව්වා. ඊට පස්සේ දෙන්නා දෙමළෙනුත් කථා කරා. කථා කරනකොට කිව්වා ඉස්ලාතික මවුල ඉස්ලා එයා කියලා මාව, ඊට පස්සේ කිව්වා දැන් ඇවිල්ලා ගියේ කියලා එයා දෙමළෙන් කිව්වා. ඊට පස්සේ මම කිව්වා සිංහලෙන් පේසුංග කියලා. දෙමළ දන්නවා ....,

ප්‍ර : සිංහලෙන් කථා කරන්න කියලා?

පි : ඔව්. සිංහලෙන් කථා කරන්න කිව්වා. එයා දෙමළෙන් කථා කරනකොට. ඊට පස්සේ අරයා තේරුම් කරලා දුන්නා මෙයා මෙහෙමයි කියලා. ඊට පස්සේ ටොෆි බෝතල්ද, දෙළුම් කිලෝ පහක්, අවශ්‍ය කරන ගොඩාක් ජාති මම ගත්තා. කිසි දේකට සල්ලි ගත්තේ නැහැ. අපිට Cool Drinks දෙකක් අර ලොකු වීදුරු

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දෙකකට Cool Drinks ගෙනල්ලා දීලා, ඒවා ගේන්න ගියෙත් අපි දෙන්නා කඩේ තියලා. අරයා විස්තරය කිව්වා අපේ මහල්ලාගේ අමීර්තාජ් කෙනෙක්. විස්තරය කිව්වා. සිංහලෙන්ම කථා කළේ. මට කිව්වා උදේ ඇවිල්ලා කිව්වේ නැහැනේ කියලා. මම කිව්වා එහෙම කියන්න බැහැනේ. මම ඔයා හඳුනන්නේ නැහැනේ තවුහිද්ද, තබ්ලික්ද, සී.අයි.ඩී. ද කවුද කියන්න බැහැනේ.

ප : එතකොට අර කඩේ ඉන්න එක්කෙනාත් මුස්ලිම් එක්කෙනෙක්?

පි : එයාත් මුස්ලිම්. එයාත් තබ්ලික් ජමාද් ඉන්දියාවේ හැන්ඩල් කරන කෙනෙක්. එයත් අමීර් කෙනෙක්. ඉන්දියාවෙත් මේක තියෙනවා. එයත් අමීර්තාජ්.

ප : ඉන්දියාවෙත් තියෙනවා?

පි : ඔව්. ඊට පස්සේ සලාම් දෙන්න එළියේ බැහැනේ හාමුදුරු කෙනෙක්නේ. ඇතුළට ගිහිල්ලා තමයි අපි සලාම් දුන්නේ. මොකද මාත් හාමුදුරු කෙනෙක් කියලා ආයේ සලාම් දෙන්න වුණා මුසාබා කරලා. ඒ විදිහට මුසාබා කරලා නායකයෝ හම්බ වුණාම සලාම් දිය යුතුයි. ඉතිං කරුණු ටික එතනින් දැන ගත්තා.

ප : දැන් ඔබ වහන්සේට පොඩ්ඩක් බාධා කරනවා. දැන් ඔබ වහන්සේ ඉස්ලාම් ආගම ඇත ඇරලනේ?

පි : ඔව්.

ප : එතකොට ඇයි ඒ වගේ සලාම් දුන්නේ?

පි : ඒක ඉතිං මනුස්සයෙක්ගේ ....,

ප : චාරිත්‍රයක්?

පි : නැහැ. ඒක එතන එයාගේ ඒ ටික එතන මොකද්ද කියලා ඒකත් ආවට පස්සෙත් දැන ගැනීමක්නේ. මම අතහැරලා ආවට පස්සේ අමතර දැන ගැනීමක්. ඒක අපට වටිනවා. අපේ රටට වටිනවා. මොකද එතන අන්තවාදය හොයා ගන්නවා කියන්නේ අපි ඉන්දියාව දැනුවත් කර ගන්න පුළුවන්. අපිට මිත්‍ර කර ගන්න පුළුවන්. එහෙත් ඉන්නේ මනුස්සයොනේ. දැන් මුස්ලිම් බලාපොරොත්තුව සියලුම කාෆීර් කියන මිනිස්සු ඝාතනය කරන්න නම් ඒක වළකා ගැනීමට අපි හින්දු අයත්, ස්වාමීන් වහන්සේ කෙනෙක් වශයෙන් සියලු සත්වයෝ බෝධි සත්වයෝය. එහෙනම් ඒගොල්ලන් බේරා ගැනීම මා සතු වගකීමක්. ඒක නිසා මම ඒ ටික එතන හොයා ගත්තා.

ප : හොඳමයි. එතකොට ඔබ වහන්සේයි අර මුසම්මිලුයි අතර යම් සාකච්ඡාවක් වුණාද?

පි : ඔව්. සාකච්ඡාවක් වුණා. මම කිව්වා දැන්, මගෙන් ඇහුවා කවද්ද යන්නේ කියලා. මම කිව්වා තව ටික දවසක් ඉන්නවා. මගෙන්

FAIR COMMENT BY JEZEEM

ඇහුවා කොච්චර කල්ද, මම කිව්වා මාස තුනක් විතර වෙනවා කියලා. මොකද කියලා, මම කිව්වා උවමනාවකට ඇවිල්ලා තියෙන්නේ රාජකාරී වාගයකට. මම ඇහුවා ඔයා මොකද කියලා. එයා බඩු ඒ කියන්නේ සෙරෙප්පුවලට අවශ්‍ය Item එකක් කිව්වා. ඒවාට අවශ්‍ය බකල්ස් අරවා මේවා වගේ බඩු තමයි Toys බඩු. ඒවා තමයි ගෙනියන්න ඇවිල්ලා තිබුණේ.

ප්‍ර : එයා ලංකාවේ මොන පළාතේ කෙනෙක්ද ඔය මුසම්මිල්?

පි : එයා බේරුවල.

ප්‍ර : එයා ඔය විසිතුරු බඩු අලෙවි කිරීමක් එහෙම කරනවද?

පි : බඩු දැම්මා කිව්වා. Toys දැම්මා කිව්වා. එක එක Item වාගයක් එයා ඒ වෙලාවේ කියාගෙන ගියා. ඉන් පස්සේ මම ඇහුවා කවද්ද යන්නේ කියලා. දවස් දෙකක් විතර යනවා කිව්වා බඩු කෝච්චිය එන්න. බඩු කෝච්චිය වෙනයි. සෙනඟ Transport කරන කෝච්චිය වෙනයි එහේ. එතකල්ම එයා ඉන්නවා කිව්වා එහේ. මම ඇහුවා කොහේද කියලා. පල්ලිවල ඉන්නවා කිව්වා. පල්ලිවල තමයි මුස්ලිම් අය ඉන්නේ. හෝටල්වල වැඩිය ඉන්නේ නැහැ. හෝටල්වල ඉන්න අයත් ඉන්නවා. මාෂා හොටෙල් එකට අපි පාස්පෝර්ට් වීසා පෙන්වලා කාමර Book කරනකොට Cardවලින් ඇතුළට ගියා මුස්ලිම් අය.

ප්‍ර : Cardවලින් ඇතුළට ගියා කියන්නේ?

පි : ඒක අමුතුම Card එකක් ඒගොල්ලෝ ළඟ තිබුණා. ඒ Card එක දුන්නා. ඒගොල්ලෝ හෝටල් කාමරවලට ගියා. ඒ කට්ටියත් ටිකක් ඒ කියන්නේ මුස්ලිම් .....,

ප්‍ර : කාමරවලට දැන් ස්වාමීන් වහන්ස අර Card එක වගේ තියෙන යතුරු තියෙනවනේ?

පි : නැහැ. යතුරු ඒවා වල නැහැ. ඒවා සාමාන්‍යයෙන් ඒ වගේ සුපිරි නැහැ. මම ඔය ඒ හොටෙල් එකේ Lift එකේ ගිහිල්ලා හැම කාමර, හැමතැනම මම ඇවිදලා බලනවා ඕවෑ ගියහම. Check කළා. එහෙම නැහැ. අර අංගොඩ මානසික රෝහලට යන්න තියෙන්නේ Card එකක් ගහලා, Card එක ගහලා. ඉතිං ඒ වගේ ඒවා දැකලා තියෙනවා මම. එතකොට මේකේ එහෙම නැහැ. ඔක්කෝගෙම Key එක තියෙන්නේ. Number දාලා Key එක තියෙන්නේ. දොර කවුළු තියෙනවා. යතුරු කවුළු. ඒකෙන් හත් අට දෙනෙක්ම ආවා. ඒගොල්ලන්ට බිල් මොකුත්ම කැඩුවේ නැහැ. පොතක් දුන්නා අත්සන් කරලා තමයි ඒගොල්ලෝ ඇතුළට ගියේ. සේවකයොත් නෙමෙයි. සේවකයන්ට ඒකේ Kit එකක්

FAIR COMMENT BY JEZEEM

තියෙනවා. ඒගොල්ලෝ සේවයේ යෙදුණෙම නැහැ. සේවකයින්ගේ කාගේවත් රැවුල් වවලා නැහැ. Shave කරලා හෝටලයේ ඉන්න අයගේ ඉන්නේ. දැන් මේ ආවේ රැවුල වවපු අමීර්ලා, අමීර්තාජ්ලා ඒ වගේ නායකයෝ තමයි ආවේ. මොකද තොල්ලහු කරලා මේ නළල් ඔක්කොම කළු වෙනවා තියෙනවා බැජ් ඒගොල්ලන්ගේ.

ප්‍ර : ඒ කියන්නේ වඳිනකොට ....?

පි : තබ්ලික් තමයි මේ නළල තියලා, පොළොවේ තියලා තද කරලා (අරාබි භාෂාවෙන් ප්‍රකාශ කර සිටී.) කියලා මෙහෙම අත් දෙක තියලා නළල හිර කරගෙන ඉන්නවා. අල්ලා නුඹ වෙනුවෙන්ම මම කැප වෙන්නේ කියලා, ඒ කියන්නේ ඒකට ඇබ්බැහිම වෙනවා.

ප්‍ර : ඒ නිසා මේ නළල කළු වෙනවා?

පි : නළල කළු වෙනවා. ඒ කියන්නේ තද කරගෙන ඉන්නවා පොළොවට.

ප්‍ර : ස්වාමීන් වහන්ස අර මුසම්මිල් හම්බ වෙච්ච එක ....?

පි : ඉන් පස්සේ දෙන්නා ඉතිං කථා බහ කළා. ඊට පස්සේ මම ඇහුවා මොකුත් එහේ නැද්ද සිද්ධි කියලා.

ප්‍ර : ඒ කියන්නේ?

පි : ලංකාවේ.

ප්‍ර : ලංකාවේ?

පි : ලංකාවේ. තවුහිද්කාරයෝ ගහනවා කිව්වා. තවුහිද්කාරයෝ කියලා තමයි කියන්නේ. තබ්ලික් එක කියන්නේ තවුහිද්කාරයෝ. තවුහිද්කාරයෝ නම් ගහනවා. මේ පාස්කු ගහනවා. නත්තලටත් තව එකක තියෙනවා. මම ඇහුවා මොකෝ තවුහිද්කාරයෝ ගහන්නේ. මම කිව්වා එතකොට අපිට කේස්ද කියලා. එහෙම කිව්වා අර භාෂාවෙන්ම. ඒ කියන්නේ මෙතන ස්වාමීන් වහන්සේ ඒවා දාන්න බැහැ. ඒ අස්සේ මට පරණ Phone එකට Call එකකුත් එනවා. දැන් Call එක Answer කළේ නැහැ. මොකද අනිවාර්යයෙන්ම තෙරුවන් සරණයි කියලා ගන්න ඕන. නැත්නම් එහෙන් තෙරුවන් සරණයි කියනවා. මම බලලා කිව්වා මේ පිස්සෙක් Call කරනවා කියලා Phone එක Off කරලා තිබ්බා. ඊට පස්සේ තමයි Phone එක මතක් වුණේ. ඊට පස්සේ කිව්වා මෙහෙම ගහනවා කියලා. මම කිව්වා ඒගොල්ලෝ ගහන්නේ. එයා තමයි මට කිව්වේ ලෝකයට ලංකාවේ අන්තවාදය ප්‍රචාරය කරන්න. මම කිව්වා ඉතිං අපි ගහලනේ තියෙන්නේ ගිවිසුම්. තවුහිද්, තබ්ලික් ඔක්කොම....,

FAIR COMMENT BY JEZEEM

ප : කාත් එක්කද ගිවිසුම් ගහලා තියෙන්නේ. කවුරු කවුරුද ගිවිසුම් ගහලා තියෙන්නේ?

පි : 2014 තබ්ලික් එකයි, තක්කියා එකයි එකතු වෙලා ගිවිසුමක් ගහගත්තා. දෙගොල්ලෝ වෙන වෙනමනේ හිටියේ.

ප : ඒ කියන්නේ සුන්නි නිකාය?

පි : ඔව්. සුන්නි නිකායයි, සියා නිකායයි දෙගොල්ලෝ ගිවිසුමක් ගහගත්තා. ගහගෙන අන්තවාදය මේ රටේ තියෙනවා කියලා ලෝකයට පෙන්නුම් කරන්න ඕන. නැත්නම් මේක එක පාර විශාල ඝාතනයක් කළොත් ඒගොල්ලන්ට ප්‍රශ්නයක් ඇති වෙනවා. එතකොට දැන් ඒකනේ ඊට පස්සේ කිව්වේ, අපේ කුරාන්වලට, මා ගාව Video එකක් තියෙනවා. අපේ කුරාන්වලට අපහාස කිරීම, උන් අපට අපහාස කිරීම, පල්ලි කැඩීම, ගිනි තිබීම එහෙම කළොත් ඕගොල්ලන්ට විශාල ලෙස අපි හිතේ බයක් ඇති කරනවා. මුස්ලිම් කියන නම ඇසුණාම, මා ගාව Video එක තියෙනවා. මුස්ලිම් කියන නම ඇහුණත් ඕගොල්ලන්ට එතන මුත්‍රා පහළ වෙන තත්ත්වයට ඕගොල්ලන්ගේ හිත් තුළ අපි බියක් ඇති කරනවා කියලා මේක ප්‍රසිද්ධියේ මේ Video එක මේ පුද්ගලයා හෙළි කළා. මා ගාව ඒ Video එක තියෙනවා. මේක ජඹුරේවෙල චන්ද්‍රරතන හාමුදුරුවන්ටයි, ප්‍රසාද් කියන පුද්ගලයාටයි තමයි මේක warning එකක් දෙන්නේ.

ප : ඒක ඔබ වහන්සේට මේ වෙලාවේ තියෙනවද?

පි : තියෙනවා. ඉතිං මේක තමයි ලක්ෂ පනහ ඝාතනය කළොත් තමයි ....,

ප : නැහැ ස්වාමීන් වහන්ස ඒ Warning එකක් දෙන එකක්. ගිය පාර ස්වාමීන් වහන්ස අර ....?

****

ගරු සභාපතිතුමා :

ප : රැවුලක් තියෙන ...?

පි : ඔව් ඔව්. මේක එයා කියනවා මේක Warning Period එකක් ඕගොල්ලන්ට කියලා. Warning Period එකක් ....,

ප : මාසයක කාලයක්ද?

පි : ඔව්. මාසයක කාලයක්. දැන් ඒක අතනින් ඒක වෙනම බැලුවේ එතනින් බැලුවේ. මෙතනින් මේ ....., (ස්වාමීන් වහන්ස අත තිබූ ජංගම දුරකථනය ගරු කොමිෂන් සභාවට පෙන්වයි)

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒ ඔය කඩු ලක්ෂ විසි පහේ ප්‍රශ්නය තමයි ඔය පෙන්වන්නේ. ඔයා තමයි ආයුධ භාරව හිටිය පුද්ගලයා.

****

ප්‍ර : මොන ආයුධද ස්වාමීන් වහන්ස?

පි : කඩු භාරව හිටිය පුද්ගලයා මෙයා තමයි. ප්‍රවාහනය සඳහා මෙයත් එක්කෙනෙක් මීපේ යාසිම් හාජ්ජියාර්. මගේ පළවෙනි බොස් එයා. ගිහි කාලේ ඒ කියන්නේ ඉස්ලාමයට යන්න ඉස්සරලා හිටපු බොස්.

ප්‍ර : මෙයා නෙමෙයිනේ?

පි : නැහැ නැහැ. මෙයා එක්කෙනෙක්. අනිත් එක්කෙනා රථ වාහන සියලුම දේ යාසිම් හාජ්ජියාර්, සෙංකඩගල මෝටර්ස්, හයිලෙවල් ටයර් මාර්ට්. එයාගේ දැන් විශාල විශාල ලෙස ව්‍යාපාර තියෙනවා. ලොකු ව්‍යාපාරිකයෙක්. ඉස්සරලා ටයර් කඩෙයි, සෙංකඩගල මෝටර්ස් කියන පොඩි මෝටර්ස් එකයි තිබුණේ. Spare Parts බඩු කඩේ. Three Wheel Spare Parts බඩු. දැන් විශාල මහා පරිමාණයේ ව්‍යාපාරිකයෙක්. මෙයා බැඳලා ඉන්නේ අවිසාසාවේල්ලෙන්, කොටියාකුඹුරෙන් මෙයා විවාහ වෙලා ඉන්නේ විශාල ධනපතියෙක්ගේ දුවෙක්. කොටියාකුඹුරෙන් මෙයා විවාහ වෙලා ඉන්නේ. මෙයා ඉස්මයිල් හාජ්ජියාර්ගේ Sub කරන කෙනෙක්. ඉස්මයිල් හාජ්ජියාර්ගේ Sub Contract කරන කෙනෙක්.

ප්‍ර : Sub Contractor කෙනෙක්, උප කොන්ත්‍රාත්කරුවෙක්?

පි : ඔව්. යාසිම් හාජ්ජියාර්. එයා ගාවින් තමයි මම මුලින්ම අන්තවාදය හොයා ගත්තේ එයා ගාවින්. අර මම කිව්වේ හලීම් හාජ්ජයාර්, අර ගුණතිලක කියන ආමි පුද්ගලයාට කියපු ඒවා, ඒගොල්ලෝ මසූරා ඉඩම් අල්ලන්න මසූරා කරපු අය, චන්ද්‍රිකා පැත්තේ තියෙන ඉඩම්වල මම මුලින් ප්‍රකාශ කරා එව්වා.

ප්‍ර : ගිය පාර කිව්වා?

පි : ඔව්. ගිය පාර කිව්වා. ඒ පුද්ගලයා තමයි යාසිම් හාජ්ජියාර්. මේ පුද්ගලයා තමයි ආයුධ සම්බන්ධව. මොකද මුත්‍රා බට දාලා මුත්‍රා පහළ වෙන්නේ නැහැනේ. L.T.T.E. ගැහුවා කොච්චර විනාශ කළාද. මොකද L.T.T.E. කියන නම ඇහුණා කාටවක්වත් මුත්‍රා ගියේ නැහැනේ. දැන් මේ විදිහට ලංකාව පුරා මේගොල්ලෝ තැනින් තැනින් තැනින් තැන ඉන්න ඒ අවට ඝාතනය කළහම ඒ සැලසුම අනුව එක්කෙනා පස් දෙනයි ඝාතනය කරන්න ඕන.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ස්වාමීන් වහන්ස නැවත ඒ කෙනාගේ, දැන් ඔබ වහන්සේ කිව්වා එක්කෙනෙක් තමයි ඔබ වහන්සේගේ අර ලොක්කා යාසිම් හාජ්ජයාර් කියලා?

පි : යාසිම් හාජ්ජියාර්.

ප්‍ර : එතකොට දැන් මේ ආයුධ භාරව හිටපු, මේ කථා කරපු එක්කෙනාගේ නම නැවත අපි කිව්වොත්?

පි : මෙයාට අමීර් කිව්වේ. මෙයාගේ නම මට....,

ප්‍ර : ඒ අමීර් කියන්නේ අර ආගමේ තියෙන අමීර් නෙවෙයි?

පි : නැහැ නැහැ ඒ අමීර් නෙමෙයි.

ප්‍ර : නම අමීර්?

පි : නැහැ මෙයා, ඔව් දැන් නම් අනූ නවයෙන් මේගොල්ලන්ගේ සඳහන් වෙන හින්දා, මුසම්මිල්ලා පහළොවක් ....,

ප්‍ර : ඔබ වහන්සේ ගිය පාර ඔය නම් අනූ නවය ගැන කියවුණේ නැහැ?

පි : ඔව්. නම් අනූ නවයෙන් තමයි මුස්ලිම්වරුන්ගේ නම් තියෙන්නේ. එතනින් එහා නැහැ. දැන් අපට තියෙන්නේ වැඩියෙන්ම හින්දි නළු නිළියන්ගේ නම්නේ. නම් එක්දහස් පන්සීයක් විතර අපට තියෙනවා. එතකොට මේ නම් අනූ නවයෙන් තමයි හැදිලා තියෙන්නේ. සියලුම නම් අනූ නවයට මුලට මොහොමඩ් කියන කෑල්ල තියෙන ඕන. එක්කෝ අබ්දුල් තියෙන්න ඕන.

ප්‍ර : හැමෝටම?

පි : අබ්දුල් හෝ මොහොමඩ් තියෙන්න ඕන.

ප්‍ර : එහෙමයි. එතකොට මේ අමීර්ට ස්වාමීන් වහන්ස ඔය වීඩියෝ පටියේ කථා කරන එයාගේ නම මොකද්ද ඔබ වහන්සේට මතක විදියට? ඔබ වහන්සේට මතකයි එයා ආයුධ භාරව හිටියා කියලා?

පි : ඔව්. මෙයා ආයුධ භාරව හිටපු කෙනෙක්.

ප්‍ර : මොන ආයුධද, කොයි කාලයේද ආයුධද?

පි : කඩු.

ප්‍ර : අර පහුගිය අවස්ථාවලදී ඔය පාස්කු ප්‍රහාරයෙන් පස්සේ අර පොලීසිය, යුධ හමුදාව එහෙම අර මුස්ලිම් ජාතිකයින් ගාව තිබ්බා එකතු කරපු කඩුද ....?

පි : ඒ කඩු ටික ඔක්කොම ඒ ටිප් එක ගන්න තිබුණා ඒ මෙහෙයුම් තියෙන, අපේ රටේ තියෙන දුර්වලතාවය එකක්, දේශපාලන දුර්වලතාවය. අනිත් එක කොහෙන් හරි බලපෑමක් කරා. මොකද L.T.T.E. එක ගහද්දිත් බලපෑම් ඇති වුණානේ. මේ කඩු අහුවෙන්න ගියේ. මේ කඩු අහුවෙන්න යනකොට දැන් මේවා

Page 22 of 157

FAIR COMMENT BY JEZEEM

- 274 -

වෙනත් ස්ථානගත කරලා ඇති කියලා මම හිතනවා. මම සැක කරපු බංකර් තියෙනවා ඒ පල්ලිවල .....,

ප්‍ර : අපි ස්වාමීන් වහන්ස ඒකට එමු. මේ නම පොඩ්ඩක් ?

පි : නම චුට්ටක්.

ප්‍ර : මොන අමීර්ද කියන එක ඔබ වහන්සේ දැන් මතක් කරන්නේ?

පි : Call එකක් පොඩ්ඩක් ගන්නද. මගේ යාළුවා ගාව මම File එකක් දාලා තියෙනවා.

ප්‍ර : (ගරු සභාපතිතුමාගෙන් අවසර ඉල්ලා සිටියි)

පි : මට එහෙනම් නැවත ඒ හිස් තැන පුරවන්න මෙහෙන් මට Phone Numberයක් දුන්නොත් නවාතැනට ගිහිල්ලා දුන්නැහැකි.

ප්‍ර : නැහැ ස්වාමීනි අපි අදම ඒක කරමු. තව ටිකකින් අපිට අවස්ථාව ලැබෙයි. එතකම් අපි අනිත් කරුණු ගැන ඉස්සරහට යමු. ඔබ වහන්සේ දැන් යම් පහර දීම් සම්බන්ධයෙන් දැන් කිව්වනේ?

****

ගරු සභාපතිතුමා :

ගරු ස්වාමීන් වහන්ස, කොමිසම ඉස්සරහා සාක්ෂි දෙනකොට පිටතට කථා කිරීමට, ඇමතුම් කාටවත් ලබා ගැනීමට සාක්ෂිකරුට අවස්ථාව දෙන්නේ නැහැ.

****

ප්‍ර : ඔබ වහන්සේ දැන් ඔය කඩු පිළිබඳව කථා කරපු හින්දා මම මේ ප්‍රශ්නය අහන්නේ. ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ කිව්වනේ මේ ආයුධ ගබඩා කිරීමක් ගැන?

පි : ඔව්.

ප්‍ර : ඔය ආයුධ ගබඩා කරලා තියෙන්නේ ඔබ වහන්සේගේ අත්දැකීම් අනුව මොන වගේ ස්ථානවලද? පල්ලිවල ආයුධ ගබඩා කරලා තියෙනවද නැද්ද කියන එක පිළිබඳව ඔබ වහන්සේ පෞද්ගලිකව දන්නවද කියන්න?

පි : දැන් මුලින් හදාපු පල්ලිවලට අමතරව කුවේට් ආධාරවලින් හදපු පල්ලි සහ Toilet ..,

ප්‍ර : කුවේට් ආධාර?

පි : ඔව්. කුවේට් ආධාරවලින් හදපු පල්ලි සහ Toilet. ඩ්‍රැනේජ් වළවල් ....,

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : වැසිකිළි?

පි : වැසිකිළි, ළිං සෑම දෙයක්ම හැදුවා. ඒ මෑත කාලයේදී හදපු පල්ලිවල, පල්ලියක් ඇතුළේ සාමාන්‍යයෙන් ඔළු ටැංකියක් තියෙන්නේ නැහැ. මුහුණ කට සෝදන්න, පිරිසිදු වෙන්න තියෙන ඔළු ටැංකියක් තියන්නේ නැහැ. ඒක එළියෙන් තමයි තියෙන්නේ. දැන් මේ පල්ලියක් ඇතුළේ, පල්ලි දෙක තුනක්ම ඇතුළේ මම දැක්කා මේ ආකාරයට සාමාන්‍යයෙන් අඩි තුනයි තුනේ වගේ, අඩි දෙක හමාරක තුනක වගේ ජඹුර වලක්. ඒකේ මේ ආකාරයට තියෙනවා පොඩි කොන්ක්‍රීට් එකක් දාන්න පුළුවන් අහල් එක හමාරක දෙකක විතර. මේ සයිස් එකට පොඩි කට්ටයක් වටේට තියලා ලී ස්ථරයක් වගේ. ඒ කියන්නේ ඒකට ඩිරැනේජ් එකක් වහනවා වගේ එකක්. ඒ කියන්නේ පල්ලියක් ඇතුළේ එවැනි එකක් එන්නේ නැහැ. අඩි තුනක විතර, තුනයි දෙක හමාර, දෙක හමාරක් විතර පළල. ඒ තැන්වල මම හදපු පල්ලිවල දැක්කා වතුර තියෙන අර ප්ලාස්ටික් බර නැති. මොකද අතන කොන්ක්‍රීට් එක සනකම අඩුව එතන ඒ ලී ස්ථරය වගේ තිබ්බේ හදිස්සියකට ක්ෂණිකව කඩා ගන්න. හදිස්සියකට උවමනාවකට ක්ෂණිකව කඩා ගන්න.

ප්‍ර : කොහොමද ඔබ වහන්සේ දන්නේ ඒක?

පි : ඒක සිමෙන්ති දාලා ඒක තිබුණේ. කොන්ක්‍රීට් දාලා තිබුණේ. මෙතන වළ තිබුණා. මේක සාමාන්‍යයෙන් කට්ටයක් තිබුණා. එතකොට හිතා ගන්න පුළුවන් මේ වගේ එකක් දාන්නේ, ඒ වගේ තැන්වල සනකම අඩු කොන්ක්‍රීට් කට්ටයක් තමයි මේකේ තියලා තිබුණේ. එතකොට මේක කොන්ක්‍රීට් ලෑල්ලකින් වහලා, උඩින් ටයිල් අල්ලලා මේක වහන්න. එතකොට ඒ තැන්වල කෙනෙක් නැග්ගහම ඒක ක්ෂණිකව කඩා ගන්න කම්බි මොකුත් නැහැනේ. ඒ තැන්වල සෙනඟ නැග්ගහම කඩා වැටෙන නිසා එතන ආරක්ෂාවට අර වතුර බෝතල් තුන තිබෙන Cool, Hot, Normal වතුර ප්ලාස්ටික් මෙව්වා එකක් තියලා බංකුවක් තියලා තියෙනවා ඉඳගෙන වතුර බොන්න. පල්ලිය ජරා වෙනවට ලොකු සනකම පාපිසි දාලා තියෙනවා. අර පොඩි ළමයිගේ අතින් වතුර හැලෙයි කියලා. කෝප්ප ගැට ගහලා තියලා තියෙන්නේ එතන. ළමයි කෝප්ප අරන් වතුර බොනකොට, ඒකටම තමයි හිස් වතුර දාන්න තියෙන්නේ. ඒ තැන්වල ඒක තියලා තියෙන්නේ හදිස්සියකට ඔය ගොඩක් සෙනඟ නැග්ගොත් කඩාගෙන වැටෙයි කියලා ඒක වළක්වන්න. ඒක තමයි පල්ලි Check කරන්න දුන්නේ නැත්තේ මේ සැරේ. බල්ලෝ ගෙනියනවා අරෙහේ මෙහේ කියලා, සපත්තු

FAIR COMMENT BY JEZEEM

දාගෙන යනවා කියලා පල්ලි Check කරන්න නොදුන්නේ මේ සැරේ කඩු අහුවුණා, නාරම්මල ගොඩක් අහුවුණා. නාරම්මලට ටැංකියක් ගිහිල්ලා තියෙනවා සම්පූර්ණම.

ප්‍ර : මොන ටැංකියක්ද?

පි : අඩි හතළිහේ ටැංකියක් අවි ආයුධ ගිහින් තියෙනවා.

ප්‍ර : ඔබ වහන්සේ කිව්වා අර කුළු ගෙඩි, මිටි එහෙම තියෙන්නේ ...?

පි : ඔව්. සාමාන්‍යයෙන් පල්ලියක කුළු ගෙඩියක්, මිටියක් අවශ්‍ය වෙන්නේ නැහැ. ඔය ඕක හදිස්සියක ගහලා කඩා ගන්න තමයි එක්කෝ බෝල ගල් ගෙඩියක් තියලා තියනවා පල්ලිය කිට්ටුව හදිස්සියකට ගන්න. පල්ලිය ඇතුළේ ලස්සන බෝල ගල් ගෙඩියක් තියලා තියෙනවා. එහෙම නැත්නම් පල්ලියේ අනිවාර්යයෙන්ම රාත්තල් දා හතරේ මිටියක් හරි මොකක් හරි කුළු ගෙඩියක් හරි මිටියක් හරි තියනවා ටක් ගාලා කඩා ගන්න.

ප්‍ර : ඔබ වහන්සේ කියන්නේ සාමාන්‍යයෙන් පල්ලියකට එවැනි කුළු ගෙඩියක්, මිටියක් අවශ්‍ය වෙන්නේ නැහැ කියලා?

පි : ගොඩක්ම මේවාගේ කඩු තමයි තියෙන්න ඕන. හදිස්සියකට සිංහල මිනිස්සු කුපිත වෙලා පල්ලියකට සිකුරාදා වගේ දවසක පහර දෙන්න හැදුවොත්, මේක පල්ලිය ඇතුළෙන් අරගෙන එළියට බහින්න තමයි මේක නිර්මාණය කරලා තියෙන්නේ පල්ලිය ඇතුළේ කියලා සැකයක් තියෙනවා. ඒ වගේම පල්ලිය අවට තියෙන ස්ථානත් මේ විෂයන් ඇතුළේ හිටපු නිසා, මේගොල්ලොත් එක්ක අවුරුදු දා හතක් එකට ජීවත් වෙච්ච නිසා මට සුදුසුකමක් තියෙනවා මේවා හොයන්න, පුළුවන්කමක් තියෙනවා කියලා මට මේ විෂයන් ඇතුළේ හිටපු නිසා හිතාගන්න පුළුවන්. අපේ යුධ හමුදාවේ අය ඉන්නවා දක්ෂ නිලධාරී මහත්වරු ඉන්නවා. ඒ වගේම මටත් උදව් කරන්න පුළුවන් සාමාන්‍යයෙන් මේකට තැනක ඉඳගෙන හරි මෙන්න මේ ආකාරයට උපදෙස් දී ගන්න පුළුවන් කියන හැකියාව තියෙනවා මේ ආයුධ ටික ගොඩ ගන්න.

ප්‍ර : මොන වගේ ස්ථානද පරීක්ෂා කරන්න ඕන කියලා ඔබ වහන්සේට පුළුවන් උපදෙස් දෙන්නට කියලා මේ කියන්නේ?

පි : ඒ වගේම තබ්ලික් ජමාද් ඕනම ගමක, අමීර් කෙනෙක් මට හොයා ගන්න පුළුවන්. අමීර් කෙනෙක් අවශ්‍ය නැහැ ඔහුගේ ෂාර්ප් කෙනෙක් වුණත් කමක් නැහැ. මේ නළල හොඳට කළු වෙලා තියෙනවා නම්, රෙදිවල කොණ්ඩේ වවලා තියෙනවා නම් ඔහු තබ්ලික්.

ප්‍ර : තබ්ලික්?

FAIR COMMENT — BY JEZEEM

පි : ඔව්. තවුහිද් නළල යන්තම් තියන්නේ. මේ නළල කළු කර ගන්නේ නැහැ ඒගොල්ලෝ. තබ්ලික් තමයි මේ නළලේ කැවුම් ගෙඩිය වගේ ඇවිල්ලා තියෙන්නේ, හොඳම නායකයා. ඒකයි නායකත්වය මුහුණ බලලා කියන්න පුළුවන් හැකියාව තියෙන්නේ. මෙතන තියෙනවා තනිකරම විශාලම, ඒගොල්ලන්ට කියන්නේ මූමින්වරු බවට පත් වෙච්ච අය කියලා කියන්නේ.

ප්‍ර : කවුද ඒ ස්වාමීන් වහන්ස මුමින්වරු කියලා කියන්නේ?

පි : ඒ මූමින්වරු කියන්නේ අල්ලාහ් වෙනුවෙන්, මේ ලංකාවේ ඉන්නවා මූමින්වරු. දැන් අපේ රහත්භාවය ලබලා කියලා කියන්නේ. ඒ වගේ අල්ලාහ් වෙනුවෙන් කළ නොහැකි දෙයක් නොමැති පුද්ගලයෝ තමයි මෙතන කරගැට එන්න දෙවියන් වැඳලා තියෙන්නේ.

ප්‍ර : ඒ වෙනුවෙන්ම කැප වෙලා ඉන්න අය?

පි : ඒ වෙනුවෙන්ම කැප වෙලා ඉන්න අය. මම සෙරෙප්පුවක් අතුල්ලලා තමයි කළු කර ගත්තේ. මොකද මට අර භක්තියක් නැහැනේ ඒ විදියට පොළොවේ ඇන ගන්න. කළු සෙරෙප්පු කෑල්ලක් අරගෙන අතුල්ලපුවාම ගෙදර ඉන්නකොට නිකම් මෙතන ඊට පස්සේ කළු ගැටයක් එනවා. ඒක කාලයක් යද්දි මැකිලා යනවා. අරක මැකෙන්නේ නැහැ.

ප්‍ර : ස්වාමීන් වහන්ස මේ කාෆීර් කියන්නේ කවුද? කාෆීර් නෙමෙයි, කලීෆා කියන්නේ කවුද? කලීෆ කෙනෙක් කියන්නේ?

පි : ප්‍රථම කලීෆා තමයි අබුබක්කර් අලී කියන්නේ. කලීෆා කියන්නේ දෙවියන්ට ගොඩක් අවනත වූ පුද්ගලයෙක් හැටියට තමයි සාමාන්‍ය අදහස. ඒගොල්ලන් ඒ කියන්නේ හිටපු අය. ප්‍රථම පළමුවෙන්ම කලීෆා වෙලා තියෙන්නේ අබුබක්කර් අලී. ප්‍රථම කලීෆා අබුබක්කර් අලී.

වේලාව : ප.ව. 3.40 යි.

මෙතැන් සිට සටහන් මුතුමාලි මෙය.

President's Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන ල/ලේ : ඉන්ද්‍රානි මහත්මිය .
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි .
වේලාව : 03.40 යි .

ප්‍ර : එතකොට මුස්ලිම් රාජ්‍යයක නායකත්වයට කලිෆා කෙකෙන් සුදුසුයි කියලාද තියෙන්නේ ?

පි : ඒ කියන්නේ ?

ප්‍ර : පිළිගැනීම

පි : රාජ්‍යයකට දැන් මෙහෙම තියෙනවා ඒක දැන් මට චුට්ටක් මේවා වුණා දැන් ලංකාවේ ගොඩක්ම ඉස්ලාමය වෙනුවෙන් සටන් වදින්නේ මුදල් වියදම් කරන්නේ කැප වෙන්නේ කවුද රජු වෙන්නේ. රජු වෙන්නේ ඒ වගේ දැන් ඊළඟට අගමැති වෙන්නේ

ප්‍ර : එහෙමයි

පි : ඒ වගේ කෙනෙක් තමයි මේ කලිෆාවරයා කියලා කියන්නේ . කලිෆාවරයෙකුට ගොඩක් රාජකාරි මට්ටමෙන් තියෙනවා ඒවා ගොඩක් අධ්‍යයනය කළේ නෑ ප්‍රථම කලිෆා අක්බක්කර් අලි ප්‍රථම පාංගු කියපු එක්කෙනා නෙයික් ජාතික ලෝකයේ ඉස්සෙල්ලාම බාංගු කිව්වේ නෙයික් ජාතික බිලාර් අවිඅල්හා නෑ බිලාල් තමයි

ප්‍ර : ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ දැන් ඔය ආයුධ පිළිබඳව සඳහන් කෙරුවානේ. එතකොට ඒ ආයුධ පාවිච්චි කරන්න මුස්ලිම් පිරිමි දරුවන්ව පුහුණු කිරීමක් කළාද ?

පි : ඔව්.

ප්‍ර : ඒ පුහුණු කිරීම කරන්නේ කවුද ? ඒ පුහුණු කිරීම් කරන ස්ථානයක් හෝ ස්ථාන තියෙනවාද ?

පි : ස්ථාන ගොඩක් තියෙනවා .

ප්‍ර : ඒ මොනවාද?

පි : මේක සිදු කරන්නේ මෙන්න මේ ආකාරයේ පුද්ගලයන්ට පමණයි.

ප්‍ර : එහෙමයි .

පි : මෞලවි කෙනෙක් කියන්නේ එයා කුරානේ පාඩම් තියෙනවා එයාට කුරානේ තේරුම කියන්න පුළුවන් .

ප්‍ර : එහෙමයි.

පි : එතකොට හාෆිස් කෙනෙක් කියන්නේ සම්පූර්ණයෙන් කුරානේ කට පාඩම් තියෙන කෙනෙක් .

ප්‍ර : හ්ම්..

පි : කුරානේ කට පාඩම් තියෙන කෙනෙක් බලන්නේ නැතුව කුරානේ අග ඉදන් මුලටත් මුල ඉදන් අගටත් කියන්න පුළුවන් . මෞලවි කියන්නේ කුරානේ කියන්නත් පුළුවන් තේරුමත් සම්පූර්ණ කියන්න පුළුවන් මෞලවි කෙනෙක්. මෞලවි කෝස් එක තමන්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඉවර වුණහාම තබ්ලික් ජමාත් කියන්නේ මොකද ජමාත් එක හඳන්නේ පයිසර් ජමාත් විල්ල ජමාත් හදන්නේ දුවගෙන් අහලානේ මේ යුද්ධයට යන්නනේ . යුද්ධයට යන්න

ප්‍ර : දවස් කීයක් සැමියා නැතුව ඉන්න පුළුවන්ද කියලා ?

පි : එතකොට මේගොල්ලො දවස් 365 ක් නොකඩවා මේ ජමාත් එකේ සිටිය යුතුයි . දවස් 40 යනවා මර්කස් එකට යනවා දවසක් ඉන්නවා ඊළඟට ෆයිසල් එකක් යනවා .

ප්‍ර : මෞලවිවරු ?

පි : මෞලවිවරු දින 365 ක අවුරුද්දක ජමාත් එකක් යා යුතුයි.

ප්‍ර : කොහේටද යන්නේ ?

පි : යන්නේ ලංකාව පුරා ලැබෙන ඊළඟ ජමාත් එක යනවා. දැන් අපි නුවර ගියානම් නුවර සයිඩ් එක කළානම් ඊට පස්සේ තව සයිඩ් එකක් ලංකාව පුරාම ඒගොල්ලො දවස් 365 ක් යා යුතුයි.

ප්‍ර : ඔය ජමාත් වලදී එතකොට ආයුධ පුහුණු වීම් කරනවා ද ?

පි : ඔව් ජමාත් එකේදී ද? . ජමාත් එකේ ආයුධ පුහුණුවක් නෑ .

ප්‍ර : මම අහන්නේ ස්වාමීන් වහන්සේ ආයුධ පුහුණු වීම් ගැන

පි : ආයුධ පුහුණු වීමක් ජමාත් එකේ දෙන්නේ නෑ. මෞලවිලාට වෙනම මද්‍රසාවල ආයුධ පුහුණුවක් තියෙනවා.

ප්‍ර : ඔය ඕක කොහේද සිද්ධ වෙන්නේ ?

පි : ඒක සිද්ධ වෙන්නේ අරළුගම .

ප්‍ර : අරළුගම කොහේද අපේ හාමුදුරුවනේ තියෙන්නේ ?

පි : අරළුගම තියෙන්නේ බණ්ඩාරගම අරළුගම .

ප්‍ර : කළුතර දිස්ත්‍රික්කයේ ?

පි : හොරණින් එහෙන් කළුතර දිස්ත්‍රික්කයේ

ප්‍ර : ඔබ වහන්සේ එතැනට වැඩලා තියෙනවා ද ගිහි කාලේදී ?

පි : ඔව් එතෙන්ට විශ්වාස වන්ත හෙඩ් කුක් කෙනෙක් ඉල්ලුවා.

ප්‍ර : ඔය මොන කාලේද ස්වාමීන් වහන්ස?

පි : 2012 වගේ

ප්‍ර : 2012 වගේ ?

පි : 2012

ප්‍ර : එතකොට ප්‍රධාන කෝකියෙක්ව ඉල්ලුවා කියලා කිව්වා ?

පි : ඔව් . හෙඩ් කුක් කෙනෙක්.

ප්‍ර : එහෙමයි .

පි : එතකොට එකේ ළමයි 1000 ක් 1400 ක් විතර වගේ තමයි 1400 ක් විතර වගේ ඉන්නවා . දිනකට හරකෙක් අනිවාර්යෙන් අවශ්‍යයි

ප්‍ර : දිනකට හරකෙක් අවශ්‍යයි ? ළමයි කීයක් ඉන්නවාද ?

පි : 1400 කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා.

ප්‍ර : ඒ ඔක්කොටොම එක හරකෙක් ඇද්ද ?

FAIR COMMENT BY JEZEEM

පි : ඇ...

ප්‍ර : එක හරකෙක් ඇද්ද 1400 කට?

පි : සදාකාලික නෙවේ . එක වේලකට දෙකකට වගේ තමයි.

ප්‍ර : එක හරකෙක් ඇති.

පි : ඔව්. වේලකට

ප්‍ර : ඒ කියන්නේ මෙෘලවිවරුද ස්වාමින් වහන්සේ ?

පි : මෙෘලවිවරු හාෆිස්වරු තමයි එතන උගන්වන්නේ.

ප්‍ර : සමාවෙන්න ස්වාමින් වහන්සේ පොඩ්ඩක් බාධා කරනවා . එක පල්ලියකට මෙෘලවිලා කී දෙනෙක් ඉන්නවාද?

පි : මෙෘලවිලා එක්කෙනයි. ලෙබ්බේ වෙනම ඉන්නවා ලොකු පල්ලිවල නම්

ප්‍ර : එහෙමයි.

පි : Toilet හෝදන්න, බාංගෝ කියන්න ලෙබ්බේ කෙනෙක් ඉන්නවා . මොයිදිනානා කියලා ලෙබ්බෙත් කියනවා මොයිදිනානාත් කියනවා.

ප්‍ර : එහෙමයි.

පි : එතකොට ලංකාවේ ගත්තහාම ලක්ෂ 03 කට වැඩිය මෙෘලවිලා සහ හාෆිස්ලා ඉන්නවා.

ප්‍ර : නෑ ස්වාමින් වහන්සේ එතෙන්ට මම එනවා . එතකොට එක පල්ලියකට අවශ්‍ය වෙන්නේ එක මෙෘලවි කෙනෙයි?

පි : එක මෙෘලවි කෙනයි.

ප්‍ර : ලංකාවේ පල්ලි දළ වශයෙන් කොච්චර තියෙනවාද ?

පි : ලංකාවේම සම්පූර්ණ දළ වශයෙන් කියන්න මට අපහසුයි.

ප්‍ර : 2013 / 2014 වගේ

පි : කල්පිටියේ තියෙනවා පල්ලි 700 ක් විතර .

ප්‍ර : 700 ක් විතර ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔතන පුහුණු වෙන්නේ 2014

පි : පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටියේ පුත්තලමත් එක්කලා 700 ක් පමණ තියෙනවා.

ප්‍ර : එහෙමයි. එදා දැන් ඔබ වහන්සේ 2014 ප්‍රධාන අරක්කැමියා විදිහට ඔය අටළුගම ඔය ස්ථානයට යන කොට එතන එතකොට කී දෙනෙක් පුහුණු කළාද මෙෘලවිවරුන් විදිහට?

පි : මෙෘලවිලා හාෆිස්ලා දෙගොල්ලොම එතන ඉන්නවා . මෙෘලවිලා 100 ක් ඔක්කොම ගත්තහාම 1200 ක් 1400 ක් විතර වගේ එතන පුහුණු සංඛ්‍යාවක් හිටියා. මේක එළියේ ඉදලත් එන අය පෙළක් අය ඉන්නවා . එළියේ ඉදලා ඇවිත් යන අයත් ඉන්නවා මේකට විශාල තාප්ප තියෙනවා සිකුරිටි එකක් තියෙනවා .

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ආරක්ෂක භටයෝ ?

පි : ඔව් ඔව් සාමාන්‍යයෙන් PHI එනවා ඉදලා හිටලා

ප්‍ර : එහෙයි.

පි : එදාට මේකේ තියෙනවා කඩු දෙකක් මෙහෙම ගහලා අරාබි භාෂාවෙන් දාපු බෝඩ් එකක් .

ප්‍ර : කොහේද ගහලා තියෙන්නේ ?

පි : ඒක බිත්තියේ ලෑල්ලකින් මේවා කරලා මේ වගේ බිත්තියක එල්ලලා තියෙනවා.

ප්‍ර : බිත්තිය කියන්නේ ඔය බිත්තිය කොහේ තියෙන බිත්තියක්ද?

පි : ඉස්සරහ යන තැන දොරකඩ තියෙනවා ඒක

ප්‍ර : තාප්පෙද එහෙම නැත්නම්

පි : පොඩි කොරිඩෝ එක වගේ ඇතුල් වෙන තැන තියෙනවා

ප්‍ර : එන්ට්‍රන්ස් ඇතුල් වෙන තැන ස්ථානයේ

පි : ලාංඡනයක් අර අපේ යුධ හමුදා මුලස්ථානවල

ප්‍ර : එහෙමයි.

පි : ලාංඡනයක් වගේ තියෙනවා. ඒ වගේම දෙන්නෙක් ඉන්නවා මෙහෙම හෙළි දෙකක රෙදි කැලි ගැට ගහලා කොළ පාට රෙදි කැලි ගැට ගහපු දෙන්නෙක් ඉන්නවා ඒක විශේෂයෙන්ම තිබුණේ අරාබි කට්ටිය දවසක් ආවා ඒ වගේ දවස් වලට තමයි ඒක මේවා කරන්නේ අපි මේක රාජ්‍යයක් බවට පත් කර ගෙන ඉන්නවා කියලා පුහුණු කඳවුරක් කියලා පෙන්වන්න වගේ ඒක තමයි මම විශේෂ මෞලවි කෙනෙක් තමයි මාව එතෙන්ට යවන්නේ හෙඩ් කුක් වශයෙන් . එහේ මෞලවි කෙනෙක් තමයි මේක භාරව ඉන්නේ .

ප්‍ර : එහෙමයි.

පි : ඉතින් PHI එහෙම එන දවසට මේක අස් කළා දවසක් .

ප්‍ර : මොකක්ද අස් කරන්නේ ?

පි : අර බෝඩ් එකත් අස් කළා . මෙව්වා දෙකත් සිකුරිටි ඇවිල්ලා කියනවා PHI ඇවිල්ලා ඉන්නවා කියලා ඊට පස්සේ බෝඩ් එක ගලවලා ගිහිල්ලා ඔෆිස් එකේ තියෙනවා සයිඩ් එකක් එකේ තිබ්බා අර මේව්වා දෙකත් තිබ්බා ළමයි පැත්තකට ගියා.

ප්‍ර : මේ ඔබ වහන්සේ ඉන්න කාලේ වෙන්න ඕනේ ?

පි : ඉන්න කාලේ සුදු තලප්පා ගැටගහලා ළමයි ඒ මෙව්වා දෙක තියන් ඉන්නේ . එතකොට මර්කස් එකත් එන මුලස්ථානයත් එතනත් ඉන්නවා හෙළි දෙකක් තියාගෙන . කොළඹ මර්කස් එක මගේ 1500 ක් දිනකට ගිහිල්ලා යවනවා කියලා .

ප්‍ර : කොස්ගස් හංදිය ?

පි : ඊළඟට තියෙනවා මාකොල ඕෆ්නේජ් එක

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මාකොළ ඕෆ්නේජ් එක ? අනාථ කඳවුර

පි : මාකොළ ඕෆ්නේජ් 02 ක් තියෙනවා .

ප්‍ර : එහෙමයි.

පි : එකක් මාකොළ කිරිබත්ගොඩ මාකොළ අනිත් එක මල්වාන උලහිටිවල ඕපනිව් එකක් තියෙනවා . එකත් විශාල භූමියක් . එකෙත් මේ ආකාරයට තමයි එතන ඉන්නේ ගොඩක්

ප්‍ර : ඔබ වහන්සේ ඒ දෙකට ගිහිල්ලා තියෙනවාද ?

පි : ඒ දෙකටම මම ගිහිල්ලා තියෙනවා.

ප්‍ර : එතන කවුද ඉන්නේ ස්වාමීන් වහන්ස?

පි : එකේ පල්ලිය තියෙනවා සිකුරාදාට ජුම්මා වන්දනාව මම ඕක චුට්ටක් වෙක් කරන්න මම යනවා .ඕනේ පල්ලියකට අපිට යන්න පුළුවන් . ඒ පල්ලියට මම ජුම්මා වඳින්න පුම්මා වලට යනවා. ඊට අමතරව එකේ ඔය වයරින් වැඩ ඒවා මේවා වගේ වැඩ අහු වෙනවා අපිට කන්ට්‍රැක්

ප්‍ර : ඔබ වහන්සේට මේසන් වැඩ පුළුවන් කියලා කිව්වානේ ?

පි : මට මේසන් වැඩ පුළුවන් වයරින් වැඩ පුළුවන් බාබෙන්ඩර් පුළුවන් සැටලින් පුළුවන් හැමදෙයක්ම වෙල්ඩින් අංශයෙන් පුළුවන් .

ප්‍ර : එහෙමයි.

පි : ඔව්.

ප්‍ර : එතකොට ස්වාමීන් වහන්ස අර අපි නැවත අටළුගමට ගියොතින් ඒ අටළුගමදී ඔබ වහන්සේ මොනවාද දැකපු මොනවාද අත් විඳින්න ලැබුණේ මොනවාද නිරීක්ෂණය කරන්න ලැබුණේ ?

පි : එකේ පිටිපස්ස පැත්ත ගොඩක් ඉඩම තියෙනවා පල්ලෙහා ගොඩ කරලා තියෙන්නේ

ප්‍ර : අක්කර කීයක් විතර තිබ්බාද?

පි : අක්කර ගාණ නම් කියන්න බෑ.

ප්‍ර : පොඩි ඉඩමක් ද ලොකු ඉඩමක් ද ?

පි : ලොකු ඉඩමක්.

ප්‍ර : ඉතා ලොකු ඉඩමක්?

පි : ඔව්. අපි දවල් කෑමෙන් පස්සේ ළමයි එක්කලා ක්‍රිකට් ගහනවා . ඒ වේලාවේ

ප්‍ර : එතකොට ඔබ වහන්සේට වයස කීයක් විතර ඇද්ද?

පි : හතළිස් ගාණක් වගේ තමා තිබුණේ . ඉන් පස්සේ බැකෝ එකක් ඇවිත් කැපුවා අර පස් .

ප්‍ර : එක දවසක් ?

පි : ඔව්. එහේ අර ඉන්නවා විශාල මාර කොක්කු වගේ කොක්කු . කට්ටිය අපි මද්රසා එකේ එතනම

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ස්වාමීන් වහන්සේ ඔබ වහන්සේ අර කරපු ගස් වල නිරීක්ෂණය කියලා ඔතැන්ට ආවා නම් ලේසි .

පි : පොල්ගස්වල එහෙම කොටාපු ඒවා ඒකේ තියෙනවා.

ප්‍ර : පොල්ගස්වල කොටනවා කියලා කියන්නේ ?

පි : ඒ කියන්නේ කඩු වලින් කොටාපු පාරවල් ඒවා තියෙනවා පොල් ගස් වල ඊට අමතරව බැකෝ එකෙන් කපන කොට ප්ලාස්ටික් ඔළුව නැති මිනිස්සු ඒ කියන්නේ දැන් show room එකක තියෙනවානම් තියෙන්නේ මේ කොට අත් තියෙන සම්පුර්ණ මිනිසාගේශරීරයක් නැනේ .

ප්‍ර : එහෙමයි.

පි : සම්පුර්ණ මිනිසාගේ ශරීරයේ අර කෑලි එල්ලෙනවා කොටලා කොටලා බැකෝ එකට වල හාරන කොට මේක කුණු වලක් තමයි කැපුවේ. ඩස්පින් වලක් කැපුවේ. ඒ වල කපන වේලාවේ මම අර කොක්කු ඉන්න නිසාවෙන් වල හාරන වේලාවේ මම එතැනට ගියා

ප්‍ර : එහෙමයි

පි : කට්ටිය බෝල ගහන්න ඇවිල්ලා නැති නිසා එන කට්ටිය එනකම් මම එතැනට ගියා බැකෝ එක ගාවට ඉතින් මම ඒක දැක්කා ඒක අර වෙනම වලක් හාරලා මේව්වා කරලා බැකෝ එකේ එක්කෙනා මුස්ලිම් එක්කෙනෙක් තමා බැකෝ එකේ හිටියේ . වෙනම වලක් හාරලා මේව්වා කරලා ඇඳලා අරගෙන දාලා ඒක වැහුවා එතන . ඒක හෙට වුනත් ගොඩ ගන්න පුළුවන්.

ප්‍ර : එතකොට ඔබ වහන්සේ දැකලා තියෙනවාද ඔය ඒ හිටපු කාලය තුළදී අටළුගම කඩු සටන් පුහුණු වීම් ඒ වගේ දේවල්.

පි : නෑ එහෙම දැක්කේ නෑ .

ප්‍ර : ඒවා දැක්කේ නෑ?

පි : දැක්කේ නෑ.

ප්‍ර : එතන ආයුධ තිබ්බාද නැද්ද කියන එක ගැන ඔබ වහන්සේ දන්නේ නෑ ?

පි : ඒවා මොකුත් දන්නේ නෑ. මොකද අපිට සීමාවක් දීලා තියෙන්නේ යන්න එන්නත් අපි විශ්වාසවන්තව ගියාට

ප්‍ර : හැමතැනටම යන්න දෙන්නේ නෑ?

පි : අපිට සීමාවක් තියෙනවා . ඒකේ විශේෂ ස්ථාන තියෙනවා ඒකට කවුරුවත්ම අපිට යන්න දෙන්නේ නෑ.

ප්‍ර : එහෙමයි.

පි : මම ටිකක් ඇවිදින්න එහෙම ආවහම මේ මට එහේ යන්න තහනම් කිව්වා. ඒවා රහස් ගතව ඒවායේ අනිවාර්යෙන්ම මොනවා හරි යම් කිසි දෙයක් සිදු වෙනවා කියන එක තියෙනවා . ඒ වගේම

FAIR COMMENT — BY JEZEEM —

ලංකාවේ තියෙන මද්‍රාසා ටිකයි එළියට බහින මෞලවිලා ටිකයි බැලුවහාම විශාල

ප්‍ර : මද්‍රාසා කියන්නේ මොනාද ස්වාමීන් වහන්සේ ?

පි : මද්‍රාසා කියන්නේ ඒවායේ කරන්නේ හාෆිස්ලා මෞලවිලා එළියට දාන එක

ප්‍ර : ඒ කියන්නේ පාසල් වගේ

පි : පාසැල්. හාෆිස්ලා මෞලවිලා කියන්නේ තනිකර අන්තවාදී හොඳම training වුණු කට්ටිය. දැන් පොඩි පැන්සි කඩ එතකොට කොමිනේට් කේෂන් ඔය වගේ ඔය වගේ තරුණ අවුරුදු 19,20 ළමයි ඉන්නේ . ඒ ඔක්කොම මෞලවි කෝස් එක කරපු අය .

ප්‍ර : එහෙම කොහොමද ඔබ වහන්සේ කියන්නේ ?

පි : ඒගොල්ලොන්ට රැකියාවක් වශයෙන් දෙන්නේ මෞලවි කෝස් එක ඉවර වුණාහම පල්ලි නෑනේ වැඩ කරන්න. මෞලවිලා පල්ලි තියෙන්නේ මෙච්චරයි මෞලවිලා ඔච්චරක් ඉන්නවා නේ .

ප්‍ර : එහෙමයි.

පි : ඒගොල්ලන්ව කඩවල් වලට අරගෙන ඒ ගොල්ලන්ව පෝෂණය කරනවා මේ සංවිධානයෙන් ඒගොල්ලොන්ට සාමාන්‍යයෙන් රුපියල් 15000/= ක වගේ පඩියක් තමයි දෙන්නේ .

ප්‍ර : එහෙමයි.

පි : ඊට අමතරව ඒ ගොල්ලොන්ගේ සියළුම රාජකාරි ඒ ගොල්ලො කෝස් එක කරලානේ තියෙන්නේ . මාසේකට දෙකකට සැරයක් ඒ ගොල්ලන්ට බයන් එකට කැඳවනවා. ඒ රොටරියට ඒ ඉන්න සංඛ්‍යාව ඒ ගොල්ලන්ගේ මාසෙකට සැරයක් වැඩ සටහන් වලට කැඳවනවා. ඊට අමතරව ඒ ගොල්ලන්ගේ සියළුම ඕනේ එපාකම් මේ සංවිධානයෙන් ඉටු කරනවා. මෞලවි කෙනෙකුට ඒ විදිහට සලකනවා. මොකද ඒ ගොල්ලො කුයික් එකේ ඉන්න training කරලා ඕනේ වේලාවක හරි අප් කිව්වහාම එළියට බහින්න ඉන්න කට්ටිය අමීර්ලාත් සමඟ එළියට බහින්න ෂාප්ලා සමඟ අමීර්ලා සමඟ අමීර් ෂාප්ලා සමඟ එහෙදී අපි කඩුවක් උස්සන්න පුළුවන් සෑම කෙනාම එළියට බහිනවාමයි.

ප්‍ර : ඒකයි ඔබ වහන්සේ කියන්නේ අර යම් යාඥාවක් මගින් යම් පණිවිඩයක් දෙන්නට පුළුවන්කම තියෙනවා .

පි : ඔව්.

ප්‍ර : ඒ පණිවිඩය දුන් වහාම ඒ ක්‍රියාත්මක වීම සඳහා මේ අය සංවිධානය වෙලා ඉන්නවා ?

පි : දැන් අර මම කිව්වේ හයියාලත් සාලා හයියාලා සාලා එහෙම කඩනවා කියලා

ප්‍ර : එහෙමයි .

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පි : ඒ වගේ කළහාම පල්ලියට එනවා . ඒ ගොල්ලො කියනවා වහාම හෙට උදේ අපි ආරම්භ කරනවා වැඩ කොයි මොහොතේ

ප්‍ර : පල්ලියේ වැඩ ?

පි : කොයි මොහොතේ සිදු වෙනවා ද කියලා

ප්‍ර : එහෙමයි

පි : දැන් කියන්නේ අන්තවාදී සංවිධාන ඇතුළේ හිටියා නම් මට පුළුවන් ඇතුලේ ඉදලා මේ සම්බන්ධ වෙන්න අපහසුයි මට එහෙම සම්බන්ධ වෙනවා නම් හෙට පටන් ගන්නවා කියලා දැන් මොන මොහොතේ සිදු වෙනවා ද කියලා දන්නේ නෑ

ප්‍ර : දන්නේ නෑ. හරි දැන් මම ඔබ වහන්සේගේ මතකේ නැවත ගෙනියනවා අර මේ ඉන්දියාවේදී මුසම්දිල් හමු වෙලා කරපු සාකච්ජාව ගැන ? ඔබ වහන්සේ කිව්වා දැන් පාස්කු ප්‍රහාරය පිළිබඳවත් නත්තල් ප්‍රහාරය පිළිබඳවත් සැලසුම් තිබෙන බව ඒ අවස්ථාවේ දී දැන ගන්නට ලැබුණා කියලා ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ වහන්සේ මොකද කළේ?

පි : මම ලංකාවට ඇවිල්ලා

ප්‍ර : ඒ ප්‍රහාර දෙක ගැන විතරද දැන ගන්න ලැබුණේ ?

පි : ඒ දෙක ඒහෙදී ලැබුණේ .

ප්‍ර : ඔබ වහන්සේට ඔයිට ඉස්සර වෙලා ඔය වගේ ප්‍රහාර පිළිබඳව ඔය සංවිධානය ඇතුළේ ඉන්න කොට දැනගන්න ලැබුණාද?

පි : ඔව් තව ප්‍රහාර ගොඩක් මම 2017 එළියට එන්නේ

ප්‍ර : එහෙයි

පි : 2022 ප්‍රහාරයක් විශාල ප්‍රහාර එල්ල කරනවා කියලා කිව්වා. ලංකාව අත්පත් කර ගන්න ප්‍රහාර දෙකක් තියෙනවා . තුනක් තියෙනවා .

ප්‍ර : මොනවාද ඒවා ස්වාමීන් වහන්සේ ?

පි : මේක තබ්ලික් එකේ

ප්‍ර : තබ්ලික් එකේ .

පි : මේවා අපි මසුරා කරපු දේවල් මේවා

ප්‍ර : එහෙමයි ඔබ වහන්සේලා සාකච්ජා කරපු දේවල් ?

පි : මේවා අපි සාකච්ජා කරපු දේවල් . ඒවාට හිටපු අමීර්ලා ඉන්නවා. හෙට වුනත් ඒගොල්ලෝ ඒවා වමාරන්න වෙනවා ඒ ගොල්ලන්ට මාත් එක්ක මසුරා කරපු අමීර්ලා .

ප්‍ර : එහෙමයි.

පි : මට ඉහළ තලයේ ඉන්න අමීර්ලා. ඒ අමීර්ලා සියළුම දෙන අද ජීවතුන් අතර ඉන්නවා තාමත් වැඩ කරනවා

ප්‍ර : එහෙමයි

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පි : ඊයේ පෙරේදාත් ඉස්මයිල් හාජ්ජියාර් එක්ක කිරිබත් කවනවා ඒ ගොල්ලන්ට මොකද තබ්ලික් තවුහිද්ලා කිරිබත් කවා ගන්න තියා තරහින් හිටපු කට්ටිය ඉස්සර දැන් හරි කම්බයින්ඩ් වෙලා තියෙනවා. මගේ අම්ර්ලා මට වඩා ඉහළින්ම හිටපු අම්ර්ට අනුෂ්ට ප්‍රහාර තව තුනක් තියෙනවා ඉදිරියට .

ප්‍ර : ඒ මොනවාද අපේ හාමුදුරුවනේ ඒ ? කොහොමද ඒක දැන ගත්තේ ?

පි : ඒක 2022 වෙනකොට මේවා සම්පුර්ණ ඉවර වෙන්න ඕනේ කියන එක තමා තිබුණේ . පළවෙනි එක තමයි ඒක මම මේ ආකාරයට දැනුවත් කරන්න ඕනේ . මේක බෞද්ධ රටක් නෙමෙයි කියලා කියනවා නේද ?

ප්‍ර : හ්ම් ...

පි : මේක බෞද්ධ රටක් නොවන ආකාරයට සිදු කරන්න ඒවා දැනුම තියෙන අය තමා අපේ සිංහල මන්ත්‍රීවරුත් කියන්නේ මේක බෞද්ධ රටක් නෙවෙයි කියලා. සියළුම ස්වාමින් වහන්සේලා එකම රාත්‍රියක සාතනය කිරීමේ සැලැස්මක් තියෙනවා . ඒ සාතනය සැලසුම් කළේ මේ ආකාරයට මේක අද ඊයේක කරපු දෙයක් නෙවෙයි මම මේ සංවිධානයට යන්න ඉස්සෙල්ලා ඉදලා තිබිච්චි සැලසුම් පවා මම හොයා ගත්තා . මුලින්ම අටපිරිකර තමයි මේකෙන් ඇල්ලුවේ .

ප්‍ර : එහෙමයි

පි : අටපිරිකර අපේ බෞද්ධ අයට මුස්ලිම් අය එක්ක වෙළඳාම් කරන්න බෑ. අපේ බෞද්ධයන්ට ගන්න තියෙන්නේ ඔය හරස් විදි හතරෙන් එකකින් තමා රෙදි ගන්න තියෙන්නේ . ඒ ගොල්ලෝ මේක මහා පරිමාණයෙන් පිටරටවලින් රෙදි ගෙනල්ල ටැංකි ගණන් ගෙනල්ලා මේ ගොල්ලො අටපිරිකර නිෂ්පාදනය කරනවා. අපේ අය 1200 ට දාපු අටපිරිකර අපි නිකම් සාමාන්‍යයෙන් දළ වශයෙන් ඒවා ගෙනාවේ රුපියල් ඊට අඩුව ගිහිල්ලා තියෙන්නේ ඒගොල්ලෝ රුපියල් 900 කට දාන්න පටන් ගන්නවා. එතකොට ලාභ අයගෙන් තමා කවුරුත් බඩු ගන්නේ .

ප්‍ර : ගන්නේ .

පි : ඒක නිසා අපේ ශාසනය ඇතුළේ තියෙන පිරිකර ටික ඒ ගොල්ලෝ මුලින් ඇල්ලුවා කඩ ටික. ඉන් පස්සේ දැන් වෙන දෙයක් මම කියන්නම් ඒ කාලේ අපේ හිතාගන්න පුළුවන් මේ අපේ විද්වත් මණ්ඩලයට රුපියල් 58 ක සබන් කැටයක් ස්වාමින් වහන්සේලාට ලැබෙන්නේ බික් රේසර් කවුරු දානේකට ගියත් බික් රේසර් , දත් බෙහෙත් , දත් බුරුසු , සබන් , සිද්ධාලේප , පැනඩෝල් ඔය ටික තමා ලැබෙන්නේ . ඔය ටික අරගෙන

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

හාමුදුරුවොන්ට කරන්න දෙයක් නෑ. මුස්ලිම් අය ඇවිල්ලා රුපියල් 58 සඹන් කැටේ ගන්න රුපියල් 50 ට . අපේ සිංහල අය ආවහාම ගන්නේ ඒක 35 ට . මොකද අපේ ස්වාමීන් වහන්සේලා තමයි මේ ඒ ගාව වෙළෙන්දෙක් දාලා තමයි මේ අර ගෙන එයාට කොමිස් එකක් ගන්න වගේ මේ ශාසනය නැති කරනවා. හාමුදුරුවෝ කියන්න බෑ ඒ ගොල්ලන්ට හාමුදුරුවෝ හොරු කියන කට්ටිය තමයි ඒ ඉන්නේ . මම ඉන්න පස්සලේ තියෙනවා ස්වාමීන් වහන්සේලාට ඉන්න දෙන්නේ නෑ ඒ අය සිංහල කෙනෙක් ගන්නේ ඒ කියන එක්කෙනාගෙන් තමයි බඩු දෙන්න ඕනේ හාමුදුරුවරු එයාට කොමිස් එකක් අර ගන්නවා . එවැනි තත්වයකට පත් වුණා. මුස්ලිම්වරු ඇවිල්ලා වැඩි ගාණට බඩු ගත්තා. ඒ බඩු ගන්න ගමන් හාමුදුරුවන්ට අවශ්‍ය කරන පෙත්තොයි, කුඩ්ඩොයි , කේජී කාරයෝ බවට මේ සම්බුද්ධ ශාසනය ස්වාමීන් වහන්සේලා පත් කරලා ඉවරයි.

ප්‍ර : පෙත්තො , කුඩ්ඩෝ , කෙජී කියන්නේ මත්ද්‍රව්‍ය ?

පි : මත්ද්‍රව්‍ය භාවිතා කරන අයට පත් කරලා ඉවරයි. මහා නායක ස්වාමීන් වහන්සේලාට අවශ්‍ය දේවල් පොඩි අයට හොරෙන් ගිහින් දෙනවා . පොඩි අයට ගෙනල්ලා දෙනවා මහානායක හාමුදුරුවොන්ට හොරෙන් ඒ වුනාට ඔක්කොම ස්වාමීන් වහන්සේලා හැන්දෑවට පන්සල් වලට ගියහම සිහියෙන් ඉන්න අය දැන් නෑ. මේ මම පන්සල් යන ගමන් තවත් කරපු දෙයක් . මේ පන්සල් තියෙනවා මම ඔප්පු කරලා පෙන්වන්නම් .

ප්‍ර : ඒ වගේ සමහර පන්සල් තියෙනවා ?

පි : සමහර සීයයට බණ අහන කට්ටියත් ඉන්නවා බණ නහන කට්ටියත් ඉන්නවා මේකේ ගොඩක්ම වැඩි පුරම ඉන්නේ මේ කට්ටිය

ප්‍ර : එහෙමයි.

පි : මේ තත්වයෙට පත් වෙලා තියෙනවා. එතකොට අපි ගියොත් පන්සලකට නිකාය අහනවා . ID කාඩ් එක ගන්නවා. සාමණේර නම් සාමණේර සහතිකේ ඉල්ලනවා. උපසම්පදා නම් උපසම්පදා සහතිකේ ඉල්ලනවා දවස් දෙකක් තුනක් පස්සට අදිනවා . මුස්ලිම් අය ආවහාම හාමුදුරුවන්ගේ සහෝදරයෙක් වගේ ඕනම තැනක ඒ ගොල්ලොන්ට ඇවිදින්න පුළුවන්. එවැනි තත්වයක් තියෙන්නේ . අපිට වඩා තැනක් තියෙනවා මුස්ලිම් අයට පන්සල්වල ඒ ගොල්ලො සැලසුම් කරලා තියෙන්නේ සියළුම ස්වාමීන් වහන්සේලා එකම රාත්‍රියක ඝාතනය කරන්නටත් එදාම පාන්දර මේක 06 ට වගේ තමයි කාර්ය බහුල වේලාවේ සියළුම සිංහලයෝ ඝාතනය කරන්නත්. ඒකට තව ප්‍රහාර දෙක තුනක් එල්ල

FAIR COMMENT BY JEZEEM

කරලා ඒ ගොල්ලොන්ට ඒක ලේසී . මොකද අපි හැම තිස්සේම හමුදාවේ මුස්ලිම් ඒරියා සිංහල ඒරියා කියලා කවර් කරගෙන ඉන්නේ නෑනේ.

ප : එහෙමයි

පි : දැන් රටේ ආරක්ෂාව තිබුණාට කැම්ප් වලනේ පොලිසිවලනේ ඉන්නේ . රටේ හැමතැනම සන්නද්ධ කරලා අර උතුරේ වගේ මේවා කරලා නෑනේ. ඒ වගේ මොහොතක මේ රට එකම පාරට වට්ටන්න තමා මොකද ලෝක ප්‍රජාවේ තියෙනවා ඒ ගොල්ලන්ගේ ලෝකයේ බලගතු රටවල් අල්ලන්න බැරි තත්වයේ උදා වුණා. ලෝකය ඒ ගොල්ලන්ව වැට්ටෙව්වා . ආර්ථිකයෙන් වට්ටලා මේවා ලෝකයේ ඒක හින්දා මේ වගේ පුංචි රටවල් අල්ලන්න පුංචි රටවල් අල්ලලා ප්‍රශ්නයක් ඇති වුනොත් මුස්ලිම් මහ ප්‍රජාව මේකට අත දාන්න බලා ගෙන මේකට ගොඩක් ඒ ගොල්ලෝ මේ ශක්තිය අරන් තියෙන්නේ විදේශ බලවේගයන් මුස්ලිම් රටවල් 45 ක බලවේගවල් තියෙනවා.

ප : එහිදී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව යා කරලා මුස්ලිම් රාජ්‍යයක් බිහි කිරීමේ යම් සැලසුමක් එහෙම තියෙනවා කියලා ඔබ වහන්සේ දන්නවාද?

පි : මම එහෙම දෙයක් දැන ගෙන නෑ.ඒ ගොල්ලන්ගේ බලාපොරොත්තුව නෑ මේ කිසිම මේව්වා එකක් දැන් Tamil අයත් එක්ක එකතු වෙලා අල්ලන්නත් ඉඩ තියෙනවා ගිව්සුම් ගහගෙන මේකට මනෝ ගනේෂන් , රිෂාද් බදුර්දීන් , හිස්බුල්ලා එතකොට අබ්දුල් රාසික් ඒ දෙමළ පක්ෂ ඔක්කොම 2016 හරි 2014 මට හරියටම දින වකවානු මතක නෑ .ඒකට එරෙහි වෙච්චි කෙනා තමයි ෆවුසි . ෆවුසි ඒක තමයි බේරුවලදී මරන්න හැදුවේ LTTE එක දම්මලා. ඒක රිෂාද් බදුර්දීන්ලා හොඳාකාරවම ආණ්ඩුවට පක්ෂපාතයි කියලා රිෂාද් බදුර්දීන්ලා මරන්න මෙයාව මේ ෆවුසිව මරන්න හැදුවේ . ඊට පස්සේ මේගොල්ලො ගිව්සුමක් ගහගත්තා දෙකොණ ගිනි තියන්න මේ ගොල්ලො මෙහේ පටන් ගන්න උතුරේ එහේ පටන් ගන්න . එතකොට හමුදාව මෙහේ මුස්ලිම් ඉන්න ප්‍රමාණය ගම්වල බැලුවහාම ගියාහම අපිට හමුදාව මදී වෙනවා. උතුරට දාන්නයි මෙහෙට දාන්නයි. ඒ වේලාව ලංකාව ගොඩක් අර දුබල තත්ත්වයට ආණ්ඩුව අසරණ කරන්න තමයි මේ ගොල්ලො බලා ගෙන ඉන්නේ මේ රටේ ආරක්ෂක අංශ අසරණ කරලා මහජනයා අසරණ කරලා ඒ වගේ විශාල ලෙස මේව්වා කරනවා මොකද මුස්ලිම් ලෝක ප්‍රජාවෙන් මේ රට අල්ලනවාට ගොඩක් උදව් උපකාර තියෙනවා. ඒක මේ සංවිධාන ඇතුළේ ඉන්දැද්දි ලබා ගත්තු අවබෝධය .

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ස්වාමීන් වහන්සේ ඔය ප්‍රයත්නය කොයි වේලාවක හරි ක්‍රියාත්මක කරන්න මේ සංවිධානය කටයුතු කෙරුවාද ? අඩුගානේ උත්සාහයක් හෝ දරන්න . නැත්නම් ඒක තවමත් ඔබ වහන්සේ කියන විදිහට සැලසුමක් පමණද ?

පි : ඒක කවදාකවත් එකම පාරට හරියප් කියනවා මිසක් වේලාසනින් දැනුම් දීමක් නෑ. මෙහෙම දෙයක් ඉදිරියේදී වෙනවා කියන එක තමයි කොයි මොහොතේද කියලා දින වකවානුවක් කිසි දෙයක් නැහැ ඉහළින් ලැබෙන නායකත්වයත් රහසක්. ඉන්න අය අතරත් රහසක්. ඉන්න අය අතරත් රහසක් මේක ඒක සාමාන්‍යයෙන් මහරිබ් එකට තමා කියන්නේ ඉන්සා එකට ගහනවා කියලා නැත්නම් ඒක එළියට පිට වෙනවා. නැත්නම් ෂුවර් එකටම මොකද මේ ක්ෂණික ආයුධ ළඟ තියෙන්නේ කඩු . මම අර මුලින් ප්‍රකාශ කළා යුද්ධෙට මරණෙට මඟුලට අග්නි වියදම. ඒක තමා සාර්ථකත්වය කියලා කියන්නේ.

ප්‍ර : එතකොට ඔබ වහන්සේ මේ කරුණ පිළිබඳ සොයා ගත්තේ ඔබ වහන්සේ කියන විදිහට මේ සංවිධානය ඇතුළත කටයුතු කරලා ?

පි : ඔව් මගේ විවාහ සහතිකයෙත් ඩිවෝස් සහතිකෙත් බැලුවහාම කාල සීමාව මේකේ හිටපු ඩිවෝස් වෙලත් මම අවුරුදු දෙකක් විතර මේ සංවිධානයේ ඉදලා තමයි එන්නේ දෙවෙනි විවාහය කර ගන්න මම කිව්වානේ අර

ප්‍ර : එහෙමයි.

පි : සිරීපාදේ ඒක වැඩක් නැති වෙනවා. එතනින් ඊට පස්සේ වැඩක් නැති නිසා තමයි මම එළියට එන්නේ . ඒ කාල සීමාව බැලුවහාම මම ගිහිල්ලා තියෙන ස්ථාන බැලුවහාම මම ජමාත් ගිහිල්ලා තියෙන තැන් බැලුවහාම මම ඒ කාල සීමාවේ සියළුම දේවල්වල නිරත වෙලා ඉන්නවා. නැත්නම් මට මේ වගේ සෙනඟක් නැනේ .

ප්‍ර : ඔබ වහන්සේ ඔය සංවිධානය ඇතුළත ඉන්න අවස්ථාවේ යම් අවස්ථාවක දැන ගත්තාද ශ්‍රී පාද පද්මය සොරකම් කිරීමේ යම් ප්‍රයත්නයක් හෝ සැලසුමක් තිබුණාය කියලා ?

පි : ඔව්.

ප්‍ර : ඒක ගැන පොඩ්ඩක් කරුණු කියන්න පුළුවන් ද ස්වාමීන් වහන්ස?

පි : මම නෝටොන්වල යනවා හැටන් නෝටොන් මම වෙනම විල්ලා ජමාත් එකක යනවා . ඒ ගිහින්

ප්‍ර : දින 40 කට ?

පි : දින 40 ක ඒ ගිහිල්ලා නෝවඩ් එකේ මම දකිනවා ලෑලිවලින් කැටයම් ලෑලිවලින් ගහපු පල්ලියක් මේ සිරිපාද කන්ද පාමුල වළාකුළු ඒ කියන්නේ හිම පවා වැටෙනවා මීදුම පවා ගලාගෙන

FAIR COMMENT BY JEZEEM

යන පෙන්නේ නැති අඳුරු වෙන හරියක් . එහේ ජමාත් ගියාට පසුව අපිට මට එනවා එහේ මසුරා එකක් දින තුනක මේක ජමාත් නෙවේ මසුරා එකක් ඒ එනකොට හැටන් අපි මෙහෙන් යනවා මම මේ සලමන්සාජ් කියලා සල්මන් එයා ෂාජ් කෙනෙක් මුස්ලිම් වුනාට එයා අමීර් නෙවේ මම අමීර් එයා ෂාජ්

ප්‍ර : ඒ කොයි කාලේ වගේද දන්නේ නෑ අපේ හාමුදුරුවනේ ? දළ වශයෙන් අපිට අවුරුද්ද කිව්වොත්?

පි : මම දින ලියන්න ගියා වෙන වෙන දේවල් දාලා ඒවා අහු වුනොත් එහෙම සංවිධානයට යම් මොකක්හරි මතකයක් ලියලා තිබුණොත් අර දිනේ දාලා ඔයා අහවල් ගිය දිනේ දාලා එයාලා ගාව ඔය සියළුම සටහන් තියෙනවා . අමීර්ලා ළඟ සටහන් තියෙනවා. ඒ නිසා මගේ ගේ වෙක් කරලා අහු වුනොත් එහෙම ඒ දිනෙට මම වෙන දෙයක් ලියලා තිබුණොත් අහු වෙනවා ඒ තරම් මේක හරි සුක්ෂම අන්දමට ඒ අය ගෙනියන්නේ . කිසිම දෙයක් නොලියා ඉදීම තමයි ඒක මේව්වා එක දින වකවානු

ප්‍ර : ආසන්න සිදු වීමක්වත් ඔබ වහන්සේට මතකයේ තියෙනවා නම් ?

පි : 2012

ප්‍ර : අවුරුද්දේ වගේ

පි : 2012 / 2013 වගේ ඒ කාල සීමාව වගේ තමයි

ප්‍ර : එතකොට නොවුඩ් ගිහිල්ලා මොකද ස්වාමීන් වහන්සේ

පි : දෙවෙනි පාර නෝවුඩ් ගියා අපි වැන් එකක ගියේ අපි ගිහිල්ලා හැටන් එකෙන් නැංගා එතන සාක්ෂියක් තියෙන්නේ මෙයා මස් කඩේ මුදලාලිගේ බාලපුතා මේකට ගොඩ වෙනවා එතකොට පොලිසියෙන් එතෙන්දි වහනයට අත දාලා පොඩි සත්තමක් දානවා අපිට ඊට පස්සේ කියනවා අර කොල්ලා කියනවා උන් මට දැම්ම සත්තම මම මේකේ ඉන්න SI ට ගැහුවා ඊයේ පෙරේදා නඩුව තියෙනවා කියලා ඇතුලේ ඉදලා තමයි මම ආවේ ඒක තමයි ඔය සත්තම දැම්මේ කියලා අන්න ඒක තමයි සාක්ෂිය

ප්‍ර : මස් කඩේ මුදලාලි ඉන්නේ කොහේද ?

පි : මුදලාලි ඉන්නේ කොතැනද දන්නේ නෑ .

ප්‍ර : නෑ ඔය කඩේ ?

පි : ඒ කඩේ දන්නෙත් නෑ . මස් කඩේ දන්නෙත් නෑ Town එකේදී පොලිසිය ගාවදී තමයි නැංගේ පොලිසියේ එතන Traffic එහෙම ඉන්න එතෙන්දි නැංගේ අපේ වැන් එක නතර කරලා ආවහාම වැන් එක අද්දන කොට නතර කරලා තමයි ඇවිල්ලා මෙතන නතර කරන්න බෑ එහෙම කියලා පොලිසියේ අය පොඩි සද්දයක් දැම්මේ ඒ විදිහට කියනවා. එතකොට එයා තමයි මස් කඩේ මුදලාලිගේ පුතා ඒ ගොල්ලො තමා සදාකාලික මස් කඩේ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කොච්චරකල් ඉදන්ද කරන්නේ කියලා එදා ඉදන් අපේ තාත්තා තමයි කරන්නේ අපේ තාත්තාගේ නමට නෙවේ අරන් තියෙන්නේ මගේ නමට මුන්ට මස් නිකම් දෙන්න ඕනේ එකේ කේස් එකක් ගියේ මම අරින්නේ නෑ ඒකා හෙණ චණ්ඩියා මේකා . ඉතින් සදාකාලික මේගොල්ලෝ තමා මේ මස් කඩේ දෙන්නේ නෑ කාටවත් කීයට ගියත් මේගොල්ලෝ ගන්නවා එයා එතනින් තමයි හොයා ගන්නේ ඒ කියන්නේ සාමාන්‍යයෙන් මිනිහා වයසට වැඩිය හොඳට ඇඟ කඳ තියෙන ශක්තිමත් ඇඟකඳ තියෙන පුද්ගලයෙක්.

ප්‍ර : ඔබ වහන්සේ කියන්නේ මේ ගරු කොමිෂන් සභාවට එදා ඒ සිදු වුණු සිද්ධිය තමා මේකට සාක්ෂියක් විදිහට තියෙන්නේ කියලා ?

පි : ඊට පස්සේ අපි රෑ තමයි මෙතනින් ගියේ අපි හතර හමාරට පහට විතර තමයි හැටන් එකෙන් ගිහිල්ලා මඟ චුට්ටක් නතර වෙලා රෑ තමයි මේ නොවඩ පල්ලියට නැවත යන්නේ . ඒ දෙවෙනි වතාවට එකේ

ප්‍ර : ඒ මස් කඩේ මුදලාලිගේ පුතාගේ නම දන්නවාද ස්වාමීන් වහන්සේ?

පි : මොහොමඩ්

ප්‍ර : මොහොමඩ්?

පි : දැන් මෙහෙමයි මොහොමඩ් හසන්ලා ඉන්නවා නිකම්ම මොහොමඩ් ඉන්නවා .

ප්‍ර : අ.... නිකම්ම මොහොමඩ්ලා?

පි : මම කිව්වේ අර මේ අපිත් එක්ක හැටන් ගියේ කඩේ මුදලාලිගේ පුතෙක් ඉන්නවා . එයත් මොහොමඩ් විතරයි මම මේ නම් අනූ නවයෙන් මේ නෙවේ කියන්නේ දැන් එකම ගෙදර ඉන්නවා මේ අල්ලපු ගෙදරත් මොහොමඩ් ඉන්නවා එහේ මොහොමඩ් යාරේ ගාලා එහෙන් ගහනවා මොකද මේ කියලා අහනවා මෙහේ මොහොමඩ් කියන කොට ඉතින් ඒ වගේ දැන් පෙළක් අයට මොහොමඩ් තියෙනවා නම් සී තම්බි කියනවා බී තම්බි කියනවා ඒ වගේ එක එක නම් දාගේන ඉන්නවා නම් අනූ නවයෙන් තමයි මේ

ප්‍ර : ඔක්කොමගේම නම් හැදිලා තියෙන්නේ ?

පි : මේ නම් හැදිලා තියෙන්නේ

ප්‍ර : එහෙමයි .දැන් අපි මේ හඳුනා ගැනීමට

පි : එයාගේ නම මොහොමඩ්ගේ නම මට මතකයි මොකද ඒ

ප්‍ර : ඒ මස් කඩේ මුදලාලිගේ පුතා මොහොමඩ් ?

පි : මොහොමඩ් එයා ගොඩක් කල්

ප්‍ර : මස් කඩේ තියෙන්නේ ?

පි : හැටන් . මස්කඩ අයිතිකාර

ප්‍ර : හැටන් town එකේ ?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්

ප්‍ර : නගරේ ?

පි : ඔව්. එයා අපි එක්ක ගොඩක් සම්බන්ධ වුණා අපිත් එක්ක ජමාත් එහෙකත් එයා ඉන්නවා. ඒක පානදුරේ පැත්තේ ජමාත් එහෙක අපිත් එක්ක හිටියා . එතෙන්දිත් සම්බන්ධ වුණා. ජමාත් 03 ක හිටියා එයා. ආයේ හිටියා අවසානේට එයා හම්බු වුණේ මට ඒකෙන් තමා එයාගේ නම හොඳට මතක නාරම්මල ඒ සයිඩ් එකේ ජමාත් එකක් ගියා විල්ලා එකක් අවසාන ජමාත් එකේදීත් එයා මට හම්බ වුණා.

ප්‍ර : හම්බ වුණා ?

පි : ඒත් කවදාවත් ෆොන් නම්බර් ඒවා මේවා කිසිකෙනෙක් දුන්නේ නෑ.

ප්‍ර : එහෙමයි.

පි : ඔය වත්තල මැලේ කට්ටිය එක්ක මම ජමාත් එකක් ගියා මම විල්ලා ජමාත් සෑහෙන්න ගිහිල්ලා තියෙනවා මම 5 ක් විතර

ප්‍ර : එතකොට ස්වාමීන් වහන්සේ දැන් ඔය ශ්‍රී පාද පද්මය

පි : ශ්‍රී පාද පද්මය එදා එහෙදී මසුරා කළේ ඒක සෞවුදියට ඉල්ලන්නේ.

ප්‍ර : කවුද ඉල්ලන්නේ ?

පි : සෞවුදි අරාබියෙන් වියදම් කරන්නේ මේ රටට සෞවුදියෙන් මේ රටට ගොඩක් වියදම් කරන්නේ .

ප්‍ර : එහෙමයි.

පි : සෞවුදියෙත් කොටස් දෙකක් තියෙනවා . සෞවුදියේ ඉන්නවා මේ ලංකාවට උදව් කරන අය ඉන්නවා . ලංකාවත් එකක් තරහ අය ඉන්නවා .

ප්‍ර : ඒ මොකද ඒ ?

පි : ඒක ලංකාවේ ඉන්නේ නියම මුස්ලිම් නෙවේ කියලා ඒ ගොල්ලො කියන්නේ .

ප්‍ර : ආ.. ආ. .ඒ තරහ අය ?

පි : කවලම් මුස්ලිම්

ප්‍ර : කවලම් මුස්ලිම් ?

පි : කවලම් මුස්ලිම් කියන්නේ සෞවුදියේ ඉන්නේ තනිකරම උපතින්ම මුස්ලිම් අම්මලා තාත්තලා ඔක්කොම මුස්ලිම් . මේකේ සිංහල මුස්ලිම් මේකේ 07 යි ආවේ .

ප්‍ර : එහෙයි.

පි : අපේ කට්ටියත් එක්ක තමයි මේ සම්බන්ධ වෙලා මේව්වා වුණේ . ඒ නිසා මුන්ව විශ්වාස නැති තම්බි කියලා තමයි ඒගොල්ලෝ කියන්නේ. ඒකයි චුට්ට බැරි වෙව්ව හැටියේ අතපය කපලා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මරන්නේ සෞවුදියේ ලංකාවේ ඉන්න මුස්ලිම් ගෑණු එහෙනම් කවුරුත් හිතනවා නේ මුස්ලිම් හින්දා බේරයි කියලා .නෑ. ලංකාවේ අය පෙන්වන්න බෑ. ඒ කොටසක් ඉන්නවා උදව් කරන්න. කොටසක් ඉන්නවා ඒ කොටසෙන් තමයි ඔය ලංකාවට බයන් වලට එන්නේ මම අර මුලින් කිව්වේ

ප්‍ර : එහෙමයි.දේශනා සඳහා ඔබ වහන්සේ එනවා කියලා කිව්වේ ?

පි : ඒ දේශන ඇවුහාම අපිට දුකත් හිතෙනවා .අපිව ගණන් අරන් තියෙන විදිහ .

ප්‍ර : මහ ජාතිය ගණන් අරන් තියෙන විදිහ?

පි : මහ ජාතිය ගණන් අරන් තියෙන විදිහ.

දැන් වේලාව : 4.10 යි

මෙතැන් සිට ල/ලේ : චන්දිමා මිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව.4.10
පෙර සටහන් :ල/ලේ මුතුමාලි මෙනවිය
මෙතැන් සිට: ල/ලේ චන්දිමා මෙනවිය.

ප්‍ර: ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ කිව්වානේ අර සෞදියට මේ ශ්‍රීපාද පද්මය ගන්න වියදම් කරනවා කියලා ඒ මොකද ඒ?

පි: ඒ ඒගොල්ලෝ ඒක සඳහන් කරලා තියෙනවා ස්කෑන් කරලා කොහොමහරි ශ්‍රී පාදයේ හැමදාම සෙනග නැහැ හිටියත් පොලිසියක් ඕකේ නැහැ.උඩ පොලිසියක් නෑ අනෙක් කාලේට පල්ලෙහා හිටියාට හැමපැත්තෙන්ම නගින්න පුළුවන් ඒ ගොල්ලෝ පරීක්ෂණය කරලා තියෙනවා ඕකේ නිල් මැණිකකින් නිම වෙච්චි පතුලක් කියලා ඒ ගොල්ලෝ කියනවා බුදුරාජණන් වහනසේගේ ඒවාගේ ලොකු පතුලක් නැහැලු ආදම්ගේලු තිබුනේ.

ප්‍ර: ආදම් කොහොමද ඉස්ලාම් ආගමට සම්බන්ධ වෙන්නේ ඒක ක්‍රිස්තියානි ආගමේ නේද?

පි: නැහැ.

ප්‍ර: ආදම් සහ හේවා?

පි: හේවා සහ ආදම් කිව්වා ක්‍රිස්තියානි කට්ටිය දෙවියන්ගේ පුත්‍රයා කියලානේ ජේසුස් වහන්සේ ඒ ගොල්ලෝ කියන්නේ අල්ලාහ්ට අල්ලාහ කවුරුවත් ඉපදෙව්වෙත් නැහැ අල්ලාහ්ටදාව කවුරුවත් ඉපදුනේත් නැහැ කියලා එහෙමයි කියන්නේ එතකොට ආදම් පස් වලින් දින 07 ක් පස් අනලා අනලා දින 07 ක් විතර ඊට පස්සේ තමයි ආදම් හැදුවේ කියලා.හැබැයි ස්වර්ගේ මෙහෙමත් තියෙනවා මම ඒක චුට්ටක් කියන්නම් ඒක වටිනා දෙයක් තර්ක කලොත් මුස්ලිම් අය පරදිනවා ස්වර්ගයේ වතුර නැත වතුර අවශ්‍ය නැත දහඩිය දාන්නේ නැහැ නාන්න අවශ්‍ය නැහැ කිසිම දෙයක් නැහැ වන්දන නැහැ මුකුත් නැහැ.වතුර නැහැ මී පැනි ගංගා තියෙන්නේ.

ප්‍ර: ඒ ඉස්ලාම් ආගමේ තියෙන්නේ?

පි: ඉස්ලාම් ආගමේ තියෙන්නේ එතකොට අල්ලාහ් මැටි අනලා මොනවාගෙන්ද හෝද ගත්තේ කියලා අහන්න පුළුවන් මී පැණිවලින්ද කියලා එහෙම තමයි සඳහන් කරලා තියෙන්නේ.එතකොට ආදම්ව මවලා එයා හවුවාව මැව්වේ මෙහෙම ඇනලා ඉල ඇටයක් කඩලා අරගෙනලු හව්වා මැව්වේ.

ප්‍ර: හව්වා කියන්නේ මේ පුද්ගලයෙක්?

පි: නැහැ ගැහැණියව හව්වාරලි තුමිය ආදම් අලෙයි තුමා ආදම් නබිත් කියනවා ආදම් නබි අලෙයි අලි කියලා කියන්නේ එයයි හව්වා අලි තුමියයි ඊට පස්සේ ජීබ්බි අලියා සලන් සහ අල්ලා ජීබ්බි අලිසලම් ස්වර්ගේ හිටියේ අල්ලාහ් හිටියා ජීබ්ලි අලිසලන් හිටියා හව්වා හිටියා

FAIR COMMENT BY JEZEEM

සෙයිතා මැව්වේ ගින්දරවලින්ලු එතකොට ආදම්ට යි හව්වාටයි කියනවාලු අල්ලාහ්ට වදින්න කියලා ඒ දෙන්නා වදිනවාලු සෙයිතාන්ට කියනවාලු උඹ මටත් වැදපන් ආදම්ටත් වැදපත් කියලා නුඹට මා වන්දන්නම් මා මැව්ව නිසා මේ මැටියෙන් මැව්වේ ඒ ආදම්ට වදින් නැහැ මාව ගින්දරට මවලා තියෙන්නේ මන් ඊට වඩා වැඩියි කියලා. ඊට පස්සේ කියනවා අල්ලහ් කියනවා නුඹ මට අවනත වෙන්න ඕනි නැත් නම් මන් නුඹව අරගෙන ආකාශයට දමලා ගැහුවාලු සෙයිතාන්ව අල්ලහ් ඊට පස්සේ බිමට වැටුනාට පස්සේ කිව්වාලු නුඹගේ මේ මැවීම මන් නොමග යවනවා කියලා ඒක අවුතු බිල්ලා හෙග්න සෙයිතා රජෙන් කියලා සෙයිතාන් ඉවත් කරන්නේ ඇගට ආවම රන්වන් ගැන සෙයිතා සෙයිතාන් සෙයිතාන් ඉවත් කරගනින් කියලා තමයි කියන්නේ සෙයිතාන් ඇගට ආවා ඉවත් කරගනින් කියලා තමයි කියන්නේ ඊට පස්සේ ස්වර්ගේ සෑම දෙයක්ම මවලා ගහක් මවලා කිව්වාලු මේ ගහේ ගෙඩි කන්න එපා කියලා. ඊට පස්සේ ඒ ගහේ ගෙඩි කනකොටලු ජිබ්‌ලි අලිසලන් ඇවිත් මෙතනින් අල්ලගෙන උගුරුකැටේ මේක මනුෂ්‍යගේ පිරිමියෙක්ගේ ඉලන්දාරියෙක් වෙන්න මේක තමයි බල්ලෙක් ඉලන්දාරියෙක් වෙනවා කියන්නේ මම මේ වාචා සංවරව නෙමේ තේරුම් කරන්නේ ඒ ගොල්ලෝ මිත්‍යාවක් කරන්නේ මේ බල්ලෙක් ඉලන්දාරියෙක් වුනාම තමයි පිරිමියෙක් ඉලන්දාරියෙක් වුනාම ඒ උගුඇට කැඩිලා සද්දෙ වෙනස් වෙනවා වොයිස් එක වෙනස් වෙනවා බල්ලෙක් ඉලන්දාරියෙක් වුනාම කකුලක් උස්සලා තමයි මුත්‍රා කරන්නේ එතකම් වුහිටගෙන තමයි කකුල් හතරෙන් මුත්‍රා කරන්නේ කකුලක් උස්සන්නේ බල්ලෙක් ඉලන්දාරියෙක් වුනාම මේ ඉලන්දාරි වුනාම තමයි මේ උගුරු ඇටේ කැඩෙන්නේ ඒ ගොල්ලෝ කියන්නේ සෙයිතාන් ඇල්ලුවා මේක එහෙමයි වුනේ කියලා ඒක බොරු මිත්‍යාවයක් ඒක ගෙනියන්නේ ස්වර්ගය ඒ දෙවියන් ඒ ආදම් ඒ ඔක්කෝම මවා ගත්ත දෙයක් ඒ නබි කරපු බොරුවක් මේක.

ප්‍ර: එහෙමයි එතකොට ස්වාමීන් වහන්ස අර ශ්‍රී පාදයත් එක්ක?

පි: ශ්‍රී පාදේ ගෙනිහිල්ලා ඒ ගොල්ලෝ ගි කියනවා බුදුරාජණාන් වහන්සේගේ ශ්‍රී පද්මයත් අනෙක් පද්මය තමයි මක්කා විහාරස්ථානයේ තියෙන්නේ එතින් තිබ්බාට පස්සේ.

ප්‍ර: ඒ මක්කමේ තියෙන?

පි: මක්කමේ තියෙන බුදුරාජාණන් වහන්සේගේ ශ්‍රීපාද පද්මය එතනම ගිහින්ලා අනෙක් පාදයේ තියන්න ඕනි ඒ ගොල්ලන්ට මේක සෞදියෙන් තමයි වියදම් කරන්නේ.

ප්‍ර: ඒ කියන්නේ අපේ ශ්‍රී පාදයේ තියෙන බුදුරාජාණන් වහන්සේගේ ශ්‍රී පාද පද්ම ගෙනිහිල්ලා ඒ ලාංඡනය ගෙනිහිල්ලා ඒ මක්කම තියන්න ඕනි

FAIR COMMENT
BY JEZEEM

කියලා මේ මුස්ලිම් ජාතිකයෝ කියන්නේ එත කොට ස්වාමින්වහන්ස ඒ සඳහා මොකක්ද සැලසුම ?

පි: ඒකේ සැලසුම එතනදි අපි එහේ මසුරා කලා.

ප්‍ර: මසුරා කලා කියන්නේ සකච්ඡා කලා?

පි: ඔව් සකච්ඡා කරලා ඒක ඒකාලයේ හිටියේ ඒ හෙලිකොප්ටර් එකක හැප්පිලා මලේ මන්ත්‍රි හිටියේ ඇමති.

ප්‍ර: අශ්රොක්?

පි: ඔව් අශ්රොෆ් සහ අනෙක් එක්කෙනා මලා ප්‍රසිද්ධ මවුලව් කෙනෙක් හිටියා එයා හිටියේ මාලිගා වත්තේ එයා අසනීපත්වෙලා හෙලිකොප්ටර් එකෙන් තමා ගෙනිව්වේ එයාගේ මොන මවුලව්ද කියනවා මේ මාලිගා වත්තේ මලා මවුලව් කෙනෙක් ප්‍රසිද්ධ කෙනෙක් බුද්ධාගම ගැන එහෙම සිංහලෙන් හොඳට කියන්නේ එයා අන්තවාදි හොද එක්කෙනා ඒ නම එන් නැහැ මට මතකයට.

ප්‍ර: එහෙමයි හොදට බෞද්ධාගම ගැන හොද දැනිමක් තියෙනවා?

පි: හොද දැනිමක් තියෙනවා එතකොට එයත් මේකට සම්බන්ධයි ඒ කට්ටියම ඒකට සම්බන්ධයි ඉන්පසුව ඒක එතන චුට්ටක් රිශාද් බදුර්දින්ලා එතකොට එන කාලේ මේකට .

ප්‍ර: ඒ කියන්නේ මොකට එන කාලේද?

පි: දේශපාලනයෙන් ඇවිල්ලා සාමාන්‍යයෙන් දියුණු වෙන කාලේ .

ප්‍ර: දියුණු වෙල කාලේ තමයි රිශාද් බදුර්දින් මහත්තයා ආවේ?

පි: ඔව් එතන රිශාද් බදුර්දින් නෙමේ මෙයා මේ .

ප්‍ර: අශ්රෝෆ් හිටියා එතන ස්වාමින් වහන්ස.

පි: ඔව් අශ්රොෆ් හිටියා මේයා මේ අරය ප්‍රසිද්ධයි එතකොට .

ප්‍ර: හකිම් ද නැත් නම්?

පි: නැහැ රිශාද් බදුර්දීන් දේශපාලනයේ ෆෝම් වෙලා එන කාලේ. එදා එයා ඒ දෙන්නාම ආවා ඒ මසුරා එකට. ඒ දෙන්නා ඇවිත් තමයි මසුරා එක ඉවර වෙනකොට ඒ ගොල්ලෝ මගදි හම්බුනේ මසුරා ඉවරයි අපි යන කොට එදා මට ඒ ටික කියා ගන්න බැරිවුනා ඊට පස්සේ තමයි ශ්‍රීපාද පද්මේ ගාව තියෙන රක්ෂිතය ගැන දෙමළෙන් කතා කලේ. එතකොට මට දෙමල පොඩ්ඩක් තේරෙනවා අඩුයි. මම ඇහුවා මොකක්ද කියලා මෙහි ඉඩම් තමයි ඊට පස්සේ කිව්වේ නැහැ.තේ ඉඩම එතන ඒක රජයේ තේ ඉඩම තමයි රක්ෂිතයත් එක්ක තියෙන්නේ එතන දැන් සුද්ද කරලා ඒ පල්ලිය ගාව සුද්ද කරලා අල්ලා තියෙනවා ඒක හැටන් එකට ආපහු භාර දුන්නා හැටන් එකෙන් භාර දිලා දුන්නා වරකාපොලට වරකාපොලින් මම ඒක හොයන්න යනකොට ඉතුරු ටික මන් ඒ ශ්‍රී පාද පතුලේ කවදාවත්ම ගලවන්න දෙන්නේනැහැ කියන එක තිරණය කරා මම හරි ඕක උඩට වෙලා ඉන්නවා කියන එක තීරණය මා ගාව තිබුනා මම 17 වතාවක් වන්දනය කරලා තියෙනවා ශ්‍රී පාද පද්මය මම අපේ මාමලාගේ බස් එකේ

ලෝඩ් අරන් යන්නේ මම ඒකාලේ හැමදාම මම ගියොත් ශ්‍රීපාදයට නගිනවා.

ප්‍ර: ඔබ වහන්සේ ඔය සංවිධානයේ ඉන්න කාලයේ?

පි: නැහැ නැහැ ගෙදර ඉන්න කාලයේ. අවුරුදු 20 මම එහෙ මෙහෙ දගලනකාලේ ඕවා හොයන කාලයේ මනෝරි බස් එකේ කොන්දොස්තර කෙනෙක් හිටියේ නැහැ ඉස්කෝලේ ළමයි අරන් යන්නේ මම ශ්‍රීපාද කාලයට ඒ මාමාත් එක්ක ගෝලයාට යන්නේ හරි ආදරයක් තිබුනා ශ්‍රීපාද පද්මයට ඉතින් ඒක ඒ විදියට වරකාපොල දුන්නා ඊට පස්සේ වරකාපොලින් ආපහු දුන්නා හැටන්වලට වරකාපොල එක තමයි අපි ගියේ හැටන් එකත් එක්ක එකතු වෙලා ඊටපස්සේ ආපහු වරකාපොලින් හැටන් එකට භාරදුන්නා නැවත දැන් හැටන් එකෙන් තමයි මේක කරන්නේ මොකද නිවාස යෝජනා ක්‍රමයත් ඔතන තියෙනවා.

ප්‍ර: දැන් හැටන් එකේ තියෙන පල්ලියේන් තමා දැන් මේක කරන්නේ?

පි: මහ මර්කස් සැලසුම් කරලා තියෙන්නේ හැටන් මර්කස් එකෙන් හදලා තියෙන්නේ.

ප්‍ර: ඒ කියන්නේ ඒ ගොල්ලෝ මේක අතහැරලා නැහැ?

පි: අතහැරලා නැහැ ඒකිසිම දෙයක් ඒ ගොල්ලන්ගේ තියෙන එක ශ්‍රී මහාබෝධිය විනාශ කිරීම දළදා මාලිගාව කවුරු මැරුණත් ඒ ගොල්ල විනාශ කරනවා කියන එක තියෙනවා.

ප්‍ර: ස්වාමින්වහන්ස දැන් ඔබ වහන්සේ ශ්‍රී මහාබෝධිය ගැන කිව්වානේ ඔය ශ්‍රී මහ බෝධිය ඉස්සරහා මේ මල් එහෙම විකුණන කඩ තියෙනවානේ?

පි: ඔව් මල් විකුණන පොඩි තට්ටු කඩ තියෙනවා. දැන් අයින් කරලා තියෙන්නේ.

ප්‍ර: එතකොට දැන් ඒ කඩවල් සාමන්‍යයෙන් එවායේ වෙළඳාම් කරනවාද මේ මුස්ලිම් ජාතිකයින්?

පි: මුලින් එහෙම කරගෙන හිටියා දැන් එක පැත්තක් තිබුනා මහින්ද මහත්තයා සඳමිණි සෑය කරන කොට මස් කඩ ඔක්කෝම අයින් කරා සඳමිණි සෑය අටමස්ථානයට අයිති ඉඩම්වල තිබුනු ඔක්කෝම මුස්ලිම් ගම්මාන අයින් කරා අර පොඩි තට්ටුමේවා තිබ්බා ඒවාත් ඔක්කෝම අයින් කෙරුවා. දැන් ඒවා මුස්ලිම් එවා එතන නැහැ.ඒවුනාට එහෙ නැති වුනාට අටමස්ථානය ඇතුලේ පන්සල්වලට අටපිරිකර ඒවා මේවා අට පිරිකරවලට නම් ගොඩක් අඩුයි ඒක වෙනම වෙළඳාමක් දැන්.

ප්‍ර: එහෙයි?

පි: අනික් පිරිකර ගන්න මුස්ලිම් අය යනවා.

ප්‍ර: ඒ කියන්නේ ඒ ගොල්ලන් පන්සල් සමඟ ලඟ සම්බන්ධතාවයක් ඇතිකරගෙන පවත්වාගෙන යනවා කියලා ඔබ වහන්සේ කියන්නේ?

පි: ඔව්.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: හොඳයි දැන් ඔබ වහන්සේ කිව්වානේ ඔය මේ ප්‍රහාර කීපයක් පිළිබඳව දන්නවා කියලා?

පි: ඔව්.

ප්‍ර: එතකොට දැන් එකක් ඔබවහන්සේ කිව්වා පාස්කු ප්‍රහාරය ගැන. දෙවනි එක නත්තල් සමයේ ඒ කියෙන්නේ මොන කාලේ නත්තල්වලට අදාලවද ඒ ප්‍රහාරය ස්වාමීන් වහන්ස?

පි: ඒක ඒ පුද්ගලයා කිව්වේ නත්තල් ප්‍රහාරයේ ඒ ගොල්ලන්ට.

ප්‍ර: මුසම්මිල් කිව්වේ ඉන්දියාවේ හම්බෙව්වි මුසම්මිල්?

පි: එයා කිව්වේ නත්තල් ප්‍රහාරයක් තියෙනවා දින වකවානුවක් කිව්වේ නැහැ දෙසැම්බර් මාසේ දෙසැම්බර් වල කියලා එයා කිව්වේ තලවිල පල්ලියට හෝ මඩු ඔය දෙකෙන් එකක්.

ප්‍ර: නත්තල් කාලේට තලවිල පල්ලියට හෝ මඩු පල්ලියට?

පි: ප්‍රහාරයක් එල්ල කරනවා කියලා.

ප්‍ර: සැලසුමක් තියෙන බව

පි: එහෙම කියලා කිව්වා දේශපාලනයේ මොන තත්ත්වයට

ප්‍ර: ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ දන්නවාද ඒ ඒ වෙලාවේ දන්නවාද නෙමේ ඔබ වහන්සේ මුසම්මිල් එක්ක කතා කරන කොට ඒ වේලාවේ ඒවා පල්ලිවලට ප්‍රහාර එල්ල කිරීම සිද්ධ වෙනවා කියලා කතා කරපු වේලාවේදී ඔය ඉන්දියාවේදී කතෝලික පල්ලිවලටද ක්‍රිස්තියානි පල්ලිවලටද කියන ඒ පිළිබඳව සාකාච්ඡාවක් වුනාද?

පි: නැහැ එහෙම වුනේ නැහැ.

ප්‍ර: සමාන්‍යයෙන් පොදුවේ තමයි පල්ලි කියන වචනය පාවිච්චි කරේ?

පි: ඔව් දැන් මුස්ලිම් පල්ලිවලට ගහන්නේ නැහැනේ.

ප්‍ර: එහෙමයි.

පි: පල්ලිවලට කියලා තමයි කිව්වේ

ප්‍ර: එහෙමයි පල්ලිවලට ප්‍රහාරය එල්ල කරනවා එකක් පාස්කු ඒක මුස්ලිම් වලට අයිති නැහැ. අනික් එක නත්තල නත්තලත් මුස්ලිම් නෙමේ?

පි: ඔව් නත්තලටත් ප්‍රහාරයක් එල්ලකරනවා වාතාවරණය බලලා කිව්වේ.

ප්‍ර: එතකොට ඔබ වහන්සේ කිව්වා තුන්වෙනිව සංඝයා?

පි: ඔව් මහා සංඝ රත්නය විශාල ඝාතනයක්.

ප්‍ර: ඝාතනයක් සමුල ඝාතනය කිරීමට සැලසුම් කරලා තියෙනවා කියලා?

පි: ඔව්.

ප්‍ර: එතකොට ස්වාමීන් වහන්ස වෙන මොනවාද ඔබ වහන්සේට දැන ගන්න ලැබුනේ?

පි: ඊහට ඒ ගොල්ලන්ගේ 2020 මේක 2022 මේකේ අනිවාර්යෙන් 2022, 2020 ඉඳලා 2022 ඇතුලත විශාල ඝාතනයකට තමයි කඩු ඔක්කෝම ලැස්ති කරලා තියෙන්නේ මන් කිව්වානේ කඩු ලක්ෂ 25 ක් පමණ

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ලංකාවට ගෙනාවා කියලා ඒවා පරීක්ෂණවලින් ඔප්පු වුනා කියලා CID එකේ දි කිව්වා.

ප්‍ර: CID එකේන් කිව්වා?

පි: CID එකෙන් කිව්වා පළවෙනි පරීක්ෂණයේදි දෙවනි පරීක්ෂණය කරද්දි පළවෙනි පරීක්ෂණයේ ප්‍රතිඵල අරගෙන ආවා මාරසිංහ මහත්තයා ගාවට පළවෙනි පරීක්ෂණය කලේ පුත්තලමේ අපරාධ විමර්ශණ අංශයෙන්.

ප්‍ර: අර ඔබ වහන්සේගේ පැමිණිල්ල අනුව

පි: ඔව් ඒක එහෙන් කරලා CID එකට මොකකට හරි එවලා එතන ඕ.අයි.සි.මාරසිංහ මහත්තයාගේ එක බැජ් එකේ කරපු ඕ.අයි.සි.මහත්තයා තමයි කිව්වේ ඔබවහන්සේගේ පළවෙනි දේ සාර්ථකත්වය තියෙනවා කිව්වා . මම ඇහුවා මන් ඒ වෙලාවේ කිව්වා පළවෙනි පාර පන්සලත් නැති වුනා ඉන්න තැනකුත් නැති වුනා කියලා පන්සල් ගානේ රෙදි බෑග් එක කරේ දාගෙන හිගන්නෙක් වගේ යන්න වුනා දැන් ජීවිතේත් නැති කරන්න ද හදන්නේ කියලා මාව පාවලා දුන්නානේ එතනදි. ඉන් පස්සේ කිව්වා නැහ ඔබ වහන්සේගේ කටඋත්තර සාර්ථකයි කියලා මැලේසියාවෙන් ලංකාවට ඇවිල්ල තමයි අයුධ තියෙන තැන දන්නවාද කියලා ඇහුවා මම කිව්වා CID එකේ වාර්ථාව අරන් බලන්න කිව්වේ.

ප්‍ර: මොක ද ඔබ වහන්සේ තොරතුරු දුන්න හින්දා?

පි: දුන්නු නිසා එතකොට කඩු ගෙනත්ලා

ප්‍ර: ඒ කියන්නේ ඉබ්‍රහම් හජ්ජියාර් විසින් ආනයනය කරන ලද කඩු ගැන ඔබ වහන්සේ කිව්වේ.

පි: නැහැ ස්මයිල් හජ්ජියාර් විසින් එතකොට ඒවා මැලේසියාවෙන් ලංකාවට කඩු ලක්ෂ 25 ක් අවිල්ලා තියෙනවා කියලා ඒ ගොල්ලන්ට වාර්ථාවේ බුද්ධි තොරතුරු ලැබිලා තියෙනවා කියලා ඒ මහත්තයා කටින් ඒ වෙලාවේ කිව්වා මාරසිංහ සර් ඉස්සරහ පිට කිව්වේ ටයිප කරපු මැඩම් හිටියා එතන 4,5 දෙනෙක් ඉන්නැද්දි ඒ ගොල්ලෝ කිව්වේ ඔබ වහන්සේගේ මේ හමුදුරුවන්ගේ සාර්ථකත්වයක් තියෙනවා කටඋත්තරේ.

ප්‍ර: ඔබ වහන්සේට මතකයක් තියෙනවා නම් විතරක් කියන්න ඔය මේ ඉස්මයිල් හාජ්ජියාර් විසින් ඒ කඩු ලංකාවට මැලේසියාවෙන් ආනයනය කරපු කාලය වෙන කොට වරාය භාරව හිටියේ කුමන අමාත්‍යවරයෙක්ද කියන එක?

පි: ඒක මතක නැහැ අමාත්‍යවරයා මතක නැහැ බැසිල් රාජපක්ෂ මහතා මහින්ද මහතාගේ රජය කාලේ ගරු බැසිල් රාජපක්ෂ මහත්තයා හිටියේ ගම්පහ දිස්ත්‍රික් භාරව හිටපු කෙනා ඉස්මල් හාජ්ජියාර් ගම්පහ දිස්ත්‍රික් මුදල් කටයුතු කරපු කෙනෙක් මේ ෆොන් එකේ තියෙනවා මං වුට්ටක්

FAIR COMMENT — BY JEZEEM

බලන්නද ඉස්මායිල් හාජ්ජියාර්ගේ තනතුර මේකේ පොටෝ එකක් තියෙන්නේ.

ප්‍ර: එහෙමයි.

පි: මට ටිකක් පේනවා අඩුයි.

ප්‍ර: ස්වාමීන් වහන්ස ඒ කාලේ රේගුව භාරව හිටිය අමාත්‍යවරයා ඔබ වහන්සේට මතකද?

පි: මතක නැහැ.

ප්‍ර: ඒ කියන්නේ ස්වාමීන් වහන්ස ගම්පහ දිස්ත්‍රික්ක මුස්ලිම් සංවිධානයේ භාණ්ඩාගාරික අල්ලාජ් එම්.එම්.ඒ.ස්මයිල් මහතා?

පි: ඔව්. එයා තමයි මේ බැසිල් සර් එක්කලා තඹ මේවා කරලා මේ ලංකාවට මේ බැසිල් මහත්තයා මේ සම්බන්ධ නිසා කිසිම දෙයක් වෙක් කලේ නැහැ. මොකද යකඩ බරට තමයි මේ තඹ ගියේ.

ප්‍ර: යකඩ බරට තඹ ගියේ ලංකාවෙන් අපනයනය කරලා ?

පි: ලංකාවෙන් පිටරටට අපනයනය කරලා .

ප්‍ර: මොන රටටද ස්වාමීන් වහන්ස?

පි: මැලේසියාවට.

ප්‍ර: මැලේසියාවට ලංකාවෙන් තඹ බරට

පි: තඹ කිලෝ එකක් රුපියල් 550 යි යකඩ කිලෝ එකක් රු. 60 එතකොට යකඩ කිලෝ එකේ රුපියල් 60 බද්ද තමයි ලංකාවට අවේ. ට්‍රාන්ස්පෝට් එකට ඒක තමයි මෙතන කරපු හොර වැඩේ මෙතන මේ ගොල්ලෝ ඒක සහසුද්දෙන් ඉස්මයිල් හජ්ජියාර්ගෙන් අපි ඒක දැන ගත්තා ඒක වරායෙනුත් දැන ගත්තහැකි ලංකාවේ තඹ 250 ක් මනුස්සෙයක් වික්ක නම් පතුරම් කොපුවලට හැර ඒ සියළුම ස්මයිල් හාජ්ජියාර් වෙත ආවේ ඒවා හතරැස් පෙට්ටිබවට ඒවා ටැංකියක් හරිගස්සලා ලොකු මේවා එකින් කොටලා තමයි බේල් කරලා තමයි කන්ටේනර් වලට ගැහුවේ ඒ කන්ටේනර් යාර්ඩ් එකට තමයි කන්ටේනර් 7 ම ආයුධ ගෙනාවේ.

ප්‍ර: ඔබ වහන්සේ ඒක දැක්කා?

පි: ඔව් ඒ කන්ටේනර්වල තඹ යැව්වේ තඹ යකඩ ඔක්කෝම යැව්වේ ඒකේ තමයි කන්ටේනර් යාඩ් එකේ බඩු ආවේ ගියේ ඒකට තමා මේ බඩු ගෙන්නුවේ ඒක තමයි මේ යාඩ් ඒකේ තඹ ගෙනත්ලා ලොරිවලින් බානවා මේ පෙට්ටියත් වගේ එකට දාලා තලලා තලලා ඒවා බේල් කරලා ඔක්කෝම කන්ටේනර්වල ටැංකිවලට දාලා සීල් කරලා ඒවා මොනවාද කියලා වරායෙන් බැලුවේ නැහැ ඒවායේ ප්‍රවාහනය කෙරුවේ මන් කිව්වනේ යාසිම් හජ්ජියාර් කියලා.

ප්‍ර: ඇයි ඔබ වහන්සේ කියන්නේ වරායෙන් ඒවා බැලුවේ නැහැ කියලා කොහොමද ඔබ වහන්සේ දන්නේ?

පි: ඒ ටීම් එකේ හිටපු කට්ටිය අපේ හොදම යාළුවෝ කිසිම දෙයක් වෙක් කලේ නැහැ කියලා ඒ ගොල්ලෝ කියනවා.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ වහන්සේ ඒ ගොල්ලන්ගෙන් දැන ගත්තා?

පි: මේ අපි සංවිධානයේ අමිර් කෙනෙක් කියන්නේ ඕනම රහසක් අපි අතර මහානායකත්වය තිබුනාට රහස් නැහැ අපි අතර ඒ ගොල්ලත් කරන්නේ හොරෙන් පොල් කැඩිල් අපිත් කරන්නේ හොරෙන් පොල් කැඩිල්ල දෙගොල්ලෝම කරන්නේ හොරෙන් පොල් තමයි පොල්ම තමයි කඩන්නේ ඒ ගොල්ලන් හිතන්නේ අපි පොල් නෙමේ ඔක්කෝම කරන්නේ මේ රට ඇල්ලිම මුස්ලිම් කොහොම නැග්ගත් ඔක්කෝම එකම ගහේ තමයි නගින්නේ එකම දේ තමයි කරන්නේ. ඒ වගේ අපි අතර අර මහා නායකත්වය දේවල් අපිට දෙන්න අර ස්මයිල් අසරත් කියන්නේ ලංකාවේ ඉන්න ප්‍රධාන නායකයා භාෂා ව24 කින් කතා කරන්න පුළුවන් දරුවෝ 21 ඉන්නවා පවුල් 4 යි ඔක්කෝම දරුවෝ එයා කියන්නේ සාලි හාන් කියලා ඔක්කෝම මවුලවිලා හාෆිස්ලා උලමාවරු ඒ වගේ මහා ඉහළ තත්ත්වයේ ඉන්න කෙනෙක් මෙයා භාෂා 24 ක් ලෝකයේ තියෙන සියළුම භාෂා කිව්වොත් නිවැරදියි එයා තමයි විශේෂ නායකයා මොකද එයා..

ප්‍ර: අර කිලිටු වගේ ඇදගෙන?

පි: කිලිටු වගේ ඇදගෙන ඉන්න පුංචි මනුස්සයා කිලෝ 35 වක්වත් බර නැතිව ඇති කුඩයක් කිහිල්ලේ ගහගෙන පරන බෑග් එකක් කරේ දා ගෙන ඉන්නේ මහානායකත්වයට විතරයි මුලස්ථානවලට ගිහිල්ලා දේශනා කරන්නේ. ලංකාවේ නෙමේනේ සෞදි අරාබියට ඉස්ලාම් ආගම ගියේ. සෞදි අරාබියට යන්න ඕනි නැහැ ඉස්ලාම් ධර්මේ දේශනා කරන්න සෞදි කියන්නේ තනිකරම මුස්ලිම් රාජ්‍යයක් ඒකට දේශනා කරන්න යන්න විදිහක් නැහැ එහෙනම් එයා සෞදි යන්නේ මොකටද එයා පකිස්ථාන් යන්නේ මොකටද ඒ ගොල්ලෝනේ මෙහෙ ඇවිල්ලා කියලා දෙන්න ඕනි ලංකාවේ මුස්ලිම් වෙච්ච අය වගේනේ ඉන්නේ. මෙයා ලෝකේම ගිහිල්ලා මේවා කරනවා මේ ලංකාවේ නායකයෝ පමණයි මෙයා හම්බෙන්නේ. උලමාවරු මුණ ගැසෙනවා ඒ වගේම දැන් මල්වාන,පූගොඩ කුමාරිමුල්ල ඔය තියෙන මර්කස් එකට අයිති පලාතෙම තියෙන අමිර්ලා විතරයි ජුම්මා රාත්‍රියට ඇවිල්ලා එදාට අපිව පිටත් කරනවා මේ අපිව තියා ගන්නේ එතකොට ඒකේ.

ප්‍ර: එතකොට ඔබ වහනසේ වෙන ආගමකින් ආපු මවුලවි කෙනෙක් හින්දාද?

පි: නැහැ එහෙම නැහැ ඒක ඒ ගොල්ලෝ එහෙමත් එතන තියෙනවා විශේෂ දේවල් අපිට දෙන්නෙ නැහැ. මේකේ ඒරියා පුරුප්පුල විතරයි ඉතිරිවෙන්නේ. 19 නායකයෝ විතරක් මොක ද එහෙම ඉඩ පාඩු මදි වෙනවා සාකාච්ඡාවට මොකද අනික් තැන්වල නම් එකම විෂයන් අපි 7 දෙනා 7 දෙනා සියක් හිටියත් අපි තැන් තැන් වල රොක් වෙලා කරනවා මේකේ එයා මුලිකත්වයෙන් කරන දේශනාවක්. ඒ පිටරට තියෙන ඒ දේවල් තමයි මෙයා එහේ ගිහිල්ලා කේලාම් කියලා ඔක්කෝම කරලා

FAIR COMMENT BY JEZEEM

තමයි මේ එන්නේ තනිකර කේලමා කියලා තමයි අපි නම දාලා තියෙන්නේ අර ආමි එකේ තියෙන්නේ අර චුටි හෙලිකෝප්ටර්ය ඇවිල්ලා පණිවිඩ කියන කොට කේලමා කියලානේ කියන්නේ ඒ වගේ මෙයත් කේලමා තමයි.මෙයා තමයි නායකත්ව දෙන්නේ තබ්ලික් එකේ මම දන්න තබ්ලික් ජමාත් එකේ ප්‍රධාන නායකයා මේ පුද්ගලයා තව එක්කෙනෙක් ඉන්නවා කල්පිටියේ ඉන්නේ මෙයා චුටි මධුර සා එයාගේ ඇස් පේන්නැහැ .

ප්‍ර: චුටි?

පි: චුටි මධුරසා ඉන්නේ මෙයාගේ ඇස් දෙක පේන් නැහැ කළු මහත පුද්ගලයෙක් හරියට ඒයා පූගොඩ උසාවියේ හිටිය වැලිවේරියේ හිටපු නඩුකාරතුමාගේ හැඩ රුව තියෙන්නේ එයාට ඒ කළු මහත.

ප්‍ර: ඒ කියන්නේ ඔබ වහනසේට නඩු තියෙන අවශ්‍යතාවේදි ?

පි: ඒ නඩුකාර තුමාත් එයාගේ රූපේමයි.කසාද 4 ක් බැඳලා ඇස් දෙක පේන් නැහැ. රතගාල කුරුවානක නිකසන් මධුරසා එකේ වෙනම ඉන්නවා මවුලවිලා උගන්වන්නේ එයා මේකේ නිකම් ඉන්නේ. රටට පේන්නේ එයා තමයි ලංකාවේ මැප් හදන කෙනා.

ප්‍ර: ඇස් පේන් නැතිව?

පි: ඇස් පේන් නැහැ ඒක තමයි කියන්නේ දක්ෂතාවය.

ප්‍ර: කොහොමද මැප් හදන්නේ ස්වාමින් වහන්ස?

පි: මේ රට ඇල්ලිමේ මැප් එක හදන්නේ එයා.

ප්‍ර: ඔබ වහන්සේ කොහොම ද දන්නේ?

පි: මම කල්පිටියේ මාස 6 ක පුහුණුවක් ලැබුවා මුල්ම පුහුණුව මම ලබන්නේ කල්පිටියේ.

ප්‍ර: ඒ කියන්නේ ?

පි: ආගමට ගිය දවස්වල 2003,2004 වගේ 2004 වගේ මම පුහුණුව ලබන්නේ මාස 6 ක් ඒ පුහුණු ලබන කාලේ ඊට පසසේ මම අමීර් කෙනෙක් වශයෙන් එහේ ගිහින් දුපත් ඔක්කෝම මේවා කරලා දූපත් දෙපාරක් මම ගියා.

ප්‍ර: නම කොටලා එහෙම ඔබවහන්සේ?

පි: ඔව් නම එහෙම කොටලා ලාෆිර් කියන පොලිස් නිලධාරියා රථවාහන අංශයේ ගිහිල්ලා මම කිව්වේ අර බිලා වගේ ඩෙරප් වගේ එක්කෙනෙක් ඉන්නවා කියලා එයා එයා කොයිවෙලාවෙත් අරක්කු මතේ ඉන්න කෙනෙක් වගේ බිලා වගේ ඉන්නේ එතකොට ඒ පුද්ගලයා ඒ මසුරා එකට ගියා චිල්ලා ජමාත් ගියා මාස 6 ක වෙනම ට්‍රෙනින් එකකට ගියා ඔය දූපත්වල මම ට්‍රෙනින් වලට ගියේ නෑ. රතු පල්ලිය, කාටු පල්ලිය කොලනි පල්ලි ,කුරුඳන් පිටි පල්ලි,කන්දකුදි පල්ලි, ඔය පල්ලි ටිකේ තමයි වැඩ කලේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ වහනසේ කියනනේ රජයේ සේවකයන් වශයෙන් වැඩ කෙරුවාට දැන් ඔය වගේ නිලධාරින් ඔය අන්තවාදී දේශනාවලට සහභාගී වෙනවා ඔය ඒ ක්‍රියාකාරම් වල යෙදෙනවා කියලා.

පි: ඔව්.

ප්‍ර: ඒ ඇරෙන්න ඔබ වහන්සේ දන්න වෙනත් ඔය අන්තවාදී කටයුතුවල යෙදෙන වෙනත් සමාජයේ මිනිසුන් කෙරෙහි බලපෑමක් ඇති කරන්න පුළුවන් ආකාරයේ වෙන චරිත තිබෙනවාද ඔබ වහන්සේ දන්න දේශපාලන හෝ නැත්නම් අධ්‍යාපනය පැත්තෙන් හරි ?

පි: මෙහෙම දෙයක් තියෙනවා මේකට සුසයිඩ් වුනා නාරාහේන්න පිට එයා මැරුනේ බෝම්බයකට මේවා වෙලා එයා බුද්ධි අංශයේ හිටියේ ආමි එකේ මුස්ලිම් මුතාබ්ලිප් මොකක්ද එකක් එයාගේ නම මුතාජ්ජිත් හරි මුතාජ්ජිත්.

ප්‍ර: මුතාලිබ්?

පි: මුතාබ්ලි එයා බුද්ධි අංශයක් බිහි කළා. මේක සිදු කලේ ට්‍රෙනින් එක දුන්නේ ට්‍රින්කෝ කින්නියා වැල්ලවනම් කියන ගමේ පල්ලියේ තමයි මෙයා ට්‍රෙනින් කරේ එතකොට මෙයා මුතාලිෆ් එයා ලංකාවේ ආමි එකට මෙහෙන් හිත දිනාගෙන මම මෙහෙන් කරපු රගපෑම තමයි එයා කලේ මේ පැත්තේ හිත දිනාගෙන ඒ පැත්තට වැඩ කලා ඒ පැත්තේ හිත දිනාගෙන හොයාගෙන ඇවිල්ලා අපේ රටට මා සේවයක් කරන මගේ සේවය තමයි එයත් කලේ මෙහි අල්ලගෙන ආමි එක අල්ලගෙන මෙවා කරන මෙකේ දක්ෂතාවය කරන ඒකට ටිම් එකක් හැදුවා එතකොට එයා මෙන්න මේක සම්බන්ධයක් තියෙනවා. මේක රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ බටලන්දේ සම්පුර්ණ මිනිස් ඝාතනය කලේ මුස්ලිම් ටිම් එකක් දාගෙන එතකොට මම මේ සංවිධානයේ නැහැ ඒ කාලේ එතකොට.

ප්‍ර: එත කොට ඔබ වහන්සේ දැන ගත්තේ කොහොමද?

පි: බියගම කලාපයේ මේ සංවිධානයේ ඇතුලේ අපිට දැන් එකම පවුලක කට්ටියක් වගේ තමයි දැන් ඔය කතා කරලා මසුරා ඉවරවුනාම ඇත අතීතයේ යනවා තමන්ගේ පුද්ගලික ජීවිත කතා .

ප්‍ර: ඔක්කෝම දේවල් පිළිබඳ සාකච්ඡා කරනවා?

පි: සාකච්ඡා වෙනවා අපි වැඩි පුර පැයක් හමාරක් ඉන්නවා යන්න එන්න වෙලාවක් කියන්නේ ඒකට ගියාම වෙන රාජකාරියක් නැහැ එදාට ඒ වගේ කතා කරනවා බටලන්දේ මිනිස් ඝාතනය කරේ මුස්ලිම් ටිම් එකක් දාලා. ඒකට පාතාලේ හිටපු කෙනෙක් මලා මේ තඹුත්තේගම දිහා මන්ත්‍රිවරයෙක් මලා නේද විශාල ගහක හැප්පිලා වාහනයක්

ප්‍ර: සුරියආරච්චි ශ්‍රී පති සුරියආරච්චි?

පි: ඒ එතන මලා නේද මුස්ලිම් පුද්ගලයෙක් මලා හරි බෙරුනා හරි එකේ ඉදලා ඊ ළඟට සොත්ති උපාලිත් එක්ක හිටපු කෙනෙක් ඉන්නවා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මල්වානේ එයාගේ නමනම් මට මතක නැහැ එයා මලා ඒයාවත් වෙඩි තියලා මැරුවේ ඒ පුද්ගලයගේ ටිම් එක 6 දෙනෙක් දාගෙන තමයි සිංහල මිනිසුන්ව ඝාතනය කලේ ඒකේ විඩියෝ එක සහ කන්ට්‍රෑක් එක තිබුනා ඔය මුතාලිබ් කියන පුද්ගලයා ගාව එයාගේ අතින් තමයි කන්ට්‍රක් එක දුන්නේ එයා ගාව මේකේ CD එක තියෙනවා ඒක තියෙනවා මුස්ලිම් අය අතේ රනිල් මහත්තයාව නටවන්නේ මේ පාස්කු ප්‍රහාරයේ නැටෙව්වෙත් මන් ඒක ගෝඨාභය මහත්තයාට දෙන්න හිටපු කරුණු තමයි මට පියතුමා කිව්වා මේ අපේ සර්ලාට සම්පූර්ණයෙන් මේක දෙන්න කියලා. රනිල් මහත්තයාව නැටෙව්වේ රනිල් මහත්තයා නායකත්වය දාලා යන්න කැමතියි රනිල් මහත්තයාව චම්පික රනවක මහත්තයා ඩොක්ටර් රාජිත මහත්තයලා.

ප්‍ර: රාජිත සේනාරත්න මහත්තයා?

පි: ඔව් රාජිත සේනාරත්න මහත්තයා එතකොට බියගම කලාපයේ ඉදිකරන කාලේ හරි ඔය වගේ කාලේක තමයි රනිල් මහත්තයා දේශපාලනයේ චුට්ටක් ඉහළට ආව කාලේ ඒ කාලේ කන්ට්‍රක් එකට අනික් කට්ටිය දැන් ජීවතුන් අතර නැහැ රනිල් මහත්තයාත් සහභාගි වෙලා තියෙනවා රනිල් මහත්තයාව බ්ලැක් මේල් කරලා තමයි රිශාඩ් බදුර්දින්ලා ඔය ටිම් එකම යු.ඇම්.පි. නටාගෙන හිටියේ කඩු අහුවේගෙන යද්දි ඒවා නතර කරලා ඔක්කෝම අන්තිමට නඩු ටික හිරේ ගියා මිනිසුන් ගෙදර ගියා ඒකනේ වුනේ

ප්‍ර: දැන් ඔබ වහන්සේ කිව්වානේ අර මේජර් මුතාලිෆ්ගේ ට්‍රේනින් එක ගැන එම පුහුණු වීම ඔබ වහන්සේ කිව්වා ලංකාවේ.

පි: ඒකට ඉන්නවා තවුහිත් තවුහිද් කියලා කෙනෙක් එයා කහටඕවිට පල්ලියේ හිටපු මව්ලවි කෙනෙක් එයා බුද්ධි අංශයේ කෙනෙක් එයා ටික කාලයි ඒකේ හිටියේ

ප්‍ර: තවුහිද් එකේ බුද්ධි අංශයේද නැත්නම් ලංකාවේද?

පි: නැහැ මෙයාගේ නම තවුහිද් .

ප්‍ර: තවුහිද් හිටියේ ශ්‍රී ලංකාවේ ?

පි: එයාගේ බුද්ධි අංශයේ හිටපු කෙනෙක් මෙයාගේ

ප්‍ර: රාජ්‍ය බුද්ධි අංශයේ?

පි: මම ආගමට ගිය දවස්වල තමයි මෙයා කහටෝවිට පල්ලියේ හිටියේ ඊට පස්සේ මම කහටෝවිට හිටියාට පස්සේ මගෙන් ඇහුවා තවුහිත් හිටියාද කියලා පල්ලියේ මම කිව්වා තවුහිත් හිටියා පල්ලියේ ලංකාවත්තේ පල්ලියේ කියලා අපේ අම්ර් කෙනෙක් ඇහුවේ ඒ තවුහිත් අපේ බුද්ධි අංශයේ පුද්ගලයෙක් තමයි කිව්වා. මම ඇහුවා බුද්ධි අංශයේ කවුද ඉන්නේ කියලා අපිට අහන්න තහනම්. ඊට පස්සේ ඔයා ආගමට ඇවිල්ලා කොහේද හිටියේ කියලා මම කිව්වා කහටෝවිට හිටියේ කියලා ඒ ගොල්ලෝ දන්නවා මම ආගමට ආවේ ඒවා ඔක්කෝම වාර්ථා හොයලා

FAIR COMMENT BY JEZEEM

තියෙන්නේ මම ඒකට බැඳෙන කොට ඔක්කොම හොයලා ඉවරයි මගේ දෙමව්පියෝ කවුද සහෝදරයෝ කවුද මගේ ඔක්කෝම හොයලා ඉවරයි. ඒ විදියට ඒ ගොල්ලෝ පරික්ෂා කරලා ඉවරයි එ ගොල්ලෝ පරික්ෂණ කරලා තමයි මෙවා දෙන්නේ

ප්‍ර: පරික්ෂා කරලා ගත්තා කියලා කිව්වානේ?

පි: මෙතැන්ට ගත්තේ පරික්ෂා කරලා තමයි සහෝදරියෝ පරික්ෂා කරලා ඔක්කෝම කරලා තමයි ගත්තේ මගෙන් ඇහුවා තවුපික් කියලා කෙනෙක් හිටියාද කියලා මං කිව්වා ඔව් කියලා. ඒ පුද්ගලයා බුද්ධි අංශයේ හොඳ වැඩකාරයෙක් මුතාලිෆ් තමයි ට්‍රේනින් කරලා තියෙන්නේ සාමාන්‍යයෙන් 50 ක් වගේ ට්‍රේනින් කරලා තියෙනවා .

ප්‍ර: එයා ඉන්නවාද දැන් තවුපික්?

පි: තවුපික් ඉන්නවාද නැද්ද දන්නේ නැහැ ටික කලක් ඒ පල්ලියේ හිටියා දත් බොල්ලෑ පුද්ගලයෙක්.

ප්‍ර: ඔබ වහන්සේ වෙන මොනවාද ඒ පුහුණුවිම් කෙරුව යම් ස්ථානයක් ගැන ඔබ වහන්සේ කිව්වානේ ?

පි: ඔව්

ප්‍ර: එම ස්ථානය නැවත කියන්න පුළුවන්ද?

පි: පුළුවන් .

ප්‍ර: ඒ කොහේද?

පි: මේක කින්නියා වැල්ලවනම් කියන වැල්ලවනම් කියන්නේ දෙමලෙන් වැල්ලවනම් කියන්නේ සුදු වැල්ල කියන එක ඒ සුදු වැල්ල කියන ගමේ ප්‍රධාන පල්ලිය තමයි මේ ගොල්ලෝ කරලා තියෙන්නේ කෙන්නියා වයිනාබ්බි කින්නියා.

ප්‍ර: මොකක්ද කරපු පුහුණු විම?

පි: පුහුණු විම බුද්ධි අංශයේ.

ප්‍ර: බුද්ධි අංශයේ කටයුතු පිළිබඳව පුහුණු විමක් කෙරුවා ඒ මොන පරමාර්ථයෙන් ද කරලා තිබ්බේ කියලා ඔය සාකච්ඡාවලදි දැනගන්න ලැබුනාද?

පි: ඒ කට්ටියව අරගෙන ඒ කට්ටියව ආරක්ෂක අංශවලට යොමු කරනවා රාජ්‍ය අපි කියමුකෝ ආර්.එම්.බි එකේ මම කිව්වානේ මැඩම්ට මුලින් අපිට දේශනාකරපු ශාපිහුසේන් සි.අයි.එස්.එකේ මුල් අවදියේ අපිට සුරා කියන සුරා කියන්නේ කුරානේ තියෙන්නේ කුල්අල්ලාහු,හත්අල්ලාහු සමාධි,යම්වලත්,වලාමියත් කුන්පුවාන් හත් අපේ ගථා වගේ අපේ ඉතිපිසෝ ගාථාව වගේ ලොකු සූරා පොඩි සූරා කෙටි සූරා තියෙනවා එතකොට ඒවා පුරුදු කරපු කෙනා තමයි මම සති 4 , 5 , යන්න මට ගෙදරින් කිව්වා පුරුදු පුහුණු වෙන්න ඒ ගොල්ලන්ගේ වයිෆ් හොදට ඉගෙන ගත්ත කෙනෙක් එයාට හොදට සිංහල පුළුවන්නේ ඔයා ගෙදර ගිහින් හොදට ඉගෙන ගන්න මෙහේ එන්න එපා කියලා ඊට පස්සේ මම

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගෙදර තමයි මම පුහුණු වුනේ ඒ පුද්ගලයා මට හිතෙනවා ඔය තත්ත්වයට පත්වුනේ මොකද මේ ආර්.එම්.බී එකේ ලයිසන් එකක් මෙව්වා කරලා ඔය තත්ත්වයට දියුණු වෙන්න බැහැ.මෙයා බුද්ධිමය තොරතුරු මොනවා හරි මෙයා දෙනවා මෙයා විශේෂ පුද්ගලයෙක් හොඳට ඉංග්‍රිසි පුළුවන් හොඳට ඉගෙන ගෙන තියෙනවා ඉංග්‍රිසි පුළුවන් මෙයා සිංහල විදියට තමයි හැසිරෙන්නේ එයා මුස්ලිම් කියන්න බැහැ අයිඩින්ටි කාඩ් එක දැක්කොත් තමයි මම ශාපි හුසේන් කියලා දන්න නිසා මට හඳුන ගන්න පුළුවන් මෙයා ඒකයි මල්වානේ දෙහිවලට ආවේ .

ප්‍ර: බැලූ බැල්මට කියන්න බැහැ මුස්ලිම් කියලා?

පි: මුස්ලිම් කියලා කියන්න බැහැ සිංහලයින් අතර ඉන්න අමුතුම චරිත මේවා ඒ කියන්නේ ලගින් ගියොත් ඇහැක් නැහැ මේගොල්ලන්ගේ ඒ තරම් තත්ත්වයට පත්වෙලා තියෙන්නේ මිනිහෙක්ගේ දිහා බැලුවාම ඒ ගොල්ලන්ට කියන්න පුළුවන් මේ පුද්ගලයා මේ විදිය කියලා.

ප්‍ර: එතකොට මේ බුද්ධි අංශයේ ඔවුන්ව පුහුණු කිරීමේ පරමාර්ථය වුනේ අපේ හාමුදුරුවනේ?

පි: රාජ්‍ය ආයතනවලට රිංගවීමනේ

ප්‍ර: රාජ්‍ය ආයතනවලට රිංගවීමේනේ ඒ කියන්නේ බලය අල්ලා ගැනිම සඳහාද?

පි: ඒ කියන්නේ මේ තැනකට සාමාන්‍යයෙන් ආවා කියමුකෝ මෙතැන තියෙන දේවල් ඒ ගොල්ලන්ගේ අවශ්‍ය කරන පුද්ගලයින්ට තොරතුරු ලබා දිම.

ප්‍ර: ඒ සඳහා දෙන පුහුණුව තමා?

පි: මම ඇතුලේ ඉන්නැද්දින් වරායේ මන් කිවේ සිදුවිම මේ විදියයි යකඩ බරට මේවා ගියා ඒකත් මේ විදයට තමයි මිත්‍රයන්ගෙන් දැන ගත්තේ මන් හිතන්නේ කස්ටම් එකේ ඉන්නවා මේගොල්ලන්ගේ බුද්ධි අංශ රාජ්‍ය ආයතන සියල්ල බුද්ධි අංශ යොමු කරනවා.

ප්‍ර: තවුපික් හැරෙන්න ස්වාමීන් වහනසේ ඔබ වහන්සේදන්න විදියට ?

පි: නැහ ඒක සංවිධානයෙන් කියපු කෙනා තමයි නම අනෙක් අය සාමාන්‍යයෙන් සැකයක් තමයි හිතා ගන්න පුළුවන් විෂයන් ඇතුලේ හිටපු නිසා හිතා ගන්න පුළුවන් මේ පුද්ගලයා මේ ආකාරයේ මේ ආකාරයේ කියලා මට අපේ අමිර් කියන කෙනෙක් තමයි මෙහෙම තවුපික් කියලා කෙනෙක් මතකද කියලාද ඇහුවා ඔව් දත් බෝල්ලෑ බුද්ධි අංශ කෙනෙක් එයා කලයි ටික කලයි පල්ලිවල ඉන්නේ ඒ පල්ලිවල ගම්මානවල යන අයත් ඉන්නවා රාජ්‍ය ආයතනවල යන අයත් ඉන්නවා පාරේ නිකම් රස්සාවක් නැතිව පාරේම ගමන් කරන අය ඉන්නවා කොයිවෙලාවෙත් ගමන් කරනවා හැම තැනම ඒ ගොල්ලන්ගේ වියදම් ඒ ගොල්ලන්ට හම්බෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ වහන්සේ දන්නවාද මේ වර්ථමානයේ ඔය ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන කවුරු හරි නිලධාරින් ඉන්නවාද ඔය වගේ පුහුණු වීම් කරන මේ මුස්ලිම් පුද්ගලයින්ව ඔය අන්තවාදී කටයුතු සම්බන්ධව රාජ්‍ය අංශ ත්‍රිවිධ හමුදාවේ,පොලිසියේ, ආරක්ෂක අංශවල ඉන්නවාද ඒ වගේ අය?

පි: එහෙම දන්නේ නැහැ අර කියපු පුද්ගලයා ඇරෙන්න වෙන කෙනෙක් මට එහෙම දන්නේ නැහැ.

දැන් වේලාව:4/40

මෙතැන් සිට:ල/ලේ සවිනි මධුෂිකා මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන්:- ල/ලේ වන්දිමා මෙනවිය.
මෙතැන් සිට:- ල/ලේ සචිනි මෙනවිය.
වෙලාව:- පස්වරු 5.05

කෙටි විවේකයෙන් පසු නැවත කොමිසම රැස් වෙයි.
ප්‍රතිඥා දී නැවත කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය විසින්.</u>

ප්‍ර: ස්වාමීන් වහන්ස කෙටි විවේකයට පෙර ඔබ වහන්සේ මේ ගරු කොමිෂන් සභාව දැනුවත් කර සිටියා අන්තවාදී සංවිධානයට අදාළව යම් යම් මතවාද ප්‍රචාරය කරන ඒ වගේම ඒ සඳහා ඉතා ක්‍රියාකාරී විදියට සහභාගීත්වය දක්වන උදව් සපයන පුද්ගලයින් පිළිබඳව , ඒ වගේම ඔබ වහන්සේ කිව්වා අර එක පුද්ගලයෙක්ගේ නමක් සඳහන් කරන්නන් කියලා, ඔබ වහන්සේව පුරුදු පුහුණු කරපු ?

උ: ක්‍රිෂාර් මහරුජ්.

ප්‍ර: යාසීම් හජ්ජියාර් සමඟ හිටපු කෙනා ස්වාමීනි, අර අවි අයුධ භාරව හිටපු එක්කෙනා කියලා කිව්වේ?

උ: රිෂාම් මහරුෆ්.

ප්‍ර: රිෂාම් මහරුෆ් ඔහුගේ නම?

උ: ඔව්.

ප්‍ර: ඔහු පදිංචි කොහේද ස්වාමීනි වහන්ස?

උ: මෙයා විවාහ දෙක තුනක් තියෙනවා. විවාහ දෙකක් ද කොහේ ද මෙයාගේ තියෙනවා. මැලිතියන් ගබඩාව තියෙන්නේ කොහේද කොළඹ, ඔය වැල්ලම්පිටියෙන් එහෙන් එන කොළඹ ප්‍රදේශයේ තමයි එයාගේ.

ප්‍ර: මාලිගාවත්ත නෙමෙයි ස්වාමීන් වහන්ස?

උ: නෑ. මාලිගාවත්ත නෙමෙයි.

ප්‍ර: අංගොඩ නෙමෙයි?

උ: නෑ.

ප්‍ර: කොළොන්නාව නෙමෙයි.

උ: නෑ.

ප්‍ර: කොස්ගස් හංදියත් නෙමෙයි?

උ: නෑ.

ප්‍ර: අඹතලේ නෙමෙයි?

උ: නෑ. ඒ පැත්ත නෙමෙයි. අයිඩී නෑ.

ප්‍ර: අයිඩී එව්?

උ: අයිඩීඑව් තමා. අයිඩීඑව් එකේනේ අර ගිනිගත්තේ මැලිතියන් ගබඩාවක් ගිනි ගත්තා. අන්න ඒ කාලෙ තමයි දැනගත්තේ. කොළඹ පැත්තෙන් යන්න බෑ.ගඳ ගැහුවා. මැලතියන් ගබඩාවක් ගිනි අරගෙන.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: අයිඩීඑච් එකේ තමා පදිංචිය?

උ: අයිඩී එච් එකේ පදිංචියක් තිබුණා. දැන් කොහේ ඉන්නවද කොතන ඉන්නව ද මොකද මේ පුද්ගලයෝ දැන් සහරාන් සහරාන්ගේ මල්ලි එහෙම එක තැනක සිටියේ නෑ. ඒ වගේ ,

ප්‍ර: රිල්වාන් ගැන ඔබ වහන්සේ කියන්නේ?

උ: ඕ, රිල්වාන් එහෙම එකතැනක හිටියේ නෑ. මේ පුද්ගලයාත් එවැනි පුද්ලයෙක් මෙයායි යාසීම් තමයි ආයුධ සම්බන්ධව ස්මයිල්ගෙන් ගෙනාවේ ආයුධ ගොඩාක්ම ප්‍රවාහනය සඳහා. මේ මෙයා දේශනවලටත් ඉන්න හරි චණ්ඩියෙක්. දැන් මේ දැන් චෝනින් එක ජේනවනේ. මෙයා හරි චණ්ඩියෙක්.

ප්‍ර: ඔබ වහන්සේ පෞද්ගලිකව ඒ ගැන දන්නව ද?

උ: ඔව්. මෙයා හරි රෙක්පට්.

ප්‍ර: රෙස්පට් කියන එකෙන් අදහස් කරේ කුමක් ද?

උ: කිසි කෙනෙක් එයා කෙයා කරන්නේ නෑ එයා.

ප්‍ර: ඒ කියන්නේ කිසිකෙනෙක් තැකීමක් නෑ.

උ: ඒ කියන්නේ මේ ගොල්ලො ස්ටොන් වෙච්ච කට්ටිය. ගල් වගේ. ඉස්ලාමයෙන් හයිවෙච්ච මිනිස්සු.

ප්‍ර: දැඩි ඉස්ලාම් භක්තිකයන්?

උ: දැඩි ඉස්ලාම් භක්තිකයන්.

ප්‍ර: දැඩි මතධාරීන්?

උ: මතධාරින්.මෙයා කලක් තහුහිද් එකට සිටියා. කලක් තබ්ලික් එකේ සිටියා. ඉස්මයිල් හාජ්ජියාරුත් තබ්ලික් ඉඳලා තමයි තවුහිද් වුණේ. මල්වානේ ගොඩාක් පල්ලි හදලා තියෙන්නේ ඉස්මයිල් හාජ්ජියාර්. දැනටත් මර්කස් පල්ලියේ විශාල ලෙස ගොඩනගා ගන්නේ ස්මයිල් හාජ්ජියාර්. පල්ලි ගොඩාක් හදලා තියෙනවා.

ප්‍ර: ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ මේ කෙටි විවේකයට පෙර මේ අන්තවාදය සඳහා ඒ සම්බන්ධයෙන් සාකච්ජා කරන, ඒ සම්බන්ධයෙන් යම් ආකාරයකට උදව් උපකාර කරන අය විදියට යම් යම් දේශපාලනඥයින්ව හඳුනාගනු ලැබුවා?

උ: ඔව්.

ප්‍ර: ඔබ වහන්සේ දන්නවාද රිෂාඩ් බදුර්දීන් මැතිතුමා කොයි ආකාරයට ද මේ සඳහා කියනවනම් යම් ආකාරයකට දායක වෙනවා කියලා මොන වගේ දායකත්වයක්ද දක්වන්නේ?

උ: එයා මුලින්ම කල්පිටිය පුත්තලම් පැත්තේ හිටපු නායකයෙක් ඉස්ලාම් එකේ. ඒ අතරතුර මෙයාට දේශපාලන දැනුම දේශපාලන ඒ අයට උදව් කරනවා. කකුලෙන් අදින්නෙ නෑ. තමන් ඉස්ලාම්නම්, දැන් මාව ගත්තාම මම නිර්භීතකමේ ඒ ගැන උනන්දුවක් තිබුණ නිසා මට අමීර් කෙනෙක් වෙන්න පුළුවන් වුණා. මං අන් ජාතිකයෙක් අන් ආගමික කෙනෙක්.ඒ

FAIR COMMENT — BY JEZEEM —

වගේ එතැන සුදුස්සාට උදව් කරනවා යන්න. දැන් මම දේශපාලන මාර්ගයෙන් ගියානම් එතැනදි මට දේශපාලන මාර්ගයෙන් උදව් කරනවා. මම වෙළඳාමෙන් ගියා නම් මම විශාල හජ්ජියාර් කෙනෙක් බවට පත් කරනවා. එහෙම තමයි ඒකේ ඒ ගොල්ලොන්ගේ තියෙන, මං පුංචි කාලයේ ගිය කාලේ ඉඳලම හම්බු කරපු මිනිස්සුන්ට උදව් මාව උස්සල තියනවා.ඒ කියන්නේ තමන්ගේ යන ගමනට උදව් සදකා දීගෙන ගියා නම් කරන මිනිස්සු තබ්ලික් එක. තබ්ලික් එක හරි නිහතමානී. සියට සියක් හරියට හරි ඒ ගොල්ලො කරන දේ.ඒ ගොල්ලො එකේ ඉන්නේ. රිෂාඩ් බදුර්දීන් මෙතෙන්ට ආව වෙලාවේ මෙයා දේශපාලන ගමන අර මිනිස්සු කියන්නේ ෂොපින් බෑග් එකේ බඩු දාගෙන ආව කෙනා කියලා. මෙයා කල්පිටිය ඒ ලයින් එකේ ඉන්න කොට මෙයාට උදව් කරා.

ප්‍ර: ඔහුත් ස්වාමීනි තබ්ලික් ජමාත් ?

උ: මෙයා මුලින් තබ්ලික් සිටියා ඊට පස්සේ මෙයා තවුහිද් වෙනවා.

ප්‍ර: ඊට පස්සෙද තවුහිද් වුණේ?

උ: ඔව්. සහරාන්ලා ඒ කට්ටිය ඒ මෙව එකට සිය සුන්නි මුස්ලිම් ඉඳලා සියා මුස්ලිම් වෙනවා. දැන් ඉස්මයිල් හාජ් වෙයා සුන්නි මුස්ලිම් සිටියේ දැන් එයා සියා මුස්ලිම් වුණා. ඒ වගේ

ප්‍ර: කොහොමද එහෙම වෙන්නේ ස්වාමීනි?

උ: ඒ නිකාය අතහැරලා අර පල්ලියකට යන එකයි තියෙන්නේ. ඒකට බැඳෙන එකයි තියෙන්නේ. ඒ බෝඩ් එකට එන්ටර් වෙන්නයි තියෙන්නේ. පල්ලියේ ලියා පදිංචි වෙනවා.

ප්‍ර: හා එහෙම වෙලා තමයි ඒ නිකායට යන්නේ?

උ: අපි පල්ලියක හිටියනම් ඒ ගමෙන් වෙන ගමකට යනව නම් ඒ පල්ලියෙන් ලියුමක් අරන් ගිහිල්ලා ඒ ගමේ පල්ලියේ මර්කස් එකේ ලියා පදිංචි වෙන්න ඕන. මේ පල්ලියෙන් ලියුමක් අරන් යන්න ඕන. එතකොට එයත් ඒ විදියට ඇවිල්ලා තමයි දේශපාලන ගමන ආවේ. ගොඩක් ඔය තත්වයට පත් වුණේ. දක්ෂයෙක් වුණා.

ප්‍ර: ඔව්, එතකොට එයාගේ අන්තවාදය සඳහා ?

උ: අන්තවාදය සඳහා තමයි ඔය මරාගෙන මැරෙන ඒ සහරාන්ලගේ ඉස්මයිල් හාජ්ජියාර්ලාගේ තවුහිද් කට්ටිය අමීර් හාජ්ජියාර් නවුපර් නානා, සහාබ් එකේ හිටපු ලපර් හාජ්ජියාර්ලා ඒ වගේ කට්ටියත් එක්කලා එකතු වුණා. දැන් නිතරම මල්වානෙට එන ඔය සියළුම දෙනා මල්වානේ තමයි මූලස්ථානය ඒ ගොල්ලොන්ගේ.මඩකලපු තිබුණත් කාත්තන්කුඩි තිබුණත් මල්වාන අනිවාර්යෙන්ම කාත්තන්කුඩි , මල්වාන තමයියනවා. ඒ ගොල්ලොන්ගේ ප්‍රසිද්ධ තැන. මල්වානේ තමයි හොඳම සල්ලිකාරයෝ ඉන්නේ.

ප්‍ර: එතකොට ඒ මුල්‍ය වශයෙන් යම් දායකත්වයක් ඔහු දරනවද, මුදල් සැපයීමක් කරනව ද?

FAIR COMMENT — BY JEZEEM

උ: මුදල් සැපයීම කියන්නේ දැන් තිබෙනවා ලොකු ලොකු ව්‍යාපාර.

ප්‍ර: හාහා දැන් තියෙනවා නමුත් මුලදී තිබුණේ නෑ කියලා ඔබ වහන්සේ කියන්නේ?

උ: ඔව් මුලදී ඒ වගේ ව්‍යාපාර තිබුණේ නෑ. දුප්පතෙක් . විදේශ ආධාර එයා ලබා ගත්තා. රජයෙන් පුළුවන් තරම් හම්බු කරා. දැන් මේ සහරාන්ලා ඔච්චරක් විතරක් නෙමේ. සහරාන්ල විශාල ප්‍රමාණයක් ඒ ගොල්ලෝ බිහි කරා. ඒවට ගොඩක්ම මෑත කාලයේ දී චෙක් කරොත් අපේ සිංහලයො නම් චෙක් කරන්න පුළුවන්. මුස්ලිම් චෙක් කරන්න අපහසුයි. මෑත කාලයේ දී මුදල් අතේ නැතිව ව්‍යාපාර නැතිව පොහොසත් වෙලා සියළුම සැප සම්පත් විඳින අය ඉන්නේ ඒ අය තවුහිද් එකේ සහරාන් වගේ පුහුණුව ලබලා මැරෙන්න ඉස්සර වෙලා සැප සම්පත් විඳින තමන්ගේ දරුවෝ බලා ගන්න. මොකද සහරාන් මැරුණට තමන්ගේ බිරිඳව ඒ විදියට චුට්ටක් පාවලා දුන්නට එතැන පළවෙනිම සුසයිඩ් එක පළවෙනි මරාගෙනමැරීමනේ. ඒක පළවෙනි එක නිසා. ඊට පස්සේ ගානක් නැති වෙනවා. එවැනි තත්වයට පත් වෙනවා. පළවෙනි එක තමයි ඔය වගේ සිරියස් වන්නේ. ඊට පස්සේ අපේ ලංකාවේ ජනතා විමුක්ති පෙරමුණේ මිනිස්සු මරනකොට එකක් දෙකක් දැක්කම ඒක නිකන් ගාණක් නැනේ මීනි කොහෙ තිබුණත් ගාණක් නැතුව ගියේ.ඒ තත්වයට ඒ ගොල්ලො පත් වුණා. විශාල සංඛ්‍යාවක් ඒ ගොල්ලොන්ගේ ඉන්නවා ලක්ෂ 5 ක් පමණ තමයි සුන්නි මුස්ලිම් ඉන්නේ ඒකේ ගොඩක් ඉන්නේ තවුහිද් තක්කියා කියන කට්ටි ය.

ප්‍ර: ඔබ වහන්සේගෙන් දැන් මං මෙහෙම අහන්නම්කො දැන් ස්වාමීන් වහන්ස මේ මසුරා තියෙනවනේ මසුරා ඔය මර්කස් වල තියෙනවනේ ඒ ඇරෙන්නට ඔය ඔබ වහන්සේ කියන මල්වානේ ඊබ්‍රහම් හජ්ජියාර් ඉස්මයිල් හජ්ජියාර් ඒ වගේම දේශපාලඥයන් රිෂාඩ් බදුර්දීන් මහත්තයා ඒ වගේම හකීම් මහත්තයා ඒ වගේ ඒ ගොල්ලො එකතු වෙලා මසුරා පවත්වනවා නැත්නම් සාකච්ඡාවල් පවත්වනවා ඔබ වහන්සේ දැකලා තියෙනව ද?

උ: ඔව්.

ප්‍ර: ඒ මොන අවස්ථාවලදී ද දැකලා තියෙන්නේ සහ ඒවා පවත්වන්නේ කොහොම ද?

උ: දැන් මේක තබලික් එකේ මාසයකට 80 ගාණක් තියෙනවා මසුරා.තවුහිද් එකේ එහෙම මසුරා නෑ.

ප්‍ර: ඒ ඔක්කොම තවුහිද් අය ද?

උ: තවුහිද් අය තමයි ඒ මසුරා දැම්මේ. දැන් මේ අපේ මැඩම් ඇහුවේ මසුරා එකට එකතු වෙන කට්ටිය, මේකට එකතු වෙන කට්ටිය තමයි මම ඇස් දෙකට දැකපු අය.

ප්‍ර: ඒක තමයි ස්වාමීන් වහන්ස අපිට වටින්නේ?

FAIR COMMENT — BY JEZEEM

උ: එතැන මසුරා මං මේ කට්ටිය හොයා ගන්නේ මම නිතරම යනවා එනවා මාපිටිගම හරහා එතැනින් තමා යන්නේ අපේ ගෙවල් ගාව මාපිටිගම පැත්තට මං වෙළඳාම් කරන්නේ මල්වානේ මාපිටිගම ග්‍රවුන්ඩ් එක පැත්තෙන් යන්නේ.

ප්‍ර: ඇයි ඔබ වහන්සේ පදිංචියට මල්වානේ තෝර ගත්තේ ?

උ: මල්වාන තෝරා ගත්තේ මේකේ නිකායවල් 4 ම ඉන්නවා. විශාල ලෙස මල්වත්තට කියන්නේ දෙමළෙන් පූන්තෝට්ටම් කියලා. ලංකාවේ ඉන්න ගොඩාක් කෝටිපතියො ටික ඉන්නේ මල්වානේ.

ප්‍ර: පූන්තෝට්ටම් වල?

උ: ඔව්. මල්වත්ත කියන්නේ මල්වානේ.මම පෙළක් වෙලාවට යන කොට මම දකිනවා කාර් ටික අල් මුබාරක් ඉස්කෝලේ ග්‍රවුන්ඩ් එකේ රවුමට ගහලා තියෙනවා. එතකොට මේකේ සම්පූර්ණයෙන් තවුහිද් කට්ටිය.

ප්‍ර: එතකොට අල්මුබාරක් ඉස්කොලේතිබෙන්නේ කොහෙද අපේ හාමදුරුවනේ?

උ: මල්වාන පූන්තෝට්ටම් වලට හැරෙන තැන. ස්මයිල් හජ්ජියාර්ලාගේ ගෙවල් ලග. තැපැල් කන්තෝරුව ටෙලිකොම් එක ඊළඟට මල්වානේ ඉස්කෝලෙ. ඉස්කෝලේ තියෙන්නේ කරාබු ගස් හංදිය පැත්තට වෙන්න පූගොඩ පැත්තට බැලුවම දකුණු අත පැත්තට වම් අත පැත්තේ තමා ග්‍රවුන්ඩ් එක තියෙන්නේ. ඕකේ ඉන්නවා තම්සර් හාජ්ජියාර් . දැන් මං එකේ ඉන්න කට්ටිය හොයන්නේ මෙහෙමයි. දැන් අසර් එකට සාමාන්‍යයෙන් ලුහර් ඉවර වුණාම 12 පහු වෙලා අසර් එක කිට්ටු කරලා තමයි මේ ගොල්ලො.

ප්‍ර: ඊළඟ යාඥා වාරයට පෙර ?

උ: නෑ. ඕ ඊළඟ යාඥා වාරට පෙර, එතකොට මම ඔය රවුම ගහලා හරියට වෙලාව බලලා බාංගෝ කියන්න ඉස්සෙල්ලා එනවා. එක කොට මේ ගොල්ලො මේ ඔක්කොම ඉස්මයිල් හාජ්ජියාර්ගේ ඒසි පල්ලිය තමා තොලිහු කරන්නේ.එතැනින් ඒ ගොල්ලො නැගිටින්නේ බාංගෝ කියන කොට තමා. වාහන ටික අරගෙන යන්නේ. පල්ලිය ගාවට ගිහිල්ලා ඇතුළට වහනවා ලොක් කරලා ගහනවා ලොක් එක. එතනින් යන්න තියෙනවා ශෝට්කට් එක. ඒක දන්න කොනා තමයි ඒ පල්ලියට යන්න පුළුවන්. මං ඒකෙන් පැනලා තොලිහුවට ටක්ගලා රිංගනවා. ඒ අතර තුර මං බලනවා මේ මේ ඉන්න කට්ටිය.

ප්‍ර: ඒ කාර් එහෙම කොහොම ද නවත්වලා තියෙන්නේ?

උ: කාර් ලස්සනට රවුමට ගහනවා කාර් ටික .

ප්‍ර: පිට්ටනිය වටේට ගහනවා?

උ: ඔව්. එන්ජීම් එක පැත්ත එළියට තියලා ගානට රිවස් .

ප්‍ර: පිටිපස්සේ බොනට් එක පිටිපස්සේ ඩිකිය එන පැත්තට?

FAIR COMMENT BY JEZEEM

උ: ඩිකිය එන පැත්ත ඇතුලට ගහලා ඒකේ ඇතුලේ ඉඳන් තමා මේ ගොල්ලො මසුර කරන්නේ. ඔතන මම දැකපු චරිත තමයි ලාපිර් හාජ්ජියාර් ඉස්මයිල් හාජ්ජියාර්.

ප්‍ර: ඒ අය ව්‍යාපාර කරනව ද ස්වාමීන් වහන්ස?

උ: ඔව්. ලාපිර් හාජ්ජියාර් හැබැයි. එයා ඇමරිකන් ජේම්ස් කරන්නේ එයා තබ්ලික් එකේ මල්වානේ නායකයෙක්.ඒ වුණාට එයා අර ගොල්ලොත් එක්ක කම්බයින්. ඉස්මයිල් හාජ්ජියාර් , අමීර් හාජිජියාර්, ලපර් හාජ්ජියාර්,තම්සන් එකේ අයිතිකාරයා.

ප්‍ර: එයාගේ නම?

උ: ඒ ගොල්ලොන්ගේ නම් දන්නේ නෑ. එතකොට නෝලිමිට් එකේ අයිතාකාරයා නෝලිමිට් ලංකාවේ තියෙන්නේ. එතකොට බෙන්ලි කොම්පැනි.

ප්‍ර: බෙන්ලි කම්පැනි?

උ: බෙන්ලි කොම්පැනි .බේලින් කම්පැනි අයියයි මල්ලියි පෙන්ලි බේලින් කියන්නේ අයියයි මල්ලියි. ඒ ගොල්ලෝ නාබුලුව. පස්යාල නාඹුළුව ඒ ගොල්ලො මං අඳුරනවා. එතකොට තම්සර් මම කිව්වනේ. ඒ වගේ කට්ටිය එතකොට ඒ අතරේ ඉඳලා තියෙනවා ගපූර් සර්. ගපූර් සර් මම දෙවරක් තුන්වරක් දැකලා තියෙනවා. ලතීෆ් සර්.

ප්‍ර: මොන ලතීෆ් ද?

උ: අපේ බුද්ධි අංශයේ වැඩ කරන ලතීෆ් සර්.

ප්‍ර: STF එකේ ඉන්න ලතීෆ් ද?

උ: ඔව්. එක දවසක් මගේ උසාවියේ නඩු මෙව්ව කරන්න ගිය දවසේ එතැනදී දැක්කා. ඒ ගොල්ලොන්ගේ මසුරා දෙකක් තුනක් විතර දැකලා. තියෙනවා. පල්ලියේ ඒ ගොල්ලෝ එක්ක ආපු කට්ටිය තමයි මේ ඔක්කොම ඉන්නේ සුදු තෝපිය දාලා සුදු ෂර්ට් එක ඇඳලා සුදු සරම ඇඳලා. එතැන ඉස්මයිල් හාජ්ජියාර් විතරයි හැමදාම නිල් පාට ටී ෂර්ට් එකක් ඇදගෙන සුදු සරමක් ඇඳලා. සුදු සරමයි නිල් පාට ටී ෂර්ට් එකයි තමයි ඉස්මයිල් හාජ්ජියාර් මේ ටීම් එකේ මසුරා එකට ඉන්නේ. ඒකේ මොකක් හරි වෙනසක් ඇති. ඒක මං දන්නේ නෑ.තවුහිද් එකේ එච්චර දුරට දන්නේ නෑ. මේ කට්ටිය ඒ කරන්නේ මසුරා.

ප්‍ර: එතකොට නෝලිමිට් එක ස්වාමීන් වහන්සේ ඒකේ කවුද?

උ: ඒ ගොල්ලො ඔක්කොම සුදු ඇඳගෙන.

ප්‍ර: ඒ ගොල්ලොත් එනවා ද?

උ: ඔව්. ඒ ගොල්ලොන්ගෙන් ගන්න බැරි වුණා.මං අර දැන් අපි කරන විමර්ශන හොඳයි කියලා.

ප්‍ර: ඔබ වහන්සේට ඒ අයගේ නම් මතක ද? මතක නම් විතරක් කියන්න.

උ: මට නම් මතක නෑ.

ප්‍ර: නමුත් එකේ අයිතිකාරය එන බව ඔබ වහන්සේ දන්නවා?

FAIR COMMENT
BY JEZEEM

උ: ඔව්, නෝලිමිට් එකේ අයිතිකාරයා මම පල්ලියේ වන්දනා කරලා එක දවසේ ඔක්කමලගේ නම් අහන්න බෑ. ඒකෙත් ඉන්නවා පල්ලිය සුද්ද කරන්න ඔක්කොම කරන්න මොයිදි කෙනෙක්. මොයිදිගෙන් මං අහනවා හැඩරුව එහෙම කියලා එයා නගින කාර් එක බලාලා මොයිදි ඔක්කොම දන්නවා. මොයිදිට සල්ලි එහෙම කට්ටිය දීලා යනවා ඔයි කට්ටිය රිස්සලාම් මලෙයික්කම් කිව්වම සාක්කුවට 500 ක් 1000 ක් දීලා යනවා. මං මොයිදිගෙන් අහනවා අරයා කවුද,එයා තමයි නෝලිමිට් අයිතිකාරයා. තම්සර් නිතරම මං තිහාරියේ යනවා තම්සර් මුදලාලි කිව්වට මම දැකලා නැහැ. හාජිජියාර් කිව්වට මම දැකලා තියෙනවා එහෙදි අහලා නැහැ. දැකල ඇති එයා කියලා අඳුරන්නේ නැහැ.මෙහෙදි තමයි මං අඳුරගත්තේ තම්සර් හාජ්ජියාර් මෙයා කියලා. බේලින් කම්පැනිය අයියයි මල්ලියි දෙන්නම දන්නවා. මොකද අපේ මාමණ්ඩි එතැන වැඩ කරා. මං එහෙ ගිහිල්ලා තියෙනවා. මාමණ්ඩිය එතැන ඉස්සරහ කඩයක් කරගෙන සිටියා. ඒක හින්දා ඒ දෙන්න හඳුනනවා. අයියයි මල්ලියි. බෙන්ලි බේලින් කියන්නේ දෙන්නා. ඉතින් අර ගවුන්ඩ් එකේ ඉන්න කට්ටිය එතැනින් ගියාට අතනින් තමයි මං මේ කට්ටිය එකට සිටිනවා දකින්නේ. ඒසී පල්ලියේ.

ප්‍ර: නමුත් ඒ සාකච්ඡා කරන ඒවා ඔබ වහන්සේට ඇහිලා තියෙනවා ද?

උ: නෑ ඒවා ඇහිලා නෑ.

ප්‍ර: ඇහිලා නෑ?

උ: නෑ ඇහිලා නෑ.

ප්‍ර: එතකොට ඔබ වහන්සේ කියන්නේ මේ ගොල්ලන් ඒ වාහන රවුමක් වගේ නවත්ව ගෙන ඒ මැද්දෙ ඉදන් තමයි මේ සාකච්ඡාවල් කරන්නේ?

උ: සාකච්ඡා කරන්නේ, මොකද ඉස්මයිල් හාජ්ජියාර් ස්ටීල් තඹ කරන්නේ අරයා නෝලිමිට් එක බිස්නස් එකක්.එයා රෙදි.

ප්‍ර: අපේ හාමුදුරුවනේ පොඩ්ඩක් බාධා කරන්නද? දැන් ස්වාමීන් වහන්ස පල්ලියේ එක යාච්ඤාවකට පස්සේනේ ඊලග යාච්ඤාව එනකන් මේ ගොල්ලො හම්බ වෙන්නේ එතකොට ඒක මෙහෙම සිද්ධ වෙන්න බැරිද දැන් ඔක්කොමල්ලා පල්ලියට යනවා ඒ පල්ලියට ආපු වෙලාවේ ඒ ගොල්ලො කතාබහ කරනවා ඒක සාමාන්‍ය කතාබහක් වෙන්න බැරිද? ඒක මසුරා එකක්ම වෙන්න ඕන ද?

උ: රහස්ම හෝරා එකක් කියන්නේ පල්ලියේ දැන් අපි කියමුකෝ සුහර් ලුසර් අසර් නෙ. අසර් වලට සාමාන්‍යයෙන් ඉමාන් ජමාත් එකේ වදින කට්ටිය ඉන්නවා. සියළුම දෙනා එකට එකතු වෙලා මේ සුළඟිල්ලට සුළඟිල්ල ගෑ වෙන්න කකුල් ලං කර ගෙන වදිනවා. ඒක ඉමාන් ජමාත්. ඒකට පිං වැඩි. ඒකට සාමාන්‍යයෙන් ටයිම් එකට එන්න බැරි වුණානම් තනි තනියෙන් පුද්ගලයො ඇවිත් වදින්න පුළුවන්. එතකොට අසර් එකේ ඉඳලා මහරිබ් එකට බාංගෝ කියන එකත් සැරින් සැරේ පල්ලියට එනවා.

FAIR COMMENT BY JEZEEM

එතකොට ඒ ගොල්ලොන්ට බාධාවක්. ඊටත් වඩා සිංහල ගොඩාක් ගැවෙසන හරියෙ තමයි කරාබුගස් හංදිය කියන්නේ. සිංහල ගොඩාක් ගැවෙසනවා. අර කිසි කෙනෙක් දන්නේ නෑ පල්ලියට වාහන ටික ආවම මොකද්ද මේ වුණේ කියන එක. එතකොට මේ ගොල්ලොන්ගේ බිස්නස් අයිටම් කියලා කියන්නේ තම්සර් කරන්නේ එක එක බිස්නස් දුම්කොළ ඒවා මේව කරන බිස්නස් එතකොට නෝලිමිට් එකබිස්නස් එකක්. අරයා ස්ටීල් තඹ ඒවා කරන එක්කෙනෙක් බිස්නස් සබ්ජට් එකක් මෙතැන කතා කෙරෙන්නෙ නෑ. එතකොට බිස්නස් සබ්ජට් එකක් වුණොත් එහෙම අපේ ලතීෆ් සර් එතැන්ට එන්න අවශ්‍යයත් නැනේ. එතකොට නඩුකාරතුමා ගපුර් සර් එන්න අවශ්‍යයක් නැනේ. එතකොට මේ කට්ටිය කරන්නේ අපි මසුරා 80 ක් කරනව නම් මාසෙකට මේ ගොල්ලො සාමාන්‍යයෙන් මාසකට තුනක් හතරක් වගේ තමයි කරන්නේ. පල්ලියේ.

ප්‍ර: ලතීෆ් මහත්තයත් එහෙද පදිංචිය කොහෙ ද පදිංචිය?

උ: ලතීෆ් මහත්තය කොහේද පදිංචිය කියලා දන්නේ නෑ. මම මේ පුද්ගලයන්ගේ රූපවල් මට හොඳට මතකයි. ඊට පස්සේ මම බුද්ධි අංශය එක්ක චුට්ටක් කතා කරලා ඒ ගොල්ලොන්ගේ මොකද වෙන්නේ කියලා අපිත් දත් මිටි කන තැන් තියෙනවා. සර් කෙනෙක් කියනවා හාමුදුරුවනේ අපිට ඉතින් බඩගින්නේ ඉන්න වෙන්නේ මේව අවුස්සන්න ගියාම අපේ කෝට් ගැලවෙන තැනුත් තියෙනවා කියලා. ඊට පස්සේ තමයි මම දෙරණ මාධ්‍යයෙන් මේ ෆෝටෝ ටික බුද්ධි අංශ වැඩ කරන මේ ෆොටෝ ටික ඉල්ල ගන්නවා. ඉල්ල ගත්තට පස්සේ මං බලනවා මේ පුද්ගලයා මට හොඳට පුරුදු පුද්ගලයෙක් . මං ඇහුවා මේ පුද්ගලයා ගැන හෙව්වා. දෙරණෙන් මේ ෆොටෝ ටික අරගෙන මේ පුද්ගලයා ගැන හෙව්වා. මං කිව්වා මේ පුද්ගලයා මං අඳුරනවා කියලා. මෙයා මේ අහවලත් එක්ක ඉන්නවා. මෙයාගේ නම මම මල්වානේම කෙනෙක්ගෙන් ඇහුවා. මල්වානේ මුස්ලිම් කෙනෙක්ගෙන්ම මං මේ නම ඇහුවා. ඊට පස්සේ මං කිව්වා මේ පුද්ගලයා කවුද මේ ලතීෆ්. මේ පුද්ගලයා එහෙ ඉදලා තියෙනවා.මෙයා බුද්ධි අංශයේ.

ප්‍ර: එහෙමයි ඔබ වහන්සේ දැන ගත්තේ?

උ: එහෙමයි මං හොයා ගත්තේ.

ප්‍ර: ස්වාමීන් වහන්සේ ඔබ වහන්සේ දැක්කයි කියල කිවුවනේ ඔය මසුරා එකට සම්බන්ධ වුණ පුද්ගලයින්ව?

උ: ඔව්.

ප්‍ර: යම් යම් අවස්ථාවල දී එතකොට ඔබ වහන්සේ එතකොට ඒ අයව හඳුනාගැනීමකුත් සිදු කරයි කියලා දැන් පැහැදිලිව සඳහන් කෙරුවා?

උ: ඔව්.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: එතකොට ඒ අය අතර ඔබ වහන්සේ සඳහන් කරපු ඔය අන්තවාදය සඳහා උදව් කරනවා කියලා ඔබ වහන්සේ කරුණු සොයා ගත්ත මේ රිෂාඩ් බදුර්දීන් මැතිතුමා හිටියද?

උ: ඒ ගොල්ලෝ දැකල තියෙන්නේ මේ ආකාරයට.

ප්‍ර: ඒ ගොල්ලෝ කිව්වේ අපේ හාමුදුරුවනේ?

උ: රිෂාඩ් බදුර්දීන් ඒ දැන් ඉන්න මුස්ලිම් දේශපාලනඥයෝ ගොඩ දෙනෙක් එකට ඉස්මයිල් හාජ්ජියාර් විතරක් ඔය රිෂාඩ් බදුර්දීන් ඉන්නෙ ඒ ටීම් එකේ ඔය ඉන්න සියලුම දෙනා බදුර්දීන්ලා එතකොට මුජාර්බින් ඔය ඒ නම් ටික මට මේ වෙලාවේ කියන්න මතකයට එන්නේ නෑ.

ප්‍ර: බදුර්දීන් හකීම් මහත්තයලා?

උ: බදුර්දීන් හකීම් මහත්තයලා හිස්බුල්ලා ඔය කට්ටියම.

ප්‍ර: අසාද් සාලි මහත්තයා?

උ: ඒ ඔක්කොම ඉස්ලාම් කියන පවුසි හැර ඉස්ලාම් කියන සියලුම දේශපානඥයෝ අර විදියටම ඔය කාර් තියලා මේව කරලා ඔය විදියටම මං කරාබුගස් හංදියේ පල්ලියේ මං දැකලා තියෙනවා. ඒ අතර මෑත කාලයේ දී අපේ සුසයිඩ් වුණ මෙයත් ඉඳලා තියෙනවා. එයයි එයාගේ මල්ලි මේගොල්ලොත් එක්ක ඉඳලා තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ සහරාන් රිල්වාන්?

උ: මං අර ෆොටෝ එකේ පෙන්නුවේ අර සීඩි එකේ ඉන්නේ එයා මේ කට්ටියම සියලු දෙනාම මං කරාබුගස් හංදියෙ පල්ලියේ දී දැකලා තියෙනවා.

ප්‍ර: ඒ කොයි කාලෙද?

උ: මේ මෙයත් මේ පත්තරේ ඉන්නේ අර මං කිව්වේ දෙන්නෙක් ඉන්න ඉස්මයිල් හාජ්ජියාර්ගෙ පිටිපස්සේ එක්කෙනයි.

ප්‍ර: ඒ අර කිරිබත් කන එක?

උ: ඕ කිරිබත් කන්නේ සහරාන් වගේම එක්කෙනෙක් ඉන්නේ අර රැවුල චුට්ටක් වවලා. එතැන ඒ දෙන්නත් මේ මසුරා වලට වාඩිවෙලා තියෙනවා මේ මන්ත්‍රීල ඉන්න එකේ. දවස් දෙක තුනක් ම දැකලා තියෙනවා.

ප්‍ර: දැකලා තියෙනවා?

උ: දෙක තුනට වැඩි මිසක් අඩු නෑ.

ප්‍ර: ඔබ වහන්සේට දළ වශයෙන් ඒ අවුරුද්ද වකවානුව ගැන පොඩ්ඩක් අපට කියන්න පුළුවන් ද?

උ: මේව ගොඩක්ම වුණේ මහින්ද මහත්තයගේ රජය සමයේ එතකොට 2010 , 2012 විතර .

ප්‍ර: 2015 ඉස්සරවෙලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔව්. ඒ කාලේ තමයි මේව ගොඩක් සිද්ධ වුණේ, අවසාන කාලයේ දී මම 2015 2014 ත් දැකලා තියෙනවා. මොකද මම 2015 තමයි මල්වානේන් එන්නේ.

ප්‍ර: 2015

උ: කල්එලියට

ප්‍ර: කල්එළියට ආවේ 2015

උ: ඔව්.හසන් පරීඩ් මවුලවී එක්ක රණ්ඩු වෙලා. එයත් විශේෂ නායකයෙක් නිලා පවුන්ඩේෂන් එයා එක්කත් රණ්ඩු වෙලා මං එයාගෙන් කප්පමකුත් ගත්තා. ලක්ෂ 05 ක් දෙනවා මට. මම නෙවෙයි මගේ බිරිඳ තමයි ගිහිල්ලා සල්ලි අරන් එන්නෙ . මට එන්න කියනවා.මං යන්නේ නෑ. ඒක ටිකක් දිග කතාවක්.

ප්‍ර: ඇයි ඒ කප්පම් දෙන්නේ ඔබ වහන්සේට ?

උ: මට එන්න විදියක් නැනේ. රණ්ඩු සරුවල් කරලා

ප්‍ර: ඒ කියන්නේ ආගමෙන් දැන් ඉවත් වෙන්න හදනවා ඔබ වහන්සේ ?

උ: ඉවත් වෙන්න හදනවා කියන්නේ මට යන්න ඕන වෙන කොහාට හරි මල්වාන අතහැරලා. ඊට පස්සේ මං කිව්වනේ සංවිධානයෙන් අයින් කරනවා කියලා. එතකොට ගනන් ගන්නේ නෑ. මම මත්පැන් පානය කරනවා. ඒ කියන්නේ ගොඩක් නෙවෙයි. චුට්ටක් මේව කරලා විශාල ලෙස පෙන්නනවා. බයික් එකෙන් පාර හරහා යනවා. තීවීල් එක ඇගට කපා ගෙන යනවා. කෑ ගහගෙන යනවා. අර තිබ්ච්ච මුමේන් ගතිය නෑ මගේ ළඟ. අර තිබ්ච්ච මුමෙන් ගතිය. එතකොට ස්වාමීන් වහන්සේ කෙනෙක් ආකාරයට තමා හැසිරෙන්නේ මේ තබිලික් කට්ටිය. ඒවා නැති කරලා මම මේකෙන් අයින් වෙන්න යනවා. ඒ මොහොතෙදි මට දීපු දීමනා මේ ගොල්ලෝ ගන්න යන්නේ. මට උලහිටිවලේ දීලා තිබුණු නිලා පවුන්ඩේශන් ගේ. එතැන රණ්ඩු වෙලා කපා කොටගෙන මම එතැන මම හොස්පිටිල් ඉදලා මට පිහිවලින් කපලා කොටලා ගහගෙන මරාගන්න හැදුවා. දැන් මට එන්න වෙන ක්‍රමයක් නෑ එතැනින්. කලා වගේම සිරියස් වෙන්න ඕන එන්නත් මෙතැනින් අයින් වෙන්න.

වෙලාව:- පස්වරු 5.35
මෙතැන් සිට:- ල/ලේ යමුනා මිය.

FAIR COMMENT
BY JEZEEM

සටහන් ගැනිම ල/ ලේ සචිනි මෙනවිය විසිනි.
වේලාව ප.ව **5.35**
මෙතැන් පටන් සටහන් ගැනිම ල/ ලේ යමුනා දසනායක විසිනි

උ අයින් වෙන්න කියලා කිව්වා ඊට පස්සේ මම සිංහල අපේ ටීචර් කෙනෙක්ගේ නිවසක සිංහල ගම්මානෙක එයා මට නොමිලේ ගෙයක් දෙනවා.ඒ ගේ මාසයක් අපි ඉන්නවා. ඉඳලා මම හසන් තවුන් මවුලවිට කියනවා එතකොට තියන ලොකුම දේ තමයි බොදුබල සේනා . බොදු බල සේනා එකට උඹලෑ ඔක්කෝම කියනවා මට මෙච්චරක් සල්ලි ඕනේ මම ලක්ප පණහක් ඉල්ලන්නේ. . ලක්ප පහක් එවනවා එතකොට මගේ අතෙත් සල්ලි ටිකක් තිබුනා ඊට පස්සේ මට සලමන් නානා කෝල් කරලා කියනවා මොනවද හසන් කලේ හසන් ෆරිඩත් එක්ක හැප්පිලා බේරෙන්න හම්බ වෙන්න නැහැ මොනවද ඔය කප්පම් අරගෙන තියනවා අරහේ මෙහේ කප්පම් නොවේ දිලා තියෙන්නේ අරහේ මෙහේ. මරයි අරහේ මෙහේ කියලා ඊට පස්සේ මම දැන් කල්පනා කරනවා දැන් බේරෙන්නත් එපැයි අපි කල්එලියෙන්නේ ඉගෙන ගත්තේ අරාබි කොලේජ් එකේ මම බැඳලා හිටිය භාර්යාව එයා ඒ වටේ කට්ටිය අඳුරනවා. ඉදි ආප්ප සප්ලයි කරන කට්ටිය අරාබි කොලේජ් එකට.2000 ක් විතර ඉන්නවා අරාබි කොලේජ් එකේ. තව ගෙවල් 10 ක් විතර ඉදි ආප්ප තම්බලා දුන්නා ඉදි ආප්ප ඔඩර් දාට. ඒ ඇන්ටිලා අඳුරනවා.ඒ ගොල්ලොන්ගේ මාර්ගයෙන් අපි කොවීවියාහේන කල්එලියේ කොවිවියාහේන පල්ලියට අල්ලපු ගේ කුලියට ගන්නවා.අරගෙන ඒකේ පදිංචි වෙනවා.එතකොට බේරුමක් තියෙනවා.ඊට පස්සේ මේ ගොල්ලෝ කියනවා මේ කොහෙද පදිංචිය අපි කියනවා මෙහේ මල්වානේ හිටියේ . මල්වානේ ලිවුමක් ගෙන්නකියලා.ඊට පස්සේ මම යන්නේ නෑ බිරිඳ යන්නේ. එයා ගිහිල්ලා ලියුමක් අරන් එන්නේ. අරන් ගිහිල්ලා මේ පල්ලියට දීලා.ඊට පස්සේ එතැනම ඉඩම් කැල්ලක් මම ගන්නවා.එතැන පල්ලිය ගාවම ඉඩම් කැල්ලක් අරන් ටක්ගාලා ගෙදරක කාමරයක් හරිගස්සනවා.ඒ අතර මම අර කිව්වේ පොඩි ළමයෙක් පිහිට අදින කොට මාමා කිව්වා කියලා.

ප්‍ර එහෙමයි.

උ ඒ පුද්ගලයා එනවා මාව හොයාගෙන මම ඉන්න ගෙදරට. මගෙන් අහනවා හසෙන් පරඩි මවුලවිව අඳුරනවද කියලා.මම කියනවා ටිකක් අඳුරනවා කියලා. ඊට පස්සේ මට කියනවා කමක් නැහැ එහෙමනම් අද හැන්දෑවේ පල්ලියට වුට්ටක් එන්නකෝ පොඩි සාකච්චාවක් තියනවා කියලා එතකොට හසන් ෆරිඩ් මවුලවි පල්ලියට ඇවිල්ලා උඩ ටැංකිය ගාව දැකලා අස්ලාම් අලෙක්කුම්

FAIR COMMENT BY JEZEEM

කිව්වා වාල්ලෙයිකු සලාම් කිව්වා. මම තරහද කිව්වා මම කිව්වා මල්වානේ ඉන්නේ කකුලෙන් අදින මිනිස්සු ඉස්ලාම් ඉහලට යන්න දෙන්නේ නැහැ මම කිව්වා සාප් ඉඳලා අම්ර්වුනා අම්ර් සාප් ගෙන් අම්ර් වුනා ඊට පස්සේ කකුලෙන් අදින්න පටන් ගත්තා ඒකයි මට ඒ දේවල් මෙව්වා වුනේ එහෙන් එන්න තමා මම මෙව්වා කලේ මොකද දැන් මම යන්නේ තබ්ලික් නෙමෙයි මම කරපු හරිය ඇති සේවය මගෙන් බිහි වෙච්ච කට්ටිය ඒ ගොල්ලන් ඉන්නවානේ. මම දැන් යන්නේ ස්වර්ගය යන්න මම ආගම දහම .අදහාගෙන යනවා තබ්ලික් කරන්නේ නැහැ කිව්වා ඊට පස්සේ මරණෙන් බේරුණා කොහෙද ඉන්නේ මම කිව්වා පල්ලියට අල්ලපු ගේ ගත්තේ ලේසි පල්ලියට යන්න මම කිව්වා තබ්ලික් කරන්නේ නැහැ කියලා කමක් නැහැ මෙහේ කරන්න මෙහේ මිනිස්සු හොඳයි මල්වානේ මට චුට්ටක් තේරුණා කිව්වා ස්කිම් එක නිසා තමයි කිව්වා වුනේ එතන කවලම් වුනා කිව්වා ටැමිල් සිංහල මුස්ලිම් ඔක්කොම කලවම් වුනා එතන තමයි කිව්වේ මොකද මට එතන නායකත්වයක් දිලා තියනවා ස්කිම් එකේ භාණ්ඩාගාර මම ඒ කට්ටිය මොනව වුනත් ඔක්කෝම බලා ගන්නවානේ මම ඒකෙන් මට එතන මිනිස්සු මේව වුනා ඒක පිට දාලා තමයි එතනින් පැන්නේ . මට කල්එලියෙන් පනින්න පුලුවන් අතන කාලය ගොඩක් කල් ගත කලා මල්වානේ එතනින් මෙතෙන්ට ආවාට පස්සේ තව විවාහයක් කර ගන්න එතකොට ඩිවෝස් වුනා පලවෙනි බිරිඳ ඩිවෝස් වුනා ඊට පස්සේ තව විවාහයක් මම අර කිව්වේ ඒ විදියට සුක්පම අන්දමට කියලා මාස දෙකකට පමණ විවාහය ඇති කරගත්තා ඒක පල්ලියෙන් කලේ ඒ විවාහය කරගන්න මට විල්ල ජමාත් එකක් ඒක තමයි එතකොට නාරම්මල ගිය අවසාන විල්ලා එක මම කිව්වේ හැටන් එකේ මස් කඩේ මුදලාලි ගේ පුතා මට හම්බ වුනා කියලා ඒ විල්ලා ජමාත් එක එතනින් පස්සේ මම හිටපු හැටියේම ඒකෙන් ඉවත් වුනා . ඒ විල්ලා ජමාත් එකේ පල්ලියෙන් තමයි සම්පුර්ණයෙන්ම මේ වෙඩින් එකට වියදම් කලේ ඒක ඩිවෝස් කරපු බිරිඳ වුනත් දැන් වුනත් මම නම්බර් එක දෙන්නම් මේක අහගන්න පුලුවන් මැඩම්ලගේ ෆෝන් එකෙන් කථා කරලා. දෙවනි විවාහයට කව්ද වියදම් කලේ කියලා ඔ චිචර දේවල් තිබිලත් පල්ලිය වියදම් කරන්නේ නැවතත් මාව එහෙන් අරගන්න බැලුවේ මොකද හසන් ෆරීඩ් මවුලවි ආවේ අනිවාර්යයෙන්ම මාව බලන්න . මම කිව්වා තරහ වෙන්න එපා මොකද මුසාබා කරලා සලාම් දෙන්නේ එතකොට සියට එකසිය පණහක් පුවර් වෙරයක් නැහැ කියලා නිකම් සලාම් දුන්නොත් සැක හිතන්න පුලුවන් අනට අත දිලා හිතන්න පුලුවන් වෙරයක් තියනවා කියලා

ප්‍ර එහෙම නැතිව කොහොමද දෙන්නේ ?

FAIR COMMENT — BY JEZEEM —

උ මුසාබා කරලා බදා ගෙන මේ දෙපැත්තට දෙපැත්ත මෙව්වා කරලා තමයි අර අවුරුදු වලට ඒ ගොල්ලෝ සලාම් දෙන්නේ ඒ විදියට සලාම් දුන්නම වෛරයක් නැහැ ඒක සත්‍ය ඉස්ලාම්

ප්‍ර ඒක සත්‍යය?

උ දැන් පෙරනාල් වලට ඒ විදියට සලාම් දෙන්නේ පෙරනාල් කියන්නේ අවුරුදු පෙරනාල් වලට ඒ විදියට තමයි සලාම් දෙන්නේ ඊලගට දැන් මේ කාලය කෝච්චි නතර කරලා මරන්න

ප්‍ර අන්න ඒක තමයි දැන් ඔබ වහන්සේ කිව්වා පාස්කු එක එතකොට නත්තල් ඒවාගේම සංඝයාව ඝාතනය කිරීම එතකොට ඊලග සංහාරය ස්වාමීන් වහන්ස?

උ ඊලග ඒ ගොල්ලන්ගේ දැන් ඒ අතරතුර තබ්ලික් තව්හිද් කන්ට්‍රැක් එකක් අත්සන් කර ගත්තා

උ එහෙයි.

ප්‍ර ටැම්ල් අයත් එක්ක ලංකාව පුරා විසිරිලා ඉන්න ඒගොල්ලන්ට බෝම්බ පත්තු කරන්න ලේසියි අර කට්ටියට තබ්ලික් එක උදව් කරනවා

ප්‍ර කාටද ?

උ තව්හිද් අයට.

ප්‍ර හා හා

උ තව්හිද් අයට බෝම්බයක් පුපුරවන්න ලේසියි මුස්ලිම් අය මැරෙන්නෙ නැතිව මොකද තබ්ලික් එකේ පල්ලි වැඩියි තව්හිද් එකේ පල්ලි අඩුයි තබ්ලික් වල තමයි අර විදියට බාංගෝ කියන්නේ අර භයියෙන් කියන්නේ අද දෙහිවල කව්රුවත් යන්න එපා දෙහිවල බෝම්බයක් පුපුරනවා අනිවාර්යයෙන් පුපුරන්න ඒ ගොල්ලන්ට පුලුවන් ඒවා මේ මසුරා කරපු ඒවා ඒ ගොල්ලන්. තව්හිද් එකයි තබ්ලික් එකයි මසුරා එකයි කරපු ඒවා එතකොට පිටකොටුවේ බෝම්බයක් පුපුරනවා ඒ ගොල්ලන්ගේ

ප්‍ර පණිවිඩය දෙනවා ?

උ පණිවිඩය දෙනවා කිසි කෙනෙක් යන්න එපා කඩවල් ඇරපල්ලා ඇතුලට වෙලා හිටපල්ලා සැකයක් නැහැ කඩවල් අරින්න පුලුවන් එලියේ ඉන්නේ නෑ ඇතුලේ ඉන්නේ ඒ ටයිම් ඔක්කෝම දෙනවා අහවල් වෙලාවට බෝම්බ පුපුරවනවා ඒ වෙලාවට කඩේ ඒ ගොල්ලන් ආරක්පිතව ඉන්නවා ඒ වගේ ඒ දේවල් මෙව්වා කරනවා කෝච්චි නතර කිරීම සෙනග නැති තැන්වල පීලි පන්නලා ඒකෙන් දවස් 40 ගෙදරින් පිට වෙලා ඉන්නේ කැලෑ තියන ඇත කෝච්චි යන ඒවා හැටන් ඕවගේ යන ඒවා කැලෑ තියන තැන්වල නතර කරලා කපලා කොටලා ඝාතනය කරන්න ඒ අවසාන

ප්‍ර කෝච්චියේ යන මගින් ?

FAIR COMMENT — BY JEZEEM

උ එක පාර ඉහල වල ඉනාගත්තා වගේ වල ඉනාගත්තාම ඉතිරි වන ඒවා තමයි අර විදියට වඳ කරන්නේ .මේක වඳ කිරීම තමයි ඒ ගොල්ලන්ගේ මේ දැන් ඔය නිකම් ඒ ගොල්ලන් පාස්කු ප්‍රහාරයක් නිකම් ජීවිතයක් කව්රුවක් වත් නැති කර ගත්තේ නැහැනේ බෝම්බ පුපරවාගෙන සැලසුමක් ඉදිරියේ තියන නිසා තමයි මේ දේවල් කලේ කියන එක

ප්‍ර ස්වාමීන් වහන්ස දැන් එතකොට ඔය ඒ හැරෙන්න සමූල ඝාතනය කිරීම් වෙන දේවල් ඔබ වහන්සේ දන්නවාද ?

උ ඒක තමයි මම මුලින් සඳහන් කලේ එක්කෙනා පස්දෙනා ගානේ කෝච්චි එන්නෙත් අන්තිමට ස්වාමීන් වහන්සේලා සහ රාත්‍රියේ ස්වාමීන් වහන්සේලා ඒලගට එක්කෙනා පස්දෙනා ගානේ සාමාන්‍ය ජනතාව

ප්‍ර ඒ කියන්නේ එක වෙලාවකට බොහෝ දෙනා විනාශ කිරීමේ ප්‍රයත්නයන් ගැන .ඒ කියන්නේ ?

උ ඔව්

.ප්‍ර ස්වාමීන් වහන්සේ දැන් ඒ හැරෙන්න ක්‍රමානුකූලව රටේ මිනිස්සු ජීවත් වෙන කොට ඒ ගොල්ලන් ගේ දෛනික දින චර්යාවේ යම් යම් වෙනස් කම් රෝගි තත්වයන් ඇති වන ආකාරය ?

උ මුස්ලිම්වරුන් ගේද

ප්‍ර නැහැ ස්වාමීන් වහන්සේ කතීර්ලාගේ ?
ඒ කියන්නේ මුස්ලිම් නොවන අයගේ ඇති වන ආකාරයේ යම් යම් උපක්‍රම එහෙම තියනවාද ?

උ තියනවා.

ප්‍ර මොනවාද ඒ ?

උ මේකට තව්හිත් එකේ අමීර් හාජ්ජියාර් කියන කෙනා මේ මල්වානේ උලහිටිවලේ දැන් ඔය කිරිඹත් කන පොටෝ එක තියෙන්නේ එතනින් උඩට යනකොට තියන දකුණු අත පැත්තේ තියන පලවෙනි ගේ ඒක බුද්ධි අංශයෙන් ගිහිල්ලා එතන සෙව්වා ඒ කියන්නේ ගෙවල් මැප් කරගෙන ආවා ගිහිල්ලා මට කිව්වා ඔක්කොම හරි මම දුන්න ඒවාගෙන් මැප් කරගෙන ආවා .එතන එයා තමයි මහරගම ගොඩාක් රෙදි බිස්නස් කරන්නේ

ප්‍ර මහරගම කියන්නේ පමුනුවේද අපේ හාමුදුරුවනේ?

උ පමුණුව තියෙන විශාල නොග කඩ පිටකොටුව ඊට අමතරව ගොඩාක් තැන්වල මෙයාගේ තියනවා මෙයා වයිනා ලංකාවට රෙදි ගේන ගබඩා තියන කෙනෙක් ස්ටෝස් තියෙන කෙනෙක්. පිටකොටුවෙත් තියනවා ඔය වරායට මෙහා පැත්තේ ස්ටෝරුවක් තියනවා ලොකු ස්ටෝරුවක්. බියගමත් තියනවා ස්ටෝරු ගෙදරත් තියනවා ස්ටෝරු .මෙයා ගාව තියෙනවා කෙමිකල්

ප්‍ර ඔබ වහන්සේ කොහොමද දන්නේ?

උ මේක ගිනිගත්තා

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර කොහේ තියන එකද ගිනි ගත්තේ ? කොහේ තියන ස්ටෝරුවද ගිනි ගත්තේ ?

උ මල්වානේ උලහිටිවලේ තියන එක ස්ටෝරුව ගිනිගත්තා ගිනි ඇරගත්තාට පස්සේ කිසි කෙනෙක් ගියේ නැහැ ඔකේ කෙමිකල් තියනවා කියලා

ප්‍ර ඔබ වහන්සේ සමාවෙන්න ස්වාමීන් වහන්ස මල්වානේ කොයි කාලේ තුලද පදිංචි වෙලා සිටියේ ?

උ මමද ?

ප්‍ර එහෙයි.

උ දැන් මේක වෙනකොටද ?

ප්‍ර නැහැ දැන් ඔබ වහන්සේ යම් අවස්ථාවක ජීවිතයේ මල්වානේ පදිංචි වුනානේ ?

උ ඔව්

ප්‍ර ගෙවල් හම්බ වෙලා එහෙම ?

උ ඔව්.

ප්‍ර මම අහන්නේ ඒ මොන කාලය තුලද ඔය මල්වානේ පදිංචි වුනේ ?

උ **2003 - 2004** වගේ කාල සීමාව තුල තමයි

ප්‍ර .අවුරුද්දයිද හිටියේ නැහැනේ ?

උ මම කිව්වේ මම ඉස්ලාමෙට ආවේ **2001** තුන්වෙනි මාසේ වගේ හතරවැනි මාසේ වගේ තමයි ආවේ

ප්‍ර එහෙමයි.

ප්‍ර විවාහ වුනේ හයවෙනි මාසේ අවුරුදු දෙක හමාරක් විතර කහටඔවිට ඉඳලා තමයි මල්වානෙට එන්නේ

ප්‍ර එතකොට මල්වානේ කොච්චරකල් හිටියාද කියලා මම අහන්නේ ?

උ මල්වානේ **2003** ඉඳලා **2015** විතර වගේ වෙනකල් හිටියා

ප්‍ර දැන් නැවත ඔබ වහන්සේ අමීර් හාජ්ජියාර් ගේ අර ?

උ ඉන් පස්සේ මේකට ගිනි නිවන හමුදාවට කෝල් කලා

ප්‍ර එහෙමයි මොන වගේ ස්ථානයක්ද ගිනි ගත්තේ ? අමීර් හාජ්ජියාර් ගේ ?

උ එයාගේ නිවසට අල්ලපු එකේ තියනවා ලොකු ස්ටෝරුවක්. ඒකේ තමයි මේ රසායනික කෙමිකල් එක තිබ්බලා තියෙන්නේ . විප කෙමිකල් එක. එයා ඒක ගිනිගත්ත වෙලාවේ මම එතකොට එතකොට අර වතුර බටයක් එක්කෙනෙක් මෙහා වහලයට නැගලා අල්ලනවා ස්පිඩ් එකවැඩිකමට එයාට කොන්ට්‍රෝල් කරගන්න බැහැ

ප්‍ර අමාරුයි

උ ඊට පස්සේ මමත් නැගලා අල්ලා ගත්තා මම කිව්වා මෝටරේ පවර් අඩු කරන්න කියලා අඩු කරලා ඇරගෙන කොන්ට්‍රෝල් කරලා ඇල්ලුවට පස්සේ තමයි මම කිව්වා දැන් රේස් කරන්න කියලා . මේක නතර කර ගත්තාට පස්සේ නතර කරන්න පුලුවන් ,

Police Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

කිහිල්ලට ගහගත්තාම . මම තමයි ගොඩාක්ම මේක මෙව්වා කලේ මට රුපියල් 50.000 ක් මෙයා දෙනවා නැග්ගක් වශයෙන්, මොකද මගේ හොඳ ලස්සන ඇඳුමක් තිබුනා ජුබ්බා එකක් . ඒක වටිනා ජුබ්බා එකක්. මම මසුරා එකට ගිහිල්ලා එනකොට විශේෂයෙන් මසුරා එකට ගිහිල්ලා එනකොට ඒවා ඔක්කෝම දුම ගෑවිලා මෙව්වා වෙලා ඊට පස්සේ අපේ මසුරා එකේදි කිව්වා ඔකේ මේ මෙන්න මේ කෙමිකල් එක තියෙන්නේ ඒ කෙමිකල් එකෙන් සිද්ධ වෙන්නේ වයිනා රෙදි ගේනවා මේක වෙනම ස්ථානයක තමයි තියාගෙන ඉන්නේ උඩ පෝ රූම් දාන්නේ නැහැ යට දාන්නේ. එයාගේ සේවකයෙකුත් මේ ගැන ටිකක් අපි එක්ක මසුරා වල හිටියා . මොකද සේවකයෙක් තබ්ලික් .මෙයා තව්හිද්. දැන් සාමාන්‍යයෙන් ළමයෙක් මෙහෙම අතේ අරන් යන ළමයෙක් තව මාසෙකින් දෙකකින් කෙලින් කරලා වඩා ගන්න පුලුවන් කෙනෙක් අනිවාර්යයෙන්ම ගියොත් එයාට කියට හරි මේ රෙද්දක් හෝ මහපු ඇඳුම් ඒකේ තියනවා ස්කර්ට ඔලව්ස්

ප්‍ර ඒ කියන්නේ අම්මට අන්දන ඒවා ?

උ අම්මා කෙනෙක් අඳින ඒවා ඒවා දෙනවා

ප්‍ර ඒ කියන්නේ අලුත ලැබුනු දරුවෙක්ට ඒ අම්මාට අඳින්න පුලුවන් ඇඳුම්

උ ඔව් එනකොට ඒ වාගේ කෙනෙක් ගියොත් අනිවාර්යයෙන්ම මේ ඇඳුම් තියලා තියෙන්නේ පොලිතින් එකක දාලා මෙව්වා කරලා තමයි තියෙන්නේ

ප්‍ර හා හා

උ ඒක ගත්තට පස්සේ ඒ ගොල්ල කෙහොමත් අත් හෝදලා ඔක්කොම කරලා තමයි මෙව්වා කරලා තමයි වෙන දෙයක් කරන්නේ ඒතරම්.

ප්‍ර ඒ කියන්නේ ඒ ඇඳුම අර ගත්තාට පස්සේ ?

උ ඔව් ඒක සාමාන්‍යයෙන් තෙත් වුනොත් කෙල වලට තමයි මේ විපබිජ මෙව්වා වෙන්නේ ඊට පස්සේ ඒ ළමයා අම්මා ඇඳුම ඇඳ ගත්තාට පස්සේ ළමයා කෙලින් කලාම අපි සාමාන්‍යයෙන් දැකලා තියනවා බස් වල වුනත් කිරි වමනේ කරගෙන සුප්පු කරලා මෙතන තෙමිලා තියනවා අම්මලාගේ ඒකෙන් විපබිජයක් ශරීර ගත වෙනවා දරුවට ඉස්සරලාම නිකම් විජනලයක් වගේ හැදිලා කැස්ස හැදෙන්නේ ළමයට. කැස්ස හැදිලා ඊට පස්සේ ඉතින් ගමේ ඉස්පිරිතාලෙට අරන් ගිහිල්ලා ලේ වෙක් කරලා මූත්‍රා වෙක් කරලා අන්තිමට තියන සේසත නැති වෙනවා නැති වුනාට පස්සේ කනේ කරේ තියන රත්තරන් බඩු තියන්න වෙනවා ඊට පස්සේ නෝනා වාට්ටු ගෙනියනවා නෝනා වාට්ටු ගෙනිච්ච හැටියේ අථහම් වගේ පුල්ලි පුල්ලි පුල්ලි පුල්ලි වගේ මේ ළමයාගේ මතු වෙනවා

President Secretariat
FAIR COMMENT BY JEZEEM

ප්‍ර අර පොඩි බබාගේ

උ ඔව් මම මේක පරීක්ෂා කරන්න ගියා

ප්‍ර කොහාටද ඔබ වහන්සේ වැඩියේ ?

උ මම නෝනා වාට්ටුවට ගියා

ප්‍ර ඒ කොයි කාලෙද ?

උ ඒ ගිනි ගත්තාට පස්සේ මම මල්වානෙන් එන්න ඔන්න මෙන්න.

ප්‍ර ගිනිගත්තේ කොයි කාලෙද අපේ හාමුදුරුවනේ නැවත කිව්වොත් ?

උ ගිනි ගත්තේ 2014 - 2012 වගේ ?

උ 2012 - 2014 වගේ ඔබ වහන්සේට මතක ?

උ මතක හැටියට දින වකවානුවක් ලිව්වේ නැහැ. ඉන් පස්සේ ඒක මසුරා එකේදි මය අනස් තමයි අනුන්ගේ ඕපදූප ඔක්කෝම ඉස්මයිල් හාජ්ජියාර් කිරිඹත් කවන්නේ අනුන්ගේ ඔපදූප ඔක්කෝම මා එක්ක කියනවා. හසන් අයියා හසන් අයියා මෙහේ එන්නකෝ කියලා ලගින් ඉන්දවාගෙන කාගේ හරි දෙයක් තමයි කියන්නේ ඒ වගේ වරිත තියනවා ඉතින් අනුන්ගේ ඕපදූප එයාගෙන් තමයි මම ගොඩක් ගන්නේ එයා තමයි ගොඩක් තවහිද් ඒකේ මට දුන්නේ .

ප්‍ර එයාගේ නම මොකක්ද ස්වාමීන් වහන්ස ?

උ අනස් හම්පාබ් එයා බැඳලා ඉන්නේ එහේ ඉන්න බ්‍රෝකර් කෙනෙක් ඉන්නවා එයාගෙත් අම්ර් නම .එයාගේ දුව එයා තව්හිද් තව්හිද් .තබ්ලික් එකතු වෙව්ව නැනක් එනන.ඒක හින්දා තව්හිද් එකේ ඒවා ඒ ගොල්ලන්ගේ තාත්තගෙන් අහගෙන දුව මෙව්වා කරලා එයා හොයලා කියනවා. නැන්දම්මලාගේ ගෙදර ගියාම ඒවා නොයා ගන්නවා ඒ ගොල්ලන්ට ඉතින් ඒවා ලොකු දෙයක් නොවේ ඒව දැන ගන්න එක. ඉන්පස්සේ මම ගියා නෝනා වාට්ටුවට ගිහිල්ලා බැලුවා.

ප්‍ර බොරැල්ල තියන නෝනා වාට්ටුවට

උ නෝනා වාට්ටුවට ගියා අර ඇඳුමක් දාගෙන අර මෙව්වා එකේ ඇඳුම් දාගෙන ඉන්නවා කහපාට බුට්ස් දෙකකුත් දාගෙන එනන ඉන්න මගෙත් කව්රුවක් වත් ඉන්නේ නැහැ එනන අම්මලා ඉන්නවා එලියේ මෙව්වා වල විදුරුවලින් බලාගෙන ඉන්නවා කට්ටිය ඊට පස්සේ ඇතුලට කට්ටියක් යනවා මං ඒ කට්ටියත් එක්ක ගිහිල්ලා කථා කරලා ඒ ගොල්ලන්ගේ ආව කෙනෙක් විදියට වගේ ඒ ගොල්ලන් එක්කම මාත් ඇතුලට ගියා ලමයි ගොඩක් ගේ මේ හිල් කරලා ගහලා මේව අර වයර් දාලා හැම තැනම කටු ගහලා මේව කරලා ළමයි හිටියා 10 ක් 12ක් විතර ඒ සියලුම ළමයින්ට තිබුනේ මේ ඇගේ පුල්ලි දාපු රෝගය .

ප්‍ර ඔබ වහන්සේ දැක්කා ඒක ? පුල්ලි තිබුනද ස්වාමීන් වහන්ස ?

උ ඔව්. අථහම් වගේ පුල්ලි තිබුනා.

FAIR COMMENT — BY JEZEEM

සියථම ළමයින්ගේ එතකොට වෛද්‍යවරු ඒ ගැන කිසිම තැකිමක් නැහැ. ඒ ගොල්ලන්ට සල්ලි හම්බ වෙනවා පඩි හම්බ වෙනවා විපඛ්ජයක් ගියා කියන එක තමයි කියන්නේ මොකක්ද මේ විපඛ්ජය කියලා පරික්පණය කලේ නැහැ ලංකාවේ

ප්‍ර තාමත් තියනවාද ඒ ලෙඩේ ?

උ තාමත් ඒක තියනවා.

ප්‍ර කුඩා දරුවන්ට තමයි තියෙන්නේ ?

උ ඔව්. බුද්ධි අංශ මහත්වරුන්ට කිව්වේ පුලුවන් තරම් ඉක්මනින් මේක ගමු කියලා ඒක ගෑස් සිලින්ඩර් එකක වගේ තියෙන්නේ කෙමිකල් එක

ප්‍ර ඒක අර රෙදි වලට ?

උ ඔව් රෙදි වලට ස්ප්‍රේ කරනවා අංශක 90 ට තැම්බුනත් ඒ විපඛ්ජය නැති වෙන්නේ නැහැ කියලා කියන එක තමයි අනස් මට කිව්වේ ඔය අනස් ඉගෙන ගත්ත කෙනෙක්

ප්‍ර හා හා හා

උ අධ්‍යාපනය හොඳට තියෙනවා මුස්ලිම්

ප්‍ර එතකොට ඔය ඇදුම් ඒ වගේ රෙදි වලට විතරද ස්වාමීන් වහන්සේ වෙන ජනතාව? ඔබ වහන්සේ දන්නේ එපමණයි ?

උ එපමණ තමයි යට ඇදුම් වලට අනිත් ශරීරය වැහෙන ඇදුම් වලට ඕවා ස්ප්‍රේ කරනවා කියලා ඒක දැනුත් නැහැ අරක තමයි මට කිව්වේ.

ප්‍ර ඔබ වහන්සේ දන්නේ නැහැ ?

උ ඒ කියන්නේ ඒක කිව්වේ උන් කරන බලුවැඩ කියලා කිව්වේ අමීර් පාප්ලා කරන ඒවා ගැලපෙන්නේ නැහැ

ප්‍ර ඒ කියන්නේ එකග වෙන්නේ නැහැ ?

උ එකග වෙන්නේ නැහැ ඒවට තමයි තව්හිද් එකයි තබ්ලික් එකයි කම්බයින් වුනානේ මගේ අනස් අමීර් කියනවා මහ එවුන්ගේ මොලේ හොඳ නැහැ ඔවුන්ගේ පව් අපිට එනවා අපි නිරයට යයි හසන් අයියේ කියලා මා එක්ක ඒවා තමයි කථා කරන්නේ මුන් මේ මේ විදියට මිනි මරන්නේ රෙදි දෙනවා මේ කිරි බොන ළමයි මරන්නේ මුන් වඳ කරන්නේ එහෙම නැහැ කපලා තමයි මරන්න කියන්නේ සතත් කපලා තමයි කන්න කියලා තියෙන්නේ කාපිර්ලත් කපලයි මරන්න කියලා තියෙන්නේ . ඒ ගොල්ලෝ කියන එක තමයි කියන්නේ කැපුවාම වේදනාවක් නැහැ කියලා වට්ටාගෙන කොහොමහරි වට්ටාගෙන බෙල්ල කපන්න කියලා තමයි කියන්නේ පිටිපස්සෙන් ගිහිල්ලත් කමක් නැහැ මෙහෙම දාලා බෙල්ල කැපිම තමයි ඒ ගොල්ලන් ගේ සිස්ටම් එක නබි කිව්ව විදිය ගෙල සිදීම තමයි ඒ ගොල්ලන්ගේ සිස්ටම් එක.

Presidential Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර ඔය ක්‍රමය හැරෙන්නට වෙන කාෆිර්වරු සම්බන්ධයෙන් යම් වෙනත් උපක්‍රම හින්දු ,කතෝලික ,බෞද්ධ කියන ආගම් වල අය සම්බන්ධයෙන් ඒ ගොල්ලන්ට යම් හානියක් කරන්නට පුලුවන් වෙනත් උපක්‍රම යෙදීමක් ගැන ඔබ වහන්සේ පෞද්ගලිකව දන්නවාද ?

උ මේක 100% ක්ම නිගමනය කරන්න අපහසුයි මේක සැකයක්.

ප්‍ර එහෙයි ඇයි ඒක මොකක්ද ඒක සැකය කොහොමද ඒක ඇති වුනේ ?

උ හගුරන්කෙත විවාහ වෙලා හිටිය ගිහි කාලේ උපාසක අම්මාගේ සීයා අසනිප වුනා

ප්‍ර එහෙයි.

උ එයාට සියට අංශ භාගය හැදුනා

ප්‍ර මොන කාලෙද ස්වාමීන් වහන්සේ ?
වසර වශයෙන් කිව්වා නම් අපිට ? අදාල සිද්ධියක් ඒ කිට්ටුව වෙච්ච එකක්වත් මතකයක් තියනවාද එහෙම නැත්නම් ඔබ වහන්සේ ඒ ආගම අතඅරින්න 2017 ඊට කොපමණ කාලයකට පෙර වගේද ඔබ ?

උ 2009 වගේ

ප්‍ර 2009 වගේ කියලා මතකයි

ප්‍ර දල වශයෙන් ද ඒක මතක?

උ ඔව්.

ප්‍ර මොකක්ද සිද්ධ වුනේ ?

උ ඒ සියට අංශභාගය හැදිලා අපිට එයාව මෙහේට දොම්පේ ඉන්නවා වෙද මහත්මයෙක්

ප්‍ර භාර්යාවගේ සීයා ?

උ ඔව් එයාව ගේන්න ඕනේ කියලා නැන්දම්මා කිව්වා ඊට පස්සේ ලෆර් භාජියාර් මම කිව්වානේ ගිලන් රථ සේවයක් තියනවා කියලා. පස්සේ මම ඒ අකකලා අපි කථා කලාම කිව්වා හරි මම ගිලන් රථයක් දෙන්නම් අපි ඉතින් එදාට

ප්‍ර අර ඒ ගිලන් රථයක තමයි කව්ද ?

උ සහරාන්ව එහෙ මෙහේ යැව්වේ ඒ ටීම් එකේ කට්ටිය.

ප්‍ර ස්මයිල් භාජ්ජියාර් ගාව හිටපු එක්කෙනානේ ස්වාමීන් වහන්ස (ඉංග්‍රිසියෙන් කරුණු පැහැදිලි කර ගනියි.) අපි ආයෙත් ඒක පොඩ්ඩක් මතක් කරමුද ?
දැන් ඔබ වහන්සේ කිව්වානේ අර සහරාන්ව යම් අවස්ථාවකදි ඔය ඇම්බියුලන්ස් එහෙක යැව්වා කියලා

උ ඔව්.

ප්‍ර ඔබ වහන්සේ ගිය පාර කිව්වේ ඒක 2014 දි වුන බවයි ඔබ වහන්සේට මතක කියලා ?

FAIR COMMENT BY JEZEEM

උ ඔව්.

ප්‍ර එතකොට ඒ කාගේ ගෙදර ඉදිද්දිද සහරාන්ව ඒ වගේ යැව්වේ ?

උ ස්මයිල් හාජ්ජියාර්ගේ රතුපස්වල තිබුනා යාඩ් එකක්

ප්‍ර එහෙයි.

උ ඒ යාඩ් එකේ තමයි ඉඳලා තියෙන්නේ ඒ සහරාන්ලා ඒ කට්ටිය ඒක ටිකක් සුපිරියට තිබ්ලා තියනවා .

ප්‍ර සුපිරි ?

උ සුපිරි කියන්නේ කන්ටෙනර් එකක ඒ .සි. හයි කරලා තිබ්ච්ච ස්ථානයකුත් ඔකේ තියනවා සහරාන්ලාට ඉන්න

ප්‍ර ඒ කියන්නේ ආරක්ෂිත නවාතැනක් ?

උ ඔව්.

ප්‍ර සේෆ් හවුස් එකක්

උ ඔව්.
මට සංවිධානය ඇතුලෙන් ලැබිච්ව දේවල්

ප්‍ර එහෙමයි.

උ. එතකොට කන්ටෙනර් එකකට ඒ .සි හයි කරලා දැන් ඇපල් මාථ වගේ ඒකට තේ ඒ.සි. හයි කරන්නේ

ප්‍ර එහෙමයි.

උ මේක ඒ.සි. හයි කරපු කන්ටෙනර් එකක් මේ ගොල්ලෝ භාවිතා කරගෙන තියනවා රතුපස්වල . එතකොට ඒ කාලේ එකම නිකායේනේ ලෆර් හාජ්ජියාර් කියන්නේ සහාබ් එකේ තව්හිද් එකේ ලොක්කා කොළඹ. එතකොට ඒ කට්ටිය එකට වැඩ කරන කට්ටිය.

ප්‍ර එහෙමයි.

උ එතකොට යූ.ඩි. එකේ ගේ ඉස්සරහ පිට මම කිව්වේ යූ.ඩී කියලා රෑවුල වවාගත්ත එක්කෙනෙක් යූ.ඩි කියලා කිව්වේ එයයි ලෆර් හාජ්ජියාර් ගේ ගෙවල් දෙකක් තියනවා ඒක ඉස්සරහ .මෙයාගේ ගේ ලෆර් හාජ්ජියාර් ගේ තමයි මේ කඩ පෙලත් යූඩි කරන්නේ යූ.ඩි දේශකයෙක්.මේ තව්හික් එකේ. එතකොට ඉස්මයිල් හාජියාර්ලගේ ගෙදර අනන්ත අප්‍රමාණ තියනවා ලෆර් හාජ්ජියාර්ලා ගේ ගිලන් රථයක් පෙලක් දවස් වලට . ඒ සහරාන් ආවා කියන්න. එහෙම තමයි හිතෙන්නේ මොකද මේවා සයිරන් නලාදාගෙන මේ ගොල්ලන් යන්නේ පෙලක් වෙලාවට අහනවා උලහිට්වලේ ඒ පැත්තටද මේ කොහේද මම කියනවා දොම්පේ ඉස්පිරිතාලෙට මිනියක් ගෙනියනවා කියලා ලෙඩෙක් නොවේ මිනියක් ගෙනියනවා කියලා ඒ දවස් වල දන්නවා ලෆර් ගේ ඒවා තමයි මේ දුවන්නේ කියලා සද්ද දාගෙන මේ ගොල්ලෝ යන්නේ ලෙඩ්ඩු ගෙනියන විදියට ඒවා මේවා තමයි මේ ගෙනිච්චේ.

FAIR COMMENT — BY JEZEEM —

එතකොට අපේ ලෙඩා ගෙනියන කොට මේ ගොල්ලෝ ෆාමසි වලටත් මේක දුන්නා. බුලත්විට කඩේකටත් දුන්නා. ඒකෙන් මට සැක හිතුනා

ප්‍ර මොනවද දුන්නේ අපේ හාමුදුරුවනේ ?

උ ලොකු පෙට්ටියක් ඉස්සරහ තිබුනා අපි පිටිපස්සේ ගියා මමයි

ප්‍ර ලෆර් හාජ්ජියාර් ඒ වෙලාවේ හිටියාද වාහනයේ ?

උ ලෆර් හාජ්ජියාර් තමයි ඒ වෙලාවේ වාහනය ඩ්‍රයිවින් කලේ

ප්‍ර හා?

උ ලෆර් හාජ්ජියාර් ඩ්‍රයිවින් කලා තව කෙට්ටු ළමයෙක් හිටියා සාමාන්‍යයෙන් මේ වගේ ඇන්කර් පෙට්ටි තියෙන්නේ .සාමාන්‍ය ඇන්කර් පෙට්ටි වගේ ඔඩොක්කුවේ තියාගෙන ඒකේ තිබුනා වෝක් පෙට්ටි සයිස් එකට වෝක් තියෙන්නේ ඒ පෙට්ටි සයිස් එකට පෙට්ටි තිබුනා මාවනැල්ල දිගටම හගුරන්කෙතට යනකල් දිගටම හගුරන්කෙතට මෙහා නුවරට යනකල්ම නුවරටත් එහා යනකල් දාගෙන ගියා

ප්‍ර මොනවාද ඒ දැම්මේ ඒ පෙට්ටි?

උ ඒ කොල්ලා බහිනවා ඒකත් ඇරගෙන. ඒවගේ දැන් අරහරිය කඩේකට වගේ අරවගේ කඩවලට වගේ ෆාමසි වලට වගේ

ප්‍ර මොනවගේ කඩවල් වලටද ඔය පෙට්ටි දුන්නේ ?
වෝක් පෙට්ටි වගේ ඒවා දුන්නේ මොන වගේ කඩවල් වලටද ?

උ සිල්ලර බඩු කඩවලටත් දුන්නා. එතකොට මම නිකමට ඇහුවා මේ මොනවද කියලා මේ බෙහෙත් වගයක් කියන එක කිව්වා.

ප්‍ර කව්ද කිව්වේ ?

උ ලෆර් හාජ්ජියාර්.

ප්‍ර එතකොට මේ බෙහෙත් වගේ ඒවා දුන්නේ සිල්ලර කඩ වලට විතරද?

උ සිල්ලර කඩවලටත් දුන්නා ෆාමසි වලටත් දුන්නා බුලත්විට කඩේකටත් මේක දුන්නාම තමයි මම ඇහුවේ මොනවද හාජ්ජියාර් රකාත්වත් දෙනවද කියලා නැහැ නැහැ මේ අපේ බෝවෙන රෝගයකට බෙහෙත් වගයක්.

ප්‍ර බුලත්විට කඩේට දෙනවා ?

උ ඔව් ඔව් ඒවා බෙදන්න කිව්වා දුන්නේ. ඒ තැන් වලට දුන්නේ මේක මොකක් හරි එහෙම දෙයක් තමයි කලේ ඒ මොනව වුනත් ඉතින් එලියට එන්න ඒ අවස්ථාවේ අපහසුයි මට .

ප්‍ර එහෙමයි ඔබ වහන්සේ දැන් ඒ දවස්වල සංවිධානයේ ක්‍රියාකාරි විදියට කටයුතු කලා ?

උ සංවිධානයේ ක්‍රියාකාරි විදියට හිටියා. ඒ දවස් වල ජීවත් වෙලා ඉන්න කොට ප්ලැන් කරගෙනම තමයි එහෙම එලියට එන්න සිදු

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

වුනේ. හිතු හැටියට එන්න බැහැ මොලේ කල්පනා කරලා නාවොත් කවිරුත් ජීවත් වෙන්න ආසයිනේ.

ප්‍ර එතකොට එහෙමනම් අපි ස්වාමීන් වහන්සේ දැන් ඒ එතනට ඔබ වහන්සේ ?

උ අපේ ලෙඩාව ගෙනාවා ලෙඩා ගෙනල්ලා බැස්සුවා .ලෙඩා කොහොම හරි දවස් දෙකෙන් කහටඔවිටදි මලා අන්තිමට එහේ ඒ කට්ටිය කැගැසුවා ඒ ගොල්ලන් සිංහලනේ ඩිංගිරි බංඩාර නිලමේ තුමා නම එස්.බී.ගේ මාමණ්ඩි මස්සිනාව මේ දැන් අපි ගෙනාවේ. එස්.බී.දිසානායක මහත්මයාගේ ඇමතිතුමා ගේ මාමාව මස්සිනාව ගෙනාවේ .එයාගේ අක්කගේ මනුස්සයානේ මේ ඩිංගිරි බංඩාර නිලමේතුමා . නැන්දම්මාගේ තාත්තා නේ. මිනිය ගෙනල්ලා දෙන්න කිව්වා මං අන්තිමට මගේ මුදලින් නැන්දම්මලාට සල්ලි තිබුනේ නැහැ හර්ස් එකක් අරන් එහේ මිනිය අරන් ගියා. ඒක තමයි වුනේ මම ඉතින් සංවිධානයට මම කිව්වා මෙහෙම කරදරයක් වුනා කිව්වාම සල්ලි දුන්නා. මිනිය එහේ ගිහින් බාරදිලා ආවා එම්බාම් කරලා පෙට්ටියකම තියලා ගිහින් දුන්නා ඒවාගේ සිද්දි ඇති වුනා

ප්‍ර එහෙමයි එතකොට එස්.බී.දිසානායක මහත්මයා ඔබ වහන්සේට ඥාතිත්වය ඇති වන්නේ විවාහයෙන් ?

උ විවාහයෙන් එස් බී දිසානායක මහත්මයා මගේ ගෙදරට එන්නේ කේ බී කියන එක්කෙනා එනවා .

ප්‍ර කේ.බී.දිසානායක කියන එක්කෙනා ?

උ කේ.බී.දිසානායක එනවා ඒ ගොල්ලන්ගේ ඥාති පරම්පරාව ඔක්කෝම එනවා මල ගෙදරට නැන්දම්මලා ගියේ ඔක්කොම සිංහල විදියට ඇඳගෙන එන්න එපා කිව්වා මල ගෙදරටවත් මය විදියට නම් ඇඳගෙන ඔක්කොම සාරි ඇඳගෙන මගට ගිහිල්ලා ඩ්‍රයිවර්ලා පුංචි අම්මලාගේ ගෙදර ගිහින් සාරි අරන් හැට්ට හොයාගෙන ගිහිල්ලා තමයි මල ගෙදර ගියේ. මේ ගොල්ලෝ ගෙදරින් පැනලා ගිය කෙනෙක් නේ.

ප්‍ර එහෙමයි?

උ නැන්දම්මා හාමුදුරුවන් එක්කලා ඉතින් ඒ විදියට තමයි මල ගෙදර ගියේ .ඒත් හින්ටි ගහනවා ඔන්න ඌරෝ එනවා කියලා කට්ටිය .

ප්‍ර ස්වාමීන් වහන්ස දැන් ඔබ වහන්සේ කිව්වානේ දැන් කවුරු වුනත් කැමති ආරකපිතව ජීවත් වෙන්න .ජීවිතය බේරාගන්න කියලා. එතකොට ඔබ වහන්සේට මේ ගරු විනිශ්චය සභාවට සඳහන් කරන්න පුලුවන්ද අර ඔබ වහන්සේ යම් අවස්ථාවකදි කල්පිටිය විහාරයේ සමාවෙන්න ස්වාමීන් වහන්ස ඉන්දියාවේදි මුසම්මිල්

President's Copy
FAIR COMMENT BY JEZEEM

ගෙන් දැනගත්ත නොරතුරු ලංකාවට ආවට පස්සේ කාටහරි ලබා දෙන්නට උත්සාහ දැරුවාද කියලා ?

උ ඔව්

ප්‍ර ඇයි ඒ ?

උ මට මුහුණ දීලා කරන්න බැරි නිසා ඒ අවස්ථාවේ .

ප්‍ර නැහැ ඇයි ඒ ඔබ වහන්සේ හිතුවේ ඒ වගේ නොරතුරක් ලබා දෙන්න ඕනේ කාටහරි කියලා ?

උ මේ මිනිස් ජීවිත ඝාතනය නතර කරන්න

ප්‍ර මිනිස් ජීවිත විනාශ වෙන එකෙන් වලක්වා ගන්න?
ඉතින් මොකක්ද ඔබ වහන්සේ ගත්ත පියවර ?

උ මම ඉස්සරලාම ඉන්දියාවේ ඉඳලා ආවේ හැටිය පන්සලට ගොඩවෙච්ච හැටිය මනසාලංකාර හාමුදුරුවෝ කියලා මගේ එක් සහෝදර හාමුදුරු නමට කියන්න එයා මම ඇහුවා මොකද කරන්නේ මේක නායක හාමුදුරුවන්ට කියලා වැ ඩක් නැහැ. නායක හාමුදුරුවෝ ආර්යාවන්ගේ එකමුතුව කියලා මුස්ලිම් අය එක්ක සංවිධානයක් ඇති කරගෙන කල්පිටියේ සමගියක් කරලා ඔවා කරන්න එයා දගලනවා . ඉතින් මෙයා කිරෙන් වතුරයි බේරන්න යන්නේ ඒක හරියන්නේ නැහැ වෙන කාට හරි කියමු කියලා

ප්‍ර සහෝදර පැවිදි නම කිව්වා ?

උ කිව්වා ඉන් පස්සේ අපි දෙන්නා කථා කරලා ඉස්සරලාම ක්වායිට් එකේ එහේ ඉන්න මෙයාගේ නම කයිවාරුප්පුව බුහාව පල්ලිය ගාව මිගමුවේ එයා බැඳලා ඉන්නේ ක්‍රිස්තියන් එයාගේ නෝනා මෙයාගේ රුකියාව පරිසණකයෙන් වැඩ කරන්නේ විසා එක ක්වායිට් එකේ

ප්‍ර නම ස්වාමීන් වහන්ස ?

උ එයාගේ නම රසික මහත්මයා

ප්‍ර කවිද රසික ?

උ රසික.

ප්‍ර කුවේට් එම්බසියේ වැඩකරන රසික මහත්මයා ?

උ ඔව් රසික මහත්මයා ඒ වගේම ආනන්දාරාමයේ විහාරාධිපති කියන්නේ මිගමු පැත්තට ඉන්න ශාසානාරක්ෂක බලමණ්ඩලයේ ගොඩක් ඉහළ නායක හාමුදුරුනමක්

ප්‍ර එහෙමයි.

උ ඒ කියන්නේ හොඳ ස්වාමීන් වහන්සේ කෙනෙක් හොඳට ආගම ධර්මය රකින හොඳ ස්වාමීන් වහන්සේ කෙනෙක්

ප්‍ර ඔබ වහනසේ ඇයි මිගමුවේ ස්වාමීන් වහන්සේ කෙනකුට ඒක කියන්න උත්සාහ කලේ ?

උ ඒ පන්සලේ රසික මහත්මයාලගේ ෆැමිලි එක තමයි ගොඩක් පල්ලියට ඉන්නේ ඒ ගොල්ලන් ගේ බාප්පලා, පූංචි අම්මලා, මාමාලා

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඒ ගොල්ලන් ඔක්කෝම සිංහල බෞද්ධ ක්‍රිස්තියන් කලවම් වෙච්ච කට්ටිය පල්ලිත් යනවා පන්සලටත් උදව් කරනවා . ක්‍රිස්තියානු උදවිය ඇත්තු හිටන් අඹපු ඒවා තියනවා . ඒ ගොල්ලන්ගේ වියදමින් බෞද්ධ පන්සලේ ඒ හින්දා ඒ සම්බන්ධකම නිසා මම ඒකේ ධර්මදේශනාවක් කරනවා .

ප්‍ර ඔබ වහන්සේට කවි ඔණ එහෙම වදාරන්න පුලුවන් නේද ?

උ ඔව්. එතකොට එතන එහෙම තියෙන නිසා තමයි එයාට කියන්නේ ඊට පස්සේ කෝප්‍රල් කෙනකුට කියනවා එයා ෆෝස් එකේ අපේ පොයින්ට් එකේ ඒ ඔක්කෝම මෙතන මුලින් විමර්පණය කරනකොට ෆෝන් එකෙන් ඒ ගොල්ලො කථා කරලා කියලා එතන හිටපු අපේ සර් ඒ ගොල්ලන්ගේ වොයිස් කට් එක ගත්තා මේකේ රෙකෝඩින් තියනවා.

ප්‍ර ඔව් පොලිස් අධිකාරි ලියනගේ මහත්මයාට

උ ඔව් මම ඔප්පු කරලා පෙන්නුවා සාක්පි පාස්කු ප්‍රහාරයේ.

ප්‍ර ප්‍රකාශය වාර්තා කරන අවස්ථාවේ ?

උ ආනන්ද හාමුදුරුවන් ෆෝන් එක ඔෆ් කරලා මම බැලුවා පස් පිඩැල්ලෙ ඉන්නේ.

ප්‍ර ඔබ වහන්සේ අවස්ථාවකදි හමුදාවේ ?

උ ඔව්

ප්‍ර හමුදාවේ සාජන් මේජර් කෙනකුට කථා කලාද ?

උ ඔව්. ජයතිලක මහත්මයාට

ප්‍ර ජයතිලක මහත්මයාට කථා කලා මොකක්ද ඔහුට කිව්ව පණිවිඩය?

උ ඔහුට මම කිව්වා මේ විදියට පාස්කු ඉරිදා ප්‍රහාරයක් කියලා තියෙන්නේ මයා ආමි එකේ හිටපු හින්දා සාජන් මේජර් කෙනෙක් ඒ නිලධාරින්ට කියන්න කියලා .ඒකත් අපේ මේ සර් ඉදිරිපිට එයාගේ කටහඩින්ම

ප්‍ර සර් කියලා කියන්නේ අපේ මේ පොලිස් අධිකාරි ලියනගේ මහත්මයා

උ ලියනගේ මහත්මයා ඉදිරිපිට මම ඒකත් ඔප්පු කලා ඒවාගේම මේකේ 07 දෙනකුට විතර එහෙම.

එතනින් එහාට මම ඔකට ලියන්න බැරිවුනා දුඩි මහත්මයා සමග අපේ කල්පිටියේ පන්සල අවට ඉන්න දොලහකට දහතුනකට විතර ක්‍රිස්තියානි තරුණයොත් මේක දැනුවත් වුනා

ප්‍ර එහෙමයි.

උ ඒ ගොල්ලොත් විහිඵවක් හැටියට සැලකුවා පාස්කු ප්‍රහාරයෙන් පස්සේ මාව ඝාතනය කරන්න එනවා හතර දෙනෙක් .

ප්‍ර අපේ හාමුදුරුවනේ අපි එතෙන්ට එමුද අපි පිලිවෙලට ගිහිල්ලා එතෙන්ට එමු නේද ?

උ ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර එහෙමයි එතකොට ඔබ වහන්සේ ජූඩ් මහත්මයාට කිව්වා ?
උ ඔව්.
ප්‍ර ජූඩ් ඔබ වහන්සේගේ හොඳ දායකයෙක් ?
උ ඔව්.
ප්‍ර එතකොට ඒ අයට කියලත් මේ නොරතුර ඉහලට ලබා දෙන්න උත්සාහ කෙරුවා ?
උ ඔව්.
ප්‍ර ඒක සාර්ථක වුනෙත් නැහැ ?
උ නැහැ.
ප්‍ර දැන් යම් වෙලාවක ඔබ වහන්සේ මේ ඉතාලියේ ඉඳලා ආපු කෙනෙකුට ?
උ ඔව් ඉතාලියේ අජිත් අයියාට කිව්වා එයා ගාව තියෙනවා මේකේ රෙකෝඩින් එක
ප්‍ර ඒ කියන්නේ අජිත් අයියට කථා කරපු එකේ රෙකෝඩින් එක තියෙනවාද ?
උ ඔව්.
ප්‍ර අජිත් අයියට මොකද කිව්වේ ?
උ මෙහෙම පාස්කු ප්‍රහාරයක් තියනවා අජිත් අයියේ පුලුවන් නම් දේශපාලඥයෙක් අල්ලලා මහින්ද මහත්මයාලට මේක කරන්න කියලා.
ප්‍ර අජිත් අයියා ඔබ වහන්සේ කිව්ව ඉතාලියේ රස්සාව කරන කෙනෙක් ?
උ එතකොට ලංකාවට ඇවිල්ලා
ප්‍ර ලංකාවේ කොහේද පදිංචි ?
උ ලංකාවේ අනුරාධපුර අටමස්ථානයට එනා පැත්තේ කටුකැලියාව ඉස්කෝලේ ඉස්සරහ පිට මෙයාගේ ගේ තියෙන්නේ.
ප්‍ර අජිත් අයියාට ඒ පණිවිඩය දෙන කොට ඔබ වහන්සේ කොහේ ඉඳලාද දුන්නේ ?
උ මම කල්පිටියේ ඉඳලා
ප්‍ර එතකොට ඔබ වහන්සේ දුරකථනයෙන් කථා කලේ ?
උ ඔව්
.ප්‍ර අර වාර්තා වෙලා තියනවා කියලා කිව්වේ ඒ දෙබස.
උ ඒ දෙබස
ප්‍ර ඒක දැන් ඔබ වහන්සේ ගාව දැන් තියනවා ?
උ මා ගාව නොවේ එයා ගේ ෆෝන් එකේ තියනවා.
ප්‍ර එයාගේ ෆෝන් එකේ තියනවා ?
උ අප්‍රේල් මාසේ මගේ මේ ෆෝන් එකේ නම්මරය වෙක් කලාම ටෙලිකොම් එකේ මේ සියලුම සත්‍ය තියනවා කුවයිට් එකේ උපාසක අම්මා කෙනකුට ගොඩක් අයට මම මේක සඳහන්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කරලා තියනවා ෆෝන් එකෙන් 15 දෙනකුට වැඩිය මම සඳහන් කරලා තියනවා මගේ ටෙලිකොම් එක 077-4315385

ප්‍ර ආයේ කියන්න ස්වාමීන් වහන්ස ?

උ 077-4315385

ප්‍ර ඔබ වහන්සේගේ නොම්මරය ?

උ ඔව් එතකොට මම මෙන්න මේ කෙනාගෙන් මේ නොම්මරය ඉල්ලා ගත්තේ ගීත රචක හා තරුණ සේවා සම්බන්ධව.

ප්‍ර ඔබ වහන්සේ දැන් ඔය යන්නේ තව ටිකක් ඉස්සරහට ගිහිල්ලා නේද ?

උ නැහැ . නැහැ.

ප්‍ර දැන් අපි සිරිතුංග ?

උ සිරිතුංග අයියාටත් මම කිව්වා. එයාටත් ෆෝන් එකෙන් කිව්වේ

ප්‍ර එතකොට එයාෆෝස් එකටත් යන්න කිව්වානේ ?

උ එයා ෆෝස් එකටත් කිව්වා

ප්‍ර පිලිවෙලට යන් නේද එතකොට අර පිලිවෙලට තේරෙනවානේ නේද ?

එහෙම යන් නේද ?

උ එයා ෆොස් එකටත් කිව්වා.

ප්‍ර එතකොට සිරිතුංග මහත්මයාටත් කිව්වා ?

උ එයා දේශපාලනය කරන කෙනෙක් සිරිතුංග අයියා

ප්‍ර එතකොට එයාට කියලා යම් ප්‍රතිඵලයක් තියනවාද ?

උ නැහැ. කිසිම තැනකින් ප්‍රතිඵලයක් ලැබුනේ නැහැ .

ප්‍ර එතකොට ගුවන් හමුදාවේ කාටහරි මේ පිළිබඳව කිව්වාද?

උ ගුවන් හමුදාවේ සි. ඕ මහත්මයාටත් කිව්වා.

ප්‍ර ඒ කොහේ සි. ඕ ද?

උ එයා කෆිර් යානා පුහුණු කරන මධ්‍යස්ථානය කල්පිටිය බ්‍රාන්ච් එකේ සි.ඕ මහත්මයා

මෙතැන් සිට ල/ ලේ දම්මිකා මිය විසිනි

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

මුල් කොටස වාර්තා කලේ යමුනා මිය විසින්ය.
දැන් වේලාව ප.ව.6.05
මෙතැන් සිට වාර්තා කරන්නේ ධම්මිකා පෙරේරා විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල්වරිය විසින්:</u>

ප්‍ර :ඔහුට දුන්න පණිවිඩය මොකක්ද?

උ :එයා ප්‍රතිචාර දැක්වුයේ නැහැ හාමුදුරුවනේ දානේ එහෙම පන්සලට, මම කිව්වා ඉතින් නාවික හමුදාවේ කවුරු හරි ගෙනල්ලා දුන්නොත් ඔගොල්ලන්ගේ පොයින්ට් එකේ කට්ටිය දානේ ගෙනල්ලා දුන්නොත් හැරෙන්න දානයක් හම්බ වෙන්නේ නැහැ, එයා රු:500 ක් දීලා 500 කින් ෂේප් වෙලා ගියා.

ප්‍ර :එතකොට දැන් මේ ඔබවහන්සේ කියන දැනුම්දීම් සිද්ධ වුනේ අර ජනවාරි මාසේ 2019 ඔබ වහන්සේ ලංකාවට වැඩියට පස්සේ පාස්කු ප්‍රහාරය සිදු වෙන්නට ඉස්සරවෙලා?

උ :ඔව්.

ප්‍ර :එතකොට ඔබ වහන්සේ දැන් ගීත රචකයෙක් ගැන කිව්වනේ?

උ :ඔව්.

ප්‍ර : ඒ ගීත රචකයා කවුද නම?

උ : එයාගේ නම ඇන්ටන් වෙල්ගම මහත්තයා. එයාගෙන් මම කිව්වා මේ ස්වාමීන් වහන්සේ කෙනෙක් රටට අවශ්‍ය කරන දෙයක් පරික්ෂණය කරලා තියෙනවා අවුරුදු 38 ක් ඒක මහින්ද රාජපක්ෂ මහත්තයාට තමයි වටින්නේ, මට නොම්මරය ඕනේ කියලා.

ප්‍ර : කාගේ නොම්මරයද?

උ :මහින්ද මහත්තයාගේ නොම්මරය.

ප්‍ර : නොම්මරය ඕනේ කියලා කිව්වා?

උ :එයා මහින්ද මහත්තයාට අප්‍රේල් 14 වෙනිදා මට කවි ලියලා තියෙනවා. මගේ අමුතුම කවි ශාලියක් තියෙනවා ඒක හොඳයි කියලා

ප්‍ර :කවුද ලියලා දෙන්නේ කවි?

උ :එයා ලියලා දෙන්නේ. එයා අප්‍රේල් 14 පන්සලට එනවා එයා.

ප්‍ර :ඒ කියන්නේ ඇන්ටන් වෙල්ගම තමයි ඔබ වහන්සේට ලියලා දෙන්නේ කවි බණ කියන්න? එයා අප්‍රේල් 14 පන්සලට ආවා. ඊට පස්සේ?

ප්‍ර :එයා මහින්ද මහත්තයට කෝල් එකක් අරගෙන

ප්‍ර :ඔබ වහන්සේගේ ඉස්සරහාද?

උ :මගේ ඉස්සරහාපිට. Hand free දාලා

ප්‍ර :මොන මහින්ද මහත්තයටද?

උ :අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ

ප්‍ර :වර්ථමාන ගරු අග්‍රාමාත්‍යතුමා?

උ :අග්‍රාමාත්‍යතුමාට කෝල් එකක් අරගෙන විපක්ෂ නායකතුමනි ...

FAIR COMMENT BY JEZEEM

ප්‍ර :ඒ අවස්ථාවේදි එතුමා විපක්ෂ නායක?

උ :එතකොට අවුරුද්දට සුභ පතනවා.

ප්‍ර :දැන් ඔබ වහන්සේට ඇහෙනවද ඒක?

උ :ඇහෙනවා. මගේ ඉස්සරහාපිට තමයි එයා කරන්නේ. ඊට පස්සේ මම ඇහුවා කාටද කතා කලේ කියලා. මහින්ද මහත්තයට කිව්වා. ඊට පස්සේ මම කිව්වා මට නොම්මරය දෙන්න පුළුවන්ද මම අඳුරන ස්වාමීන් වහනසේ කෙනෙක් පොඩි ගවේශනයක් කරලා තියෙනවා අවුරුදු 37 ක ඒක මහින්ද මහත්තයට කියන්න ඕනේ මට ඔය නම්බර් එක දෙන්න එපා කියලා සර් කියලා තියෙන්නේ, කමක් නැහැ අපේ හාමුදුරුවෝ මට විශ්වාසයි දෙන්නම් කියලා එවේලෙම එයාම දාලා දෙනවා නම්බරය.

ප්‍ර :ඒ නොම්මරය මොකක්ද ස්වාමීන් වහන්ස?

උ :071-1100011

ප්‍ර :ඒක තමයි නම්බර් එක ඒ අවස්ථාවේ විපක්ෂ නායකතුමාගේ?

උ :ඒක මහින්ද මහත්තයාගේ කියලා හොදාකාරව දැන ගත්තා වයිබර් වල මහින්ද මහත්තයාගෙයි, තව ඇමති කෙනෙක්ගෙයි පින්තූර ටක් ගාලා වැටුනා නම්බරයට යටින්.

ප්‍ර :හා, හා නම්බරය දැම්මාම තියෙනවා. දැන් ඔබ වහන්සේ ලඟ තියෙනවද?

උ :තියෙනවා.

(සාක්ෂිකරු විසින් ෆෝන් එකෙහි ඇති එම නම්බරය විවෘත කර පෙන්වයි)

ඕකේ තියෙනවා මෛත්‍රිපාල මහත්තයාගෙත් නොම්මරය තියෙනවා. එයාගේ නොම්මරයත් මම ගත්තා. විශේෂ ව්‍යාපෘති අධ්‍යක්ෂක පීරිස් මහත්තයාගෙන් තමයි ගත්තේ පොලොන්නරුවට ගිහිල්ලා.

ප්‍ර :ඇන්ටන් වෙල්ගම මහත්තයගෙන් එවකට විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මහත්මයාගේ මේ 071-1100011 නොම්මරය ලබා ගත්තට පස්සේ ඔබ වහන්සේ මොකද කලේ?

උ :මම එදා ඉදලා දවසකට පහලොස් වතාවක් කෝල් අරන් තියෙනවා. අප්‍රේල් 23 වෙනිදා තමයි මම රෑ දවල්,මම රෑ 10ට, 11 ත් ගන්නවා.

ප්‍ර :හරි ඔබ වහන්සේ ඒ කියන්නේ බොහෝ අවස්ථාවලදි කතා කෙරුවා?

උ :ඔව්.

ප්‍ර :දැන් ස්වාමීන් වහන්ස කතා කරන කොට ඔය ඔබ වහන්සේ ලඟ ටච් ෆෝන් එකක්නේ තියෙන්නේ

උ ඔව්

ප්‍ර :දැන් ඔය විවිධ ආකාරයට පුළුවන් නේ සාමාන්‍ය දුරකතන සේවය තියෙනවා, එතකොට වට්සැප් තියෙනවා, වයිබර් තියෙනවා, ඉස්ට්‍රොග්‍රෑම් තියෙනවා, ඉමෝ තියෙනවා මොන ආකාරයෙන්ද ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ :ගොඩක්ම අරගත්තේ දැන් මේ වයිබර් කියන එකයි අනිත් ලයින් එකෙනුයි දෙකෙන්ම අර ගත්තා.

ප :අනික් ලයින් එක කියන්නේ සාමාන්‍ය දුරකතනය?

උ :සාමාන්‍ය මුදල් කැපෙන දුරකතනය. ඉමෝ හැර.

ප :ඔබ වහන්සේ කිව්ව ඔබ වහන්සේගේ දුරකතන අංක 077-4315385 කියන අංකය නේද?

(මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් ඉහත අංක දරන ජංගම දුරකතනය ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. තමන්ගේ උපන් දිනය සහිත පාස්වර්ඩ් අංකය එහි දමා ඇති බව දන්වන ලදුව, කොමිෂන් සභාව විසින් එය සාක්ෂිකරුට විවෘත කර දෙන ලෙසට දන්වා සිටින ලදුව එය විවෘත කර නැවත කොමිෂන් සභාවට ලබා දෙයි)

ප ඒ කාලේ කෝල් ලොග් එකට අපිට යන්නත් පුළුවන්ද?

උ :එච්චර නම් මම ෆෝන් මම ලඟදි තමයි ටච්ෆෝන් අපිට සංවිධානයෙන් අපිට දුන්නේ නැහැ, මම ලඟකදි තමයි ෆෝන් එක ටිකක් පාවිච්චි කලේ. ඔතන තියෙනවා විමල් වීරවංශ මහත්තයාගේ තියෙනවා, අනුර කුමාර දිසානායක මහත්තයාගේ තියෙන්න ඕන, ගුවන් හමුදාපතිතුමාගේ තියෙනවා, නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ තියෙනවා, සියළුම දේශපාලන නායකයන්ගේ..

ප :ඔබ වහන්සේ තොරතුරු එකතු කර තියෙනවා?

උ :හැම තැනින්ම නම්බර් හොයාගෙන හැම කෙනාටම ටිකක් කිව්වා. අන්තවාදී සම්බන්ධව ගොඩක් විස්තර මා ගාව තියෙනවා.

ප :එතකොට ඔබ වහන්සේ කිව්වා අප්‍රේල් 14 වෙනිදා ඉදන් ම විපක්ෂ නායකතුමාට ඔබ වහන්සේ මේ දුරකතනය මගින් අමතන්න උත්සාහ කෙරුවා මේ පණිවිඩය දෙන්න කියලා,?

උ :ඔව්.

ප :එතුමා ගත්ත ද දුරකතනය?

උ :දුරකතනය ඉස්සුවේ නැහැ.

ප :ඒ වගේ අවස්ථා කීයක, දවස් කීයක ඔබ වහන්සේ උත්සාහ කෙරුවද මේ පාස්කු ප්‍රහාරය පිළිබඳව මේ තොරතුර ලබා දෙන්න විපක්ෂ නායකතුමාට? ඒ කියන්නේ ගරු වර්ථමාන අග්‍රාමාත්‍යතුමාට?

උ :අප්‍රේල් 23 වෙනිදා වෙන කල් දවසේ ගානේ වගේ කෝල් ගත්තා.

ප :ඇයි ඔබ වහන්සේ කියන්නේ අප්‍රේල් 23 වෙන කල් දවස ගානේ ම කෝල් ගත්තා කියලා, ඊට පස්සේ මොකද වුණේ?

උ :පාස්කු ඉරිදායින් පස්සෙත් මම ගත්තා. මොකද ඊලඟ නත්තල් ප්‍රහාරයක් තියෙනවානේ. ඉන් පස්සේ අප්‍රේල් 23 වෙනිදා තමයි ෆෝන් එක උස්සන්නේ. 10 කුත් ගානකට. උදේ දානේ ගන්න ඔන්න මෙන්න 10 ට, 11 ට වගේ තමයි ෆෝන් එක උස්සන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර :ඒකෙන් ඔබ වහන්සේ අදහස් කරන්නේ විපක්ෂ නායකතුමා උත්තර දුන්නා කියලා ඔබ වහන්සේගේ දුරකතනය පණිවිඩයට?

උ :ඔව් දුරකතනය අරගෙන කිව්වා මම තෙරුවන් සරණයි කිව්වාම, හාමුදුරුවනේ කොහේද කියලා, මම කිව්වා මම කල්පිටියේ, මම කිව්වා පාස්කු ප්‍රහාරය මම විස්තර ගොඩාක් දැනගෙන හිටියේ, ඔබතුමා, නායකතුමාට අප්‍රේල් 14 වෙනිදා ඉදලා ගන්නේ, ඇන්ටන් වෙල්ගම මහත්තයාගෙන් තමයි නම්බර් එක ගත්තේ, ඉතුරු ප්‍රහාරත් තියෙනවා, මම මේ සම්බන්ධව ගොඩක් දන්නවා කියලා. එතකොට රාලහාමි කෙනෙකුට එන්න කියලා ඇරලා DIG මහත්තයෙකුට තමයි ෆෝන් එක දෙන්නේ මහින්ද මහත්තයා.

ප්‍ර :ඔබ වහන්සේ කොහොමද දන්නේ ඔය DIG කෙනෙක්ට ෆෝන් එක දුන්නා කියලා?

උ ෆෝන් එක ඔන් එකේ තියාගෙන තමයි මෙන්න මේ DIG මහත්තයා මෙන්න මේ හාමුදුරුවන්ගේ මේක අහගන්න කිව්වා. ඒක වටිනාකමක් තියෙන නිසා තමයි නායකතුමා ඒක කිව්වේ. එතනින් පස්සේ නායකතුමාට ඒක අමතක වෙන්න ඇති, ගොඩක් ප්‍රශ්න වෙලාවනේ, ගොඩක් සෝෂාව තියෙන තැනක තමයි ගත්තේ නායකතුමා. ඊට පස්සේ මගෙන් ඇහුවා මොකක්ද කියලා ඉවර වෙලා, මම කිව්වා මෙන්න මේහෙම...

ප්‍ර :කවුද ඇහුවේ ?

උ :DIG මහත්තයා. DIG මහත්තයට නේ මේ කියන්න කිව්වේ, ඊට පස්සේ එයා ඇහුවාම මම විස්තරය කිව්වාම කිව්වා අර ගලබොඩ අත්තේ ඥාණසාර හාමුදුරුවෝ ජම්පරයක් ගහගෙන අන්න ඇතුලේ ඉන්නවා, ඔබ වහන්සේටත් යන්න ඕන නම් ඔය වැඩේ කරන්න කිව්වාම මට ඒ වෙලාවේ මගේ වාචා සංවරය නැතුව ගියා. මට විශාල වේදනාවක් 300 ක් මැරුණා, 500 ක් තුවාල වුණා ඒකේ පාපය මට අයිතියි කියන හැඟීම ඇති වුණා. ඒ වෙලාවේ මට ඉවසීම නැතුව ගියා. මොකද මාත් ප්‍රථක්ජන මනුස්සයෙක්, ඒ වගේම මම රහත් වෙලා නැත. ඒ වෙලාවේ මම එයාට දෙන්න ඕන උත්තරය වාචා සංවරය නැතුවම කිව්වා. ඊට පස්සේ ෆෝන් එක මම කට් කලා.

ප්‍ර :ඒ කියන්නේ පරුෂ විදියට ඔබ වහන්සේ ඇමතුවා?

උ :ඔව්. මම මෝඩයා කියලා බැන්නේ. තොපි වගේ මෝඩයෝ තමයි ඔය තැන්වලට එන්න ඕන කියව වචනය මම කිව්වා. කියලා තමයි මම ෆෝන් එක තිබ්බේ. ඒකත් ගත්ත හැකියි ටෙලිකොම් එකෙන්. ඒතරම් කේන්ති ගියා මට. මොකද සත්තු නෙමෙයිනේ මම මනුස්සයෙක්නේ.

ප්‍ර :ඔබ වහන්සේට ඒ වෙලාවේදි දුරකතනයෙන් අර DIG මහත්තයට එන්න කියන්න කියන එක ඇහුනානේ, ?

FAIR COMMENT BY JEZEEM

උ :ඔව්.

ප්‍ර :එතකොට ඔබ වහන්සේ එක්ක කවුරු හරි කතා කලානේ ඊට පස්සේ?

උ :ඔව්

ප්‍ර :ඒ කතා කරන එක්කෙනා කවුද කියන එක ඔබ වහන්සේ ඇහුවද?

උ :මම ඇහුවා.

ප්‍ර :එයාගේ නම කිව්වද?

උ :නම කිව්වා. නම මට මතක නැහැ මම DIG කියලා ඉවර වෙලා නමක් එයා කිව්වා. කිව්වට පස්සේ මම සර් කියලා කතා කෙරුවා, මම කිව්වා සර් මේ පාස්කු ප්‍රහාරය පිළිබඳව මම ගොඩාක් දන්නවා, මම මේ නායකතුමාට ගන්නෙත් අප්‍රේල් 14 වෙනිදා ඉදලා කියන්න. කිව්වට එයා ඒක පිළි ගත්තේ නැහැ. ඒතරම් බුද්ධිමත් කට්ටිය තමයි හම්බ වුණේ.

ප්‍ර :එතකොට ස්වාමීන් වහන්ස දැන් ඒකෙනුත් ප්‍රතිඵලයක් නැතිවුණාම ඊට පස්සේ ඔබ වහන්සේ මොකද කලේ?

උ :ඊට පස්සේ මම දැන් උසස් තැන්වලට ගිහිල්ලා නැහැ, ආරක්ෂක ලේකම් කාර්යාලය අරෙයි මෙහෙයි මම ගිහිල්ලා නැහැ, කොතන තියනවද කියලා දන්නෙත් නැහැ. ඉන්පසුව මම මැසෙන්ජර් වලින් හොයා ගන්නවා මගේ Face book එකේ ඉන්නවා ජඹුරේවෙල චන්දරතන හාමුදුරුවරු, ගලබඩ අත්තේ ඤාණසාර හාමුදුරුවන්ගේ ලේකම් වගේ ඉන්න හාමුදුරු නමක්.

ප්‍ර :එතකොට ඔබ වහන්සේ කියන්නේ ඔය වකවානුව වෙන කොට ගලබඩ අත්තේ ඤාණසාර හාමුදුරුවෝ බන්ධනාගාර ගතව හිටියේ?

උ :ඔව්. ඊට පස්සේ මම ගුවන්විදුලි සංස්ථාවට එහා පැත්තේ ඔය තුන්මුල්ලෙන් බැහැලා තමයි මම ගියේ මීටර් ටැක්සියක එය පන්සලට. ඒකේ පන්සලක් තිබුණා කෙලවරේ. ඒ පන්සලට ගිහිල්ලා ඒගොල්ලෝ මුණ ගැසිලා එදා රාත්‍රියේ ඒ පන්සලේ ඉදලා පහුවදා උදේ පාන්දර, රාත්‍රියේ ඒගොල්ලෝ මගේ විස්තර ගන්න බැලුවා. විස්තර ගන්න බලන කොට මම ඒ විස්තර දුන්නේ නැහැ. මොකද ඒගොල්ලෝ හම්බ වෙන්න යනවා කිව්වාම මම අදුරන ස්වාමීන් වහන්සේ කෙනෙකුට මට කීව්වා හාමුදුරුවනේ ඔබ වහන්සේ යන්නේ රට බේරගන්න ඒගොල්ලෝ යන්නේ වෙන ගමනක්, ඒගොල්ලොත් එක්ක ගිහිල්ලා ආරක්ෂක අංශවලට දැනුම් දෙන්න ඉහළ තැනකට. ඒගොල්ලන්ට විස්තර දෙන්න එපා කියලා. ඒගොල්ලෝ ගොඩාක් උත්සහා කලේ විස්තර ගන්න. පසුව උදේ ඒක සාර්ථක වුනේ නැති හින්දා මාව එක්කරගෙන ඇවිල්ලා ඉස්සෙල්ලම යනවා ජනාධිපති ලේකම් කාර්යාලයට යන්නේ ඉස්සෙල්ලාම. ගිහිල්ලා ලිපියක් බාර දෙනවා ඒගොල්ලෝ. ඒගොල්ලොන්ගේ ලිපියක්, මගේ එකක් නෙමෙයි.

ප්‍ර :ඤාණසාර හාමුදුරුවන්ගේ කණ්ඩායම?

Provisional Copy
FAIR COMMENT BY JEZEEM

උ :ඥාණසාර හාමුදුරුවන් එළියට ගන්න. ඊට පස්සේ ගොල්ෆේස් එක ඉස්සරහා තියෙන්නේ ඔය දැන් චීනෙන් ගහන මේවා එක ඉස්සරහාපිට, එතනට ඇතුල් වෙනවා අපි. එතනට ඇතුල් වෙලා ඉවර වෙලා එකේ ඇතුලේ මේවගේ කෝට් එක ඇඳගත්තු ටයි එක දාගත්ත මහත්තයෙක් හිටියා.

ප්‍ර :ඒ කියන්නේ ඔබ වහන්සේලා මේ ආරක්ෂක ලේකම් කාර්යාලය ඇතුලේ?

උ :ඒකේ ඇතුලට ගියා. ගිහිල්ලා ඉස්සරහා පුටුවක ඉඳගෙන එයා ෆයිල් එකක් අරගෙන ඒකේ ලිව්වා මගේ සටහන් ටික. මම කිව්වා අවුරුදු 17 ක් මම මේකේ ඇතුලේ නායකත්වයක් දරනවා, අවුරුදු 20 ක් පිටින් හොයලා තියෙනවා. පාස්කු ප්‍රහාරය මුලින් සඳහන් කලා. මේ ගැන මට ඉහල නායකත්වයකට මට දැනුම් දෙන්න ඕනේ කියලා. ඊට පස්සේ ඒකට එන්නේ නොරොච්චෝලේ පොලිසියේ මත් ද්‍රව්‍ය අල්ලන රාලහාමිලා.

ප්‍ර :ඔබ වහන්සේ දැන් රාජ්‍ය ආරක්ෂක ලේකම්වරයාට කරන ලද පැමිණිල්ලට ඒ ගැන විමර්ශන කරන්නේ ඔබ වහන්සේ කියන විදියට නොරොච්චෝලේ දෙන්නෙක්?

උ :තුන්දෙනෙක් එනවා. SI මහත්තයෙකුයි, ජගත් කියන SI මහත්තයයි, අනෙක් දෙන්නා එන්නේ රාලහාමිලා දෙන්නෙක්.

ප්‍ර :ඔබ වහන්සේට පැහැදිලි කරන්න පුළුවන්ද දැන් ආරක්ෂක ලේකම්වරයාට කරන පැමිණිල්ලකට කොහොමද නොරොච්චෝලේ නිලධාරීන් සහභාගි වෙන්නේ කියලා, නැත්නම් සම්බන්ධ වෙන්නේ කියලා?

උ :ඒක තමයි එතන ප්‍රශ්නේ.

ප්‍ර :දැන් කල්පිටියට නොරොච්චෝලේ අයිති වෙනවද? නැත්නම් කල්පිටියේ ඉන්නේ නොරොච්චෝලේ යටතේ නෙමෙයිනේ?

උ :මගේ පොලිස් වසම නොරොච්චෝලේ.

ප්‍ර :ඔබ වහන්සේගේ පන්සල තිබුනේ නොරොච්චෝලේ පොලිස් වසමේ?

උ :නොරොච්චෝලේ පොලිස් වසමේ.

ප්‍ර :එතකොට ඔබ වහන්සේ මේ පැමිණිල්ල කරලා ආරක්ෂක ලේකම්වරයාට ඊට පස්සේ නැවත කල්පිටිය පන්සලට වැඩියද?

උ :ඔව් පන්සලට වැඩියා. වැඩලා ..

ප්‍ර :එතකොට ඊට පස්සෙ ද නොරොච්චෝලේ පොලිස් නිලධාරීන් පැමිණියේ විමර්ශනයට?

උ :විමර්ශනයට ඒගොල්ලෝ පලවෙනි දවසේ පොලිසියට ආවා. ඇවිල්ලා ඒ ටික කලා. ඊට පස්සේ ආයෙත් පොලිසියට මට එන්න කිව්වා දෙවෙනි දවසේ..

ප්‍ර :පළවෙනි දවසේ පන්සලට එන්න කිව්වා, ඇවිල්ලා විමර්ශනය කෙරුවා?

Prosecution Secretary Copy
FAIR COMMENT BY JEZEEM

උ :ඔව්, ඊට පස්සේ දවසේ එගොල්ලන්ට වැඩ තියෙනවා කිව්වා.

ප්‍ර :ඒ අවස්ථාවේදී ඔබ වහන්සේගේ පන්සල පරික්ෂා කිරීමක් කෙරුවද ඒගොල්ලෝ?

උ :ඔව්.

ප්‍ර :කොහොමද පරික්ෂා කිරීම කලේ?

උ :SI මහත්තයයි මමයි මගේ පන්සලේ ඉස්තෝප්පු කෑල්ලේ විමර්ශනය කරන කොට ඇතුලේ මම සැතපෙන කාමරය තියෙනවා, මම නැගිටලා වතුර එකක් ගන්න යන කොට, පැන් එකක් ගේන්න යන කොට මම නැගිට්ටාම මගේ ඇඳන් මෙට්ට උස්සලාගෙන මේ දෙන්නා දහලනවා හොයනවා. මට ඊට පස්සේ කෑ ගැහුවා හාමුදුරුවෝ අන්තවාදියෙක් නෙමෙයි, අන්තවාදය ගැන කියන්න ආවේ. හාමුදුරුවනේ එළියේ බීඩි කොට තිබුණා කිව්වා. මම ඉදලා කිව්වා රෑට කොල්ලෝ 15 ක් විතර මේකේ ඇතුලේ නිදා ගන්නවා. මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ.

ප්‍ර :ඇයි ඒ?

උ :පාස්කු ප්‍රහාරයෙන් පස්සේ.

ප්‍ර :ඔබ වහන්සේ කිව්වානේ අර ජූඩ්ට කිව්වා කියලා මේ සිද්ධිය ගැන?

උ :ඔව්. ජූඩ් මහත්තයටත් කිව්වා.

ප්‍ර :ඒ පැත්තේ ක්‍රිස්තියානි ආගම අදහන අයටත් කිව්වයි කිව්වා තරුණ අයට?

උ :ඔව්, කොල්ලෝ ආවාම බිලොක් ගල් ගොඩක් එළියේ තියෙනවා ඒකට කවර් වෙලා තමයි කොල්ලෝ මට පේන්න බොන්නේ නැහැ, ඒගොල්ලෝ එතන තමයි ඒවා පාවිච්චි කරන්නේ. මොනවා පාවිච්චි කරනවද දන්නේ නැහැ, අරක්කු අරවා මේවා බීලා පන්සලට එන්නේ නැහැ, බීඩි බීලා එයාට මොනවා හරි සැකයක් ඇති වෙලා ඊට පස්සේ මම බැන්නා. බැන්නාම SI මහත්තයා කෑ ගැහුවා මෙහාට එන්න කියලා. ඊට පස්සේ දින 2 ක් විමර්ශනය කලා. සතියකට විතර පස්සේ මට කෝල් එකක් ආවා .

ප්‍ර :කොහෙන්ද?

උ :පුත්තලම අපරාධ විමර්ශන ඒකකයේ ලයින් එකේ නොම්මරය තියෙනවා මා ගාව.

ප්‍ර :අපි ඒක බලමුද ස්වාමීන් වහන්ස?

(මේ අවස්ථාවේදී සාක්ෂිකරු එම නොම්මරය ෆෝන් එක open කර ගනිමින් පරික්ෂා කරයි)

ප්‍ර :ඔබ වහන්සේ ඒක බලන කල් ස්වාමීන් වහන්ස අර නොරොච්චෝලෙන් ඔබ වහන්සේව ඔය පරික්ෂණය සදහා නැත්නම් විමර්ශන කටයුතු සදහා ආවේ බුද්ධි අංශ නිලධාරින්ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ :නැහැ,

ප :එතකොට ඔබ වහන්සේව ඔය නොරොච්චෝලේ නිලධාරින් විසින් විමර්ශනය ආරම්භ කරලා පුත්තලම විමර්ශන ඒකකයෙන් එන්නට කියලා පණිවිඩය ආපු ඒ කාලසීමාව අතරතුරදී යම් අවස්ථාවකදී බුද්ධි අංශ නිලධාරින් මුනගැහුනද?

උ : බුද්ධි අංශයේ නිලධාරින් වයසක 2 ක් ආවා. කළු මහත එක්කෙනෙකුයි කොන්ඩේ සුදු වෙච්චි ටිකක් වයසක එක්කෙනෙකුයි.

ප :ඒ කොහාටද පන්සලටද?

උ :පන්සලට ආවා.

ප :මොකටද ආවේ?

උ :පන්සලට මාව හම්බ වෙන්න ඇවිල්ලා තිබුනේ. ඒගොල්ලෝ එන කොට ජුඩ් මහත්තයාගේ වයිෆ් එතන එහා පැත්තේ මුස්ලිම් එක්කෙනෙක්, පන්සලට වතුර තිබුනේ නැහැ, අපි අර හෑන්ඩ් පොම්පයකින් ගහලා තිබුනේ, එයා කොටුවක් කරන වෙලාවේ අහලා එයාම බට දාලා වතුර දාන ලයින් එකෙන්ම පන්සල අයිනෙන්ම දාලා වතුර ලයින් එකක් දීලා තිබුණා. එයා එහා කොටුවේ ලූණු කැපුවේ මේ කොටුව අස්කරලා ඉවරයි. එයාගෙන් අහලා තියෙනවා මේ බුද්ධි අංශයේ නිලධාරී මහත්වරු දෙන්නා අරයගේ නෝනත් ඉන්දැද්දි ජුඩ් මහත්තයාගේ, මේ හාමුදුරුවෝ මේ අන්තවාදී සංවිධානවල වැඩ කරනවද කියලා. ඊට පස්සේ ජුඩ් මහත්තයා එතන යතුර ඉල්ල ගන්න නෝනා හම්බ වෙන්න ගිහිල්ලා තියෙන්නේ මොකද එයා කලපුවේ ඉදලා එන ගමන් යතුර ඉල්ල ගන්න ලූණු කොරටුවට ගිහිල්ලා තියෙන්නේ. ජුඩ් මහත්තයා විගහට මට කෝල් එකක් අරගෙන කිව්වා මෙන්න රාලහාමිලා දෙන්නෙක් වෙන්න ඇති සිවිල් පිට මේ නානගෙන් ඇහුවා හාමුදුරුවෝ අන්තවාදි සංවිධානයකට වැඩ කරනවද කියලා. එතනින් ඒ පැත්තට ගියා. ඉන්පසු ඒගොල්ලෝ එන කොට බුද්ධි අංශයේ. මට මුලින්ම කතා කලා කල්පිටියේ ඉන්න ලොකු මහත්තයා. එයාගේ නම්බර් එකත් මා ලඟ තියෙනවා. එයා බුද්ධි අංශයේ නිලධාරියෙක්, ලොකු මහත්තයෙක් කිව්වා.

ප :දැන් ඔය පුත්තලම විමර්ශන ඒකකයෙන් එන්නට ඉස්සර වෙලා?

උ :ඔව්. ඊට පස්සේ තමයි පුත්තලමෙන් ආවේ. ඊට පස්සේ මම කිව්වා ආපහු දෙන්නව එවන්න එපා කියලා. ඊට පස්සේ මේ දෙන්නා ඇවිල්ලා හාමුදුරුවනේ කිව්වා. මම ඇහුවා ඇයි මහත්තයලා ආවේ කියලා. ඊට පස්සේ කිව්වා හාමුදුරුවෝ චුට්ටක් බලලා යන්න ආවේ කියලා, අපිට අර ගැන චුට්ටක් විමර්ශනය කර ගන්න. මම කිව්වා ඇයි නානා විමර්ශනය කලේ නැද්ද එහේ කියලා ඇහුවා. මම කිව්වා කරුණාකරලා ගුටි නොකා යන්න කිව්වා මම දැන් ලොකු මහත්තයට කියලා තියෙන්නේ ගහලා එලවන්නේ කියලා මම කිව්වා. ඊට පස්සේ මේ

FAIR COMMENT — BY JEZEEM —

දෙන්නා ගියා. ලොකු මහත්තයා කිව්වා ආයේ එවන්නේ නැහැ . මම කිව්වා මෙහෙම සාක්ෂි තියෙනවා කියලා. මම දැන් කෝල් කරලා මහත්තයට කියන්නම් ගිහිල්ලා මම ඇහුවා මෙහෙම නිලධාරින්ද මහත්තයො ඉන්නේ කියලා. ඊට පස්සේ ඒ මහත්තයා මොනවා කලාද දන්නේ නැහැ ඊට පස්සේ නම් ඇස් දෙකටවත් දැක්කේ නැහැ.

ප්‍ර :එතකොට ඔබ වහන්සේ කිව්වා පුත්තලම විමර්ශන ඒකකයෙන් ඔබ වහන්සේට පණිවිඩයක් ආවා කියලා?

උ :ඔව්.

ප්‍ර :අංකය බලා ගන්න පුළුවන් වෙයිද අපේ හාමුදුරුවනේ?

(සාක්ෂිකරු ෆෝන් එකේ එම අංකය බලා කියයි)

උ :032-2266002

ප්‍ර :ඒ පුත්තලම විමර්ශන ඒකකයෙන්?

උ :ඔව්.

ප්‍ර :කවදද ස්වාමිණින් වහන්ස පණිවිඩය ආවේ? දළ වශයෙන්?

උ :මුලින් කිසි දෙයක් සඳහන් කලෙත් නැති නිසත් කිසිම දෙයක් ලිව්වේ නැහැ මම.

ප්‍ර :ඕකේ ඩිරෙක්ටරිය බලලද ඔබ වහන්සේ කියන්නේ නැත්නම් කෝල් ලොග් එක බලලද?

උ එච්චර මම ෆෝන් ගැන දන්නේ නැහැ.

ප්‍ර :Bar කෝඩ් එක පොඩ්ඩක් බැලුවට කමක් නැද්ද?

(සොලිසිටර් ජනරාල්වරිය Bar කෝඩ් එක පරීක්ෂා කර බලයි)

උ :මම ඊයේ පෙරේදත් ගත්තා හැබැයි එයාට චුට්ටක් කතා කරලා දින ඔක්කොම හදන්න මම ඊයේ කතා කලා. කතා කරලා මම දින ටික ඇහුවා, මහත්තයාගේ නම අහගන්න මට අවශ්‍යක් තිබුණා. මෙතනට පැමිණිල්ලක් කරන්න එයා ගැන.

ප්‍ර :නැහැ ස්වාමින් වහන්ස අපි නොම්මරය ගත්තානේ හරි.
දැන් ස්වාමින් වහන්ස පුත්තලම විමර්ශන ඒකකයෙන් ඔබ වහන්සේට පණිවිඩයක් ආවා.?

උ :ඔව්.

ප්‍ර :මොනවා කරන්න කියලද ආවේ?

උ :මට කිව්වා පාස්කු ප්‍රහාරය ගැන විමර්ශනයක් තියෙනවා, ඒකට එන්න කියලා.ඊට පස්සේ මම කිව්වා මේ වෙලාවේ චුට්ටක් කකුල අසනීපයක් තිබෙනවා. පොඩි බැන්ඩේව් එකක් දාගෙන තමයි තිබුනේ. කකුලේ අමාරුවක් තියෙනවා මොකක් හරි වාහනයක් එවන්න බැරිද කියලා, කිලෝමීටරයක් පයින් යන්න ඕන වාහනයකින් යන්න බැහැ වැල්ල.

FAIR COMMENT — BY JEZEEM

පන්සලේ ඉදලා වැල්ල. පස්දාලා පුරවලා නැහැ එරෙනවා වාහනය යන්න බැහැ. ෆ්ලෝවීල් එකක් විතරයි යන්න පුළුවන්. එහෙම වාහන නැහැ හාමුදුරුවනේ ඔයා අනිවාර්යයෙන් මේකට එන්න ඕනේ, අරෙහි මෙහේ කියලා එතන පොඩි තර්ජනයකුත් කලා. එන්න බැරි නම් මොන එහෙකටද ගිහිල්ලා ලොකු තැන්වල පැමිණිලි දැම්මේ කියලා. මම කිව්වා හරි මම කොහාම හරි නොන්ඩි ගගා හරි එන්නම් කියලා. ඒකත් මේ විදියට තමයි කලේ ඒගොල්ලෝ. ඉස්සෙල්ලා ම කෝල් කලේ නැහැ. මම එහෙන් නොම්මරය අරගෙන එන්නේ. මහ කඩේකට ඔය ලියුම දීලා යන්නේ, මුස්ලිම් මිනිස්සු යන එන කඩේකට තමයි ලියුම ඕපන් එකේ දීලා යන්නේ. ඕපන් ලියුමක් මේ දීලා යන්නේ ආව නිලධාරි මහත්තයා.

ප්‍ර :මොනවා ලියලද තිබ්බේ ඒකේ?

උ :ඒකේ ලියලා තිබ්බේ විමර්ශනයක් සඳහා පැමිණෙන්න කියලා.

ප්‍ර :මොකක්ද විමර්ශනය කියලා ලියලා තිබුනේ නැහැ?

උ :විමර්ශනය කියලා කිව්වේ නැහැ. ඒක අරගෙන තමයි මම යන්නේ. ඒකේ තිබිච්ච නොම්මරයක් හරි මොකක් හරි තිබිලා මම කෝල් එකකුත් අරගෙන තමයි නොම්මරය ඒකෙන් අරගත්තේ.

ප්‍ර :දැන් ඔබ වහන්සේ ගියානේ? කොහාටද ගියේ?

උ :පුත්තලම බස් ස්ටෑන්ඩ් එකට මෙහායින් තියෙනවා හරස් පාර පොලිසියේ නෙමෙයි.

ප්‍ර :විමර්ශන ඒකකය? විශේෂ විමර්ශන ඒකකයක්ද?

උ :ඔව් විශේෂ විමර්ශන ඒකකයක්.

ප්‍ර :එතකොට කවුද එතන මුනගැහුනේ?

උ :එතන ඉස්සෙල්ලාම හිටියා පිළිගැනීමේ නිලධාරියෙක් වගේ එතන හිටියා. මම මෙහෙම ලියුම පෙන්නුවා.

ප්‍ර :එතනින් කොහාටද යැව්වේ?

උ ඊට පස්සේ මම එතනින් ඇතුලට ගිහිල්ලා කෙරෝලෙම තියෙනවා බිල්ඩිං එක ඒකේ ඇතුලේ තමයි ගිහිල්ලා විමර්ශනය කලේ.

ප්‍ර :කා වෙතද ඔබ වහන්සේව යොමු කලේ? කවුද ඔබ වහන්සේගේ ප්‍රකාශය සටහන් කලේ? කවුද ඔබ වහන්සේගෙන් ප්‍රශ්න කලේ?

උ :එතන මට ඒගොල්ලන්ගෙන් ඒවා ලබා ගන්න බැරි වුණා. ඉන්පස්සේ එතන ලේඩි කෙනෙක් හිටියා, මිස් කෙනෙක් ටයිප් කරලා මෙව්වා කරලා අර ගත්තා. ඒකේ ඉස්මයිල් හාජ්ජියාර්ගේ නම කිව්වේ නැහැ මැලේසියාවෙන් ලංකාවට ආයුධ ගෙනාවා කියන තැනට වෙන කල් මම විමර්ශනය දුන්නා.

ප්‍ර :එහෙමයි ප්‍රකාශය දුන්නා?

FAIR COMMENT
BY JEZEEM

උ :ප්‍රකාශය දුන්නා. එවේලේ ආවා මේ දෙන්නා තවුලික් දෙන්නෙක්. මුස්ලිම්. ඇවිල්ලා සර් අරක , ආ ඒක තමයි මම මේ කරන්නේ කියලා කිව්වා.

ප්‍ර :ඇවිල්ලා ඔබ වහන්සේගේ ප්‍රකාශය වාර්තා කරන දෙන්නට මුස්ලිම් දෙන්නා කතා කලා?

උ :කතා කලා.

ප්‍ර :ඔබ වහන්සේ කියන්නේ ඒ දෙන්නා තවුලිත් දෙන්නෙක්?

උ ඔව් තවුලික් දෙන්නෙක්. මොකද ෂර්ට් යට කරලා ඇදලා මෙව්වා කරලා අත් නවලා මෙව්වා කරලා මුස්ලිම් අනිවාර්යයෙන් කියන්න පුළුවනු මුස්ලිම් කියලා. දැක්කාම කියන්න පුළුවන්. මම අර කිව්වේ පුසුබෙන් කියන්න පුළුවන් කියලා මුස්ලිම් කියලා. ඊට පස්සේ මේ දෙන්නා සර් යන්නම් කිව්වා, ගියා. ඊට පස්සේ මම අර මහත්තයට කිව්වා මට වොෂ්රූම් එකට යන්න ඕන කියලා. ඊට පස්සේ මම කකුල බැදගෙන ගිය හින්දා බැන්ඩේජ් එක දාගෙන ගිය හින්දා මම පුටුවක් උඩ තියාගෙන තමයි විමර්ශනය කලේ. චුට්ටක් මම කිව්වා මට බංකුවක් මොකක් හරි දෙන්න කියලා කකුල තියා ගන්න. පොඩි අමාරුවක් තිබුණා මම අමාරුව ගොඩක් කරගෙන ගියා. ඉන් පස්සේ ..

ප්‍ර :ඒ උපක්‍රමයක් ඔබ වහන්සේ යොදා ගත්ත, ආරක්ෂාවට එහෙමද?

උ :ඔව්, මට මුලින් කෑ ගැහුවානේ, මම ඊට පස්සේ ඒ නම්බර් එකට කෝල් කලා. මට අද එන්න බැහැ හෙට එන්නද කකුලේ අමාරුවක් තියෙනවා කියලා. එහේනම් මොන එහෙකටද ආරක්ෂක අමාත්‍යාංශයට ගිහිල්ලා දැම්මේ අරෙහේ මෙහේ කියලා කෑ ගැහුවා. ඊට පස්සේ මම ගියා. ගිහිල්ලා මට ඒ වෙලාවේ කිව්වා නායක හාමුදුරුවනේ පොලිසි, CID තියෙනවා හොයන්න පැත්තකට වෙලා බණ පදයක් කියනවා, තව බණක් කියනවා කියලා කිව්වා. මට ඒකත් මතක් වුණා. පස්සේ මම ගියා. ඒත් ඉතින් මම නැගිට්ටා. නැගිටලා මම වොෂ්රූම් යනවා කියලා එයාට පේන්නේ නැති සීමාවේ ගියා. ඊට පස්සේ මම පුළුවන් තරම් හයියෙන් ගිහිල්ලා ත්‍රීවිල් එකක් අත ඇල්ලුවා නැවැත්තුවා ගියා.

ප්‍ර :ඇයි ඔබ වහන්සේ එහෙම කලේ?

උ :එහෙම කලේ අත පාවා දීම් සිදු කරපු නිසා.

ප්‍ර :ඒ කියන්නේ ඔබ වහන්සේ හිතනවා අර තවුලික් දෙන්නෙක් ඇවිල්ලා ඒ ගැන තමයි මම මේ කරන්නේ කියලා ප්‍රතිචාර දැක්කුවාම නිලධාරියා එතන සිදු වුනේ ඔබ වහන්සේව පාවාදීමක් කෙරුවා කියලා?

ප්‍ර :පාවා දීමක් කලා. ඒක අනිවාර්යයෙන්ම මට 100% තේරුනා ඒගොල්ලන්ගේ හැසිරීම් රටාවයි ඒගොල්ලන්ගේ සිග්නල් එකයි.

(එම සංඥාව සාක්ෂිකරු විසින් පෙන්වා සිටී)

FAIR COMMENT
BY JEZEEM

උ :ඔහොම කරලා අතිනුත් කිව්වා. මේ විදියට මෙහෙම කරලා යන්න කියලා, මම එතකොට එතන බබෙක් නොමෙයි.

ප්‍ර :යන්න කියලා සංඥාවකුත් දුන්නා?

උ :සංඥාවකුත් දුන්නා. එයාට කියවුනා එකපාරටම. හරි හරි මම ඒක තමයි කරන්නේ කියන එක වචනය නිකම් එකපාරටම මගේ වෙලාවට පැන්නා. ඊට පස්සේ මම එළියට බැහැලා ගියා.

ප්‍ර :එතනින් කොහාටද ගියේ?

උ :මම එතනින් ත්‍රිවිල් එකක් ආවා ඒකට ගොඩ වුණා. ඒකට ගොඩ වෙලා පාරට යනවත් එක්කම හලාවත බස්එක යනවා. මම ත්‍රිවිල් එකේ එක්කෙනාට කිව්වා බස් එක ෆලෝ කරලා අල්ලලා දෙන්න කියලා. එයා රේල්පාර කිට්ටු කරන කල් බස් එක හයියෙන් ගියේ. එතනින් රේල්පාර ගාවින් ස්ලෝ කරන කොට අත දාලා නතර කලා. මම එතනින් වුට්ට දුරයි බැහැල ගියේ. බස් එකේ නැගලා පන්සලට ගියා. කිලෝ මීටර් 47 ක් විතර යන්න ඕනේ පුත්තලමේ ඉදලා පන්සලට. මහ බස් එකේ ඇතුලේ ඉදලා ගොඩක් වෙලා හිටියා. පාරේ නතර කරලා තිබුණ බස් එකේ. කොහොම හරි මහත් වුට්ටක් අදුරන ගෙදරකටත් ගිහිල්ලා මගින් බැහැලා ත්‍රිවිල් එකකත් යන්න තියෙනවා. කිලෝ මීටර් 7 ක් විතර ත්‍රිවිල් එකේ යන්න තියෙනවා පන්සලට. පන්සල ලඟට. එතන කිලෝමීටර් ¾ ක් විතර යන්න ඕනේ පයිනුත්. ඒ යන කොට පැය 2 ½ ක් විතර ගිහිල්ලා.

ප්‍ර :අර පුත්තලමේ ඔෆිස් එකේ ඉදලා?

උ :ඔෆිස් එකේ ඉදලා. එතකොට අපේ මගේ නම්බරයක් වයිෆ් ගාවත් නැන්දම්මා ගාවවත් නැහැ. මොකද මගේ අක්කා තමයි මගේ සිම්එක අරන් දෙන්නේ. මට සිම්එක අරන් දෙන්නේ මගේ අක්කා මහණ වෙච්චි අළුත පරණ යාළුවෝ ඔක්කොම හාමුදුරුවනේ ඔතනින් අත්හරින්න ඕනේ, ඔය සිම් එකට මචං අරෙහේ මෙහෙ කතා කරයි යාළුවෝ, ඔබ වහන්සේට ගැලපෙන්නේ නැහැ, මම දැන් සිම්එකක් ගෙනත් දෙන්නම් කියලා අක්කා වාහනයේ ගිහිල්ලම සිම් එකක් අක්කගේ නමට ගෙනත් දුන්නා. ඒ සිම්එක තමයි ෆෝන් එකේ තියෙන්නේ.

<u>ගරු සභාපති විනිසුරුතුමා</u>:

ප්‍ර ඒ අක්කා ඔබවහන්සේගේ අක්කා?

උ මගේ දෙවනි අක්කා.

උ :අපේ භාර්යාවගේ අම්මා මට කෝල් එකක් අරගෙන අහනවා මොනවද මේ පුත්තලම් ගිහිල්ලා කලේ කියලා.

ප්‍ර :දැන් ඔබ වහන්සේ කිව්වනේ අළුත් සිම් එකක් ඔබ වහන්සේ අරගත්තේ..

FAIR COMMENT BY JEZEEM

උ :ඒක තමයි මගේ නොම්මරය නැතුව මේ නැන්දම්මා කතා කලේ. ඒ වුට්ටට. තබිලික් කියන්නේ ඒතරම් එක්කෝ තවුෆික් එක්කෝ තබිලික්. තවුෆික්කාරයෝ වුනත් කමක් නැහැ කියනවා මෙහෙම මෙහෙම දෙයක්, එක්කෝ තවුෆික් තබිලික්, මේ තවුෆික් තමයි ආවේ. මුස්ලිම් ආවේ, තවුෆික් තබිලික් නෙමෙයි මුස්ලිම් ආවේ මේගොල්ලෝ. මොකද තබිලික් එකෙත් සිංහල විදියටම රැවුල් කපාගෙන කොන්ඩේ කපාගෙන ඇවිල්ලා ඉන්නවා බුද්ධි අංශයේ අරෙහේ මෙහේ.. එතකොට මම කොටින්ම දන්නවා ඔය ලයින් එකම ආරක්ෂක අංශය නඩත්තු වෙන්නේ ඒගොල්ලන්ගේ පුද්ගලයින්ගේ අන්තවාදි සල්ලි වලින්. ඒගොල්ලන්ගේ වෙඩිං, පාටි ඔක්කොම කරන්නේ අන්තවාදින්ගේ සල්ලි. ආරක්ෂක අංශයේ. ඒවා මම ඊට ඉස්සෙල්ලා දැන ගත්ත දේවල්.

ප දැන් ඔබ වහන්සේගේ අර පැවිදි වුණාට පස්සේ ලබා ගත්ත සිම්එකේ නොම්මරය පොලිසියට ඔය පුත්තලම පොලිසියට දුන්නද?

ප :පුත්තලම පොලිසියෙන් මගෙන් ගත්තා. මගේ හැදුනුම්පත්, නම් ගම් ඒවා ඔක්කොම ෆෝන් අංක ඒවා ඔක්කොම ඒගොල්ලෝ ගත්තා. එතකොට කොහොම හරි එතනින් කතා කලා නැන්දම්මා. මම කිව්වා නැහැ CIS වෙක් කරලා තියෙනවා වැල්ලවත්තේ. CIS එක වෙක් කෙරෙව්වේ මම .

උ :මොකක්ද CIS එක කියන්නේ?

ප :CIS එක කියන්නේ ආගමට ගිය තැන. වැල්ලවත්තේ රෝහිණි පටුමගේ CIS එක. ඕක ඉස්සෙල්ලා තිබ්බේ ISIS කියලා. ඊට පස්සේ ඔය නම වෙනස් කරලා C අකුරක් දැම්මා. දාලා මුල්ම මම කොට 2001, 2002 ඕක IS කියලා ලෝක ගෝලේ ලාංඡනය දාලා IS කියලා තිබුනේ. ඊට පසු C අකුරක් දැම්මා. CIS කලේ. ඉස්සෙල්ලාම IS විතරයි. ඉස්ලාම් සෙන්ටර් කියලා ඒගොල්ලෝ කියන්නේ. ඒ වුනාට IS තමා තිබුනේ. IS එකට ඊට පස්සේ C අකුරක් දැම්මා.

ප :CIS කියන්නේ?

උ :සිලෝන් ඉස්ලාම් සෙන්ටර් කියන එක තමයි දාලා තියෙන්නේ. ඊට පස්සේ මට සැක හිතුනා මේක. දැන් කොහොමද මෙච්චර ඉක්මනට නැන්දම්මට ගියේ කියලා.

ප :නැන්දම්මා දැන ගත්තේ කොහොමද ඔබ වහන්සේගේ දුරකතන අංකය?

උ :ඔව්,

ප :එතකොට මොනවද නැන්දම්මා ඔබ වහන්සේ එක්ක කතා කෙරුවේ ඔය දුරකතනයෙන්?

උ :කතා කරලා මම කිව්වා CIS එක වෙක් කරලා ෆයිල් එකක් අහු වෙලා මම CIS එකේ ක්ලාස් ගියා. ආගමට ගියේ එතනින්. මගෙන් ඇහුවා මම කිව්වා කොහොම මේ නොම්මර තියෙන්නේ, මගෙන් නෙමෙයි ඇහුවේ.

FAIR COMMENT BY JEZEEM

මම හංවැල්ලේ 141 හි දිසාවත්ත, හංවැල්ල ලිපිනයේ CIS එකේ මම ආගමට ගියේ ඔගොල්ලන් එක්ක දුන්නේ ඒ ඇඩ්‍රස් එක. ඒ ඇඩ්‍රස් එකට අපේ ගෙදර ගිහිල්ලා. අපි එතකොට ඉඩම් කඩම් විකුණලා වෙනම මල්ලි මහ ඉඩම විකුණලා වෙනම ටවුන් එකට ගිහිල්ලා ඉඩමක් අරගෙන. එහේ හොයාගෙන ගිහිල්ලා එහෙන් තමයි මගේ නම්බර් හොයාගෙන මට පොලිසියෙන් කතා කලේ. පොලිසියෙන් කතා කලාම මම ගිහිල්ලා මම කිව්වා ඉස්ලාම් ආගමට මම ගියා විවාහයක් කර ගත්තා, වන්දනා ගමන් ගියා, ජමාත් වන්දනා ගමන් මම ගිහිල්ලා තියෙනවා. එතනින් එහාට මම කිසි දෙයක් දන්නේ නැහැ කියලා. දන්න විස්තර ඇහුවා මම කිව්වා එච්චරයි දන්නේ කියලා. මම ඩිවෝස් වුණා, මහණ වුණා. ඒ ටික තමයි දීලා තියෙන්නේ. එහෙනම් මේ අන්තවාදී සංවිධාන ගැන තබිලික් ජමාත් කඩු ගැන එහෙමම කියලා තියෙන්නේ කියලා කිව්වා. 100% ක් මේ සැකය හරි.

ප්‍ර: පණිවිඩය ගියා කියලා?

උ ඔව්, ඊට පස්සේ

ප්‍ර :පොඩ්ඩක් බාධා කලාට සමාවෙන්න ස්වාමීන් වහන්ස,
ඔය නැන්දම්මා කියලා ඔබ වහන්සේ සඳහන් කරපු එක්කෙනා ගේ නම මොකක්ද ස්වාමීන් වහන්ස?

උ :එයාගේ සිංහල නම චන්ද්‍රාවතී කුමාරි හාමි. දසනායක මුදියන්සේලාගේ. ආච්චි අම්මා තමයි දිසානායක. දසනායක මුදියන්සේලාගේ චන්ද්‍රාවති දිසානායක අම්මා. ඉස්ලාම් නම පාතිමා සලීමා.

දැන් වෙලාව ප.ව.6.35 යි.
මෙතැන් සිට වාර්තා කරන්නේ මුතුමාලි මෙනවිය විසින්ය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් ල/ලේ : ධම්මිකා මිය
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි
දැන් වේලාව : ප.ව.06.35 යි.

ප්‍ර : එතකොට ස්වාමීන් වහන්සේ අර Wife ඔබ වහන්සේගේ උපාසක අම්මාගේ මේ සීයා අසනීප වෙලා ගෙනාවා කිව්වානේ ?

පි : ඔව්.

ප්‍ර : ඒ ගෙනාපු ඒ සීයා එස්.බී.දිසානායක මහත්මයාගේ

පි : මස්සිනා කෙනෙක් වෙනවා .

ප්‍ර : මස්සිනා කෙනෙක් කියලා කිව්වානේ ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ ඥාතියා තමයි ඔය නැන්දම්මා කියලා කියන්නේ නේද ?

පි : එයාගේ දුව

ප්‍ර : එයාගේ දුව ?

පි : ඔව්.

ප්‍ර : දැන් ඒ තැනැත්තිය තමයි මේ ඔබ වහන්සේට මේ කතා කරන්නේ?

පි : ඒ සීයාගේ නම ඩිංගිරි බංඩාර නිළමේතුමා .

ප්‍ර : නිළමේතුමා.

පි : මරණ දැන්වීමෙත් තියෙනවා මා ගාව තියෙනවා කවි කොළෙකුත් ඩිංගිරි බංඩාර නිළමේතුමා . සීයාගේ නම එස්.බී.දිසානායක මහත්මයාගේ මස්සිනා වෙනවා.

ප්‍ර : එහෙමයි. දැන් ඉතින් ඔය විදිහට නැන්දම්මා ඔබ වහන්සේගෙන් ප්‍රශ්න කෙරුවාට පස්සේ ඔබ වහන්සේ මොකද කෙරුවේ?

පි : ඊට පස්සේ මම පන්සලට ගිහිල්ලා

ප්‍ර : මේ පණිවිඩේ ගිහිල්ලානේ තියෙන්නේ ?

පි : ජූඩ් මහත්මයාට කිව්වා. දැන් රෑට කැති පොලු හෙවි කඩු අරගෙන කොල්ලෝ ඉන්නවා පන්සලේ .

ප්‍ර : ජූඩ් මහත්මයාට මොනවාද කිව්වේ ?

පි : මම කිව්වා මෙහෙම විමර්ශනයක් කළා ජූඩ් මහත්මයා මාව මෙහෙම පවා දුන්නා ජූඩ් මහත්මයා පොලිස් නිළධාරී මහත්මයා දැන් නැන්දම්මත් මම මේ ගොඩ වුණු හැටියේ කෝල් එකක් දුන්නා . ජූඩ් මහත්මයා ගෙදර හිටියේ නෑ පැයකට පස්සේ විතර පස්සේ ආවේ . ඊට පස්සේ සුද්දි සුද්දි කියලා එයාගේ නෝනාට කතා කළා.

ප්‍ර : එහෙමයි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එයා සිංහල බෞද්ධ ගෑණු ළමයෙක් . අරයා සිංහල කතෝලික . හාමුදුරුවෝ පාවලා දීලා තියෙනවානේ පොලිසියෙන් මොකද කරන්නේ කොල්ලො ටික ලැස්ති කරලා අද සෙට් වෙලා ඉන්න ඕනී කියලා තමා එයා කිව්වේ.

ප්‍ර : එතකොට ජූඩ් මහත්මයාගේ සම්පූර්ණ නම මොකක්ද අපේ හාමුදුරුවනේ ?

පි : එයාට චුට්ටි මහත්මයා කියනවා. ජූඩ් මහත්මයා කියනවා .නම ජූඩ් තමයි නම .

ප්‍ර : ලියාපදිංචි නමක් දන්නේ නෑ ඔබ වහන්සේ ?

පි : ලියාපදිංචි නමක් දන්නේනෑ පන්සලේ ඉදලා මීටර් 150 ක් ඉහළින්

ප්‍ර : කල්පිටිය පන්සලේ ?

පි : කල්පිටිය පන්සල

ප්‍ර : නම මොකක්ද ස්වාමීන් වහන්සේගේ කල්පිටිය පන්සලේ ?

පි : කල්පිටිය ශ්‍රී වාළුකාරාම විහාරස්ථානය , දියසෙන්පුර , පල්ලිවාසල්තුරේ කල්පිටිය , රෙඩ්බානා කියලාත් දානවා.

ප්‍ර : පොඩ්ඩක් හිමින් ස්වාමීන් වහන්ස .

පි : ශ්‍රී වාළුකාරාමය , දියසෙන්පුර , පල්ලිවාසල්තුරේ , රෙඩ්බානා කල්පිටිය . ඔය ටික හැබැයි පිළිවෙලකට කිය වුණේ නෑ.

ප්‍ර : කමක් නෑ ස්වාමීන් වහන්සේ ඔය ටික ඇති.

පි : අන්තිමට රෙඩ්බානා එන්නේ කමක් නෑ.

ප්‍ර : එතකොට පණිවිඩේ දැන් දුන්නා ජූඩ් මහත්මයාට ?

පි : ඔව්.

ප්‍ර : ජූඩ් මහත්මයා කිව්වා මේක එයාගේ භාර්යාවට ?

පි : ඔව්.

ප්‍ර : දැන් ඒ අනුව ඔබ වහන්සේ කියනවා සැලසුම් ඒ අය කල්පනා කියලා මේ තරුණයොත් එක්ක එකතු වෙලා ඔබ වහන්සේට ආරක්ෂාව සපයන්න ?

පි : ඔව් .

ප්‍ර : ඉතින් මොකද වුණේ?

පි : ඊට පස්සේත් තරුණයෝ ටික මොකද ඒ ඉඩමත් මුස්ලිම් අය ඒජී ඔෆිස් එකේ තිබ්බිච්ච අක්කර විසි ගාණක් අල්ල ගෙන හිටියා බලෙන් තමා මේ ඉඩම් ටික අල්ල ගෙන මේ ගෙවල් ටික හදලා තියෙන්නේ . ඔක්කොම සිංහල කට්ටිය තමා ඉන්නේ සිංහල ගෙවල් දෙකයි තිබුණේ සිංහල ගෙවල් 20 ක් විතර අපි නිර්මාණය කර ගත්තා බලෙන් ඒකට නඩුත් දාලා තියෙන්නේ අපිට . දැන් මේ අපි අල්ලපු මුස්ලිම් ඉඩම් ටිකට ඉන් පස්සේ මේ ඔක්කොම කට්ටිය පන්සලත් එක්ක හරි හිතවත්

ප්‍ර : එහෙමයි

FAIR COMMENT — BY JEZEEM —

පි : Tamil කට්ටියත් ඉන්නවා පවුල් දෙකක් ඒ කට්ටියත් හිතවත්. දැන් ඔක්කොම දැනුවත් කළා. මොනවා හරි වුනොත් බලමු කියලා . ඉන් පස්සේ ⁄ 08 ට වගේ ජූඩ් මහත්මයා කඩේට ගියා උවමනාවකට එයාගේ නෝනාත් පන්සලේ හිටියේ ළමයත් එක්කලා.

ප්‍ර : මේ එදාමයි?

පි : එදාමයි.

ප්‍ර : ඔබ වහන්සේ අර පුත්තලම විශේෂ විමර්ශන ඒකකයට ගිහිල්ලා ආපු දවසේ ?

පි : ඔව් ඊට පස්සේ ජූඩ් මහත්මයා කිව්වා මෙන්න මෙහෙමයි ත්‍රීවීල් එකකින් ඇවිල්ලා අර තම්බි ටිකක් කියලා කිව්වේ තම්බියෝ ටිකක් බැස්සා මට සැකයි අතේ මොනවා හරි ආයුධ හරි මොනවා හරි ටිකක් මෙයාගේ කකුල ඇක්සිඩන්ට් වෙලා නොන්ඩි ගගහා එයා යන්නේ කෑල්ලක් නෑ ඇටවල මස් කෑලි නෑ . ඒක නිකම් මේවා වෙලා ඉඩ වගේ තියෙන්නේ ඒකට රෙදි තියලා බැඳලා තමයි මෙයා ඉන්නේ ඊට පස්සේ මෙයා නොන්ඩි ගගහා දුවගෙන ඇවිල්ලා කිව්වා හාමුදුරුවනේ ටක්ගාලා ඔබ වහන්සේ ගැහිගන්න කියලා අපේ තිබුණේ විදුලි බලය නෙවේ සුර්ය කෝෂ දොරවල් වහලා එයා මගේ සෙරෙප්පු දෙක අරගෙන දිව්වා මගේ සෙරෙප්පු දෙක තිබ්බොත් අහුවෙයි කියලා කොහොම හරි බුට්ස් මාක් සපත්තු මාක්ස් වගේ තිබුණා.

ප්‍ර : ඔබ වහන්සේලා දැන් එතකොට මොකද කෙරුවේ . පන්සලේ හිටියාද පන්සලෙන් පිටත් වුණාද ? මොකක්ද කෙරුවේ ?

පි : මම ඔය කෆීර් යානා පුහුණු වෙන පැත්තට මම දිව්වා එතන විශාල වැලි කන්දක් තිබුණා .

ප්‍ර : එතනින් එහා පැත්තේ තියෙන්නේ යුධ හමුදා ගුවන් හමුදා කඳවුර?

පි : ගුවන් හමුදා කඳවුර විශාල මිග් යානා වලින් බෝම්බ පුපුරවන කඳවුරේ . ඒකේ කැලේ සම්පුර්ණයෙන් එකේ ගොඩක් යන්නේ නෑ පිපිරිච්චි නැති බෝම්බ තියෙන නිසා මිනිස්සු මළා ඒවා පුපුරලා. ළමයි දෙන්නෙක් මළා. ඉන් පසු එතනින් මට කිව්වා මොනවා හරි වුනොත් හාමුදුරුවෝ කැලෙට පනින්න කිව්වා කරන්න දෙයක් නෑ කියලා . ඊට පස්සේ ටිකක් වෙලා ගියාට පස්සේ ජූඩ් මහත්මයාත් ආවා නෝනාත් එහා පැත්තේ එතනම හිටියේ ඉදලා ඉවර වෙලා මේ කට්ටිය මගේ ටෝච් එකක් තිබුණා ජූඩ් මහත්මයා ඒ ටෝච් එකෙන් ගිහින් අරගෙන එහෙන් මෙහෙන් ගැහුවා ගහන කොට කොල්ලන්ට කිව්වා ටෝච් එළිය වැටෙනවා වරෙන් කියලා . කොල්ලො එහෙන් මෙහෙන් ටෝච් අල්ලගෙන

FAIR COMMENT BY JEZEEM

පොලු අරගෙන එනකොට මේ ගොල්ලො පැනලා දිව්වා. ඊට පස්සේ හැමතැනම හෙව්වා පරණ අර අල්ලපු ඉඩම් වල පොල්අතු ගෙවල් හදලා තියෙනවා සෙනඟ නෑ. ඒ ගෙවල් වලට ගිහිල්ලා ඇතුළ ඔක්කොම වෙක් කරලා කොල්ලෝ මුළු සම්පූර්ණ සර්ච් එකක් දැම්මා මේ සත්‍ය

ප්‍ර : එහෙමයි.

පි : ඒ කට්ටිය සාක්ෂියට වුනත් ගෙන්ව ගත හැකි. ඒ ගොල්ලො වෙක් කරලා ඔක්කොම කරලා බලලා ඊට පස්සේ කිව්වා හාමුදුරුවනේ හරියන්නේ නෑ හෙට උදේ පාන්දර පන්සලෙන් පිටත් වෙන්න කියලා . මං ටෝච් එකත් ඡූඩ් මහත්මයාට දීලා අල්ලන්න එහෙම ලේසී හින්දා පන්සල භාරව තිබ්බ යතුරු කැරැල්ලත් දීලා නායක හාමුදුරුවන්ගේ පන්සලට යතුරු කැරැල්ල දෙන්න කියලා මගේ නමට ඒ පන්සල ලියලා තිබ්බේ . කෝටි හතර හමාරක් ඒ පන්සලට වියදම් වෙලා තියෙනවා කාම්බෝජ මහත්මයෙක්ට මට ශිෂ්‍ය පරම්පරාවටත් අයිතිවාසකම් කියන්න බැරි විදියට තමා මේ ඔප්පු ලිව්වේ නායක හාමුදුරුවෝ මහණ කරපු එයාගේ ශිෂ්‍යයෙක් නෙවෙයි. එයාගෙන් ඉගෙන ගත්ත ශිෂ්‍යයෙක් ඒ කිසි කෙනෙකුටවත් අයිතිවාසිකම් ඉල්ලන්න බෑ කියලා මට ඒ තරම් ආදරෙයි නායක හාමුදුරුවෝ පන්සල ලියලා දුන්නේ . ඉන් පසු ඒවාත් දාලා ඒ ආපු Trip එක තමයි මේ විදිහට මම එළියේ ඉන්නේ පන්සලත් අත හැරලා .

ප්‍ර : එතකොට ඔබ වහන්සේ දැන් එහෙම ඇවිල්ලා කොහාටද ගියේ ?

පි : මම අනුරාධපුරේ අජිත් අයියා කියන ඉතාලි ඉඳලා ආවා කියලා කිව්වේ

ප්‍ර : ඔව්

පි : එයාලාගේ ගෙදර තමයි ගිහිල්ලා ඉන්නේ

ප්‍ර : එහෙමයි.

පි : පන්සලක් තිබුණේ නෑ වෙන යන්න.

ප්‍ර : එහෙමයි. ස්වාමීන් වහන්සේ දැන් ඔබ වහන්සේ යම් අවස්ථාවකදී අතිඋතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් වහන්සේ සම්බන්ධ කර ගත්තාද ?

පි : ඔව්.

ප්‍ර : අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් මාහිමිපාණන් වහන්සේ සම්බන්ධ කර ගන්නට උත්සහ කෙරුවාද ?

පි : ඔව් හලාවත බිෂොප් මාළිගාවෙන් බැලුවා බැරි වුණා.

ප්‍ර : කාවද ඒ මුණ ගැහෙන්න හැදුවේ ? හලාවත බිෂොප් මාළිගාවේ ?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : බිෂොප් මාළිගාවෙන් කාදිනල්තුමාව මුණ ගැසෙන්න බැලුවා ඒ මම හිතන්නේ ඒ වේලාවේ ඒ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ මම එළියට බැහැලා තමයි මම අනුරාධපුරේ ඉදලා යන්නේ .

ප්‍ර : මේ කාදිනල් තුමාව තමයි ඔබ වහන්සේ මේ මුණ ගැහෙන්න උත්සහ කරන්නේ ?

පි : උත්සහ කරන්නේ .

ප්‍ර : මොකක්ද මේ ඒ කියන්නේ පෞද්ගලිකව මුණ ගැහෙන්නද දුරකථනයෙන් කතා කරන්නද මොකක්ද ඒ කරන්න හදන්නේ ?

පි : දැන් මේ විමර්ශන ඔක්කොම කළානේ .

ප්‍ර : ඔව්

පි : ඒ එකක් වත් හරි ගියේ නැනේ ඊට පස්සේ තමයි අපි කල්පනා කළා කාදිනල්තුමාව හමුවෙලා ඉතාලියේ ඉන්න අජිත් අයියා කියනවා ඉතාලියේත් අම්බැසැඩර් ෂාප් කියනවා කාපිර්ලා කියනවා ෂාප්ලා කියනවා මෙහෙත් ඕක තියෙනවා ඉතාලියෙත් ඕක තියෙනවා

ප්‍ර : එහෙමයි .

පි : ඔය පාප් වහන්සේ ප්‍රංශේනේ එහා පැත්තෙනේ . ප්‍රංශ් වලනේ ඉන්නේ ප්‍රංශේටත් මේක ප්‍රංශේටත් මේ කට්ටිය එනවා. අපි කොහොමහරි මම ටිකට් එක කොහොමහරි හරිස්වන්නම් ඉඩමක් හරි විකුණලා මම සර් කෙනෙක් ඉන්නවා ඉංග්‍රීසි සර් කෙනෙක් එයාවත් ලැස්ති කර ගෙන අපි ගිහිල්ලා මේක ලංකාවේ මෙවුන්ට කරන්න නෑ එහෙමයි අජිත් අයියා කිව්වේ අපි යන් කාදිනල්තුමා හම්බවෙලා පාප් වහන්සේ දැනුවත් කරමු කියන අධිෂ්ඨානයෙන් අපි පිටරට යන්න බැලුවේ උත්සාහ කළේ .

ප්‍ර : එහෙමයි.

පි : ලංකාවේ ඉන්නත් බෑ. කසාවලදී මරන්න හැදුවා එහේ ආවා හොයා ගෙන මෙහෙදී ඒක සාක්ෂි තියෙනවා .

ප්‍ර : එහෙමයි. ස්ථානවල ඔබ වහන්සේ වැඩ වසන අවස්ථාවේ ඒ ස්ථානවලට කරදර කෙරුවා ?

පි : මුස්ලිම් ආවා කඩු අරගෙන ආවා අහුවුණා මළගෙදර කට්ටිය තමයි මේ දියතලාවේ එහෙන් ඇවිල්ලා බදුල්ලේ ගඩාදෙහිගොල්ලේ දී

ප්‍ර : එහෙයි

පි : යම් යම් ස්ථාන වලදී එහෙමයි

ප්‍ර : ඔව් දැගලුවේ

පි : ඊට පස්සේ අපි බැලුවා මේක මෙහේ හරියන්නේ නෑ අපි මෙහෙම කරමු කියලා . ඊට පස්සේ තමයි මේක හලාවතින් ගන්න බැරි වෙනවා ඊට පස්සේ අනුරාධපුරේ බිෂොප් මාළිගාවට අපි යනවා අජිත් අයියාගේ ත්‍රී වීල් එකේ එහේ ගිහිල්ලා

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔය කොයි කාලේ වගේද අපේ හාමුදුරුවනේ ? මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ කොච්චර කාලේකට පස්සේ ද?

පි : පාස්කු ප්‍රහාරයෙන් පස්සේ මේ

ප්‍ර : බිනර පෝය පත්තරේට දුන්න එක කිව්වේ නෑනේ?

පි : ඔව් පත්තරේක ගඩාදෙහි ගොල්ලේ වෙච්චි සිද්ධිය ඒ ගමේ අයට මම කියනවා ඕක මම දෙනවා දිවයින පත්තරේට අර පත්තර වාර්තාවක් දෙනවා නේද මැඩම් ෂාපි ගැන හරි මොකක් හරි පත්තර වාර්තාවක්

ප්‍ර : එහෙමයි. ඒ පාස්කු ප්‍රහාරයට පස්සේ

පි : ඔව්

ප්‍ර : ෂාෆි වෛද්‍යවරයා පිළිබඳව ප්‍රචාරයක් ගියා?

පි : ඔව්.ඒ පත්තරේ හොයා ගන්නවා එයාගේ නම්බර් එක

ප්‍ර : කවුද හොයා ගන්නේ ?

පි : මම

ප්‍ර : කාගේ නොම්බරේද ?

පි : ඒ වාර්තාකාරයාගේ හොයාගෙන පත්තර වාර්තාකාරයා ඒක ගන්නේ බදුල්ලේ පත්තර කඩෙන් . බදුල්ලේ පත්තර බෙදන තැනින් එතනින් තමයි ගිහින් මම ඉල්ල ගන්නේ . ඉන් පස්සේ ඒකත් පත්තරේ වැටෙන්නේ නෑ.

ප්‍ර : පත්තරේට දුන්නාට ඒක පත්තරේ යන්නේ නෑ?

පි : ඒක පත්තරේ වැටුණේ නෑ. අපි පත්තරේ බල බල හිටියා පන්සලට පත්තරේ එනවා .

ප්‍ර : එහෙමයි.

පි : පත්තරේ වැටුණේ නෑ. එතනින් මම එනවා කඩින පිංකමට ඔන්න මෙන්න තියලා

ප්‍ර : එහෙයි

පි : එහෙන් මම එනවා එළියට ඇවිල්ලා ඉවර වෙලා එතකොට පියතුමා අපි ටිකක් දැනුවත් කරලා පියතුමාගෙන් පිළිතුරක් ලැබුණේ නෑ එතකම් ඉන් පස්සේ එතනින් ඇවිල්ලා අනුරාධපුරයේ මම වඩිනවා පරසන්ගස්වැව

ප්‍ර : එහෙමයි

පි : පන්සලට. දැන් පන්සලකට ගියම අනිවාර්යෙන්ම චුට්ටක් අජිත් අයියලාගේ ගෙවල්වලට එහා තමා පරසන්ගස්වැව තියෙන්නේ. අජිත් අයියාට ඒ හාමුදුරුවෝ චුට්ටක් අජිත් අයියා කිව්වා ඒ හාමුදුරුවෝ චුට්ටක් දේශපාලනය කරලා තියෙනවා හරි ටිකක් ගම්භීරයි බය නෑ ඔය ටී 56 ක් එහෙම අතේ තිබිලා අහු වුණා දේශපාලනය කරලා අරහේ මෙහේ කියලා කිව්වා. මමත් බැලුවා මෙයා අන්තවාදීන්ට එරෙහි වෙන්න ඇති අර චරිතේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

බලලා මටත් චුට්ටක් ගැළපෙනවා කියන අධිෂ්ඨානය තියාගෙන මම ගියා එතෙන්ට . ගියාහම එයා කොළඹ ආධාර එකතු කරනවා එයාගේ හොඳ කාර් එකක් තියෙනවා. එයා ගම්පහ ඒ හරියේ බැලුම්මහර හෝටලේක ඉන්නේ. එයාගේ පියාම සාක්ෂියට ඉන්නවා එයා සල්ලි එකතු කරලා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා ඉන්නේ හෝටලේ ඉදලා මත්ද්‍රව්‍ය පාවිච්චි කරන කෙනෙක් . මෙයාට මම මේ අන්තවාදය ගැන චුට්ටක් කියලා තිබුණා. මෙයා බියගම හෝටලේක ඉදලා මට කෝල් කරනවා මම අන්තවාදය ටිකක් කියලා තිබුණා . බියගම හෝටලේක ඉදලා මෙයා කතා කරනවා දැන් මම දන්නේ නෑ බියගම කියලා ඒ වේලාවේ. මට සද්ධාශීල කියලා කතා කළේ . අවුරුදු ගාණක් මහණ වෙලා ඉදලා උපසම්පදා වෙලානෑ එයා . අවුරුදු ගාණක් මහණ වෙලා. මම මුලින් හිතුවේ මහනායක හාමුදුරුවෝ කෙනෙක් කියලා. සද්ධාශීල උඹ අර අන්තවාදය පිළිබඳ චුට්ටක් කියපන්කෝ කියලා ඒ විදිහට තමා මට ඇමතුවේ. මම කිව්වා අන්තවාදය ගැන කියන්න දෙයක් නැනේ ඔබ වහන්සේට කියලානේ තියෙන්නේ කියලා ඕවා අතඇරලා දාපන් මේ අපිටත් එක්ක අන්තිමට හිරේ යන්න වෙනවා මෙයා මේ මුස්ලිම් එවුන් මරන්න ඕනී කපන්න ඕනී කියලා කිව්වේ මනුස්සයා මට ඒ විදිහට දැන් කතා කරනවා. මම කිව්වා දැන් ඔබ වහන්සේ මුලින් මොකක්ද කිව්වේ මුස්ලිම් කපන්න ඕනී මරන්න ඕනී කිය කිය කිව්වේ හාමුදුරුවනේ මේ මොනාද කියන්නේ. දැන් අපේ නම්බර් එහෙම දෙන්න එපා ඕවා මේ දරුණු වැඩ ඕක ගැන චුට්ටක් විස්තරේ කියහන්කෝ. මම කිව්වා පොඩ්ඩක් ඉන්න ෆෝන් එකේ Battery බැහැලා මම කාමරේට ගිහිල්ලා ආවාසේට ගිහිල්ලා charge එකට ගහලා ගන්නම් කියලා එයාගේ ඩ්‍රයිවර්ට ගත්තා මම ඇහුවා කොහේද මහත්මයා ඉන්නේ කියලා මේ බියගම මල්වානේ කිට්ටුව මෙන්න මේ හෝටලේකට ආවා කවුදෝ එන්න කියලා ඒකේ ඉන්නේ කියලා කිව්වා . මම අර ඉස්සෙල්ලා බුද්ධි අංශයේ මහත්මයාලාට ටක් ගාලා කෝල් එකක් දුන්නා.

ප්‍ර : නම මොකක්ද ඒ මහත්මයාගේ ?

පි : ඒ නම තමා ටිකක් මට අමතක වෙන්නේ .

ප්‍ර : දිනේෂ් රණසිංහ මහත්මයා

පි : දිනේෂ් රණසිංහ මහත්මයා

ප්‍ර : දිනේෂ් රණසිංහ මහත්මයා

පි : දිනේෂ් රණසිංහ මහත්තයාට කිව්වහාම

ප්‍ර : මේජර් දිනේෂ් රණසිංහ ?

FAIR COMMENT
BY JEZEEM

පි : ඔව් එයා ඊට පස්සේ හාමුදුරුවනේ මම ටක් ගාලා බලන්නම් කියලා එයා ටක් ගාලා බලලා කිව්වා මෙහෙම හෝටලේ හරි මේ හෝටලේ තමයි කාර් එකේ නොම්බරේ දන්නවාද මම කිව්වා කාර් එකේ නොම්බරේ එයා කාර් එකේ නොම්බරේත් මට කිව්වා දිනේෂ් මහත්මයා. ඒ ක්ෂණික ගිහිල්ලා තියෙන්නේ දිනේෂ් මහත්මයා මොකද එයාලා අපිත් එක්ක විමර්ෂණය කළානේ. එයා කිව්වා හාමුදුරුවනේ ඔක්කොම හරි මම උදේට ගන්නම් කියලා කිව්වා චිප් එක කවුද ආවේ ඔක්කොම බලන්නනම් ඔබ වහන්සේ බය වෙන්න එපා එතකොට මම පරසන්ගස්වැව රාළහාමි මට ඊයේත් කතා කළා සාජන් මහත්මයා OIC මහත්මයා මම දැනුවත් කළා. ඒගොල්ලෝ මුස්ලිම් මිනිසුන්ට විරුද්ධව වැඩ කරන දෙන්නෙක් . මම එක තැනකින් හොයා ගත්තා. මම ටක් ගාලා සාජන් මහත්මයාව දැනුවත් කළා සාජන් මහත්මයා අරගෙන ටක් ගාලා ජීප් එක අරගෙන ආවා . මොකද පාවලා දුන්නොත් මුස්ලිම් එතන අලුත්ගම ගම්මිරිස් වැව අලුත්ගම කියන්නේ ළඟ මුස්ලිම් ඉන්නවා පන්සලට එහා පැත්තේ මුස්ලිම් ඒරියා

ප්‍ර : එහෙමයි.

පි : ටක්ගාලා සාජන් මහත්මයා ජීප් එකත් අරගෙන රෑ වෙනකම් පොලිසියේ හිටියේ මාත් එක්කලා . ජීප් එකේ ආයුධ දෙකකුත් තියාගෙන එතන හිටියා ඒ ගොල්ලො එළිවෙනකම්ම හිටියා ඒ ගොල්ලෝ තේ වක්කර ගෙන බීලා මට කිව්වා හාමුදුරුවෝ ගිහිල්ලා සැතපෙන්න ඒ ගොල්ලො බණ ශාලාවට වෙලා හිටියා දන් ශාලාවට වෙලා . ඊට පස්සේ අපිත් අයියා උදේ පාන්දර ඇවිත් ත්‍රී විල් එකේ දාගෙන ගියා. ඒ යන ගමන් කතරගම පොඩි හාමුදුරුවොන්ට කෝල් කළා . හාමුදුරුවෝ කිව්වා ඔබ වහන්සේ දැන්ම නඟින්න ඔතනින් බස් එකේ

ප්‍ර : එහෙමයි. ඊට පස්සේ ඒ ස්ථාන මාරු එක එක අවස්ථාවලට ඒක කරන්න සිද්ධ වුණා

පි : සිද්ධ වුණා

ප්‍ර : ඒ පාවා දීම් සිදු වෙන නිසා ?

පි : ඔව්.

ප්‍ර : ස්වාමීන් වහන්සේ දැන් ඔය අතරේදී දැන් අර මේ පල්ලියකට ඒ කියන්නේ ඉස්ලාම් ආගමට අයත් නොවන පල්ලියකටනේ පහර දෙනවා කියලා දැන් ඔබ වහන්සේට තොරතුරු ලැබුණේ ඉන්දියාවේ දී ?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට කතෝලික හරි ක්‍රිස්තියානි හරි පල්ලියක පූජකවරයෙක්ට ඒ පිළිබඳව දැනුම් දීමට ඔබ වහන්සේ යම් පියවරක් ගත්තා ද?

පි : දැනුයි මේ ක්‍රිස්තියානි අය මේච්චර හොඳයි කියලා හිතුවේ මේ කාදිනල්තුමාගෙන් දැන ගත්තේ මම කවදාකවත් ක්‍රිස්තියානි ෆාදර් කෙනෙක් එක්ක වැඩි සම්බන්ධකම් තිබිලත් නෑ ක්‍රිස්තියානි ආගම ගැන දන්නෙත් නෑ

ප්‍ර : දැන් ඔබ වහන්සේට මතකයිද අර ඔබ වහන්සේ අර අනුරාධපුරේ වැඩිය අවස්ථාවේදී ඒ ක්‍රිස්තියානි කෙනෙක්ගෙන් ඇහුවානේ අර

පි : ඒ පාස්කු ප්‍රහාරයෙන් ඔක්කොගෙන්ම පස්සේ .

ප්‍ර : නෑ අපේ හාමුදුරුවනේ . අර මේ ට්‍රයි ෂෝ එකේ යනකොට ඇහුවා නේද ?

පි : මොකක්ද

ප්‍ර : පණිවිඩේ ගැන කියන්න .

පි : කොහේ යන කොටද?

ප්‍ර : අනුරාධපුරේට වැඩිය වේලාවේ හරි කල්පිටියේදී හරි ?

පි : පාස්කු ප්‍රහාරයේ ස්වාමී කෙනෙකුට දැනුම් දුන්නේ අන්තිමටම අපි මේ ඔක්කොම සිද්ධ වෙලා සාමාන්‍යයෙන්

ප්‍ර : ඒක ගැන එතකොට හැමදාම පාස්කු තමයි කියලා කිව්වයි කියලා කිව්වේ ?

පි : ඒ ස්වාමී කෙනෙක් නෙවේ .

ප්‍ර : නෑ නෑ එහෙම නෙවේ නමුත් ඒ පණිවිඩේ

පි : ඒ කළුමල්ලි

ප්‍ර : කළුමල්ලි

පි : කළුමල්ලි ඒක බලන්නේ කළුමල්ලි එයා ත්‍රී විල් එක එළවන කළුමල්ලි

ප්‍ර : ඔබ වහන්සේ එකෙන් තොරතුරක් ගන්නනේ හැදුවේ කවුරුහරි ක්‍රිස්තියානි ආගමේ

පි : ඔව්

ප්‍ර : අන්න ඒක ගැන පොඩ්ඩක් කියන්න පුළුවන්ද? ඒ කියන්නේ ඔබ වහන්සේ යම් උත්සහයක් ගත්තානේ ඒක ක්‍රිස්තියානි ආගමේ කාටහරි කියන්න ?

පි : ඔව් දැන් රසික මහත්මයාගේ නෝනා ක්‍රිස්තියානි

ප්‍ර : ඔව්

පි : එයාට තමා ඉස්සෙල්ලා කිව්වේ එයාගේ නෝනා පල්ලියේ ඉස්සරහා පිට ගුහාව පල්ලියේ ඉස්සරහ පිට අපි කියනවාට වැඩිය ඒ ගොල්ලෝ මොකද මම මේක මගේ නාමය එළි කළේ නැත්තේ එතෙන්ට ගිහිල්ලා ස්වාමිලා කතා වුනොත් මෙහෙමයි මෙහෙමයි

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කියලා හාමුදුරුවෝ යන් පොලිසියට යන් අරහේ මේහේ මාව අල්ලන් පොලිසි ගියොත් මාව ප්‍රසිද්ධ වෙනවා ඉතින් අන්තවාදී අතන මට මොකක් හරි කළොත් එහෙම ඒකත් මම රහසිගතවනේ මේවා කරන්න හැදුවේ

ප්‍ර : එතකොට අර කල්පිටියේ පූඩ් මල්ලිට කතා කෙරුවේ පූඩ් මහත්මයාට කතා කරලා අර තරුණ ක්‍රිස්තියානි ඒගොල්ලන්ට කිව්වයි කියලා කිව්වානේ ඒ පණිවිඩේ ගැන ?

පි : අවසාන මොහොතේදී මේකේ සාක්ෂියක් තියෙනවා එයාගේ නම්බරේ තියෙනවා අවසාන මොහොතේදී මගේ පන්සලට එහා පැත්තේ තියෙන්නේ ක්‍රිස්තියානි පල්ලිය

ප්‍ර : එහෙමයි.

පි : ඒ පල්ලිය භාරව ඉන්න කෙනෙක් ඉන්නවා ක්‍රිස්තියානි එක්කෙනෙක්

ප්‍ර : එහෙයි.

පි : එයාගේ නොම්බරේ මම අරගෙන එයාට කතා කළහාම එයා කොහේද ඈතක ගිහිල්ලා පුළුවන් නම් ස්වාමිලාට කියන්න මෙහෙම ප්‍රහාරයක් තියෙනවා කියලා එයාවත් මම දැනුවත් කළා.

ප්‍ර : ආ... එයාගේ නම මොකක්ද ස්වාමීන් වහන්සේ ?

පි : එයාගේ නම මේ ෆෝන් එකේ තියෙනවා.

ප්‍ර : ඒ පාස්කු ප්‍රහාරයට පෝද ස්වාමීන් වහන්සේ?

පි : ඔව්. ඒ නොම්බරේ නෑ Delete වෙලා .

ප්‍ර : කවදා වගේ ද එතකොට කතා කළේ කියලා ඔබ වහන්සේට

පි : එයාට හෙට වගේ තමා අවසාන මොහොතේදී තමයි එයාට කතා කළේ මෙහෙම මේ පාස්කු දා කළු මල්ලිගෙන් ඇහුවාම කිව්වානේ දැන් දිගටම පාස්කු තමයි කියලා

ප්‍ර : එහෙයි

පි : මම බැලුවා ඉතින් හැමදාම ඉරිදා පාස්කු වෙන්න ඇති ක්‍රිස්තියානි ආගම ගැන මම දන්නේ නෑ කතෝලික ආගම ගැන

ප්‍ර : ඔබ වහන්සේ දැනන් හිටියේ නෑ ?

පි : දැනන් හිටියේම නෑ. ඉතින් ඊට පස්සේ කිව්වා ඉරිදා කියන්නේ හැමදාම පාස්කු මම හිතුවා පුම්මා කියන්නේ සිකුරාදා ඒ වගේ පාස්කු ඉරිදා තමා වෙන්න ඇති කියලා . මම කල්පනා කළා දිනයක් කියන්නත් බෑ මොකුත් නෑ පාස්කුව කවදාහරි ගහයි කියලා . ඊට පස්සේ තමා දන්නේ 21 තමා පාස්කු තිබුණේ කියලා .

ප්‍ර : එහෙමයි.

පි : මොකද වැස්සකටවත් පල්ලි ගිය නැති කෙනෙක් තමයි කළුමල්ලි කියලා අන්තිමට කිව්වා ගමේ උදවිය .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙමයි එතකොට අතිඋතුම් කාදිනල් තුමාට ඔබ වහන්සේ කතා කළාද ?

පි : කාදිනල්තුමාට තමා අපි අවසානයේ අනුරාධපුරේ ගිහිල්ලා මේ කිසිම විමර්ශනයක් වෙන්නේ නැති හින්දා

ප්‍ර : එහෙමයි.

පි : දැන් එතකොට පළවෙනියා ඇවිල්ලා කිව්වා මමයි කතරගම පොඩි හාමුදුරුවොයි ආවේ ඇවිල්ලා කිව්වා

ප්‍ර : ඒ කොයි කාලේ වගේ ද කියලා මතකද ?

පි : මේ අවසාන ටික . ජන්දේට ඉස්සෙල්ලා

ප්‍ර : ඒ කියන්නේ ජනාධිපතිවරණයට පෙර

පි : පෙර මාසේකකට දෙකකට එක හමාරකට වගේ පෙර ඇවිල්ලා හම්බවෙලා මම විස්තර ටිකක් කිව්වා ඉස්සෙල්ලාම අපි දැන් අනුරාධපුරේ ඉදලා බයිසිකල් එකේ එන්නේ මෝටර් සයිකලේක අපි හලාවතට රෑ අජිත් අයියායි මමයි ඇවිල්ලා එහෙන් ගන්න බැලුවා මම ප්‍රධාන බිෂොප් මාළිගාවේ හිටියේ නෑ

ප්‍ර : බැරි වුණා?

පි : කාදිනල් තුමාගේ ඒ ගොල්ල ගාව නෑ කියලා කිව්වා

ප්‍ර : බිෂොප් තුමා හිටියේ නෑ කිව්වා?

පි : හිටියේ නෑ ඊට පසේස් අපි අනුරාධපුරේ ගිහිල්ලා පහුවදා කවුද කිව්වා ඇහුවහාම අනුරාධපුරෙත් තියෙනවා කියලා ලොකු පල්ලියක්. ගිහිල්ලා බැලුවහාම මිනිහෙක් භාර ගෙන ගිය තැන හොයන්න මම අතින් රුපියල් 500 ක් දීලා බිෂොප් මාළිගාව හොයා ගන්න. සල්ලි නැති වේලාවේ. එන ගමන් පෙන්නන්නම් කියලා කිව්වා 500 ක් දෙන්න කියලා කිව්වා මම කිව්වා යන් නඟින්න මිනිහාත් අරගෙන ගියා ගිහිල්ලා තමා නොම්බරෙත් තියෙනවා අපි ඉල්ල ගත්තා පොඩ්ඩෙ කියලා ටිකක් බොන මිනිහෙක් ඊට පස්සේ එතන ගිය හැටියේම එතන වේලාවට දුන්නා කාදිනල්තුමාගේ ලේකම්තුමාගේ

ප්‍ර : අංකේ දුරකථන අංකේ?

පි : දුරකථන අංකේ. ඒයාව මම දැනුවත් කළා ඔබ වහන්සේ පොඩ්ඩක් ඉන්න මම හැන්දෑවට ගන්නම් කියලා කිව්වා කෝල් එකක්. අපේ හාමුදුරුවනේ අනිද්දාට ඔබ වහන්සේ වඩින්න මම එපොයිමන්ට් එකක් දා ගත්තා මේ දවස්වල විශාල ලෙස මේ අර ඝාතන සිදු වෙච්චි අරහෙ මෙහේ බීසි කිව්වා මම බොහොම අමාරුවෙන් දා ගත්තා මේක වටිනා දෙයක් කියලා

ප්‍ර : ලේකම්තුමා කිව්වේ ?

පි : ලේකම්තුමා කිව්වේ .ඊට පස්සේ පියතුමා හම්බවුණා එතන හිටපු හම්බවෙලා මගෙන් ඇහුවා කොච්චර කල්ද කියලා මම කිව්වා

FAIR COMMENT BY JEZEEM

මාස 07 ක් තිස්සේ මෙහෙම ඇවිදිනවා මේ විදිහයි කියලා ඔබතුමාට දැන් පන්සලත් නෑ ඒ විස්තරත් ඔක්කොම කෙටියෙන් පැවසුවා පැය 2 හමාරක් 3 ක් විතර . උදේ ආවේ දානේ වළඳනකම්ම 12 වෙනකම්ම කිට්ටු වෙලා වගේ

ප්‍ර : එහෙමයි.

පි : කතා කළා සාකච්ජා කරලා ඉවර වෙලා ඊට පස්සේ මගේ පර්ස් එක තියලා ගියා එතන එනකොට රුපියල් 20000 ක් මේ පර්ස් එකට පියතුමා මට හොරෙන් දාලා . මම නිකමට පර්ස් එක ඇරලා බැලුවහාම ඇන්විලොප් එකක් මම දැක්කා මේක අස්සේ තියෙනවා ඇතුළ ඇරලා නෑ මෙහෙම ඇන්ලොප් එකක් නමලා මෙහෙම තියලා මම ඊට පස්සේ අරන් බැලුවහාම සල්ලි වගයක් මට ගන්න පුළුවන් මම ආපහු අතට දීලා කිව්වා මම කිව්වා මේක පුජා කරන්න කියලා ඔහොම ගන්න හොඳ නෑ මම පිං අනුමෝදන් කරන්න ඕන කියලා

ප්‍ර : එහෙමයි.

පි : ඊට පස්සේ මම පිං අනුමෝදන් කරලා ඒකත් අරගෙන ඔක්කොම විස්තරේ කිව්වා . ඊට පස්සේ දෙවෙනි වතාවට නිතරම නිතරම මට කතා කළා එදාම පියතුමාගේ හැන්ඩ් ෆෝන් නම්බරේ දුන්නා කාදිනල් පියතුමාගේ හැන්ඩ් ෆෝන් නම්බරේ දුන්නා මේක ඔබ වහන්සේ තියා ගන්න හදිසියක් වුනොත් මට කෝල් එකක් දෙන්න කියලා . ඊට පස්සේ ආරක්ෂක ලේකම්තුමා පදවි ප්‍රාප්තියට හෙට ආව වේලාවේ මට හදිස්සි කියලා කිව්වා එන්න කිව්වා මට කිව්වා ඔබ වහන්සේට එන්ට පුළුවන්ද කියලා මම කිව්වා පුළුවන් වාහනයක් හරි අරගෙන එන්න කිව්වා මම මුදල් ගෙවන්නම් කියලා කිව්වා සල්ලි අපරාදේ නාස්ති කරන්න ඕනේ නෑ කිව්වා මම රෑ බස් එකේ එන්නම් කිව්වා උදේ එන්න හිටියොත් එන්න නෑ ඊට පස්සේ මම රෑ 11 ට බස් එකට නැගලා එළිවෙන්න මෙහෙට වැඩියා මම 8 නෑ ඊට ඉස්සෙල්ලා නෑ මට ඊට ඉස්සෙල්ලා දවසේ එන්න කිව්වේ ඇවිල්ලා මම ඒ වගේ උදේ 10 ට මෙහේ හම්බ වෙන්න ඕනේ කියලා කිව්වා කොහොම හරි මම ෆෝන් එක ඕප් කරලා ආවේ .

ප්‍ර : එහෙයි

පි : ෆොන් එක ඕප් කරලා ආවාට පස්සේ කොළඹට කිට්ටු වෙලා ෆෝන් එක ඔන් කරහාම මිස් කෝල් 27 ක් තියෙනවා ලේකම්තුමාගේන් ඊට පස්සේ හාමුදුරුවනේ අද නෙවෙයි ඒක කලි ගියා හෙට එන්න කියලා දැන් ඇවිල්ලා ඉන්න තැනකුත් නෑ මොකද කරන්නේ කියලා බොරැල්ලේ කතරගම ඉන්නවා මගේ තව හාමුදුරුවෝ කෙනෙක් මම එයාට කතා කරලා ඇහුවා

FAIR COMMENT BY JEZEEM

බොරැල්ලේ පන්සලක් නැද්ද කියලා තිලකරත්නාරාමයේ අඳුරනවා කියලා කිව්වා එයාට කෝල් එකක් දීලා කියන්න කිව්වා හාමුදුරුවෝ කෙනෙක් එයි එන්ඩ කියලා කිව්වා. ඒ හාමුදුරුවෝ කතා කරලා කිව්වහාම මකුණු දැල් කඩාගෙන බොහොම අමාරුවෙන් මෙට්ට ගඳ ගහන කාමරයක නිදා ගත්ත ඔව්වර තිලකරතනාරාමයේ මේ එහා පැත්තේ පන්සල. ඊට පස්සේ ෆෑන් එකක් නෑ ගැරැජ් එකේ කොල්ලා අර බස් වල තියෙන්නේ පොඩි ෆෑන් එක මෙව්වා කර ගෙන මඳුරුවෝ විමානේ ඒකත් දාගෙන සැතපුණා. පස්සේ මම චීවරයක් වැඩි පුර අරන් ආවා කෝකටත් මොනවා හරි ඇඟට වැටුණොත් තියෙන්න එපැයි ඒක පහුවදා ඇඳගෙන මේ ලේකම් තුමාව හම්බවෙලා මට කිව්වා විනාඩි 03 ක් වගේ තියෙන්නේ ඔබ වහන්සේ කැඳවනවා . මේ ටක් ගාලා කියන්න කියලා මම කිව්වා උපන් දිනේ කිව්වා හැදිච්චි ගම කිව්වා අවුරුදු 37 ක් හොයලා තියෙනවා 17 ක් ඉස්ලාම් නායකත්වයක් අන්තවාදි සංවිධානයේ අමීර්ෂාප් වෙලා ඉදලා තියෙනවා මේ සම්පූර්ණ මා ගාව තියෙනවා කියලා . ඊට පස්සේ තමයි එතනින් තමයි ජනාධිපතිතුමාට මේක ගියේ ඊට පස්සේ තමයි මේ කොමිෂමට

ප්‍ර : ඔබ වහන්සේගේ කැඳවීම කළේ ?

පි : ඒක ඉතින් මගේ වාසනාවට නොවේයි රටේ වාසනාවට

ප්‍ර : දැන් ඔබ වහන්සේ මේ පිළිබඳව දන්න කරුණු ගැන යම් රූපවාහිනී මාධ්‍යයක යම් වැඩසටහනකට කරුණු ඉදිරිපත් කරලා තියෙනවා ද?

පි : ඔව්. මොකද මට දෙරණ මාධ්‍ය තමයි මට ගොඩක් උදව් ලැබුන්නේ මොකද මම පුංචි ළමයි කට්ටියක් මගේ කවි අහන්න ආසයි කියලා ඒ කියන්නේ

ප්‍ර : තැන කියන්නේ නැතුව කියන්න අපේ හාමුදුරුවනේ .

පි : ආ..... ඔව්. පුංචි ළමයි කණ්ඩායමක් මේ කවි වලට ආසයි කියලා අවුරුදු 12 හේ 13 නේ වගේ පොඩි පිරිමි ළමයි ටිකක් මා එක්ක මැසෙන්ජර් වලින්

ප්‍ර : කතා කළා

පි : කතා කරනවා . මම ඇහුවා ඔය ගොල්ලන්ගේ තාත්තා මොකද කරන්නේ කියලා . අපේ තාත්තා මෙහෙම රූපවාහිනී ආයතනයක වැඩ කරන්නේ කියලා කිව්වා . ඊට පස්සේ මම ආයතන නම කිව්වාට කමක් නැද්ද ඒවා කියන්න එපාද

ප්‍ර : ආයතනය කමක් නෑ ස්වාමීන් වහන්ස

පි : ඉන් පසුව එයා මට දුන්නා සිරසයි දෙරණෙයි . සිරසෙන් මම අරගෙන කියන්නේ මොකද මම දන්න දෙයක් තමයි රටේ

FAIR COMMENT BY JEZEEM

විපත්තියක් වෙච්චි වේලාවට මහරාජා මහත්මයා සෑම දේකටම උදව් කරනවා. නාය ගියොත් ගංවතුර ගියොත් ගොඩක් දේවල් වලට එයා උදව් කරනවානේ . ඊට පස්සේ මම කිව්වා ඔය ගොල්ලොන්ගේ මහරාජා මහත්මයාව මට මුණ ගැහෙන්න ඕනේ කියලා මම බැලුවේ එයා ලව්වා හරි මොකක් හරි දෙයක් මේ කරන්න . අපේ අටමස්ථානාධිපති හැම ස්වාමීන් වහන්සේලාටම කිව්වා හරි ගියේ නැනේ . ඊට පස්සේ ඒ ගොල්ලෝ නිකම් රෝන් ටෝක් දැම්මේ ඒක හරි ගියේ නෑ. ඊට පස්සේ කතා කලා දෙරණට කතා කලාහම උකුස්සා වැඩ සටහනේ ප්‍රධානියාගේ නම්බර් එක එයා කතා කරලා කිව්වා මම විස්තර කිව්වා අපේ හාමුදුරුවනේ මේක අපිට මාධ්‍යයෙන් කරන්න බෑ ඔබ වහන්සේ එයා කොහොම හරි මගෙන් රුපියල් 700 ක රිලෝඩ් එකක් ඉවර වෙනකම් මම එයාත් එක්ක කතා කළා. අන්තිමට ඉවර වුණාට පස්සේ ඒ මහත්මයාත් අරන් කතා කළා. කතා කරලා කිව්වා අපි හෙට එවනවා කිව්වා ඒගොල්ලොන්ගේ කට්ටියක් ඊට පස්සේ ඒ ගොල්ලෝ පහුවදාම ඇවිල්ලා අජිත් අයියලාගේ ගෙදර තමයි ඒක තාප්ප වට කරලා ලොකුවට බැඳපු ගෙයක් මම සතියක් විතර එහේ ඉදලා තියෙනවා ඉන් පස්සේ අපි එහේ පැය 6 හමාරක් රෙකොඩින් එකක් ගැහුවා . ගහලා ඒගොල්ලො කිව්වා මේක මම කිව්වා ඕක දෙන්නේ යම් කිසි දවසක මම මිය ගියොත් මේක දෙන්න රජයට මම ඊට ඉස්සෙල්ලා වෙක් කරලා බැලුවා ෂෙයා වැඩියෙන්ම තියෙන්නේ සරත් අමුණුගම මහත්මයාගේ දුවට මොකද ඒකේ රියදුරු අපිට දෙරණෙන් එන්න ඉස්සෙල්ලා එකේ රියදුරු බලන කොට අජිත් අයියලගේ ඥාතියෙක් . එයා කිව්වා ෂෙයා වැඩියන්ම තියෙන්නේ සරත් අමුණුගම මහත්මයාගේ දුවට කියලා. එතකොට ඒක බර මහින්ද මහත්මයාලාට . ගෝඨාභය මහත්මයාලාට බරයි. ඒක හින්දා අපි ඒක තෝර ගත්තා . තෝර ගෙන ඒ ගොල්ලො කිව්වා පොලිස් ඕගනයිෂේසන් එකේ වෙලගෙදර සර්ව ඒ ගොල්ලො තමයි මට මේවා කරලා දුන්නේ . ඊට ඉස්සෙල්ලා ගුවන් හමුදාපතිතුමාගෙන් තමයි අපේ මේ අනිත් නුවර හැඩිල් කරන්නේ

ප්‍ර : එහෙයි

පි : ඒ මහත්මයා

ප්‍ර : ඒ කියන්නේ දිනේෂ් රණසිංහ මහත්මයාගේ මේ ජ්‍යෝෂ්ඨ නිළධාරීතුමා

පි : දිනේෂ් රණසිංහ මහත්මයාගේ ජ්‍යෝෂ්ඨ නිළධාරීතුමා මහත්මයා

ප්‍ර : එහෙයි.

FAIR COMMENT
BY JEZEEM

පි : එතකොට අපි ඔය ගල්කිස්සේ ඔය හැමතැනම ඉදලා හෝටල්වල ඉදලා ඕවා විමර්ශනය කරගෙන දිනේෂ් මහත්මයලා පරීක්ෂණ කළා මම කියපු තැන් ගොඩක් හරි යාඩ් දෙක බැලුවා ඉස්මයිල් හාජ්ජියාර්ගේ ඒකේ දැනටත් මම හිතන්නේ කන්ටනර් වගයක් තියෙනවා . ඒකේ විශාල වලක් කපලා තිබුණා එතන වලක් කපන්න අවශ්‍ය නෑ . වල කලකදී වහලා තිබුණා . එතන තිබිච්චි ලා රතු පාටට හුරු කන්ටනර් එක මම හිතන්නේ එතන වැරදි ඒක දිනේෂ් මහත්මයාලා කිව්වා කාටවත් කියන්න එපා අපි ගොඩ දාන්න හාමුදුරුවනේ හදන්නේ කියලා ඒ ගොල්ලො ඒකට ගහගෙන ඉන්නේ ඇස් දිනේෂ් මහත්මයලා අමීර් හාජ්ජියාර්ලාගේ ගෙදරට ගියා . ඒ ගොල්ලො චෙක් කළා හැමතැනම මල්වානේ වෙක් කරලා තියෙන්නේ ඒ ගොල්ලෝ කිව්වා හාමුදුරුවනේ මේ ඉහළින් හිර වෙනවා මේවුවා කියලා . දත් මිටි කන තැන් තියෙනවා කිව්වා ඒ සර් කිව්වේ . ඊට පස්සේ ඔය ටික අපි හොයා ගෙන දෙරණ කිව්වා හදිස්සියක හාමුදුරුවොන්ට මොනවා හරි වුනොත් අපි දෙනවා . නැත්නම් මේක රජය අරගෙන හාමුදුරුවන් අර ඒ ගොල්ලොම තමා මේ අනාවැකිය කිව්වේ . ගජමුතු තියෙන ඇතාගේ දළ කපා ගත්තාට පස්සේ ඇතාගේ වටිනාකමක් නෑ දළ දෙක තමයි අරගෙන යන්නේ අන්න ඒ වගේ වෙනවා කියලා කිව්වා හැබැයි යු.එන්.පී ආණ්ඩුව මහින්ද මහත්මයාලාගේ ආණ්ඩුව එහෙම කරන්නේ නෑ ගෝඨාභය සර් එහෙම කරන්නේ නෑ . ආණ්ඩුව පත් වුනොත් හොඳයි කිව්වා නැවත යු.එන්.පී ආණ්ඩුවක් ගියොත් හාමුදුරුවන් අවසානයේ හාමුදුරුවොන්ට මේ තියෙන සිද්ධිය අනුව හාමුදුරුවොන්ව මරණවා කිව්වා ඒ ගොල්ලො දෙරණෙන් කිව්වේ මම කිව්වා එහෙම වුනොත් කමක්නෑ මම මැරුණාට මගේ සාක්ෂි මැරෙන්නේ නැනේ . ඕක අනිවාර්යෙන්ම මාධ්‍යයෙන් රට පුරා ප්‍රදර්ශනය කරන්න කියලා කිව්වා

ප්‍ර : දෙරණට කිව්වා?

පි : දෙරණට කිව්වා. මම කිව්වා යු.ඇන්.පී ආණ්ඩුවක් ගියොත් අනිවාර්යෙන් මම මැරුවොත් රටට මහත්මයෝ ඕක හෙළි කරලා දාන්න කිව්වා එතකොට මහජනතාව දැනුවත් වෙනවානේ . මම ඒක මහජනතාව දැනුවත් කළා. සියළුම ගෙදරක ගැහැණු පිරිමි තියුණු ආයුධ තියා ගත යුතුයි කියන වචනේ තමා මම අවසානේට මෙච්චරයි මට කියන්න තියෙන්නේ කියලා උන් අපිව කපලා මරන්න ඉන්න වචනේ මම කිව්වා මානසික රෝහලේ මම අර ගියේ ඩෝක්ටර් වෛද්‍යසේකර මහත්මයාගේ යොමු කරන්න ඒ සීන් එකත් මම කිව්වා . මේ විදිහට නැත්නම් මට පිස්සෙක් කියලා

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කියයිනේ ඒ සර්ගේ මම කකුල් දෙක අල්ලලා වැදලා කිව්වා මම ගමනක් යන්නේ එයාට මම කිව්වා මෙමෙම මම අන්තවාදය හොයනවා කියලා ඩෝක්ටර් වෛද්‍යසේකර සර්ට. මගේ නඩු ගොඩක් තිබුණානේ පොලිසියත් එක්කලා කෝලහාල කරගෙන කෝලහාල නඩු තිබුණා. ඒවත් ඔක්කොම විස්තර වෙනම දාලා

දැන් වේලාව : 07.05 යි.
මෙතැන් සිට ල/ලේ : චන්දිමා මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව:07.05
පෙර සටහන් :ල/ලේ මුතුමාලි මෙනවිය
මෙතැන් සිට:ල/ලේ චන්දිමා මෙනවිය

ප්‍ර: වෛද්‍ය සේකර ද වෛද්‍ය රත්නද?

පි: වෛද්‍ය සේකර අධිකරණ මානසික වෛද්‍ය මානසික ශල්‍ය වෛද්‍ය ඩොක්ටර් වෛද්‍ය සේකර හරි ජේ.මිල්ටන් පෙරේරා වගේ තමයි ඒ සර්ගේ හැඩරුව.

ප්‍ර: වෛද්‍ය රත්න නෙමේද අපේ හාමුදුරුවනේ?

පි: නෑ නෑ වෛද්‍ය සේකර පිස්සන් වාට්ටුව.

නැවත ප්‍රතිඥා දෙයි

ප්‍ර: ස්වාමීන් වහන්ස ඔබවහන්සේව යම් අවස්ථාවකදි මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කට උත්තරයක් ඒ කියන්නේ CID එකට කට උත්තරයක් දුන්නාද?

පි: ඔව්.

ප්‍ර: ඒ කොයි කාලේද?

පි: මන් ඒක තමයි අවසානයට

ප්‍ර: ඇයි අපරාධ දේපාර්තමේන්තුවට කටඋත්තරයක් දෙන්න යන්න හේතුව වුනේ?

පි: මට දෙරනින් සංවිධානාත්මක අපරාධ පරීක්ෂණ විමර්ශණ අංශයේ වෙලගෙදර මහත්තයාව දෙරණින් තමයි සම්බන්ධ කරලා දෙන්නේ මන් වෙලාස්ට් එකට තමයි එන්නේ.පලාත උඹව කියන්නද

ප්‍ර: ඒවා ඕනි නැහැ අපේ හාමුදුරුවනේ එතනට යන්න ඔනි ඒවා විතරක් කියන්නකෝ අපේ හාමුදුරුවනේ අනුරාධපුරයට ගියපුවා කිවාට කමක් නැහැ

පි: මන් ඉන් පසුව වෙලගෙදර සර්ව හම්බෙලා එතනින් පැය භාගයක් විතර විමර්ශනය කරනවා.එතකොට වෙලගෙදර සර්ටත් වඩා නිලධාරියෙක් මහත්තයෙක් එතන ඉන්නවා .උසස් නිලධාරි මහත්තයෙක් එයා එනකම් ඉදලා එයා සර්ට කෝල් කරලා කතා කරලා කිව්වා මේක සිරියස් මේක අපිට කරන්න බැහැ මේක ඉහල දාන්න ඕනි කියලා පැය භාගයක් විමර්ශනය කරලා පැයක් විතර විමර්ශණය කරනවා ඉන්පසුව ඒ සර්ට කියනවා එහෙනම් මේක ඩි.අයි.ජී මහත්තයාට දාන්න කියලා ඊට පස්සේ ඩි.අයි.ජී මහත්තයා ගාව මහත මහත්තයෙක් ඉන්නවා පොලිස් .

ප්‍ර: නම දන්නවාද දන්නැහැ?

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඒ මහත්තයාගේ නම එහෙම ඇහුවේ නැහැ එයා ගිහිල්ලා පැය භාගයක් ඇහුවාම කිව්වා මේක හරි යන්නේ නැහැ මේක දාන්න ඕනී කියලා මේ නියෝජ්‍ය පොලිස්පතිතුමාටද කාටද දාන්න ඕනි කියලා.

ප්‍ර: ඩි.අයි.ජී කියන්නේ අපේ හාමුදුරුවනේ නියෝජ්‍ය පොලිස්පති තමයි ඒ කියන්නේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිටද නැත්නම් පොලිස්පතිට ද?

පි: පොලිස්පති තුමාට දාන්න ඕනි කියලා ඊට පස්සේ එතනින් කෝල ගත්තාම ඒ සර් නැහ ඊට පස්සේ එයා කියනවා ඕ.අයි.සි මාරසිංහ මහත්තයා ගාවට අරන් ගිහිල්ලා CID ඒකේ මෙයාව විමර්ශනය කරන්න කියලා එතකොට ඒ දවස් ටික සම්පුර්ණම CID එකෙන් නම් ගොඩාක්ම අපහාස විදියට තමයි ස්වාමීන් වහන්ස කෙනෙකුට නෙමෙයි මේ අර අන්තිම හිර කාරයෙකුට වගේ තමයි සැලකුවේ .

ප්‍ර: ඒ කියන්නේ ඔබ වහන්සේ අවසනයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමක් සිදු කලා. එත කොට එහිදි ඔබ වහන්සේගෙන් විමර්ශනය කෙරුවේ මාරසිංහ කියලා මහත්තයෙක්?

පි: මහත්තයා හිටියා ටයිපින්.

ප්‍ර: මොන තනතුරද අපේ හාමුදුරුවනේ?

පි: එයා ඕ.අයි.සි මහත්තයෙක්.

ප්‍ර: පොලිස් පරීක්ෂවරයෙක්?

පි: පොලිස් පරීක්ෂක වරයෙක් එතන පළවෙනි දවසේ .

ප්‍ර: ඔබ වහන්සේට මතක ද ඒ කවදා වගේද කියලා අපේ හාමුදුරුවනේ අඩු ගානේ කාල පරිච්ඡේදයවත්?

පි: කාල පරිච්ඡේදයේ හැබැයි දින නම් මතක නැහැ.

ප්‍ර: නමුත් ඔබ වහන්සේගේ ප්‍රකාශය ලිව්වා දවස් කියක් විතර ප්‍රකාශය ලිව්වාද?

පි: පළවෙනි දවසේ වරුවයි දෙවනි දවසේ තුන්වෙනි දවසේ දවස් දෙකක් තුනක් වගේ තමයි.දවස් දෙකයි.

ප්‍ර: ඔබ වහන්සේට මතක ද අපි දින වකවානු මතක නැති වුනාට දැන් අපිට ස්වාමීන් වහන්ස වෙසක් තියෙනවා පොසොන් තියෙනවා එතකොට වස් සමාදන් වෙනවා පෙරවස් තියෙනවා පසු වස් තියෙනවා දැන් ඕවා බැලුවාම කොයිකාලේ වගේද?

පි: අගෝස්තුවේ වගේ

ප්‍ර: අගෝස්තුවේ වගේ?

පි: ඔව්.

ප්‍ර: එහෙමයි.

පි: අගෝස්තු ,සැප්තැම්බර් වගේ තමයි ඔක්තෝම්බර් .

ප්‍ර: පත්තරේට දුන්නේ බිනර පෝයටනේ අපේ හාමුදුරුවනේ?

පි: ඔව්.

ප්‍ර: මේකත් දුන්නේ බිනර පෝයටද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව් මන් එහේ ඉන්න දවස් ටිකටනේ ඒ කිට්ටුවමනේ.

ප්‍ර: ඒ කියන්නේ සැප්තැම්බර් මාසේ?

පි: එහෙන් එනකොට තමයි ඒ වස් කිට්ටුවම තමයි මේ ටික ඔක්කෝම එකට සිද්ධ වුනේ.

ප්‍ර: සැප්තැම්බර් ,ඔක්තෝම්බර් මාසවල වගේ ඔබ වහන්සේට මතක තියෙන්නේ?

පි: ඔව් ඔය දිනය ඕන්නම් ගන්න පුළුවන් වෙළගෙදර මහත්තයාට කතා කරාම ගන්න පුළුවන් චුට්ටක් ලියපු එකක් තියෙනවා කියලා. මේසේ උඩ එදාත් පෙන්නුවා ඔබ වහනසේ දීපු එකක් ඒවා ටික මෙහෙම තියෙනවා කියලා ඊට පස්සේ එතන පළවෙනි දවසේ විමර්ශනය කරලා මාව එක්ක යනවා දවස් දෙකයි එතන දින්නේෂ් මහත්තයා එක්ක හෝටලය කරන්නේ ඒ පිටමනේ දින්නේෂ් මහත්තයානේ මාව එක්කගෙන එන්නේ ඊට පස්සේනේ මාරසිංහ මහත්තයාගාවට එන්නේ එත කොට ඒ ගොල්ලෝ ගාව දවස් දෙකයි.

ප්‍ර: CID එකේ දවස් දෙකයි?

පි: ඒ දවස් දෙකේ මාව ප්‍රවාහනය ඔක්කෝම කලේ වෙලගෙදර මහත්තයා එයා තමයි නවාතැන් පහසුකම් ඔක්කෝම සැපයුවේ මුදලුත් අතට දීලා හාමුදුරුවනේ මේක වියදමට තියා ගන්න කියලා මුදලුත් අතට දුන්නා ඒ මහත්තයා මම ඉල්ලුවෙත් නැහැ මම නෑ කිව්වෙත් නැහැ. මුකුත් කිව්වේ නැහැ. ඒ ගොල්ලෝත් සේවය කරන්නේ පඩියටනේ ඊට පස්සේ ඔබවහනසේ උතුම් දෙයක් කරලා තියෙන්නේ කියලා මේ සල්ලි තියා ගන්න කියලා මට සල්ලි වගයකුත් දුන්නා ඊට පස්සේ ඉත්තෑපානේ නායක හාමුදුරුවන්ගේ පන්සලට එයා කතා කරලා අපේ ස්වාමීන් වහන්ස කෙනෙක් ඉන්නවා නවාතැන් දෙන්න කියලා එහේ නවාතැන් දීලා ඒ රාජකාරිත් කලා. කරලා අවසානයට .

ප්‍ර: ඉත්තෑපානේ ධම්මාලංකාර හාමුදුරුවෝද?

පි: ඔව් ඉස්කෝලේ හාමුදුරුවෝ එහෙම ඉන්නේ එහේ ඉස්කෝලේ හාමුදුරුවන්ගේ කාමරයේ තමයි හිටියේ කාමර කඩලා අලුතෙන් හදනවා ඉස්කෝල හාමුදුරුවෝ බිම සැපතිලා තමයි දෙවනි හාමුදුරුවෝ මට ඇඳ දුන්නේ මාරසිංහ මහත්තයාගේ තියෙන නැහැ වෙලගෙදර මහත්තයාගේ තියෙන මේවා එකට ආගන්තුක සත්කාර දන්නවා හොඳ ස්වාමීන් වහනසේලා එහේ ඉන්නේ ඉන් පස්සේ අන්තිම දවසේ මන් එනවා .

ප්‍ර: ඒහෙයි?

පි: අරගොල්ලො තමයි කැබ් එකේ ගිහිල්ලා සර්ම තමයි ප්‍රවානය කරන්නේ උදේ දානේ ගන්න අපිට තැනක් හම්බුනේ නැහැ ඊට පස්සේ එහේ ගිහිල්ලා අහනවා උදේ දානේ ගත්තා ද කියලා මම කිව්වා දානේ ගන්න හම්බුනේ නැහැ අපිට තැනක් මේ වාහන බ්ලොක් වෙන හින්දා ටග් ගාලා ආවා මහරගම වාහන බ්ලොක් වෙනවානේ ඊට පසසේ මට 11

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

තමයි මට දානේ දෙන්නේ උදේ දානේ දෙන්නේ බටර් බනිස් ගෙඩියක් ගෙනත්ලා බීම බෝතලෙත් එක්ක ගෙනත් දෙනවා. බටර් බනිස් ගෙඩිය ඔතලත් නැහැ නිකම් පොලිතින් එකේ ගෙනත්ලා මේස උඩ තියෙලා බීම බෝතලයක් ගෙනත්ලා දෙනවා කඩලත් නැහැ. කඩන්න එකකුත් නැහැ මේ දතේ කැල්ල කඩලා ගියා කවුරුත් නැහැ වට පිට ගිලන් පස එක කටේ දාලා ඔහොම අල්ලන කොට තමයි දතේ කැල්ලක් කඩලා ගියා බීම බෝතලය කඩලා ඒ තරමට තිබයි. රෑ දානේ වලදන්නේ නැහැ අර පන්සලේ රෑට මුකුත් නැහැ.මොකද මන් ඒ දවස්වල බෙත් වගයක් පාවිච්චි කෙරුවා තුනටිය අමාරුවකට බෙත් පෙති වගයකුත් පාවිච්චි කෙරනවා ඉතින් දානේ චුට්ටක් අනිවාර්යෙන් ගන්න ඕනි දවලුත් හරියට දානයක් අපිට තිබුන් නැහැ.ඉන් පසුව මේ ගොල්ලෝ ඔක්කෝම අරගන්න කොට 4 ට විතර පුත්තලමෙන් එනවා කෝල් එකක් අර පුත්තලම විමර්ශනය කලේ.

ප්‍ර: කොහාටද එන්නේ ඔබ වහන්සේගේ දුරකථනය?

පි: අර පුත්තලමේ විමර්ශනය කලේ මගේ පෝන් එකට.

ප්‍ර: ඔබ වහන්සේට දුරකථන ඇමතුවක් එනවා පුත්තලම විමර්ශන ඒකකයෙන්?

පි: ඔව් මම අහනවා මට ඔයට ඉස්සෙල්ලාත් කතා කරලා කියනවා මම අරහේ බස් එනකල් හිටිය පන්සලේ ඉන්නැද්දි .

ප්‍ර: එහෙයි?

පි: එහේ ඉන්නැද්දි ඊට පස්සේ ඒ ගොල්ලෝ මට එන්න කියනවා මට 8 ට එන්න කිව්වේ මන් කිව්වා 8 ට එන්න බැහැ. මම මෙච්චර දුර ඉන්නේ ඇවිල්ලා ඉන්න කිව්වා කොළඹ කියලා මන් කිව්වා කොළඹ හාමුදුරුවන්ට ඉන්න පන්සලක් නැහැ හාමුදුරුවෝ ස්ටේෂන් එකේ ඉන්නද,පේමන්ට් එකේ ඉන්නද ඔය ගොල්ලේ කියන විදියට එන්න බැහැ පළවෙනි පාර මෙහෙම වුනා කිව්වා. මම පාවලා දෙන්න ගියා කියලා කිව්වේ නැහැ මට පන්සලත් නැති වුනා කිව්වා මම එන්නේ නැහැ කිව්වා. ඊට පස්සේ එදාත් ගත්තා ගත්තාම මන් කිව්වා මහත්තයා කවුද කියලා ඊට පස්සේ එයා එයාට ටිකක් හොදින් කතා කළා කතා කරලා මන් කිව්වා මාත් ඉන්නේ ආරක්ෂක අංශ ස්ථානය තමා මන් ඊට පස්සේ එයා කිව්වා බැජී කියලා කතා කෙරුවා එයාගේ විස්තර අහලා ආ බැජී වරෙන් වරෙන් මාත් ඉන්නේ මෙහෙ තමයි මා ගාව ඉන්නේ අහවල් තැනට එන්න කියලා.

ප්‍ර: කවුද බැජී කියන්නේ?

පි: ඕ.අයි.සි මාරසිංහ මහත්තයා 4 වෙනි තට්ටුවේ කිව්වා ඉන්නේ 4 වෙනි තට්ටුවේ තමයි මේ විමර්ශන කලේ එයා විනාඩි 10 ක් වගේ ඇතුලත ආවා.එයත් එතන ඉදලම තමයි කෝල් එක අරන් තියෙන්නේ. ඊට පස්සේ මන් කිව්වා පළවෙනි පාර පන්සල නැති වුනා. මේ පාර

හාමුදුරුවෝ රිමන්ඩ් කරන්න ද දන්නැහැ ආවේ කියලා නෑ නෑ ඔබ වහන්සේගේ විමර්ශන සාර්ථකයි තෑගි බෝග දෙන්න වටිනවා ඔබ වහන්සේට එහෙමයි කිව්වේ එතන මැලේසියාවෙන් ආයුධ ගෙනාපු තැනට සාර්ථකයි කියන එක ඒ මහත්තයා කිව්වේ මං කිව්වේ නෑ. බුද්ධි තොරතුරු අනුව මැලේසියාවෙන් ලංකාවට ආයුධ ඇවිල්ලා තියෙනවා.

ප්‍ර: ඔබ වහන්සේට අර පුත්තලමෙන් ආපු මහත්තයා කියනවා?

පි: මහත්තයා කිව්වේ

ප්‍ර: ඒ මහත්තයාගේ නම මොකක්ද ස්වාමීන් වහන්ස?

පි: නම ඇහුවේ නැහැ ඒක ඕ.අයි.සි මාරසිංහ මහත්තයාගේ හිතවතෙක් ඒ නම් මුකුත් මට අහන්න අවශ්‍යයක් වුනේ නැහැ. ඊට පස්සේ ඕ.අයි.සි මාරසිංහ මහත්තයාත් එතැන ඉන්නවානේ සාක්ෂියකට ඉන් පස්සේ මන් අහන්නත් ඇති මට ඔක්කෝම මතක තියාගන්න අපහසුයි ඊට පස්සේ එතන ඉන්නවා මැඩම් කෙනෙක් කෙට්ටු කොන්ඩේ කපලාද කොහේද හොඳ තරු ගහපු මැඩම් කෙනෙක් මම හිත්නනේ එයා ලේකම්තුමිය වෙන්න ඕනි CID එකේ එයා ටේබල් එකේ පැය භාගයක් විතර

ප්‍ර: එතකොට ස්වාමීන් වහන්ස එයා තරු ඇදලා හිටියාද?

පි: තරු ඇදලාද ඒක .

ප්‍ර: යුනිපෝම් එක ඇදලා හිටියාද CID එකේ නිලධාරින්?

පි: නැහැ.නැහැ තරු නැහැ එයා නිකම් කලිසමක් වගේ තමා ඇදන් එහෙම මොකක් හරි තමා නැහැ තරු තිබුන් නැහැ එයාට ඔක්කෝම මැඩම් මැඩම් කියලා තමයි කතා කලේ.ඕ.අයි.සි මහත්තයත් මැඩම් කියලා කතා කලේ.එයා ටිකක් උසස් නිලධාරියෙක් මම එක්කෙනෙක්ගෙන් ඇහුවාම මම එතන ටයිප් කරන කෙනා ගාව හිටියා මාව ටොයිලට් අරන් යන්න එහේ මෙහේ එක්කන් යන්න එක්කෙනෙක් හිටියා එයා කිව්වා එයා තමයි ලේකම් තුමිය කියලා CID එකේ ඊට පස්සේ එයා ඉංග්‍රිසියෙන් කියලා ගියා කොහොම හරි ස්වාමීන් වහන්සේ 100% CID එක නෙමේ කියලා කියලා ගියා. ඒ ගොල්ලන්ගෙන් වැඩක් නැහැ කියලා එහෙත්ම කියලා ගියා අතනත් කිව්වා මේක යන්නේ නැහැනේ ඉහලට බැලුවා බැලුවා ඊට පස්සේ මම හැදුවා විඩියෝ එකක් තිරවට කරලා.

ප්‍ර: ස්වාමීන් වහන්ස දැන් CID එක අපි ඉවර කරලා ඉමුකෝ?

පි: ඒක එතැනින් විමර්ශනය කරලා.

ප්‍ර: දැන් ඔබ වහන්සේගේ ප්‍රකාශය වාර්තා කරලා අවසන් කෙරුවාද?

පි: අවසන් කෙරුවා 5.30 ට ඊට පස්සේ මන් කිව්වා මට කොහොමහරි පිටකොටුවට හරි කොහාට හරි යන්න ඔනි මේ ටයිම් එකට කොළඹ 5.00 ,5.30 ට වැඩ ඇරෙන ටයිම් එකට ඒවා ඉතින් අපි දන්නේ නැහැ හාමුදුරුවනේ හාමුදුරුවන්ගේ ආරක්ෂාව හාමුදුරුවෝ බලාගන්න.එහෙමයි කිව්වේ.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: කවුද කිව්වේ?

පි: එතන හිටපු නිලධාරියෙක් කිව්වේ

ප්‍ර: නම දන්නවාද?

පි: නම දන්නේ නැහැ.හාමුදුරුවන්ගේ ආරක්ෂාව හාමුදුරුවෝ බලාගන්න මෙතන ඉවර වුනාට පස්සේ එළියට බැහැලා යන්න මේකේ ඉන්න බැහැනේ හාමුදුරුවන්ට කියලා මට රෙස්පට් එක දැම්මා.කමක් නැහැ දැන් ඉතින් නහයට උඩින් ගිය වතුර කොහෙන් ගියත් එකයි උන්නත් එකයි මලත් එකයි කියලා ලොකු බෑග් එක අරහෙන් අවසන් කරලානේ දැන් එන්නේ ඒකත් කරේ එල්ලගන ආවා එළියේ වැස්සක් තිබුනා එකේ චීවර මගේ පොත් හරි බරයි පොත් එහෙම ධර්ම අවබෝධ කරගන්න පොත් ත්‍රිපිටකය සම්බන්ධ පොත් ගොඩක් පොත් එකේ තිබුනා.

ප්‍ර: දැන් අපේ හාමුදුරුවනේ CID එක ඇතුලට යනකොට එහෙම බෑග් එහෙම ගෙනියන්න දෙන්නේ නැහැනේ බෑග් ටික එළියේ තියලානේ යන්න ඕනේ කවුන්ටරයේ

පි: ඔව් බෑග් එක එළියේ තියෙලා තමයි ගියේ.එන කොට මන් නමලා චීවරත් තෙමිලා අදින්න බැහැ. තැලුනොත් තෙමලා හරි ආයේ දාන්න ඕනි මේවා මදින්නේ නැහැ. ඒ චීවර ඔක්කෝම ඇදලා උන්ඩි කරලා උන්ඩි කරලා ඇතුලේ දාලා ඒවා වනසලා තිබුනේ.

ප්‍ර: ඔබ වහන්සේ එහෙම නෙමේ ඒක අස් කරලා තිබුනේ බෑක් එක?

පි: මං බෑග් එක ලස්සනට චීවර නමලා මේවා ඔතනවා චීවර නමලා අදින කඩේ අංශ කඩේ තියලා ඔතලා රබර් බෑන්ඩ් දැම්මාම තැලෙන්නේ නැහැ එහෙම තමයි මේ චීවර සකසන්නේ අපි ඒවා ඔක්කෝම ගලවලා මේවා කරලා දිග ඇරලා ඔක්කෝම ගසලා දිග ඇරලා නිකම් අර රෙදි පෙට්ටියට පොඩි ළමයින් ඔබනවා වගේ රෙදි ඔබලා විනාශ කරලා තිබුනේ ඒකේ.එතකොට පොත් ඇදලා පොත් වෙනම අරවා මේවා ගොඩාක් විනාශ කරලා ඒක තිබුනේ. පෝන් එක ගෙනියන්න දෙන්න බැහැ.මන් කිව්වා පෝන් එකේ විශේෂ දේවල් තියෙනවා මට ඒක ගෙනියන්න ඕනි මන් කිව්වා මට පෝන් එක අවශ්‍යයි පෝන් එකේ බැයිනම් එළියේ විමර්ශනය කරන්න කියලා කිව්වා ඇතුලට යන්න පෝන් එක කතා කරලා මේවා කරලා මාව අරන් යන්න ආව නිලධාරි මහත්තයා පෝන් එක ගන්න අවසර ගත්තා ඊට පස්සේ එළියට ඇවිල්ලා මන් දැන් බසුත් නැහැ කරේ තියාගෙන යන්නත් බැහැ. කකුල උඩ බෑග් එක තියගෙන මඩේ ඉන්නත් බැහැ කකුලු උඩ තියාගෙන මුස්ලිම් මනුශ්‍යයෙක් ත්‍රිවිල් එකේ එහා පැත්තේ පාක් එකේ හරවගෙන කොහාටද සාදු යන්නේ කියලා ඇහුව්වා මම කිව්වා පිටකොටුවට කියලා ඕන දෙයක් වෙච්ච දෙන් කියලා ගියා.ඊට පස්සේ 150 වෙන්න ඇති ගන්නේ 250 හයර් එකක් ගත්තා. මම ඊට පස්සේ අනුරාධපුරය බස්එකක නැගලා අනුරාධ පුරේ වැඩියා. ඊට පස්සේ මේ කිසි දෙයක් වුන් නැති පාර තමයි

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කදිනල් තුමා හම්බිලා නැවත ආරක්ෂක ලේකම් තුමා ඔය ටික මේවා කරලා .

ප්‍ර: එත කොට ඔබ වහන්සේ විඩියෝ එකක් හදපු එක?

පි: විඩියෝ හදපු එක මම දැම්මා ඊට පස්සේ තමයි

ප්‍ර: මොකට ද ඒක හැදුවේ?

පි: මම ඒක හැදුවේ දැන් කිසිම තැනකින් මේක යන්නේ නැහැනේ ඉහළට විමර්ශනයක් වෙන්නේ නැහැනේ ටි.වි.එකක හරි පෙන්වන්න එපැ මෙහෙම ඇල්ලුවා මෙහෙම ඇල්ලුවා කියලා අපිට මොනවා උනත් මම විඩියෝ එක හැදුවා මන් කිව්වා රටේ විශාල මනුශ්‍ය ඝාතනයක් මේ අන්තවාදි සැලැසුම් කරලා තියෙනවා මේක රජයේ යූ.එන්. පි රජයේ මේ සියළුම නිලධාරින්ට CID එකට හැමතැනටම දුන්නා මේක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මුන්ට ඕනි අපි නැති වුනාට කමක් නැහැ මුන්ට ඡන්දෙමයි අවශ්‍ය කිසිකෙනෙක් ඡන්දේ දාන්න එපා ඡන්දේ ප්‍රතික්ෂේප කරන්න ඕනි ලංකාව පුරාම වාහනවල නිවෙස්වල කළු කොඩි දාන්න ඕනි ඡන්දේ දාන්න ඡන්දේ දාන්න එපා මීටින්වලට යන්න එපා මම මාධ්‍යට කතා කරලා ඡන්දේ දාන්න කියනතුරු යන්න එපා කියලා මම විඩියෝ එකක් හදලා ගෝඨාභය මහත්තයාගේ ප්‍රධාන ආරක්ෂක සහ ගාල්ල දිස්ත්‍රික් සංවිධායක මොහාන් සිල්වා මහත්තයාට IMO වලින් මේවා වලින් දැම්මා විඩියෝ තුනකට හැදුවේ විඩියෝ දෙකකට හැදුවා හදලා එයාට දැම්මා. මම දැන් ෆේස්බුක් දාලා තියෙන්නේ කියලා හාමුදුරුවනේ ටක් ගාලා ඩිලිට් කරන්න කියලා මොනවාද ඔබ වහන්සේ හිරේ දායි කියලා මන් කිව්වා මරණයට කැපවෙලා ඉන්න හාමුදුරුවන්ගේ හිරේ ගියාම මොකද කියලා ඉවර වෙලා මම කිව්වා මරණයට කැපවෙලා ඉන්නේ දැන් හිරේ ගියාට කමක් නැහැ මන් මේක නතර කරනවා ඡන්දේ කිව්වා.

ප්‍ර: ඔබ වහන්සේ ගාව ඒ විඩියෝ එක් තියෙනවාද?

පි: විඩියෝ එක ෆේස් බුක් එකේ තිබිලා මේකේ නැහැ කැපුවා. බ්ලොක් එකක් තිබිලා මන් කැපුවා.මගේ යාළුවෙක් ගාව මේක තියලා තියෙනවා ඒක පෝන් එකෙන් එව්වා හැකි.ඉන් පස්සේ මන් කිව්වා එහෙනම් අහන්න CID එකෙන් දුන්න මේවා ඒකට එතන සාර්ථකත්වයක් තිබුනා අසාර්ථක වුනා නම් මන් බොරුවක් කරේ නැහැ. ඇත්ත කිව්වේ ඇත්තට ආයුෂ වැඩියි බොරුවට ආයුෂ නැහැ කියලා මම දන්නවා ඊට පස්සේ මන් කිව්වා සත්‍ය මම සත්‍ය සම්පූර්ණ සත්‍ය කියලා තියෙන්නේ එහෙනම් මොකද කියලා අහන්න හාමුදුරුවෝ මේ ප්‍රසිද්ධ වෙන්න බයිලා ගහනවා කියලා කිව්වා පැය භාගේකට පස්සේ අර මහත්තයා

ප්‍ර: කව්ද මොහාන් සිල්වා මහත්තයා?

පි: මොහාන් සිල්වා මහත්තයා මන් කිව්වා හරි මත්තයා ඒක තමයි මට දැනගන්න ඕන වෙලා තිබුනේ මම ෆේස්බුක් එකේ දලා ගොඩක් දුර

Project Sakvithi Copy
FAIR COMMENT BY JEZEEM

ගියේ නැහැ මන් ශෙයා කරේ නැහැ මගේ ෆේස් බුක් එකේ තිබ්බා මම ඒක ශේයා කලේ නැහැ මම ඊට පස්සේ මන් කාදිනල් තුමාට මන් සම්පූර්ණ විස්තර කිව්වා ඊට පස්සේ තමයි CID ඔක්කෝම එකේ ඇතුලේ ඔක්කෝම මෙව්වා කරලා ඔක්කෝම හැදිගාලාම මේක හෙව්වා හොද්ද හැදි ගාලා කෑලි හොයනවා වගේ මන් හෙව්වා ඇතුල මගේ දක්ෂ විදියට තමයි ඒක මට ගොඩාක් උදව් තිබුනා අපේ දිනේෂ් මහත්තයාගෙන් උදව් තිබුනා වෙලගෙදර මහත්තයා උදව් කරා.

ප්‍ර: වෙන කාගෙන්ද?

පි: වෙලගෙදර මහත්තයා මට උදව් කලා. වචන දෙකයි ගත්තේ දිනේෂ් මහත්තයා කිව්වා දත් මිටි කැවෙන තැන් තියෙනවා හාමුදුරුවනේ මට රස්සාවත් එපා වෙලා තියෙන්නේ කිව්වා වෙලගෙදර මහත්තයා හමුදුරුවනේ අපි යුනිෆෝම් එක රැක ගන්න එපැ අවසානේ පැන්ෂන් එක හරි ගන්න කරන්න දෙයක් නැහැ කියන එක එතනින් ප්‍රකාශ වුනා.එකෙන් තියෙන්නේ මාගේ දැනුමේ හැටියට මැදපෙල පිතිකරුවෝ හොදයි ඉහළ ඉන්න පිතිතකරුවෝ තනිකරම හොරු.

ප්‍ර: ඔබ වහන්සේ ඒ කාලයේ ක්‍රිකට් ගහලා තියෙනවා?

පි: ඔව් මැද පෙල පිතිකරුවෝ හොදයි මේකේ ඉහල පෙල සම්පූර්ණයෙන් ඉන්නේ රට නැති කරන මිනිස්සු එකට මහින්ද මහත්තයාත් වගකියන්න ඕනි මොකද මහින්ද මහත්තයා දුන්න රාජිත මහත්තයාට යි චම්පික රණවක මහත්තයාටයි එයාගේ ආණ්ඩුව කාලේ බුද්ධි තොරතුරු ඒ ගොල්ලන්ට ලබාගන්න හොඳම දෙන්නෙකුට දීලා තියෙන්නේ ඒ ගොල්ලෝ අරගෙන රාජිත මහත්තයා දුන්නා අන්තවාදින්ට මේක මන් දැනුවත්ව අපේ තබිලික් එකට දුන්නා රාජිත මහත්තයා .

ප්‍ර: ඔබ වහන්සේ ඒක දන්නවා ඒක?

පි: දන්නවා ඒක චම්පික රණවක මහත්තයා දුන්නා ගලබොඩඅත්තේ ඥානසාර හාමුදුරුවන්ටයි මේ රතන හාමුදුරුවන්ටයි .

ප්‍ර: ඒ හාමුදුරුවරුන්ට දුන්නාම ප්‍රශ්නේ මොකක්ද?

පි: ඒ ගොල්ලෝ ඒක තමයි මේක දාගෙන කෑගහන්නේ මං ඒකයි ඉස්සෙල්ලාම පියතුමාටත් කිව්වේ ගලබොඩඅත්තේ ඥානසාර හාමුදුරුවන්ගේ අනිවාර්යෙන් කටවහගෙන ඉන්න කියන්න ඕනි. චන්දරතන හාමුදුරුවෝ කරන දේ හරි මුලින් එයාත් ගියා එයා දැන් සාමාන්‍යයෙන් රටට අවශ්‍ය කරන දෙයක් එයා කරනවා වැරදි හොයන එක යුතුකමක් එයා තේරුම් ගත්තා එයා හැදුනා අරයා අමුතුම දෙයක් තමා මගෙන් පුළුවන් තරම් උත්සහ කලානේ ගන්න මගේ විස්තර චන්ද්‍රරතන හාමුදුරුවොයි ගලබොඩඅත්තේ ඥානසාර හාමුදුරුවන්ගේ ලේකම් හාමුදුරුවෝ මේ විස්තර ගන්නම දැගලුවා මට ඒ ගැනි ඉතින් අපි උඩබලාගෙන කෙල ගැහුවා වගේ මහා සංඝරතනයට අපහාස කරනවා කියන්නේ.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: නමුත් ඔබ වහන්සේ ඒවා දුන්නේ නැහැ?

පි: දුන්නේ නැහැ.

ප්‍ර: ඒ හේතුව සද්භාවයෙන් නෙවෙයි කියලා.

පි: නොයෙක් ක්‍රම මං ඒ ගොල්ලන්ගේ චරිතය මන් දැනගෙන තමයි එතෙන්ට ගියේ ආරක්ෂක අමාත්‍යාංශයට යන්න ඕනි හින්දා. ඉන්පසුව ඉතින් හෙව්වා මම ටග් ගාලා කොටුවට ගිහිල්ලා ගත්තා මන් කිව්වා ආරක්ෂක අංශය මට දැන් චෙක් කරන්න ඕනි මේ කට්ටියන්ගේ පෝටෝ ටික දෙන්න කියලා.

ප්‍ර: මොන කට්ටියගේද?

පි: ආරක්ෂක අංශයේ ඉන්න මුස්ලිම් අයගේ එතකොට ටග් ගාලා මට පොටෝ ටිකක් එව්වා පොටෝ ගොඩාක් එව්වා ඒකෙන් අවශ්‍ය කරන පොටෝ එක තමයි එව්වේ.

ප්‍ර: කවුද එව්වේ ස්වාමීන් වහන්ස?

පි: දෙරණ උකුස්සා එකේ ඒ ගොල්ලෝ ගත්තා පොටෝ ටික ඒ ගොල්ලෝ ගාව ඕන තරම් පොටෝ තියෙනවා ඒ ගොල්ලෝ ටග් ගාලා පොටෝ ඉන්ටර්නෙට් එකෙන් පොටෝ අරගෙන දෙරෙනේ තියෙනවානේ පොටෝ අරගෙන මෙවා කරලා අර සුසයිඩ් වෙලා මැරුනේ එයාගේ බුද්ධි අංශය මුතාලිබ් එයාගේ පොටෝ එක පවා එව්වා මට ඒ ගොල්ලෝ ඒ ඔක්කෝම හරි ඒ පෝටෝ ඔක්කෝම එව්වා හොයලා බැලුවාම මේ පුද්ගලයා ඉතින් මසුරා වලට ලතිෆ් මහත්තයා ඉදලා තියෙනවා 4,5 පාර දැකලා තියෙනවා.ගමවල් ගෙවල් කොහේද දන්නේ නැහැ මන් කිව්වේ එතන මසුරා කරපු ඒකේ ඒ.සි පල්ලියට යන්නේ ලොක්කෝ ටික ලොක්කන්ට වෙනම පල්ලි තිබුනා ඒකේ ලංකාවේ ඒ.සි පල්ලියක් ඉස්සෙල්ලාම හැදුවේ මල්වානේ .

ප්‍ර: ඒ ගොල්ලෝ යන්නේ ඒ.සි පල්ලියට?

පි: ඒ.සි පල්ලියට ඒ.සි පල්ලිය කාපට් දාලා අනෙක් ඒවායේ මාබල් එකේ වදින්න ඕනි. මාබල් එකේ මේකේ අර බම්වෙනන කාපට් දාල මේක හරි සුපිරි පල්ලිය පිටරට නායකයෝ ඔක්කෝම ආවාම ඕකේ තමයි ප්‍රේ කරන්නේ පල්ලියේ.

ප්‍ර: මල්වානේ පල්ලියේ?

පි: ඔව් මල්වානේ පල්ලියේ.

ප්‍ර: ඒකේ නම් මොකක්ද අපේ හාමුදුරුවනේ?

පි: ඒක කාරාඹුගස් හන්දියේ තියෙන තවුපික් පල්ලිය කියලා කිව්වාම කවුරුත් දන්නවා මෙහෙම කරාඹු ගස් හන්දියෙන් ගිහින් මෙහෙම වන්ගුව **මෙහෙම පැරණුත් එක්කම** උඩහිටිවලට දෙකටනම නැත ඒ කියන්නේ කොළඹ ඉදලා යනකොට උඩහිටිවලට එතනම තියෙන්නේ පල්ලිය

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ස්වාමීන් වහන්ස ඔබවහන්සේ දැනට මෙතෙක් වෙලා මේ ගරු කොමිෂන් සභාවට පසු ගිය අවස්ථාවේ වගේම දැනුත් දුන්න සාක්ෂිවලට අමතරව වෙන මොනවාද ඔබ වහන්සේට ගරු කොමිෂන් සභාවට දැනුම් දෙන්න තියෙන කරුණු?

පි: ඒ සම්බන්ධවද පුද්ගලිකවද ? ඒ සම්බන්ධව මම දැන් ගොඩාක් සාමාන්‍යයෙන් මේ අතරතුර මට මතකයට එන දේවල් තියෙනවා පරණ සිද්ධි ගියපු නැති නිසා පාඩම් කරපු නැති නිසා නිතරම කියෙව්ව නැති නිසා මීට වඩා මේකේ සිද්ධි දන්න මෙච්චර කල් කතා කරලා නවුශාජ් ගැන කිව්වේ නැහැනේ.

ප්‍ර: නැහැ?

උ එයා නාවල. එයා නිලා ෆවුන්ඩේෂන් මුල් නිර්මාතෘ එයා. එයා දැන් ඒකේ නායකත්වය වෙන කෙනෙකුට දීලා නිලා ෆවුන්ඩේෂන් කියන්නේ ලෑලි මඩුවකින් පටන් අරගත්තු එක අද තට්ටු ගානක බිල්ඩිං එකකින් නිලා ෆවුන්ඩේෂන් ආයතනය අරන් යනවා ඉස්ලාම් ආයතනය. ඒක දැන් එයා දීලා එයා එතනින් එහාට ගිහිල්ලා තියෙන්නේ. කවදා හරි රටේ ප්‍රධාන නායකත්වය දරන කෙනා.

ප්‍ර: තව ඔබ වහන්සේ තව නමක් කිව්වා?

FAIR COMMENT BY JEZEEM

උ: අනෙක් නම CIS එකේ මට මුලින්ම එයාත් සෞදි විශාල ලෙස යන කෙනෙක්. මට මුලින්ම ඉස්ලාම් අධ්‍යාපනය ලබා දුන් සාෆි හුසේන්.

ප්‍ර: ඔබ වහන්සේ දන්නවද මේකත් මුස්ලිම් අය අතරේ තමයි ලංකාවේ වැඩිහරියක්ම තියෙන්නේ උන්ඩියල් ක්‍රමයට මුදල් යවනවා කියලා ක්‍රමයක් ලංකාවේ, ඒකත් මුස්ලිම් අය අතර තමයි ඒකත් ප්‍රචලිත වෙලා තියෙන්නේ, දැන් උන්ඩියල් ක්‍රමයට ලංකාවේ මුදල් එළියට යනවා වගේම එහෙම වෙනත් රටවල් වලින් බැංකු තුලින් නොවන ඒ උන්ඩියල් ක්‍රමයට වගේ මුදලුත් ලැබෙනවද? ඔබ වහන්සේ දන්නවද මේ උන්ඩියල් ක්‍රමය කියන එක ගැන?

උ: උන්ඩියල් ක්‍රමය ගැන අහලා තිබුණට ක්‍රමය දන්නේ නැහැ. මේ මැතිවරණයට පෙර, මේ ජනාධිපතිවරණයට පෙර මේක පිටරට සෞදි නැවක් ඇවිත් ඩොලර් ගෙනල්ලා තියෙනවා හෙලිකොප්ටර්වලින් තමයි ඩොලර් ඇදලා තියෙන්නේ යුධ හමුදා මුලස්ථානයට තමා මේ හෙලිකොප්ටර් බාලා තියෙන්නේ. ඒකට මුස්ලිම් ඇමතිවරු හිස්ඔුල්ලා ඔය සෙට් එකම මේකට සහභාගියි. මේකට දැන් විපක්ෂයේ, දැන් ඉන්න විපක්ෂයේ ගොඩක් නායකත්වය තියෙනවා ඩොලර් ඇවිල්ලා තියෙනවා ලංකාවට.

ප්‍ර: කොහේද හෙලිකොප්ටර් එක බාලා තියෙන්නේ හාමුදුරුවනේ?

උ: යුධ හමුදා මූලස්ථානයකට ඔය හරියකට තමයි හෙලිකොප්ටර් ඇවිල්ලා තියෙන්නේ, මේක විශේෂ බුද්ධිමය තොරතුරක් මේක.

ප්‍ර: කොයි කාලයේද කියලා කියන්න බැරිද ඔබ වහන්සේට?

උ: මේ දේශපාලන වාතාවරණය තිබිච්ච කාලේ මේ හෙලිකොප්ටයෙන් තමයි මේ ඩොලර් ගෙනල්ලා බාලා තියෙන්නේ.

ප්‍ර: කොයි රටකින් වගේ එහෙමත්.?

උ: සෞදියෙන් කියන එක තමයි මේක ගේන්නේ.

ප්‍ර: ඒක තමයි ඔබ වහන්සේට පුළුවන්ද ඒකට මේක සනාථ කරන්න මොනවා හරි සාක්ෂි තියෙනවා නම් ඉදිරිපත් කරන්න, රහසිගතව වුනත් කමක් නැහැ, දැන් මේ අවස්ථාවේ කියන්න බැරි නම්?

උ: මේ අවස්ථාවේ මට ගන්න බැහැ. මම වොයිස්කට් එකකින් මේක ගන්න පුළුවන් මට. ෆෝන් එකට රෙකෝඩින් එකක් මට සතියක් ඇතුලත ගන්න පුළුවන්.

ප්‍ර: එහෙම වුනොත් ඔබ වහන්සේ ඒක...

උ: ඒක මට පාවා දෙන්න දැන්ම බැහැ, මම මේ රාජකාරි ඉටු කරලා අර හොරාට ඉස්සෙල්ලා කෙහෙල් කැන පැන්නා වගේ වෙනවා දැන්ම කියන්න ගියොත්, ඒක හින්දා මම මේකේ ..

ප්‍ර: සතියක වගේ කාලයකින් ඔබ වහන්සේට දෙන්න පුළුවන් නම් ඉතින් ඒක ලොකු දෙයක්?

FAIR COMMENT
BY JEZEEM

උ: ඒක ගෙන්නගෙන තියෙන්නේ සජිත් මහත්තයාට කොටසක් ගිහිල්ලා තියෙනවා. මේක මෛත්‍රි මහත්තයටත් කොටසක් ගිහිල්ලා තියෙනවා. රනිල් මහත්තයටත් කොටසක් ගිහිල්ලා තියෙනවා. යුඑන්පී එකේ සාමාන්‍ය කොටසකට ගිහිල්ලා තියෙනවා. මේක විශේෂයෙන් ගෙන්නගෙන තියෙන්නේ මුස්ලිම් දේශපාලඥයින්ට සල්ලි අවශ්‍ය වෙනවා. සජිත් මහත්තයාගෙන් ශත පහක්වත් මේ දේශපාලනයට වියදම් වුනේ නැහැ. මුස්ලිම් අන්තවාදින්ගේ සල්ලි තමයි ඒ මාර්ගයෙන් මේගොල්ලෝ එක ගලෙන් කුරුල්ලෝ දෙන්නා මරන කට්ටිය මුස්ලිම් අන්තවාදීන්. අරගොල්ලන්ට දුන්නා අර විදියට මේගොල්ලොත් ගත්තා. මේගොල්ලන්ට සල්ලි ඒගන්න විදියක් නැතුව දැන් බ්ලොක් වෙලා තියෙනවා. සල්ලි ගන්න විදියක් නැතුව පොඩි මේවා තියෙනවා ආයතන වලින් ලංකාවට සල්ලි ඇතුල් කර ගන්න බැරි එකක් තියෙනවා. මේක රාජ්‍ය අංශය තමයි දන්නේ මොකක් හරි ප්‍රශ්නයක් ඇති කරලා තියෙනවානේ. ඇතුලට සල්ලි ගන්න බැරි වෙන්න මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ලංකාවට ඒගොල්ලන් විදේශිය සල්ලි ගන්න බැරි වෙන්න. මේක රටඉඳි ක්‍රමයටත් ඇවිල්ලා තියෙනවා. නෝම්බියට දෙන රටඉඳිවල රටඉඳි චෙක් කරන්නේ නැහැනේ. ඇතුලේ ඩොලර් සල්ලි එවලා තියෙනවා. දැන් හෙරොයින් වගේ නම් ඒවා වදිනවා. ඩොලර් වදින්නේ නැහැනේ මේකේ. ඒ වගේ අනික් එක තමයි ලංකාවේ නීතියක් සම්මත කරන්න ඕනේ නායකත්වයට කියලා ආධාර දෙනවා නම් මුස්ලිම් එවුන්ට විතරක් දෙන්න බැහැ. දෙනවා නම් නෝම්බියට හරි හජ්ජිවලට හරි සිංහල ඔක්කොමටත් දෙන්න ඕන. රටඉඳි හරි මොන දෙන කෙහෙල්මල හරි වහ හරි අපිටත් එක්ක දෙන්න ඕන කියලා නීතියක් සම්මත කරන්න ඕන.

ප්‍ර: මේ රටඉඳි ස්වාමීන් වහන්ස මම හිතන්නේ ඉස්ලාම් දේශපාලඥයින්ට මම හිතන්නේ කෙලින්ම ඒවා ලැබෙනවා, එහෙමද?

උ: ඔය රටඉඳි එකෙන් මොකද නෝම්බියට අනිවර්යයෙන්, රටඉඳි අනිවාර්ය කරලා නැහැ, නෝම්බියට සූකිරි අනිවාර්යය කරලා තියෙන්නේ. සූකිරි කාලා තමයි නෝම්බි අරින්න ඕනේ. මේගොල්ලෝ රටඉඳිවලින් පොඩි දෙයක් කරනවා. ඒක අපිටවත් හරියට දෙන්නේ නැහැ, මේ අතර සැක හිතෙනවා.

ප්‍ර කොහොමද ඒ පිළිබඳව ටිකක් වැඩියෙන් තොරතුරු හොයා ගන්නවා නම් අපිට ඔබ වහන්සේ දන්න යමක් තිබෙනවා නම් කියන්න බලන්න?

උ: මේක කස්ටම් එක ඇතුලේ සම්පූර්ණයෙන් දැන් මුස්ලිම් දැන් ගොඩක් ඉන්නවා. මොකද වරායට ඇමතිකම දැරුවනේ මුස්ලිම් දේශපාලඥයෝ. වරායේ ගොඩක් අයින් කර ගත්තානේ වන්දි ගෙවලා. වන්දි ගෙවලා අයින් කර ගත්තා, මුස්ලිම් කට්ටිය දා ගත්තා. දැන් මුස්ලිම් ඉන්නේ. රාජ්‍ය ආයතනවලට අන්තවාදීන් ඇතුල් කර ගන්න හොඳ නැහැ.

FAIR COMMENT — BY JEZEEM

වෙළඳාමත් කඩන්න, ඒක තමයි කරන්න තියෙන්නේ. රට ආරක්ෂා කරලා ඔය කඩු ටික එලියට අරගෙන ආර්ථිකය වට්ටලා මේකේ එපා කරලා යන්න නැත්නම් අපේ ආතනාථ කර ගන්න අනාගතයට වහල්ලු බවට පත් කර ගන්න. නැතුව මේක විසඳන්න බැහැ.

ප්‍ර: දැන් ඔබ වහන්සේට මගෙන් තියෙන අවසාන ප්‍රශ්නය, ඔබ වහන්සේ ස්ව කැමැත්තෙන් යමක් කියන්න තියෙනවද කියලා ඇහුවාම කිව්වා ඔබ වහන්සේ CD තැටියක් හදන්නට අපේක්ෂා කරනවා, එම CD තැටිය හරියට දෙසැම්බර් 31 වන දින රාත්‍රියේ රතිඤ්ඤා සියළු ගෙවල්වලම පත්තු වෙනවා වගේ මේක ඇහුවාම මිනිසුන් තුළ කිසියම් පිබිදීමක් ඇති වෙන එකක් මම අහන්නට කැමතියි ඔබ වහන්සේගෙන් ඔබ වහන්සේ තබ්ලික් ජමාත් කියන ඉස්ලාම් අන්තවාදී සංවිධානයේ කිසියම් කාලයක්, අවුරුදු 16 ක් වගේ දීර්ඝ කාලයක් ඉදලා ඔබ වහන්සේ දන්නවා ඒ අන්තවාදී ආගමික අන්තවාදය නිසා මේ රටේ ජීවත් වෙන බහුතර කියන්නේ විවිධ ජන වර්ග ජීවත් වෙන රටක්නේ ලංකාව, සිංහල, දෙමල, මුස්ලිම් සහ විවිධ ආගම් තියෙන. එතකොට ඒ සියළුම ජන වර්ගවල සාමයට, සංහිදියාවට ලොකු බාධාවක් නේ මේ ආගමික අන්තවාදය, එතකොට ඔබ වහන්සේගේ ඔය CD තැටිය මගින් ඔබ වහන්සේ බලාපොරොත්තු වෙනවද මේ අපේ රටේ තියෙන සියළුම ජන වර්ග සහ ආගම් අතර සමඟියක් ඇති කිරීම තුලින් රට තුළ සාමය, සංහිදියාව තිරසාර අන්දමින් ගෙන යාමට කිසියම් මෙහෙවරක් කරන්න?

උ: ඔව් මම මේක අන්තවාදයක් ඇවිස්සෙන්නේ නැති ආකාරයට , මොකද මම මේකේ හිටපු එක දේශනාවක්වත් අන්තවාදී සංවිධානයේ එක දේශනාවක්වත් මිනිසා මිනිසා මරන්න කුහකත්වය ඇති කරන කාපීර් විනාශ කරන භාවයට හරියන දේශනාවක් මට ඉදිරිපත් කර ගන්න බැරි වුණා. සාමාන්‍යයෙන් පැයක විතර දේශනාවක්. ඒකෙන් මට හදා ගන්න පුළුවන් මේ අපේ මිනිස්සුන්ගේ තියෙන මොළේ හෝදන Face wash එක බවට පත් කර ගන්න පුළුවන් මේ දේශනාව. මොකද අපේ මිනිස්සුන්ගේ මොළේ විපරියාස වෙලා තියෙන්නේ.

ප්‍ර: අපේ මිනිස්සුන් කියන්නේ, මේ ලංකාවේ ඉන්න ඕක්කොම මිනිස්සුන්ද?

උ: ලංකාවේ ඉන්න සිංහල මිනිස්සු. ඒ මිනිස්සු හරි සිහි කල්පනාවෙන් වැඩ කරනවා. අපේ සිංහල බෞද්ධයෝ කතෝලික වුනත් සිංහලයෝ හරි සිහියෙන් නිසි ලෙස වැඩ කරන්නේ නැහැ. පෙලක් කාන්තාවෝ මම දැකලා තියෙනවා ෆෝන් එක කනේ තියාගෙන ළමයගේ කකුල් දෙක උඩට අරගෙන ඔළුව පල්ලෙහාට තියාගෙන වඩාගෙන ඉන්න කාන්තාවෝ මම දැකලා තියෙනවා.

ප්‍ර: ඒ Face book එකේ හාමුදුරුවනේ?

උ: ළමයා වඩාගෙන තියෙන්නේ ඔළුව මෙහෙම තියාගෙන. ඒතරම් පිස්සුවක් අපේ අයට තියෙන්නේ. ඒ මිනිස්සු එහෙම නැහැ. කිසිම

FAIR COMMENT BY JEZEEM

මුස්ලිම් කාන්තාවක් දැකලා තියෙනවද ෆෝන් එකක් කනේ තියාගෙන බස් එකක ඉන්නවා. කිසිම මුස්ලිම් කාන්තාවක් අතේ තියාගෙන ෆෝන් එකක් Face book යන්නේ නැහැ. එහෙම චාරයක් තියෙන්න ඕනේ. මේක කරන්න පුළුවන් මේක අන්තවාදයක් ඇවිස්සෙනවා. මොකද මුස්ලිම් අය කවදාවත් බෞද්ධ ආගමට ආපු අය නැහැ. මේක බලපු කෙනෙක් මේක පිට යවන්නෙත් නැහැ. ඒගොල්ලන්ගේ සංනිවේදන ක්‍රම, ඒගොල්ලන් සන්නද්ධ වෙන හැටි අන්තවාදයක් ඇවිස්සෙන්න කරන්නේ නැහැ. මේ ආකාරයට අපේ ආර්ථිකය ඒගොල්ලෝ අල්ල ගන්න විදිය, අපේ රට අල්ල ගන්න විදිය එහෙම දේශනාවක් තමයි මම මේකේ හදන්නේ. මෙවැනි තත්ත්වයක තියෙන්නේ වහළුන් බවට පත් වෙන්න කැමති නම් එගොල්ලෝ කපා කොටා මරන වෙලාවක මැරෙන්න කැමති නම් ඔය ආකාරයට ජීවත් වෙන්න ඕනේ, නැත්නම් රටේ නායකත්වය දෙපාරක් අනිවාර්යයෙන්ම මේ නායකත්වයෙන් ගෙනියන්න දෙන්නේ නැහැ. මොකද අද මිනිස්සු දන්නවා අද දේශපානයේ බැලුවාම ලංකාව මේවා කරලා බැලුවාම අන්තවාදී ත්‍රස්තවාදීන් තමයි දැන් යුඑන්පී එකට ඡන්දේ දීලා තියෙන්නේ. ඒගොල්ලන්ගේ බලාපොරොත්තුව තිබුනේ අනිත් ඡන්දත් ආවා නම් අනිවාර්යයෙන්ම අපිට රටක් නැති වෙනවා. අපේ පෙර වාසනාවකට මේ රට බේරුනා. එහෙනම් ඒවත් දැනුවත් කරලා මේ අන්තවාදය තියෙන ටිකකුත් මේකට දාලා මගෙත් තියෙනවා කරුණු ටිකක් මේකට දාන්න. කරුණු කියන්නේ මේ අන්තවාදීන් හොයා ගත්තේ කරුණු ටික. ඒ ටිකත් දාලා විනාඩි 35 ක පොඩි CD එකක් රහසිගතව මේක පන්සල්වලට බෙදන්න ඕනේ. ඒ බැලුවට පස්සේ එළියට කවුරුවත් කියන්නේ නැහැ. මේක හිතේ තැන්පත් කරගෙන ඉන්න පුළුවන් ආකාරයට මට ඒක නිර්මාණය කරන්න පුළුවන් හැකියාව තියෙනවා. මිනිසුන් අසරණයි. මොකද මම ඒක චෙක් කලේ මේක සාමාන්‍ය දුරට දැනුවත් කරපු මිනිස්සු ඉන්නවා දැන් මට කතා කලේ මට විශ්වාසවන්ත අය අපේ හාමුදුරුවනේ අපේ හාමුදුරුවනේ මට දැන් නිවනක් නැහැ, 10 දෙනෙක් විතර මම ලෑස්ති කරගෙන අපේ හාමුදුරුවනේ මුස්ලිම් එකෙක් යනවා මෙන්න මේ විදියට මට සැකයි කියන වෙලාවල් තියෙනවා දැක්ක වෙලාවට කතා කරලා. ඒක සිහියෙන් මම ඒ නිර්මාණය කරන ටිකෙන් මම 10 දෙනෙක් හදලා චෙක් කරලා බැලුවා. ඒ 10 දෙනා මට නිතරම කතා කරනවා හාමුදුරුවනේ මෙන්න මෙහෙම පුද්ගලයෙක් ඉන්නවා, මෙහෙම පුද්ගලයෙක් ඉන්නවා, මෙහෙම පුද්ගලයෙක් ඉන්නවා කියලා මම ටිකක් දාලා තියෙන්නේ. ඒ විදියට ඒගොල්ලෝ මාත් එක්ක කතා කරනවා.

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරුතුමා විසින්:</u>

මේ අවස්ථාවේදී අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් නියෝජනය කරන ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතාට සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටී.

ඉල්ලීමට ඉඩ දෙමි.

<u>ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා:</u>

ප්‍ර ගරු ස්වාමීන් වහන්සේ ඔබතුමා කිව්වා මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් තමාට මේ ප්‍රහාරය සිදුවීමට පෙර දැන ගන්න ලැබුණා කියලා?

උ ඔව්.

ප්‍ර දැන් ඒ සම්බන්ධයෙන් කිසියම් කතෝලික පියතුමෙකුටවත් දැනුම් දුන්නේ නැද්ද?

උ කතෝලික පියතුමෙකුට දැනුම් දුන්නේ නැහැ. මම කතෝලික බැතිමතුන්ට දැනුවත් කලා. එතකොට අපේ මහා සංඝරත්නය දැනුවත් කලා. ආරක්ෂක අංශ කතෝලික පියතුමාලටත් වැඩිය, කතෝලික බැතිමතුන්ටත් වැඩිය සිංහල බෞද්ධ අපේ ගිහි දායකයින්ටත් වැඩිය ආරක්ෂක අංශය දැනුවත් කලා කියන්නේ ඒක තමයි කරන්න ඕනේ. පොලිසියකට ගිහිල්ලා කල්පිටිය පුත්තලම තමයි මට යන්න තියෙන්නේ. ඒවා මම හොදාකාරවම දන්නවා සංවිධානයේ ඉන්දැද්දි මේ සංවිධානය තමයි පොලිස් නිලධාරින්ගේ ඒ ඉන්න නිලධාරින්ගේ පුද්ගලික දේවල් ඉටු කරන්නේ. ඒ නිසා මම ආරක්ෂක අංශය දැනුවත් කලා. සේවයේ නියුක්ත වෙලා ඉන්න හොඳ උගත් කෙනෙක් තමයි කෝප්‍රල් කෙනෙක් කියන්නේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ.

ප්‍ර දැන් ඔබ වහන්සේට දැන ගන්න ලැබුණද පල්ලිවලට යම් ප්‍රහාරයක් සිදු වෙනවා කියලා පාස්කු?

උ ඔව් පාස්කු පල්ලිවලට තමයි කිව්වේ. පාස්කු උත්සව වලට කිව්වේ. පල්ලිවලට නෙමෙයි. පාස්කු උත්සව තියෙන්නේ පල්ලියේනේ. මොකද මට ක්‍රිස්තියානි ආගම ගැන දැනුමක් තිබුනේ නැහැ, එතකොට ගුහාව පල්ලිය ගාව, කළුඅලුත්තුවේ ගුහාව පල්ලිය ගාව ක්‍රිස්තියානි ගෑනු ළමයෙක් තමයි රසික මහත්තයා බැඳලා ඉන්නේ. එයා බෞද්ධ නොවන ක්‍රිස්තියානි.

ප්‍ර කොහේද ගුහාව පල්ලිය තියෙන්නේ,

උ ගුහාව පල්ලිය තියෙන්නේ මීගමුව, කළුඅලුත්තුවේ. ඒක තමයි ගුහාව පල්ලිය කියලා කියන්නේ. ඒක ප්‍රසිද්ධ පල්ලියක්. ඒ පල්ලිය ඉදිරිපිටම පේන තෙක්මානේ ඉදිරිපිට ගෙදරක කට්ටිය තමයි ක්වේට් එකේ කිව්වේ. ඒ පවුල්වල කට්ටියම ක්‍රිස්තියානි බෞද්ධ කට්ටිය.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර එතකොට ඔබ වහන්සේට කියන්න පුළුවන්ද හෝටල්වලට මේ ප්‍රහාරය එල්ල කෙරුවේ ඇයි කියලා යම් හේතුවක් තිබුණද?

උ නැහැ එච්චර දැනුමක් තිබුනේ නැහැ.

<u>ගරු සභාපති විනිසුරුතුමාගේ නියෝගය</u>:

මෙම සාක්ෂිකරු විසින් කොමිෂන් සභාවට ලබා දෙනු ලැබූ සාක්ෂිය හේතුවෙන් ඔහුට යම් අනතුරක් හෝ තර්ජනයක් ඇති වීමට හැකියාව ඇති බවට කොමිෂන් සභාවට වැටහී යන හෙයින්, 2015 අංක 4 දරන අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතේ 25(4) උප වගන්තිය ප්‍රකාර අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත මෙම සාක්ෂිකරුට ලබාදිය යුතු අයිතීන් සහ වරප්‍රසාදයන් එකී පනත යටතේ ලබාදෙන ලෙසට මෙයින් නියෝග කරමි. මෙම නියෝගය ලිඛිතව මෙම කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉහත කී අධිකාරිය වෙත ආමන්ත්‍රණය කරන ලද ලිපියකින් දැනුම්දෙන ලෙස සකස් කර සාක්ෂිකරු හට ලබාදෙන ලෙසට නියෝග කරමි. එකී ලිඛිත ඉල්ලීම සාක්ෂිකරුට අවශ්‍ය වුහොත් එම අධිකාරියට ලබාදීමේ හැකියාව ඇති බව සාක්ෂිකරුට දන්වමි.

සාක්ෂිකරු මුදා හරිමි.

දැන් වේලාව ප.ව. 9.05 යි.

නැවත කොමිෂන් සභාව 2019.12.20 වන දින සිකුරාදා ප.ව. 2.00 ට රැස්වන බව දන්වා සිටි.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.02.20 වෙලාව:- ප.ව.2.30 යි.
සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

ගරු විනිසුරු මඩුල්ල:-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03 හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04 හිටපු ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05 හිටපුඅමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

<u>පෙනී සිටීම:</u>

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා සමඟ නීතිඥ සිතිජා ජයමාන්න කන්‍යා සොහොයුරිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර දෙන ලදි.
සාක්ෂිකරු කැඳවයි

President's Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

සාක්ෂි අංක: **251**

සම්පූර්ණ නම	:	තුවාන් සුරේෂ් සාලේ,
වයස	:	අවුරුදු **51** යි,
ජාතිය	:	මැලේ,
ආගම	:	ඉස්ලාම්,
තනතුර	:	දැනට අධ්‍යක්ෂක, බුද්ධි. (රාජ්‍ය බුද්ධි සේවාව)

සාක්ෂිකරු කුර්ආනයේ අත තබා ප්‍රතිඥාව ලබා දෙයි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සංජීව දිසානායක මහතා:

ප්‍ර: ඔබ දැනට රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කරන්නේ?

උ: එහෙමයි ස්වාමිණි.

ප්‍ර: ඔබ ශ්‍රී ලංකා යුධ හමුදාවට අනුයුක්ත නිලධාරීවරයෙක් කිව්වොත් නිවැරැදිද?

උ: නිවැරදියි ස්වාමිණි.

ප්‍ර: ඔබ **1987** ශ්‍රී ලංකා යුධ හමුදාවට Cadet නිලධාරීවරයෙක් වශයෙන් සම්බන්ධ වෙනවා හරිද?

උ: ඔබ හරි.

ප්‍ර: ඒ සම්බන්ධ වුණාට පසුව ඔබ පිළිවෙලින් දෙවන ලුතිනන්, ලුතිනන්, කැප්ටන්, මේජර්, ලුතිනන් කර්නල්, කර්නල් යන තනතුරුවලට පිළිවෙලින් **1988.12.10, 1991.06.10, 1993.06.10, 1996.06.10, 2007.07.26** සහ **2012.06.10** වන දින උසස්වීම් ලබනවා.

උ: නිවැරදියි ස්වාමිණි.

ප්‍ර: යුධ හමුදාවේ ඔබගේ වර්ථමාන තනතුර කුමක්ද?

උ: මම බ්‍රිගේඩියර්වරයෙක් හැටියට සේවය කරනවා.

ප්‍ර: ඔබ බ්‍රිගේඩියර් තනතුරට පත් වුණේ කවද්ද?

උ: **2014** වසරේ.

ප්‍ර: **10.12** වෙනිදා කිව්වොත් හරිද?

උ: නිවැරදියි.

ප්‍ර: ඔබ ශ්‍රී ලංකා යුධ හමුදාවට සම්බන්ධ වුණාට පසුව ශ්‍රී ලංකා යුධ හමුදාවේ බුද්ධි බලකායට ඔබ එකතු වෙනවා?

උ: ඔබ හරි.

ප්‍ර: ඒ මොන කාලපරිච්ඡේදයේද ඔබ එකතු වන්නේ?

උ: **1993** වසරේ.

President's Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: දැන් යුධ හමුදාවේ බුද්ධි බලකායට සම්බන්ධවීමට ඔබට කිසියම් විශේෂිත සුදුසුකමක් තිබුණාද ඒ වෙන කොට?

උ: 1993 වසරේදි විශේෂයෙන්ම එවකට හිටපු යුධ හමුදාපතිවරයා නිලධාරීන් 10 දෙනෙක් තෝරාගෙන තිබුණා බුද්ධි බලකායට සම්බන්ධ කර ගන්න. ඒ අනුව මම ඇතුළු දහදෙනෙක්ව බුද්ධි බලකායට තාවකාලිකව බඳවා ගැනීම් කළා. මම හිතනවා එතනදී විශේෂයෙන්ම දෙමළ භාෂාව කතා කිරීමේ හැකියාව සහ අනෙකුත් discipline පිළිබඳව පරීක්ෂණයකින් පසුව තමයි ඒ selection එක කරන්න ඇත්තේ කියලා මම විශ්වාස කරනවා.

ප්‍ර: ඔබ යුධ හමුදාවේ බුද්ධි බලකායට සම්බන්ධ වෙන්න ඕන කියලා අයදුම් කළාද?

උ: මම අයදුම් කළේ නැහැ.

ප්‍ර: ඔබව තෝරා ගනු ලැබුවා ඒ කියන්නේ?

උ: ඔබ හරි.

ප්‍ර: දැන් යුධ හමුදාවේ බුද්ධි බලකායට ඔබ සම්බන්ධ වුණාට පසුව ඔබට එම කටයුතු කරන්න 93 වර්ෂයේ සම්බන්ධ වෙන කොට ඔබට යම් දැනීමක් තිබ්බද?

උ: මට එහෙම විශේෂිත කියලා දැනුමක් තිබුණේ නැහැ. නමුත් මගේ Cadet Period එකේදී එවකට current affairs වල තිබෙන උපරිම ලකුණු ලබාගෙන මම එතනදී පළමු ස්ථානය ලබා ගත්තා. එහි ජාත්‍යන්තර පිළිබඳව තිබූ දැනුම පමණයි මට තිබ්බේ.

ප්‍ර: දැන් බුද්ධි බලකායට සම්බන්ධ වුණාට පසුව ප්‍රථමයෙන් ඔබට යම් පුහුණුවක් ලබා දුන්නද?

උ: සියළුම මට පමණක් නෙමෙයි සියළුම නිලධාරීන්ට ඕනම බුද්ධි අංශයක මූලින් බඳවා ගන්නා අයට මූලික පාඨමාලාවක් ලබා දෙනවා, ඒක Basic Intelligence course කියලා අපි හඳුන්වනවා.

ප්‍ර: කොයි කාලෙද ඔබට ඒක ලබා දුන්නේ?

උ: ඒක 1993 මාව නම් වශයෙන් nominate කලාට පස්සේ ඒක කොළඹට ගෙනල්ලා මා ඇතුළු එවකට බඳවා ගැනීම් කරපු නිළධාරීන් දහ දෙනාටම එම පුහුණුවීම් ලබා දුන්නා.

ප්‍ර: ඒ ඔබගේ කණ්ඩායමට මෙම පුහුණුවීම කොච්චර කාලයක් ලබා දුන්නද?

උ: මගේ මතකයේ හැටියට ඒක සති 4 ක පුහුණුවීමක්.

ප්‍ර: ඒ සති 4 ක පුහුණුවීමෙන් පසුව ඔබ කොහාට හරි අනුයුක්ත කළාද? කොහොමද ඒ ක්‍රියාකාරකම් සිදු වුණේ?

FAIR COMMENT
BY JEZEEM

ඌ: ඒ යති 4 පුහුණුවට පසුව මාස කිහිපයක් කොළඹ ප්‍රදේශයේ රාජකාරීවලට නිරත කලා. ඊට පසුව මාව මඩකලපුවට Posting එකක් ලැබුණා.

ප්‍ර: හමුදා බුද්ධි බලකායේ කුමන තත්ත්වයක් යටතේද ඔබ සම්බන්ධ වුනේ? කුමන තනතුරක් කියන එක මම හිතන්නේ වැරදියි, කුමන නිළයකටද ඔබ පත් වුනේ?

ඌ එවකට මම දරපු නිළය ලුතිනන් වරයෙක් හැටියට තමයි මම හිටියේ.

ප්‍ර: බුද්ධි බලකායේ ඔබට, ඔබ හඳුනා ගැනීමට ඔබට යම් නිළයක්, ඔබේ තත්ත්වයක් තිබුණද ලුතිනන් කියන නිළයට අමතරව?

ඌ: මට බුද්ධි නිලධාරී කියන තනතුර තමයි ලබා දීලා තිබ්බේ.

ප්‍ර: එයට අංකයකුත් ලබා දී තිබුණද?

ඌ එහෙම විශේෂ අංකයක් නැහැ, යුධ හමුදා බැඳීමේ අංකය තමා අපි ආරම්භයේ සිට අපි අවසානය දක්වාත් එක අංකයක් තමයි අපි පාවිච්චි කරන්නේ.

ප්‍ර: ඔබ මඩකලපුවට රාජකාරී යොමු කලාට පසුව කොපමණ කාලයක් ඔබ මඩකලපුව ප්‍රදේශයේ ඒ කියන්නේ නැගෙනහිර ප්‍රදේශයේ සේවය කලාද?

ඌ: මම තෝරා ගන්න කොටත් මම 1991 වසරේ ඉදන් මම මඩකලපුවේ තමයි හිටියේ. නැවත වරක් 93 ට Training එකට පස්සේ 93 ඉදන් 97 වසර දක්වාම මම මඩකලපුවේ සේවය කළා.

ප්‍ර: එම සේවය කිරීමේදී ඔබ යම් ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක් වුණාද?

ඌ ඔව් එවකට 97 වසරේදී යම්කිසි ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක් වුණාට පස්සේ මම කොළඹට පැමිණුනා.

ප්‍ර: දැන් මෙම කාල වකවානුව තුළ ඔබ නැවත කොළඹට 1997 වර්ෂයේදී පැමිණෙන කාල වකවානුව තුළ බුද්ධි කටයුතු සම්බන්ධයෙන් අර ලබපු මූලික පාඨමාලාවට අමතරව ඔබට වෙනත් පාඨමාලාවන් සඳහා ඔබ යොමු කෙරෙව්වද?

ඌ: විටින් විට මගේ career එකේ විශේෂ බුද්ධි පාඨමාලවලට මම ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවලට යොමු වුණා. 94 වසරේදි මම ඉන්දියාවට ගොස් මාස 3 ක පාඨමාලාවක් හැදෑරුවා Intelligence Staff Officers Course කියලා.

ප්‍ර: යුධ හමුදා මාණ්ඩලික විද්‍යාලය සපුගස්කන්දේ තියෙන, එම විද්‍යාලයේ ඔබ යම්කිසි පාඨමාලාවක් හැදෑරුවාද?

ඌ මම පාඨමාලාවක් හැදෑරුවා ඒක Staff Officers course කියලා කියන්නේ. ඒකෙදී ඒක අවසානයේදී හොඳම දක්ෂ නිලධාරීන්ට පශ්චාත්

FAIR COMMENT
BY JEZEEM

උපාධිය ලබා දෙනවා. මම එතනදි කැළණිය විශ්ව විද්‍යාලයෙන් Master of Defense උපාධිය ලබා ගත්තා.

ප්‍ර: එය ලබා ගත්තේ සපුගස්කන්දේ මාණ්ඩලික..

උ: මාණ්ඩලික විද්‍යාලයේ වසරක සේවයෙන් පස්සේ. ඊට අමතරව ඒ Degree එකට අවශ්‍ය සුදුසුකම් University එකේ ඒ අදාල අවශ්‍ය අනෙකුත් පාඨමාලාවන් හැදෑරුවා.

ප්‍ර: දැන් මෙම පාඨමාලාව හැදෑරීමේදී බුද්ධි කටයුතු සම්බන්ධයෙනුත් ඔබ හැදෑරීමකට ලක් වුණාද?

උ විශේෂයෙන් ම Subjects විසිගානක් විතර තිබ්බා. නමුත් ඒකේ මගේ Research paper එක කලේ ඇත්තටම suicide terrorism කියන Subject සම්බන්ධයෙන්. ඒකත් ඒකේ හොඳම එකක් හැටියට තේරුණා කැළණිය විශ්ව විද්‍යාලයෙන්. ඉතින් ඒ තුලින් තවදුරටත් මට අධ්‍යයනයක් ලැබුණා විශේෂයෙන්ම ඒ බුද්ධියට සම්බන්ධ දැනුම වර්ධනය කරන්න සහ ඒ එක්කම විශේෂයෙන්ම Strategic පැත්තෙන් ගොඩක් දුරට අපේ බුද්ධි නිලධාරියෙක් හැටියට අපි ගොඩක් වෙලාවට Operational Tactical Level එකෙන් තමයි අපි invest කරන්නේ. එතනදි පාඨමාලාවේදී විශේෂයෙන්ම කොහොමද මේ ප්‍රශ්න දිහා මීට වඩා පුළුල්ව බලන්නේ කියන එක ලොකු අවබෝධයක් සහ අත්දැකීමක් ලැබුණා.

ප්‍ර: දැන් ඊට පසුව, ඔබ ඒ පාඨමාලාව හැදෑරීමෙන් පසුව ඔබ කුමක්ද සිදු කලේ? ඔබ නැවත බුද්ධි බලකායට ආවද?

උ: ඔව්, ඒක ඉවර වුණාට පස්සේ මම නැවත වරක් බුද්ධි බලකායට පැමිණුනා.

ප්‍ර: ඒ බුද්ධි බලකායට පැමිණියේ කුමන තරාතිරමක් යටතේ ද බුද්ධි බලකායේ?

උ මම බුද්ධි බලකායේ මුල ඉදන්ම පටන් ගත්ත නිලධාරියෙකුට Hold කරන්න පුළුවන් අවම එක තමයි SO, Staff Officer 1 කියන එක. මම Staff Officer 1 ඉදන් Staff Officer (i), Staff Officer (ii), Staff Officer (iii), Colonel Int, Colonel DS සහ Director Military Intelligence යන සියළුම තනතුරු මගේ කාලය තුලදී මම දැරුවා.

ප්‍ර: දැන් ඔබ මා පෙර කී ලෙසට මෙම මාණ්ඩලික විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරලා ඉවර වෙලා ඔබ නැවත සේවයට වාර්තා කළ කාලවකවානුව මතකයක් තියෙනවද?

උ: මගේ මතකයේ හැටියට 2003 වසර.

ප්‍ර: ඔබ එම කාල පරිච්ඡේදයෙන් පසුව ඔබ දිගටම යුධ හමුදා බුද්ධි බලකායේ සේවය කළා?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ දිගටම මම බුද්ධි බලකායේ සේවය කලා.

ප්‍ර: 2006 අවුරුද්දේ ඔබව ප්‍රංශයේ තිබෙන ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට අනුයුක්ත කරනු ලැබුවද?

උ: ඔව් අනුයුක්ත කරනු ලැබුවා.

ප්‍ර: කුමන ඔබට තනතුරක් ලබා දීලද ඒ අනුයුක්ත කිරීම සිදු කලේ?

උ: ඔව් එවකට පැවති යුධ වාතාවරණය අනුව මේ යුද්ධය අවසන් කළයුතුයි කියන මතයකට ඇවිල්ලා තිබ්බා. මේ කුරිරු යුද්ධය මොකද රජයවල් 6 ක්, රාජ්‍ය නායකයන් 6 ක් එක්ක එකම ප්‍රභාකරන්, එකම පොට්ටු අම්මාන් තමයි මේ යුද්ධයට මේව වුනේ. ඒ 2006 දී අපි Identify කළා පැති දෙකක්, එකක් ඇවිල්ලා අපි Military Language එකෙන් කියනවා නම් Centers of gravity. ඒ කියන්නේ එක පැත්තකින් නායකත්වය අපි විනාශ කළයුතුයි. අනෙක් පැත්තෙන් විශේෂයෙන්ම ඒ නායකත්වයට සහයෝගය දෙන ඒ කියන්නේ Propaganda, Fund raising and Procurement මේ තුනම වුනේ විදේශිය රටවල් වලින් ඒ පැත්තෙන් ඒ සියළු ටික අපි අකර්මන්‍ය කළයුතුයි කියලා. ඉතින් ඒ අනුව යුධ සැලසුම් කරන ගමන්ම විශේෂයෙන්ම LTTE එක ඉතාමත්ම බලවත් වෙලා තිබ්බේ යුරෝපයේ. One million population එකක් තිබ්බා. නමුත් ඒ population එක LTTE එකට අවශ්‍ය කරන විදියට ඒගොල්ලන් ඒක හදාගෙන තිබ්බා. මම කියපු ප්‍රධාන කාරණා තුන කරන්න. එතනදි මාව යුරෝපයට යැව්වා ඒ Center of Gravity එකේ විශේෂයෙන්ම Propaganda, Fund raising and Procurement කියන ජාලා සම්බන්ධයෙන් කටයුතු කරන්න.

ප්‍ර: ඒ කියන්නේ එහෙම ජාලා අකර්මන්‍ය කිරීමේ කාර්යයටද ඔබව යැව්වේ?

උ ඔබ හරි.

ප්‍ර: ඒ අනුව ඔබ වසර 3 ක පමණ කාලයක් ප්‍රංශයේ එම තානාපති කාර්යාලයේ සේවය කළා?

උ: ඔව් මා මූලික වශයෙන් ගියේ වසරකට. පසුව ඒ ලැබෙන ප්‍රතිඵල අනුව මාව වසර තුන දක්වාම තිබ්බා. ඒ වසර තුන ඇතුලත සෑහෙන රාජකාරී කොටසක් යුරෝපයේ කිරීමට අපිට හැකියාව ලැබුණා.

ප්‍ර: මොකක්ද ඔබට කරන්න පුළුවන් වුන රාජකාරී, කෙටියෙන් කියන්න, මොකක්ද ඔබට LTTE ත්‍රස්තවාදී සංවිධානයට ලැබෙන ඒ අරමුදල් එහෙම නැත්නම් ඒ ප්‍රචාරණ අකර්මන්‍ය හෝ අඩපන කිරීමට හැකියාව ලැබුණේ?

උ ඔව් විශේෂයෙන් කොටස් 3 ගත්තොත් පළවෙනි එක ඇවිල්ලා Propaganda එක, ඒක විශේෂයෙන්ම ඒගොල්ලන්ට ගුවන් විදුලි, රූපවාහිනී සහ Printed මාධ්‍යය තුනම තිබ්බා, ඒකෙදී විශේෂයෙන්ම ඒගොල්ලන් ගොඩක් ප්‍රචලිතව තිබ්බේ රූපවාහිනී. ඒක ඒ දවස්වල

FAIR COMMENT BY JEZEEM

හැඳින්වුයේ Tamil Television Network කියලා. ඒක ඇත්තටම ඒක විකාශනය වුනේ ප්‍රංශයෙන්. අපිට හැකියාව ලැබුණා ඒ තිබ්බ වකවානුව අනුව ඒ සම්බන්ධයෙන් කවුද කරන්නේ, ඒ අවශ්‍ය කරන පුද්ගලයන්ව හඳුනාගෙන ඒ මුදල් කොහොමද, ඒ ලැබෙන මුදල් කොහොමද නැවතත් LTTE ත්‍රස්තවාදී සංවිධානයට අවි ආයුධ ගන්න ලැබෙන්නේ, ඒ එක්කම ඒ තුළින් ප්‍රකාශිත දේවල් වලින් කොහොමද යුරෝපයේ ජනතාවගේ විශේෂයෙන්ම Third Generation of Tamils ඒගොල්ලන්ගේ මනස වෙනස් වෙන්නේ, ඒ ආදී සම්පූර්ණයෙන්ම ඒ පිළිබඳව Study කරලා ඒ එක්කම ඒ රටේ නීතිය පිළිබඳව හොඳට හඳුනගෙන ඒ රටේ බුද්ධි සේවාවන් සහ බුද්ධිය සහ නීතිය කටයුතු කරන සංවිධාන අඳුනාගෙන ඒ හරහා ඒ විශේෂ ගොඩක් දේවල් සිදු වුණා, ඉතින් ඒ අනුව අපිට හැකියාව ලැබුණා විශේෂයෙන්ම අවශ්‍ය තොරතුරු ඒ රටේ නීතිය කඩන අවශ්‍ය තොරතුරු ඒ අවශ්‍ය නිලධාරීන්ට ලබා දීලා මුල්වරට ප්‍රංශයේ **17** දෙනෙක් LTTE ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වුණා. ඒ අත්අඩංගුවට පත්වීම යුරෝපයේ වෙච්ච මුල්ම අවස්ථාව. ඒ තුළින් එවකට විදේශිය කටයුතු භාරව හිටිය ලක්ෂ්මන් කදිරගාමර් මැතිතුමා මරණයට පත් වෙනවාත් එක්කම LTTE තහනම් සංවිධානයක් කළා. ඉන්පසු මේ arrest කිරීමත් එක්කම අපිට හැකියාව ලැබුණා යුරෝපීය Soil එකේ මේ දක්වාම මේ තහනම දික් කරන්න. නමුත් විශේෂයෙන්ම **2007, 2008, 2009, 2010** වසරවලදි හැම වසරේදීම අළුත් Information වෙන්න ඕනේ. ඉතින් විශේෂයෙන්ම මේ යුරෝපීය Soil එකේ කරපු මේකේ නීතිමය වශයෙන් මේ **17** දෙනා අත්අඩංගුවට ගැනීම සහ ඒ තුළ දඬුවම් කිරීම ඒගොල්ලන්ට වරදකරුවන් හැටියටම සැලකීම නිසා අපිට හැකියාව ලැබුණා මේ තහනම දික් කරන්න.

ප්‍ර: ඔබ ඒ සාර්ථක විදෙස් කටයුත්ත අවසන් කරලා ඔබ නැවත ලංකාවට එන්නේ **2009** වර්ෂයේ?

උ: **2009** මාර්තු **01** වෙනිදා.

ප්‍ර: ඔබ ලංකාවට පැමිණිලා ඔබ නැවත කොහාටද සම්බන්ධ වෙන්නේ?

උ මම **2009** මාර්තු මාසෙට පැමිණිලා මට පත්වීම ලැබෙනවා Foreign Coordinator හැටියට. ඔක්කොම බුද්ධි Coordinator හැටියට, එතකොට මම ආරක්ෂක අමාත්‍යාංශයට පත්වීම ලැබිලා Chief of National Intelligence යටතේ සේවය කරන්න මම එතනට යනවා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ යනවා, ආරක්ෂක අමාත්‍යාංශයට යනවා විදේශ බුද්ධි තොරතුරු සම්බන්ධව Coordinator කෙනෙක් හැටියට?

උ: සියළුම විදේශ බුද්ධි සේවය සම්බන්ධව කළමනාකරණය කරන්න.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එසේ ගිහිල්ලා ඔබ කොච්චර කාලයක් එම ස්ථානයේ, එම තනතුරේ රැකියාව කරනවද?

උ: මම **2009** ඉදන් **2012** නොවැම්බර් දක්වා මම එතනදි එහි සේවය කරනවා.

ප්‍ර: ඊට පසුව ද ඔබ අධ්‍යක්ෂක, යුධ හමුදා බුද්ධි බලකායට පත්වන්නේ?

උ: ඔව් **2012** නොවැම්බර් මස බුද්ධි අධ්‍යක්ෂක තනතුරට පත් වෙනවා.

ප්‍ර: ඉන් අනතුරුව **2016.11.08** වෙනිදා දක්වා ඔබ එම තනතුර හොබවනවා?

උ: ඔබ හරි.

ප්‍ර: දැන් සාක්ෂිකරු ඉන් අනතුරුව ඔබ මලයාසියාවේ තිබෙන ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට සම්බන්ධ වෙනවා?

උ: ඔබ හරි.

ප්‍ර: එහි කොච්චර කාලයක් ඔබ සේවය කරනවද?

උ: මම එහේ වසර **2** ක කාලයක් සේවය කරනවා.

ප්‍ර: ඔබ මලයාසියාවේ තිබෙන ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට අනුයුක්ත වෙලා කටයුතු කිරීමේදි ඔබට පැවරිලා තිබ්බද විශේෂ රාජකාරියක්?

උ: විශේෂයෙන්ම මම එතනදි බුද්ධි රාජකාරීවලින් තොර රාජකාරියක් තමයි මාව එතනට යොමු කරන්නේ. මට විශේෂයෙන්ම Minister Councilor කියන Appointment එක තමයි මට ලබා දෙන්නේ. එතකොට මම බුද්ධි කටයුතුවලට මම සම්බන්ධ වෙන්නේ නැහැ.

ප්‍ර: ඉන් අනතුරුව ඔබ **2018** දෙසැම්බර් මාසේ පමණ ශ්‍රී ලංකාවට පැමිණෙනවා?

උ: ඔව් මම Malaysia වලින් මාව යවනවා ඉන්දියාවේ National Defense College එකට. එතනදි මම වසරක පාඨමාලාවක් හදාරනවා. එතනින් මම MPhil කියන උපාධිය මම හදාරනවා.

ප්‍ර: ඔබව ඉන්දියාවේ ජාතික ආරක්ෂක, National Defense Academy

උ: College

ප්‍ර: මෙහි අධ්‍යාපනය හැදෑරීම සඳහා ඔබට ශිෂ්‍යත්වයක්ද ලැබෙන්නේ, නැත්නම් කොහොමද ඒක ඔබට ලැබෙන්නේ?

උ නැහැ මගේ වසර දෙක අවසාන වෙන කොට මගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව යුධ හමුදාපති තීරණය කරනවා මම ඒ course එක කරන්න සුදුසුයි කියලා මාව එතනින් ඒ පාඨමාලාවට යවනවා.

ප්‍ර: එහිදී ඔබ කුමක්ද හදාරන්නේ?

උ: එහිදි හදාරන්නේ විශේෂයෙන්ම ලෝකේ රටවල් **25** කින් Officers ලා ඉන්නවා, ඊට අමතරව ඉන්දියාවේ Military Officers ලා ඉන්නවා, ඒ එක්කම සිවිල් සහ නීති ඒ සියළුම අංශවල තියෙනවා. ඒක විශේෂයෙන්ම

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Strategic Geo Political Security Aspects ඒ වගේ දේවලුත් Socio Political Economic subject මේවගේ කාණ්ඩ 6 ට වෙන් කරලා තමයි සම්පූර්ණ වසරේ ඒ පාඨමාලාව හදාරන්නේ. ඒක ඉන්දියාවේ තියෙන Highest ම Military course එක .

ප්‍ර: ඔබ ඒක සාර්ථකව නිම කරනවද?

උ ඔව් ඒකෙදි මගේ Field එක මගේ Research එක මම Reconciliation in tion Sri Lanka කියන Title එකට යන්නේ ඒක හොඳම Research එක හැටියට තේරෙනවා among all foreign officers.

ප්‍ර: ඉන් අනතුරුව ඔබ 2019 ඒ කියන්නේ ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසේ නැවත ලංකාවට පැමිණෙනවා

උ: 2019 දෙසැම්බර් 02 වෙනිදා ලංකාවට පැමිණෙනවා.

ප්‍ර: ඒ ආවට පසුව ඔබව 2019.12.06 වෙනිදා ඔබ වර්ථමානයේ හොබවන තනතුර වන අධ්‍යක්ෂක, ජාතික බුද්ධි වශයෙන් පත් වෙනවා?

උ ඔබ හරි.

ප්‍ර: 1993 ඔබ යුධ හමුදා බුද්ධි බලකායට සම්බන්ධ වෙලා මේ වන විට ඔබගේ මේ බුද්ධි සේවාවන් සම්බන්ධයෙන් තියෙන ඔබගේ අත්දැකීම කොච්චර කල්ද?

උ: 1993 ඉදන් මේ දක්වාම මම බුද්ධි රාජකාරියේ තමයි නිරත වුනේ. ඒ කියන්නේ Malaysia වේ ඉන්දැද්දි වුනත් මට රාජකාරී වශයෙන් මට පැවරි නැති වුනත් ඒ අදාල රටේ ඉන්න බුද්ධි අංශ සහ ඒ අදාල Agencies එක්ක මම කටයුතු කලා 93 ඉදලා මේ වසර දක්වා.

ප්‍ර: ඒ කියන්නේ කොයි ආකාරයටද ඔබ කටයුතු කලේ?

උ විශේෂයෙන්ම මොකද ඒ හැම රටක් එක්කම මම කළමනාකරණය කලා ලංකාවේ 2009, 2012 වසරේදි. සාමාන්‍යයෙන් බුද්ධි නිලධාරින්ගේ සේවය එහෙම තැනක් මාරු වුණා කියලා එහෙම ඉවර වෙන්නේ නැහැ. ඒ Continuation එක තියෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ඒ කටයුතු පිළිබඳ මම දායකත්වයක් නොදැක්වුවත් ඒ තියෙන Network එක්ක මම දිගටම සම්බන්ධ වෙලා හිටියා.

ප්‍ර: මේ බුද්ධි සේවාවේ සිටින විට තොරතුරක්, බුද්ධි තොරතුරක් Information and intelligence මෙම වචන දෙකෙහි වෙනසක් තිබේද? එසේ තිබේ නම් ඔබට අනුව මොකක්ද ඒ වෙනස?

උ: ඉතාමත් පැහැදිලි වෙනසක් තියෙනවා. තොරතුරු කියන්නේ Raw material එකක්. ඕන තොරතුරක් වෙන්න පුළුවන්. ඒ තොරතුර අපි convert කරන්න ඕනේ බුද්ධිමය වටිනාකමක් ඒකට. ඒ වටිනාකම convert කලාම තමයි අපි intelligence කියලා එය හඳුන්වන්නේ. එතකොට මේක සිද්ධාන්තයක් තියෙනවා මුළු ලෝකෙම ඔක්කොම

Prabath Jayasinghe's Copy
FAIR COMMENT BY JEZEEM

රටවල්වල අපි අනුගමනය කරන. ඒකෙදී විශේෂයෙන් Direction, collection, procession and dissemination මේ කියන්නේ intelligence cycle එක. ඉතින් මේ cycle එකේදි Direction එක හැම තිස්සෙම ලබා දෙන්න ඕනේ ඉහල ස්ථානයකින්. ඒක පහල ස්ථරය දක්වාම ඒ Direction එක යනවා.

ප්‍ර: කොහොමද ඒක ලබා දෙන්නේ?

උ: දැන් උදාහරණයක් වශයෙන් අපිට අවශ්‍ය නම් විශේෂයෙන්ම LTTE සංවිධානයේ කිසියම් කාරණාවක් දැන ගන්න. එතකොට අපි කියනවා මේ වගේ මේ සම්බන්ධයෙන් තොරතුරු අවශ්‍ය යැයි කියලා අපිට ඒ තොරතුරු ලබා දෙනවා. විශේෂයෙන්ම අපි කියමු ඒක Security Council එකෙන් එන්න පුළුවන්. ආරක්ෂක අමාත්‍යාංශයෙන් එන්න පුළුවන්. DMI එකෙන් එන්න පුළුවන්. DMI එකෙන් ආවායින් පස්සේ ඒ Direction එක එන්න පුළුවන් එතන Unit එකට. Unit එකෙන් ඊට පල්ලෙහාට යන්න පුළුවන්. ඉතින් මේ හැම යටට යන දක්වාම මේ Direction එක කියන එක තියෙනවා. ඊට පස්සේ ඒ Direction එක අනුව collection එක පටන් ගන්නවා. ඒ collection එක ඒ දීපු Direction එකට අනුව සියළු තොරතුරු අපි එකතු කරන්න පටන් ගන්නවා. ඒ තොරතුරු එක්රැස් කිරීම ඒ හැම Level එකේදීම ඒ තොරතුරු එක්රැස් කිරීම වෙනවා. ඒවා ඇවිල්ලා raw තොරතුරු. ඒ එක්රැස් කරන තොරතුරු අපි ඒවා විශ්ලේෂණය කරන්න ඕනේ, විශ්ලේෂණය කිරීමේදි අපි අනුගමනය කරන ක්‍රියාවලියක් තියෙනවා එතනදි ඒ තොරතුරු ඔක්කොම **1,2,3,4** මීට කලින් ආපු තොරතුරද, පසු තොරතුරුද මේ ඔක්කොම ඒක්කම ඒකට සම්බන්ධ අනෙකුත් තොරතුරු ඔක්කොම Identify කරලා අපි ඒක intelligence වලට convert කරනවා. Intelligence වලට convert කලාම intelligence කරපු Reports තියෙනවා විශේෂයෙන් තොරතුරු ලබා ගැනිමේදි Grading System එකක් තියෙනවා. තොරතුරුකරුගේ Grading එක A,B,C,D,E,F වශයෙනනුත්, තොරතුරේ Grading එක **1,2,3,4** වශයෙනුත් ඒවා සඳහන් වෙනවා. ඒ Process දෙකක් එක්ක එකතුවෙලා තමයි ඒ තොරතුර එන්නේ උඩට. එතකොට ඒ වගකීම් ඒ තොරතුරු ඒකේ වර්ගීකරනය සියළු දෙනාම කලාම ඒ හැම Level එකටම Identify කරන්න පුළුවන් විශේෂයෙන්ම ඒ තොරතුරේ තියෙන වටිනාකම සහ තොරතුරුකරුගේ තියෙන වටිනාකම. නමුත් තොරතුර දුන්න පුද්ගලයාවත් තොරතුරුකරු පිළිබඳවත් document එකක් ඒ අදාල Level එකේ තිබ්බට ඒක හැම තැනටම share වෙන්නේ නැහැ. ඒ කියන්නේ උදාහරණයක් වශයෙන් දැන් මම හිටියේ Ground Level එකේ

FAIR COMMENT — BY JEZEEM —

නම් මට Direction එකක් උඩින් ආවා නම් මම තොරතුරු එක්රැස් කරන්න පටන් ගත්තාම මගේ තොරතුරු කරුවෝ හතර දෙනෙක් ඉන්න පුළුවන්. ඒ තොරතුරුකරුවෝ හතර දෙනා මට A කියන පුද්ගලයා මට තොරතුරු ලබා දුන්නාම මම ඒ තොරතුරු වර්ගීකරණයකට ලක් කරනවා. ඒ කියන්නේ A කියන පුද්ගලයා මට මීට කලින් මේ තොරතුරු කොච්චර සත්‍යයද කියන එක. ඒක මම Judge කරන්නේ මේ තොරතුරුකරු මීට කලින් මට තොරතුරු කීයක් දීලා තියෙනවද? ඒ වසරට තොරතුරු පහක් දීලා තියෙනවා නම් ඒ තොරතුරු පහ අනුව වෙච්ච Successes මොනවාද, ඒ අනුව මම A,B,C,D,E,F වශයෙන් මම වර්ගීකරණයක් කරනවා. ඊට අමතරව ඒ තොරතුරු කරු දෙන තොරතුර පිළිබඳව මම දකුණු පැත්තෙන් ලියලා ඒ තොරතුර මම බලනවා මේ තොරතුර මීට කලින් වෙනත් තොරතුරුකරුවොත් දීලා තියෙනවද කියලා. එහෙම තොරතුරුකරු දීලා තියෙනවා නම් ඒක 1 කියලා දා ගන්නවා. තොරතුරුකරුවෝ කිහිපදෙනෙක් දීලා තියෙනවා නම්, තොරතුරුකරුවෝ දෙන්නෙක් තුන්දෙනෙක් දීලා තියෙනවා නම් ඒක අපි 2 කියලා සඳහන් කරනවා. තොරතුරුකරුවෙක් දීලා නැත්නම් ඒකට වෙනත් තොරතුරුවලින් අපිට සනාථ වෙනවා නම් ඒක නමුත් තොරතුරු 3 කියලා සටහන් කරනවා. එතකොට සාමාන්‍යයෙන් උදාහරණයක් ගත්තොතින් A1 කියන එකක් බොහොම අමාරුයි අපිට ලබා ගන්න. සාමාන්‍යයෙන් ගොඩක් වෙලාවට B2 කියන තොරතුරට තමයි අපි යන්නේ. ඒ කියන්නේ A1 නම් ඉතාමත්ම අල්පයි ඒ තොරතුරු එහෙම නම් ඒක හොඳටම ඒක confirm ම තොරතුරක්. ඉතින් ඒ තොරතුරු මම ඒ විදියට තොරතුරු වර්ගීකරණය යට Level එකේ ඉදන් Commanding Officer ට උඩට යවන කොට එයා දකිනවා මේ තොරතුරත් එක්කම මේ information එක convert කරලා තියෙනවා intelligence වලට. එයා intelligence වලට convert කරපු එක එයා දකිනවා assessment එක. ඒකේ තියෙනවා තොරතුරු වර්ගීකරණයේ A2 , B2 එතකොට ඒ තොරතුරේ තියෙන වැදගත්කම දකිනවා. මොකද ඒ තොරතුර ලබා දෙන CO ට access එකක් නැහැ තොරතුරුකරුවටවත්, තොරතුරු දෙන පුද්ගලයාටවත් ඒ තොරතුරේ වටිනාකමටත්. ඊට පස්සේ එයා කරන්නේ ඒ තොරතුරු අරගෙන එයාගේ තොරතුරුත් එක්ක එයා බලනවා තවත් ඒ සමාන තොරතුරු ඇවිල්ලා තියෙනවද කියලා. ඒ අනුව එයාට වර්ගීකරනයක් නැවත කරන්න පුළුවන් නම් එයා වර්ගීකරනයක් එතන කරනවා. නැත්නම් එයා වර්ගීකරනයක් නැත්නම් ඒක එයා ඊලඟ ස්ථානයට අරිනවා. ඉතින් එතකොට උඩටම ආවායින් පස්සේ ඒ අනෙකුත් level වලට ආවායින් පස්සේ ඒකටත් අවශ්‍ය කරන

FAIR COMMENT BY JEZEEM

වර්ගීකරනය automatically හැදිලා තියෙන්නේ. ඉතින් ඒ අනුව තමයි අපි තීරණය කරන්නේ ඔබ කිව්ව ප්‍රශ්නෙට තොරතුර හා intelligence එකට. නැත්නම් අපිට හැම තොරතුරක්ම දෙන පලියට අපි කරන්න ගියොත් එහෙම හැමෝම ගහනවා ගහනවා කිව්වොත් හැමදාම ගහනවා ගහනවා උඩටත් හැමදාම ගහනවා කිව්වොත් ඒකේ තොරතුරේ කිසිම වටිනාකමක් නැහැ. හැබැයි අපි ගහන්නේ නැහැයි කියන එක තීරණය කරන එකත් අපිට ඕන විදියට තීරණය කරන්න බැහැ. ඒකට සිද්ධාන්ත තියෙනවා ඒවා වර්ගීකරනයකට ලක් කරන්න ඕනේ. ඒවට වගකීමකින් කටයුතු කරන්න ඕනේ. මේක ආවාම මේ තොරතුරු දන්න සියළු දෙනාම වගකීමකට ලක් වෙනවා. ඊට පස්සේ ඉහලම ස්ථානයේ තියෙනවා Source Controller කියලා කෙනෙක් ඉන්නවා. Source Controller ගෙන් මේ සියළුම තොරතුරු කරුවන් පිළිබඳව සම්පූර්ණයෙන්ම assessment එකක් කරනවා

ප්‍ර: තොරතුරු කරුවන්ද ?

උ තොරතුරුකරුවන් පිළිබඳව. එයාගේ නම ගම මුකුත් නෙමෙයි මොකද payment system එකක් තියෙනවා. එයාගේ code එකකින් යන්න පුළුවන්. අපි කියමු S කියන පුද්ගලයා මයික් කියලා. ඒ පුද්ගලයාට වෙනම ෆයිල් එකක් තියෙනවා. එයා ලබා දුන්න තොරතුර තියෙනවා. එයා කොච්චර ලබා දීලා තියෙනවද කියන එක. ඒවා මාස 6 ට සැරයක් වර්ගීකරනය වෙනවා Source Controller. ඒකට access එක තියෙන්නේ Director Military Intelligence ට විතරයි. Source Controller කෙනෙක් යට level එකටත් ඉන්නවා. ඉතින් ඒක ආවාට පස්සේ අපි මාස 6 ට සැරයක් අපි බලනවා මේ තොරතුරු කරු ඇත්තටම තවදුරටත් තිබීමට අවශ්‍යද, නැද්ද මේ ගෙවීම් කරන එක සාධාරණද කියලා ඒ වගේ කරලා අපි ඊට පස්සේ ඒ අනුව බුද්ධි අධ්‍යක්ෂක විසින් උපදෙස් ලබා දෙනවා මේ තොරතුරු කරු වැඩක් නැහැ මෙයාව අයින් කරන්න එහෙම නැත්නම් මේ තොරතුරු කරු හොඳයි. මෙයාව ඊලඟ grade එකට දාන්න. ආදි වශයෙන් අපි උපදෙස් ලබාදීමක් කරනවා. හැබැයි ඒ තොරතුරු දුන්න පුද්ගලයාව අපි කිසිම අයුරකින් අපි හඳුනා ගැනීමක් කරන්නේ නැහැ.

දැන් වෙලාව ප.ව. 3.00 යි.
මෙතැන් සිට වාර්තා කරන්නේ සචිනි මෙනවිය විසින්ය.

FAIR COMMENT
BY JEZEEM

වේලාව: ප.ව 3.00
පෙර සටහන්: ධම්මිකා මිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඔබගෙන් අහපු ප්‍රශ්නය Information එකයි Intelligence එකයි අතර වෙනස මෙකද්ද, මේ Intelligence එක අතර වෙනස මෙකද්ද කියන එක?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඒ ක්‍රියාදාමයේ දී ඔබ කිව්වා direction, collection, processing and dissemination, කියන කොටස් 4 ක් තියෙනවා කියලා. ඒක නිවැරදි ද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට information එක ලබා ගන්නේ කවුරු හරි කෙනෙක් direction එකක් දෙනවා මේ වගේ තොරතුරු ගන්න කියන එක?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඊළඟට තියෙන්නේ collection එකක්?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඊළඟට තමා processing එක?

උ: ඒ collect කරපු සියළුම දේවල් ටික process කරන්න ඕන ස්වාමිනි.

ප්‍ර: එතකොට මම නිවැරදිද කියලා කියන්න යම් කිසි තොරතුරක් ලබා ගැනීමෙන් පසු direction, collection processing එක ඉවර වුණාම පස්සේ ඒ අවස්ථාව පසු කරහයින් පස්සේ ඒක information එකේ ඉඳලා intelligence එකක් බවට පරිවර්තනය වෙනව ද ඒ අවස්ථාව වන විට?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: process වුණ එක ඉවර වෙච්ච ගමන් that becomes intelligence?

උ: yes,මොකද නැත්නම් ඊට කලින් ඒක raw information එකක් පමණයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: දැන් ඔබ කියා සිටියා තොරතුරුකරුට grading එකක් තිබෙනවා. තොරතුරට grading එකක් තියෙනවා කියලා. දැන් ඒ තොරතුරු ඔබ බුද්ධි සේවයේ ඉන්නා විට තොරුතුරු ලබා ගන්නේ එම grading එක ලබා දි තිබෙන තොරතුරුකරුවන්ගෙන් ම විතර ද නැත්නම් වෙනත් තොරුතුරුත් ඔබලා ලබා ගන්නවා ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඉතාමත් පැහැදිලිව ම බුද්ධි සිද්ධාන්ත වල තියෙනවා තොරතුරුකරුවෝ විවිධ තොරතුරුකරුවෝ ඉන්නවා. විශේෂයෙන්ම අපි කියනවා casual sources ඉන්නවා. agentsලා ඉන්නවා විවිධාකාරයෙන් ඉන්නවා. ඉතින් එතැන දි අර අපි මම මේ කතා කරන්නේ ඇවිල්ලා established agentsලා පමණයි. ඒ කියන්නේ තොරතුරු සාමාන්‍යයෙන් casual source එකක් අපි එළියේ ගියත් මිනිහෙකුට කියන්න පුළුවන් අරක අතන වෙනවා මෙතැන වෙනවා කියලා. එතකොට ඒ ගොල්ලන් casual source එකක් විතරයි. ඒ තොරතුරු ටික අපි එකතු කරලා යම් කිසි විශ්ලේෂණයක් කරනවා. දැන් ඒ process එක ඇත්තටම අපි පුරුදුවෙලා තියෙන්නේ ඒ කියන්නේ අපි මේ අවුරුදු ගාණක්ම ඉදලා ඒ හැම level එකේ දිම අපි ඒක ගත්තම. සාමාන්‍යයෙන් එක දෙකක් වෙන කොට මේ දෙය වෙන කොට මොකද්ද වෙන්නේ කියන එක අපිට ඔළුවට සාමාන්‍යයෙන් එනවා. ඉතින් එතැන දි මේක මේ ක්‍රියාවලිය ඒක අපි මේක හදලා තියෙන්නේ මේ ක්‍රමයට යන්න. හැබැයි මේ ක්‍රමයට ම යන්න කියලා අවශ්‍යතාවයක් නැහැ. මේ ක්‍රමය අපිට පුළුවන් සාමාන්‍ය තොරතුරු දෙක තුනක් ආවයින් පස්සේ අපිට මනසෙන් ඕක කරන්න. ඒ කියන්නේ අපි direct කරගෙන අපි මනසින්ම අපි ඒ දෙන්නෙක් තුන්දෙනෙක් කතා කරලා අපි collect කරගෙන ඒ මනසින්ම අපි **1, 2, 3** යි එකතු කරොත් දැන් මොකද්ද වෙන්නේ කියන එක අපි ඒක බුද්ධිමය තත්ත්වයකට පරිවර්තනය කරගෙන අපිට ඒ තොරතුර ලබා දෙන්න පුළුවන් intelligence එකක් හැටියට ඉහළ මූලස්ථානයට. ඉතින් එතකොට මේ තොරතුරු කියන එක සීමා වෙලා නැහැ. ඒක අංශක **360** ක වගේ වෙන්නේ. ඒ කියන්නේ ප්‍රධාන වශයෙන් ගත්තොත් electronic sources තියෙනවා, human sources තියෙනවා.ඒ එක්කම මේක තව ටිකක් ගත්තොත් human sources එක ගොඩාක් කොටස් වලට කැඩෙනවා. casual sources තියෙනවා. ඊට පස්සේ agentsලා ඉන්නවා. paid agentsලා ඉන්නවා. ඒ වගේ හැම ගොඩාක් ම එකතු වුණ මේ සියළුම මූලිකවම ලැබෙන තොරතුරු ටික තමයි අපි තොරතුරු කියලා ගන්නේ. ඒවා කිසිම විශ්ලේෂණයක් වෙන්නේ නැහැ. නමුත් ඒ සියළුම ආකාරයෙන් ගන්නා ලබා ගන්නා තොරතුරු අපි අර විදියට දැම්මයින් පස්සේ තමයි ඒක විශ්ලේෂණය වෙලා process එකක් වෙලා intelligenceවලට convert වෙන්නේ. ඒක පොත අනුව convert වෙන්නත් පුළුවන්. දැන් සමහර රට වලින් අපිට විදේශ තොරතුරු එවන කොට සමහර විට grading එකක් එන්නේ නැහැ. හැබැයි හැම අවස්ථාවක ම professional නිලධාරියෙක් හැටියට අපි තොරතුරු දුන්නම අපි grading එකක් ඉල්ලන්න ඕන මොකද හේතුව නැත්නම් ඒ

FAIR COMMENT — BY JEZEEM —

එන රටවල් වලින් තොරතුරු ගත්තම අතන දැන් වෙනවා කියන. උදාහරණයක් වශයෙන් December 25 වැනිදා සිදුවීමේ ඒ කියන්නේ මේ නත්තල් දවසේ මටත් බුද්ධි අධ්‍යක්ෂක හැටියට ඉන්දැද්දි තොරතුරු ආවා සමහර රට වලින් මෙන්න මෙහෙම threat එකක් තියෙනවා මෙන්න මෙහෙමයි කියලා. ඉතින් මං ඒ විදියට මේක ටක්ගාලා මේක උඩට කිව්වොත් එහෙම හැමෝම හිතන්නේ දැන් මේක ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා accountability එකක් තියෙනවා. හොඳම දේ ඇවිල්ලා මේක ඉක්මනටම දාන එක කියලා එහෙම කරොත් ඒක society එකට ඒක ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඒ කියන්නේ එතකොට අපිට මේ මිනිස්සුන්ට නත්තල සමරන්න හම්බුවෙන්නේ නැහැ. ඒ එක්කම සංවිධායකයන්ට ඒක ලොකු ප්‍රශ්නයක් වෙනවා. Military forces වලට ප්‍රශ්නයක් වෙනවා. අපි විශේෂයෙන් ම අපිව train කරලා තියෙන්නේ විශේෂයෙන් ම මේක අනුගමනය කරාම අපි professionally මේක handle කරන්න ඕන. එතැන දි මම ඒ රටවල් වලට කිව්වා මම. හොඳයි විශේෂයෙන්ම මට එතැනදි ශබලාගේ grading එක එවන්න කියලා. Grading එක එවන්න කිව්වම ඒ ගොල්ලෝ නැවත වරක් grade කරලා එවුවයින් පස්සේ මට එවලා තිබ්බා C4 හැටියට. C4 හැටියට ආවාම මම දන්නවා මේක reliability එකක් නැහැ. Just you need to warn. So ඒක නිසා අපි ඒකට කරේ මිනිස්සුන්ට අපි ඒ දේ ඔළුවට දැම්මේ නැහැ. අපි ඒ දේ කරේ ඇවිල්ලා අපි යම්කිසි precautions ගත්ත එකයි. දැන් අනික් උදාහරණයක් වශයෙන් මම කිව්වා දැන් American Travel Warning එකක් දෙනවා. Travel Warning එකේ 1,2,3 ,4 කියලා කොටස් 4 කට දෙනවා. දැන් Travel Warning එකක් දුන්නම one කියලා කියන්නේ කෙළින්ම කිසිම ඇමරිකානුවෙකුට කොහෙවත් travel කරන්න එපා කියන එකයි. Number two කියලා කිව්වොත් එහෙම travel කරන්න පුළුවන් හැබැයි Be very precautious මේ මේ area වලට යන්න එපා කියලා. එතකොට travel warning three දුන්නොත් යන්න ප්‍රශ්නයක් නෑ හැබැයි be cautious. දැන් මෙතනදි අපි ඒක මේ විදියට අපි අවබෝධ කරගත්තේ නැත්නම් අපට වෙන්නේ අර number four එක දුන්නත් අපි අනවශ්‍ය විදියට alert වෙනවා. ඉතින් එක පැත්තකින් අපි හැම තිස්සේම alert කරලා පැය 24ම තියලා 365ම දීලාත් මේ බුද්ධිය අපිට කරන්න බෑ. ඉතින් ඒක නිසා තමයි මේ හැම ක්‍රමයක්ම අපිට ඒ විදිහට training කරලා basic midterm, long term කරලා ඒ එක්කම මේ විශේෂයෙන්ම බුද්ධි නිලධාරියෙක්ව මේ තත්ත්වයට ගොඩනගන්න ක්‍රියාකරුවෙක් ගොඩනගන්න ලේසි නෑ. එයාගේ experience එක, maturity එක,

FAIR COMMENT BY JEZEEM

assessment එක ඉතාමත්ම වැදගත්. ඉතින් ඒ අනුව තමයි අපි මේ professionalism එක්ක තමයි අපිට හරියටම රටට අවශ්‍ය කරන threat එකයි නැද්ද කියන එක අපිට හඳුනාගන්න පුළුවන්. ඉතින් මං අර පැහැදිලි කිරීමක් මම කළේ ස්වාමීනි විශේෂයෙන්ම තොරතුරු සහ සාමාන්‍ය තොරතුරක තියෙන වටිනාකමයි intelligence කියන වටිනාකමයි ඒක වෙන්නේ process එකට ගියාට පස්සේ තමයි.

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: කොමිෂන් සභාව ඔබෙන් යම් ප්‍රශ්න ඇහුවොත් අපි ඒක සිමා කරනවා ඒ අවස්ථාවේ දි මෙහෙයවපු සාක්ෂිය සම්බන්ධයෙන් පමණක්. පස්සේ අවස්ථාවක අනික් විෂයන් සම්බන්ධයෙනුත් අපි ප්‍රශ්න අහනවා. දැන් ඔබගෙන් අහන්නේ information එකයි intelligence එකයි අතර ඔබ දැන් දුන්න සාක්ෂි සම්බන්ධයෙන් පමණයි. ඔබ ප්‍රකාශ කරන හැටියට විදේශීය බුද්ධි අංශයකින් අපේ බුද්ධි අංශයකට යම් කිසි තොරතුරක් ලැබුණම ඔබ කියනවා grading එකක් තියෙන්න ඕන කියන එක. ඒක නිවැරදි ද?

උ: ස්වාමීනි ඒක නිවැරදි. නමුත් සමහර රටවල් ඒ රටවල් වලට ආවේණික වූ systems තියෙනවා. එතැන දි සමහර වෙලාවට grading එවනවා. සමහර වෙලාවට grading එවන්නේ නැති අවස්ථාත් තියෙනවා.

ප්‍ර: ඒ grading එව්වෙ නැත්නම් ඒක ඉල්ලුවොත් දෙන අවස්ථාත් තියෙනවාද?

උ: ස්වාමීනි විශේෂයෙන්ම ඒ grading systems අනුව රටවල් අනුව වෙනස් වෙන්න පුළුවන්. අපි දැන් ලංකාවේ කරන්නේ UK system එක අනුව. තව රටක් අනුගමනය කරන්නේ වෙනත් රටක system එකක් නම් අනිවාර්යෙන්ම ඒ රටේ process එකක් තියෙනවා. ඒ ගොල්ලන්ට ඒකේ reliability එක අපිට අනිවාර්යෙන් ම දෙන්න පුළුවන්. එහෙම නැත්නම් මීට කලින් මං ඔබතුමාට කිව්වා වගේ ස්වාමීනි මීට කලින් තොරතුරු අපිට ලබා දීලා තියෙනව නම් එම ලබා දුන්නු තොරතුරු අනුව අපිට grading එකක් අපිට හදා ගන්න පුළුවන්.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියපු හැටියට මට තේරුණ හැටියට යම්කිසි අවස්ථාවක සමහරක් විදේශීය බුද්ධි අංශ වලින් ලංකාවේ බුද්ධි අංශයකට නැත්නම් නිලධාරියෙකුට යම් බුද්ධි තොරතුරක් දුන්නත් ඒකේ දෙන අවස්ථාවේ දි grading එකක් තියෙන්නත් පුළුවන් නොතිබෙන්නත් පුළුවන්.

උ: ඔබ හරි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: grading එකක් නොතිබුණු අවස්ථාවක අපේ බුද්ධි අංශ නිලධාරියාට පුළුවන් සාමාන්‍යයෙන් ඒ බුද්ධි අංශයෙන් ඉල්ලන්න ඒ grading එක?

උ: එසේමයි ස්වාමීනි.

ප්‍ර: එහෙ කට්ටියට ඒක දෙන්න පුළුවන් නම් අපේ බුද්ධි නිලධාරියට දෙනවා?

උ: එසේමයි ස්වාමීනි.

ප්‍ර: දෙන්න බැරිනම් දෙන්නේ නැහැ?

උ: එහෙම දෙන්නේ නැහැ. නමුත් අපිට පුළුවන් ඒ තොරතුර දැන් අපි රටක් එක්ක ගනුදෙනු කරන කොට පලවෙනි තොරතුරු නෙමෙයි ස්වාමීනි ඒ ගොල්ලන් මීට කලින් පස්සැරයක් එවලා ඇති. ඒ අනුව අපේ system එක අනුව අපිට පුළුවන් මේක ඊට කලින් පස්සැරයක් එවලා තියෙනවා තොරතුරුකරු අපි දන්නවා, ඒ රටේ බුද්ධි අංශය. මේ වගේ තොරතුරු 5 වතාවක් එවලා තියෙනවා. 5 වතාවෙන් 3 වතාවක් ම මේක වෙලා තියෙනවා. ඒක නිසා අනිවාර්යෙන් ම මේක B2 A1 හරි කියන grading එකක් අපිට කිරීමට හැකියාව තියෙනවා.

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: ඔබට තේරුම් කරලා දෙන්න පුළුවන් ද මේ විදිය බුද්ධි තොරතුරක තියෙන වටිනාකම සම්බන්ධයෙන් අන්තර් ජාතික වශයෙන් මොකක් හරි ප්‍රමිතියක් නැද්ද? ඒ කියන්නේ එක එක රටවල් මේක grade කරන විදිය වෙනස් ද?

උ: ස්වාමීනි ඒක වෙන්නේ මෙහෙමයි. දැන් අපේ හාමුදාවල් ඔක්කොම තියෙන්නේ UK LF කියන system එකට. British ඇවිල්ලා තමයි අපිට කරේ. එතකොට Russian system එක සම්පූර්ණයෙන් ම වෙනස්. නමුත් මේක මූලික සිද්ධාන්ත ඔක්කොම ගොඩාක් දුරට එකක්. ඒ කියන්නේ Russian කරන grading system එක වෙන අකුරු වෙන්නත් පුළුවන්. වෙන විදියක් වෙන්නත් පුළුවන්. UK තියෙන system එක වෙන විදියක් වෙන්නත් පුළුවන්. එතැන ප්‍රශ්න තියෙන්නේ මේ process එක හැම රටකම තියෙනවා. නමුත් ඒ රටවල් වල ආවේණික වූ ඒක කොමියුනිස්ට් රටක් නම් ඒ අනුව ඒක වෙනස් වෙනවා. නමුත් මූලික වශයෙන් ම මේ හැම තොරතුරක්ම ගන්න තොරතුරක් මේක intelligence වලට convert වෙලා මං අර කියපු direction, collection, process කියන එක මේ cycle එක ලෝකේ තියෙන සියළුම රටවල් වල අනුගමනය කරන ක්‍රමවේදයක්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: තව එකක් මං පැහැදිලි කරගන්න අහන්නම්. දැන් රුසියාවෙන් ලැබෙන බුද්ධි තොරතුරක වර්ගීකරණයත් ඊශ්‍රායලයෙන් ලැබෙන බුද්ධි තොරතුරක වර්ගීකරණයත්, ඉතාලි වලින් ලැබෙන බුද්ධි තොරතුරක වර්ගිකරණයත්, ඉන්දියාවෙන් ලැබෙන බුද්ධි තොරතුරක වර්ගීකරණයත් අතර වෙනසක් හිටින්න පුළුවන් ද?

උ: එසේමයි ස්වාමීනි මොකද ඒකට හේතුව දැන් අපි ඒ රටක් වලින් තොරතුරු ඒ කියන්නේ එක විදියට අපිට ගන්න බැහැ. අපි ඉස්සෙල්ල ම MoUs වලට අත්සන් කරන්න ඕන. සමහර රටවල් තොරතුරු අපිට එහෙම දෙන්නේ නැහැ. දැන් විශේෂයෙන් ම අපි ඉන්දියාවත් එක්ක ගත්තොත් අපි ගොඩාක් කිට්ටුයි ඒ ගොල්ලො යම්කිසි ක්‍රමවේදයක් අනුගමනය කරනවා. ඉතින් අනුගමනය කරන ක්‍රමවේදය අනුව අපි security system establish කරලා තියෙනවා. දැන් මගේ බුද්ධි සේවාව ගත්තොත් මම රටවල් 8 ක රහස්‍ය තොරතුරු මාරු කරන්න පුළුවන් විදියට security system එකක් තියෙනවා. එතකොට සමහර රටවල් වල එහෙම security system එකක් නැහැ. තවත් සමහර රටවල් ඒ ගොල්ලෝ මොන තොරතුරු තිබ්බත් ඒ ගොල්ලෝ කියන්නේ ඒ ගොල්ලන්ට එවන්න බැහැ දුරකථනයෙන් කියන්න බැහැ. SMS එකක් මගින් එවන්න බැහැ. ඊමේල් එකෙන් එවන්න බැහැ. අපි අනිවාර්යෙන් ම මේ තොරතුරු ලබා දෙන්නේ එතැන ඉන්න Defense Attachéට එතකොට Defense Attachéට තොරතුරු ලබා දීම Defense Attaché සාමාන්‍ය ක්‍රමානුකූලව Foreign Ministry එකට ඇවිල්ලා seal envelop එකෙන් අපිට එනවා. ඉතින් ඒ වගේ වෙනවා. ඒ වගේ දේවල් අපිට වෙනස් කරන්න බැහැ ස්වාමීනි. මොකද ඒ රටවල් වලට ආවේණිකව තමයි වේලා තියෙන්නේ. ඉතින් ඒවා තමයි අපි විශේෂයෙන් ම බුද්ධි අංශයක් හැටියට අපි ඒ රටවල් එක්ක සම්බන්ධ වෙලා අපේ priorities තීරණය කරගෙන, අපේ MoUs අත්සන් කරලා අපිට ක්‍රමවේදයන් අපි යොදවා ගන්නවා අපිට අවශ්‍ය කරන තොරතුරු ලබා ගන්න.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: බුද්ධි සේවාවේ දී තිබෙනව ද reliable, highly reliable, not so reliable and to be confirmed කියන වර්ගීකරණයක්?

උ: ඔබ නිවැරදි.

ප්‍ර: එම වර්ගීකණය සහ ඔබ දැන් මීට පෙර සාක්ෂි දීමේ දී කියපු වර්ගිකරණය අතර වෙනසක් තියෙනව ද නැත්නම් ඒ දෙකම එකක් ද?

FAIR COMMENT BY JEZEEM

උ: මම කලින් කියපු ශ්‍රී ලංකිය වර්ගීකරණය එක වර්ගිකරණයක් තියෙනවා. අපි සියළුම බුද්ධි අංශ ඒ එකක්.

ප්‍ර: එතකොට මේ සෑම බුද්ධි තොරතුරක් ම reliable, highly reliable, not so reliable සහ to be Confirmed කියන වර්ගීකරණයට යටත් කරනව ද?

උ: සියළුම තොරතුරු යටත් විය යුතුයි. නමුත් මම practically මේක කොච්චර දුරක් වෙනව ද කියන්න මම දන්නේ නැහැ ස්වාමීනි. නමුත් මේක අපි Basic Intelligence Course එකේදි මේක අනිවාර්යෙන්ම මේක ඒ වර්ගීකරණය වෙනවා. ඔබතුමා හරි ඒ කියපු දේ. ඒ විදියටම ඒක විය යුතුයි. ඒක වෙනවා. සමහර අවස්ථා දි නොවන අවස්ථා තියෙන්න පුළුවන්. ඒ ඒ intelligence agencies වල professionalism එක අනුව.

ප්‍ර: එතකොට විදේශ රට වලින් අපිට තොරතුරක් ලැබීමේ දී ලබා දෙන වර්ගිකරණය ඒ කියන්නේ ඔබේ ඉල්ලිම මත හෝ එම තොරතුර සමග විදේශ තොරතුරුකරු විසින් ලබා දෙන එම තොරතුරත් මෙම මා පෙර සඳහන් කරපු එකී වර්ගීකරණයට යටත් කරලා ද ලැබෙන්නේ?

උ: එතැන දි මම කිව්වා කලින් මම explain කරා. විවිධ රටවල විවිධ ක්‍රම අනුගමනය කරන්න පුළුවන්. නමුත් මෙතැනදි අපිට ඒ තොරතුරු වර්ගීකරණයක් අපිට ලක් කරන්න පුළුවන්. දැන් උදාහරණයක් වශයෙන් අපි කියමු එංගලන්තයෙන් අපිට තොරතුරු 5 ක් එවලා තියෙනවා රටේ විවිධ සිදුවීම් සම්බන්ධයෙන්.ඒ පළමුවෙනි තොරතුර ඇවිල්ලා තියෙනවා අපි තොරතුර නවත්වලා තියෙනවා එහෙම සිදු වීමක් වෙලා තියෙනවා. දෙවැනි තොරතුර එහමෙ වෙලා තියෙනවා. 3 වෙනි තොරතුර මුකුත්ම වෙලා නැහැ. 4 වෙනි තොරතුර වෙලා තියෙනවා. ඒ අනුව අපිට ඇත්තටම එංගලන්තයෙන් ඇසීමට අවශ්‍ය නැහැ. මොකද එංගන්තයේ file එක ගත්තම ඒක අනුව අපි දන්නවා මේ රටේ මේ තොරතුරු ආවොත් 5 න් තොරතුරු 4 ක් ම මේක ground එකේ වෙලා තියෙනවා. ඒක නිසා අපි automatically අනිවාර්යෙන් ම අපි react කරන්නේ මේක අර අපේ තියෙන grading එක අනුව මේක B2 කියන එකයි. දැන් විශේෂයෙන්ම ස්වාමිනි මට තත්පරයක් දෙනව නම් මට මේක තව පොඩ්ඩක් explain කරන්න. එක sentence එකකින්. විශේෂයෙන්ම මේ grading එක මේවා හදලා තියෙන්නේ ඇවිල්ලා අර තොරතුරු සාමාන්‍ය තොරතුරු Intelligence වලට convert කරලා අපි බුද්ධි නිලධාරීන් විය යුතු assessment එක කරලා අපි හරි තොරතුර උඩට ලබා දෙන්න Intelligence හැටියට. ඉතින් අපි මේ process එක තමයි අපි එංගලන්තේ කරත් ඇමරිකාව කරත් ශ්‍රී ලංකාව කරත් අපි කළ යුත්තේ.

FAIR COMMENT BY JEZEEM

අපි මේක යම් කිසි දේකට standalization එකට ලක් කර යුතුයි, ඉගැන්විය යුතුයි කියන පදනම මත තමයි ඔය grading එක හැදිලා තියෙන්නේ source සහ තොරතුර අනුව.

ප්‍ර: දැන් ඔබ මේ සාක්ෂි දෙන්නේ බුද්ධි තොරතුරු වර්ගිකරණය ද නැත්නම් තොරතුරක සාමාන්‍ය තොරතුරක වර්ගිකරණයක ද?

උ: ඔව් මම නැවත වරක් මම කිව්වා තොරතුර කිව්වම it's a big scope. Anything, anything is තොරතුර Information එකක්. බුද්ධි තොරතුරක් කියන්නේ it has to do with some intelligence.

ප්‍ර: ඒ කියන්නේ එය බුද්ධිමය තොරතුරක්?

උ: ඔව්. ඒක වෙන්න ඕනේ තොරතුර තමයි අපි කියමු දැන් මෙහෙන් කවුරු හරි පුද්ගලයෙක් මෙතැනින් එළියට යනවා. යාම ඇවිල්ලා තොරතුරක්. නමුත් මේ පුද්ගලයා යාම තුළින් අපි දකිනවා මේ පුද්ගලයා අර room එකට යන පුද්ගලයෙක් නෙමේ. එතකොට මේක බුද්ධිමය තොරතුරකට එනවා. ඒ විදියට අපි ඒ තොරතුර ඒ පුද්ගලයාගේ තියෙන හැකියාව අනුව තමයි ඒක අපි හැම තිස්සෙ ම අපි මේව කරන්නේ.

ප්‍ර: දැන් ඔබ කියා සිටියා වර්ගීකරණයක් ලැබී නොමැති නම් ඔබ උදාහරණයක් සමග කියා සිටියා වර්ගීකරණයක් ඉල්ලා සිටින්න පුළුවන් කියලා අදාළ විදේශ රටින්. දැන් එහෙම ඉල්ලා සිටියම ඒ තොරතුරට අදාළ ව වර්ගීකරණය ලබා දෙන්න කියලා ඉල්ලා සිටියම ඒ වර්ගීකරණය ලැබෙන්න කොච්චර වගේ කාලයක් ඔබට සාමාන්‍යයෙන් අනෙකුත් පාර්ශවයන් ලබා ගන්නවද?

උ: ඔව් ඇත්තටම මම කිව්වා දැන් රාජ්‍ය බුද්ධි සේවාව හැටියට අපි රටවල් 8 ක් එක්ක දිගටම secure communication තියෙන්න ඕන ඕන වේලාවක දැන් වුණත් ටක් ගාලා කතා කරලා අපිට ඒක clarify කර ගන්න පුළුවන්. නමුත් ඒ තොරතුර ඇවිල්ලා තියෙන්නේ වෙනත් රටකින් නම් ඒ තොරතුර අපිට ඒ system එකෙන් අපිට system එකක් නැති නිසා අපිට එහෙම ක්‍රමවේදයක් නැහැ.

****

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඔබ ඔය කරපු ප්‍රකාශය හින්දා සහ කොමිෂන් සභාවේ කාර්ය භාර්ය හින්දා මේ ප්‍රශ්නය අහන්නම ඕන. ඔබගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. ඉන්දියාව සමඟ ඔය secure communication එක තියෙනවද? ඔය කියපු රටවල් 8 ට ඉන්දියාව වැටෙනව ද?

උ: ස්වාමිනි ඇත්තටම මං මේකට හරි පිළිතුරක් ලබා දෙන්න මට හෙට ඔබ දෙනවා නම් මොකද හේතුව මම හරි පිළිතුරක් ලබා දෙන්න ඕන.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: ඔබ දන්නවා අපි ඇයි ඔය ප්‍රශ්නේ අහන්නේ කියලා?

උ: මං දන්නවා ස්වාමිනි. මට හරියටම ඒක හෙට අවසර දෙනව නම් ස්වාමිනි මට හෙට මේ සභාවට ලබා දෙන්න පුළුවන්.මට මතකයි. අපිට තියෙනවා රටවල් නමුත් මොකද ඉන්දියාවත් එක්ක direct communication තියෙනව ද කියන ස්වාමිනි මට හෙට වෙන කොට ලබා දෙන්න පුළුවන්.

ප්‍ර: හෙට වෙනකොට කියන්නේ ඔබ ඒක අපිට කොමිෂන් සභාවට දෙන්න ඕනේ සාක්ෂි පිට. ඒක හින්දා ඔබට ආපහු කැඳවීමක් කරන්න වෙනවා හෙට එහෙම නම්. නැත්නම් අපි මෙහෙම කරන්න පුළුවන්. අපි දැන් කොහොමත් Tea Break එකක් තියෙනවා. ඒ අවස්ථාවේ දි ඔබට check කරලා කරන්න පුළුවන් ද?

උ: පුළුවන් ස්වාමිනි.

ප්‍ර: ඉන්දියාව ගැන තමයි අපිට අවශ්‍ය.

උ: ස්වාමිනි ඒ එක්කම අපිට ඉන්දියාව සමග ගනුදෙනු කරනකොට ඇත්තටම secure communication එකකුත් අවශ්‍ය නැහැ. මොකද මේ රටේ ඒ ඉන්දියාවේ ප්‍රධාන බුද්ධි ප්‍රධානි දෙන්නම මේ රටේ ඉන්නවා. ඉතින් අපිට ඊට වැඩිය මොකද ඒ ගොඩාක් තොරතුරු ලැබෙන්නේ අපිට ඒ ගොල්ලන්ගෙන්. විශේෂයෙන් ම secure communication එක පාවිච්චි කරන්නේ අපි විශේෂයෙන් ම අපිට Agentවරු නැති අවස්ථාවක පමණයි. මොකද මේ රටේ ඉන්නව නම් ඒ අදාළ බුද්ධි සේවා වල නියෝජිතයෝ ඇත්තටම secure communication එකක් අවශ්‍ය වෙන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: මං ඒ ප්‍රශ්නේ පස්ස වේලාවක අහන්න හිටියේ. දැන් ඔබ දුන්නු හින්දා පිළිතුර ඒකත් ප්‍රශ්නයක් වෙන්න තිබ්බා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: ඒ කියන්නේ ඉන්දියාවේ තිබෙන ඒ බුද්ධි අංශ දෙකක නියෝජිතයන් ලංකාවේ ඉන්නවා කියල ද ඔබ කියන්නේ?

උ: ඔබ හරි ස්වාමිනි.

ප්‍ර: දැන් මෙම නියෝජිතයින් මෙම ආයතන දෙකේ නියෝජිතයින් ලංකාවේ සිටින්නේ **2019/04/21**න් පසුව ද එහෙම නැත්නම් ඊට පෙර සිට ඉන්නව ද?

උ: මං බුද්ධි අධ්‍යක්ෂක ලෙස ඉන්න කොට ඒ කියන්නේ යුධ හමුදා බුද්ධි අංශයේ ඉන්දෙද්දි ගොඩාක් රටවල මේ රටේ ඉන්නවා. ඉන්දියාව, ඕස්ට්‍රේලියාව ඒ ආදි ගණනාවක අපි හැම සතියේ ම අපි හමුවීම් කරනවා.

FAIR COMMENT BY JEZEEM

priority කරනවා.හමුවීම් කරනවා. ඉතින් ඒක ලෝකයේ පිලිගත්ත විශේෂයෙන් ම ඉතින් ඉන්දියාව අපේ ළඟම රට. ගොඩක් අපිට මේව තියෙනවා. ඉතින් අපි මේ සබඳතාවය බුද්ධි සබඳතා කියන්නේ සෑහෙන්න කාලයකට යනවා. ඒ නියෝජිතවරුන් ලංකාවේ ඉන්නවා.

ප්‍ර: **2019/04/21** න් පසුව පැමිණි නියෝජිතයින් නෙමෙයි කියලා ඔබ කියන්නේ ?

උ: මං දැනුවත්ව මගේ ජීවිත කාලයම මම ඒ ගොල්ලෝ එක්ක move වෙලා තියෙනවා. ලංකාවේ ඉන්න නියෝජිතයොත් එක්ක.

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ප්‍රශ්නය ඒ එක් එක් නියෝජිතයින් ගැන නෙමෙයි. ඒ රටේ ඒ වගේ ක්‍රමවේදයක් **2015** ඔබ වෙනත් තනතුරකට යන කොට තිබ්බ ද කියන එකයි?

උ: ස්වාමිනි ඔබ හරි. මම **2012** දි බුද්ධි අධ්‍යක්ෂක හැටියට මම ඉන්දැද්දි ඔය ගොඩාක් රටවල ඉන්දියාව ඇතුළුව ඒ ප්‍රධානින් ලංකාවේ නියෝජිතයින් ඒ රට ඒ ඒ බුද්ධි සේවාව නියෝජනය කරන බලධාරින් ලංකාවේ ඉන්නවා.

ප්‍ර: ඉන්න පුද්ගලයා වෙනස් වෙන්න පුළුවන්. නමුත් ඒ තනතුර ඔබ දන්නා කාලයක ඉඳලා ලංකාවේ තියෙනවා?

උ: ඔව් ඒක තියෙනවා.

ප්‍ර: ඉන්දියාව ඔබ දන්නා කාලයක ඉඳලා ලංකාවේ ඒ තනතුර තියෙනවා?

උ: ඉන්දියාව තියෙනවා.

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: දැනටමත් තියෙනවා?

උ: දැනටත් තියෙනවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: ඒ අනුව ඉන්දියාවෙන් යම් තොරතුරක් එම නියෝජිතයන් සිටින රාජ්‍යයකින් එවැනි බුද්ධි තොරතුරක් ලැබිලා එහි තිබෙන විශ්වාසවන්ත භාවය ඔබට තහවුරු කරගන්න අවශ්‍ය විට ඔබ කරන්නේ එම නියෝජිතයින් ලංකාවේ සිටින නියෝජිතයින් සමග එය එම තොරතුරේ සත්‍යතාවය විමසා බැලීමද?

උ: ඔව්. ඔබ හරි. විශේෂයෙන් ම දැන් අපි කරන්නේ සාමාන්‍යයෙන් ටක්ගාලා තොරතුරක් මොනව හරි තියෙනව නම් ඒ රටක ඉන්දියාව වෙන්න පුළුවන්. ඒ වේලාවේ කෝල් එකක් දාලා කියනවා හමුවීමක්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කරන්න ඕන කියලා. ඒ අනුව අපි හමුවීම decide කරනවා කොහේද හමුවෙන්නේ කියලා. ඒ අනුව ඒ ලිපිත් එක්ක අපිත් එක්ක පැමිණෙනවා. අපි සාකච්ඡා කරනවා. සාකච්ඡා කරලා නැවත වරක් ඒක අපි එයාට තොරතුරු අපිට අවශ්‍ය තියෙනව නම් එහෙමයි clarification එකක් ඕන නම් එයාට දුන්නම එයා secure communication එක පාවිච්චි කරලා නැවත වරක් අපි හමු වීමක් කරනවා.

ප්‍ර: මේ අවස්ථාවේ දී ලේඛන කිහිපයක් පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා ස්වාමිනි. C4B ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා ස්වමිනි.

C4B සාක්ෂිකරුට පෙන්වයි.

ප්‍ර: මගේ පළමු ප්‍රශ්නය මේ C4B ලේඛනය සඳහන් කරුණු බුද්ධි තොරතුරක් ද නැත්නම් සාමාන්‍ය තොරතුරක් ද?

උ: මේක අනිවාර්යයෙන් බුද්ධි තොරතුරක්.

ප්‍ර: මෙම බුද්ධි තොරතුර ඇයි මෙම C4B බුද්ධි තොරතුරක් ලෙස ඔබ හඳුන්වන්නේ?

උ: ඔව්. විශේෂයෙන් ම මේ තොරතුර ගැන කතා කරනවා suicide attack එකක් ගැන. ඒ එක්කම සඳහන් කරනවා පුද්ගලයෝ ගැන. ඉතින් මේක අනිවාර්යෙන් ම මේක බුද්ධි තොරතුරක් . මේක නිකන් තොරතුරක් නෙමෙයි මේක බුද්ධි තොරතුරක්.

ප්‍ර: දැන් මෙම C4B වලට වර්ගීකරණයක් දෙනවා නම් මෙයට වර්ගීකරණයක් ලබා දී තිබෙනව ද?

උ: දැන් මට මේ කොළේ විතරයි තියෙන්නේ. මේක බැලුවම දැන් මේක මට අනිවාර්යෙන්ම මුලින්ම බලන්නේ මේක කවුද මට ලබා දුන්නේ කියලා. ලබා දෙන පුද්ගලයෙක් ඉන්න එපැයි. ඒ ලබා දෙන පුද්ගලයා අපි කියමු උදාහරණයක් වශයෙන් එංගලන්තය කියලා. එතකොට මං බලනවා එංගලන්තය මට ඒ වසරේ දි මීට කලින් ලබා දීලා තියෙන තොරතුරු මොනවද, එතකොට මං මේ විදියට මේක ඇවිල්ලා මේකට එන්න කලින් මට මේ සම්බන්ධව තොරතුරු ලබා දීලත් ඇති. ඊට අමතරව තව තොරතුරු ලබා දීලාත් ඇති . ඉතින් විශේෂයෙන් ම විදේශීය බුද්ධි රටකින් මේ වගේ තොරතුරක් එනකොට අපි සාමාන්‍යයෙන් අනිවාර්යෙන් ම grade එකක් දෙනවා. අපි විදේශීය බුද්ධි රටවල තොරතුරු ලබා ගන්න කොට අපි සාමාන්‍ය තොරතුරුක් අපි ලබා දෙන්නේ නැහැ. අපි හොඳටම විශ්ලේෂණය කරලා ඔක්කොම කරලා තමයි අපි ලබා දීමක් කරන්නේ. මොකද අපි දන්නවා ඒ තොරතුරු අපේ ආයතනයක් හැටියට අපි professionally ඒක ලබා දිය යුතුයි. ඉතින් ඒක නිසා එහෙම තොරතුරු පමණයි අපි ලබා දීමක් කරන්නේ. නැත්නම් අපි

FAIR COMMENT BY JEZEEM

task කරනවා මේ මේ විස්තර ටික අපිට ලබා දෙන්න කියලා. දැන් අපි කියමු

ප්‍ර: Task කරනවා මේ විස්තර ලබා දෙන්න කියලා. කාටද?

උ: ඒ තොරතුරු ලබා දුන්නු සංවිධානයට හෝ පුද්ගලයාට.

ප්‍ර: දැන් මෙම තොරතුර බුද්ධි තොරතුර ඉන්දියාවෙන් ලැබුණු නම් ඔබ ගන්න පියවර මොකද්ද?

උ: දැන් බලන්න බුද්ධි.

****

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ලැබුණ නම් ලංකාවේ තිබූ වර්ගීකරණය හැටියට ඒක මොකද්ද ඒක?

උ: දැන්

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: ඉන්දියාවෙන් මෙම තොරතුර ලැබෙනවා ඔබට ඒ අනුව මෙයට ඔබ මොන වගේ වර්ගීකරණයක් ද ලබා දෙන්නේ?

උ: උත්තර දෙකක් තියෙනවා ස්වාමිනි. එකක් ඇවිල්ලා මම මේ බුද්ධි සේවාවේ වසරක් හිටිය නම් මේ ආයතනයේ මොකද මේක එකපාරට එන්නේ නැහැ. මට කෙලින්ම මේක ඔළුවට එනවා මේක **1,2,3,4,** මේ **5** වෙනි එක කියන එක මට ඔළුවට එනවා කෙළින්ම Automatically පලවෙනි එක. ඔබතුමා අහන්නේ මම දැනුයි මේක දැනුයි මං මේක දකින්නේ. මේ තොරතුර. මම දැන් මේ තොරතුර ගත්තා මම අලුත් පුද්ගලයෙක්. එතකොට මම කරන්නේ එහෙම නම් මේකෙදි මම අර file එක ගෙන්න ගන්නවා. මේකේ file එක ගෙන්න ගෙන මම බලනවා මීට කලින් මොකද මේකේ අගක් මුලක් තියෙන්න ඕන. මීට කලින් මේකට සම්බන්ධ තොරතුරු එවලා තියෙනවා කියලා. ඒ අනුව අපි බලනවා A,B,C කියන තොරතුරු ඇවිල්ලා තියෙනවද කියලා. ඊට පස්සේ මම ඒක බලලා මේ තියෙන analysis එක අනුව මේකේ ගොඩාක් අපිට තව ගන්න පුළුවන් නම් විශේෂයෙන් ම දිනයක්, තව ගන්න පුළුවන් නම් අපිට දුරකථන මොකක් හරි මේකක් ඒ අනුව මම immediately මම එක පැත්තකින් මම immediately මම task කරනවා මොකද මේකේ තිබෙන බැරෑරුම්කම අනුව මම immediately මම task කරනවා meeting එකක් කැදවලා එක්කෝ දුරකථනයෙන් ඒක මේක අනුව එහෙම නැත්නම් ඊළඟ දවසේම එදාම හරි කතා කරලා මම source එකට මම කියනවා. එහෙම නැත්නම් රටේ ඉන්න නියෝජිතයාට කියනවා. මේක මට immediately මට අවශ්‍යයි. මේකේ මේන්න මේ තොරතුරු ටික ලබා

FAIR COMMENT — BY JEZEEM

දෙන්න. ඊට අමතරව මගේ ළඟ තොරතුරු මේක සම්බන්ධව තියෙනව නම් මම ඒ තොරතුරු ටිකක් ඒකට ලබා දෙනවා. මේ තොරතුරු ලබා දෙන ගමන් එක පැත්තකින් මම එහෙම කරන ගමන් මම ඒ තොරතුරු ටික මං මගේ පහළට direction, collection, procession කියන එකට මගේ පහලට ලබා දීමක් කරනවා. ඒ ලබා දීමේ දි මට අහන්න ඕන ප්‍රශ්න ටික මේ සහරාන්ලා මෙහෙම ගියාම මේකේ මේ තොරතුරු ආවම හැම එකක්ම අපි LU කරනවා. ඒ කියන්නේ

ප්‍ර: මොකද්ද?

උ: LU කියලා කියනවා. ඒ කියන්නේ Look Up.

ප්‍ර: Look Up

උ: ඔව් එතකොට මේක අපේ බුද්ධි අංශයකම තියෙන register එකක්. ඒ register එක තමයි හදවත බුද්ධි අංශයක. ඒ හැම record එකක්ම ඒකේ තියෙනවා. ඉතින් අපි ගියාම සහරාන් කියන නම ආවම ටක් ගාලා ඒ record එක බැලුවම ඒ සහරාන්ට වෙන වෙනම file open වෙලා තියෙනව නම් record වෙලා තියෙනව නම් එයාගේ activity එක සඳහන් කරලා තියෙනව. මේ සියළු දේවල් ටික තියෙනවා. ඒ අනුව මට මේකෙන් අවබෝධයක් ගන්න බැරිනම් මම registry එකෙන් ඉස්සෙල්ලාම report එකක් ඉල්ලනවා මේ සහරාන් පිළිබඳව මේ පිළිබඳව මම ඉල්ලුව ම ඒ ගොල්ලෝ සම්පූර්ණයෙන් ම මට විස්තර වාර්තාවක් ලබා දෙනවා. ඒ එක්කම මම ground එකට immediately task කරනවා අනිත් පැත්තෙන් මට මේ අවශ්‍ය කරන තොරතුරු immediately මට ලබා දෙන්න කියලා. එතකොට ඒ එක්කම මේකේ තියෙන gravity එක අනුව මං යම්කිසි warning එකක් දෙනවා මේ තියෙන මේක අනුව අදාළ ඉහළ මූලස්ථාන වලට මේක මෙහෙම මෙහෙම.

ප්‍ර: මොනව ද ඉහළ මූලස්ථාන කියලා කියන්නේ?

උ: විශේෂයෙන් ම මම ඉන්නේ Director/SIS නම් මම මුලික දේ කරන දේ තමයි මම CNIට සහ Secretary/Defenceට immediately මං මේක දැනුම් දීමක් මම කරනවා. ඒ එක්කම මම යුධ හමුදා බුද්ධි අංශයට සහ ඒ ඒ ප්‍රදේශය ආවරණය කරන අනිකුත් බුද්ධි අංශ තියෙනව නම් මම ඒවටත් දැනුම් දීමක් කරනවා. මේ පිළිබඳ මෙහෙම එකක් තියෙනවා මට මේක පොඩ්ඩක් monitor කරලා මොනවහරි development තියෙන්න කියන එක. ඊට අමතරව මේ තොරතුර විශේෂයෙන් මම අපි මං අර කිව්වා process එකේ තියෙනවා අපි හැම තොරතුරක් ම දැන් මම නිලධාරියෙක් හැටියට හැම සදුදාම meeting දෙකකට යනවා. Coordinating meeting දෙකකට. එකක් ඇවිල්ලා පොලිසියේ සදුදා

FAIR COMMENT BY JEZEEM

උදේ 9.30 ට තියෙනවා එකක්. ඒ එක්කම යනවා සදුදා 2.00 ට තියෙනවා ආරක්ෂක අමාත්‍යාංශයේ Intelligence Coordinating Meeting එක එතැනදි අපි Power Point slide presentation එකක් ඉදිරිපත් කරන්න ඕන. එතැනදි අපේ රටට එන තොරතුරු රටට එන තර්ජන 5 ක් අපි හඳුනාගෙන තියෙනවා. 4 ක් වෙන්න පුළුවන්. ඒ තර්ජන 4 ට අදාළ තොරතුරු ටික මම දාන්න ඕන. ඒ තොරතුරු දාලා මම ඒ තොරතුරු මගේ assessment එක මම කියන්න ඕන. මෙන්න මේ සතියේ මෙන්න මේ මේ ටිකයි. මේ අනුව මම දකින දේ මෙහෙමයි කියන එක. ඒ එක්කම මම එතැනින් එහාටත් යනවා. මේ ඔක්කොම analyze කරහම අපිට කළ යුතු ක්‍රියා මාර්ගයක් එකක් අපි සදහන් කරනවා. මේ කරන එක ඇවිල්ලා රාජකාරිය ඇවිල්ලා ඉහළ මූලස්ථාන වල. නමුත් මේක තමයි කළ යුත්තේ කියන එක. ඉතින් මම නැවත හඳුන්වා දීමක් චුට්ටක් කරොත් බුද්ධි නිලධාරියෙක් හැටියට එක එක නිලධාරියෙක් ට වෙනස්. නමුත් මම නිලධාරියෙක් හැටියට මා හැම තිස්සේ ම බලාපොරොත්තු වෙන්නේ යම් කිසි දෙයක් ආවයින් පස්සේ දැන් මේකෙ තියෙන්නේ බැරෑරුම් කම වටිනාකම ඔය grading හැම ප්‍රශ්නයක් ම මගෙන් ඇහුවේ මමයි මේක ගන්නේ. සාමාන්‍ය පුද්ගලයෙක් මේකේ තියෙන grading එකේ වටිනාකමක් දන්නේ නැහැ. එතකොට මම මුලින්ම මම කළ යුත්තේ මේක දැක්ක ගමන් මම මගේ තියෙන experience එක අනුව මේ වගේ ආයතනයක් නම් මේ වගේ තොරතුරක් නම් මම මේක මට අමුතුවෙන් grading කරන්න මට question කරන්න දෙයක් නැහැ. එතකොට මං මේක දන්නවා මේක ඉතාමත් ම බැරෑරුම් දෙයක් කියලා මගේ මූලික දේ වෙන්නේ මං මේක අනිවාර්යෙන් ම මම මේක නවත්වන්න. ඕන ඒ නැවැත්වීම ම ඇවිල්ලා අපි විශේෂයෙන්ම මේකේ තියෙනවා. Target කරලා.

වේලාව: ප.ව. 3.30
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.3.30
පෙර සටහන් ල/ලේ: සවිනි මෙනවිය.
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා

ප්‍ර: ඔබ එතෙන්ට යන්න ප්‍රථමයෙන්ම මේ මා කතා කලේ බුද්ධි තොරතුරුකට ඔබ ගන්නා ක්‍රියාමාර්ගය. මෙම C - 4 (B) කියන ලේඛනය අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි විසින් යොමු කරනු ලබන ලේඛනයක් නම් මෙය අනිවාර්යයෙන්ම සත්‍ය බුද්ධි තොරතුරුක් තේරුණාද මං කියපු එක. මෙන්න මෙම සත්‍ය තොරතුර අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි වෙත ලැබුණාම අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි වශයෙන් ගත යුතු පියවර කඩිනම් ද නොපමාව ද නැත්තම් එහෙම පියවරවල් තියෙනවාද? තියෙනවානම් ඒක විස්තර කරන්න.

පි: දැන් විශේෂයෙන්ම ඒ පියවරවල් ගැනීම පුද්ගලයා අනුව වෙනස් වෙනවා ස්වාමීනි. මොකද හේතුව දැන් මම යුධ හමුදා බුද්ධි අංශ නිලධාරියෙක් නිසා ඒකේ ඉන්නවා සාමාන්‍යයෙන් 4000කට විතර ඒගොල්ලන් ගොඩාක් දුරට අපි යන්නේ Preventive measure එකට. ඒ කියන්නේ විශේෂයෙන්ම අපිට පුළුවන් contact intelligence කරන්න. මොක ද අපේ ground එකේ ලොකු access එකක් තියෙනවා අපිට. එතකොට අපි හැමතිස්සේම බලන්නේ incident එකක් වෙන්න කළින් ඒ incident එක නවත්වන්න. ඉතින් ඒ අනුව මම ක්‍රියා කරන විදිහ වෙනස්. නමුත් බුද්ධි අධ්‍යක්ෂක හැටියට මෙතන ගැටලුවක් තියෙනවා මොකද මේ ආයතනය ගොඩාක් දුරට මේක analysis and assessment ආයතනයක්. Ground එකේ army එකේ වගේ ලොකු deployment එකක් නැහැ. සාමාන්‍ය සංඛ්‍යාව ගත්තහොත් 1300ක් වගේ තමයි ප්‍රමාණයක් ඉන්නේ. ඉතින් එතකොට මම මෙතන දී මම DMI හැටියට ගන්න ක්‍රියා මාර්ගයයි SIS හැටියට ගන්න ක්‍රියා මාර්ගයයි ක්‍රියාමාර්ග 2ක්. මම DMI හැටියට ගන්නවානම් මම ක්‍රියා මාර්ගය immediately ගන්න ක්‍රියා මාර්ගය මූලික වශයෙන්ම මේ වගේ තොරතුරක් ඇත්තටම පිටරටකින් දෙනකම් අපිට එහෙම වෙන්නේ නැහැ කියලා මම හිතනවා ස්වාමීනි. මොක ද අපේ රටේ තියෙන බුද්ධි අංශය සහ අපේ තියෙන Contacts අපේ මේ තියෙන training එකයි ඔක්කෝම බැලුවාම මෙච්චර දුරට develop වෙන්න බැහැ තොරතුරක් පිටරටකට දෙන්න බැහැ. මොක ද අපිට ඇවිල්ලා කියන්න අවුරුදු 30 ක යුද්ධයක ඉතාමත් මීට වැඩිය ඉතාමත් sensitive දේවල් කරලා අපි පිටරටවලටත් තොරතුරු දීපු ආයතනයක්.

Provisional Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඉතින් ඒක නිසා මූලික වශයෙන්ම මේ වගේ දෙයක් එන්න නෑ මීට කළින්ම මේවා කැඩෙනවා.

ප්‍ර: Director SIS?

පි: Director SIS විදිහට බැලුවාහම ඇත්තටම SIS දැම්මාහම මට මේ තොරතුර ලැබුණොත් මම මූලික වශයෙන්ම immediately මම කරන දේ තමයි එකක් ඇවිල්ලා මූලික වශයෙන් මෙම තොරතුර ලබා දුන්න කට්ටියට මම immediately කියනවා මට අවශ්‍යයි ඉක්මනට මේ ගොල්ලන්ගේ දුරකතන අංකයක් තිබෙනවාද, මේකේ Date එකක් තිබෙනවාද, ඒ එක්කම මේ ගොල්ලන්ගේ වෙන මොනවාහරි අපිට තොරතුරක් වෙන්න පුළුවන් ද මේ තොරතුර develop කර ගන්නනම් අල්ල ගන්න කරන්න යම්කිසි lead එකක් දෙන්න පුළුවන් ද යන්න immediately මම ඒක කරනවා. අනිත් පැත්තෙන් මම මේක registry එකට යවලා LU එකක් කරනවා මේක පිළිබඳව සියලුම තොරතුරු මේ පුද්ගලයන් පිළිබඳ ඔක්කෝම තොරතුරු ටික මට දෙන්න කියලා. 3 වෙනි එක මම අනිත් පැත්තෙන් මම වගේ ඉන්න desk වලට මම කියනවා මේක immediately මේක තියනවා කරුණාකරලා මේ ටික මම ඉක්මනටම සොයා දීමක් කරන්න කියලා. 5 වෙනි පියවර හැටියට මේ තියෙන තොරතුරු අනුව හැම දෙයක්ම එන්න කළින් මම ඉහළ මුලස්ථානය හා Parallel Organization මම දැනුවත් කිරීමක් කරනවා. මෙහෙම දෙයක් වෙනවා පොඩ්ඩක් බලන්න ඔයගෝල්ලන්ගේ sources දාලා. අපිට මෙන්න මේ සහරාන් කියන පුද්ගලයා ඉතාමත් වැදගත් මේ තොරතුරු අනුව අනිත් පැත්තෙන් අදාළ ස්ථාන වලට මම කියනවා විශේෂයෙන්ම CNI ට අනිවාර්යයෙන්ම සහ ආරක්ෂක ලේකම්ට මෙන්න මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා මෙහෙම තව පොඩ්ඩක් මේවා කරන්න පුළුවන් විශේෂයෙන්ම මේකේ සඳහන් කරලා තිබෙනවානම් Indian High Commission එක ඒ වගේ ස්ථාන සඳහන් කරලා තිබ්බොත් ඒකේ නිලධාරින්ටත් මම කතා කරලා කියනවා මෙහෙම තොරතුරක් තියෙනවා Alert වෙලා ඉන්න අපි තව ඉස්සරහාට තව තොරතුරක් දෙන්නම් කියලා. හැබැයි මෙම තොරතුර දෙනකොටම අපි සාමාන්‍යයෙන්ම assessment එකක් කරන්න ඕනි. විශේෂයෙන්ම මගේ assessment එක මොකක් ද කියන එක. ඕනෑම තොරතුරක් මොන රටකින් ආවාත් මම comment හෝ assessment එක යටතේ මම කියනවා මේ තොරතුරු අනුව මම assess කරන situation එක මේකයි. මෙන්න මේකයි Level එක . දැනට investigation යනවා. හැබැයි මේ Precautions ගත යුතුයි කියලා මම සඳහන් කිරීමක් කරනවා.

FAIR COMMENT BY JEZEEM

ගරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර: ඔබ දැන් කරපු පැහැදිලි කිරීම මට ප්‍රශ්න 2ක් අවශ්‍යයි අහගන්න. ඔබ කියන හැටියට යම්කිසි තොරතුරක් බුද්ධි තොරතුරක් බවට පත්වෙන්න එහි යම්කිසි නිශ්චිත දිනයක් හෝ ස්ථානයක් සඳහන් වෙන්න අවශ්‍ය නැහැ?

පි: අවශ්‍ය නැහැ.

ප්‍ර: ඒක හරි ද?

පි: ඒක හරි.

ප්‍ර: දෙවැනියට ඔබ කිව්වා ඔබට C -4 (B) කියන ලේඛනය ලැබුණානම් ඔබ ආරක්ෂක ලේකම් සහ ජාතික බුද්ධි අංශ ප්‍රධානියාට හා ආරක්ෂක ලේකම්වරයාට දන්වනවා කියන එක?

පි: ඔබ හරි ස්වාමීනි.

ප්‍ර: එතකොට මගේ ප්‍රශ්නය C -4 (B) ලේඛනය විතරක් ඔබට තියනවානම් ඔබ ඒ පිළිබඳව දන්වන්නේ ඒ නිලධාරීන් දෙන්නාට පමණ ද?

පි: නැත ස්වාමීනි. මම පැහැදිලි කිරීමක් කළා මගේ මම පත්වීම දෙනකොට විශේෂයෙන්ම මම Parallel බුද්ධි අංශ වලටත් මම දැනුම් දීමක් කරනවා විශේෂයෙන්ම මට වැඩිය Access තියනවා DMIට. DMIට Ground Sources තියෙනවා. ඉතින් මේකේ තොරතුරු ගත්තාහම මේකේ භායනක තොරතුරක්. ඉතින් අනිවාර්යෙන්ම ඒක කරන ගමන් මම අනිත් පැත්තෙන් මම කතා කරලා කියනවා මෙහෙම දෙයක් තියෙනවා immediately ඔයා Fail වුණත් මම Fail වුණත් කවුරු Fail වුණත් රට Fail වෙනවා. ඉතින් ඒක නිසා ඒක කියනවා.

ප්‍ර: මම හිතන්නේ මම ප්‍රශ්නේ හරියට ඇහුවේ නැහැ. මගේ ප්‍රශ්නය හරියට වෙන්න ඕනි ඒ ආරක්ෂක ලේකම් සහ ජාතික බුද්ධි අංශ ප්‍රධානියා ඇරෙන්න ඊට ඉහළින් ඉන්න රජයේ නිලධාරියෙකුට ඔබ දන්වනවා ද? C -4 (B) ලේඛනය විතරක් ඔබට තිබ්බානම්?

පි: ස්වාමීනි ඒ මගේ නම් මම ජනාධිපතිතුමාට දැනුම් දීමක් කරනවා මගේ හැටියට. මම දන්නේ නැහැ ඉහළ නිලධාරීන්, අනිත් නිලධාරීන් කොහොමද කෙරෙන්නේ කියලා මොක ද මට වගකීමක් තියෙනවා ඒක දැනුම් දීමක් කරන්න.

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

ප්‍ර: ආරක්ෂක කවුන්සිලයට දැනුම් දෙනවද?

පි: ආරක්ෂක කවුන්සිලයේ ස්වාමීනි විශේෂයෙන්ම ආරක්ෂක කවුන්සිලය රැස් වෙන්නේ සතියකට එක සැරයයි. අනිවාර්යයෙන්ම මේක මේ අර MOD Coordinating meeting එක හා ආරක්ෂක කවුන්සිලය

FAIR COMMENT BY JEZEEM

අනිවාර්යයෙන්ම මේක දැනුම් දීමක් කරනවා. Assessment එකත් එක්ක.

ප්‍ර: ඒ තොරතුරු දැනගත්ත ගමන්ම සතියක් ඇතුළත ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම තියෙන්න ඕනි නේද?

පි: ඔව්. එතකොට විශේෂයෙන්ම ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම් තියෙන එක තීරණය කරන්නේ ජනාධිපති තුමා. ජනාධිපති තුමා විශේෂයෙන්ම මේ වගේ දෙයක් මේවා වෙනකොට අපිට ආරක්ෂක මණ්ඩලයේ රැස්වීමක් වෙනකම් ඉන්නේ නැහැ ස්වාමිනි මොකද විශේෂයෙන්ම මේක ගත්තාහම මේ ලොකු ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන් ගැටලුවක්. එතකොට immediately මේක දෙකට කියන ගමන් මමනම් මට තියෙන මේක අනුව අනිවාර්යයෙන්ම මම ජනාධිපතිතුමාට දැනුම් දීමක් කරනවා. ඒ එක්කම අනිත් පැත්තෙන් බලනවා මේකට ගත්ත ක්‍රියා මාර්ග හරියට අරන් තියෙනවාද නැද්ද කියලා ඒකත් නැත්තම් ඒකත්

<u>ගරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඒ ටික ඔබ විස්තර කෙරුවා. තව එක ප්‍රශ්නයක් තියෙනවා. ඔබ මීට කළින් හිටියානේ රාජ්‍ය බුද්ධි අංශය නැත්තම් Director Military Intelligence විතර ද හිටියේ?

පි: රාජ්‍ය බුද්ධි අංශයේ හිටියේ නැහැ ස්වාමිනි. ..

ප්‍ර: හරි. ඔබ Director Military Intelligence ඉන්න කාලේ ඔබට මේ පිළිබඳව පුද්ගලික දැනුමක් තියෙනවානම් කියන්න. එවකට රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානියා වගකිව්වේ කාට ද? Report කෙරුවේ directly කාට ද ඒ කාලේ ?

පි: මම ස්වාමිනි ඒකට මට පැහැදිලි උත්තරයක් දෙන්න අපහසුයි ස්වාමිනි. මොකද හේතුව SIS Director ඇවිල්ලා ඒකත් බොහොම Intelligence very sensitive මගේ පැත්තෙන් මම බුද්ධි අධ්‍යක්ෂක ලෙස සිටියාත් සමහර විට ඒක තියෙන අනුව සමහර වෙලාවට එවකට හිටපු ජනාධිපතිතුමානම් මම මේවා කළේ නැහැ. නමුත් කළින් අවස්ථා වල දී මේ වගේ threat එකක් එනකොට ඉහළ මුලස්ථානයට මම දැනුම් දීමක් කරනවා ඒ threat ස්වභාවය අනුව.

<u>ගරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: ඔබ ජාතික බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා ලෙස ජනාධිපතිතුමාට මෙවැනි තොරතුරක් ලැබුණොත් ඔබ වාර්තා කරනවා කියලා ප්‍රකාශ කරා නේද?

පි: ඔව් රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂක ලෙස.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ කිසිම අවස්ථාවක ජනාධිපති ලේකම්වරයාට දන්වන්නේ නැද්ද මේ වගේ තොරතුරක් ලැබුණහාම? ජනාධිපතිතුමා ළඟට ජනාධිපති ලේකම්ට දන්වනවා ද?

පි: නැහැ ස්වාමීනි. නැහැ ජනාධිපති ලේකම් කිසිම දේකට බුද්ධි මේවා වල දී සම්බන්ධ වීමක් වෙන්නේ නැහැ. Security Council එකේ ඉන්න එක පමණයි. එතුමා කිසි දේකට සම්බන්ධ වීමක් සිදු වෙන්නේ නැහැ.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: මෙම C -4 (B) ඔබගේ වාර්තාවක් ඒ කියන්නේ අධ්‍යක්ෂක SIS. රාජ්‍ය බුද්ධි නම් ඒ කියන්නේ මෙම තොරතුර සත්‍ය තොරතුරක් අනිවාර්යයෙන්ම මෙවැනි පිපිරීමක් සිදු වෙන්න යනවා. මෙය ඔබගේ වාර්තාවනම් C -4 (B) ඔබගේ වාර්තාව නම් ඔබගේ සොයා ගැනීමනම් මොකක් ද ඔබ ගන්න ක්‍රියා මාර්ගය? පෙර සඳහන් කරපු ක්‍රියාමාර්ගයම ද නැත්තම් ඊට වඩා වෙනස් ද?

පි: විශේෂයෙන්ම මමනම් මගේ වාර්තාවක් හෝ ඒවාගේම පිටින් වාර්තාව ආවාත් threat එක එකයි. මොක ද මේක විශේෂයෙන්ම මේක පිටරටකින්නම් ආවේ.

ප්‍ර: This is your report after the assessment and these are your findings as Director SIS?

පි: yes

ප්‍ර: what are you going to do ? Are you going to do the same thing or not? Your action?

පි: my action will be more or less the same because I will have a more investigative power because if I..

ප්‍ර: ඔබ විමර්ශනය සිදු කරලා මේ ලබා ගත් තොරතුර තමයි මේ තියෙන්නේ?

පි: ඔව්.

ප්‍ර: මෙය ස්ථිර කරන ලද තොරතුරක් ?

පි: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ මෙහෙම දෙයක් වෙනවා මෙයා ගහන්න යන්නේ මේ ඔක්කෝම නිවැරදියි?

පි: ඔව්.

ප්‍ර: එසේනම් ඔබ ගන්න ක්‍රියා පිළිවෙත ඔබ පෙර සඳහන් කළ ක්‍රියා පිළිවෙතට වෙනස් වෙනව ද නැද්ද?

පි: ඇත්තම කියනවානම් ලොකු වෙනසක් නම් වෙන්න බැහැ මොක ද හේතුව ඒක reason එක මම කිව්වා. ඒක මේක බැලුවම threat එකක්

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඉතාමත්ම පැහැදිලියි. ඒක ඉතින් මගේ තොරතුරක් හෝ පිට තොරතුරක් නෙමෙයි. මේක රටකින් ඇවිල්ලා තියෙන තොරතුරක්නම් අනිවාර්යයෙන්ම මේකේ දී මිනිස් ඝාතනයක් සිදු වෙන්න පුළුවන්. එතන දී මං විශේෂයෙන්ම මගේ තොරතුරකට වැඩිය මෙතන වැදගත් වෙන්නේ මම නොදන්න තොරතුරක් මේ තොරතුර ලබා දීම පිළිබඳව ඊට වැඩිය මම Precautions ගන්න ඕනි. ඉතින් ඒක නිසා මම එතනදී ලොකු වෙනසක් ඇති වෙන්නේ නැහැ. ඒ ක්‍රියා මාර්ගය දෙකම එකයි.

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: කිසිවෙකුට සාක්ෂිකරු මෙම තොරතුර ස්ථිර තොරතුරක් නෙවෙයි කියලා කියන්න පුළුවන් ද? බුද්ධි ප්‍රධානියෙකුට මෙම තොරතුර තහවුරු නොවූ තොරතුරක් කියලා කියන්න පුළුවන් ද?

පි: එහෙම කියන්න හැකියාව තියෙන්නේ කරුණු 2ක් මත. එකක් ඇවිල්ලා මේක Casual Source එකකින් එකෙන් ඇවිල්ලා තියෙනවානම්. ඒ කියන්නේ මීට කළින් මේ Source එක තොරතුරු ලබා දීලා නැත්තම් මේක නිකන් අර පාරේ යන කොළ කෑල්ලක් අහුලා ගත්තානම් එහෙම නැත්තම් හිටපු ගමන් එක්කෙනෙක් ඇවිල්ලා කියනවා සර් මෙහෙම ලොකු attack එකක් තියෙනවා කිව්වානම් ඒක තහවුරු නොකරන ලද තොරතුරක්. නමුත් පිළිගත්ත ආයතනයකින් agent කෙනෙක්ගෙන් එනවානම් ඒක තහවුරු නොකරන ලද තොරතුරුක් කියලා කියන්න බැහැ.

ප්‍ර: එම තොරතුර ලැබුණේ මොන ආයතනයෙන් ද කියලා තමන්ගේ බුද්ධි අංශයේ තොරතුරේ සමඟ ඒ File එකේ සඳහන් වෙනවා ද?

පි: ස්වාමිනි අනිවාර්යෙන්ම documentation එක 100%ක්ම බුද්ධි අංශ වල වෙනවා. ඕනෑම තොරතුරක් ඕනෑම කෙනෙක් ආවාත් ඒ හැමදෙයක්ම සඳහන් වෙනවා ඒක තමයි ස්වාමිනි මම කළින් කිව්වේ registration එක ඇවිල්ලා බුද්ධි මේකේ හදවත. මේ සියලු දෙයක්ම ඒ කියන්නේ අපි මේ document එකක් එළියට දුන්නත් ඒක පවා මම File එකක් ඉල්ලුවාත් ඒ File එකේ Movement එක පවා මේවා වෙනවා. හැම incident එකක්ම, හැම location එකක්ම, එතකොට හැම එකක්ම ඒ register එකේ වෙනවා. අපිට පුළුවන් ඒ නම ගැහුවාම ඒ සියලු තොරතුරු පරිගණකයෙන් අපිට ලබා ගන්න හැකියාව තියෙනවා.

ප්‍ර: තමන් දැන් බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා. දැනට මෙම අංශයේ අධ්‍යක්ෂකවරයා?

පි: ඔව් ස්වාමිනි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: තමන් පත්වුණයින් පස්සේ තමන් මෙම තොරතුරු සම්බන්ධව පසු විපරමක් කළා ද? බැලුව ද සොයලා File එක බැලුවාද ?

පි: ඔව් ස්වාමිනි සාමාන්‍යයෙන් අපේ සාම්ප්‍රදායක් හැටියට මම භාරගන්න කොට හැම එකක්ම සාමාන්‍යයෙන් රතු ඉරක් ගහලා තමයි අපි පටන් ගන්නේ. ඒක තමයි අපිට කියලා දීලා තියෙන්නේ. මොක ද හේතුව මට කළින් හිටියාම මගේ කාලේ වෙච්ච සිදු වීමක් තියෙනවානම් මට පසුව කතා කළොත් මගේ කාලේ සිදුවීම ස්වාමිනි මට කියන්න පුළුවන් මොකද වුණේ කියලා. නමුත් මං දන්න සිදුවීම තව නිලධාරියෙකුට කියන්න බැහැ. ඉතින් එතකොට ඒක නිසා මම ප්‍රතිපත්තියක් හැටියට ස්වාමිනි මම ඉගෙන ගත්ත දේවල් හැටියට මම භාරගත්තේ 19 ඉඳන් ඒ සියලු දේවල් හැමදේටම මම සම්පූර්ණයෙන්ම වගකියනවා. නමුත් ඊට කළින් දේවල් වලට මම වගකීමට බැඳිලාත් නැහැ මම සාමාන්‍යයෙන් සොයන්න යන්නෙත් නැහැ ස්වාමිනි.

ප්‍ර: නැහැ වගකිමක් නෙවේ. මං කියන්නේ තව කරුණු දැන ගන්න මොකක් ද වුණේ කියලා කරුණු දැන ගන්න ඒ File එක බැලුව ද?

පි: ස්වාමිනි මම ඇත්තටම ස්වාමිනි බැලුවේ නැහැ.

ප්‍ර: ඒක මොකක් ද වුණේ මේ සිද්ධිය මොකක් ද මේ තොරතුර කොහොමද ආවේ ඊළඟට ඒ පිළිබඳ හිටපු අධ්‍යක්ෂකවරයා ගන්නා ලද පියවර මොනවා ද කියලා තමන් අධීක්ෂණය කිරීමක් කරාද?

පි: ස්වාමිනි මම ඒ විදිහට සාමාන්‍ය කෙනෙක් හැටියට මම අධීක්ෂණය කරා. ඒ කියන්නේ මෙතන දී යම්කිසි වරදක් සිදු වෙලා ඒ කියන්නේ යම් කිසි දෙයක් මෙතන gap එකක් තියෙනවා.

ප්‍ර: මොකද විශාල ප්‍රහාරයක් නේ?

පි: ඔව්.

ප්‍ර: එය සත්‍ය කරුණු හෙළි කරන්න ඕනිනේ අපි?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඔබ දැන් බුද්ධි අංශ ප්‍රධානියා?

පි: ඔව්.

ප්‍ර: මෙතන මොකක් ද සිදු වෙලා තියෙන්නේ කියලා ඔබ සොයලා බැලුව ද?

පි: ස්වාමිනි මම ඒ in detail සොයලා බැලුවේ නැහැ ස්වාමිනි. නමුත් මෙතන දී අර පැහැදිලිවම මම විශ්ලේෂණය කරපු විදිහට අනිකුත් තොරතුරු හා බුද්ධි මේක අනුව මේකේ ලොකු මුළු mechanism failure එකේම තියෙනවා ස්වාමිනි. ඒ කියන්නේ ඉදිරියේ දී මට කියන්න පුළුවන් මම දකිපු විදිහට තිබ්බ systems කොහොම ද මේවා වෙනස් වුණේ කොහොම ද සහරාන්ලා මේ තත්ත්වයට මොකද අපි මේ වගේ තොරතුරක් ලබා ගන්නාවට අපි ලැජ්ජා වෙන්න ඕනි ස්වාමිනි. මොක ද

President Secretariat
FAIR COMMENT BY JEZEEM

අපි මේ රටේ මෙච්චර බුද්ධි අංශයක් ඉන්නවානම්, මෙච්චර අපිට වෙන දෙයක් කරන්න නැහැ. අපිට තියෙන්නේ යුද්ධ කාලේ දී සහ සාම කාලේ දී අපිට ඔක්කෝම හැම දෙයක්ම දෙන්නේ තොරතුරු ලබා ගැනීම මේ හැම දෙයක්ම කරන්න. ඉතින් මෙහෙම තොරතුරක් අපි නොදැන අපි මුලින්ම ලැජ්ජා වෙන්න ඕනී මේක කොහොම ද ඉන්දියාව දැනගත්තේ කියන එක ලොකු ප්‍රශ්නයක් වෙනවා ස්වාමිනි. ඒක එකක් වෙනවා. 2 ඇවිල්ලා මෙතෙන්ට අපි එන්න අවශ්‍යතාවයක් නැහැ ස්වාමිනි. මේක අපි හරි Corrective measures ගත්තානම් 2015/2016 වසරේ දී.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා</u>

මා ඔබට පෙන්වා සිටිනවා C -4 (C) ලේඛනය.

ප්‍ර: මෙය රාජ්‍ය බුද්ධි සේවාව විසින් සකස් කරන ලද වාර්තාවක්? මෙම වාර්තාවේ C -4 (C) කියන වාර්තාවේ නිශ්චිතවම සඳහන් වෙනව ද ප්‍රහාරය එල්ල විය හැකි ස්ථාන සහ එල්ල කරන පුද්ගලයන් සම්බන්ධයෙන්?

පි: ස්වාමිනි විශේෂයෙන්ම මේ document එක බැලුවහම Specific නැහැ. But they give that they say that කතෝලික පල්ලි. ප්‍රසිද්ධ කතෝලික පල්ලි. ලංකාව පුරාම ප්‍රසිද්ධ කතෝලික පල්ලි තියෙන්න පුළුවන්. හැබැයි Specifically කියනවා ඉන්දියානු මහාකොමසාරිස් කාර්යාලය කියන එක. හැබැයි පුද්ගලයන්ගෙන් නම් very Specific සහරාන් හෂිම්, රිල්වාන් එතකොට එයාගේ ජාතික හැඳුනුම්පත් එතකොට දින වකවානු ඒවා හැම දෙයක්ම දන්නවා. නම් සහ ඒවා බොහොම specific. නමුත් මේකේ දී මං හිතනවා 75%ක් Specific කියලා මම හිතනවා විශේෂයෙන් area එක ගත්තාහම.

<u>ගරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: First question is, is that information or intelligence?

පි: This is intelligence.

ප්‍ර: දැන් ඕක බුද්ධි තොරතුරක් නම් ඇයි අපි දැන් කතා කරන්නේ Specific ද නැද්ද කියන එක? You need to explain that.

පි: අපි දැන් කතා කරන්නේ මේ බුද්ධි තොරතුර ඒ බුද්ධි තොරතුර මම කිව්වා ස්වාමිනි මේ බුද්ධි තොරතුර අපි develop වෙලා එනකොට තව ටිකක් තොරතුරු එකතු වෙලා එකතු වෙලා තව ටිකක් විශ්ලේෂණය වෙලා තව ටිකක් මේක Specific එකට යන්න ඕනි පිරමීඩයක් වගේ කොණකට යන්න ඕනි. දැන් මෙතන දී අපි සාමාන්‍යයෙන් මේ හැම එකක්ම lead වෙන්න පුළුවන් නම් date, time, location nature of the incident කියන කොටස් 4ට අපි ඒ මනසින් තමයි බලන්නේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එතකොට අපි මේක බැලුවාම මූලික දේ තමයි මගේ ඔළුවට එන්නේ මේකේ කවදාහරි date එකක් තියෙනවද මේ attack එක වෙන්න පුළුවන්. එහෙම නැත්නම් බලනවා මේකේ date එකක් නැත. ඊට පස්සේ බලනවා එහෙමනම් time එකක් සඳහන් වෙලා තියෙනවාද නැහැ මේකේ time එකක් නැහැ. ඊට පස්සේ මම check කරනවා මේකේ location තියෙනව ද කියන එක, location එකක් සඳහන් වෙන්නේ නැහැ. ඊට පස්සේ nature of incident බලනවා. ඔව් nature of incident එකක් තියෙනවා. Suicide mission එකක් තියෙනවා. මේකේ මේ ටික සඳහන් වෙනවා. මං එතකොට ඔය කාරණා ටික අරගෙන මේ බුද්ධි තොරතුරු අරගෙන මම තව ටිකක් මේක මගේ තියෙන අනිකුත් තොරතුරු මේ තොරතුර ඇවිල්ලා පළමු තොරතුරත් නෙවෙයි අවසාන තොරතුරත් නෙවෙයි ස්වාමිනි. මේ හා සමානව අතිවිශාල තොරතුරු රාශියක් මේකේ තියෙනවා. දැන් මේකේ කළින් දී මම දන්නේ නැහැ මම මාතෘකාවෙන් එළියට යනව ද කියලා ස්වාමිනි විශේෂයෙන් අපි මේ incidents ගත්තාහම මේකට වෙන්න කළින් විශේෂයෙන්ම රාළහාමි කෙනෙක්ගේ බෙල්ල කපනවා වචනියාව මේකේ දී. ඊට පස්සේ පුත්තලම පැත්තෙන් explosive recover කරනවා. ඊට පස්සේ අතනින් කණ්ඩායමක් ගිහිල්ලා බුදු පිළිම කඩලා එතනින් අත්අඩංගුවට පත් වුණාට පස්සේ ඒ පුද්ගලයාගේ කටට වෙඩි වැදීමක් කරනවා. ඒ එක්කම අනිත් පැත්තෙන් අපි ගත්තාහම තව වාහනයක් පුපුරුවා හැරීමක් කරනවා. ඊට පස්සේ දවසට කළිනුත් මෝටර් සයිකල් එකක් මේවා කරනවා. මේ ඇවිල්ලා ඔක්කෝම සිදුවීම්. දැන් මේවා එකක්වත් Incident වුණාට කවුරුත් මේවා හරියට analyze කරලා නැහැ. මේ එකක් analyze කෙරුවොත් මේ තත්ත්වයට යන්නේ නැහැ. ඒක පළවෙනි එක. දෙවැනි එක මේ කාලවකවානුවේ දී අපි සියලු මේ කාලයේ දී generate වෙච්ච බුද්ධි තොරතුරු මොනවද. මේ බුද්ධි තොරතුරු ඒ කියන්නේ දැන් අතන රාළහාමි මැරිච්ච දවසේ ඉඳන් මොනවාද ආවේ. මේ මේ groups ගැන ආවා. මේ ගැන ආවා. සහරාන්ලා ගැන ආවා. එතකොට training ගැන ආවා. අර තොරතුරු ආවා ඒ පැත්ත එක පැත්තකට යනවා. මේ සියලු ටිකම Fail වුණාට පස්සේ අපි ඔක්කෝම අමතක කරලා අපි ඊට පස්සේ බලනවා දැන් අපි මුකුත්ම දන්නේ නැහැ අපිට එනවා රටකින් එක දවසක් තොරතුරක් එනවා මෙහෙම එකක් plan එකක් තියෙනවා. ඊට පස්සේ තොරතුරුක් එනවා තව plan එකක් එනවා. එතකොට ස්වාමිනි මේකේ දී අපි සමස්ථයක් විදිහට මේ කොළේ විතරක් බලන්න බැහැ. එතකොට අපි කතා කරන්නේ ලොකු පද්ධතියක් ගැනයි. ලොකු ක්‍රමානුකූල වෙච්ච direction, collection process එකක් ගැනයි. එතකොට මේ තොරතුර

FAIR COMMENT BY JEZEEM

මෙතෙනට එද්දී මගේ මනස ඇවිල්ලා සම්පූර්ණයෙන්ම මේකට geared. දැන් මේ කොළේ බලාගෙන මට බුද්ධි තොරතුරු නෙමේ මම අනිකුත් සියලු තොරතුරුත් එක්ක දැන් මේ දුරකතන අංක, දැන් මෙයාගේ දුරකතන අංකයත් සඳහන් වුණේ නැති වුණාට සහරාන්ගේ දුරකතන අංක අපි ලඟ තියෙනවා. එතකොට මේ හැම දෙයක්ම තියෙනවා. එතකොට මේවා ටක් ටක් ගාලා immediately ඔය කියන පිළිතුරු ටික මම සොයා ගන්න උත්සාහ ගන්නවා මං ළඟ තියෙන available resources අනුව, ඒක තමයි මගේ රාජකාරිය විය යුත්තේ. ඒ අනුව මම assessment එකට එනවා මේ තොරතුරත් එක්ක assessment කියලා එකක් එනවා. මේ assessment එකේ දී අපි අනිවාර්යයෙන්ම කියනවා මේ තියෙන මේවා අනුව මේ මේ තියෙනවා. අපි suspect කරනවා මේක දවස් කිහිපයක් ඇතුළත වෙන්න පුළුවන්. නැත්නම් immediate nature එකේ වෙන්න පුළුවන්. ඒක නිසා මේක මේ වාගේ Suicide ප්‍රහාරයක් මේ විදිහට වෙන්න පුළුවන්. මේකට මේ විදිහට development එක්ක තියෙනවා. ඒක නිසා මේ මේ කටයුතු immediately මේ ක්‍රියා මාර්ග මේක වළක්වන්න කටයුතු ගත යුතුයි කියලා අපි අනිවාර්යයෙන්ම ඒ comment එක එන්න ඕනි. ඒක තමයි සම්පූර්ණයෙන්ම analysis එකෙන් එන්නේ. අපි document එකක් හැටියට ගන්නවට වැඩිය අපි ඒ process එකට යන්න ඕනි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: ඔබ කාට ද ඒ දැනුම් දීම කරන්නේ?

පි: අනිවාර්යයෙන්ම එකක් ඇවිල්ලා මගේ වගකීම තමයි මේ තොරතුර මෙහෙමම යවන්න කළින් මගේ තියෙන එක තමයි මේක මම එකපාරට මෙතෙන්ට ආවේ නැති නිසා මේ සියලු තොරතුරු රාශියක් මම කියපු incident තොරතුරු ඒ එක්කම සාමාන්‍යයෙන් ground එක්ක ආපු තොරතුරු ඊට අමතරව technical Source වලින් ආපු තොරතුරු එතකොට මේ incident වෙච්ච තොරතුරු සියලු දේ ගත්තම මං හිතන්නේ අමුතුවෙන් අපි මේ document, එකක් ගැන කතා කරන්න අවශ්‍යතාවයක් නැහැ. අපි දන්නවා මේක very imminent අපි කියමු Suicide ඕනෑම සාමාන්‍ය සිදුවීමක දී Rehearsal එකක් කරන්නේ දින කිහිපයකට ප්‍රථම. ඒක අපි අමුතුවෙන් කියන්න ඕනි නැහැ. අවුරුදු 30ක LTTE ඉතිහාසය ගත්තාත් යම්කිසි දෙයක් Suicide mission එකට කළින් ඒ ඔක්කෝටම කළින් ඒ process එකක් තියෙනවා. Recruitment, එකක් තියෙනවා, Training එකක් තියෙනවා ඔක්කෝම කරලා අවසානයේ තමයි final එක තමයි Rehearsal එක කරන්නේ. Rehearsal

එක කරපු ගමන් Suicide mission එකට එවනවා. අපේ තියෙන දැනුම අනුව අපි දන්නවා මෙතන දී බෝම්බ එක තැනක දී explosive ගියානම් එතනම ලොකු වගකීමක් තියෙනවා මේ explosive ටික කොහෙන්ද පුපුරන්න යන්නේ අනිවාර්යයෙන්ම මේක detect කරේ නැත්තම් මේක කොහෙන් හරි පුපුරනවා. එතකොට අපි අනිවාර්යයෙන් මේක පස්සෙන් යන්න ඕනි. මේ explosive එක ගන්න. එතකොට සහරාන්ගේ case එකේ දී මිනිහෙකුට වෙඩි තිබ්බාම තොරතුරුකරුට ඒ තොරතුරුකරු වෙඩි තිබ්බා කියන්නේ ඒක ලොකු ප්‍රශ්නයක්. ඒ කියන්නේ දැන් මෙතන ඇවිල්ලා extremist organization එකක්, තොරතුරු දුන්නු මිනිහාගේ කටට වෙඩි තියලා තියෙනවා. එතකොට මේක අපි හිතනවාට වැඩිය ඉතාමත්ම බැරෑරුම් ප්‍රශ්නයක්. ඊට පස්සේ අනිත් පැත්තෙන් අපි ආයෙත් .. ගියාට පස්සේ මෙතන දී කාත්තන්කුඩිවල යම්කිසි පිපිරීමක් සිදු වුණා. ඉතින් මේ පිපිරීම කියන්නේ ඇවිල්ලා very imminent. You don't want to have a date here ස්වාමිනි.මොක ද මේක අපි දන්නවා පිපිරීම කරන්නේ ඒ පිපිරීම කරලා අනිවාර්යයෙන්ම අපි දින දෙක තුනක් ඇතුළත ඒ කියන්නේ පැයක් වත් අපිට ඉන්න බැහැ එහෙම එකක් වුණානම් identify වුණානම් පිපිරීමක් වුණා කියන්නේ මොකද මේ මිනිස්සු කරන මිනිස්සු යම්කිසි ලොකු plan එකක් කරේ නැතත් මම යම්කිසි දෙයක් කරන්න යනවානම් ඕනි වෙලාවක මම detect වෙන්න තියෙන හැකියාව මම බලනවා. එතකොට මම අන්තිම මොහොතේ තමයි මම මේක කරන්නේ හරි. test එක කරනවා මේක හරියයි ද success ද කියලා ටක් ගාලා test එක කරපු ගමන් at any given time it can happen so ඒ පිපිරීම වෙලාව ඇති. තොරතුරු මොකුත්ම ඕනි නැහැ එතනින් එහාට යන්න. නමුත්

ප්‍ර: දැන් මේ C4 – C මේ කියන ලේඛනය අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි වශයෙන් ඔබ යොමු කරන්නේ කාට ද?

පි: මේක මම මුලින්ම යොමු කරන්නේ

ප්‍ර: ඔබ යොමු කරානම් ඔබ යොමු කරන්නේ කාටද?

පි: මම මුලින්ම මම යොමු කරන්නේ ඇත්තටම මම මුලින්ම යොමු කරනවා මේකේ CNIට සහ Secretary Defenseට immediately දැනුම් දීමක් කරනවා. මොකද දැන් මේකේ දී ගත යුතු ක්‍රියාමාර්ග රාශියක් ගන්න තියෙනවා. මොකද මේක ඒ කියන්නේ මගේ වගකීම තමයි එක පාරට මම මේක handle කරන එකට වඩා මම මේක සම්පූර්ණයෙන් තව ටිකක් මේක හොයනකම් immediately ඒ කියන්නේ බුද්ධි ප්‍රධානිට සහ ආරක්ෂක ලේකම්ට which has more authoritative executive

FAIR COMMENT BY JEZEEM

authority to dead with it. එතකොට ඒක මං immediately දැනුම් දීමක් කරනවා පොලිස්පති තුමාට ඇතුළුව.

ප්‍ර: උප පොලිස්පතිතුමාටත් දැනුම් දෙනවා?

පි: අනිවාර්යයෙන්ම රාජ්‍ය බුද්ධි සේවාවේ ඉන්නවානම් මම පොලිස්පතිතුමාට යොමු කරනවා. Director MI නම් මුලින්ම මම හමුදාපතිට දැනුම් දෙනවා. මොකද මම හමුදාපති අනිවාර්යයෙන්ම මේක ක්‍රියා කළ යුතු නිසා.

ප්‍ර: ඔබ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි වශයෙන් මෙම තොරතුර අධ්‍යක්ෂක හමුදා බුද්ධි බලකාය වෙත දැනුම් දෙනවාද නැද්ද?

පි: විශේෂයෙන්ම මමනම් අනිවාර්යයෙන්ම දැනුම් දීමක් කරනවා. මොක ද මම DMI ඉන්න කොට යම්කිසි දෙයක් අපි දෙනකොට විශේෂයෙන් SIS එකත් එක්ක මම බොහොම කිට්ටුව වැඩ කරේ. SIS එකේ මොනවා හරි තිබ්බත් මට දැනුම් දීමක් කරනවා. මට මොනවා හරි තිබ්බාත් මම ඒ දැනුම් දීමත් කරනවා.

ප්‍ර: ඒ පුද්ගලයා අනුව වෙනස් වෙනවා කියලා ද කියන්නේ?

පි: ඔබ හරි ස්වාමිනි මොකද හේතුව දැන් පිටරටක වුවත් අපිට access එක දෙන්නේ ඒ අපේ තියෙන knowledge එක අනුව තමයි. ඒ කියන්නේ ඉතාමත්ම වටිනාකරන හැම බුද්ධි තොරතුරකම වටිනාකමක් ගැබ් වෙලා තියෙනවා. හැම ඒකේම ලොකු වගකීමක් ගැබ් වෙලා තියෙනවා. ඉතින් විශේෂයෙන්ම පිටරටක වුණත් තොරතුරක් දීලා ඒ තොරතුර හරියට ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් ඒගොල්ලෝ නැවත වරක් ඒ වගේ තොරතුරක් ලබා දීමක් කරන්නේ නැහැ. එතන මම බුද්ධි අධ්‍යක්ෂක ඉන්න කාලේ දී මේ තොරතුරු අපි සියලු දෙයක්ම ලැබුණා. ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවා ගනුදෙනු කරන රටවල් සියලු දෙනාත් එක්කම මමත් ගනුදෙනු කිරීමක් කරා. එතකොට සාමාන්‍යයෙන් එයා මට මොකක් හරි දුන්නාහම සාමාන්‍යයෙන් මම රාජ්‍ය බුද්ධි සේවාව එක්කෙනත් අහනවා අරයා මට දුන්නා මොකක් ද මේකේ තියෙන්නේ කියන එක. එතකොට එයාත් මට කියනවා මේක මෙහෙමයි මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා මෙහෙම කියන එක. එතකොට එයා මට දුන්නොත් එයා මගෙන් අහනවා මෙන්න මේ විදිහට කරා කියන එක. ඒක ගොඩාක් වෙලාවට අන්‍යොන්‍ය අවබෝධය සහ knowledge එක අනුව තමයි තීරණය වෙන්නේ.

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු දැන් රාජ්‍ය බුද්ධි අංශවල පුද්ගලයාගෙන් පුද්ගලයාට ක්‍රමවේදය වෙනස් වෙනවාද නැත්නම් නිශ්චිත ක්‍රමවේදයක් තමන්ලාගේ රජය කිසියම් රටක නිශ්චිත ක්‍රමවේදයක් තමන් අනුගමනය කළ යුතුයි

FAIR COMMENT BY JEZEEM

කියලා ක්‍රමවේදයක් තියෙනවාද නැත්තම් එන එන පුද්ගලයාගේ දුර්වලතා අනුව හරි ඒ දක්ෂතා අනුව හරි ඒ ක්‍රමවේදය වෙනස් වීමක් සිදුවෙනවා ද එසේ වීම හරි ද?

පි: ස්වාමිනි දැන් අපේ මේ බැඳීම් විශේෂයෙන්ම අපිට රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂක, DMI, DNI, Air Force Intelligence, මේ ඔක්කෝම අපිට බැඳීමක් කරනවා හැම සතියකම. හැම තැනින්ම Coordinating Intelligence Conference එකක් තියෙනවා. අපිට මොන තොරතුරු ආවාත් අපි තොරතුරුකරුවෝ සඳහන් කරන්නේ නැති වුණාට එතන අපේ coordinate body එකක් තියෙනවා. ඊට පස්සේ යට level එකෙත් ප්‍රාදේශිය වශයෙනුත් DII, SIS ඔක්කෝම කට්ටියක් සතියකට සැරයක් හමුවීමක් කරනවා. ඊට පස්සේ ආරක්ෂක අමාත්‍යාංශයේ උඩට ගියාම security council එකෙත් ස්වාමිනි ඒ ටික තියෙනවා. එතකොට අපි system එකෙන්ම අපිව බැඳිලා තියෙන්නේ. නමුත් ඒකෙන් එහා පැත්තට ගිය මේකක් තියෙනවා ස්වාමිනි මොකද හේතුව විශේෂයෙන්ම ඒ දැන් අපිට තියෙන හැකියාව අනුව මම ඇවිල්ලා සම්පූර්ණයෙන්ම මම පුද්ගලයෙක් හැටියට මට කොච්චර පහසුකම් තිබ්බත් මගේ knowledge එකත් සහ මගේ different Attitude තියෙන පුද්ගලයෙක්නම් කොච්චර වුණත් ස්වාමිනි මම කැමැති නැහැ මම එයාත් එක්ක ගනුදෙනු කරන්න. ඉතින් මම මගේ එකත් එක්ක අවස්ථාවේ දී පෙන්නුම් කරන්නේ මම තමයි තොරතුරු ගත්තේ කියන එක. ඒක ලෝකයේ ගොඩාක් බුද්ධි අංශ වලට ආවේණික වූ දෙයක්. නමුත් ප්‍රශ්නය තියෙන්නේ මෙතන දී එහෙම තිබ්බානම් අනිවාර්යයෙන්ම ඒ කියන්නේ අපි මෙතන දී පෞද්ගලිකව කතා කර ගත්තේ නැතත් අපි අනිවාර්යයෙන්ම intelligence coordinating conference එකේ දී ඒ තොරතුරු මේකේ ඉදිරිපත් කිරීමක් කරනවා. Presentation එකේ දී මෙන්න මේ මේ තොරතුරු තියෙනවා කියලා. ඒක තමයි පැහැදිලිවම Ministry of Defence එකේ intelligence coordinating meeting එක ඒ එකතු කිරීම කරන්න. ඉතින් අනිත් පැත්තෙන් බැලුවාහම විශේෂයෙන්ම අපි කියමු ස්වාමිනි drugs වගේ දෙයක් දැන් මෙතන දී ඉතාමත්ම අපි දන්නේ නැහැ කවුද විශ්වාස කවුද විශ්වාස නැත්තේ අපි ඉතාමත් පැහැදිලිව handle කරන්න ඕනි. ඉතින් ඒ වගේ දේවල් ඉතාමත් sensitive information ඒවා need- to-know basis පමණයි අපි පමණයි ගනුදෙනු කරන්නේ. මෙතන දී මට ගනුදෙනු කිරීමේ දී රාජ්‍ය බුද්ධි සේවාවේ සහ මගේ අතරේ කිසිම gap එකක් තිබ්බේ නැහැ මොක ද බොහෝදුරට 90%ක්ම එයාට ලැබුණු තොරතුරු මට ලැබුණා. මට ලැබුණු තොරතුරු එයාට ලැබුණා. ඒ එක්කම අපි දෙන්නා හැම තිස්සේම විශේෂයෙන්ම Security Council

FAIR COMMENT BY JEZEEM

එකට යන්න කළින් පවා මේක repetition එකක් වෙන්න පුළුවන් නිසා අපි කතා කර ගන්නවා කළින් ඔයා අද මේ කොටස කරන්න මං මේ කොටස කරන්නම් අපි එහෙම සම්බන්ධතාවයක් තිබුණා ස්වාමිනි.

දැන් වෙලාව: ප.ව. **4.00**
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව :- ප.ව.04.00 යි
පෙර සටහන් ල/ලේ :- නිල්මිණි මෙය
මෙතැන් සිට ල/ලේ :- මුතුමාලි

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : දැන් ඔබ ප්‍රකාශ කළා Director SIS ට විදේශ රාජ්‍යයන් වල බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා රාජ්‍යයක් ලෙස ලංකාව ගිවිසුමක් අත්සන් කරනවා කියලා රටවල් 08 ක් සමඟ තිබෙන බවත් ඔබ ප්‍රකාශ කළා. විදේශ රාජ්‍යයකින් බුද්ධි තොරතුරු ලබා ගැනීමේදී තියෙන ක්‍රමවේදය. එම ගිවිසුම් වල තිබෙනවාද දැන් Director SIS ට විදේශ රාජ්‍යයකින් තොරතුරු ලැබෙන කොට එම තොරතුරු Director, Military Intelligence ටත් ලබා දීමට තියෙනවාද ඒ ගිවිසුම් වල ඉඩ ප්‍රස්ථා?

පි : ස්වාමිනි විශේෂයෙන්ම ඒ රටවල් අනුව අපි ගොඩක් දුරට MOU අත්සන් කරනවා රටවල් දෙක අතර Intelligence Sharing කියන එක. ඒ කියන්නේ DMI තායිලන්තයත් එක්ක අත්සන් කරනවා වගේම අපි සමහර රටවල් එක්ක අත්සන් කරනවා. සමහර රටවල් අත්සන් කරනවා. සමහර රටවල් අත්සන් කරන්නේ නෑ. හැබැයි විශේෂයෙන්ම ඒ අපි රාජ්‍යය බුද්ධි සේවාව හැටියට ඒගොල්ලන් ගන්නේ මේ රාජ්‍ය බුද්ධි සේවාව තමයි ලංකාවේ තියෙන Prime Intelligence Agency එක. එතකොට ඉන්දියාව ගත්තොත් අපි උදාහරණයකට වශයෙන් අපි ගත්තොත් ඉන්දියාවේ තියෙන විදේශ කටයුතු සම්පූර්ණයෙන්ම handle කරන්නේ ඇවිල්ලා RAW කියන සංවිධානය. Internal බුද්ධි අංශය කටයුතු කරන්නේ IV කියන සංවිධානය. එතකොට ඒගොල්ලන්ට අපි මොන දේ කිව්වත් අපි දුර්වල වුනත් ශක්තිමත් වුනත් RAW එක අනිවාර්යෙන් deal කරන්නේ රාජ්‍ය බුද්ධි සේවාව පමණයි deal කරන්නේ. ඒක ඒගොල්ලොන්ගේ හැම තොරතුරකම යටින් සඳහන් කරලා තියෙනවා මේ information එක share කරන්න පුළුවන් වෙන්නේ ඇවිල්ලා ඒගොල්ලන්ගෙන් concurrent එක approval එක ගත්තයින් පස්සේ පමණයි කියන එක. ඒ එක්කම ස්වාමිනි ඒ එක්කම අපිට පැහැදිලිවම අපි අපි රටකට තොරතුරක් දුන්නොත් අපි මේ ඒ වගන්තිය ඇතුළත් නොකර තොරතුර දුන්නත් ඒ රටෙන් අහනවා අපි කමක් නැද්ද මේ B රටත් එක්ක මේ තොරතුරු හුවමාරු කළාට ප්‍රශ්නයක් නැද්ද කියලා අපෙන් අහනවා. එතකොට අපි කියනවා අපේ රට සඳහන්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කරන්න එපා. ඔබ ඒක කරන්න කියලා. ඒ වගේ විශේෂයෙන්ම ලොකු අන්‍යෝන්‍ය අවබෝධයක් එක්ක කටයුතු කරන්නේ. දැන් මේකේදී වුනත් අපිට සමහර ගැටලු සහගත තත්වයක් තියෙනවා ස්වාමිනි විශේෂයෙන්ම මෙතැනදී අපි රටකින් තොරතුරක් දෙනකොට ඒ රටේ තියෙන sources ඉතාමත්ම වැදගත්. විශේෂයෙන්ම අපි දැන් යම්කිසි නවක තොරතුරක් ගත්තොත් ස්වාමිනි අපි කියමු equipment එක වෙන්න පුළුවන් 5 million වගේ US Dollars එතකොට අපි මෙතනදී විභාගයකදී අපි කියනවා මේ තොරතුරු ගත්ත විදිහ අපි කිව්වොත් එහෙම නැත්නම් මේ තොරතුර source එක කිව්වොත් ඊට පස්සේ අපිට නැවත කවමදාකවත් ඒ තොරතුර ඒ equipment එකෙන් ගන්න හම්බ වෙන්නේ නෑ. ඒ වගේ ලොකු මුදලක් අපිට වැය කරන්න බෑ. මම කියන්නේ LTTE එකේ තියෙන මගේ අත්දැකීම් එක්ක ඒ එක්කම අනිත් පැත්තෙන් අපිට ඒ එක්කම තියෙනවා යම් කිසි තොරතුරක් ඒක දුන්නේ ඇවිල්ලා source එකක් නම් ඒ source එක ඉතාමත්ම වර්ධනය කර ගත්ත හොඳ source එකක් නම් ඉන්දියාව විසින් අපේ ලංකාවේ man කරන source එකක් නම් එතකොට අපි මෙතනදී කිව්වොත් එහෙම මේ මේ source එක තමයි මේ තොරතුර දුන්නේ කියලා අනිවාර්යෙන්ම ඒ පුද්ගලයාගේ ජීවිතයට ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඒක නිසා කවමදාකවත් අපි ඒ තොරතුරු අපි තොරතුරු contents එක අරගෙන අපි දැනුම් දීමක් කරනවා අපි action එක ගන්නවා මීසක් කවමදාකවත් අපි කියන්නේ නෑ source එක මොකක්ද කියන එක.

ප්‍ර : දැන් ඒ අනුව මෙම ඉන්දියාවෙන් ලැබිච්ච බුද්ධි තොරතුරු ඔබ SIS Director හැටියට සිටින අවස්ථාවකදී ලැබුණා නම් ඔබට Director Military Intelligence සමඟ හුවමාරු කර ගන්න බෑ ඉන්දියාවේ Intelligence Agency එකේ අවසරය නැතුව?

පි : ඔබ හරි ස්වාමිනි අපිට ඉන්දියාවේ Intelligence Agency එකෙන් අවසරය නැතුව අපිට එක share කර ගන්න බෑ. නමුත් මම කලින් උදාහරණය වශයෙන් ගත්තොත් මමත් ඉන්දියාවත් එක්ක ගනුදෙනු කළා DMI හැටියට. SIS Director ත් ගනුදෙනු කළා. නමුත් අපි ඊට වැඩිය suite වෙන්න ඕනේ ස්වාමිනි මොකද ස්වාමිනි විශේෂයෙන් අපිට පොතටයි මේකටයි හැම තිස්සේම අපිට එන්න බෑ. එතකොට මම දැන ගන්න ඕනේ මම මගේ ලංකාවේ කියන මගේ Director SIS එකත් එක්ක ඔයාටත් යම්කිසි

FAIR COMMENT BY JEZEEM

දෙයක් ආවාද ? ආවා නම් මොන විදියටද දැම්මේ කියන එක අහනවා මගේ දැනුමට. එතකොට එයත් කියනවා ඔව් සුරේෂ් මෙහෙමයි මේක ඔයා මොකද හිතන්නේ මම කියනවා මම හිතන්නේ මේකයි ඔයා හිතන්නේ මොකක්ද ඒක ඇවිල්ලා අපි අතර අන්‍යෝන්‍ය එකත් එක්ක එන එකක්. ඉතින් එතනදී අර සංවිධානය කැමති නෑ මගේ එක්ක මොකද ඒගොල්ලො ඒ දවස් වල මම ඒ සමහර බුද්ධි අංශත් එක්ක සම්බන්ධ වුනේ මොකද අපි ground එකට තියෙන අපිට හැකියාව වැඩි. අපි ප්‍රතිඵල ලබා දීමේ හැකියාව වැඩි. එතකොට automatically මම ලොකු උත්සාහයක් ගත්තා මට අවශ්‍ය කරන sources ටික develop කරන්න. එතකොට මට රාජකාරී පැත්තෙන් අයිති නැති වුනත් මම සමහර sources මම tap කළා. ඒ අනුව මම develop කළා ඒක un officially ද officially ද කියන එක අපි සැලකුවේ නෑ. මට ඕනේ වුණේ අවශ්‍ය කරන තොරතුරු පමණයි. එතනදී මම සමහර දේවල් මම ඒ තොරතුරු මම ලබා ගත්තා නමුත් මම ඒ තොරතුරු ලබා ගත්තා කියන එක මම ප්‍රකාශ කරන්නේ නෑ document එකක් හැටියට.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : දැන් මෙම තොරතුර ප්‍රධාන වශයෙන් SIS සහ DMI වලට අමතරව ඔබ කී පරිදිම නාවික හමුදාවේ, ගුවන් හමුදාවෙත් ඒ හා සමානව STF වලත් බුද්ධි ඒකක තියෙනවා ද තියෙනවා නේද ?

පි : ඔබ හරි.

ප්‍ර : එම බුද්ධි ඒකක සමඟත් මෙම තොරතුරු හුවමාරු කර ගැනීමක් සිදු කරනවා ද නැද්ද මෙවැනි තොරතුරු ?

පි : ස්වාමිනි මම දන්නේ නෑ කොච්චර කාල වේලාවද කියලා නමුත් මේ බුද්ධි අංශ ගත්තහම ලංකාවේ ප්‍රධාන Prime Intelligence Agency දෙකයි තියෙන්නේ. State Intelligence Service එක සහ DMI එක. ඒකයි එහෙම කියන්නේ. DMI එකේ මම නිළධාරියෙක් හැටියට බැඳුණහාම මම අවසානය දක්වා මේ cap-badge එක අඳින්නේ මම අර කියපු විදිහටම අර process එකෙන්ම තමයි මම උඩට එන්නේ. නමුත් නාවික හමුදාවේ බුද්ධි අංශය ගත්තහාම එහෙම නෙවෙයි. ඒගොල්ලො ඇවිල්ලා කාලයකට වැඩ කරනවා. කාලයකට යනවා. ඊට පස්සේ ඒගොල්ලොන්ගේ process එක වෙනස්. ගුවන් හමුදාවෙත් ඒ

FAIR COMMENT BY JEZEEM

විශේෂයෙන්ම බුද්ධි අංශ නෑ. ඒගොල්ලො ඉන්නේ කාලයක් වැඩ කරනවා කාලයක් යනවා කාලයක් එහෙම තමයි වෙන්නේ. එතකොට මේ බුද්ධි අංශ සියළුම බුද්ධි අංශත් එක්ක අපිට මේවා කරන්න බෑ. Foreign Affairs වලත් බුද්ධි අංශ තියෙනවා ඒ කාලයක් ඇවිල්ලා අවුරුදු 2 ක් වැඩ කරලා ඊට පස්සේ විදේශ රටකට ගිහිල්ලා වෙන රස්සාවක් කරන්නේ. ඒක නිසා අපි මෙතැනදී විශේෂයෙන්ම අපි සැලකිලිමත් වෙනවා Prime Intelligence agencies දෙක රාජ්‍යය බුද්ධි සේවාව සහ Directorate of Military Intelligence කියන එක තමයි Prime Intelligence Service වල ඒක නිසා හැම බුද්ධි තොරතුරක්ම විශේෂයෙන්ම අපි අතරේ ඒ හුවමාරු කිරීමක් සිදු වෙනවා. නාවික හමුදාව, ගුවන් හමුදාව අතරේදී අපි දෙසැරයක් හිතනවා මේවා හුවමාරු කර ගන්න කලින් මොකද ඒවාට තොරතුරු වල රහස්‍යභාවය, ඒ තොරතුරු වලට ඒගොල්ලොන්ට react කිරීමේ හැකියාව, මේ තොරතුරු නැවත වරක් අනවශ්‍ය පුද්ගලයින්ට පත් වීමේ හැකියාව ඒ කාරණා කර ගෙන අපි හැම තොරතුරක්ම මේවා කරන්නේ නෑ. හැබැයි විශේෂයෙන්ම මේ වගේ දෙයක් එතෙන්ට ආවායින් පස්සේ Intelligent Coordinating Meeting එකට ආවායින් පස්සේ මෙතනදී මේ threat අපි තොරතුර Intelligence මේවා වෙලා intelligence එකට ලොකු threat එකක් මේ develop වෙන්නේ. එතනදී අපි විශේෂයෙන්ම මේ සියළු මේ දෙනාගේම මේකට අපි භාජනයට ලක් කරනවා අපි sensitive දෙයක් තිබ්බොත් අපි එතනදී කියන්නේ නෑ. උදාහරණයක් වශයෙන් දුරකථනයක් තිබ්බොත් අපි දුරකථන අංකයේ නම්බර් කියන්නේ නෑ. නමුත් අපි අනිත් ටික ඔක්කොම කියනවා. මොකද අර දුරකථන අංකය පිළිබඳව වෙන කිසිම Agency එකකට අපිට හැකියාව තියෙනවා විශ්ලේෂණ කරලා ඉතා ඉක්මනින්ම මේක ගන්න. මොකද

ප්‍ර : අපිට කියන්නේ ?

පි : ඒ කියන්නේ විශේෂයෙන්ම රාජ්‍ය බුද්ධි සේවාවට සහ DMI එකට තියෙනවා මොකද මේවා ඇවිල්ලා estabiiwshed system. මේවා වල නිළධාරීන් professional නිළධාරීන් ඉන්නේ. ඉතින් එක නිසා අපිට අර ඔක්කොම එක විදිහට ගන්න බෑ. නමුත් ඔබතුමාගේ ප්‍රශ්නේට පිළිතුර තමයි මෙතනදී අර මම කිව්ව සියළුම බුද්ධි අංශ ටික එකතු වෙනවා. අපි පෞද්ගලිකවම කතා කර ගන්නේ නෑ. මමයි රාජ්‍ය බුද්ධි සේවාවයි කතා කරනවා වගේ

FAIR COMMENT BY JEZEEM

ඒ වගේ දේවල් අනිත් බුද්ධි අංශ එක්ක කතා කර ගන්නේ නෑ. Unless otherwise ඒ නාවික මුහුදු පිළිබඳව එකක් නම් අනිවාර්යෙන් අපි කතා කරනවා. නැත්නම් අපි මේවාගේ දෙයක් නම් කතා කරන්නේ නෑ. හැබැයි මේක කතා කරන්නේ අනිවාර්යෙන් ඇවිල්ලා Intelligent Coordinating Meeting එකේදී අඟහරුවාදාට තියෙන Meeting ඒකෙදී එක Secretary Defence, IGP, Army Commander, Navy Commander, Airforce ඔක්කොම තියෙද්දි අනිවාර්යෙන් මේක හංගලා එන්න පුළුවන් දෙයක් නෙවෙයි. අනිවාර්යෙන් මේක අපි discuss කරනවා. එතකොට ඒ ආරක්ෂක ලේකම්, රාජ්‍ය බුද්ධි ප්‍රධානී ඒ තොරතුරත් එක්කම මේක එකින් එකට ඒ වේලාවේම directions දෙනවා. අපි අරක කරන්න මේක කරන්න අරක අරයාට කිව්වාද පල්ලිය ගැන බැලුවාද කාදිනල්ට කතා කරන්න මේක නැත්නම් ඒක brief කරන්න. මේ දේවල් ඒ හැම කෙනාටම ලොකු වගකීම් රාශියක් තියෙනවා. හැබැයි බුද්ධි අංශයක් හැටියට ඔය හැම පැත්තටම අපිට වගකීමක් තියෙනවා. තොරතුර දුන්නා තොරතුර ගත්තා තොරතුර ක්‍රියාත්මක වෙනවාද. අවශ්‍ය security එකක් දීල තියෙනවාද ඉතින් මොකද ඒ හේතුව ඒ මම බුද්ධි නිළධාරීයෙක් නම් මේක පටන් ගත්ත ඉඳන් අවසානය දක්වාම මම මේ baton එක අරගෙන යන්න ඕනේ. නැත්නම් මට භාගයක් අරගෙන දීලා ඉන්න ඒ කියන්නේ නතර වෙන්න බෑ. ඉතින් එක depend වෙනවා එක එක පුද්ගලයා හැටියට සහ ඒ ආයතන හැටියට ඒක තීරණය වෙනවා.

(C 4 (A) සාක්ෂිකරුට පෙන්වා සිටී.)

ප්‍ර : ඔබට මෙය වර්ගීකරණය කරන්න හැකියාවක් තියෙනවාද ?

පි : දැන් ඔබ මට කලින් දුන්න තොරතුර ඒකම තමයි මේ reprint එකක් තියෙන්නේ . දැන් මම කලින් බලපු document එකේ තියෙන

ප්‍ර : C 4 (B)?

පි : ඔව්. කලින් බලපු document එකම තමයි මේකේ වෙලා තියෙන්නේ වෙනසකට තියෙන්නේ මේක CNI විසින් IGP ට යවලා තියෙන්නේ. ඒ තොරතුර ඒ ආකාරයෙන්ම මේකේ මෙතන තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : හරි දැන් මෙම C 4 (A), C 4 (B), C 4 (C) කියන මේ ලේඛන 03 එකවර පොලිස්පතිවරයා වෙත ගියාද නැද්ද කියලා කියන්න ඔබට හැකියාවක් තියෙනවාද ?

පි : එකම අවස්ථාවේ යන්න බැහැ. මේක අනිවාර්යෙන්ම මේක originate වෙච්චි තැනක් තියෙනවා. අපි කියමු මේක originate වුණේ පිටරටකින් කියලා. එතකොට මේක අනිවාර්යෙන්ම මේක SIS එකට එන්න හැකියාව තියෙනවා. SIS එකෙන් මේක අනිවාර්යෙන්ම initiate වෙන්න පුළුවන්. CNI ට සහ Secretary defence ට. IGP තුන්දෙනාටම initiate වෙන්න පුළුවන්. එහෙම නැත්නම් සමහර අවස්ථාවලදී යි, CNI ටයි Secretary defence ටයි Initiate වෙන්න පුළුවන්. ඉතින් මෙතැනදී CNI ට ආවායින් පස්සේ CNI එයාට ආපු ලියුම බලනවා මේක IGPට කට්ටියට ගිහිල්ලා නැත්නම් CNI ගේ තියෙන වගකීම අනුව CNI මේක ඒ අදාළ ස්ථාන වලට දැනුම් දීමක් කරනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : නෑ ප්‍රශ්නේ මේකයි C 4 (A), C 4 (B) සහ C 4 (C) දරණ ලේඛන තුනම එකම අවස්ථාවක පොලිස්පතිවරයා වෙත ලැබුණා නම් එහි වැදගත්කම බුද්ධිමය වශයෙන් කොපමණද ?

පි : එකම අවස්ථාවක ලැබුණා නම් මුලික දේ තමයි ස්වාමිනි එකම අවස්ථාවක ලැබුණාත් එකම තොරතුර තමයි මේ ඇවිල්ලා තියෙන්නේ. එතකොට පොලිස්පති හැටියට දන්නවා. එයාට කොහෙන්ද මේක originate වුණේ කියන එක. මොකද ලිපි තුන එකක් SIS එකෙන් වෙන්න පුළුවන්. එකක් CIN එකෙන් වෙන්න පුළුවන්. එකක් තව තැනකින් වෙන්න පුළුවන්. එතකොට එතුමා දන්නවා විශේෂයෙන්ම තොරතුරු ලැබෙන්නේ ඒ වෙන කොට පළවෙනි වතාවට තමයි තොරතුරු ලැබෙන්නේ . මේක තමයි තොරතුරු ලැබෙන ක්‍රමවේදය. එතකොට එතුමාට එකපැත්තකින් කල්පනා කරන්න පුළුවන් මේක ඔක්කොම පිටරටකින් ඇවිල්ලා තියෙන්නේ. එකම තොරතුර තමයි මෙයාට එන්න කියන එක. ඉතින් මෙතනදී තොරතුරු තුනක් ලැබුණත්, තොරතුරු දෙකක් ලැබුණත්, එක තොරතුරක් ලැබුණත් මේකේ තියෙන contents එක අනුව ඒ කියන්නේ මේ තුනම CNI ගෙන් ලැබුණත්, SIS එකෙන් ලැබුණත් , වෙන කොහෙන් ලැබුණත් මේක ඉතාමත්ම immediately action ගන්න ඕනේ කියන තොරතුරක

FAIR COMMENT BY JEZEEM

අවශ්‍ය කරන සියලුම මේවා ටික මේකේ සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර : ඒක තමයි මම ඔබෙන් ඇහුවේ. මොකද ඔබ මීට කලින් ප්‍රකාශයක් කෙරුවා ඔබට යම් කිසි තොරතුරක් ලැබුණාට ඔබ හැමදේම ආරක්ෂක ලේකම්ට කියන්න යන්නේ නෑ කියලා. ඒ කියන්නේ ඒක තොරතුර assess කරන්න ඕනේ කියන එක. ඒක හින්දා දැන් මේ අවස්ථාවේ දී C 4 (A), C 4 (B) සහ C 4 (C) දරණ ලේඛන තුනම ගත්තහාම පේනවා ඒ ලේඛන තුනම රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානීයා විසින් පොලිස්පතිට පිටපතක් සමඟ යවලා තියෙන්නේ කියන එක. සාමාන්‍යයෙන් හැම තොරතුරක්ම එහෙම යැවෙන්නේ නැනේ රාජ්‍ය බුද්ධි අංශයේ ප්‍රධානීයාට ලැබෙන හැම තොරතුරක්ම පොලිස්පතිට යැවෙන්නේ නැනේ?

පි : හැම තොරතුරක්ම ලැබෙන්නේ නෑ. මම බුද්ධි අංශයට එහෙම හැම තොරතුරක්ම යවන්නේ නෑ.

ප්‍ර : යවනවා නම් යම් කිසි ඒ කියන්නේ වැදගත්කමක් විශේෂත්වයක් තියෙනවා ඒකේ ?

පි : ඒ තොරතුර අනුව සහ ඒ ගන්න ඕනේ action එක අනුව need to know basis කියන principle එකක් තියෙනවා. ඒ අනුව මම තීරණය කරනවා කාටද යවන්නේ කියන එක.

ප්‍ර : ඔබ දැන් කියපු හැටියට C 4 (A), C 4 (B) සහ C 4 (C) දරණ ලේඛන තුනම එකම අවස්ථාවේ දී පොලිස්පතිවරයාට ගියානම් එහි වැදගත්කමක් තියෙනවා කියන එකයි ඔබ කියන්නේ ?

පි : එහෙමයි ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : මෙවැනි තොරතුරක් ලැබුණහාම ඉක්මනින් පියවර ගත යුතුයි කියලා කවුද ක්‍රියා කරන්න ඕනේ? කාගෙන්ද නියෝග ලැබිය යුත්තේ මේ සම්බන්ධයෙන් මූලිකව කටයුතු කරන්න. මෙවැනි ප්‍රහාරයක් වගේ සිදුවීමකදී ?

පි : ස්වාමිනි විශේෂයෙන්ම executive authority එක තියෙන්නේ ඒ කියන්නේ අත්අඩංගුවට ගැනීම් කරන්න බුද්ධි අංශ වලට බෑ ස්වාමිනි. ඒ එක්කම security provide කරන්නත් බුද්ධි අංශයට බෑ. බුද්ධි අංශයට කරන්න පුළුවන් රාජකාරිය තමයි මේ තොරතුරු ඉක්මනට විශ්ලේෂණය කරලා ඉක්මනට ලබා දීලා ඒ තොරතුරේ තියෙන බැරෑරුම්කම පෙන්වලා ගත යුතු ක්‍රියාමාර්ග

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පිළිබඳවත් අවශ්‍ය නම් සඳහන් කරන්න පුළුවන්. නමුත් අනිකුත් නිළධාරීන් මේ තොරතුර ලැබුණහාම ගත යුතු executive authority එකක් තියෙන නිළධාරීන්ගේ වගකීම තමයි මේ තොරතුරක් ලැබිච්ච ගමන්ම මේකට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග immediately ගන්න එක.

ප්‍ර : ඒ කියන්නේ ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව ආරක්ෂක ලේකම්වරයාගෙන් නියෝග අවශ්‍යද ? ඒ සම්බන්ධව මේ ආරක්ෂක council යේ අනුමැතිය අවශ්‍යද ?

පි : එහෙම කිසිම අවශ්‍යයක් නෑ ස්වාමීනි මොකද විශේෂයෙන්ම මේ තොරතුර තියෙන්නේ මිනිමැරීමක් සම්බන්ධයෙන් ඉතින් මේ process එකටම යන්න තිබුණොත් මේක කවදාවත් නවත්වන්න බෑ. ඉතාමත්ම ඒ කියන්නේ පොලිස්පතිතුමාට මේ වගේ තොරතුරක් ලැබුණොත් එතුමාට කරන්න පුළුවන් එකක් තමයි එතුමා විශේෂයෙන් එයාගේම intelligence section එකක් තියෙනවා special branch එකට, ඒකට දාන්න පුළුවන්. ඉතුරු ටික එයාට මේකේ කිසිම ඒ කියන්නේ analysis එකක් කරන්න අවශ්‍යතාවයක් නෑ. Immediately මේ identify කරපු targets වලට security එක provide කරන්න ඕනේ immediately, ඊට අමතරව එයාගේ අත්අඩංගුවට ගැනීම් කරන්න මෙතන තියෙන නිසා ඒ අදාළ අංශවලට දැනුම් දීමක් කරන්න ඕනේ immediately මේවා අත්අඩංගුවට ගන්න ඕනේ කියලා. අත්අඩංගුවට ගැනීම් කරන්න ඕනේ. ආරක්ෂාව සපයා දීම් කරන්න ඕනේ. ඒ ටික කරන්න ඕනේ. හැබැයි මෙතන බුද්ධි අංශයේ වගකීමක් තියෙනවා මේ දේත් වෙනවා ද කියන එක සොයා බලන එක . මොකද මේ දෙක තොරතුර දුන්නත් මේ තොරතුරට නැත්නම් එතනදී අපි we fall short of our responsibility

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඔබ දැන් කියපු කාරණාවෙන් තව එක ප්‍රශ්නයක් මට අහන්න ඕනේ. දැන් ඔබ කිව්වා මේ සම්බන්ධයෙන් තොරතුරු තිබ්බාද කියලා බලන්න ඕනේ කියලා?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔය C 4 (A), C 4 (B) සහ C 4 (C) දරණ ලේඛන වලට අමතරව ?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : ඔය ලේඛනවල සඳහන් පුද්ගලයින්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි අංශයේ ඒකට කලින් තොරතුරු Memo's තියෙනවා නම් ඒවා ඔය ලේඛනවල සඳහන් කළ යුතුද නැද්ද ?

පි : ස්වාමිනි ඒක මම කිව්වේ අර අන්තිමට assessment කියලා එකක් එන්න ඕනේ නේ ස්වාමිනි. ඉතින් විශේෂයෙන් අපි මේ තොරතුරු ලැබුණහාම අපේ තියෙන knowledge එක එතන තමයි input එක එන්නේ knowledge එකයි back ground knowledge එකයි ඔක්කොම දාලා තමයි ඒ assessment එක දෙන්න පුළුවන්. ඒ assessment එකේ අපිට සඳහන් කරන්න පුළුවන් කලින් ඒ reports වල සඳහන් කරන්න පුළුවන් ඊට කලින් අපි මේ සම්බන්ධයෙන් reports එකක් ඇවිල්ලා තියෙනවා නම් ඒකේ reference එකක් අපිට එහෙම දාන්නත් පුළුවන්. නමුත් ඒ කලින් තිබ්බත් නැතත් ස්වාමිනි මොකද විශේෂයෙන්ම දැන් මේකේදී විවිධ පුද්ගලයන්ටනේ යන්නේ.සමහර අයට ඒ reference එක ගිහිල්ලා නැතුව ඇති. නමුත් විශේෂයෙන් මම හිතනවා assessment එක කියන එක ඉතාමත් වැදගත්. අපි කොහොමද මේක දකින්නේ කියන එක. අනිත් එක මේකේදී එහෙම reference එකක් තිබ්බත් නැතත් ස්වාමිනි පොලිස්පතිතුමාට හෝ මේක ලැබෙන ආරක්ෂක ලේකම්තුමාට මේකේ ගැටලුවක් තියෙනවා නම් එයා immediately මේක CNI එකෙන් හෝ SIS Director ගෙන් immediately clarify කරන්න ඕනේ. නැත්නම් clarify කළේ නැත්නම් අනිවාර්යෙන් එයා ඒ තනතුර අනුව අනිවාර්යෙන්ම immediate action ගන්න ඕනේ කියලායි මම හිතන්නේ ස්වාමිනි මොකද

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු C 4 (C) ලේඛනයේ අවසානයේ තියෙන ඡේදය ගැන තමන්ට කියන්න පුළුවන් මොකක්ද ? C 4 (C)

පි : දැන් මෙතනදී මම දකින එක තමයි මේ last sentence එක උඩ paragraph එකේ පළවෙනි කොටස සහ දෙවෙනි කොටස අතර යම්කිසි වෙනසක් තියෙනවා. මොකද පළවෙනි කොටසෙන් කියන්නේ සහරාන් තම සමාජ ජාලා ගිණුම ඔස්සේ සිය

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

අනුගාමිකයන් අභිප්‍රේරණය කිරීමේදී මෙරට කතෝලික පල්ලි ඉල්ලක් කර ගන්නා ලද විශේෂ සඳහන් කළ බවට තොරතුරු මේ වෙන තෙක් නිරීක්ෂණය වී නොමැත. ඉතින් එතනදී අපි ළඟ තියෙන records අනුව තමයි මේක සඳහන් කරලා ඇත්තේ කියලා මට හිතෙනවා. මොකද නිරීක්ෂණය වෙලා නෑ කියන එක. අනිත් පැත්තෙන් කියනවා සියළු අනුගාමිකයන් ඝාතනය කිරීම උතුම් ආගමික කරුණක් බවත් අන්‍ය ආගම විනාශ කරමින් අර 2016 වෙච්ච development ටික සඳහන් කරලා තියෙනවා. නමුත් මේ 2016 development හරියට analysis කළා නම් මීට වැඩිය strongly මේ ලයින් එක එන්න ඕනේ කියන එක තමයි මගේ හැඟීම මම අර කියපු incident යි ආපු තොරතුරුයි ඔක්කොම ගත්තාම මේ දෙකත් එක්ක ගත්තහාම මීට වැඩිය මෙතන ගැප් එකක් උඩින් එකක් කියලා යටින් අපි ලයිට් කරලා තියෙනවා ඒ කියන්නේ මෙකේදීත්. ඉහත සඳහන් තොරතුරු පිළිබඳ රහසිගත පරීක්ෂණයක් සිදු කරමින් කියන එක ඇවිල්ලා that's ගොඩක් open.ඒක කිසිම වේලාවක් කාලයක් නෑ. ඉතින් මෙතනදී විශේෂයෙන්ම මේ තොරතුරු ගත්තහාම මේක ලොකු threat එකක් තියෙනවා. මුලිකව විය යුත්තේ ඇවිල්ලා මේක immediately මම අර කිව්ව date, time, location, nature of incident කියන එක identify කරලා කටයුතු කිරීම තමයි. ඉතින් මෙතනදී අර සම්ප්‍රදායික ක්‍රමයට බුද්ධි මේකක් තමයි මෙතනදී assessment එකක් වගේ එකක් තමයි මෙතනදී වෙන්නේ.

ප : එතකොට ඉන්දියානු තොරතුරු නිශ්චිතවම ආවායින් පස්සේ එම තොරතුරේ වැදගත්භාවය අඩු කිරීමක් මෙතන සිදු වෙලා තියෙනවා නේද?

පි : ස්වාමිනි මමත් එක දකිනවා.

ප්‍ර : දකිනවා ඒ වැදගත්භාවය ඉන්දියානු

පි : ඒකේ බැරෑරුම්කම

ප්‍ර : බැරෑරුම්කම මේ ලිපියෙන් අඩු කරලා තමයි යවලා තියෙන්නේ ?

පි : ඔව් ස්වාමිනි එතනදී ඒක තමයි මම අර කිව්වේ ස්වාමිනි officer කෙනෙක්ගේ professionalism එක වැදගත් වෙන්නේ දැන් අපි උදාහරණයක් වශයෙන් දැන් මේ මම අර කියපු development එක ගත්තාම අපි දන්නවා කොයි වේලේ දැන් explosive තියෙනවා කොයි වේලේ පත්තු වෙයිද නැද්ද කියන එක තමයි අපේ ඔළුවේ තියෙන්නේ. හැබැයි එහෙම තියෙන අවස්ථාවකදී මේ ඉන්දියාවේ තොරතුරු ආවා කියන්නේ ඉතාමත්ම ඒ

FAIR COMMENT BY JEZEEM

කියන්නේ මේ දෙකම ටක්ගාලා immediately හරි. දැන් explosive කොයි වේලේ පත්තු වෙයිද මේ ඔක්කොම ටික. අපි මෙතනදී අර සාමාන්‍ය සාම්ප්‍රදායික ඒ කියන්නේ assessment එක නැතුව record Base එකට ගියපු assessment එකක් තමයි ස්වාමිනි මෙතෙන්ට ඇවිල්ලා තියෙන්නේ. නමුත් අපි බුද්ධි නිළධාරීන් වශයෙන් ඊට වැඩිය අපි මෙතනදී අපි වැදගත් වෙන්නේ analysis එක තොරතුරට වැඩිය. ඒ analysis එක මත තමයි information එකක් Intelligence වලට convert වෙන්නෙත් ඒ analysis එක මත තමයි හරියටම මම අර කියපු කාරණා ටික එකතු වෙන්නේ. මොකද ලෝකයේ කොහේවත්ම කියන්නේ නෑ ත්‍රස්තවාදීයා මේ වේලාවේ දැන් එහෙම ගහනවා කියන එක කොහේවත් ලෝකයේ කියන්නේ නෑ. ඉතින් ඒ නිළධාරීන්ගේ හැකියාව මත තමයි ඒ action එක තීරණය වෙන්නේ. මෙතනදී මම දකිනවා ඒ කියන්නේ මේ තියෙන තොරතුරුත් එක්ක ගත්තහාම මෙතෙන්දී යම් කිසි

ප්‍ර : නිශ්චිත මේ තොරතුරේ වැදගත්භාවය අඩු කරලා

පි : ඔව්

ප්‍ර : අඩු කිරීමක් සිදු වෙලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : මෙවැනි අඩු කිරීමක් වැදගත්භාවයේ සිදු වුණාම පහළ නිළධාරීන්ගේ මානසික තත්ත්වය කුමන ආකාරයෙන් වෙයි කියාලද ඔබට කියන්න පුළුවන් ?

පි : ස්වාමිනි මම මෙතනදී දකිනවා මෙතනදී මේ analysis එකේ මදී පාඩුවක් තියෙනවා කියලා මම දකිනවා ස්වාමිනි.

ප්‍ර : නෑ එතකොට මෙවැනි වාර්තාවක් ගියාම අනිකුත් අංශවල නිළධාරීන් මෙම තොරතුර සම්බන්ධයෙන් කුමන ආකාරයේ අවබෝධයක් අවබෝධ කර ගනියි කියලාද තමන්ට හිතෙන්නේ බුද්ධි නිළධාරියෙක් වශයෙන් ?

පි : සාමාන්‍යයෙන් මේක ගියාම immediate එකක් වෙන්නේ නැහැයි කියනවා වගේ හැඟීමක් අපි දකිනවා. රහසිගතව පරීක්ෂණ පවත්වනවා. දැන්මම කලබලවීමක් අවශ්‍ය නෑ කියනවා වගේ පණිවිඩයක් යනවා ස්වාමිනි.

ප්‍ර : දීලා තියෙනවා ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එහෙම පණිවිඩයක් දීලා තියෙනවා ?

පි : ඔව්. එහෙම හැඟීමක් යන්න පුළුවන් මේ නිළධාරීන්ට .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සාක්ෂිකරු ඔබ මේ සාක්ෂි දෙන අවස්ථාවේ දී රැස්වීම් පවත්වන ස්ථාන රැස්වීම් දෙකක් තිබ්බා. එකක් තමයි Security Council ය, අනිත් එක බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම යන කාරණා දෙක සම්බන්ධයෙන් සඳහන් කරන්නට යෙදුණා. අධ්‍යක්ෂක හමුදා බුද්ධි බලකායේ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කිරීමේදී ඔබ Security Council යේ රැස්වීම්වලට සහභාගි වී තිබේද ? එසේම බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම් වලට සහභාගි වෙලා තිබෙනවාද ?

පි : එසේමයි ස්වාමිනි.

ප්‍ර : මා ප්‍රථමයෙන් මොකක්ද මේ බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමක් කියන්නේ ?

පි : බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමක් කියන්නේ සම්බන්ධීකරණය ඒ කියන්නේ සියළුම බුද්ධි අංශ එක table එකට ගෙනල්ලා ආරක්ෂක ලේකම්, CNI ඒ සියළු දෙනාගේ සහභාගිත්වයෙන් අපි ඒ ගන්න තොරතුරු ඒ සතියේ තොරතුරු විග්‍රහ කරලා අවශ්‍ය කරන තීරණ ගැනීම තමයි එතනදී වෙන්නේ Security Council එකට යන්න කලින්.

ප්‍ර : එහිදී මොනවාද සාකච්ඡාවට ගැනෙන්නේ සාමාන්‍යයෙන් මොනවාද සාකච්ඡාවට ගැනෙන්නේ ?

පි : සාමාන්‍යයෙන් සාකච්ඡාවට ගැනෙන්නේ කොටස් හතරක් තමයි . ඒ කියන්නේ විශේෂයෙන්ම අපි ලංකාවට දෙන threat එක අපි කොටස් හතරකින් identify කරලා තිබ්බා **2009** දී. **2015** දී තව විදිහක් . එක අවුරුදු පහකට අපි threat එක identify කරනවා. ඊට පස්සේ හැම වසරකම threat අපි review කරනවා. එතකොට ඔබතුමා කිව්ව විදිහට මෙතැනදී ඒ කියන්නේ මම ඉන්දැද්දී **2012** කිව්වහාම DMI හැටියට එතකොට threat එක identify කරලා තිබ්බේ කොටස් හතරකින් . පළවෙනි threat එක තමයි Possibilities of Re-emerging of Terrorism ඒ කියන්නේ නැවත LTTE ඒමේ හැකියාව. දෙවැනි එක ඇවිල්ලා extremism. තුන්වෙනි එක ඇවිල්ලා trans national crimes ඒ කියන්නේ money laundering, human smuggling, drug smuggling. හතරවෙනි එක Cyber crimes. පස්වෙනි එක ඇවිල්ලා Geopolitical realities and impact ඒ කියන්නේ අනිත් රටවල බුද්ධි අංශ කොහොමද මේ මේ රටේ මේවා වෙන්නේ කියන එකයි. දැන් මේ කරුණු පහ තමයි මේ කරුණු පහ යටතේ අපි Presentations කරන්න ඕනේ. එතකොට ඒක ඉතාමත්ම

FAIR COMMENT BY JEZEEM

පැහැදිලිව එතනදී අපි කියමු නැවත වරක් LTTE එහෙම ඒමේ හැකියාව තියෙන ඒ මාතෘකාව යටතේ මම DMI හැටියට මට ඒ සතියේ තියෙන තොරතුරු සහ පරණ ඒවා තියෙනවා නම් මම විශ්ලේෂණයක් කරලා මම ඒවා ඉදිරිපත් කිරීමක් කරනවා. ඒ කොටස් හතරට මම ඉදිරිපත් කරනවා. ඊට පස්සේ SIS එකත් ඉදිරිපත් කිරීමක් කරනවා. නාවික හමුදාව මේ හතරටම ගියේ නැතත් ඒගොල්ලොන්ගේ තියෙන තොරතුරු මේ හතරට සම්බන්ධයෙන් හෝ වෙනත් තොරතුරු සම්බන්ධයෙන් කරනවා. මේ සියළු තොරතුරු ඔක්කොම ටික අහගෙන ඉඳලා පස්සේ එතනදී ආරක්ෂක ලේකම්තුමා තීරණය කරනවා මේ මේ actions ටික අපි මෙහෙම ගමු කියලා ඒ අවස්ථාවේ දීම සමහර දේවල් ප්‍රධාන දේවල් ටික විතරක් අපි එතනින් ගන්න බැරි තීරණ අපි ඊළඟ දවසේ Security Council එකේ decision එකක් ගන්න ඕනේ. ඒ නිසා මේ මේ කරුණු තමයි අපි සාකච්ඡා කරන්න ඕනේ කියලා අපිට උපදෙස් ලබා දෙනවා. ඒ අනුව අපි ප්‍රධාන කරුණු ටික Security Council එකේදී අපි ඊට වැඩිය strategically ඉදිරිපත් කරලා ඒ අවශ්‍ය කරන ගන්නවා. මේ දෙකටම එන්න කලින් මේ තොරතුරු එන්න කලින් ground එකේදී තව Coordinating Meetings තියෙනවා ප්‍රාදේශීක වශයෙන් උදාහරණයක් වශයෙන් යාපනය ගත්තාම යාපනයේ තිබ්බා හැම සිකුරාදාවකම හෝ බ්‍රහස්පතින්දා දවසක සියළුම යුධ හමුදා බුද්ධි අංශ නිළධාරීන්, SIS නිළධාරීන්, TID නිළධාරීන් ඒගොල්ලො ගෙනල්ලා ඒ ගොල්ලොන් සති දෙකකට සැරයක් conference එකක් තියෙනවා. ඉතින් මම අර කියපු විදිහට ප්‍රාදේශීක වශයෙන් එන තොරතුරු තමයි තව ටිකක් තීරණය වෙලා ඒ යුධ හමුදා, නාවික හමුදාවට එන්නේ. ඒගොල්ලො ඊට පස්සේ strategic වශයෙන් එන තොරතුරු අරගෙන Coordinating Meeting එකට Ministry of Defence එකට එනවා. ඒ ටික අරගෙන ගන්න තීරණ අනම් මනම් ඒ ටික අරගෙන පස්සේ ඊට පස්සේ ආරක්ෂක කවුන්සිලයට යනවා. ඉතින් මේක ඇවිල්ලා සම්පූර්ණයෙන්ම මේ process එකක්. මේ process එක මම ගියා 2009 ඉඳන්.

****

දැන් වේලාව : 04.30 යි.
මෙතැන් සිට ල/ලේ : චන්දිමා මෙය.

FAIR COMMENT
BY JEZEEM

වේලාව: 4.30
පෙරසටහන්:ල/ලේ මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: ල/ලේ චන්දිමා දිල්හානි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබ ප්‍රකාශ කෙරුවා 2012 දී ලංකාවට එන එක අනතුරක් හැටියට extremism identify කෙරුවා කියලා?

පි: එසේය ස්වාමීනි.

ප්‍ර: ඒකට religious extremism ඇතුලත් වෙනවාද?

පි: අනිවාර්යෙන්ම ස්වාමීනි විශේෂයෙන්ම extremism ගත්තාම අපි වැඩියෙන්ම focus කරේ ආගමික තමයි.

ප්‍ර: පස්සේ ඒකේ details කතා කරමු.දැනට එතකොට 2012 දී ත් religious extremism කියන threat එක තිබ්බාද?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: මම කියන ප්‍රකාශය නිවරදි ද කියලා කියන්න විදේශීය රාජ්‍යයකින් ලැබුණු තොරතුරක් අනුව 2004 දී ලංකාවේ religious extremism ඇතිවෙන්න පුළුවන් කියන තත්ත්වයක් ගැන අනතුරක් ලැබිලා යවිවිධ ස්ථාන වල Desk වශයෙන් සඳහන් කරන ආයතන කිහිපයක් 2004 දී ස්ථාපිත කෙරුවාද?

පි: මම දැනුවත්ව ස්වාමීනි එහෙම ස්ථාපිත කිරීමක් වුනේ නෑ. මොක ද හේතුව ස්වාමීනි විශේෂයෙන්ම අපි ගත්තාම

ප්‍ර: ස්ථාපිත කිරීමක් සිදුවුනේ නෑ?

පි: මම දැනුවත්ව නෑ

ප්‍ර: ඔබ දැනුවත්ව?

පි: 2014 දී මම විශේෂයෙන්ම අපිට ලොකුම threat එක තිබ්බේ LTTE එකත් එක්ක සියළුම බුද්ධි අංශ ඒ කියන්නේ අපිට ලොකු resources නෑ. අපිට එක සතුරයි හිටියේ ඒ සියළු බුද්ධි අංශ එකතු කරා අපේ systems වෙනස් වුනා. පළමුවෙන්ම අපි කල යුත්තේ මේ LTTE සතුරා විනාශ කිරීම ඒකට තමයි මුළු පද්ධතියම එකතු වුනේ ස්වාමීනි.

ප්‍ර: ඔබගේ දැනීමේ හැටියට religious extremism සම්බන්ධයෙන් ඉස්සෙල්ලාම ලංකාවට threat එකක් එනවා කියන පදනම මත අපි ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුනේ කොයි අවුරුද්දේද?

පි: මගේ දැනීමේ හැටියට අපි 2010 තමයි විශේෂයෙන් මේ හැම දෙයක්ම එළියට එන්න පටන් ගත්තේ මේවා ඔක්කෝම sub-merge වෙලා තිබ්බේ මං අර වාර්ථාවකින් පෙන්නුම් කරලා තියෙනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ කියපු හන්දා තමයි අර පැහැදිලි කිරීම අවශ්‍ය වුනේ අපි ඒක පස්සේ සාකච්ඡා කරමු.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: මෙම බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමකට ඔබ කියා සිටියා ආරක්ෂක ලේකම් සහභාගිවෙනවා ඊට අමතරව අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂ හමුදා බුද්ධි සහභාගි වෙනවා කියලා. ඊට අමතරව ඔබ තවදුරටත් කියා සිටියා නාවික හමුදාවේ බුද්ධි අංශය සහ ගුවන් හමුදා බුද්ධි අංශයත් මෙම සම්බන්ධීකරණ රැස්වීමට එනවා කියලා ඊට අමතරව වෙන රාජ්‍ය නිලධාරීන් පැමිණෙනවාද නැද්ද?

පි: දැන් MOD එකේ තියෙන කලමණා Intelligence Coordinating Meeting එකට ඔබ කියපු නම්වලට අමතරව Chief of National Intelligence එනවා IGP එනවා Special Branch එන්න ඕනේ.

ප්‍ර: Special Branch කියන්නේ පොලිස්පතිගේ ?

පි: පොලිස්පතිගේ එන්න ඕනේ. ඊට පස්සේ Director TID එන්න ඕනේ director CID එන්න ඕනේ. ඒ සියළුම මං කියපු කට්ටිය සහභාගී වෙනවා.

ප්‍ර: ඒ සියළු දෙනාම ඔබ කිව් ආකාරයෙන් presentation සිදු කල යුතුද?

පි: විශේෂයෙන්ම main presentation ඉදිරිපත් කරන්නේ ඇවිල්ලා Prime Intelligence ඒ Agency කියන්නේ SIS එකයි Slideshow දාලා ඉතුරුවා අනික් හැමෝම තමන් contribute කරන්න ඕනේ ඒ කියන්නේ එක එක්කෙනාට වාර දෙනවා නාවික හමුදාවට කියන්න ඕනේ එකක් Air Force කියන්න ඕනේ එකක්, TID එකට කියන්න ඕනේ එකක්, CID එකට කියන්න ඕනේ එකක්, SIS එකට කියන්න ඕනේ එකක්, මොකද ඒ වගේ .

ප්‍ර: නැවත Record කිරීම සඳහා කරුණා කරලා කියන්න මෙම සම්බන්ධීකරණ රැස්වීමට සහභාගී වන්නේ කවුද කියලා අධ්‍යක්ෂක ?

පි: ආරක්ෂක ලේකම්, සමහර අවස්ථාවේදී state ඒ කියන්නේ **2015** දී State Minister සහභාගි වෙන අවස්ථා තිබ්බා.

ප්‍ර: රාජ්‍ය අමාත්‍ය?

පි: රාජ්‍ය අමාත්‍ය. ඊට අමතරව රාජ්‍යය බුද්ධි ප්‍රධානීන්,Director SIS, Director Military Intelligence, Director Naval Intelligence, Director special branch , Director Air Force Intelligence, Director TID , Director CID,IGP, Army Commander, Navy Commander ,Air Force Commander ,STF Commander, STF එක්කෙනාත් එනවා සමහර අවස්ථාවලදී එනවා.

FAIR COMMENT BY JEZEEM

ගරු අදිකාරි මැතිණිය

ප්‍ර: chief of Defense Staff ?

පි: sorry ස්වාමිනි Chef of Defense Staff ත් එනවා.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා

ප්‍ර; මේ අනිවාර්යෙන්ම පැමිණෙනවාද නැත් නම් ආරාධනා?

පි: මේ මං කියපු කට්ටිය අනිවාර්යෙන්ම පැමිණිය යුතු කට්ටිය.

ප්‍ර: කොහේද ඒක සඳහන් වෙලා තියෙන්නේ කියලා ඔබට දැනිමක් තියෙනවාද?

පි: ඒක අනිවාර්යෙන්ම අපි ගත්තොත් මේක ඇත්තටම මේක පටන් ගත්තේ ඇවිල්ලා 2006 ඉදන් 2006 නොවත්වාම 2016 වෙනකම් එක දිනක ඒ කියන්නේ unless secretary defense පිටරට ගියත් ඒ දෙවනියා තියෙනවා හැමදාම ඒ වකවානුවේදි හැම අඟහරුවාදා දිනකම මේ meeting එක තියෙනවා. ඊට පස්සේ හැම බදාදා දිනකම Security Council එක තියෙනවා.

ප්‍ර: එතකොට මීට අමතරව වෙනත් අමාත්‍යාංශ ලේකම්වරු මෙම බුද්ධි සම්බන්ධිකරණ රැස්වීමට එනවාද?

පි: ඒක විශේෂයෙන්ම අපි මේ සතියේ ගත්තනම් immigration එකේ යම් කිසි ප්‍රශ්නයක් ගැටළු සහගත ප්‍රශ්නයක් ගත්තානම් Security Defense ඊළඟ සතියට කතා කරනවා Controller immigration එකට එන්න කියන්න කියලා.

ප්‍ර; ආරාධනා පරිදි යම් යම් රාජ්‍ය නිලධාරීන් එනවා?

පි: එහෙමයි.

ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා

ප්‍ර: ඔබගෙන් ඇහුවේ ඒ අඟහරුවාදා තියෙන meeting එකට සහභාගි වෙන්න ඕනේ කවුද කියන එක යම් කිසි ලේඛනයක සඳහන් වෙනවාද Circular එකක් තියෙනවාද or its unwritten understanding එකක්ද?

පි: ස්වාමිනි ඒ කියන්නේ මගේ දැනුම අනුව මොකද ඒක ඒ කියන්නේ 2006 වසරේ තමයි පටන් ගත්තේ ඒ ඒකේ ඉදන් මම 2006 කීපයකට ඉදලා මම 2009 ලංකාවට ආවට පස්සේ ඔය සියළු දෙනාම ඇවිල්ලා තිබ්බා නමුත් මම දන්නේ sorry ස්වාමිනි මේකේ ඒක written තිබ්බාද කියලා හැබැයි අනිවාර්යෙන්ම දැනුම් දීමක් ලියුමක් එවනවා. ඒ ගොල්ලන්ට එන්න කියලා .

****

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: කවුද එවන්නේ?

පි: ඒක එවන්නේ CNI Office එකෙන් .

ප්‍ර: ඊළඟට ඔබ කියා සිටියා security council එක ගැන ආරක්ෂක කවුන්සිලය මෙම ආරක්ෂක කවුන්සිල රැස්වීමකට කවුද සහභාගිවන්නේ අනිවාර්යෙන්ම?

පි: අනිවාර්යයෙන්ම ආරක්ෂක කවුන්සිලයේ රැස්වීමට ජනාධිපතිතුමා අනිවාර්යයෙන් සහභාගි විය යුතුයි. ජනාධිපතිතුමා නැත්නම් ආරක්ෂක කවුන්සිලයත් තියෙන්නේ නෑ මොකද ජනාධිපතිතුමා තමයි ඇවිල්ලා Armed force වල Chief in Armed force එතකොට ඒ මත සේනාධිනායක හැටියට එතකොට ඒ එක්කම Defense Minister ත් ජනාධිපතිතුමා ඇවිල්ලා තමයි ඉතින් ඒ තියෙන බලතල අනුව එතනදි ජනාධිපතිතුමාට අමතර එතනදී ජනාධිපතිතුමාගේ ලේකම් එතනදී සහභාගී වෙනවා. ගොඩක් වෙලාවට Policy matters තමයි මේවා discuss කරන්නේ ඊට අමතරව ස්වාමීනි Secretary Defense Chief of Intelligence ,Army Commander ,Navy Commander ,Air Force Commander , ඊට අමතරව Director Finance, sorry Secretary Finance, Secretary Foreign Ministry ඊට අමතරව බුද්ධි හැටියට DMI ,SIS, පමණයි සහභාගි වෙන්නේ.

ප්‍ර: පොලිස් පතිත් ඇතුළුව?

පි: ඔව් IGP ත් ඇතුළු

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර; Prime Minister අගමැතිතුමා ?

පි: අගමැතිතුමාත් සහභාගි වෙනවා සමහර වේලාවේදී අගමැති සහභාගි නොවන අවස්ථාත් තිබ්බා ඒ කියන්නේ මං ඉන්නකාලේදි විශේෂයෙන්ම **2012 ,2013** වසරවලදී නමුත් ගොඩාක් දුරට අගමැතිතුමාත් සහභාගි වෙනවා.

ප්‍ර: ජනාධිපතිතුමා නැති අවස්ථාවේදි ?

පි: නැති අවස්ථාවකදී security council එකක් තියන් නෑ ස්වාමීනි.

ප්‍ර: විදේශගත වූ අවස්ථාවල?

පි: ඒ අවස්ථාවලදි security council තියන්නේ නෑ.මොකද තීරණගත යුත්තේ ජනාධිපතිතුමා නිසා.

ප්‍ර: ආරක්ෂක ඇමතිවරයෙක් හිටියොත් පුළුවන්ද?

පි: ආරක්ෂක ඇමතිත් ඇවිල්ලා ජානාධිපතිතුමා තමයි defense

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: වෙනම ආරක්ෂක ඇමතිවරයෙක් හිටියා නම් ?

පි: දැන් විශේෂයෙන්ම අපි DMI හැටියට ආරක්ෂක කවුන්සියලයට මට අසනීප තත්ත්වයෙන් යන්න බැරිවුනොත් මා වෙනුවෙන් වෙන කවුරුත් ඉදිරිපත් වීමක් වෙන්නේ නෑ.මොකද ඒ Policy ඔක්කෝමලා ඒ line up එකත් එක්ක ඉන්න ඕනේ මොකද විශේෂයෙන්ම අපි ගන්න තීරණ කිසි දෙයක් අපි ලියන්නේ නෑ මොකද ඔක්කෝම ගත යුතු පුද්ගලයෝ තමයි එතන ඉන්නේ එතන සාකච්ඡාවුනාම එතැනින් කිව්වාම මේ විදියට තිරණය ගන්න කිව්වාම එතනම ලබා දීමක් සිදුවෙනවා.

ප්‍ර; ජනාධිපතිතුමාගේ කාර්ය භාර්ය මොකක්ද එම council ලේ?

පි: ජනාධිපතිතුමා තමයි ඒ මුල සුන ගන්නේ එතකොට ඒකේදී අර Briefing එක අනුව විශේෂයෙන්ම Policy level එකේ ගත යුතු තීරණ තමයි ගන්නේ ඒ වෙනකොට අර security Coordinating , Ministry of Defence එකේ තීරණ අරගෙන ඉවරයි. නමුත් ඒ Meeting වලට එන්නේ නෑ විශේෂයෙන්ම foreign secretary එන්නේ නෑ. ඊට පස්සේ secretary මුදල් අමාත්‍යාංශය එන්නේ නෑ. ඉතින් එතනට ආවාට පස්සේ ඒ වගේ ගැටළු සහගත තත්ත්වලදී ඒ වගේ තීරණ ලබා ගැනීම් සිදුකරනවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: මේ මෙම ආරක්ෂක කවුන්සිලයේදී එකේ ජාතික ආරක්ෂාව ගැන සාකච්ඡා වෙනවද නැද්ද?

පි: මේක තනිකර මේකේ coordinating එකේ මේ Conference මම හිතන්නේ අවුරුදු 2012 ඉදන් 2016 වෙනකම් නිත්‍ය සාමාජිකයෙක් හැටියට හිටියා 2009 ඉදන් ඒ topics අනුව විදේශ කටයුතු මොනවාහරි තිබ්බොත් මම යනවා. මේකේ සම්පූර්ණ සාකාච්ඡා වෙන්නේ 95% මම සාකච්ඡා සියළු දේම ඇවිල්ලා directly ම රාජ්‍ය ආරක්ෂාවට දේවල් තමයි මේකේ සාකච්ඡා වෙන්නේ .

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: තමන් 2016 වෙනකම් හිටියේ ආරක්ෂක council ට සහභාගි වුනාද?

පි ස්වාමිනි මම 2016 නොවැම්බර් අවසානය council සහභාගි වුනා.

ප්‍ර: එම කාල සීමාව තුලදී මසකට කොපමණ රැස්වීම් මාලාවක් පවත්වනවාද?

FAIR COMMENT — BY JEZEEM

පි: ස්වාමිනි මං අර කලින් කියපු 2006 ඉදන් 2015 වෙනකම් රට ගියේ නැත්නම් අනිවාර්යෙන්ම security council එක තිබ්බා. ඒක වෙනසක් වුනේ නෑ.

ප්‍ර; කී වරක්ද කී සැරයක්ද?

පි: ඒ හැම සතියේම තියෙනවා.අනිවාර්යෙන්ම බදාදා දවසක තියෙනවා.ඒ එක්කම හැම අඟහරුවාදාවකම Secretary Defense නැත්නම් හෝ එහෙම නැත් නම් CNI හරි හැම අඟහරුවාදාවකම ඒ තිබ්බා. 2015 න් පස්සේ ඒක මුල්කාලයේදී තිබ්බත් පසුකාලීනව ඒවා හරි විදියකට තිබ්බේ නෑ. නිලධාරින් පැමිණියේත් නෑ ගොඩාක් වේලාවට.

ප්‍ර: ඒ හරි විදියකට තිබුන් නෑ කියන්නේ තමන් ඒ කියන්නේ ආරක්ෂක රැස්වීම් තිබ්බේ නැද්ද මාසිකව සතියකට වඩා ?

පි: හරියට තිබ්බේ නෑ.ඒ කියන්නේ සමහරවෙලාවට ආරක්ෂක රැස්වීම් සති ගණනක් යනකල් නොතිබුණු අවස්ථා තියෙනවා Coordinating meeting එකත් ගොඩාක් දුරට තීරණ ගැනිමේ තිබ්බේ නෑ. සමහර අය එන්නේ නෑ.සමහර අය සමහර Reasons කියලා එන්නැතිව ඉන්නවා.ඉතින් ඒක නිසා මේකේ ජාතික ආරක්ෂාව පිළිබදව ගත යුතු ක්‍රියාමාර්ග ගොඩාක් අතපසුවීම් සහ ඒවා ගන්න හැකියාවක් ලැබුණ් නෑ ඒවාට විවිධ හේතූන් තිබුනා ඒවාට.

ප්‍ර; ඒ ආරක්ෂක council රැස්වීම් එම කාලසීමාවේ පසුව තමන් කියන විදියට නොපැවැත්වීමට හේතු මොනවාද?

පි: ආරක්ෂක council.

ප්‍ර: ඔව් නොපවැත්වීම පරණ විදයටම දිගටම පවත්වන්නේ නැතිවීමට ?

පි: ස්වාමිනි ඒක සම්පූර්ණයෙන්ම ආරක්ෂක council එකන් තීරණය කරන්නේ ජනාධිපතිතුමා එතකොට ජනාධිපතිතුමා තීරණය කරන්න මං හිතන්නේ ගොඩාක් දුරට ආරක්ෂක ලේකම් කියන්නත් ඕනේ සර් මෙහෙම ගොඩාක් important points තියෙනවා අපි මේක කතා කරමු කියලා නමුත් ඒ ඔක්කෝම තීරණය වන්නේ ඇත්තටම ජනාධිපතිතුමාට ඕන විදියට තමයි

ප්‍ර: ජනාධිපතිතුමාගේ වගකීමක් නේද ආරක්ෂක කවුන්සිලය කැඳවීම ?

පි: ජනාධිපතිතුමා අතේ තමා වගකීම තියෙන්නේ.

ප්‍ර; ඒ කියන්නේ ඔබ කියන්නේ ඒම වගකිම හැටියට බුද්ධි ප්‍රධානියෙක් වශයෙන් එම වගකිම පැහැර හැරීමක් සිද්ධවෙලා තියෙනවාද?

පි: ස්වාමිනි මම ඒ පිළිතුර දෙන්න ගොඩාක් අපහසුයි ස්වාමිනි.

ප්‍ර: නෑ තමන්ගේ පළපුරුද්දෙන් තමන්ගේ තමන් දැනුවත්ව තමන් සහභාගි වුනානේ තමන් 2016?

Fair Comment by Jezeem

පි: මම හිතන්නේ විශේෂයෙන් ආරක්ෂක ලේකම්ටත් වගකීමක් තියෙනවා.

ප්‍ර: නෑ කාගේද ?

පි: එතනදී ඇත්තටම ජනාධිපතිතුමාට ලොකු දැනුමක් තියෙනවානම් ජාතික ආරක්ෂාව පිළිබඳව Automatically ඒක තියන්න ඕනේ කියන එක මම හිතනවා. නමුත් එතුමාට සමහරවිට ඒ පිළිබඳව ලොකු දැනුමක් අඩු වගේ දැනේනවානම් ආරක්ෂක ලේකම්ගේ වගකීම තමයි මේ පිළිබඳ මේක තියන්න ඕනේ කියලා කියන එක. ඉතින් මේ මෙතන මං හිතන්නේ මං දැක්ක මගේ කාලේදී ගොඩාක් දුරට මේ ආරක්ෂාව පිළිබඳව දැනුමක් තිබ්බ දැනුම අඩුයි කියලා මට හිතෙන්නේ ඒක නිසාම මේකේ ඉන්න අනෙකුත් නිලධාරිනුත් ඒ වලින් යම් යම් විදියට මේ කියන්නේ දැන් discipline එකක් නායකයෙක් හැටියට ආරක්ෂක ලේකම් හැටියට සියළු දෙනා පැමිණිය යුතුයි කිව්වාම පැමිණිය යුතුයි කියන එක අපි වුනත් එනවා එන්නැතිව ඉන්න බෑ. අපි එනවා අනිවාර්යෙන්ම ඒ කියන්නේ නමුත් ඉතින් සමහර වෙලාවලදී අපි දැක්කා 2015 න් පස්සේ සමහර විට meeting තිබ්බාත් නිලධාරින් පැමිණෙන්නේ නෑ. සමහරදාට නිලධාරින් කලින් ඇවිල්ලා හමුවීමක් කරලා යනවා. ගන්න discussion වලදී තීරණ ගැනීමක් සිදු වෙන්නේ නෑ ඒක මං නිලධාරින්ට ඒ කියන්නේ අපිට මේවා කියන්න බෑ.ඉතින් මං හිත්න්නේ priorities වෙනස් වුනා කියලා මම දකින්නේ ජාතික ආරක්ෂාව තිබ්බ priority එකක් නෙමේ තිබ්බේ වෙන දේවල් වලට priority එක තිබ්බේ. බුද්ධි අංශවල රාජකාරිනුත් මේකේ තියෙනවා රටක් වුනාම කොටස් 4 ක්ක් තියෙනවා ස්වාමීනි. විශේෂයෙන්ම රටක ප්‍රධාන තීරණ ගන්නේ council එකෙන් ඒකේ විශේෂයෙන්ම Information intelligence, diplomacy, military සහ diplomacy මේ හතර තමයි ලෝකයේ තියෙන pillars 4 රටක සියළු තීරණ ගන්න මේ තීරණ ගැනීමේදී ඉතාමත්ම දුර්වලතා ගොඩාක් මෙතන අපි දැක්කා බුද්ධි නිලධාරියෙක් හැටියට.

ප්‍ර: දැන් තමන් කිව්වා ජනාධිපතිවරයාට ආරක්ෂාව පිළිබඳ දැනීමක් නැති නිසා වෙන්න ඇති කියලා?

පි: මම එහෙමම කිව්වේ නෑ ස්වාමිනි මම කිව්වේ මේ විදියට ඒ කියන්නේ මම ගත්තොත් මම වැඩ කරේ කලින් වැඩ කරේ ආරක්ෂක ලේකම්තුමත් එක්ක තමයි එතුමා මේ යුද්ධයත් එක්ක හැප්පිලා මේකේ හිටපු කට්ටිය ඔක්කෝම ඒ දැනුමයි ඊට පස්සේ දැන් අපි කවුරු හරි අලුතෙන් ආවාම ඒක ජනාධිපතිතුමා විතරක් නෙමේ ආරක්ෂක ලේකම් තුමාත් අවාත් ජාතික ආරක්ෂාව පිළිබඳව දැනුමක් නැත්නම් ඒ කියන්නේ

FAIR COMMENT BY JEZEEM

සාමාන්‍ය දැනුමක් තියෙන්න පුළුවන් නමුත් මේ පිළිබඳව මොකක්ද ඊට වැඩිය ලොකු දැනුමක් තියෙන්න ඕනේ මොකද හේතුව එතුමන්ලා තමයි තීරණ ගන්නේ .

ප්‍ර: කලින් සිටි ජනාධිපතිවරුන්ට තිබ්බාද ඒ දැනුම?

පි: විශේෂයෙන්ම ඒ කාලයේදි විශේෂයෙන්ම යුද්ධයක් තිබ්බා ඒකේ හැමෝම alert එකේ හිටියේ ඒ වගකීම සියළු දෙනාම හදුනගත්තා එතකොට ඒ focus එක හොදටම තිබ්බා ජනාධිපතිතුමනි සොරි ස්වාමිනි.

<u>ගරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර; දැන් ජනාධිපති වරයෙකුට ජාතික ආරක්ෂාව පිළිබඳ ලොකු දැනුමක් නොමැති වුනත් දැන් නිලධාරින් ඉන්නවානේ ජනාධිපතිතුමා යටතේ ආරක්ෂක ලේකම් , CNI, SIS , Military forces තුනේම මෙහෙම commanders ලා ඉන්නවානේ එතකොට ඒ අයට අවබෝධයක් තියෙන්න ඕනේයි කියලා හිතන්නේ.ඔබ නැද්ද මේ අවධානය පිළිබඳව ජනාධිපතිතුමා හමුවී එතුමාට කරුණු පැහැදිලි කිරීමට ඒ අයට වගකීමක් තිබෙයි කියලා ඔබ හිතනවාද එහෙම නැත්නම් මොකක්ද සිද්ධ වුනේ ජනාධිපතිතුමාව දැනුවත් කිරීමේ තිබ්බ්ච අඩුපාඩුව?

පි: ස්වාමිනි එක තැනක මං කිව්වා කලිනුත් විශේෂයෙන් හැමෝටම ඒ වගකීමක් තියෙනවා නමුත් ප්‍රශ්නය වෙලා තියෙන්නේ හැමෝම වගකීම අයටම මේ පිළිබඳ දැනුමක් නැත්නම් එතනත් ලොකු ප්‍රශ්නයක් ඇතිවෙනවා විශේෂයෙන්ම මේ appointment එක පත් කිරීමේදී ඊට වැඩිය වගකිවයුතු වෙන්න ඕනේ අනෙක් රටවල ගත්තාම Russia එහෙම ගත්තාම කොච්චර දක්ෂ සිවිල් නිලධාරියෙක් වුනත් මාස තුනක ජාතික ආරක්ෂාව පිළිබඳව යම් කිසි පාඨමාලාවක් කරලා තමයි ඒ තත්ත්වයට පත් කරන්නේ. ඉතින් ඒක නිසා මෙතනදි මම දකින්නේ ඇවිල්ලා බුද්ධි නිලධාරියෙක් හැටියට සම්පූර්ණ systematic failure එකක් හැටියට තමයි මම දකින්නේ රාජ්‍ය විශේෂයෙන්ම ජාතික ආරක්ෂාව පිළිබඳව ඇත්තටම මොකක්ද රාජ්‍ය ආරක්ෂාව රාජ්‍ය ආරක්ෂාවෙන් විය යුත්තේ මොකක්ද කියන එක පිළිබඳව කාටත් ලොකු දැනුමක් සහ මං හිතන්නේ ඒ තුලින් වගකීමක් තිබුන් නෑ කියලා මම බුද්ධි නිලධාරියෙක් හැටියට මම දකිනවා ස්වාමිනි.

<u>ගරු විනිසුරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියන හැටියට මේ වෙන රටවල ඒ විදියට ඒ තත්ත්වය තියෙනවා කියලා කිව්වානේ එහෙම නම් ඒ ඔය මේ නිලධාරින්ට වෙනම හමුදා පුහුණුවක් වගේ දෙයක් දිය යුතුද ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව් ස්වාමිනි හමුදා පුහුණුවක් නෙමේ ස්වාමිනි මම මේ පාඨමාලාව මේ එන්න කලින් මාස 06 කට කලින් මම Russia හිටියා අපේ NDC එකේ කොටසක් හැටියට දවස් 10 ක් ඒ System එක study කරා ඉතින් එතනදි අපිට කියපු තමයි විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයේ සියළුම නිලතල ඒ කියන්නේ secretary විතරක් නෙමේ එන්න කලින් වෙනමම teller course එකක් තියෙනවා weapon වේ ජාතික ආකර්ෂාව කියන්නේ ලොකු දෙයක් ඒ කියන්නේ විශේෂයෙන්ම extremism security ,energy security ,cyber security ,community security, public security , මේ කියන්නේ අති විශාල scope එකක් අපි කතා කතා කරන්නේ මේ පිළිබඳව ලොකු දැනුමක් දෙන්න ඕනේ strategic ලෙවල් ඒ අනුව ඒ දැනුමත් එක්ක ආවානම් අනෙක් එතකොට ලේසි මේක මේ තත්ත්වය හඳුනාගන්න සහ පරිපාලනය කරන්න එහෙම නැතිවෙන කොට වෙන්නේ ජුනියර් නිලධාරින් තමන්ගේ තියෙන knowledge එකත් එක්ක ගොඩක් දුරට mislead කරන්න පුළුවන්. ඒ ගොල්ලන්ගේ අවශ්‍යතා වෙන් කරන්න පුළුවන් ඒ එක්කම මම එකක් දැක්කා මට අවසර දෙනවානම් මම කියන්නම් මම දැක්ක දෙයක් security council එකේදී විශේෂයෙන්ම අපි හැම තිස්සේම මම වැඩ කරන කොට එක් නායකත්වයක් පැහැදිලිව දැක්කා එක policy එකක් දැක්කා මම පළවෙනි වතාවට මම දැක්කා අපි security council මුහුණ දිලා එද්දි විශේෂයෙන්ම ජනාධිපතිතුමා ගේ පැත්ත බැලුවාම එතුමා විශේෂයෙන්ම nationalism line ඒකේ හිටපු කෙනෙක් අගමැතිතුමා ගත්තාම ගොඩාක් liberal තත්ත්වයක තියෙන කෙනෙක් ඉතින් මං හිතන්නේ ලෝකයේ රටවල් 190 ගත්තාම රටවල් තුනක විතර මේ වගේ ක්‍රමයක් ඇතිවෙලා තියෙන්නේ liberal වාදින් සහ nationalist වාදින් මේවා කරන එක අපි එතනදී තීරණය අපි එතනදී briefing කිරීමේදී අපි ඉතාමත්ම අපහසුතාවයට පත් වුන අවස්ථා තියෙනවා උදාහරණයක් වශයෙන් J.V.Pඑකේ අනුර කුමාර දිසානායක මැතිතුමා ආවාත් එහෙනම් අපි ඉතාමත් පැහැදිලියි ඒ line up එකට අපි එනවා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමේදි මෙතනදි අපි ගැටළු රාශියකට පත්වුනා මම හිතනවා මම අනික් අය ගැන කියන්න දන්නේ නෑ මම බුද්ධි නිලධාරියෙක් හැටියට අපි යම් යම් දේවල් ඉදිරිපත් කිරීමේ දී සමහර reject සමහර ඒවා promote කරා ඉතින් මට මම සමහර විට security council යන කොට report දෙකක් අරගෙන යනවා. සමහර අවස්ථාවලදී මොකද දෙදෙනාම ඉන්නැද්දි මම එක report එකක් කරනවා එක්කෙනෙක් ඉන්නැද්දි එක report එකක් කරනවා.

FAIR COMMENT
BY JEZEEM

ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

ප්‍ර: ඔබ ඒ report දෙකක් හදාගෙන යාම වැරැද්දක් නෙමේද?

පි: ඔව් ඒකත් මම කියන්නම් ස්වාමීනි මොකද මං විශේෂයෙන්ම මං බුද්ධි නිලධාරියෙක් හැටියට අපි මම අනුගමනය කරන්නේ එස්.විවේකානන්දන් කියලා තියෙනවා poet කෙනෙක් ඔබ විශේෂයෙන් බුද්ධි නිලධාරියෙක් හැටියට තිස්සේම 100% ම හැමදෙයක්ම කරන්න බෑ ස්වාමීනි. විශේෂයෙන් අපි darkness එක blame කරොත් ඒ darkness එක අපිව පිළිගන්නවා. if you can light one candle need to candle it එතකොට බුද්ධි නිලධාරියෙක් හැටියට අපි 100% වැඩ කරා නමුත් එතනදී මේ අවස්ථාවේදී අපි අපිට හැකියාව තියෙන්න ඕනේ විශේෂයෙන් ඕනම සතුරෙක් මිතුරෝ අපිත් එක්ක හැම තිස්සේම ඉන්නවා ඕනෑම සතුරෙක් එක්ක අපිට හැකියාව තියෙන්න ඕනේ අපේ අභිප්‍රායට අපි යන්න එතනදී මම 100% ප්‍රකාශ කරන්න ගියා නම් මං පැය 24 න් ස්වාමීනි මම එළියේ එතකොට මේ සහරාන්ලා සමහරවිට 2015 දී ඇතිවෙන්න ඉඩ කඩ තිබ්බා. එතකොට මමත් බුද්ධි නිලධාරියෙක් හැටියට මම මේ තත්තවයට එන්න සෑහේන හැල හැප්පීම් රාශියක් තිබ්බා එතකොට අපිට 80% අපිට දෙන්න බැරිවුනත් 30% දෙන එක ඉතාමත්ම වැදගත් ඒ 30% දිම තමයි වුනේ ඒ තුළින් තමයි ස්වාමීනි 2016 නොවැම්බර් වෙනකම් හිටියේ අවසානයේදී ඒ ගැලවීමත් එක්ක මේකේ ලොකු වෙනසක් ඇති වුනා ඒ තුලින් තමයි ස්වාමීනි 2018 සහරාන්ලා බිහි වුනේ එහෙම නැත් නම් ඒ මගේ මම පැහැදිලිව documentation දීලා තියෙනවා. ඒකේදී අපි දැක්ක threat එක 2012 දී දැක්ක threat එක අපි අනුගමනය කරපු ක්‍රියාමාර්ග එතකොට ලංකාවේ radicalization එකක් තිබ්බේ නෑ. නමුත් අපි පිටරටට ගිහිල්ලා පිටරටට යවලා ඇමරිකාව වගේ රටවලට අපට පුහුණු වීම් ලබා දීලා සම්ප්‍රදායි ක්‍රමයෙන් එහා පැත්තට ගිහිල්ලා ඒ ඒ systems හදලා first time open media cells හදලා ඒවාට වෙනමම බුද්ධි අංශයෙන් එළියට ගිහිල්ලා ඒවා කරලා අපි live targets කරලා පිටරටත් එක්ක සම්බන්ධ වෙලා මොකද මේ එක threat එකක්වත් ලංකාවෙන් එන threat නෙමේ අපි විදේශ රටවල් එක්ක පුහුණුවීම් කරලා civilians ලා අරගෙන Arabic training කරන කට්ටිය අරගෙන මේ ඔක්කෝම සුදානම් වෙලා තිබ්බේ. නමුත් ලංකාවේ පළවෙනි වතාවට තමයි 2015 තමයි ජනවාරි 12 තමයි වගේ පළවෙනි කණ්ඩායම ISIS එකට යන්නේ ISIS කියන සංවිධානය බිහි වෙන්නේ ඇවිල්ලා 2014

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ජුනී 29 කැලිෆ් කියන එක බිහිවෙන්නේ ඇවිල්ලා ඒ ටිකේ කරපු ප්‍රකාශයන්ට අනුව

ප්‍ර: එතකොට ඔබ බුද්ධි අංශ දැනගෙන හිටියා මේ සම්බන්ධව 2014,2015ත්?

පි: අපි මුලින්ම කණ්ඩායමක් යන්නේ 2015 ශ්‍රී ලංකාවෙන් නමුත් අපි දැනගෙන හිටියා මේ threat එක එනවා කියන එකට ඒකට අවශ්‍ය කරන සියළුම දේවල් ඒ කියන්නේ අපිට capacity building ,capability enhancement මේ සෑම එකක්ම අපි Physically කලා ඒවා ඔක්කෝම ඉදිරිපත් කරලා තියෙනවා අපි කරපු දේවල් මෙනවාද.

ප්‍ර: දැන් තමුන්ලා ISIS ගැන 2014 ඉදන් දැනගෙන හිටියා?

පි: මොකද ISIS එක බිහිවෙන්න කලින් අල්කයිඩා එක බිහිවෙනවා. අල්කයිඩා එක බිහිවුනාට පස්සේ IS කියන සංවිධානය බිහිවෙනවා ඊට පස්සේ ISIL කියන සංවිධානය බිහිවෙනවා .

ප්‍ර: ඒ කියන්නේ හමුදා බුද්ධි අංශ වලත් තමන් හමුදා බුද්ධි අංශයේ හිටියා ඒ කාලේ හමුදා බුද්ධි අංශවලට එම තොරතුරු ලැබිලා තිබ්බා?

පි: තොරතුරු පමණක් නෙමේ ස්වාමිනි පිටරටවලට අපි ඇරියා. මම 2013 දී මම ගියා ඇමරිකා එක්සත් ජනපදයට විශේෂයෙන්ම මේ threat එක මොකද මේවා එකක්වත් ලංකාවෙන් එන ඒවා නෙමේ Regionally එන threat මේවා spill over effect එකක් තියෙනවා. ඉතින් මේවාට අපි කලින් ඉඳන්ම අපි මේ තත්ත්වයක් ආවොත් මුහුණදෙන්න අපි සූදානම් හැම තිස්සේම හිටියා. ඉතින් අපි ඒ හින්දා තමයි මුලින්ම ලංකාවේ කව්රුත් විවිධ අය විවිධ ප්‍රකාශ කරනවා නමුත් ISIS එක බිහිවෙන්නේ 2014 ජූනි 29 එතැනදි මේ caliphate කියන එක කියනවා එතනදි පැහැදිලි oath එකක් දෙන්න වෙනවා. එතනදි අල් බග්ඩාඩ් එයා ප්‍රකාශයක් කරනවා ක්‍රම 3ක් ගැන එයා සඳහන් කරනවා. ඒගොල්ලන් කියනවා පුළුවන් නම් ඒ රටවල ඉඳන් සටන් කරන්න. අනික් කට්ටිය නැවත වරක් ඒ කියන්නේ මේ රටට එන්න කියන එක. ඒ අනුව ලංකාවෙන් පළමු කණ්ඩායම යන්නේ 2015 ජනවාරි 12. හැබැයි ඒ යන කණ්ඩායම පිළිබඳ අපිට දැනුමක් තිබ්බේ නෑ. නමුත් පළමු වතාවට අපිට පිටරට ඒජන්සි එකක් මාර්තු මාසේදි අපිට පොඩි දැනුම්දීමක් කරනවා කට්ටියක් ඉන්නවා කියන එක. අපි ඒවත් තව ටිකක් develop කරගෙන අපේ social media spectrum technology එකක් මෙව්වා කරගෙන යනවා. 2015 දී ජූලිවලදී නිලාම් කියන පුද්ගලයා කියන පුද්ගලයා මරණයට පත්වෙනවා. හැබැයි නිලාම් මරණයට පත්වෙනකොට අපි දවස් 15ක් වගේ කාලයකදි සියළු network එක අපි identify කරනවා 38ක්

FAIR COMMENT BY JEZEEM

ඉන්නවා රට මේ කව්ද ගියේ. මොකද්ද කවුද travel agent. මොන වීසාද අරගෙන ගියේ.

ප්‍ර: Travel agent දැන ගෙන හිටියද?

උ: ඔක්කොම අපි දන්නවා 2015 දි . ඒ විතරකුත් නොවෙයි අපි ඒ විදේශීය සංවිධානත් එක්කත් අපි සම්බන්ධ වෙනවා. අපි identify කරනවා මොකද්ද ඒගොල්ලන් ලංකාවේ බලන්නේ කියන එක පිළිබඳව. අතිවිශාල ගණනාවක් සිදුවෙනවා. ඒ අතරෙදි අපි 2015දී මං presentation එකක් කරනවා 2015 නොවැම්බර් මාසයේදී මේ සියළුම ගියපු කට්ටිය කව්ද ගියේ මොකද්ද කියන එක. එතැනදි අපි දැනගන්නවා ඉදිරියේදී මේක ප්‍රශ්නයක් වෙනවා කියලා. එතකොට සිරියාවෙන් ඊට පස්සේ අපි මේ presentation එක කළාට පස්සේ ඒ අතරේ immediately අපි මේ incident එකත් එක්කම අපි identify කරනවා ලංකාවේ කණ්ඩායම් 2 ක් ඒක ඇවිල්ලා JMI කියන සංවිධානය හා JI කියන එක. JMI සංවිධානයට අපේ බුද්ධි අංශයට හැකියාවක් ලැබෙනවා මේකට infiltrate කරන්න ඒ ඒ පටන් ගන්නවාත් එක්කම ඒවා ලොකු possess එකක් ස්වාමීනි විශේෂයෙන් මගේ ජීවිත කාලයේ අවුරුදු 32 කාලයේදී මං infiltrations හතරයි මං කරලා තියෙන්නේ එහෙම ලේසියෙන් කරන්න පුළුවන් infiltrations නෙමේ. අතිවිශාල දැනුමක් සහ මේකත් කරන්න ඕනේ ඊට පස්සේ අපි මේකේ වෙන සියළු දේවල් අපි දැනගන්නවා 2016 වෙනකොට අපි ඉදිරිපත් කරනවා මේ මේ දේවල් නිරතවම අපි security council එකේ කියනවා නමුත් මේ පිළිබඳව .

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබගේ දැනීමේ හැටියට ඔබ ගොඩාක් දේවල් ඉක්මනට කියවනවා අපිට ඒ වගේ දැනීමක් නැනේ පොඩ්ඩක් තියෙන්නේ ඉස්සෙල්ලාම කියන්න ඔබ presentation කෙරුවා කියලා කිව්වා නේද?

පි: ඔව් ස්වාමිනි.

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: තමන් අර ඉස්සෙල්ලා ඉදිරි ප්‍රශ්නයට යන්න ඉස්සෙල්ලා කියන්න security council එකේදී ඔබ කීවා අගමැතිතුමා සහභාගී වුනේ නෑ කියලා සමහර බොහෝ අවස්ථාවලදී අගමැතිතුමා සහභාගීවුනේ නෑ කියලා ජනාධිපතිතුමා කියලා මුලිකත්වය ගන්නේ කියලා හැමදාම අගමැතිතුමා සහභාගි වුනාද නැද්ද?

පි: ස්වාමිනි.

ප්‍ර: මුල ඉදන්ම ඒ කියන්නේ 2015?

FAIR COMMENT BY JEZEEM

පි: අපි **2012** ඉදන් මම යන අවස්ථාවලදී මගේ දැනුමේ හැටියට දි.මු ජයරත්න අගමැතිව හිටියා කියලා මගේ මතකයේ හැටියට දැන් එතුමා සමහර අවස්ථාවලදී අසනිප තත්ත්ව නිසා ලොකුවට සහභාගී වීමක් වෙන්නේ නෑ.

ප්‍ර: **2015** ඉදන්?

පි: **2015**න් පස්සේ ඒකෙත් සමහර අවස්ථාවලදී අගමැති තුමා පැමිණ හිටියා සමහර අවස්ථාවලදී අගමැතිතුමා පැමිණියේ නෑ.සමහර අවස්ථාවලදී මැද හරියේදී අගමැතිතුමා පැමිණෙන අවස්ථා තිබුණා.

ප්‍ර: අගමැතිතුමාට ආරාධනා කරනවාද නැත්නම් අනිවාර්යෙන්ම පැමිණිය යුතුද?

පි: ස්වාමිනි අනිවාර්යෙන්ම අගමැතිතුමා පැමිණිය යුතුයි.

ප්‍ර: පැමිණිය යුතුයි?

පි: මොකද ඒකට අපි ආරාධනාවක් කිරීමට අවශ්‍යතාවයක් නෑ කියලායි මම හිතන්නේ මොකද අසනීපයක් හරි පිටරට ගිහිල්ලා තිබ්බෙ නැත්නම් අනිවාර්යයෙන් පැමිණිය යුතුයි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

කොමිෂන් සභාවේ කටයුතු ප.ව **5.15** ට රැස්වේ.

දැන්වේලාව : **4.55**

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

කෙටි විවේකයකින් පසු නැවත කොමිෂම රැස්වේ.
දැන් වෙලාව ප.ව. 5.20 යි.
වාර්තා කරන්නේ ධම්මිකා පෙරේරා විසින්ය.

සාක්ෂිකරු නැවත කැඳවයි.
සම්පූර්ණ නම: තුවාන් සුරේෂ් සාලේ නැවත කැඳවා ප්‍රතිඥා දෙයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>:

ප්‍ර: ඔබ අද මෙම කොමිෂන් සභාවේ සාක්ෂි දෙනු ලබන්නේ 2019.04.21 වෙනි දින සිදු වූ මරාගෙන මැරෙන ප්‍රහාරය සම්බන්ධවයි?

උ: ඔබ හරි.

ප්‍ර: මෙම ප්‍රහාරයේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් වුයේ මුස්ලිම් ලබ්ධිකයන්?

උ: ඔබ හරි.

ප්‍ර: ශ්‍රී ලංකාව තුළ සාමාන්‍යයෙන් මුස්ලිම් ජනගහනය කොච්චරක් ඉන්නවද කියලා ඔබට කියන්න පුළුවන්ද? දළ වශයෙන්?

උ: ශ්‍රී ලංකාවේ අවසාන සංඝණනය අනුව 9.7 Million ඉන්නවා.

ප්‍ර: මිලියන 9.7 ක් සිටිනවා?

උ: ඔබ හරි.

ප්‍ර: එය මුළු ජනගහනයෙන් සියයට කීයක්ද?

උ: මුළු ජනගහනය ඇවිල්ලා 22 Million. ඒකෙන් ගත්තාම අඩු කරලා ගන්න ඕනේ.

ප්‍ර: ලංකාව තුළ ඉතාමත් ඈත අතීතයේ ඉදලම මුවර් සහ මැලේ වශයෙන් වෙන් වූ මුස්ලිම් ඉස්ලාම් ලබ්ධිකයන් ලංකාවේ සිටියා.

උ: ඔබ හරි.

ප්‍ර: මෙම ඉස්ලාම් ලබ්ධිකයන් සම්ප්‍රදායික මුස්ලිම්වරු කිව්වොත් හරිද?

උ: ඔබ හරි.

ප්‍ර: නමුත් මෙම තත්ත්වය 1980, 90 කාලයේදී වෙනස්වීමකට ලක් වුණා

උ: ඔබ හරි.

ප්‍ර: ඒකට හේතුවක් ඔබට මේ අවස්ථාවේදී කීමට හැකියාවක් තියෙනවද?

උ: ඔව්, ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ට ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් තමයි තිබුණේ. නමුත් 1980 මුල් භාගයේ ඉදන් එය වෙනස්වීමක් ඇති වුණා. විශේෂයෙන්ම අරාබි සංස්කෘතිය, සමාජීය ඒ හැම අංගයක්ම එන්න පටන් ගත්තේ 80 මුල් භාගයේ ඉදන්. ඒකට ප්‍රධාන හේතුවක් හැටියට මම දකින්නේ අරාබිකරයේ තෙල් ලබා ගැනීමත්, ඒ මුදල් හරහා තම නිකායන් වර්ධනය කිරීමට උත්සාහ ගත්තා විශේෂයෙන්ම සෞදි සහ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඉරාකයේ ඉන්න සුන්නි කියන කට්ටියත්, ඒ එක්කම ඉරානයේ තියෙන ෂියා community එකත් අතර තමයි ඒ තරඟය ඇති වුනේ. ඉතින් ඒ තුළින් ඒගොල්ලන්ට අවශ්‍යතාවය තිබ්බා සුන්නි සහ ෂියා කියන තම නිකායන් වර්ධනය කරන්න. එතකොට ලංකාවේ හිටපු මුස්ලිම් ජාතිකයන්ගෙන් 98% ක්ම ඇවිල්ලා සුන්නි නිකායට අයිති. 1.5% ක් වගේ තමයි එන්නේ ෂියා. ඒ කියන්නේ ඉරානයේ සම්භවයත් එක්ක . ඉතින් ඒකෙදි තෙල් ඒ ලැබීමත් එක්කම ඒ තියෙන influence එක social, political, economic මේ අංශ තුනෙන්ම ලංකාවේ මුස්ලිම්වරුන්ට බලපෑවා ශ්‍රී ලාංකික අනන්‍යතාවය වෙනස් වන්න.

ප්‍ර: ඒ අනුව ලංකාව තුළ සිටි මුස්ලිම් කාන්තාවන් ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් ඒ වගේම මුස්ලිම් ප්‍රජාව ඒ තමන්ලා ලබා ගන්නා ආහාරවල තත්ත්වයන් වෙනස්වීමකට ලක් වුණාද?

උ: ඔබ හරි.

ප්‍ර: කොහොමද ඒක වුනේ?

උ: ඇත්තටම ඒ වෙනස්වීම මම කොටස් වශයෙන් පහක් මට සඳහන් කරන්න පුළුවන්. විශේෂයෙන් මූලික වශයෙන්ම ගත්තාම මේ පාසැල් පද්ධතිය මද්‍රසාස් ඒවා වැඩි වශයෙන් බිහිවීමක් දැක්කා. දෙවනුව ඒ මද්‍රසාස් වලින් ඒ සංස්කෘතිය ඉගැන්නුවා. ඒ කියන්නේ විශේෂයෙන්ම අරාබිකරණයකට ලක් වුණා ඒ පාසැල් වැඩිවීමකට ලක් වෙලා ඒ තුළින් ඒ වගේ ඒ දේවල් උගන්වන්න පටන් ගත්තා. දෙවෙනි එක ඇවිල්ලා ඒ තුළින් එන සමහර දක්ෂ තරුණයන් විදේශ රටවල ඒ මුස්ලිම් Universities වලට යවන්න පසුකාලීනව යොමු වීමක් සිදු වුණා. ඒ එක්කම ශ්‍රී ලංකාවට එතෙක් කිසිම කෙනෙක් ආවේ නැහැ ආගම් උගන්වන්න. අපි දැක්කා ඊට පස්සේ විශේෂයෙන් ම මුස්ලිම් ආගම උගන්වන්න විශේෂයෙන්ම දේශකයෝ වසරකට සාමාන්‍යයෙන් මෑතක් වනතුරුම 200 ක් 300 ක් වගේ දෙනෙක් ශ්‍රී ලංකාවට පැමිණෙනවා. ඉතින් ඒ පැමිණෙන හැම කෙනෙක්ම ඇවිල්ලා ඒ සංස්කෘතික ආගම තමයි අරගෙන එන්නේ. මේ යන කට්ටියත් ඇවිල්ලා ඉගෙන ගන්නේ ඒ සංස්කෘතිය හා ඒ ආගම. ඒ scholarships වලින් ගිහිල්ලා. එතකොට තුන්වෙනි එක මම දකින්නේ ඇවිල්ලා ෂරියා නීතිය, ෂරියා Law එක. ඒක වැඩි වශයෙන් පටන් ගත්තා මුල ඉදන්ම තිබ්බා අපේ වකුප් වගේ ඒ ඒවගේ දේවලුත් තිබ්බා. ෂරියා Law එකත් තිබ්බා ලංකාවේ. නමුත් ඒවා වැඩිපුර practice කිරීමේ සහ ඒ පැත්තට නැඹුරත්වයක් දැක්වුයේ ඇවිල්ලා මේ 80 වෙන් පස්සේ. ඒ එක්කම අපි දැක්කා Dress එකේ වෙනසක් වෙනවා. හිජාබ් ඒ වගේ දේවල් මේවා කරන්න පටන් ගත්තා. එතකොට ඒ ආදී වශයෙන් ඒ වෙනස්වීම් වෙන කොටම ඒ විවිධ

FAIR COMMENT BY JEZEEM

නිකායන් වර්ධනය වීමට පටන් ගත්තා. විශේෂයෙන්ම ඔය තවුහිද් ජමාත් කියන සංකල්පය. ඒ වගේ දේවල් groups වලින් කැඩෙන්න පටන් ගත්තා. ඒ එක්කම ෂියා මුස්ලිම්වරුන් එකට එකතුවීමක් වගේ දෙයක් වගේ අපි දැක්කා එක එක සංවිධානවලට. ඒ සංවිධානවලට පිටරටින් ආධාර ලැබෙන්න පටන් ගත්තා. ඒ එක්කම භයවෙනි කාරණාව හැටියට විශේෂයෙන්ම හලාල් කියන එක. ඒක සාමාන්‍යයෙන් මමත් මුස්ලිම් භක්තිකයෙක් වුණාට මගේ ආගම වැඩි වශයෙන් හදාරන්නේ නැහැ. මගේ අම්මා ක්‍රිස්තියානි, තාත්තා මැලේ. මම විවාහ වෙලා තියෙන්නේ බෞද්ධ. මම ඉගෙන ගත්තේ මහානාම විද්‍යාලයෙන්. එතකොට ඒක නිසා මගේ ආගම පිළිබඳ ලොකු දැනුමක් නැහැ, නමුත් මගේ දැනුමේ හැටියට මේ දේවල් ටික විශේෂයෙන්ම මේ මුස්ලිම් සමාජය තුළ සෑහෙන්න බලපෑමකට ලක් වුණා. ඉතින් එතකොට සංවිධාන බිහිවුණා. ඒ වගේ දේශපාලන පක්ෂ බිහිවුණා. ඊට පස්සේ ඒ මුදල් ආවා. ඉතින් ඒ ඔක්කොම වශයෙන් ගත්තාම ඉතාමත්ම පැහැදිලි වෙනසක් **1980** න් පටන් ගත්ත වෙනස. ඒක සෑහෙන්න Develop වුනා. ඒක යම්කිසි දුරකට මර්ධනය වීමක් තිබුණා යුද්ධ කාලෙදි. Priorities තිබ්බා වෙනස්. ඊට පස්සේ යුද්ධ කාලෙදී නැවත **2010** න් පස්සේ යුද්දේ ඉවර වෙනවත් එක්කම ඒක විශාල වශයෙන් අපි දැක්කා පිබිදීමක් එනවා.

ප්‍ර: දැන් ඔබ මද්‍රාසා පාසැල් ලංකාවේ බිහි වූ බව කියා සිටියා, මේ මද්‍රාසා පාසැල් කොයි කාලේ වගේද බිහි වුණේ? ආරම්භය?

උ: ආරම්භය, දැන් මුල් කාලේම තිබ්බා. ඒ කියන්නේ මුල් කාලේම මගේ දැනුමේ හැටියට මුල් කාලේදීම පාසැල් තිබ්බා දැන් දහම් පාසැල් තියෙනවා වගේ. නමුත් ඒ පාසැල් එහෙම වර්ධනයක් වුණේ නැහැ. ඒවගේ සංවිධානාත්මක වෙලා තිබ්බේ නැහැ. ඒවා යම් යම් දේවල් ඒ කියන්නේ ශ්‍රී ලංකාවට ආවේණික වූ දේවල් තමයි වුණේ. නමුත් පසුව **1980** ත් එක්කම ඒ සංවිධානාත්මක වෙච්ච පසුබිම මත තමයි මේවා ඉතාමත්ම වර්ධනය වීමක් වෙන්න පටන් ගත්තේ. ඉතින් මේක මූලික වශයෙන්ම මුදල් සහ ඒ මුදල් තුළින් ඇති වෙච්ච දේශපාලනික, ආර්ථික සහ සංස්කෘතික වෙනස.

ප්‍ර: දැන් මෙම මද්‍රාසා පාසැල් කියලා ඔබ සඳහන් කරන ආයතන මොන වර්ගයේද, කියන්නේ එය ප්‍රාථමික අංශයේද, ද්විතික අධ්‍යාපනය ලබාදෙන ආයතනද, නැත්නම් ඒ සියළුම ද්විතීක, තෘතීක ඒ සියළුම අධ්‍යාපනයන් ලබාදෙන ආයතනයක්ද?

උ: මම ඒ ප්‍රශ්නයට මේ විදියට පිළිතුරු දෙන්නම්. මුස්ලිම් සමාජය ගත්තාම ගොඩක් මුස්ලිම් සමාජය යම්කිසි ඒ කියන්නේ ඔක්කොම එකතුවීමක් තියෙනවා. ඒ කියන්නේ මුළු ලංකාවේ ඉන්න සියළුම මුස්ලිම්වරුන්

FAIR COMMENT BY JEZEEM

පල්ලිවලින් එකතුවීමක් සිදු වෙනවා. ඒ එක්කම ආගම්වලින් හැමදාම සිකුරාදා පල්ලි යනවා. ඒ තුළින් එකතුවීමක් වෙනවා. ඒ එක්කම මේ සියළුම මුස්ලිම් Community එක එකතුව තියෙනවා 90% ක් විතර ජමෙයිතුල් උලමා කියලා සංවිධානයක් තියෙනවා. ඒගොල්ලෝ තමයි මේ රටේ මුස්ලිම්වරුන් වෙනුවෙන් තීරණ ගන්නේ. ඉතින් ඒක ගත්තාම සියළුම සමාජයම කුඩා දරුවෝ, සියළු දෙනාම මේ සමාජයේ ඇතුලේ තමයි මේගොල්ලන් මේ ජීවත් වෙන්නේ. එතකොට ඒ සමාජයත් එක්ක එනකොට මුලින්මම යටම තලය ඒ කියන්නේ අධ්‍යාපනය ලබන ඒ කියන්නේ අපි Nursery යන කොට තමයි මේ මද්‍රසාස් පටන් ගන්නේ. ඒ වගේම ඒ ආගමික පාසැල් මම දැනුවත්ව ලංකාවේ දැනට 1500 ට වැඩිය තියෙනවා. ඒ පාසැල් තුළින් තමයි, ඒවගේ ඒ මද්‍රාස් තුලින් තමයි මේ ළමයි මූලිකවම ඇවිල්ලා දිගටම උඩට ගිහිල්ලා ගිහිල්ලා අවසාන වශයෙන් ඉස්ලාම් University වල ඒවල හොඳ ළමයින් අරගෙන පිටරට Universities වලට යන්නත්, ලංකාවේ තියෙන ඉස්ලාම් Universities වලට යන්නත් ඒ වගේ පෙළඹීමක් කරන්නේ. ඉතින් මේක ඉතාමත්ම ක්‍රමාණුකූලව සිදු වෙලා ඉස්සර එකම නිකායකට විතරක් අයිති වෙලා තිබ්බ මද්‍රාසාස් පසුව පල්ලිත් වෙනස් වෙන්න පටන් ගත්තා. විවිධ පල්ලි එන්න පටන් ගත්තා, ඒ එක්කම විවිධ පාසැල් එන්න පටන් ගත්තා. මේවා කිසිම නියාමනයක් තිබ්බේ නැහැ, මේවට උගන්වන්නේ කවුද කියන එක තිබ්බේ නැහැ. මේවයේ Subject එක ගැන කවුරුවත් Study කලේ නැහැ. ඉතින් මේ ඔක්කොම ටික ගත්තාම මේක ඒ පාසැලේ ඔය හැම දෙයක්ම සිදු වුණා. ඉතින් Extremism නුත් ඉගැන්වෙනවා, සාමාන්‍ය විදියේ සිදුවිමුත් උගන්වනවා. ඉතින් නමුත් මෙතනදී ඒ දක්ෂතා හඳුනන ළමයින්ව සාමාන්‍ය University වලට යන්නෙත් නැතුව සමහර විට ඒගොල්ලෝ ඊට වැඩිය කැමැත්ත දක්වනවා Scholarship එකක් අරන් ඉස්ලාම් University එකකට යන්න. මොකද ඒ විදියට තමයි ඒ සමාජය ගොඩනැගිලා තියෙන්නේ.

ප්‍ර: දැන් මෙම ප්‍රාථමික අංශයේ සිට උසස් අධ්‍යාපනය දක්වා මේ ලබාදෙන අධ්‍යාපනය, ඒ අධ්‍යාපනික පසුබිම ගැන ඔබට කීමට හැකියාවක් තිබේද? එහිදි එම දරුවන්ට ලබා දෙන දැනුම නැත්නම් අධ්‍යාපනය ගැන ඔබට යමක් කීමට හැකියාවක් තියෙනවද?

උ: ඔව්, විශේෂයෙන් ම ගත්තාම අපිට මූලික වශයෙන් අපිට ක්‍රම දෙකකට ගන්න පුළුවන්. එකක් අපි බුද්ධිමත් පැත්තෙන් බලන කොට එකක් බලන්නේ පුද්ගලයන්ගේ Network එක. අනෙක් පැත්තෙන් අපි බලනවා සාමාන්‍යයෙන් කොහොමද මේ Funding වෙන්නේ කියන එක. ඉතින් මේවා අපි අන්තිම කොනට යන කොට මේවා නතර වෙන්නේ

FAIR COMMENT — BY JEZEEM —

ගොඩක්දුරට නතර වෙන්නේ Middle East වලින් තමයි නතර වෙන්නේ. එතකොට මේගොල්ලෝ ඉතාමත් ක්‍රමානුකූලව කරන ක්‍රියාවලියක්. මම එක උදාහරණයක් කියන්නම් සමහර විට අවුරුදු 5, 6 ගැණු ළමයෙක් දන්නේ නැති වුණත් එයාට මුහුණ වහලා යන්න තමයි උගන්වන්නේ. ඉතින් ඒ ළමයට ඒ වයසට ඒ ළමයා ඒක තේරුම් ගන්නේ නැහැ මොකක්ද කියන එක. නමුත් එයා හිතනවා ඊට පස්සේ ඒක තමයි එයාගේ ලෝකය කියන එක. ඒ තුළින් තමයි එයා එතනින් හැදෙන්නේ. ඒ එක්කම ඒ ඒ කාලවලදි මුස්ලිම් දේශකයෝ ගෙන්නනවා. සමහරක් මගේ දැනීමේ හැටියට මගේ කාලයේදි 2012,2013 කාලවලදි අපි සෑහෙන්න ඒවා Control කරන්න measures ගත්තා. සාමාන්‍යයෙන් වසරකට 300 ක් විතර එනවා. ඉතින් මේ 300 ඇවිල්ලා මේ පාසැල්වල ඉගැන්වීම් සිදුකිරීම් කරනවා. සමහර අය අවුරුදු ගානක් ඉදන් ඒ ඉගැන්වීම් සිදු කිරීමක් කරනවා. ඉතින් මේවල ශ්‍රී ලංකාවේ ඉතිහාසයවත්, ශ්‍රී ලංකාවේ සංස්කෘතියවත්, ශ්‍රී ලාංකික සිරිත් විරිත්වත් ඉගැන්වීමක් කරන්නේ නැහැ. මේවායේ ඉගැන්වෙන්නේ ඇවිල්ලා මේ අරාබියේ තියෙන Syllabus වලට තමයි ගොඩක් පාසැල්වල ඉගැන්වීමක් කරන්නේ. ඉතින් මෙතන එකම මම දකින ගැටළුව ඇවිල්ලා මේ පිළිබඳව අපිට තියෙන දැනුම ඉතාමත්ම අල්පයි. අදට වුනත් මේ පල්ලිවල අපි කියමු මේ පල්ලිවලින් 90% ක්ම පාලනය කරන්නේ ජමෙයිතුල් උලමා කියන සංවිධානය නම්, එතකොට මේ පල්ලිවල සියළුම සිකුරාදාවල දේශනය කරන්න ඇවිල්ලා ඒගොල්ලන් කියන දේශන නම් එතකොට මොන බුද්ධි අංශයටද හැකියාව තියෙන්නේ කවුද මේවා මොන දේශනයද කරන්නේ කියන එක. ඉතින් මේක හරි Sensitive area එකක්. ඉතින් මේක මූලික වශයෙන්ම ඒ පාසැල් පද්ධතිය තුළින්ම මේක සමාජයට යට ඉදන්ම එන එකක් තමයි මේක. ඉතින් ඔබතුමාට මම පිළිතුරු ලබාදුන්නේ ඒ හැම Level එහෙකදිම, මේ හැම පාසැලකම උගන්වන, අපි ගත්තොත් අපි කියමු අරාබි භාෂාව, ඉතින් අරාබි භාෂාව මම හිතන්නේ නැහැ ලංකාවට මම දැනුවත්ව අරාබි භාෂාවට වඩා ඉගෙන ගන්න ඕන භාෂාවල් තියෙනවා. ඊට කලින් සිංහල භාෂාව ඉගෙන ගත යුතුයි. ඊට කලින් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගත යුතුයි. ඉතින් අරාබි භාෂාව ඉගෙන ගන්න කොට ඒ අරාබි භාෂාවේ අකුරුවල වචනවත් තේරෙන්නේ නැහැ. නමුත් පසුකාලීනව මේවා තේරුම් අරගෙන මේවා තුළින් බිහි වෙලා, මේව වලින් තමයි බිහි වෙන්නේ. දැන් ඔය සහරාන්ලා බිහි වුණෙත්, නිලාම් කියන පුද්ගලයා ඉස්සෙල්ලාම ලංකාවේ මැරුනේ සිරියාවට ගිහිල්ලා කොහේද එයා ඉගෙන ගෙන තියෙන්නේ. එයා මූලික වශයෙන්ම Trinity College එකේ

ඉගෙන ගෙන තිබ්බේ, පස්සේ ගිහිල්ලා සෞදි අරාබියාවට ගියා, නමුත් එයත් මද්‍රාසාස් වලට ගිහිල්ලා තිබ්බා. ඒ ආගමට. පස්සේ පකිස්තානයේ ගිහිල්ලා පකිස්තාන් Islamic University එකේ තමයි Study කලේ. ඒ Study කිරීමේදි අවුරුදු සාමාන්‍ය උපාධිය සහ පශ්චාත් උපාධිය, මාස්ටර්ස් දෙකම කලා. එතනදි එයාගේ Wife වත් හම්බ වෙනවා. ඊට පස්සේ ලංකාවට ඇවිල්ලා International School වලත් ඒ පුද්ගලයාම උගන්වනවා. ඊට පස්සේ බග්දාගේ සටහන් කරන්න එන්න කියපු ගමන් ඔක්කොම ටික අමතක කරලා යනවා. ඉතින් අපි මෙතනදි දකින්න ඕනේ ඒ තියෙන පරිසරය සහ පසුබිම.

ප්‍ර: නීලම් ගැන කතා කරපු ඔහුගේ පාසලේ වෙනත් සමකාලීනයොත් මේ ආකාරයට රැගෙන ගිහිල්ලා තියෙනවද?

උ: මෙහෙමයි දැන් මම කිව්වේ ඒ පාසැලට ගියාට පාසැලත් එක්ක මද්‍රසාස් එකත් මේකට Parallel යනවා. ඉතින් මෙතනදි ඒ පාසැල නෙමෙයි ප්‍රශ්නෙ තියෙන්නේ. දැන් මම මහනාම විද්‍යාලයේ ඉගෙන ගත්තත් මම මද්‍රාසාස්වල ඉගෙන ගත්තොත් මම ඒ පරිසරය තුළ ඉගෙන ගත්තොත් මගේ Ideas ටික ඒ විදියට Develop වෙනවා.

ප්‍ර: දැන් මෙම ඔබ කියා සිටියා මෙම පාසැල්වල අරාබි භාෂාවෙන් තමයි ඒ අරාබි සිරිත් විරිත් සහිත අධ්‍යාපනයක් ලබන්නේ, මෙහිදි ෂරියා නීතිය සම්බන්ධයෙන් ඒවායේ අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ට දැනීමක් සහ වැටහීමක් ලබා දෙනවද?

උ: ඔව් මම කිව්වේ පද්ධතියේ මද්‍රාසාස් කියලා ගත්තාම එකේ ඉදන්ම University වෙනකල්ම ඉගෙන ගන්න පුළුවන්. ලංකාවේ University තිබ්බේ නැති වුනත් මේ තුළින් එන කට්ටිය තමයි Islamic universities වලින් ලෝකෙට යන්නේ. ඉතින් මේකේ end එකක් නැහැ. මේක හොඳට well organized ඒක ලංකාවේ පමණක් නොවෙයි මුස්ලිම් ඔක්කොමත් එක්ක එකට තියෙන්නේ.

ප්‍ර: ෂරියා නීතිය කියන්නේ මොකක්ද කියලා ඔබට කෙටියෙන් විස්තර කරන්න පුළුවන්ද?

උ: ෂරියා නීතිය ඉතාමත් කෙටියෙන් කිව්වොත් ඒක ඇවිල්ලා කොහොමද මුස්ලිම්වරයෙක් මුස්ලිම් ආගම අනුව ජීවත් විය යුතුයි කියන එක තමයි ෂරියා Law එකෙන් කරන්නේ.

ප්‍ර: දැන් මේ මද්‍රාසා පාසැල්වලට අමතරව විශ්ව විද්‍යාලයන් පවා ලංකාවේ තිබෙනවා ඔබ කියා සිටියා. ඒ විශ්ව විද්‍යාල ඔබට නම් කිරීමට හැකියාවක් තියෙනවද සාමාන්‍යයෙන්?

උ: දැන් විශ්ව විද්‍යාලය කියලා අපි ගත්තොත් අපි දැන් හඳන විශ්ව විද්‍යාලයක් තියෙනවානේ එකක් මඩකලපුවේ. මෙතනදි මඩකලපුවේ

FAIR COMMENT BY JEZEEM

විශ්ව විද්‍යාලය දැන් හදන විශ්ව විද්‍යාලය ඇවිල්ලා ඒකට උදාහරණයක් ගන්න පුළුවන් දැන් මේ විශ්ව විද්‍යාලය හදන කොට විශ්ව විද්‍යාලයේ investment එකයි විශ්ව විද්‍යාලයේ පමණක් නෙමෙයි මොනවද මේකේ උගන්වන්න යන්නේ, කවුද උගන්වන්නේ, මේ වගේ ලොකු විශ්ව විද්‍යාල අවශ්‍යද ශ්‍රී ලංකාවට. ශ්‍රී ලාංකිකයන්ට පමණක් වෙච්ච විශ්ව විද්‍යාලද? ඒ එක්කම ලෝකේ අනෙක් රටවල ගත්තම විශේෂයෙන්ම දැන් Bangladesh එක ලඟදී team එකක් ආවා, අපි ඒ ගොල්ලන්ගෙන් ඇහුවා ඕගොල්ලන් කොහොම 90% ක් 80% ක් විතර මුස්ලිම් ජාතිකයෝ ඉන්න කට්ටිය කොහොමද මේක පාලනය කරන්නේ කියලා . ඒගොල්ලෝ ලෝකේ Identify කරලා තියෙනවා සමහර Universities ඇවිල්ල Islamic universities වෙන්න පුළුවන් හොඳයි moderate . නමුත් සමහර Universities ඇවිල්ලා Radical විදියට ඒගොල්ලෝ තහනම් කරලා තියෙනවා ඒ Universities වලට ළමයින් යනවට. ඒ එක්කම ඒගොල්ලන් ප්‍රතිපත්තියක් හැටියට ඉන්දියාව ගත්තත්, ඉන්දියාවට කිසිම පුජකවරයකුට එන්න දෙන්නේ නැහැ. ඒ එක්කම යන කොට ගත්තත් ඒ Scholarship එක check කරලා බලලා යන්නේ. ඉතින් අපි කුඩා රටක්, අපේ මේ Mechanism මුකුත් නැහැ, අපි දන්නේ නැහැ මොන Scholarship එකටද යන්නේ, මොන University එකටද යන්නේ කියලා, තාමත් එහෙම තමයි, ඒ එක්කම අපි දන්නේ නැහැ කවුද preachers ලද කරන්නේ, මොන preachers ද කරන්නේ කියලා. ඉතින් අපි ගොඩක් දුරට මම හිතන්නේ අපි තවමත් අඳුරේ තමයි මේ දේවල් අතපත ගාන්නේ.

ප්‍ර: දැන් ඔබ මේ අන්තවාදය ගැන මෙහිදි ප්‍රකාශ කර සිටියා, දැන් මෙම පාසැල්වල අධ්‍යාපනය ලබන සහ ලබා දෙන්නන් මේ අන්තවාදයට එම පාසැල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ව යොමු කරනවාද?

උ: 9.7 Million population එක ගත්තාම මේ අන්තවාදයට යොමු වෙලා තියෙන්නේ බොහොම සුළු පිරිසක් තමයි. ඉතින් ඕනම මේකක ඒක තියෙනවා. එතකොට එතනදි මේ මද්‍රාසාස්වලින් ලැබෙන මූලික මේකත් එක්කම ඒවලින් සමහර කොටස් ඒ පැතිවලට යොමු වෙනවා. මේ කියන 80% ක් විතර මම කියන්නේ නැහැ අන්තවාදි එනවා කියන එක. නමුත් මේ සමාජය ගොඩනැගෙන්නේ ඇවිල්ලා ශ්‍රී ලාංකික අනන්‍යතාවයකින් නෙමෙයි. මේ සමාජය ගොඩනැගෙන්නේ ඇවිල්ලා වෙනත් රටක තියෙන අනන්‍යතාවයක් තුළින්. මේ අනන්‍යතාවය තුළින් විවිධ තරාතිරමේ මිනිස්සු ඉන්න පුළුවන්. ඒ කියන්නේ Religious ideology එකට යන කට්ටිය ඉන්න පුළුවන් violent extremism එකට යන කට්ටිය ඉන්න පුළුවන්. Neutral යන කට්ටියට ඉන්න පුළුවන්. මෙතනදි ඒ

environment වලින් එකෙන් තමයි ගොඩ නැගෙන්නේ. කොටසක් තමයි මේකේදී ඒ extremism line එකට යන්නේ. ඒ අවශ්‍ය කරන පසුබිම එතනින් ගොඩ නැගෙනවා ඒවා හරියට නියාමනය කරලා සිදු නොවුනොත්.

ප්‍ර: ඔබ කියන්නේ ආගමික අන්තවාදය?

උ: ඔබ හරි.

ප්‍ර: ලංකාවේ ආගමික අන්තවාදය ගැන කතා කිරීමට ප්‍රථමව ලෝකයේ ආගමික අන්තවාදයක් ආරම්භ වන්නේ කොයි කාලෙද කියලා ඔබට කීමට හැකියාවක් තියෙනවද?

උ: ඔව් ආගමික අන්තවාදයක් ඇති වෙන්නේ මම හිතන්නේ මේ ගොඩාක් ඉතිහාසයක් එක්ක. නමුත් අපි විශේෂයෙන්ම ලංකාවේ අන්තවාදය ගත්තොත් විශේෂයෙන්ම Middle East වලින් තමයි ආරම්භ වෙන්නේ. මේක ආරම්භ වෙන්නේ විශේෂයෙන්ම ඒකට බලපාන කරුණු කිහිපයක්ම තියෙනවා. මම අර පලවෙනි එකට කිව්වා විශේෂයෙන්ම අතීතයේ ඉදන්ම මේ මුස්ලිම්වරු අතර දැන් ඉස්ලාම් මුස්ලිම් සහ ක්‍රිස්තියානි ඔක්කොමත් එකක්. එතනින් ඒවා කැඩුනා. Testimonies anecdotes ඒවා අනුව කැඩුනා. පසු කාලීනව සුන්නි, ෂියා කියන පාර්ශවයන් දෙකක් කැඩුනා. ඒ එක්කම අපි දැක්කා තෙල් එනවා. තෙල් එනවාත් එක්කම අපි දැක්කා බටහිර රටවල් මේ තෙල් ලබා ගැනීමට විවිධ උපක්‍රම අනුගමනය කර ඒවා ආක්‍රමණය කරනවා.

ප්‍ර: ඒ කියන්නේ තෙල් සොයා ගැනීම මැදපෙරදිග සිදු වුණාම ඒ සඳහා ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල්ද නැත්නම් බටහිර රටවල් පමණක්ද?

උ: ඔබ හරි Super powers කියලා කිව්වාම හරි. ඒ කියන්නේ කලින් Russia සහ ඇමරිකාව දෙකම අයිති වුණා. දැන් ඉතින් අද ඇමරිකාව..

ප්‍ර: ඒ ඔවුන්ට මෙම මැදපෙරදිග සම්බන්ධයෙන් ඔවුන්ට නතු කර ගැනීමේ අවශ්‍යතාවයක් ඇති වුණා කියලා ඔබ කියන්නේ?

උ: ඔව් මගේ දැනුමේ හැටියට Geo Political ගත්තාම විශේෂයෙන්ම අද Super power කියලා තීරණය වෙන්නේ සම්පූර්ණයෙන්ම ආර්ථික වශයෙන්. මෙතනදි තෙල් නිපදවීමක් සිදු වෙන කොට අති විශාල මුදල් කන්දරාවක් ඉතින් මෙතනදි තෙල් නිපදවීම තුළින් ඒ රටවල් බලවත් වුනොත් ඒක challenge එකක් වෙනවා. ක්‍රම දෙකක් තියෙනවා. එකක් ඇවිල්ලා සියළුම මුදල් ලබා ගැනීමේ ක්‍රමවේදයක් ඇති කිරීම , දෙවනි එක ඇවිල්ලා ඒ රටවල් බලවත් වෙන්න නැති වෙන්න කටයුතු කිරීම. ඉතින් ඒ Policy එක තමයි ඇත්තටම මම හිතන්නේ බලවත් රටවල් අනුගමනය කලේ.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: බලවත් රටවල් මෙම තත්ත්වය අනුගමනය කිරීම තුළින් මැදපෙරදිග ආගමික අන්තවාදය බිහිවුණාද?

උ: ඇත්තටම ආගමික අන්තවාදය කියන එක තිබුණා. නමුත් ඒ ටික සම්පූර්ණයෙන්ම ප්‍රමාණය ඉක්මවා ගියේ ඇවිල්ල ඒ තුලින් තමයි. දැන් අපි

ප්‍ර: එම ආගමික අන්තවාදීන් පසුව ප්‍රචන්ඩත්වයට යොමු වුණා?

උ: ඔබ හරි. විශේෂයෙන්ම අල්කයිඩා වගේ සංවිධාන බිහිවීම පිළිබඳ ඉතිහාසය ගත්තාම ඒවා කොහොමද බිහිවුණේ, මොන හේතුවක් මතද බිහිවුණේ, පස්සේ ඒවට කොහොමද arm fund කලේ කොහොමද, ඉතින් මේ සියළු දේම දේශපාලනික සහ ආර්ථික මේකත් එක්ක යන එකක්. දැන් මේකම තමයි මේ අවි ගත්ත කට්ටියම තමයි මේ විශේෂයෙන්ම ISIS එක ඒ කියන්නේ අල්කයිඩා එක බිහිවුණාට පස්සේ මේගොල්ලෝ දකිනවා සම්පූර්ණයෙන්ම අරාබියේ සහ ඒකට එරෙහිව විශේෂයෙන්ම පලවෙනි සතුරා හැටියට මේගොල්ලෝ දකින්නේ බටහිර රටවල් සහ ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල්. ඉතින් මෙතනදි මේ සියළුම දේවල් ඇත්තටම Focus කරන්න ලංකාවත් අපිත් අහුවෙලා තියෙන්නේ. අනුන් කරන ප්‍රශ්නෙකට තමයි අපි මැදිහත් වෙලා තියෙන්නේ.

ප්‍ර: දැන් අන්තවාදියෙකු සහ අවිගත් අන්තවාදි එම තත්ත්වය ඔබට නිර්වචනය කරන්න පුළුවන්ද?

උ: ඔව්, විශේෂයෙන්ම දෙකක් අපි දකිනවා, එකක් ඇවිල්ලා extremism . අනික් එක ඇවිල්ලා violent extremism, religious extremism and violent extremism. ඒ කියන්නේ Religious extremism එකේ end එක තමයි violent extremism. හැබැයි ඔය ප්‍රශ්නය දැන් මගෙන් ඔබ අහනවා බුද්ධි නිලධාරියෙක් හැටියට ඔබ මේ ප්‍රශ්නය ඇහුවොත් violent extremism එකේ ඉන්න කෙනෙක් ගෙන් ඇහුවොත් ඔබට ලැබෙන්නේ තවත් පිළිතුරක්. මේ ප්‍රශ්නය තව කෙනෙක්ගෙන් ඇහුවොත් ඔබට ලැබෙන්නේ තවත් පිළිතුරක්. ඉතින් මම බුද්ධි නිලධාරියෙක් හැටියට දෙන පිළිතුර මම ලබා දෙන්නම්. ඔබ කැමති නම් මම violent extremism එකේ කෙනෙක් හැටියට බලන චිත්‍රයත් මම ලබා දෙන්නම්. මම බුද්ධි නිලධාරියෙක් හැටියට මම ලබා දෙන පිළිතුර කියන්නේ මේ ඉස්ලාමීය ආගමත් එක්ක අර මම කිව්වේ නිකායන් අතර තියෙන ප්‍රශ්නයත් ඒක වර්ධනය වීමත් ඒ එක්කම මේ තුලින් බටහිර රටවල් තව ටිකක් මේ ප්‍රශ්නය ඇති කිරීමට කරන ප්‍රතිඵලයක් හැටියට ඒ වර්ධනයත් වීමේ ප්‍රතිඵලයක් හැටියට මේගොල්ලෝ යම් කොටස් පොඩි පොඩි කණ්ඩායම් බිහි කරනවා.

ප්‍ර: කවුද බිහි කරන්නේ?

FAIR COMMENT BY JEZEEM

උ: ඒක විශේෂයෙන්ම බටහිර බලවේග තමයි මෙය බිහි වෙන්නේ. ඔය හැම කතාවක්ම අපි ගත්තොත් අවසානයේදී ඕක සියළුම extremism එක අපි මේ දැන් කතා කරන්නේ ලංකාවේ වෙනසක් වීම ඇති වෙන්නේ 80 දශකයේ නේ. අරාබියේ තියෙන තෙල් එකත් එක්කනේ. එතකොට මේ තෙල් එකත් එක්ක අරාබියේ මේ පැත්තට ඒගොල්ලන්ගේ බලය මුස්ලිම් කියන පැත්ත තහවුරු කරන්න යන කොට අනිත් පැත්තෙන් අපි ඒ එක්කම දකිනවා බටහිර රටවලුත් මේ තෙල් ලබා ගැනීමට ඇතුලට එනවා. ඇතුලට ආවයින් පස්සේ ඒගොල්ලෝ දකිනවා විශේෂයෙන්ම අපි දැක්කා ඉරාකය ආක්‍රමණය කරනවා. දැන් ඉරාකය ආක්‍රමණය කිරීමේදි Reason එකක් නැහැ ඒගොල්ලන් කියන්නේ ඇවිල්ලා nuclear තිබ්බා කියලා. නමුත් අද වෙන කොට ඒගොල්ලන් පිළිඅරන් තිබ්බා ඒක nuclear නැහැ කියන එක. එතකොට අපි දැක්කා ලිබියාවේ ආක්‍රමණය කරනවා. අපි දැක්කා සිරියාව ආක්‍රමණය කරනවා. ලිබියාවේ Human rights නෑ කියනවා. අද Human right එකක් ලිබියාවේ හොයා ගන්නත් නැහැ, රටක් කියන එකක් හොයා ගන්නත් නැහැ, සිරියාවට අද කී දෙනෙක් මරණයට පත් වෙනවද ඉතින් මේ ඔක්කොම ඇවිල්ලා තම වාසි සඳහා කරන ක්‍රියාවලියක් හැටියට තමයි සාමාන්‍යයෙන් මම බුද්ධි නිලධාරියෙක් හැටියට මම දකින්නේ ඉතින් ඒ තුලින් විවිධ ක්‍රම අනුගමනය කරනවා. එක පැත්තකින් මුදල් සොයා ගැනිමක් කරනවා, එක පැත්තකින් ආයුධ ටිකිරි ගමක් ඇති කරනවා. එක පැත්තකින් සම්පූර්ණයෙන්ම එතන division එකක් ඇති කරනවා. ඒ තුළින් තම රටවල් ශක්තිමත් කරනවා. නමුත් ඒ තුලින් එන spillover effect එක තමයි පොඩි පොඩි කණ්ඩායම් බිහි වෙලා ඒ කණ්ඩායම් ඊට පස්සේ එක තැනකදි identify කරනවා මේකේ කවුද සැබෑ සතුරෝ ඒගොල්ලන්ගේ. ඉතින් එතනදි ඒකයි මම දකින්නේ, සමහර දැන් අපේ ලංකාවේ ගත්තාම මේ මිනිස්සුන් ගොඩක් ඉගෙන ගත්ත කට්ටිය. දැන් මේගොල්ලන් ඉගෙන ගෙන Universities වලට ගිහිල්ලා අපි කියමු හොඳ ඉස්කෝලවල ගිහිල්ලා ඉගෙන ගත්තම මේගොල්ලෝ ඉක්මනට ඒක change වෙනවා. මම මොකද සමහර පුද්ගලයින්ට මම කතා කරලා තියෙනවා, මගේ දැනුමේ හැටියට. ඉතින් මේගොල්ලන් එක්ක අපි පොඩ්ඩක් කතා කලොත් එහෙම අපිත් radical වෙන තත්ත්වයකට පත් වෙනවා සමහර අවස්ථාවලදි විශේෂයෙන්ම තරුණ පුද්ගලයෙක් නම් JVP එකේ පන්ති 5 කරලා , පන්ති 5 කරලා ඉවර වෙන කොට ඒක අනික් පැත්තට යනවා. ඉතින් ඒගොල්ලෝ පෙන්නන එක තමයි. මෙච්චර මැරෙනවා මෙච්චර මේවා කරනවා ලෝකේ කිසි දෙයක් ඒ ගැන තර්ක කරන්නේ නැහැ, අද ඒ වෙනුවෙන් තමයි ඒගොල්ලෝ කරන්නේ

FAIR COMMENT BY JEZEEM

එතකොට ලංකාවෙත් ප්‍රහාර කරන්නෙත් ඇවිල්ලා ඒගොල්ලොන්ට බටහිර රටවල්වලට කරන්න බැරිකම නිසා. එතකොට ඒගොල්ලෝ පැහැදිලිවම ප්‍රකාශ කරලා තියෙනවා පලවෙනි එක ඇවිල්ලා...

ප්‍ර: exclusivism සහ Religious extremism ගැන, ඒ ගැන එහි සම්බන්ධයක් තිබේද නැත්නම් ඒක දෙකක්ද?

උ: ස්වාමීණි exclusivism කියලා අදහස් කලේ extremism එක ගැනද?

<u>ගරු සභාපති විනිසුරුතුමා</u>:

ප්‍ර: නැහැ exclusivism එකෙන් මම අදහස් කරන්නේ යම්කිසි කණ්ඩායමක් ඒ කණ්ඩායම විශේෂයි ඒ කණ්ඩායම කැපී පෙනෙන තනි පැවැත්මක් තියෙන බවට යන හැඟීම.

උ: OK, extremism ඇත්තටම ඒ දෙකේ ලොකුම සම්බන්ධයක් තියෙනවා මොකද ඒ ආගමික කණ්ඩායම් කැඩිලා කැඩිලා ගියාම තම ආගමික කණ්ඩායම වර්ධනය කරන්න තමයි මේ ආගම මේගොල්ලන් ප්‍රයෝජනයට ගන්නේ. ඒ ආගම ඒකට අවශ්‍ය කරන විදියට ඒගොල්ලෝ සකසා ගෙන ඒගොල්ලන්ගේ Group එකට අවශ්‍ය කරන Identification එක ලබා ගන්නවා. ඉතින් ඒක ලබා ගැනීමේදි ඒගොල්ලන්ට end එකක් නැහැ, extreme end එකට යනවා, ඒකට ගියාම තමයි ඒකේ තියෙන දරුණු කමත් එක්ක තමයි එතනදි ඒගොල්ලන් මේවා කරන්නේ. මොකද ඒගොල්ලන් අනික් එක හොඳටම දන්නවා දැන් මෙතනදි මුස්ලිම් එක ගත්තාම දැන් සියළු දෙනාම ISIS ත් නෙමෙයි. සියළු දෙනාම extreme violent ත් නෙමෙයි. එතන දී ඒගොල්ලන් identify කරනවා යම්කිසි කොටසක් එතනට ගන්න පුළුවන් කියන එක. දැන් ලංකාවේ සමාජය ගත්තොත් ලංකාවේ identify කරනවා උපරිම extreme line එකට ගන්න පුළුවන් වෙන්නේ 5% ක් නැත්නම් 7 ක් විතරයි. නමුත් ඒ 5 හරි 7 ගත්තොත් ඒගොල්ලන්ට 90% ම පාලනය කරන්න පුළුවන්. ඉතින් ඒක නිසා ඒගොල්ලන් worry වෙන්නේ නැහැ 90% ක් ගන්න ඉතින් ඒක නිසා ඒගොල්ලන් සම්පූර්ණයෙන්ම ඒගොල්ලන්ගේ Identity එක ස්වාමීණි ඒ එක්කම ඒ extreme violent එකට ගිහිල්ලා තමයි ඒ identity එක ඒගොල්ලෝ establish කර ගන්නේ. ඉතින් ඒ දෙකේ ඉතාමත්ම සම්බන්ධයක් තියෙනවා.

ප්‍ර: උදාහරණයක් ලෙස LTTE සංවිධානයට ඒ තත්ත්වයට එන්න පුළුවන් වුනේ දෙමළ ජනතාව වෙනම ජන කොටසක් ඔවුන්ට අයිති වෙනම ඉඩම් ප්‍රමාණයක් තියෙන සංකල්පය ස්ථාපිත කෙරුවායින් පස්සේ ද ඔබගේ දැනීමේ හැටියට?

FAIR COMMENT BY JEZEEM

උ: ඇත්තටම LTTE එක ගත්තොත් මේක දෙකක්. LTTE සංවිධානය ගත්තාම විශේෂයෙන්ම LTTE සංවිධානය Fight කලේ ඇත්තටම separatism කියන objective එකට. Separatism objective එකට සාමාන්‍යයෙන් රටක් වෙන් කරන්න නම් කොටස් 5 ක් ඕනේ. ස්වාමින් දක්වපු ආකාරයට ඒතේ ethnic identity එකක් තියෙන්න ඕනේ. එතකොට ඒක නිසා North and East එක සම්පුර්ණයෙන් දෙමළ කියන identity එක ඒගොල්ලන් ඇති කලා. ඒ එක්කම මුස්ලිම් කට්ටිය ඉන්න නිසා ඒගොල්ලන් ඒක broad කලා Tamil speaking identity එක ගත්තා. ඊට පස්සේ ඒගොල්ලන්ට වෙනමම නිජභූමි සංකල්පයකට අවශ්‍ය කරන ඒක වෙනම ම ඒ boundary එකක් ඒගොල්ලෝ මේවා කලා.

ප්‍ර: ඒ ඔක්කොම exclusivism එක යටතට වැටෙනවා නේද ?

උ: ඔබ හරි ස්වාමීණි. මොකද ඒ තුලින් තමයි ඒ Objectives සේරම හැදෙන්නේ.

දැන් වේලාව ප.ව. 5.50 යි.
මෙතැන් සිට වාර්තා කරන්නේ සචිනි මෙනවිය විසින්ය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව: ප.ව **5.50**
පෙර සටහන්: ධම්මිකා මිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: ඔබ ප්‍රකාශ කර සිටියා ISIS සංවිධානය ගැන. එය **2014.06.29** වන දින ඇතිවුන බවත් ඔබ මීට පෙර කියා සිටියා. ISIS කියන සංවිධානය මුස්ලිම් ආගම අන්තවාදීත්වයට රැගෙන යන සංවිධානයක් කිව්වොත් හරිද?

උ: අනිවාර්යයෙන්ම.

ප්‍ර: ඒ කියන්නේ Islamic State of Iraq and syria.

උ: Siriya.

ප්‍ර: යන නාමයෙන් හඳුන්වන ISIS සංවිධානය **2014** බිහිවෙන්නේ කුමන අරමුණු යටතේ ද?

උ: ස්වාමීනි මට, පුළුවන් ද මේකේ document.එකක් හැටියට ගෙනාවේ නැහැ. මං පොඩි Note එකක් ගහගෙන ආවේ. මට ඕනෙනම් ඒ document එකක් විදියට පස්සේ ඉදිරිපත් කිරීමක් කරන්න පුළුවන්. ඔබ අහපු ප්‍රශ්නෙට මං උත්තර ලබා දෙන්න ද, විශේෂයෙන් ම ඒ **2014** ජූනි **29** වැනි දා තමයි මේ ISIS කියන සංවිධානයේ Caliphate කියන එක බිහිවුණේ ඇවිල්ලා **2014** ජූනි **29** ය.

ප්‍ර: මොකද්ද Caliphate කියන්නේ?

උ: Caliphate කියලා කියන්නේ වෙනම ම මුස්ලිම් Islamic State of Iras and Syria කියන ඒකට අයිති වෙනවා රටවල් ගණනාවක්. ඒකට ශ්‍රී ලංකාවත් එක කොටසක්. ඒ කොටස හැඳින්වුයේ Caliphate කියන එක.

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: Caliphate කියන එකේ වැදගත්කම ඉස්ලාම් ආගම පැත්තෙන් කියන්න.

උ: ඔව්. දැන් විශේෂයෙන් ම දැන් මෙතනදී ඒ ගොල්ලෝ දකින දෙයක් තමයි පළවෙනි සතුරා හැටියට ISIS සංවිධානය දකින්නේ. ඒ ගොල්ලෝ මුළු ලෝකේ ම කොටස් **3** කට කඩලා තියෙනවා. පළවෙනි කොටස තමයි ඇවිල්ලා.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: ඒ ගොල්ලො කියන්නේ IS සංවිධානය.

උ: ඔව්, IS සංවිධානය.ඒ ගොල්ලන්ගේ අරමුණ. ඒ ගොල්ලන්ගේ පළවෙනි කොටස සතුරා විදියට ඒ ගොල්ලෝ දකින්නේ ක්‍රිස්තියානි ආගම සහ බටහිර රටවල් ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් තමයි Number one

FAIR COMMENT BY JEZEEM

target එක. ඒ ගොල්ලන් කියන්නේ දුටු තැන මරන්න ඕන කියන එක තමයි කියන්නේ. ඒකට ප්‍රධාන හේතුව කියන්නේ මේ ගොල්ලො ක්‍රිස්තියානි ආගම සහ අනෙකුත් ආගම ප්‍රචාරය කරගෙන සම්පූර්ණ මේ ලෝකේ ම ක්‍රිස්තියානි ලෝකයක් බිහි කර ගන්න උත්සාහ ගැනීමක් තමයි කරන්නේ. ඉතිං ඒකට පළවෙනි පියවර තමයි අපි අපේ Islamic state එකක් අපි ඇති කළ යුතුයි කියන එක. ඉතින් අර මූලික ඉරාකයෙන් පටන් අරගෙන IS and Syria කියන එක පටන් අරගෙන, ISIS කියන එක ඇති කරගෙන පස්සේ ඒක මේ Caliphate කියන එකට ඇවිල්ලා තියෙන්නේ මේ මේ ඇවිල්ලා මුස්ලිම් රාජ්‍යයක් විය යුතුයි. ඒක තමයි පළවෙනි අර කියපු Identity එකත් එක්ක එන්නේ.

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: Caliphate එකට යම්කිසි Caliphate කියන එකට යම් කිසි විශේෂ තේරුමක් තියෙනවද?

උ: ස්වාමීනි ඇත්තටම මම Caliphate කියන වචනයට මම තේරුමක් දන්නේ නැහැ.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: කැලිෆ් සහ Caliphate?

උ: Caliphate කියලා කියන්නේ ඒ ගොල්ලන්.

ප්‍ර: ඒ කියන්නේ Caliphate කියන්නේ සංකල්පයක්?

උ: සංකල්පයක්.

ප්‍ර: එය ක්‍රියාත්මක කරන්න

උ: නැහැ. Caliphate කියන්නේ ඇවිල්ලා මුස්ලිම් රාජ්‍යය කියන එක තමයි කියන්නේ. Islamic state කියන එක තමයි Caliphate. ස්වාමීනි ඉස්ලාම් රාජ්‍යය තමයි Caliphate.

ප්‍ර: දැන් ඔබ කියා සිටියා එහි දී විරෝධය එල්ල වන කොටස් 3 ක් සම්බන්ධයෙන්?

උ: ඔව්.

ප්‍ර: දෙවෙනි කොටස කවුද?

උ: දෙවැනි කොටස තමයි දැන් මේ ක්‍රිස්තියානි ආගම සහ ඇමරිකානු ප්‍රමුඛ බටහිර රටවල් වලට තම අරමුණු ඉටුකර ගැනීමට සහාය දක්වන රටවල් තමයි ඒ ගොල්ලෝ ගත්තේ දෙවැනි Category හැටියට. දෙවැනි Category ඉන්න රටවල් වලට ඒ ගොල්ලෝ දිගටම මරන්නේ නැහැ. නමුත් ඉඳලා හිටලා ප්‍රහාරයන් එල්ල කරනවා. මොකද අර ඇමරිකාවත් එක්ක සහ බටහිර රටවල් එක්ක තියෙන සම්බන්ධතා නතර කරන්න. තුන්වැනි කොටස තමයි Neutral රටවල්. ඒ Neutral රටවල් ඇවිල්ලා

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කිසිම සහයෝගයක් ඇමරිකාවට දක්වන්නෙත් නැහැ. ඒ එක්කම අනිත් රටවල් වලට දක්වන්නෙත් නැහැ. ඒ අනුව තමයි ඒ ගොල්ලෝ ඒ රටවල් වලට ඒ ගොල්ලන් කියන්නේ අපි කිසිම ප්‍රහාරයක් ඒ රටවල් වලට එල්ල කරන්නේ නැහැ කියලා. ඒ අනුව මුළු ලෝකේම කොටස් 3 කට මේ ගොල්ලන් කැඩුවා.

ප්‍ර: දැන් මේ කරා IS සංවිධානය නායකයා විසින් තමයි සිදු කරන්නේ?

උ: ඔව් මේ ප්‍රකාශය නිකුත් කරනවා මෙයා මේ මේ මේකේ තවත් වැදගත් දෙයක් කියන්න ඕන. මේ ප්‍රකාශය මේකේ වැදගත්කම මේ ලංකාවේ තියෙන සිදුවීම් මාලාවට ඉතාමත් වැදගත් මේ කරන ප්‍රකාශය මොකද 2014 ජුනි 29 මේ ප්‍රකාශය කිරීම.

ප්‍ර: මං මෙතැන්ට එන්නම්. මේ නායකයාගේ නම ඇවිල්ලා අබුබකර් අල් බග්ඩාඩ්?

උ: yes.

ප්‍ර: ඔහු තමයි ISIS සංවිධානයේ ඒ Caliphate එක ප්‍රකාශ කරන්නේ?

උ: ඔව්.

ප්‍ර: මේ Caliphate එකෙන් ප්‍රකාශ කරන්නේ මුස්ලිම් රාජ්‍යයක් මේ ලෝකේ ඇති කිරීම?

උ: ඔව්. ඉස්ලාම් රාජ්‍යය.

ප්‍ර: මේ ඉස්ලාම් රාජ්‍යය යන ඒ සංකල්පයේ ඒ රාජ්‍යයට ඒ ශ්‍රී ලංකාව කියන රාජ්‍යයත් මේ ISIS සංවිධානය විසින් ඔබට අනුව ඇතුළත් කරලා තියෙනවා?

උ: ඔව්. පැහැදිලිවම ඒ ගොල්ලන් ප්‍රකාශ කරලා තියෙනවා. Internet එකේ මොකද්ද ඒ අයිති වෙන රටවල් ටික.

ප්‍ර: මොනවද අයිති වෙන රටවල් ටික?

උ: ඔව්.

ප්‍ර: දැන් මෙම Caliphate එක ප්‍රකාශ කිරීමත් සමගම ISIS නායක අබුබකර් අල්බග්ඩාඩ් ප්‍රසිද්ධ විවෘත ඇරයුමක් එහෙම නැත්නම් විවෘත ඇරයුමක් ලෝකයේ සිටින මුස්ලිම් ජනතාව සියළු මුස්ලිම් ජනතාවට සිදු කරනු ලබනවා. හරිද?

උ: ඔබ හරි.

ප්‍ර: මොකද්ද ඒ ප්‍රකාශය කියලා ඔබට කියන්න පුළුවන් ද?

උ: ඔව්. මට පුළුවන්. මොකද එයා ප්‍රකාශ කරනවා. එයා කියනවා මේ Caliphate එක කරන්න there are three golden and rules ඒ කියන්නේ Caliphateඑක කරන්න step 5 ක් තියෙනවා. ඒ step 5 තමයි මං කියන්නම්. පළවෙනි එක තමයි. පළවෙනි step 5 න් පළවෙනි එක තමයි හිජ්ලා කියලා කියනවා. ඒ කියන්නේ English වලින් migration.

FAIR COMMENT BY JEZEEM

දෙවැනි එක ඇවිල්ලා ජමාත්. Congregation 3 rd එක ඇවිල්ලා Taghut, ඒක ඇවිල්ලා de-stabilized idolatry ඔය බුදු පිළිම කඩන්න ඒවා ටිකට. ඊට පස්සේ 4 වැනි එක තමයි Consolidation ඒ කඩා ගත්තම පස්සේ අවශ්‍ය කරන ප්‍රදේශ Caliphate කරන්න. පස්වැනි එක තමයි ඇවිල්ලා Khalifah. ඒක තමයි Caliphate එක කියලා කියන්නේ. දැන් මෙතැනදී ඉතාමත්ම පැහැදිලි මේ ටික තමයි මේ සහරාන්ලාගේ කණ්ඩායම අනුගමනය කරේ. දැන් අපි මෙතැන පැහැදිලිව මම කිව්වා steps 5. එතකොට ඒ steps 5 දී මං නිකන් කෙටියෙන් කිව්වොත් step 5 දි migration එකේ දි එයා කියනවා මේ මේ 29 වැනිදා පිටරට ඒ කියන්නේ ඉන්න පුළුවන් නම් ඉන්න තැනක ඉඳන් මේ මේ සංකල්පය මේ රට බිහි කරන්න ඔයගොල්ලන් පුළුවන් ආකාරයෙන් උදව් කරන්න. ඒ කියන්නේ lone wolf attack හරි ඒ ආගම කරලා හරි ඒ ටික කරන්න කියනවා. අනිත් කට්ටිය මේ රාජ්‍ය බිහිකරන්න ඕනේ Iraq හා syria කියන පැත්තෙන් නිසා ඔයගොල්ලන්ට මම ඇරයුම් කරනවා මේ රටට එන්න කියලා. එතකොට ඒක තමයි.

ප්‍ර: කොහේට ද එන්න කියන්නේ?

උ: සිරියාවට.

ප්‍ර: සිරියාවට එන්න කිව්වේ විවෘත ඇරයුමක් කරන්න ?

උ: ඔව්. දැන් අපි ගියොත් එහෙම internet එකට 2019 දි බග්ඩාඩිගේ ප්‍රකාශය Caliphate ප්‍රකාශය ගත්තහම ඒක පැහැදිලිව ම මේක කියනවා. එතැනදි එන කට්ටියට කියනවා කොටස් 3 ක්. ඒ එන කට්ටියට කියනවා Golden rules for foreign fighters මොන රටින් ආවත් එකක් පළවෙනියා කියලා migrate කරන්න කියලා කියනවා. පුළුවන් කට්ටියට එන්න කියලා කියනවා. දෙක ඒ ගොල්ලන් ඇවිල්ලා Oath එකක් දෙන්න ඕන. ඒකට බායා කියලා කියනවා. ඒකට කියන්නේ religious oath of allegiance of loyalty ඒ කියන්නේ අපි මේක පිහිටවන්න LTTE සංවිධානය ඊලම් පිහිටනවා වගේ ඒක කියනවා. අනිත් එක තමයි lone wolf attacks ඒ ගොල්ලෝ කියනවා ඇවිල්ලා ඒ කියන්නේ සම්පූර්ණ සටනට සුදානම් වෙන්න කියලා රට ඉරාකය ඇතුළ හෝ පිට හෝ ඒක කරන්න කියනවා. ඒ කියන්නේ මේක foreign fighterලා ඇවිල්ලා මේකේ ඇතුළෙම fight කරන්න ඕනෙ නැහැ. ඒ ගොල්ලන්ට පුළුවන් ඇමරිකාවට ගිහිල්ලා හරි මේ lone wolf attack එක කරන්න පුළුවන් තම රටේ නැතුව. එතකොට මේක ඉතාමත්ම පැහැදිලිව කරලා තියෙනවා. එතකොට මම මේ ලංකාවේ සිදුවීම් මලාවට ගත්තොත් දැන් මේක migration එක පළවෙනි කොටස දැන් අපි දැක්කා ලංකාවෙන් 37 දෙනෙක් යනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: හරි මං එන්නම් එතැන්ට.

උ: 5 කියන්නද මම.

ප්‍ර: කියන්න.

උ: පළවෙනි එක කිව්වේ Fightersලාට තියෙන golden rule එක එක මම කිව්වා. කොටස් 3 ක්. ඒ කියන්නේ ඇවිල්ලා හිජ්ලා migration ඒ කියන්නේ එන්න ඕනේ. දෙක ඇවිල්ලා සියළු දෙනාම oath එක දෙන්න ඕනේ. බායා. තුන්වැනි එක ඇවිල්ලා attack, lone wolf attacks ඒක සිරියාව ඇතුළත හෝ ඇමරිකාවට හෝ කොහේ හරි රටකට ගිහිල්ලා ඔයගොල්ලෝ ඕක කරන්න ඕන. ඕක තමයි අර පළවෙනි migration එක යටතේ step 5 පළවෙනි එක යටතේ fightersලා ගෙන් එයා බලාපොරොත්තු වෙන දේ. එතකොට දෙවැනි එක ඇවිල්ලා Congregation කියන්නේමේ කරන ගමන් තමන්ගේ මේක ව්‍යාප්ත කරන්න Identity එක ව්‍යාප්ත කරන්න කටයුතු කරන්න ඕන. පුළුවන් තරම් recruitment කරලා . ඒවා ටික කරන්න ඕන. දැන් අපි ඒක දැක්කා. දැන් කට්ටියක් සිරියාවට යනවා. 37 දෙනා. 37 දෙනා සිරියාවට යනකොට ඒකට ආවේණික ,

ප්‍ර: ලංකාවේ 37 දෙනා?

උ: ඔව්. එතකොට ලංකාවේ තව group එකක් මේකට කිසිම සම්බන්ධයක් නැහැ. තව group එකක් JMI කියන සංකල්පයත් එක්ක මේක බිහිවෙනවා ලංකාවේ. ඒකට කිසිම සම්බන්ධයක් නැහැ ඒකට.

ප්‍ර: JMI කියන්නේ?

උ: ජමෙතු මිලාති ඊබ්‍රාහිම්.

ප්‍ර: පීසයිලානි?

උ: ජමෙතු මිලාති ඊබ්‍රාහිම් සයිලානි ඒක JMI කියලා තමයි අපි හඳුන්වන්නේ කෙටි නාමය. මේකට තියෙන සංකල්පයත් එක්ක මේක බිහි වෙනවා. මොකද්ද අරයා කියන්නේ. කට්ටියක් එන්න කට්ටියක් ඔය ගොල්ලන් කරන්න පුළුවන් විදියට එන්න. දැන් ඒ inspiration එකත් එක්ක යට කට්ටියටයි මේ කට්ටියටයි කිසිම සම්බන්ධතාවයක් නැහැ. මේ එක group එකක් ඒකට යනවා. මේ group එක මෙතැන බිහි වෙනවා. JMI කියන group එක මේ පැත්තේ බිහි වෙනවා. දැන් දෙවැනි එකේ දි ඊට පස්සෙ තුන්වැනි එකේ දි අර ටකහට් ඒ කියන්නේ පිළිම වන්දනාව ප්‍රතික්ෂේප කරනවා. අපි දකිනවා මාවනැලේල් මේ කණ්ඩායම් ගිහිල්ලා වලට ගහනවා. දැන් මේ පිළිම පිළිබඳව අපි මේ Ideology එක අපි හොඳට Study කරන්න ඕන. මේක මැදින් ඕන කෙනෙකුට කියන්න පුළුවන් පෙරහැරට ගහන්න හිටියා අරහෙට ගහන්න හිටියා කියලා. නමුත් අපි ගත්තම මේ මේ පුද්ගලයෝ බිහිවන්නේ මේ මම කියපු මේ

FAIR COMMENT BY JEZEEM

කොටියාශය බිහිවන්නේ මේ process එකෙන්. මීට කලින් ගියේ නැහැ සිරියාවට. මීට කලින් සහරාන්ලා බිහි වුණේ නැහැ. නමුත් ඒ තියන පද්ධතියක් එක්ක මේ ඉල්ලීම මත යම් කිසි කොටසක් මේකට යනවා. එක කොටසක් කැමති වෙනවා රැඩිකල් කෙලින්ම රැඩිකල් නෙමෙයි Violent පැත්තට යන්න. ඒ කොටස යනවා සිරියාවට. ඉතුරු කොටස Violent පැත්තට යන්න කැමති නැහැ. ඒ ගොල්ලෝ ඇතුලෙ ඉඳගෙන ඉතුරු ටික කරන්න පෙළඹෙනවා. ඒ කියන්නේ කරලා recruitment කරලා මේ කරලා පුළුවන් දේවල් කරන්න ඒ ගොල්ලෝත් පසුබිම හදා ගන්නවා. එතකොට මේ පසුබිම් දෙක මේක හැදෙන කොට තුන්වැනි කොටස නැවත වරක් Violent පැත්තට ඔය සහරාන්ලා මේ group එක මෙතැනින් කඩාගෙන සහ අනෙකුත් තව කණ්ඩායමක් එක පැත්තකින් බිහි වෙනවා. මේ ගොල්ලෝ ඊට පස්සෙ තුන්වැනි Stage එකට යනවා අර පිළිම කඩන්න.නැත්නම් කිසිම හේතුවක් නැහැ මේ එහෙම ගහලා ඕන්නම් ඊට පස්සේ තිබ්බ පෙරහැර දවසට ගහන්න ඊට වැඩිය Casualty එකක් කරන්න තිබ්බා. එහෙම නැත්නම් extremism එක මේ ගොල්ලොන්ට විරුද්ධව සමහර ස්වාමීන් වහන්සේලා සමහර ගොඩාක් කටයුතු කරපු ස්වාමීන් වහන්සේලා කෙනෙක්ට යම් කිසි දෙයක් කරන්න තිබ්බා. නමුත් අපි මේක පැහැදිලි වෙන්න ඕන මේ ගොල්ලෝ මේ හැම දේම කරන්නේ යම් අරමුණක් එක්ක. ඉස්ලාම් රාජ්‍යය බිහි වෙන ගමන් අවසානයේ දි ස්වර්ගයට යන්න තමයි මේ ගොල්ලන් මේ කරන්නේ. දැන් ඒ වගේ ඉතාමත්ම Ideology එක ඉතාමත්ම Strong Ideology එකක් එක්ක ඒ විදියට Suicide ක්‍රමයටයන කෙනෙක්ට කිසිම දවසක මුදුණ ලබා ගැනීමක්වත් කරන්නේ නැහැ. ඒ ගොල්ලන්ගේ Identity එක extreme ඒ ගොල්ලන්ගේ objective එක කොනටම ගිය එක. එතකොට මේ ඔක්කොම ඇවිල්ලා ඉගෙන ගත්ත කොටියාශයක්. මේ ඉගෙන ගත්ත කොටියාශයක්. මේ ගොල්ලන්ට ඕනතරම් මුදල් තියෙනවා. මිලියන ගණන්. මෙතැනදි අපි දැක්කා මේ parallel එකේ යනකොට විවිධ analyst ලා මේක ඇවිල්ලා පෙරහැරට ගහන්න හිටියේ මේක ඇවිල්ලා tourists ලාට ගැහුවේ. එහෙම නැත්නම් මේක ඇවිල්ලා හමුදා වලින් ඒ ගොල්ලන්ව recruit කරලා තිබ්බා. ඉතින් මේ එකක්වත් වෙන්නේ නැහැ. මේ ගොල්ලන් ස්වර්ගයට යන්න නම් මොකද එතැනදි ඒ පැත්තට ගියොත් එහෙම ඒ ගොල්ලෝ ස්වර්ගයට යන්න හම්බ වෙන්නේ නැහැ. මේක සම්පූර්ණයෙන් ම මේ සංකල්පයත් එක්කම බිහි වෙච්ච එකක්. එතැනදි අර 2018 දි මේගොල්ලෝ පිළිම ඒ ටික කඩලා පස්සේ ඒ ගොල්ලෝ යම් ප්‍රදේශ වලට ව්‍යාප්ත කරගෙන යනවා. ඒ ගොල්ලන්ගේ ඒ කණ්ඩායම එක් රැස්කරගෙන. අවසානයේ දි

ඒ ගොල්ලන් ස්වර්ගයට යනවා. Suicide කරගෙන. එතැන දි අපි දැක්ක දේ තමයි මේ 5 steps තමයි මුල ඉඳන්ම මේවා අනුගමනය කළේ. ඉතින් එතැන දි අර Golden fightersලාට තිබ්බ golden rules එකයි. එතකොට මේ Caliphate එක කරගන්න 5 කරන්නයි,. මේ ගොල්ලන්ගේ පැත්තෙන් ගත්තහම ඒ හැම කෙනෙක් ම දැන් ඔතැන අත්අඩංගුවට ගත්ත හැම කෙනෙක්ම මේකේ එක කොටසක් කරලා තියෙනවා. මේ කොටස් ගත්තේ නැත්නම් මේ කොටස් 5 ට ඒ ගොල්ලෝ යාමක් සිදු කරනවා. ඉතින් එතකොට 5 වෙනි කොටසට ගිය කට්ටිය මැරුණා. කොටස් 4 ක් ගිය කට්ටිය අත්අඩංගුවට පත් වෙලා තියෙනවා. කොටස් 3 නේ කට්ටියත් ඉන්නවා කොටස් 2 කේ කට්ටයත් ඉන්නවා. ඊට පස්සේ මේකට හැදෙන්න පුළුවන් environment එකකුත් තාම සමාජයේ තියෙනවා.

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: මොකද්ද ඔබ සඳහන් කළේ environment එකක් සමාජයේ තියෙනවා කිවුවනේ ඔබ දැන් විස්තර කරපු සිදුවීම් සියල්ලම සිදු වීමට. ඒ කොහේ ද ඒ අපේ ශ්‍රී ලංකාවේ සමාජය තුළද?

උ: ඔව්. ස්වාමිනි අපි දැක්කා මේ .Development එක මේ පැත්තේ වෙනකොට බුද්ධි අංශයක් හැටියට අපි දැක්කා එක කණ්ඩායමක් එහෙම යනවා. ඒ එක්කම අපි Identify file කරා JMI කියන සංවිධානය 12 දෙනෙක්ගෙන් විතර යම්කිසි බිහි වීමක් සිදු වෙනවා මේ ලංකාවේ 2015 අග හරියේ අගෝස්තු මාසෙට අපි ඒක Identity file කරනවා. ඒ එක්කම අපි දකින්වා Social media එකේ එක 450 ක් විතර කණ්ඩායමක් කොටස් 6 කට විතර අපි ඒක කැඩුවා. ඒ කියන්නේ අපි ගත්තොත් මුස්ලිම් සමාජය පිරමීඩයකට ගත්තොත් අපි ගත්තොත් උඩම ඉන්නවා religious body එක. මේ religious body එකේ අපි දැක්කා 1% 2% ක් විතර මේ මේ mindset එකේ ඉන්නවා. ඊට පස්සේ ඊළඟ line එකේ අපි දැක්කා intellectual 2% 3% intellectualලාත් මේ mind එකේ ඉන්නවා. හැබැයි Violent නෙමෙයි. ඒ ideology එකේ ඒකේ ඉන්නවා. ඊට පස්සේ අපි දැක්ක ලොකුම එක තමයි තරුණ කොටඨාශය. මේ තරුණ කොටඨාශය මේ ඉන්න 450 වැඩිම 150 හිටියේ මේ තරුණයින්. තරුණයන් අතර අපි දැක්කා ඒ ගොල්ලන්ගේ තියෙන ප්‍රකාශයන් අනුව මේ මේ ගොඩාක් Extreme religious පැත්තට බර වෙන පැත්තක් Violent පැත්තට බර වෙනවාත් අපි දැක්කා. මේකේ යටම කොටස අපි දැක්කා භායනකත්වය අනුව යටම කොටස අපි දැක්කා ඇවිල්ලා විශේෂයෙන් ම මේ JMI සංවිධානය වගේ සංවිධාන මේ යටින් එනවා. ඊට

FAIR COMMENT BY JEZEEM

පස්සේ එහා පැත්තට ගිය ලොකුම කොට්ඨාශය තමයි සිරියාවට ගිය කොට්ඨාශය. එතකොට මම ගත්තොත් Social media එකේ අපි Identify කරාම මෙහෙම ත්‍රිකෝණයක් අපි දැක්කා. සමාජය අපි Identify file කරාම ඒ වගේ අපි දැක්කා. ඉතින් ඒකයි මම ස්වාමිනි මම පැහැදිලි කරේ. මෙතැන දි සහරාන්ලා බිහිවෙනකොට මේක එක end එකක් පමණයි. මේක මුළු මුස්ලිම් ජනතාවම ඒ කියන්නේ Neutral කොටසක් එක්ක මේ කොටස් මේ ආකාරයෙන් යනවා. ඒක නිසා ඒක තමයි මම අදහස් කළේ Society එක හැටියට.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: දැන් ඔබ කියා සිටියා අර rules 5 ක් සම්බන්ධයෙන් ISIS නායකයා ප්‍රකාශ කරලා තියෙනවා කියලා. දැන් මෙහි මූලික අරමුණ ඉස්ලාම් රාජ්‍යය. ඉස්ලාම් රාජ්‍යය බිහිවීමක් මෑත අතීතයේ සිදුවන බවට කිසිම සාක්ෂියක් නොමැතිව මෙම පුද්ගලයන් තම ජීවිත පරිත්‍යාගයන් එහෙම නැත්නම් ජීවිත නැති කරගෙන තවත් ව්‍යසනයක් සිදු කරන්නේ මොකද්ද ඒ ගොල්ලන්ගේ ඒකෙන් බලාපොරොත්තු වන්නේ?

උ: මම මේ විදියට ගත්තොත් LTTE එකේ Suicide Carders ලා ඔක්කොම ටික කරගෙන මේකේ ඒ ගොල්ලන් හොඳටම දන්නව නම් උතුරු නැගෙනහිර වෙලා වෙනත් රටක් බිහි කරන්න බැහැ කියලා ඇයි Suicide Carders ලා කරන්නේ. මගේ පිළිතුර මේකයි. මේකයි මම කිව්වේ. මුස්ලිම් සියළු සමාජයේ 95% ක් ඉන්නේ රැඩිකල් සමාජයක් නෙවෙයි. නමුත් හැම සමාජයකම කොටසක් ඉන්නවා රැඩිකල් Element එකක්.නමුත් ඒ රැඩිකල් Element එකට ලොකු Impact එකක් දෙන්න පුළුවන් මුළු Society එකටම. ඉතින් මෙතැන දි ඒ ගොල්ලෝ බලාපොරොත්තු වුණේ අර හැම පද්ධතියක් තුළින් ම මේ රැඩිකල් Element එක තමයි ගන්න බලාපොරොත්තු වුණේ. ඒ රැඩිකල් Element එක ඒ ගොල්ලො විශ්වාස කරනවා ඒ ගොල්ලෝ යම්කිසි step එකක් විතරයි. ඒ කියන්නේ අපි ගෙයක් හදන්න නම් ඒ ගොල්ලෝ ජීවිත කාලයේදී ඒ ගොල්ලෝ ඉන්න කොට ඒ ගොල්ලන්ට ගෙයක් හදන්න බැහැ. හැබැයි ඒ ගොල්ලෝ කවද හරි දවසක කරන ජීවිත පරිත්‍යාගය ඒ ගොල්ලන්ට ජීවිත පරිත්‍යාගය ඉවර වෙන්නේ ස්වර්ගයෙන්. ඒ කියන්නේ මේ රට Caliphate එක හදන්න තම ජීවිත පරිත්‍යාගය කරන හැම කෙනෙක් ම ස්වර්ගයෙන් තමයි නතර වෙන්නේ. ඒ තියෙන ස්වර්ගය බොහොම artificial ස්වර්ගයක් මේ ගොල්ලන් කියන්නේ මේ ගොල්ලෝ මේ ආගම් පැත්තෙන්ම වෙලා ඒ කියන්නේ ඒ කැප වීමේ scarification එක ඉතාමත්ම මේ ආගම් වෙනුවෙන් තමන් මේ රටට

FAIR COMMENT BY JEZEEM

බිහිවෙන අය වෙනුවෙන් කරන්න පුළුවන් ඉහළම කැපවීම තමයි එයා එතැනින් කරන්නේ. ඉතින් ඒ අනුව මම කොටසක් කරනවා මම කොටසක් කරනවා මම කොටසක් කරනවා මේ සියළු කොටස් කරනවා කවද හරි දවසක රාජ්‍යයක් බිහි වෙනවා කියන එක තමයි කියන්නේ. ඒ ඒ ගොල්ලන්ගේ කාලේ නෙමෙයි . ඒක ඉස්සරහට වෙන්න පුළුවන්. නමුත් මම රාජ්‍ය යවෙනුවෙන් කරන කැප වීම ඒක කරන්න පුළුවන්. හොඳම උදාහරණය සයින්දමරුදු වල 17 දෙනා වෙඩි තියලා මැරෙන කොට ළමයි ඔක්කොම ටික තියලා ලොකු ප්‍රශ්නයක් දැන් මේක. සාමාන්‍ය සමාජයේ මේක බලනකොට කොහොම ද මේ තත්ත්වය ඇති වෙන්නේ කියලා. මොකද හේතුව තුවක්කුවක් අරන් කියනවා අනිත් පැත්තෙන් ප්‍රකාශයක් කරනවා අපි සියළු දෙනාම ස්වර්ගයට යනවා අපි ඔබ වෙනුවෙන් කැප වෙනවා. ඒ ගොල්ලෝ කතා කරන්නේ නැහැ මේ ලංකාවක් ගැන . ඒ ගොල්ලෝ කතා කරන්නේ අබුබක්කර් ගැන. ඒ ගොල්ලො කතා කරන්නේ Caliphate එකක් ගැන. ඒ ගොල්ලො කතා කරන්නේ ස්වර්ගයක් ගැන. ඉතින් එතකොට බලන්න ඒ ගොල්ලන්ගේ මානසිකත්වය මොකද්ද කියලා. අපි බලන මානසිකත්වය ලොකු වෙනසක් තියෙනවානේ. ඒ ගොල්ලො අද හිටිය නම් ඒ ගොල්ලො කියයි කොහෙම ද ඒ මානසිකත්වය . ඉතින් එතකොට ඒ මුළු කාත්තනුකුඩිය සමාජය ම නෙමෙයි ඒ ගොල්ලෝ දැඩි විශ්වාසයක හිටියා. අපි මේ කරන Contribution එක කිසිම වතුරේ යන්නේ නැහැ කියන එක.

ප්‍ර: දැන් ඔබ ඔබගේ සේවා කාලයේ යම් යම් කාල පරිච්ඡේද වල විදේශගත වීම් සිදු වුණාද, ඊට අමතරව ඔබගේ මුළු සේවා කාලයම ලංකාව තුළ 2016 වෙනකන් ඔබ කළේ බුද්ධි කටයුතු ?

උ: ඔබ හරි.

ප්‍ර: 2009 ලංකාවේ රජය විසින් ලංකාවේ පැවති ත්‍රස්තවාදය සම්පූර්ණයෙන් ම පරාජයට පත් කරනවා හරිද?

උ: ඔබ හරි.

ප්‍ර: මේ 2009 වර්ෂය වන විට ඔබ සිටියේ බුද්ධි කටයුතු වල, ලංකාව තුළ ආගමික අන්තවාදය ආගමික ප්‍රචණ්ඩත්වයට නැඹුරු වූ සංවිධාන සහ පුද්ගලයන් සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු ලැබිලා තිබුණ ද?

උ: ඔව්. නිවැරදිව ම අපිට ලැබිලා තිබ්බා.

ප්‍ර: මං කියන්නේ 2009 යුද්ධයට පෙර?

උ: ඔව් 2009 යුද්ධයට පෙර අපි යුද්ධ කාලෙදි?

ප්‍ර: ඔව්.

උ: අපි ඇත්තටම අපි සියළු දෙනාම මං හිතන්නේ ශ්‍රී ලංකා රට වැසියොත් වෙන්න ඇති සියළු දෙනාම යොමු වෙලා තිබ්බේ මේ LTTE ත්‍රස්තවාදයට

FAIR COMMENT BY JEZEEM

තමයි. අපි දැක්ක එකම Threat එකත් ඇවිල්ලා LTTE එක පමණයි. එතකොට අපි සම්පූර්ණයෙන්ම යුධ හමුදා සහ සියළුම බුද්ධි අංශ ඒ එකතු කිරීම් ඒ වෙනස් වීම් නම් වෙනස් වීම් ඔක්කොටම වෙන්න reason එකක් තියෙනවා. අපිට මූලික Threat එක තිබ්බේ මේකයි. අපේ resources ටික මේකයි. ඒක නිසා අපි සියළුම දේවල් අපි focus කළේ ඇවිල්ලා මේ threat එකට. ඉතින් ඒක මුළු සමාජයේ ම.

ප්‍ර: LTTE.

උ: LTTE ත්‍රස්තවාදය විනාශ කරන්න.

ප්‍ර: ඒ **2009** ත්‍රස්තවාදය අවසන් වුණාට පසුව මේ බුද්ධි අංශවල යම් වෙනස් වීම් Structural වෙනස්වීමක් සිදු කරාද?

උ: ඔව් අනිවාර්යෙන් ම බුද්ධි අංශ වල Structural වෙනස් වීම් රාශියක් සිදු වුණා. මොකද ඊට පස්සේ ආපු landscape එක Security and Intelligence landscape සම්පූර්ණයෙන් ම වෙනස්.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් DMI එක ඒ කියන්නේ ඔබ සිටි යුධ හමුදා බුද්ධි බලකාය තොරතුරු රැස් කිරීම හරි මොනව හරි දෙයක් සිදු කරාද?

උ: ඔව්. ඒ කියන්නේ **2009** පස්සේ යුද්ධයෙන් පස්සේ මම හිටියේ **2009, 2010, 2012** වෙනකන් මම සිටියේ Coordinator foreign Intelligence හැටියට නමුත් මම බුද්ධි අංශයේ සාමාජිකයෙක් වෙනම Director MI කෙනෙක් වෙනම හිටියා. එතකොට අපිට මූලික වශයෙන් අපි දැක්කා දේ තමයි එතනදි මම බුද්ධි නිලධාරියෙක් හැටියට දැක්ක දේ තමයි Structural Changes හැටියට LTTE එකට පමණක් සීමා වෙලා තිබ්බ අපිට ශ්‍රී ලංකාවේ Security තිබ්බ අභියෝගය විවිධ කොටස් හරහා කැඩිලා මේ ඒ ඒ තර්ජන **4** ක් දක්වා **2010** දී ත් **2012** දී ත් තර්ජන **5** දක්වාත් වර්ධනය වීමක් සිදු වුණා. ඒ වර්ධනය වීමට සමගාමීව අපි අපේ Structures ටික re-vamp කරලා ඒ Structures ටික ඒ කියන්නේ ඒ threat මුහුණ දෙන ආකාරයට අපේ අනිත් දේවල් අපි වෙනස් වීම් රාශියක් අපි සිදු කරා.

ප්‍ර: **2010** දී ඔබ ඒ දැක්ක තර්ජන මොනවද?

උ: **2009** ට කලින් තිබ්බ තර්ජන

ප්‍ර: **2010** දි?

උ: ඔව්. LTTE පමණයි. **2010** දි අපි තර්ජන **4** ක් දැක්කා. ඒ පළවෙනි ප්‍රමුඛම තර්ජනය ඇවිල්ලා නැවත වරක් ත්‍රස්තවාදය ඇති වීමේ ප්‍රවණතාවය ඒ කියන්නේ LTTE මැරිලා තිබ්බට අපි ගොඩාක් attempt දැක්කා. දෙවැනි එක තමයි ඇවිල්ලා අපි දැක්කේ ඇවිල්ලා Organized Crimes විශේෂයෙන් අපි දැක්කා අති විශාල ප්‍රමාණයක් ඕස්ට්‍රේලියාවට යනවා. මත්ද්‍රව්‍ය එන්න පටන් ගන්නවා. එතකොට හොර සල්ලි එන්න පටන්

FAIR COMMENT — BY JEZEEM —

ගන්නවා. එතකොට human smuggling, drugs smuggling, money laundering මේ ආදි විශාල වශයෙන් අපි දැක්කා 2016 දි. ඒක තමයි අපේ දෙවැනි threat එක දැක්කේ.

ප්‍ර: 2009 දි?

උ: 2010 දි. 2009 අගභාගයේ දී යුද්ධෙන් ඉවර වුණාට පස්සේ අපි කරපු Assessment එක ඊළඟ අවුරුදු 5 ට. තුන්වැනි එක අපි දැක්කා Cyber crimes විශේෂයෙන් ම technical පැත්තෙන් යම් යම් internet වගේ භාවිතාවෙන් ඒවල වෙන්න පුළුවන් threat එක අපි දැක්කා. ඒ එක්කම අපි දැක්කා Extremism පැත්තේ යම් යම් දේවල් ගොඩනැගීම් වෙනවා. ඇත්තෙන් ම මේක අපි දැක්කේ අපි දැක්කා විශේෂයෙන් ම යම් යම් ආගමික සංවිධාන යම් යම් අපි දැක්කා ඉදිරියට එනවා. ඒ ආගමික සංවිධාන වල යම් යම් ප්‍රශ්න ඉදිරිපත් කරා. මුස්ලිම් සමාජය කෙරෙහි. එතකොට මෙතැන දි අපි දැක්කා මේ දේවල් ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙන්න පුළුවන් කියන එක. ඒ කියන්නේ මුස්ලිම් එකට වැඩිය අපි දැක්කේ මේ ආගමික සංවිධාන බිහිවීම තුළින් රටට ප්‍රශ්නයක් වෙන්න පුළුවන් කියන එක. ඊට පස්සේ ඒක තමයි 4 වැනි එක දැක්කේ.

ප්‍ර: දැන් 2012 .

උ: ඒක ගත්තා. 2011 වෙන කොට දැන් මං කිව්වේ threat 4 ම අපි review කරා. නැවත වරක් ඒ ඔක්කොම කරේ ආරක්ෂක ලේකම් තමයි අපිව appoint කරලා අවුරුදු 5 ට Forecast කරන්න කිව්වේ. අපිට threat එක. එතැනදි මේ දැන් ඔය extremism එක අපි දැක්කා Number 3 තිබ්බ threat එක Number 2 වලට ආවා. Organized Crime එක ගියා 4 ට. ඒ එක්කම 5 ක් ආවා ඇවිල්ලා geo political realities at impact අපි දැක්කා අපි යුද්ධෙන් පස්සේ අපි රටක් හැටියට නැගී සිටින්න උත්සාහ ගන්න කොට economy සහ ඒ පැත්තත් අපි දැක්කා ඒකට එරෙහිව සමහර රටවල්, සමහර බුද්ධි අංශ විවිධාකාරයෙන් මේ රට තුල සහ externally ක්‍රියාත්මක වෙනවා. එතකොට අපි දැක්කා පැහැදිලිව ම ඒ කොහොම ද ඒවා ක්‍රියාත්මක වෙන්නේ කියලා. එතකොට ඒකත් අපිට ලොකු තර්ජනයක් වුණා රටක් හැටියටCompulsive Security Strategy එකක් හැටියට අපි කොහොම ද ඒ රටවල් වලට මේ ප්‍රශ්න වලට මුහුණ දෙන්නේ කියන එක අපිට ලොකු ගැටළු සහගත තත්ත්වයක් ආවා.

ප්‍ර: ඔබ කියා සිටියා මේ 2010 දි අංක 4 ට තිබුණු extremism ආගමික අන්තවාදය 2012 දි අංක 2 ට පැමිණි බව. ඔබ කියා සිටියා 2010 දි මෙම අන්තවාදය ඇති විය හැකි බව තමයි ආගමික අන්තවාදය රට තුළ ස්ථාපනය වෙන්න ඒ කියන්නේ ඇති වෙන්න බලපාන අනිකුත් කරුණු

LEAK COMMENT BY JEZEEM

බිහි වෙලා තිබුණේ. ඔබ එහිදි කියා සිටියා යම් යම් ආගමික සංවිධානයන්?

උ: ඔව්.

ප්‍ර: ඔබට මෙය තව දුරටත් මෙම කොමිෂන් සභාවට පැහැදිලි කරන්න. මොකද්ද ඔබ එයින් අදහස් කරේ? ඒ කියන්නේ Extremism ඇතිවෙන්න ආගමික අන්තවාදය ඇතිවෙන්න බාහිරව රට තුළ පැවති තත්ත්වය සහ සංවිධාන තිබුණා ඒ සංවිධාන මොනවද ඔවුන්ගේ ක්‍රියාකාරකම් මොනවද කියලා පැහැදිලි කරන්න .

උ: බුද්ධි අංශ හැටියට අපි හැමතිස්සෙම අපි නිරතුරුවම අවධානය යොමු කරලා තිබබේ හැම දෙයක් ගැනම technical සහ රටේ වෙන සිදුවන සිදුවීම් සෑම පිළිබඳවම. එතැන දි අපි දැක්කා බොදුබල සංවිධානය වගේ සංවිධාන බිහිවීමක් සිදු වෙනවා. ඒ වෙනකනුත් මම බුද්ධි නිලධාරියෙක් හැටියට ආගමික Extremism එකක් මම දැක්කෙ නැහැ. මුස්ලිම්වරුන් අතරින් . මොකද අපි සම්පුර්ණයෙන් යුද්දෙට තමයි අපි Focus වෙලා තිබ්බේ. අපි එතැන දි දැක්කා සමහර විට මේ සංවිධාන පාලනයෙන් තොර යාම තුළින් ලොකු තර්ජනයක් රටටත් පවත්වන්න පුළුවන් කියන එක.

ප්‍ර: මොන සංවිධාන ද?

උ: විශේෂයෙන් ම මූලිකව ආවේ බෞද්ධ සංවිධාන තමයි ආවේ. සිංහල රාවය, ඒ වගේ සංවිධාන. නමුත් එතැන දි අපි බුද්ධි අංශය හැටියට අපි දැක්කා මේ සංවිධාන මේව එනකොට මේ සංවිධාන පිටිපස්සේ සමහර දේවල් තියෙනවා අතරම මේගොල්ලන් ගේන මේ points ඇවිල්ලා අපිට මේ ගොල්ලන්ට උත්තර දීමේ දි අපි engagement එකක් ඇති කරා. මේ හැම සංවිධානයක් එක්කම. මොක ද හේතුව අපි 2009 වෙන කොට යුද්ධ කාලෙදි සම්පූර්ණයෙන් ම dis engagement Strategy එකක් තමයි කරේ. මොක ද අපි යුද්දෙ ඉවර වෙලා 2006 දි මේ යුද්ධය කරන්න යන කොට ඉතාමත්ම පැහැදිලි මොකද අපි හැමසැරේම තේරුම් ගත්තා මේ කුරිරු යුද්ධය ඉවර කරන්න බැහැ හැමෝත් එක්කම ඒ නිසා අපි dis engagement වුණා ඒ කියන්නේ අපි මීඩියා එක ලං කර ගත්තේ නැහැ දමිළ ඩයස්පෝරාව ලංකරගත්තේ නැහැ. LTTE එක අපි ලං කරගත්තේ නැහැ. අපිට තිබ්බා එක අරමුණක්. ඒ අරමුණ ඉවළු කරලා තමයි අපි නතර වෙන්නේකියලා. ඒ අරමුණ ඒ නායකත්වයේ අරමුණත් එක්ක අපි අරමුණ කරා ගියා. එතකොට මං කියන්නේ මේ සම්පූර්ණ ear දකින්නේ dis engagement එකක් හැටියට. එක මං යුද්ධෙ ඉවර කරලා තමයි අපි නතර වෙන්නේ කියලා. යුද්දෙ ඉවර වුණායින් පස්සේ මේ තිබ්බ එකත් එක්ක හැම තිස්සෙම අපි engagement Strategy එකකට

FAIR COMMENT BY JEZEEM

Presidential Secretariat Copy

තමයි ගියේ. ඒ කියන්නේ මීඩියා එක engage කරා. දෙමළ ඩයස් පොරා එක engage කරා. LTTE එක engage කරා. Kp ලා වගේ. ඒ පැති වල අපි සෑහෙන වැඩ කොටසක් කරා. ඒ අතර අපි දැක්කා මේ අලුතෙන් සංවිධාන බිහිවෙන කොට අපිට අවශ්‍යතාවය තිබ්බා මේ ගොල්ලෝ එක්ක engage වෙන්න. Engage වෙලා identify කරලා බලන්න මොකද්ද මේ කියන එක සහ මේකට එන කරන්න . තර්ජනේ mitigate කරන්න. එතකොටඒ ගොල්ලෝ ගෙනාපු ඒව තමයි Wahhanism කරන ඒවා. ඉදිරිපත් කරන්න පටන් ගත්තා.අපි මුල් වරට මගේ ජීවිතෙත් මං ඇහුවේ. දෙවැනි එක ඇවිල්ලා කිව්වා මේ ඔය හලාල් කරණය සම්බන්ධයෙන් කියන්න හැදුවා. ෂරියා law එක ගැන කියන්න හැදුවා. අපි ඇත්තට එතැන engage වුණාම අපිට මේවට උත්තර ලබා දෙන්න ඕන. මොකද මේ උත්තර ලබා දෙන්නේ නැතිව අපිට මේවා එළියේ කරන්න බැහැ. ඊට පස්සේ අපි ඒවා engage. වෙලා අපි මේවා හොයන්නම්, Study කරන්නම් කියලා. ඒ අනුව අපි ගොඩාක් focus කරා ඒවට පිළිතුරු හොයන්න. ඒ focus කිරීම තුළින් අපි දැක්කා 2009 වෙනකන් අර එකතු වෙලා තිබ්බ මිරිකිලා තිබ්බ සමාජය ඒක අපි ගත්තොත් නැගෙනහිර විශේෂයෙන්ම ඒ හැම සමාජයක්ම මුස්ලිම් වෙන්න පුළුවන් දෙමළ සමාජයක් වෙන්න පුළුවන් නිදහසක් තිබ්බේ නැහැ. එළියට බහින්න බැරි තත්ත්වයක් තිබ්බා. මේ විදියට මුහුණ වහගෙන යන්නේ නැහැනෙ ඒ දවස් වල. මුහුණ වහගෙන ගියොත් මුණ ගලවනවා. ඒ එක්කම එහෙම පල්ලියකටත් යන්න බැහැනේ. ගියොත් ඒ පල්ලියේ වෙඩි තියනවා. ඒ එක්කම ආගම නායකයෝ එන්නෙ නැහැනේ කවුරුත්. ආගම කියන්න. ඒක ලංකාවෙන් ගියෙ නැහැනේ. ඉතින් ඒක නිසා නමුත් එක පාරටම මේකේ දි අපි දැක්කා එක පාරටම මේක Open up වෙනවා. මේ open up එක වීම තුළින් තුළින් ඒ ප්‍රවේගය වැඩි වෙනවා. ඒ ප්‍රවේගය වැඩි වීම තුළින් තමයි අපි දැක්කේ අනිකුත් ආගම්වල යම්කිසි ප්‍රතිරෝධයක් මතු වෙන්න පටන් ගත්තා. ඒ සමාජයේ මතු වෙච්ච ප්‍රතිරෝධය අපි හොයන කොට තමයි අපි Identify කරා නැහැ මෙතැන ප්‍රශ්නයක් තියෙනවා කියන එක. ඉතින් අපි ගියා හලාල් එකේ ඇත්තෙන්ම සෑහෙන්න Studies අපි කරා. දැන් උදාහරණයක් වශයෙන් මම කියන්නේ දැන් අපි මෙතැන දි හලාල් කිව්වම හලාල් එක කවුද කරන්නේ. හලාල් එක කරන්නේ ජමෙයිතුල් උලමා සංවිධානයෙන්. ජමෙයිතුල් උලමා සංවිධානය ආගමික සංවිධානයක්. එතකොට අපි කිව්වා ඒ ගොල්ලෝ කිව්වා මේක ආගමික දෙයක් කියලා. එතකොට අපි කිව්වා හරි ආගමික දෙයක්. කොහොමද ඒකේ මුදල් එකතු කරන්නේ කියලා. ඊට පස්සේ ඒ ගොල්ලන් කිව්වා

FAIR COMMENT BY JEZEEM

මෙමෙයි අපි හැම කම්පැනි එකටම අපි යනවා. මේ ඔක්කොම අපි Export කරන්නේ. අපි මේකට යම්කිසි එක මුදලක් යොදමු කියලා. අපි කම්පැනිස් වලට ගියා අපි මැලිබන් factories වලට ගියා. එතකොට අපි දැක්කා කොච්චර මුදලක් එකතු කරනව ද කියලා. එතකොට අපිට ප්‍රශ්නයක් ආවා මේ මුදල් කොහේට ද යන්නෙ කියලා. ඇයි මේ ආගමික ස්ථාන වල මේ මුදල් ගන්නේ. අපි සමහර දැක්කා සමහර මුදල් කොහාට ද යන්නේ කියන එක අපි Identify වුණා. ලොකු ප්‍රශ්නයක් ආවා.

වේලාව:-6.20

මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.6.20
පෙර සටහන් ල/ලේ: සචිනි මෙනවිය.
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා

ප්‍ර: කොහාට ද යන්නේ?

පි: සමහර මද්‍රසා වලට ඉස්ලාම් ආගම වෙනුවෙන් මේ මුදල් යනවා. දැන් අපි සමාජයේ අනිකුත් ගත්තොත් අපි සාමාන්‍යයෙන් විශේෂයෙන් hypothetically ගත්තොත් මම ජාතිවාදයක් ගන්නවා නෙවෙයි. අපි කියමු දහම් පාසලට ගත්තොත් දහම් පාසලට කොයින් ද මුදල් එන්නේ මං හිතන්නේ බොහොම සුළු මුදල් ප්‍රමාණයක් තමයි වැය වෙන්නේ. නමුත් මේවා ඉතාමත් ක්‍රමානුකූලව මුදල් එක පැත්තකින් එනවා. ඉතින් එතකොට මෙතන දී ලොකු ප්‍රශ්නයක් තියලා තිබ්බා. ඒ එක්කම මේ 2009 නොතිබුණු හලාල් කරණයක් අපි දැක්කා 2009න් පස්සේ. අපි දැක්කා වතුර බෝතලේ මේකේ හලාල් කියලා ගහලා තියෙනවා. කොස්ස හලාල් කියලා ගහලා තියෙනවා. දැන් මේ මං හිතන්නේ ඉස්ලාම් ආගමෙත් කියලා නැහැ මේ හැම දේටම හලාල් කරණයක් කරන්න ඕනි කියලා. මස් මාළු වගේ දේවල් අපිට identify කරන්න පුළුවන්. එතකොට මෙතන දී මුළු සමාජයම හලාල් කරණයකට භාජනය වුණා. ඊට පස්සේ අපි මේකට ගේනවා John Keells privateලා companies, food city ගෙනල්ලා අපි ඇහුවා. ඇයි මේ හැම සුපර් මාකර්ට් එකේම මේක තියෙන්නේ ඒගොල්ලන් කිව්වා මෙහෙමයි අපිට පිටරට යන local market එකෙන් අපිට වෙනමම label එක ගහන්න බැහැ. මේ label එක අරන් දාන්නත් අවුරුදු 2ක් යනවා. මොකද අපි මේවා අවුරුදු 2,3කට අපි ගහලා තියෙන්නේ කියලා. ඒ ලොකු ගැටලුවක්. එතකොට අපි දැක්කා සමාජයේ බෞද්ධ සමාජයත් අපිට මේක තේරුම් ගන්න අමාරුයි අපහසුයි. මොකද ඒගොල්ලෝ සමහර විට හිතන්න පුළුවන් අපි බුදු හාමුදුරුවන්ට යම්කිසි දෙයක් දානයක් පිළිගන්න කොට මේ වතුර බෝතලයනම් මේක අරාබික් තියෙනවානම් හලාල් කියන්නේ මේක ඇවිල්ලා ලොකු ප්‍රශ්නයක් ඇති කරගත්තා. එතකොට මේ වගේ සමාජ ප්‍රශ්න එක පාරට මේවට පිළිතුරු දෙන්න බැහැ. එතකොට අපිට හොඳට කල්පනා කරා ඊට පස්සේ මේ බොදු බල සේනාව අපි ගෙනාවා. බොදු බල සේනා සිංහල රාවය සංවිධානය අපි ආරක්ෂක අමාත්‍යාංශයට ගෙනවා. ඒ එක්කම ගෙනවා අපි අනිත් පැත්තෙන් ජමෙයිතුල් උලමා සංවිධාන අපි ගෙනවා. එකම table මෙතන ඉඳන් අපි කතා කරන්න කිව්වා. දැන් පැහැදිලි කරා දැන් මේක නවත්වනවා 2013 මේක

Fair Comment by Jezeem

නවත්වනවා. ඒ ආදි වශයෙන් ලොකු මේකක් ගියා නමුත් ඒක යන්න පුළුවන්කම ලැබුණේ මේ engagement process එකත් එක්ක. නමුත් අද සමාජයේ ඒවා ගැන දකින්නේ නැහැ. ඒගොල්ලෝ දකින්නේ මෙතන ඇවිල්ලා එක්කෝ බොදු බල සේනාවකට කෑගහනවා ඒක තමයි extremism එක ඇති කරේ කියලා. අනිත් පැත්තෙන් කතා කරනවා මේක වෙනයි කියන එක. නමුත් අපිට තිබ්බ ප්‍රශ්නේ තමයි ඔය ඒ ප්‍රශ්නෙට එහා පැත්තට ගියපු ප්‍රශ්නයක් තිබ්බා. එතකොට අපි දැක්කා සමහර විට මේ සංවිධාන විශාල වශයෙන් ඔය කරා එකතු වෙනවා. ඒ කියන්නේ ස්වාමීන් වහන්සේලා එකතු වෙනවා. බෞද්ධ ජනතාව එකතු වෙනවා. සමහර කට්ටියක් මේක extremes කියලා හඳුන්වනවා. අනිත් පැත්තෙන් මුස්ලිම් සංවිධාන අපි දැක්කා එක එක දේශපාන නායකයෝ මේ තුළින් උඩට එනවා. ඉතින් මේක ගත්තාහම මේක ලොකු ව්‍යාකූල තත්ත්වයක් ඇති වුණේ. ඉතින් අපේ මේක තිබ්බේ මෙතන දී මේක හරහා තමයි ඇත්තටම අපිට හැකියාව ලැබුණේ මේ විශේෂයෙන්ම මේ පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කරන්න. ඒ තුළින් අපි Security council ඒකේ කතා කරාම මේ පිළිබඳව අපි අලුතින් දැන් පටන් ගන්න ඕනි. මොකද මේ ප්‍රශ්නේ තව දුරටත් යන්න පුළුවන් කියන එක. ඒ අනුව අපි අපිට යන්න ලැබුණා විදේශ රටවල් වලට. අපි ගියාම අපි දැක්කා කොහොමද ඒ රටවල් වල study කරන්නේ කියලා. අපිට වඩා steps 3,4ක්ම ඒගොල්ලෝ ඉස්සරාහ. ඊට පස්සේ ආවායින් පස්සේ විශේෂයෙන්ම DMI හැටියට මම ලංකාවට ආවාට පස්සේ මම වෙනමම උපදෙස් අනුව වෙනමම open sources media කියලා වෙනම එකක් ඇති කරා. වෙනම මේ ඇමරිකන් system එක අනුව සම්පූර්ණයෙන් monitor කරන system එකක් මේවා කරා. පිටරටින් වෙනම කට්ටිය ගෙනාවා. සිවිල් කට්ටියව අපි recruit කරා. අරාබි කතා කිරීමේ හැකියාව සහ ලිවීමේ හැකියාව තියෙන කට්ටියව අපි බඳවා ගැනීම් කරා. Computer knowledge එක ඒවා අපි ලබා දුන්නා. ඒ සම්පූර්ණයෙන්ම මේ පිළිබඳව ලොකු focus එකක් කරා. ඒ ඇවිල්ලා **2013** දී. ඒ **2013** කරගෙන ගියාට හැබැයි ලංකාවේ අපි රැඩිකල් එකක් දැක්කේ නැහැ. අපි අනිත් ඒවා engage කර කර හිටියා. ඒ එක්කම අපි දැක්කා ඒ හරහා විශේෂයෙන්ම දේශපාලනීකරණය වෙලා ලොකු ලොකු ප්‍රශ්න රාශියක්ම තිබ්බා. නමුත් ඒ ප්‍රශ්න රාශියත් එක්ක තමයි අපි මේ engagement අපි කරේ. ඉතින් සමහර අහන ප්‍රශ්න වලට අපි ළඟ පිළිතුරු තිබ්බෙත් නැහැ.

ප්‍ර: උදාහරණයක් වශයෙන්?

පි: උදාහරණයක් වශයෙන් දැන් ඇහුවොත් එහෙම දැන් මේ **2009**ට කළින් මුහුණ වහගෙන තිබ්බේ නැහැ. දැන් මේ මුහුණ වහගෙන එනවා.

දැන් ඔබතුමාලා ගන්න මොකක් ද මේකට ක්‍රියාමාර්ගය 2009ට කළින් කොස්සට හලාල් ගැහුවේ නැහැ. හැම වතුර බෝතලයට හලාල් ගැහුවේ නැහැ. ඔබතුමාලා ගන්න ක්‍රියාමාර්ගය.

ප්‍ර: ඒ කියන්නේ දැන් කාගෙන්ද?

පි: නැහැ සමාජයේ විවිධ කොටස්වල අපෙන් අහනවා. බුද්ධි අංශ වලින් මේ ගොල්ලන්ගේ engagement එක කරානේ. මේ පැත්තෙන් ඔය සියලු සංවිධාන engagement කරන කොට අනිත් පැත්තෙන් ඔය තවුහිද් ජමාත් කට්ටිය ජමෙයිතුල් උලමා කට්ටිය සියලු දෙනාම engage කරා. මේ සියලු දෙනාම එක table වලට ගෙනාවා. එතකොට අපි එතන දී මම identify කරා මට මතකයි මම එක අවස්ථාව දී ඒක මට කියන්න පුළුවන්. මම විශේෂයෙන්ම එක සංවිධානයක් එක්ක මම කතා කරා. ඊට පස්සේ කතා කරලා පැය 3ක් විතර ආරක්ෂක අමාත්‍යාංශයෙන් කතා කරලා මොකද මේ මට ඒ තියෙන ආගමික හා ඒ පසුබිම එක්ක මම කතා කරාහම රාජකීය විද්‍යාලයේ ඉගෙන ගත්ත පුද්ගලයෙක්. හොඳට කථිකත්වය ඉතාමත්ම දක්ෂ පුද්ගලයෙක්. ඒ කතා කරලා ඔක්කෝම කරලා මං හිතුවා Convince වුණා කියලා කතා කරලා identity card එක මාරු කරන්න යනකොට එයා ඇහුවා කතා කරලා දැන් ඔබට කවදාවත් ඉස්ලාම් ආගමේ සමාවක් දෙන්නේ නැහැ කියලා. ඉතින් මං ඇහුවා ඇයි සමාවක් දෙන්නේ නැත්තේ කියලා එතකොට මට කිව්වා ඔබතුමා විවාහ වෙලා තියෙන්නේ සිංහල කාන්තාවක් ඒක නිසා කවදාකවත් ඉස්ලාම් ආගමේ ඔබට සමාවක් දෙන්නේ නැහැ කියලා එහෙනම් මං ඇහුවා මොනවද මං කළ යුත්තේ කියලා. ඔබට ක්‍රම 3ක් තියෙනවා කරන්න. මං කාන්තාවක් දෙන්න ඔබ විවාහ වෙන්න කියලා කිව්වා. ඒකේ දී අදහස් කරේ කාන්තාව වෙළෙඳ භාණ්ඩයක්. ඒ කියන්නේ ආගමට තැන තියෙන කොච්චර ද කියන එක. දෙවැනි එක ඇවිල්ලා ඔබ තුමා convert කරන්න කියලා කිව්වා wifeව ඉස්ලාම් ආගමට. එහෙම නැත්තම් ඔබ divorce කරන්න කියලා කිව්වා. මං කිව්වා මම හා කියලා ආවා. එතකොට මම දැන ගත්තා එදා 2014 දී. අපි මෙච්චර convince කරා පැය ගාණක් කතා කරත් ඒ මනස වෙනස් කරන්න හම්බවෙන්නේ නැහැ. එහෙම element එකක් තමයි තිබ්බේ. නමුත් අපි එහෙම කරා කියලා අත ඇරියේ නැහැ. අපි පුළුවන් තරම් ඒවා engage කරගෙන ගියා. මේ සංවිධාන 2ම. දැන් අද කතා කරන්නේ අපි ඔක්කෝම කතා කරන්නේ මේ සංවිධාන එකක් දෙකක් ගැන විතරයි. අපි කියන්නේ across the system we engaged all these people. ඊට පස්සේ එතකොට ඒ අතරේ දී තමයි 2015 දී අපි දැක්කේ මූලික වශයෙන්ම 2015 දී මේක එහෙම්මම ආවා. ඊට පස්සේ රජය වෙනස් වීමක් ඇති වුණා. 2015 දී දැන් මේක

FAIR COMMENT BY JEZEEM

එනකොට 2015 අප්‍රේල් මාසේ දී අපිට තොරතුරක් ලැබුණා විදේශිය රටකින් යම්කිසි කොටියාශයක් ඉන්නවා කියලා නමුත් ඒක specific තොරතුරක් නැහැ. ඇත්තටම sentence දෙකයි කිව්වේ. ලංකාවේ කට්ටියක් මේ රටේ සිරියාවට ගිහිල්ලා තියෙනවා අපි කිව්වා හොයලා බලන්නම් පුළුවන්නම් අපිට තොරතුරු පොඩ්ඩක් දෙන්න. කොහේට ද ගිහිල්ලා තියෙන්නේ කින් ද මං ද ඊට පස්සේ

ප්‍ර: ඔබ දැන් මේ ප්‍රකාශ කර engagement. ඒ සියලු කාරණා කළේ DMI එක ද එහෙම නැත්නම් SIS එක ද එහෙම නැත්නම් කවුද මේ වැඩකටයුතු කළේ?

පි: ඇත්තටම මේක කරේ DMI එක කරේ. මම බුද්ධි අධ්‍යක්ෂ හැටියට මොකද හේතුව මම කියන්න ඕන මොක ද විශේෂයෙන්ම අපි හැම තිස්සේම කළේ proactive intelligence එකක් මම මුලින්ම මම ප්‍රකාශ කරා මොකද අපි ඇවිල්ලා මම දන්නේ නැහැ තැපැල් කන්තෝරුවක් වගේ බුද්ධි අංශයක් වෙන්න බැහැ අපිට. ඒ තොරතුරු ඇවිල්ලා මේ තොරතුරු දෙන එක නෙවෙයි අපේ රාජකාරිය විය යුත්තේ. අපි වෙන්න ඕනි ඒ තර්ජනය හඳුනා ගැනීම, ඒ තර්ජන හඳුනාගෙන ඒවා වැළැක්වීමට කටයුතු කිරීම තමයි අපෙන් විය යුතු රාජකාරිය. ඒ නිසා අපි මුල ඉඳන්ම හැදිලා තිබුණේ ඒ proactive strategy එකට. Proactive strategy එක තමයි මම කියපු විදිහට කලින් disengagement strategy එක අපි engagement strategy එකට ආවා. ඉතින් ඒකට මට ගොඩාක් උදව් වුණා Diplomatic Service එකේ military officer කෙනෙක් හැටියට ඒ knowledge එකයි පිටරට ගිය knowledge එකයි ඒ එක්කම ඒ නායකත්වය ඒ තුලින් දක්වපු environment එක අපිට ගොඩාක් උදව් උපකාර වුණා මේ තත්ත්වය ඇති කරන්න. මං විසින් තනි පුද්ගලයෙක් ඇති කරපු එකක් නෙවෙයි. මට උඩ පුද්ගලයෝ හිටියා. ඒ එක්කම මගෙත් එක්ක පල්ලහා වැඩ කරපු නිලධාරින් හිටියා ඒ නිලධාරින් groom වුණා. ඉතින් ඒ විදිහට අපි ඉතාමත්ම එක unit එකක් හැටියට තමයි. අපිට ගොඩාක් නිදහස දීලා තිබ්බා.

ප්‍ර: ඔබ කියා සිටියා 2015 ජනවාරි මාසේ ලංකාවෙන් සිරියාවේ ISIS සංවිධානයට බැඳිලා කටයුතු කරන්න පුද්ගලයෝ 37 දෙනෙක් ගිය බව?

පි: ඔව්.

ප්‍ර: හැබැයි ඒ සම්බන්ධයෙන් තොරතුරු මුලින්ම ඔබට ලැබෙන්නේ ?

පි: 2015 මාර්තු අප්‍රේල් වගේ.

ප්‍ර: මාර්තු අප්‍රේල් මාසේ.

පි: ඔව්.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: එම තොරතුර ලැබුණාට පසුව අධ්‍යක්ෂක යුධ හමුදා බුද්ධි වශයෙන් ඔබ ඒ ගියපු පුද්ගලයන් කවුද, ඔවුන් කොයි ආකාරයෙන් ද ගියේ, ඔවුන්ට එම මොන airline එකේ ද ගියේ ඔය කරුණු කාරණා ඔබට සොයා ගන්න ලැබුණු බව කියා සිටියා. මෙම බුද්ධි තොරතුරු සොයා ගැනීම් සමඟ ඔබ නැවත සොයා බැලුවාද ලංකාවට ඒ වන විට ඒ කියන්නේ **2015** මැද භාගය වන විට ලංකාවේ ආරක්ෂාවට මොන වගේ තර්ජනයන් තියෙනව ද කියලා?

පි: ඔව්. විශේෂයෙන්ම මම කිව්වා අපි ලංකාවට තියෙන ආරක්ෂක තර්ජන අපි හඳුන ගත්තේ **2012** දී. ඒ කියන්නේ අපේ රටේ කිසිම දෙයක් තිබ්බේ නැතත් Middle East වල තියෙන development සහ Regional අනිත් Countries වල සිදු වීම් ගත්තාහම it's a matter of time මේ ලංකාවට එන එක. ඒ අනුව තමයි අපි කුමක් හරි අවුරුදු **5**කට plan කරන්නේ කියලා ඒ හැම අවුරුද්දේම review වෙනවානේ. අපි strategy එක හැම තිස්සේම **2012** දී අපි work out කරේ **2017** වෙනකම් තමා අපි work out කරේ. එතකොට විශේෂයෙන්ම අපි ඔය තත්ත්වය අපි ලංකාව වෙනකන් ඇවිල්ලා Social media trails ඇඳගෙන කරන්න, training අරගෙන කරන්න හිටියොත් මේ කරන එකක් අපි වැරදියි. ඒ නිසා අපි **2013** වෙනකොට අපි මේ සියලු පුහුණු වීම් කටයුතු, ඇරැබික් කරන කටයුතු, ට්‍රේනින් කටයුතු, අනිත් රටවල කොහොම ද අපි තොරතුරු රැස් කරන කටයුතු ඒ සියලු දෙයකින්ම අපි full fed වෙලා හිටියේ. හැබැයි කිසිම radicalization එකක් අර එහා පැත්තට ගිය radicalization එකක් අපි දැක්කේ නැහැ. ඒ කියන්නේ ඇවිල්ලා violent radicalization එකක් අපි දැක්කේ නැහැ. එතකොට අපි මුලින්ම radicalization එකක් අපි ආරම්භ වෙන්නේ අර තොරතුරත් එක්කම ඒ තොරතුර ඒ රටට immediately අපි දැනුම් දෙනවා අපිට මේක යම්කිසි තොරතුරක් අපට ලබා දෙන්න කියලා. ඒ එක්කම අපි පුළුවන් තරම් අපි හොයා ගන්න උත්සාහ ගත්තා. අපේ තියෙන තොරතුරු හෝ ගම්වලට ගිහිල්ලා අපිට හැකියාවක් තියෙනවා ද කියලා detect කර ගන්න. ඒ එක්කම social media එකෙන් අපි ගත්තා link එකක් තියෙනවා ද කියලා. අද වෙනකන් මම කියනවා සිරියාවයි JMI එකයි සම්බන්ධයක් නැහැනේ. එහෙම සම්බන්ධයක් නැහැ. ඉතින් එතකොට JMI ගියා කියලා මේ ලංකාවේ sorry සිරියාවට ගිය group එක JMI එකට සම්බන්ධයක් නැත්තම් අපිට connectivity එකක් හම්බවෙන්නේ නැහැනේ. නමුත් අපිට මේ නිලාම් මැරිච්ච ගමන්ම අපි දැක්කා social media එකේ යම් යම් post එනවා. මං අර කියපු පිරමිඩ් එකේ. ඒගොල්ලෝ වෙලා ටිකක් extreme line එකට යනවා. එතකොට අපි දැක්කා යම්කිසි recruitment effort එකක්

FAIR COMMENT BY JEZEEM

වෙනවා. ඒ කියන්නේ චුට්ටක් එතන දී අපි පොඩ්ඩක් පස්සට පස්සට යනකොට අපි දැක්කා නිකන් එකතු කිරීමක් කරන්න උත්සාහ ගන්නවා වාගේ. ඒ උත්සාහ ගත්තේ ඇවිල්ලා JMI කියන සංවිධානය. එතකොට JMI කියන සංවිධානය ඇවිල්ලා මේ group එකේ group එකක් හැටියට නැහැ. මේ open ඒ කියන්නේ මේ extreme line අනුව පොඩි පොඩි කණ්ඩායම් ඇතුලේ අපි ඔක්කෝම monitor කරා ඒ ඔක්කෝම ගත්තාහම තමයි 140ක කණ්ඩායමක් අපි තරුණයෝ දැක්කේ.

ප්‍ර: මොකට ද ඒගොල්ලෝ එකතු කළේ?

පි: ඒගොල්ලෝ ගත්තේ life minded මොක ද අරයා මැරිච්ච ගමන්ම යම් ප්‍රකාශයන් කරා. මුස්ලිම් social media groups වලින් මේක ඇවිල්ලා නිකන් නිරපරාදේ සමහර අය කිව්වා මේක ඇවිල්ලා අපේ රටේ මැරිච්ච මිනිහෙක් තව කට්ටියක් කතා කරා මේ වෙනුවෙන් අපි පළිගන්න ඕනි මේ වෙනුවෙන් අපි contribute කරන්න ඕනි. ඉතින් අපි ළඟ system එකක් තියෙනවා. මම මේ කෙටියෙන් කියන්නේ මේ radicalization එක identify කර ගන්න methodology එකක් තියෙනවා. එතකොට අපි අලුතින් නිෂ්පාදනය කරපු දේවල් නෙවේ. ලෝකේ මේවා හදලා තියෙන්නේ. ඒ අපිට තියෙනවා IT tool කියලා තියෙනවා. මොක ද මගේ මනසයි operatorගේ මනසයි වෙනස්. එතකොට information tool කියලා තියෙනවා ඒවා ගොඩාක් වටින equipment ඒ තොරතුර දැම්මහාම අපිට automatically ඒ දත්ත ටික අපිට එනවා. අපිට අවශ්‍ය විදිහට. ඒ විදිහට ඒ අනුව අපි identify කරා මේ පොඩි group එකක් 15ක විතර group මෙතන යම්කිසි ක්‍රියාකාරීත්වයකට නිරත වෙනවා. ඒ ක්‍රියාකාරීත්වය නිරත වෙන කණ්ඩායමට අපිට හැකියාව ලැබුණා කිහිප දෙනෙක් social media එකෙන් ඇතුළු කරලා අපිට හැකියාව ලැබුණා මේ කට්ටියත් එක්ක රිංගවලා ඒ like minded group එකට යන්න. එතකොට ඒක හරහා අපි දැක්කා social media group එකෙන් එළියට ගිහිල්ලා සමහර අයත් එක්ක individually connect කරගෙන පොඩි සාකච්ඡාවක් කියන්න කටයුතු යොදනවා. ඒ පළවෙනි සාකච්ඡාවට අපිට යන්න බැරිවුණත් දෙවැනි සාකච්ඡාවට අපිට හැකියාව ලැබුණා පුද්ගලයෙක්ව මේක ඇතුළට infiltrate කරලා දාන්න. එතකොට මේක දැමීමේ දීත් ලොකු වැදගත්කමක් අපිට ආවා. මෙතන දී මට මං කියන්න ලේසියි වචන දෙකකින් දැමීම කියන එක. දැන් මෙතන දී බලන්න ඕනි ඒ mind set එකේ ඉන්න ඕනි. ඒ වගේ යම්කිසි අදහසක් මේවා කරන්න ඕනි. එහෙම නැතුව දෙමළ කතා කරන්න පුළුවන් විදිහට, ආගමට පස් වේලා හෝ සිකුරාදා ආගම ගිය පලියට, මද්‍රසාස් එකට ගිය පළියට මේ සංවිධානයට එහෙම රිංගන්න බැහැ. මොකද ඒ mind එක වෙනස්. අපිට

FAIR COMMENT BY JEZEEM

ලොකු Process එකක් identify කරන්න වුණා මේ පුද්ගලයෙක්. Identify කර ගන්න. ඉතින් identify කරන ඒ Process එක අනුව social media එකේ ඒ රහපෑව ඒ involve වෙච්ච කෙනා නෙවෙයි අපි infiltration එක කරේ ඒ පුද්ගලයාම තමයි ඒ පුද්ගලයා නෙවෙයි වෙන පුද්ගලයෙක් තමයි මේක අපි ඇතුළට දැම්මේ. එතන දී අපිට ගැටලු සහගත තත්ත්වයක් ඇති වුණා මං practically ඒක උදාහරණයක් වශයෙන් කියන්නේ අපිටත් ඇතුළට ගියාට පස්සේ අපිටත් දන්නේත් නැහැ මොකද වෙයි කියලා. හදිස්සියෙන් මම අද ඒ පුද්ගලයා අරන් ගිහිල්ලා ඒ පුද්ගලයාත් පස්සේ අද ගිහිල්ලා තිබ්බානම් suicide එකට මට අද ප්‍රශ්න කරන්නේ වෙන ආකාරයකට. ඔබලා තමයි recruit කරලා තියෙන්නේ, ඔබලාගේ එක්කෙනා තමයි Suicide කරලා තියෙන්නේ. එක්කෝ double agent කියයි. අපි මේ පිළිබඳව ඉතාමත්ම මේ field එකේම ඉඳලා අපි දන්නවා විශේෂයෙන්ම කොහොමද මේ infiltration එකක් කරන්න ඕනි. ඒකයි මම කිව්වේ ජීවිත කාලයම මං infiltrations කරලා තියෙන්නේ 4යි. එතකොට මෙතන දී අපි ඒ පුද්ගලයා අපි දානකොට අපිට තියෙනවා ගොඩක් technical equipment bugging equipment තියෙනවා. ඒ bugging equipment එකක් තමයි අපි දාන්නේ. ඒ දැම්මාහම ඒ පුද්ගලයා එතන ගිහිල්ලා සාකච්ඡා කරත් මට එහා පැත්තේ වාහනයේ ඉඳන් මට අහගෙන ඉන්න පුළුවන් ඒ සාකච්ඡාවේ වෙන සියලු දේවල් ටික. ඒ ළඟ distance එකේ ඉඳන් මම අහගෙන ඉන්න පුළුවන්. අපි එතකොට මේක 8ට පුද්ගලයා meeting එක පටන් ගත්තොත් 9 වෙනකන් සම්පූර්ණයෙන් එයා මෙතනින් එළියට එනකන්ම අපි ඒක තියෙනවා. ඉතින් පුද්ගලයා දැනගෙන තමයි ඒක ඇතුළට දාගෙන යන්නේ. ඊට පස්සේත් අපිට හැකියාව තිබෙනවා මේ පුද්ගලයාව කොහේද කොහේද යන්නේ කියලා monitor කිරීමේ හැකියාවක් තියෙනවා. ඒ වගේ අපි ගොඩාක් Counter measures ගත්තා මේ ඒ අනුව අපි develop කරගෙන ආවා අපිට identify කර ගන්න ඕන කරලා තිබ්බා කොතන ද මේ ගොල්ලන් යන්නේ මොකක් ද network එක කියලා identify කර ගන්න. ඒක එහෙම යනකොට අපි දැනගත්තා මේ යන වේගෙත් එක්ක අපි ටිකක් පරක්කු වෙන්න පුළුවන්. දැන් අපි මේක මේගොල්ලෝ රැඩිකල් එකට ගියොත් අපිට අත්අඩංගුවට ගන්න පුළුවන් ද? රැඩිකල් එකටම ගියොත් එතකොට මේකේ දී අපි දැක්කා නිලාම්ලාගේ එක ප්‍රතික්ෂේප කරනවා. බැහැ අපිට Suicide කරගන්න බැහැ. හැබැයි අපි දන්නේ නැහැ මේ Suicide කරගන්න දැන් නැහැ කිව්වාට ඊළඟ දවසේ යන්න එයාට ඉඩකඩ බොහොම තියෙනවා. එතකොට ඒ Process එක අපි identify කරගෙන යන ගමන් අපි රජයට

FAIR COMMENT BY JEZEEM

පැහැදිලිව මේ පළවෙනි presentation එක කරේ 2015 දී. මුලින් මම කළේ සම්පූර්ණයෙන්ම සිරියාවට ගිය network එක. ඒ අතරේ අපිට හැකියාව ලැබුණා අපේ බුද්ධි අංශයට සිරියාවේ network එකට infiltrate කරන්න. අපිට හැකියාව ලැබුණා ඔය නිලාම් කියන පුද්ගලයාත් එක්ක වක්‍රකාරව සම්බන්ධ වීමක් ඇතිවෙන්න. පස්සේ ඒක direct සම්බන්ධ වීමක් අපි ඇති කරා. මේ ඔක්කෝම බුද්ධි අංශ ගොඩාක් covert operations මේවා සාමාන්‍ය පුද්ගලයෙක් ගියාහම ඒගෝල්ලෝ මේක analyze කරන්නේ නැහැ. ඇයි අපි එහෙම කරන්නේ. අපි දැන ගන්න ඕනි exactly කවුද මෙතන ඉන්නේ? අපි exactly දැන ගන්න ඕනි කොහෙන්ද මේගොල්ලෝ ගියේ අපි exactly දැන ගන්න ඕනි මේ network එකේ තව කවුද ඇතුලේ ඉන්නේ. මේ ගොල්ලන්ට මුදල් දෙනවද මේගොල්ලන්ගේ moral එක කොහොම ද මේගොල්ලන්ගේ fighting spirit එක මොකක් ද කී දෙනෙක් මැරිලා තියෙනවා ද අම්මලා මොනවද කරන්නේ ළමයි මොනවද කරන්නේ? මෙය ඉතාමත්ම වටිනාම intelligence මේවා ලෝකේ අනිත් රටවල් වලට ලබා ගන්න බැරිවෙච්ච intelligence තමයි අපි මේවා develop කරලා තුළින් අපි මේ තුළින් අනිත් රටවල් එක්ක බෙදාගෙන ලොකු contribution එකක් කරා මේ systems කඩන්න. ඒ වගේම live operations කරන්න. ඒ එක්කම අපි දැන ගත්තා මේගොල්ලන්ව මේ පාලනය කරන්නනම් අපිට control එකක් තියෙනවා. අපි මේගොල්ලන්ගේ Family members ලා අපි link කර ගත්තා. ඒ Family membersලාට අපි විවිධාකාරයෙන් control එකක් ගත්තා. මේ තුළින් හැම තිස්සේම ඒ distance එක maintain කරා ඒක ඇවිල්ලා වෙනමම බුද්ධි ක්‍රියාන්විත. එතන දී අපි නොකියා අපි කිව්වේ උඹලා දැඟලුවොත් මේ දේ සිද්ධ වෙනවා කියන එක. ඒවගේම තමයි ඒ පැත්තත් එහෙමයි. ඉතින් අපි ඒ විදිහට යම් යම් විවිධ ක්‍රම අනුගමනය කරලා මේක කර ගත්තා. හැබැයි මේ දෙකම කරාම මං අර කිව්ව රටවල් 3 දී අපි ලංකාව හිටියේ neutralනේ. අපි දැක්කා හැබැයි ලංකාව neutral හිටියට ලංකාවේ recruitment Process එකක් යනවා. ඒ එක්කම අපි දැක්කා ලංකාවේ recruitment Process යනකොටම ලංකාවේ විවාහක කාන්තාවෝ එකතු වෙලා යම් යම් ඉරිදා පොළවල් වගේ මුස්ලිම් පොළවල් වලට ගිහිල්ලා යම් යම් භාණ්ඩ විකුණනවා. අපි බැලුවා මොකක් ද මේ කරන්නේ එක එක සංවිධාන NGO පිහිටවගෙන. මේක ඇවිල්ලා සිරියාවේ ඉන්න ළමයි මැරෙනවාට මේ මුදල් අරින්නේ. ඇත්තටම එකතුවක් එතන මුදල් එකතුවක් වෙන්නේ නැහැ. අඩුම ගානේ ටිකට් භාගයක්වත් සල්ලි ගන්න හම්බ වෙන්නේ නැහැ මේ මුදල් වලට.

FAIR COMMENT BY JEZEEM

අපි බැලුවා මොකක් ද මෙතන දී කරන්නේ ඒ like minded group එක මම කියපු caliphate එකට අවශ්‍ය කරන consolidation එක ඒක පුළුල් කිරීමක් තමයි මෙතන කරේ. එතකොට අපිට හැකියාව ලැබුණා කාන්තා පාර්ශවයකුත් මේක ඇතුළට හෙමින් දාගෙන මේක කරනවා. දැන් මේ 2ක develop වෙන ගමන් අපිට රජයට විශේෂයෙන්ම මේක කොහාට ද යන්නේ කියන එක ඉතාමත්ම පැහැදිලි චිත්‍රයක් අපි ලබා දුන්නා. අපි ලබා දුන්නා මුලින්ම මම කරපු presentation එක 2015 දී 37 දෙනාගේම පින්තූරු පවුල් කීයකට අයිති ද මේ ගොල්ලෝ ගියේ මොන Airline එකේද මොන රටින් ද වීසා ගත්තේ one way ටිකට් ද two way ටිකට් ද මොකක් ද cross කරපු boundary එක. ඇතුළට ගිහිල්ලා මොකද කරේ. ඊට පස්සේ එළියට එනකොට මොන පැත්තෙන් ද ආවේ එතකොට කවුද මේ fighting groups වල ඉන්නේ. කවුද මේගොල්ලන්ට වෙන රටවල් වල උදව් කරේ කවුද අනිත් fightersලා ඉන්නේ කවුද කී දෙනෙක් මැරිලා තියෙනව ද මොනව ද ඔයගොල්ලන්ට encounter කරපු challenge එක අති විශාල තොරතුරු රාශියක් ගත්තා පිටු

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: ඔවුන් ආපසු ලංකාවට ආවා ද කියලාත් බැලුව ද?

පි: නැහැ ඒක තමා ස්වාමීනි මම ඉන්න කාලේ දී මම එක පුද්ගලයෙක්ව මම ගෙන්න ගත්තා. ඒක මට උසාවියේ මට ප්‍රකාශ කරත් මට බුද්ධි පැත්තට යන්න බැහැ. ඒ කියන්නේ ඉතාමත් වයසක පුද්ගලයෙක් අවුරුදු 78ක පුද්ගලයෙක්. ඒ පුද්ගලයාව අරගෙන තමයි මම මේ information ටික සම්පූර්ණයෙන්ම develop කරේ. නැත්නම් අපිට අරයා කියන එකයි මෙයා කියන එකයි ඒ වෙන්න බැහැ. අපි ඇත්තටම දැන ගන්න ඕනි මේක. ඊට පස්සේ අපි ඒක ඉගෙන ගත්තාට පස්සේ තමයි ඒක bargaining chip එකක් හැටියට භාවිතා කරේ. හැබැයි අපි දැනගෙන හිටියා මේක අපි හිතුවාට වැඩිය මේක ටිකක් භායනක තත්ත්වයකට යන මේකක්. අපි මේ presentations මම ඉදිරිපත් කරා Security Council එකට. මෙන්න මේකයි තත්ත්වේ මෙන්න මේ වගේ සංවිධාන තියෙනවා. මෙන්න මේ පුද්ගලයෝ අපි හඳුනගෙන තියෙනවා. මේකට අපි අනිවාර්යෙන්ම ක්‍රියාමාර්ගයක් ගත යුතුයි මොකද දැනට තිබෙන නීති පද්ධතිය අනුව ක්‍රියාමාර්ගයක් ගන්න බැහැ. මොකද හේතුව අපි study කරා. අපි මේවා අපි විසින්ම කරපු දේවල් නෙවේ අපි ඉගෙන දේවල්. අපි රටවල් එක්ක කතා කර ගත්තා. ඒ රටවල් වල කොහොම ද කරන්නේ මේ රටවල් ඒ Level එකට අපි ඇවිල්ලා නැහැ. නමුත් එහෙමනම් අපිට කිව්වා මේ මේ ගන්න කියන එක. ඒක ප්‍රධාන වශයෙන්

FAIR COMMENT BY JEZEEM

ලොකු document එකක්, ලොකු research එකක් අපි කරා. ඒකේ දී අපි කිව්වා අපි දැනගත්තා මේ රජයට එවකට තිබ්බ රජයට මේ තොරතුරු දීලා හරියන්නෙත් නැහැ මේ තොරතුරු ඔක්කෝම අහනවා.

<u>ගරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබ කියන්නේ **2015** කරපු presentation එක කොයි කාලේ ද කෙරුවේ කොතන ද කෙරුවේ කවුද හිටියේ?

පි: මේ **2015** දී මේ presentation කරේ **2015** අග භාගයේ දී ඒක කරේ Security Council එකේ තමයි මේ presentation කරේ.

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: **2015** දෙසැම්බර් වල?

පි: දෙසැම්බර් වල.

<u>ගරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: කවුද හිටියේ රැස්වීමේ ?

පි: ඒකේ දී සියලුම දෙනා ඒකේ නිත්‍ය සාමාජිකයෝ සියලු දෙනාම ඒකේ හිටියා. නිලන්ත ජයවර්ධන ඇතුළුව.

ප්‍ර: ජනාධිපතිවරයා හිටියද?

පි: හිටියා. ජනාධිපතිතුමා අනිවාර්යයෙන්ම ඉන්න ඕනි.

ප්‍ර: අග්‍රාමාත්‍යවරයා හිටිය ද?

පි: අගමැතිතුමා හිටියා.

ප්‍ර: ආරක්ෂක ලේකම් හිටියද?

පි: ආරක්ෂක ලේකම් හිටියා.

ප්‍ර: එවකට ආරක්ෂක ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි ද?

පි: එවකට හිටියේ ආරක්ෂක ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි මහතා.

<u>ගරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: **2015** දී ද?

පි: **2015** අන්තිමට.

ප්‍ර: බස්නායක ?

පි: ඊට කළින් මට මතක හැටියට මං presentation එක සැරයක් විතරක් නෙවෙයි ස්වාමිනි. මම මේ presentation එක මොකද ඒ development එක අනුව **3**න් **4** වතාවක්ම මම කරා.

<u>ගරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: මම අහන්නේ ඉස්සෙල්ලාම කරපු presentation එක?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි: ඉස්සෙල්ලාම කරපු presentation එකේ දී ඒ 2015 හිටපු ආරක්ෂක ලේකම් තුමා හිටියා මට මතකයක් නැහැ.

ප්‍ර: වෙන කවුද?

පි: Army Commander, Navy Commander, Air Force Commander.

ප්‍ර: නියෝජ්‍ය ආරක්ෂක ඇමති හිටියද?

පි: නියෝජ්‍ය ආරක්ෂක ඇමතිත් හිටියා.

ප්‍ර: කවුද?

පි: රුවන් විජේවර්ධන ඇමතිතුමා.

ප්‍ර: පොලිස්පති හිටිය ද?

පි: අනිවාර්යයෙන් 1/3 එකට පොලිස්පති අනිවාර්යයෙන් හිටියා. මට එදා හිටියා ද කියලා මතකයක් නැහැ.

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: presentation එකට පස්සේ ගත්ත තීරණය මොකක් ද?

පි: අපි විශේෂයෙන්ම presentation කරනවා. presentation කරාට මෙතනින් එහාට යාමක් සිදු වෙන්නේ නැහැ. ඒ කියන්නේ එතන දී තොරතුරක් කළ යුත්තේ කියන එක අපිට උපදෙසක් ලැබෙන්නේ නැහැ. හැබැයි ඒ එක්කම අපි

<u>ගරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබ ඒ presentation එක කෙරුවාට පස්සේ ඒ ඔබ කරපු presentation එක ඒ ආරක්ෂක මණ්ඩලය විසින් Seriously ගත්තා ද නැත්තම් ඒකෙන් තවත් report එකක් වගේ විතරක් ද දැක්කේ වෙනත් ඉදිරි කටයුතු සඳහා ඔබට උපදෙස් ලැබුණා ද ඒ මොකක් ද?

පි: මම බුද්ධි නිලධාරියෙක් හැටියට ලොකු වෙනසක් දැක්කා 2015 දී මේ presentation එක කරොත් එහෙම ඒකට response එකයි 2015න් පස්සේ ඒ තියෙන ආරක්ෂක මණ්ඩලය කරන response එකයි මම ලොකු වෙනසක් දැක්කා. එතන දී එහෙම ආරක්ෂක මණ්ඩලය මේකට කොහොමද react කරන්න ඕනි කියන එකට හරි උපදෙසක් ලබා දුන්නේ නැහැ.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: ඔබ 2015ට පෙර සහ 2015ට?

පි: 2015 දී අපේ යම්කිසි චූටි development එකක් වුණත් දැන් උදාහරණයක් වශයෙන් කිව්වොත් ස්වාමිනි යාපනයේ දී මිනිහෙක් මට මතකයි එක සිංහල පුද්ගලයෙක්ව.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: **2015** දී ද?

පි: **2015**ට කළින්. සිංහල පුද්ගලයෙක්ව මොකක් හරි වැඩ කරන්න ගිහිල්ලා මරණයට පත් වෙනවා. හැබැයි අපිට මේක ඉවර වෙනකන් අපිට නිදිය ගන්න දුන්නේ නැහැ අපිට. මේ පුද්ගලයාව මරන්නේ කවුද ඔක්කෝම එළවන්නම අපි කරා. ඒ එක්කම මට තව මතකයි ගොපිඅප්පන් කියන case එක ඇවිල්ලා එතන දී LTTE ත්‍රස්තවාදීන් මුල් වතාවට වෙඩි තියලා **2014** දී වෙඩි තියලා පොලිස් රාළහාමි කෙනෙකුට එළියට පැන්නා. එතකොට මම හිටියේ විදේශ රටක. Immediately ගෙන්නුවා. ගෙනල්ලා මම ගුවන් තොටුපලේ ඉඳන් කෙළින්ම යන්න කිව්වා දැන් ඔක්කෝම හොඳයි තමයි කිව්වේ. නමුත් මට පෙන්නේ නැහැ කිසිම හොඳකමක්. මේක ඉවර කරලා කතා කරන්න කිව්වා. මට අවශ්‍ය නැහැ කිව්වා මොකක්ද වුණේ කියන එක දැනගන්න. එතනින් අපි යුධ හමුදාපතිතුමත් එක්ක දයා රත්නායක සර් එක්ක අපි ගියා කෙළින්ම වව්නියාවට. දවස් **42**ක් හිටියා. දවස් **42**ක් ඉඳලා සියලුම identify කරලා මේවා කරලා අවසානයේ දී ඒ **3**න් දෙනාම මරණයට පත්වුණා. මට මතකයි තාම **2012** දී අප්‍රේල් **12**.

<u>ගරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: **2012** ද?

පි: **2013** හරි **2014** හරි අප්‍රේල් **12** එදා තමයි මගේ wifeගේ උපන් දිනය. ඉතින් මට ඒක අමතක වෙන්නේ නැහැ කවදාකවත්. ඉතින් මම එතන දී දැක්කා මරණ **3**. මම ඒ එක්කම ඒක වගකීමෙන් දැක්කා ඒ තුන්දෙනා අද එළියට පැනලා ගිහිල්ලා තිබ්බානම් එක්කනෙක් ඇවිල්ලා pilot කෙනෙක් LTTE එකේ හිටපු. ඉතින් ඒ තුන්දෙනා අද පැනලා ගිහිල්ලා තිබ්බනාම් අපිට වෙන්න පුළුවන් threat එක අතිවිශාලයි. නමුත් අද මැරුණ නිසා අද අපි ඒ ගැන කතා කරන්නේ නැහැ. ඉතින් මම කියන්නේ ඒක තනි පුද්ගලයෙක්ගේ හෝ මෙතන පුද්ගලයින් ක්‍රියාකාරීත්වයක් නෙවේ. ඒ නායකත්වය තියෙනවා මේකට. ඒකට අපිට විශේෂයෙන්ම telephone හැකියාවක් තිබ්බේ නැහැ මට මතකයි තොරතුරු ත්‍රස්තවාදියා කතා කරෙත් නැහැ. ඔක්කෝම service providersලාට කිව්වා ඒගොල්ලන්ගේ වාහන ටික ඔක්කෝම ටික අරින්න කියලා. Royal Thomian මැච් එකක් තිබ්බේ. එතන දී එක service Provider කෙනෙක් කිව්වා මැච් එකට අපි දාලා තියෙනවා. ඒක හරියන්නේ නැහැ අරින්න කිව්වා කරුණාකරලා එතෙන්ට. පැය **48**ක් ඇතුළත එතෙන්ට ආවා. ඒ වගේ දවස් **41** එතන හිටියා. දවස් **41**

FAIR COMMENT — BY JEZEEM

පස්සේ තමයි අපි නැවත වරක් කොළඹට ආවේ. ඉතින් ඒ තියෙන දැක්ම සහ මෙතන තියෙන දැක්ම හරියට අහසයි පොළවයි වගේ, අපි ඒකට වරදක් කියන්නේ නැහැ ස්වාමීනි. ඉතින් මම බුද්ධි නිලධාරියෙක් හැටියට මම දැකපු දේ තමයි මගේ පෞද්ගලික අත්දැකීම තමයි මම ප්‍රකාශ කරේ. ඉතින් එතන දී මේකේ විතරක් නෙවෙයි. මේ බුද්ධි නිලධාරියෙක් හැටියට එහෙම තොරතුරු දීලා අපිට තොරතුරු එහෙම එන්න බැහැ. අපි දකිනවා මේක යනවා කියන එක. ඊට පස්සේ මම 2016 ඔක්තෝබර් 27 වෙනිදා හැම දෙයක්ම සම්පූර්ණයෙන් research එකක් දැම්මා. මං ඒ පොත ඉදිරිපත් කරා. ඒ අතරේ විටින් විට මේ presentation කරා. අපි පළවෙනි දෙසැම්බර් වලින් පටන් ගත්ත 2015 දී මොකද මම කිව්වානේ threat එක කරන්නේ කොටස් 4කටනේ extremism යටතේ මේ හැම development එකක්ම අපි ප්‍රකාශ කරා. අපි මේවා කිව්වා. ඒ කියන්නේ මෙහෙම වෙනවා විශේෂයෙන් මට මතකයි අපි පුද්ගලයෙක් ගේනවා කියන එකටත් මම කිව්වා මම එක්කෙනෙක් මෙහෙම ඒකටත් ප්‍රතිරෝධ ආවා. නමුත් බුද්ධි නිලධාරියෙක් හැටියට මම risk එකක් අරගෙන මම ගෙනවා ඒ පුද්ගලයාව. මොකද මම දැක්කා ඒක මගෙන් විය යුතු රාජකාරියක් හැටියට. හැබැයි ඒක එහෙම දිගින් දිගට ගියාට පස්සේ අවසානයේ දී මේක action එකක් ගන්න බැරි වෙනකොට තව දුරටත් මේක ගියොත් ලොකු ප්‍රශ්නයක් වෙයි කියලා අපි ඉස්සෙල්ලාම මේක සම්පූර්ණයෙන්ම ලොකු study එකක් කරලා තව පොතක් හැටියට මේක හැදුවා. ඒ පොතේ දී identify කරා මොකක් ද මුස්ලිම් අන්තවාදය කියන්නේ ලංකාවේ අන්තවාදය කොහොමද ඇති වෙලා තියෙන්නේ, ලංකාවේ groups කීයක් තියෙනවාද, JMI එක කියන්නේ කවුද ඒ එක්කම අපි අනිත් පැත්තෙන් රජය විසින් ගතයුතු ක්‍රියාමාර්ග serial number එතකොට මං අර කියපු මූණ වහන ඒවා ඒ සියලු දෙනාම ඒ ටික දැම්මා. ඊට පස්සේ අපි දැම්මා ඒ line ministries. Religion Ministry එකෙන් ගන්න ඕනි. මේ ඔක්කෝම කරා. අපි අවසානයේ දී අපි කිව්වා විශේෂයෙන්ම Task Force එකක් දාන්න ඕනි. මේක මේවා කරන්න. නීතිමය ගැටලු තියෙනවා මේ තියෙන Extremism අල්ලන්න බැහැ. නීතිය පිළිබඳ නැවත වරක් මේවා කරන්න ඕනි. ඉතාමත්ම Strategically හැම දෙයක්ම black and white මේ පොත හදලා අපි දුන්නා මොක ද හේතුව ඒක ඇවිල්ලා අපි පෙන්වන්න නෙවෙයි අපි මේක කරේ මොකද මේක කරේ නැත්තම් අපිට ලොකු ප්‍රශ්නයක්. හැබැයි මේක කරලා අපි නතර වුණේ නැහැ ස්වාමීනි.

දැන් වේලාව: ප.ව.6.50

මෙතැන් සිට ල/ලේ: මුතුමාලි මෙනවිය.

FAIR COMMENT BY JEZEEM

වේලාව :- ප.ව.06.50 යි.
පෙර සටහන් ල/ලේ :- නිල්මිණි මෙය
මෙතැන් සිට ල/ලේ :- මුතුමාලි

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා

ප්‍ර : හරි ඔබ එම මෙම ඔබ දැන් කියා සිටි වාර්තාව ඔබ ඉදිරිපත් කළේ ආරක්ෂක council යටද ? නැත්නම්

පි : මේකේ කරුණු ආරක්ෂක council ට ඉදිරිපත් කරලා මේ පොත මම යුධ හමුදාපති එවකට යුධ හමුදාපතිට ක්‍රිෂාන්ත සිල්වා Army Commander ට දුන්නාම මට මේ පොත ගිහිල්ලා දෙන්න කිව්වා ආරක්ෂක අමාත්‍යාංශයට. ඒ අනුව මම මේ පොත ගිහිල්ලා ඊට පස්සේ ආරක්ෂක අමාත්‍යාංශයට මම මේක භාර දුන්නා.

ප්‍ර : ඔබ මෙම පොත ආරක්ෂක අමාත්‍යාංශයේ කාටද

පි : ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ට තමයි මම භාර දුන්නේ.

ප්‍ර : මතකද ලේකම්ගේ නම ඒ කාලේ?

පි : මට එහෙම මතකයක් නම් නෑ. මම ඒ කියන්නේ ඒ කාලේ ගත්තාම ඒ කාලේ හිටපු ලේකම් තමයි භාර දුන්නේ.

ප්‍ර : සිවිල් සේවකයෙක්ද නැත්නම්

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර : කරුණාසේන හෙට්ටිආරච්චි

පි : මේ ලියුම ඇරියේ . ස්වාමීනි විශේෂයෙන්ම හමුදාපති මම හම්බ වුණාම හමුදාපති කිව්වා මේ ලියුම අරින්න කියලා . ඊට පස්සේ හමුදාපතිට ඒ කියන්නේ ආරක්ෂක ලේකම්ට address කරලා ඒ ටික යවලා පස්සේ තමයි අපි එක යවන්නේ . ඉතින් මම ලියුම ගිහිල්ලා භාර දෙන්නේ නෑ. ඒ ලියුම මට හමුදාපති උපදෙස් දුන්නා මේක යවන්න කියන එක. ඒ අනුව තමයි මම ඇරියේ.

ප්‍ර : ඔබ එය භාෂා මොන භාෂාවෙන්ද එම වාර්තාව පිළියෙල කළේ ?

පි : ඇත්තටම Security Council එකේ ඔක්කොම වගේ සිංහලෙන් වගේ තමයි මේවා කළේ . නමුත් මේකේදී සිංහල සහ ඉංග්‍රීසි දෙකෙන්ම අපි ප්‍රචාරය කළා. මොකද හේතුව අපිට වැදගත්කමක් තිබ්බා මේ මේකේදී අපි තනියෙන් කරන්න පුළුවන් යුද්ධයක් නෙවෙයි. අපි මේ ලොකේ අනිත් රටවල් එක්ක සම්බන්ධ වෙලා තමයි මේක මේ document එක prepare කළේ. ඒක නිසා අපි භාෂා දෙකෙන්ම මේක අපි හැදුවා. මොකද

FAIR COMMENT BY JEZEEM

අපි ඒගොල්ලොන්ටත් මේක ඒගොල්ලන් එක්කත් අපි ඒගොල්ලොන්ගේ අදහස් exchange කර ගත්තා.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා

ප්‍ර : ඔබ 2015 අවුරුද්දේ කොයි කාලේද මෙම

පි : දැන් මම ඕක හැදුවේ 2016 ඇවිල්ලා . 2016 ඕකේ ගහලා ඇති ස්වාමිනි මම හිතන්නේ. 2016/09/27

ප්‍ර : එම 2016

පි : 2016 September 27. මේ තියෙන්නේ ඒ පොත.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර : ඒ දිනයෙන් ඔබ අදහස් කරන්නේ ඒ දිනයේද ආරක්ෂක අමාත්‍යාංශයට භාර දුන්නේ නැත්නම් ඒ presentation එක කෙරුවේ ඒ දවසේද ?

පි : ඔව් ස්වාමිනි දැන් මේ අපි presentation එක නෙවේ මේ පොතක් සාමාන්‍යයෙන් කළාම බුද්ධි අංශය මේ හැම එකක්ම අපි මේ විදිහට ලස්සනට bind කරලා තමයි අපි දෙන්නේ . මොකද ඒකේ තියෙන වැදගත්කම පෙන්වන්න. ඒ පොත භාර දුන්න දවස තමයි අපි ඒක දාන්නේ.

ප්‍ර : කාට භාර දුන්නද ?

පි : ඒ කියන්නේ මේක යුධ හමුදාපතිට මේක භාර දුන්නාම යුධ හමුදාපති මේක ආරක්ෂක අමාත්‍යාංශයට යවන්න කියලා.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා

2016 සැප්තැම්බර් 27 දිනැති Identification of the Threat posed by the Islamic State in Iraq and Syria (ISIS) and suggested per-emption/ counter strategy prepared by the Directorate of Military Intelligence ලෙස පිළියෙල කර තිබෙන රහසිගත වාර්තාවේ ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙළ කර තිබෙන වාර්තාව උතුමාණනි මා මේ අවස්ථාවේ දී C 268 ලෙස ලකුණු කර ඉදිරිපත් කරනවා. සාක්ෂිකරු ඒ සම්බන්ධයෙන් වන පිටපතකුත් කොමිෂන් සභාව වෙත රැගෙන පැමිණ ඇති බව ප්‍රකාශ කර සිටිනවා ස්වාමිනි. එසේම එම වාර්තාවම සිංහල භාෂාවෙන් "ISIS ත්‍රස්තවාදීන් (ඉරාකය සහ සිරියාව සඳහා

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වන ඉස්ලාම් රාජ්‍යය) විසින් සිදු කළ හැකි තර්ජනයන් හඳුනා ගැනීම සහ යෝජිත ප්‍රති උපක්‍රම වැළැක්වීමේ ක්‍රියා පිළිවෙත" ලෙස සඳහන් වාර්තාව උතුමාණනි **C 268 (A)**ලෙස ලකුණු කර ඉදිරිපත් කරනවා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : එම වාර්තාව දීලා මාස තුනකින් තමන් ඉවත් වීමක් කළාද ?

පි : මම නොවැම්බර් මාසේ වෙනකොට මට එළියට යන්න සිද්ධ වුණා. නමුත් මේ වාර්තාව දුන්නා විතරක් නෙවේ. තව එකක් මම මේ ගරු සභාවට කියන්න ඕනේ ඔය 27 දෙනා සිරියාවට ගියායින් පස්සේ 37 දෙනා ඊට පස්සේ කවුරුත් සිරියාවට ගියේ නෑ. ඒ සිරියාවට ගියේ නැත්තේ ඇවිල්ලා අපි විසින් ගත්ත බුද්ධි අංශ විසින් ගත්ත ක්‍රියාමාර්ග නිසයි. මොකද අපි පැහැදිලිවම මම මේ ගරු සභාවට මම කිව්වා අපි ගත්ත ක්‍රියා මාර්ග ඒ රටවල් එක්ක සම්බන්ධ වෙලා . ඒ මේ වීසා දුන්න රටවල් වලට ගිහිල්ලා නැවත වරක් වීසා නොදෙන්න කටයුතු කරලා ඊට අමතරව ඒ travel agent ව අපි අල්ලලා ඒ කියන්නේ අපි අත්අඩංගුවට ගත්තේ නෑ. අපි ඒ travel agent ව කරලා මොකද එයා කියන්නේ එයා දැන ගෙන හිටියේ නෑ කියන එක. ඒ එක්කම ඒ අදාළ පවුල්වලට එකතු වෙලා ඊට පස්සේ මේ 37 න් පස්සේ කිසිම කෙනෙක් සිරියාවට ගියේ නෑ.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

එසේම මේ අවස්ථාවේ උතුමාණනි දී අවසර ඉල්ලා සිටිනවා **Fundamentalism, Extremism and Muslims Structure in Sri Lanka** ලෙස සම්පාදිත වාර්තාවක් සාක්ෂිකරුට පෙන්වා සිටීමට.

ප්‍ර : මෙම වාර්තාව කවුරු විසින් සම්පාදනය කරපු එකක් ද කියලා ඔබට කියන්න පුළුවන්ද ?

පි : මේ ඔක්කොම මගේ කාලයේදී ගත්තු documents තමයි. මේක අපි විසින් Director Military Intelligence තමයි මේක කළේ. මොකද මේක ඇවිල්ලා අපි හැමදාම

ප්‍ර : මේක ඔබ DMI ව ඉන්න කාලේ සිදු කළේ ?

පි : DMI

ප්‍ර : ඔබ DMI වශයෙන් ඉන්න කොට කාල වකවානුව කියන්න පුළුවන්ද ?

FAIR COMMENT — BY JEZEEM

පි : ඔක්කොම 2016 ට කලින් . ඒ කියන්නේ ඔය 2015 July ත්. 2016 November අතර කාලයේදී සියළුම Studies කරපු ටික තමයි දැන් අර එකක් ඇවිල්ලා රජයට ඉදිරිපත් කරපු එක. ඒ එක්කම අපේ අයව දැනුවත් කිරීම් කරන්න ඒක නැවත වරක් ඒ අනෙකුත් යුධ හමුදාපති දැනුවත් කිරීම මේ ආදී වශයෙන් අපි දිගටම මොකද අපි dedicated unit එකක් අපිට මේකට establish කරපු නිසා .

ප්‍ර : ඔව් මෙම ලේඛනය මෙම වාර්තාව ඔබ කවුරු සඳහා ද සකස් කරපු වාර්තාවක්ද ?

පි : දැන් මේ හැම වාර්තාවක්ම අපි සකස් කරලා යුධ හමුදා මූලස්ථානයට ගිහිල්ලා ආරක්ෂක අමාත්‍යාංශයට යනවා ස්වාමිනි.

ප්‍ර : මෙම ලේඛනය කුමක්ද C 269 ?

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : මෙම වාර්තා වල ඒ කාලේ සහරාන් හෝ සහරාන්ගේ මේ තවුහිද් ජමාත් ගැන ජාතික තවුහිද් සම්බන්ධව මොකක්වත් තොරතුරු ලැබුණාද ?

පි : ස්වාමිනි එහෙම සහරාන් කියන පුද්ගලයෙක් ඒ දවස්වල හිටියේ නෑ ස්වාමිනි. ඒ කියන්නේ අපේ Network එකට ලැබුනේ නෑ. මොකද අපිට Network එකට ආවේ JMI එකයි ඒ ටික විතරයි. මොකද විශේෂයෙන්ම සහරාන්ලා ඇත්තටම violent සහ බිහි වුණේ 2017 න් පස්සේ මොකද ඒ ගොල්ලො ඇවිල්ලා අර යම් කිසි මද්‍රසාස්වල ඒ කොටියාශයත් එක්ක ඇවිල්ලා යම් කිසි එකක් ඇති වෙලා මුලින්ම මෙයා මේ JMI කියන එකට recruit වෙන්න වෙනවා 2016 අග භාගයේදී එනවා. එතකොට එයාට extremist element එකක් තියෙන්නේ නෑ. හැබැයි අග භාගයේදී ළං වෙලා එයා බලනවා මේක මෙහෙම කරලා හරියන්නේ නෑ. මේක අපි violent එකට යන්න ඕනේ කියලා කියනවා. ඒ කියන්නේ 2017 දී එතකොට මම නෑ.

ප්‍ර : එතකොට පාස්කු ප්‍රහාරයට සම්බන්ධ වුණ දිවිනසාගත් කාගේවත් නම් කවුරුවත් හෙළි වුණේ නෑ ඒ කාලේ ?

පි : ස්වාමිනි එතනදී දැන් මෙතන දැන් අත්අඩංගුවට ඉන්නවා උමෙයිර් කියන පුද්ගලයා පමණක්.

ප්‍ර : කවුද ඒ නම?

FAIR COMMENT — BY JEZEEM

පි : උමෙයිර් JMI එකට උමෙයිර් කියන පුද්ගලයා අත්අඩංගුව පත් වෙලා ඉන්නේ. මොකද මේකට හේතුව incident එක වුණ ගමන්ම මම මැලේසියාවේ හිටියේ. එතකොට මේ දැන් incident එක වෙච්චි ගමන්ම මට දුරකථන ඇමතුමක් ආවා මේ පාස්කු ඉරිදා එක්කම. ඉතින් එතකොට විශේෂයෙන්ම මම immediately මම කෝල් කළා. මම දැනුම් දුන්නා එවකට යුධ හමුදාපතිට. මේ Network එක එහෙමම තියෙනවා 2016 දී මම හදපු Network එක. ඉක්මනටම මේ කට්ටිය සියළු දෙනා අත්අඩංගුවට ගන්න කියලා. ඒ අනුව තමයි TID එකට හැකියාව ලැබුණේ මේ සියළු තොරතුරු ඒ කියන්නේ මේ පුද්ගලයෝ මේකේ පිටිපස්සේ හිටපු පුද්ගලයන් ඒ කියන්නේ මේගොල්ලන් අර සහරාන්ගේ කණ්ඩායමේ නැති වුනත් මේ අද අත්අඩංගුවට ගන්න සියළුම ප්‍රධාන කට්ටියව අපිට හැකියාව ලැබුණේ .

ප්‍ර : ඒ උමෙජ් කියන එක්කෙනා කවුද?

පි : උමෙයිර් කියන්නේ JMI හිටපු නායකත්වය දරපු පුද්ගලයා ස්වාමිනි.

ප්‍ර : කලින් ?

පි : ඔව්.

ප්‍ර : 2016 ?

පි : ඔව්.

ප්‍ර : එතකොට අර තමන්ලාට ඒ කාලේ දැන ගන්න ලැබුණාද PJ කියලා ඉන්දියාවේ ඉඳන් පුද්ගලයෙක් ඇවිල්ලා මෙහේ ඉන්නවා කියලා ?

පි : ඔව් PJ කියන දැන් මේ මුස්ලිම් සමාජය තුළ මම කිව්වේ විවිධ කණ්ඩායම් විවිධ ආගමික ප්‍රශ්න තියෙනවා. ඒ එක්කම විවිධ නිකායන් තියෙනවා. එතකොට අපි දැක්කා මේකේ ඇතුළේ දේශපාලනයක් ගැන තමන්ගේ ප්‍රතිරූපය සහ මේක මම හිතන්නේ එක නිකායකට විරුද්ධව තව එක්කෙනෙක් කටයුතු කරනවා. තව නිකායකට විරුද්ධව තව නිකායක් කටයුතු කරනවා. එතකොට PJ කියන එක්කෙනා Thamilnadu තවුහිද් ජමාත් කියන එකේ සංවිධානයේ ප්‍රධානියා . මේ PJ කියන කෙනා ඇවිල්ලා එක සැරයක් ඇවිල්ලා මුල්ම කාලයේදී සුගතදාස stadium එකේ මේකක් කරලා ගියා. දෙවෙනි සැරේ එනකොට ඒකට අනිකුත් පාර්ශවයන්ගෙන් ලොකු ප්‍රතිවිරුද්ධත්වයක් තිබුණු නිසා ආවේ නෑ. ඊට පස්සේ නැවත වරක් උත්සාහයක් ගත්තා

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

මෙයා එන්න. නමුත් ඊට පස්සේ අපි එයාට එන්න දුන්නේ නෑ. මොකද එතනදී එන්න දුන්නේ නැත්තේ ඇවිල්ලා එතන විශේෂයෙන්ම අපි බුද්ධි අංශයක් හැටියට අපේ assessment එක වුණේ ඇවිල්ලා ඒ තුළින් ආගමික මතවාදයක් නෙවෙයි අපි දැක්කේ මේ තුළින් මේ ඇතුළේ තියෙන මේ මුස්ලිම් කණ්ඩායම් අතර යම්කිසි ලොකු ඝට්ටනයක් ඇති වෙන්න පුළුවන් එක තමයි අපි දැක්කේ. අද PJ කියන එක්කෙනා අද ඉන්දියාවේ ඉන්නවා කිසි ප්‍රශ්නයක් නැහැ ස්වාමීනි.

ප : එහේ ක්‍රියාත්මක වෙනවාද යම්කිසි සංවිධානයක් ?

පි : ටැමිල්නාඩු තවුහිද් ජමාත් එකේ නායකයා තමයි PJ. එහෙනම් ඉතින් මෙයා රැඩිකල් නම් එහෙනම් ඉන්දියාව තමයි මුලින්ම අත්අඩංගුවට ගන්න ඕනේ . නමුත් මේ අපේ සමහර කොටඨාශයක් කියනවා මෙයා ඇවිල්ලා රැඩිකල් කියන එක. ඒක ඇවිල්ලා නිකාය තමයි මේ ඒගොල්ලො මේ නිකායන් අතර ලොකු ප්‍රශ්නයක් තියෙනවා ලොකු තරහයක් තියෙනවා. මේ තරහය දේශපාලඥයන් හරහා ආගමික කණ්ඩායම් හරහා මේක ඒගොල්ලොන්ගේ වාසිය තකා උපයෝගි කර ගන්නවා. ඉතින් මේ කිරීම තුළින් තමයි මම හිතන්නේ දැන් ඔය සහරාන්ලා වුනත් බිහි වීමට එක්තරා පසුබිමක් මේකෙන් සැකසුනා. සමහර මිනිසුන්ව සම්පූර්ණයෙන්ම සමාජයෙන් අයින් කරලා ත්‍රස්තවාදීන් කරලා කටයුතු කර ගත්තාම වෙන්නේ ඒ මිනිස්සු ත්‍රස්තවාදී පැත්තටම යොමු වෙනවා.

ප : ඔය සිරියාවට ගිය පුද්ගලයින්ට ටිකට් ගත්තේ ඒ වියදම් දැරුවේ කවුද ?

පි : ඒ ඔක්කොම සියළු දෙනා දැම්මේ. මොකද මේ කණ්ඩායමේ හිටපු ප්‍රධාන ලොකුම එයාගේ අයියා තමයි 2013 වෙනකොට එයා එංගලන්තයේ study කළේ. එයා ඕමාන් රටේ හිටියේ. ළමයි පස් දෙනෙක් ඉන්නවා. එයා තමයි මේ කට්ටිය Group එක යන්න කලින් ඒ මතවාදයත් එක්ක හිටුණේ. ඒ මතවාදයත් එක්ක පෝෂණය කළේ. එයාගේ influence එක තමයි මේ 37 නාගේ 37 ගත්තාත් 37 දෙනාම අයිති වෙන්නේ පවුල් තුනකට පමණයි. තුනකට උපරිම වුනොත් හතරකට . මේ පවුල්වල සාමාජිකයෝ තමයි දැන් ගත්තොත් නිලාම් ගත්තොත් නිලාම් එක්ක 07 ක් යනවා. එයා, එයාගේ Wife, එයාගේ ළමයි පස්දෙනා, අම්මා තාත්තා එතනම ඇවිල්ලා 08 යි. ඉතින් එතකොට එහේ ගිහිල්ලාත් ළමයෙක් හම්බ වෙනවා. පොඩිම ළමයාගේ වයස අවුරුදු 2 යි.

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඉතින් අපි 37 යි කිව්වාට 37 fighting carders ලා හිටියා ඇවිල්ලා හතක් අටක් විතර. නමුත් ඒක තමයි අපි අදහස් කළේ මේ Wife ලා මොකද කරන්නේ. අම්මලා තාත්තලා මොනවාද කරන්නේ . එතකොට Wife ලා මොකද කළේ තමන්ගේ ස්වාමි පුරුෂයා ඇවිල්ලා සටන් බිමට යන කොට Wife ලා කළේ ඒ like minded wife ලා එක්ක එකතු වෙලා අර ළමයින්ව බලා ගෙන NGO's run කර ගෙන internet එක run කර ගෙන එහෙම හිටියා. එතකොට වයසක කට්ටිය කළේ ඒ ළමයින්ට ආගම උගන්වන්න ඒ වගේ. මුළු පද්ධතියම මේගොල්ලො මුළු පවුල් පිටින්ම උපයෝගී කර ගත්තා. මේ කට්ටියට ඕනේ කරලා තිබුනේ පවුල් පිටින්ම ස්වර්ගයට යන්න . ඒ වගේ radical thinking එකත් එක්ක ඒ වගේ ලොකු ඉගෙනීමක් එක්ක ආපු කට්ටියක් තමයි අපි මේ 2015 න් පස්සේ නැවත වරක් අපිට තිබුණ ලොකුම ප්‍රශ්නේ තමයි මොකද මේ incident එක වෙච්චි ගමන්ම මට විනාඩි 05 ක් වත් ගියේ නෑ මොකද වුණේ කියලා තේරුම් ගන්න. මොකද target එක ඉතාමත්ම පැහැදිලියි. මොකද මේ ideology එක දන්නවා නම් Number one target එක ඇවිල්ලා ක්‍රිස්තියානි ආගම සහ බටහිර රටවල්. ඒ ගොල්ලො පාස්කු ඉරිදා තෝරා ගත්තා. මොකද ක්‍රිස්තියානි භක්තියකයන්ට මරන්න ඕනේ කියලා. ඒ එක්කම inspiration එකක් හැටියට New Zealand වෙච්චි incident එක මේගොල්ලොන්ට තව ටිකක් බලපෑවා. මොකද මේ සාකච්ඡා වලදී ඒ ගොල්ලො කතා කරලා තිබුණා විශේෂයෙන්ම මුස්ලිම් කට්ටියකට ගිහිල්ලා වෙඩි තියනවා Christ-church වල incident එකට. එතකොට මේවා ඇවිල්ලා දැන් LTTE එක ඇවිල්ලා Hierarchy structural ඒ කියන්නේ ප්‍රභාකරන් උපදෙස් දෙනවා sub නායකයින්ව ඒ විදිහට යන්නේ Network එකක් තියෙනවා, centralized control එකක් ඔක්කොම තියෙනවා. මේවා සම්පූර්ණයෙන්ම inspire එකක් වෙලා යන්නේ. අර golden rules ඔක්කොම ගත්තාම ඕගොල්ලො මේක කරන්න lone wolf කරන්න ආගමෙන් තමයි මේ බැඳීම් ඇති කරන්නේ. ඊට පස්සේ සහරාන්ගේ චරිතය ගත්තාම එයා හිතනවා මට මේ දේ කරන්න පුළුවන් මේක තමයි. හැබැයි මම නායකත්වයෙන් එහාට යන්නේ නෑ. Golden rules වලින් එහාට යන්නේ නෑ. Caliph එහාට යන්නේ නෑ. ස්වර්ගයෙන් එහාට යන්නේ නෑ. ඉතින් ඒ වගේ තියෙන මානසිකත්වයත් එක්ක තමයි අනිකුත් කණ්ඩායමක් බිහි

වෙන්නේ . එතකොට මේ සියළුම අය ඇවිල්ලා ඉගෙන ගත්ත මිනිස්සු. ඉතින් මෙතනදී තව කවුරුහරි සමහර අය උත්සාහ ගන්නවා නෑ මේ DMI එක handle කළා. SIS එක handle කළා. මේ ගොල්ලන්ව පඩියට ගත්තා කියලා . මම හිතන්නේ නෑ අපේ සියළුම තියෙන access vote එකට තියෙන මුදල ගත්තත් සහරාන් වගේ පුද්ගලයෝ ගන්න පුළුවන් කියන එක. ඉතින් මේක ඇවිල්ලා idiological මේකක්. ඉතින් මෙතනදී ඒගොල්ලො පැහැදිලිවම ඒ අර caliph එකේ කොටස් පහ හැටියට අපි දැක්කා කට්ටියක් යනවා කට්ටියක් මෙහේ ප්‍රචාරණය කරනවා කට්ටියක් ආගම් වල මේ මේ ප්‍රතිරූප කඩනවා. ඊට පස්සේ ඒගොල්ලො violent එකට 2017 දී එක කණ්ඩායමක් කැඩිලා ගිහිල්ලා violent එකට යනවා. ඒ violent එකේදී ඒගොල්ලො target කරනවා ඇවිල්ලා ක්‍රිස්තියානි ආගම. ඒගොල්ලොන්ට දැන් ඇමරිකන් කාරයෝ කියලා හොයා ගෙන යන්න බැහැ මෙහේ. මොකද embassy එකට ගිහිල්ලා ගහන්න බෑ මේක. ඒක නිසා ඒගොල්ලො විශ්වාස කරනවා මේ බටහිර රටවල්වල තමයි මේ ඒ කියන්නේ මේ විශේෂයෙන්ම ෂැංග්‍රිලා හෝටලය, එතකොට මොකක්ද සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය මේ ඔක්කොම ඒගොල්ලන් target කරන්නේ ඇවිල්ලා ඒ සුදු ජාතීකයන්ට තමයි target කරන්නේ. එතකොට ඒ මනසත් ඇවිල්ලා මේ මේ කවුද බග්ඩාඩ් කියන්නේ නෑ මොකක්ද target කරන්නේ ඕනේ කියලා එතකොට මම හිතනවා මම නම් සහරාන් ඕකේ මේ ටික target කරනවා තව target එකක් තියෙනවා. කවුද ළඟ යන්න පුළුවන් එහෙනම් කමක් නෑ TAJ ඒකට ගියාට ප්‍රශ්නයක් නෑ ඒක මමයි තීරණය කරන්නේ. ඉතින් මේ ගොල්ලො සම්පූර්ණයෙන්ම target කළේ ඇවිල්ලා බටහිර ජාතිකයෝ target කළේ ඇවිල්ලා ඒ ඒ කියන්නේ ඒ ක්‍රිස්තියානි පල්ලි ටික . ඊට පස්සේ අපි හොඳටම දැක්කා ඒක පසු වදනේදී අපි කතා කිරීමේ දී අපි දැක්කා විශේෂයෙන්ම අර 17 දෙනා අපි හොයා ගෙන යනකොට 17 දෙනා මොනාද කිව්වේ ඉතාමත් පැහැදිලියි ideology එකයි මේ හැම දෙයක්ම කිව්වේ. මේ විදිහට තමයි මේ තියෙන high end එකට තමයි යන්නේ . මේ කිසිම පුද්ගලයෙක් ඔය ආගම් පද්ධතියේ extremism යන පුද්ගලයෙකුට මම හිතන්නේ නෑ අපිට Infiltration එකක් කරන්න පුළුවන්.

ප්‍ර : ඔය සංවිධානයට වියදමට මුදල් සැපයුවේ කවුද ?

FAIR COMMENT BY JEZEEM

පි : මුදල් මේකට ඉතාමත්ම පැහැදිලියි ස්වාමීන් වහන්ස අපි දැක්කා කෝටි ගණන් මුදල් අපි මේ කතා කරන රුපියල් 100, 200 නෙවෙයි ඊබ්‍රහීම්ගේ පුත්තු ගත්තාම BMW තියෙන්නේ. අපි දැක්කා මේකට අපි නොදකින පැතිත් ගොඩක් මේකේ තාම තියෙනවා. අපි තාම

ප්‍ර : කොහොමද අරමුදල් ආවේ?

පි : ඒ අරමුදල් කෙළින්ම ඒ අරමුදල් ලබා දුන්නා. ඒ අරමුදල් ගත්තොත් අපි උදාහරණයක් වශයෙන් මෙතනදී බුදුපිළිම කේස් එකේදී බුදුපිළිම කේස් එකේ අත්අඩංගුවට ගත්ත පුද්ගලයාට කතා කරන්න මිලියන 2.5 ක් ලබා දෙනවා සහරාන්. එතකොට ඒ මුදල් මිලියන 2.5 අරගෙන අපේ ලෝයර්ස්ලා කතා කරනවා ඒ වෙනුවෙන්. ඉතින් එතකොට ප්‍රශ්නේ තියෙන්නේ මුදල් 2.5 million කොහොමද ආවේ. එතකොට කවුද මේකට කතා කරන්නේ. එක පළවෙනි එක. දෙවෙනි එක මේගොල්ලොන්ට මේ බෝම්බ හදන්න, වාහන ගන්න අති විශාල මුදල් කන්දරාවක් ඊබ්‍රහීම් විසින් ලබා දෙනවා. ඒ එක්කම පිටරටින් ඒ මුදල් ඒගොල්ලන්ගේ මුදල් අපි දැක්කා මේකේ පරීක්ෂණ පවත්වන කොට අපි දැක්කා කටාර් වල සංවිධානාත්මක Groups තියෙනවා. ශ්‍රී ලංකික Group. ඒ එක්කම අපි දැක්කා ඩුබායිවල සංවිධානාත්මක Group තියෙනවා. ඒගොල්ලො එකතු වීමක් කරනවා. ඒ ගොල්ලො සල්ලි මුදල් එකතු කිරීමක් කරනවා. ඉතින් මේ විශේෂයෙන් ලංකාවේ වෙච්ච සිදු වීම සියළුම මුදල් ආවේ ලංකාවේ ඇතුළෙන්. ලංකාවේ සියළුම මුදල් explosive ඔක්කොම ලංකාවේ explosive ඒ කියන්නේ gelatnite ගත්තා ලංකාවේ. Gel එක හැදුවේ ලංකාවේ. internet එක බලලා තමයි එක හැදුවේ. ඒගොල්ලන්ම තමයි මේක ඇවිල්ලා test කරලා බැලුවේ කොහොමද කියන එක ඒක සම්පූර්ණයෙන්ම මුදල් ඇවිල්ලා ලංකාවේ ඔය Group එකේම මුදල් ටිකත් ඒගොල්ලන්ගේ සියළුම දෙනා ඒක මේ ශ්‍රී ලාංකික සම්පූර්ණයෙන්ම පිටින් ආවේ inspiration එක පමණයි.

ප්‍ර : මෙවැනි සංවිධානයකට දේශපාලන උදව් නැතුව දේශපාලඥයන්ගේ උදව් නැතුව මෙවැනි ක්‍රියාත්මක වෙන්න පුළුවන්ද ?

පි : ඔව් දැන් මෙතනදී මම දකින්නේ ඇවිල්ලා ස්වාමීනි මගේ දැනුම හැටියට මෙතනදී මම කිව්වා මුස්ලිම් මුළු සමාජයම ගත්තාම මුළු සමාජයම අරාබිකරණය කිරීමකට ලක් වීමක් දකිනවා. ඉතින්

FAIR COMMENT BY JEZEEM

මුළු සමාජයම යම් මුස්ලිම් කණ්ඩායමක් විසින් ඔක්කොමලා පාලනය කරනවා. ඒ පාලන ත්‍රන්තය හැටියට අපි දැක්කා අර පාසල් පද්ධතිය දැක්කා, scholarship දැක්කා, එතකොට preachers ලාව ලාව දැක්කා. පල්ලි පාලනය කිරීමක් දැක්කා. ඒ එක්කම ඔය හලාල් කරණයක් දැක්කා . සංස්කෘතියක් දැක්කා. එතකොට මේ line එකේම අපි දැක්කා යම් කිසි මුදලක් මේවාට මුදල් එනවා පිටරටින් අතිවිශාල මුදල් ප්‍රමාණයක් . අද ඇහුවොත් එහෙම ලංකාවට එන ඒ දවස්වල ආපු scholars ලා 300 ට කවුද මුදල් fund කරන්නේ. ලංකාවෙන් නෙවේ මුදල් fund කරන්නේ. එතකොට ලංකාවෙන් එන 300ක් 400 ක් විතර යන තරුණයන්ට අරාබි ගිහිල්ලා ඉගෙන ගන්න කවුද fund කරන්නේ. ලංකාවෙන් නෙවේ fund කරන්නේ. එතකොට ලංකාවේ හදන්න museum හදන්න කවුද university fund කරන්නේ කවුද පිටරටින් fund කරන්නේ . කවුද මේ ආගම ප්‍රචාරය කරන්න fund කරන්නේ. පිටරටින් fund කරන්නේ. එතකොට මේක තමයි මම දකින්නේ පිටරටින් තමයි conduit කරන්නේ. මේකට හැදෙන විදිහට ස්වාමීනි හැදිලා තියෙනවා structure එක. එතකොට දේශපාලනය ඇන්දත් මේ line එකට එනවා. දේශපාලනය ඇන්දත් මේක තනියෙන් දේශපාලනය කරන්න බෑ. දේශපාලනයාට මේක ඒකනේ අපි එක්කෙනෙක්ව අයින් කරාම යම් කිසි දේකට සියළු දෙනාගේ එකතුවීමක් දකිනවානේ අපි. මම නිකම් කියන්නේ මම බුද්ධි අංශයේ පැත්තෙන්. ඉතින් එතකොට ඒක දකින්නේ නෑනේ අපි සමාජයේ අනිත් පැතිවල මොකද මේ ඔක්කොම interdependence හැම එකටම ළං වෙනවා. අපි අද හඳ දැක්කා කිව්වොත් සියළු දෙනාම ඒ හඳ දැක්කා ඒ line එකේ ඉන්නවා. හෙට හඳ දැක්කේ නෑ කිව්වොත් හෙට කවුරුත් හඳ දැක්කේ නෑ කියනවා. සියළු දෙනාම vote කරන්න කිව්වොත් මේ පැත්තට සියළු දෙනාම එක පැත්තකට vote කරනවා. ඉතින් මේ සමාජය එවැනි සමාජයක් ඇති කරලා තියෙන්නේ ශ්‍රී ලාංකිකත්වය නැති කරලා මෙහෙම සමාජයක් එක්ක තමයි නිර්මාණය කරන්නේ . මෙහෙම සමාජයක් එක්ක සම්බන්ධ වීමේදී ස්වාමීනි මම කියන්නේ අපිට තියෙන knowledge එක මදි ඇත්තටම.

ප්‍ර : නෑ බුද්ධි තොරතුරු ලැබුණාද මෙම සහය දැක්වූ කවුද කවුද පුද්ගලයන් කියලා ?

පි : දේශපාලන විදිහටද

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දේශපාලන හෝ වෙනත් පිටස්තර පුද්ගලයින් ?

පි : ඔව් එතකොට ස්වාමිනි මම 2016 අගොස්තු වෙනකොට මේ මුදල් කිසි දෙයක් තිබිලා නෑ. ඒ කියන්නේ දේශපාලනයෙන් කවුරුත් fund කරන්නේ නෑ. මොකද එහෙම violent එකකට ගියෙත් නෑ. එහෙම වාහන ගන්න තිබ්බෙත් නෑ. සම්පුර්ණයෙන් කළේ religious extremism එක පමණයි.

ප්‍ර : දැන් එයින් පසු තමන් පත් වීමෙන් පසුව මේ සම්බන්ධව කළ පරීක්ෂණ වලදී මොනවා හරි හෙළි වුණාද ?

පි : ඔව් ස්වාමිනි මම පටන් ගන්න කොට කිව්වා මම මේ පිළිබඳව අධ්‍යයනයක් කළේ නෑ. මොකද මම ආවායින් පස්සේ දැන් මෙතන ආයේ වරක් වැරදි නොවෙන්න කටයුතු කරනවා මිසක් මේකේදී මම හොයන්න ගියේ නෑ මේ පැත්තෙන් කොහොමද වුණේ කියන එක මම හොයන්න ගියේ නෑ.

ප්‍ර : නමුත් එයත් සොයනවා නම් ඒක සුදුසුයි නේද ?

පි : ස්වාමිනි ඒක අනිවාර්යෙන්ම ඒක අපි සොයනවා නම් සුදුසුයි. නමුත් දැනට අපි විශේෂයෙන්ම යම් යම් පැතිවලින් ඒ කියන්නේ විශේෂයෙන්ම දැන් ඔතන 140 ක් 450 ක් ඉන්නවා අත්අඩංගුවට පත් වෙලා. දැන් මෙතන දී මේ අත්අඩංගුවට පත් වෙන්න වෙනම කණ්ඩායමක් සම්පුර්ණයෙන්ම ප්‍රශ්න කිරීම් රාශියක් කරනවා. ඒ රාශිය ඉවර කළායින් පස්සේ අපිට හරියටම identify කර ගන්න පුළුවන් වෙයි කොහොමද fund ආවේ. මේ හැමදෙයක්ම අපිට දැන ගන්න හැකියාව ලැබෙයි.

ප්‍ර : දැන් ඔබ වැනි නිළධාරීයෙක් අලුතෙන් පත් වෙලා තියෙන්නේ එම නිසා නව තොරතුරු ලබා ගන්න එක තමන්ට පුළුවන්නේ කරන්න?

පි : පුළුවන් ස්වාමිනි දැනට අපි විශේෂයෙන්ම දැන් ඒ සමහර තොරතුරු අපි අරගෙන ගොඩක් දේවල් මේකට මේ Net එකට අහු වෙච්චි නැති කොටසක් ඉන්නවා. ඒක මම පැහැදිලිවම කියන්න ඕනේ දැන් මේ අපි දකින්නේ සහරාන්ලායි 450 යි පමණයි. නමුත් මේ සහරාන්ලාට වැඩිය පිරිසක් පිටිපස්සේ ඉඳන් මේවා විවිධ ප්‍රධාන දේශපාලනඥයෝ වගේ පුද්ගලයන් පැත්තක ඉන්න පුළුවන්. විවිධ වෘත්තිවල නිළධාරීන් ඉන්න පුළුවන්. අද මේ ගොල්ලො NGO's හැටියට මේගොල්ලො ඇවිල්ලා සමාජ සේවකයෝ හැටියට මේගොල්ලො ඇවිල්ලා දේශපාලනයේ පිටිපස්සේ හිටියට ගණනාවක් ඉන්නවා. නමුත් මේගොල්ලන්ව identify කරන එක විතරක් නෙවෙයි ස්වාමිනි මේ සමාජයත්

FAIR COMMENT — BY JEZEEM

එක්ක අපි යාමේදී අපි බොහොම පරිස්සම් වෙනවා මොකද හේතුව මෙතනදී මේ හැමෝම එක තලයේ නෙවෙයි ඉන්නේ ස්වාමිනි ඒක තමයි අපිට ලොකුම ප්‍රශ්නේ. රටක් හැටියට අපි හරියට assessment එකක් කරලා නෑ. එතකොට රටක් හැටියට අපි දැන් මෙතනදී තාම struggle කරනවා de-radicalization process එකට කොහොමද මේක categorise කරන්නේ කියලා දැනට අවුරුද්දකට කිට්ටු වෙන්න වෙනවා අපි රටවල් වලින් කට්ටිය ගෙනාවා බංග්ලාදේශයෙන් කට්ටිය ගෙනාවා. කොහොමද ඒගොල්ලො de-radicalization process එක කරන්නේ කියලා. ඉතින් මේකට ලොකු process එකට යන්න අවශ්‍යතාවයක් තියෙනවා.

ප : ඔබට කියන්න පුළුවන්ද තනිවම මෙම පුද්ගලයන්ට තනිව විතරක් මෙවැනි ප්‍රහාරයක් එල්ල කරන්න පුළුවන් ද කියලා? සහරාන්ට සහ ඒ අට දෙනාට තනිවම තව වටින් සහය වීමට කට්ටියක් හිටියා නේද කියන එක.

පි : ස්වාමිනි මේක ගත්තාම මේක basically lone wolf ඇටෑක් එකක් වගේ තමයි මේක යන්නේ. ඒ like minded group ටික එකතු කරගෙන ඒ කියන්නේ මේක ක්‍රමානුකූලව ඒගොල්ලන් අර social media එකෙන් අරගෙන recruit කරගෙන JMI එකෙන් කොටසක් කඩා ගෙන කාත්තන්කුඩිවලට ගිහිල්ලා එහේ කට්ටිය අරගෙන ඒ කට්ටිය වෙනම ගිහිල්ලා training කරගෙන self-fund එකක් කරගෙන ඒ ආදී වශයෙන් කරන ගමන් සමාජයේ අනිකුත් කට්ටිය මුදල් වලට මේක මේ වගේ ප්‍රශ්නයක් වුනොත් ඒක මේවා කරන්න. ඊට පස්සේ මේවා වලින් ජීවත් වෙන කොට්ඨාශ ඉන්නවා. ඉතින් මේ ඔක්කොමත් ඒගොල්ලො කරගෙන ගියා. හැබැයි මේ ඔක්කොම කරගෙන යාමේදී මම දකින එකම observation එක තමයි මම අර කලින් කිව්වා වගේ දැන් මේ ඔක්කොම එක පැත්තකින් කර ගෙන යන කොට කොහොමද ශ්‍රී ලංකාව මෙච්චර blind වුණේ කියන එක. එතකොට මේගොල්ලන් ඉතාමත්ම අර ප්‍රාථමික දේවල් මේගොල්ලෝ කළා. ඒ කියන්නේ පොලිස් එක්කෙනා වෙඩි තියලා මැරුවා. මම අර කියපු ගණනාවක් වෙද්දිත් අපි කවුරුත් ඒවා ගැන අවධානයක් යොමු කළේ නෑ. මේ තොරතුරු එනකොට ප්‍රධාන අවධානයක් යොමු කළේ නෑ. ඉතින් ඒ ගොල්ලොන්ට එහෙම ලොකු දෙයක් ඒ කියන්නේ ඉතාමත් පහසුවෙන්ම මේ තත්ත්වයට ගියා ඒගොල්ලොන්ව.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සහරාන් නායකයා නම් නායකයා දිවිනසා ගන්නා සාමාන්‍යයෙන් තමන්ගේ දැනීමේ හැටියට බුද්ධිමය කටයුතු කරන නිසා නායකයා suicide කර ගන්න අවස්ථාවක් තිබිලා තියෙනවාද වෙනත් කණ්ඩායම් වල?

පි : ඔව් විශේෂයෙන්ම ස්වාමීනි මේ ගත්තාම ඒකෙන් ගම්‍ය වෙන්නේ ඒ radicalization එක කොච්චරද කියන එක තමයි. එතනදී නායකයාද නැද්ද කියන නෙමෙයි එතනදී බලපවත්වන්නේ එතනදී බලපවත්වන්නේ ideology එක සහ ස්වර්ගය තමයි බලපවත්වන්නේ. ඒකේදී නායකයා ගියත් කියන එක මට අවශ්‍ය නෑ. නායකයා කියන නිසා නෙවෙයි මම කරන්නේ . LTTE එක ටිකක් වෙනස්. මෙතැනදී මට දැන් හොඳම උදාහරණය ඇවිල්ලා අර 16 දෙනාමත් suicide කර ගත්තානේ මේකේදී . සහරාන්ගේ Group එකේ වයසක ටික ඔක්කොම ටික එකතු වෙලා සහරාන්ලා අර විදිහට හෝටල් වල මැරෙන කොට ඇස් දෙකේ දැක දැකත් ළමයින්වත් ඔඩොක්කුවේ තියාගෙන ඒ ගොල්ලො වෙඩිතියා ගත්තේ ඇවිල්ලා සහරාන් මැරුණාද නැද්ද කියන එක නෙවෙයි ප්‍රශ්නේ තිබ්බේ. නමුත් ඒ අතරේ දී Wife ට අපි කතා කරන කොට Wife කියපු දේ තමයි එයා කිව්වා මෙහෙමයි මේ එතනදී එයාගේ පොඩි තැකීමක් ඇති වුණා කියලා. මම මැරෙන්න පොඩි වෙනසක් ඇති වුණා කියලා ඔක්කොම ටික මැරෙන්න කාමරයට එන්න ගියාම එයා Bathroom එකට ගියා කිව්වා ළමයාවත් අරගෙන .

ප්‍ර : කාගේ Wife ද කිව්වේ ?

පි : සහරාන්ගේ Wife. එතකොට ඒ මනස වෙනස් වුණා. ඒක නිසා එයා බේරුණා. එයාගේ ළමයාත් බේරුණා. එතකොට එයා ළඟට යනකොට අර අනිකුත් කාන්තාවක් තව කාන්තාවක් එන්න එන්න අපි ඉක්මනට යන් කියලා ඇතුළට ගියා කියලා කිව්වා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : සහරාන් ?

පි : ඔව්.ඉතින් එතකොට මේක ගත්තාම මේක ස්වාමීනි මේ ideology එක Study කරන්න මේ ideology එකේම අපි ඉන්න ඕනේ. නමුත් මම හිතන්නේ නෑ ඒකයි මේ Counter කරනවා නම් මේ වගේම කොටියාශයක් අරගෙන මේ වගේම මනස දියුණු කරපු කොටියාශයක් එක්ක මේ ගොල්ලොන් එක්ක de-radicalization

FAIR COMMENT BY JEZEEM

එක දානවා මිසක් එහෙම නැතුව මේක වෙනත් පාර්ශවයක් හෝ කොච්චර PHD Doctorate තිබ්බත් මේ පුද්ගලයන්ගේ de-radicalization process එකක් කරන්න බැහැයි කියන එක තමයි මගේ හැඟීම . ඒක නිසාම තමයි අපි පිටරටින් ගෙනල්ලා මැලේසියාවෙන් අපි ගිය සතියේ ගෙනාවා බංග්ලාදේශයෙන් කොහොමද මේ Program එක කළේ කියලා. ඉතින් අපි ඒ වගේ මනසක් දියුණු කරපු පුද්ගලයෙකුට අපි ඊට වැඩිය මනසක් තියෙන්න ඕනේ ඒ de-radicalization process එකට යන්න .

ප්‍ර : 2015 සහරාන් නැගෙනහිර දේශපාලන කටයුතු වල යෙදිලා තියෙනවා කියලා තොරතුරු තියෙනවාද ?

පි : ඔව්.

ප්‍ර : ඒ දේශපාලන කටයුතු වල ඒ බව ඒ අනුව තමන්ලාට ඒ කණ්ඩායම් අතර මේ ගැටීම් ඇති වෙලා තියෙනවා. ඒ සම්බන්ධව තොරතුරු ලැබිලා තිබුණාද ?

පි : ස්වාමිනි සහරාන් කියලා අපිට ඇවිල්ලා නෑ ඇත්තටම කිසිම අවස්ථාවක අපේ Records වල කවමදාවත් ඇවිල්ලා නැහැ. නමුත් අපිට ගණනාවක් ඇවිල්ලා තියෙනවා හැම එක Group එකක් නෙවේ විවිධ Group වල විවිධ පුද්ගලයෝ විවිධ මත එක්ක තමයි ජීවත් වුණේ. ඉතින් හැමෝම ඒ යම් යම් දේවල් වලට මේවා වෙනවා. නමුත් අපිට රේඩාර් එකට එන්නේ කොතැනද මේගොල්ලො extremism එකට යන්නේ කොතැනද violent තැනට යන්නේ කියන එක දැන්. උදාහරණයක් අපි ගත්තොත් ස්වාමිනි පොටිටුඅම්මාන්ව ගත්තොත් ප්‍රභාකරන්ව ගත්තොත් ප්‍රභාකරන් කියන චරිතය ඉස්කෝලේ යන කාලයේදී වෙනස් චරිතයක්. ඉතින් ඉස්කෝලේ යන කාලේ අපිට අත්අඩංගුවට ගන්න බෑ. ඊට පස්සේ Bank robbery දෙනකොටත් වෙනස් චරිතයක්. නමුත් පසුකාලීනවදී මෙයා ඇවිල්ලා violent එකට ගියාම තමයි අපි අත්අඩංගුවට ගන්නේ . ඉතින් දැන් ගොඩක් වේලාවට වෙලා තියෙන්නේ ස්වාමිනි දැන් මෙතනදී ප්‍රභාකරන් කියන චරිතය ඇයි මේ අවුරුදු 17 දී ඔගොල්ලන් දැක්කේ නැද්ද මේක කරන කොට අත්අඩංගුවට පත් වුණේ නැද්ද කියන ඒවා එනවා. නමුත් බුද්ධි අංශයක් හැටියට

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : දැන් මේ මෙතුමා අහපු ප්‍රශ්නේම පොඩි දිගුවකට මම යන්න උත්සාහ කරන්නේ. ඔබ 2012 වසරේ සිට 2016 වසර දක්වා Military Intelligence Directorate rate එකේ Director හැටියට සේවය කළා නේද හරි නේද ?

පි : හරි ස්වාමිනි.

ප්‍ර : එතකොට 2014 දී දැන් නැගෙනහිර පළාතේ ඔය Military Intelligence Directorate rate එකේ Units නැද්ද ?

පි : අපේ ඉතාමත්ම ඉන්නවා 4000 කට වැඩිය සංඛ්‍යාවක්. ඒ කියන්නේ එකම badge එක අඳින. අපේ තියෙනවා.

ප්‍ර : තියෙනවානේ ?

පි : තියෙනවා.

ප්‍ර : Units කීයක් තියෙනවාද ?

පි : අපේ ඔක්කොම Units මම ඒ කියන්නේ 2016 වෙනකොට Units 06 ක් තිබ්බා.

ප්‍ර : එතකොට දැන් මේ කාත්තන්කුඩිය කියන ප්‍රදේශය ආසන්නයේ තිබුණාද ?

පි : දිස්ත්‍රික්ක අනුව අපි බෙදලා තියෙනවා යාපනයට එක Unit එකකුත්

ප්‍ර : නෑ නෑ මම අහන්නේ

පි : කාත්තන්කුඩි ප්‍රදේශයට මඩකලපුව මින්නේරිය තියෙන Unit එකෙන් සම්පූර්ණයෙන්ම ඒ ප්‍රදේශයම Cover කරනවා.

ප්‍ර : මින්නේරියෙන්ද Cover කරන්නේ කාත්තන්කුඩියත් ?

පි : ඔව් මින්නේරියේ තියෙන Head Quarter. එක එතකොට operation Quarters

ප්‍ර : කාත්තන්කුඩිය පැත්තේ නැද්ද ?

පි : එතකොට මඩකලපුවේ තියෙනවා. අපේ මේ

ප්‍ර : හරි එතකොට 2014 දී මේ

පි : 2010

ප්‍ර : මම ප්‍රශ්නේ වෙනස් විදිහකට අහන්නම් දැන් නැෂනල් තවුහිද් ජමාත් කියන සංවිධානය සහරාන්ගේ ප්‍රධානාත්වයෙන් ආරම්භ කළේ 2011 වසරේ දී ද? ඔබට ඒ ගැන දැනුමක් තිබෙනවාද උත්තරයක් දෙන්නට?

පි : නෑ මට උත්තරයක් දෙන්න පුළුවන්. එතකොට අපි එතකොට මේවා තියෙද්දී දැන් අපි එහෙම සංවිධානයක් ගැන අපිට Record වෙලා තිබ්බේ නෑ. අපි බලන්න ඕනේ මේ නැෂනල් තවුහිද්

FAIR COMMENT — BY JEZEEM

ජමාත් එක කොහේද Register වුණේ කියන එක පළවෙනි එක. දෙවැනි එක අපි බලන්න ඕනේ මේ Register කරපු සංවිධානේට කී දෙනෙක් හිටියාද කියලා . ඒ එක්කම ස්වාමීනි අපි බලන්න ඕනේ මේ සංවිධානයත් එක්කම තව සංවිධාන දහස් ගණනාවක් මේවාට Record වෙලා තියෙන්නේ . අපි යන්නේ activity එක මිසක් සංවිධානය පිටිපස්සේ නෙවෙයි. අපි බලන්නේ පුද්ගලයෝ. පුද්ගලයොන්ගේ ක්‍රියාකාරීත්වය එක්ක. එතකොට අපි මොකක් හරි කෙනෙක්ගේ ක්‍රියාකාරීත්වය අහු වුණා නම් ඒ ක්‍රියාකාරීත්වය හරහා අපි එයාගේ පිටිපස්සේ ඉන්නේ කවුද සංවිධායකයා කවුද මොකක්ද violent එකට තමයි අපි train වෙලා තියෙන්නේ එහෙම කරන්න.

****

දැන් වේලාව : ප.ව.07.20 යි.
මෙතැන් සිට ල/ලේ : චන්දිමා මෙය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව 7.20
පෙර සටහන් ල/ලේ මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට :ල/ලේ චන්දිමා දිල්හානි.

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර: දැන් ඔබ කිව්වා ඔබගේ අර ලියපු පොතක් තියෙනවාද පිළියෙල කරපු පොතක්?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ පොතේ තියෙනවා මුස්ලිම් සංවිධාන 80 ක් ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ සංවිධාන එකක්වත් ISIS සංවිධානය සමග සම්බන්ධතා පැවැත්වුවා කියලා ඔබට දැනගන්න ලැබිලා තියෙනවාද?

පි: ස්වාමිනි කිසිම සංවිධානයක් සම්බන්ධතා පැවැත්වුයේ නෑ. අපි දැනටත් ඒ සියළු සංවිධානවල අපි පුද්ගලයන්ගේ connectivity එක, මේ ගොල්ලන්ගේ පාවිච්චි කරපු දුරකථන ඒ කාලේ ඉදන්ම පාවිච්චි කරපු දුරකථන සියළු පද්ධතියක් අපි ළඟ තියෙනවා. ඒ එක්කම මේ ගොල්ලන්ගේ පල්ලි වල හිටපු සියළු දේවල් මේ සියළු දේවල් අපි ලග තියෙනවා. අද දුරකථනයක් ලැබුනත් මේ දුරකථන නම්බර් එක දාලා හොයාගන්න පුළුවන් පහු ගිය අවුරුදු පහේදී මේ එක දුරකථනයකට connectivity එකක් තියෙනවාද කියලා දුරකථන මාරු කරලා කතා කරත් ස්වාමිනි අපට පුළුවන් IMI එක හරහා මේ SIM මාරු කරලා ගත්තාත් අපිට ගන්න පුළුවන් ඉතින් අපි සාමාන්‍යයෙන් 70% විතර අපි දෙන මේ assessment එක නිවැරදියි කියලයි මම කියන්නේ ස්වාමිනි. මොකද මේ සංවිධාන ඉතාමත් රහසිගතව තමයි දැන් සහරාන්ලා 2012 හිටියාට සහරාන් වගේම තව කණ්ඩායම් 80 ක් විතර මෙතන හිටියා.නමුත් සහරාන්ලා මෙතනදි violent වෙන්නේ 2017 දී. 2017 තමයි අපේ රේඩාර් එකට එන්නේ. එතකොට තව කවුරුහරි අහන්න පුළුවන් මේ සංවිධාන තව සීයක් පමණ තියෙනවා. මේ සීය අතරට ඔයගොල්ලන්ගේ රේඩාර් එකට ආවේ නැද්ද කියලා. අපේ රේඩාර් එකට එන්න කිසිම හේතුවක් නෑ . කිසිම connectivity එකක් නෑ. මුළු ලංකාවක්ම අපිට nine point seven million population ක් අපිට coordinate කරන්න බෑ 400 ක වගේ deployment එකක් කරලා ඒක නිසා අපි විශේෂයෙන්ම technology එක ඔක්කෝම පාවිච්චි කරගෙන අපි ඒ ටික කරන්නේ. ඒ අනුව අපේ තියෙන ශක්තිය සහ මේ අනුව තමයි මේ ප්‍රධාන සියළුම කණ්ඩායම් හඳුනාගෙන මේ අපි කටයුතු ටික කරලා තියෙන්නේ යුද හමුදා බුද්ධි සේවාවට.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මුදල් සැපයීමක්වත් කරලා නෑ IS විසින්?

පි: මම IS විසින් ස්වාමිනි.

ප්‍ර; මේ කිසිම මුදල් සැපයීමක්වත් එහෙම දෙයක් කරලා නැද්ද ?

පි: රජයක් හැටියටද?

පි: රජයක් හැටියට නෙමේ?

පි: එහෙනම්.

ප්‍ර: ආයේ මේ ?

පි: බුද්ධි සේවා හැටියටද?

ප්‍ර: ඔව් Agency යක් හැටියට supply කරලා නැද්ද මේ ලංකාවේ කිසිම තැනකට මුදල් ?

පි: අනිවාර්යෙන්ම ස්වාමිනි මං ඉතාමත්ම පැහැදිලිව කියන්න ඕනේ මේ කාරණාව එකක් මම කියන්න ඕනේ ලෝකයේ තියෙන ඕනේම බුද්ධි සේවාවකට ඕනම කෙනෙක් recruit කිරීමට සම්පූර්ණයෙන්ම බලතල තියෙනවා. ඒක විශේෂයෙන්ම අපි recruit කරන්නේ සතුරා. මිතුරෝ නෙමේ ඒක ඇවිල්ලා මොන සංවිධානයක් ද මොන රටක ද මොන තරාතිරමකද කියන එක අපිට බලපාන්නේ නෑ. මොකද ඒක තමයි මුළු ලෝකේ බුද්ධි අංශ හැදිලා තියෙන්නේ. හැබැයි මෙතනදි පැහැදිලිව කියන්න ඕනේ ස්වාමිනි ඔය කිසිම suicide carder කෙනෙක්ටවත් සහරාන්ට හෝ කිසිම කෙනෙකුට SIS එක ඇතුලෙන් හෝ යුධ හමුදා බුද්ධි අංශයෙන් සතපහක මුදලක් ලබා දීලා නෑ. ඒ එක්කම මම තව දෙයක් කියන්න ඕනේ මේ සහරාන්ලාට මුදල් ලබා දෙන්න කලින් අපි බලන්න ඕනේ සහරාන්ලාට මුදල් අවශ්‍යද කියලා බලන්නත් ඕනේ ස්වාමිනි මේ ගොල්ලෝ මේ deal කරන්නේ million එක්ක මේ අපි දෙන මුදල් ඇවිල්ලා අපි මේ බුද්ධි අංශයක් හැටියට අපි ගොඩාක් වෙලාවට recruit කරන්නේ මුදල් මත නෙමේ අපි recruit කරන්නේ වෙන වෙන විදියට අපි ඇවිල්ලා ලෝකයේ අනික් රටවල් වගේ මුදල් වියදම් කරන්න

ප්‍ර: නෑ නෑ මං කියන්නේ IS විසින් ISIS සංවිධානය විසින්?

පි නෑ IS විසින් කිසිම එකක් මුදලක් ලබා දීලා නෑ මොකද හේතුව අපි ඉතාමත්ව පැහැදිලියි මේ money trail එක අද වෙනකම් කිසිම Network එකක් පිටරට වෙන්න පුළුවන් ලංකාවේ වෙන්න පුළුවන් ලෝකයේ අනිකුත් මේකට ගොඩාක් අපිට උදව් කරා පස්සේ විවිධ Intelligence සංවිධාන කිසිම Network එකක් අපි establish කරලා නෑ මුදල් එළියෙන් ආවා කියන එක. එහෙම එන්න කිසිම අවශ්‍යතාවයක් නෑ ස්වාමිනි. මොකද ඇති තරම් මුදල් මේකේ මේගොල්ලන්ට තිබ්බා. ඊබ්‍රහම් ලබා දීපු මුදල් ගත්තාම

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මේගොල්ලන්ගේ bank account වල මුදල් ගත්තාම මේවා මං හිතන්නේ පරම්පරා ගාණකට ඉන්න පුළුවන් මුදල් මේ ගොල්ලන් ළඟ තිබ්බා.

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: ඒ මුදල් සහරාන් රැකියාවක් කරලා හම්බ කරපු ව්‍යාපාරයක් කරපු මනුස්සයෙක් නෙමේනේ. ඒ කියන්නේ ව්‍යාපාරයක් කරලා, රැකියාවක් කරලා, රට ගිහිල්ලා හම්බකරපු එක්කෙනෙක් නෙමේනේ එවැනි පුද්ගලයකුට මෙම මුදල් කොහෙන්ද ආවේ මෙච්චර ප්‍රමාණයක්?

පි: ස්වාමිනි මෙතනදී අපි මම පැහැදිලි කිරීමක් කරන්න ඕනේ සහරාන් ඇවිල්ලා පුද්ගලයෙක් පමණයි. සංවිධානය කියන්නේ එකක්. එතකොට මේ සංවිධානයේ හිටියා තවත් පුද්ගලයෝ මේකේ හිටියා ඊබ්‍රහිම්ගේ පුත්තු දෙන්නාම හිටියා. ඒ ඔක්කොම කෝටිපතියෝ. මේ ගොල්ලන්ගේ බෑන්ක් account ගත්තාම ඉතාමත්ම කෝටිගාණක් දීලා තියෙනවා. අපි මේ ගැන තව ටිකක් විමර්ශනය කලොත් මේ දෙන්නා 2016 ඉදන් කාටද donate කරලා තියෙන්නේ, මොන සංවිධානද ඇති කරලා තියෙන්නේ, මොන මොන ආයතනවලට donate වෙලා තියෙන්නේ මේ අතිවිශාල මුදල් කොහේට ද ගියේ කියන එකට අපිට Identify කරගන්න හැකියාවක අපිට ලැබෙනවා. එතකොට විශේෂයෙන්ම මේ වාහන ගැනිම් වලදී ඒගොල්ලන් අතපය දිග ඇරලා මේවා කරා ඒ ගොල්ලන්ට කිසිම මේවා එකක් තිබ්බේ නෑ මොකද ideology එක මේකයි. ඒකම අපිට ඇති තේරුම් ගන්න මේකේ ඉන්න පුද්ගලයන් මේ අපිට මේ දෙන මුදල් වලින් recruit **කිරීමට කිසිමම හැකියාවක් නෑ. ඉතින් මුදල් ඕනතරම් ඒ ගොල්ලන්ට මුදල්වල කිසිම ප්‍රශ්නයක් නෑ ඒ ඇතුලෙන්ම තමයි මුදල් තියෙන තවමත් ඒ මුදල් දැන්** confiscate **කරලා තියෙනවා ඒකේ මුදල් අතිවිශාල ප්‍රමාණයක් ඒ මේ මුදල් වශයෙන් ගත්තම අනිත් එක අපි දැක්කා සහරාන් විශේෂයෙන්ම අන්තිම දවස්වල එයා මරුණයින් පස්සේ හදිසියෙන් කාට හරි ප්‍රශ්නයක් වුනොත් කියලා ඒ ගොල්ලන්ගේ අයියලා මල්ලිලාටත් ලොකු මුදල් ප්‍රමාණයක් මිලියන ගණන් මුදල් ප්‍රමාණයත් විසික් කිරීමක් කලා. එතකොට මේ ගොල්ලන් මේකෙ කිසිම විදේශික රටකට එන්න අවශ්‍යතාවයක් නෑ මේක මේගොල්ලන්ගේ ඇතුලේ තියෙන ආදායම ගත්තම ඇත්තටම මේ ඇටෑක් එකට වියදම් කරලා තියෙන්නේ 10% යක්වත් වියදම් කරලා නෑ ස්වාමිනි.**

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: ඒ ඇතුලේ ආදායම කොපමණ ප්‍රමාණයක්ද?

පි: හොඳටම තියෙනවා මොකද දැන් අපි ඊබ්‍රහිම් ගත්තාම හිරේ ඉන්නේ ඊබ්‍රහිම්ගේ පුත්තු ගත්තාම පුත්තු දෙන්නාගේ business ගත්තාම ආදායම ගත්තාම අති විශාලයි. මේ ගොල්ලෝ තමයි basically මේකට Fund කරලා තියෙන්නේ. අනික මේකේ ළමයිනුත් ඇවිල්ලා ඔක්කොම පිටරට ගිහිල්ලා ආපු ළමයිනේ ස්වාමිනි.

ප්‍ර: එවැනි සංවිධානයක් ඔය විදියට පවත්වාගෙන යාමට දේශපාලන සහාය ලැබිලා තියෙනවාද?

පි: මගේ ඉන්න කාලේ නම් ස්වාමිනි දේශපාලන සහයක් direct සහයක් ලැබුන් නෑ. නමුත් මං අර කියපු දැන් මේ වගේ සහරාන්ලා බිහි වෙන්න ශ්‍රී ලාංකික මුස්ලිම් අනන්‍යතාවය වෙනස් වෙන්න මේකේ මේ වගේ මේකට සියළු දෙනාම ඒ කියන්නේ මේවා කරන්න ඕනේ මුස්ලිම් සමාජය 5% බොහෝම සුළු පිරිසක් මේ සහරාන්ලා කියන්නේ 1% එකක්වත් නෑ නමුත් ඒ ගොල්ලන්ට හැකියාව ලැබුනා අනෙක් කට්ටියව control කරන්න මොකද රජය විසින් එක පැත්තකින් අපි ආගමික නායකයෝ බය වුනා. මේ වෙනුවෙන් එක්කෙනෙකු කටඋස්සලා කතා කරන්න මොකද කතා කරපු එක්කෙනෙකුට කෙලින්ම කටට වෙඩි තිබ්බානේ. ඒ කටට වෙඩි තිබ්බ වෙනුවෙන් බැලුවානේ එයාට කතා කරලා වෙඩි තිබ්බා ගත්ත ක්‍රියාමාර්ග මොකුත් නෑ නේ ස්වාමිනි. එයා ගැන එච්චරයි. තව පල්ලියේ කවුරු හරි කතා කරොත් මීට විරුද්ධව ඒකම තමයි. ඉතින් මේක මුස්ලිම් සමාජයේ මේක නීතිය ක්‍රියාත්මක වුනේ නෑ. නිතිය ඉතාමත්ම මේක සිද්ධවීමක් සිදු වුන් නෑ. ඒ හරහා ඒ සමාජය කවුරුත් මේකට විරුද්ධව කටයුතු කලේ නෑ. හැබැයි මේකේදී මේ අන්තවාදය ගැන කතා කරනවාට මුස්ලිම් සමාජය කැමතිවුන් නෑ. දේශපාලඥයෝ කැමතිවුන් නෑ. ඒක මං පැහැදිලිව දැක්කා 2015 දි මට මේ ගැන ප්‍රකාශ කරන්න කියන කොට මං පැහැදිලිවම සමහර අය මේක දැක්කේ නෑ අපි විසින් බුද්ධි අංශ විසින් මේ කරන්න හදන්නේ මේ තියෙන පක්ෂ කඩන්න හදනවා. මේ මුස්ලිම් ජාතිකයින්ව අයින් කරන්න හදනවා. මේවා ඇවිල්ලා මේ පිළිගන්න එපා සමහර පොලිස් නිලධාරින් නම් වශයෙන් මං කියන්න කැමති නෑ. මේ ගොල්ලෝ ගිහිල්ලා කිව්වා මේ හදන්නේ සම්පූර්ණ බොරුවක් කරන්නේ මේ නැති ත්‍රස්තවාදයක් මේ ගොල්ලෝ බිහිකරනවා කිව්වා මේ තුළින් හදන්නේ මේ, තියෙන මුස්ලිම් support එක නැති කරන්න කිව්වා. ඒවා දේශපාලඥයෝ පිළිගත්තා ඒ අනුව මේවා අපි නොදකින පැති ගොඩාක් තියෙනවා ස්වාමිනි මම දකින විදියට

ප්‍ර: පක්ෂ කඩනවා කියලා කවුද කිව්වේ?

FAIR COMMENT — BY JEZEEM

පි: දැන් අපි ගත්තොත් එහෙම මට විශේෂයෙන් පුද්ගලයෙක් හැටියට කිව නොහැකි වුනාට මේ රටේ තියෙන දේශපාලනය ගත්තාම මේ කිසිම රටකට කිසිම රජයක් පිහිටවන්න බැහැ minority vote එකක් නැතිව. එතකොට මේ minority vote එක නැතිව දේශපාලඥයෝ හොඳටම දන්නවා minority vote එක ආරක්ෂා කරගන්න නම් minority vote එකත් එක්ක තමයි මේරට රාජ්‍ය ඒ කියන්නේ මේක රටක් පිහිටන්න ඕනේ. ඒකටම හරියන පිරිසක් මේකේ බිහිවෙලා ඉන්නවා. ඒකටම ඒ තුලින්ම යන්න පුළුවන්. ඉතින් මම ඒ ගැන වැඩිපුර කතා කරන්න මං හිතන්නේ මට අයිතියක් නෑ ස්වාමිනි නමුත් මම බුද්ධි නිලධාරියෙක් හැටියට මම හැම තිස්සේම මම දකිනවා මේ වගේ අපි නොදකින සමාජයේ ගොඩාක් දේවල් මේකේ සිද්ධ වුනා.ඒ වටම ඊට පස්සේ ඒවා වැඩකරන මිනිස්සුන්ව යම් යම් අපහසුතාවයට පත් කරන්න කටයුතු කරා. තව එකක් කියන්න ඕනේ විශේෂයෙන්ම තව එකදෙයක් වුනා .

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඔබ ඊට කලින් ප්‍රකාශ කරන්න යෙදුනු ප්‍රකාශය පොලිස් නිලධාරින් ගිහිල්ලා ඔබගේ බුද්ධි තොරතුරු හෑල්ලු කිරීමට ලක් කිරීමක් කෙරුවා කියලානේ ඔබ ව්‍යංගයෙන් කියන්නේ ?

පි: අනිවාර්යෙන්ම කරා.

ප්‍ර: ඔබ එය නම් කරන්න ඒ කට්ටිය මේ කොමිෂමේ කටයුතුවලට අවශ්‍යයි.

පි: ස්වාමිනි මට ඒක ඒක මං හිතන්නේ

<u>විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සටහන් කරලා දෙන්න පුළුවන්ද?

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: තාම සේවයේ ඉන්නවාද?

පි: නෑ දැන් තහනම් ඒ ගොල්ලන්ව තහනම් වෙලා ඒ කියන්නේ ඒ ගොල්ලන් අයින් වෙලා තියෙන්නේ හැබැයි මේ පරීක්ෂන පවත්වලා තියෙද්දි දැනට කරන පරීක්ෂණ වලදි ස්වාමිනි එකේ එළිවෙයි මොකද ඒ තුලින් තමයි සමහරවේලාවට දේශපාලඥයෝ misled වුනේ කියලා මට හිතෙනවා. මොකද

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: නම ලියලා දෙන්න පුළුවන්ද?

පි: ආයතනයක් හැටියට DMI එකක් හැටියට මම DMI ප්‍රධානියා හැටියට මගේ අවුරුදු 4 ¼ දි ඒ ආයතනය ක්‍රියා කලාපය අඩු කරන්න ඒ

President's Secretariat
FAIR COMMENT BY JEZEEM

ක්‍රියාකලාපයේ ගත්ත ක්‍රියාමර්ග ගැන ගත්තම ඉතින් මම පැහැදිලිව මම හිතනවා අපි ඒ පිළිබඳව යම් යම් දේවල් සිදුවෙන්න සිදුවුනා කියලා මගේ Assessment එක

ප්‍ර: තමුන් කිව්වනේ නිලධාරියෙක් පොලිස් නිලධාරියෙක් කවුරු හරි නිලධාරියෙක් තමන්ට කිව්වා කියලා මේක මේවා කරන්න මේයා හදන්නේ කියලා මොකක්ද කරන්නේ කියලා මේ තොරතුරු දීලා presentation මේවා කරලා ඒ සම්බන්ධයෙන් බුද්ධි අංශ පක්ෂ කඩනවා ඒ විදයට කවුරු හරි කිව්වා කියලා?

පි: ඔව් ඒ කියන්නේ මං නැවත පැහැදිලි කිරීමක් කරන්නම් ස්වාමිනි විශේෂයෙන්ම අපි ගත්තාම **2015** ඉඳන් අපිට මුහුණ දෙන්න පුළුවන් අභියෝග ගත්තාම අපි බුද්ධි නිලධාරියෙක් හැටියට මට පැහැදිලි අවබෝධයක් තියෙනවා මේ දේවල් කොහොමද සිද්ධ වුනේ කියලා.එතකොට එතනදි විශේෂයෙන්ම.

ප්‍ර: ඔබ කියන්න ප්‍රහාරයට මේ සංවිධානයට සම්බන්ධව පමණයි ?

පි: ඔව් .

ප්‍ර: ඒ කියන්නේ පාස්කු ප්‍රහාරය මේ මේ ත්‍රස්තවාදි සංවිධානයට සම්බන්ධව පමණයි?

පි: එතනදී මට කියන්න පුළුවන් සමහර අවස්ථාවලදී අපිට address කරන්න ඒ කියන්නේ බුද්ධි නිලධාරියෙක් හැටියට මට සමහර forum වල, address කරන්න කිව්වම මේ පිළිබඳව එකසැරේම ගෙන්වා ගැනිමක් නතර වුනා. එතනදි මම කරුණු සොයා බැලුවා ඇයි මාව ගෙන්ව ගත්තේ නැත්තේ කියලා එතකොට මට කරුණු අවබෝධ වුනා ඒකට යම් කිසි හේතුවක් තියෙනවා කියලා. ඒ තුලින් මං ගත්ත assessment එක තමයි මෙතනදි එහෙම වෙන්න හේතුව ඇවිල්ලා යම් කිසි වැරදි අවබෝධයක් මේ ප්‍රචාරය වීම කියන එක තමයි මගේ assessment එක. ඒ අතරේ මුස්ලිම් සමාජය දේශපාලන නායකත්වයත් කවදාවක්වත් පිළිගැනිමක් කරන්න කැමති තිබුනේ නෑ මේ ISIS එක ප්‍රශ්නයක් වෙයි කියලාවත් ISIS එක 37 ඉන්නවා කියන එකත් පැහැදිලි වුනේ නෑ ඒකට හොදම උදාහරණය මට කියන්න පුළුවන් ස්වාමිනි විශේෂයෙන් පාර්ලිමේන්තුවේදී මේ 37 දෙනා පිළිබඳව එවකට හිටපු අධිකරණ ඇමති ප්‍රකාශ කරද්දිත් එතකොට ඒ ගැන කවුරුත් තැකිමක් කරේ නෑ.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඒ හිටපු අධිකරණ ඇමති ඇවිල්ලා කොමිෂම ඉදිරියේ ඊළඟ සතියේ සාක්ෂි දෙනවා එතකොට අපි ඒ ඇමතිවරයාගෙන් කරුණු ලබා ගන්නම්.

FAIR COMMENT BY JEZEEM

අපිට වැදගත් වන්නේ දැන් ඔබ කියන හැටියට ඔබ presentation කෙරුවාම ඒක ඔබ කිව්වා ඔබගේ නිරීක්ෂණය වුණේ කියන එක බරපතල ලෙස ගත්තේ නෑ කියන එක?

පි: ඔව්.

ප්‍ර: අර 2015?

පි: 2015.

ප්‍ර: 2015 දෙසැම්බර්?

පි: ඔව් අන්තිම කාලයේ.

ප්‍ර: දැන් ඒ වගේ ඔබට වෙනත් අවස්ථාවක ආයිත් ඒ වගේ උනාද ඔබ බුද්ධි තොරුතුරු ලබා දීමේදී එය හැල්ලුවකට ලක්කිරිමක් වුනාද?

පි: විශේෂයෙන්ම එක්තරා අවස්ථාවක මේ දේශපාලන කට්ටියට මට Brief එකක් arrange කරලා තිබ්බා මේ ගැන කතා කරන්න කියලා .

ප්‍ර: ඒ ටික කියන්න ඒ විස්තර කියන්න?

පි: කතා කරලා තිබ්බා 2015 මේ ප්‍රශ්නය එනකොට ඊට පස්සේ අන්තිමට කිව්වා ඒක Briefing එක අවශ්‍ය නෑ කියලා

ප්‍ර: කවුද කිව්වේ briefing එක අවශ්‍ය නෑ කියලා ?

පි: ඒ briefing එක අවශ්ය නෑ කියලා මට පණිවිඩයක් ලැබුනා මට එන්න ඕනේ නෑ කියන එක

ප්‍ර: කවුද පණිවිඩය දුන්නේ?

පි: ඒක මට පුද්ගලයා හැටියට හදුන ගන්න කියන්න අමාරුයි ස්වාමීනි ඒක මට මතක නෑ නමුත් ඒක ආරක්ෂක අමාත්‍යාංශයෙන් මට ලැබුණු පිළිතුරක්.

ප්‍ර: Briefing එක ලැස්ති කලේ කවුද?

පි: Briefing එක ලැස්ති කලේත් ඇවිල්ලා ඒ සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශයේ කටයුතු කරන ලද නිලධාරින් තමයි ලැස්ති කලේ Briefing එක.

ප්‍ර: ඒ ලැස්ති කෙරුවේ ඒ කට්ටියගෙන්ම initiative එකෙන්ද නැත්නම් ඔබ කරපු ඉල්ලීමක් මතද?

පි: නෑ.

ප්‍ර: නැත්නම් ඔබ කරපු presentation එකක් ද?

පි: ඒ ගොල්ලන්ගේ මේ සම්බන්ධයෙන් දැන් මූලික වශයෙන් හැම පැත්තෙන්ම පොඩ්ඩ දේවල් වෙන කොට යම් යම් ක්‍රියාමාර්ග ගත යුතුයි කියන ස්ථානයක හිටියා එක්තරා අවස්ථාවකදි ඒක හරි ක්‍රමයට වුනේ නැතත් එතනදි මේකේදී මේ පිළිබඳ අපි කොහොමද discuss කරන්නේ කියන එක ඒ කියන්නේ මේක කොහොමද නවත්වන්නේ ඕනේ මේ පිළිබඳව අවබෝධයක් ඇති කරගන්න ඕනේ සමාජය කොහොමද

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

එක්කාසු කරගන්නේ කියන එක යම් කිසි කතිකාවක් ඇති වුනා ඒ කතිකාවේදී අපි මුස්ලිම් දේශපාලන නායකයන් ගෙනත්ලා අපි මේ පිළිබඳව ප්‍රකාශයක් මේ පිළිබඳ දැනිමක් කරන්න ඕනේ කියන වගේ එකක් ආවා.ඒකේදී මට කාර්යය භාරයක් පැවරුනා ඒක කරන්න පසුව.

ප්‍ර: කවුද ඒක ගෙන්න හැදුවේ?

පි: ඒක ආරක්ෂක අමාතංශයෙන් ස්වාමිනි මට ඒක පුද්ගලයා වශයෙන් මට මතක නෑ ආරක්ෂක අමාත්‍යාංශයෙන් තමයි ඒක suggest කලේ ඒ වගේ දෙයක් **2015** අගබාගේදී තමයි.

ප්‍ර: එතකොට නැවැත්තුවේ අවශ්‍ය නෑ කියලා ඔබට පණිවිඩය දුන්නේ කවුද?

පි: ඒත් ආරක්ෂක අමාත්‍යාංශයේ තමයි මට දුන්නේ මොකද

ප්‍ර: අපට නමක් කියන්න එතකොට අපිට ඒ තැනැත්තාගෙන් ප්‍රකාශයක්?

පි: මට හරියට මතකයක් නෑ ස්වාමිනි.

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: තනතුරවත් කියන්න පුළුවන්ද?

පි: මොකද ඒකට හේතුන් දෙකක් ඇති එකක් ඇවිල්ලා මම දකින විදියට එකක් ඇවිල්ලා තමයි මේක කිරීම තුලින් අනවශ්‍ය ප්‍රශ්නයක් මතු වෙන්න පුළුවන් කියන ප්‍රශ්නයකුත් ඇතිවෙන්න ඇති. අනෙක් ප්‍රශ්නේ තමයි ඇවිල්ලා නෑ එහෙම නෑ මේක ඇවිල්ලා එහෙම එකක් නෙමේ මේක බොහොම සුළුවෙන් යන එකක් මේ කිරීම තුලින් මේ තොරතුරු සියළුම මුස්ලිම් සමාජයට ගිහින් මේක අනවශ්‍ය බියක් ඇතිවෙයිද කියන එකක් කියලා ගන්න ඒක ඉහල ස්ථාන වල ගන්න ඇති මම දන්නේ නෑ මොකක්ද කියන එක මොකද ඒ මගේ assessment එකක් නෙමේ ඒක.

ප්‍ර; ඒ කියන්නේ තමන්ලාගේ බුද්ධිමය තොරුතුරු ගැන විශ්වාස කිරීමක් කලේ නෑ?

පි: ඒක දෙපැත්තටම ගන්න පුළුවන් ස්වාමිනි ඒක එක පැත්තකට ගන්න පුළුවන් සමහරවිට දේශපාලන බලඅධිකාරි කියලා මෙතනදි දේශපාලන බලඅධිකාරි හිතන්න ඇති මේක ඒගොල්ලන්ට දැන් මම විතරක් නෙමේ Assessment එක දෙන්නේ මේක අනිකුත් බුද්ධි නිලධාරින් ඉන්නවානේ මේක එහෙම ලොකුවට ගත යුතු කාරණාවක් නෙමේ මොකද මේක තුලින් නැවත වරක් ඊට වැඩිය ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන් කියන එකත් ගන්න ඇති. අනිත් පැත්තෙන් දේශපාලනික වශයෙන් මේක කිරීම තුළින් මුස්ලිම් සමාජය වෙනස් වීමක් ඇතිවෙන්න පුළුවන් කියන කාරණාවත් ගන්න පුළුවන් ඒ දේශපාලනය ගන්න තීරණ පිළිබඳ අපිට කිසිම හැගීමක් නෑ මොකද අපි එතැන්ට නෑ අපි ඉන්නේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණයෙන්ම බුද්ධිමය පැත්තෙන් රටට තියෙන තර්ජනය හා ඒක counter කරන කියන පැත්ත තමයි අපි බලන්නේ.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබ මීට ඉස්සෙල්ලා ප්‍රකාශ කෙරුවා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කෙරුවා හිටපු අධිකරණ ඇමතිවරයා මේ ISIS එකට ලංකාවෙන් ගිය පවුල් 37 දෙනා ගැන 37 දෙනා ගැන පවුල් පහකින් නේද ගියේ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ ප්‍රකාශයෙන් පස්සේ ඔබගේ කටයුතුවලට යම් කිසි ප්‍රශ්නයක් ඇති වුනාද නැත්නම් ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් කතා කරන එක ආරක්ෂක අංශවල නැවතුනාද?

පි: එවකට හිටියා විශේෂයෙන්ම අපි දැක්කා ඒ ප්‍රකාශයෙන් පස්සේ කිසි වෙනසක් අපි දැක්කේ නෑ ඒ ප්‍රකාශය ගොඩාක් වෙලාවට සැහැල්ලුවට හැල්ලුවට තමයි ලක් කරේ. ඒ ප්‍රකාශය කරයින් පස්සේ ඒ ප්‍රකාශය තුලින් ඒ කියන්නේ කිසිම Counter action එකක් ගත්තේ නෑ. ඒ කියන්නේ අපි තිස්දෙනා තිස් හත් දෙනා පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කරාම ස්වාමිනි එතනදී ගත යුතු පියවරවල් තිබෙනවානම් ඒ පියවර ගත යුතුයි කියලා මම හිතනවා මොකද අපි බලාපොරොත්තු වුනා සමහරවිට තිරණ ගනී කියලා නමුත් එහෙම තිරණයක් අපි දැක්කේ නෑ.

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: Mr සලේ මගේ ප්‍රශ්න ටික මම source එකත් එක්ක කියනවානම් සුදුසුයි කියලා මට යෝජනා වුනා. ඒක නිසා මම අහපු ප්‍රශ්න ටික මම ඔබගෙන් නැවත අසන්නම්. මම කැමති දැනගන්නට පාර්ලිමේන්තු තේරිම් කාරක සභාවට නැගෙනහිර පලාතේ සුෆි මුස්ලිම් පුජක තුමෙක්ක කලිලුල් රහමාන් මොහොමදු සහලාන් එතුමා ප්‍රකාශ කරලා තියෙනවා NTJ සංවිධානයේ **2011** දී කාත්තන් කුඩිය ප්‍රදේශයේ මේ සහරාන් කියන පුද්ගලයා තමයි ආරම්භ කලේ සහ ඔහු මූලික වශයෙන්ම වහබ්වාදය මුල් කරගෙන තමයි එයාගේ සංවිධානය පිහිටවේව්වේ කියලා ඊට පස්සේ **2011** ඉදලා අඛණ්ඩවම **2014,2015,2016,2017** මාර්තු මාසයේ **10** වෙනිදා එහි ඉන්න සුෆි මුස්ලිම්වරු සහ මේ කණ්ඩායම් අතර ඇතිවෙව්ව බරපතල ගැටුමකදි සහරාන් සහ එයාගේ කණ්ඩායම ඒ ප්‍රදේශයෙන් පිටත්වෙලා යනවා. ඒ ප්‍රදේශයේ ජීවත් වෙන්නේ නෑ කියලා. ඒ වගේම මේ මුස්ලිම් පූජකතුමා කියනවා මම ඒකයි ඔබගෙන් ඇසුවේ නැගෙනහිර පලාතේ directorate of Military Intelligence එකේ **unit** එකක් ඔපරේට් වෙනවාද ඔබ කිව්වා මඩකලපුව ප්‍රදේශයේ එකක් තියෙනවා කියලා. එතකොට **2014** නැගෙනහිර පලාතේ හමුදා

Fair Comment BY JEZEEM

අණදෙන නිලධාරි ලෙස කටයුතු කල මේජර් ජෙනරාල් ලාල් පෙරේරා මහතාට පැමිණිලි කරලා තියෙනවා මෙහේ ඉන්න සූෆී මුස්ලිම්වරු සහරාන් කරන දේවල් පිළිබඳව. එතකොට එතුමාත් සහරාන්ට එන්න කියලා අවවාද කරලා තියෙනවා මුස්ලිම් ජනවර්ගය අතර මෙහෙම ගැටුම් ඇති වෙන විදිහට කටයුතු කරන්න එපා කියලා . දැන් ඔබගේ Military Intelligence unit එකට ඔබ අධ්‍යක්ෂක ලෙස ඉන්නකොට මඩකලපුවේ මේ සහරාන්ගේ ආගමික අන්තවාදී කටයුතු පිළිබඳ වාර්තාවෙලා තියෙනවාද ?

පි: ස්වාමිනි මම පළමුවෙන්ම කියන්න ඕනී මම **2011** දී මම ඇවිල්ලා ජාත්‍යයන්තර බුද්ධි කටයුතු පිළිබඳව මම කලේ **2012** තමයි මම **2012** නොවැම්බර් මාසේ තමන් මම බුද්ධි අධ්‍යක්ෂ භාර ගන්නේ. ඒ ඒ බුද්ධි අංශ භාර ගත්තාම ලංකාවේ එකක් විතරක් නෙමේ කණ්ඩායම් මං හිතන්නේ සියගාණුනක් විතර තියෙනවා. සිය ගානක ඔය එක activity එකක් පමණයි ස්වාමිනි ඔබතුමිය කිව්වේ මේ වගේ ගනනාවක්ම තියෙනවා පොලිසියේ පොත බැලුවොත් එහෙම දවසකට සමහර විට දෙක තුන ගානේ තියෙනවා. ඉතින් එතකොට මේ හැම එකක්ම අපිට එහෙම identify වෙන්නේ නෑ මම කිව්වා විශේෂයෙන්ම අපි mechanism එකක් තියෙනවා ඒ ඒ සම්බන්ධ ප්‍රශ්න එද්දි ඒ ඒ mechanism එකෙන්ම ඒ ගොල්ලෝ ගිහිල්ලා මේ සාමයෙන් ඉන්න කියන එක මේවා කරලා කරනවා. හැබැයි එතනදී මෙතනදි පහර දීම් වෙනවා එතකොට යම් යම් මත ගැටුම් වෙනවා.ඒවා අතිවිශාල ගනනාවක්ම තියෙනවා. හැබැයි අපිට detect වෙන්නේ කවුරු හරි එකකට violent එකකට ගියොත් **violent** පැත්තකට ගිහිල්ලා **extreme** පැත්තට ගියොත් අනිවාර්යෙන්ම අපිට ඒක detect වෙනවා ඊට පස්සේ තමයි අපි ඒයාගේ ලෙවල් එක involvement එක අනුව background එක ගිහිල්ලා study කරන්නේ. එතකොට කාත්තන්කුඩි එක ගත්තාම ස්වාමිනි විශේෂයෙන්ම අපි කලින් කියපු විදියට ආරබිකරණයක් එක්ක පොඩි පොඩි group හැදෙන්න පටන් ගත්තා තවුහිද් වගේ එකක් විතරක් නෙමේ ගොඩාක් හැදෙන්න පටන් ගත්තා. ඒ එක්ක විවිධ පල්ලි හැදෙන්න පටන් ගත්තා ඒ අතරේ සහරාන්ලා එක්කෙනෙක් නෙමේ දහ පහලොස් දෙනෙක්ම ඔය Class වල ඉන්න ඇති නමුත් අවසානයේ දී මේ සහරාන්ලා ටික ටික ගිහිල්ලා මේ **10,15** දෙනා අතරින් එක්කෙනෙක් තමයි ඔය **2017** දී ඔය තත්ත්වයට යොමුවෙන්නේ එයා කියන්නේ ඇත්තටම එයාව network එකට එන්නේ ඇවිල්ලා **2017** කියන ඒ වෙලාවේ තමයි නමුත් එයා මීට කලින් violent activity එකක් වෙලා තිබ්බා නම් අනෙක් එකට වැඩිය

FAIR COMMENT BY JEZEEM

President's Secretariat's Copy

significant අනිවාර්යෙන්ම ඒක අපිට එනවා. විශේෂයෙන්ම ස්වාමිනි එක කාරණයක් කියන්න ඕනේ පොඩි පොඩි ප්‍රශ්න වුනාම සමහර ප්‍රශ්න සමථ මණ්ඩලයට දාලා විසඳන ප්‍රශ්න තියෙනවා සමහර ඒවා නඩුව ගෙනියන ඒ level එක අනුව. අර පොඩි දේවල් වෙන ඒවා අපිට .

ප්‍ර: නෑ මෙම සිදුවීම් සමහර අවස්ථාවල මුස්ලිම් ජාතිකයන්ගේ නිවාස එකසිය ගණනකට ගිනි තබලත් තියෙනවා මේ සහරාන්ලාගේ කණ්ඩායම ?

පි: ඔව් මං හිතන්නේ **2017** පස්සේ කියලා මම හිතන්නේ.

ප්‍ර: දෙදහස්?

පි: **2017** න් පස්සේ වෙන්න කියලා මං හිතන්නේ

ප්‍ර: ඒ කියන්නේ ඔබ හිටිය නැති කාලේදිද?

පි: මම **2016** නොවැම්බර් මාසේ පස්සේ යනවා.

ප්‍ර: නෑ එතකොට දැන් ඔබ කියන්නේ military නැගෙනහිර පලාතේ අණ දෙන නිලධාරිතුමාත් සමග ඔබ coordinate වෙන්නෙත් නෑ නේද ඔබගේ unit එකක් සම්බන්ධව?

පි: ස්වාමිනි මම **2016** ලංකාවෙන් යනවා එහෙම නැත්නම්.

ප්‍ර: **2014** සිදුවීමක් ගැන මම මේ කියන්නේ?

පි: ගෙවල් එකසීය ගානක් ගිනි තියලා තියෙනවානේ.

ප්‍ර: නෑ නෑ military intelligence එක්කෙනා?

පි: ඔය සිදුවීම ස්වාමිනි ඉතාමත්ම පොඩි සිදුවීමක් එය වගේ සිදුවීම් රාශියක් සිදු වෙනවා. රාශියක් සිදුවීමේදී ඒ හැමෝම engagement එකක් වෙනවා. සහරාන් කියන කෙනා ඇවිල්ලා විතරක් නෙමේ ඒ කාලේ ගත්තොත් අපි ලග දහස් ගානන් ඇති ඔය වගේ නම් ඒවා ඇවිල්ලා සමථ මණ්ඩලය වගේ විසඳනවා. නමුත් කොහේ හරි ගිහිල්ලා ගෙවල් ගිනි තියලා වුනොත් අනිවාර්යෙන්ම අපිට රේකෝඩ් එකක් එනවා. එතකොට අපි ඒක ගන්නවා. දැන් ඔබ තුමිය කියපු දෙදහස් ගිනි තියපු එක ඇවිල්ලා **2017** වෙච්ච සිදුවීමක් සහරාන්ලා ඔය තත්ත්වයට develop වුණේ ඇවිල්ලා සමාජයත් එක්ක ඇවිල්ලා ඒ activity එක කරන්න පටන් ගත්තාම තමයි අපිට ප්‍රශ්නේ තියෙන්නේ **2010** activity වෙනකොට මෙයා රෙකෝඩ් එකට ආවාට පස්සේ ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක තමයි ගැටළු සහගත වෙන්නේ ස්වාමිනි නමුත් **2016** මගේ කාලයේදී එහෙම කෙනෙක්ව මට locate වුනේ නෑ.

ප්‍ර: සහරාන් IS සංවිධානයත් එක්ක සම්බන්ධයි කියලා දැන් මේ ප්‍රහාරයෙන් පස්සේ IS සංවිධානයේ Ama ද news agency එක ප්‍රකාශයක් පත්කරානේ ටිකක් ප්‍රමාද වෙලා සහාරාන්?

පි: ඔව් ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: ඒක පිළිබඳ ඔබට මොකක්ද කියන්න පුළුවන්? සහරාන් IS සංවිධානයත් එක්ක සම්බන්ධ දැන් ඔබ මේ දක්වාම ප්‍රකාශ කරේ ජමතේ මිල්ලතේ ඊබ්‍රහිම් කියන සංවිධානය තමයි විශාල වශයෙන්ම IS සංවිධානයත් සමඟ සෘජු සබඳතා පැවැත්තුවේ විදේශ රටවල්වල විවිධ දේවල් කරානේ දේශිය ඒවත් කරා එහෙම?

පි: ඔව්.

ප්‍ර: එය දැන් මොහොමඩ් සහරාන් කියන පුද්ගලයා මේ අප්‍රේල් 21 බෝම්බ ප්‍රහාර කලාට පස්සේ එයාගේ කණ්ඩායමත් එක්ක Ama ද nuws agency එක IS එකේ ප්‍රධාන සංවිධානය මාධ්‍යවලින් ප්‍රචාරය කරන්නේ ටිකක් ප්‍රමාද වෙලා. එතකොට ඒ ප්‍රමාදයට හේතුවත් මේIntelligence Report එකක් තමයි තියෙන්නේ military එකේ. ඒ සහරාන් කියන පුද්ගලයා ත්‍රස්තවාදී සංවිධානයේ පිළිගත්ත ශ්‍රී ලංකාවේ පිළිගත්ත පුද්ගලයා ලෙස IS සංවිධානයේ ඉරාකය බේස්කරගත්ත මවු සංවිධානය පිළිගෙන තිබුනේ නැහැලු. ඒක නිසා බයිඅත් කරලා නැති නිසා මෙයාව බයියත් කරන්න ඕනෑ එහෙම කරලා තමයි මේ ගොල්ලො declare කරේ මේ IS එක සම්බන්ධයි සහරාන්ලා කියලා ඔබට Intelligence officer කෙනෙක් හැටියට කියන්නට පුළුවන්ද ඇත්තටම මේ සහරාන්ලා IS එකත් එක්ක සම්බන්ධ පුද්ගලයෝ පිරිසක්ද කියලා ?

පි: ස්වාමනි මගේ දැනුමේ හැටියට අනිවාර්යෙන්ම physical සම්බන්ධතාවයක් නෑ ස්වාමීනි මොකද එතනදි සහරාන් සම්පූර්ණ කටයුතු කරන්නේ inspiration එකත් දැන් statement එක්ක ඕන කෙනෙකුට issue කරන්න පුළුවන්. හැම incident එකක් වුණාම සම්බන්ධය හෝ නැතිව මේගොල්ලො කරනවා දැන් උදාහරණයක් වශයෙන් ගිය සතියේ මාලදිවයින ජාතිකයෝ පස්දෙනෙක් අත් අඩංගුවට පත්වුනා ඒගොල්ලෝ යන ගමන් tourist ලාගේ කපාගෙන ගිහිල්ලා මේ tourism එක අයින් කරන්න ඕනේ IS සංවිධානයේ Ideology එකත් එක්ක ඉන්න කණ්ඩායමක්.

ප්‍ර: මං හිතන්නේ ඔබ කියනවාද මේ සහරාන් IS එකත් එක්ක සම්බන්ධව එහෙම නැත්නම් සම්බන්ධ නැද්ද spiritually හරි physically හරි?

පි: අනිවාර්යෙන්ම spiritually සම්බන්ධයි ස්වාමිනි.

ප්‍ර: සම්බන්ධයි නේද?

පි: නැත් නම් ඒ ideology එකනේ කරන්නේ. ඒ caliph එකත් එක්කනේ මෙයාලායන්නේ physical සම්බන්ධයක් නෑ.

ප්‍ර: ඔබගේ ප්‍රකාශයේ මෙම පොලිස් ඒකකයට ලබා දී ඇති ප්‍රකාශයේ තියෙනවා ඔබ සඳහන් කරලා ජමාතේ ඉස්ලාමිය සංවිධානය JIA එක එතකොට ඒ ජමාතේ ඉස්ලාම් සංවිධානයේ මේ හජ්ජුල් අක්බර් කියන

FAIR COMMENT BY JEZEEM

පුද්ගලයාගේ නමත් ඕකේ තියෙනවා. එතකොට ජමාතේ ඉස්ලාමිය සංවිධානය සම්බන්ධ වුනාද මේ අප්‍රේල් මාසේ 21 ප්‍රහාරය හා ඊට ප්‍රථමයෙන් ඇතිවෙච්ච මාවනැල්ල බුදු පිළිම වනාතවිල්ලුව එවැනි දේවල්වලට සම්බන්ධ වුණයි කියලා බුද්ධිතොරුතුරු තියෙනවාද?

පි: ස්වාමිනි මෙහෙමයි මුල් කාලේදී මේක IS එකට සම්බන්ධයක් කියලා ආවේ නෑ. නමුත් අපි investigation කරගෙන යන කොට දැන් උදාහරණයක් වශයෙන් හක් කියන පුද්ගලයා බුදුපිළිම එකට ඒයා ඇවිල්ලා JI එකේ සාමාජිකයෙක්. නමුත් ප්‍රශ්නේ තියෙන්නේ අපි නිලාම් මැරුනා කියලා නිලාම් අපිට කියන්න බෑනේ එයා විශේෂයෙන්ම trinity college එක මේක සම්බන්ධයි කියලා. ඉතින් මම කියන්නේ ඒ වගේ JMI එකේ ලොකු අපි මේකක් කියන්නේ. මේකේ සමහර පුද්ගලයින් මේකෙන් කඩාගෙන ගිහිල්ලා ඒ ideology එක යනවා.එතකොට ස්වාමිනි ප්‍රශ්නේ තියෙන්නේ එක සංවිධානයක් හැටියට ලොකු involvement එකක් අපි දකිනනේ නැහැ. නමුත් මං කියපු මුස්ලිම් සංකල්පය අපි පොඩ්ඩක් එහා පැත්තට ගිහිල්ලා ශ්‍රී ලාංකික මුස්ලිම් තත්ත්වයෙන් මේකේ බෙදුනාම මේකේ හැමදේටම indirectly contribution එකක් එනවා කියලා මම දකිනවා මේ සහරාන්ලා ඔක්කොම බිහි වෙන්නේ ලොකු සමාජය තුල මේ අරාබිකරණය කරන එක තුල මේ මුස්ලිම් බිහිවෙන්නේ මේ JI කියන සංවිධානය direct involvement එකක් අපි දකින්නේ නෑ.

දැන් වේලාව:ප.ව.7.55
මෙතැන් සිට: ල/ලේ දම්මිකා මිය

President Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

මුල් කොටස වාර්තා කලේ සචිනි මෙනවිය විසින්ය.
දැන් වේලාව ප.ව. 7.50 යි.
මෙතැන් සිට වාර්තා කරන්නේ ධම්මිකා පෙරේරා විසින්ය.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:

ප්‍ර: දැන් ඔබ කියා සිටියා මේ විජේදාස රාජපක්ෂ ඇමතිවරයා එවකට සිරියාවේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලාංකිකයන් 37 දෙනා සම්බන්ධයෙන් ප්‍රකාශයක් කලා පාර්ලිමේන්තුවේදී. දැන් ඔබට හැකියාවක් තියෙනවද මේ කොමිෂන් සභාවට කියන්න එම තොරතුරු විජේදාස රාජපක්ෂ මහතා වෙත ලැබුනේ කොහොමද කියලා?

උ: මට ඒක කියන්න පුළුවන් ඔබතුමා අහන ප්‍රශ්නය නිසා, ඒ තොරතුර ලබා දුන්නේ මමයි.

ප්‍ර: දැන් මා මීට පෙර ඔබගෙන් විමසා අසමින් සිටියේ ඔබ විසින් ඉදිරිපත් කරන්නට සහ සකස් කරන්නට යෙදුනු වාර්තාවන් සම්බන්ධයෙන්.

ප්‍ර: මේ අවස්ථාවේදි Report on Sri Lankan National Militants (Said to be dead) Express Support to the Islamic State of Iraq and Syria ISIS වශයෙන් තිබෙන ලේඛනය
මෙය DMI එක විසින් සකස් කරපු ලේඛනයක්ද?

උ: ඔව් අපි විසින් සකස් කරපු ලේඛනයක්.

එම ලේඛනය **C270** ලෙස එම ලේඛනය ලකුණු කර ඉදිරිපත් කරනවා.

ප්‍ර: මෙම ලේඛනය ඔබ විසින් ඒ කියන්නේ DMI එක විසින් කවද්ද ඉදිරිපත් කලේ කියලා කියන්න ඔබට හැකියාවක්, කොයි කාලෙද?

උ: මේක ඉදිරිපත් කලේ 2015 දෙසැම්බර් මාසෙදී.

ප්‍ර: කාටද ඉදිරිපත් කලේ?

උ: ඒ හැම එකක්ම අර විදියට තමයි යන්නේ යුධ හමුදාපතිට පෙන්නලා එතනින් අපි ආරක්ෂක අමාත්‍යාංශයට යවනවා.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:

ප්‍ර: ඒ කියන්නේ ඒ කාලේ හිටපු යුධ හමුදාපති ක්‍රිශාන්ත ද සිල්වා මහතා?

උ: ක්‍රිශාන්ත ද සිල්වා මහතා.

ප්‍ර: ඔබගෙන් අර මීට කලින් දීපු උත්තරයට ප්‍රශ්නයක් තියෙනවා, ඔබ ඒ විදියට ඒ තොරතුරු එවකට හිටපු අධිකරණ ඇමතිවරයාට සැපෙව්වේ ඇයි? අපිට නිගමන එන්න පුළුවන් නමුත් අපි ඔබෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා?

FAIR COMMENT BY JEZEEM

උ: මම හැම තිස්සේම විශ්වාස කරනවා ස්වාමීණි අපේ බුද්ධි නිලධාරියෙක් හැටියට මගේ ලොකු රාජකාරියක් තියෙනවා, විශේෂයෙන්ම මේ රටට අපේ රාජකාරිය සීමාවක් නැහැ අංශක තුන්සිය හැටකට අපි බැදිලා ඉන්නවා. එතකොට අපි මේ තත්ත්වයට එන්න බුද්ධි නිලධාරියෙක් සහ මේ කණ්ඩායමක් හැටියට අති විශාල කැපවීමක් කරන්න වෙනවා. ඒ කැපවීම අපිට වතුරට යන්න දෙන්න බැහැ ස්වාමීණි. ලෝකේ ඕනම රටක බුද්ධි අංශයක් එහෙම තමයි. මොකද ඒගොල්ලන් ක්‍රියා කරද්දි හැම තිස්සේම නීති රාමුවක් එක්ක ක්‍රියා කරන්න බැහැ. මේකේදි විශේෂයෙන්ම මම දැක්කා මම මේකෙදි මේ threat එක මෙහෙම Develop වෙන කොට මේක ලොකු ප්‍රශ්න සහගත තත්ත්වයක්. එතකොට මම මේකේදි මම සමහරක් මගේ ඉහල මම විශ්වාස කරන නිලධාරින්ට මම කතා කරලා ඇහුවා රටට ආදරේ දැන් මේක මෙහෙම වෙනවා මොකද මම කරන්නේ කියන එක. ඊට පස්සේ එහෙම නම් මේක අපි අර Proposal එකේ පැහැදිලිව තියෙනවා විශේෂයෙන්ම නීති හදන්න ඕනේ මොකද මේ නීති හරියට හදන්නේ නැත්නම් අපිට මේ අයව අත්අඩංගුවට ගන්නත් බැහැ, engagement process එකට යන්නත් බැහැ. ඒ අනුව මම තීරණය කලා හොඳම කෙනා තමයි විශේෂයෙන්ම මගේ බුද්ධි මේක අනුව සාමාන්‍යයෙන් අධිකරණය පිළිබඳව මගේ දැනුම නෙමෙයි එතුමාට තිබෙන දැනුම සහ ඒ අනුව විශේෂයෙන්ම ඒ සම්බන්ධයෙන් ඒ දවස්වල කතා කිරිමක් කලා යම් යම් දේවල් කතා කිරිමක් කලා. ඒ නිසා මම අදුරගෙන හිටියේ නැහැ, නමුත් මම එතුමාගේ address එක ඔක්කොම අරගෙන මම ගිහිල්ලා එතුමාව හම්බ වෙලා කිව්වා මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා මේක ලොකු ප්‍රශ්නයක් ඉස්සරහාට වෙයි මේක ගත්තේ නැත්නම් ඒක නිසා ඔබතුමාට මම කිව්වේ නැහැ පාර්ලිමේන්තුවේ කියන්න මම එහෙම එකක් කිව්වේ නැහැ ඔබතුමාව දැනුවත් කෙරෙන්න මම අදහස් කලා විශේෂයෙන්ම මේකෙන් දකින threat එක නිසා. එපමණක් නෙමෙයි මේ වගේ රාජකාරි කිරිමේදි අනෙකුත් යම් යම් වෙන වෙන ක්‍රියා මාර්ගත් ගත්තා. මේ මට උසාවියේ ඒ කියන්නේ කියන්න බැරි ක්‍රියාමාර්ග අපි ගත්තා පුළුවන් තරම් මේක convince කරන්න හැම පැත්තකින්ම. අනෙක් පැත්තෙන් අපිට කරන්න පුළුවන් රාජකාරිය මේකට අපි සීමා වුනේ නැහැ ඒකයි මම පැහැදිලිවම කිව්වේ මේ 37 දෙනාට ගියාට පස්සේ කිසිම කෙනෙක් ගියේ නැහැ. අපි කරපු Physical action එකක් අපි ඒක නොකල තිබ්බා නම් අද මේ 37 ඊට වැඩි ප්‍රමාණයකට අද සීමා වෙන්න තිබ්බා. නමුත් අපි ගත්ත ක්‍රියාමාර්ග බුද්ධි අංශයක් හැටියට initiative අරන් ගත්ත ක්‍රියාමාර්ග අඩු පහසුකම් යටතේ ඒක නිසා අපිට හැකියාව

ලැබුනා ගිය 37 දෙනාට හැරෙන්නට වෙන කිසිම කෙනෙක් ඒ රටට නොයන්න කටයුතු කරන්න.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර: ඒ විජේදාස රාජපක්ෂ මහත්තයා හැරුණු විට වෙන කාටවත් කියපු කට්ටිය කියන්න පුළුවන්ද?

උ: ඇත්තටම මම එහෙම කිව්වොත් එතුමන්ලා අපහසුතාවයට පත් වෙන හින්දා ස්වාමිණි මට ඒක කියන්න බැහැ ස්වාමිණි අපි රාජකාරි කිරීමේදි ගොඩක් විශ්වාසයකින් අපි කටයුතු කරන්නේ, ඉතින් ඒක නිසා ඒක මට කියන්න අපහසුයි ස්වාමිණි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>

ප්‍ර: මෙම ලේඛනය ඔබ කියා සිටියා C270 හමුදාපතිවරයා වෙත ඔබ ඉදිරිපත් කලා, ඉන්පසුව එය ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කල බව. ආරක්ෂක අමාත්‍යාංශයේ කා වෙතද මෙම C270 යොමු කලේ?

උ: අපි මේ හැම එකක්ම යවන කොට ඒ කියන්නේ මම අතින් ගිහිල්ලා බාර දෙන්නේ නැහැ. ආරක්ෂක ලේකම්තුමාට address කරලා තමයි අපි මේ ලිපි යවන්නේ.

(මේ අවස්ථාවේදි Muslim Organization / Groups and its activities in Sri Lanka යන මැයෙන් සකස් කර ඇති වාර්තාවක් සාක්ෂිකරුට පෙන්වා සිටිනවා)

ප්‍ර: මෙම වාර්තාව DMI විසින් සකස් කරපු, පිළියෙල කරපු වාර්තාවක්ද?

උ: ඔව් මේක DMI විසින් සකස් කරපු වාර්තාවක්. මේක මතක නැහැ මගේ කාලේ කරපු වාර්තාවක්ද කියලා මට මතක නැහැ.

ප්‍ර: මේ වාර්තාව ඔබේ කාලේ සිදු කලාද නැද්ද කියලා ඔබට මතකයක් නැහැ,

උ: ස්වාමිණි මට මතකයක් නැහැ මම මේක prepare කලාද කියන එක. අනිවාර්යයෙන් මේක DMI වාර්තාවක්. නමුත් මේක මගේ කාලේ වුණාද 2016 න් පස්සේ ගියාද කියලා මට මතකයක් නැහැ. මොකද අරවා මම පැහැදිලිවම

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර: මේකේ කවුද අත්සන කියලා දන්නේ නැද්ද?

උ: අත්සන් මුකුත් නැහැ ස්වාමීණි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර: මේ ලේඛනය ගත්තේ පිටපතක් කොහේ හරි තියෙනවද?

උ: ඔව් මේකේ ඔක්කොම ගත්තේ මම ඇවිල්ලා DMI එකෙන්. මොකද මම ලඟ එක මේවා එකක්වත් අපිට තියා ගන්න බැහැ ස්වාමීණි. දැන් මේ නඩු විභාගයට එද්දි මම කිව්වා මගේ කාලේදි ලියපු සියළු ඒ Document ටික, මේ Document විතරක් මීට වැඩිය අපි ගණනාවක් ලියුම් ලියලා තියෙනවා ඒකේ. මොකද මට Access එක නැහැ, මොකද මම Director SIS නිසා. නමුත් DMI හැටියට මට මේවා හොඳට මතකයක් තියෙනවා Presentation කරපුවයි මම කරපු පොතුයි ඒක නිසා මම ඒ ඉන්න CNI හරහා බුද්ධි අධ්‍යක්ෂකට දැනුම් දුන්නා මට මේ පොත් ටික අවශ්‍යයි, සාක්ෂි දෙන්න යන්න කියලා, ඒ අනුව තමයි මම මේකේ Originals ටික ගෙන්න ගත්තේ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>

Muslim Organization / Groups and its activities in Sri Lanka යන මැයෙන් සකස් කර ඇති වාර්තාවක් **C271** ලෙස ලකුණු කර ඉදිරිපත් කරනවා.

(2016 ඔක්තෝබර් ලෙස සඳහන් ශ්‍රී ලංකාව වෙත පැමිණෙන විදේශීය ආගමික දේශකයන් අධ්‍යාපනය හැදෑරීමට පැමිණෙන්නන් හා ශ්‍රී ලංකාවෙන් විදේශීය ආගමික ශිෂ්‍යත්ව ලබා විදේශගත වන අයවලුන් සබැඳි අධ්‍යයනය හා ඒ තුලින් ජාතික ආරක්ෂාවට සිදු වන බලපෑම නිර්දේශ යන මැයෙන් තිබෙන වාර්තාව සාක්ෂිකරුට පෙන්වා සිටි)

ප්‍ර: මෙම ලේඛනය ඔබට හඳුන ගන්න හැකිද?

උ එසේමයි ස්වාමීණි.

ප්‍ර: කුමක් වශයෙන්ද ඔබ මෙය හඳුනා ගන්නේ?

උ: මේක **2016** ඔක්තෝබර් වල මම prepare කරපු Document එකක් මගේ staff එකත් එක්ක එකතු වෙලා. මේක විශේෂයෙන්ම දැන් අර මා කරුණු ගණනාවක් කිව්වා මේ කරුණ මම වෙනමම මම කතා කරලා

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

තියෙනවා විශේෂයෙන්ම ලංකාවට පැමිණෙන විදේශිය ආගමික දේශකයින් අධ්‍යාපන හැදෑරීමට පැමිණෙන්නන් හා ශ්‍රී ලංකාවේ විදේශිය ආගමික ශිෂ්‍යත්ව ලබා විදේශගත වුවන් සැබැදි අධ්‍යනය හා ඒ තුලින් ජාතික ආරක්ෂාවට සිදු වන බලපෑම පිළිබඳව කරපු brief research එකක Document එක තමයි මේකේ තියෙන්නේ.

මෙම ලේඛනය **C272** ලෙස ලකුණු කර ඉදිරිපත් කරනවා ස්වාමීණි.

දැන් වේලාව ප.ව. **8.10** යි.
නැවතත් හෙට දින **(2020.02.21)** උදෑසන **10** ට කොමිෂන් සභාව රැස්වන බව දන්වා සිටී

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: **2020.03.07** වේලාව: පෙ.ව.**10.20**
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 හිටපු ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:	**430**
නම	:	මොහොමඩ් ඉස්මත් රිස්වින්
වයස	:	අවුරුදු **41**
ආගම	:	නිරාගමික
රැකියාව	:	සුළු මැණික් ව්‍යාපාර
ලිපිනය	:	**72,** දෙවෙනි මාළිගාකන්ද පටුමඟ, මරදාන, කොළඹ **10**

සාක්ෂිකරු ඉංග්‍රීසි බසින් ප්‍රතිඥා දෙයි.
මම මේ කියන සාක්ෂිය, සැබෑය, සම්පූර්ණ සැබෑය, සැබෑවක් මිස අන් කිසිවක් නොකියන බවට ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනෙවිය</u>

ප්‍ර : ඉස්මත් මහත්මයා ඔබ මේ ගරු කොමිෂන් සභාවට පැමිණිලා මේ ආකාරයට සාක්ෂි දීමට තීරණය කෙරුවේ ඇයි?

පි : උපතින් ඉස්ලාම් භක්තිකයෙක් වූ මම යම් කිසි කාලේක දැන ගත්තා මේකේ වැරදි දේවල් තියෙනවා කියලා. ඊට පස්සේ මම ආගමෙන් එළියට ආවා. මේ වැරදි දේවල් ඒ වගේම රටේ සිදු වන භයානක දේවල් මේ ආගම විශ්වාසය හින්දා මම මට තේරුම් ගන්න පුළුවන් වුණා ඒ ගැන මම පොලිසියට සහ ආරක්ෂක අංශවලට පැමිණිලි කළා **2016** ඉදලා. ඒ ගැන මම දන්නා තරමට කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තේ නෑ. එතකොට මේ කොමිෂන් සභාව ගැන දැන ගත්තට පස්සේ මට හිතුනා මේ කොමිෂන් සභාව ඉදිරියට ඇවිල්ලා සාක්ෂි දීමෙන් යම් කිසි යහපතක් රටට හා ජනතාවට ඒ වගේම ලෝකයට ආදර්ශයක් වෙන්න පුළුවන් කියන මතය.

ප්‍ර : ස්තූතියි. ඔබ අද දින මේ කටයුතු ආරම්භයේදී ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා ඔබ නිරාගාමිකයෙක් කියලා. ඇයි ඒ කියලා ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : මම ඉපදුණේ මුස්ලිම් හැටියට. මම මගේ family එක ජීවත් වෙච්ච පරිසරය අනුව මට ඒ ආගම තමයි පිළිපදින්න වුණේ. ඒ ආගම මම සාමාන්‍ය මුස්ලිම් කෙනෙකුට වඩා යම් කිසි මට්ටමට ගැඹුරට ඉගෙන ගත්තා. ඒ වගේ Chances මට ලැබුණා. ඊට පස්සේ මම ඒක ඉගෙන ගෙන යනකොට මට තේරුණා මේකේ ගොඩක් ප්‍රචණ්ඩකාරී දේවල් තියෙනවා. ඒ වගේම ඒකේ නිර්මාතෘවරයා සාමාන්‍ය මිනිහෙක් හැටියට අපිට අද කාලේට පිළිගන්න බැරි තත්ත්වයේ දේවල්වලට දේවල් ඒ කාලේම කරලා

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඒක ලෝකයාටම සදාකල් කරන්න පුළුවන් Good examples කියලා පෙන්නුම් කරලා තියෙනවා. ඒක පිළිගන්න බෑ කියන එක මගේ බුද්ධියට දැනුණා. ඊට පස්සේ මම ආගමෙන් අයින් වුණා. වෙන ආගමක් අදහන තරමට මට satisfaction එකක් තිබුණේ නෑ.

ප්‍ර : ඔබේ පිළිතුර සලකලා බලන කොට එහි අඩංගු වෙලා තිබෙනවා ඔබ මුල් අවස්ථාවේදී අදහන ලද ආගමත්, ඒ වගේම පසු අවස්ථාවලදී බුද්ධිගෝචරව සලකලා බලලා එම තමන් අදහන ලද ආගමෙන් ඇයි ඔබ අයින් වෙන්නට තීරණය කළේ කියන කරුණක් පිළිබඳව නේද?

පි : ඔව්.

ප්‍ර : එහෙම නම් අපි ගරු කොමිෂන් සභාවේ දැන ගැනීම පිණිස ඔබේ ඉතිහාසයේ පටන් මේ දක්වා ඔබ කොයි ආකාරයටද ජීවිතේ කටයුතු කරලා තියෙන්නේ කියන එක පිළිබඳව දැන් විමසලා බලමු. මගේ සහෝදර නිලධාරී මහත්මයා ඔබෙන් ඒ පිළිබඳව ප්‍රශ්න අසනවා ඇති.

පි : Thank you.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ ඔබගේ ප්‍රශ්නවලට ඔබගෙන් සාක්ෂි ලබා ගන්නේ පිටස්තර පුද්ගලයින් සහ මාධ්‍යය නැතුව. ඒක හින්දා ඔබට නිදහසේ කරුණු දක්වන්න පුළුවන්.

පි : බොහොම ස්තූතියි.

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර : මොහොමඩ් ඉස්මත් රිස්වින්? ඔබ උපත ලබන්නේ කොහේද?

පි : යාපනයේ මානිප්පායි පෞද්ගලික රෝහල.

ප්‍ර : ඔබගේ මවගේ සහ පියාගේ නම ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න?

පි : පියාගේ නම අබ්දුල් මජීත් මොහොමඩ් ඉස්මත්. මවගේ නම සිත්ති රෆායි ඉස්මත්.

ප්‍ර : ඔබට සහෝදර හෝ සහෝදරියන් සිටිනවාද?

පි : සහෝදරියෙක් ඉන්නවා.

ප්‍ර : සහෝදරිගේ නම කුමක්ද?

පි : රිෂ්වියා ඉස්මත්.

ප්‍ර : දැන් ඉස්මත් ඔබ යාපනයේ ඉඳලා ඔය යාපනයේ තමයි මූලික අධ්‍යාපනය ලබන්නේ?

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : මොකක්ද පාසල?

පි : යාපන මධ්‍ය මහා විද්‍යාලය.

ප්‍ර : ඊට පස්සේ ඔබ වෙනත් පාසලකට ඇතුළත් වෙනවාද?

පි : 1990 න් පස්සේ මාවනැල්ල සහීරා විද්‍යාලයට ඇතුළත් වෙනවා.

ප්‍ර : ඔව්. එම පාසලේ ඔබ මුහුණ දෙන ප්‍රධාන විභාගයන් මොනවාද?

පි : අටවෙනි වසරේ first term exam එක. ප්‍රථම first ..

ප්‍ර : මම මෙහෙම ප්‍රකාශ කළොත් ඔබ සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සඳහා පෙනී සිටියේ මෙම සහීරා විද්‍යාලයේ සිසුවෙකු වශයෙන් කිව්වොත් නිවැරදිද?

පි : ඔව්. සාමාන්‍ය පෙළ examination එක කරන්නේ මාවනැල්ල සහීරා විද්‍යාලයේ.

ප්‍ර : උසස් පෙළටත් පෙනී සිටින්නේ?

පි : උසස් පෙළ මම private කරනවා . මොකද ඒක one time මම I have to skip the examination මට. ඉස්කෝලෙන් කරන්න බැරි වෙනවා.

ප්‍ර : ඊට පස්සේ ඔබ මුහුණ දෙන ඔබ වැඩිදුර අධ්‍යාපනය ලබනවාද?

පි : ඔව්.

ප්‍ර : මොනවද වැඩිදුර අධ්‍යාපනය කියලා ඔබ හදාරන විෂයන් මොනවාද?

පි : පරිගණකය ගැන යම් කිසි මට්ටමකට ඉගෙන ගන්නවා. ඒ වගේම විදේශ භාෂා තුනක් මම ඉගෙන ගත්තා. ඒ කියන්නේ උසස් පෙළ විභාගය සමත් වෙන කොටවත් මගේ ඉංග්‍රීසි දැනුම තිබ්බේ නෑ. ඉංග්‍රීසි භාෂාව හා ප්‍රංශ හා ජර්මන් ඒ තුනම මම ඉගෙන ගත්තා.

ප්‍ර : කොහේන්ද ඒ භාෂාවන් ඉගෙන ගත්තේ?

පි : මාවනැල්ලේ හිටියා එක්මන් උනම්බුව කියලා ගුරුවරයෙක් එයා ගාව තමයි එතුමා ගාව තමයි sorry මගේ වචනවල වරදක් තියෙනවා නම් හරිගස්ස ගන්න මොකද සිංහල මගේ මව් භාෂාව නෙවෙයි. එතුමා ගාව තමයි ඉංග්‍රීසි හා ප්‍රංශ භාෂාව ඉගෙන ගත්තේ. ඊට පස්සේ French වැඩිදුර අධ්‍යාපනය සඳහා මහනුවර පිහිටි Alliance Francaise de Kandy ආයතනයට මම එකතු වෙනවා. ජර්මන් භාෂාව ඉගෙන ගත්තේ ඒත් මාවනැල්ලේ ජර්මන්වල ඉගෙන ගත් සරත් දයානන්ද කියලා විශ්‍රාමික ඉංජිනේරු මහත්මයෙක් හිටියා. එයා ගාව ඉගෙන ගත්තා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඔබ පෞද්ගලිකව ගුරුවරයන් මාර්ගයෙන් මේ භාෂාවල් ඉගෙන ගත්තා කිව්වොත් මම නිවැරදිද?

පි : ඔව් පෞද්ගලිකව හා Alliance Francaise de Kandy is an institute.

ප්‍ර : ඊට පස්සේ ඔබ ඔබගේ ජීවනෝපාය නැත්නම් රස්සාව ලෙස පළවෙනියෙන්ම තෝරා ගන්නේ කුමක්ද?

පි : පළවෙනියට මම spice garden එකේ සංචාරක ව්‍යාපාරය සම්බන්ධ ඒකට තමයි joined වෙන්නේ.

ප්‍ර : කුමන වර්ෂයේද ඒ?

පි : මට මතක හැටියට 2003 වර්ෂයේ වෙන්න ඕනී. 2002 නැත්නම් 2003 වෙන්න ඕනී.

ප්‍ර : ඔබ අපට ලබා දී තිබෙන තොරතුරු අනුව 2004 කිව්වොත් මම නිවැරදිද?

පි : 2004 මම එකතු වෙන්නේ මැණික් ව්‍යාපාර ක්ෂේත්‍රයට. ඒකේ වෙළෙඳ salesman කෙනෙක් හැටියට. ඒකත් මේ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ එකක්.

ප්‍ර : ඊට පස්සේ ඔබ යොමු වන්නේ කුමන රස්සාවටද?

පි : ඊට පස්සේ 2004 සුනාමි බෙදවාජකය සමඟ මම ටික කලකින් ඒ රස්සාවෙන් අයින් වෙලා මාවනැල්ලේ Orange Agent ගාව office management එකට එකතු වෙනවා.

ප්‍ර : ඊට පස්සේ ඔබ වෙනත් රස්සාවකට යෙදෙනවාද?

පි : සෞවුදි අරාබි යාමට යනවා 2009 ජුනි මාසේ රස්සාවක් සඳහා.

ප්‍ර : කවදද ලංකාවට පැමිණෙන්නේ?

පි : 2011 අන්තිම.

ප්‍ර : ඊට පස්සේ ඔබ ජීවනෝපාය ලෙස තෝරා ගන්නේ කුමක්ද?

පි : සුළු මැණික් ව්‍යාපාරය.

ප්‍ර : අද වෙනකල් ඔබ එම රස්සාවෙම නිරත වන පුද්ගලයෙක් ලෙස සඳහන් කළොත් මම නිවැරදි?

පි : අද වෙනකම් කිව්වට පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනේ. මොකද මේ මම නිරාගමේ කියලා යම් කිසි මට්ටමකට දැන ගත්තට පස්සේ දැනට මේ ව්‍යාපාරය මට යොමු වීමේ අපහසුතාවය තියෙනවා. මේ දවස් ටිකේම පොඩ්ඩක් ඒක

ප්‍ර : මැණික් ව්‍යාපාරයේ නිරත වෙන්න ඔබට අපහසුතායක් තියෙනවා?

පි : ඔව් අපහසුතාවයක් තියෙනවා. මොකද මගේ ගොඩක්ම contacts තිබ්බේ මුස්ලිම් අය. අනිත් එක මේ අර බෝම්බ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍රහාරයත් එක්කම සංචාරක ව්‍යාපාරය යම් කිසි පසුබෑමක් සිද්ධ වුණා. ඒ දෙකම.

ප්‍ර : ඔබට මේ ප්‍රශ්න වලට මුහුණ දෙන්න සිදු වුණේ බෝම්බ ප්‍රහාරයෙන් පස්සේද බෝම්බ ප්‍රහාරයට කලින්ද?

පි : සාමාන්‍යයෙන් මේ බෝම්බ ප්‍රහාරයට කලිනුත් ප්‍රශ්න තිබ්බා. හැබැයි මේ ලොකුවටම බලපෑමක් ආවේ ප්‍රහාරයට පස්සේ.

ප්‍ර : ඉස්මත් ඔබ ඉහතින් සඳහන් කළා ඔබ යාපනයේ මධ්‍ය මහා විද්‍යාලයේ මූලික අධ්‍යාපනය ලබලා ඊට පස්සේ මාවනැල්ලේ සහීරා විද්‍යාලයේ අධ්‍යාපනය ලැබුවා කියලා? ඔබ මාවනැල්ලේ සහීරා විද්‍යාලයට ඇතුළත් වීමට හේතුව මොකක්ද?

පි : 1990 අගෝස්තු 30 වෙනිදා LTTE සංවිධානය විසින් අපිව පළවා හරිනවා මුස්ලිම්වරුන් යාපනයේ සිට. පැය දෙකක කාලය ඇතුළත පළවා හරිනවා. ඊට පස්සේ අපි අනාථයෝ හැටියට එන්නේ මාවනැල්ලට. අපේ මගේ තාත්තාගේ training college මිත්‍රයෙක් හිටියා. තාත්තා ගුරුවරයෙක්. එයාගේ training college මිත්‍රයෙක් හිටියා. එතකොට අපි මාවනැල්ලට එන්නේ.

ප්‍ර : ඒ තාත්තාගේ සම්බන්ධතාවය හින්දා තමයි මාවනැල්ල තෝරා ගන්නේ ?

පි : ඔව් තාත්තාගේ සම්බන්ධතාවය හින්දා.

ප්‍ර : ඔබ යාපනයේ ද්‍රවිඩ පසුබිමක් සමඟ අධ්‍යාපනය ලැබූ පුද්ගලයෙක් පළමුව? ඊට පස්සේ ඔබ මාවනැල්ලට පැමිණෙනවා. මාවනැල්ලේ එවකට තිබුණු පසුබිම කොහොමද?

පි : ඉස්ලාම් පරිසරය කියලා කියන්න පුළුවන්. It's a Islamic environment in Mawanella. It was like everybody will be more attached to religion Islam in one way or the other way.

ප්‍ර : එතකොට මාවනැල්ලේ ඔබට සිසුවෙකු වශයෙන් ජීවත් වීමට එච්චර අපහසුතාවයක් තිබුණේ නැහැ මොකද ඔබ මුස්ලිම් ජාතීකයෙක් කිව්වොත් මම නිවැරදිද? මුස්ලිම් භක්තිකයෙක් කිව්වොත්?

පි : වෙනස තිබුණා. යාපන මධ්‍ය මහා විද්‍යාලයයි මාවනැල්ල සහීරා විද්‍යාලයයි බලන කොට තිබෙන culture එක ගොඩක් වෙනස තිබුණා. යාපන මධ්‍ය මහා විද්‍යාලය ගොඩක් open culture එකක් තිබ්බේ. මාවනැල්ල හැමදේම පාසල ඇතුළෙත් හැමදේම තීරණය වුණේ ආගම මත උඩ තමයි.

ප්‍ර : ඇයි එහෙම කියන්නේ ඔබ?

FAIR COMMENT BY JEZEEM

Presidential Secretariat Copy

පි : පාසල පටන් ගන්න වේලාව, ඉවර වෙන වේලාව, ඒ අතර මැද වෙන සියළු දේවල් වලට ආගම religion involved in everything in Mawanalla Sahira but in Jaffna Central College it was not there.

ප්‍ර : ඔබට සහීරා පාසලට හැර වෙනත් පාසලකට යන්න අවස්ථාවක් තිබ්බද නැත්නම් ඔබට කිසිම අවස්ථාවක් ලැබුණ් නැද්ද පාසල තෝරා ගැනීමට?

පි : ආශාව තිබුණා නමුත් අවස්ථාවක් ලැබුණේ නෑ. මොකද 1990 යාපනයෙන් එනකොට අපි අතේ මොකුත් නෑ. ඒ සිද්ධිය ගැන ගරු සභාව දන්නවා ඇති. මුස්ලිම්වරුන්ගේ හැමදේම සොරකම් කරගෙන හිස් අතින් වාගේ තමයි එව්වේ. ඒ හින්දා අපේ තාත්තාට ආර්ථික පසුබිම තිබ්බේ නෑ මාව මහනුවර තිබෙන හොඳම පාසලකට යවන්න. මට ආශාව තිබුණා. මමත් උත්සාහ කළා. ඒ වුනාට ඒක සාර්ථක වුණේ නෑ.

ප්‍ර : එතකොට ඔය යාපනයේ සිටිය පාසලේ ඔබගේ පන්තියේ සිටියේ ද්‍රවිඩ කට්ටිය පමණද? මුස්ලිම් කට්ටිය පමණද? නැත්නම් සිංහල කට්ටියද? නැත්නම් ජාතීන් තුනේම සිසුවන් ඔබ යාපනයේ සිටියදී ඔබේ පන්තියේ සිටියාද?

පි : සිංහල අය නම් කවුරුත් හිටියේ නෑ. මම පාසල් යන්න පටන් ගන්නේ 1984. එතකොට 1983 ට පස්සේ මම හිතන තරමට යාපනයේ සිංහල මිනිස්සු හිටියේ නෑ. ක්‍රිස්තියානි හා හින්දු ආගම අදහන ක්‍රිස්තියානි ආගම ඇතුළෙත් කතෝලික හා ක්‍රිස්තියානි දෙකම අදහන කට්ටිය හිටියා. ඒ වගේම මුස්ලිම් අය සමහර කාලේ එක්කෙනෙක් ඉන්නවා. සමහර කාලවල ඒකත් හිටියේ නෑ. සමහර විට මම විතරයි හිටියේ.

ප්‍ර : සහීරා පාසලේ?

පි : සහීරා පාසලේ 100% ම මුස්ලිම් ළමයි විතරයි හිටියේ.

ප්‍ර : මුස්ලිම් ළමයි විතරයි හිටියේ?

පි : මුස්ලිම් ළමයි විතරයි හිටියේ.

ප්‍ර : එතකොට සාක්ෂිකරු සහීරා පාසලේ ඉස්සෙල්ලාම ඉගෙන ගෙන යන පංතිය කුමක්ද?

පි : අටවෙනි ශ්‍රේණිය.

ප්‍ර : අටවෙනි ශ්‍රේණියට ඇතුළ් වෙද්දී ඔබ විෂයක් වශයෙන් ඉස්ලාම් දහම හැදෑරීමක් කළාද?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එම ඉස්ලාම් දහම හැදෑරීම කළේ ඔබ කැමැත්තෙන්ද නැත්නම් ඔබගේ උප්පත්තියෙන් ලැබුණු ආගම හින්දද?

පි : If I answer that question there was no, we have to study 8 subjects, Islam is one of them. එතන අපිට තෝරා ගන්න හෝ මඟ හැරීමේ අවස්ථාවක් නෑ. ගණිතය, භාෂාව වගේම ඉස්ලාම් ආගමත් ඉගෙන ගන්න ඕනී.

ප්‍ර : අනිවාර්ය විෂයක් විදිහට තිබ්බා?

පි : අනිවාර්ය විෂයක්.

ප්‍ර : ඒ අනිවාර්ය විෂයක් කරලා තිබ්බද ඔබ යාපනයේ සිටිය පාසලේත්?

පි : යාපනයේ සිටිය පාසලේ ආගම කියලා විෂය තිබ්බට එක ගුරුවරයයි හිටියේ ඉස්ලාම් ආගම උගන්වන්න. ඒ වුනාට අපි එයා එතුමා ගොඩක් වෙලා ගත කළේ නෑ. උසස් පන්තියේ ඉන්න ළමයින්ටත් උගන්වන්න ඕනී හින්දා අපිට එහෙම ඉස්ලාම් ආගමක් ඉගෙන ගැනීමේ ලොකු අවස්ථාවක් එහෙම තිබ්බේ නෑ.

ප්‍ර : එතකොට ඔබ අට වසර පන්තියට ඇතුළත් වී ඔබට මතකද ඔබට ඉස්ලාම් ආගම කියලා දුන් පළවෙනි ගුරුතුමාගේ නම?

පි : අටවෙනි පන්තියේදී මට ඉස්ලාම් ආගම උගැන්නුවේ උසාන්තින් මවුලවි කියන ගුරුවරයා. එයා අටවෙනි පන්තියේ විතරක් ඉගැන්නුවා.

ප්‍ර : නවය?

පි : ඊට පස්සේ නවවෙනි පන්තියේ සිට සාමාන්‍ය පෙළ විභාගය දක්වා ඉක්බාල් මවුලවි කියන ගුරුවරයා

ප්‍ර : ඒ කියන්නේ **9,10,11**

පි : ඔව්.

ප්‍ර : **9,10, 11** තුනම

පි : තුනම

ප්‍ර : ඉක්බාල් මවුලවි තමයි ඔබගේ ඉස්ලාම් ගුරුවරයා ලෙස ඉස්ලාම් ආගම පන්තියේ ඉගැන්නුම් කරනු ලැබුවේ?

පි : ඔව්.

ප්‍ර : කිව්වොත් මම නිවැරදිද?

පි : ඔව් නිවැරදි.

දැන් වේලාව : පෙ.ව.**10.35** යි.

මෙතැන් සිට ල/ලේ : සචිනි මෙය.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව: පෙ.ව. **10.35**
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා.</u>

ප්‍ර: එතකොට ඔබ ඔය ඉක්බාල් මවුලවීවරයා පාසලේ පන්තියේ ඉස්ලාම් දහම ගැන සිසුන්ට මොන වගේ දේවල් ද කියලා දුන්නේ?

උ: පාසල් පොතේ තියෙන දේවල් කියලා දුන්න වගේම ඒකේ අමතර දේවලුත් කියලා දුන්නා. එයා ඉස්ලාම් ආගම තමයි සම්පූර්ණම ජීවිත රටාවන් හැමදේම ඉස්ලාම් ආගමේ තියෙනවා. අපිට ඉස්ලාම් ආගමෙන් එළියට යම්කිසි දෙයක් ඕන වෙන්නේ නැහැ කියන මතය අපිට ගොඩාක් දෙන්න උත්සාහ කරා. ඒ වගේම අමතර කුරාන් පන්ති ගැනත් අපිට කිව්වා.

ප්‍ර: අමතර කුරාන් පන්තියට එන්න ඉස්සර වෙලා කියන්න පන්තියේ වැඩිපුර මොනවද කියලා දුන්නේ කියලා?

උ: පාසල් පොතේ තියෙන හැමදේම. එයා ඒ කියන්නේ පාසල් පොතේ සමහර Subject තිබ්බා සූෆි ඉස්ලාම් කියන පැත්තට තියෙන ඒවා. ඒවා වැරදි කියලා අපිට කියලා දුන්නා. ඒවා අපි ඉගෙන ගන්න ඕන් නෑ කියන එකත් කියලා දුන්නා.

ප්‍ර: ඇයි වැරදි කියලා කියලා කිව්වේ?

උ: එතකොට කුරාන් සහ හදීස් කියන නඹිතුමාගේ ජීවිත රටාව අනුව තමයි ඉස්ලාම් ආගම අපි මේ රටේ Sorry ඉස්ලාම් ආගම පිළිපදින්න ඕන. අපි ඉගෙන ගන්න ඕන කියන මතය ඒ වන කොට ලංකාවේ පැතිරිල තිබ්බා. එතකොට එයත් ඒ වගේ මතේ හිටපු එක්කෙනෙක් ඒ හින්දා සූෆි කියන එක ආගමට පසු කාලයේ එකතු වෙච්ච එකක් කියලා හින්දා ඒ ගැන එච්චර Importance එකක් දුන්නේ නැහැ. Importance එක දුන්නේ කුරාන හා හදිස් මත. ජිහාත් ගැන. ජිහාත් වගේ දේවල් ගැන අපිට කියලා දුන්නා.

ප්‍ර: ජිහාත් කියලා ඔබ අදහස් කළේ මොකද්ද?

උ: ආගම වෙනුවෙන් සටන් කිරීම හා දිවි පරිත්‍යාග කිරිම.

ප්‍ර: ඒවා පිළිබඳ පන්තියේ ඔබගේ වයසේ සිසුන්ට මෙම මවුලවී ඉක්බාල් මවුලවී විසින් ඉගන්වනු ලැබුවා.

උ: ඔව්, මේ අවුරුදු තුන තියෙන කාලය තුළ ඒක ඉගැන්වනු ලැබුවා. ඒකට එයා කෙළින්ම ඒකට දැම්මේ නැහැ. ඒකට යන්න පුළුවන් විදියට දේවල් පාසල් පොතේ තිබුණා.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: පාසල් පොත ගැන අපි පස්සේ කතා කරමු. මවුලවීතුමා පන්තියේ කතා කරපු දේවල් පමණක් මෙම අවස්ථාවේ දී මම ඔබගෙන් ප්‍රශ්න කරනවා. මෙම මවුලවීතුමා පාසලේ ඉගැන්වූ ඉස්ලාම් ආගම සම්බන්ධව කරුණු වලට අමතරව විශේෂ පන්ති සඳහා ඇරයුමක් කරාද?

උ: ඔව්. මාවනැල්ලේ වලව්වත්ත ප්‍රදේශයේ බ්‍රහස්පතින්දා (Thursday) දවස් වල හවස පැවැත්වෙව්ව පන්ති වල.

ප්‍ර: එතකොට ඒක කරේ පන්තියේ සිසුන්ට පමණ ද නැත්නම් තෝරාගත් සිසුන් පිරිසකට ද ?

උ: ඒක විවෘතයි. විවෘතයි කියන්නේ ජමාතේ ඉස්ලාමිය සංවිධානයට අයිති ස්ථානයක .

ප්‍ර: ඔව්.

උ: එය පාසල් සිසුන්ට පමණක් නොවේ. ඒක විවෘතයි.

ප්‍ර: ඒක පාසල් සිසුන්ට පමණක් නොවේ?

උ: නොවේ.

ප්‍ර: එතකොට මෙය මෙහෙයවනු ලැබුවේ කවුද කොයි සංවිධානය ඔබ සංවිධානයක් කිව්වා?

උ: ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමිය සංවිධානය විසින්. ඒ ගොල්ලන්ගේ මූලස්ථානය තමයි වලව්වත්ත මාවනැල්ල වලව්වත්ත ප්‍රදේශයේ පිහිටලා තියෙන්නේ.

ප්‍ර: මොහොමඩ් ඉස්මත් රිස්වින් ඔබ මෙම පන්ති වලට සහභාගි වුණාද?

උ: ඔව්. මම සහභාගි වුණා.

ප්‍ර: ඔබේ මේ පන්ති වලට සහභාගි වීමට පෙර ඔබගේ දෙමාපියන්ගෙන් අවසර ගත්තද?

උ: ඔව් මම අවසර ගත්තා.

ප්‍ර: අවසර ලබා දුන්න ද?

උ: ඔව් අවසර ලබා දුන්නා.

ප්‍ර: මොනව කියල ද ගියේ?

උ: කුරාන් පන්ති කියලා. කුරාන් ඉගෙනගන්න යනවා කියලා තමයි අපි ගියේ.

ප්‍ර: මෙම අමතර පන්ති වලට ඔය කියන පන්තියේ ඉගැන් වූ මවුලවීතුමා හැරෙන්න වෙනත් කවුරුත් ඇවිත් දේශනා පැවැත්තුවාද?

උ: ඔව්. ගොඩාක් අය ආවා. ඉක්බාල් මවුලවී හැර වෙනත් දේශකයෝ ඇවිල්ලා තියෙනවා.

ප්‍ර: මොනවද ඔය අමතර පන්ති වල කියලා දුන්නේ?

උ: කුරාන් එකේ තියෙන මොනව හරි ඒ කියන්නේ මොනව හරි වචන වාක්‍යයක් නැත්නම් පරිච්ඡේදයක් අරගෙන ඒකෙන් අදහස් වෙන්නේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මොකද්ද ඒක අපි කොහොමද තේරුම් ගන්න ඕනේ ඒක කොහොමද අපේ ජීවිතයේ අපි ක්‍රියාත්මක කරන්නේ ඒ වගේම ක්‍රියාත්මක කරන්න බැරි දේවල් තියෙනවා නම් අපි ඒක ක්‍රියාත්මක කිරීම සඳහා කොහොම ද සූදානම් වෙන්නේ ඕන වාගේ දේවල් තමයි අපිට විග්‍රහ කළේ. ඒ කියන්නේ Explanation Class කියලා අපිට කියන්න පුළුවන්.

ප්‍ර: කුරානය විග්‍රහ කිරීමේ කටයුක්තක් තමයි මෙම අමතර පන්තියේ සිදු කරනු ලැබුවේ කිව්වොත් මම නිවැරදිද?

උ: ඔව්.

ප්‍ර: ඊට අමතරව ඔය පන්ති වල තව මොනවද කියලා දුන්නේ? කුරානය විග්‍රහ කිරීමට අමතරව.

උ: පිළිම කැඩීම ඒවා ඔක්කොම අඩංගු දේවල්.

ප්‍ර: ඔව් මොනවද ඒ අඩංගු වුණු දේවල් ඔබට මතකයි ද?

උ: සාමාන්‍යයෙන් මතකයි මට.

ප්‍ර: ඒ මතක ටික මේ ගරු කොමිෂන් සභාවට ප්‍රකාශ කරන්න?

උ: පිළිම කැඩීම ගැන අපිට දවසක් කියලා දුන්නා. ඊබ්‍රහීම් නබිතුමා කියන ඉපැරණි නබි කෙනෙක්. නබිතුමා කෙනෙක්ගේ දේවදූත කෙනෙක්ගේ ජීවිතයේ සිද්ධ වෙච්ච දේවල් ගැන අපිට ඉගැන්නෙන කොට පිළිම කැඩීම ගැන අපිට ගොඩාක් ප්‍රශංසා කරලා Praise කරලා අපිට කියලා දුන්නා. ඒ වගේම කොහොමද ඉස්ලාම් මුස්ලිම් ජීවිත රටාව නැත්නම් ඉස්ලාම් ආගම අනුව ජීවිත රටාවක් ගත කරන්නේ කියන වගේ දේවල්. ඉස්ලාම් ආගමේ පණිවිඩය කොහොමද අනිත් මිනිස්සු ගාවට අරන් යන්නේ. කොහොමද මේ අනිත් මිනිස්සු ඉස්ලාම් ආගමට හරහා අපි ගන්නේ. හරව ගන්නේ. වගේ දේවල් කියලා දුන්නා.

****

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඔබ කිව්වා පිළිම කැඩීම සම්බන්ධයෙන් කියලා. දැන් පිළිම හුඟක් තියෙනවානේ. දේශපානඥයන්ගේ පිළිම තියෙනවා, ආගමික ශාස්තෘවරුන්ගේ පිළිම තියෙනවා කාගේ පිළිම කැඩීම ගැන ද ඔබට කියලා දුන්නේ?

උ: අන්‍යාගමික ආගම සම්බන්ධ පිළිම. මිනිසුන් The statues been Prayed.

ප්‍ර: වන්දනා සඳහා භාවිතා වන පිළිම?

උ: වන්දනා සඳහා භාවිතා වන පිළිම ගැන.

****

FAIR COMMENT
BY JEZEEM

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා.</u>

ප්‍ර: මීට අමතරව යම් යම් යුද්ධයන් පිළිබඳව කියලා දුන්නා ද?

උ: ඒ වකවානුවේ පැවතිච්ච පලස්තීනයේ යුද්ධය ගැන ගොඩාක් අපිට කියලා දීල තියෙනවා. ඊශ්‍රායල රාජ්‍යයට විරුද්ධව මතයක් අපිට ගොඩාක් තද බඳ ලෙස අපේ මනසට දැම්මා. බොස්නියා යුද්ධය ගැන. ඒ දවස් වල යුගස්ලෝවියා රාජ්‍යය ගැන කෑලි 3, 4කට රටවල් 3,4 කට කැඩිලා ඒ රටවල් අතර යුද්ධය තිබ්බා. බොස්නියා, සර්බියා, ක්‍රෝෂියා යන රටවල් අතර තිබ්බ යුද්ධය ගැන අපිට කියලා දුන්නා. කාශ්මීර යුද්ධය ගැන ගොඩාක් කියලා දීලා තියෙනවා. ඇෆ්ගනිස්ථාන යුද්ධය ගැන. මේව ගැන අපිට ගොඩාක් කියලා දිලා තිබුණා.

ප්‍ර: කියලා දුන්නා පමණයි ද, නැත්නම් මොනව හරි Video පට යොදලා ඒවා පෙන්නුම් කරනු ලැබුවද?

උ: ඒවා සිදු කරනු ලබන්නේ මාවනැල්ල සහිරා විද්‍යාලයේ සතිඅන්ත දවස් වල ජමාතේ ඉස්ලාමිය සංවිධානයෙන්. මේ කුරාන් විග්‍රහ කිරීමේ පංති පැවැත් වුණේ මාවනැල්ල වලව්වත්ත ප්‍රාදේශීය පැවතිච්ච ජමාත් ඉස්ලාමිය සංවිධානයේ Regional Head Office.

ප්‍ර: ප්‍රාදේශීය මූලස්ථානය තමයි. ඒ කියන්නේ මෙම ජමාතේ ඉස්ලාම් සංවිධානය මගින් පවත්වනු ලබන මෙම අමතර පන්ති වලට සහිරා පාසලෙත් අනුග්‍රහය දැක්වුවා?

උ: ඔව් එවක හිටිය විදුහල්පති ගුරු මණ්ඩලයේ යම් සාමාජිකයෝ ජමාතේ ඉස්ලාමිය සංවිධානය එක්ක සම්බන්ධ නැත්නම් ඒකේ සාමාජිකයෝ. ඒ හින්දා ජමාතේ ඉස්ලාමිය මතවාදී නැත්නම් ඒ ගොල්ලන්ගේ වැඩකටයුතු සහිරා පාසල ඇතුළට කරගෙන යාමේ කිසිම බාධාවක් තිබුණේ නැහැ.

ප්‍ර: ඒ කියන්නේ මෙම පාසලයි ජමාත් ඉස්ලාමිය සංවිධානය අතර හොඳ සම්බන්ධතාවයක් පැවතුණා කිව්වොත් නිවැරදි?

උ: ඔව්. යම්කිසි ගුරුවරුන්ගේ විරෝධතා තිබුණා. තිබුණාට මේ ගොල්ලන් තමා ශක්තිමත් විදියට හිටියේ.නම් වශයෙන් කියනව නම් අපිට දෙමළ භාෂාව උගන්වපු නිසාර් උඩයාල් කියන ගුරුවරයා මේකට විරුද්ධයි. එයා ඒකට කැමති වුණේ නැහැ. ඒ වගේම මම අහලා තියෙනවා තව ගුරුවරියෙක් අයේෂා කියන ගුරුවරිය. ඒ හැර අනිත් අය මන් දන්න තරමට එක්කොම මේකට කැමති නැත්නම් නිශ්ශබ්දව සිටියා.

ප්‍ර: ඔබ මේ අමතර පන්ති වලට යද්දි ඔබගේ වයස කියද?

උ: 13 යි . 14යි.

ප්‍ර: වයස මතකද?

උ: මතකයි. මම 1979 ඉපදුණේ.

ප්‍ර: එතකොට 92

FAIR COMMENT
BY JEZEEM

ඌ: ඔව්.

ප්‍ර: එතකොට වයස කියද ඔය පන්ති වලට සහභාගි වෙද්දී?

ඌ: 13 යි 14 යි 15, 16 වෙනකන් මම ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ හිටියා.

ප්‍ර: මොන අවුරුද්දෙ ද එතකොට ඔය සම්බන්ධ වුණේ?

ඌ: 92.

ප්‍ර: 92 තමයි සාමාන්‍ය පෙළ පන්තියේ ඉන්න කොට?

ඌ: 1992

ප්‍ර: 1992 තමයි සම්බන්ධ වුණේ.

****

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඔබ ඒ පන්ති වලට 1992 යන විට ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ නායකයින් නැත්නම් මාවනැල්ලේ හිටපු ප්‍රධාන නිලධාරීන්ගේ නම් මතකද?

ඌ: ඔව් මතකයි. නායකයා හැටියට හිටියේ ඒ.එල්.එම්. ඊබ්‍රාහීම් මවුලවී කියන එක්කෙනෙක්. ඊට පස්සේ

ප්‍ර: ප්‍රධාන සංවිධායක ?

ඌ: ජාතික නයකයා. ඊට පස්සේ ශිෂය ඒකකයේ නායක යන හැටියට හිටියේ නජා මොහොමඩ්. එතුමා දැන් National Front for the Good Governance එකේ ලේකම් හැටියට දැනට කටයුතු කරනවා. තව දැනට පොලිස් අත්අඩංගුවේ සිටින ඊබ්‍රාහීම් මවුලවී, රෂීඩ් ඊබ්‍රාහීම් මවුලවීතුමා එතැන සිටියා. ඒ වගේම හජ්ජුල් අක්බර් මවුලවීතුමා එතැන සිටියා. අබ්දුල් වාජිත් මවුලවීතුමා එතැන සිටියා. බේරුවල ජාමීයා නලිමියා එකේ ජමෙයිතුල් උලමා සංවිධානයේ උපනායකයෙක් හැටියට කටයුතු කරන ඒ.සී. අගාර් මොහොමඩ් එතැන සිටියා. මතක හැටියට ඒ නම් ටික මට දැනට කියන්න පුළුවන්.

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා.</u>

ප්‍ර: දැන් ඔබ මෙම සංවිධානය ගැන කතා කරපු හින්දා මම මේ සංවිධානය ගැන දැනට පොඩ්ඩක් ප්‍රශ්න කරනවා. දීර්ඝ වශයෙන් නෙමේ ඉතිහාසය පිළිබඳව මම පස්සේ එනවා. මේ මෙම ප්‍රශ්නාවලිය අහන්නේ මම ඊළඟ ප්‍රශ්න වලට අවශ්‍ය කරන කරුණු සඳහා පමණයි. දැන් ඔය ජමාතේ ඉස්ලාම් සංවිධානයේ අරමුණ මොකද්ද කියලා ඔබ දන්නවද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඒ දවස් වල ඒ කියන්නේ O/L විභාගෙට පෙනී සිටිනකන් මම අරමුණ මේක තමයි කියලා පැහැදිලිව දැන ගෙන සිටියේ නැහැ. ඊට පස්සේ දැනගත්තා.

ප්‍ර: දැන් දන්නවද මොකද්ද අරමුණ කියලා?

උ: දන්නවා.

ප්‍ර: මොකද්ද ඒ අරමුණ?

උ: ලංකාවේ ඉස්ලාම් රාජ්‍යයක් පිහිටිවීම හා ලංකාව ඉස්ලාම් රටක් හැටියට පත් කිරීම සහ ලෝක ඉස්ලාම් රාජ්‍යයක් ලෝක ව්‍යාප්ත ඉස්ලාම් රාජ්‍යයක් පිහිටිවීම. The Broader Isamic State Internationally අධිරාජ්‍යයක් කියලා. I don't know the correct term.

****

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඒ කියන්නේ ලෝකයේ පිහිටවන ඉස්ලාමීය රාජ්‍යයක කොටසක් වශයෙන් ලංකාවේ ඉස්ලාමීය රාජ්‍යයක් බවට පත් කිරිමද?

උ: Their Frist intention was to they have two intentions. One is to make Sri lanka an Islamic Country. Second building up a Worldwide Islamic Caliphate.

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා.</u>

ප්‍ර: මෙම දැන් ඔය අරමුණුවල් ඉටුකර ගන්න දිර්ඝ කාල වශයෙන් මෙම සංවිධානය පිහිටුවනු ලැබුවාක් ද?

උ: ඔව්. ඒ ගොල්ලන්ගේ දීර්ඝ කාලින වැඩසටහන් තමයි තිබුණේ.

ප්‍ර: ඒක ඔබ දන්නවා?

උ: ඔව් මම දන්නා තරමට. I can understand මට වටහා ගන්න පුළුවන්. ඒ අරමුණත් එක්ක තමයි ඒ ගොල්ලන් ක්‍රියාත්මක කරගෙන ගියේ. ඒකට විවිධාකාර දේවල් ඒ ගොල්ලන් භාවිතා කරා.

ප්‍ර: ඔබ දැන් ප්‍රකාශ කරා විවිධ දේවල් විවිධ ආකාරයේ දේවල් පාවිච්චි කරා කියලා. මොනවද විවිධාකාර දේවල්. නැත්නම් ඔය ක්‍රියාකාරකම් ඔය සංවිධානය විසින් මෙහෙයවනු ලැබුවේ?

උ: ඒ සංවිධානයට සාමාජිකයන් බඳවා ගැනීම නැත්නම් ආධාරකරුවෝ බඳවා ගැනීම සඳහා අධ්‍යාපන හදාරන සිසුන් ටශිෂ්‍යත්වය ඒ වගේම helping them for their education. Educational work like if there a senior student who have studied one thing and someon is going to start they make connection between two of them.ඒ දෙන්නා අතර සම්බන්ධතාවයක් ඇති කරනවා. එතකොට ඒ කලින් ඒ විෂය ඒක

FAIR COMMENT BY JEZEEM

President's Secretary's Copy

ඉගෙනගත්ත එක්කෙනා අලුත් එන එක්කෙනාට උදව් කරනවා. ඒ හරහාත් ඒ ගොල්ලන් සංවිධානයට සාමාජිකයෝ නැත්නම් ආධාරකරුවෝ එකතු කරගත්තා. ඒ වගේම Blood donation camps, educational programs ඒ වගේ දේවල් තිබුණා.

ප්‍ර: ලේ දන් දීමේ ක්‍රියාවලියන් කරා.මෙම ලේ දන්දීමේ ක්‍රියාවලියන් කරා කිව්වම ඒවාට ඔය ජමාතේ ඉස්ලාමීය සංවිධානය අනෙකුත් සංවිධානත්ගේ සහයෝගය ලබා ගත්ත ද? නැත්නම් තනියම ම කරගත්ත ද මෙම ලේ දන්දීම වගේ දේවල් තනියමද කරේ?

උ: තනියම තමයි කරේ.

ප්‍ර: වෙනත් සංවිධාන වලින්

උ: මං දන්නා තරමට ලබා ගත්තේ නැහැ.

ප්‍ර: දන්න තරමින් ලබා ගත්තේ නැහැ. දැන් ඔබගේ ආගමේ හැටියට ලේ දන්දීම ඔබ දන්න තරමින් සාමාන්‍ය ආගමේ පිළිගන්න දෙයක් ද?

උ: According to the basic understanding it is not allowed as far as my understanding it is said that taking the blood of another it means in taking පානය කිරීම වෙන වචනයක් තමයි එතැන එන්නේ. ඒක තහනම්. Drinking the blood but මෙතැන ආගමේ තව දෙයක් තියෙනවා. Save the life of another කෙනෙක්ගේ දිවි බේරා ගැනීම සඳහා උරුමස් කන එක තමයි අන්තිම option එකක් නම් ඒ හැර වෙන කිසි දෙයක් නැත්නම් ඒකත් පුළුවන්. ඒ යටතේ ලේ දන්දීම යම්කිසි කෙනෙක්ගේ දිවි බේරා ගැනීම සඳහා කරන්න පුළුවන් කියන එක තමයි.ඒ මතය උඩ තමයි ඒ Camps ඒ ලේ දන්දීමේ ව්‍යාපාරය කරගෙන යන්නේ.

ප්‍ර: ඒ කියන්නේ මෙම ලේ දන්දීමේ Camps ඔක්කොම ඔබ කියන විදියට සඳහන් කළේ මේ ජමාතේ ඉස්ලාමීයේ ප්‍රධාන අරමුණ ඉෂ්ට කරගන්න කිව්වොත් මම නිවැරදි. ඒ කියන්නේ ඉස්ලාම් රාජ්‍යයක් හදා ගැනීම සඳහා මිනිසුන්ගේ සහයෝගීතාවය දිනා ගැනීම කිව්වොත් නිවැරදිද?

උ: මිනිසුන්ගේ සහයෝගිතාවය දිනා ගැනීම සහ රටේ පාලකයා නැත්නම් ආරක්ෂක අංශවල ඒ ගොල්ලන් ගැන හොඳ මතයක් Good Image එකක් ඇති කිරීමේ ක්‍රියාවක් කියලා මට මේක හඳුන්වන්න පුළුවන්. මම ඒකේ සාමාජික හැටියට හිටපු කෙනෙක් හැටියට මට ඒක කියන්න පුළුවන්.

ගරු ස්වාමිනි මෙම අවස්ථාවේ දී මෙම සාක්ෂිකරුට පින්තූරයක් පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටී.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

අවසර දෙමි.

****

<u>රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා.</u>

ප්‍ර: ඔය පින්තූරයේ සිටින පුද්ගලයා හඳුනනවාද?

උ: අඳුරනවා.

ප්‍ර: කවුද?

උ: සහරාන් හාෂිම්.

ප්‍ර: මොනවද ඔය ඔතන කරන්නේ?

උ: ලේ දන්දීමේ ක්‍රියාවේ නිරත වී සිටිනවා.

ප්‍ර: කවර සංවිධානයක් විසින් ද ඔය ලේ දන්දීමේ වැඩසටහන කරගෙන යන්නේ?

උ: ජාතික තවුහිද් ජමාත් සංවිධානය.

ප්‍ර: ඔබට මේ පින්තූරය කොහෙන්ද ලැබුණේ?

උ: බෝම්බ ප්‍රහාරයට පස්සේ අන්තර්ජාලයේ සැරිසරපු පින්තූරයක් තමයි මේක. ඒ ගොල්ලන්ගේ වෙබ් අඩවිවලින් හරි නැත්නම් ෆේස්බුක් පිටුවලින් හරි කවුරු හරි කෙනෙක් ගත්ත එකක් ඒ වේලාවේ ම මම ඒක Save කරගත්තා.

ගරු ස්වාමිනි මෙම සාක්ෂිකරු විසින් මොහොමඩ් සහරාන් ශැංග්‍රිලා හෝටලේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය දියත් කර පුද්ගලයා ලේ දන්දීමේ පින්තූරයක් අඩංගු මෙම හඳුනාගනු ලැබූ ලේඛනය **MIR 1** වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිමි.

ප්‍ර: සාක්ෂිකරු ඔබට පේනවනේ ඔය තිරයේ දෙවන පින්තූරය පහළින් තියෙන. ඒකේ බැනරයක් තියෙනවා.

උ: ඔව් පේනවා.

ප්‍ර: ඒ බැනරයේ මොනවද සඳහන් කරලා තියෙන්නේ?

උ: (දෙමළ බසින් සාක්ෂිකරු ප්‍රකාශ කරයි) ඒකෙන් අදහස් වෙන්නේ කාත්තන්කුඩි based at කාත්තන්කුඩි Base Hospital.

ප්‍ර: ඊට පස්සේ සඳහන් වෙන්නේ කවුද?

උ: N.T. J. ජාතික තවුහිද් ජමාත් (දෙමළ බසින් සාක්ෂිකරු කියවයි.) Social Service unit.දැවැන්ත ලේ දන්දීමේ ව්‍යාපාරය. මෙතැන දිනය සඳහන් වෙලා තියෙනවා මට පේන විදියට සැප්තැම්බර් ද Mayද කියලා එක අකුරයි දාලා තියෙන්නේ. මාසේ මුල අකුර විතරයි. මැයි මාසේ 1 වැනිදා 2016 . For a small clarification this මැයි මාසේ the month of may it is written in a decorated font and only one letter. So it

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

looks like may. It's may 1 st but 1 st the date is clear and the year is clear. 2016 And inside the plaque the motto is said (දමිළ බසින් කියවයි.) Let's donate the blood and save the lives.

****

<u>ගරු අදිකාරී මැතිනිය.</u>

ප්‍ර: අරාබි භාෂාවෙන් කියෙන්නේ මොකද්ද?

උ: අරාබි බසින් පිළිතුරු දෙයි.

ප්‍ර: ඒ කියන්නේ මොකද්ද?

උ: I start with the name of the merciful God; that is the normal uerse Muslims say before starting anything, even before having a meal. ගරු ස්වාමිනි මේ අවස්තාවේ මේ පින්තූරය **C 323** ලෙස ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

****

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: 16 th of May 2016?

උ: 1 st May 2016.

ප්‍ර: කාත්තන්කුඩි hospital

උ: කාත්තන්කුඩි Base hospital

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිජහ මහතා.</u>

ප්‍ර: සාක්ෂිකරු මම ඔබගෙන් ප්‍රශ්න කරේ ජමාතේ ඉස්ලාම් සංවිධානය මගින් කරන ක්‍රියාකාරකම් පිළිබඳව. දැන් ඔබෙන් ඉස්සෙල්ලා මං ප්‍රශ්න කර කර සිටියේ පාසල් අවධියේ ඔබ ඉස්ලාම් ආගම පන්තියේ දී ත් සහ අමතර පන්තිවල දිත් හදාරපුව පිළිබඳව. දැන් ඔබ සාමාන්‍ය පෙළට පෙනී සිටින්නේ කුමන අවුරුද්දේ ද?

උ: **1994** දෙසැම්බර් .

ප්‍ර: **94** දෙසැම්බර්. ඊට පස්සේ ඔබ යම් කිසි පුහුණු කඳවුරකට සහභාගි වුණාද?

උ: ඔව්. **1995** ජනවාරි මාසයේ පටන් ගන්නවා ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ ශිෂ්‍ය ඒකකයෙන් කරන ලද දවස් **5**හේ නේවාසික පුහුණු කඳවුරක් .

ප්‍ර: ඔබ එම පුහුණු කඳවුර පිළිබඳව පළවැනියට දැන ගන්නේ කොහොමද?

උ: සාමාන්‍ය පෙළ විභාගය ඉවර වෙච්ච ගමන්ම ඒවේලේ මාවනැල්ල ජමාතේ ඉස්ලාමීය ප්‍රාන්ත කාර්යාලයෙන්. Regional Head Office එකේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

භාරකරු හැටියට හිටපු මවුලවී අබ්දුල් වාජිත් නැමැත්තා දැනුම් දෙනවා මෙහෙම දෙයක් තියෙනවා සහභාගි වෙන්න කියලා ආරාධනා කරනවා.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: මෙම ලකුණු කළ ලේඛනයේ ISIS කියලා තියෙනවනේ ශ්‍රී ලංකා කියලා?

උ: ඔව්.

ප්‍ර: ඒ මොකක්ද?

උ: පහුකාලිනව මේ ලේ දන් දීමේ ව්‍යාපාරය සිද්ධ වෙලා තිබෙනවා 2016 මැයි මාසේ 1 වැනිදා. නමුත් ගිය අවුරුද්දේ පාස්කු ඉරිදා දින ප්‍රහාරයට ඒ ලේ දන්දීමේ ව්‍යාපාරයේ ඒ පින්තූරයේ ඉන්න පුද්ගලයෙක් වන සහරාන් හෂීම්ගේ නායකත්වයෙන් සිද්ධ වෙච්ච හින්දා ඒ ෆේස්බුක් එකේ නැත්නම් අන්තර් ජාලයේ ඒකේ පල කරපු එක්කෙනා ඒක දාලා තිබුණා. ඒ එවපු Title එක තමා ISIS කියන එක. පහුකාලිනව මේ පුද්ගලයා මේ වගේ දේවල් වලට සම්බන්ධ වුණා කියන එක.

ප්‍ර: ඒක දිනය දන්නවද තමන් කවද්ද ගත්තේ ?

උ: පාස්කු ඉරිදා ප්‍රහාරයට පස්සේ. හරියටම මට දිනය මතක නැහැ. ඒක පස්සේ දවස තමයි මේක Public ආවේ.

ප්‍ර: තමන් මේක ගත්තේ පාස්කු ප්‍රහාරයෙන් පසුව?

උ: පසුව.

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා.</u>

ප්‍ර: දැන් ඔබ මෙම දවස් 5හේ වැඩමුළුව ගැන දැනගන්නට ලැබුණා. කියලා ඔබ ඉස්සෙල්ලා ප්‍රකාශ කළේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔය වැඩමුළුව පිළිබඳව ඔබගේ පාසලේ සිසුන්ට පමණ ද දැන ගන්නට ලැබුණේ?

උ: නැහැ. මුස්ලිම් සිසුන්ට ජමාතේ ඉස්ලාමිය සංවිධානයත් එක්ක යම්කිසි මට්ටමේ සම්බන්ධ තියෙන. එක්කෝ සහෝදරයෙක් හරි නැත්නම් පියා හරි නැත්නම් අන්කල් කෙනෙක් හරි සම්බන්ධ වෙච්ච සිසුන්ටත් ඒ පණිවිඩය යැව්වා. ලංකාවේ හැම පළාතේ ඉදල වගේම සිසුන් ඒකට සහභාගි වුණා.

ප්‍ර: ඔබ ඒකට සහභාගි වුණාද?

උ: ඔව්. මම සහභාගි වුණා.

ප්‍ර: ඔබගේ දෙමාපියන්ගෙන් ඒකට අවසර ලැබුණද?

FAIR COMMENT BY JEZEEM

ඌ: මුලදී තාත්තා අකමැති වුණා. මම හරියට දන්නේ නැහැ . හේතුව පස්සේ කොහොම හරි ඒ කියන්නේ ශිෂ්‍යයෙක් වශයෙන් අපි trip එකක් යනවා කිව්වොත් ගෙදරින් තාත්තලා සාමාන්‍යයෙන් එකපාරම කැමති වෙන්නේ නැහැ. මොකද ප්‍රශ්න ඒකට හේතු වෙන්න පුළුවන්. ඒ වුණාට දෙතුන් පාරක් Try කරලා තාත්තා කැමති වුණා. ඊට පස්සේ මං ඒකට සහභාගි වුණා.

ප්‍ර: සහභාගී වීමට ඔබට ආශාවක් ඇති වුණේ ඇයි?මේක trip එකක් කියලා හිතාගෙනද නැත්නම්?

ඌ: නැහැ එහෙම හිතුවේ නැහැ. එතකොටත් මම ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ ගොඩාක් programs වලට සහභාගි වෙලා හිටියා. එතකොට ඒ ගොල්ලන් විසින් මේ දවස් 5 හේ නේවාසික පුහුණු කඳවුරු කිව්වට මට අසාවක් හිතුනා. ආගම ගැන වැඩිපුර ඉගනගන්න ඕනේ. ඒ කියන්නේ එතකොට ඒ දවස්වල අපිට They have made us thinking that do anything for the religion, to learn more and we have to dedicate ourselves. So be course of that desire I participated in that program. 5 day program.

ප්‍ර: මෙම දවස් 5 හේ පුහුණු කඳවුර කොහේද තිබ්බේ?

ඌ: මාදම්පේ ඉස්ලාහියා අරාබි පාසල හා පල්ලිය. ඒ වෙන කොට දෙකම තිබ්බේ එකට. පල්ලිය පිටුපස්සේ ගෙයක් තමයි එයයි පල්ලිය උඩතට්ටුව ඒ පරිසරය තමයි මාදම්පේ ප්‍රධාන පල්ලිය. මාදම්පේ පරණ නගරයේ තියෙන ප්‍රධානපල්ලිය හා ඉස්ලාහියා ආරාබි පාසල දෙකම එකට තමයි තිබුණේ. ඒ දවස් වල තිබ්බේ.

ප්‍ර: ඔබට මතක ද මෙම කඳවුරට ශිෂ්‍යයන් කියක් විතර සම්බන්ධ වුණාද කියලා?

ඌ: මට හරියට මතක නැහැ. මගේ මතකයෙ හැටියට 40 ක් හරි 50 කට සාමාන්‍යයෙන් ඒ වගේ. ශිෂ්‍යයන් තමයි 40 ක් කියලා මට කියන්න පුළුවන්.

ප්‍ර: ඒ කියන්නේ සහිරා පාසලෙන් පමණක් 40 ක් ද නැත්නම් මාවනැල්ල ප්‍රදේශයෙන්ම 40 ක්ද?

ඌ: නැහැ ලංකාවේ පුරාම ඉඳලා ඇවිල්ලා හිටියේ 1995 ජනවාරි නේවාසික පුහුණු කඳවුරට 40 ක් පමණ ශිෂ්‍යයන් තමයි.

ප්‍ර: 40 ක් පමණ සම්බන්ධ වෙලා සිටියා?

ඌ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ ඔබ නැවතත් මේ වගේ පුහුණු කඳවුරු වලට ගියා. නැවතත් මේ වගේ දෙවැනි වසරටත්

ඌ: දෙවැනි වසරටත් මම සහභාගි වුණා.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒකත් එතැනම ද තිබ්බේ?

උ: ඔව්. එතැනමයි තිබ්බේ.

ප්‍ර: එතකොට ළමයි කී දෙනෙක් විතර සහභාගි වුණාද?

උ: 120 නැත්නම් 130 වගේ ප්‍රමාණයේ සිසුන් සහභාගි වුණා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ පළමු සැරේට යනවට වැඩිය දෙවන සැරේ සිසුන් සංඛ්‍යාව වැඩි?

උ: ඔව් සෑහෙන්න වැඩි වීමක් තිබුණා. කණ්ඩායම් වශයෙන් සිසුන්ව බෙදන්නත් සිද්ධ වුණා.

ප්‍ර: ඔය කණ්ඩායම් වශයෙන් සිසුන් බෙදීමක් සිදු වුණාම ඔබව යම් කිසි කණ්ඩායමක් නායකයෙක් ලෙස පත් කරාද?

උ: ඔව්. කණ්ඩායම් 5 ක් බෙදලා නායකයෝ 5 දෙනෙක් පත් කරනවා. ඒකෙන් එක් කණ්ඩායමක නායකත්වය මට භාර දුන්නා.

ප්‍ර: ඒ ඔබලාව භාරව සිටියේ කවුද ඔයි කාලේ?

උ: 94 සාමාන්‍ය පෙළ විභාගයෙන් පස්සේ සහභාගි වෙච්ච වේලාවේ ද ?

ප්‍ර: 94 කවුද භාරව සිටියේ?

උ: 94 භාරව සිටියේ පුත්තලමේ පදිංචි සල්මාන් ෆාරිස් නලිමි කියන මවුලවීතුමා. නලිමි කියන්නේ බේරුවල ජාමීයා නලිමියා පාසලේ ඉගෙනගත්ත එක්කෙනෙක්.

ප්‍ර: ඔහුට යම්කිසි තනතුරක් තිබුණ ද මේ සංවිධානයේ?

උ: ඒ ගැන හරියට මම දන්නේ නැහැ.

ප්‍ර: ඊට පස්සේ දෙවැනි වසරේත් ඔබ සහභාගි වුණාම කවුද ඔබලාව බලාගත්තේ?

උ: දෙවැනි වසරේ මවුලවී අබ්දුල් වාජිත් ඉස්ලාහි එයාගේ නම මම කලින් සඳහන් කරා. මාවනැල්ලේ ජමාතේ ඉස්ලාමී කාර්යාලය. ප්‍රාන්ත කාර්යාලය භාරව හිටපු.

වේලාව: 11.35

මෙතැන් සිට: චන්දිමා මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව: ප.ව11.05.
පෙර සටහන් :ල/ලේ සචිනි මෙනවිය
මෙතැන් සිට: ල/ලේ චන්දිමා දිල්හානි.

<u>රජයේ අධිනිතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර: ඔබ පළමුවරට මෙම කඳවුරට සහභාගි වුනේ 95 අවුරුද්දේ ජනවාරි මාසේ කිව්වොත් මම නිවැරදිද?

පි: නිවැරදියි.

ප්‍ර; දෙවනි සැරේටත් මෙම කඳවුරට සහභාගි වුනේ කුමන අවුරුද්දේද?මතක ද?

පි; මම 94 සාමාන්‍ය පෙල විභාගයෙන් පස්සේ පැවැත් වෙච්ච කඳවුරට 95 සහභාගි වුනේ කියන එක මට මතක් වුනේ ඒ දවස් වල මට ඩයරිය ලීවිමේ පුරුද්ද තිබ්බා ඒ diary එකෙන් තමයි මම ඒක තහවුරු කර ගත්තේ. 95 සාමාන්‍යපෙළ විභාගයෙන් පස්සේ මම මගේ ඩයරි එක බැලුවා ඒකේ හිස් පිටු ගොඩාක් තියෙනවා ජනවාරිවලත් හිස් පිටු ගොඩාක් තියෙනවා. ඒ හින්දා මට හරි නිගමනයකට නැත්නම් ස්ත්‍රීරව උත්තරය දෙන්න බැරිවෙනවා. ඒක දෙසැම්බර් වල පැවැත්වුනාද 95 දෙසැම්බර්වල පැවැත්වුනාද 96 ජනවාරිවල පැවැත්වුනාද කියන එක මට ස්ථිරව කියවිමේ අපහසුතාවයක් තියෙනවා.

ප්‍ර: ඔබ මේ සහභාගි වුන වැඩමුළුවේ ඔබ නායකත්යව දුන් කණ්ඩායමේ ඔබට මතකද හිටපු සිසුන් ?

පි: ඔක්කෝමලා මතක නෑ සමහර අය මතකයි.

ප්‍ර: ඔබට මං ලේඛණයක් පෙන්වුවොත් එහෙම හදුනා ගැනිමේ හැකියාවක් තියෙනවාද? කවුද ඔබට මතක?

පි; දැනට අත්අඩංගුවට පත්වෙලා ඉන්න රිස්වි කියන පුද්ගලයා මට මතකයි පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් සහරාන්ලා එක්ක සම්බන්ධවෙලා හිටපු රිස්වි කියන එක්කෙනා

ප්‍ර; වෙන කවුද ඔබට මතකද?

පි: මානැල්ලෙන් ශාකිර් කියලා හිටියා හෙම්මාතගමින් සිසුන් කීපදෙනෙක් හිටියා පොළොන්නරුව ඒ වගේ ප්‍රදේශවලිනුත් සිසුන් හිටියා.

ප්‍ර; කියන්න ?

පි; ඒ වගේම මාවනැල්ලේ හිටපු අයවත් මට මතකයි. ෆර්ශාන් නැත්නම් රිශාන්. ඒ සහෝදරයන් දෙන්නාගෙන් එක්කෙනෙක් හිටියා ඒ නිවුන් සහෝදරයෝ ඒකේ එක්කෙනෙක් හිටියා.

ගරු ස්වාමිනි මෙම අවස්ථාවේදී මෙම සාක්ෂිකරුට ලේඛණයක් පෙන්වා සිටිමට අවසර ඉල්ලා සිටිමි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: සාක්ෂිකරු මෙම ලේඛණය මොකක්ද?

පි: මගේ කණ්ඩායමේ භාරව සිටි සිසුන්ගේ නාමලේඛණය.

ප්‍ර: ඕකේ දිනයක් සඳහන් වෙනවාද?

පි: නෑ.

ප්‍ර; ඕක කවුරුන් විසින් සකසන ලද ලේඛණයක් ද?

පි: මේක සකසනකොට මේක භාරව හිටියේ. මම. මේකේ ලියවිලා තියෙන නම් ඒ ඒ පුද්ගලයින් විසින්මයි මගේ මතකය හැටියට ලියලා තියෙන්නේ අදාල අය වෙනුවෙන්.අදාල අයමයි තමන්ගේ නම සඳහන් කරලා තියෙනවා.

පි: ඔව්. මගේ භාරයේ තිබ්බේ.

ප්‍ර: මේක ඔබේ භාරයේද තිබ්බේ?

ප්‍ර: ඔබ ගාව මෙම අපිට ලබා දුන් මෙම ලැයිස්තුවේ මුල්පිටපත තියෙනවාද?

පි; මෙතන යම් කිසි පැහැදිලි කිරීමක් මට කරන්න සිද්ධ වෙනවා. මම මේ පාස්කු ඉරිදා ප්‍රහාරයට පසුව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට සාක්ෂි දුන්නා. දුන්නට පස්සේ තමයි නිරාගමික කියන එකයි මම ඉස්ලාම් ආගම අතහැරපු එක්කෙනෙක් කියන එකයි මාධ්‍ය හරහා මුළු රටටම ප්‍රචාරය වුනා .ඊට පස්සේ මට ගොඩාක් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒකෙන් එකක් තමයි.මට ගෙදරින් පිටත් වෙන්න සිද්ධ වුනා.ගෙදර අයත් කැමතිවුනේ නෑ මම ගෙදර ඉන්නවාට.ඒ වගේම ඒයාලටත් තර්ජන තිබ්බා තර්ජන කියන්නේ ප්‍රශ්න තිබ්බා පිඩන තිබ්බා මාව ගෙදර තියාගෙන ඉන්න එකෙන්. ඊට පස්සේ මම පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ඉදිරියේ සාක්ෂි දුන්නේ **2019** ජුනී **20** වෙනිදා. ඊට දවස් දහයකට පස්සේ ගෙදරින් පිටත් වෙනවා මම. පිටත් වෙනකොට මම දන්නවා මම ගෙදරින් යන්න ඕනේ කියන එක මට යන්න බල කරා. එතකොට මම මේ හැම ලේඛනයක්ම අරන් යන්න බැරි වුණාට ඒ වුනාට මේක මට උදව් වෙයි කියන එක මම දැනගෙන හිටිය හින්දා මේක මම මගේ ෆෝන් එකෙන් පින්තූරයක් ගත්තා. හැබැයි මේ මේකේ ඔර්ජිනල් එක මම ගෙදර තියලා ආවා ඊට පස්සේ අම්මා මට කිව්වා ඔයා ගාව තිබ්බ සමහර දේවල් මම විසිකරා පුච්චලා දැම්මා කියලා.අම්මාට දැන් වයසයි එයාට බයයි. එයාට තේරෙන්නේ නෑ මොකද තියාගන්න ඕනේ මොකක්ද තියාගන්නේ නැතුව ඉන්න ඕනේ කියන එක. මේක ගෙදර තියනවාද නැද්ද කියන එක මට දන්නේ නෑ එදායින් පස්සේ මම අද වෙනතුරු මම ගෙදර ගියේ නෑ.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: තමන් ට තිබුණු තර්ජන පිළිබඳ පොලිසිය දැනුවත් කරාද?

පි: සාක්ෂි දීමට පෙරද පසුද .

ප්‍ර; පසුව දැන් තමන්ට කිව්වා තමන්ට ගෙදරිනුත් යන්න සිද්ධ වුනා කියලා ?

පි; ඔව්.

ප්‍ර: මොකක්ද ඒ සිද්ධි මාලාව ?

පි: ගෙදරින් යන්න සිද්ධ වුනේ ගෙදරින් දීපු පීඩනය ඒ ගොල්ලන් ගෙදර අයගේ නෑදෑයෝ අපේ නෑදෑයොන්ගෙන් ඒ පාරේ ජීවත්වෙන මිනිසුන්ගෙන් එක එක කතා අහන්න වුණා ඒ වගේම like if I say it in English the indirect mental pressure was on them. and all the family. rest of the family members out the ties with us. so it is a big pressure and a mental torture. It was unbearable. so we were living in the down stairs with my uncle. so they asked me to leave the house. for their safety and my safety and all, so then I happened to leave. To make a complaint to the police regarding this one I don't have any concrete evidence, so and so is trying to harm me. so it is all like a කතාව එක එක කතාවල් කියවගෙන ආපු හැර ස්ථිර evidence එකක් මං ගාව තිබ්බේ නෑ. පොලිසියට ඒ ගැන කියන්න මට Social media එකෙන් ආපු ඒවා මම වෙනම Document කර ගත්තා.

ප්‍ර; දැන් ඔබට ඔබ සඳහන් කරා ඔබ අසල්වැසියන්ගෙන් එල්ලවූ බලපෑම් හේතුවෙන් ඔබගේ පවුලේ සාමජිකයන් ඔබට ගෙදරින් යන්න කිව්වා කියලා ?

පි: ඔව්.

ප්‍ර; ඔය අසල්වැසියයෝ කුමන ආගමට ජාතියට අයත් පුද්ගලයන්ද?

පි: මරදාන දෙවන මාළිගාකන්ද පටුමගේ ඔය ආගම් 3 ටම අයත් ක්‍රිස්තියානි ,බෞද්ධ,හින්දු, මුස්ලිම් ඉන්නවා.

ප්‍ර; ඔය ජාතින් තුනේම අය බලපෑම් කරාද ?

පි; මට කෙලින්ම කවුරුත් බලපෑම් කරේ නෑ. මගේ අන්කල්, Sister එයාලාට තමයි මොකද මාධ්‍යයේ හැම රූපවාහිනී නාලිකාවක වගේම පත්තරවල මගේ පින්තූරත් එක්ක ම ගිය හින්දා එක එක කතා direct and indirect talks

ප්‍ර; බලපෑම් කරපු පුද්ලයන්ගෙන් කුමන ජාතියකට අයත් ද? ඔය ක්‍රිස්තියානි ආගමේ අයත් ඔබට බලපෑම් කරාද බෞද්ධ ආගමේ අයත් බලපෑම් කරාද, ඉස්ලාම් ආගමේ අයත් බලපෑම් කරාද? නැත්නම්?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඒ පාරේ ඒ පටු මගෙහි හිටපු මිනිසුන් කවුරුත් මට කෙලින්ම බලපෑම් එල්ල කලේ නෑ මොකද සාක්ෂි දුන්නාට පස්සේ මම ගෙදරින්කොහේවත් එළියට ගියේ නෑ කාමරයට වෙලාමයි හිටියේ ඒ දවස් දහය වෙනකම් ජූලි 01 වෙනිදා උදේ පාන්දර මම ගෙදරින් පිටත් වුනා. මේ ඔක්කෝම මම ගෙදර කට්ටිය කියපු කතාව තමයි.

ප්‍ර; ඔබ දන්නවාද ගෙදර කට්ටියට බලපෑම් කරේ කවුද කියලා?ගෙදර කට්ටිය කිව්වාද කවුද බලපෑම් කරේ කියලා?

පි; ඒ දවස්වල ගෙදර කට්ටියත් එක්කත් මගේ සම්බන්ධතාවය මගේ මිත්‍රකම නැත්නම් නෑදෑකම ගොඩක් බිඳවැටිලා තිබ්බේ කැඩි බිදිලා ඒ ගොල්ලන් මාත් එක්ක ගොඩාක් තරහින් හිටියේ මේ වගේ දෙයක් ගිහිල්ලා මාධ්‍යය ඉස්සැරහ ඇයි ප්‍රකාශ කලේ කියලා හින්දා එක ඒ ගොල්ලන් විස්තර දීම මට විස්තර දෙන්න තරමට සමත් වෙලා හිටියේ නෑ ඒ තරම් මිත්‍රත්වයක් නැත්නම් ,සුහදශීලිත්වයක් ගෙදර ඇතුලේ තිබ්බේ නෑ.

ප්‍ර; එතකොට ඔබ දැනුවත් වෙන්නේ මේ අසල්වැසියන් පමණයි මේ බලපෑම් කරා කියලා පමණයි.?

පි: අසල්වැසියෝ හා නෑදෑයෝ.

ප්‍ර: දැන් මම ආයේ ඔබගේ අවධානය මෙම ලේඛණයට යොමු කරනවා ඔබ දැන් කිව්වා ඔය ලේඛණයේ මුල් පිටපත ඔබ ගාව නෑ කියලා?

පි: දැනට මං ලාව නෑ ගෙදර තියෙන්නත් පුළුවන් නැතිවෙන්නත් පුළුවන්.ඒක මම ස්ථිරව දන්නේ නැත මම ගෙදරට ගියේ නැත.

ප්‍ර; ඔය ලේඛණයේ යම් කිසි හෝ පුද්ගලයන් අදුරනවාද?පුද්ගලයන් කීදෙනෙක් ඔබ අදුරනවාද?

පි; 05 කට වැඩි ප්‍රමාණයක් මම අදුරනවා.

ප්‍ර: ඔබට තවමත් ඔය පුද්ගලයන් සමඟ සම්බන්ධතාවයක් තියෙනවාද?

පි: කාත් එක්කවත් සම්බන්ධතාවයක් නෑ.ඒ වුනාට ඒ ගොල්ලන් ගැන සමහර තොරතුරු මං දන්නවා.

ප්‍ර; දැනට ඔබ ඉස්සරහා ප්‍රකාශ කරා අත්අඩංගුවේ සිටින පුද්ගලයෙක්ගේ නම ?

පි: ඔව්.

ප්‍ර: එම පුද්ගලයාගේ නම ඔතන තියෙනවාද?

පි: තියෙනවා එම්.ආර්.එම්.රිස්වී.

ප්‍ර: මොකක්ද නම?

පි: එම් ආර්.එම් රිස්වී.

ප්‍ර: ඔහුගේ නම තියෙන්නේ උඩ ඉදන් කීවෙනි නොම්බරය යටතේද?

පි; 08 වෙනි.

ප්‍ර; ඒ ඔහුගේ අත්අකුරුද?

FAIR COMMENT
BY JEZEEM

පි: ඔව් ඔහුගේ අත්අකුරු. මට මතකයි එයා මාවනැල්ලේ ගනේ තැන්න කියන ප්‍රාදේශියේ පදිංචිකරුවෙක් එතකොට මේ ලේඛණයේ තමාගේ නම හා ගම තමයි ලියන්න අපිට advice එකක් දුන්නේ. එතකොට එයා ගනේතැන්නේ කියලා ලියන්න හැදුවා ඊට පස්සේ ඒක කපලා තමයි මාවනැල්ලේ කියලා කිව්වේ මොකද ගනේතැන්න කියන්නේ ඉතා කුඩා ගම්මානයක් ඊට පස්සේ මාවනැල්ල මැවනැල්ල ජමාතේ ඉස්ලාම් එකට අපි අයිති නිසා මාවනැල්ල කියලා ලිව්වා.ඒකත් එතන තියෙනවා. ඒක මට මතකයි.

ප්‍ර: දැන් මේ ඔබව දෙවනි සැරේ සහභාගි වුන කදවුරේ තමයි ඔබව නායකයා ලෙසට ඔබ පත්වුනේ

පි: හරි.

ප්‍ර: ඒකේ ලැයිස්තුව තමයි ඔබට ලැබුනේ?

පි; හරි.

ප්‍ර: ඔය පළවෙනි සැරේ එකේ නෙමේ?

පි: නෑ පළවෙනි සැරේ එක නෙමේ.

ගරු ස්වාමිනි මෙම සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද ලේඛණය **IR 01** ලෙස ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිමි.

ප්‍ර; සාක්ෂිකරු ඔබ සහභාගිවුණු පළවෙනි නේවාසික කදවුරේ ඔබට ඉගැන්නුවේ කුමද්ද?

පි: විවිධ දේවලින් උගැන්වූවා ඉස්ලාම් ආගම ගැන ශාරීරික exercises, Fun programs, even English but , ආගම ගැන තමයි ගොඩාක්ම ඉගැන්වූවේ විශේෂයෙන්ම එතැනින්ම කියන්න පුළුවන් කලිමා ගැන මුස්ලිම් වරයෙක් වීම සඳහා කරන ප්‍රකාශයක් the oath ඒක විග්‍රහ කරලා ඒ ගැන තමයි වැඩිපුරම අවධානය යොමු කරේ.

ප්‍ර: මොකක්ද ඒ කලිමා කියන ඔබ ගන්න ඒ දිවුරුම?

පි: ඔව් ඒ කදවුරට සහභාගිවීමට කලින් මම සාමාන්‍යයෙන් දැනගෙන හිටියේ ලායිල්ලාලා ඉල්ලල්ලා මොහොමදු රසු උල්ලා ඒක ආරබිවාක්‍යක් ලලිල්ලා ඉල්ලල්ලා මොහොමදු රසු උල්ලා ඒකේ තේරුම මම හිතන් හිටියේ අල්ලාහ් දෙවියන් හැර වෙන දෙවියන් නැත මොහොමද් නබිතුමා ඒ අල්ලාහ් දෙවියන් වහන්සේගේ දේවදූතයෙක් කියන එක. එතෙන්ට ගියාට පස්සේ ඒ ගොල්ලන් අරාබි භාෂාව අනුව ඒකටවෙන අර්ථ කථනයක් දුන්නා ලා ඉලාව ඉලාහ් කෙනෙක් නැත ඉල්ල්ලාහ් අල්ලාහ් හැර ඉලාහ් කෙනෙක නැත .ඉලාහ් කියන වචනය යටතේ කරුණු අඩංගු තුනක් ඒ කියන්නේ එතනින් එන්නේ the right of worshipping, the right of seeking help. If you have a problem or

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

anything we should pray to god and the third , they introduced that one with an Arabic word Harkimieth. That නීති රීති the parliament has the right of oreating the laws but here (දමිල බසින් ප්‍රකාශ කරයි) authority to introduce laws only belongs to allah. There are three things belongs to allah. One is the prayers or the worships. Second is the seeking help . that is we can call it prayers. The third one is the authority to create laws. So we should not make anyone or anything companion to allah in these three matters. A Muslim can not worship can not pray and can not follow the rules of any other thing. This is what they teach us. So based on this they said that creating an Islamic state is a must. We can't live under any other laws. This is what they clearly taught us

ප්‍ර: ඔබ මේ සදහන් කරන්න යෙදුනු කාලය ඔබගේ වයස කියද?

පි: 15,16 යි

ප්‍ර; මේවා පිළිබඳව ඔබට මෙම මවුලවි වරුන් ඔබලාට ඉගැන්වීමේදී ඔබට යම් කිසිදෙයක් සිතුනාද ?

පි: සිතුනේ නෑ.

ප්‍ර: මේක තමයි නිවැරදි ඉස්ලාම් ධර්මය කියලා ද ඔබ වටහා ගත්තේ?

පි: ඔව්.මේ වෙනුවෙන් තමයි මාත් I should also work for this one කියන මතය තමයි the feeling I got I should work for this.

ප්‍ර; රටේ තියෙන සාමාන්‍ය නීතියට සෑම දාම යටත් බව සාක්ෂිකරු දන්නවාද?

පි: දන්නවා.

ප්‍ර: එතකොට මෙම නේවාසික පුහුණු කදවුරේ රටේ නීතිය වැරදී නීතියක් ලෙසද අර්ථකථණය කරලා දුන්නේ?

පි; පැහැදිලිවම කිව්වා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වැරදීයි කියලා එතන නීති they create the laws. They make the laws, amend the laws. This is the right of the god no one can create or make laws same as no one can be worshipped and a Muslim can not seek help from anything other than allah and we should not follow or we should not support or help creating laws. මේ ගැන අපට පැහැදිලිවම කිව්වා ශ්‍රී ලංකා පාර්ලිමෙන්තුව ගැන විශේෂයෙන්ම සදහන් කලා.

ප්‍ර; එතකොට පාර්ලිමේන්තුවේ සම්පාදනය කරන නීතිරීති පටහැනිව ක්‍රියාකිරිමක්ද ඔය වැඩමුළුවේ සිසුන්ට කියා දුන්නේ?

පි: නෑ. එහෙම කෙලින්ම එහෙම දෙයක් අදහස් කරේ නෑ මේ නීතිරීති යටතේ අපිට ජීවත් වෙන්න සිද්ධ වෙලා තියෙනවා this is a (දමිප

FAIR COMMENT BY JEZEEM

ඔසින් ප්‍රකාශ කරයි) we don't have a choice so that we happened to live but විකල්පයක් නෑ ඒක අනිවාර්යෙන්ම නැති හින්දා අපි ජීවත්වෙනා. හැබැයි අපි මේකෙන් බැහැරවෙලා අපේම නීතියක් අල්ලාහ් දෙවියන් වහන්සේ විසින් හදුන්වා දීපු නීතිය ක්‍රියාත්මක කිරීමේ වාතාවරණයක් නැත්නම් පසුබිම් ඇති කිරිමට we should work for that one අපි ඒ ගැන වැඩකරන්න ඕනේ කියන එක මතය තමයි දුන්නේ.කොහෙවත් කිව්වේ නෑ ලංකාවේ තියෙන නීතියට විරුද්ධව යන්න කියලා කිව්වේ නෑ

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර; ඔබට ඔය විදියට පාඩම් කියන කොට ඔබට ඒ සම්බන්ධයෙන් යම් කිසි ආකර්ෂණයක් ඇති වුනාද ?

පි: ඔව්.

ප්‍ර; ඇයි එහෙම වුනේ ?

පි; ආගම පිළිබද තිබ්බ ආදරය තමයි ඒකට ප්‍රධානම හේතුව. විශේෂයෙන් ඉස්ලාම් ආගම අනුව මුස්ලිම් කෙනෙක්ගේ ලොකු ම බලාපොරොත්තුව මරනෙන් පස්සේ තියෙන ජීවිතය. ස්වර්ගයට යාම ඒ ජීවිතය සදාකල්. එතකොට මම දන්නවා ඒ දවස්වල දැනගෙන හිටියා මේ ජීවිතය අවුරුදු 70 ක් හෝ 80 ක් පමණයි ඒ සදාකල් ජීවිතයට යන්න ඕන්නම් ආගම හරියට අදහන්න ඕනේ අල්ලාහ් දෙවියන් කියපු දේවල් හරියට කරන්න ඕනේ කියන මතය තිබුනා.

ප්‍ර; ඔබගේ තිබ්බ අදහස ඒ පන්තියට සහභාගි වුන අනෙක් ශිෂ්‍යයන් තුලත් ඇතිවුනාද?

පි: ඒ ගැන මට පැහැදිලි උත්තරයක් දීම අමාරුයි .

ප්‍ර; මං මේ විදියට ප්‍රශ්නය ඇහුවොත් දැන් ඔබට ඔය කරපු පාඩම ඉස්ලාම් ධර්මයට අනුබද්ධ කරන් නැතිව ඔබටකෙලින්ම උගන්වන්න හැදුවා නම් ඔබ ඒ සම්බන්ධයෙන් ක්‍රියාකරපු විලාශය වෙනස් වෙනවා?

පි: ඔව් වෙනස් වෙනවා

****

<u>රජයේ අධිනිතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා.</u>

ප්‍ර; ඉස්ලාම් ආගමේ සිසුවකු වශයෙන්ම සාමාන්‍ය නීතියට යටත් වීම ඔබට කියලා දුන්නේ කුමන ආකාරයට එය වැරදි ක්‍රියාවක්ද එය පාපයක් ද ?

පි: විකල්පයක් නැති හින්දා ඒකට තාවකාලිකව යටත්වෙලා ඉන්න වෙනවා කියන එක තමයි කියලා දුන්නේ ඒකට තමන්ගේ හිතින් හදවතින් ඒකට එකගවීම පාපයක් කියලා තමයි අපිට කියලා දුන්නේ. ඒ පමණක් නොව

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජාතික ධජය ජාතික ගීතය වැනි දේවල්වලට ගරු කිරීමක් පවා වැරදියි කියන මතය කියලා දුන්නා.

ප්‍ර: ඔබ මේ වගේ මතවල් පළවෙනි සැරේට ගියාම ද ඔය කියලා දුන්නේ? පළමු වරට කදවුරට සහභාගි වුනාමද?

පි; පළවෙනි වරටත් කියලා දුන්නා දෙවනි වරටත් ඒකම කියලා දුන්නා.

ප්‍ර: ඔව් පළමුවරටත් කියලා දුන්නා ට පස්සේ ඔබට දෙවනි වරටත් කදවුරට යාමට තිබ්බ ආසාව කුමක්ද?

පි: ආගම හා සංවිධානයත් එක්ක තිබිච්ච ආගමත් එක්ක තිබිච්ච භක්තිය හා සංවිධානයත් එක්ක තිබිච්ච බැදීම ඒ වගේම මේ වගේ දේවල් තව ගොඩාක් පැහැදිලිව මම ඉගෙන ගන්න ඕන කියන ආසාව මා තුල තිබ්බා. Repeat කරන්න ඕනේ මේ කේ මොනවා හරි මිස්වෙලා තිබ්බොත් ඒක හරියට අල්ල ගන්න ඕනේ හරියටම අල්ල ගන්න ඕනේ කියන ආසාව මා තුල තිබ්බා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර; මේ ඉගැන්වීම් හැරුණුවිට ශාරීරික අභ්‍යාස වැනි ඔය දේවලුත් කරාද?

පි: ඔව් උදේම ශාරීරික අභ්‍යාස කරනවා ඒ වගේම හවස් වෙලා ඩිබේට් නැත්නම් puzzlesඅහන එක

ප්‍ර; ආත්ම ආරක්ෂක ක්‍රම ගැන පුහුණුවක් වුනාද?

පි; නෑ ආත්ම ආරක්ෂාව ක්‍රම ගැන පුහුණුවක් කරේ නෑ ශාරීරික අභ්‍යාස විතරයි කරේ දුවන එක බඩටlike abs exercises, push ups එවැනි දේවල් තමයි කරේ ඒකට භාවිතා කරේ මාදම්පේ මුස්ලිම් විද්‍යාලයේ ග්‍රවුන්ඩ් එක සමහර programs වලට . මේ පළමු සැරේ කුඩා ප්‍රමාණයක් 40 ක ප්‍රමාණයක් හිටපු හින්දා ඒක වුවමනා වුනේ නෑ දෙවනි වරට සමහර ප්‍රෝගැම්ස්වලට භාගෙට භාගයක් වගේ අපිට මාදම්පේ මුස්ලිම් පාසලක් මුස්ලිම් විද්‍යාලය නම හරියට මතක නෑ ඒ මාදමපේ ඉස්ලාහියා පල්ලිය එක්ක පාරේ ඇතුලතට යන්න ඕනේ ඒ පැත්තේම තියන පාසලක් ඒ පාසලේ පන්ති කාමර හා ක්‍රීඩා පිටිය භාවිතයට ගත්තා

ප්‍ර; මෙම වැඩමුළුවලට සහභාගි වුනේ ඉස්ලාම් ආගම හදාරණ මුස්ලිම් සිසුවන් කිව්වොත් නිවැරදිද?

පි: ඔව් මුස්ලිම් සිසුන් පමණයි සහභාගි වුනේ.

ප්‍ර: ඔබලා අතර ඉතාමත් අන්තර් බැදීමක් ඒ කාලයේ ඇති වුනාද?

පි: ඔව් ඇති වුනා.

පි: එතකොට ඔබට ඒ කාලේ අනෙක් ආගම් අදහන සිසුවන් පිළිබඳව ඇති වී තිබූ ආකල්පය කුමක්ද?

FAIR COMMENT — BY JEZEEM

පි; වැරදි ආගමක් නැත්නම් අපිව නිර්මාණය කරපු දෙවියන් නොව වෙන දේවල්වලට වන්දනා කරන වරදක් කරන කට්ටිය මතය තිබුනා ඒ වුණාට ඒ ගොල්ලන් ගැන තරහක්වත් වෛරයක්වත් තිබුනේ නෑ.

ප්‍ර; ඇයි තිබුන් නැත්තේ?

පි; මේ ගොල්ලන්ට හරි ආගම හදුන්වලා දුන්නොත් මේ ගොල්ලොත් අපේ මාර්ගයට එයි කියන විශ්වාසය මට තිබුනා.

ප්‍ර: ඒ කියන්නේ ඔබට ආකල්පයක් ඇති වුනා වෙනත් ආගම් වල සිටින සිසුවන්ව තමන්ගේ ආගමට නම්වා ගැනීමට කිව්වොත් නිවැරදිද?

පි: ගන්න පුළුවන් කියන විශ්වාසය තිබුනා .

ප්‍ර; ඒක ඔබ තුලින් ආපු විශ්වාසයක් ද නැත්නම් මෙම මවුලවි විසින් ඔබලාට යොමු කරන ලද විශ්වාසයක් ද ?

පි: මවුලවිලා විසින් යොමු කරන ලද විශ්වාසයක්.ඒ ගැනත් අපිට ජමාතේ ඉස්ලාමිය සංවිධානයේ යම් කිසි පුහුණුව නැත්නම් දේශනා පවා කරා.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: තමුන් මේවා ඉගෙන ගන්න කොට ඒ අය කියලා දුන්නාද මේවා Confidential ඒ කියන්නෙ දැන් මේ පිට ගිහිල්ලා කියන්න එපා කියන හැගිමක් තිබුනාද එතන?

පි: කෙලින්ම එහෙම දෙයක් කියලා දුන්නේ නෑ ඒ වුනාට අපි ඇතුල අපි සාමාන්‍යයෙන් දන්නවා මේක කියන්න හොද නෑ එළියට ගිහිල්ලා අන්‍යාගමිකයින් මේකට සහභාගි නොවුනු ආගම හෝ ගැන කිසිම උනන්දුවක් නැති අයට කියන්න හොද නෑ කියන දෙයක් තිබුනා ඒ වුනාට පළවෙනි වතාවට මම මේකට සහභාගිවෙලා මාවනැල්ලට එනවා එනකොට මගේ යාළුවෝ හිටියා හැමෝම මේකට සහභාගි වුනේ නෑ. ඒ ගොල්ලත් ඉස්ලාම් ආගමට සම්බන්ධ අය ඒකේ සමහර අය දේශපාලන වශයෙන් අපි ඉතා කුඩා සාමාන්‍ය පෙල විභාගය කරලා හිටියාට ඒ දවස්වල අපි දේශපාලනය ගැන කතා කරනවා මුස්ලිම් කොන්ග්‍රසයට සහයෝගය දෙන නැත්නම් එවකට හිටපු ජනාධිපති ගරු චන්ද්‍රිකා බණ්ඩාර නායක මැතිණියට සහයෝගය දෙන පිරිසකුත් හිටියා එතටකොට සාමාන්‍යපෙල විභාගයට කලින් මමත් එවකට හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියට කැමැත්තක් හිටපු කෙනෙක් මට ඡන්දේ තිබ්බේ නෑ.ඊට පස්සේ එනකොට මගේ මතය වෙනස් වුනා මෙතුමියට අපි සහයෝගය දෙන්න බැහැ. මේක වැරදියි කියන මතය ඇතිවුනා. එතකොට ඒ වගේ මුස්ලිම් කොන්ග්‍රසයට සහ චන්ද්‍රිකා මැතිණියගේ ආණ්ඩුවට සහයෝගය දෙන අපි කතා බහ කරන කොට ඒ විදියට දේශපාලනය ගැන කතා කරන යාළුවෙක් එක්ක මම විවාද කරා.

ඒ ගොල්ලන්ගේ ඒ මතය වෙනස් කරන්න මම උත්සහ කරා. පැය ගණන් මම ඒ ගොල්ලන් එක්ක argue කරා මෙහෙම නෙමේ ඉස්ලාම් ආගම මෙහෙම තමා මේ අපි මුස්ලිම් කලිමා එක ලයිල්ලා ඉල්ලල්ලා රසු උල්ලලා අපි කියලා තියෙනවා ඒ අනුව අපිට මේක කරන්න බැහැ කියලා

ප්‍ර; දැන් ඔබ ට කියන්න පුළුවන්ද දැන් මේ පාසලට ගිහිල්ලා මේ ඉගෙන ගෙන එන කොට ඔබ brain wash වෙලාද එන්නේ ?

පි: ඔව් ඒ හින්දා තමයි මට මේ 94 මම O/L කරන කාලේ තමයි ජන්දේ තිබ්බේ අවුරුදු 17 එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු පාලනයෙන් පස්සේ අපි ගොඩාක් සතුටින් තමයි හිටියේ මම දන්නේ නෑ මම ගොඩාක් පොඩියි වෙනසක් ඇතිවෙනවා කියලා රටේ මේකට සහභාගිවෙලා ආවට පස්සේ මේකට නෙමේ අපිට ඕන වෙනස ඉස්ලාම් රාජ්‍යයක් තමයි අපිට ඕනේ වෙනස කියන මතය ආවා එතනින් ඒ සතුටත් නැති වුනා.

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: දැන් ඔබ වයස අවුරුදු 14,15 ඉදලාම ඉස්ලාම් ආගමික පාසල්වල ඉස්ලාම් ආගම ඉගෙන ගත්තා නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට දැන් සාමන්‍යයෙන් තරුණ දරුවෙක් අවුරුදු 14,15 වගේ වෙනකොට තමන්ගේ Social life එක වගේ ගැන හිතලා තමන්ට කැමති විදියට ගෙදරින් එළියට ගිහිල්ලා තමන්ගේ වයසේ තව තරුණ පිරිස් සමඟ එකතු වෙලා එහෙම කටයුතු කිරීම ක් ඔබලා ගේ කණ්ඩායමට තුල ඉඩ තිබුනේ නැද්ද එහෙම නැත්නම් ආගමික ඉගැන්වීම නිසා එවැනි දේවල් කිරීමට අවස්ථාවක් නොළැඹුනාද?

පි: තිබුනා අපි එවැනි දේවලුත් කරා ඒ වුනාට ඒකට සහභාගි වෙන යාළුවෝත් ජමාතේ ඉස්ලාමී සංවිධානයට සම්බන්ධ පරිසරය තමයි තිබ්බේ ඒ කියන්නේ අපිට මගේ යාළුවොත් ඒ දවස්වල හිටියේ ජමාතේ ඉස්ලාමිය සංවිධානයත් එක්ක සම්බන්ධ වෙච්ච නැත් නම් ආගම ගැන කතා කරන යාළුවෝ නැත්නම් දේශපාලනය ගැන අපි ඒ ලයින් එකේ තමයි අපේ යාළුවෝ ගොඩාක්ම හිටියේ .

ප්‍ර: එතකොට ඔබලාගේ ඔය මද්‍රසා හෝ දහම්පාසල්වල ධර්මය උගන්වන පාසල්වල ඔබලාට චිත්‍රපටි නැරඹීම හෝ සංගීතය හෝ සංගීත භාණ්ඩ වාදනය එවැනි දේවල් තහනම් කරලා තිබෙනවාද?

පි: ඔව් ඉස්ලාම් ආගමේ අනුව චිත්‍රපට බැලීම සහ සංගීත තහනම් මට පොඩි කාලේ ආසාක් තිබුනා සංගීත භාණ්ඩ මොනවාහරි දෙයක් ඉගෙන

FAIR COMMENT — BY JEZEEM —

ගන්න ඕනේ කියලා මම ඒ මාර්ගයේ ගියේ නෑ අඩුම ගානේ චිත්‍ර අදින්නවත් මං කැමති වුනේ නෑ.

පි: Drawing THE LIVE BEINGS. පණ තියෙන දේවල් DRAW කරන එක ආගමේ තහනම්.

ප්‍ර: චිත්‍ර අඳින එකක් ආගමෙන් තහනම් කරලා ද තියෙන්නේ?

ප්‍ර: ගස්කොලනුත් පන තියෙනවානේ ගස් කොළන් අඳින එකක් තහනම්ද?

පි: ඉස්ලාම් ආගමේ පන කියන එක define කරන එක වෙන විදියට ඒ අනුව සත්තු තමයි සත්තු හා මනුශ්‍යයෝ .

****

<u>රජයේ අධිනිතීඥ අරින්ද්‍ර ජයසිංහ මහතා.</u>

ප්‍ර: ඔබ මේ පළවෙනි සැරේ මෙම කදවුරට සහභාගි වුනාම ඔබට මෙම එක එක විෂයන් පිළිබඳව ඉගැන්වූ මවුලවි වරුන් ගේ නම් මතකද?

පි: සල්මාන් ෆාරිස් නලිම් හිටියා, හනීස් බුදර් කියන එක්කෙනා ආවා. හජ්යුල් අක්බර් මවුලවි පළමු එකට ආවාද කියන එක ගැන පොඩ්ඩක් මට මතයේතියෙනවා දෙවනි එකට ආවා. හජ්ජුල් අක්බර් මවුලවි තුමා. පළවෙනි එකට ආවා කියලා තමා මට මතකයේ තියෙන්නේ මොකද මට දෙපාරක් සහභාගි වේච්ච හන්දා මට සමහර සිද්ධි පළවෙනි වතාවේ වුනා ද දෙවනි වතාවේ වුනාද කියන එක මට මේකේ තියෙනවා තව ඉංග්‍රීසි ගුරුවරයෙක් ආවා ඉස්ලාහියා කට්ටිය ආවා.

වේලාව:පෙ.ව.11.35

මෙතැන් සිට:දම්මිකා මිය

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කලේ චන්දිමා මෙනවිය විසින්ය
දැන් වේලාව :- පෙ.ව. 11.35 යි
මෙතැන් සිට සටහන් කරන්නේ ධම්මිකා පෙරේරා විසින්ය.

<u>රජයේ අධිනිතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා:</u>

ප්‍ර : මම ඔබට යෝජනා කලොත් මින්හාජීස්ලා කියන මව්ලවිතුමත් ආවද?

පි : ඒ මව්ලවිතුමත් ආවා, ඒක පලවෙනි වතාවද, දෙවෙනි වතාවද කියන එක මට හරියට මතක නැහැ.

ප්‍ර : ඔබ සඳහන් කලා හජ්ජුල් අක්බාර් කියන මව්ලවිතුමා ආවා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඔහු යම්කිසි විශේෂ දෙයක් මෙම දේශනා පවත්වද්දි කිව්වද?

පි : දේශනා නෙමෙයි පන්තියේදි, පන්තිය පවත්වන කොට කිව්වා ඒක තාම මට මතකයි. මාදම්පේ පල්ලියේ ඇතුල් වෙන කොට වම් පැත්තේ දොරටුවක් තියෙනවා, ඒ දොරටුව ගාව පුටුවේ තමයි එයා වාඩි වෙලා හිටියේ. ඒ වෙලාවේ තමයි අපිට මේ ඉස්ලාම් රාජ්‍ය පිහිටුවීම ගැන ඒක කොහොමද ක්‍රියාත්මක කරන්නේ කියන එක කියාගෙන යන කොට එක ප්‍රශ්නයක් ආවා ඉස්ලාම් රාජ්‍යයක්, ලංකාවේ ඉස්ලාම් පාලනයක් පිහිටුවනවා නම් බහුතරයක් මුස්ලිම් වෙන්න ඕන, ඒකට කල් යයි නේද කියන ප්‍රශ්නයක් ඇහුවාම ඒකට එයා දුන්නු උත්තරය මට තාම මතකයි, එතුමා එතකොට ඒ ප්‍රශ්නෙට කිව්වා ඉන්දියාව මුස්ලිම්වරුන් විසින් අවුරුදු 800 ක් පාලනය කලා. කවදාවත් මුස්ලිම්වරු ඉන්දියාවේ බහුතරයක් වෙලා හිටියේ නැහැ කියන වචනය. මෝගල් අධිරාජ්‍යයා විසින් අවුරුදු 800 ක් පාලනය කලා. කවදාවත් මුස්ලිම්වරු බහුතරයක් වෙලා හිටියේ නැහැ කියන එක. එතනින් එයා අදහස් කලේ අපි බහුතරයක් වෙන්න ඕන නැහැ අපිට බලය තියෙනවා නම් අල්ලා ගන්න පුළුවන් නම් අල්ලා ගන්න පුළුවන් කියන එක තමයි මම ඒ කාලේම තේරුම් ගත්තේ.

ප්‍ර : ඔබ ඒ වයසේ ඉද්දි ඒ ආකල්පයට ආශාවක් ඇති වුණාද?

පි : ඔව්, ඒ ඉස්ලාම් රාජ්‍යයක් පිහිටුවන්න පුළුවන් නම් හොඳයි කියන, ඒක තමයි හරි කියන අදහසක් තිබුණා.

ප්‍ර : මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න මෙම හජ්බුල් අක්බාර් කියන මව්ලවිවරයාගේ තනතුර මොකක්ද කියලා?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒ වෙන කොට එයා ජමාතේ ඉස්ලාම් සංවිධානයේ ජාතික නායකයා. ලංකාවටම එයා තමයි නායකයා. ඒක අරාබි භාෂාවෙන් අමීර් කියන නමින් තමයි අඳුනන්නේ.

ප්‍ර : ජාතික නායකයෙක් ඔබ ඉස්සෙල්ලා ප්‍රකාශ කල ආකාරයට පැහැදිලි කිරීමක් කලාම ඔබට යම්කිසි ධෛර්යයක්, උද්යෝගයක් ඇති වුණාද?

පි : ගොඩාක්.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : දැන් මේ හජ්ජුල් අක්බර් ඔබට කිව්වනේ ඉන්දියාවේ මුස්ලිම් බහුතරයක් නැතුව ඉන්දියාව මුස්ලිම් ඉස්ලාම් රාජ්‍යයෙකු විසින් පාලනය කලා වසර 800 ක් විතර කියලා, ඉතින් ලංකාවෙත් ඒක කරන්න පුළුවන් කියලා, එතකොට ඔහු දේශනාවලදීත් පැවසුවාද ලංකාවේ ඉන්න බහුතරයක් අන්‍යාගමිකයන් ඉස්ලාම් ආගමට හරවා ගන්නවා, එහෙම හරවා ගන්නට කැමති නැති අයව මරා දමනවා කියලා?

පි : නැහැ එහෙම දෙයක් එයා එතන පැවසුවේ නැහැ.

****

<u>රජයේ අධිනිතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා:</u>

ප්‍ර : දැන් ඔය හජ්ඛුල් අක්බාර් කියන මව්ලවිතුමා කොහේද ඉන්නේ?

පි : දැනට මාවනැල්ලේ පදිංචිව සිටිනවා මම දන්න තරමට.

ප්‍ර : ඊට පස්සේ ඔබ සඳහන් කලා මිනාජ්

පි : මින්හාජ් ඉස්ලාහි පුත්තලමේ පදිංචි මිනිහාජ් ඉස්ලාහි.

ප්‍ර : එම මව්ලවි තුමා පිළිබඳව ඔබ දන්නවාද?

පි : දන්නවා.

ප්‍ර : කොයි කාලෙදී ද දැන ගත්තේ?

පි : 93 වසරේදී වගේ මම දැන ගත්තා. මොකද එයා ඒ දවස්වලම ආවේගශීලි විදියට Emotionally his delivered speeches about Jihad. Jihad ගැන ගොඩක් ආවේගශීලීව විදියට.

ප්‍ර : මෙම මව්ලවිතුමා කුමන හෝ රටකට ගියා කියලා දන්නවද?

පි : ඔව් එතුමාම පැවසුවා ඇෆ්ගනිස්ථානයට ජිහාත් කිරීම සඳහා ගිය බව. මාදම්පේ ඉස්ලානියාවේදි එතුමා පැවසුවා. මම හිතන විදියට දෙවෙනිවර ගිය එකක් වෙන්න ඕනේ. ඒකත් මට හරියට ම කියන්න බැහැ දෙවෙනිවර මම නේවාසික පුහුණු කඳවුරට ගිය වෙලාවේ එතුමා පැවසුවා එයා ජිහාත් කිරීම සඳහා

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඇෆ්ගනිස්ථානයට ගියා කියලා. මේ පන්තියේ නෙමෙයි සුහඳව කතා කරගෙන ඉන්න වෙලාවේ දී කිව්වා.

ප්‍ර : ඒ පිළිබඳව එයා මොනවා හරි පින්තූරයක් එහෙම පෙන්නුම් කලාද?

පි : නැහැ එයා පින්තූරයක් පෙන්නුවේ නැහැ.

ප්‍ර : ඊට පස්සේ දැන් ඔබ නැවතත් පාසලේ අධ්‍යාපනය හදාරනවාද මෙම වැඩමුළුවලට සම්බන්ධ වීමෙන් අනතුරුව?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සෙත් ආයෙත් මෙම සංවිධානය මගින් තවත් වැඩමුළු පවත්වනවා නේ?

පි : ඉජිටිමා මෝස්කර් නම්වලින් පැවැත්තුවා.

ප්‍ර : ඒක දින කීයක වැඩමුළුවක් ද?

පි : ඒක පොදුවේ හැමෝටම පැවැත්තුවා දින එකක්, දින දෙකක් වගේ දේවල් පැවැත්තුවා. ඒ හැර උසස් පෙළ විභාගයට Sit කරපු ළමයින්ටත් දින 7 ක් පැවැත්තුවා. ඒ වුණාට ඒකට සහභාගී වීමට මට අවස්ථාවක් ලැබුනේ නැහැ.

ප්‍ර : ඇයි ඔබ සහභාගි වුනේ නැත්තේ?

පි : 96 වසර වෙන කොට ඇති වෙච්ච යම්කිසි මතභේද හින්දා මම ජමාතේ ඉස්ලාමිය සංවිධානයෙන් ඈත් වුණා.

ප්‍ර : මතභේදය මොකක්ද?

පි : ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ මතය වෙලා තිබ්බේ ඉස්ලාම් රාජ්‍යයක් පිහිටුවීම. ලංකාවෙත් හා ලෝකයේ ඉස්ලාම් රාජ්‍යය පිහිටුවීම. ඒ වුණාට අපිට එදා එදා, එදිනෙදා ජීවිතවල කරන්න ඕන ආගමික කටයුතු පස්වේල වදින එක, නෝම්බි අල්ලන එක, නෝම්බි කාලේ තිබෙන විශේෂ Prayer එක මේ වගේ දේවල්වල මුස්ලිම් සමාජය ඇතුලේ යම්කිසි මත 2 ක් ඇති වුණා. කොයි විදියටද ඒක කරන්න ඕන කියන එක ඒ කාලේ ඇති වුණා, ඒක තවුහිද් සංවිධානය විසින් අළුත් මතයක් ගෙනාවා. නබීතුමා කරපු විදියට තමයි අපි කරන්න ඕනේ කියලා. හැබැයි ඒ වෙන කොට ලංකාවේ කරගෙන හිටියේ වෙනස් විදියට. එතකොට අපි අතර ප්‍රශ්නයක් ආවා කොයි විදියටද අපි කරන්නේ ජමාතේ ඉස්ලාමීය කට්ටිය. එතකොට ජමාතේ ඉස්ලාමේ අපිට කිව්වා ගොඩක් මිනිස්සු කරන විදියට ඕගොල්ලන් කරන්න, අපේ අරමුණ මේක නෙමෙයි පාලනය ඇති කිරීම, පාලනය ඇති කලාට පස්සේ ඒ පාලකයා ඉස්ලාමීය රාජ්‍ය නායකයා තමයි තීරණය කරන්නේ කොයි එකද හරියි කියලා, ඒ හින්දා ඒක ඕගොල්ලන් දැන් අතට

Parliament Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ගන්න එපා කියලා. ඒ වුණාට මගේ ආසාව තිබුනේ මරණෙන් පස්සේ දෙවියන් වහන්සේ අල්ලාහ් දෙවියන්ට මුහුණ දෙන කොට හරියට ආගම පිළිපදින කෙනෙක් වෙන්න ඕනේ කියලා. එතකොට තවුහිද් ජමාත් එකේ කිව්වා නැහැ අපි හරි දේම දැන්ම කරන්න ඕනේ. මේකට පාලනයක් එන කල් බලා ඉන්න ඕනේ නැහැ, පල්ලියේ අපි වඳින එකේ වැරදි විදියට Prayer කරගෙන ඉන්න ඕනේ නැහැ පාලනයක් එන කල් ඒක දැන්ම අපිට කරන්න පුළුවන් කියලා. එතකොට ඒ මතය මට හරියි කියලා හිතුනා. ඒ හින්දා තමයි මට ජමාතේ ඉස්ලාමීය සංවිධානයෙන් ඇත් වෙන්න සිද්ධ වුනේ.

ප : ඒ ඇත් වුණ හින්දා තමයි ඔබ අර දවස් 7 නේවාසික කඳවුරට සහභාගී වීමට හැකියාවක් නොලැබුණා කිව්වොත් නිවැරදි ද?

පි : නිවැරදියි.

ප : හැබැයි ඔබ මෙම නේවාසික කඳවුර පිළිබඳව, දවස් 7 නේවාසික කඳවුර පිළිබඳව තොරතුරු දන්නවද?

පි : දන්නවා. මගේ Senior Students ලා මට කලින් අවුරුද්දකට කලින් A/L කරපු Students ලා ඒකට සහභාගි වෙලා ඇවිල්ලා මට ඒවා ගැන කිව්වා. ඒ 96 දී. 96 A/L කරපු කට්ටිය A/L කරන කොට ඒක තිබුණේ මාවනැල්ලේදි. එතකොට මට හරියටම මතක නැහැ ඒ වෙන කොට ප්‍රාන්ත ප්‍රාන්ත වලට වෙනම පුහුණු කඳවුරු පටන් ගත්තද, නැත්නම් ලංකාවටම තිබ්බ එකම කඳවුර මාවනැල්ලේ තිබ්බද කියන එක. පහුකාලේ වෙන කොට ජමාතේ ඉස්ලාමීය සංවිධානය සෑහෙන ව්‍යාප්ත වුණා. ව්‍යාප්ත වුණාට පස්සේ ඒගොල්ලන්ට එක කඳවුරක් මුළු ලංකාවටම තියෙන එක ගොඩක් අපහසු වෙච්ච හින්දා ප්‍රාන්ත ප්‍රාන්තවලට වෙන වෙනම තමයි තියෙන්නේ. මාවනැල්ලේ තිබිච්ච එක 96 A/L වලට පස්සේ පැවැත්වූ එක මාවනැල්ල ප්‍රාන්තයට ඒ කියන්නේ මධ්‍යම පළාතට විතරක් අයිති එකක්ද නැත්නම් මුළු ලංකාවටම අයිති එකක්ද දන්නේ නැහැ, ඒකට මගේ යාළුවොත් සහභාගී වුණා. මගේ Seniors ලා සහභාගී වුණා. ඒගොල්ලන් මට ඒ ගැන කිව්වා.

ප : ජ්‍යෂ්ඨයන් ඔය සහභාගී වූ වැඩමුළුව පිළිබඳව සාකච්ඡා කරද්දි ඔබට යම්කිසි ආසාවක් ආවේ නැද්ද නැවතත් ඔය වැඩමුළුවට සහභාගිවීමට අවශ්‍යයි කියලා?

පි : මම ඒ ගැන බලාපොරොත්තුවෙන් හිටියා. ඒ වුනාට ඊට කලින් මම සංවිධානයෙන් අයින් වෙන්න සිද්ධ වුණා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මෙම ගරු කොමිෂන් සභාවට කියන්න මොනවද ඔය ඔබට දැන ගන්න ලැබුනේ ඔය සංවිධානයේ ඔය දවස් 7 පුහුණු කඳවුරේ සිසුන්ට ඉගැන්නුවේ කියලා?

පි : මට මගේ Seniors ලා කියපු විදියට අපිට උගන්වපු දේවල් විශේෂයෙන් අර ඉස්ලාමීය පාලනය ගැන, කලීමා ගැන කියපු දේවල් තව ගැඹුරට උගන්වලා තියෙනවා. ඒ හැර පිහිණුම් පවා උගන්වලා තියෙනවා කියලා මට දැන ගන්න ලැබුණා. Swimming .

ප්‍ර : දැන් ඔබ ඔය වැඩමුළුවලට සහභාගී වීමේදී ඔබ කිව්වා ජමාතේ ඉස්ලාමීය සංවිධානයෙන් තමයි ඔබට මෙය දැන ගන්න ලැබුනේ කියලා, ඔබ දැන් දන්නවද මෙම සංවිධානය මගින් තවමත් මෙම වැඩමුළු පවත්වනවාද කියලා?

පි : ඔව් පාස්කු ඉරිදා ප්‍රහාරය වෙන කල් මේක පැවැත්තුවා. ඊට පස්සේ පැවැත්වෙනවාද කියන එක ගැන මම දන්නේ නැහැ. ඒ වෙන කල් පැවැත්තුවා.

ප්‍ර : ඔබ කොහොමද ඒක දැන ගත්තේ?

පි : අන්තර් ජාලය, ඒ වගේම අඳුරන අය ඒකට සහභාගි වෙනවා, මම මාවනැල්ලේ ඉන්න කාලෙත් 2009 වෙන කල් මාවනැල්ලේ හිටියා. එතකොටත් මම අඳුරන මල්ලිලත් ඒකට සහභාගි වුණා. ආරාධනාවක් ආවා මම අඳුරන මල්ලිලාට මේකට සහභාගී වෙන්න කියලා. ඒ වගේම Face Book හරහාත් මම ඒ ගැන දැන ගත්තා ඒක පැවැත්වෙනවා කියලා.

ප්‍ර : ඔබට ඔය ආරාධනාව ආවේ පාස්කු ප්‍රහාරයට කලින්ද? පසුවද?

පි : මට නෙමෙයි මා අඳුරන මල්ලිලාට. ඒ 2009 ට කලින්. 2009 ට පස්සේ මම මාවනැල්ලේ ජීවත් වුනේ නැහැ.

ප්‍ර : හැබැයි ඔබට තොරතුරු ලබා ගැනීමට හැකියාවක් තිබ්බා?

පි : ඔව් තොරතුරු ලබා ගැනීමේ හැකියාව තිබ්බා..

ප්‍ර : ඒ තොරතුරු ලබා ගත්තේ පාස්කු ප්‍රහාරයට කලින්ද, පසුවද?

පි : කලින් මම දැන ගෙන හිටියා මේවා සිද්ධ වෙනවා කියන එක

ප්‍ර : ඔබට ඒ සම්බන්ධව මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද සාක්ෂිමය වශයෙන් ඔබ මෙම ජමාතේ ඉස්ලාම් සංවිධානය මගින් මෙම වැඩමුළු පවත්වා ගැනීම සඳහා යම්කිසි Leaflet එකක් වගේ දෙයක් බෙදා හැරීමක් කලාද කියලා?

පි : බෙදා හැරපු Leaflet එකක් නම් මට හම්බ වුනේ නැහැ. ඒ වුණාට මම දැනගෙන හිටියා මේක සිද්ධ වෙනවා කියන එකයි, මේකට

FAIR COMMENT BY JEZEEM

රජයේ ලාංඡනය සහිත සහතික පතක් ලබා දෙනවා කියන එකයි, ඒකට මුස්ලිම් Cultural Department, මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ අනුග්‍රාහය අරන් තියෙනවා කියන එකයි මම දැන ගත්තා. ඊට පස්සේ Net එකේ ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ ශිෂ්‍යය ඒකකයේ Facebook Page එකේ හොයලා බැලුවාම ඒවා තිබුණා. ලාංඡනෙත් එක්ක නේවාසික පුහුණු කඳවුරවලට සහභාගී වෙන්න කියලා දාපු ආරාධනාව.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : මෙම තමන්ට ඔය සහතිකය මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශයකින් ලැබිලා තිබ්බේ රජයේ ලාංඡනයත් සමඟද?

පි : මම සහභාගි වෙච්ච කාලේ එවැනි දෙයක් තිබුණේ නැහැ. පසු කාලේදි 2000 ගණන්වලට පස්සේ තමයි ඒක පටන්ගෙන තියෙන්නේ.

ප්‍ර : ලාංඡනයත් සමඟ තමයි සහතිකය නිකුත් කරලා තියෙන්නේ?

පි : සහතිකය නිකුත් කරලා තියෙන්නේ මම දැන ගත්ත විදියට ඒ වුනාට සහතිකයේ පිටපතක්වත් මම ලඟ නැත. මට සොයා ගන්න බැරි වුණා. එහෙම වැඩමුළුවක් තියෙනවා කියලා පළ කරපු අත් පත්‍රිකාවේ Facebook Copy එක මං ගාව තියෙනවා.

ප්‍ර : ඒ කාලෙත් ඔය මුස්ලිම් පාලනයක් රට තුළ ඇති කළ යුතුයි බහුතරයක් නැති වුණත් සුළු පිරිසකට මුස්ලිම් පාලනයක් කරන්න පුළුවන් කියන දේශන පවත්වලා තියෙනවද?

පි : ඒක ගැන මම විස්තර දන්නේ නැහැ 96 දී මම ඒ සංවිධානයෙන් ඈත් වුණාට පස්සේ අභ්‍යන්තර දේවල් දැන ගැනීමේ පොඩි අපහසුතාවයක් තිබෙනවා. මොකද ජමාතේ ඉස්ලාමීය සංවිධානය කියන්නේ ගොඩාක්ම Closed Circle එකක්. ඒකේ ඇතුලේ තියෙන දේවල් ලේසියෙන් කියන්නේ නැහැ.

ප්‍ර : තමන් දන්නවද ඒ අමාත්‍යාංශවලින් මේ පවත්වන දේශන මොනවද කියලා අධ්‍යයනයක් කලාද කියලා ඒ දවස්වල, සංස්කෘතික අමාත්‍යාංශයෙන්?

පි : අපි සහභාගි වෙච්ච දවස්වල නම් ඒ වගේ දෙයක් සිද්ධ වුනේ නැහැ.

ප්‍ර : මුස්ලිම් ආගමික අමාත්‍යාංශයෙන්?

පි : නැහැ එහෙම දෙයක් සිද්ධ වුනේ නැහැ.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : කෙසේ වුවත් ඒ සහතික පත්‍ර රජයේ ලාංඡ නය ඇතුව දුන්නත් ඔබ කියන්නේ ඒ පාලන තන්ත්‍රයට විරුද්ධ අදහස් ප්‍රකාශයක් කරලා තියෙනවා?

පි : මම සහභාගි වෙච්ච වැඩ සටහන්වල ඒක පැහැදිලිව සඳහන් කලා. ඒ වුණාට ඒ දවස්වල වුනත් අද වුනත් ඒ පුහුණු කඳවුරුවලට භාවිතා කරන්නේ වෙන නමක්. මහ පෙන්වීමේ ව්‍යාපෘතිය නැත්නම් ශිෂ්‍යයන්ගේ career guidance වගේ නම තමයි ඒගොල්ලන් භාවිතා කරන්නේ. ඉතා සූක්ෂම ලෙස තමයි නම තෝරා ගන්නේ. ඉස්ලාම් පාලනය ඇති කිරීම සඳහා කරන ලද පුහුණු කඳවුරක් කියලා නම භාවිතා කරන්නේ නැත.

ප්‍ර : නමුත් දේශණවල පවත්වන මතවාදය එකයි?

පි : දේශනවල ඒකත් එක මතවාදයක්. එතන career guidance ගැන කියන්නේ. A/L නැත්නම් O/L වලට පස්සේ කොයි වගේ දේවල්ද කරන්න ඕනේ, මොන මොනවද ලංකාවේ තියෙන අධ්‍යාපන Chances කොයි වගේ Field එකේ යන්න පුළුවන් වගේ ඒවත් කරනවා. ඒකට අදාල Specialists ලා නැත්නම් University Students ලා ඇවිල්ලා ඒකත් Lectures කරනවා. ඒත් එක්කම මේකත් කරනවා.

****

<u>රජයේ අධිනිතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා:</u>

ප්‍ර : ඔබ මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කලා ඔබ Facebook මාර්ගයෙන් මෙම ජමාතේ ඉස්ලාම් සංවිධානය මගින් මෙහෙයවනු ලබන කඳවුරු පිළිබඳව තොරතුරු ලබා ගත්තා කියලා? මේ අවස්ථාවේදී මෙම ගරු කොමිෂන් සභාවට ඔබ එම ගිණුමට Log වී පෙන්නුම් කරන්න පුළුවන්ද මෙම Leaflet තිබ්බ බව?

පි : සමහර ඒවා Log වෙන්න පුළුවන්කම තියෙනවා Facebook එකට. සමහර ඒවා මගේ Account එකක් නැතුව අමාරුයි. පුළුවන් දේවල් මට පෙන්නුම් කරන්න පුළුවන්.

ප්‍ර : Leaflet ටිකක් පුළුවන්ද කියලා බලන්න ඔබට පුළුවන් මෙතන මවුස් එකක් තියෙනවා, මෙම රූපවාහිනියෙන් අන්තර් ජාලයට..

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදි කොමිෂන් සභාව ඉදිරියේ තිබෙන රූපවාහිනී තිරයට අන්තර්ජාල පහසුකම් සපයා ඇති අතර, සාක්ෂිකරු විසින් මුහුණු පොත

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

හරහා සාක්ෂිකරු ප්‍රකාශ කර සිටින අත් පත්‍රිකා කොමිෂන් සභාවේ අවධානය සඳහා යොමු කිරීමට ප්‍රයත්නයක් දරන බවට සටහන් කර තබමි.

****

<u>රජයේ අධිනිතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා:</u>

ප්‍ර : සාක්ෂිකරු මේ ගරු කොමිෂන් සභාවට ප්‍රකාශ කරන්න මෙය ඔවුන්ගේ නිළ වෙබ් අඩවියද කියලා?

පි : නිළ Facebook ගිණුමක් වෙන්න ඕන කියලා මම හිතනවා. ඒගොල්ලන්ගේ ලාංඡනය සහ මේකට likes කියද කියලා දැන් බලන්න අමාරුවක් තියෙනවා.

ප්‍ර : ලාංඡනය කියලා ඔබ අදහස් කරන්නේ කුමක්ද?

පි : මෙතන මෙහෙම ලංකාව ඇතුලේ යට තියෙන්නේ කුර්ආන් එක. ඊට පස්සේ what you call the Crescent. The sign of Islam අඩ සඳ and Middle the Sri Lanka it has rounded at the Sri Lanka and Sri Lanka is in the Middle

ප්‍ර : ලංකාව වටකර තමයි අඩ සඳ තියෙන්නේ.?

පි : you can get that kind of idea also but they never explain us something like that, according to the way they are we can. April 7 වෙනිදා 2019. 10 වන ශ්‍රේණියේ සිසුන් සඳහා පවත්වපු දවස් තුනේ නේවාසික පුහුණු කඳවුරක්. මම ඒගොල්ලන්ත් එක්ක හිටපු කාලේ මෙවැනි දේවල් තිබුනේ නැහැ. මේක පහුකාලේ ඇති කරපු දෙයක්. මෙතනින් අපිට බලන්න පුළුවන් රතුපාට යට කොටසේ වම් පැත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය. In Collaboration with Department of Muslim Religious and Cultural Affairs කියලා ඒක දාලා තියෙනවා.

ප්‍ර : ඔබට ඔය දෙමලෙන් සඳහන් වෙන වැකියන් කියවීමට හැකියාවක් තියෙනවද?

පි : උඩ දාලා තියෙනවා Young Adventures (දෙමළ භාෂාවෙන් එම වැකිය කියයි) Almost the same meaning that a courageous Youngsters. (දෙමළ භාෂාවෙන් එම වැකිය කියයි) There are thousand desires in front of me (දෙමලෙන් වැකියක් කියවයි) මා ඉදිරියේ සිහිනය, dreams, desires අධිෂ්ඨානය, Will they become true සාර්ථක වේද. (දෙමලෙන් වැකියක් කියයි) The guidance towards the successful way. (දෙමලෙන් වැකියක් කියයි) Breaking the barriers and achieve the targets like

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

skies, yes. (දෙමලෙන් වැකියක් කියයි) To know about yourself, know about your talents, put out your creativities, to become a student who would be loved by everybody, to become a trusted person, to shine as a healthy student and become a successor.

****

<u>රජයේ අධිනිතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා:</u>

ප්‍ර : සාක්ෂිකරු මේකේ දිනය ලෙස සඳහන් වෙන්නේ කවද්ද?

පි : අප්‍රේල් මාසේ 19 Face book

ප්‍ර : නැහැ Leaflet එකේ දිනය කවද්ද මේ වැඩ සටහන තියෙන්නේ?

පි : 2019 දවස් 3 කියලා තමයි සඳහන් වෙන්නේ.

ප්‍ර : ඕකේ වර්ෂය ලෙස සඳහන් වෙන්නේ 2019

පි : 2019

ප්‍ර : එතකොට කාලය සඳහන් කරන්නේ කවද්ද?

පි : On April school holidays, කියලා තමා දාලා තියෙන්නේ. අප්‍රේල් පාසැල් නිවාඩු කාලේ.

ප්‍ර : 10 වසරේ සිසුන්?

පි : පිරිමි ශිෂ්‍යයන් සඳහා.

ප්‍ර : එතකොට මේ සම්බන්ධව යම්කිසි පුද්ගලයෙකුගේ දුරකථන අංකයක් තිබෙනවද?

පි : ඔව් තිබෙනවා.

ප්‍ර : කවුද ඒ පුද්ගලයාගේ නම?

පි : අෆ්රිත් බසීර් කියලා නමක් සමඟ දුරකථන අංකය.

ප්‍ර : ඔහුගේ තනතුර මොකක්ද තියෙන්නේ?

පි : ජාතික සංවිධායකයෙක් කියලා. National Coordinator.

ප්‍ර : ඔහුගේ මොකක්ද නොම්මරය සඳහන් වෙලා තියෙන්නේ? ජංගම දුරකතන නොම්මරය?

පි : 0777 -849964

ප්‍ර : ඒකේ වම් පැත්තේ පල්ලෙහා තියෙන ලාංඡනය කුමක්ද?

පි : ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය ලාංඡනය. ජනරජ ලාංඡනය.

ප්‍ර : ඔබ දැනුවත්ද මෙම ජනරජ ලාංඡනය ඕනෑම Leaflet එකකට මුද්‍රණය කරන්න හැකියාවක් තියෙනවද නැද්ද කියලා?

පි : මම දන්නා තරමට රාජ්‍ය අනුමැතියෙන් තොරව, නිසි අනුමැතියෙන් තොරව ඒක හිතාමතා භාවිතා කිරීම වරදක් හැටියට මම හිතනවා. ඒක භාවිතා කරන එක සුදුසු නැහැ.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මේකේ යටම ලියලා තියෙනවා Department of Muslim Religious and Cultural Affairs කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට මෙම රාජ්‍ය සංවිධානයක් මගින්ද මෙම වැඩමුළුව පවත්වන්නේ?

පි : In Collaboration with කියලා වචනය එතන සඳහන් වෙනවා. මම පහුකාලේ දැන ගත්තා Department of Muslim Religious and Cultural Affairs එක්ක ඒගොල්ලන් යම්කිසි සම්බන්ධතාවයක් ඇති කර ගෙන ඒකේ වැඩ කරන යම්කිසි නිලධාරීන් විශේෂයෙන් නලීමියා විද්‍යාලයෙන් පිටත් වෙච්ච අය සමඟ සම්බන්ධතාවයක් ඇති කරගෙන මේ වගේ දෙයක් කරා කියලා මට 2000 ගණන්වල දැන ගන්න ලැබුනා.

ගරු ස්වාමිණි මෙම අවස්ථාවේදි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නට ලැබූ අත් පත්‍රිකාවේ මුද්‍රණය කරන ලද පිටපතක් **C324** ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.

පි : තව මොනවද අත් පත්‍රිකා මෙම අන්තර් ජාලයේ වෙබ් අඩවියේ තිබෙන්නේ?

(සාක්ෂිකරු අන්තර් ජාලයේ ඇති තවත් අත්පත්‍රිකා පරික්ෂා කරයි)

පි : මේ දවස් 5 නේවාසික පුහුණු කඳවුර සම්බන්ධ අත්පත්‍රිකාවේ පිටපත.

ප්‍ර : මේක කුමන වර්ෂයට අදාල අත් පත්‍රිකාවක්ද?

පි : 24 දෙසැම්බර් 2018 නිකුත් කරලා තියෙනවා. මේක මහනුවර පැවතිච්ච එක විතරයි.

ප්‍ර : මේක කුමන අවුරුද්දට අයත් අත්පත්‍රිකාවක්ද කියලා නැවත සඳහන් කරන්න?

පි : 2018

ප්‍ර : මේකේ මාතෘකාව ලෙස සඳහන් වෙන්නේ කුමක්ද?

පි : Youth Enforcement Program 5 days Resident

ප්‍ර : කා සඳහාද මෙය පවත්වනු ලබන්නේ?

පි : අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට

ප්‍ර : දවස් කීයකටද?

පි : දවස් 5 යි.

ප්‍ර : මේකෙත් අර වම් පැත්තේ රාජ්‍ය ලාංඡනය තියෙනවා කියලා සාක්ෂිකරු අවධාරනය කරනවද?

පි : ඔව්.

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප : මේකේ තියෙනවා දකුණු පැත්තේ උඩ ඊමේල් Address එකක්

පි : වෙබ් අඩවියේ.

ප : ඒක මෙම ගරු කොමිෂන් සභාවට සදහන් කරන්න?

පි : www. slism.org

ප : සාක්ෂිකරු මෙම වෙබ් අඩවිය පිළිබඳ දන්නවද?

පි : කාලෙකට කලින් ඒ වෙබ් අඩවිය It was active ලඟදී මම බලපු වෙලාවල දැන ගත්තා ඒක දැන් නිශ්ක්‍රිය හරි Expired හරි වෙලා තියෙනවා ඒක.

ප : කවදද ඔබ ලඟදි බැලුවා කිව්වේ කවදද බැලුවේ?

පි : Like One Month before I checked it was not available but couple of years ago it was there.

ප : මෙම අත් පත්‍රිකාවේ ඉස්සෙල්ලා අපි බලපු අත් පත්‍රිකාවේ නොම්මරයක් සදහන් වෙලා තිබුණා?

පි : ඔව්.

ප : C324 නොම්මරයක් සදහන් වෙලා තිබුණා. දුරකතන අංකයක්, නමුත් මෙම අත්පත්‍රිකාවේ දුරකතන අංකයක් සදහන් වෙන්නේ නැහැ?

පි : ඔව්.

ප : එතකොට සාක්ෂිකරු දන්නවද එතකොට මෙම Program එකට කොහොමද සම්බන්ධ කරන පුද්ගලයෙක් ඉන්නවද කියලා?

පි : මේක Facebook එකේ ඒගොල්ලන්ගේ Facebook පිටුවේ පල වෙච්ච එකක්. Facebook පිටුවට Inbox එකෙන් Message කරන්න පුළුවන්. ඒ වගේම ලංකාවේ හැම ගමකම මුස්ලිම ගමකම ඒගොල්ලන්ගේ සාමාජිකයෝ ආධාරකරුවෝ ඉන්නවා, ඒගොල්ලන් හරහා මේකට සම්බන්ධ වෙන්න පුළුවන්.

ප : ඒ කියන්නේ ඔබ කියන්නේ මේ මුහුණු පොතේ මෙම අන්තර්ගතයට ක්‍රියාකාරී පුද්ගලයන් ඉන්නවා මේක පවත්වාගෙන යන්න?

පි : ඔව්.

ගරු ස්වාමීණි මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් හඳුනා ගනු ලැබූ තවත් මුද්‍රිත අත්පත්‍රිකාවක පිටපතක් **C325** ලෙස ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

ප : සාක්ෂිකරු බලන්න තවත් මොනවද ඕවගේ අත් පත්‍රිකා මෙම වෙබ් අඩවියේ තියෙන්නේ?

(සාක්ෂිකරු තවත් අත්පත්‍රිකාවක් විවෘත කරයි)

ප : මෙම තිරයේ දිස්වෙන අත් පත්‍රිකාව වර්ෂය ලෙස සදහන්

FAIR COMMENT BY JEZEEM

වෙන්නේ කවද්ද?

පි : 2018 Face book එකේ එය පලවෙලා තියෙනවා.

ප්‍ර : ඔබට මෙම අත් පත්‍රිකාවේ දමිල භාෂාවෙන් තිබෙන වැකි මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කිරීමට හැකියාවක් තියෙනවද? මෙම අත් පත්‍රිකාවේ සඳහන් අඩංගු වන දෑ කෙටියෙන් මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න?

පි : මෙතන පවත්වන ස්ථාන ලංකාවේ පවත්වන ස්ථාන 12 ක් හරි නැත්නම් 14 හරි මෙතන සඳහන් වෙලා තියෙනවා. අදාල පුද්ගලයින්ගේ නම් හා දුරකතන අංකය සඳහන් කරලා තියෙනවා. අදාල ස්ථාන සඳහන් කරලා තියෙනවා. උසස් පෙල විභාගයට සහභාගි වෙච්ච සිසුන් සඳහා පවත්වන දවස් 7 නේවාසික පුහුණු කඳවුරක් සම්බන්ධයෙන් තමයි මේ අත් පත්‍රිකාව පල කරලා තියෙන්නේ. ඒ වගේම එයට සහභාගි වීමට Online registration කරන්න කියලා තවත් තොරතුරක් මෙතන දීලා තියෙනවා. අර කලින් අත් පත්‍රිකාවල වගේම රාජ්‍ය ලාංඡනය මේකේ දකුණු අත පැත්තේ භාවිතා කරලා තියෙනවා. Department of Muslim Religious and Cultural Affairs කියන In Collaboration with Department of Muslim Religious and Cultural Affairs කියන එක යට සඳහන් කරලා තියෙනවා.

දැන් වේලාව ප.ව. 12.10 යි.

මෙතැන් සිට වාර්තා කරන්නේ යමුනා මිය විසින්ය.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

වෙලාව ප .ව. 12. 05
පෙර සටහන් ගැනිම ල/ලේ දම්මිකා
සටහන් ගැනිම ල/ලේ යමුනා

<u>රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර මෙම අත්පත්‍රිකාවේ යම්කිසි අයකිරිමක් ගැන සඳහන් වෙනවාද ?

උ course fee එකක් සඳහන් කරලා තියෙනවා.

ප්‍ර කීයක් ලෙසද ?

උ රු. 3800 sri Lankan rupees

ගරු ස්වාමිනි මෙම අවස්ථාවේදි තිරයේ දිස්වන්නාවූ මෙම සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලැබූ තවත් අත්පත්‍රිකාවක මුද්‍රිත පිටපතක් **C 326** ලෙස ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරු මාර්ගයෙන් ලකුණු කරන ලද **C 326** සහ **C 324** දරණ ලේඛණ වල කොටස් දමිළ භාෂාවෙන් ප්‍රකාශ කර ඇති හෙයින් කොමිෂන් සභාවේ භාෂා පරිවර්තකට එකී දමිළ භාෂාවෙන් සඳහන් කරුණු පරිවර්තනය කර කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට නියම කරන අතර **C 324** දරණ ලේඛණයේ දමිළ භාෂාවෙන් ඇති කොටස පරිවර්තනය කිරිමෙන් පසු ඉදිරිපත් කරන ලේඛණය **C 324 A** වශයෙන්ද **C 326** දරණ ලේඛණයේ දමිළ භාෂාවෙන් අඩංගුව ඇති කරුණු පරිවර්තනය කර ඉදිරිපත් කරන ලේඛණය **C 326 A** වශයෙන්ද ලකුණු කරන ලෙසට සටහන් කර තබමි.

ප්‍ර ඔබ 1995 සහ 94 සහභාගි වුණු පැවති පන්ති වලට ඔබට යම්කිසි ගෙවීමක් කරන්න සිදුවුනාද ?

උ ඔව්. රුපියල් 100 ක් හරි මට මතකේ හැටියට රු 100 ක් හරි රු 200 ක් වගේ ප්‍රමාණයක් තමයි ඒ දවස්වල ගෙවීමට සිද්ධ වුනේ.

ප්‍ර ඔබගේ දැනිමේ හැටියට මේ 1994 , 1995 කාල සිමාවලදී තිබ්බ පන්ති වලට සමගාමිව කාන්තාවන් සඳහා වෙනම පන්ති පැවැත්තුවාද ?

උ ඒ කාලේ පැවැත්තුවේ නැහැ. පසුකාලයේදි දෙදාස් ගණන් වල ඒක පටන් ගත්තා කියලා මට දැන ගන්න ලැබුනා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර තමන් ගේ මේ පින්තූර වල තමන් දන්න කට්ටිය ඉන්නවාද ?

උ මම එහෙම එක්කෙනෙක් දෙන්නෙක් වගේ මං දැක්කා.

ප්‍ර දැක්කා?

Freshlegalcopys Copy
FAIR COMMENT BY JEZEEM

උ මෙතන ඉන්නේ ගොඩක් තරුණ අය පහු කාලයේ එකතු වෙච්ච කට්ටිය.

ප්‍ර ඒ පුද්ගලයින් අර නම් ලැයිස්තුවක් පෙන්නුවේ ඒ නම් වලට ඇතුලත් කට්ටියත් ඉන්නවාද ?

උ නැහැ එහෙම කවුරුත් දැක්කේ නැහැ. ඒ කට්ටිය දැන් අවුරුදු 40 ක් විතර වැඩිමල් කට්ටිය. එතකොට මේක ඇවිල්ලා students movement ඒ ගොල්ලන් දැනට ඉන්නේ ජමාතේ ඉස්ලාමිය සංවිධානයත් එක්ක ඉන්නවා නම් සමහර අය රටින් පිටත් වෙලා ගිහිල්ලා වෙන රටවල්වල පදිංචි වෙලා ඉන්නවා රස්සාවල්වලට ගිහිල්ලා ඉන්නවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර ඔබගේ දැනිමේ හැටියට පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් මියගිය තැනැත්තන් කවුරු හරි ඔය ඔබ ගිය පන්ති වලට සහභාගිවුනා කියලා දන්නවාද?

උ නැහැ මියගිය අය කවුරුත් සහභාගි වෙලා නැහැ මම දන්න තරමට.

ප්‍ර ඔබ දන්න තරමින් නැහැ.

උ මම දන්න තරමින් සහභාගි වුනේ නැහැ.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය.</u>

ප්‍ර Mr. ඉස්මත් පුහුණු පාඨමාලාවල් අවසානයේදි සහතික පත්‍ර ප්‍රදානයක් කරනවානේ නේද ?

උ එහෙම තමයි මට ආරංචි වුනේ පහුකාලිනව ඒක පටන් ගත්තා කියලා රාජ්‍ය ලාංඡනය සමග.

ප්‍ර එතකොට ඒ අවස්ථාවලදි රාජ්‍ය නිළධාරින් හෝ මේ දේශපාලඥයන් මැති ඇමතිවරුන් වගේ අය සම්බන්ධවුනාද ? දැන් රජයේ සහතිකයක් දෙනකොට ඒ සහතික පත්‍ර ප්‍රදානය කරන අවස්ථාවලදී රාජ්‍ය නිළධාරින් සහ ඇමතිවරුන් වගේ අය සහභාගි වෙලා තියනවයි කියලා ඔබට දැන ගන්නට ලැබුනාද ?

උ මේ පුහුණු කඳවුරට පස්සේ නිකුත් කරන සහතික ප්‍රදානය කිරිමේ උත්සව වලට සහභාගි වුනා කියන එක මට කිසිම තොරතුරක් නැහැ ඒ වුනාට 2007 නැත්නම් 2008 පුත්තලමේ ජමාතේ ඉස්ලාමිය ශිෂ්‍ය ඒකකයේ ජාතික මහා සමුළුවක් පැවැත්තුනා . ඒකට මුස්ලිම් දේශපාලන නායකයෝ සහභාගි වුනා කියලා මට දැන ගන්න ලැබුනා.

ප්‍ර ඔබට නම් වශයෙන් කියන්න පුළුවන් අය ඉන්නවාද? සහභාගි වෙච්ච ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ මට ඒක හරියට සඳහන් කරන්න බැහැ. මට මතකේ හැටියට කියනවා නම් ඒක්කෝ ඒ වෙලාවේ හිටපු ඇමති රිෂාද් බදුර්දීන් නැත්නම් හිටපු ඇමති රවුෆ් හකීම් ඒ දෙන්නාගෙන් එක්කෙනෙක් සහභාගි වුනා.

ප්‍ර නැවත කියන්න පුළුවන්ද වසර සහ ඒ සම්මේලනයේ නම ?

උ Sri Lanka Islamic student movement National Conference or either convention

ප්‍ර අවුරුද්ද ?

උ between 2006 – 2008

ප්‍ර මේක කොහේද තිබුනේ ?

උ පුත්තලම

ප්‍ර පුත්තලමේ කොහේද ?

උ පුත්තලමේ They call it Ijthima ground

ප්‍ර ඔබ සඳහන් කලේ කවුද ඒ දේශපාලඥයන්ගේ නම් නැවත කියන්න පුළුවන්ද?

උ හිටපු ඇමති රවුෆ් හකීම් ඇමති තුමා හෝ නැත්නම් ගරු ඇමති රිෂාද් බදුර්දීන් ඒකේ සහභාගි වෙච්ච කට්ටිය කියපු තොරතුරු අනුව මුස්ලිම් දේශපාලන නායකයෝ සහභාගි වෙලා හිටියා කියලා.

****

<u>රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර සාක්ෂිකරු දැන් මේ තිරයේ දිස් වෙන්නේ තවත් අත්පත්‍රිකාවක් කිව්වොත් නිවැරදිනේ ?

උ හරි.

ප්‍ර ඒකේ භාෂාව මොකක්ද ?

උ ඉංග්‍රීසි සහ සිංහල.

ප්‍ර සිංහල භාෂාවෙන් තියනවා.

ප්‍ර මීට පෙර අපි C 326, C 325 ලේඛණයන් දමිළ බසින් තිබ්බේ. මෙය සිංහළ භාෂාවෙන් තියෙන ලේඛණයක් ?

උ ඔව්.

ගරු ස්වාමිනි මේ අවස්ථාවේදි **C 327** වශයෙන් තිරයේ දිස්වෙන අත් පත්‍රිකාවේ මුද්‍රිත පිටපතක් ලකුණු කිරිමට අවසර ඉල්ලා සිටිමි.

ප්‍ර සාක්ෂිකරු දැන් මේ ඔක්කෝම ඔබ සහභාගි වුන වැඩ මුළු දින 5 වැඩමුළුව සහ ඔබ සහභාගි නොවූ නමුත් දැන ගන්නට ලැබුනු දින 7 වැඩ මුළු සෑම දේම ජමාතේ ඉස්ලාමීය සංවිධානය මගින් තමයි මෙහෙයවනු ලබන්නේ ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ එහෙමයි.

ප්‍ර එතකොට මෙම ගරු කොමිෂන් සභාවට ප්‍රකාශ කරන්න මෙම ජමාතේ ඉස්ලාම් සංවිධානයේ පියා කවුද කියලා ඔබ දන්නවාද ?

උ ඔව්.පකිස්ථානයේ We Can call it the British India මව්ලානා අබුල් අව්ලා මවුදුනි .

ප්‍ර ඔබ එම පුද්ගලයා පිළිබඳව දැනගත්තේ කොහොමද ?

උ ජමාතේ ඉස්ලාමිය සංවිධානයේ ඉන්න කාලේ මම දැනගත්තා එතුමාගේ පොතක් තියෙනවා ඉදිදාන් ඉස්ලාම් this is Islam ඉදිදාන් ඉස්ලාම් මම මාවනැල්ල සහිරා විද්‍යාලයේ ඉගෙන ගන්න කාලේ හැම බ්‍රහස්පතින්දාම Last two subjects was every other week මාසෙකට දෙසැරයක් Thursday දවස්වල last two subjects මානවර් මන්ඩ්‍රම් කියලා programme එකක් තියෙනවා .

Q Student's association එකක්

A. NO.

උ Kind of Students can do the dramas singing and cultural programme එකක් every other Thursday the last two subjects will be allocated for that one. In this programe also, I have not done this one but some other students bring this book and read chapters from this book. From the founder of the Jamaat-e-Islami in the Mawanella Zahira. When there is enough time some students will do singings dramas without music songs without music and some jokes and all will go

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර ඔබ කියන විදියට ජමාතේ ඉස්ලාමී සංවිධානයේ නිර්මාතෘ ඔබ දැන් පාකිස්තානු ජාතිකයෙකු වශයෙන් නම් කෙරුවා?

උ ඔව්

ප්‍ර ඒ ලංකාවේ තිබෙන ජමාතේ ඉස්ලාමිය සංවිධානයද නැත්නම් පාකිස්ථානයේ තිබෙන ජමාතේ ඉස්ලාමිය සංවිධානයක්ද නැත්නම් ලෝකයේම තියෙන සංවිධානයක්ද?

උ ලෝකේම තියෙන ජමාතේ ඉස්ලාමිය සංවිධානය . මේ ජමාතේ ඉස්ලාමිය වැඩිපුරම ශක්තිමත් විදියට වැඩ කරන්නේ පකිස්ථානය, ඉන්දියාව බංගලාදේශය , ශ්‍රී ලංකාව මේ රටවල් වල තියෙන ජමාතේ ඉස්ලාමිය සංවිධානය නිර්මාතෘවරයා තමයි මවුලානා අබුල් අව්ලා මවුදුනි

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

****

<u>රජයේ අධිනිතිඥ අරින්ද ජයසිංහ මහතා</u>.

ප්‍ර ඔබට මෙම මව්ලවි ගැන යම්කිසි තොරතුරක් හෝ යම්කිසි පොතක් මාර්ගයෙන් තොරතුරු ලබා ගත්තාද ?

උ ඔව්.

ප්‍ර එම පොත ඔබ ගාව දැන් ඔබේ බාරයේ තියෙනවාද ?

උ අන්තර්ජාලයෙන් ලබා ගත් print -out එකේ research paper එකක් research paper දෙකක් තියෙනවා එතුමා ගැන එතුමාගේ මතය ගැන සංවිධානය ගොඩ නගපු අරමුණ ගැන.

ප්‍ර ඔය සංවිධානය ගොඩ නගන්නේ පකිස්ථානයේ කුමන වර්ෂයේද ?

උ **1941** .

ප්‍ර ඒකේ ඔබ ඔය සඳහන් කරනු ලැබූ පත්‍රයේ ඔබ ගාව තියෙන අන්තර්ජලයෙන් බහාගත් ලේඛණයේ මෙම සංවිධානයේ අරමුණ වශයෙන් සඳහන් කරලා තියෙන්නේ මොනවද කියලා ඔබට මෙම ගරු කොමිෂන් සභාවට ප්‍රකාශ කිරීමට හැකියාවක් තියෙනවාද ?

උ මම මේක කියවලා බලපු හැටියටත් ඒවාගේම මම එහි සාමාජික වෙලා ඒ ගොල්ලත් එක්ක වැඩ කරපු නැත්නම් සම්බන්ධවෙලා හිටපු එක්කෙනෙක් හැටියටත් එතුමාගේ මතය වෙලා තිබ්බේ ලෝක ඉස්ලාමීය රාජ්‍යයක් කලිෆත් එකක් කැලිෆට් එකක් පිහිටුවා ගැනීම.

ප්‍ර ඔබට ඔය කරුණු පිළිබඳව දැන ගන්න ලැබුනේ ඔබ මෙම සංවිධානයේම සාමාජිකයකු ලෙස කටයුතු කරන කාලයද නැත්නම් ඊට පසුවද?

උ ඒ සංවිධානයත් එක්ක එකට කටයුතු කරපු කාලේ.

ප්‍ර එතකොට සෑම සිසුන් සෑම සිසුවෙක් සමගම මෙම අත්පත්‍රිකා ලේඛණය තිබ්බාද ඒ කාලේ ?

උ නැහැ මේ ලේඛණය ගැන මං දන්නේ නැහැ. නමුත් ඒ මතය හැම එක්කෙනාටම දුන්නා.මං දන්න තරමට මම හිටපු කාලේ හැම එක්කෙනාටම ඒ මතය තමයි දුන්නේ.

ප්‍ර ඊට අමතරව ඔය ලේඛනයේ සඳහන් වන කරුණු ඉතා සාරාංශ වශයෙන් මෙම කොමිෂන් සභාවට පැහැදිලි කිරීමක් කරන්න ?

උ ඉස්ලාම් නොවන රාජ්‍යයක් නැත්නම් පාලනය යටතේ ජීවත්වීමේ වරද මුස්ලිම් එක්කෙනෙක් එහෙම ජීවත්වීම තම මුළු හිතම එහෙම දෙයක් කරන්න හොඳ නැහැ කියන මතය මෙතන සඳහන් වෙලා තියෙනවා.මුස්ලිම්වරු ඔක්කෝම ලෝකයේ තියන මුස්ලිම්වරු අරාබියේ වුනොත් මේ ලංකාව වුනොත් ලාංකිකයෝ වුනොත් අප්‍රිකානු වුනොත් ඔක්කෝම එකතු වෙලා ශක්තිමත් ඉස්ලාමීය රාජ්‍යයක් එක ධජය යටතේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එක නායකයා යටතේ පිහිටුවෙන්න ඕනේ කියන මතය මෙතන සඳහන් කරලා තියෙනවා.

ප්‍ර තව මොනවද තියෙන්නේ ?

උ ඉස්ලාමිය නීතිය තමයි හරිම නීතිය .ඒ නීතිය පාලනයට ගේන්න අපි වැඩ කරන්න ඕනේ.ඒ සඳහා අපි අපේ we have to put all our efforts for that one කියන මතය සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර ඕක ලියලා තියෙන්නේ කවර පුද්ගලයන් කියලා සඳහන් කරනවාද ?

උ රමීෂ් අහමඩ් ලියෝන් කියන පුද්ගලයා විසින් ලියපු එකකුයි

ප්‍ර අපි එකින් එක සඳහන් කරමු

උ එයා ලියපු ඒකේ සාරාංශයක් අඩංගු තව එකකුත් තියෙනවා.
ඒ එක පුද්ගලයා තමයි දෙකම ලියලා තියෙන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර නම මොකක්ද? right the name ?ලියපු කෙනා ?

උ රමීෂ් අහමඩ් ලියෝන් about මවුලානා මව්දූති. mawdudi's political ideology has been verify explain in a research paper for publishing about maulana mawdudi

****

<u>රජයේ අධිනිතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා</u>

මේ අවස්ථාවේදි කොමිෂන් සභාව ඉදිරියේ තිබෙන රූපවාහිනී යන්ත්‍රය සහ අන්තර්ජාල පහසුකම් භාවිතා කිරීමෙන් සාක්ෂිකරු සඳහන් කරන **Jamaat –e-Islami Ideology** කතෘ රමීෂ් අහමඩ් ලෝන් **lone** යන තැනැත්තා විසින් රචිත ලේඛණය **International Journal of Research Sotial Sciences volume 8 issue 5 May 2018** ලෙස සඳහන්ව ඇතිබව සැහිමට පත් වීමෙන් පසු එකී ලේඛණය **C328** වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර සාක්ෂිකරු ඔබට අදහසක් තියෙනවාද මෙම සංවිධානයට ජමාතේ ඉස්ලාම් කියන නම යෙදීම සම්බන්ධයෙන් ?

උ ජමාත් කියන්නේ එකමුතුව මට මේ ජමාත් ඉස්ලාමිය හිටපු කාලේ මට මේ දිපු පැහැදිලි කිරීම මට මෙතන කියන්න පුළුවන් ජමාත් කියන එකමුතුව ඉස්ලාමිය කියන්නේ ඉස්ලාම් ආගමේ එකමුතුව කියන එක තමයි . මුස්ලිම් වරු හැමෝම එක නායකත්වය නැත්නම් එක ධජය යටතේ එකතු කිරීමේ අරමුණ තමයි මේ සංවිධානයේ නමේ අරමුණ නැත්නම් meaning එක කියලා මට ඒ දවස්වල ඒ ගොල්ලන් කියලා තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර සාක්ෂිකරු මෙම ගරු කොමිෂන් සභාවට සදහන් කරන්න මෙම සංවිධානය ලංකාවට පැමිණෙන්නේ කවදාද ? ලංකාවේ මෙම සංවිධානය බිහි වන්නේ කවදාද කියලා ඔබ දන්නවාද ?

උ ඔව් මම History එක ඒ ගොල්ලන්ම කියලා තියෙනවා ඉන්දියාවෙන් ලංකාවට පැමිණි ව්‍යාපාර කටයුතු සඳහා පැමිණි පුද්ගලයෙක් විසින් තමයි මේක ලංකාවේ පටන් ගන්නේ ලංකාවේ බිහි කරන්නේ.

ප්‍ර කවිද ඒ පුද්ගලයා ?

උ දැනට නම නම් මට මතක නැහැ. දැනට

ප්‍ර කොයි වර්ෂය කියලා මතකද ?

උ **1953** නැත්නම් **1954** පමණ

ප්‍ර මෙම සංවිධානය පටන් ගත්තහාම ලංකාවේ මෙම සංවිධානය කුමන හරි ස්ථානයක ස්ථානයක් තියෙනවා කියලා දැන ගත්තාද ?

උ ඔව්. දෙමටගොඩ ප්‍රදේශයේ තමයි පටන් ගෙන තියෙන්නේ. මට ඉපැරණිම සාමාජිකයෝ ඒ නැත්නම් founding member කෙනෙක් කියපු විදියට දෙමටගොඩ ප්‍රදේශයේ එතකොට මම කොළඹ ගැන මම හරියට දන්නේ නැහැ.දෙමටගොඩ ප්‍රදේශයේ තමයි නැත්නම් දෙමටගොඩ පාර. මරදාන නැත්නම් දෙමටගොඩ ඒ ආශ්‍ර ප්‍රදේශයේ තමයි පටන් ගෙන තියෙන්නේ ඉන්දියාවෙන් ආපු ව්‍යාපාරිකයා තමයි පලවෙනි නායකයා .

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර ජමාතේ ඉස්ලාමය සංවිධානයේ දැනට ඉන්දියාවේ නායකයා කවිද කියලා දන්නවාද ?

උ නැහැ ඉන්දියාවේ මම නායකයා අඳුරන්නේ නැහැ.ඒක ජමාතේ ඉස්ලාමික් හින්ත් නමින් හඳුන්වනවා දෙවරක් ඉන්දියාවෙන් ඒ සංවිධානය තහනම් කලා මම දන්නා තරමට . එකක් අර ඉන්දියාවේ ඇති වෙච්ච ආගම් riots වලින් පස්සේ ඒ තහනම් කලා දෙපාරක්. ඒ හින්දා ඒ සංවිධානය මං දන්නා තරමට වෙන් වෙන් නම් වලින් වෙන් වෙන් පක්ෂ හා Organizations පිහිටුවා ගෙන තියෙනවා S.T.P.I ඒ වගේ වෙන නම් වලින් පක්ෂ හා Organizations පිහිටුවලා තියෙනවා.

ප්‍ර පකිස්ථානයේ තිබි එම සංවිධානය සහ ත්‍රස්තවාදී කටයුතු අතර සම්බන්ධතාවයක් තිබ්බාද කියලා දන්නවාද ?

උ ලංකාවෙන් ඇෆ්ගනිස්ථාන්, පකිස්ථාන්වලට ජිහාත්කරුවෝ යැවිවේ පකිස්ථානයේ පිහිටුවලා තියන සංවිධාන හරහා තමයි ඒවගේම

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ඇෆ්ගනිස්ථාන් වල ජමාතේ ඉස්ලාමිය සංවිධානය තිබුනා ඒ ගොල්ලන් Russia පාලනයට විරුද්ධව ජිහාත් කලා.

ප්‍ර පැහැදිලි කරන්න ලංකාවෙන් ජිහාත් සංවිධානයට කවිද යැවිවේ ?

උ ඒක නම් මම සාක්ෂි ඉදිරිපත් කරලා තියනවා.

ප්‍ර පසුව ඉදිරිපත් කරන්න.

උ පසුව ඒක ඉදිරිපත් කරන්නම්. ඒවාගේම අර අබ්දුල් වාජිඩ් කියන පුද්ගලයා ගැන කලින් එතන සඳහන් වුනා.

****

<u>රජයේ අධිනිතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර ලංකාවේ පළමුව නායකත්වය දුන්න පුද්ගලයා දන්නේ නැහැ කියලා ඔබ මේ කොමිෂන් සභාවට සඳහන් කලා ?

උ දැනට මතක නැහැ . නම මතක නැහැ.

ප්‍ර ඊට පස්සේ ආව නායකයා ඔබට මතකද ?

උ පිළිවෙලට මට මතක නැහැ . ඒ වුනාට යුසුෆ් සාහිඩ් කියන නායකයෙක් හිටියා.ඊට පස්සේ . ඒ. එල්. එම්. ඉබ්‍රාහිම් මවුලවි කියලා මම මෙතන කලිනුත් සඳහන් කලා. ඊට පස්සේ හජ්ජුල් අක්බර් අවුරුදු 24 ක් නායකත්වයක් හැටියට කටයුතු කළා one of the successful leaders from their point of view ඒ ගොල්ලන් ඒ පැත්ත බලනකොට ඉතාම සාර්ථක නායකත්වය දීපු එක්කෙනෙක් තමයි හජ්ජුල් අක්බර් ඊට පොඩි උදාහරණයක් තමයි අර මං කිව්වේ 94 සාමාන්‍ය පෙල විභාගයට පස්සේ අ. පො. ස. සා. පෙළ විභාගයට පස්සේ මම ගිය වෙලාවේ සහභාගි වුනේ 40 ක් පමණ සිසුන් .ඊලඟ අවුරුද්ද වෙන කොට ඒක 120 නැත්නම් 130 වෙනකල් වර්ධනය වුනා දැන්නම් ඒ කියන්නේ බෝම්බ ප්‍රහාරයට කලින් එක තැනක් නෙවෙයි ලංකාවේ තැන් කීපයක කඳවුරු පවත්වාගෙන යන තරමට ඒක ගොඩක් ව්‍යාප්ත වුනා. සංවිධානය.

ප්‍ර සාක්ෂිකරු ඔබ ඉහතින් සඳහන් කරපු ආකාරයට මෙම සංවිධානය ව්‍යාප්ත වෙලා තියෙනවා. ඔබ දන්නවාද කොච්චර නගර සංඛ්‍යාවකට මෙම සංවිධානය ව්‍යාප්ත වෙලා තියෙනවාද කියලා ?

උ එහෙම නම්බර් ගණන් නම් මං ගාව නැහැ. ඒ වුණාට මම දන්නා තරමට ගොඩක් ශක්තිමත්ව ක්‍රියාත්මක වන නගර කීපයක් නම් කියන්න පුළුවන්.

ප්‍ර මොනවද ඒ නගර ?

උ මාවනැල්ල , ඒ වගේම හෙම්මාතගම, අකුරණ, මඩවල ප්‍රදේශය ඉන්නවා කාත්තන්කුඩි වැනි ප්‍රදේශවල මේ ගොල්ලන් ශක්තිමත් විදියට ක්‍රියාත්මක කරනවා.

FAIR COMMENT BY JEZEEM

****

<u>සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර මල්වාන?

උ තිහාරිය . වරකාපෙල ප්‍රෙද්ශය. ලංකාවේ මුස්ලිම් මිනිස්සු බහුතරය වශයෙන් ඉන්න ගම්වල මේ ගොල්ලන් මේ සංවිධානය ඉන්නවා.

ප්‍ර ඔබ කියපු කාරණාවක් හින්දා මං ප්‍රශ්ණයක් අහන්න ඕනේ . දැන් ඔබ කියපු ප්‍රදේශ සලකා බැලුවහොත් අවුරුදු **20, 30** කට පෙර මුස්ලිම් ජනතාව වැඩිය පදිංචි වෙලා හිටියේ නැහැ ඒ සංඛ්‍යාව වැඩිවුනේ කාලයක් යනකොට.දැන් ඔබ ඔය ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ සිටිය කාලය තුල ඒ මුස්ලිම් ප්‍රජාව රට පුරාම විවිධ ස්ථානවල වැඩි කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනවා කියලා ඔබට යම්කිසි අදහසක් තිබුනාද?

උ හිටපු කාලේ නම් ඒ වගේ අදහසක් තිබුනේ නැහැ. ඒ වුනාට ඒ සංවිධානයේ **1996** මා අයින් වුනාට පස්සෙත් මාවනැල්ලේ මුස්ලිම් සමාජය අතර ජීවත් වුනා ඒ දවස්වල මම දැකපු එකක් තමයි මාවනැල්ලේ අවට ප්‍රදේශවල ගම්වල ඉන්න මුස්ලිම් ජනතාව වැඩි වශයෙන් මාවනැල්ලට පදිංචියට ආවා. මම Refugee කෙනෙක් හැටියට **90** දි මාවනැල්ලට යනකොට මාවනැල්ලේ ගොඩක් මාවනැල්ල කියන්නෙ එතකොට සාමාන්‍යයෙන් ගමක් වගේ තිබුනේ Paddy fieldS කුඹුරු වතු ඒ වගේ දේවල් ගොඩක් දේ තිබුනා . රබර් වතු එහෙම තිබුනා. ඒ වුනාට මගේ ඇස්පිට මම **2009** මාවනැල්ලෙන් යන්න කලින්ම ගොඩක් දේවල් නැතිවුනා. කපලා කපලා ගේ හදන දේ මම දැක්කා. එතකොට ගොඩක් ආවේ මාවනැල්ලට ආවේ හෙම්මාතගම දිප්පිටි ප්‍රදේශ වලින් ජමාතේ ඉස්ලාමීය සංවිධානයට සම්බන්ධ අය ඒ ප්‍රදේශවලට පදිංචියට ආවා.

මින් පසු සටහන් ගැනීම ල/ලේ නිල්මිණි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

දැන් වේලාව: ප.ව.12.35
පෙර සටහන් ල/ලේ: යමුනා මීය.
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>ගරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: එහෙම පදිංචි වීමක් පහසු කිරීමක් යම්කිසි දේශපාලනඥයෙක් නැත්තම් දේශපාලන පක්ෂ කෙරුවාද?

පි: මං දන්න තරමට නැත. ජමාතේ ඉස්ලාමීය සංවිධානය ඒකට පුළුවන් පසුබිමක් ඇති කරලා දුන්නා. ඒගොල්ලන්ගේ ඒ සාමාජිකයන් සහයෝගය දුන්නා. ජමාතේ ඉස්ලාමීය නායකයා පවා ඒ දවස්වල අනූ ගණන් වල මාවනැල්ලේ පදිංචි වෙලා හිටියේ නැහැ. දෙදහස් ගණන් වෙන කොට කුලියට ගෙයක් අරගෙන මාවනැල්ලට ආවා. ඊට පස්සේ මට දැනට ආරංචි වෙලා තියෙනවා ගෙයක් එයාටම කියලා හදාගෙන හරි නැත්තම් මිලට අරන් මාවනැල්ලේ ස්ථිර පදිංචිකරුවෙක් වෙලා ඉන්නවා කියලා.

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර: ජමාතේ ඉස්ලාමීය සංවිධානයට සිසුනුත්, ඉස්ලාම් මුස්ලිම් සිසුනුත් යම් යම් ක්‍රියාකාරකම් වල යෙදෙන ඒවා ඔවුන් අධ්‍යයනය කරනවා කිව්වොත් නිවැරදි ද? අර දින 5 කඳවුර, දින 7 කඳවුර ඒ ඔක්කෝම කරන්නේ මේ ජමාතේ ඉස්ලාමීය සංවිධානය මඟින්

පි: හරි.

ප්‍ර: එතකොට එම ශිෂ්‍යාන්ට, සිසුවන්ට ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ ඉන්න ප්‍රධාන පුද්ගලයන් හට කෙළින්ම කතා කිරීමේ හැකියාවක් තියෙනවා ද?

පි: ඔව් තියෙනවා. නායකයාට වුවත් කතා කිරීමේ හැකියාවක් තියෙනවා. ඒගොල්ලෝ එතනින් කියන්නේ නායකයා කියන එක්කෙනා හුඟාක් simple වෙන්න ඕනි කියන අර මතය තියෙනවා ඒගොල්ලන් අතර.

ප්‍ර: ඒ කියන්නේ මධ්‍යස්ථ පුද්ගලයෙක් නැහැ මෙම නායකයා සහ සිසුවන් අතර සම්බන්ධය ඇති කිරීම සඳහා?

පි: ඒ program වලට නැත්තම් දේශනාවලට ආපු වෙලාවේ නායකයාත් එක්ක ඒගොල්ලන්ට කෙළින්ම ගිහිල්ලා කතා කරන්න පුළුවන්කමක් තියෙනවා.

ප්‍ර: ඔබ ඉස්සෙල්ලා සඳහන් කරා මෙම ජමාතේ ඉස්ලාමීය සංවිධානය රට පුරා ව්‍යාප්ත වෙලා තියෙනවා කියලා නගර කිහිපයක් සඳහන් කරා?

පි: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ නගර වලට අනුයුක්තව නායකයෝ සිටිවා ද?

පි: ඔව්. ඒගොල්ලන්ට කියන්නේ Area leaders මට නම මතකයට එන්නේ නැහැ. Area leaders ඉන්නවා. එක එක පළාත් වලට එක එක Area leaders ඉන්නවා. In charges ඉන්නවා.

ප්‍ර: ඔබ මෙම ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ නායකයාගේ නම පැවසුවානේ?

පි: ඔව්.

ප්‍ර: ආයේ නම පොඩ්ඩක් සඳහන් කරන්න.

පි: හිටපු නායකයා නම තමයි හජ්ජුල් අක්බර් අවුරුදු 24ක් හිටියා. 2018 අන්තිම වාගේ වකවානුවේ වාගේ එයා නායකත්වයෙන් අයින් වුණා, අයින් වෙලා දැනට හුසේර් කියන එක් කෙනෙක් තමයි නායකත්වයේ ඉන්නේ.

ප්‍ර: ඔවුන්ට වෙන මොනවා හරි නම් තියෙනවා ද?

පි: අමීර් කියන නමින් නායකයා හඳුනනවා. ශිෂ්‍ය ඒකකයේ නායකයාව නාසීම් කියන නමින් තමයි හඳුන්වන්නේ.

ප්‍ර: ඊට පහළ හිටපු නායකයන් නම් ඔබ හඳුනනවා ද?

පි: තනතුරු

****

<u>ගරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: තනතුරු නෙවේ. යම්කිසි විශේෂිත නමක්, ඒ කියන්නේ සංවිධානයේ සාමාජිකයන්ට එක නමක් තියෙනවා. ඊට ඉහළ ස්ථරයක තව නමක් තියෙනවා. ඒකට ඉහළින් තව එහෙම ක්‍රමයෙන් උඩට යන්න යන්න එක එක විශේෂිත නම් තියෙනවද?

පි: නැහැ මම දන්න තරමට ඒ ගැන මට දැනුමක් නැහැ. මම ඉන්න කාලේ එහෙම දෙයක් මට මතක නැහැ.

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර: දැන් ඔය ජමාතේ ඉස්ලාමීය සංවිධානය පිළිබඳව ඔබ ඔවුන් විසින් පවත්වන ලද වැඩමුළු ගැන සඳහන් කළා ඔබ ජමාතේ ඉස්ලාමීය සංවිධානය ගැන යම්කිසි ශිෂ්‍ය ආධාර ලබා දෙනවා කියලා ඔබ දන්නවාද?

පි: ඔව් ශිෂ්‍යත්වය ලබා දෙනවා.

ප්‍ර: මොනවාටද ඔය ශිෂ්‍යත්වයන් ලබා දෙන්නේ?

පි: උසස් පෙළ සහ විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබන ළමයින්ට ලබා දෙනවා කියලා මම දන්නවා. ඒ වගේම පිටරටවල් වල ගිහිල්ලා ඉගෙනුම ලැබීම

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සඳහාත් ඒ වගේ දේවල් සලස්වලා දුන්නා කියලා පහු කාලයේ සලසා දුන්නා කියලාත් මට දැන ගන්න ලැබුණා.

ප්‍ර: ඔය සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සඳහා විෂයන් හදාරන ශිෂ්‍යන්ට ශිෂ්‍යත්ව ලබා දීම සඳහා යම්කිසි ක්‍රියාපටිපාටියක් තියෙනවාද?

පි: System එකක්

ප්‍ර: System එකක්?

පි: මම කවදාකවත් ඒ වගේ දේවල් වලට apply කරපු නැති හින්දා මම ඒ ගැන හරියට දන්නේ නැහැ. මොකද මම ඉන්න කොට මමත් ශිෂ්‍යයෙක්. එතකොට not a decision making power එකේ මම ආවේ නැහැ ඒ හින්දා එච්චර විස්තර මම දන්නේ නැහැ.

ප්‍ර: ඔබ සඳහන් කරා මෙහෙම ශිෂ්‍යත්වයන් දෙනවා වෙනත් රටවල් වලට යෑම සඳහා?

පි: YES.

ප්‍ර: එහෙම රටවල් වලට යෑම සඳහා තෝරා ගන්න පුද්ගලයන් යම්කිසි ක්‍රියාපටිපාටියක් ඔබ දන්නවා ද තියෙනවා ද කියලා?

පි: කොයි ආකාරයෙන් ද ඒ පුද්ගලයෝ තෝරා ගත්තේ කියලා දන්නේ නැහැ. ඒ වුණාට ගිය පුද්ගලයෝ මම අඳුනනවා.

ප්‍ර: මොන රටවල් වලට ද ගියේ ?

පි: තුර්කි රටට.

ප්‍ර: ආයේ?

පි: තුර්කි රටේ ගිහිල්ලා එතනින් සිරියාවට ගියා කියලා එක්කෙනෙක් පුද්ගලයෙක් පවසපු එක මම මාධ්‍යයෙන් දැක්කා. හැබැයි තුර්කි රටට ගිය පුද්ගලයන් දෙදෙනක් මට මුණ ගැහුණා. ඒ

ප්‍ර: කවුද ඒ පුද්ගලයන් දෙදෙනා?

පි: එක් පුද්ගලයෙක් හිටපු නායක හජ්ජුර් අක්බර්ගේ පුත්‍රයා.

ප්‍ර: නම ?

පි: නම මගේ අර එයාත් එක්ක මගේ ආගම ගැන සුහද සාකච්ඡා කරන්න ඕනි කියන අරමුණින් තමයි මාත් එක්ක හම්බුණේ. Face book හරහා තමයි මාව contact කරලා වෙන යාළුවෙක් හරහා තමයි contact කරේ. එයාගේ නම මගේ phone එකෙන් තමයි මට බලන්න වෙන්නේ. මේ අර WhatsApp Messages වල තමයි ඒක තියෙන්නේ. අර පරණ WhatsApp Messages වල. එයයි තව මාවනැල්ලේ සහිරා විද්‍යාලයේ අපිට, ඒ කියන්නේ මම හිටපු කාලයේ ඉංග්‍රීසි උගන්වපු රීසා ලතීෆ් කියන ගුරුවරයාගේ පුත්‍රයා. අක්මල් හසන් කියන පුද්ගලයා. ඒ දෙන්නා ගිහිල්ලා තියෙනවා තව කට්ටියත් ගියා කියන එක මම. I have heard it

FAIR COMMENT BY JEZEEM

from here and there. But unable to point out this person went this year and with solid evidence but these are things that I can say.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: ඒගොල්ලෝ ආපසු පැමිණියා ද?

පි: ඔව්. හජ්ජුර් අක්බර්ගේ පුත්‍රයා මෙහෙට ආවාට පස්සේ තමයි එයයි , රීසා ලතීෆ් සර්ගේ පුතාත් ලංකාවේ තමයි මට හම්බුණේ.

ප්‍ර: ඒ කොයි කාලේද?

පි: 2016 වසරේ වෙන්න ඕනි. නැත්තම් 2017.

ප්‍ර: දැන් ඒ කට්ටිය කොහේද?

පි: දැන් කොහේද කියලා මම දන්නේ නැහැ.

ප්‍ර: 2016 ලංකාවේ හිටියා?

පි: ඔව්. ලංකාවට ආපු වෙලාවේ හරි නැත්තම් හිටපු වෙලාවේ තමයි මට හම්බුණේ.

ප්‍ර: ඔබ ඇහුවාද මොනවද හම්බුණා කියලා කිව්වා නේද?

පි: ඔව්.

ප්‍ර: ඔවුන්ගෙන් ඇහුවාද මොනවද එහේ ගිහිල්ලා කරේ කියලා?

පි: මම එච්චර විස්තරයක් අහන්න ගියේ නැහැ. එයාලාම අඳුන ගත්තා තුර්කි වල දෙන්නාම ඉගෙන ගන්නවා කියන එක නැත්තම් ඉගෙන ගත්තා කියන එක because my focus was not about their studies but I got it ok they went to Turkey, it was a discussion about the religion. They were tried to convince me to get back to the religion. That was the basic so I was must focus on that one.

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර: ඔබ මෙම සඳහන් කරන පුද්ගලයන් ඔබ දැන ගත්තේ මෙම පුද්ගලයන් තුර්කි රටට ගිහිල්ලා ලංකාවට පැමිණියාට පස්සේ ද?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔබ ඔවුන් එක්ක සම්බන්ධ වුණානේ?

පි: ඔව් හම්බුණා.

ප්‍ර: එතකොට මේ ගැන තොරතුරු කිව්වාද?

පි: තුර්කි වල මොනවද කරේ කියන තොරතුරු නම් මට කිව්වේ නැහැ.

ප්‍ර: තුර්කියට ගියා කියලා විතර ද කිව්වේ?

පි: ඔව් තුර්කි වල උසස් අධ්‍යාපනය සඳහා තුර්කි වලට ගියා කියන එක විතරයි කිව්වේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මොකක් ද උසස් අධ්‍යාපනය හැදෑරූ විෂයන් හෝ මොනවා හරි යමක් කිව්වාද?

පි: එහෙම පැහැදිලිව මට මොකුත් කිව්වේ නැහැ. මමත් ඒවගේ දේවල් ගැන අහන්න ගියේ නැහැ.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා මේ පුද්ගලයන් තුර්කියේ සිට සිරියාවට ගියා කියලා?

පි: ඔව්.

ප්‍ර: ඒක ඔබ කොහොම ද දැන ගත්තේ?

පි: එක පුද්ගලයෙක්

ප්‍ර: කවුද පුද්ගලයා?

පි: ඊබ්‍රහීම් මවුලවිගේ පුත්‍රයා සාදික් අබ්දුල්ලා ඒක මාධ්‍ය වලින් තමයි මම දැන ගත්තේ. එයා ජමාතේ ඉස්ලාමීය නායකයාගේ මල්ලිගේ පුතා. තුර්කි වලට ශිෂ්‍යත්වයෙන් ගිහිල්ලා එතනින් සිරියාවට ගිහිල්ලා ISIS සංවිධානය එක්ක සම්බන්ධකම් ඇති කරගත්තා කියන එක බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ මාධ්‍ය වලින් මම දැන ගත්තා.

ප්‍ර: මාධ්‍ය වලින් නෙවේ, ඔබගේ පෞද්ගලික දැනුමක් ඇතිව අර ඉහතින් සඳහන් කළ පුද්ගලයන් ඔබට තුර්කි රටේ ඉඳලා සිරියාවට ගියා කියලා කිසියම්, යම් තොරතුරක් ලබා දුන්නා ද?

පි: නැහැ වැඩිදුර විස්තර මට මොකුත් කිව්වේ නැහැ.

ප්‍ර: ඔබ මෙම තුර්කි රටට යන පුද්ගලයා, මෙම පුද්ගලයන් පමණ ද තුර්කි රටට ගියා කියලා ඔබ දන්නේ ?

පි: නැහැ තව පිරිසක් ගිහිල්ලා තියෙනවා. ඒක තමයි මම කිව්වේ. When I said in English that I have heard from here and there but I can't point out this guy went this year and returned this year. I don't have that solid details. But from my friends and people I have heard adot of youngsters being sent to Turkey with the support of Jamaat-e-Islami.

ප්‍ර: දැන් ඔය තුර්කියට ගියා කියන පුද්ගලයන් ඔවුන්ගේ ස්ව කැමැත්තෙන් ද ගියේ?

පි: මම දන්නා තරමට ඒගොල්ලන්ගේ ස්ව කැමැත්තෙන්.

ප්‍ර: ඒගොල්ලන්ගේ කැමැත්තෙන් තමයි ගියේ?

පි: ඔව්.

ප්‍ර: ඔවුන් පුහුණුවක් ලබා ගත්තා ද ඉගෙන ගත්තා ද මොනවාත්ම සඳහන් කළේ නැහැ?

පි: නැහැ. ඉගෙන ගත්තා කියලා කිව්වා. පුහුණුවක් ලබා ගත්තා ද නැද්ද කියලා මට මොකුත් සඳහන් කළේ නැහැ.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මේ පුද්ගලයන් සඳහන් කරා ද මෙම තුර්කියට යන කොට අපේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මොනවා හරි යම්කිසි උදව්වක් එහෙම නැත්තම් සහතිකයක් ලැබෙනවා ද කියලා?

පි: නැහැ මොකුත් සඳහන් කළේ නැහැ.

****

<u>ගරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: ඔබ මෙම කොමිෂන් සභාව හමුවේ කියා සිටියා 1941 වසරේ දී ජමාතේ ඉස්ලාමීය සංවිධානය පාකිස්ථානයේ ආරම්භ කරා, ඔවුන්ගේ අරමුණ ඉස්ලාම් රාජ්‍යය හෝ කැලිෆට් එකක් බිහි කිරීම කියලා. දැන් අවුරුදු 70 ක් වගේ දීර්ඝ කාලයක් ගිහිල්ලා තියෙනවානේ, ඔබ දැන් ඉස්ලාමීය ආගමේ, ජමාතේ ඉස්ලාමීය ශිෂ්‍ය සංවිධානයේ ඉඳලා ඔවුන් ඔබලාට ඉගැන්වූ ඉස්ලාම් රාජ්‍යයක් බිහි කිරීම ශ්‍රී ලංකාවේ වැනි දේවල් ගැනත් ඔබගේ තියෙන අදහස් එකතු කරමින් මේ ප්‍රශ්නයට පිළිතුරක් දීම මම අපේක්ෂා කරනවා. මෙම කොමිෂමේ දැන ගැනීම සඳහා. දැන් අවුරුදු 70 ක් වැනි දීර්ඝ කාලයක් ගිහිල්ලාත් මේ දක්වා පාකිස්ථානයේ ඉස්ලාම් රාජ්‍යය පිහිටුවීමට නොහැකි වීම සහ ඒ අනුසාරයෙන් ශ්‍රී ලංකාවේ ජමාතේ ඉස්ලාමීය සංවිධානය විසින් ශිෂ්‍ය සංගමයක් හරහා සිසුන්ට ආගමික අන්තවාදී අදහස් උගන්වමින් ඉස්ලාම් රාජ්‍යයක් කරා ශ්‍රී ලංකාව ගෙන යාමට පුළුවන් කියන එක පිළිබඳව ඔබගේ මතය කුමක් ද?

පි: දැනට තිබෙන වාර්තා අනුවනම් ලංකාවේ ඒ වගේ දේවල් කරන්න අමාරුයි. හැබැයි ඒගොල්ලන්ගේ මතය තිබ්බේ දීර්ඝ කාලය කියන ප්‍රශ්නය 1995 මම දවස් 5 නේවාසික කඳවුරේ සහභාගී වුණා වෙලාවෙත් ඒ ප්‍රශ්නය කවුරුහරි ශිෂ්‍යයෙක් ඇහුවා හජ්ජුල් අක්බර්ගෙන් ඇහුවා. නායකයාගෙන්. එයා වාඩි වෙලා අපිට දේශනාව කර ගෙන ඉන්න වෙලාවේ ප්‍රශ්න අහන්න කිව්වාහම කවුරුහරි ශිෂ්‍යයෙක්, එතන හිටපු ශිෂ්‍යයෙක් ඇහුවා මෙච්චර කල් ගිහිල්ලානේ ජමාතේ ඉස්ලාම් එක මොකුත් කරලා නැහැනේ. එතකොට එයා එතනින් උත්තරේ දුන්නා තමාගේ පුතා ගැන කියලා උත්තරේ දුන්නේ. මගේ පුතා පොඩි ගහක්. A small plant. පොඩි පැළයක් හිටෙව්වා. ඒකට දවස් 2ක් වතුර දාලා බැලුවා. ඒක ලොකු වුණේ නැහැ. ඒක ගලවලා විසිකරලා ගියා. ඒ වගේ කරන්න බැහැ. It's a long-term plan කියලා කිව්වාහම, එතන හිටපු තව ශිෂ්‍යයෙක් එයාගේ නමත් මට මතකයි හසීර් කියලා එයා ඒ වෙලාවේ ගොඩාක් දහකාර කෙනෙක් control නැහැ. එයා එතනින් with a small voice එයා ගාණක් නැතිව කිව්වා ඉතින් ඔයාගේ පුතානේ. ඔයා වගේ තමයි කියලා කිව්වා. එතකොට මට තරහාත් ගියා නායකයාට මෙහෙම කියනවා කියලා. එයාට ඇහෙන්නේ නැතිව කිව්වා. එතකොට

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උත්තරේ හජ්ජුල් අක්බර් එතන කියපු උත්තරය තමයි long -term plan කියන එක. මේ ගොල්ලෝ ජමාතේ ඉස්ලාමීය නිතරම කියන කතාවක් තමයි මම ඉන්න කාලෙත් කිව්වා. The Sayanism Plan, ඉස්ලාමීය රාජ්‍යයක් කොහොමද යුදෙව් ජාතිකයන් විසින් පිහිටුවා ගත්තේ කියන එක. ඒක ඒගොල්ලන් අවුරුදු 2න් 3න් කරේ නැහැ. long-term plan ඒකට education, financial support වගේ හැම දේම එකතු කරාට පස්සේ තමයි වැඩේට බැස්සේ කියලා. ඒ වගේ තමයි අපිත් යන්න ඕනි. හදිස්සි වෙලා හරි යන්නේ නැහැ කියන මතය තමයි ඒගොල්ලන් ඉන්නේ. ඒ target එක achieve කරන්න ඒගොල්ලනේ විවිධ උපක්‍රම යොදවනවා. education පැත්තෙන්, social service, sports, whatever the possibilities මොන මොනවද ඒගොල්ලන්ට ඒක යාම සඳහා උපයෝගී කර ගන්න පුළුවන් හැම සාධකයක්ම ඒක උපයෝගි කර ගන්න ඕනි කියන මතය තමයි ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ මතය.

ප්‍ර: දැන් ඔබ ඉස්ලාමීය ආගමිකයෙකු කියලා ප්‍රකාශ කරන්නත් අකැමැති වුණානේ ඔබ ඉගෙන ගත්ත ඉස්ලාම් ආගම පිළිබඳව ඔබට ඇති වෙච්ච අකැමැත්ත හේතු කොට ගෙන?

පි: yes

ප්‍ර: මම මෙම කොමිෂන් සභාවට දැන ගැනීමට ඔබගේ අදහස කියනවානම් හොඳයි ශ්‍රී ලංකාවේ ඉස්ලාම් රාජ්‍යයක් ඇති කරන්න පුළුවන් වෙයි ද කියන එක?

පි: ආරක්ෂක අංශ ශක්තිමත් විදිහට වැඩ කළොත් පිටරට ඉස්ලාමීය සංවිධාන එක්ක තියෙන සම්බනබන්ධකම් ගැන විමසිලිමත්ව සිටියොත් පුළුවන් වෙන්නේ නැහැ.

****

<u>ගරු විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේ දී කොමිෂන් සභාව ඉදිරියේ තිබෙන රූපවාහිනී යන්ත්‍රයෙන් CD තැටියක අඩංගු යම් කොටසක් කොමිෂන් සභාවට නැරඹීමට සලසන බව උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනවිය දන්වයි. ඊට අවසර ලබා දෙමි. එහි මුල "රට අල්ලන කුමන්ත්‍රණයේ හෙලි නොවූ රහස A.G.M. නසීර් (ජමාතුල් මුස්ලීම් සංවිධානයේ හිටපු නායක) බැලුම්ගල ඉදිරියේ පාපොච්චාරණය කරයි." යනුවෙන් සඳහන් කර ඇති අතර තිරයේ ඉහළ කෙළවරේ දකුණු පසින් නෙත් FM9594.8 සඳහන්ව ඇති අතර වම්පස ඉහළ බැලුම්ගල යන අකුරු කළු පාටින් රතුපාට පසු බිමක සඳහන් කර ඇති බව සටහන් කරන අතර තිරයේ යට මෙය රහසිගත පටිගත කිරීමක් යනුවෙන් ද රතු පාටින් සඳහන් කර ඇති බව නිරීක්ෂණය කරයි.

FAIR COMMENT BY JEZEEM

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර: සාක්ෂිකරු දැනට මෙම දැනට තිරයේ දිස්වන සංයුක්ත තැටියේ අඩංගුවනවා මෙම රහසිගත පටිගත කිරීමක් කියලා. ඔබට මෙය ලැබුනේ කොහෙන්ද?

පි: මේක මම ලබා ගත්තේ නෙත් FM බැලුම්ගල වැඩ සටහනේ You Tube channel එක හරහා තමයි මං මේක ලබා ගත්තේ. ඒක තාම online මේක තියෙනවා කියලා මං විශ්වාස කරනවා.

****

<u>ගරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: ජමාතේ ජමාතේ මුස්ලිමින් කියන්නේ ජමාතේ ඉස්ලාමේ ම හඳුන්වන නමක් ද?

පි: ඒකත් මේ ඔබතුමිය කළින් අහපු ප්‍රශ්නයට පොඩි පිළිතුරක් හැටියට කියන්න පුළුවන්. ඇයි මෙච්චර අවුරුදු 70 ක් කාලයක් ගිහිල්ලාත් පිහිට වෙන්න බැරිවුනා කියලා ජමාතේ මුස්ලිමින් කියන්නේ ජමාත් ඉස්ලාමිය හිටපු යම් සාමාජිකයකු තවුහිද් ජමාතේ එකේ තව එක් සාමාජිකයෙකුත් එකතු වෙලා අපිට ගොඩාක් කල් බලන් ඉන්න බැහැ අපිට වෙනම පාලනයක් ඕනේ කියලා පිහිටවපු සම අංශයක්, ඒගොල්ලන් ඒක පොඩි ගමක් අල්ලගෙන පාලනයක් ඇති කලා පුත්තලමේ ඒතාලේ ප්‍රදේශයේ. 1990 ගණන්වල. ඊට පස්සේ ජිහාත් කරන්න ඕනි කියලා ඒගොල්ලන් ලෑස්ති වුණා. මේ මට ලැබිච්ච ආරංචි එතකොට ඒ වෙලේ හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස අණමත ඒගොල්ලෝ අත්අඩංගුවට ගත්තා. ඒ අනුව මේ නදීර් මහත්තයා අවුරුදු 07 ක් නැත්නම් 8 ක් වැනි කාලයක් හිරේ ගත කරනවා. එයත් එක්ක හිටපු තව එක්කෙනෙක් තමයි උමර් අලි කියන පුද්ගලයා එයා දුවලා හැංගෙනවා. ඊට පස්සේ 94 න් පස්සේ තමයි එළියට ඇවිල්ලා ආපහු ඒ සංවිධානය කරගෙන යනවා.

ප්‍ර: මේ සංවිධානය තවමත් තියෙනවාද?

පි: ඔව් පුත්තලමේ ක්‍රියාත්මක වෙනවා. ඒ වුනාට ඒගොල්ලන් ජිහාත් කිරීම වැනි දේවල් දැනට කරන්නේ නැහැ. ඒගොල්ලන්ගේ තව දෙයක් කියන්න ඕනේ ඉස්ලාම් ආගම අතහැරියොත් මරා දැමිය යුතුයි කියන එක තියෙනවා. මම පස්සේ ඒ ගැන මං හිතන්නේ මගෙන් ඒ ගැන ප්‍රශ්න කරයි. මාගේ ප්‍රකාශය අනුව. මේ සංවිධානයෙත් ඒ දවස්වල මේගොල්ලන් සලකන්නේ මේගොල්ලන්ගේ සංවිධානයට නොවන මුස්ලිම් අයව කාෆිර් හැටියට. මුස්ලිම් ආගමට නැති අය හැටියට ඒගොල්න්ගේ නායකයාට දිවුරුම දීපු කට්ටිය විතරයි මුස්ලිම් හැටියට

FAIR COMMENT BY JEZEEM

පිළිගත්තේ. එහෙම ඒගොල්ලන් එක්ක ඉඳලා තරහ වෙලා නැත්තම් අකමැත්තෙන් එළියට යන අයගේ නම ඒගොල්ලන්ගේ පල්ලිය ඇතුලේ ඉස්ලාම් ආගම අතහැර ගිය අය කියලා සඳහන් කරලා තිබ්බා. ඒ වුණාට මරණ දඬුවම ක්‍රියාත්මක කරන්න ඒගොල්ලන් උත්සාහ කරලා නැහැ. ඒ ගොල්ලන්ට බලය තිබ්බේත් නැහැ. ඒ වුනාට එහෙම දෙයක් ඒ ගොල්ලන්ගේ සංවිධානයේ වෙලා තියෙනවා දැනට තත්ත්වය කොහොමද කියලා මට දන්නේ නැහැ.

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ දන්නවාද මෙය කවදා පටිගත කරන ලද එකක් ද දිනය?

පි: මේක මේ You tube එකේ පලවෙලා තිබ්බේ ජූනි මාසේ **19** වෙනිදා **2019**

****

දැන් වේලාව: ප.ව. **1.05**

මෙතැන් සිට ල/ලේ: මුතුමාලි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව : **01.05**
පෙර සටහන් ල/ලේ : නිල්මිණි මෙය
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ගරු ස්වාමිනි මෙම අවස්ථාවේදී මෙම තිරයේ දිස්වූ විඩියෝ පටය අන්තර්ගත වූ නෙත් බැලුම්ගල විඩියෝ පටය අන්තර්ගත වූ **CD** තැටිය **C 329** ලෙස , බැලුම්ගල වැඩසටහනේ **2019** ජුනි මස **19** වෙනි දින විකාශනය වූ නෙත් එෆ් එම් බැලුම්ගල වැඩසටහනේ සංයුක්ත තැටිය **C 329** ලෙස ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

අවසර ලබා දෙමි.

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර : සාක්ෂිකරු මෙම ජමාතේ ඉස්ලාමීය සංවිධානය විසින් මුද්‍රණය කරනු ලබන සඟරාවක් තිබෙනවාද?

පි : ඔව්. අල්හසනාත් කියන සඟරාවක් ඉපැරණි සඟරාවක් තියෙනවා. අල්හසනාත් කියන

ප්‍ර : මොකක්ද නම ආයේ කියන්න?

පි : අල්හසනාත්

ප්‍ර : කියන සඟරාව තියෙනවා.

පි : තියෙනවා.

ප්‍ර : මාසේට ඒක කී සැරයක් සාමාන්‍යයෙන් මුද්‍රණය කරනවාද?

පි : මාසේකට සැරයක්.

ප්‍ර : ඔබ මෙම මුද්‍රණය කරන ලද සඟරාවල පිටපත් ඔබ ළඟ තියෙනවාද?

පි : දැනට මන් ගාව නෑ.

ප්‍ර : දැනට නෑ කියන්නේ ඔබගේ නිවසේ තිබෙනවාද නැත්නම්, ඔබට මෙම **2012** ජනවාරි මාසේ yosuf with Thasmin කියන පුද්ගලයා පිළිබඳව රචිත ලිපියක් පෙන්නුම් කළොත් අදුර ගැනීමේ හැකියාව තියෙනවාද?

පි : ඔව්.

ප්‍ර : ඒක ඔබ ගාව තියෙනවාද? ඕකේ සඳහන් වන මාතෘකාව මොකක්ද? ඔබට දෙමළ භාෂාවෙන් තියෙන්නේ?

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අබ්දුල්හසාම් කියන ඇෆ්ගනිස්ථානයේ මරණයට පත් වෙච්චි ජීහාත්කරු සම්බන්ධයෙන් තමයි මෙතන පත්තරේ ප්‍රකාශ කෙරෙන්නේ.

ප්‍ර : ඕක මුද්‍රණය කරලා තියෙන්නේ කුමන හෝ සඟරාවකද?

පි : අල්හසනාත් කියන සඟරාවේ.

ප්‍ර : දවස කවදද?

පි : මේක මම අන්තර්ජාලයෙන් ලබා ගත් පිටපතක්. මේකේ දවස මට හොයා ගන්න බැරි වුණා. මේකේ මලර් ඒ කියන්නේ මේ edition එක 17. Issue 12 කියන version එකේ තමයි මේක පළ වෙලා තියෙන්නේ.

ප්‍ර : ඕක මොනවා සම්බන්ධවද ඕකේ තියෙන්නේ? මොනවා සම්බන්ධයෙන්ද තියෙන්නේ? ආයේ කියන්න කුමන වසරේද ඕක පළ කරලා තිබෙන්නේ කියලා?

පි : මේක වසර මට හොයා ගන්න බැරි වුණා. මේ ඒකේ version එක විතරයි book එකේ serial number එක විතරයි මට හොයා ගන්න පුළුවන් වුණේ.

ප්‍ර : මොකක්ද ඒ serial number එකේ තියෙන්නේ?

පි : මලර් පදිනෙන්රාල් this is called edition 17 publication 12. In Tamil they call මලර් 17 ඉදල් 12.

ප්‍ර : ඒකේ අන්තර්ගතය ගැන කෙටියෙන් පොඩ්ඩක් පැහැදිලි කරන්න?

පි : අබ්දුල්ලා හසාම් කියන ජීහාත් සටන්කරුවා ඇෆ්ගනිස්ථානයේ යුද්ධයට ගිහිල්ලා මරණයට පත් වෙනවා. එයා ගැන ගොඩක් ප්‍රශංසා කරලා ලියපු Article ඒක තමයි මේක. ඒකේ ඉවර කරන්නේ අන්තිම paragraph එක ඉවර වෙන්නේ අපිත් මේ වගේ දිවි පරිත්‍යාග කරලා ජීහාත් යුද්ධය සටන ඉතා ධෛර්යමත් ලෙස ඉදිරියට ඉටු කර යා යුතුයි කියන අදහස තමයි මෙතන අන්තිම ඒකෙන් ඉවර කරන්නේ.

ප්‍ර : ඔබ ඔය ප්‍රකාශ කළානේ ජමාතේ සංවිධානය

පි : ඉස්ලාම් ආගම නඟා සිටුවීම සඳහා අපිත් ජීහාත් කරලා මේ වගේ තත්ත්වයකට අපිත් මේ ගමන ඉදිරියට අරන් යන්න ඕනී. ධෛර්යමත් ලෙස අරන් යන්න ඕනී කියන එක. ඒත් එක්කම තව මෙතන තව දෙයක් සඳහන් කරලා තියෙනවා අබ්දුල්ලා හසාම් ගේ අවුරුදු පහේ පුත්‍රයාගේ අභාවප්‍රාප්ත වෙච්ච නැත්නම් එතනින් ඝාතනයට ලක් වෙච්චි ඒ අබ්දුල්ලා හසාම්ගේ අවුරුදු පහේ පුද්ගලයාගෙන් පොඩි interview එකක්. යුද්ධයේදී මරණයට

LEAR COMMENT — BY JEZEEM —

පත් වෙච්චි අබ්දුල්ලා හසාම්ගේ අවුරුදු පහේ පුත්‍රයාගේ පොඩි interview එකක් දාලා තියෙනවා. ඒකේ පුත්‍රයා එක ප්‍රශ්නෙකට උත්තර දෙන කොට ඒ පුත්‍රයා කියනවා මමත් ජීහාත් යුද්ධයේදී මරණයට පත් වෙලා මගේ තාත්තා ගාවට යන්න ඕනී කියලා ඒ ඒ අදහසත් කියලා තියෙනවා. ඒ වගේම තාත්තාව මරපු එයා පියාව මැරුවේ කවුද කියලා අහලා තියෙනවා ඒකට උත්තරේ දීලා තියෙනවා කාෆීර් මුස්ලිම් නොවන අය කියන වචනය. ඒක ඉතා it's a broad term. මුස්ලිම් නොවන අය කියන වචනය. මමත් මරණයට පත් වෙලා ඒ විදිහට යන්න ඕනී කියන එක අවුරුදු පහේ ළමයා කියන එක ආදර්ශයක් හැටියට මෙතන සඳහන් කරලා තියෙනවා මේ සභරාවේ.

ප්‍ර : ඔබ ඔය ප්‍රකාශ කරන්නේ ජමාතේ

පි : ජමාතේ ඉස්ලාමීය සංවිධානය

ප්‍ර : ජමාතේ ඉස්ලාමීය සංවිධානය විසින් නිල වශයෙන් ප්‍රකාශ කරන සභරාවේ පල කරලා තිබෙන කොටසක්?

පි : ඔව්.

ප්‍ර : ලිපියක්?

පි : ලිපියක්. 02 වෙනි පිටුව, 15 වෙනි පිටුව, 16 වෙනි පිටුව, 24 වෙනි පිටුව වල මේක සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර : ඕකේ ප්‍රකාශ කරලා තියෙන මරණය පිළිබඳ මොනවද සඳහන් කරලා තියෙන්නේ?

පි : අවුරුදු පහේ පුත්‍රයා කියනවා මම ජීහාත් වලට ගිහිල්ලා මරණයට පත් වෙන්න ඕනී කියන එක.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී කොමිෂන් සභාව ඉදිරියේ තිබෙන රූපවාහිනියෙන් අන්තර්ජාලය උපයෝගි කර ගනිමින් සාක්ෂිකරු ජමාතේ ඉස්ලාමීය සංවිධානය විසින් පළ කරනු ලබන අල්හසනාත් යන ජර්නලයේ 1990 පෙබරවාරි මසට අදාළ කලාපය කොමිෂන් සභාවට පෙනෙන අයුරින් තිරයට ලබා ගෙන එහි පිටු අංක 2 හි ඇති ලිපියක් කොමිෂන් සභාවට පෙනෙන පරිදි රූපවාහිනි තිරයේ දක්වයි. එහි ජායා පිටපතක් මෙම සාක්ෂිකරු විසින් දැනටමත් කොමිෂන් සභාවට ලබා දී ඇති අතර එම ජායා පිටපත C 330 වශයෙන් ලකුණු කිරීමට උගත් රජයේ අධිනීතිඥවරයා ඉල්ලීමක් කරන අතර එයට අවසර ලබා දෙනු ලැබේ. එම ලිපිය දෙමළ භාෂාවෙන් ඇති අතර එය කොමිෂන් සභාවේ භාෂා

FAIR COMMENT — BY JEZEEM

පරිවර්තක විසින් දැනටමත් සිංහලට පරිවර්තනය කර ඇති අතර එම සිංහල පරිවර්තනය **C 330 (A)** වශයෙන් ලකුණු කිරීමට අවසර ලබා දෙමි.

මේ අවස්ථාවේදී උගත් රජයේ අධිනීතිඥවරයා දන්වන්නේ අදාළ ලිපියේ පිටු අංක **02,15,16,24** යන පිටු පමණක් මෙම සාක්ෂිකරු විසින් දැනටමත් මෙම කොමිෂන් සභාවට ලබා දී ඇති අතර එකී පිටුවල එකතුව මෙම කොමිෂන් සභාව ඉදිරියේ **C 330** වශයෙන් ලකුණු කරන ලද බව සටහන් කරමි. එසේම එම පිටු හතරෙහි සිංහල පරිවර්තනය පමණක් **C 330 (A)** වශයෙන් ලකුණු කරන ලද බව සටහන් කරමි .

මේ අවස්ථාවේ කොමිෂන් සභාව වැඩි දුරටත් නියෝග කරන්නේ අදාළ ලිපියේ සම්පූර්ණ පිටපතක් ලබා ගෙන එය **C 330 (B)** වශයෙන් ලකුණු කිරීමටත් එම අදාළ සම්පූර්ණ දමිළ භාෂාවෙන් පල කර ඇති ලිපියේ සිංහල පරිවර්තනය **C 330 (C)** වශයෙන් ලකුණු කිරීමටත් නියෝග කරමි.

දැන් වේලාව : ප.ව.01.35 යි
මෙතැන් සිට ල/ලේ : සචිනි මෙය.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව. 1.35
පෙර සටහන්: මුතුමලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා.</u>

සාක්ෂිකරු මෙම කොමිෂන් සභාවට අනුයුක්තව සිටින පොලිස් ඒකකයට තවත් මේ වගේම අල් හසන් සඟරාවේ **Journal** (ලිපියක්) ලබා දී තිබෙනවා.

ගරු ස්වාමිනි මේ අවස්ථාවේ මෙම සාක්ෂිකරුට තවත් ලේඛනයක් පෙන්වීමට අවසර ඉල්ලා සිටිමි.

ප්‍ර: ඔය ඔබගේ අතේ තිබෙන ලේඛනය යම්කිසි සඟරාවකද පල කර තිබෙන්නේ?

උ: ඔව් අල් හසනාත් සඟරාවේ පල වෙලා තිබෙනවා.

ප්‍ර: දවස කවදද?

උ: 2008 ජූනි මාස නිකුත් කරපු සඟරාව.

ප්‍ර: මොකද්ද ඕකට දීලා තිබෙන මාතෘකාව ?

උ: මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර වල යොදවන්න පුළුවන් ද.

ප්‍ර: ඕක තියෙන්නේ මොන භාෂාවෙන් ද කියලා ඉස්සෙල්ලාම ප්‍රකාශ කරන්න?

උ: දෙමළ භාෂාවෙන්.

ප්‍ර: කවුද ඕක ලියලා තියෙන්නේ?

උ: ඒක ලියපු එක්කෙනාගේ නම නැහැ. මේකේ සඳහන් වෙලා තියෙන්නේ ජාත්‍යන්තර ඉස්ලාමිය විද්වතෙක් වන යුසුෆ් අල් කල්රාවි. මේ රටේත් බොහෝ ඉස්ලාමිය සංවිධාන සහ දේශකයින් විසින් ඉතා highly respected and highly recommended and පිළිගනු ලබන කෙනේක තමයි යුසුෆ් කල්රාවි. එයා විසින් නිකුත් කරපු ආගම the Fatwa. Fatwa means the religious statement මගපෙන්වීමක් ඒක තමයි මෙතැන පල වෙලා තියෙන්නේ. එකේ දෙමල පරිවර්තනය.

ප්‍ර: ඔබට ඔය ලිපිය කොහොමද ලැබුණේ?

උ: අල් හසනාත් සඟරාවේ අන්තර්ජාලය හරහා මම ලබා ගත්තා. නූලහම් කියන වෙබ් අඩවියේ.

ප්‍ර: දැන් ඔබට එම ලබාගත් පිටුව පෙන්නුම් කරන්න හැකියාවක් තියෙනවද මෙම කොමිෂන් සභාවට?

උ: ඔව්.

****

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු අදිකාරී මැතිනිය.

ප්‍ර: යුසුෆ් අල් කල්රාවි කියන ඉස්ලාමික ආගමික පූජකතුමා කිනම් රටක එක්කෙනෙක් ද?

උ: ඊජිප්තු ජාතික කෙනෙක්. දැනට කටාර් රාජ්‍යයේ පදිංචි වෙලා ඉන්නේ.

****

රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා.

ප්‍ර: මේ දමිළ බසින් තියෙන කොටසේ සංක්ෂිප්ත සාරාංශයක් මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට හැකියාවක් තියෙනවද?

උ: ජිහාත් යුද්ධය සඳහා සියදිවි නසා ගැනීමේ නැත්නම් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන්න පුළුවන් කියන එකයි. ගෑනු අය එවැනි ප්‍රහාරයකට යොමු වෙනව නම් තමාගේ ස්වාමී පුරුෂයාගේ අවසර ගන්න ඕනෙ නැහැ. අවසරයෙන් තොරව ඒකේ යොදවන්න පුළුවන් කියන එකයි. මෙතැන සඳහන් කරලා තියෙනවා. ඉස්ලාම් ආගමේ අනුව යම්කිසි දේකට ගෑනු කෙනෙක් යනවනම් තමාගේ ස්වාමිපුරුෂයාගේ හෝ තාත්තගේ හෝ අවසරය ලබා ගන්න ඕන. මේ වගේ දේකට යනව නම් ඒ අවසරය පවා ඕනේ නැහැ. මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය දියත් කරන්න පුළුවන් කියන එක තමයි මෙතැනින් ඉස්ලාම් ආගම අනුව පුළුවන් කියන එක කියලා තියෙනවා. තව මෙතැනින් translation එකේ පොඩි දෙයක් add කරලා තියෙනවා. තත් කොලේ කියලා දාලා තියෙන්නේ තමාගේ ජීවිතය පරිත්‍යාග කරලා ඒක පොඩ්ඩක් තත් කොලෙයි කියන එක Suicide කියන එක සියදිවි නසා ගැනීම කියන එක විවිධ හේතු මත සිද්ධ වෙනවා. ජීවිතයේ කලකිරීමකින් නැත්නම් ජීවිතය බේරා ගැනීම ජීවත් වෙන්න බැරි අවස්ථාවක. හැබැයි මෙතැන තියෙන තත් කොලෙයි තමාව පරිත්‍යාග කරලා ඒක උතුම් කරලා තමයි මෙතැන කියලා තියෙන්නේ. දෙමළෙන් ඒ වචනය භාවිතා කරලා තියෙන්නේ. ඒ ලියපු එක්කෙනාගේ translation කියලා මං හිතනවා මේක.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.

ප්‍ර: ස්වාමිපුරුෂයා යනවනම් බිරිඳගේ හෝ දෙමාපියන්ගේ බිරිඳගේ අවසරය අවශ්‍ය නැද්ද?

උ: ඉස්ලාම් ආගමට අනුව කිසිම දේකට ස්වාමිපුරුෂයාට ඒ කියන්නේ පිරිමියෙක් හැටියට ඒ අවසරය වුවමනා වෙන්නේ නැහැ.

ප්‍ර: දෙමාපියන්ගේ

උ: ඕනවෙන්නේ නැහැ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: තමන් තනි තීරණයට එත හැකි?

උ: පුළුවන්.

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ප්‍ර: කෙටියෙන් කිව්වොත් එහෙම මෙම ජමාතේ ඉස්ලාම් සංවිධානය විසින් ප්‍රකාශ කරන අල් හසනා නැමැති සගරාවේ මරාගෙන මැරීම පිළිබඳව ලේඛනගත කරලා තියෙන Journal එකක් කියලා කිව්වොත් නිවැරදි?

උ: ඔව්.

ගරු ස්වාමීනි මෙම අවස්ථාවේ දී ජමාතේ ඉස්ලාම් සංවිධානය මගින් ප්‍රකාශ කරන ලද අල් හසනා නැමැති නිල සගරාවේ මරාගෙන මැරෙන ප්‍රහාරවල නිරතවිය හැකි ද යන්න මාතෘකාව වශයෙන් සඳහන් කර ඇති මහාචාර්ය යුෂිම් අල්හර්අබී නැමැති පුද්ගලයා විසින් රචිත **2008** ජූනි මස සඟරාව **C 331** ලෙස ඉදිරිපත් කර ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිමි. ගරු ස්වාමීනි මෙම ලියකියවිල්ල දැනටමත් පරිවර්තනයක් භාෂා පරිවර්තක විසින් ලබා දීලා තිබෙනවා. එය **C 331 A** ලෙස ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිමි.

****

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

අවසර ලබා දෙමි.

****

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා</u>

ගරු ස්වාමීනි තවත් ලේඛනයක් පෙන්වීමට අවසර ඉල්ලා සිටිමි.

****

<u>ගරු අදිකාරී මැතිනිය.</u>

ප්‍ර: ජමාතේ ඉස්ලමිය සංවිධානය Islamic brotherhood කියන ජාත්‍යන්තර ඉස්ලාම් ආගමික අන්තවාදී සංකල්පයක් සමඟ යන ඒ මගින් සවුදි අරාබියේ කටාර් රාජ්‍යයේ සහ තවත් මුස්ලිම් රාජ්‍යයන් වලින් මූල්‍යාධාර ලබා ගනිමින් ලංකාවේ ක්‍රියාත්මක වෙනවද?

උ: Islamic brotherhood and ජමාතේ ඉස්ලාමීක් මේ සංවිධාන දෙකම Ilhwanua Muslimin යන නමින් හඳුන්වන Islamic brotherhood සහ ජමාතේ ඉස්ලාමීක් යන සංවිධාන දෙකම එකම අරමුණ කරා යන සංවිධාන දෙකක්. ලෝකයේ වෙනස් වෙනත් පළාත් දෙකක තමයි මේ සංවිධාන දෙකම ක්‍රියාත්මක වෙන්නේ. දකුණු ආසියාතික රටවල් වල

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ජමාතේ ඉස්ලාමී හා අනිත් රටවල් වල ආරාබි භාෂාව කතා කරන රටවල් වල Ilhwanua Muslimin සංවිධානය ක්‍රියාත්මක වෙනවා. ජමාතේ ඉස්ලාමී සංවිධානය බොහෝ දුරට Ilhwanua Muslimin නැත්නම් Islamic brotherhood සංවිධානයේ Scholars ලාගෙන් විද්‍යුතයන්ගෙන් නැත්නම් නායකයන්ගෙන් පොත් පත් ප්‍රකාශක ඉතා ඉහළ ලෙස ප්‍රශංසා කරලා ඒවා පරිවර්තනය කරලා නිකුත් කරනවා. මේ සංවිධාන දෙකම ලෝක ව්‍යාප්ත ඉස්ලාමීය රාජ්‍යයක් ගැන කතා කරන හින්දා Kingdom එකක් වන සවුදි ආරාබියා මේ ගොල්ලන්ට එච්චර කැමැත්තක් දක්වන්නේ නැහැ. ජමාතේ ඉස්ලාමීයා සංවිධානයට since I giving this statement in front of the judges the Court I may not be able to support with this claim with the documents whether I can proceed or have stop about the finances.

****

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: Let us know what you know about it?

උ: Right, as far as I understand and I heard from the other people මේ ජමාතේ ඉස්ලාමික් සංවිධානයට ගොඩාක්ම සල්ලි හම්බුවන්නේ කුවේට්, කටාර් රාජ්‍ය වලින්. ඒ දවස් වල. දැනට ඒ දෙකම අබිබවා overtake ඇවිල්ලා තියෙන්නේ තුර්කි රාජ්‍යයන්. තුර්කි වලින් තමයි මූල්‍ය ආධාර ජමාතේ ඉස්ලාමීය සංවිධානයට ලැබෙන්නේ.

****

<u>ගරු අදිකාරී මැතිනිය.</u>

ප්‍ර: ඔබට ප්‍රකාශ කරන්න පුළුවන්ද මෙම කොමිෂන් සභාවට තුර්කි රාජ්‍යය ජමාතේ ඉස්ලාමිය සංකල්පය අනුව යන ඉස්ලාම් ආගමික අන්තවාදය අනුගමනය කරමින් තිබෙන රටක් ද? එහෙම නැත්නම් මැද පෙරදිග වැනි Islamic brotherhood කියන එක අනුව යන රටක් ද?

උ: මගේ දැනුම අනුව මේ දෙකටම රාජ්‍ය අයිති නැහැ. මම පොඩි Correction එකක් කරන්න ඕන. කුවේට් රාජ්‍යයේ තියෙන යම්කිසි සංවිධාන තමයි මේ ගොල්ලන්ට සල්ලි දෙන්නේ. කුවේට් රජයෙන් නෙවෙයි. මං දන්න තරමට. But may be the government has spent the money for some Certain projects through some nongovernmental organization they made direct this money to them, but Turkey's concerned that government is in the same ideology as Jamaat-e-Islami and Ikhwanua brotherhood. Erdogan

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

the President of the Turkey is known as the modern Calipher leader of the Caliphate among the J Jamaat- e- Islami and Ikhwanua Muslimin so he is trying to bulid up that image and this they are directly supported not like kuwit and Qatar.

ප්‍ර: ලංකාවේ ජමාතේ ඉස්ලාමීය සංවිධානයට තුර්කියෙන් මූල්‍යාධාර ලැබෙනවා කියලා එකට ඔබට තොරතුරු තියෙනවද?

උ: yes, because there are Certain evidences like Jamaat-e- Islami members getting scholarship and going to turkey directly is one of them. And there are unproveable since I don' t have the evidences but there here and there I hear that jamaat-e- Islami is fully supported by Turkey nowadays financially.

ප්‍ර: තුර්කියේ තිබෙන ෆෙටෝ කියන ත්‍රස්තවාදී සංවිධානය ගැන ඔබ අසල තිබෙනවාද? ඒක ලංකාවේ ක්‍රියාත්මක වුණු බවට?

උ: නැහැ.

ප්‍ර: අහලා නැහැ?

උ: නැහැ.

ප්‍ර: ෆෙටෝ කියලා ත්‍රස්තවාදී සංවිධානයක් තුර්කියේ තිබුණ කියලා ඔබ අහලා නැද්ද?

උ: නැහැ.

****

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඔබ ජමාතේ ඉස්ලාමී සංවිධානයට සම්බන්ධව කටයුතු කරපු කාලයෙන් ඔබගේ දැනිම අනුව ඒ ශ්‍රී ලංකාව ඉස්ලාම් රාජ්‍යයක් බවට පත් කර ගැනිමට තිබ්බ සැලැස්ම මොකද්ද?මොන විදියට ද ඒක මේ කරන්න හැදුවේ?

උ: ඒක කාලෙන් කාලෙට වෙනස් වුණා . මුල් කාලේ දී මුස්ලිම් කට්ටය ඇතුළට ආගම කියන එක තද ලෙස දීමෙන් ඒක ක්‍රියාත්මක කරන්න හැදුවා. ඊට පස්සේ ගත්ත අනුගමනය තමයි අධ්‍යාපනය කියන එක. ඊට පස්සේ තව පොඩ්ඩක් ඒක පුළුල් කරලා broaden කරලා social service කියන එක අතට ගත්තා. දැන් ඊට පස්සේ Sports කියන එක අතට ගත්තා. Wherever there are opportunities they use everything for their maxmum for example when I joined first there was not much support for the education. Later on thwy started supporting students with education. After thatthey went into the social service like blood donation camps and all and ශ්‍රමදාන Campaigns

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

and later o n they get in to the sports also, Creathing sport Clubs and this things. Specially university students and higher education students. They are giving all these things and even if some muslim Government servants are retired they also approach them. Wherever the possible ways they approach and they honour the people and they get them in to their fold.

මෙම සාක්ෂිකරුගෙන් ජමාතේ ඉස්ලාමීය සංවිධානය සම්බන්ධ වෙනත් ප්‍රශ්න නොමැති බව කොමිෂන් සභාව දන්වයි. මෙම සාක්ෂිකරුගෙන් දීර්ඝ වශයෙන් වෙනත් කරුණු සම්බන්ධයෙන් සාක්ෂි ලබා ගැනීමට ඇති හෙයිනුත් පසු අවස්ථාවකදී කොමිෂන් සභාවේ වාර්තාව සකස් කිරීමේ දී පහසුව උදෙසා පමණක් ජමාතේ ඉස්ලාමීය සංවිධානය සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු දෙන ලද සාක්ෂිය හා ඊට වෙනත් සම්බන්ධකමක් ඇති ඒ සංවිධානයට සම්බන්ධව යම් ප්‍රශ්න ඇසීමට අවශ්‍යතාවයක් ඇද්ද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසයි. නැත යනුවෙන් දන්වයි .

ඒ අනුව මේ අවස්ථාවේ දී දිවා ආහාරය සඳහා කොමිෂමේ කටයුතු නවත්වමි. නැවත 2.30 කොමිෂම රැස් වෙන බව දන්වයි.

වේලාව:1.55
මෙතැන් සිට: චන්දිමා මෙනවිය.

President Secretariat.com

FAIR COMMENT
BY JEZEEM

වේලාව:ප.ව.2.40
පෙර සටහන් :ල/ලේ මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට :ල/ලේ චන්දිමා දිල්හානි .

දිවා විවේකයෙන් පසු කොමිෂන් සභාව නැවත රැස්වේ . සාක්ෂිකරු නැවත ප්‍රතිඥා පිට කැදවයි.
මම කියන සාක්ෂිය සැබෑය සම්පූර්ණ සැබෑය. සැබෑවක් මිස අන්කිසිවක් නොකියන බවට ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි.

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර; ඔබ අද දින සඳහන් කරනු ලැබුවා නිරාගාමිකයකු වන්නට පෙර ඔබ ඉස්ලාම් ආගම හදාරන ලද බව ?

පි: ඔව්.

ප්‍ර; එහෙනම් ඔබට අපි ඒ නිසා ඉස්ලාම් ධර්මයට අදාල යම් කරුණු කීපයක් පිළිබඳව ඉස්සරවෙලා විමසලා බලමු.?

පි: හරි.

ප්‍ර; එතකොට විශ්වය මවලා එය පාලනය කරන්නේ සර්ව බලධාරී අල්ලාහ් කියලා විශ්වාසයක් තිබෙනවා නේද ඉස්ලාම් භක්තිකයින්ට?

පි; ඔව්.

ප්‍ර; එතකොට නබි මොහොම්මදු තුමා මෙලවට එවලා තියෙන්නේ කවුද?

පි: අල්ලාහ් දෙවියන් වහන්සේ විසින් තමයි එවලා තියෙන්නේ කියන එක තමයි ඉස්ලාම් ආගමේ විස්වාසය.

ප්‍ර; මොන පරමාර්ථයෙන්ද එතුමාව මෙලොවට එවලා තියෙන්නේ?

පි: පොඩ්ඩක් ගැඹුරින් උත්තරය දෙනවානම් අල්ලාහ් දෙවියන්වහන්සේ පෘතුවිය නිර්මාණය කරාට පස්සේ කියනවා මගේ කලීෆා කියන වචනය මගේ Representative කලීෆා කියන වචනය

ප්‍ර; කලීෆා කියන්නේ Representative

පි: Not Representative this is directly related to khilafat, Caliphate. That is the same Arabic word. In Quran Allah say is that I' am going to create my khaleefa on Earth. So this is how අල්ලාහ් දෙවියන් වහනේස් විසින් මනුෂ්‍යයාව ලෝකයේ නිර්මාණය කරන්නේCreate කරන්නේ. ඊට පස්සේ ඒ මනුෂ්‍යන්ට මග පෙන්වීම සදහා අල්ලාහ් දෙවියන් වහන්සේගේ නීතිය ලෝකයේ ඇති කිරීම සදහා තමයි නබි මොහොමද් තුමාට දේව පණිවිඩ ලබා දී මේ දේවදූතයෙක් විදියට එයාව පත්කරන්නේ.

ප්‍ර: ඒ කියන්නේ මොහොම්මද් නබිතුමා අල්ලාහ් දෙවියන්ගේ දේවදූතයා ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: දේවදූතයා.

ප්‍ර; නමුත් මෙලොවට පහල කරලා තියෙන්නේ අල්ලාහ් විසින් එම නබි මොහොම්මදු තුමා විතරද දේවදූතයෙක් විදියට?

පි: ඉස්ලාම් ආගමේ විදියට කුරානයේ සඳහන් වෙනවා එක්ලක්ෂ විසිහතර දාහක් දේවදූතයෝ මේ ලෝකේට එව්වා කියලා If I say the word the God chosen certain people to give his message. පහල කරනවා කියන වචනය ඒකට ගැළපෙනවාද කියලා මට I'm not sure about that one. Select the people to give the message තෝරාගන්නවා.

ප්‍ර; එතකොට නබි මොහොම්මද්තුමාට පස්සේ අල්ලාහ් දෙවියන්ගේ නියෝජිතයන් විදියට නැත් නම් උන්වහන්සේගේ ධර්මය මේ පෘතුවිය තුල ප්‍රචාරය කිරිමට පුද්ගලයින්ට මග පෙන්වීමට වෙන කවුරුත් එවලා තියෙනවාද?

පි: According to Islam ඉස්ලාම් ආගම විදියට වෙන කාවවත් යවන්න බැහැ මොහොම්මද් නබිතුමා තමයි අන්තිම දේවදූතයා අල්ලාහ් දෙවියන් වහනසේගේ ලෝකයේ අවසාන වෙනකම් සිද්ධවෙන්න ඕන හැමදේටම ලෝකයේ අවසාන වෙනකම් ජීවත් වෙන අන්තිම මනුෂ්‍යයාටත් මඟ පෙන්වීමේ guidance එක ඒ නබිතුමාගේ අතට දීලා යවලා තියෙනවා කියන එක තමයි ඉස්ලාම් ආගමේ මතය.

ප්‍ර: එතකොට එහෙමනම් අපිට පැහැදිලි කරන්න පුළුවන්ද කුර්ආන් එකේ මොනවාද සඳහන් වෙලා තියෙන්නේ කියලා ?සාමාන්‍යයෙන් කුරාන් එක එහි යම් යම් දේවල් තියෙනවානේ මොනවාද එහි සාමාන්‍යයෙන් සංක්ෂිප්තව කියනවා නම් කෙටියෙන් කියනවානම් එහි සඳහන්වෙලා තියෙන්නේ?

පි: From the point of view of an ex- Muslim or from the point of view of a Muslim?

ප්‍ර; Separately First you answer as a follower that you had been. What did you understand?

පි, According to Islam that whole Quaran is give by God directly to the whole human race to be followed. It contains the histories, teaching guidance etc'

ප්‍ර: So these are au decisions of God?

පි: Not only decisions. Incidents happened prior to Mohomad 1000 years, 2000years ago and about the creation of the world, the universe, sky, sea and all the things how God created and what man should do and also the solution for the problems within the family problem and the ruling of the earth and the administration

FAIR COMMENT BY JEZEEM

system and financial system and dividends of the property, once someone passé, away how the property should be divided between the family, among the family members and guidance are given in the Quaran.

ප්‍ර: ඔබ එයින් අදහස් කරන්නේ කුරාන් එකේ තියෙන්නේ මේ පෘතුවිය තුල මේ සමස්ත පෘතුවිය තුල මත තිබෙන දේවල් සහ ඒවා උපයෝගි කරගන්නා විට මිනිසා විසින් එය කෙසේ කල යුතුද කියන එක පිළිබඳව මග පෙන්වීමක් ද?

පි: ඒවා තියෙනවා ඒවා පමණක් නොව මට මිස් වෙච්ච කාරණයක් තමයි මරණින් පස්සේ ජීවිතය ගැන ස්වර්ගය ගැන ,අපාය ගැන, එහි තියෙන දඩුවම tortures,වදහිංසා ගැන බය කරලා තියෙනවා ඒ වගේ දේවලුත් තියෙනවා. පෘතුවියේ මනුෂ්‍යයා ජීවත් වෙනකොට එන ප්‍රශ්නවලට කොහොමද මුහුණ දෙන්නේ කොහොම ද ජීවිතයක් නැත්නම් පාලනයක් කරගෙන යන්නේ කියන ඒවාත් එතැනෆ සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර; ඒ කුරාන් එක ලැබුනේ කාටද?

පි; මොහොම්මද් නබිතුමාට ලැබුනා කියන එක තමයි ඉස්ලාම් ආගමේ විශ්වාසය.

ප්‍ර: එතකොට මොහොම්මද් නබි තුමාට ඒ කුරාන් එක ලැබුනේ මොන භාෂාවෙන්ද?

පි: අරාබි භාෂාවෙන්.

ප්‍ර: ආරබි භාෂාවෙන් එහෙම නම් කුර් ආන් එකේ තියෙන දේවල් කියවලා පැහැදිලි කර ගන්නට නම් අරබි භාෂාව දැනගන්නට ඕනේ නේද?

පි: දැනට පරිවර්ථනය හැම භාෂාවෙන්ම වගේ.

ප්‍ර; සාමාන්‍යයෙන් පරිවර්ථනය කරන්නත් භාෂාව දැනගන්න ඕනේනේ ?

පි: ඔව්.

ප්‍ර; නේද?

පි; ඔව් .

ප්‍ර; ඒ කියන්නේ මූලික වශයෙන් එය සඳහන් කරලා තියෙන එය පිළියෙල කරලා තියෙන භාෂාව වන අරබි භාෂාව එහෙම නම් දැන ගැනීම අවශ්‍ය වෙනවා.

පි: අවශ්‍ය වෙනවා.

ප්‍ර: අප විසින් දැනට C 138 කියලා ලකුණු කරලා තියෙනවා සමස්ථ ලංකා ඉස්ලාම් ආගමික වියතුන්ගේ සංගමය මගින් ප්‍රකාශිත ඔබ ලග තියෙනවාද?

පි: මම ලඟ නෑ පරිවර්ථනය තියෙන්නේ.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: අල්කුර් ආන් අර්ථ සංග්‍රහය එහි එක් කරුණක් කෙරෙහි මා අවධානය යොමු කරන්නේ එහි සඳහන් කරලා තියෙනවා පෙර වදනේ තුන්වන පිටුවේ ශුද්ධ අල් කුර්ආනය අරාබි භසින් පහල වුවද අරාබින් පවා එහි වැකි වල නියම අරුත දැන ගැනිමට හා නියම ආකාරයට උච්චාරනය කිරිමට නබි මොහොම්මද්තුමාණන්ගේ පිහිට පැතුහ.එතකොට ඒකෙන් අදහස් කරන්නේ අරාබියේ වෙසෙන අරාබි ජාතිකයන් පවා ආරාබි භාෂාවෙන් පහළ වෙලා තිබුණු මේ කුර්ආන් එකේ තිබෙන කරුණු ඒකේ නියම අරුත දැන ගැනිමට නබි මොහොම්මද්තුමානන්ගේ පිහිට පතලා තියෙන බව නේද?

පි: පිහිට පතලා තියෙන බව Translate කරොත් ඒක මට පොඩ්ඩක්.

අල්කුරාන් අර්ථ සංග්‍රහයේ ඉංග්‍රීසි බසින් ඇති කොටසක් කියවයි.

ප්‍ර; ඉතා ගෞරවයෙන් ගරු කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන්නට කැමති C138 ලෙස ලකුණු කොට අප ඉදිරිපත් කොට තිබෙන සමස්ථ ලංකා ඉස්ලාම් ආගමික වියතුන් ගේ සංගමය මගින් ප්‍රකාශිත අල් කුර්ආන් අර්ථ සංග්‍රහයේ පෙර වදනේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම පවතින බවත් එහි මේ කුර් ආනය සම්බන්ධයෙන් වන පළමු අරමුණ මිනිසුන්ට පාරායනය කර පෙන්වීම යන උප ශිර්ෂය යටතේ III පිටුවේ සිංහල භාෂාවෙන් සඳහන් විස්තර කිරීමෙහි මේ ආකාරයට සඳහන් වන බව එනම් " ශුද්ධ අල් කුර් ආනය අරාබි භසින් පහළ වුවද අරාබීන් පවා එහි වැකි වල නියම අරුත දැන ගැනිමට හා නියම ආකාරයට උච්චාරනය කිරිමට නබි මොහොම්මදුතුමානන්ගේ පිහිට පැතුහ."එය ඉංග්‍රීසි භාෂාවෙන් මේ පෙරවදන තිබෙන ආදාල පිටුව වන්නේ XIV එමXIV හි සඳහන් First to recite to these people Allah's revelation යන්න යටතේ එය ඒ අකාරයෙන්ම පරිවර්ථනය වී නොමැති බවයි.

සිංහල භාෂාවෙන් මුද්‍රිත පෙරවදනේ එනම් Preface හි සඳහන් අර්ථ දැක්වීම සිංහල භාෂාවෙන් සඳහන් පෙර වදනෙහි දක්වන අර්ථ දැක්වීමට වඩා වෙනස් බව ගෞරවයෙන් ගරු කොමිෂන් සභාවේ අවධානය වෙත යොමු කරනවා.

ඉංග්‍රිසි භාෂාවෙන් සඳහන් Preface හිත් සිංහල භාෂාවෙන් සඳහන් පෙර වදනෙහිත් ඒ පළමු අරමුන සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු සමාන නොවන බව ගෞරවයෙන් ගරු කොමිෂන් සභාවේ අවධානයට යොමු කරනවා.

පි: Regarding certain verses there are sometimes there are disputes which is the correct interpretation. But they take the hadeesh

FAIR COMMENT BY JEZEEM

itadeesh is a separate set of books that the actions of Mohomad what he did , what he permitted and what he said. Quaran is also said by Mohomad, but he said this is directlytdd to me by the God. But when it comes to Hadeesh he said it himself. His sayings are recorded as Hadeesh. When there are certain disputes about certain Quaranic verse there are recordings of Hadees, they match the Hadees and they see how this Quaranic verse was practiced.

ප්‍ර: So they match hadees with the Quaran?

පි: with Quaranic verse and they come to a conclusion how this one was understood in the earlier eras of Islam and how it was practiced by prophet Mohomad.

ප්‍ර: හදීස් වල ඒක එක පොතක්ද නැත්නම් පොත් කීපයක්ද නැත් නම් එහි වෙලුම කිපයක් තියෙනවාද ඒ පිළිබඳව අදහස පැහැදිලි කරන්න?

පි: There are many Hadees books. ගොඩාක් තියෙනවා.බුහාරි කියන එක තමයි ඉතාම ප්‍රධානම හදිස් පොත ඊට අනුව සහිහල් මුස්ලිම් , තිර්මිදි තිබුණු භාජා,නසීර්, අබුදාවුද් වැනි හදිස් ග්‍රන්ථවල ග්‍රන්ථ තියෙනවා.

ප්‍ර: ඔබ කිව්වානේ නබිතුමා විසින් කරන දේවල් තමයි මේවායේ සදහන් වෙන්නේ කියලා එතකොට ඔබ ඔය නම් කරන ලද එම හදිස් පොත් වල වෙළුම් වල නැත්නම් එක එකහි අඩංගු කරුණු එකින් එකට වෙනස් වෙනවාද ඒ කියන්නේ යම් විෂයක් අනුවද ඒවා බෙදලා තියෙන්නේ?

පි: මේ මම කියපු නම් ඔක්කෝම ඒ හදිස් ග්‍රන්ථ ඒ හදිස් එකතු කරපු අයගේ නම ඒ අය ඒ නබිතුමාගේ මරණින් පසසේ එයාත් එක්ක ජීවත් වෙච්ච එයාත් එක්ක ජීවත් වෙච්ච කට්ටියත් එක්ක ජීවත් වෙච්ච අයගෙන් ඒ ප්‍රකාශ ටික ඒ ප්‍රකාශන“Statements අරගෙන සදහන් කරපු ඒවාග ඒ පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙනස් වෙනවා සමහර හදීස් ග්‍රන්ථ ලියලා තියෙනවා subject එක අනුව සමහර ඒවා ඒ ගොල්ලන්ට ලැබිච්ච ආකාරයට සමහර ඒවා සිද්ධ වෙච්ච ආකාරයට On a chronological order. It’s different from one Hadees book to Hadees Books. But must of the leading Hadees books වල හදීස් ග්‍රන්ත්‍රවල they go according to the subject.

ප්‍ර: මා ඔබේ අවධානය නැවත යොමු කරනවා අර මේ C 138 හි III පිටුවෙහි පෙර වදනේහි සදහන් අර පළමු අරමුණ කෙරෙහි එහි කියනවානේ මේ අරාබි භාෂාවෙන් මේක පහළ වුනාට අරාබි කරයේ සිටින අරාබින් පවා එහි අරුත වටහාගන්නට නබි මොහොම්මද්තුමාගෙන් ඒ පිළිබඳ විමසනු ලැබුවායි කියලා. ඒකෙන් අදහස් වෙනවාද එහෙම නම් කාට හරි එහි තියෙන කරුණ අරාබි

FAIR COMMENT BY JEZEEM

භාෂාවෙන් තිබෙන කරුණු ඔබ කිවු ආකාරයට පරිවර්තනය කරනවානම් නැත්නම් ඒ පිළිබඳව විග්‍රහයක යෙදෙනවානම් ඒ ලියන පුද්ගලයාට කෙරෙන ආකාරයටනේ එක ලියන්නේ නේද?එතන වැරදීමක් සිදුවන්නට පුළුවන් ද? අර්ථ විග්‍රහයක හෝ එහෙම නැත්නම් පරිවර්තනයකදි හෝ?

පි: පරිවර්තනයේ පොඩි පොඩි වෙනස්කම් ඇතිවීමට ඉඩ කඩ තියෙනවා.

ප්‍ර: අර්ථවිග්‍රාහයක දී INTERPRETATION එකකදී ?

පි: අර්ථවිග්‍රහය කියන්නේ ඒකට ඉස්ලාම් ආගමේ හඳුන්වන නමක් තමයි තප්සීර් කියන එක මේ තප්සීර් එක ලියන කට්ටිය ගොඩාක් ඉස්ලාම් ආගම ගැන ගැඹුරට ඉගන ගත්ත අය පමණක් තප්සීර් එක ලියලා තියෙන්නේ. මොපස්සීර් කියලා ඒ අය හඳුන්වන්නේ ඒ අය හඳුන්වන්නේ මොපසරින් කියලා ඒ අය ඉස්ලාම් ආගම ගැන ගැඹුරට ඉගෙන ගෙන තමයි තප්සීර් එක ලියලා තියෙන්නේ යම් කිසි විද්වතෙක් තප්සීර් එකක් ලියනවා නම් එයා හදීස් ඔක්කොම වගේ ඉගෙනගෙන ඊට පස්සේ තමයි ඒ වැඩේට ඒ වැඩේ පටන් ගන්නේ .

ප්‍ර: මට එතකොට පොඩි ප්‍රශ්නයක් තියෙනවා එහෙම නම් සිංහල භාෂාවෙන් ලිව්වොත් දෙමළ භාෂාවෙන් ලිව්වත් අර්ථවිග්‍රහයේ එකම වන්නට ඕනේ නේද?

පි; වෙනස්කම් තියෙනවා.

ප්‍ර: ඇයි එහෙම තියෙන්නේ? ඔබ කියන ආකාරයට ඒ පිළිබඳව හොදින් දන්නා අයනම් ඒ අර්ථ විග්‍රහය දක්වලා තියෙන්නේ උගත් අයනම් කොහොම ද ඒ ආකාරයට වෙනස්කම් ඇති වන්නේ ?

පි: මගේ දැනුම According to my understanding ඒගොල්ලන් පරිවර්ථනය නැත්නම් අර්ථවිග්‍රහය කරන කොට කාවද කොයි වගේ සමාජයකටද මේ Translation එක යන්නේ කියන එක මත පවා සමහර වචන වල වෙනස් කම් ඇති කරනවා.

ප්‍ර; ඇයි ඔබ එහෙම කියන්නේ ඔබට ඒ වගේ කියන්නට කොහොමද දැනුමක් ලැබෙන්නේ?

පි: දැන් ලංකාවේ පොඩි උදාහරණයකට කිව්වොත් ජමාතේ ඉස්ලාමිය සංවිධානයෙන් පරිවර්ථනය කරපු කුරානයේ මම ඒ කුරානය ගත්තේ නෑ ඒකෙන් ෆේස්බුක් එකට දාලා තිබ්බ එකේ සමහර වචනවල කුරානයේ දාලා තියෙන වචනය හාට් කල්ප අරාබි වචනය ඇවිල්ලා කල්ක් කියන එක හාට් එක ඒ වුණාට කුරානයේ අහලා තියෙනවා ඔයගොල්ලන්ට හාට් එකක් නැද්ද ඔයගොල්ලන් හාට් එක පාවිච්චි කරන්නේ නැද්ද හාට් එකෙන් think කරන්නේ නැද්ද ඒ කියන්නේ අවුරුදු එක්දහස් හාරසීයකට කලින් වෙච්ච ජීවත් මිනිසාට ඒ

මොහොම්මද් නබිතුමාට දැනුම තිබුනේ නෑ මොළය කියන දේ මොකටද පාවිච්චි කරන්නේ කියලා දැන් අපි දන්නවා මොළය කියන්නේ මොකටද හාට් එක මොකද හාට් එකේ ඩියුටිය job එක මොකද දැන් මේජමාතේ ඉස්ලාමිය එක පරිවර්තනය කරන කොට සිංහල පරිවර්ථනය ඒ හාට් එක කියන වචනය අයින් කරලා ඒකට මොළේ කියන සිංහල වචනය යොදලා තියෙනවා ඒ වගේ දේවල් වෙලා තියෙනවා. ඒ වගේම the word කල්බිස් directly is for the heart.

Because සමහර හදිස්වල කෙලින්ම කියලා තියෙනවා මනුෂ්‍යයාගේ ශරීරය ඇතුලේ එක්තරා මස්කොටසක් තියෙනවා ඒක සුදුවට තියෙනකොට තමයි එයා ගොඩක් පින් කරන්නේ ඒක පව් කරන කොට ඒක චුට්ට චුට්ට කළුවෙනවා කියලා. එහෙම තව කියලා තියෙනවා එතුමාගේ හදවත හාට් එක එළියට අරන් සුද්ධ වූ වතුර වලින් දේවදූතයා දවස්ක් හොදලා ඇතුලේ තිබ්බා කියලා එතකොට එතනින් අපිට mind කියන සංකල්පයත් මේ Translation එකටත් යන්න බැරිවෙනවා. මොකද මේකේ යම් කිසි solid භාණ්ඩයක් නැත්නම් a solid thing. He is talking about a solid thing. ඒ වගේම අර ප්‍රචන්ඩකාරී තියෙන වාක්‍ය ගැන Translation කරන කොට මුස්ලිම් නොවන රාජ්‍යයක් නැත්නම් නැත්නම් මුස්ලිම් නොවන මිනිසුන් target කරනවා නම් එකේ තියෙන සැර අඩු කරලා තමයි ඒ Translation එක දෙන්නේ ඒක internet එකෙත් බලන්න පුළුවන් Translation අතර සමහර playing between the words. Whom they are targeting for that people they do the things. The translation doing the thing like to get the good impression 'Some of the things they try to down play the strangeness or the power of the words.'

ප්‍ර; එබ කියන්නේ මේ මේ අදාල කරුණු ආශ්‍රයෙන් ඔබ කරන ලද අධ්‍යනයෙන් කරනු ලබන නිරීක්ෂණය තමයි දැන් මේ ගරු කොමිෂන් සභාවේ කිව්වේ ඒ කියන්නේ යම් යම් භාෂාවන්ට ඒවා පරිවර්ථනය කරන කොට ඒ ඒ සමාජ තල අනුව ඒ ඒ සමාජයන් අනුව Translation එක එහෙම නැත්නම් පරිවර්ථනය හෝ අර්ථවිග්‍රහය වෙනස්වන්නට පුළුවන්?

පි: සුලු වෙනස්

ප්‍ර: සුලු වෙනස් කම් තියෙන්නට පුළුවන් හැබැයි ඔබ කියන ආකාරයට එය ස්වේච්චාවෙන්ම කැමැත්තෙන්ම කරනු ලබන වෙනස් කිරීමක් නේද එතකොට ?

පි: ඔව්. Also there are some differences because different fractions of the Muslim groups, when they to strength something. they also

FAIR COMMENT BY JEZEEM

have the small differences in between' Even in Sri Lanka the Quaran Translated by Jamiyyathul Ulama and another one is Translated by Sri Lanka Thauheed Jamath both of them had differences and they accused each other.

****

<u>ගරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර: It's Translated by Abdul Rassk?

පි: Abdul Rasik.

****

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: සාක්ෂිකරු විසින් කියන ලද ඒ පිළිතුර අනුව මා කැමතියි ඔබතුමාන්ලාගේ අවධානයට පහත කරුණ යොමු කරන්නට ශ්‍රී ලංකා තවුහිද් ජමාත් විසින් ප්‍රකාශයට පත්කරන ලද කුර්ආන්හි 3359 වැකිය සහ ජමෙයිතුල් උලමා විසින් ප්‍රකාශයට පත් කරන ලද කුර් ආනයෙහි 3359 වැකිය අතර වෙනසක් තිබෙන බව මේ වන විට අපේ අවධානය වෙත යොමු කොට තිබෙනවා. එම නිසා අපේ විමර්ශකයින් වෙත යම් නියෝගයක් ලබා දෙනවානම් මං කැමතියි ස්වාමිනි ඒ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් විසින් ප්‍රකාශිත එම කුර්ආනයත් මෙම ගරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වන ලෙසට

ප්‍ර; What is the version you are having?

පි: නබි ඔබගේ භාර්යාවන්ටද ඔබගේ ගැහැණු දරුවන්ටද විශ්වාසවන්තයින්ගේ ගැහැණුන්ට ද ඔවුන් තම හිස් වැස්ම (තමන්ගේ මුහුණු වලින් සුළුවෙන්) වසාගන්න ලෙස කියනු මැනව .

ප්‍ර; ඔය කාගේ එකෙන්ද කියන්නේ?

පි: එමගින් ඔවුන් (ගෞරවනිය අය යයි) දැනගැනිමෙන් කිසිවෙකුගේ චේතනාවකට ඔවුන් ලක් නොවීමට මෙය ඉතාමත් ලේසි මාර්ගයකි Its the sinhala Translation සුද්ධවු අල්කුර්ආනය අර්ථය සිංහල භාෂාවෙන් by නසීම් ඉස්මයිල් and ඒ.බී.එම්.කලිල් මවුලවි.

ප්‍ර: ඒක ඒ දෙකටම වැඩිය වෙනස්?

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානය විසින් ප්‍රකාශයට පත් කර ඇති අල්කුර්ආන් යන ග්‍රන්ථයේ පිටපතක් ලබා ගෙන කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට නියෝග කරමි.

වේලාව : ප.ව 3.10

මෙතැන් සිට : ධම්මිකා මිය

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කලේ චන්දිමා මෙනෙවිය විසින්ය.
දැන් වේලාව :- ප.ව.3.10 යි.
මෙතැන් සිට වාර්තා කරන්නේ ධම්මිකා පෙරේරා විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනෙවිය:</u>

ප්‍ර : මම නැවත ඔබේ අවධානය නබී මොහොමඩ් තුමා වෙත යොමු කරනවා. කරුණාකරලා ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න පුළුවන්ද එතුමා මේ ආගමික කටයුතුවල යෙදෙන්නට පටන් ගත්තේ වයස කීයේදී පමණ ඉදලද කියලා?

පි : 40 දී.

ප්‍ර : එතෙක් එතුමා මොකද කරලා තියෙන්නේ? ,

පි : එතෙක් එතුමා සාමාන්‍ය පුද්ගලයෙක් හැටියට ජීවත් වෙලා තියෙනවා මෙතන මම එක දෙයක් සඳහන් කරන්න ඕනේ මොහොමඩ් නබීතුමා ගැන නැත්නම් ඉස්ලාමයේ මුල සිට ඒ කාලයේ, වකවානුවේ තියෙන history එක වාර්තා හැමදේම මුස්ලිම් අය විසින් ලියපු ඒවා තමයි තියෙන්නේ. There is no alternative history available simultaneous period is not available. Everything is right or wrong or whatever everything about Mohamed is written by the Muslims. There is no alternative history books available.

ප්‍ර : අවුරුදු 40 දී තම ආගමික ජීවිතය පටන් ගත්තාට පස්සේ මොහොමඩ් නබීතුමා අභාවයට පත්වන තුරුම ඒ ආගමික ජීවිතය දිගටම ගතකරනු ලැබුවද?

පි : ඔව්.

ප්‍ර : යම් අවස්ථාවකදී එතුමා රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවල නියැළුණාද?

පි : ඔව්.

ප්‍ර : ඒ මොන වයස් සීමාවේදී ද?

පි : 53 වන අවුරුද්දේ තමයි එයාට ඒ බලය ලැබෙන්නේ රාජ්‍ය පාලක බලය.

ප්‍ර : ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද අවුරුදු 40 දී ආගමික නැඹුරුවට පත්වන මොහොමඩ් නබීතුමා කොයි ආකාරයද අවුරුදු 53 වෙන කොට මේ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු ආරම්භ කරනු ලබන්නේ කියලා?

පි : ප්‍රශ්නය අහපු එක ගැන මම ගොඩාක් ස්තූති කරනවා. මට පොඩ්ඩක් වෙලාව ඕන වෙනවා මේක මම ඉතා වගකීමෙන් කියන ප්‍රකාශයක්. මම හිතන්නේ මම මෙතනට පැමිණි එකෙන් මේක

President's Copy
FAIR COMMENT BY JEZEEM

වෙන්න ඕනේ මම කියන ඉතාමත්ම වැදගත්ම ප්‍රකාශයක් වෙන්නේ. මොකද සාමාන්‍යයෙන් මේ දේ මේ සභාවට හෝ වෙන අයට මුස්ලිම් කෙනෙක්ගෙන් අහන්නට ලැබෙන්න බැරි දෙයක් වෙන්න ඕනේ මම හිතන තරමට. අවුරුදු 40 වෙන කල් සාමාන්‍ය ජීවිතයක් ගත කරපු මොහොමඩ් නබිතුමා, මොහොමඩ් කියන මේ තරුණයා අවුරුදු 40 දී තමාට දේව පණිවිඩය Messages form the God එනවා කියලා පවසනවා. පවසලා එක එක කවි මාර්ගයෙන් තමා මේ දේව පණිවිඩය එන්නේ.

ප්‍ර : වහී කියන්නේ මොකක්ද?

පි : වහී කියන්නේ දේව පණිවිඩය. දෙවියන් වහන්සේ විසින් එන පණිවිඩය වහී එනවා කියන, දේව පණිවිඩය එනවා කියලා කියනවා කියලා ආගමේ ප්‍රචාරය වෙන්න පටන් ගන්නවා. එතුමාව දෙවියන් වහන්සේ දේව දූතයෙක් හැටියට පත් කරලා තියෙනවා. තෝරගෙන තියෙනවා හැමෝම එතුමාගේ මඟ පෙන්වීම පස්සේ එන්න ඕන කියන මතය ඉදිරිපත් කරනවා. ඒ වුණාට එයාගේ උපන් ගම වෙන්නේ මක්කම. මේ මක්කමේ ඊලඟ අවුරුදු 13 ක්, 40 ඉදන් 53 වෙන කල් ඒ කටයුතුවල යෙදී සිටිනවා.

ප්‍ර : මක්කමේ?

පි : මක්කමේ. එයාට ලොකු සාර්ථකත්වයක් ගන්න බැරි වෙනවා. අසාර්ථක වෙනවා.

ප්‍ර : ඒ කියන්නේ ආගමික නායකයෙක් විදියට අනුගාමිකයින් එතුමාට ලැබෙන්නේ නැද්ද?

පි : අනුගාමිකයින් ලැබෙනවා. ඒ වුනාට ඉතා සීමිත ප්‍රමාණයක්. 200 ක් නැත්නම් 300 ක් වගේ ප්‍රමාණය විතරයි එයාට ලැබෙන්නේ.

ප්‍ර : මක්කමේදි?

පි : මක්කමේදි. ඊට පස්සේ දිගටම එයාට එහේ ඉන්න බැරි වෙනවා. ඉස්ලාම් ආගමට අනුව නම් අනෙක් ඒ මිනිස්සු මොහොමඩ් නබිතුමාට හිරිහැර කරනවා. පාරේ යන කොට කුණු විසි කරනවා ඒවගේ දේවල්වලින් හිරිහැර කරනවා. එතකොට එහේ ඉන්න බැහැ කියලා මක්කම ඉදලා කිලෝ මීටර් නැත්නම් හැතැක්ම 300 ට එහා තියෙනවා මදීනා කියන නගරය. ඒ නගරයේ ඉන්න මිනිස්සු මෙයාට කොහොම හරි කැමති වෙනවා. ඒගොල්ලන්ට නායකයෙක් ඕන වෙනවා , මෙතුමාට කැමති වෙනවා, ඊට පස්සේ අවුරුදු 53 දී මෙතුමා යනවා මදීනාවලට. මදීනාවලට යන්න කලින් මෙතුමා මේ අවුරුදු 13 කාලය තුළ ඉතාම සාමකාමී

ජීවිතයක් ගත කරපු පුද්ගලයෙක්, කෙනෙකුට පහර දුන්නා කියලාවත්, කෙලින්ම මුහුණට බැන්නා කියලාවත්, කාට හරි කෙනෙකුට ගහන්න පෙළඹීම් කලා කියලාවත් කිසිම සඳහනක් එතුමාගේ history එකේ නැහැ. ඉස්ලාම් Muslims විසින් ලියපු histories තමයි ඒ history වල කොහේවත් සඳහන් වෙලා නැහැ. හදීෂ්වල පවා කොහේවත් සඳහන් වෙලා නැහැ කිසිම ප්‍රචණ්ඩ හෝ ඒ වගේ දේවල්. Violence වලට එතුමා සම්බන්ධ වුණා කියලා. අවුරුදු 53 දී මදීනාවලට ගියාට පස්සේ එතුමාට එහේ රාජ්‍ය බලයක් හම්බ වෙනවා මදීනා වල.

ප : ඒක පැහැදිලි කරන්න ඇයි එතුමාව තෝරා ගන්න හේතු වුනේ කියලා දෙපාර්ශවය අතර ?

පි : මදීනා කියන නගරයේ ගෝත්‍ර දෙකක් අතර කාලාන්තරයක් යුද්ධයක් පවතිනවා. ගෝත්‍ර දෙකම. මෙතුමා එතනට ගිහිල්ලා ඒ ගෝත්‍ර දෙක අතර සාමයක් ඇති කරනවා. ඇති කරන ගමන් ඒ ගෝත්‍ර දෙකට නායකයෝ ඒ කියන්නේ එකතු වෙච්ච United Medina එකතු වෙච්ච මදීනා නගරයට නායකයෙක් අවශ්‍ය වෙනවා. එතකොට ඒක මෙයාට හොඳ opportunity එකක් වෙනවා. ඒගොල්ලන් කැමති වෙන්නේ නැහැ අනෙක් ගෝත්‍රයේ කෙනෙක් තමාට නායකයා වෙනවට. එතකොට ඒ ප්‍රයෝජනය අරගෙන මෙයා ඒ ගමටම නායකයා වෙනවා. ඒ ගමේ ඉන්න මිනිස්සු අවුරුදු ගානක් යුද්ධ කරලා පුරුදු වෙච්ච මිනිස්සු. ඒ මිනිස්සුන්ට මෙයා නායකත්වයට පත් වුණාට පස්සේ මෙයා පාලන ක්‍රමය, දණ්ඩ නීතිය වගේ හැම දේම ඇති කරනවා. ඊට පස්සේ තමයි මෙතෙක් මේ අවුරුදු 53 වෙන කල් මෙයා ජීවත් වෙලා හිටියේ එකම බිරිඳත් එක්ක පමණයි. එකම කාලේ. කවදාවත් බිරිඳවරු දෙන්නෙක් එතුමාට හිටියේ නැහැ. මදීනාවලට ගිහිල්ලා 53 දී බලය අත්කර ගත්තාට පස්සේ different accounts are there. But හැමෝම පිලිගත් accounts තමයි එතුමාට බිරින්දෑවරුන් 10 දෙනෙක් සිටියා කියන එක. 53 ඉදලා මැරෙන කල්. ඊට පස්සේ ඒ 53 දී තමයි එයා කසාද බඳින්නේ අවුරුදු 6 දැරියක්ව.

ප : 53 දී,?

උ : 53 දී.

ප : නම මොකක්ද ඇයගේ?

පි : ආයිෂා කියන දැරියව කසාද බඳිනවා. ඒ වගේම යුද්ධ කරනවා, ගෝත්‍රවලට විරුද්ධව යුධ කරනවා, මංකොල්ල, සමූහ ඝාතන,

FAIR COMMENT BY JEZEEM

වහල් ව්‍යාපාරය, ලිංගික වහල්කම මේ වගේ හැම දේටම එයා සම්බන්ධ වෙනවා. ඒවා අනුමත කරනවා.

ප්‍ර : ඇයි ඔබ කියන්නේ ඒවට සම්බන්ධ වෙන්නේ කොහොමද එතුමා?

පි : ඒවට Support කරනවා වැනි කුර්ආන්වල හා හදීෂ්වල සෑහෙන්න තියෙනවා. හදීෂවල සෑහෙන්න තියෙනවා කොහොමද මේ සමූහ ඝාතන කලේ කොයි විදියටද ඒ ඝාතන සිද්ධ වුනේ, ඒ ගැන සාක්ෂි මම ගොඩක් සමහර දේවල් ලිපි ලේඛන ඉදිරිපත් කරලා තියෙනවා. ඒවගේ දේවල්වලට යොමු වෙනවා. එතකොට මේ අවුරුදු 13 කාලයේ හරිම සාමකාමී පුද්ගලයෙක් හැටියට ඉතා very Cool Character හිටපු එක්කෙනෙක්. අන්තිම අවුරුදු 10 ඉතාම ප්‍රචණ්ඩකාරී අද අපි අඳුනන භාෂාවෙන් කියනවා නම් ත්‍රස්තවාදයට සම්බන්ධ පුද්ගලයෙක් හැටියට පරිවර්ථනය වෙනවා. මේක හරියට පැහැදිලි කර ගත්තේ නැත්නම් ඇයි ඉස්ලාම් ආගම සම්බන්ධව නැත්නම් මුස්ලිම් අය ඇයි මෙතරම් ත්‍රස්ත ක්‍රියාවලට ලෝකයේ හැම පලාතේම ඇයි මුස්ලිම් අය විතරක් ත්‍රස්ත ක්‍රියාවලට සම්බන්ධ වෙන්නේ, ගොඩක් අනික් අයට වැඩිය කියන එකට උත්තරය හොයන්න අමාරු වෙනවා.

ප්‍ර : ඔබ මේ කරන ලද පැහැදිලි කිරීමට අදාල කරුණු ඔබ කොහෙන්ද රැස්කර ගත්තේ, ඔබ කිව්වානේ උප්පත්තියෙන් ඔබ ඉස්ලාම් ආගම අදහන ලද පුද්ගලයෙක් කියලා, එතකොට ඒ ආගම ඉගෙන ගන්න කොට ඔබ මේ කරුණු ඉගෙන ගත්තද?

පි : ඔව් ආගම ඉගෙන ගන්න කොට මම ඉගෙන ගත්තා. ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ ඉන්න කොටම ඒ ගොල්ලන්ගේ සිහිනය තිබ්බේ මදීනා සිහිනය කියලා. තාමත් මාවනැල්ලේ ඒගොල්ලන්ගේ FM වැඩ සටහනක් මම හිතන විදියට මම හරි නම් ඒගොල්ලන් ඒකට අදාල උපකරණ FM නාලිකාව විකාශනය කිරීම සඳහා වන උපකරණ ලබා ගන්නේ මහනුවර පුෂ්පදාන මාවතේ තියෙන කඳුරට FM ආයතනයෙන් කුළියට. For the rental අරන් විකාශනය කරනවා. ඒ විකාශනය කරන කොට මාවනැල්ල හා අවට ප්‍රදේශවලට ඒ නාලිකාවට පවා ඒගොල්ලන් දාපු නමක් තමයි මදීනා FM. මදීනා කියන සිහිනය හරහා තමයි ජමාතේ ඉස්ලාමීය ගමන් කලේ. මදීනා කියන්නේ පාලන බලය මොහොමඩ් නබීතුමා අත්කර ගත්තට පස්සේ තිබිච්ච ජීවිතයක්. එතනින් තමයි ඉස්ලාම් ආගම සම්පූර්ණ වුනේ කියලා තමයි ඉස්ලාම් ආගමේ මතය. ශක්තිමත් විදියට ඉස්ලාම් ආගම

FAIR COMMENT BY JEZEEM

තිබුණෙත් මේ මදීනාවලයි. මදීනා ජීවිතය තමයි එවැනි දේවල් ගොඩක්ම වුණේ.

ප : ඔබ යම් අවස්ථාවකදී මේ කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට කුර්ආනයේ තිබෙන ප්‍රචණ්ඩත්වය පිළිබඳව කුර්ආනයේ තිබෙන යම් කරුණු අඩංගු ලේඛනයක් භාර දුන්නද? ඔබට ඒ ලේඛනය කොහෙන්ද ලැබුණේ?

පි : ඒක අන්තර් ජාලයෙන් ගත්ත එකක් හා මම එකතු කරපු ඒවා. ඔක්කොම එකට join කරලා තමයි මම ඒක දුන්නේ.

ප : So you have synchronized ඒ දෙකම එකතු කරලා?

පි : ඔව් විවිධ තැන්වලින් හොයා ගත්තේ. ඒ වුණාට ඒ වැකි කලින්ම මම දැනගෙන හිටිය වැකි. මම මුස්ලිම් වෙලා ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ කුර්ආන් විග්‍රහ කරන පන්තිවලට, දේශනාවලට සහභාගි වෙච්ච දවස්වල ඒවා ඔක්කොම මම ඉගෙන ගෙන හිටියා. ඉතින් ඒවත් එක්ක තමයි මම එකතු කරලා භාර දුන්නේ. For the comfort of collecting them I used the internet. But I already knew these verses.

ප : So all these verses you have downloaded from the internet or?

පි : Yes, for the purpose of submitting the Commission..

ප : And then you collated everything. That's what you did.

පි : I collected from internet.

ප : ඔබට ඒ ලේඛනය නැවත දැක්කොත් හඳුනන්න පුළුවන්ද?

පි : Yes.

(සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වයි)

ප : Published by whom?

පි : most of these translations are from quran.com.

ප : quran.com

පි : By Hadeesh International Pickal Yusuf Ally. If you go to the web site there are around 9-10 translations are available. We can select one verse and collect the translators name all these verses will be appear one by one.

ප : So can you please include that the fact that you have downloaded it from quran.com?

පි : Yes.

ප : In the answer that you are giving.

පි : Yes.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

quran.com වෙබ් අඩවියට පිවිසිලා ලබා ගන්නා ලද ප්‍රවණ්ඩත්වයට අදාලව කුර්ආනයෙහි සඳහන් වැකිවල එකතුවක් සාක්ෂිකරු විසින් පිළියෙල කොට තිබෙනවා. එම ලේඛනය IR 02 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

(සාක්ෂිකරු විසින් එම ලේඛනය භදුනා ගනී)

ප : නබීතුමා විතරද දැන් ඔබ කිව්වානේ නබීතුමා යම් ආකාරයට ප්‍රචණ්ඩකාරී විදියට අවුරුදු 53 ඉදලා හැසිරුනාය කියලා මේ රාජ්‍ය නායකත්වයට පත්වුණාට පස්සේ. ඔහු යුද්ධ කටයුතුවලට ගිහිල්ලා තියෙනවද?

පි : ඔව්.

ප : ඔහු ඇතැම් ප්‍රාන්තවලට පහරදීම් සිදු කරලා තියෙනවද?

පි : ඔව්.

ප : ඔහු තනියමද ඒවා කරලා තියෙන්නේ, නැත්නම් පිරිස් සමූහයක් සමඟද කරලා තියෙන්නේ?

පි : එතුමාගේ අනුගාමිකයොත් එක්ක. ඉස්ලාම් ආගමේ ඒ අයව Sahaba යන අරාබි වාක්‍යයෙන් හඳුනනවා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප : කාටද පහර දුන්නේ?

පි : අන්‍යාගමික හා ඉස්ලාම් ආගම පිළිනොගත් ගෝත්‍රවලට යුදෙව් ජාතිකයන්ටත් විරුද්ධ වුණා. යුදෙව් ජාතිකයන්ට, අන්‍යාගමික අයට, ඉස්ලාම් ආගම පිළිනොගත් අයට විරුද්ධව තමයි මේ පහර දීම සිද්ධ වෙලා තියෙන්නේ.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප : ක්‍රිස්තියානි ජාතිකයන්ටත් පහර දුන්නද?

පි : එවකට හිටපු අන්‍යාගමිකයන් කියලා තමයි සඳහන් වෙන්නේ. රෝමයට පහර දෙනවා ක්‍රිස්තියානි එතකොට. රෝමයටත් පහර දෙනවා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනෙවිය:</u>

ප : ඔබේ අවධානයට මා මේ අවස්ථාවේදි ලේඛනයක් යොමු කරනවා (සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටී)

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඔබට මා දැන් පෙන්වන ලේඛනය ඔබ යම් අවස්ථාවකදී මෙම කොමිෂමෙහි විමර්ශන ඒකකය වෙත ඉදිරිපත් කරනු ලැබුවද?

පි : ඔව්.

ප්‍ර : එම ලේඛනයේ ශීර්ෂය මොකක්ද? What is the heading?

පි : Wars, battles, murders, lootings, genocides, riots, plunders etc. done by Mohamed and his companions under his instruction during his period in Medina ....

ප්‍ර : ඔබට මෙම කරුණු ඔය ලේඛනය ලැබුනේ කොහෙන්ද?

පි : අන්තර් ජාලයෙන් ලබා ගත් එක්තරා document එකකින් මම මේ headings විතරක් තෝරා ගත්තා. ඒ document එකේ විස්තර පවා සඳහන් වෙලා තිබුණා. කෙටියෙන් යොමු කරන්න ඕන හින්දා headings විතරක් මම තෝරා ගත්තා.

ප්‍ර : ඔබ මීට පෙර IR 02 ලේඛණය පිළියෙල කලා වගේ අන්තර් ජාලයෙන් ලබා ගන්නා ලද එම ලේඛනවලින් උපුටා ගන්නා ලද කරුණු එකතු කරලද ඔබට මා දැන් පෙන්වන ලේඛනය පිළියෙල කරනු ලැබුවේ?

පි : ඔව්.

ස්වාමිණි එය **IR 03** වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර පතනවා.

ප්‍ර : මෙම IR 03 හි ඔබ එවැනි අවස්ථාවන් කීයක් පිළිබඳව සඳහන් කරලා තිබෙනවද?

පි : 79 යි

ප්‍ර : ඒ කියන්නේ අවුරුදු 53 ඉදලා නබීතුමා කරන ලද ප්‍රචණ්ඩාකාරී ක්‍රියා තිබුනේ වාර්තා වෙලා 79 ක් පමණ ද? නැත්නම් තිබුණු ඒවයින් ඔබ යම් යම් කරුණු උපුටා ගෙන 79 ක් පමණක් අන්තර්ගත වන ලැයිස්තුවක් පිළියෙල කලාද?

පි : තිබුණු ඒවායින් යම් යම් කරුණු මේවා කරලා 79 ක් ඉදිරිපත් කලා.

ප්‍ර : ඔබ සඳහන් කලා මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවල යෙදෙන කොට යම් යම් ස්ථානවලට ඔහු යනු ලැබුවාය, ඒවගේම යම් යම් පුද්ගලයින්ට යම් ජාතීන්ට පහර දීමක් සිදුකරනු ලැබුවාය කියලා, මා ඔබේ අවධානය තවත් ලේඛණයක් කෙරෙහි යොමු කරනවා. මා ඔබට පෙන්වන මේ ලේඛනය ඔබ මේ ගරු කොමිෂන් සභාවේ විමර්ශන ඒකකය වෙත ලබා දුන් ලේඛනයක්ද?

(සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටී)

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්..

ප්‍ර : එම ලේඛනය විමර්ශකයින්ට ලබා දීමට ඔබට හේතු වුනේ ඇයි?

පි : ඉස්ලාම් ආගමේ ප්‍රචණ්ඩකාරී තත්ත්වය නැත්නම් අමානුෂික ලෙස අන්‍යාගමිකයන් නැත්නම් ඉස්ලාම් ආගමේ මතයට එකඟ නොවන මිනිස්සුන්ව හිංසනයට ලක් කරන විදිය නබිතුමාගේ කාලයේම එතුමාගේ අනුදැනුම මතම සිද්ධ වෙලා තියෙන එක පෙන්නුම් කිරීම සඳහා.

ප්‍ර : එම ලේඛනයේ මාතෘකාව විදියට තියෙන්නේ මොකක්ද?

පි : Removing clothes and checking the pubic hair and doing genocide .

ප්‍ර : ඔබට මේ ලේඛනයේ අඩංගු කරුණු කොහෙන්ද ලැබුනේ?

පි : මේ කරුණු මට ලැබුනේ අන්තර්ජාලයෙන්. මේ ගැන මම ඉස්ලාම් ආගම follow කරපු කාලේ දැනගෙන හිටියා.

ප්‍ර : දැනගෙන හිටියා ඒ කාලයේදී?

පි : දැනගෙන හිටියා.

ප්‍ර : එතකොට අන්තර්ජාලයට ඔබ පිවිසිලා මේ කරුණු ලේඛනයට ලබා ගත්තේ කොයි කාලයේද එහෙම නම්?

පි : මේ කරුණු ගැන මම නිතරම මගේ Facebook පිටුවෙත් මම විවේචනයට ලක් කරපු, විවේචනය ඉදිරිපත් කරපු එක් කරුනක් තමයි, ඒ හින්දා මේ ගැන නිතරම touch එකේ හිටපු subject එකක් තමයි මේක. මේ විදියට දේව දූතයෙක් මිනිසාට මඟ පෙන්වීමට දෙවියන් වහන්සේගේ පණිවිඩය අරන් එන එක්කෙනා හැසිරෙන්න බැහැ. මේක ඉතා අමානුෂික විදියේ හැසිරීමක් කියන මතයේ මම හිටියා. ඒ හින්දා මේ ගැන නිතරම මම touch එකේ හිටියේ.

ප්‍ර : ඔබට මා පෙන්වන මේ ලේඛනයෙහි අඩංගු කරලා තියෙන ඔය . Removing clothes and checking for pubic hair and doing genocide කියන මාතෘකාව යටතේ සංක්ෂිප්තව සඳහන් වෙලා තියෙන දේ ගැන කියන්න ගරු කොමිෂන් සභාවට?

පි : මේ හදීෂ් එකේ සඳහන් වෙන්නේ එක්තරා යුධ ගෝත්‍රයට විරුද්ධව නබිතුමා පහර දීමක් කරලා ඒ ගෝත්‍රයේ ගෑණු සහ ගෑණු ළමයින් ලිංගික වහලුන් හැටියට පත් කරගෙන පිරිමි අයව මරා දමන්න හදනවා. එතනදි වැඩිවියට පත් නොවූ දරුවන්ව ඝාතනය කරන්න හොඳ නැහැ කියන එකෙන් ඒ කවුද වැඩිවියට පත් වෙලා තියෙනවා කියන එක ඉස්ලාම් ආගමේ අනුව හොයා ගැනීම. ඒ

FAIR COMMENT BY JEZEEM

කියන්නේ The attaining the puberty is the age of that is the boarder for differentiate somebody from..

ප්‍ර : Whether to kill or not to kill?

පි : Not to kill.

ප්‍ර : So this is relevant to the girls or the boys?

පි : For the boys.

ප්‍ර : පිරිමි ළමයින්ට අදාලව ?

පි : අදාලව. This incident is narrated by one of the captives, later he accepted Islam.

දැන් වෙලාව ප.ව.3.40 යි.

මෙතැන් සිට වාර්තා කරන්නේ යමුනා මිය විසින්ය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව ප.ව. 3.40
පෙර සටහන් ගැනීම ල/ලේ දම්මිකා මිය.
සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක .

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය.</u>

ස්වාමිනි Removing Clothes and checking for pubic hair and doing genocide යන ශීර්ෂය යටතේ තිබෙන මෙම ලේඛණය I.R 4 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ප්‍ර මා ඔබේ අවධානයට යොමු කරන I.R 4 කියන ලේඛණයෙහි සඳහන් කරුණු පිළිබඳව ඔබ විමර්ෂණ ඒකකයට මේ ලේඛණය බාර දෙන්නට පෙර දැනගෙන හිටියාද?

උ ඔව්. දැන ගෙන හිටියා.

ප්‍ර මොන අවස්ථාවේද ඔබ මුලින්ම මේ I.R 4 හි සඳහන් කරුණු පිළිබඳව දැන ගත්තේ?

උ මම මුස්ලිම් භක්තියකු හැටියට ජීවත් වෙච්ච කාලේ ඉස්ලාම් ආගම ඉගෙන ගන්න කාලේ මේ ගැන කිප වතාවක්ම මට දැන ගැනීමට ලැබුනා.

ප්‍ර ලැබුනා .දැන් ඔබ ඒ ලේඛණයේ පලමුවන ඡේදයේ අවසාන පේලියේ වරහන් ඇතුලේ තියෙනවා නේද (Sunan Abu Dawud **38** : **4390**)යනුවෙන් මොකක්ද ඒකෙන් අදහස් කරන්නේ ?

උ අපි හදීස් ග්‍රන්ථ ගැන කලින් සඳහන් වුනා.

උ ඔව්.

ප්‍ර Sunan Abu Dawud කියන හදීස් ග්‍රන්ථයේ **38** වැනි පොතේ **4390** වෙනි හදීස් එක තමයි මේක.

ප්‍ර මේ කරුණ සඳහන් වෙලා තියෙන්නේ?

උ සඳහන් වෙලා තියෙන්නේ.

ප්‍ර එම මේ I.R 4 හිම දෙවන ඡේදයේ සඳහන් වෙනවා නේද අවසන් පේලියේ Al - Tabari ,Vol 8, pages **39-40** සඳහන් වෙනවද නැද්ද ?

උ සඳහන් වෙනවා.

ප්‍ර ඒ මොකක්ද ?

උ Al – Tabari කියන ග්‍රන්ථයේ

ප්‍ර ඒ කියන්නේ හදිස් එකක් ?

උ ඔව් හදිස් ග්‍රන්ථයේ

ප්‍ර වෙළුම **8**

උ වෙළුම **8.**

ප්‍ර පිටු අංක?

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

උ 39 සහ 40 අතර මේක සඳහන් වෙලා තියෙනවා.

ප සඳහන් වෙලා තියෙනවා හරි. අද අප විසින් මගේ සහෝදර නිළධාරි මහත්මයා විසින් ඔබෙන් අසන ලද ප්‍රශ්ණයකට පිළිතුරු දෙන ගමන් ඔබ සඳහන් කලානේ මේ ජිහාඩ් කිරීම් පිළිබඳව . මොකක්ද ජිහාඩ් කරනවා කියලා කියන්නේ ?

උ ආගම වෙනුවෙන්

ප ජිහාඩය පිළිබඳව ඔබත් සමග සාකච්ඡා කරන්නට පෙර මා කැමතියි නැවත අපේ අද දින ලකුණු කරන ලද I.R 2, I.R 3 , I.R 4 කියන ලේඛණ කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්නට. ඔබ මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරනු ලැබුවා එම ලේඛණ වල සඳහන් වෙනවාය කියලා මෙහොමඩ් නබිතුමා විසින් කරනු ලැබූ යම් ප්‍රචණ්ඩ ක්‍රියාවන් වගේම ශුද්ධවූ කුර්ආනයේ
සඳහන් ඇතැම් ප්‍රචණ්ඩත්වය පිළිබඳව සඳහන් වන කොටස් අඩංගු වන කරුණු ගැන ? ඔබට මතකද ඔබ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ඉදිරියේ සාක්ෂි දෙනු ලැබුවා?

උ ඔව්.

ප ඔබ එහි දෙනු ලැබූ සාක්ෂිය ඔබ එහි පිටපතක් ලබා ගත්තා නේද ?

උ ඔව්.

ප දැන් මම නැවත ඔබේ අවධානය යොමු කරනවා යම් කොටසක් ඔබේ සාක්ෂියෙහි කියවලා ඊට පස්සේ මම ඔබෙන් එහි ප්‍රශ්ණයක් අහන්න යනවා ඔබ දෙන ලද උත්තරයක මේ විදියට සඳහන් වෙලා තියෙනවා මා අසන ලද ප්‍රශ්ණයට අදාලවම “not only Quran Bukari Muslims Eagnu vaja Abu Dawud nasai All these Books contain lot of violence even the Quran contains verses of violence “ කියලා සඳහන් වෙනවා .දැන් ඔබ ඒ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ඉදිරියේ සඳහන් කරන ලද එම කරුණුද අද සවිස්තරාත්මකව I.R 2, I.R 3 , සහ I.R 4 යන ලේඛණ ඉදිරිපත් කරමින් තවදුරටත් මේ ගරු කොමිෂන් සභාවේ පැහැදිලි කරනු ලැබුවේ ?

උ ඔව්.

ප එතකොට පැහැදිලි කරන්න පුලුවන් ද ඔබේ මම පසුව එනවා මේ පාර්ලිමේන්තු කාරක සභාවේ ඔබ දෙන ලද සාක්ෂියට . එහි සඳහන් වෙනවා නේද Bukari Muslims Eagnu baja Abu Dawud nasai ඒ මොනවද කියලා කියන්න පුළුවන්ද?

උ බුහාරි -මුස්ලිම්, ඉබුනුමාජා-නසෙයි there is a small

FAIR COMMENT BY JEZEEM

differentiation pronunciation of the recording This are hades books and one of the hadith මම බාරදිපු හදිස් එකක් . I.R 3 එකේ උඩම තියෙන හදිස් එක Abu Dawud .

උ I.R 4 ලේඛණයේ තියෙන ප්‍රථම හදිස් එක. Sunan Abu Dawud කියන ග්‍රන්ථයෙන් උපුටාගත් එකක්.

ප්‍ර ඒක තමයි මෙතන කියන්නේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ කිව්වේ ?

උ ඔව්.

ප්‍ර ඒකේ Sunan එක ගැන කියලා නැහැ Abu Dawud?

උ Abu Dawud මතන අරාබි නම් වල පොඩි පොඩි වෙනස්කම් සිදු වෙන්න පුළුවන් සහිඩ් අබුදාවුත්, සුනන් අබුදාවුත්, අබුදාවුත් යන නම් තුනෙන්ම හඳුන්වන්නේ එකම හදීස් ග්‍රන්ථය. ඒවාගේම බුහාරි කියන එක බුහාරි කියනවා සහේදුල් බුහාරි කියලා කියනවා ඒනම් දෙකෙන්ම මුස්ලිම් එක ගත්තොත් මුස්ලිම් සහේදුල් මුස්ලිම් කියන නම් දෙකක් භාවිතා වෙනවා .

ප්‍ර නමුත් මේ එකම හදීස් ග්‍රන්ථය තමයි එයින් අදහස් වෙන්නේ ?

උ එකම හදීස් ග්‍රන්ථය තමයි අදහස් වෙන්නේ.

****

<u>ගරුසභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර ඔබ අද පිලිගත්තා ඔබ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ඉදිරියේ සාක්ෂි ලබා දෙන කොට අද උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනවිය ඔබ ගේ අවධානයට යොමු කරපු ඒ විවිධ ලේඛණ වල ප්‍රචණ්ඩත්වය පිළිබඳ සඳහන් වෙනවා කියලා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ඉදිරියේ ප්‍රකාශ කල බව ඔබ පිලිගත්තා.?

උ ඔව්.

ප්‍ර එම පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සාමාජිකයින් එක් ආගමික කණ්ඩායමකට පමණක් හිටපු අයද නැත්නම් ආගම් කිපයකින් සමන්විත අයද?

උ මගේ දැනුම අනුව ආගම් කිපයකට සම්බන්ධ අය.

ප්‍ර ඒ තේරීම් කාරක සභාවේ ඉස්ලාම් ධර්මය අනුගමනය කරන මහජන මන්ත්‍රී වරුනුත් හිටියාද ?

උ ඔව් එක් මන්ත්‍රීවරයෙක් හිටියා.

ප්‍ර එතකොට ඔබ ඒ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ ඉදිරියේ ඒ කරපු ප්‍රකාශය එම මන්ත්‍රී වරයා විසින් යම්කිසි ප්‍රශ්ණ කිරීමකට ලක් කෙරුවාද ?

FAIR COMMENT BY JEZEEM

උ මට මතක හාටියට මගේ ප්‍රකාශයේ මං ඉදිරිපත් කරපු කරුණු ගැන ප්‍රශ්ණ කිරීම හෝ අභියෝගයකට ලක් කරනු නොලැබේ.
එතන හිටපු මුස්ලිම් නියෝජිතයා පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ගොඩක්ම අවධානය යොමු කලේ මගේ පෞද්ගලික තොරතුරු මත එක්තරා අවස්ථාවකදි මගෙන් ඇහුවා. ඒ ප්‍රකාශය වෙනකොට මාධ්‍යයට එලියට මාධ්‍යයෙන් තොරව. තමයි එතුමාගේ ප්‍රශ්ණ පටන් ගත්තේ මාධ්‍යයෙන් තොරව එක්තැනකදි මගෙන් අහනවා ඔබතුමා කසාද බැඳලාද කියලා එතකොට මම ආපහු හරවා ප්‍රශ්ණයක් යොමු කලා මේ පරීක්ෂණයකට ඒක අදාල වෙනවාද මේ වාර්තාවට මේක සඳහන් වෙනවද කියලා .ඊට පස්සේ එතනින් සඳහනක් කරනවා මේක සඳහන් වෙන්නේ නැහැ කියලා ඒක අයින් කරන්න කියලා වාක්‍යයක් කියනවා ඒක සඳහන් වෙලා තියෙනවාද නැද්ද කියන එක මම දන්නේ නැහැ.

ප්‍ර මොකක්ද සඳහන් වෙන්නේ ?

උ මම කසාද බැඳලද නැද්ද කියන මගෙන් අහපු ප්‍රශ්ණය මම එතුමාගෙන් ආපසු හරවා ප්‍රශ්ණයක් ඇහුවා මේක අදාල වෙනවාද කියලා මේ පරීක්ෂණයට.

මින්පසු සටහන් ගැනිම ල/ලේ මුතුමාලි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.04.10 යි.
පෙර සටහන් ල/ලේ : යමුනා දසනායක මිය
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය</u>

ප්‍ර : මා ඔබේ අවධානයට ඉස්මත් මහත්මයා ලේඛනයක් යොමු කරනවා ඔබ මේ ලේඛනය විමර්ශන අවස්ථාවේදී මෙම ගරු කොමිෂන් සභාවේ විමර්ශන නිළධාරීන් වෙත ලබා දෙනු ලැබූ ලේඛනයක්ද?

පි : ඔව්.

ප්‍ර : ඒ ලේඛනය කුමන කරුණක් අරඹයාද ඔබ ඔවුන්ට ලබා දෙනු ලැබුවේ? මොන කරුණක් තහවුරු කරන්නටද?

පි : මාවනැල්ලේ ඇති වෙච්ච බුදු පිළිමය කැඩීමේ සිද්ධිය ඉස්ලාම් ආගමට සම්බන්ධ දෙයක් යන කරුණ තහවුරු කිරීම සඳහාත් වන්දනා කිරීම සඳහා

ප්‍ර : ඉස්ලාම් ආගමට සම්බන්ධද නැත්නම් මුස්ලිම් ජාතිකයින් විසින් කරන ලද්දක් කියලා පෙන්වන්නටද?

පි : ඉස්ලාම් ආගමට සම්බන්ධ දෙයක්. ආගමේ සඳහන් වෙලා තියෙන දෙයක් තමයි එතනින් කරලා තියෙන්නේ කියන එක පෙන්නුම් කිරීම සඳහා තමයි මම ඒක ඉදිරිපත් කළා.

ප්‍ර : ඔව්.

ස්වාමිනි **Breaking statues** යන මාතෘකාව යටතේ මෙම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලබන මෙම ලේඛනය **IR 5** වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා

ප්‍ර : ඉස්මත් මහත්මයා ඇයි ඔබ ඔබේ කලින් දෙනු ලැබූ පිළිතුරේ සඳහන් කරනු ලැබුවේ මාවනැල්ල ප්‍රදේශයේ බුදුපිළිමවලට හානි කිරීම මේ ඉස්ලාම් ආගමට අදාළව සිදු වුණ දෙයක් කියලා?

පි : මේ සිදු වීම් සියල්ලටම පස්සේ

ප්‍ර : ඔව්.

පි : පාස්කු ඉරිදා ප්‍රහාරයට පස්සේ ලොකු ප්‍රචාරයක් මාධ්‍ය හා අනිත් ක්‍රමවලින් ක්‍රියාත්මක වුණා මේ සිද්ධි කිසිදේකට ඉස්ලාම් ආගම සම්බන්ධ නොවූ බව.

ප්‍ර : අහ්.... අහ්....

පි : මම හිතුවා මේ කරුණු මේ සභාවට පැහැදිලි කළේ නැත්නම් මේ සභාව විසින් භාර දෙන වාර්තාවේ මත ගන්නා ලද තීරණය නිවැරදි වෙන්න තියෙන ඉඩ කඩ අඩුයි කියලා.

Proceedings Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ සඳහා ඔබ මොනවාද මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන කරුණු තහවුරු කිරීමේ කරුණු?

පි : ප්‍රචණ්ඩ ක්‍රියාව නැත්නම් මෙවැනි දේවල් ඉස්ලාම් ආගමට බාහිර දේවල් නෙවෙයි. මේ ඇතුළේම තියෙන දේවල්. මේක කුර්ආන් හා හදීස්වල මේ රට ඇතුළේ තියෙන දේවල් තමයි ක්‍රියාවට ඒ තරුණයෝ අරගෙන තියෙන්නේ කියන පණිවිඩය තමයි මම දෙන්න හැදුවේ.

ප්‍ර : එහෙමනම් මේ IR 5 කියලා ඔබ දැන් ලකුණු කරලා ඉදිරිපත් කරපු ලේඛනය කොහොමද මේ සඳහා දායක වෙන්නේ කියලා කරුණාකරලා පැහැදිලි කරන්න?

පි : මාවනැල්ලේ සිදු වෙච්ච බුදුපිළිම කැඩීමේ සිද්ධිය තමයි.

ප්‍ර : What does it say in these documents that's what I am asking you how does your contention is supported by this document that you are now trying to produce. You say it is in the Islamic religion.

පි : Yes.

ප්‍ර : Why do you say it and in which books are those best which books support that position?

පි : බොහාරි, මුස්ලිම් වැනි හදීස් ග්‍රන්ථ සහ කුර්ආනයේ මේවා සඳහන් කරලා තියෙනවා.

ප්‍ර : ඔව්.

පි : මේවා ලංකාවේ තියෙන මද්‍රාසාවල හා

ප්‍ර : අපිට ටිකක් specific වෙන්න පුළුවන්ද? නිශ්චිත වශයෙන් දැන් ඔය කියන කරුණු ඔබ කියනවානේ හදීස්වල සහ කුර්ආන්වල තියෙනවා කියලා. එතකොට ඒ මොන Verse එකේද තියෙන්නේ අංකය මොකක් ද කියන කරුණ පිළිබඳව නිශ්චිතව සටහන් කරන්න පුළුවන්ද?

පි : කුර්ආන් එකේ 21 වෙනි පරිච්ඡේදයේ.

ප්‍ර : 21;

පි : 57 සිට 61 දක්වා මේ ගැන සඳහන් වෙලා තියෙනවා. ප්‍රශංසා කරලා පිළිම වන්දනාවට භාවිතා කරපු පිළිම කැඩීමේ සිද්ධිය ගැන.

ප්‍ර : කවුරු වන්දනාවට පාවිච්චි කරපු පිළිමද කඩලා තියෙන්නේ?

පි : ඊබ්‍රාහීම් කියන නබිතුමාගේ කාලේ එවකට හිටපු මිනිසුන් වන්දනාවට භාවිතා කරපු පිළිම එතුමා විසින් කඩා දමපු සිද්ධිය ගැන.

President's Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ ඒ පිළිම ඉස්ලාම් ආගමට අදාළ පිළිමද?

පි : නෑ ඉස්ලාම් ආගමට අදාළ පිළිම නොවේ. ඒ කුමන ආගමේද කියලා කුර්ආනයේ සඳහන් වෙලා නෑ. ඒත් ඒ කාලේ ජීවත් වෙච්චි මේ මිනිස්සු වන්දනා කිරීම සඳහා භාවිතා කරපු පිළිම.

ප්‍ර : ඔවුන් ඉස්ලාම් භක්තිකයින් නෙවෙයි ඔබ කියන ආකාරයට?

පි : ඉස්ලාම් භක්තිකයන් නෙවෙයි. ඒ වගේම නබිතුමා විසින්

ප්‍ර : ඔව් කොහේද මේ පිළිම විනාශ කිරීම සිදු වෙලා තියෙන්නේ ඔය ඊබ්‍රහීම්තුමාගේ කාලේ?

පි : මෙතන ප්‍රදේශය සඳහන් වෙලා නෑ.

ප්‍ර : ඔව්.

පි : එතුමා මක්කම හා ෆැලස්තීස් ප්‍රාන්තයේ ජීවත් වුණු බව තමයි

ප්‍ර : No, no now you quote Quran no?

පි : Yes.

ප්‍ර : Can we go in to the Quran and say be specific?

පි : Yes. නමුත් නුඹලාගේ

ප්‍ර : Yes Mr. Ismath.

පි : මේක ඊබ්‍රහීම් නබිතුමා විසින් පවසන ලද . "නමුත් ඔබලාගේ

ප්‍ර : What's the page you are referring to please?

පි : 654.

ප්‍ර : 654 ok.

පි : 657 in the bracket and starting there.

ප්‍ර : Yes.

පි : නමුත් නුඹලාගේ පරමාධිපති වනුයේ අහස් හා මිහිතලයකි. පරමාධිපති (අල්ලාහ්) ය. ඔහු ඒවා මැව්වේය. තවද මම ඒ කෙරෙහි සාක්ෂි දරන්නේ.

ප්‍ර : ඔව්.

පි : දරන්නේ අතුරිනි.

ප්‍ර : දරන්නන් අතුරිනි.

පි : දරන්නන් අතුරිනි. අල්ලාහ් මත දිවුරුම්

ප්‍ර : දිවුරම්.

පි : දිවුරම්. සැබෑවින්ම මම නුඹලා හැරී ගිය පසු නුඹලාගේ පිළිම වලට උපක්‍රමයක් යොදන්නම්.

ප්‍ර : උපක්‍රමයක් යොදන්නෙම්.

පි : යොදන්නෙම් යයි ඔහු (ඊබ්‍රහීම්) පැවසුවේය.

ප්‍ර : දැන් ඔබ විසින් එම කියවන ලද කොටසට පාද සටහනක් තියෙනවා නේද foot note ?

Premier Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ok

ප්‍ර : ඒ පාද සටහනේ මොනවද කියන්නේ?

පි : මෙහි අදහස්

ප්‍ර : Can I read it?

පි : Yes.

ප්‍ර : ජනයින් තම ආගමික උත්සවය සැමරීමට ගමින් පිට වෙයි. ඒ කියන්නේ 12 වන පාද සටහන. ජනයින් තම ආගමික උත්සවය සැමරීමට ගමින් පිටවන විට ඔවුන්ගේ පිළිම කඩන බවට නබි ඊබ්‍රහීම්තුමානන් සිතා ගත්තේය. අල් කුර්ආන් 370083-94 දක්වා සඳහන් වී ඇති අයුරින් ජනයින් නබි ඊබ්‍රහීම්තුමානන්වද එම උත්සවයට කැඳවුවෝය. එනමුත් ඔහු සහභාගි නොවීය. පසුව ඔවුහු ගමින් පිටවූ කළ පිළිම කිහිපයක් කඩා එහි විශාල පිළිමය මෙසේ කඩා දැමූ බව ජනයාට පැවසීය. තව තියෙනවා ඒකේ නබි ඊබ්‍රහීම්තුමා මෙහිදී බොරුවක් පවසා තිබුණද ඔහුගේ චේතනාව වුයේ ජනයාට සත්‍ය අවබෝධ කර දීමය. ඒ කියන්නේ කඩලා නැද්ද?

පි : කඩලා තියෙනවා. මේ සිද්ධිය වෙන්නේ තවදුරටත් 58 ඉඳලා 60 වෙනකම්.

ප්‍ර : අපි මේක ලකුණු කරලා ඉමු නේද?

පි : ඔව්.

ස්වාමිනි **C 138** ලේඛනයේ **654** වන පිටුවේ දෙවෙනි ඡේදයේ පහළ සිට ඉහළට ගණින විට පස්වන පේළිය තමයි මගේ ආරම්භය වෙන්නේ මේ ලකුණු කිරීමේ එම වාක්‍ය **5 C 138 (D)** වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : මිස්ටර් ඉස්මත් මේ කොමිෂමට පැහැදිලි කරන්න පුළුවන්ද නබි ඊබ්‍රහීම් කියලා මෙම දැන් කුර්ආනයේ සඳහන් වෙන්නේ කවුරුද කියලා?

පි : මොහොමඩ් නබිතුමා එතුමාව හඳුන්වන්නේ තමාගේ පියා ලෙස. පියා කියන්නේ not a blood father ආගමේ පියා ලෙස හඳුන්වන කෙනෙක් තමයි නබි ඊබ්‍රහීම්. හජ්ජි වන්දනාව පවා පටන් ගත්තේ එතුමා විසින් බව තමයි මතය තියෙන්නේ. හජ්ජි වන්දනාවට ගිහිල්ලා sacrificing the animal goat or a cow or a camel is also started by him.

ප්‍ර : එයා මනුෂ්‍යයෙක්ද දේව දූතයෙක්ද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : මනුෂ්‍යයෙක්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය</u>

ප්‍ර : තාත්තා

පි : Not a blood father like. Father of the ideology

ඒ වගේම ස්වාමිනි 12 වෙනි පාද සටහන එම පිටුවේ තිබෙන **C 138 (E)** අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා

ප්‍ර : මගේ මීට පෙර අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙන අවස්ථාවේ දී ඔබ ඒ පිළිතුරේ තව 58 ක් පිළිබඳව සඳහන් කරනු ලැබුවා නේද?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද ඒ අංකේ 58 වශයෙන් සඳහන් කළේ?

පි : නමුත් ඔවුන් සතු ප්‍රධාන පිළිමය හැර අනෙක් ඒවා කැබැලි වලට

ප්‍ර : කැබැලි බවට

පි : කැබැලි බවට පත් කළේය. එසේ කළේ ඔහු ඒ වෙත නැවත පැමිණෙනු පිණිසය. අපගේ දෙවිවරුන්ට මේ අපරාධය කළේ කවුරුන්ද? සැබවින්ම ඔහු අපරාධකරුවන් අතරිනි.

ප්‍ර : අතුරිනි.

පි : යයි

ප්‍ර : ඔහු පැවසුවෝය.

පි : ඔවුහු පැවසුවෝය. 60 වෙනි වැකිය " තරුණයකු ඒවා පිළිබඳව දොස් කතා නැඟීමේ අපි අසා

ප්‍ර : ඇත්තෙමු.

පි : ඇත්තෙමු. ඔහුට ඊබ්‍රහීම් යයි පවසනු ලැබේ යයි පිරිසක් පැවසුවේය.

ප්‍ර : පැවසුවෝය.

පි : පැවසුවෝය. එසේ නම් මිනිසුන් දකිනු පිණිස ඔවුන්ගෙන් දොස් ඉදිරියට දෑස් ඉදිරියට ඔහුව ගෙන එනු යයි ඔවුනු පැවසුවේය." 62 වැකිය "අහෝ ! ඊබ්‍රහීම් අපගේ දෙවිවරුන්ට මෙසේ කළේ ඔබද යයි ඔවුහු

ප්‍ර : ඔවුහු විමසුවෝය.

පි : ඔවුහු විමසුවේය. නැත එය කළේ ඒවායෙහි ප්‍රධාන වන මේ පිළිමය

ප්‍ර : ප්‍රධානියා වන

පි : ප්‍රධානියා වන මෙම පිළිමයය. එබැවින් ඒවා කතා කරන්නේ නම් ඒවාගෙන් අසා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ගනිවු යැයි

පි : ගනිවු යැයි

ප්‍ර : ඔහු පැවසුවේය.

පි : ඔහු පැවසුවේය. එවිට ඔහු තමන් දෙසට හැරී සැබවින්ම නුඹලාය අපරාධකරුවෝ යයි ඔහු පවසා ගන්නේය.

ප්‍ර : ගත්තෝය.

පි : ගත්තෝය. පසුව ඔවුන්ගෙන් හිස් අවුල් වියවුල් බවට පත් වී මේවා කතා නොකරන බව සැබවින්ම නුඹ

ප්‍ර : දන්නෙහිය.

පි : දන්නෙහිය යයි ඊබ්‍රහීම්ට පැවසුවෝය."

ප්‍ර : ඊළඟ ඡේදය it's very important 66, 67 වාක්‍ය

පි : "එසේ නම් අල්ලාහ් හැර නුඹලාට කිසිදු ප්‍රයෝජනයක් හෝ හානියක් හෝ කළ නොහැකි ද

ප්‍ර : නොහැකි දෑ

පි : නොහැකි දෑ උඹලා

ප්‍ර : නමදින්නෙහුද?

පි : නමදින්නෙහුද? නුඹලාටද අල්ලාහ් හැර නුඹලා නමදින ඇයටද

ප්‍ර : දැයටද

පි : දැයටද

ප්‍ර : නින්දාවකි.

පි : නින්දාවකි. නුඹලා අවබෝධ කර නොගත්

ප්‍ර : නොගන්නේ දැයි

පි : නොගන්නේ දැයි

ප්‍ර : ඔහු විමසුවේය.

පි : ඔහු විමසුවේය. නුඹලා මොහුට දඬුවම් කරන්නට සිටින්නේ නම් නුඹලා මොහුව පුළුස්සා දමා නුඹලාගේ දෙවිවරුන්ට උපකාර කරවු යයි ඔවුහු පැවසුවෝය.

ප්‍ර : පැවසුවෝය.

පි : අහෝ! ගින්න නුඹ ඊබ්‍රහීම් කෙරෙහි සිසිල් හා

ප්‍ර : ශාන්තිමත්

පි : ශාන්තිමත් වවු යැයි පැවසුවෙමු.

ප්‍ර : පැවසුවෙමු.

පි : පැවසුවෙමු. ඔහුට කුමන්ත්‍රණය කිරීමට ඔවුහු අපේක්ෂා කළේය.

ප්‍ර : කළෝය.

පි : කළෝය. නමුත් ඔවුන් ඔවුන්ගේ කුමන්ත්‍රණ නිශ්ඵල කිරීමෙන් ඔවුන්ට අපි

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අලාභීන් බවට

පි : අලාභීන් බවට පත්

ප්‍ර : කළෙමු.

පි : කළෙමු.

655 පිටුවෙහි ඇති පළමුවන ඡේදය **C 138 (F)** අක්ෂරයෙන්ද එහි තිබෙන දෙවන ඡේදය **C 138 (G)** අක්ෂරයෙන්ද ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා

ප්‍ර : On the same document IR5 you also referred to another paragraph in the Quran right? 1**781**

පි : That Quran verse is part of the Hadith.

ප්‍ර : Part of the Hadith.

පි : yes.

ප්‍ර : එතකොට හදීස් එකට අපි එහෙනම් යන්න ඕන නේ?

පි : ඔව්.

ප්‍ර : IR **5** ලේඛනයේ වෙනත් ස්ථානවල මේ පිළිම විනාශ කළ යුතු බවට සඳහන් වෙනවාද?

පි : ඔව්. ඒ පිළිම විනාශ කරපු සිද්ධීන් සම්බන්ධයෙන්

ප්‍ර : සඳහන් වෙනවා.

පි : සඳහන් වෙනවා.

ප්‍ර : ඒ තව කුමන ස්ථානවලද?

පි : මක්කම හා

ප්‍ර : මැකා

පි : මක්කම සිද්ධ වෙච්ච සිද්ධිය ගැන එතන සඳහන් වෙනවා. මොහොමඩ් නබිතුමා විසින් කරන ලද සිද්ධිය ගැන.

ප්‍ර : මොකද එතුමා කරලා තියෙන්නේ?

පි : මක්කමේ ඒ මක්කමේ වාසය කරපු මිනිස්සු worship කරපු පිළිමවල් කඩා දැමීමේ සිද්ධිය.

ප්‍ර : ඔව්. ඒ පිළිබඳව වඩාත් පැහැදිලිව කරුණු සඳහන් වෙන්නේ IR 5 ලේඛනයේ කුමන ඡේදවලද? I think last paragraph of ..

පි : බුහාරි **4** වෙනි පොතේ **1812** වෙනි හදීස් එකේ හා මුස්ලිම් එකේ

ප්‍ර : මුස්ලිම් හදීස් එකේ

පි : **969** වෙනි හදීස්, බුහාරි එකේ volume **5** පොත **59** හදීස් number **643** ඒවා වල සඳහන් වෙනවා.

ප්‍ර : බලන්න Breaking statues No it's a Hadith. Written by Buhari.

Project Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : His name is Ima Buhari, he lived on almost 1300 years ago.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : Out of all Hadith translations that's a most vital translation.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය</u>

ප්‍ර : Buhari?

පි : No. Hadith not translation. Hadith books. Hadith books contains everything from good to bad.

****

<u>ගරු සභාපති විනසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : Hadith was written in Arabic?

පි : Yes Arabic. Buhari is an Arabic book.

ප්‍ර : Was it translated in to different language by Buhari?

පි : No Buhari did not do any translations.

ප්‍ර : He constructed Hadith ?

පි : He recorded the Hadith collected and he recorded. And there are violence Hadiths also in the Buhari and all other books are almost same. They have the violence Hadiths as well as good Hadiths. Because they just recorded the Hadiths whatever they received and verified it and recorded.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය</u>

ප්‍ර : මා ඔබෙන් මීළඟට ප්‍රශ්න කරන්නට කැමති ජිහාඩ් කිරීම පිළිබඳව. ජිහාඩ් කරනවා කියලා කියන්නේ මොකක්ද?

පි : සාමාන්‍යයෙන් ඉස්ලාම් ආගමේ ජිහාඩ් කරනවා කියන එක ආගම වෙනුවෙන් යුද්ධ කිරීම.

ප්‍ර : ආගම වෙනුවෙන් යුද්ධ කිරීම.

පි : ඔව්. ආගම පැතිරීම සඳහා හෝ ආගම බේරා ගැනීම සඳහා කරන යුද්ධ.

ප්‍ර : කොහේද එහෙම කියලා තියෙන්නේ?

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : General understanding is like that. When the word Jihad is said and also I guess I submitted a document about by Ebon tasmania it also explains what is Jihad and how Muslims shoot and Quran also said about war

ප්‍ර : ජිහාඩ් කියන්නේ අරාබි වචනයක් නේද?

පි : අරාබි වචනයක්.

ප්‍ර : ඒ අරාබි ඔබ අරාබි දන්නවාද?

පි : සුළු මට්ටමෙන්.

ප්‍ර : ජිහාඩ් කියන එක සිංහලට පරිවර්තනය කරන්නට හෝ ඉංග්‍රීසියට පරිවර්තනය කරන්නට ඔබ දන්නවාද?

පි : සාමාන්‍යයෙන් හැමෝම පිළිගත්ත පරිවර්තනය තමයි ශුද්ධ වූ යුද්ධය කියන්නේ .

ප්‍ර : ශුද්ධ වූ යුද්ධය.

පි : ශුද්ධ වූ යුද්ධය.

ප්‍ර : ඒ කියන්නේ මුස්ලිම් ජාතිකයින් විසින් ජිහාඩ් කියන වචනය පිළිගන්නේ ඔබ කියන ආකාරයට ශුද්ධ වූ යුද්ධය කියලාද?

පි : සාමාන්‍යයෙන් පිළිගන්නේ ශුද්ධ වූ යුද්ධය කියන ආකාරයෙන් තමයි.

ප්‍ර : ඒ ජිහාඩ් කරන විධි තියෙනවාද?

පි : නබිතුමා විසින් එය පවසලා තියෙනවා.

ප්‍ර : මොන ආකාරයටද ජිහාඩ් කරන්නට පුළුවන් වෙන්නේ?

පි : ඉස්ලාමීය රාජ්‍යයක් නැත්නම් ඉස්ලාමීය ප්‍රාන්තයක් පිහිටුවාට පස්සේ අන්‍යාගමිකයන් ජීවත් වන ප්‍රදේශවලට පහර දීම කරන්න කලින්. පහර දීම කරන්න කලින් ඒගොල්ලන්ට options 3 ක් දෙනවා.

ප්‍ර : හ්ම්.

පි : එකක් ඉස්ලාම් ආගම වැළඳ ගන්න කියලා. නැත්නම් ඉස්ලාම් ආගම ඒ රාජ්‍යයට යටත් වෙලා ජෙසියා නැමැති කප්පමක් ගෙවලා ජීවත් වෙන්න ලේසි. ඒ දෙකම පිළිගත්තේ නැත්නම් තුන්වෙනි එකෙන් තමයි යුද්ධ කරන්න ඕනී ඒගොල්ලොන්ට විරුද්ධව. ඒ වගේම මුස්ලිම් ප්‍රාන්තයට නැත්නම් ඉස්ලාම් රාජ්‍යයට විරුද්ධව වෙන අන්‍යාගමික කණ්ඩායම් හෝ රටකින් ප්‍රහාරයක් එල්ල කළොත් ඒක බේරා ගැනීම කරන යුද්ධයත් ජිහාඩ් නමින් සඳහන් වෙනවා. මේක පොදුවේ තියෙන Understanding එකක්.

ප්‍ර : අන්‍යාගමිකයින් නැවත අවසාන උත්තරේ කියන්න.

පි : අන්‍යාගමිකයින් විසින් පාලනය කරන රටක් හෝ රාජ්‍යයක් විසින්

Prosecution Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔව්

පි : මුස්ලිම් රාජ්‍යයට, නැත්නම් මුස්ලිම් විසින් පාලනය කරන ප්‍රදේශයට එරෙහිව යුද්ධය අක්‍රමණශීලි යුද්ධයක් කළොත් ඒක බේරා ගැනීම සඳහා ඒකට විරුද්ධව කරන යුද්ධයත් ජිහාඩ් ඒ වාගේම ගිහින් පහර දීමත් ජිහාඩ්.

ප්‍ර : ඔබට ඔය ජිහාඩ් කියන ඒකේ අදහස වෙන්නේ සහ එයින් සිදු කරන්නට පුළුවන් ක්‍රියා ඔය ආකාරයටයි කියන අවබෝධය ලැබුනේ කොහෙන්ද?

පි : පාසල් කාලයේ සිටම.

ප්‍ර : කවුද එහෙම කියලා දුන්නේ?

පි : මට මගේ මතකය හැටියට අපිට ඉස්ලාම් ආගම උගන්වපු ඉබ්බාල් මවුලවිතුමා පවා ඒ මතය අපිට ලබා දුන්නා.

ප්‍ර : ඔවුන් ඒ ඔබලාට පාසල් දරුවන් විදිහට ඉස්ලාම් ආගම උගන්වන කොට පෙළපොත් පාවිච්චි කළේ නැද්ද ඉස්ලාම් ධර්මයේ තියෙන?

පි : භාවිතා කළා.

ප්‍ර : එතකොට ඒ පොත්වල තිබුණේ ඒ ආකාරයටද?

පි : බදුර් උහත් යන යුද්ධය ගැන 9 පන්තියේ දී මට මතකේ හැටියට හරිනම් 9 වන ශ්‍රේණියේ දී ඉගෙන ගන්න කොටම ඒ පොත් වල තිබුණා කියලා මට මතකයි. ඒ වගේම හැම නෝම්බි මාසයේ 15 වැනි දිනයේ තමයි බදුර් කියන යුද්ධය සිදු වෙලා තියෙනවා. මොහොමඩ් නබිතුමා විසින් කරනු ලැබූ ප්‍රථම මහා පරිමාණ යුද්ධයක් ඒක මංකොල්ලයත් එක්ක සම්බන්ධ වෙච්චි යුද්ධයක්. ඒ යුද්ධය ගැන හැම අවුරුද්දෙම සමරනවා. ඒ 15 වැනි දිනය. එදාට හෝ ඒ දවසට ආසන්න දිනයක් ජමාතේ ඉස්ලාමීය සංවිධානය විසින් විශේෂ දේශනා පවත්වනවා. තාම ඒක සිදුවෙමින් පැවැත්වෙනවා. අන්තර්ජාලය මුහුණුපොත Facebook ඒකේ පවා නෝම්බි මාසයේ 15 වැනි දිනය ළං වෙන කොට බදර් යුද්ධය සැමරීම පිළිබඳව post දකින්න පුළුවන්.

දැන් වේලාව : ප.ව.04.40 යි.

මෙතැන් සිට ල/ලේ : සචිනි මෙය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව : ප.ව. ප.ව **4.40** යි
පෙර සටහන් කළේ මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට සටහන් කළේ : සචිනි මෙනවිය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය</u>.

ප්‍ර : මා කිව්වෝතින් නිවැරදිද ජීහාදය ආකාර පහකට කරන්නට පුළුවන් කියලා? ඔබ දන්නවාද මනුෂ්‍යයෙක්ගේ හිතෙන් ජීහාදයක් කරන්නට පුළුවන් කියලා? චෛතසිකෙන්?

පි : ඒ වගේ දෙයක් සුළු ලෙස ඉස්ලාම් ආගමේ සඳහන් කරලා තියෙනවා. තමාට එන කෝපය Angry එක Control කරන එක ජීහාදයේ එක කොටසක් කියලා. ඒ වුණාට සාමාන්‍යයෙන් ...,

ප්‍ර : ඒ කියන්නේ වැරදි සහ අකුසල්වලට කෙනෙක් පෙළඹෙනවා නම් ඒකට විරුද්ධව තමන් තමන්ගේ හිතෙන් තමන්ට එරෙහිව ක්‍රියා කිරීම ජීහාදයක් නේද?

පි : ජීහාද් කියලා ඒකත් හඳුන්වනවා. තමාගේ ගෙදරට කඩා වැටෙන මංකොල්ලකාරයොත් එක්ක කරන සටන ජීහාද්. තමාව මරන්න එන එක්කෙනත් එක්ක තම දිවි බේරා ගැනීම සඳහා කරන එකත් ජීහාද් නමින් සඳහන් වෙනවා.

ප්‍ර : එතකොට යම් වැරදි ක්‍රියාවන් සිදුවෙනවා කියලා පේනවා නම් ඒවාට එරෙහිව නැගී සිටීමින් කථා කිරීමත් ජීහාදයක් නේද?

පි : ඔව්. ඒකත් ජීහාදයක් ලෙස සඳහන් කරනවා. ඒ වැරදි ක්‍රියා කියන එක සාමාන්‍යයෙන් අපි හිතන වැරදි සහ ඉස්ලාම් ආගම වැරදි කියලා හඳුන්වලා තියෙන දේවල් අතර පරස්පරයක් තියෙනවා.

ප්‍ර : ඇයි ඔබ එහෙම කියන්නේ?

පි : සාමාන්‍යයෙන් පිළිම වන්දනාව, ඒක ඉස්ලාම් ආගම වැරදි හැටියට දකිනවා. ඒ වුණාට වහල් ව්‍යාපාරය, කුඩා දරුවන් කසාද බැඳීම අපි වැරදි හැටියට දකිනවා, ඒක ඉස්ලාම් හරියි කියලා කියනවා. එතකොට එතනින් කොයි එකටද විරුද්ධවද ඒ ජීහාදය කරන්නේ කියන එකෙන් වචනවලින් කිව්වාට එතන By Action there's a difference. What Islam means and what we understand. අපි එතන තේරුම් ගැනීම, තේරුම් ගන්න දේවලුයි, ඉස්ලාම් ඇත්තටම එතනින් අදහස් කරන දේවලුයි වෙනස්.

ප්‍ර : මම ඔබේ අවධානයට යොමු කරන්න කැමතියි මේ C-138 වශයෙන් ලකුණු කරන ලද අල්කුරාන් අර්ථ සංග්‍රහයේ 72 වෙනි පිටුවේ සුරාල් බකරා දෙවෙනි කොටසේ, සුරාල් බකරා දෙවෙනි

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කොටසේ,Page 72, එහි සඳහන් වෙනවා නේද ජිහාදය අනු ප්‍රභේද පහකින් යුක්තයි කියලා? Page 72. එහි සඳහන් ජිහාද්බින් නෆ්ස් එහෙම නැත්නම් බිල් ක්ලබ් කියන්නේ මොකද්ද? කොහොමද ඒ ජිහාදය කරන්නේ?

පි : ජිහාද්බින් නෆ්ස් කියන්නේ තමන්ගේ හිතත් එක්ක කරන ජිහාද් කියන එක.

ප්‍ර : මොනවට විරුද්ධවද තමන්ගේ හිතත් එක්ක ඒ ජිහාදය කරන්නේ?

පි : යම්කිසි පාපය නැත්නම් යම්කිසි The controlling the mind according to,

ප්‍ර : තමන්ගේම හිත තමන් විසින් පාලනය කරනවා?

පි : පාලනය කරනවා. මෙතන පොඩ්ඩක් මම පැහැදිලි කිරීමක් කරන්න වෙනවා. මොකද මම කලින් සඳහන් කළා වගේ ඉස්ලාම් අදහස් කරන එකයි, අපි සාමාන්‍යයෙන් අදහස් කරන එකයි වෙනස් වෙනවා. සාමාන්‍යයෙන් ගැහැණු ළමයෙක්ගේ මුහුණ බලන එක නැත්නම් හිස් කොණ්ඩය බලන එකවත් ඉස්ලාම් ආගමේ අනුමත කරලා නැත. ඒ දිහා අපි ඇස් යනකොට ඒක බලන්නේ නැතුව පාලනය කරන එකත් මේ යටතේ අඩංගු වෙනවා. එතකොට මේ ජිහාද්බින් නෆ්ස් කියන එක හිත පාලනය කරනවා කියන එකෙන් සාමාන්‍ය අදහසයි, ඉස්ලාම් එකේ අදහසයි පරස්පරව වෙනස් වෙන්න පුළුවන් ඉඩකඩ බොහෝ තියෙනවා.

ප්‍ර : එතකොට ජිහාද්බින් නෆ්ස් ....?

පි : ජිහාද්බින් නෆ්ස් කියන වචනය මෙතන කොතනද සඳහන් වෙලා තියෙන්නේ.

ප්‍ර : ඒ කියන්නේ නෆ්ස්, ජිහාද්බින් නෆ්ස් It'son the number one? No. 72.Ulsan at 72.

පි : මේක කුරානයේ සඳහන් වෙච්ච දෙයක් නෙමෙයි. මේක පරිවර්ථනය කරපු අය විසින් අමතරව සඳහන් කරපු දේ තමයි මේ පහම සඳහන් වෙලා තියෙනවා. මේක මේ ආකාරයෙන්ම හැම කුරාන් එකේම සඳහන් වෙලා නැත. මේක පරිවර්ථනයේ නැත.

ප්‍ර : ඔබ ළඟ කුරානයක් තියෙනවාද?

පි : ඔව්. මගේ ළඟ කුරාන් එක තියෙනවා. ඉංග්‍රීසි එකත් තියෙනවා. අපි ඒ දෙකෙන්ම බලන්න පුළුවන්.

ප්‍ර : පෙන්වන්න බලන්න. Page 72.හරි. අපි ඒකට යන්න ඉස්සරල වෙලා ඉස්සරලා තියෙන ඒවා ගැන කථා කරලා ඉවර වෙලා ඒතනට යං. ඔබ කියන්නේ ..., පොතේ එක ඉවර කරලා ඊට

FAIR COMMENT BY JEZEEM

පස්සේ අපි ඒකත් එක්ක comparison එකක් කරන්න යන්න තියෙන්න ඕනනේ මේකේ?

පි : හරි.

ප්‍ර : එතකොට ජිහාද්බින් නිසාල් කියන්නේ මොකද්ද? ඔබ දන්නවනේ අරාබි වචන?

පි : නැහැ. ඒක මම දන්නේ නැහැ.

ප්‍ර : දිව උපයෝගී කර ගනිමින් කරන ජිහාදය? ලොවේ සිදුවන අපරාධ දුෂ්ඨකම් මෙන්ම පාප ක්‍රියාවන්වලට එරෙහිව හඬ නැගීම හා ජනයාව යහමඟ දෙසට යොමු කිරීම සඳහා කරන දේශනා, සාකච්ඡා හා සංවාද ආදිය මෙම ජිහාද් ප්‍රභේදයට අන්තර්ගත වේ. තවද අසාධාරණ දුෂ්ඨ පාලකයෙකු ඉදිරියේ නිර්භයව සත්‍ය ප්‍රකාශ කර සිටීම ශ්‍රේෂ්ඨ ජිහාදයක් බව ඉස්ලාමය අපට උගන්වයි කියලා අල් කුරාන්වල 25-52 හි තියෙනවා කියලා සඳහන්. මේ C-138 සඳහන් වෙනවා?

පි : ඔව්. හරි. ඒක මම අහලා තියෙනවා. දුෂ්ඨ පාලකයාට විරුද්ධව හඬ නැගීම ජිහාද්වලින් උපරිම එකක් කියන එක මම අහලා තියෙනවා.

ප්‍ර : අහලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ජිහාද් බිල් ඉල්ම් නැත්නම් කලම් කියන එක ඔබ අහලා තියෙනවද?

පි : නැහැ.

ප්‍ර : C-138 කියනවා " එනම් දැනුම / පෑන උපයෝගී කර ගනිමින් කරන්නා වූ ජිහාදය ලොවෙහි සිදුවන අයුක්තියට හා අසාධාරණයට එරෙහිව හා පාප ක්‍රියාවන් පිළිබඳව යහ හා නිවැරදි අයුරින් කරුණු පහදා දීම උදෙසා කරන්නා වූ විද්වත් ගවේෂණයන් මෙන්ම ඉස්ලාමය පහසුවෙන් අවබෝධ කර ගැනීමට උපකාරී වන අයුරින් ලිපි හා ග්‍රන්ථයන් සකස් කිරීමට කටයුතු කිරීමද මෙයට ඇතුළත්ය. තවද යුක්තිය, සාධාරණය හා දහම වෙනුවෙන් ප්‍රාණ ත්‍යාගිත්වයේ යෙදෙන්නාගේ රුධිරයට වඩා විද්වතාගේ තීන්ත ශ්‍රේෂ්ඨ වන්නේ යැයි ඉස්ලාමයේ උගන්වයි." ඔබ අහලා නැද්ද ඒක?

පි : මේක අහලා තියෙනවා. මේ ගැන විද්වතුන් අතර පොඩි මතභේදයක් තියෙනවා. ඇත්තටම මේක නබිතුමා පවසපු එකක්ද, නැත්නම් පසුකාලයේ එතුමාගේ නමින් කවුරු හරි කියපු එකක්ද කියන එක පොඩි මතභේදයක් තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මතභේදයට තුඩු දීලා තියෙනවා කියලා ඔබ කියන්නේ?

පි : තියෙනවා. හැබැයි උඩ කොටස සඳහන් කරලා තියෙන දේවල් මට කියන්න පුළුවන් මේ Translate කරපු කට්ටිය විසින් Add කරපු එකක්. මේක හැම කුරාන් Translation එකේම දකින්නට ලැබෙන්නේ නැහැ.

ප්‍ර : කොයි කොටසද එකතු කරලා තියෙනවා කියලද ඔබ කියන්නේ?

පි : මේකේ 1 ඉඳලා 5 වෙනකම් තියෙන ඒවා Translation එකට අදාළ දේවල් නෙමෙයි. එතන වැඩිදුර විග්‍රහය සඳහා Add කරපු දෙයක්. මේක අරාබි භාෂාවෙන් කුරාන් එකේ නැත.

ප්‍ර : හොඳයි. කමක් නැහැ. අපි එතන්ට එන්න ඉස්සර වෙලා ඔබ මේක අහලා තියෙනවද කියන්නකෝ ඔබ ඔය ඉස්ලාම් ආගම හදාරන කාලයේ. ජිහාද්බිල්යද් අහලා තියෙනවාද ඒක?

පි : ඒ වචනය අහලා නැහැ. ඒකෙන් අදහස් වෙන්නේ මොකද කියලා ....,

ප්‍ර : C-138 හි කියනවා "එනම් දැත උපයෝගී කර ගනිමින් කරන්නා වූ ජිහාදය අසරණයින්ට පිහිටවීම, සමාජයේ ඇතිවන වසංගත රෝග මැඩලීම, ආගමික වතාවන්වල යෙදීම වැනි යහ ක්‍රියාවන්වල තම ශරීරය හා සම්පත් උපයෝගී කිරීම මෙයට ඇතුළත් වේ. එමෙන්ම දෙමව්පියන්ට උවටැන් කිරීමද ජිහාද් යනුවෙන් ඉස්ලාමයේ උගන්වයි. අල්කුරාන් 29 : 69 බලන්න" කියලා තියෙනවා.

පි : මම දන්නා තරමට දෙමව්පියන්ට උවටැන් කිරීම පමණක් 29 : 69 සඳහන් වෙලා ඇතියි කියලා මම හිතනවා. අනිත් දේවල් ඒ කියන්නේ අපි පොඩ්ඩක් ඒ 29:69 බැලුවොත් අපිට දැන ගන්න පුළුවන් කියලා මම හිතනවා.

ප්‍ර : එහෙනම් අපි එතනට යන්න ඉස්සර වෙලා මේ පස්වෙනි ප්‍රභේදය, අනු ප්‍රභේදය ජිහාද් බික්ෂෙයිෆ් කියන එක අහලා තියෙනවද?

පි : ෂෙයිෆ් කියන්නේ කඩුවට කියන වචනය මම දන්නා තරමට.

ප්‍ර : C-138 හි කියනවා "එනම් අසිපත උපයෝගී කර ගනිමින් කරන්නා වූ ජිහාදය සාමයේ යුක්තිය හා සාධාරණය වෙනුවෙන් අසිපතින් හෝ වෙනත් ආයුධවලින් ජිහාද් නම් ප්‍රයත්නයක නියැලිය හැක්කේ අවස්ථාවන් දෙකක පමණය. එම අවස්ථාවන්හි සටනක යෙදීම අල් කුරාන් ඉගැන්වීම අනුව අනිවාර්යය වේ." පළවෙනි එක තමයි ජිහාද් දිෆායි. දිෆායි. "එනම් සුරක්ෂාවරණ සටහන. එක් රාජ්‍යයකට හෝ සමාජයකට එරෙහිව පහර දෙනු ලබන්නේ නම් එම රාජ්‍යයේ ආරක්ෂාව පදනම් කරගෙන ප්‍රහාරකයින්ට එරෙහිව සටනට පිවිසීමය. මෙය රාජ්‍යය හෝ

FAIR COMMENT BY JEZEEM

ජනතා නායකත්වයක් හා මඟපෙන්වීමක් යටතේ මිස සිදු නොවිය යුතුය." ඒක කියනවා අල් කුරාන් 2:190 බලන්න. එතකොට දෙවෙනි එක තමයි ජිහාද් ඉක්ඩාමී. " එනම් ප්‍රගාමී සටන. ප්‍රගාමී සටන යනු ඉස්ලාමීය රාජ්‍යයක් විසින් අපරාධ, අවනීතිය, දුෂ්ඨකම් හා ත්‍රස්තවාදය ආදියට එරෙහිව ගන්නා වූ යුධමය පියවරකි. මෙවැනි අවස්ථාවකදී ස්වභාවික නීතිය උල්ලංඝනය නොකොට එවැනි අපරාධයන්ට එරෙහිව කටයුතු කිරීම ඉස්ලාමීය රජයකට අනිවාර්යය වේ. තවද ඉස්ලාමීය නොවන රාජ්‍යයක වෙසෙන මුස්ලිම්වරුන්ට මෙම නීතිය අදාළ නොවන්නකි. අල් කුරාන් 4:75 බලන්න" කියලා තියෙනවා?

පි : මෙතන Explanations වල මම හිතන විදියට පොඩි අඩු වැඩි කිරීමක් කරලා තියෙන බව තමයි මට තේරෙන්නේ.

ප්‍ර : ඔබ අදහස් කරනවද සමස්ත ලංකා ඉස්ලාම් ආගමික වියතුන්ගේ සංගමය විසින් මේ කුරාන් අර්ථ සංග්‍රහය පිළියෙල කරනකොට මුල් කුරානයේ නොතිබුණු දේවල් මේ අර්ථ සංග්‍රහයට ඇතුළත් කරලා තියෙනවා කියලා?

පි : ඔව්. මේ කරුණු පහම මුල් කුරානයේ අරාබි භාෂාවේ නොමැති දේවල්.

අවසර පතනවා ස්වාමීනි **C-138** හි 72 වෙනි පිටුව **C-138(h)** වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්න

ප්‍ර : දැන් ඇයි ඔබ කියන්නේ සමස්ථ ලංකා ඉස්ලාම් ආගමික වියතුන්ගේ සංගමය විසින් මේ කුරාන් අර්ථ සංග්‍රහය පිළියෙල කරනකොට මුල් කුරානයේ නැති දේවල් ඒකට අඩංගු කරලා තියෙනවා කියලා ඔබ කොහොමද ඔය කියන ප්‍රකාශය තහවුරු කරන්නේ මේ ගරු කොමිෂන් සභාවට?

පි : අරාබි භාෂාවේ මෙවැනි දේවල් නැහැ කියන එක මම පැහැදිලිවම කියනවා. මොකද මෙතන සඳහන් වෙන්නේ **140** යටතේ ජිහාද් කියන එකේ **140** කියන එක කුරානයේ දෙවෙනි පරිච්ඡේදයේ ....,

ප්‍ර : ඔය **140** කොහෙන්ද කියවන්නේ?

පි : **71** වෙනි පිටුවෙන් පටන් ගන්නේ.

ප්‍ර : O.K.

පි : මේක සඳහන් වෙන්නේ **218** වෙනි වැකියට. කුරානයේ දෙවෙනි කොටසේ **218** වෙනි වැකියට විග්‍රහය කරනකොට **140** කියලා උඩින් දාලා, ඒක විග්‍රහය යටතේ තමයි මේක ලියලා තියෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

President Secretariat

මේක පරිවර්තනය නෙමෙයි. මේ විග්‍රහය කියන එක මේ පරිවර්ථනය කරපු අය විසින් ලියන ලද දේ. මේකේ සමහර දේවල් සඳහන් කරලා තියෙන ඒවා ඉස්ලාම් ආගමේ තියෙන ඒවා. සමහර දේවල් Exclamations ගොඩාක් මේ සාමකාමී ආගම කියන මතය ඇති කිරීම සඳහා මේක සඳහන් කරලා තියෙනවා කියලා තමයි මම කියන්නේ.

ප : Explanations?

පි : Explanations Add කරලා තියෙනවා. මේක මුල් කුරානයේ නැති දෙයක්. මම ගාව කුරාන් දෙකක් තියෙනවා.

ප : ඔබට පුළුවන්ද ගරු කොමිෂන් සභාවට ඒ අදාළ ලේඛන, ඒ පොත්පත් පෙන්වලා ඔබ කියන කරුණු තහවුරු කරන්න?

පි : ඔව් පුළුවන්.

ප : මම පිළිගන්නවා ඔබ කියන්නේ දැන් මේ අර්ථ දැක්වීමේ තමයි මේ කරුණු අන්තර්ගතයි කියලා නේ?

පි : ඔව්. 140 කියලා සඳහන් කරලා තියෙන ඒ රතු පාටින් ....,

ප : 71 වෙනි පිටුවේ 140 කියන ඒ පාද සටහන තමයි මෙහි පැහැදිලි කරලා තියෙන්නේ අනු ප්‍රභේද විදියට ජීහාද්වල?

පි : ඔව්.

ප : හොඳයි. එහෙනම් ඔබ කියන ආකාරයට මේක මුල් කුරානයේ නැත්නම් ඔබ ළඟ ඊට අදාළ ලේඛන තිබෙනවා නම් කරුණාකරලා ඉදිරිපත් කරන්න?

****

<u>ගරු අදිකාරි මැතිණිය .</u>

ප : ඔය කුරාන් එක අර සෞදි අරාබියන් කුරාන් එක Translate කරලද තියෙන්නේ? සෞදි අරාබියාවේ තියෙන ඉස්ලාම්....?

පි : Arabic Quranis only one.

ප : නැහැ. ඒක Translation එකක්ද ඔය?

පි : Both are the Arabics are same only the translations different and to that something they have added.මේක මේ වැඩිපුර මෙතන සඳහන් කරලා තියෙන්නේ. මේක Translation එකේ නැහැ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය.</u>

ප : මේ ඔක්කොම That page පිටුව 72, C-138(h)?

පි : 218 යටතේ එවැනි දෙයක් සඳහන් වෙලා නැහැ.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : **218,** දැන් අර C-138 කුමක් යටතේද ඒක එන්නේ?

පි : දෙවෙනි කොටසේ **218** වැනි වැකියට තිබූ විග්‍රහය තමයි ඒක වෙලා තියෙන්නේ **138** ලේඛනය. ඒ කුරාන් එකට අදාළ කුරාන් වැකිය **218** වැනි කුරාන් වැකිය.

ප්‍ර : දැන් මේ ඔබ ළඟ තිබෙන පරිශුද්ධ වූ අල්කුරාන් අර්ථය සිංහල භාෂාවෙන් තිබෙන පොතෙහි පාද සටහන් තියෙනවද?

පි : සිංහල ....,

ප්‍ර : Are there footnotes in the book now that you are referring to?

පි : No.

ප්‍ර : So then you can't expect any interpretation on that here noh?

පි : Yes this is not in the translation that's what I say it this is not in the translation the ones who made the translation have added this one.

ප්‍ර : They interpret?

පි : They interpret..

ප්‍ර : That your position.

පි : Yes, because at the beginning I said it that they make the translation and interpretations according to whom they are targeting. So since this one is in Sinhalese they try to make the understanding that Jihad is not a dangerous thing, amount those who are reading the book in Sinhalese. So if in case if we are able to find an Urdu translation made in Pakistan in a Muslim majority country it would have been totally different than what it is we see in Sinhalese.

ප්‍ර : In tamil?

පි : In tamil it will be in between where they are the author or the team of translators who they are target group, it depends this foot notes.

ප්‍ර : So the other book that you are referring to does it have foot notes?

පි : It's by Marbathuge Pitcarl it doesn't have a foot note but is the translation nothing mentioned here. Even online quran.com has the foot notes so I don't think that we will

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

find the same kind of foot notes in Quran translations.Because this is specially made for the Sinhala readers. For example like if we take the word cricket what we understand is a sport.

ප්‍ර : Mmmm.

පි : But it also refers to a kind of insect.

ප්‍ර : Yes.

පි : But general understanding of the word cricket is a sport in Sri Lanka. Among the Muslims Jihad is an understanding what I meant.

ප්‍ර : No foot note you can read..

පි : Those who believe and those who emigrate to escape the prosecution and strive in the way of Allah those have hope of Allah mercy Allah is forgiving merciful. This is only mentioned here in the translation.

ප්‍ර : C 138 what does it's say?ඕකේ මොකක්ද තියෙන්නේ ඒ අපි ලකුණු කළ 72 පිටුවේ?

පි : 218 සැබැවින්ම විශ්වාසය කළවුන්ද, හිජරත් කර අල්ලාහ්ගේ මාර්ගයෙහි ජිහාද් කළවුන්ද ඔවුහුමය අල්ලාහ්ගේ කරුණාව බලාපොරොත්තු වන්නෝ. තවද අල්ලාහ් ක්ෂමාශීලීය, කරුණාබරිතය. මෙතන අදහස් වෙලා තියෙන්නේ නබිතුමා මක්කම ඉඳලා මදීනාවලට ගියාට පස්සේ හිජරත් කියන ඒ වචනයෙන් සඳහන් වන්නේ මක්කම ඉඳලා මදීනාවලට යන එක. මදීනාවලට ගියාට පස්සේ එතුමා යුද්ධ කරන්න පටන් ගන්නවා. ඒක සාධාරණීකරනය කිරීම සඳහා තමයි මේ වචනය, වැකිය පළවෙලා තියෙනවා. ඒකට මෙතන දීලා තියෙන අර්ථකථනය වෙනස්. මදීනාවලට ගියාට පස්සේ හිජරත් කියන වචනයෙන් සඳහන් වෙන්නේ මක්කම ඉඳලා මදීනාවලට යන එක. මදීනාවලට ගියාට පස්සේ තමයි මම කලින් සඳහන් කළා වගේ එතුමා යුද්ධ කරන්න පටන් ගන්නේ. හමුදාවක් හදන්නේ, යුද්ධ කරන්නේ, මංකොල්ල, වහල් ව්‍යාපාරය හැමදේම පටන් ගන්නේ. එතකොට ඒක තමයි මෙතනින් සඳහන් කරලා තියෙන්නේ. හිජරත් එකේ පසුව වෙන්නේ ඒක තමයි. ඒ වුණාට මෙතන මේ Foot note එකෙන් තමයි ඒක වෙනස් කරලා තියෙන්නේ ඒක නෙමෙයි අර්ථය කියන මතය දෙන්න හදලා තියෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඉස්මත් මහත්මයා දැන් මට ප්‍රශ්න වගයක් තියෙනවා. දැන් ඔබ කියනවා කුරාන්හි ප්‍රචණ්ඩත්වය පිළිබඳව සඳහන් කරනවාය කියලා. ඔබ කියනවා හදීෂ්, විවිධ රචකයින් විසින් පිළියෙල කරන ලද හදීෂ් ග්‍රන්ථවල නබිතුමා විසින් සිදු කරන ලද යම් ක්‍රියාකාරකම් ලේඛනගත කරලා තියෙනවා. ඒවායිනුත් ප්‍රචණ්ඩත්වය පිළිබඳව කරුණු සඳහන් වෙනවාය කියලා. ඉතිං මේ කරුණු මුස්ලිම් ජාතිකයින් ඒ කියන්නේ ඉස්ලාම් භක්තිකයින් විසින් පරිහරණය කරන පොත්වල නේද මේක සඳහන් වෙන්නේ. ඒ කියන්නේ කුර්ආන් කියන්නේ හදීෂ් කියන පොත්පත් ඉස්ලාම් භක්තිකයින් විසින් කියවනු ලබන, පරිහරණය කරන ලේඛන නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට එහෙම නම් ඔබ කියන තරමට ඕවැයේ ප්‍රචණ්ඩත්වය අඩංගු වෙනවා නම් මේ අපේ සමාජයේ ඉන්න මේ ලෝකයේ ඉන්න හැම මුස්ලිම් පුද්ගලයෙක්ම ඉස්ලාම් භක්තිකයෙක්ම ප්‍රචණ්ඩත්වය පදනම් කරගෙන ඒ මතම කටයුතු කරන ප්‍රචණ්ඩකාරී පුද්ගලයින් වෙන්න ඕනනේ. නමුත් ඒ පිළිබඳව අපිට හැම මුස්ලිම් පුද්ගලයෙක් ගැනම කියන්න බැහැ නේද?

පි : සාමාන්‍යයෙන් There is a saying among atheists is Muslims are better than Islam.

ප්‍ර : ඇයි ඔබ එහෙම කියන්නේ?

පි : සාමාන්‍යයෙන් අපිට පොඩි දෙයක් කියන්න පුළුවන්. සංගීතය, Music ඉස්ලාම් ආගමේ තහනම් කරලා තියෙනවා.

ප්‍ර : ඇයි ඒ?

පි : මත්පැන් බීම ඉස්ලාම් ආගමේ තහනම් කරලා තියෙනවා.

ප්‍ර : නිලාර් එම් කාසිම් මහත්මයා සින්දු ලියනවා නේද?

පි : ඔව්. මම එතනට එනවා. ඒවා තහනම් කරලා තියෙනවා. තිබුණාට මුස්ලිම් අයත් සාමාන්‍යයෙන් අනිත් මිනිස්සු වගේ ජීවත් වෙන්න, ජීවිතය භුක්ති විඳින්න, සතුටින් ඉන්න කැමති මිනිස්සු. ඒ හින්දා ගොඩාක් අය ආගම ගැන ලොකුවට ඔළුවට අරන් ඒකේ කියලා තියෙන දේවල් සියයට සීයක් කරන්න හදන්නේ නැහැ. නමුත් යම්කිසි පුද්ගලයෙක් මේ මොහොමඩ් නබිතුමා ගැන ඕනවට වැඩිය ආදරේ ඇති කරලා, ආගමේ හරියට, හරි මාර්ගයේ යන්න ඕන කියන මතයට ආවට පස්සේ ඒ ගමන යන්න පටන් ගන්නවා. එතනින් තමයි ප්‍රශ්න එන්න පටන් ගන්නේ. සාමාන්‍ය ජීවිතේ ගත කරගෙන ඉන්නකොට ඒ ප්‍රශ්න එන්නේ නැහැ. මේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

රටේ ගත්තොත් 1980 ට කලින් බැලුවොත් මුස්ලිම් අය විසින් අන්තවාදය හෝ නැත්නම් එවැනි දේවල් ගොඩාක් අඩුයි. එක හේතුවක් තමයි අරාබි භාෂාව මුස්ලිම් අය දන්නේ නැහැ. මේ කුරාන් හා හදීෂ්වල පරිවර්ථනය එතරම් දුරට තිබුණේ නැහැ. කියවලා බලලා තිබ්බේ නැහැ.

ප : නමුත් මද්‍රසා පාසල්වල අරාබි භාෂාව උගන්නනවා නේද?

පි : ඔව්. මද්‍රසා පාසල්වල ඉගැන්නුවාට ඒ මවුලවීලා ඇවිල්ලා හැමදේම මේ සමාජයට උගැන්නුවේ නැහැ. ඒ වුණාට ඒ කුරාන් හදීෂ් පොත් මුස්ලිම් මිනිස්සු අතර තිබුණා. ඊට පස්සේ තමයි අර වහාබ්වාදය නමින් හඳුන්වන දෙයක් ලංකාවට එනවා.

ප : මොකද්ද වහාබ්වාදය කියන්නේ?

පි : සෞදි අරාබිවලින් එන කුරාන් හදීෂ් එකේ තියෙන විදියට ශුද්ධ වූ විදියට ඉස්ලාම් ආගම අපි පිළිපදින්න ඕනෙයි කියන මතය. ඒ විදියට යන්න ඕන කියලා. එතකොට ඒ කට්ටිය, ඒ වහාබ්වාදය ලංකාවට එනකොට අළුතින් කිසිම පොතක් අරන් එන්නේ නැහැ. ඒගොල්ලන් මුස්ලිම් අතර ලංකාවේ එවෙලේම තිබිච්ච කුරාන්, බුහාරි, මුස්ලිම් යන පොත්වල මොනවද අරාබි භාෂාවල කියලා තියෙන්නේ කියන එක පරිවර්ථනය කරලා දුන්නා විතරයි. ඊට පස්සේ තමයි ඒගොල්ලන්ට ශක්තිමත් විදියට මුස්ලිම් සමාජය ඇතුළට ව්‍යාප්ත වෙන්න පුළුවන් වුණේ. They were able to rooted inside the Muslim community. Because the Muslims already had these books they did not read. Even most of the Muslims study only the Makkah life of Mohomed Prophet Mohammed and they really love him and they think he is a real good example and he is good human. Yes I also agree that when he was Makkah he is as good as what we know about Lord Buddha or Jesus Christ. But after go in to Medina only he starts his violence and everything like what we can call terrorism. So he start after going to Madina. But normally the Sri Lankan parents study this his Makkah life. So by studying that one they also think that their children also follow the same way and we will be peaceful, most of the Muslims that they say Islam is peaceful because most of the Muslims I don't say not everybody, most of the people say the Islam is peaceful because they don't try to hide anything. ඒගොල්ලන් දෙයක්

FAIR COMMENT BY JEZEEM

හංගන්න හදන්නේ නෑ. ඒගොල්ලන් දන්න දේ එච්චරයි. But ඒක පොඩ්ඩක් ගැඹුරට ඉගෙන ගන්න යන තරුණයෝ නැත්නම් මවුලවීලා තමයි මේ අනිත් පැත්ත දකින්නේ.Once they are understanding that the violent part already they are brain washed and they are in a mentality that whatever Prophet Mohammed has done, said it and permitted we should be do. We should also do the same.

ප : ඔබ කියන්නේ එවැනි තරුණයින් මේ පොත්පත්වල සඳහන් ප්‍රචණ්ඩකාරී ක්‍රියා ඇයි මේක නබිතුමා කරලා තියෙන්නේ ඒ පිළිබඳව සහ කුරාන්වල ඒ කියන්නේ දෙවියන්ගෙන් පහළ වූ ග්‍රන්ථයක්නේ ඒක. එහි සඳහන් ප්‍රචණ්ඩත්වය ඔබ කියන ආකාරයට පිළිබඳව සඳහන් වෙනවා නම් ඇයි මේ වගේ දේශනා කරලා තියෙන්නේ කියන එක පිළිබඳව ප්‍රශ්න කරන්නේ නැද්ද? සාමාන්‍ය ජන ජීවිතයට හානියක් නේද ඒකෙන්. එතකොට ඒ පිළිබඳව ප්‍රශ්න කරන්න ඕන නැද්ද. ඒ අය ප්‍රශ්න කරන්නේ නැද්ද?

පි : භක්තිය වැඩි වෙනකොට ඒ හැමදේම දෙවියන් වහන්සේගෙන් ආපු එක කියන මේක තමයි හරි මාර්ගය අපිට තියෙන ජීවිතය මේ ජීවිතය නෙමෙයි. මරණයෙන් පස්සේ ජීවිතය තමයි කියන එකයි. තව දෙයක් තමයි අපේ මොලයට දාන දේ මේ ලෝකයේ හැම වරදටම දඩුවමක් දෙන්න බැහැ. මේක නිකම් ඔය Testing එකක් විතරයි. මෙහේ එක්කෙනෙක් අසාධාරණයට ලක් වෙනවා වගේ අපිට පෙනුණාට ඒ හැම දේටම සාධාරණය ඉටු කරන්නේ The day of judgment අවසාන දිනයේ by god කියන මතය තියෙන හින්දා. මේක වැරදියි කියලා හිතුනට ඒගොල්ලන් තමන්ගේ හිත හරි ගස්සගන්නවා අපිට වඩා දෙවියන් දන්නවා. ඒ හින්දා මම මේක කරන්නේ දෙවියන් වෙනුවෙන්. මට මේක වැරදියි වාගේ හිතුණට දෙවියන් මේක හරියි කියලා, කියලා තියෙනවායි කියලා. ඒකට දැන් අපි ඊබ්‍රාහිම් කියන නබිතුමා ගැන අපි කලින් කථා කළා. එතුමාගේම ජීවිතයම කුරානයේ සඳහන් වෙලා, හදීෂ්වල සඳහන් වෙලා තවම හජ්ජි උත්සවයේදී හැම හජ්ජි එකට යන අවුරුද්දට මම හිතන විදියට ලක්ෂ 24 ක් 25 ක් නැත්නම් ලක්ෂ 30 ක් වැනි මුස්ලිම් ජනයා යනවා. ඒ හැම එක්කෙනාම කරන එක ක්‍රියාවක් තමයි සත්තු ඝාතනය කරනවා. ඒ සත්තු sacrificing the animal ඇයි ඒක කරනවා කියලා කිව්වොත් ඒ මේ ඊබ්‍රාහිම් කියන නබිතුමා හීනයක් දකිනවා එයාට ඉන්න එකම පුතා. ඒ

පුතාට ගොඩක් ආදරෙයි. ඒ පුතාව බෙල්ල කපලා, බෙලි කපලා මරා දමන ලෙස හිනයක් දකිනවා. එයා හිතනවා මේක හීනයක් කියලා. ඊට පස්සේ එයාට තහවුරු වෙනවා නැහැ මේක අල්ලාහ් දෙවියන් මට දීපු පණිවිඩය කියලා. දවස් තුනකට පස්සේ තුන් වතාවක් මෙයාට ඒ පණිවිඩය එනවා. තමන්ගේ පුතාව බෙලි කපලා මරලා දාන්න කියලා. අල්ලාහ් වෙනුවෙන්, දෙවියෝ වෙනුවෙන් පරිත්‍යාග කරන්න කියලා. එතකොට පුතාව අරන් යනවා බිරිඳටත් කියන්නේ නැතුව බෙල්ල කපලා මරා දාන්න. බෙල්ල කපන්න හදනවා පිහියෙන්. බෙල්ල කැපෙන්නේ නැහැ. ඒ වෙනුවට අල්ලාහ් දෙවියන් Goats, Goats කියන්නේ ...,

ප්‍ර : එළුවෙක්.

පි : එළුවෙක් යවලා ඒක කපන්න කියලා මෙතුමාට කියනවා ඔබ මං වෙනුවෙන් ඔබගේ පුතාවත් කපන තරමට ගියා කියන්නේ ඔබ හොඳ භක්තිකයෙක් කියලා එයාට එයාව phrasing Ibrahim for his faith එතකොට මේ mentality එක ළමයිට ආවට පස්සේ මේ mentality එක මුස්ලිම් තරුණයෙකුට ආවට පස්සේ what they will think about killing others or whatever this they are not going to think about anything else. If it is justified it is in Quran and Hadiths . so this is what this is one of the main reasonthat I really wanted to come here, because this April blast is only just a small window what has been cooking for all these years inside.So as long as these roots are there any time a new terrorist can come. You don'tneed to have any external push, even the mentality will be there. That's what I say right and wrong. සාධාරණය හා අසාධාරණය ඉස්ලාම් දකින එකයි, ලෝකයේ අපි අනිත් කට්ටිය දකින එකයි ගොඩක් වෙනස් කියලා. Like a slavery , marrying a underage girl is a good thing a permitted thing in Islam. Slavery is something that we can't accept at all. It's really inhuman. But Islam says it is.

දැන් වේලාව :ප.ව. 5.10

මෙතැන් සිට සටහන් කළේ : චන්දිමා මෙනවිය.

FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව.5.10
පෙර සටහන් :ල/ලේ මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට සිට:ල/ලේ චන්දිමා දිල්හානි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඉමාම් ඉඹුනු තායිමියා . ඔහු මොනවාද මේ තමන්ගේ ජීවිතය පුජා කිරිම ගැන ආගම වෙනුවෙන් ජීවිතය පූජාකිරීම ගැන කියලා තියෙන්නේ?

පි: ජියාත් ගැන ඉඹුනු තයිමිය කියන්නේ ඉපැරණි හැම එක්කෙනා විසින්ම පිළිගන්නා ගොඩාක් අය සූෆී මුස්ලිම් හැර අනෙක් අය විසින් ඉතා ප්‍රශංසා කරලා ඉතා උසස් මට්ටමින් තියලා පිලිගන්නා ලද විද්වතෙක් එතුමා ජිහාත් ගැනත් සඳහන් කරලා තියෙනවා.

ප්‍ර: මොනවාද එතුමා කියලා තියෙන්නේ?

පි: එතුමාගේ ජීවිතයේත් එතුමා ජිහාත් කරලා තියෙනවා ජිහාත් කරන එකෙන් යුද්ධ කරන එකෙන් එතුමාගේ writings translation එකක් මම ඉදිරිපත් කරලා තියෙනවා එතනින් කොහේවත් සඳහන් වෙලා නෑ අනෙක් ජිහාත් පහ ගැන මේ යුද්ධ කිරිම ගැන තමයි ගොඩාක් ප්‍රශංසා කරලා තියෙන්නේ.

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: එයා ශ්‍රී ලංකන් කෙනෙක් ද?

පි: එයා අරාබි ජාතිකයෙක්

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඉස්මත් මහත්මයා මං ඔබට පෙන්වන ලේඛණය ඔබ මේ මේ ගරු කොමිෂන් සභාවේ විමර්ශන අංශයට භාරදුන්න ලේඛනයක්ද ?

පි: ඔව්.

ප්‍ර: ඒ ලේඛණය කුමන් කරුණකට අදාලවද ඔබ භාර දුන්නේ ?

පි: ජිහාත් යුද්ධය කිරිම සම්බන්ධයෙන්.

ප්‍ර: ඔබ කොහෙන්ද ඒක ලබා ගත්තේ?

පි: අන්තර්ජාලයෙන් මා ලබා ගත්තේ.

ප්‍ර : ඔබ මේ පුළුල් තීරයේ දැක්වෙන ලේඛණයද ඉමාම් ඉඹුනු තයිමියා විසින් රචිත ලේඛනය විදියට මෙම විමර්ශන අංශයට ලබා දුන්නේ?

පි: ඔව්.

එහි මුද්‍රිත පිටපතක් ස්වාමිනි අවසර අයැද සිටිනවා **C332** වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එම C332 වශයෙන් ලකුණු කරන ලද ලේඛනයේ ජීහාදය අනුමත කිරීම මෙම රචකයා විසින් සිදු කරලා තියෙන්නේ ඒ ලේඛණයේ කුමන ස්ථානයක ද කියලා ඔබට මේ ගරු කොමිසන් සභාවට පෙන්නුම් කරන්නට පුළුවන්ද ?

පි: ඔව්.

ප්‍ර: කුමන කුමන ස්ථානවලද ඒ පිළිබඳව සඳහන් වෙන්නේ?

පි: තුන්වෙනි පිටුවේ **first paragraph** එකේ ඉංග්‍රිසි බසින් ඇති ලේඛනයක් සාක්ෂිකරු විසින් කියවයි

ප්‍ර: ඒ කියන්නේ මෙම රචකයා විසින් සුරාත් අල් බකාර් කියන හදිස් වලින් තමයි?

පි: කුරාන් වැකියේ උපුටා දක්වලා ඒ රචිකයා සඳහන් කරලා තියෙනවා නබි තුමාගේ පණිවිඩය ඉස්ලාම් ආගම ගැන පණිවිඩය කාට හරි ගිහිල්ලා එයාලා ඒක පිළිගත්තේ නැත්නම් ඒයාලාට විරුද්ධව යුද්ධ කිරීම අනිවාර්යයි කියලා .

ස්වාමිනි එම ඡේදය **C332 A** වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ගරු කොමිෂන් සභාව ප.ව.5.45 රැස්වේ.

දැන්වේලාව : ප.ව.5.55
සටහන් කිරීම: ල/ලේ චන්දිමා දිල්හානි.

නැවත කොමිෂන් සභාව රැස්වේ.
සාක්ෂිකකරු ප්‍රතිඥා දී නැවත කැඳවයි.
මා කියන සාක්ෂිය සැබෑය. සැබෑවක් මිස අන් කිසිවක් නොකියන බවට ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති අයේෂා ජීනසේන මෙනවිය</u>

ප්‍ර: ඉස්මත් මහත්මයා කෙටි විවේකයට පෙර මා ඔබේ අවධානය යොමු කරා ලේඛණයකට නේද?

පි: ඔව්.

ප්‍ර: එම ලේඛණය කොයි විදියටද එහි මාතෘකාව සඳහන් වෙන්නේ page 164?

පි: අනාගමික මිනිසුන් ඉස්ලාම් ආගම වැළඳ ගන්නකම් till they accept Islam fighting against them.

ප්‍ර: ඒ කියන්නේ මේ මුළු සමස්ථ පෘතුවියේම ඉන්න මිනිස්සු ඉස්ලාම් ආගම වැළඳ ගත යුතුයි කියන එකද මුස්ලිම් අයගේ මතය වන්නේ ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඉස්ලාම් ආගමේ මතය වන්නේ.

ප්‍ර: ඒක ගැන කියලා තියෙන්නේ කොහේද ?

පි: සහියර් මුස්ලිම් එකේ තැන් කීපයකම කියලා තියෙනවා but මේක තහවුරු කිරීම සඳහා සහියර් මුස්ලිම් එකේ හදිස් එකත් මම ඉදිරිපත් කරලා තියෙනවා මුස්ලිම් ග්‍රන්ථයේ.

ප්‍ර: ඔබ මේ පුළුල් තිරයේ දැක්වෙන සුනාන් . COM කියන වෙබ් අඩවියෙන්ද ලබා ගත්තේ මා ඔබට පෙන්වා සිටින මේ ලේඛනය?

පි: මේ හදීස් එක මං කලින් ඉගෙන ගත්ත එකක් මෙතන ඉදිරිපත් කිරීම සඳහා ඉහත සඳහන් කරපු වෙබ් අඩවියෙන් තමයි මං ලබා ගත්තේ.

ස්වාමිනි අවසර ඉල්ලා සිටිනවා මේ fighting against **the people till they accept Islam** කියන ශීර්ෂය යටතේ සාක්ෂිකරු විසින් ලබාගෙන තිබෙන මෙම හදිස් සහීර් මුස්ලිම් 22 ශීර්ෂයේ පලවෙනි පොතේ 36 වෙනි හදීස් එක සඳහන් මෙම පත්‍රිකාව C333 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා

****

<u>ගරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර: දැන් ඔබ අතේ තියෙනවානේ කුරානයක් ඒ කුරානයේ ජිහාත් කියන එක යටතේ ඔය කියන එක තියෙනවාද සඳහන් වෙනවාද? එය අතේ තියෙන ශුද්ධ වූ කුරානයේ ජිහාත් කියලා එකක් සඳහන් වෙනවානේ ජිහාදය?

පි: ජිහාත් කියලා තනි පරිච්ඡේදයක් නැත්නම් තනි සුරා එකක් නෑ තැන් තැන් වල ඒක සඳහන් වෙනවා හැබැයි මේ කරුණු කෙලින්ම කුරාන් එකේ සඳහන් වෙන්නේ නෑ මේක හදිස් එකේ තමයි තියෙන්නේ.

ප්‍ර: දැන් ඔබ මේ ජමෙයිතුල් උලමාවරුන්ගේ සිංහල කුරානයේ 72 පිටුවේ තියෙනවානේ අර මෙතුමිය අහනකොට පහක් අනූ ප්‍රබේදයන් ඒවා නෑ ඔබ අතේ තියෙන කුරානයේ තියෙන්නේ ඊට වඩා දරුණු ආකාරයේ ජිහාදයක් කියලා කිව්වානේ මගේ ප්‍රශ්නය ඔබ අතේ තියෙන කුරානයේ තියෙන ජිහාත් එකේ මේ තියෙන දේත් තියෙනවාද?

පි: මම කලින් අදහස් කරපු එක පොඩ්ඩක් පැහැදිලි කෙරුවොත් කුරාන් එකේ ජිහාත් කියන වැකිය වචනය තියෙනවා. තිබුනාට ඒකෙන් අදහස් වෙන්නේ මොකද කියලා කියලා නෑ.සාමාන්‍යයෙන් ජිහාත් කියන එකෙන් හැම මුස්ලිම් එක්කෙනාම ඉස්ලාම් ආගමේ පිළිපදින හැම එක්කෙනාම තේරුම් ගන්න දෙයක් තමයි ආගම වෙනුවෙන් කරන්නා වූ ශුද්ධ වූ යුද්ධය කියන එක ඒක ඒ අර්ථය නෙමේ කියලා පෙන්වන්න ඒකට වෙන වෙන අර්ථ තියෙනවා කුරාන් එකේ ඒකේන් වෙන අර්ථයක් තමයි කියලා තියෙන්නේ මේකේ ප්‍රචන්ඩකාරී වැකියක් නෑ කියලා යම්

FAIR COMMENT BY JEZEEM

කිසි විදියකට on a rounder way method පෙන්වන්න තමයි මෙතන මේ පහක් සදහන් කරලා තියෙන්නේ නැතිව මේක කුරානයේ සදහන් කරපු එකක් නෙමේ ඒකතමයි මම කලිනුත් සදහන් කරේ අර මම පෙන්වපු කුරාන් දෙකේමත් වෙන කුරාන්වලවලත් මේක සදහන් වෙලා නෑ මේක ලංකාවේ ඉන්න සිංහල භාෂාව දන්න මිනිස්සුන්ව ටාගට් කරගෙන මේක ගහපු හින්දා මේක යම්කිසි මට්ටමක අර ජිහාත් කියන වැකියේ තියෙන බරපතල කම අඩු කරන්න යම් කිසි උත්සාහයක් දරලා තියෙනවා මේක මේ ප්‍රචන්ඩකාරී දෙයක් නෑ කියන එක පෙන්වලා තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබ මේ කියන්නේ C 138

පි: ජමෙයිතුල් උලමාවරුන්ගේ.

ප්‍ර: C 138 ට?

පි: ඔව්

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: නමුත් ඔබගේ කොළපාට කුරානයක් ඔබ ලග තියෙනවානේ ඒ කුරානයේ මට මතකයක් තියෙනවා ඔබ මේ කොමිෂම ඉදිරියේ ප්‍රකාශ කරා කියලා හිජ්වත් කරලා කරන ජිහාත් එකක් සහ කියලා මට තේරුණ හැටියට අර offensive and defensive කියන ජිහාතයක් කරන්න පුළුවන් කියලා මේ කුරානයේ තියෙනවා කියලා ඔබ ප්‍රකාශ කල බව මේ කොළ පාට ඔබ අතේ තියෙන

පි: හිජ්රත් එකට පස්සේ තමයි මෙතන මේ සදහන් වෙන්නේ හිජ්රත් එකට පස්සේ සිදු වන දේ ගැන හිජ්ත් එකට කියන්නේ මොහොමඩ් නබි තුමා අර අවුරුදු 53 දී මක්කම හැර මදිනා වලට යාම ඒ සිද්ධියට තමයි හිජ්ජත් කියලා කියන්නේ ඉස්ලාම් වර්ෂය අර කිස්තු වර්ෂ 2020 වගේ ඉස්ලාමිය වර්ෂ එක්දහස් හාරසිය ගනන් දැනට යන්නේ ඒක ගණන් කිරිම පවා ගත්තේ හිජ්රත් කියන සිද්ධිය මත තමයි. කිස්තු වර්ෂ ජේසුස් වහන්සේගේ උපත ලැබිච්ච වෙලාවේ පටන් ගත්තා වගේ ඉස්ලාම් ආගම මොහොමඩ් නබිතුමාගේ උපත ලැබිච්ච වේලාවේ ඉදලවත් කාලයේ ඉදලවත් එතුමා නබි කෙනෙක් හැටියට දේව දූතයෙක් හැටියට තමාව ප්‍රකාශ කරපු වෙලාවේ ඉදලවත් පටන් ගන්නේ නෑ. ඒක පටන් ගන්නේ මදිනා වලට ගියාට පස්සේ මොකද ඒ ගොල්ලන් ඒක හදපු අයත් ගොඩාක් solid වෙලා හිටියා ඉස්ලාම් එක සම්පූර්ණ බලයට ආවේ මදිනා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වලට ගියාට පස්සේ කියලා ඒ හින්දා එතන ඉදලා තමයි හිජ්ජත් පටන් ගත්තේ ඉස්ලාමිය කැලැන්ඩර් එක counting of the year so . හිජ්ජාත් එකට ගියාට පස්සේ තමයි මොහොමඩ් නබි තුමා ජීහාත් වලට යොමු වෙන්නේ එතකොට මෙතන කියලා තියෙන ජීහාත් 05 ඒතන අදාළ වෙනවා නම් අදාල වෙනවානම් මේ ජීහාත් ටික මක්කම ඉන්න කාලේත් වලංගු වුනා තමාගේ හිත පාලනය කරන එක දිවෙන් අනිත් අයව ,කරන එක, ලිපි වලින් මේවා කරන එක ඒවා එතනත් වලංගු වෙනවා මේ කරුණු මේක ජීහාත් නෙමේ මේ කරුණු වලංගු වෙනවා ඒ වුනාට ඇයි එක හිජ්ජත් කියන වචනයට පපස්සේ තමයි මදිනා වලට ගියා ට පස්සේ තමයි එතුමාට හමුදාවක් හදලා යුද්ධ කරන්න මං කොල්ල කරන්න මිනිමැරුම් ඒ ගොල්ලන්ට ඒ වගේ දේවල් කරන්න පුළුවන් වේලා තියෙනවා කියලා. ඒ හින්දා එතනින් අදහස් වෙන්නේ ඒක තමයි ඒ හින්දා මේ කුරාන් වල මේක නෑ මේක ලංකාව පදනම් කරගෙන සිංහල පාඨකයෝ ඉලක්ක කරගෙන ගහපු හින්දා එතන එහෙම බරපතල තාවයක් නෑ කියලා පෙන්වන්න හදපු හින්දා තමයි මේ විදියට කරුණු පහක් සඳහන් කරලා තියෙන්නේ මේකේ translation එකේ නෑ මේක explanation එකේ තමයි තියෙන්නේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය</u>

ප්‍ර: මේ ඉස්ලාම් ආගම වැළඳ ගන්නේ නැති අය ඉන්නවානම් ඉස්ලාම් ආගමේ කියනවාද ඒ අයට මොකක්ද කරන්න ඕනේ කියලා? ඒක එකක් දෙවනි එක ඉස්ලාම් ආගම වැලඳ ගෙන ඉදලා ඒක අතහැරලා යනවානම් කවුරු හරි ඒ අයට කරන්න ඕනේ මොකක්ද කියන එක පිළිබඳව ඉස්ලාම් ධර්මයේ සඳහන් වෙනවාද?

පි: පළවෙනි කාරණය සම්බන්ධයෙන් පොඩි මතභේදයක් තියෙනවා .

ප්‍ර: ඒ කියන්නේ ඉස්ලාම් ආගම කවුරුහරි වැළදගන්නේ නැත්නම්.

පි: ඒ ගැන පොඩි මත බේදයක් තියෙනවා .

ප්‍ර: මොකක්ද ඒ?

පි: සමහර විද්වතුන් කියනවා ඒ ගොල්ලන්ට ඒ ගොල්ලන්ගේ පාඩුවේ ඉන්න අපි දෙන්න ඕනේ අපිට ප්‍රශ්නයක් නෑ කියලා. සමහර විද්වතුන් කියනවා නෑ පිළිම වන්දනා කිරීම ඉස්ලාම් ආගමට ඒ කියන්නේ ලොව මවපු දෙවියන්වහන්සේව පිළි නොගැනීම ලොකු අපරාධයක් ඒක තමයි ලෝකයේ මනුශ්‍යයෙක් කරන්න පුළුවන් ලොකුම අපරාධය තමාව නිර්මානය කරපු දෙවියාව ප්‍රතික්ෂේප කරලා වෙනදේවල් වන්දනා කිරීම තමයි ලොකුම අපරාධය ඒ හින්දා ඒ ලොකුම අපරාධය කරන අයට විරුද්ධව අපි යුද්ධ කරන්න ඕනේ. කියලා ඒ ලොකුම අපරාධය ට

FAIR COMMENT BY JEZEEM

විරුද්ධව යුද්ධ කරන්න ඕනේ කියලා එතකොට එතන තමයි අර choice තුනම දෙන්නේ ගිහිල්ලා ඒ ගොල්ලන්ට ඉස්සරහම පණිවිඩය දෙනවා ඉස්ලාම් ආගම වැළඳගන්න කියලා වැළඳ ගත්තේ නැත්නම් ඒ ගොල්ලන්ට ඊළඟ chance එක දෙනවා අපිට යටත්වෙලා කප්පමක් ගෙවන්න ජීසියා නැමැති කප්පමක් ගෙවන්න කියලා ඒ දෙකටම අකමැති වුනොත් ඒ අයට විරුද්ධව යුද්ධ කරන්න ඕනේ. මට මතකේ හැටියට මේක සහරාන් පවා එක්තරා දේශනයක කියලා තිබුණා ෆේස් බුක් වල ඒ දවස්වල තිබුනා මා ඒ ගැන ඒ දවස්වලම පොලිසියට මේ ඊමේල් මාර්ගයෙන් දැනුම් දුන්නා. ඒකේත් එයා කියනවා ලෝකයේ මුස්ලිම් නොවන ජාති දෙකක් විතරයි ඉන්න පුළුවන් එකක් මුස්ලිම්වලට යටත් වෙච්ච කාෆිර්වරු අන්‍ය ආගමිකයෝ මුස්ලිම්වලට යටත්වෙච්ච කප්පම් ගෙවන ඒ කප්පන් ගෙවන එකටත් වචනයක් තියෙනවා තමා ලැජ්ජාවට පත්වෙලා ඒ ගොල්ලන්ගේ දන ගහලා.

ප්‍ර: මොනවා හින්දාද ලැජ්ජාවෙන්නේ?

පි: දන ගහලා ඒ කියන්නේ ලැජ්ජාව නෙමේ එතන හරියට වචනය ඇවිල්ලා දන ගහලා ඒ කියන්නේ යටත් වෙලා යටත් වෙලා කප්පමක් ගෙවන පිරිස නැත්නම් අපෙන් ප්‍රහාරයට ලක් විය යුතු පිරිස ඒ දෙක විතරයි ඉන්න පුළුවන් තුන්වෙනි එකට හොඳ මිනිස්සු සාමකාමී මිනිස්සු කියලා කොටසක් නෑ මුස්ලිම්වරු මේ කොටස් දෙකයි ඒ විතරයි ඉන්න පුළුවන් කියලා සහරාන් පවා කියලා තිබ්බා.දෙවනි ප්‍රශ්නය ඉස්ලාම් ආගම අතහරින කට්ටිය ගැන ඒක හදිස් වල සඳහන් කරලා තියෙනවා ඉස්ලාම් ආගම අතහැරියොත් මරා දැමිය යුතුයි කියලා .

ප්‍ර: මොන හදීස් එකේ ද තියෙන්නේ ඒක?

පි: බුහාරි එකේ තියෙනවා,මුස්ලිම් එකේ තියෙනවා.තව ග්‍රන්ථවලත් ඒ හදීස් ඇති මම මගේ ලේඛණවල කොහේ හරි ඒක ඉදිරිපත් කරලා ඇති ඒ හදීස් පාසල් පොතත් එක්ක ඉදිරිපත් කොට ඒක ඉදිරිපත් කරලා තියෙනවා.හදීස් වල සඳහන් වෙනවා තව අපි යුසුෆ් අල්කර්ලාවි ගැන කතා වුනා ජමාතේ ඉස්ලාමි ,ඉක්වානේ ඉස්ලාමින්,උස්තාත් මස්සූර් වැනි අය ලංකාවේ ගොඩාක් ප්‍රශංසා කරලා ගොඩාක් උසස් තත්ත්වයේ තියාගෙන ඒ වගේ දේවල් ගොඩාක් මේ කතා කරන එක්කෙනෙක් තමයි යූසුෆ් අල්කර්ලාවි ඒ යූසුෆ් අල්කර්ලාවි එක තැනක කියනවා රූපවාහිනී නාලිකාවකට කුරාන් වැකියක් සඳහන් කරලා කියනවා මේ කුරාන් වත් සඳහන් වෙන්නේ ඉස්ලාම් ආගම අතහරින කට්ටිය මරා දමන්න කියන එක තමයි සඳහන් වෙන්නේ කියලා ඒයා ඒක explain කරලා ඊට පස්සේ තව වචනයක් කියනවා ඉස්ලාම් ආගම අතහරින කට්ටිය මරාදමන්න ඕනේ කියන නීතිය නැතිවෙලා තිබුණොත් මේ වෙලාවට ඉස්ලාම්

FAIR COMMENT
BY JEZEEM

ආගමත් නැතිවෙලා ගිහින් ඇති කියලා කියනවා. ඒ translation එක්ක ඒ video clip එකත් ඉදිරිපත් කරලා තියෙනවා.

ස්වාමිනි සංයුක්ත තැටියක් පුළුල් තීරයේ පෙන්වා වාදනය කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>
අවසර ලබා දෙනවා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතීඥ අයේෂා ජනසේන මෙනවිය</u>

ප්‍ර: කවුද මේ තීරයේ දැක්වෙන්නේ කවුද ඉන්නේ?

පි: යුසුප් අල් කර්ලාවි

ප්‍ර: හොදයි වාදනය කරන්න යුසුප් අල්කල්රාවි මොකක්ද ඒකෙන් කියන්නේ ඒ ඉන්ටර්විව් එකේ?

පි: එයා එතනින් අදහස් කරන්නේ ඉස්ලාම් ආගම අතහැර යන කට්ටිය Apostates මරාදමන්න ඕන නිතිය තිබිලා නැත්නම් මොහොමඩ් නබි තුමාගේ මරණින් පස්සේ ඉස්ලාම් නැතිවෙලා ගිහින්ම ඇති ඒ නිතිය හින්දා තමයි ඉස්ලාම් ආගම මෙතෙක් කල් රදා පැවැත්වෙලා තියෙන්නේ. ඒ ගැන කුරාන් වැකියේ සඳහන් කරනවා අල්ලාහ් දෙවියන්ට හා නබි තුමාට විරුද්ධව යුද්ධ කරන්න නැත්නම් ඒක වචනය මට හරියට බලන්න වෙනවා සුරතුමා 5 වෙනි සූරා එකේ 33 වන වැකිය කියනවා ඒ වැකියේ සඳහන් කරන්නේ ඉස්ලාම් ආගම අතහැරලා යන කට්ටිය ගැන ඒ වැකියේ සඳහන් කරනවා එයාට විරුද්ධව යුද්ධ කරන්න කියලා ඒකේ සඳහන් වෙන්නේ මෙහෙයි කියලා ඊට පස්සේ එයා කියනවා හදීස් වලත් සඳහන් වෙලා තියෙනවා එකක් නෙමේ එකක් දෙදකක් නෙමේ ගොඩාක් හදීස් වල සඳහන් වෙලා තියෙනවා .ඉස්ලාම් ආගම අතහැරලා යන කට්ටිය මරා දැමිය යුතුයි කියලා තව කට්ටියක් කියනවා නබි තුමා කියලා තියෙනවා පුද්ගලයෝ තුන්දෙනෙක්ව මරන්න ඕනේ කියලා එකක් a life for a life second is adultery those who married engage in extra marital affair should be killed and the and the third is who leave the religion

ප්‍ර: ඔබ මේ සංයුක්ත තැටියට පටිගත කරගන්නා ලද ඒ සම්මුඛ සාකච්ඡාව කෙහෙන්ද ලබා ගත්තේ?

පි: you tube හරහා .

ප්‍ර: ඒ you tube එකේ තියෙනවාද දැන් ඒක?

පි: ඔව් තියෙනවා කියලා මම විශ්වාස කරනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: හොයාගන්න පුළුවන් වෙයිද ?

පි: පුළුවන් වෙයි This is a different video this is not the same video that I took. the content is some but the copy that I took is my copy. translation there is a small difference. maybe the duration there is a small difference. But it is al most same. the interview is the same.

ස්වාමිනි යුසුප් අල්කර්ලාවි විසින් පවතවනු ලැබූ සම්මුඛ සාකච්ඡාව අඩංගු සංයුක්ත තැටිය **C334** වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා

ප්‍ර: ඔබ දන්නවාද ඉන්දියාවේ ෆාරුක් කියලා කෙනෙක්ව?

පි: ඔව් මගේ ෆේස්බුක් සහ වට්ස්ඇප්වල මගේ මිත්‍රයෙක් හැටියට හිටියා.

ප්‍ර: ඔබ කොපමණ කලක් මුහුණු පොතේ සහ වට්ස්ඇප් ආශ්‍රයෙන් ඔහු සමඟ මිත්‍රකම පවත්වාගෙන ගියාද?

පි: මට හරියට කාලේ මතක නෑ. මොකද

ප්‍ර: ඔය මොන වකවානුවේද කියලා කියන්න පුළුවන්ද?

පි: **2016, 2017** වගේ වකවානුව තුළ

ප්‍ර: ඔහු දැනට ජීවතුන් අතර ඉන්නවාද?

පි: නෑ.

ප්‍ර: ඇයි නෑ කියලා කියන්නේ?

පි: එයාව ඝාතනය කළා. **2017** මාර්තු **16** වෙනිදා.

ප්‍ර: ඇයි ඒ?

පි: ඉස්ලාම් ආගම අතහැරපු හේතුව මත

ප්‍ර: ඔබ කොහොමද දන්නේ?

පි: දැනට මට ඉදිරිපත් කරන්න ඒ Screenshots නැහැ. එයාව ඝාතනයෙන් පස්සේ අන්අඩංගුවට ගනු ලබනවා මුනාෆ් කියන පුද්ගලයෙක්.

ප්‍ර: ඔව්.

පි: මම ඉස්සෙල්ලාම පටන් ගත්තොත් ඉස්සෙල්ලාම ලංකාවෙන් ඉස්ලාම් ආගමට එළියට ඇවිල්ලා Facebook හරහා ලියන්න පටන් ගන්නේ දෙමළෙන් ලියන්න පටන් ගන්නේ මම දන්න තරමට මම තමයි first වෙන කවුරුත් දැන ගෙන හිටියේ නෑ. අදත් මම open ලියන්න වෙන කවුරුත් දන්නේ නෑ. ඊට පස්සේ තමිල්නාඩුවේ, ඉන්දියාවේ තමිල්නාඩුවේ ඒගොල්ලො දෙමළ භාෂාව කතා කරන හින්දා එහෙම ඉස්ලාම් ආගම අතහැරලා face book එකේ ලියන කීප දෙනෙක් මම අඳුර ගත්තා. ඒ වුනාට ඒකෙන් කවුරුත් ඒගොල්ලොන්ගේ ඇත්ත නම් වලින් පෙනී හිටියේ නෑ. ඒ වුනාට මම ඇත්ත නමින් පෙනි සිටපු හින්ද

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ඒගොල්ලො මාව විශ්වාස කළා. අනිත් එක ඒගොල්ලො ගැනත් මම ගොඩාක් භය වුණේ නෑ. මොකද මම ඉන්න වෙනම රටක්. ඒගොල්ලො ඉන්නේ වෙනම රටක්. ඊට පස්සේ අපි අතර මිත්‍රශීලිත්වය ඇති වුණා. තොරතුරු හුවමාරු කරන්න අපි පටන් ගත්තා. ඊට පස්සේ අපි වට්ස්ඇප් group එකක් හදාගත්තා. ලංකාවේ මම විතරයි හිටියේ. ඉන්දියාවෙන් ඒකෙන් 20 ක් නැත්නම් 30 ටත් ප්‍රමාණයක් මට නම්බර් එක මතක නෑ. මම ඒකේ ඇඩ්මින් හිටියේ නෑ.

ප්‍ර: ඒ ඔක්කෝම මුස්ලිම් ජාතිකයෝද?

පි: මුස්ලිම් අය ඉස්ලාම් ආගම අතහැරපු අය හිටියා. සමහර ඒගොල්ලොන්ගේ ක්‍රිස්තියානි ආගම අතහැරපු ක්‍රිස්තියානි යාළුවා හින්දු ආගම අතහැරපු හින්දු යාළුවොත් හිටියා. ඒගොල්ලො සුළු ප්‍රමාණයක්. ගොඩාක්ම හිටියේ මුස්ලිම් අය. ඒ group එකේ තමා ෆාරුකුත් හිටියේ.

ප්‍ර: ඒ කියන්නේ නිරාගාමික කට්ටියගේ කණ්ඩායමක් මේක?

පි: නෑ ඒකේ පරමාර්ථය ඇවිල්ලා ඉස්ලාම් ආගම අතහැරපු මුස්ලිම් අයගේ group එකක්. මිත්‍රකම හා අපිට සහයෝගය දෙන හින්දා තමයි අපි ඉතා සුළු ප්‍රමාණයේ හින්දු ආගම අතහැරපු හා ක්‍රිස්තියානි ආගම අතහැරපු අය ඒකට එකතු කරලා හිටියා. ඒකේ තමයි ෆාරුක් සිටියේ. ඊට පස්සේ මුනාෆ් කියන පුද්ගලයෙක් ෆාරුක් එක්ක contact කරනවා. ෆාරුක්ව contact කරලා කියනවා තමාත් ඉස්ලාම් ආගම අතහැරලා ඉන්න බව. ෆාරුක් ඒක විශ්වාස කරනවා.

ප්‍ර: ඔබ කොහොමද දන්නේ ඔය කරුණු?

පි: ඒ group එකේ මම හිටපු හින්දා ඒ වගේම ඒ පොලිස් පරීක්ෂණ ගැන ඊට පස්සේ ෆාරුක්ගේ ඝාතනයට පස්සේ ඉන්දියාවේ CBCID එකෙන් මටත් කතා කරලා තිබ්බා. මම ඒ group එකේ හිටපු හින්දා. මුනාෆ් කියන පුද්ගලයා ෆාරුක්ව අඳුරන ගන්නවා.

ප්‍ර: ඔබ ප්‍රකාශයක් ලබා දුන්නාද ඒ අවස්ථාවේ ඉන්දියාවේ පොලිසියට?

පි: මගෙන් විස්තර ටිකක් ඇහුවා.

ප්‍ර: කවුද ඇහුවේ?

පි: නිලධාරීයෙක් ඇහුවා. calls දෙකක් විතර ආවා. මට තාම

ප්‍ර: කොහේන්ද ආවේ?

පි: ඉන්දියාවෙන්. එක නම්බර් එකක් මගේ phone එකේ ඇති. තාම ඇති. CBCID කියලා තමා මට හඳුන්වලා දුන්නේ. E-mail ID එකක් දුන්නා. ඒ වුනාට ඒගොල්ලන් අර

ප්‍ර: මොකක්ද CBCID කියන්නේ?

පි: This is the central Bureau of criminal Investigation Department I guess but ඒ ගොල්ලෝ බලාපොරොත්තුව ඒ නඩුව ඉදිරියට කරගෙන

FAIR COMMENT BY JEZEEM

සඳහා යන්න ඒගොල්ලො බලාපොරොත්තු වෙච්ච සාක්ෂි මං ළඟ තිබුණේ නැහැ. මොකද ඒගොල්ලො බලාපොරොත්තු වුණා.මම ගාව මොනවා හරි දෙයක් ඇති ඒ නඩුව ඉදිරියට අරන් යන්න පුළුවන් කියල. ශක්තිමක් සාක්ෂිය මම ගාව තිබ්බේ නැති හින්දා මගෙන් ප්‍රකාශයක් සඳහන් කළේ නෑ. ඒ මේ මුනාෆ් කියන පුද්ගලයා ඒ group එකට ඇතුල් වෙනවා තමාත් ඉස්ලාම් ආගම අතහැරපු එක්කෙනෙක් හැටියට. ඇවිල්ලා ඒ group එකේ ඉඳලා ටික දවසකින් පස්සේ එක්තරා දවසක් මාර්තු මාසේ 16 වෙනිදා 2017 ෆාරුක්ට කෝල් එකක් ගන්නවා. මම ඕගොල්ලොන්ගේ ගෙවල් ගාව පැත්තට ආවා මගේ බයික් එකේ. මොනවා හරි ලෙඩක් දෝෂයක් තියෙනවා කියලා පොඩ්ඩක් උදව් කරන්න කියලා 11 ට පමණ. ෆාරුක් ඒ වේලාවේ ගෙදරින් යනවා එයාගේ බයික් එකේ. ඊට පස්සේ ෆාරුක් ආපහු ආවේ නැහැ පණ පිටින්. එතනින් පස්දෙනෙක් වගේ එකතු වෙලා තමයි ෆාරුක්ව ඝාතනය කරන්නේ. කපා කොටා ඒ පිළිබඳව පින්තූර ටිකත් මම ඉදිරිපත් කරලා තිබෙනවා.

ප්‍ර: ඔබ කොහොමද ඒ තොරතුරු දැන ගත්තේ ඔක්කොම?

පි: තව තමිල්නාඩුවේ යාළුවෝ හිටියා. මේ ඝාතනය සිද්ධ වෙන්නේ කොයොම්බුතූර් නගරයේ. එහෙත් මේ තව යාළුවෙක් හිටියා. මුනාෆුත් එහේ හිටියා. ඝාතනය සිද්ධ වුනාට පස්සෙත් ෆාරුක්ගේ body එක මළ සිරුරත් සමඟත් මුනාෆ් Hospital එකේ ඉඳලා තියෙනවා. පොලිසියේ ඉඳලා තියෙනවා. පහුවදා තමයි පොලිසියට යම් කිසි නිගමනයට එන්න පුළුවන් වෙලා තියෙනවා. මෙයත් මේකට සම්බන්ධයි කියලා තමා අත්අඩංගුවට ගන්නේ. අත්අඩංගුවට ගත්තට පස්සේ මුනාෆ් තමයි ඒ ඝාතනය සැලසුම් කරලා තියෙන්නේ. තව පස් දෙනෙක් එක්ක එකතු වෙලා.

ප්‍ර: ඔබ කියන්නේ කෙටියෙන් කියනවා නම් ෆාරුක් ආගම අතහැර ගිය පුද්ගලයෙක් විදිහට පසු අවස්ථාවකදී ඔහු ඝාතනයට පත් වෙනවා කියලද?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔය ඔබ සඳහන් කරන මුනාෆ් ෆාරුක්ගේ ඝාතනය සිදු කළාය කියන මුනාෆ් එතකොට මුස්ලිම් භක්තිකයෙක්?

පි: මුස්ලිම් ජාතිකයෙක්.

ප්‍ර: ඉස්ලාම් ජාතිකයෙක්?

පි: ඉස්ලාම් භක්තිකයෙක්. ඉස්ලාම් අතහැරපු කෙනෙක් හැටියට රහපෑමක් කරලා ඒක අපිට කියනවා නම් තකියා කියන වචනයෙන් ඒක හඳුන්වනවා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: තකියා කියන්නේ මොකක්ද?

පි: රහපෑම. ආගම වෙනුවෙන් කරන රහපෑමක්. එහෙම දෙයක් කරලා තමයි ඒ group එකට ඇතුල් වෙන්නේ. ඇතුල් වෙලා තමයි ඒ ඝාතනය සිද්ධ කරන්නේ.

ප්‍ර: ඔබ කිව්වා මේ ගරු කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ෆාරුක්ට අදාළ ඡායාරූප ඔබ විසින් ලබා දුන්නාය කියලා?

පි: ඔව්.

ප්‍ර: ඒවා නැවත දැක්කොත් අඳුනන්න පුළුවන්ද?

පි: පුළුවන්.

ප්‍ර: මේ පෙන්වන ඡායාරූපයේ ඉන්නවා පොඩි ළමයි දෙන්නෙක්. තව වැඩිහිටි පිරිමි පුද්ගලයෙක්. ඔබ ඒ ඡායාරූපය ඔබ ලබා දුන්න එකක්ද?

පි: ඔව් මම ලබා දුන්න එකක්.

ප්‍ර: කවුද ඒ ඡායාරූපයේ පෙනී ඉන්නේ?

පි: ෆාරුක්. ෆාරුක්ගේ දුව අනාෆා, පුතා අෆ්රිත්

ප්‍ර: ඔබ වට්ස්ඇප් මාර්ගයෙන් ෆාරුක් සමඟ සම්බන්ධ වෙන කොට ඔහුගේ ඡායාරූප දැකලා තිබුණාද?

පි: ඔව් දැකලා තිබුණා. මම ළඟදී ඉන්දියාවට ගිය වේලාවෙත් ඒ ගොල්ලොන්ගේ ගෙදර ගිහින් ළමයි දෙන්නාත් හම්බ වෙලා ආවේ.

ප්‍ර: හම්බ වෙලා ආවේ?

පි: ඔව්.

ස්වාමිනි එහි මුද්‍රිත පිටපතක් අවසර අයැද සිටිනවා **IR 6** වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට ඒ කියන්නේ ෆාරුක් සහ ඔහුගේ දුවත් පුතත් පෙනී සිටින ඡායාරූපය.

ප්‍ර: තවත් ඡායාරූපයක් ඔබේ අවධානයට යොමු කරනවා ඒ ඡායරූපය සුදු කළු ඡායාරූපයක් නේද?

පි: ඔව්.

ප්‍ර: එහි ඉන්න වැඩිහිටි පුද්ගලයා සහ ඒ දරුවා කවුද කියන්න ඔබ දන්නව ද?

පි: ෆාරුක් සහ ෆාරුක්ගේ දුව අනාෆා.

ස්වාමිනි අවසර අයැද සිටිනවා ෆාරුක් සහ ඔහුගේ දියණිය පෙනී සිටින ඡායාරූපයක් බවට සාක්ෂි කරු හඳුනා ගනු ලැබූ ඡායාරූපයේ මුද්‍රිත පිටපත **IR 07** වශයනේ ලකුණු කර ඉදිරිපත් කිරීමට.

ප්‍ර: ඔබට පෙන්වන මේ ඡායාරූපයේ ඉන්නේ කවුද?

පි: ඝාතනයට පස්සේ ෆාරුෆ්.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ස්වාමිනි තුවාල ලබා සිටින ෆාරුප් බිම වැතිරි තුවාල ලැබීමෙන් පසුව භූමිය මත වැතිරි සිටින ආකාරය දක්වන ඡායාරූපය **IR 08** වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා.

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: අර ඉස්ලාම් ආගමේ විදියට බෙල්ල කපලාද මරලා තියෙන්නේ?

පි: ඒ ගැන මට පැහැදිලි autopsy report එකක් නෑ. කපා කොටා ඝාතනය කරා කියන එක තමයි බඩටත් මේ පිහියෙන් ඇනලා තිබ්බා කියලා මට දැන ගන්න ලැබුනා බඩට පිටට .

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතීඥ අයේෂා ජීනසේන මෙනවිය</u>

ප්‍ර: බෙල්ල ප්‍රදේශයේ තුවාල තිබෙන බව පෙනී යනවා රුධිරය වැහෙනවා. ඔබට දැන් මේ පුළුල් තීරයේ පෙන්වන ඡායාරූපය ඔබ විමර්ශකයින්ට ලබා දුන්න ඡායාරූපයක්ද?

පි: ඔව්.

ප්‍ර: ඔබට කොහෙන්ද ඒක ලැබුනේ?

පි: ෆාරුක් ඝාතනයට පත්වුනාට පස්සේ එයාගේ මළසිරුර කොයම්බුර්තූර් ඉස්පිරිතාලයට තබා තිබුණු වෙලාවේ එහෙට ගිය තව ක්‍රියාකාරකයෙක් මට නම මතක නෑ ඒ ගත්ත පින්තූරය ඒ වෙලේ වට්ස් ඇප් එකේ ගෘප් එකට දැම්මා.

ප්‍ර: ඒ අනුවද ඔබ අද දින ඉදිරිපත් කරනු ලබන ඡායාරූප ලබා ගනු ලැබුවේ?

පි: ඔව්.

ස්වාමිනි තුවාල වූ අතක් පෙන්නුම් කරන මෙම ඡායාරූපය IR 09 වශයෙන් ලකුණු කිරීමට අවසර අයැදිනවා.

වේලාව: **ප.ව.6.30**
මෙතැන් සිට:ල/ලේ ධම්මිකා මිය.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පෙර වාර්තා කලේ චන්දිමා මෙනවිය විසින්ය.
දැන් වේලාව - ප.ව. 6.30 යි.
මෙතැන් සිට වාර්තා කරන්නේ ධම්මිකා පෙරේරා විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජීනසේන මෙනවිය:</u>

ප්‍ර : මේ පුළුල් තිරයේ දක්වන තුවාල ලබා සිටින තැනැත්තා ෆාරුක් කියලා මා කිව්වතින් නිවැරදි ද?

පි : ඔව්.

ගරු කොමිෂන් සභාවේ අවධානයට ඔහුගේ මේ ඡායාරූපයේ බෙල්ල ප්‍රදේශය තුවාල වී තිබෙන බවත්, ඒ වගේම ඔහුගේ පපුව ප්‍රදේශය වගේම උදරයේ වම්පස තුවාලවී තිබෙන බවත් මේ ඡායාරූපයෙන් පෙන්නුම් කරනු ලබන බව අවධානයට යොමු කොට සිටිනවා.

එම ඡායාරූපය **IR 10** වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා.

මේ අවස්ථාවේ තවත් ඡායාරූපයක් තිරයේ දිස්වේ

ප්‍ර : මෙම ඡායාරූපයත් ඔබට ෆාරුක්ගේ මළසිරුර රෝහලට ගෙන ගිය අවස්ථාවේදී අර යාළුවා විසින් ලබාගෙන whatsapp කරමින් ඒ ආකාරයට ලබා ගන්නා ලද ඡායාරූපයක්ද ?

පි : ඔව්.

ස්වාමිණී මෙම ඡායාරූපය **IR 11** වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා.

දෙපැත්තටම ස්වාමිණී ඇනලා තිබෙනවා.

ප්‍ර : ඔබට මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්නට පුළුවන්ද තවුහිද් ජමාත් සංවිධානය පිළිබඳව, ඔබ දන්නවද තවුහිද් ජමාත් සංවිධානය?

පි : .තවුහිද් ජමාත් කියන වැකිය පොදුවේ භාවිතා වන වචනයක්. ඒක යටතේ..

ප්‍ර : මොකක්ද ඒකේ අර්ථය?

පි : තවුහිද් කියන්නේ මම දන්නා තරමින් Oneness ඇස්. එක දෙවියෝ කියන අර්ථය තමයි එන්නේ. එක දේවවාදය කියන අර්ථය තමයි එන්නේ. ඒකදේව වාදය කියන අර්ථය එන්නේ. තවුහිද් ජමාත් කියන්නේ පොදුවේ ඒ ආකල්පය මුල් කරගෙන කුර්ආන් හා හදීෂ් එක අපි හරියට ඉටු කරන්න ඕනේ එදිනෙදා

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජීවිතයේ කියන මතය අනුව ක්‍රියාත්මක වන විවිධ ජමාත්වලට ඒ නමින් හඳුන්වනවා.

ප : කොයි කාලේද මේ සංවිධානය ආම්රම්භ වෙලා තියෙන්නේ ලංකාවේ කියලා ඔබ දන්නවද?

පි : මේකේ ප්‍රධාන සංවිධානය තමයි මාවතගම, පරගහදෙනිය, වැලඩ පරගහදෙනිය, නුවර පාරේ තිබෙන ජමියතුල් අන්සාරීස් සුන්නතුල් මොහොමදියා කියන JASM කෙටියෙන් සඳහන් වන සංවිධානයක්. ඒ සංවිධානය 1940 ගණන් වල පිහිටුවෙච්ච එකක් කියලා තමයි මට ආරංචි වෙලා තියෙන්නේ.

ප : ඔබ යම් අවස්ථාවකදි තවුහිද් ජමාත් සංවිධානයට සම්බන්ධ වෙලා හිටියද?

පි : ඔව්.

ප : ඒ මොන වකවානුවේද?

පි : 1996 දී ජමාතේ ඉස්ලාමිය සංවිධානයත් එක්ක මත ගැටුමක් ඇති වුණාට පස්සේ මම තවුහිද් ජමාත් සංවිධානයත් එක්ක සම්බන්ධ වෙනවා.

ප : කොච්චර කාලයක් ඔබ, දැන් ඔබ කිව්වානේ ඔබ නිරාගාමිකයෙක් වුණා කියලා?

පි : ඔව්.

ප : ඒ මොන වසරේද?

පි : 2012 දි.

ප : එතකොට ඔබ 1996 ඉදලා 2012 වෙන කල්ම තවුහිද් ජමාත් සංවිධානයේ සාමාජිකයෙක් විදියටද හිටියේ?

පි : නැහැ.

ප : එහෙනම් කවදා වෙනකන්ද ඔබ එම සංවිධානයේ සාමාජිකයෙක් වෙලා හිටියේ?

පි : 1996 දි මම ජමාතේ ඉස්ලාමීය සංවිධානයෙන් ඉවත් වෙලා, ඇත් වෙලා තවුහිද් මත වාදයට පිවිසෙනවා. එතකොට මාවනැල්ලේ තවුහිද් ජමාත් එකක්වත්, සාමාජිකයෙක්වත් කියන්න තරමට හිටියේ නැහැ මම දන්නා තරමට පුද්ගලයෝ හතර දෙනෙක් විතර වගේ තමයි හිටියේ.

ප : කවුද නායකයා වෙලා හිටියේ ඒ දවස්වල?

පි : එහෙම කවුරුත් හිටියේ නැහැ. මාවනැල්ලේ කවුරුත් එහෙම හිටියේ නැහැ.

ප : මුළු සංවිධානයේම ප්‍රධාන නායකයෙක් කවුරු හරි මූලිකත්වය ගන්න ඇතිනේ?

President Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM

පි : නැහැ, තවුහිද් ජමාත් කියන ඒකෙත් පොඩි පොඩි සංවිධානවලට කියන නමක්. ඒ එක සංවිධානයක් නෙමෙයි. දැනට ගත්තොත් SLTJ, දැන් ආන්දෝලනයට පත් වෙලා තියෙන තහනමට පත් වෙලා තියෙන NTJ, CTJ ඒ වගේ වෙන වෙන නම්වලින් එක එක ගම්වල තියෙන සංවිධාන හැම එකක්ම හදුන්වන්නේ තවුහිද් ජමාත් කියන නමින් තමා. ACTJ. ජමියතුල් අන්සාරිස් සුන්නතුල් මොහොමදියා පරගහදෙනිය, වැඋඩ ඒ ඔක්කොම වගේ හදුන්වන්නේ තවුහිද් ජමාත් කියන පොදු නමින්.

ප්‍ර : දැන් ඔබේ පිළිතුරේ සදහන් කෙරුවානේ අර ඉංග්‍රීසි අක්ෂරවලින් කෙටියෙන්

පි : JASM

ප්‍ර : ඔව් ඒවාට සම්පුර්ණයෙන් කියන නම කියන්න පුළුවන්ද?

පි : ජමියතුල් අන්සාරිස් සුන්නතුල් මොහොමදියා

ප්‍ර : JASM ?

පි : JASM පරගහදෙනිය, වැඋඩ. නුවර පාරේ ඒගොල්ලන්ගේ මූලස්ථානය තියෙන්නේ.

ප්‍ර : එතකොට ඔබ කිව්වානේ NTJ කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ මොකක්ද?

පි : ජාතික තවුහිද් ජමාත්.

ප්‍ර : National Thowheeth Jama'ath වෙන?

පි : C TJ කියලත් එකක් තියෙනවා

ප්‍ර : මොකක්ද C TJ කියන්නේ?

පි : Ceylon Thowheeth Jama'ath

ප්‍ර : වෙන?

පි : තව SLTJ කියල එකක් තියෙනවා.

ප්‍ර : මොකක්ද SLTJ කියන්නේ?

පි : Sri Lanka Thowheeth Jama'ath.

ප්‍ර : වෙන?

පි : ACTJ කියලා තව එකක් තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ?

පි : All Ceylon Thowheeth Jama'ath. ඒ හැර ගමින් ගමටත් තවුහිද් ජමාත් තියෙනවා. එක් එක් නම්වලින් ඒගොල්ලන්ගේ ප්‍රචාරක කටයුතු වල ආගම් කටයුතුවල යෙදී සිටිනවා. මාවනැල්ලේ 2005 ඉදන් 2009 වෙන කල් මම හිටපු සංවිධානය පවා දෙවරක් නම මාරු කලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒකත් තවුහිද් ජමාත් එකට අයිතියි?

පි : තවුහිද් ජමාත් එකට අයිතියි

ප්‍ර : කෙටියෙන් ඔබ ගරු කොමිෂන් සභාවට කියන්නේ තවුහිද් ජමාත් කියන ඒ කුඩේ යටතේ නැත්නම් ඒ Umbrella එක යටතේ විවිධ සංවිධාන තියෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ කිව්වානේ ඔය 2005 ඉදලා 2009 වෙන කල් හිටියයි කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ 1996 ඉදලා 2005 වෙන කල් හිටියේ මොකේද?

පි : මොකේවත් හිටියේ නැහැ,

ප්‍ර : දැන් ඔබ කිව්වානේ තවුහිද් ජමාත් සංවිධානයේ හිටියා කියලා?

පි : Sorry, මම පොඩ්ඩක් ඒක හරිගස්වන්න ඕනේ. 96 දි මම තවුහිද් ජමාත් සංවිධානයත් එක්ක ඒ මතයට එනවා. ඒ වුණාට මට එකතු වෙලා වැඩ කරන්නවත්, ක්‍රියාකරන්නවත් කවුරුත් මාවනැල්ලේ හිටියේ නැහැ. යාළුවෝ හතරදෙනෙක් හිටියා. අපි ගොඩක් උත්සාහ කලා යම්කිසි දෙයක් ගොඩනැගෙන්න. එතකොට මම ශිෂයයෙක්. උසස් පෙළ ඉගෙන ගන්න ශිෂ්‍යයෙක්.

ප්‍ර : මොකක්ද ඔබ ඔය ආපු මතය, තවුහිද් ජමාත් සංවිධානයේ මොකක්ද ඔය මතය?

පි : කුර්ආන් හා හදීෂ් කියන එක හරි විදියට අපි එදිනෙදා ජීවිතයේ පිළිපදින්න ඕන කියන එක. ජමාතේ ඉස්ලාමිය එකේ මතය තිබ්බේ, ඒ ගැන දැන් අපි Worry වෙන්න ඕන නැහැ, ඉස්ලාම් රාජ්‍යයක් පිහිටෙව්වට පස්සේ ආගම හරියට කොහොමද පිළිපදින්න ඕන කියන දේ රාජ්‍ය නායකයා නැත්නම් caliph අපිට කියලා දෙයි කියන මතය. තවුහිද් ජමාත් කිව්වේ ඒ වෙන කල් අපි බලාගෙන ඉන්න ඕන නැහැ, අපි එදිනෙදා කරන්න ඕනදේ හරියට කරමු කියලා. ඊට පස්සේ මාවනැල්ලේ මම හිටියට කවුරුත් මට සහයෝගයකට ලොකුවට හිටපු නැති හින්දා මම ඒ හැම දේම අයින් වෙලා, ඈත් වෙලා මගේ A/L විභාගය ඊට පස්සේ French German, ඉගෙන ගෙන සංචාරක කර්මාන්තයට සම්බන්ධ රැකියාවල යෙදී සිටියා. එතකොට ආගම ගැන මම එච්චර හිතුවේ නැහැ. මම මුස්ලිම් කියලා දන්නවා. ආගම ගැන,දෙවියෝ ගැන, මරණය ගැන බිය මා තුළ තිබුණත් සාමාන්‍ය කෙනෙක් හැටියට මගේ ජීවිතය මම ගතකර ගෙන හිටියා. මායි අනිත් අන්‍යාගමික ලංකාවේ සිටින සාමාන්‍ය වැසියන් අතර කිසිම වෙනසක් තිබ්බේ

FAIR COMMENT BY JEZEEM

නැහැ. මමත් ලස්සනට ඇදලා පැළඳලා ඒ විදියටම හිටියා. ඊට පස්සේ මම බේරුවෙල ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය කලුවාමෝදර ප්‍රදේශයේ රැකියාවේ රැඳී සිටින වෙලාවේ තමයි සුනාමී බෙදවාචකය සිද්ධ වෙන්නේ.

ප්‍ර : 2005?

පි : 2004 දෙසැම්බර් 26 වෙනිදා උදේ. එතකොට මම ඒකෙන් දිවි බේරා ගන්නේ නූලෙන් වගේ කියන්න පුළුවන්. මම හිටපු, වැඩ කරපු Office එක, නැත්නම් Showroom එක ඒකත් වතුරට කුඩු වුණා. Damage වුණා. හිටපු Boarding house එකෙත් වටේම වතුර ආවා. ඊට පස්සේ මගේ හිත පොඩ්ඩක් වෙනසක් ඇති වෙන්න පටන් ගත්තා. මම හිතුවා මම මරණයට පත්වෙලා තිබුනොත් මට නිරයට යන්න වෙයිද, මම ආගම හරියට පිළිපදින්නේ නැහැ, පල්ලියට යන්නේ නැහැ, වදින්නේ නැහැ කියලා. ඊට පස්සේ තමයි මම ආපහු තවුහිද් ජමාත් එකට

ප්‍ර : සම්බන්ධ වෙන්නේ?

පි : සම්බන්ධ වෙන්නේ.

ප්‍ර : ඒ මොන කාලයේද?

පි : 2005 දී.

ප්‍ර : ඉදලා ඔබ කිව්වා 2009 වෙන කල් තවුහිද් ජමාත් එකේ හිටියා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ මොන ශාඛාවේද? මොන නමින්ද?

පි : මාවනැල්ලේ. එතකොට මම එකතු වෙච්ච කාලේ පොඩි දෙයක් කියන්න ඕනේ මම 96, 97 වර්ෂයේදි මම එතනින් ඇත් වෙලා යන කොට මාවනැල්ලේ කවුරුත් තවුහිද් ජමාත් එක්කෙනෙක්වත් හිටියේ නැහැ. හැබැයි 2005 වෙන කොට ගොඩාක් සාමාජිකයොත් එක්ක තවුහිද් ජමාත් පල්ලි තමන්ටම කියලා තනි පල්ලියත් එක්ක ශක්තිමත් සංවිධානයක් ඒ වෙන කොට මාවනැල්ලේ පිහිටුවලා තිබුණා. එතකොට ඒ තවුහිත් ජමාත් එකේ නම ජමියතුල් ඩව්වතිල් ඉස්ලාමියා. JDI කියන කෙටියෙන් අපි හඳුනා ගත්තා. පස්සේ ටික කාලයක් ගියාට පස්සේ මාවනැල්ල තවුහිද් ජමාත් කියලත් නම වෙනස් කලා. ආපහු JDA කියලත් මාරු කලා. ඒ පොඩි පොඩි මතභේද තිබුණා. හරි නම මොකද කියන එක සමහර අය කිව්වා අපිට නම් අවශ්‍ය නැහැ ඉස්ලාම් ආගම හරියට කරමු කියලා ඒ වගේ දේවල් තිබුණා. ඒ

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

වුනත් ඒ නම් දෙකම මට මතකයි. JDI ජමියතුල් ඩව්වතිල් ඉස්ලාමියා එකයි, මාවනැල්ල තවුහිද් ජමාත් කියන නමයි

ප්‍ර : මේ 2005 ඉදලා 2009 වෙන කල් මොනවද ඔබ ඒ සංවිධානයේ කලේ? මොන වගේ ක්‍රියාකාරකම්වලද යෙදුනේ?

පි : බොහෝදුරට අපි ඉස්ලාම් ආගම හරි විදියට ප්‍රචාරය කරන්න ඕන, හරි විදියට ඒක පිළිපදින්න ඕන එදිනෙදා ජීවිතයේ ඒක කරන්න ඕනේ කියන ඒ මතයේ හිටියේ. ඒ වගේම ජමාතේ ඉස්ලාමී අනෙක් ඉස්ලාමී සංවිධානවල, පල්ලිවල කියන දේවල් වලින් අපි වැරදියි කියලා දැකපු දේවල්වලට උත්තරදීම නැත්නම් පැහැදිලි කිරීම දීම වාගේ දේවල්වලදී තමයි වැඩිපුර අවධානය යොමු කලේ.

ප්‍ර : එතකොට ඔබ කිව්වානේ 2009 වෙන කල් තමයි කියලා ඒ සංවිධානයේ හිටියේ?

පි : ඔව්.

ප්‍ර : ඇයි ඒ 2009 වෙනකල් විතරක් හිටියේ?

පි : 2009 ජුනි 25 වෙනිදා මගේ මතකයේ හැටියට නම් හරිනම් 2009 ජුනි 25 වෙනිදා මම රැකියාවක් සදහා සෞදි අරාබිය බලා පිටත් වෙනවා.

ප්‍ර : එතකොට සෞදි අරාබියාවේදි ඔය තවුහිද් ජමාත් සංවිධානයේ වැඩිදුර ක්‍රියාකාරී කටයුතුවල යෙදෙන්නට අපහසුකමක් තිබුණද?

පි : ඔව්. මගේ රැකියාවත් එක්ක එහේ ඒ වගේ කටයුතු වලට සම්බන්ධ වෙන්න අපහසුතාවයක් තිබුණා.

ප්‍ර : එතකොට ඔබ කොයි අවස්ථාවකදි හරි තවුහිද් ජමාත් සංවිධානය සමඟ ගැටුම් ඇති කර ගත්තද?

පි : තවුහිද් ජමාත් එකේ ඉන්න කාලයේ

ප්‍ර : ඔව් ඉන්න කාලේ හරි එතනින් බැහැර වෙන්න?

පි : තවුහිද් ජමාත් එකේ ඉන්න කාලේ එක් එක් මව්ලවිලත් එක්ක එක එක මතභේද තිබුණට ගැටුම් කියන තත්ත්වයට නම් ගියේ නැහැ. ඒවගේ දේවල් ඇති වුණේ නැහැ.

ප්‍ර : තවුහිද් ජමාත් සහ තබ්ලික් ජමාත් අතර යම් මත ගැටුම් තිබුණද?

පි : තිබුණා.

ප්‍ර : මොනවද තිබුණේ?

පි : ආගමේ තියෙන දේවල් කවුද හරි විදියට පිළිපදින්නේ, කවුරු කියන දේද හරි ඒ වගේ දේවල් පදනම් කරගෙන තමයි ඒ වගේ දේවල් තිබුණේ. අනික් එක විශේෂයෙන් කියනවා නම් අවුරුද්ද සමරන්නේ කොයි දවසද, හඳ දකින්නේ ලංකාවේ දැක්කොත්

FAIR COMMENT — BY JEZEEM

විතරද මෙහේ සමරන්න ඕනේ, නැත්නම් පිටරටවල දැක්කොත් ඒ හඳ දැක්කාය කියන පණිවිඩය මත අපිට සමරන්න පුළුවන්ද කියන එකෙත් ගොඩක් ම මතභේද ඇති වුණා අනෙත් ජමාත් එක්ක .

ප්‍ර : ඉස්මත් මහත්මයා එතකොට ඔය ඔබ තවුහිද් ජමාත් සංවිධානයේ හිටිය කාලය තුලදී හරි කොයි අවස්ථාවක හරි ඔබේ ජීවිතයේ සහරාන් හෂිම් සමඟ ඔබ හම්බ වෙලා කතා කරලා තියෙනවද?

පි : ඔව්, දෙවතාවක්ම සහරාන් හෂිම් මාවනැල්ලට දේශනා පැවැත්වීම සඳහා පැමිණියා. ඒ එනකොටම එයා ගොඩක් Famous. තවුහිද් ජමාත් සාමාජිකයන් අතර ගොඩක් Famous එක්කෙනෙක්.

ප්‍ර : ඇයි එයා ජනප්‍රිය?

පි : ජනප්‍රිය වෙන්න හේතුව එයා ලස්සනට ආගම විග්‍රාහ කරන්න දක්ෂයා, ඒවගේම විවාද අනෙත් ජමාත් කට්ටියත් එක්ක විවාද කිරීමට ඒවට දක්ෂයා. ඒ හින්දා එයාට විශේෂ පිළිගැනීමක් තිබුණා.

ප්‍ර : ඔබට තිබුණේ ඔහු පිළිබඳව කුමන හැඟීමක්ද?

පි : ආගම ගොඩක් භක්තියෙන් හරි විදියට පිළිපදින්න ඕන කියන හැඟීම තියෙන හොඳ තරුණ මව්ලවි කෙනෙක් හැටියට.

ප්‍ර : ඔහුගේ එම දේශනාවන් වීඩියෝ පටිගත කරලා අන්තර්ජාලයට වීඩියෝ පටිගත කිරීම්, ඒ වගේම අන්තර්ජාලයේ ඔහුගේ දේශනා එයට මුදා හැරීම් ඒවා ඔබ දැකලා තියෙනවද?

පි : ඒ කාලේ නම් අපිට අන්තර්ජාලය ගැන ඒතරම් ලොකු අවබෝධය තිබුණේ නැහැ. 2007, 2008, 2009 ඒ කාලය තුල තමයි එයා දෙපාරක් ආවේ. ඒ දවස්වල අන්තර්ජාලය අද වගේ අපි අතර ඒතරම් Famous එකක් නෙමෙයි.

ප්‍ර : ඔබ කියන්නේ 2007, 2008, 2009 වසරවලදී තමයි සහරාන් හෂිම් ඔබලාට දේශනා කිරීමට ආවේ?

පි : ඔව් දෙවරක් ආවා.

ප්‍ර : ඒ ආවේ මාවනැල්ලටද?

පි : ඔව් මාවනැල්ල තවුහිද් ජමාත්.

ප්‍ර : ඔබට ඔහුගේ ඡායාරූපයක් දැක්කොත් නැවත හඳුනන්න පුළුවන්ද?

පි : ඔව් පුළුවන්.

ප්‍ර : හරි ඒක අපි ලබා ගන්න කල් ඉදිරියට යමු, එතකොට සහරාන් හෂිම් ගේ දේශනාවලට ඔබ සවන් දුන්නා කියලා කිව්වානේ?

පි : ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : එතකොට ඔය ඉස්ලාම් ආගම සම්බන්ධයෙන් ඔබ කිව්වා එය ඇදහීම පිළිබඳව තවුහිද් ජමාත් සහ තබ්ලික් ජමාත් සංවිධාන අතර මත ගැටීමක් තිබුණයි කියලා. සහරාන්ගේ ඒ පිළිබඳව තිබුණ මතය මොකක්ද?

පි : තවුහිද් ජමාත් සහ තබ්ලික් ජමාත් අතර පමණක් නොවෙයි තවුහිද් ජමාත්, ජමාතේ ඉස්ලාමිය අතරත් ඒ වගේ මත ගැටුම් තිබුණා. සහරාන්ගේ මතය වෙලා තිබ්බේ තවුහිද් ජමාත් එකේ මතය ඉතා ස්ථීරව මේක විතරයි හරි අනිත් ඒවා වැරදියි කියන මතය තමයි තිබුනේ. තවුහිද් ජමාතුත් වැරදියි කියන මතය තමයි සහරාන්ගේ මතය වෙලා තිබුණේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : කෙටියෙන් කියනවා නම් ඔබට පොඩ්ඩක් විස්තර කරන්න පුළුවන්ද ජමාතේ ඉස්ලාමිය සංවිධානය, තවුහිද් ජමාත් සංවිධානය සහ තබ්ලික් ජමාත් සංවිධාන අතර තිබෙන ප්‍රධාන වෙනස්කම්?

පි : ජමාතේ ඉස්ලාමිය කියන්නේ mainly a political movement their target ඒගොල්ලන්ගේ ඉලක්කය ඇවිල්ලා ඉස්ලාම් රාජ්‍යයක් පිහිටුවීම හා ලෝකයේ ඉස්ලාම් රාජ්‍යයක් පිහිටුවීම. ලංකාවේ ඉස්ලාම් රාජ්‍යය කර ගැනීම සහ ලෝකයේ ඉස්ලාම් පාලනය තමයි ඒගොල්ලන්ගේ ප්‍රධානම ඉලක්කය. ආගමේ තියෙන internal matters like how to pray, how should we do the prayers for a dead one like those things. Internal matters ඒගොල්ලන් ඒ ගැන එච්චර අවධානය යොමු කරන්නේ නැහැ. තබ්ලික් ජමාත් හා තවුහිද් ජමාත් එක ගත්තොත් තබ්ලික් ජමාත් කියන්නේ ජමාතේ ඉස්ලාමිය වගේම One unit, එක සංවිධානයක්. ලංකාවේ කොහේ ගත්තත් ඒක එක නායකත්වය නැත්නම් එකම විදියට ක්‍රියාත්මක කරන සංවිධානයක්. ඒගොල්ලන් ඇවිල්ලා දේශපාලන අරමුණක් ඒගොල්ලන්ට මං දන්න තරමට නැහැ. ඒගොල්ලන්ගේ ගොඩාක්ම තියෙන්නේ මුස්ලිම් අය ඉස්සෙල්ලාම හරි ඉස්ලාම් ආගමට ගේන්න ඕනේ, ඒගොල්ලෝ හරි කියලා හිතන ඉස්ලාම් ආගමට ගේන්න ඕනේ, පල්ලියට හැමෝම එන්න ඕනේ, අපි මුස්ලිම් විදියට ජීවත් වෙන්න ඕනේ, ඒ අතරතුර යම්කිසි අන්තවාදී අදහස් තියෙනවා මුහුණ වහන්න ඕනේ, රැවුල වවන්න ඕනේ ඒ වගේ දේවල් තියෙනවා. තවුහිද් ජමාත් කියන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ ඔබගේ දැනීමේ හැටියට තබ්ලික් ජමාත් සංවිධානය ලංකාව මුස්ලිම් රාජ්‍යයක් කිරීමට අවශ්‍යතාවය, අරමුණක් නැද්ද?

පි : ඒගොල්ලන්ගේ එහෙම පාලන බලය සඳහා මුස්ලිම් රාජ්‍යයක් හැටියට පත් කිරීමේ උවමනාවක් ඒගොල්ලන්ට නැහැ මම දන්න තරමට. ඒගොල්ලන්ගේ තියෙන්නේ හැම එක්කෙනාම ඉස්ලාම් ආගම වැළඳ ගත්තොත් හොඳයි කියන අදහස තියෙනවා. ඒකට ඒගොල්ලන් එහෙම හිතන්න හේතුව ඒගොල්ලන් විශ්වාස කරනවා ඉස්ලාම් ආගම වැළඳ ගත්තේ නැත්නම් අන්‍යාගමිකයෝ අපායට යනවා. ඒ මිනිස්සු අපායට යන්න හොඳ නැහැ කියන මතය උඩ තමයි ඒගොල්ලන් හදන්නේ හැමෝම ඉස්ලාම් ආගමට එන්න ඕන කියලා. පාලන බලය ඇති කිරීමේ අදහසක් ඒගොල්ලන්ට තිබෙන බව මම නම් දන්නේ නැහැ. කවදාවත් අහලත් නැහැ, ඒවගේ දේවල්.

ප්‍ර : කුර්ආනය නැත්නම් හදීෂ්වලට අනුව සියළු දෙනාම ඉස්ලාම් භක්තිකයන් කිරීමට මූලික පදනමක්ද ඉස්ලාම් රාජ්‍යයක් ඇති කිරීම?

පි : නැහැ, ඉස්ලාම් රාජ්‍යයක් ඇති කලත් ඉස්ලාම් ආගම පිළිනොගත්ත අයත් ජීවත් වෙන්න පුළුවන්, ජේසියා කියන කප්පම ගෙවලා.

ප්‍ර : ඉතුරු විස්තරය කියන්න?

පි : තවුහිද් ජමාත් එකේ අරමුණ ඇවිල්ලා ඉස්ලාම් ආගම ශුද්ධ වූ විදියට පිළිපදින්න ඕන කියන එක. තවුහිද් ජමාත් එකේ ගැටුම වැඩිපුරම තිබුණේ නැත්නම් තියෙන්නේ මුස්ලිම් අයත් එක්කමයි. වෙන වෙන මත දරන මුස්ලිම් අයත් එක්ක. සූෆිවරුන් එක්ක, ජමාතේ ඉස්ලාමිය අයත් එක්ක, තබ්ලික් අයත් එක්ක තමයි තවුහිද් ජමාත් එකේ ප්‍රශ්න තිබ්බේ. ඒ කට්ටිය හදන්න ඕන කියන මතය තමයි තිබ්බේ. ඒ වගේම තවුහිද් ජමාත් කිව්වාම එක සංවිධානයක් නෙමෙයි. එක එක සංවිධානවලට උවමනාව තිබුණා අන්‍යාගමික මිනිස්සුන්ගේ ප්‍රශ්නවලට උත්තර දීලා Open discussions වගේ නැත්නම් Questions and Answers Sessions වගේ තියලා ඒ කට්ටියත් ඉස්ලාම් ආගමට ගන්න ඕන කියන උවමනාවකුත් තිබුණා.

ප්‍ර : එතකොට තවුහිද් ජමාත් මතවාදය නැද්ද ලංකාව මුස්ලිම් රාජ්‍යයක් කිරීමේ අවශ්‍යතාවය?

පි : නැහැ ඒගොල්ලන්ට මම දන්න තරමට ඒක තිබුණේ නැහැ. ඒ දවස්වල මම දන්න තරමට තිබුනේ නැහැ. ඒගොල්ලන්ට තිබුණේ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

මේ සොහොන් ඔක්කොම කඩලා ඉවත් කරලා පල්ලිවල තියෙන සොහොන් අයින් කරන්න ඕනේ, ඒ වගේ දේවල් තමයි ගොඩාක්ම Importance එක තිබ්බේ. පිළිම වඳින එකට ඒගොල්ලන් විරුද්ධයි. විරුද්ධ වුණාට ඒක කඩන්න ඕනේ ඒක තමයි අපේ ප්‍රධාන අරමුණ කියලා ඒගොල්ලන් කවදාවත් ඒක ඉස්සරහට දාලා කතා කරලා තිබුණේ නැහැ. ඒගොල්ලන් ඉස්සරහට දාලා ගොඩාක්ම කතා කලේ මුස්ලිම් අය අතර තියෙන ඉස්ලාම් ආගමට ශුද්ධ වූ කුර්ආන් එකට, හදීෂ් එකට පටහැනි දේවල් නැති කරන්න ඕන කියන එක තමයි.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : සුන්නත්වල් ජමාත් කියලත් සංවිධානයක් තියෙනවා නේ, ඒ සංවිධානයයි දැන් සභාපතිතුමා ඇහුව සංවිධාන තුනයි එක සමානද නැත්නම් ඒක වෙනස් සංවිධානයක්ද?

පි : වෙනස්. සුන්නත්වල් ජමාත් කියලා හඳුන්වන්නේ නබීතුමාගේ මරණයෙන් ටික කාලෙකට පස්සේ ඉස්ලාම් ආගම දෙකට බෙදෙනවා. ෂියාවරුන් හා සුන්නත් කියන. ඒ ෂියා නොවන කට්ටියට ඒ දවස්වල කියපු නම තමයි සුන්නත්වල් ජමාත් කියන එක. ෂියා නොවන කට්ටියට. ටික කාලයක් ගියාට පස්සේ මේ තවුහිද් සංවිධානය ඒ වගේ වෙනකොට ලංකාවේ හිටපු පාරම්පරික මුස්ලිම්වරු නැත්නම් සූෆි මුස්ලිම්වරු තමාව සුන්නත් වල් ජමාත් කියලා හඳුනා ගන්න පටන් ගත්තා. තබ්ලික් ජමාතුත් තමාව සුන්නත්වල් ජමාත් කියලා තමයි හඳුන්වන්නේ.

ප්‍ර : එතකොට ඔය සුන්නත්වල් ජමාත් කියන සංවිධානයටත් අර ජමාතේ ඉස්ලාමිය සංවිධානයේ වගේ කැලිෆට් එකක් හදන්න ඉස්ලාම් රාජ්‍යය හදන එහෙම සංකල්ප නැද්ද?

පි : මම දන්නා තරමට නැහැ ඒක. සුන්නත්වල් ජමාත් කියන එක, එක සංවිධානයක් හැටියට කටයුතු කරනවද කියන එකත් මම දන්නේ නැහැ.

ප්‍ර : සූෆි මුස්ලිම්වරුන්ද සුන්නත් වල් ජමාත් කියලා කියන්නේ ?

පි : ඔව් ඒගොල්ලෝ පොදුවේ හඳුන්වන නමක් තමයි සුන්නත් වල් ජමාත් කියන්නේ. එක නායකත්වයක් යටතේ එහෙම සංවිධානාත්මක විදියට කටයුතු කරනවද කියන එක මම දන්නේ නැහැ, ඒ දවස්වල නම් එහෙම දෙයක් තිබුනේ නැහැ මම දන්න විදියට.

****

FAIR COMMENT
BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජීනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔබ මාවනැල්ලේ පදිංචියට පැමිණියේ 1990 වසරේ කියලා මා කිව්වොත් හරිද?

පි : ඔව්.

ප්‍ර : ඒ කියන්නේ එතෙක් ඔබ යාපනය දිස්ත්‍රික්කයේ තමයි පදිංචි වෙලා හිටියේ?

පි : ඔව්.

ප්‍ර : එම වකවානුව තුළදී මේ තබ්ලික් ජමාත් සහ තවුහිද් ජමාත් කියන සංවිධාන අතර යම් ගැටුම්කාරී තත්ත්වයක් යාපනය ප්‍රදේශයේ තිබුණද?

පි : නැහැ, ඒ වකවානුවේ යාපනයේ තවුහිද් ජමාත් කියන සංවිධානය තිබ්බේම නැහැ, ගැටුම්කාරී තත්ත්වයක් තිබ්බේ තබ්ලික් ජමාත් සහ ජමාතේ ඉස්ලාමීය සංවිධානය අතර.

ප්‍ර : මොන වකවානුවේද තිබුණේ ඕක?

පි : 80 ගණන්වල. මම පොඩියි. ඒ වුණාට මම ඒක දන්නවා. මම දැකලා තියෙනවා මම පාසැල් ගිහිල්ලා එන වෙලාවේ ගෙවල් පවා කඩලා ජමාතේ ඉස්ලාමීය කාර්යාලයට ගිණි තබා තිබුණ අවස්ථා දැකලා තිබෙනවා. ඒ වගේම මට ආරංචි වුණා ඝාතන සිද්ධියක් සම්බන්ධයෙන්, බෝම්බ ප්‍රහාර, වෙඩි තැබීම් ගැන මට ආරංචි වුණා.

ප්‍ර : සූෆියාන් මවිලවි කියන්නේ කවුද?

පි : එවේලේ යාපනේ ජමාතේ ඉස්ලාමීය එකේ භාරව හිටපු කෙනා තමයි සුෆියාන් මවිලවි කියන්නේ.

ප්‍ර : ඔහු දැන් කොහේද ඉන්නේ?

පි : දැන් තාම යාපනේ සහ කොළඹ මේ ප්‍රදේශ දෙකේම ඉන්නවා දේශපාලන කටයුතුවල...

ප්‍ර : ක්‍රියාකාරීව යෙදිලා ඉන්නවා?

පි : යෙදිලා ඉන්නවා.

ප්‍ර : මොන දේශපාලන කටයුතුද?

පි : නිශ්චිතව කියන්න අමාරුයි එයා යාපනයේ වැඩිපුර මුස්ලිම් ඡන්ද නැති හින්දා ඒ අවස්ථාව අනුව එක එක දේශපාලන නායකත්වයත් එක්ක එකතු වෙලා ඉන්නවා එක කාලයක් ගරු ඇමති ඩග්ලස් දේවානන්ද සමඟ සම්බන්ධීකරණ නිලධාරියෙක් හරි මොනවා හරි තනතුරක් දරාගෙන හිටියා. ටික කාලයක් හිටපු ඇමති රිෂාඩ් බදුර්දීන් එක්කත් සම්බන්ධකම තිබුණා. මම දැනට

Presidential Secretariat's Copy

FAIR COMMENT BY JEZEEM

හරියට දන්නේ නැහැ කොයි පැත්තේද එයා ඉන්නේ කියන එක. තාම ඉන්නවා කියන එක දන්නවා.

ප : නමුත් ඔබ දන්නේ නැහැ හරියටම..

පි : හරියට දැනට එයාගේ මතය මොකක්ද කියලා මම හරියට දන්නේ නැහැ,

ප : ජලී මාස්ටර්ව දන්නවද?

පි : මම දන්නේ නැහැ අහලා තියෙනවා.

ප : ඔහුව යම් සංවිධානයක ක්‍රියාකාරකම හේතු කරගෙන ඔහුගේ මරණය සිදු වුණාද?

පි : ඔව්.

ප : කොහොමද ඒක වුනේ?

පි : එයා තබ්ලික් ජමාත් එකට සම්බන්ධ කෙනෙක්. ජමාතේ ඉස්ලාමිය එල්ල කරපු බෝම්බ නැත්නම් වෙඩි ප්‍රහාරයකින් එයා මියගියා.

ප : ඒ කොහේදි ද?

පි : යාපනයේදී.

ප : කවද්ද ඒක සිද්ධ වුණේ කොයි කාලේද?

පි : 1980 ගණන්වල ඉන්දීය හමුදාව ලංකාවට පැමිණිමට පෙර. 87 ට පෙර.

ප : මම තවුහිද් ජමාත් සංවිධානය පිළිබඳව ඔබෙන් අහන අවස්ථාවේදී ඔබෙන් ඇහුවා සහරාන් හෂිම් ඔබව මුණගැසීමේ අවස්ථාව පිළිබඳව. එතකොට ඔබ කිව්වා අවස්ථා දෙකකදී මුණගැහිලා තියෙනවා කියලා. ඔබ ඔහු සමඟ හොඳින් කතාබහ කෙරුවද ඒ අවස්ථාවන්වලදී?

පි : ඔව්.

ප : මොනවා ගැනද කතා කලේ?

පි : ආගම ගැන, පෞද්ගලික දේවල් ගැන මගේ මතකයේ හැටියට.

ප : ඔබ කිව්වනේ ඔහු හොඳ ජනප්‍රිය දේශකයෙක් කියල?

පි : ඔව්.

ප : ඒ වගේම ඔබේ හිතේ ඔහු ගැන ප්‍රසාදයක් තිබුණා කියලත් කිව්වනේ?

පි : ඔව්.

ප : ඉතින් ඔහු සමඟ තිබුණ සම්බන්ධතාවය ඔය අවස්ථා දෙකට විතරද සීමා වුනේ?

President Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

පි : නැහැ. එයාගේ දුරකථන අංකය මං ගාව තිබුණා. ආගම ගැන මොනවා හරි ගැටළුවක් නැත්නම් Doubts ගැටළුවක් වෙන කොට මම එයාට කතා කරලා තියෙනවා Telephone එකෙන්.

ප්‍ර : දුරකථනයෙන් කතා කරලා ඔබ ඒවා විසඳ ගන්නවා?

පි : විසඳ ගෙන තියෙනවා. එයාගේ මතය අහනවා.

ප්‍ර : එතකොට ඔබ අහන ප්‍රශ්නවලට ඔහු හොඳින් පිළිතුරු දෙනවද?

පි : ඔව් දෙනවා.

ප්‍ර : ඔබට ඔහු ගැන විශ්වාසයක් හිතේ ගොඩනැගිලා තිබුණද?

පි : කොයි වගේ විශ්වාසයක් කියලද කියා පොඩ්ඩක්..

ප්‍ර : ඔබ දැන් කිව්වා අවස්ථා දෙකකදී පමණයි පෞද්ගලිකව සහරාන් හෂිම්ව ඔබට මුණ ගැසුනේ කියලා. ඒ අවස්ථාවල් දේශන පවත්වන්නට පැමිණි අවස්ථාවන් කියලා ඔබ කිව්වා මාවනැල්ල ප්‍රදේශයේ. එතකොට එහෙම හම්බ වුණ පුද්ගලයෙක් ඔබ වෙන පෞද්ගලිකව ඔහු දන්නේ නැහැනේ, නමුත් ඔහුගේ දුරකථන අංකය ලබාගෙන දුරකථනය හරහා ආගම පිළිබඳව ඔබට ඇති වන ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳව ඔහුගෙන් සාකච්ඡා කරලා උපදෙස් ගන්නට තරම් ඔබට විශ්වාසයක් ඇති වුණේ කොහොමද?

පි : එයා ගාව තිබ්බිච්ච, ආගම ගැන තිබ්බිච්ච දැනුම ඒක පැහැදිලි කිරීමට තිබ්බිච්ච දක්ෂතාවය, පැහැදිලි උත්තරදීමේ දක්ෂතාවය මත තමයි ඒක ඇති වුණේ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු සහරාන් ඇතුළු පිරිසක් තමුන්ව ඝාතනය කරන්න නිවසට පැමිණියාද කොහේ හරි නිවසකට?

පි : සහරාන් පැමිණියේ නැහැ, සහරාන් විසින් යොදවන ලද පුද්ගලයෝ හතර දෙනෙක් පැමිණියා කියලා මට දැන ගන්න ලැබුනේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයෙන්. STID එකෙන්.

ප්‍ර : තමන් දන්නේ නැහැ?

පි : මම දැනගෙන හිටියේ නැහැ, ඊට පස්සේ ඒක තව දවසක් මේක දැන ගත්තට පස්සේ නංගී තහවුරු කලා.

ප්‍ර : නංගී මොකක්ද කිව්වේ?

පි : දැනට සෞදි අරාබියාවේ අත්අඩංගුවට අරන් ලංකාවට ගෙනල්ලා තියෙන මිල්හාන් අහමඩ්. මිල්හාන් කියන පුද්ගලයා ගෙදර ඇතුලටම ආවා කියලා කඩාගෙන ගේ ඇතුලටම ආවා කියලා.

ප්‍ර : තව දෙනේනෙක් ආව නේද?

Prosecution Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නැහැ ගේ ඇතුලට කඩාගෙන ගිහිල්ලා තියෙන්නේ මිල්හාන් විතරයි. මෝටර් බයික් එකේ ඇවිල්ලා නංගීගේ ගෙදර. මාව Follow කරලා තියෙන්නේ හතර දෙනෙක් කියන එක තමයි මට

ප්‍ර : ගහුර් කියන එක්කෙනෙකුත්?

පි : ගහුර් මාමා කියන නමින් හඳුන්වන ඒ පුද්ගලයයි, සාදික් අබ්දුල්ලා තව මිල්හාන්.

ප්‍ර : සාදික් අබ්දුල්ලා කියන්නේ අර මාවනැල්ල.

පි : බුදු පිළිමය කැඩීමේ සිද්ධියේ ප්‍රධාන සැකකරුවා. මිල්හාන් කියන පුද්ගලයා මට ඒගොල්ලන්ගේ නම් TID එකෙන් ලබාගත් පරිදි හුයේන් උල් රිස්වි කාලිඩ් කියන පුද්ගලයා, ගහුර් මාමා මොහොමඩ් ෂරීෆ් ආදම් ලෙබ්බේ නැමති ගහුර් මාමා, හයාදු මොහොමඩ් අහමඩ් රිල්වාන්, සාදික් අබ්දුල්ලාහක් ඊබ්‍රාහිම්.

ප්‍ර : ඒ කොයි දවස්වලද?

පි : **2018** අගෝස්තු **6** වෙනිදා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : මා ඔබෙන් ප්‍රශ්නයක් ඇසුවනේ අර සහරාන්ව දැක්කොත් හඳුනන්න පුළුවන්ද කියලා?

පි : ඔව්.

ප්‍ර : ඔබේ අවධානයට C323 ලේඛනය පෙන්නනවා, එහි දකින්න තියෙන ඒ ඡායාරූප වල ඉන්න කවුරු හරි ඔබට හඳුනන්න පුළුවන්ද?

(සාක්ෂිකරු C323 ලේඛනය කෙරෙහි අවධානය යොමු කරයි)

පි : සහරාන් කියලා කියන්න පුළුවන්.

ප්‍ර : ඒ කොයි ඡායාරූපයේද ඔහු ඉන්නේ?

පි : උඩ තියෙන ඡායාරූපයේ ඇදේ ඉන්න පුද්ගලයා.

ප්‍ර : ලේ දන්දෙන පුද්ගලයා?

පි : ලේ දන් දෙන පුද්ගලයා.

ප්‍ර : සහරාන් මාවනැල්ල ආවයි කිව්වේ

පි : **2007, 2008 2009** අතර තමයි. හරියටම මට ඒ අවුරුද්ද

ප්‍ර : මොන පල්ලියේද?

පි : මාවනැල්ල මුවන්දෙනිගොඩ ප්‍රදේශයේ පිහිටලා තියෙන මස්ජිතුල් ෆවුසාන් කියන පල්ලියේ.

****

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : අවස්ථා දෙකේදිම එතනටද ආවේ?

පි : අවස්ථා දෙකේම ඒ පල්ලියට තමයි ආවේ.

ප්‍ර : එතකොට එතන හිටපු මව්ලවී කවුද මතකද?

පි : මතකයි. ෆරීඩ් අලියාර් කියන මව්ලවී.

දැන් වේලාව ප.ව. **7.00** යි.

මෙතැන් සිට වාර්තා කරන්නේ මුතුමාලි මෙනවිය විසින්ය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව.07.00
පෙර සටහන් ල/ලේ : ධම්මිකා මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය</u>

ප්‍ර : ඔබ සමඟ ඒ සහරාන්ගේ දේශනවලට ඔබේ මිතුරන් සහභාගි වුණද?

පි : ඔව් තවුහිද් ජමාත් එකේ මාත් එක්ක එකට වැඩ කරපු

ප්‍ර : ඔබට මතකද ඒ කවුද ඒ මිතුරන් කියලා කියන්න?

පි : නස්ලී, නස්ලී නියාස්.

ප්‍ර : නස්ලී නියාස් කොහේ එක්කෙනෙක්ද?

පි : මාවනැල්ලේ එක්කෙනෙක්.

ප්‍ර : මාවනැල්ලේ?

පි : මාවනැල්ලේ එක්කෙනෙක්.

ප්‍ර : වෙන ඊම්බ්‍රාන්

පි : ඊම්බ්‍රාන්

ප්‍ර : ඊම්බ්‍රාන් කොහේද?

පි : ඊම්බ්‍රාන් මාවනැල්ල.

ප්‍ර : මාවනැල්ලේ.

පි : කබීර්.

ප්‍ර : කබීර් කොහේද?

පි : මාවනැල්ලේ.

ප්‍ර : මාවනැල්ලේ.

පි : මාවනැල්ලේ කට්ටිය තමයි මට මතක විදිහට ගොඩක් අය සහභාගි වුණා. එක වතාවක් එයා එනකොට වැන් එකකින් ආවේ එයාත් එක්ක පිරිසක් ආවා වැන් එකේ. මම එයාලත් එක්ක කතා කළේ නෑ. නමුත් ඒ කුරුණෑගල අය කියලා විතරක් කවුරු හරි කිව්වා මට.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර : දැන් මේ සහරාන් යම් කිසි අවස්ථාවකදී ගනේතැන්නේ පල්ලියේ මවුලවි වෙලා හිටියා කියලා ඔබ දන්නවාද?

පි : නෑ දන්නේ නෑ.

ප්‍ර : ඒ කියන්නේ ඔබ කොයි කාලේද මාවනැල්ලට ආවේ?

පි : 1990

ප්‍ර : ඒ ආසන්න කාලේ දී හිටියා කියලා ඔබ දන්නේ නැද්ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : 1990 දී අපි සහරාන් ගැන කවුරුත් දැන ගෙන හිටියේ නෑ.

ප්‍ර : නෑ ඊට මෙහා?

පි : 2009 වෙනකම් මම හිටියා මාවනැල්ලේ 2009 ජූනි 25 වෙනකම්. ඒ කාලේ සහරාන් මාවනැල්ල ගනේතැන්න පල්ලියක මවුලවී වෙලා හිටියේ නෑ. 2009 ජූනි 25

ප්‍ර : මාවනැල්ලේ නෙවේ ගනේතැන්නේ?

පි : ගනේතැන්නේ හිටියේ නෑ. ඒ දවස්වල ඉඳලා තිබ්බා නම් එයාගේ දේශනා හරි එයාව හම්බ වෙන්න හරි මම අනිවාර්යෙන් ගිහිල්ලා ඇති. එහෙම හිටියේ නෑ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර : ඔබ ඉතාමත්ම තෘප්තිමත් විදිහට තමයි සහරාන් ගැන කතා කරන්නේ නේද මතක් කරන කොට?

පි : ඒ කාලේ එයා

ප්‍ර : නෑ මම කියන්නේ I am just referring to the satisfaction you had on your face. We know you are speaking about your past?

පි : yes.

ප්‍ර : ඔබ ඔබේ අතීතය ගැන කතා කරන්නේ?

පි : Yes, I never had a bad encounter with Zaharan

ප්‍ර : yes.

පි : Until TID come and told me that he tried to kill me. But my face to face, over the phone or whatever it is he was used to be a very nice person with me.

ප්‍ර : ඔබ ඔහුට ඉතාම කැමැත්තෙන් හිටියාද?

පි : ඔව් එයාගේ දේශනාවලට, එයා ප්‍රශ්නවලට උත්තර දෙන විදිහට මම කැමැත්තෙන් හිටියේ.

ප්‍ර : ඔබ අහන ඕනේම ප්‍රශ්නේකට ඔහුට උත්තරයක් තිබුණාද?

පි : ඔව් තිබුණා.

ප්‍ර : දැන් ඒ සහරාන්ගේ දේශන වලට සහභාගි වුණු ඔබේ මිතුරන්ගේ සහරාන් පිළබඳව තිබුණු අදහස මොනවාගේ ද කියලා ඔබට ඔවුන් සමඟ කතා කරන්නට අවස්ථාව ලැබුණාද?

පි : ඔව්.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප : එතකොට ඔබට දැන ගන්න ලැබුණද ඔවුන්ගේ සිත් තුළ සහරාන් පිළිබඳව මොනවගේ ආකල්පයක්ද ගොඩ නැගිලා තිබුණේ කියලා?

පි : එයා හරි හොඳයි කියන ආකල්පය තමයි, ආගම ගැන හොඳට දන්න එක්කෙනෙක්, ලස්සනට විග්‍රහ කරන්න, ඕනේ ප්‍රශ්නේකට ලස්සනට උත්තර දෙන්න ඒ වගේම විරුද්ධ මතවාදීන් එක්ක විවාද කරන්න පුළුවන් දක්ෂ පුද්ගලයෙක් කියන මතය තමයි තිබුණේ .

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප : දැන් සහරාන් සම්බන්ධයෙන් තමන් ඔහුගේ මතවාදයට අදහස් වලට කැමති වුණා කියලා කිව්වා දේශනවලට සවන් දුන්නා කියලා කිව්වා?

පි : හරියට කිව්වොත් ඒ සහරාන්ගේ මතවාදය නෙවෙයි තවුහිද් මතවාදය.

ප : තවුහිද් මතවාදය.

පි : ඒ මතවාදයේ සහරානුත් හිටියා අපිත් හිටියා ඒ මතවාදය ලස්සනට ඉදිරිපත් කරන්න පුළුවන් දක්ෂතාවය සහරාන් ගාව තිබුණා.

ප : තමන් දැන් ඒ මතවාදයට විරුද්ධයි නේද?

පි : ඔව් විරුද්ධයි.

ප : ඒ ඇයි එහෙනම් විරුද්ධ නම් ඒ ඔහු පසුපස ගියේ? ඔහුගේ දේශන සඳහා?

පි : මම විරුද්ධ වුණේ 2012 ට පස්සේ. ආගම වැරදි කියන දේ මම තේරුම් ගන්න පටන් ගත්තේ 2012 ට පස්සේ. මේවා සිද්ධ වුණේ 2007, 2008, 2009 කාලවකවානු තුළ.

ප : 2012 දී එහෙම වෙනස් වීමට විශේෂ හේතුවක් තිබ්බද?

පි : ඔව්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය</u>

ප : මොකක්ද ඒ?

පි : මම 2009 දී සෞදි අරාබියාවට ගියාට පස්සේ මට මේ කිසිම ඉස්ලාමීය සංවිධානයක් එක්ක සම්බන්ධ වීමට අවස්ථාව තිබුණේ නෑ. මම කලින් සඳහන් කළා මම යාපනයේ ඉඳලා 1990 දී අනාථයෙක් හැටියට තමයි මාවනැල්ලට refugee හැටියට තමයි මාවනැල්ලට එන්නේ. මගේ තාත්තා ගුරුවරයෙක්. අම්මා

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගුරුවරියක්. දෙන්නාම ඒ වෙනකොට විශ්‍රාම ගියා. එතකොට අපිට ලොකු මුදල් පසුබිම තිබ්බේ නෑ. එතකොට මට මේ laptop එකක්වත් computer එකක්වත් ගෙදර තිබ්බේ නෑ. Internet ගැනවත් මම කලිනුත් කිව්වා ඒ ගැන එච්චර දැනුමක් තිබ්බේ නෑ. මම ඒවා ඔක්කොම මට මේ ලැබෙන්නේ සෞදි අරාබියාවට ගිහිල්ලා මම මේ හම්බ කරන්න පටන් ගත්තට පස්සේ තමා හම්බ වෙන්නේ. ඒ වුනාට සෞදි අරාබියාවෙත් මට ඒවාට යොමු කරන්න ගොඩාක් වේලාව තිබ්බේ නෑ. තිබ්බ වෙලාවල්වල මම face book වල යම් කිසි දේවල් හොයනවා. ඒ වුනාට ලංකාවට එනවා **2011** අන්තිම කාලේදී. ආපු ගමන්ම තමයි ලංකාවේ දඹුල්ල පල්ලිය ගැන ප්‍රශ්නේ තියෙනවා.

ප : මොකක්ද තිබ්බ පල්ලිය?

පි : ඉමානුවල සුමන හාමුදුරුවෝ ඒ පල්ලිය අයින් කරන්න ඕනී කියලා

ප : හ්ම්.. හ්ම..

පි : දඹුල්ල පුජා භූමිය ඇතුළේ ඒ පල්ලිය පිහිටලා තියෙනවා. ඒක අයින් කරන්න

ප : ඉනා මළුවේ සුමංගල හාමුදුරුවෝ

පි : ඉනා මළුවේ සුමන හාමුදුරුවෝ

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප : සුමංගල හාමුදුරුවෝ

පි : ඉනා මළුවේ සුමංගල හාමුදුරුවන්ගේ නායකත්වයෙන් ප්‍රශ්න ඇති වෙනවා එතකොට මුස්ලිම් අය මම සමාජ මාධ්‍ය ජාලා ගැනවත් එච්චරම ගැඹුරට දන්නේ නෑ. කවුරුහරි මුස්ලිම් අය face book group එකක් හදනවා රහසිගත face book group එකක් ඒකේ අරමුණ වෙන්නේ ඉස්ලාම් ආගමට විරුද්ධව එන ඕනේම මේ face book page එකක් පිටුවක් report කරලා නැති කරන එක. ඒක group reporting. ඒකේ මාව add කරනවා. **12000** ක් වගේ ප්‍රමාණය හිටියා කියලා තමයි මට මතකයි. මුස්ලිම් අය හිටියා. එතකොට මේ දඹුල්ල ප්‍රශ්නය පදනම් කර ගෙන තමයි මුස්ලිම් අයට විරුද්ධව තමයි ගොඩක්ම face book pages එතන සඳහන් වුණේ. ඒවා අයින් කරන්න කියලා. එතකොට මම ඒවා report කර ගෙන යනවා. යනකොට සාමාන්‍යයෙන් බලනවා මොනවද තියෙන්නේ කියලා. **90%, 95%** ක් වගේ තිබුණේ අසභ්‍ය

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වචනවලින් මුස්ලිම් අයට ඉස්ලාම් ආගමට බැන වැදිලා තමයි තිබුණේ. ඒත් 5% ක් වගේ තිබුණා යම් කිසි ධනාත්මක විවේචන. ඒ කවුද ඒවා කළේ මොකද දන්නේ නෑ. ඊට පස්සේ මටත් පොඩ්ඩක් මම මේ ඔක්කොම ඉස්ලාම් ආගමේ නබිතුමාගේ අනිත් පැත්ත ගැනත් හරි කියලා විශ්වාස කරලා ඉගෙන ගෙන හිටියා. මම එතන ඉදිරිපත් කරන කොටත් මම කිව්වා මේ ඉස්ලාම් මුස්ලිම් වෙලා හිටපු කාලෙත් මම මේක දැන ගෙන හිටියා කියලා. ඒවට විරුද්ධ මත ඒවා විවේචනය කරන ඒවා දැක්ක ගමන්ම මම ඒවා report කරන්නේ නැතුව ඒවා book mark කළා.

ප : හ්ම් හ්ම් ඇයි ඒ?

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය</u>

පි : ඒවා පස්සේ බලන්න ඒකෙන් මොනවද අලුත් අලුත් දේවල් එන්නේ කියලා. එතකොට එතනින් තමයි මතය වෙනස් වෙන එක පටන් ගත්තේ.

ප : ඔබ අලුතින් හිතන්න පටන් ගත්තා?

පි : අලුතින් හිතන්න පටන් ගත්තා වෙනස් විදිහට එතකොට මට I was confused but it is going on කියන එක. කාලේ අවුරුද්දක් විතර වගේ මට කාලයක් ගියා. ආගම වැරදි කියලා නවත්තන්න ඕනී කියන මේක පිළිපදින්නේ නැතුව මේකෙන් අයින් වෙන්න ඕනී කියන මතයට එන්නත් මට අවුරුද්දක් විතර කාලය ගියා.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප : ඔබ සහරාන් එක්ක කතාබහ කරන කොට ඒ ප්‍රශ්න අහන කොට ඔබට කොයි වගේද හැඟුණේ සහරාන් ඔබ කෙරෙහි දක්වන කැමැත්ත? ප්‍රතිචාරය?

පි : Phone එක answer කළොත් එයා හරි මිත්‍රශීලි විදිහට කතා කරනවා.

ප : ඒ කියන්නේ ඔබ ඒ සම්බන්ධතාවය දිගටම පවත්වාගෙන ගියා නම්

පි : ඔව්.

ප : ඔබත් සහරාන්ගේ ගොඩට යන්න තිබුණද?

පි : වෙලා තිබුණ් නැති දේවල් ගැන මට කියන්න අමාරුයි. ඒක මම ප්‍රතික්ෂේප කරන්නෙත් නෑ පිළිගන්නෙත් නෑ දෙකටම chance එකත් තිබුණා කියලා තමයි කියන්න පුළුවන් වෙන්නේ. මම

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දන්නේ නෑ ඒ ගැන කියන්න අමාරුයි මොකද මම දැන් ගොඩක්ම වෙනස් වෙලා ඉන්න හින්දා ඒ line එකේ ඉඳලා පොඩ්ඩක් හිතන්න අමාරුයි. ඒත් chance එකක් තිබ්බේම නෑ කියලා මම සම්පූර්ණයෙන්ම ඒක ප්‍රතික්ෂේප කරන්නෙත් නෑ. මොකද ඉස්ලාම් ආගම හරියට භක්තියෙන් පිළිපදින කොට එතනට යන එක වැරදි කියලා හිතන්න හේතු අඩුයි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සහරාන් අන්තිමට හම්බ වුණේ කවදාද?

පි : 2009 ට කලින් තමයි . 2009 ත් මම හම්බ වුණා කියලා මතක නෑ. 2009 දීත් හම්බ වුණේ නෑ. 2008, 2007 වගේ තමයි දෙවරක් තමයි ආවේ මාවනැල්ලට. එයා කොහේද හිටියේ කියලා මම කුරුණෑගල නැත්නම් කාත්තන්කුඩි තමයි හිටියේ.

ප්‍ර : ඊට පස්සේම හම්බ වුණේ නෑ ? දැක්කේ නෑ?

පි : හම්බ වුණේම නෑ. දැක්කේම නෑ.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : දැන් සහරාන් මාවනැල්ලට ආවානේ අවස්ථා දෙකකදී ?

පි : ඔව්.

ප්‍ර : කිසියම් පල්ලියක නමකුත් ඔබ සඳහන් කළානේ?

පි : ඔව්.

ප්‍ර : ඔය ඊබ්‍රහීම් මවුලවිගේ සම්බන්ධතාවයක් ඒ කාලේ සහරාන් සමඟ තිබුණාද ඔය සාදික්ගේ පියා?

පි : නෑ තිබුණේ නෑ. ඒ ඊබ්‍රහීම් මවුලවි එතකොට නියෝජනය කළේ ජමාතේ ඉස්ලාමීය සංවිධානය. තවුහිද් හා ජමාතේ ඉස්ලාමීය අතර මත ගැටුමක් තිබුණා. සහරාන් පවා දැක්කේ ජමාතේ ඉස්ලාමීය සංවිධානය ඒ දවස්වල විරුද්ධමතවාදීන් හැටියට.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : 2009 වෙනකම් ඔබ කිව්වා ඔබ මාවනැල්ලේ හිටියා කියලා තවුහිද් ජමාත් සංවිධානයේ සමඟ සම්බන්ධ වෙලා?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබ දන්නවාද 2006 විතර වෙනකොට සාදික් මොහොමඩ් ජමාතේ ඉස්ලාමීය ශිෂ්‍ය සංගමයේ සභාපති වුණා කියලා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නෑ මම දන්නේ නෑ.

ප්‍ර : ඔබට මේ සාදික් මොහොමඩ් හම්බ වුණේ නැද්ද 2009 ට ඉස්සෙල්ලා?

පි : හම්බ වෙලා කියන්නේ මේ ඊබ්‍රහීම් මවුලවිත් එක්ක දැකලා තියෙනවා පොඩි කාලේ. මොකද මම 93 ඉඳලා වගේ 92,93 ඉඳලා වගේ ජමාතේ ඉස්ලාමීත් එක්ක සම්බන්ධ වෙලා හිටියා. ඒ කාලේ එයා කුර්ආන් පන්ති පවත්වන්න ඇවිල්ලා තියෙනවා. ඊට පස්සේත් මම එයාව දැකලා තියෙනවා. කොයි කාලේද මම සාදික්ව දැක්කේ කියලා මට මතක නෑ. ශිෂ්‍ය සංගමය ගැන මම එච්චර වැඩිපුර ඇතුළ් තියෙන තොරතුරු මම දන්නේ නෑ මොකද ශිෂ්‍ය සංගමය කියන්නේ ජමාතේ ඉස්ලාමීයට අයිති එකක්. මම හිටියේ තවුහිද් ජමාත් එක්ක. ඒ ගොල්ලොන්ගේ අභ්‍යන්තර දේවල් ගොඩාක් දුරට දැන ගන්න ලැබෙන්නේ නෑ.

ප්‍ර : එතකොට 2009 වෙනකම් තවුහිද් ජමාත් සංවිධානයට සාදික් මොහොමඩ් සම්බන්ධතාවයක් තිබ්බද?

පි : මම දන්න තරමට තිබ්බේ නෑ.

ප්‍ර : ශාහිඩ් මොහොමඩ්?

පි : නෑ තිබ්බේ නෑ. මම දන්න තරමට එයාලා කවුරුත් සම්බන්ධතාවයක් තිබ්බේ නෑ. මම දන්න තරමට. මාවනැල්ලේ එහෙම

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු තමන් ඉස්සෙල්ලා කිව්වා මේ තමන් මරන්න සහරාන්ගේ කට්ටියක් ආවා කියලා ? තමන් එයට හේතුව මොකක්ද කියලා ප්‍රකාශ කරන්න පුළුවන්ද?

පි : ඔව්. ආගම අතඇරලා ආගම ගැන විවේචන ඉදිරිපත් කරපු එක තමයි හේතු වෙලා තියෙන්නේ . මම එක්ස් මුස්ලිම් කියන පදයවත් ඒ tittle එකවත් මම භාවිතා කරලා තිබ්බේ නෑ. කවුරු හරි ඇවිල්ලා මගේ ආගම මොකද කියලා face book එකෙන් මගෙන් ප්‍රශ්න කළොත් මම ඒකට කෙළින්ම උත්තර දෙන්නේ නෑ. මම ආගම අත ඇරියා කියලවත් කියලා නෑ. ඒත් සහරාන් අර 04 දෙනාටම කියලා තියෙනවා මෙයා එක්ස් මුස්ලිම් ඒ උෆරාව මරන්න කියන වචනේ තමයි භාවිතා කරලා තියෙන්නේ. මට ත්‍රස්ත විමර්ශන ඒකකයේ නිලධාරීන් කියපු පරිදි.

ප්‍ර : දැන් තමන් ඒ මොන වර්ෂයේද ඔය සිද්ධිය වුණේ?

FAIR COMMENT
BY JEZEEM

පි : 2018 අගෝස්තු 06 වෙනිදා තමයි පළවෙනි වතාවට මාව මරන්න 04 දෙනෙක් යවලා තියෙනවා. දෙවෙනි වරට මිල්හාන් අපේ නංගීගේ ගෙදර ගිය දවස නම් මම දන්නේ නෑ.

ප්‍ර : දන්නේ නෑ. මිල්හාන් තමන්ගේ නංගීගේ ගෙදර දන්නේ කොහොමද?

පි : ඒ දවස ඒ කියන්නේ අගෝස්තු 06 වෙනිදා 2018 මාව ලුහු බැඳලා follow කරලා තියෙනවා. Follow කරලා ඒ දවස මම අන්තිමට ගිහිල්ලා තියෙන්නේ නංගීගේ ගෙදර. එතකොට ඒ කට්ටිය මාව පිටිපස්සේ මිල්හානුත් ඇවිල්ලා තියෙනවා. ඒගොල්ලො හිතාගෙන මගේ ගෙදර ඒක තමයි කියලා.

ප්‍ර : තමන් 2018 කොහේද නංගීගේ ගෙදර තියෙන්නේ?

පි : මාළිගාකන්ද පාරේ. මගේ නිවස තිබුණේ ඒ පාරේමයි. මීටර් 50 ක් 75 ක් වගේ දුර පරතරය පාරේ දෙපැත්තම. අනිත් වම් පැත්තේ නංගීගේ ගෙදර තියෙන්නේ. මම ජීවත් වෙච්චි ගෙදර දකුණු අත පැත්තේ තියෙන්නේ.

ප්‍ර : තමුන් සිටින ස්ථානය ඒ කණ්ඩායම දැන ගෙන හිටියාද?

පි : නංගීගේ ගෙදර තමා මගේ ස්ථානය කියලා මගේ නිවස කියලා හිතාගෙන ගිහිල්ලා තියෙන්නේ.

ප්‍ර : 2009 න් පස්සේ තමන් මාවනැල්ලේ හිටියේ නැනේ?

පි : 2009 න් පස්සේ මම හිටියේ නෑ.

ප්‍ර : ඊට පස්සේ 2018 වෙනකොට කොහොමද තමන් සිටින ස්ථානය එම කණ්ඩායම දැන ගත්තේ?

පි : ඒක TID එකේ මට ලැබිච්චි තොරතුරු මත සහරාන් අණ කරලා තියෙනවා හුසෙයින්උල් රිස්වික් බාලිඩ සමීර් කියන මට්ටක්කුලි පදිංචි පුද්ගලයාට මාව හොයන්න කියලා. ඒ වුණාට හොයන්න බැරි වෙලා තියෙනවා. එතකොට මම දන්නවා මට තර්ජන තියෙනවා ප්‍රශ්න තියෙනවා කියලා මම මගේ face book එකේ කවදාවත් මම යන ගමන් බිමන් ගැන මොකුත්ම සඳහන් කරන්නේ නෑ. කොහේ හරි ගිහිල්ලා ඔක්කොම ඉවර වුණාට පස්සේ සතියකට පස්සේ නැත්නම් මාසේකට පස්සේ තමයි ඒ පින්තූර මම පල කරන්නේ දාන්නේ. එහෙම නැතුව මම දාන්නේ නෑ. එතකොට මේගොල්ලො හොයලා හොයලා ඉඳලා තියෙනවා ඒ ගොල්ලන්ට කිසිම Clue එකක් හම්බ වෙලා නෑ. මොකද මම මගේම පොඩි ව්‍යාපාරයක් කරපු හින්දා හැමදාම මට යන්න වෙන්නෙත් නෑ. ඉඳලා ඉඳලා තමයි යන්නේ එතකොට උදේම duty එකට යනවා ඒ වගේ මොකුත් ඒගොල්ලොන්ට හොයන්න

තිබුණේ නෑ. එක දවසක් අපි මේ උද්ඝෝෂණයක් සංවිධානය කරලා තිබ්බා මායි මගේ යාළුවොයි ළමා හා කාන්තා අමාත්‍යාංශය ඉස්සරහා. ඒකට හේතුව ඇවිල්ලා දාරුන් හුස්රා කියලා Doctor මරීනා රිෆායිට අයිති

ප්‍ර : දෙහිවල?

පි : දෙහිවල අයිති ළමා නිවාසේක මුස්ලිම් දැරියෝ 17 ක් abused අපයෝජනයට ලක් වෙච්ච සිද්ධිය සම්බන්ධයෙන් නීතිය ඉල්ලලා අපි පොදුවේ උද්ඝෝෂණයක් සංවිධානය කළා. එතකොට ඒකට පිරිසක් එන්න ඕනී කියන වුවමනාවෙන් ජූලි මාසේ ඒ අවුරුද්දේම 29 වෙනිදා මට මතක හැටියට ඒ face book post එකත් මම භාර දීලා තියෙනවා. මම දැම්මා ඒ දවසට උද්ඝෝෂණය තියෙනවා කියලා. එතකොට ඒක සහරාන් දැකලා කියලා තියෙනවා ඒ ඌරාව මරන්න කියලා තමයි 04 දෙනාම යවලා තියෙන්නේ.

ප්‍ර : සාමාන්‍යයෙන් ඒ තමන්ලාගේ ඒ ආගමේ ඌරා කියන්නේ මොකද ඒ එහෙම කතා කරන්නේ?

පි : ඌරා කියන්නේ මේ ඉස්ලාම් ආගම අනුව ඉතාමත් අපිරිසිදු සතෙක්. ඒ වගේම හදීස් එකත් තියෙනවා. අන්තිම කාලේ ඒ කියන්නේ ලෝකේ විනාශය ළං වෙන කොට එන ජීසස් වහන්සේ ඒ කියන්නේ ඊසා නබි ඊසා ඉස්ලාම් ආගම අනුව එයා එන්නේ මුස්ලිම් හැටියට ලෝකයට ආපහු එනවා.

ප්‍ර : කවුද ජේසුස් වහන්සේ?

පි : ජේසුස් වහන්සේ එනකොට එයා එන්නේ මුස්ලිම් හැටියට මොහොමඩ් නබිතුමාගේ ආගම පිළිපදින එක්කෙනෙක් හැටියට. එතකොට එතුමා ඌරාව මරා දමනවා. කුරුසය කඩා දමනවා කියලා හදීස් එකේ තියෙනවා. එතනින් අදහසක් ගන්නේ කුරුසය කඩා දමනවා කියන එක ක්‍රිස්තියානි ජනතාව මරලා දමනවා කියන එකයි ඌරා කියන්නේ ඉස්ලාම් ආගමට විරුද්ධව ඉන්න ඉස්ලාම් ආගමේ අපිරිසිදු කියලා හිතන කට්ටිය මරා දමනවා කියන එක තමයි එතනින් අදහස් වෙන්නේ. එතකොට ඉස්ලාම් ආගම අනුව ඉතාමත් අපිරිසිදු කට්ටිය කියලා සඳහන් කරන්නේ යුදෙව් ජාතීකයින් හා ඉස්ලාම් ආගම අත්හැරපු කට්ටිය. එතකොට ඒ අනුව තමයි මට ඌරා කියන නම එයා භාවිතා කරලා තියෙනවා කියලා මට වටහා ගන්න පුළුවන්.

ප්‍ර : එතකොට එයින් හැඟෙනවද සහරාන් ක්‍රිස්තියානි ආගම සමඟ යම් කිසි විරෝධතාවයක් තිබ්බා කියලා?

FAIR COMMENT
BY JEZEEM

පි : ඒ හදීස් එක සහරාන් සඳහන් කරලා නෑ. මම ඒ හදීස් එක මම තමයි මෙතන ඉදිරිපත් කළේ. සමහර විට ඒ හදීස් එක මත එයා ඒ වචනේ භාවිතා කරලා තිබ්බොත් ඒක ඒ idea එක එයාට තියෙනවා කියලා දැන ගන්න පුළුවන්.

ප්‍ර : මනසේ තිබෙන්න පුළුවන් කියලා හිතන්න පුළුවන්?

පි : පුළුවන් කියලා හිතන්න පුළුවන්. කුරුසය කඩනවා ජීසස් වහන්සේ ඇවිල්ලා ඒ කියන්නේ ඊසා නබි Jesus කියන එක ක්‍රිස්තියානි ආගමේ භාවිතා වෙන නම ඉස්ලාම් ආගමේ භාවිතා වන නම ඊසා. ඊසා ඉබුණු මරියම්. ඊසා නබිතුමා මුස්ලිම් හැටියට මොහොමඩ් නබිතුමාගේ ආගම පිළිපදින කෙනෙක් හැටියට මේ ලෝකේට ඇවිල්ලා කුරුසය කඩා දමනවා ඌරාව මරා දමනවා කියලා තියෙනවා. ඌරා ඔක්කොම නැති කරනවා.

ප්‍ර : එතකොට මේ පාස්කු ප්‍රහාරය තමන්ගේ අදහස පාස්කු ප්‍රහාරය සමඟ ක්‍රිස්තියානි පල්ලිවලට පහර දීමෙන් ක්‍රිස්තියානි ආගම සමඟ විරෝධතාවය මත සිදු කළාය කියලා හිතන්න පුළුවන්ද?

පි : මේ හදීස් එක අනුව.

ප්‍ර : ඔව්.

පි : පොඩ්ඩක් අමාරුම ප්‍රශ්නයක්. මොකද මෙතන බෝම්බ ප්‍රහාරය ගැන ගොඩක්ම විමර්ශනය යන හින්දා මේක තමයි හේතු කියලා මට එක මතයක් ප්‍රකාශ කරන්න අමාරුයි. හැබැයි මේ වගේ දෙයක් හදීස් එකේ තියෙනවා කියන එක විතරයි මට මෙතන සඳහන් කරන්න පුළුවන් වෙලා තියෙන්නේ.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : දැන් ඔබ ඉස්ලාම් ආගමෙන් ඉවත් වුණේ මොන අවුරුද්දේද?

පි : 2012 දී.

ප්‍ර : 2012. දැන් සහරාන් ඔබට ඌරා කියලා ප්‍රකාශ කරමින් ඔබව මැරීම සඳහා පිරිසක් එව්වේ 2018 නේ?

පි : ඔව් 2018.

ප්‍ර : එතකොට 2012 ඉඳලා 2018 දක්වා කාලයේදී ඇයි සහරාන් ඔබව හෙව්වේ නැත්තේ?

පි : ඒ ගැන නම් මම හරියට දන්නේ නෑ. මමත් face book එකේ ලියන්න පටන් ගන්නේ 2014 ඉඳලා ලියන්න පටන් ගන්න කොටත් very slowly I start my criticism එතකොට එයාට දැන ගන්න ලැබුණේ කොයි කාලේද කියලා මම දන්නේ නෑ.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : **2018** අගෝස්තු මාසේ වෙනකම් ඔබ සහරාන්ගේ කණ්ඩායමත් සමඟ හිටියා කියලා යෝජනා කළොත් ඔබ ඒ සම්බන්ධයෙන් මොකක්ද කියන්නේ?

පි : නෑ මම ප්‍රතික්ෂේප කරනවා. කිසිම කණ්ඩායමක් එක්ක මම හිටියේ නෑ.

කොමිෂන් සභාවේ වැඩ කටයුතු අද දිනට අවසන් කරන ලද අතර නැවත කොමිෂන් සභාව **2020.03.10** වන දින පස්වරු **01.00** ට පැවැත්වෙන බව දන්වමි.

දැන් වේලාව : **07.30** යි.

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.05.13 වේලාව :- ප.ව. 12.00
සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති
02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික
03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික
04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික
05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා,ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ රවිෂානි පිරිස් මහත්මිය සමඟ ජනාධිපති නීතීඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංක : 430 (වැඩිදුර සාක්ෂි සඳහා කැඳවනු ලබයි)

01. සම්පූර්ණ නම : මොහොමඩ් ඉස්මත් රිස්වින්

(සාක්ෂිකරු ප්‍රතිඥාව ඉංග්‍රීසි බසින් ලබා දෙයි)

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඉස්මත් රිස්වින් මහත්මයා, ඔබ පසුගිය අවස්ථාවේදී මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙනකොට සඳහන් කරපු ඇතැම් කරුණු ගැන මම කැමතියි ඔබේ අවධානය නැවත යොමු කරන්න. ඔබේ සාක්ෂිය අදාළ වුණේ 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කරන ලද කණ්ඩායමේ නායකයාය කියලා අනාවරණය වෙලා තියෙන සහරාන් නැමැත්තාව ඔබ හඳුනා ගන්නා ලද අවස්ථාව ගැන. ඔබ මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කෙරුවා, ඔබට ඔහුව මුණ ගැහිලා තියෙනවා. ඒ වගේම මුවන්දෙණියේ මස්ජිතුල් ෆවුෂාන් පල්ලියේ පැවති දේශනවලට සහරාන් 2006, 2007 වසරවල්වල ඇවිල්ලා තියෙනවා. ඒ අවස්ථාවල්වලදී ඔබට ඔහුගේ දේශනවලට සවන් දෙන්නට අවස්ථාව ලැබිලා තියෙනවා. ඒ වගේම ඔබට අවබෝධ වුණාය කියලා ඔබ මේ ගරු කොමිෂන් සභාවට කිව්වා. සහරාන්ට ඉස්ලාම් ධර්මය පිළිබඳව ඉතා හොඳ දැනුමක් තිබුණ බව. තවදුරටත් ඔබ මේ ගරු කොමිෂන් සභාවට ඔබේ සාක්ෂියේදී සඳහන් කෙරුවා ඔබේ ඒ අවබෝධය හේතු කරගෙන ඔබ විසින්, ඔබේ ඒ අවබෝධය හේතු වුණාය කියලා ආගම සම්බන්ධයෙන් යම් ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට අවශ්‍ය වුණා නම් දුරකථනය මගින් පවා ඔහුව අමතලා ඒ ප්‍රශ්න පිළිබඳව ඔහුගෙන් විමසන්න. එහෙම කිව්වද?

පි : ඔව්. පල්ලියේ නම හෝන්දෙනිගොඩ මස්ජිතුල් ෆවුසාන්.

ප්‍ර : කොහෙද?

පි : හෝන්දෙනිගොඩ මස්ජිතුල් ෆවුසාන්.

ප්‍ර : How do you spell it?

පි : Hondenigoda.

ප්‍ර : ඒ වගේම ඔබ මේ වනවිට ගරු කොමිෂන් සභාව වෙත දැනුම් දීලා තියෙනවා ඉස්ලාම් ආගමේ යම් යම් නිකායන් වශයෙන් බෙදිලා තිබෙනවා. එකක් තමයි තවුහිද් ජමාත් කියන කොටස කියලා. එතකොට ඔබ සඳහන් කරනු ලැබුවා මේ සහරාන් කියන තැනැත්තා තවුහිද් ජමාත් නිකායට අයිති එය වර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් අනිත් අයට දේශනා කරපු, අනිත් අයව පොළඹවපු පුද්ගලයෙක් කියලා නේද?

පි : ඔව්.

ප්‍ර : එහෙම නම් ඔබට මේ ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන්ද ඔබ සහරාන් සමඟ ඒ ඇති කර ගත්ත සම්බන්ධය අනුව ඔහු කොයි

වගේ කෙනෙක්ද? ඔහුට එවැනි සිතුම් පැතුම් ඇති වුණේ කොහොමද කියන එක පිළිබඳව ඔබට යම් අවබෝධයක් ලැබුණද කියලා? If you have done any research after your meeting with him after you speak to him in 2009 you can add that also?

පි : මම දන්නා තරමට, මම හිතන තරමට සහරාන් ඉස්ලාම් ආගම ඒ විදියටම එදිනෙදා ජීවිතයේ පිළිපදින්න ඕන, Follow කරන්න ඕන කියන මතයේ ඉන්න එක්කෙනෙක්.

ප්‍ර : ඒ කියන්නේ ෂරියා නීතිය අනුව ජීවත් වෙන්න ඕනෙයි කියලා හිතන කෙනෙක්ද?

පි : ෂරියා නීතියට වඩා එදිනෙදා ජීවිතයේ තියෙන ආගමික කටයුතු හා ජීවිතයේ එදිනෙදා තියෙන දේවල්. කෑම කන දේවල්, නිදා ගන්න දේ ඉඳන් පල්ලියට යන ඒ වගේ දේවල් ගැන තමයි අපි ගොඩාක් නෝම්බි ඒ වගේ දේවල් ගැන තමයි අපි ගොඩාක්ම අවධානය යොමු කළේ. ඒවා හරි විදියට කරන්න ඕනෙයි කියන මතයේ තමයි සහරාන් හිටියේ. කුරාන් හා හදීස් අනුව විතරයි අපේ ආගම ඉස්ලාම් ආගම අපි Follow කරන්න ඕනෙයි කියන මතයේ තමයි සහරාන් හිටියේ. ඒ වෙනුවෙන් තමයි එයා දේශනා පැවැත්වුවා, පන්ති පැවැත්වුවා. එතනින් ඒකට විරුද්ධ අදහස් නැත්නම් මේ තවුහිද් නැත්නම් මේ කුරාන් හදීස් එකේ කියලා තියෙන දේවල්වලට විරුද්ධ විදියට නැත්නම් සාම්ප්‍රදායික විදියට හිටපු අයට විරුද්ධවත් එයා දේශනා පැවැත්වුවා.

ප්‍ර : එතකොට ඔහු ඒ තවුහිද් ජමාත් නිකාය අනුව කටයුතු කරන්නට පෙළඹිලා තිබුණේ ඔය කුරානයේ සහ හදීස්වල සඳහන් කරුණු නිසා පමණද? නැත්නම් ඔබට ඔහු සමඟ සාකච්ඡා කරනකොට එහෙම නැත්නම් ඔහු පිළිබඳව සොයා බලනු ලැබූ අවස්ථාවල්වලදී ඊට වඩා කරුණු අනාවරණය වෙලා තියෙනවද? එහෙම නම් ඒ මොනවද?

පි : ඔහු ගැන සොයලා බලපු වෙලාවේ මට අනාවරණය වෙච්ච එකක් තමයි ..,

ප්‍ර : කොහොමද හොයලා බැලුවේ?

පි : මම හිතන්නේ සමාජ මාධ්‍යවලින් මම දැකපු එකක් තමයි ....,

ප්‍ර : Why don't you explain that the accounts that he has the Jamathe Islam has his account so that the Honorable Commissioners will know.....,

පි : It is about his beginning he was admitted to or he joined a Thablik Jamath Madrasa in Kaththankudy where he had disputes with his teachers.

ප්‍ර : This was during what period?

පි : Possibly in 1990s.

ප්‍ර : As a student?

President's Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පි : Yes. As a student. When he started studying the religion he did not agree with the Thablik Jamath view. He studied Quaran Hadees ….,

ප්‍ර : Your evidence if you can give it in Sinhala please. If you find it difficult to express its ok. But other wise for the purpose of record we would like to have it in Sinhala.

පි : හරි. තබ්ලික් ජමාත් එකට අයිති කාත්තන්කුඩියේ තියෙන මද්‍රසා තුන් ෆලා මම හිතන විදියට. ඒ මද්‍රසා එකට තමයි ඉස් ඉස්සරලම සහරාන් යන්නේ. එතනින් සහරාන් ගුරුවරුත් එක්ක නැත්නම් උස්තාර්ලත් එක්ක මත ගැටුමක් ඇති කර ගන්නවා එතනින් උගන්වන්නේ හරි විදියට කුරාන් හදීස් නෙමෙයි කියලා.

ප්‍ර : ඔබ කොහොමද ඔය කරුණු දන්නේ?

පි : සාමාන්‍යයෙන් අරාබි භාෂාව ඉගෙන ගත්තට පස්සේ ඒ වකවානුවල තිබ්බිච්ච යම් යම් සහරාවලින් පළවෙච්ච දේවල්වලින් ඒක අනාවරණය කර ගන්න පුළුවන්. ඒක දැන ගන්න පුළුවන්. ඉතිං සහරාන් එතකොට ඒ ගුරුවරයන්ගෙන් ප්‍රශ්න කරලා තියෙනවා. එතකොට එතනින් මේ මත ගැටුමක් Dispute එකක් ඇතිවෙලා, ඒ මද්‍රසා එකෙන් අයින් වෙලා තමයි වෙන මද්‍රසා එකකට ගිහිල්ලා ඉගෙන ගෙන තමයි එයා තවුහිද් ප්‍රචාරය කරන්න පටන් ගන්නේ.

ප්‍ර : එතකොට මේ ලෝකයේ ඉන්න කවුරු හරි ඔය දැඩි මතධාරීන්ගේ ඒ ඔවුන්ගේ අදහස් උදහස් අනුව යම් ආකාරයක පිළිපැදීමක්, ඒවා පිළිබඳව අනුගමනය කිරීමක් සහරාන්ගෙන් කෙරිලා තියෙනවද නැද්ද කියන එක ඔබ ඔය සොයා බැලීම්වලදී ඔබට දැන ගන්න ලැබුණාද?

පි : 2009 වෙනකම් සහරාන් හිටියේ තවුහිද් කියන මතයේ විතරයි. ඉස්ලාම් ආගම පිරිසිදු විදියට නබිතුමා කරපු විදියට අපි එදිනෙදා ජීවිතයේ අපි Follow කරන්න ඕන කියන මතයේ. 2010 ට නැත්නම් 11 ට පස්සේ, ISIS සංවිධානය ආවට පස්සේ, එතකොට මට සහරාන් එක්ක කිසිම සම්බන්ධතාවයක් තිබුණේ නැහැ. Facebook හා විශේෂයෙන් Facebook හරහා මම සහරාන් විතරක් නෙමෙයි එයත් එක්ක හිටපු අනිත් කට්ටියත් බලපු විදියට එතන තේරුම් ගන්න පුළුවන් වෙච්ච දෙයක් තමයි එයාගේ මතය වෙනස් වෙන්න පටන් ගන්නවා.

ප්‍ර : ඔබ ඔය කරුණු කියන්න සහරාන්ගේ මුහුණු පොතෙහි තියෙන කරුණුවලට ප්‍රවේශ වෙලා තියෙනවද? Did you access his face book?

පි : සහරාන්ගේ මල්ලි ෂයිනි කියන එක්කෙනාගේ ඒ වගේම NTJ – National Thowheeth Jamath Face book පිටුව. මේවට, මේවා විතරක් නෙමෙයි දැනට අත් අඩංගුවේ ඉන්න නවුෆර් මොහොමඩ්ගේ face book, අත් අඩංගුවේ පත් වෙලා ඉන්න රිස්වි ඒ වගේ අයගේ face book මම පිවිසිලා තියෙනවා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : ඔබ පිවිසිලා තියෙනවා?

පි : පිවිසිලා තියෙනවා.

ප්‍ර : එතකොට ඒකෙන් අදහස් වෙනවද ඔබ සඳහන් කරපු අයගේ මුහුණු පොත්වලට බාධාවකින් තොරව තුන්වන පාර්ශවයකට පිවිසෙන්නට පුළුවන් කියලා? You don't want a password you can access.

පි : ඔව් පුළුවන්. ඒගොල්ලන්ගේ Posts ගොඩාක්ම තිබ්බේ Public. ඕනම කෙනෙකුට ඒක Access කරන්න, බලා ගන්න පුළුවන්.

ප්‍ර : එතකොට මොනවද ඔබට අනාවරණය වුණ කරුණු. ඒ ගැන වැඩි පැහැදිලි කිරීමක් කරන්න ගරු කොමිෂන් සභාවට?

පි : සහරාන්ගේ මතය වෙනස් වෙන්න පටන් ගන්නේ ISIS කියන ඒ ත්‍රස්ත කණ්ඩායමගේ ක්‍රියාව බලනකොට නබිතුමා එතුමාගේ ජීවිත කාලයේ, විශේෂයෙන්ම මදීනා ජීවිත කාලයේ, අන්තිම අවුරුදු 10 ඇතුළත කාලයේ කරපු දේවල්, පවසපු දේවල් ISIS සංවිධානයත් එක්ක සම්බන්ධ වෙනවා. ඒක මේ වගේ, මේ නබිතුමාගේ අඩි පාර ඒගොල්ලන් යනවා කියලා හිතන්න පුළුවන් විදියට ඒවා තියෙනවා. එතකොට ....,

ප්‍ර : සමාවෙන්න. ඔබ ඉස්ලාම් ධර්මය හදාරපු පුද්ගලයෙක් විදියට ඔබ ඒ පිළිබඳව යම් මතයකට එන්නට පුළුවන්. නමුත් මේ ගරු කොමිෂන් සභාවට ඔබේ ඒ මතයට ප්‍රවිෂ්ඨ වීමට හේතුව දැන ගන්නට ඕන. ඒ නිසා කරුණාකරලා ඒ ගැන පැහැදිලි කරන්න පුළුවන්ද? කොහොමද ඔබ කියන්නේ ISIS සංවිධානය සහ නබිතුමාගේ ඒ හැසිරීම අතර සමානත්වයක් තියෙනවා කියලා. මොනවද ඒ සඳහා ඔබ පාදක කර ගන්න කරුණු?

පි : මම ඒ සඳහා සමහර ලිපි ලේඛන ඉදිරිපත් කරලා තිබ්බා. නබිතුමාගේ ජීවිත කාලයේ එතුමා කරපු දේවලුයි, දැන් අපි මාධ්‍ය හරහා ISIS ත්‍රස්ත සංවිධානය Perform කරපු දේවලුත් එක්ක බලනකොට ඒවා දෙක අතර ගොඩාක් සමානතා අපිට දකින්න පුළුවන්.

ප්‍ර : ඔබට කෙටියෙන් ඒවා කරුණු 1, 2, 3 කියලා ගොනු කරන්නට පුළුවන්ද?

පි : විශේෂයෙන් වහල් ව්‍යාපාරය, අන්‍යාගමික මිනිසුන්ට පහර දීම, ඒගොල්ලන්ගේ කාන්තාවෝ වහලුන් හැටියට අල්ල ගැනීම, කිලාෆත් කියන ඉස්ලාමීය රාජ්‍යය Declaring the khilafat ප්‍රකාශයට පත් කිරීම, ඒකට ඕනෑම මුස්ලිම්වරයෙකුට ඇවිල්ලා රැකවරණය ගන්න පුළුවන් කියන ප්‍රකාශය වැනි කරුණු දැනට මට කියන්න පුළුවන්. ඒ වගේම ෂරියා නීතිය ක්‍රියාත්මක වීම පොඩි දඬුවමකට පවා, වරදකට පවා ෂරියා නීතිය අනුවම දඬුවම් දෙන ක්‍රමය ඒගොල්ලන් Perform කරා.

****

ගරු සභාපතිතුමා :

Proof Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : What is meant by the Madeena declaration?

පි : Madeena declaration as far as my understanding when Mohomed when to Madeena before gaining the power. එයා බලය අත්පත් කර සම්පූර්ණයෙන්ම ඒ ප්‍රාන්තයේ බලය අත්පත් කර ගැනීමට කලින් මදීනා නුවරට පිටින් හිටපු ගෝත්‍රික නායකයොත් එක්ක, ගෝත්‍රිකයොත් එක්ක කරගත් ගිවිසුම. කොහොමද මේගොල්ලන්ගේ අතර තියෙන ප්‍රශ්න විසඳ ගන්නේ, මිනිස්සුන්ව කොහොමද සළකන්නේ කියලා කරපු ගිවිසුමක්. ඒක මම දකින්නේ එක්තරා විදියේ Tactical Move එකක් කියලා. අපි පොඩ්ඩක් මේකෙන් එළියට ගියොත් දෙවනි ලෝක මහා යුද්ධයට කලින් හිට්ලර් රුසියාවත් එක්ක එවැනි ගිවිසුමකට නැත්නම් සමහර රටවල් එක්ක හිට්ලර්ට ඒ වගේ ගිවිසුමක් තිබ්බා. අපි වෙන රටකට පහර දෙනකොට ඕගොල්ලන් ඒකට මැදිහත් වෙන්න හොඳ නැහැ කියන වගේ ගිවිසුමක්. Madeena declaration එකත් ඒ විදියට Declare කරලා එයා ගිවිසුම් ටිකක් අත්පත් කරගෙන තිබ්බා. ඒ වෙන ගෝත්‍ර දෙකක් අතර ප්‍රශ්නයක් මොහොමඩ් නබිතුමාගේ මේ පාලනයයි, වෙන ගෝත්‍රයත් එක්ක ප්‍රශ්නයක් එනකොට අනෙක් ගෝත්‍රවල් අර ප්‍රශ්නයට මොහොමඩ් නබිතුමා පහරදෙන ගෝත්‍රයට සහාය දෙන්න හොඳ නැහැ වගේ දේවලුත් අඩංගු වෙලා තිබුණා. As far as my understanding if I'm correctly getting madeena declarataion.

ප්‍ර : ඔබ Madeena declaration එක කියවලා තියෙනවද?

පි : ජමාතේ ඉස්ලාමිය ඉන්න කාලයේ මම කියවලා නැහැ. ඒ ගැන මට කියවලා දීලා තියෙනවා. ඒ ගැන ....,

ප්‍ර : Madeena Declaration එකේ මොනවද තියෙන්නේ කියලා උගන්වලා තිබ්බද?

පි : මතකයේ හැටියට උගන්වලා තිබ්බා. ඔව්.

ප්‍ර : මතකයේ හැටියට ඒකේ තියෙන කරුණු කිහිපයක් කියන්න පුළුවන්ද?

පි : මට දැනට මතක නම් අර ගිවිසුම් ගෝත්‍රත් එක්ක අත්සන් කරපු ගිවිසුම. ඒ වගේම the captives අත් අඩංගුවට ගත්ත කට්ටිය කොහොමද Treat කරන්නේ, ඒගොල්ලන් සළකන්නේ කොහොමද, ඒ ගොල්ලන් හුවමාරු කරන්නේ කොහොමද වැනි දේවල් තමයි මට දැනට මතකයේ හැටියට තියෙන්නේ.

ප්‍ර : ඔබගේ මතකයේ හැටියට සහරාන් කෆීර් කියන වචනයෙන් පාවිච්චි කරපු අර්ථයයි, Madeena Declaration එකේ අන්‍යාගමිකයන් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගය සමානද වෙනස්ද?

පි : Madeena Declaration එකේ අන්‍යාගාමිකයන් ගැන කියලා තියෙන්නේ මොකද්ද කියන එක මට මතක නැහැ.

****

FAIR COMMENT
BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඔව්. ඔබෙන් මම විමසමින් සිටියේ සහරාන් හෂීම් ඔහුගේ මේ තවුහිද් ජමාත් සංවිධානය සම්බන්ධයෙන් සහ ඒ අනුව ඒක දේව වාදය. තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා කුරානයෙන් සහ හදීස්වලින් හැරෙන්නට ඔහු ආභාෂය ලැබූ, ඔහු ගුරුහරුකම් ගන්න ලද වෙනත් සංවිධාන හෝ පුද්ගලයින් සිටිය බවක් ඔබ ඔහු සමඟ කථා කරනකොට හරි එහෙම නැත්නම් ඔහු පිළිබඳව සොයා බලනවිට හරි, කරුණු සොයා බලනවිට හරි අනාවරණය වුණාද කියලා?

පි : 2009 ට කලින්ද පස්සෙද.

ප්‍ර : කොයි වෙලාවක හරි ඔබ සොයා බලනකොට. මොකද යම් යම් පුද්ගලයින් පිළිබඳව අපට කරුණු සොයා ගන්නට ඕන?

පි : 2009 ට පස්සේ බලනකොට මට තේරුණා අබුබකර් අල් බක්තාදී ගැන එයා ඒ විදියට හිතන්න පටන්ගෙන තිබුණා. එතකොට ඒකට විශේෂයෙන් මම දැකපු එකක් තමයි නවුෆර් මොහොමඩ්ගේ Involvement එක, ඒක සහන විදියට තිබුණා. සහරාන් දේශනාව පටන් ගන්න කාලයේ කාත්තන්කුඩියේ තියෙනවා දාරුල් අතාර් කියන සංවිධානය. මේ නවුෆර් මොහොමඩ්, සහරාන් සහ තව දේශකයෝ ඒකේ ඉන්නවා. ඒ ඔක්කොම එකට තමයි ඒ දේශනා කටයුතු කරගෙන යන්නේ. ඊට පසු ....,

ප්‍ර : ඔබට මතකද අනිත් දේශකයින්ගේ නම් එහෙම?

පි : නෂ්ලිව් මවුලවී කියලා එක්කෙනෙක් හිටියා. අෂ්වර් පළාහි කියලා මවුලවී කෙනෙක් හිටියා. ඒ වුණාට ගොඩක්ම කැපී පෙනෙන විදියට එතන හිටියේ සහරාන්. ඊට පස්සේ සහරාන්ට මොනවා හරි මත ගැටුමක් ඇති වෙලා එතනින් අයින් වෙනවා. එතකොට මම දන්නවා නවුෆර් මොහොමඩ් එක්ක එයාට එතරම් හොඳ සම්බන්ධතාවයක් තිබුණේ නැහැ අයින් වෙච්ච අළුතින්.

ප්‍ර : කවුද මේ නවුෆර් මොහොමඩ් කියන්නේ?

පි : නවුෆර් මොහොමඩ් කියන එක්කෙනා දැනට අත් අඩංගුවට පත්වෙලා ඉන්නවා ISIS එකේ නායකත්වය සහරාන්ට පස්සේ භාර ගන්න හිටියා කියලා මාධ්‍යවල පළ වෙලා තිබුණා. එයා ඉස්ලාහි ඇරබික් කොලේජ් එකේ ඉගෙන ගත්ත එක්කෙනෙක්. එයාගෙත් ගම කාත්තන්කුඩිය. බෝම්බ ප්‍රහාරයට පස්සේ එයා කටාර්වල තමයි දිග කාලයක් රැකියාවක යෙදී සිටියා. බෝම්බ ප්‍රහාරයට පස්සේ දවසක දඹුල්ල ප්‍රදේශයේ අත් අඩංගුවට පත් වුණා කියලා මාධ්‍යවල පළ වෙලා තිබුණා.

ප්‍ර : ඔබ කොහොමද නවුෆර් මොහොමඩ් ගැන දන්නේ. ඔබ ඔහුව අඳුනනවද?

පි : නවුෆර් මොහොමඩ් මාව අඳුනනවා.

ප්‍ර : කොහොමද?

FAIR COMMENT — BY JEZEEM —

පි : මම මාදම්පේ ඉස්ලාහියා එකට නේවාසික පුහුණු කඳවුරුවලට ගිය වෙලාවේ එයා එහේ ශිෂ්‍යයෙක්. ඉස්ලාහියා මද්‍රසා එකේ, මාදම්පේ ඉස්ලාහියා මද්‍රසා එකේ නවුෆර් මොහොමඩ් ශිෂ්‍යයෙක්, Student.

ප්‍ර : ඒ අවස්ථාවේ ඔබට ඔහු සමඟ කථා බහ කරන්න අවස්ථාව ලැබිලා තියෙනවා?

පි : ඔව්. හැම ශිෂ්‍යයෙකුට වගේම අපිට එතන සුහඳ මිත්‍රකමක් නැත්නම් කථා කරන්න අවස්ථාව ලැබිලා තිබුණා දවස් පහක කාලයක්.

ප්‍ර : ඔබ කිව්වනේ දැන් මේ නවුෆර් මොහොමඩ්ගේ යම් මත ගැටුමක් තිබුණා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ මොකක් සම්බන්ධයෙන්ද ඒ මත ගැටුම තිබුණේ කා සමඟද?

පි : නවුෆර් මොහොමඩ් ජමාතේ ඉස්ලාම් එකේ, මද්‍රසා එකේ ආගම ඉගෙන ගන්න පටන් ගෙන නවුෆර් මොහොමඩ් කියපු කථාවක් තමයි, නවුෆර් මොහොමඩ් හා ....,

ප්‍ර : කාටද කිව්වේ?

පි : මට කියපු එකක්. නවුෆර් මොහොඩ් හා එහියාස් ඉල්මි කියන දෙන්නම මට කියපු කථාව. නවුෆර් මොහොමඩ් යනවා පලහතුරේ කියන ගමට, මීගමුව කොච්චිකඩේ. මාදම්පේ තමයි තියෙන්නේ ඉස්ලාහියා ඇරබික් කොලේජ් එක. මෙයා මාදම්පෙට කිලෝමීටර් විස්සක් හරි තිහක් වගේ දුරින් තමයි තියෙන්නේ පලහතුරේ, කොච්චිකඩේ. කොච්චිකඩේ පැත්තට යනවා තියෙන ජමාතේ ඉස්ලාම් කාර්යාලයට දේශනා කටයුතු සඳහා. ඉස්ලාහියා එකෙන් එයාව යවනවා ඒ දේශනා මධ්‍යස්ථානයේ කටයුතු කරන්න කියලා. එතකොට යනකොට එයාට උදේ වරුවල ගියහම කාර්යාලයේ කවුරුත් නැති වෙලාවේ එයාට ගොඩාක් වෙලා තියෙනවා. එතකොට එයා යනවා අර එහියාස් ඉල්මි කියන මම කියපු එක්කෙනාගේ Library එකට. එතනින් සම්බන්ධයක් ඇති වෙනවා. එතකොට එහියාස් ඉල්මි ගාව තියෙන පොත් එයාගේ දේශනා දිහා නවුෆර් මොහොමඩ්ගේ, නවුෆර් මවුලවීගේ අවධානය යොමු වෙනවා.

ප්‍ර : ඒ වෙලාවේ ඔහු මවුලවීවරයෙක්ද?

පි : නැහැ. තවම ශිෂ්‍යයෙක් හැටියට තමයි හිටියේ ඉස්ලාහියා එකේ. එතනින් නවුෆර් මවුලවී නවුෆර් මොහොමඩ් තවුහිද් පැත්තට යොමු වෙනවා. එහියාස් ඉල්මි කියන එක්කෙනා සලාෆී, නැත්නම් තවුහිද් සලාෆී මතවාදයේ ඉන්න එක්කෙනෙක්. එයා Mainstream තවුහිද් එක්කත් හිටියේ නැහැ. ඒ වුණාට බොහෝ කරුණුවල තවුහිද් හා සලාෆී අතර එකඟතාවය තියෙනවා. එතකොට නවුෆර් මොහොඩ් එතනින් තමයි ජමාතේ ඉස්ලාමීය මතවාදයෙන් එළියට ඇවිල්ලා තවුහිද් පැත්තට යොමු වෙන්නේ.

ප්‍ර : නැඹුරු වෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. නැඹුරු වෙන්නේ. එතකොට නවුෆර් මොහොමඩ් ඒ විදියට ඇවිල්ලා තමයි කාත්තන්කුඩියේ එකතු වෙන්නේ දාරුල් ආතර් එකේ, සංවිධානයේ. ඒ දාරුල් අතරින් තමයි හරහා තමයි නවුෆර් මොහොමඩ්, සහරාන්, අෂ්වර් පලාහි වැනි නෂ්මල් මවුලවී වැනි අය මේ දේශනා කටයුතු කරගෙන යනවා. එතනදී තමයි සහරාන් මෙනවා හරි ආගමික හේතුව මත එතනින් පොඩි මත ගැටුමක් ඇවිල්ලා ඒකෙන් එළියට එනවා. ඊට පස්සේ තමයි ඊට පහුකාලයේ තමයි සහරාන් පටන් ගන්නේ ජාතික තවුහිද් ජමාත් එක. පටන් ගන්න කාලයේ නවුෆර් මොහොමඩ් එක්ක එච්චර ලොකු සම්බන්ධතාවයක් තිබුණේ නැහැ. දෙන්නා අතර ....,

ප්‍ර : සහරාන් සහ නවුෆර් මොහොමඩ් අතර සම්බන්ධයක් තිබුණේ නැහැ .....?

පි : සම්බන්ධයක් කියන්නේ කලින් දෙන්නම එකට හිටපු කට්ටිය. ඒ වුණාට සහරාන් එළියට ආපු හින්දා එතරම් සුහඳ මිත්‍රත්වයක් තිබ්බේ නැහැ. පස්සේ ISIS මතවාදය ආවට පස්සේ ඉස්සරලාම මම Face book වලින් දැකපු විදියට ඒකට මුලින්ම යොමු වෙන්නේ නවුෆර් මොහොමඩ්. එතකොට සහරාන් ඒ ගැන කථා කරලා තිබ්බේ නැහැ. ඊට පස්සේ නවුෆර් මොහොමඩ්ගේ මාර්ගයෙන් තමයි සහරාන් එතනට යොමු වෙන්නේ. එතකොට පස්සේ දෙන්නා අතර ගොඩාක් හොඳ මිත්‍ර සම්බන්ධතාවයක් ඇති වෙනවා. මට මතක හැටියට දෙන්නා Face book එකේ යාළු වුණා කියලා හරි කවුරු හරි Face post දාලා තිබුණා ඒ දවස්වල.

ප්‍ර : ඔබට අවස්ථාවක් ලැබුණද නවුෆර් මවුලවී සමඟ ඔය ගැන කථා කරන්න?

පි : පහු කාලයේ මට අවස්ථාවක් ලැබුණේ නැහැ.

ප්‍ර : යම් අවස්ථාවක් ලැබුණද?

පි : නැහැ. ඒ කියන්නේ ISIS මතවාදයට ගියාට පස්සේ මට එහෙම අවස්ථාවක් ලැබුණේ නැහැ.

ප්‍ර : මුණගැහුනේ නැහැ?

පි : ලැබුණේ නැහැ.

ප්‍ර : දැන් ඔබ ඔය දුන්න පිළිතුර අනුව පොඩි පැහැදිලි කර ගැනීමක්. ඔබ කලින් දුන්න පිළිතුරක සඳහන් කරලා තියෙනවා නම් සහරාන්ට පස්සේ IS නායකත්වයට නවුෆර් මවුලවීව තෝරගෙන තිබුණා කියලා. ඒ පිළිතුරේ යම් ප්‍රශ්නයක් තියෙනවද? ඔබ ඒ කියලා තියෙන කරුණ, සහරාන්ව IS නායකත්වයට තෝරගෙන තිබුණද? නැහැනේ?

පි : ශ්‍රී ලංකාවේ.

ප්‍ර : I Understand, that you have given that answer?

පි : O.K. The Question is ……,

ප්‍ර : Question you said that after Saharan for the leadership of National Thowheed Jamath there was a person who had been identified and that was Nawfer?

FAIR COMMENT — BY JEZEEM —

පි : It was the media report once he was arrested.

ප්‍ර : No No No. What I say is now if it has gone on record to say that it was for the IS leardership that he had been identified isit correct. If it is recorded in that manner?

ප්‍ර : ඔබ 2006, 2007 වසරවල්වලදී සහරාන් හෂීම්ගේ දේශනවලට සවන් දුන්නා කියලා කිව්වනේ?

පි : ඔව්.

ප්‍ර : ඒ කාලයේදීත් ඔබ කිව්වා ජාතික තවුහිද් ජමාත්, තවුහිද් ජමාත් අදහස් තමයි ඔහු විසින් කරනු ලැබුවේ කියලා?

පි : ඔව්.

ප්‍ර : ඔබ විසින් දරනු ලැබුවේත් තවුහිද් ජමාත් අදහස්?

පි : ඔව්.

ප්‍ර : දැන් ඒ කාලයේදී ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ යම් තනතුරක් සහරාන් දැරුවද? මම අහන්නේ 2006, 2007 කාලයේ. ඔබ දන්නවාද?

පි : ඒ කාලයේ ජාතික තවුහිද් ජමාත් කියන සංවිධානයක් තිබුණේ නැහැ කියන එක තමයි මම කිව්වේ. මම දන්නා තරමට තිබුණේ නැහැ. සහරාන් හිටියේ දාරුල් අතර් කියන සංවිධානයේ.

ප්‍ර : ඒක තමයි ඔබ ඉස්සරලා පැහැදිලි කළේ?

පි : ඔව්.

ප්‍ර : ඔබ දන්නවද යම් අවස්ථාවකදී ජාතික තවුහිද් ජමාත් කියලා සංවිධානයක් පිහිටුවා ගනු ලැබුවාය යැයි කියලා?

පි : ඔව්. පිහිටුවා ගත්තට පස්සේ මම දැන ගත්තා එහෙම දෙයක් තියෙනවා කියන එක.

ප්‍ර : තියෙනවා කියලා?

පි : තියෙනවා කියන එක.

ප්‍ර : ඒ වගේම ඔබට දැන ගන්නට ලැබුණද ඒ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ කිසියම් නිල තලයක් සහරාන් හෂීම් විසින් දරනු ලැබුවාය කියලා?

පි : නිල නොවන විදියට මම දැන ගත්ත එක තමයි ජාතික තවුහිද් ජමාත් එකේ නායකත්වය සහරාන් හෂීම් දැරුවා කියන එක.

ප්‍ර : ඔබ ඔය ගැන දැන ගත්තේ දළ වශයෙන් මොන වකවානුවේද කියලා ඔබට මතකද?

පි : 2013, 14.

ප්‍ර : කාලයේ තමයි ඔබ ඒක දැන ගත්තේ?

පි : කාලයේ තමයි.

ප්‍ර : ඊළඟට මම ඔබෙන් අහන ප්‍රශ්නය තමයි, ඔබ දන්නවද කියන්න, ඔබ දන්නවා නම් විතරක් කියන්න. ජාතික තවුහිද් ජමාත් සංවිධානය ISIS සංවිධානය සමඟ කිසියම් සම්බන්ධකමක් තියෙනවද නැද්ද කියලා? If only if you know and if you know you have to, give reasons also.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සහරාන් හෂීම්ගේ දේශනා ගොඩාක්ම ජාතික තවුහිද් ජමාත් Facebook පිටුවෙන් තමයි පළ වුණේ. ඉතිං ඒ දේශනාවල සහරාන් හෂීම් පවසපු දේවල් ගොඩාක්ම ISIS මතවාදය Reflecting the ISIS ideology.

ප්‍ර : දැන් අපිට කෙනෙක් ප්‍රකාශ කරනු ලබන අදහස් තවත් කෙනෙක් විසින් ප්‍රකාශ කරලා තියෙන අදහස් සමඟ සමාන බවක් පෙන්වනවා නම් ඒකෙන් අනිවාර්යයෙන්ම අදහස් කෙරෙන්නේ නැහැ නේද ඒ දෙන්නා අතර සම්බන්ධයක් තියෙනවා කියලා?

පි : ඒ අදහස් .....,

ප්‍ර : අනිවාර්යයෙන්ම සම්බන්ධයක් තියෙන්න අවශ්‍ය නැහැ නේද?

පි : ඒ අදහස් සාමාන්‍ය හැම මිනිසුන් අතරම තියෙන අදහස්වලින් එකක් නම් දෙන්නෙක් ඒ වගේ අදහසක් පළ කරලා තිබුණොත් according to my understanding we can say that දෙන්නා අතර සම්බන්ධතාවය තියෙන්නම ඕන නැහැ කියලා. මේක .....,

ප්‍ර : Can I explain to you. Now when my question was whether you were aware of any connection solid connection between the NTJ and the ISIS during Zaharan's period or thereafter or before that. Right. Now mainly because that one person would have aired his views that could have been followed by another does not necessarily mean that there was a solid connection between both parties. So that's why I'm cautioning you, you have to be careful people can follow each others views. That does not mean that they are necessarily connected. You understand the poing that I'm trying to emphasize? So please understand that and unswer.

පි : ප්‍රශ්නය අහපු විදියට හා පැහැදිලි කරපු විදියට කියනවා නම් මම ගාව NTJ සහ ISIS අතර සම්බන්ධකමක් තිබුණා කියන්න සාක්ෂියක් නැහැ.

ප්‍ර : සාක්ෂියක් නැහැ?

පි : ප්‍රශ්නය අහපු විදියට හා පැහැදිලි කරපු විදියට.

ප්‍ර : නමුත් ඔබ මේ ගරු කොමිෂන් සභාවට කියන්නේ ISIS මතවාදයන්ට සමාන මතවාදයන් තමයි සහරාන්ගේ මුහුණු පොතේ තියෙන කරුණු හරහා ඔබට දැක ගන්න පුළුවන් වුණේ කියලද?

පි : සහරාන්ගේ මුහුණු පොතේ විතරක් නෙමෙයි. ජාතික තවුහිද් ජමාත් Facebook පිටුව හරහා.

ප්‍ර : ජාතික තවුහිද් ජමාත්?

පි : ජමාත්.

ප්‍ර : මේ මොන කාලයේ වගේද ඔබ ඒ අවබෝධය ලබා ගත්තේ?

පි : 2016.

Provisional Copy
FAIR COMMENT BY JEZEEM

ප : 2016 වගේ?
පි : 2016 වගේ.

****

ගරු සභාපතිතුමා :

ප : ඔබ කිව්වා ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ Facebook පිටුව ආශ්‍රයෙන් තමයි ඔබ එය ප්‍රකාශ කරන්නේ කියලා?
පි : ඔව්.
ප : ඒ ඔබ කියන වකවානුව තුළ, ඒ කියන්නේ 2016 හා ඊට ආසන්න කාලය තුළ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ Face book පිටුවේ IS මතවාදය ඒ විදියටම ISIS සංවිධානයට සඳහනක් කරමින්ම සඳහන් කරලා තිබ්බද?
පි : නම සඳහන් කරලා, සඳහන් කරලා තිබ්බා ඒක. මට I really did not meet such a material with the name.
ප : ISIS සංවිධානයේ නායකයාගේ නම මුහුණු පොතේ කොහේ හරි සටහන් කරලා තිබ්බද?
පි : ජාතික තවුහිද් ජමාත්.
ප : නැහැ. නැහැ. ISIS කියන්නේ අබුබක්කර්?
පි : අබුබක්කර් අල්බක්දාදිගේ නම තවුහිද් ජමාත් Face book පිටුවේ මම දැක්කේ නැහැ.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : ගරු සභාපතිතුමා අහපු ඒ ප්‍රශ්නය ඔස්සේ මා ඔබෙන් කැමතියි පැහැදිලි කර ගැනීමක් ලබා ගන්න. එහෙම නම් ඔබ මොන කරුණු නිසාද කියන්නේ ISIS සංවිධානයේ තියෙන මතවාද තමයි සහරාන් හෂීම් විසින් පිළිපදිනු ලැබුවේ කියලා. නැත්නම් ඔහුගේ මතවාදත් ISIS සංවිධානයේ මතවාද හා සැසඳුනාය කියලා ඔබට අවබෝධයක් ලැබුණා කියලා?
පි : සහරාන් ඒ වකවානුව තුළදී කිලාෆත් ගැන කථා කරන්න පටන් ගත්තා. ඒ අපට .....,
ප : So now you make a comparison between the ISIS ideology and these people's ideology?
පි : Yes. I am without mentioning the name. නම සඳහන් නොකර අපි වෙනුවෙන් නායකයෙක් ඉන්නවා. අපි වෙනුවෙන් ප්‍රාන්තයක් තියෙනවා වගේ අදහස් ඒකෙන් ගොඩාක් පළ වෙලා තිබුණා.
ප : මොකේද පළ වෙලා තිබ්බේ?
පි : Facebook වල. සහරාන්ගේ Facebook එකේ. NTJ Facebook පිටුවේ ISIS කරපු ක්‍රියාව, යම්කිසි මිනී මැරුම් ක්‍රියාව සාධාරණීකරනය කිරීම සඳහා ඒකට අදාළ හදීස් අඩංගු දේශනා ඒ වෙලාවෙම පළවෙලා තිබුණා. ඒක සහරාන් විතරක් නෙමෙයි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

සමහර තරුණයෝ, වයසින් ගොඩාක් අඩුයි. සහරාන්ට වඩා ගොඩාක් අඩුයි. විසි ගණන්වල ඉන්න පුළුවන් තරුණයෝ, තරුණ මවුලවීලා ඒ දේශනා කරලා තිබුණා. ඒගොල්ලන්ගේ නම නම් මතක නැහැ. ඒගොල්ලන් මම කලින් අඳුනලා හිටියේ නැහැ. ඒ වගේ තරුණ අයත් ඒ වගේ දේශනා කරලා තිබුණා ජාතික තවුහිද් ජමාත් පිටුවේ. අන්‍යාගාමික මිනිස්සුන්ව මිනී මැරුම්, මරලා දාන එක වගේ දේවල් ගැන හදීස්වල තියෙන දේවලුත් එක්ක සංසන්දනය කරලා ඒ වකවානුවලදී ඒ වෙලාවේ 2016, 17 වගේ කාලය තුළ ලෝකයේ කථාබහකට ලක් වෙලා තිබුණු යම්කිසි කරුණු ඒ වෙලාවේ ජාතික තවුහිද් ජමාත් Face book පිටුවේ දේශනා මගින් සඳහන් වෙලා තිබුණා. තව නවුෆර් මොහොමඩ් හරි සහරාන් හරි මට මතකයේ හැටියට දෙන්නගෙන් එක්කෙනෙක් බොහෝදුරට සහරාන් වෙන්න ඕන මට මතකයේ හැටියට පළ කරලා තිබුණා අබුබක්කර් බක්තාදි මොකද මොහොමඩ් නබිතුමාගේ හදීස් එක තියෙනවා කලීෆාවරයෙක් හැටියට තෝරා පත් කිරීමේදී මොහොමඩ් නබිතුමාගේ ගෝත්‍රය වන, ගෝත්‍රය කියන්නේ The tribe inside the seet is called the croish. ගෝත්‍රයේ ක්‍රොයිස් කෙනෙකුට මුල් තැන තියෙනවා කියන එක අනිත් අයට වඩා. එතකොට එතන Prove කරන්න හදලා තිබුණා අබුබක්කර් අල්බක්තාදී ඒ ගෝත්‍රය නැත්නම් the tribe එකට අයිති එක්කෙනෙක් කියන එක ....,

ප්‍ර : මහම්මත්තුමාගේ ....?

පි : Same tribe එකට අයිති එක්කෙනෙක් කියන එක Proof කරන්න සහරාන් Facebook post එකේ Try කරලා තිබුණා. ඒකම නවුෆර් මොහොමඩ්ත් Try කරලා තිබුණා කියලා මට මතකයි දෙන්නම. තව මට මතකයේ හැටියට සහරාන් බෝම්බ ප්‍රහාරයකට කලින් දිවුරුම් කරනකොට ගත්ත වීඩියෝ එකක් පස්සේ මාධ්‍යවලින් පළ වෙලා තිබුණා.

ප්‍ර : ඒ කියන්නේ බයත් එකක්ද නැත්නම්?

පි : බයත් එකක්. ඒ ප්‍රහාරයට යන්න කලින් අර කළු ඇඳුම ඇඳගෙන අට දෙනා ඉන්නේ. ඒ ප්‍රහාරයෙත් සහරාන් අබුබක්කර් අල්බක්තාදීගේ නම කියනකොට මට මතකේ හැටියට අන්තිම කෑල්ලට අල් කුරේෂ් කියන වචනය පාවිච්චි කරනවා. ඒකට එයා එතන මේ යම්කිසි බරක් දෙන්න හදනවා. සාමාන්‍යයෙන් මාධ්‍යවල නැත්නම් අනිත් තැන්වල අපි බලනකොට අබුබක්කර් අල්බක්තාදී කියන නම සඳහන් කරනකොට අල් කුරේෂ් කියන එක අපි එතරම් දකින්නේ නැහැ. හැබැයි මෙයා එතන ඒකට....,

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔබ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සහ සහරාන්ගේ මුහුණු පොත කොයි කොයි කාලවල බලලා තියෙනවද? 2012, 13 කාලයේ බලලා තියෙනවද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : 13 මට මතක නැහැ සහරාන්ගේ එක බලපු එක මතක නැහැ. 13 ට පස්සේ තමයි මට සහරාන්ගේ මුහුණු පොත බවට, සහරාන්ට මුහුණු පොතක් ඒ කාලයේ තිබුණද කියලා මට මතක නැහැ. 13 දී මම හිතන්නේ තිබ්බේ නැහැ කියලා. ඊට පස්සේ තමයි මට මතකයි සහරාන්ගේ එක බලපු එක. සහරාන්ගේ මල්ලි ෂයිනිගේ එකක් තිබ්බා. එයා මට Friend request එකක් දාලා තිබුණා මම සෞදිවල ඉද්දී. එතකොට එයාව මම පෞද්ගලිකව අඳුරන්නේ නැහැ. එතකොට මට මේ නිකම් Like අප්‍රසන්න like Kind of dislike එකකුත් ආවා මට. Why I did not know this guy why he is sending me. Just be cause be was brother of Zaharan. At he time I was a Muslim, Still I was thinking why he doesn't know me why shoud be send me a request. I did not accept his request.

ප්‍ර : ඒ කියන්නේ ඔබ මුහුණු පොතේ ඔබ කරපු ක්‍රියාදාමයට අනුව ඔබට කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද සහරාන් අපිටම වෙන් වූ ප්‍රදේශයක් තියෙනවා කියලා මුහුණු පොතේ ඉස්සරලම සටහන් කරන්නේ 2014 ජූනි මාසෙන් පස්සෙද ඉස්සරලද කියලා?

පි : පස්සේ. මට මතකයේ හැටියට පස්සේ.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : 2016 වල ඔබ සහරාන්ගේ Face book එකේ හෝ ඔබ NTJ එකේ Face book page එකේ ඔහු ප්‍රකාශ දාලා තිබුණද සියලුම ක්‍රිස්තියානි භක්තිකයන් මරා දැමිය යුතුයි කියලා ෆත්වා එකක් Declare කරාද සහරාන් 2016 වල?

පි : මට මතක නැහැ එහෙම දෙයක් ගැන.

ප්‍ර : එහෙම එකක් අහලාවත් නැහැ?

පි : මතක නැහැ. එහෙම දෙයක් මම දැකපු එක නම් මට මතක නැහැ.

ප්‍ර : ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් සේ සෙයිලානු කියන සංවිධානය ඔය ජමාතේ National Thowheeth Jamath කියන සංවිධානය විසින් IS සංවිධානයත් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම සඳහා වූ Strategically හදපු Arm එකද?

පි : ජමෙයිතු මිල්ලතු ඊබ්‍රාහිම් සංවිධානයේ නම පවා මම දැන ගත්තේ බෝම්බ ප්‍රහාරයට පස්සේ.

ප්‍ර : ඊට ඉස්සරලා ඔබ ඒක පිළිබඳව දැනුවත් නැද්ද?

පි : මම දැනගෙන හිටියේ නැහැ ඒ නම.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඔබ සඳහන් කෙරුවා, අපි ඒ Video පටය, ලකුණු කරන ලද Video පටය ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරාට පස්සේ මම ඔබගෙන් ඒ දිවුරුම ගැන තවදුරටත් ප්‍රශ්න ඇසීමට

FAIR COMMENT BY JEZEEM

බලාපොරොත්තු වෙනවා ඉස්මත් මහත්මයා. දැන් ඔබ ඒ දුන්න පිළිතුර පාදක කරගෙන මම කැමතියි ඔබෙන් දැන ගන්න ඔබ කිව්වා අබුබක්කර් අල්බග්දාදි නායකයා විදියට ඒ දිවුරුමේ සඳහන් කරනු ලබනවාය කියලා?

පි : ඔව්.

ප්‍ර : මොකේ නායකයාද ඔහු?

පි : ඒගොල්ලන් අරාබි භාෂාවෙන් ඒ දිවුරුම සහරාන් කරන්නේ. ඒක මට පැහැදිලිතාවයක් නැහැ මොකේ නායකයා හැටියටද, එයා එයාගේ නායකයා හැටියටද, මුස්ලිම්වරුන්ගේ නායකයා හැටියට මට මතක. මුස්ලිම්වරුන්ගේ නායකයා හැටියට, මුස්ලිම්වරුන් කියන වචනය පාවිච්චි කරනවායි කියලා මට මතකයි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ කිව්වනේ නබිතුමාගේ ඒ කුලයෙන් පැවැත්වෙන, පරම්පරාවෙන් පැවැතෙන තැනැත්තෙක් කියලා ඔහු. ඒ නිසා ඔහු ඒ නායකත්වයට සුදුසුයි කියන එක කලීෆාවරයෙකුට.

පි : කලීෆාවරයෙකුට කුරේෂ් ගෝත්‍රයේ කෙනෙක් සුදුසුයි කියන එක හදිස් එකේ තියෙනවා. අබුබක්කර් බක්තාදි කුරේෂ් ගෝත්‍රයේ කෙනෙක් කියලා ඔප්පු කරන්න සහරාන් හා නවුෆර් මවුලවී Facebook වල Try කරලා තිබ්බා.

ප්‍ර : එතකොට ඔය අබුබක්කර් අල්බග්දාදිගේ මා කිව්වෝතින් නිවැරදිද සංවිධානය ISIS සංවිධානය කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ ISIS සංවිධානය පිහිටුවනු ලැබුවේ කවුරු විසින්ද? එහි මතධාරියා වුණේ කවුද කියන කරුණු පිළිබඳව ඔබ දන්නවාද?

පි : ඒ නමෙන් පිහිටු වුණේ කවුද කියන එක ගැන පොඩි මේකක් තියෙනවා. මොකද ඒ සංවිධානය එක එක කාල වකවානුව තුළ එක එක නම් භාවිතා කරලා තියෙනවා. IS කියන නමක් භාවිතා කරලා තියෙනවා. ISL කියලා නමක් භාවිතා කරලා තියෙනවා. එතනින්ම සම්බන්ධ වෙනවා අල්කයිඩා ඉරාක් Branch එකක් ඒක අනිත් අල්කයිඩා Branch එකත් එක්ක එක්තරා කාලයක මත ගැටුම් ඇති කර ගන්නවා. ඒ වුණාට එතනින් ඒ ජිහාද් මතවාදය එතනින් දාන විශේෂම පුද්ගලයා වෙන්නේ අබුමෝසාර් සර්කාවී කියන ජිහාද් සටන්කරුවෙක්. එයා ජාත්‍යන්තර ජිහාද් Circle එක ඇතුළේ එයා යම්කිසි Powerful figure එකක්.

ප්‍ර : මා කිව්වෝතින් නිවැරදිද සර්කාවි තමයි මේ සංවිධානය පිහිටුවනු ලැබුවේ කියලා?

පි : ඒක ප්‍රතික්ෂේප කරන්න මම ගාව සාක්ෂි මදි වෙන්න පුළුවන්. මොකද ඒ මතය අරාබි කථා කරන මුස්ලිම් ජනතාව අතරට අරන් යන්න ගොඩක් Try කරපු බලවතෙක් තමයි, සටන් බිමේ බලවතෙක් තමයි අබුමෝසාර් සර්කාවි.

ප්‍ර : එතකොට සර්කාවිට ඔය මතය ලැබුණේ කාගෙන්ද කියලා ඔබ දන්නවද?

පි : දන්නවා.

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔහු කාගෙන්ද ඒවා ඉගෙන ගත්තේ?

පි : එයා ඉස්සරලම මේ මතයට එයාව ගෙන්වා ගන්නේ පලස්තීන් නැත්නම් ජෝර්දාන්වල ඉපදිච්ච දේශකයෙක්, ජිහාද්කරුවෙක්. එයා ගොඩාක්ම මේ මතවාදය තමයි ගොඩාක්ම ප්‍රචාරය කළේ. එයාගේ නම ඇවිල්ලා අබ්මොහොමද් අල් මග්දීසි කියන එක.

ප්‍ර : මග්දීසි?

පි : මග්දීසි.

ප්‍ර : ඔබ දන්නවාද සර්කාවි සහ මග්දීසි කියන මේ දෙදෙනාම ජෝර්දාන්හි අල්ජෆර් හිර ගෙදර එකට හිටි අය කියලා?

පි : ඔව්. අනූ ගණන්වල දෙන්නම හිර ගෙදර එකට හිටියා කියන එක මම දන්නවා. ඒ හිර ගෙදර හිටපු කාලයේ තමයි මග්දිසි විසින් සර්කාවිට ඒ මතය, ජිහාද් මතය උගන්වනු ලැබුවේ.

ප්‍ර : ඒ වගේම ඔවුන් දෙදෙනා එකටම 1999 මාර්තු මාසේ 29 වෙනිදා එවකට පාලනය කරපු හුසේන් රජු විසින් සමාවක් මත අනිකුත් සිරකරුවන් සමඟ නිදහස් කරනු ලැබුවාය කියන කරුණ ඔබ දන්නවාද?

පි : හිරෙන් නිදහස් වුණා කියලා දන්නවා. ඒ අවුරුද්දයි, ඒ රජතුමාගේ නමයි මම හරියට අවධානය යොමු කරලා තිබුණේ නැහැ.

ප්‍ර : එතකොට ඔබට කියන්නට පුළුවන්ද ඔබ පසුගිය අවස්ථාවෙත් සඳහන් කරනු ලැබුවා හසන්අල්බන්නා. ඒ කියන්නේ Muslim Brotherhood ඒ පිහිටුවනු ලැබූ තැනැත්තා නේද?

පි : ඔව්.

ප්‍ර : එය ඔහු විසින් පිහිටුවනු ලැබූ ඒ 1928 කියලා මා කිව්වෝතින් නිවැරදිද?

පි : නිවැරදියි. 1906 දී හසන්අල්බන්නා උපත ලබනවා. තමාගේ 22 වැනි වයසෙදි තමයි ඊජිප්තුවල ඒ සංවිධානය එයා පිහිටුවන්නේ.

ප්‍ර : එතකොට ඔය Muslim Brotherhood එක කියන්නේ මොකක්ද?

පි : Muslim Brotherhood එක කියන්නේ අරාබි කථා කරන ජනතාව ඇතුළට ඉස්ලාම් රාජ්‍යයක්, කිලාෆත් එක ලෝක ව්‍යාප්ත ඉස්ලාම් රාජ්‍යයක් පිහිටුවීම සඳහා ඒ මතය හා අවි ගැටුම දෙකම අරන් යන්න හදපු සංවිධානයක්.

ප්‍ර : හදපු සංවිධානයක්?

පි : සංවිධානයක්.

ප්‍ර : එතකොට එහි මතධාරීන්ගේ මතයන් වෙනස් වෙනවද එහෙනම් ISIS සංවිධානයේ මතයන් සහ ඒ ප්‍රතිපත්තීන් සමඟ?

පි : ISIS ඒ මතවාදයත් එක්ක දැන් මෙතන හුවාන්ඩල් මුස්ලිම් Muslim Brotherhood ගැන අහපු හින්දා මට තව සංවිධානයක් ගැනත් මෙතන කියන්න වෙනවා. දකුණු ආසියානු නැත්නම් ආසියාවේ ඉන්න මුස්ලිම් ජනතාව වෙනුවෙන් මේ වගේ ඉලක්කයක් ඉස්ලාම් රාජ්‍යයක් පිහිටුවෙන්න ඕන කියන මතයෙන් පිහිටුවපු සංවිධානයක් තමයි ජමාතේ ඉස්ලාමිය කියන සංවිධානය. ඒක පිහිටවුවේ මවුලානා අබුල්ලාවලා මවුදුදී කියන එක්කෙනා.

ප්‍ර : මොන රටේද?

පි : British India කෙනෙක් තමයි ඒක. ඉන්දියාව හරි ලාහෝර් වල වෙන්න ඕන. එයා හිටියේ ලාහෝර් අන්තිම කාලයේ.

ප්‍ර : මොන කාලයේ?

පි : 1920 නැත්නම් 30 වලදී එයා පිහිටුවන්න ඕන ඒ සංවිධානය.

ප්‍ර : දැනට එහි නායකයා කවුද?

පි : දැන් ඒක එක නායකත්වයක් යටතේ නෙවෙයි තියෙන්නේ. එක එක රටවල්වල එක එක නායකයෝ ඉන්නවා. පකිස්ථානයේ මට මතක හැටියට කාසි හුසේන් කියන නායකයා හිටියා. දැන් වර්තමාන නායකයා කවුද කියලා මම දන්නේ නැහැ.

ප්‍ර : ලංකාවේ නායකයෙක් හිටියද?

පි : ලංකාවේ හිටියේ හජ්ජුල් අක්බර් කියන එක්කෙනා අවුරුදු 24 ක් හිටියා. දැන් හුසේර් කියන ඉස්ලාහි අරාබි එකේ ඉගෙන ගත්තු එකකෙනෙක් ඉන්නවා.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ජමාතේ ඉස්ලාමුයි, ජමාතේ ඊ ඉස්ලාම් කියන එකෙයි වෙනසක් තියෙනවද?

පි : ජමාතේ ඉස්ලාමිය කියන එක අරාබි වාක්‍යයක්. අර ජමාතේ ඊ කියන ඒක භාවිතා කරන්නේ උර්දු භාෂාවෙන්. ඒ අර සාමාන්‍යයෙන් අකුරු හා සමහර වචන ඒ භාෂා දෙක අතරම සමානයි අරාබි හා උර්දු අතර. අර ඊ එක භාවිතා කරන්නේ උර්දුවලින් ලියනකොට ඒ අර්ථයටම භාවිතා වෙනවා.

ප්‍ර : ජමාතේ ඉස්ලාම් සංවිධානයට තුර්කි එන්ටර්ගන් සහයෝගය දැක්වුවද විශාල වශයෙන්?

පි : ඔව්. විශාල වශයෙන්. මොකද ශ්‍රී ලංකාවේ ඉඳලා පවා ශිෂ්‍යත්වයෙන් ගොඩක් සිසුන් තුර්කි රාජ්‍යයට ගියා. විශේෂයෙන්ම ඒ කටයුත්ත කළේ ජමාතේ ඉස්ලාමිය හරහා.

ප්‍ර : ජමාතේ ඉස්ලාමිය හරහා?

පි : හරහා. මට මතකය හරිනම් ගිය සැසිවාරයේත් මම ඒ ගැන කථා කරලා තිබුණා අධ්‍යාපන අමාත්‍යාංශය හරහා මොනවා හරි දැනුම් දීමක් තිබුණද කියන එක ගැන මම දන්නේ නැහැ කියලා.

ප්‍ර : එතකොට ජමාතේ ඉස්ලාම් සංවිධානයේ ක්‍රියාත්මක වෙලා තිබ්බා බංගලාදේශයේත්?

පි : ඔව්.

ප්‍ර : බංගලාදේශයේ රොයින්ගෙන් සරණාගතයින් සම්බන්ධව කටයුතු කළේ. ඒ ඔවුන් විශේෂයෙන් සහන සැලසුවේ ඔවුන් සම්බන්ධයෙන් තුර්කියේ එන්ටර්ගන් එක්ක එක්කහු වෙලා?

පි : තුර්කියේ අර්දුවාන් ජනාධිපතිතුමා ඒකට සම්බන්ධ වුණා. එතුමාගේ බිරිඳ පවා ඒ රෝහින්යා අනාථ කඳවුරට ගිහින් තිබුණා. ඒ වුණාට බංගලාදේශය කොයි ආකාරයට වුණාද කියන එක මම

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Follow කළේ නැහැ. බංගලාදේශයේ ජමාතේ ඉස්ලාම් සංවිධානයට දැනට පවතින රජය බලයට ආවට පස්සේ තිබිච්ච පරණ නඩු හා චෝදනා මත ඒකේ පරණ නායකයෝ කිහිප දෙනෙක්ට මරණ දඩුවම ලැබුණා පකිස්ථානය හා බංගලාදේශය අතර තිබුණ යුද්ධ කාලයේදී යුධ අපරාධවලට මැදිහත් වුණා කියලා.

ප : 2013 නසීම් නැමැති නායකයත් මරණයට පත්, 16 දී එල්ලා මැරීමට නියම කරා බංගලාදේශයේ?

පි : නම මතක නැහැ. නායකයෝ කිහිප දෙනෙකුට ඒ මරණ දඩුවම ලැබුණා කියන එක මම ප්‍රවෘත්තිවල දැක්කා.

ප : ඔහු නිදහස් කර ගැනීමට තුර්කියේ අගමැතිගේ එන්ටර්ගනුත් උත්සාහ කරා කියලා තමා දන්නවද?

පි : නැහැ. මම ඒ ගැන දන්නේ නැහැ.

ප : තමා දන්නේ නැහැ?

පි : දන්නේ නැහැ.

ප : කොහොමත් ජමාතේ ඉස්ලාම් සංවිධානයේ ඔය රාජ්‍ය විරෝධී ත්‍රස්තවාදී ක්‍රියාකාරී ක්‍රියාකම් නිසා තුර්කියේ එන්ටර්ගන් ඉල්ලපු සමහර ඉල්ලීම් බංගලදේශයෙන් දීමට බැහැයි කියලා කිව්වා? දන්නවද ඒ ගැන?

පි : නැහැ. ඒ ගැන මම දන්නේ නැහැ.

ප : කෙසේ හෝ ජමාතේ ඉස්ලාම් සංවිධානය බංගලාදේශයේ ත්‍රස්තවාදී ක්‍රියාවලට හෝ ත්‍රස්තවාදී හෝ වෙනත් මනුෂ්‍ය ඝාතනවලට දේපල විනාශ කිරීම්, දූෂණ කටයුතුවලට සම්බන්ධ වුණු බවට නඩු තිබ්බද?

පි : ඔව්. නඩු තිබුණා. උසාවියේ තීන්දු පවා ඒක තහවුරු කරලා තිබුණා.

ප : එතකොට British India වල ඉන්දියාවේ කාශ්මීර් දේශයේත් ජමාතේ ඉස්ලාම් සංවිධානය ක්‍රියාත්මක වුණා?

පි : ඔව්.

ප : ඒ ජමාතේ ඉස්ලාම් සංවිධානයේ කටයුතු ශ්‍රේෂ්ඨාධිකරණයේදීත්, රජය විසින් එක් කාලයකදී තහනම් කරා?

පි : ඔව්.

ප : පසුව ශ්‍රේෂ්ඨාධිකරණය මගින් මෙය ඉවත් කරා?

පි : ඉවත් කරා. මට මතක හැටියට ඒ තහනම දෙපාරක් ඉන්දියාවේ පළ වුණා.

ප : ඔව්. ඉන්දියාවේ තමයි මම කිව්වේ. ඉන්දියා. ඒ ඉන්දියාවේදී ඒ අනුව ඉන්දියාවෙත් මතයක් තියෙනවා ත්‍රස්තවාදී ක්‍රියාවට මේ ජමාතේ ඉස්ලාම් සංවිධානය නොයෙකුත් දේපල හානි කිරීම්, මනුෂ්‍ය ඝාතනවලට නිවැරදි හෝ වැරදි ඒවාට සම්බන්ධ වූ බවට?

පි : මට ඒකට Add කරන්න දෙයක් තියෙනවා. මම මාවනැල්ල ජමාතේ ඉස්ලාමිය සංවිධානයත් එක්ක ශිෂ්‍යයෙක් හැටියට කටයුතු කරන කාලේ අපේ මාවනැල්ල ජමාතේ ඉස්ලාමික්

FAIR COMMENT BY JEZEEM

කාර්යාලය භාරව හිටපු ඒ වෙලාවේ ජමාතේ ඉස්ලාමිය ශිෂ්‍ය ඒකකයේ නායකයා හැටියට පත් වෙච්ච අබ්දුල් වාජිඩ් ඉස්ලාහි කියන එක්කෙනා මාසයක් පකිස්ථාන් බලා ගියා. 1995 වෙන්න ඕන මගේ මතකය හරිනම්. 1995 දී වාගේ ගිහිල්ලා මාසයකට පස්සේ ආපු වෙලාවේ අපිට Photo පවා පෙන්නලා තිබුණා. එයා කැෂ්මීර්වලට ගිය බවත්, එහේ සටන් කරන ජිහාද් සටන්කරුවනුත් එක්ක එක්ව කටයුතු කරා කියන එක ගැනත් අවියක් තියාගෙන ඉන්න පින්තූර පවා පෙන්වලා තිබ්බා.

ප්‍ර : ඔය ජිහාද් සටහන්කරුවන්ට ඉරාකයේ එඩකන් සහයෝගය දුන්නා නේද? තුර්කියේ?

පි : එහෙම ප්‍රවෘත්තිවල තිබුණා. එහෙම ප්‍රවෘත්ති තිබුණා. Directly or indirectly there are time to time there were some news that it could help the Islamic..... ළඟදිත් අපිට මේ අවුරුද්දේ නැත්නම් ගිය අවුරුද්දේ දෙයක් දැක්කා කුර්දිස් ප්‍රාන්තයට. තුර්කියේ හමුදාව විසින් පහර දීමක් කරපු වෙලාවේ සෑහෙන ISIS සටන්කාමීන් හිරවලින් පැනලා ගිය බව.

ප්‍ර : එතකොට තමන් පිළිගන්නවා එහෙම කටයුත්තක් සිදු වුණා කියලා. මම අහපු ප්‍රශ්නය .....?

පි : ප්‍රවෘත්ති අනුව ඒ වගේ දේවල් මම දැක්කා.

ප්‍ර : දැන් මුස්ලිම් බ්‍රදර්හුඩ් එකටත් මූලිකව කටයුතු කළේ තුර්කියේ එරගන් කියන President or Prime minister ....?

පි : President.

ප්‍ර : President. ජනාධිපතිවරයා තමයි බ්‍රදර්හුඩ් එකටත් විශේෂයෙන් මූලිකව කටයුතු කරන්නේ?

පි : මම දකින්නේ අර්දුවාන්ගේ නිර්මාණය පවා හසන්අල්බන්නා පටන් ගත්ත ඒ Movement එකේ. ඒකෙන් එක් ප්‍රතිඵලයක් හැටියට ඒකේ One of the Fruits. From their point of view one of the fruts from the Ikhwanul muslim movement.

ප්‍ර : ලංකාවේ ජමාතේ ඉස්ලාම් සංවිධානය හා ඊ සංවිධානය කියන්නේ තමන් කියන්නේ එකම එකක් කියලද?

පි : එකම නම. භාෂා දෙකෙන් දෙවිදියට කියනවා. අරාබිවලින් ජමාතේ ඉස්ලාමිය කියලයි, උර්දුවලින් ජමාත් ඊ අකුර වෙනම දාලා ජමාතේ ඉස්ලාමිය කියලා. ඒ දෙකම .....,

ප්‍ර : තමන් දන්නවද දැනට වැල්ලවත්තේ තියෙනවා BOAC ද කියලා පාසලක්. BACAS කියලා මුස්ලිම් පාසලක්?

පි : ඔව්. බී කාස්.

ප්‍ර : එහි කවුද නායකයා මේකේ සභාපති කවුද?

පි : අබ්දුල් රහුමාන් කියන ඉංජිනියර්වරයෙක්.

ප්‍ර : ඔහු ජමාතේ ඉස්ලාම් සංවිධානයට සම්බන්ධයි?

පි : මම දන්න තරමට ජමාතේ ඉස්ලාම් සංවිධානයත් එක්ක හිටපු කෙනෙක්.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : කෙනෙක්?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔහු සහරාන් හෂීම් සමඟ කාත්තන්කුඩියේදී සාකච්ඡා පවත්වලා තියෙනවා. තමන් දන්නවද දන්නේ නැහැ?

පි : දන්නවා.

ප්‍ර : දන්නවා?

පි : දන්නවා.

ප්‍ර : කොහේදීද සාකච්ඡා පැවැත්වුවේ?

පි : සාකච්ඡා කොහේද පැවැත්වුවේ කියලා ඒක මම දන්නේ නැහැ. මට මේක ස්ථිරව කියන්න පුළුවන් කාරණාවක් තියෙනවා. මගේ මිත්‍රයෙක්, පෞද්ගලික මගේ පාසලේ මාත් එක්ක ඉගෙන ගත්ත මිත්‍රයෙක් හිටියා අස්මිනයි යූත් කියලා. උතුරු පළාත් සභාවේ දෙමළ ජාතික සංවිධානයේ ජාතික ලැයිස්තුවෙන් නැත්නම් Bonus ආසනයේ තෝරා පත් වෙච්ච මන්ත්‍රී කෙනෙක්. එයා නියෝජනය කළේ NFGG. යහපාලනය වෙනුවෙන් ජාතික ව්‍යාපාරය කියන පක්ෂය. ඒ පක්ෂය පිහිටු වුණේ පක්ෂවල් කිහිපයක් එකතු වෙලා. AFGP, PMGG, ඊට පස්සේ ජමෙයිතු සලමා, ඒ වගේ ජමාතේ ඉස්ලාමිය හා ජමෙයිතු සලමා කියන සංවිධාන දෙකේ එකමුතුව තමයි ඒ පක්ෂය පිහිටුවුණේ. ඒ පක්ෂයේ එයා දෙමළ ජාතික සංවිධානය නියෝජනය කරලා ඉන්න කාලයේ පාර්ලිමේන්තු 2015 පාර්ලිමේන්තු ඡන්දය ආවා. ආපු වෙලාවේ මම අස්මින්ව මුණ ගහපු වෙලාවේ මට අස්මින් කිව්වා, වැල්ලවත්තේ අපි Meet වෙච්ච වෙලාවේ කිව්වා සම්බන්ධන්, විපක්ෂ නායකයා හිටපු කටයුතු කරපු දෙමළ ජාතික සංවිධානයේ සභාපති ධූරය දරන සම්බන්ධන් මහත්මයා කිව්වා NFGG පක්ෂයට දෙමළ සංවිධානයත් එක්ක එකතු වෙලා ඡන්දය ඉල්ලන්න කියලා. ත්‍රිකුණාමලයෙන් ඉල්ලන්න. අපිට ජාතික ලැයිස්තුවේ ආසන දෙකක් හම්බ වුණොත් එකක් දෙනවා කියලා ස්ථිරව කිව්වා කියලා. ඊට පස්සේ ඒ වෙලාවේ තමයි ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයත් එක්ක NFGG පක්ෂයට ආරාධනාවක් එනවා රවුෆ් හකීම් මහත්මයත් එක්ක කථාවකට. ඊට පස්සේ ඒකට සහභාගී වීම සඳහා මාවනැල්ල ඉඳලා අස්මින් යූත් කොළඹට එනවා. ඇවිල්ලත් මෙයා දෙමළ ජාතික සංවිධානයේ නියෝජනය කරන මන්ත්‍රී කෙනෙක් හැටියට ඉන්න හින්දා එයාට ඒ ගැන කැමැත්ත තිබුණේ නැහැ. ඊට පස්සේ ඒ අය සාකච්ඡාවට සහභාගී නොවී අපි දෙන්නම මේ Dinner එකක් ගන්න වැල්ලවත්තේ Hotel එකකට යනවා. ගිහිල්ලා කථා කරමින් ඉන්නවා. එතකොට අනිත් කට්ටිය ගිහිල්ලා තමයි රවුෆ් හකීම් මහත්මයත් එක්ක සාකච්ඡා කරලා මුස්ලිම් කොන්ග්‍රසය හරහා මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉංජිනියර් අබ්දුල් රහුමාන් ඉදිරිපත් වෙනවා. ඉදිරිපත් වුණාට පස්සේ මම අස්මින් එක්ක දිගටම සම්බන්ධකම් පවත්වාගෙන හිටියා මගේ යාළුකම හින්දා මිත්‍රකම හින්දා. එතකොට අස්මින් දවසක මගෙන්

FAIR COMMENT BY JEZEEM

අහනවා ඡන්ද වැඩ කටයුතු කොහොමද යන්නේ කියලා. එතකොට අස්මින් ඡන්ද වැඩ කටයුතු බලාගෙන ඉන්නේ ගොඩාක් දුරට මුතූර්වල. ඩොක්ටර් සාහිඩ් හරි කෙනෙක් ඩොක්ටර් කෙනෙක් ඉල්ලනවා ඒ පක්ෂයෙන්ම මුස්ලිම් කොන්ග්‍රසය යටතේ මූතූර්වල. එතකොට මඩකලපුව ගැන අස්මින් මට කියනකොට කිව්වා සහරාන්ගේ කණ්ඩායම සම්පූර්ණයෙන්ම අපට සහයෝගය පළ කරලා තියෙන්නේ කියලා.

ප්‍ර : ඒ කියන්නේ සහරාන් සමඟ සාකච්ඡා පවත්වලා තියෙනවා?

පි : පවත්වලා තියෙනවා සහරාන්ගේ පක්ෂයේ ජාතික තවුහිද් ජමාත් එක්ක. සම්පූර්ණ සහාය පළ කරලා තිබුණේ අබ්දුල් රහුමාන්ට කියලා තමයි අස්මින් මට පැවසුවේ. ඒ විතරක් නෙමෙයි කාත්තන්කුඩි ඉඳලා පළ වුණා වාර උරේහල් කියලා. ඒක පත්තරේකුයි, වෙබ් සයිට් එකකුත් තිබ්බා. Face book පිටුවක් තිබ්බා. පුවී රහුමතුල්ලා කියන කෙනෙක් තමයි ඒක කර්තෘවරයා හැටියට හිටියේ. එයාවත් මම මුණගැහිලා තියෙනවා අස්මින් එක්ක කාත්තන්කුඩියට ගිය වෙලාවේ. සුහඳව කථා කරලා තියෙනවා. එතකොට මේ ඡන්ද කටයුතු කිරීම සඳහා එයා වාර උරෙයිහල් කියන වෙබ් සයිට් එකේ සම්පූර්ණ Control එක නියාස් කියන පුද්ගලයාට, ඒ නියාස් කියන එක්කෙනා වෙඩි ප්‍රහාරයෙන්, හමුදා වෙඩි ප්‍රහාරයෙන් මරණයට පත් වෙනවා පාස්කු ඉරිදා ප්‍රහාරයට පස්සේ. සායින්දමර්දු ප්‍රදේශයේ පැවැත්වෙච්ච ගැටුමෙදි පත් වෙනවා. එයාට ඒක භාර දුන්නා කියන එකත් මම දැනගෙන හිටියා.

ප්‍ර : කවුද ඒ නම? කවුද?

පි : නියාස්.

ප්‍ර : නියාස්. එයා මරණයට පත් වෙන්නේ අර සයින්දමර්දු හමුදාවත් එක්ක ඇතිවෙන ප්‍රහාරයෙන්?

පි : ඔව්. වෙඩි ප්‍රහාරයට ලක් වෙලා මරණයට පත්වෙන එක්කෙනා. සිය දිවි නසා ගන්නේ කට්ටිය ගේ ඇතුළේ. එළියට ඇවිල්ලා වෙඩි ප්‍රහාරයට ලක් වෙන.

ප්‍ර : දැන් ඔය යහපාලන පක්ෂයක් කිව්වනේ 2015 නේ ඕක වුණේ?

පි : ඔව්.

ප්‍ර : දැන් නැවත නැවතත් ඒ පක්ෂය ලියාපදිංචි වෙලා, නැවතත් හවුල් වෙලා, වර්තමානයේත් තරහ කරන්න ඉදිරිපත් වෙලා තියෙනවද?

පි : මම ළඟදී ප්‍රවෘත්තිවල දැක්කා ඒ පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ, JVP සමඟ යම්කිසි සාකච්ඡාවක් පවත්වලා, යම්කිසි සංවිධානයක් හදනවා නැත්නම් හදලා තියෙනවා වගේ ප්‍රවෘත්තියක් මම දැක්කා.

ප්‍ර : JVP ත් එක්ක?

පි : JVP ත් එක්ක.

ප්‍ර : දැන් තමන් ජමාත් ඉස්ලාම් සංවිධානයේ තරුණ පෙරමුණේ Youth Organization එකෙත් හිටියා?

පි : Students Organization.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : තමන් දන්නවද සඟරා දෙකක් ගැහුවද එංගල් ....?

පි : එංගල් දේසම්.

ප්‍ර : අනිත් එක මොකක්ද?

පි : අල් හසනාත්.

ප්‍ර : ඔය දෙකේම ඒ කාලයේ මෙම මිනී මැරුම් ඔය තමන්ගේ මුස්ලිම් ආගම වෙනුවෙන් මරණයට පත්වීම සාධාරණ බවට 1970 කාලයේදී පවා සඟරාවල ලිපි පළ වෙලා තිබ්බද?

පි : 70 ගණන්වල මතක නැහැ. ඒ වුණාට අල් හසනාත්වල මම ගොඩාක් එංගල්දේසම් පත්තර කියවලා නැහැ. එංගල්දේසම් පත්තරේ මට මතක හැටියට පටන් ගත්තේ 2001 දී. මාවනැල්ලේ සිද්ධියත් එක්ක තමයි. මාවනැල්ලේ වෙච්ච ප්‍රශ්නයත් එක්ක තමයි ඒක පටන් ගන්නේ 2001 දී. ඒ වුණාට මම ඒක ගොඩාක් කියවලා නැහැ. අල්හසනාත් එකේ නම් ඒ මතය ප්‍රකාශ කරන ලිපි පළ වෙලා තිබුණා. සෑහෙන මම ගාවත් දැන් ඉදිරිපත් කරන්නත් මම කියනවා මම ගාවත් ටිකක් තිබෙනවා. ගරු සභාවට ...,

ප්‍ර : මාවනැල්ල සිද්ධිය කියන්නේ මොකක්ද 2017 .....?

පි : 2001.

ප්‍ර : 2001?

පි : 2001.

ප්‍ර : ඒ මොකද්ද මාවනැල්ල සිද්ධිය?

පි : දේශපාලන පසුබිමත් එක්ක මුස්ලිම් සිංහල අතර ප්‍රශ්නයක් ඇති වෙනවා මාවනැල්ලේ. ඊට පස්සේ පල්ලි කිහිපයකට පහර දීමක් සිද්ධ වෙනවා. එක් පුද්ගලයෙක්, මුස්ලිම් පුද්ගලයෙක් මරණයට පත් වෙනවා. ඒක එක දවසක් වාගේ ඒ ප්‍රශ්නය තිබුණා.

ප්‍ර : ඒ අවස්ථාවේ තමයි මේ සඟරාවල...?

පි : ඒ අවස්ථාවට පස්සේ තමයි මේ සඟරාව පටන් ගන්නේ.

ප්‍ර : ඒ සඟරාවල ඒ විදියේ ලිපි පළවීමක් සිදු වූවා නේද?

පි : නැහැ. අල්හසනාත් එකේනම් ඊට කලින් ඉඳලාම ඒ ලිපි පළවෙලා තියෙනවා. මට තව මතකයක් තියෙනවා 1994 අල්හසනාත් සඟරාවේ මුල් පිටුවේ වර්ණ ඡායාරූපයක් තිබුණා ඇෆ්ගනිස්ථාන් එකේ ජිහාද් සටන්කරුවෙක් වන කුල්බුතීන් හික්මතයාර් නැමැත්තා. එයත් ඉංජිනියර් කෙනෙක්. කුල්බුතීන් හික්මතයාර් නැමැත්තා AK 47 තුවක්කුවක් අතේ තියාගෙන ඉන්න වර්ණ පින්තූරයක් දාලා තිබ්බා මුල් පිටුවේ 1994.

ප්‍ර : ඒ ජමාතේ ඉස්ලාම් සංවිධානයට තුර්කිය රජයෙන් ආධාර විශාල වශයෙන් ලැබුණා?

පි : ඔව් එහෙම කියන්න පුළුවන් තරමට නිල නොවන තොරතුරු තියෙනවා.

ප්‍ර : ආධාර ලැබුණයි කියලා?

පි : ආධාර ලැබුණයි කියන එකට.

ප්‍ර : Projects සාමාන්‍යයෙන් ලංකාවේ ආණ්ඩුවටත් තුර්කි රජයෙන් Projects වලට ගොඩක් NGO වලත් සල්ලි එව්වා.

FAIR COMMENT — BY JEZEEM —

පි : ඒක නම් මම දන්නේ නැහැ.

ප්‍ර : තුර්කි රජයෙන් Projects දාපු එක ගැන දන්නේ නැහැ ලංකාව ඇතුළේ?

පි : දන්නේ නැහැ.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔබ දැන් කිව්වා ජමාතේ ඉස්ලාමිය සංවිධානයට තුර්කියෙන් ආධාර ලැබුණා කියලා. ඔබ පෞද්ගලිකව දන්නවද එම ආධාර ලැබුණේ තුර්කිය රජයෙන්ද නැත්නම් තුර්කියේ තියෙන ආයතනයකින්ද කියලා?

පි : නැහැ ඒක දන්නේ නැහැ. තුර්කියත් එක්ක ඉතා සමීප සම්බන්ධතාවයක් තිබුණා කියන එක විතරයි මට කියන්න පුළුවන්.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : දැන් තුර්කි රජයෙන් මද්‍රාසා පාසල් ලංකාවේ පවත්වන්නත් උදව් කරා නේද ජමාතේ ඉස්ලාමිය සංවිධානයට?

පි : එහෙම ස්ථිරව කියන්න මම දන්නේ නැහැ.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : දැන් ඔය ජමාතේ ඉස්ලාම් පිළිබඳව ඔබ ඒ සංවිධානය ගැන ඔබ පැහැදිලි කරපු ආකාරයට ඔබට ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන එක පිළිබඳව?

පි : ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් ගැන මම දැන ගන්නේ බෝම්බ ප්‍රහාරයට පස්සේ.

ප්‍ර : මොකක්ද ඒ?

පි : ෂාහිඩ් අබ්දුල්ලා හා එයාගේ සහෝදරයෝ ඒ වගේම අර සහරාන්ලත් එක්ක කටයුතු කරපු .....,

ප්‍ර : ඒ කියන්නේ මාවනැල්ලේ ඔය .....?

පි : බුදු පිළිම කැඩීමේ සිද්ධියට සම්බන්ධ ....,

ප්‍ර : ඔව්. සහෝදරයින් දෙදෙනා ....?

පි : දෙන්නා සාමාජිකයින් ලෙස හිටපු සංවිධානයක් හැටියට තමයි.

ප්‍ර : ඔබ දැන ගත්තේ?

පි : දැන ගත්තේ ඔව්.

ප්‍ර : එතකොට ඒ සිද්ධියෙන් පස්සේ තමයි ඒ කියන්නේ 2018 දෙසැම්බර් මාසයෙන් පස්සේ තමයි ඔබ ඒ පිළිබඳව දැන ගන්නේ. නැත්නම් ඒ සිද්ධියට පස්සේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නැහැ. 2019 අප්‍රේල්.

ප්‍ර : 2019 වෙනකොට එයා ....?

පි : බෝම්බ ප්‍රහාරයට පස්සේ තමයි මේ නම මම දැන ගන්නේ.

ප්‍ර : බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ දැන ගන්නේ?

පි : ප්‍රහාරයෙන් පස්සේ. එතකොට මට මෙතන සභාවට ඉදිරිපත් කරන්න බැරි වෙච්ච එකක් තියෙනවා. කලින් මම සාක්ෂි දෙනකොට අල්හසනාත් සඟරාවේ නොවැම්බර් 1999 පළ කරලා තියෙනවා එඩිටෝරියල් ඒකේ කෙළින්ම සඳහන් කරලා තියෙනවා පිළිම වන්දනා කරන එකට විරුද්ධවයි, ඒවා කැඩීම ගැන ප්‍රශංසා කරපු එඩිටෝරියල් එකක්.

ස්වාමීනි මේ අවස්ථාවේදී සාක්ෂිකරු අල්හසනාත් සඟරාවේ 1999 නොවැම්බර් මස ප්‍රකාශයට පත් කරන ලද කතුවැකියේ පිටපතක් IR - 12 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා. එය ද්‍රවිඩ භාෂාවෙන් ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : අල්හසනාත් සඟරාව මුද්‍රණය කරන්නේ මොන සංවිධානයෙන්ද?

පි : ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමිය සංවිධානයෙන්.

මේ අවස්ථාවේදී IR - 12 වශයෙන් ලකුණු කරන ලද ලේඛනයේ සිංහල පරිවර්තනයක් සකස් කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්තකට නියෝග කරමි. එය එසේ ඉදිරිපත් කළ පසු එය IR – 12(a) වශයෙන් ලකුණු කරන ලෙසටද නියෝග කරමි.

****

ගරු බන්දුල කුමාර අතපත්තු මැතිතුමා :

ප්‍ර : ඒ සඟරාව අදත් පළ වෙනවද?

පි : මෑත කාලයේ ළඟදී වෙනකම් ඒක පළ වෙලා තියෙනවා. තවම පළ වෙනවා කියලා තමයි මගේ විශ්වාසය. එහෙම දෙයක් නැවතුණා කියලා කිසිම ආරංචියක් නැහැ. 2019 වෙනකම් ඒ සඟරාව පළ වුණා.

ප්‍ර : ඒක මාසික සඟරාවක්ද කොහොමද?

පි : මාසික සඟරාවක් හැටියට අංක 77, දෙමටගොඩ පාර, කොළඹ 09 කියන ලිපිනයෙන් තමයි ඒගොල්ලන්ගේ Head Office එකෙන් Address එකත් එක්ක තමයි ඒක පළ වෙන්නේ.

****

ගරු අදිකාරි මැතිණිය :

ප්‍ර : ඊජිප්තුවෙන් පටන් ගත්ත මුස්ලිම් බ්‍රදර්හුඩ් කියන සංවිධානය ඔය කැලිෆට් එකක් ගැන සහ මුස්ලිම් රාජ්‍යය ගැන තියෙන සංවිධානයක් කියලා ඔබ ප්‍රකාශ කළා?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ වගේම ඔබ ප්‍රකාශ කළා ජමාතේ ඉස්ලාමිය කියන සංවිධානය ආසියානු රටවල්වල එම සංකල්පයම ගෙන යන සංවිධානය කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට IS සංවිධානය සහ මුස්ලිම් බ්‍රදර්හුඩ් අතර තියෙන සම්බන්ධතාවය මොකක්ද?

පි : මුස්ලිම් බ්‍රදර්හුඩ්, ජමාතේ ඉස්ලාමිය මේ දෙන්නම ඇති කරන්න හදපු ඉස්ලාම් රාජ්‍යය කියන එක, මේ වචනය සුදුසුද කියලා මම දන්නේ නැහැ. දඩි බිඩි ගාලා ඇති කළා කියන එක තමයි අදහස් කරලා තියෙන්නේ. Long term plan එකක් නැතුව ....,

ප්‍ර : ඒ කියන්නේ IS එක හදිස්සියෙන්ම ඇති වුණා මේ ....?

පි : ඔව්. ඒක හදිස්සියේ ඒ වගේ දෙයක් ඇති කරා කියන එක තමයි.

ප්‍ර : එතකොට IS සංවිධානයත් සමඟ ලෝකයේ ජමාතේ ඉස්ලාමිය සංවිධානවල කෙළින්ම සබඳතා තියෙනවද?

පි : මම දන්න තරමට ජමාතේ ඉස්ලාමිය සංවිධානය Officially IS සංවිධානයත් එක්ක සම්බන්ධ වෙලා හිටපු එකනම් මම දන්නේ නැහැ. ඒ වුණාට මේ මතවාදය බෝ කරපු හින්දා ගොඩක් අය ඒ පැත්තට ඇදිලා ගියා.

ප්‍ර : එතකොට ජමාතේ ඉස්ලාමිය සංවිධානය IS සංවිධානයේ අර බයාත් කරපු සංවිධානයක් හැටියට තියෙනවද ලෝකයේ? දැන් ශ්‍රී ලංකාවේ ජමාතේ ඉස්ලාමිය කියන සංවිධානය IS සංවිධානය විසින් බයත් කරපු සංවිධානයක්ද?

පි : නැහැ. ජමාතේ ඉස්ලාමිය නායකත්වය IS සංවිධානයට බයත් කරේ නැහැ.

ප්‍ර : සහරාන්ගේ National Thowheed Jamath එක බයත් කරලා තියෙනවද IS එකත් එක්ක?

පි : මමත් ඒක අර Video එකෙන් තමයි අපි දැනට කලින් මොහොතකට කලින් කථා කරපු Video එකෙන් තමයි දැක්කේ. සහරාන් ඒක බයත් එක ප්‍රහාරයට යන්න කලින් ඒ බයත් එක දෙනවා. බයත් කියන එක සාමාන්‍යයෙන් වෙන්න ඕන හරි ක්‍රමය අතට අත තියලා තමයි නබිතුමාගේ කාලයේ බයත් එක වෙලා තියෙනවා. ලංකාවේ ඉන්න එක්කෙනෙකුට සහරාන්ට ඒ වගේ Chance එකක් ඊට කලින් ලැබිලා නැහැ. එතකොට මම හිතන විදියට මරණයට පත් වෙන්න කලින් ඒක Video හරහා හරි කරලා තියෙනවා කියන එක තමයි.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ඒ බයියත් කිරීම සාමාන්‍යයෙන් කරන්නේ යම්කිසි ප්‍රහාරයක් සිදු කිරීමට ආසන්න කාලයේමද නැත්නම් ඊට කලින්ද නැත්නම් ඊට කලින් වුණත් කරන්න පුළුවන්ද ගොඩක් කලින්?

Preview Copy
FAIR COMMENT BY JEZEEM

පි : නබිතුමාගේ කාලයේ නම් එයා ඉස්ලාම් රාජ්‍යය පිහිටු වුණාට පස්සේ ඉස්ලාම් ආගම වැළඳගන්නා එක්කෙනෙක්. එයාගේ නීතිය යටතේ ජීවත් වෙනවා කියන එකට අතට අත තියලා තමයි ඒ බයියත් එක වෙලා තිබුණේ. ඒක ප්‍රහාරයට කලින් නෙමෙයි. ජීවිතයේ, තමාගේ ජීවිතයේ ආගම වෙනුවෙන්, ඒ නායකයා වෙනුවෙන් පරිත්‍යාග කරනවා නැත්නම් එයාට Under his guidance I will live කියන එක තමයි ඒ බයියත් එක ....,

ප්‍ර : දැන් L.T.T.E. එක මගින් Suicide attack එකක් කරන්න යන්න කලින් ඔවුන් නායකයා ඉදිරියේ ඒ එක් එක් Suicide attack එක කරන්න ඉස්සරලා ගිහිල්ලා එකතු වෙලා යම් දිවුරුමක් වගේ ආශිර්වාදයක් ලබා ගන්නවා. ඒ වගේම මෙම ISIS එකෙත් කරනවද ඒ විදියේ එක් එක් ප්‍රහාරය සම්බන්ධව කිරීමක් කරනවද නැත්නම් සියලු දෙනාම එකට එකට .....?

පි : මම හිතන්නේ නැහැ එහෙම දෙයක් ISIS සංවිධානය ඇතුළේ තියෙන්න පුළුවන් කියලා. මොකද ISIS සංවිධානයේ මරණයට නැත්නම් බෝම්බ ප්‍රහාරයට යන එක්කෙනා යන්නේ අල්ලාහ් දෙවියන් වෙනුවෙන් හින්දා. ඒ හින්දා ඒකේ නායකයා යම්කිසි තවත් පුද්ගලයෙක් හින්දා ඒකට මුල් තැන දෙනවා කියලා මම හිතන්නේ නැහැ ISIS සංවිධානය තුළ. මට අවස්ථාව තියෙනවද තව ලිපියක් යොමු කරන්න. දැනට මේ හසන්අල්බන්නා ගැනයි, බ්‍රදර්හුඩ් ගැන මෙතන ප්‍රශ්නයක් ඇහුවා. මේක මේ ලිපිය පළ වෙලා තියෙන්නේ අල්හසනාත් සඟරාවේ නොවැම්බර් 1999 හසන්අල්බන්නා ගැන පළ වෙච්ච ලිපියක්. ඒකේ ලියලා තියෙන්නේ අග්ෂේක් ඒ අබ්දුල් මලීක් නලීමි, නලීමි කියන්නේ නලීමියා එකේ ඉගෙන ගත්ත එක්කෙනෙක්. ඒකේ සඳහන් කරලා තියෙනවා .....,

ප්‍ර : ඒ කියන්නේ නලීමියා කියන්නේ බෙරුවල නලීමියාද?

පි : බෙරුවල නලීමියා. නලීමියා එකේ ඉගෙන ගත්තු එක්කෙනෙක් තමයි මේක ලියලා තියෙන්නේ. ඒකේ සඳහන් කරලා තියෙනවා මම Mark කරන තැන්වල හසන්අල්බන්නාගේ ඉස්ලාමිය View එකක් තිබුණේ ඉස්ලාමිය රාජ්‍යයක් පිහිටුවීම ගැන මෙතන සඳහන් කරලා තියෙනවා තැන් තුනක ඒක සඳහන් කරලා තියෙනවා. ඒ එක්කම මෙතන මේ තව එක තැනක සඳහන් කරලා තියෙනවා අපි දැන් කථා වෙච්ච දෙයක් තමයි (ලේඛනයෙන් කොටසක් කියවයි). ඒ කියන්නේ මෙතන කියලා තියෙනවා ඉන්දියන් උපහන්ද කියන්නේ ඉන්දියානු මහද්වීපයේ මවුලානා මවුදුති හදා ගත් ජමාත් ඉස්ලාමික් Ikhwanul Muslim නුත් එක මතයේ යනවා කියන එක. එතනින් පල්ලෙහා පොඩි සඳහනක් වෙලා තියෙනවා. මේකේ කියලා තියෙන්නේ යූසුෆ් අල් කල්රාවි කියන එක්කෙනා එයා ගැන අපි කලිනුත් කථා කරලා තියෙනවා. එතන සඳහන් කරලා තියෙනවා සඟරාවෙම High light කරලා තියෙනවා කොටුවක ඒකේ යූසුෆ් අල් කල්රාවි පවසලා තියෙනවා මේ

ඉමාම්වරු මේ නායකයෝ දෙන්නා එකිනෙකා මුණගැහිලා තිබුණේ නැති වුණාට මේගොල්ලෝ දෙන්නම ඇති කරපු සංවිධාන දෙකක් ඉස්ලාමිය විප්ලවය හරහා යයි කියන ප්‍රකාශය මෙතනින් එයත් කරලා තියෙනවා.

ප්‍ර : කවද්ද සඟරාවේ දිනය?

පි : 1999 නොවැම්බර්.

****

ගරු සභාපතිතුමා :

මේ අවස්ථාවේදී IR – 13 වශයෙන් ලකුණු කරන ලද ලේඛනයේ සිංහල පරිවර්තනයක් සකස් කර කොමිසමට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්තකට නියම කරන අතර, එය එසේ ඉදිරිපත් කළ පසු IR – 13(a) වශයෙන් ලකුණු කරන ලෙසට නියෝග කරමි.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඒ සඟරාවේ ගත්ත ඡායාරූප පිටපත ඔබ විසින් මෑතකදී ගැසූ ඡායාරූප පිටපතක් නේද?

පි : ඔව්. අන්තර්ජාලයෙන් මම ලබා ගත්ත එකක්.

ප්‍ර : මොකක්ද අන්තර්ජාලය?

පි : noolaham.net නැත්නම් noolaham.org කියන වෙබ් අඩවියේ ....,

ප්‍ර : මොකක්ද?

පි : noolaham.org නැත්නම් net කියලා එන්න ඕන.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඔබ පළවෙනියෙන්ම මේ වෙබ් සයිට් එකට ප්‍රවිශ්ඨ වුණේ කවදද?

පි : ගිය අවුරුද්දේ.

ප්‍ර : එතකොට ඔබ කියන්නේ ඒ ඉඳලා මේ 2020 අවුරුද්ද වෙනකොට 50 ක් පමණ මේ සඟරා දැනට එහි අඩංගු වෙනවා කියලද?

පි : ඔව්. ඒක මේ වෙබ් සයිට් එක ජමාත් ඉස්ලාමීක් සංවිධානයටවත්, වෙනත් සංවිධානයටවත් අයිති එකක් නෙමෙයි. මේක පොදුවේ දෙමළින් පළවෙන සඟරාව හා පොත් කැමති එක්කෙනාට ඒකේ upload කරන්න පුළුවන්. මම දැකපු අල්භසනාත් සඟරාවේ ගොඩාක්ම පිටපත්වල මුද්‍රණය තිබුණා. යාපනයේ Public Library එකේ. එතකොට යාපනය Public Library එකේ කවුරු හරි ඒක ....,

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : දැන් ඉස්මත් ඔබ දකින විදියට මේ 1999 මේ අදහස් පළ වෙලා තියෙන්නේ. ඒ කියන්නේ මීට අවුරුදු 21 කට ඉස්සරලා?

පි : ඔව්.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට තේරෙන විදියට ඒ කාලයේ මේ මතවාදය පිළිබඳව ලංකාවේ මුස්ලිම් ජනතාව තුළ දැඩි උනන්දුවක් තිබුණේ නැහැනේ. මේ 2004, 2005 වගේ කාලයෙන් පස්සේ යම් වර්ධනය වීමක්නේ ඔබට පේන්න තියෙන්නේ?

පි : ඔව්. වර්ධනය කාලයත් එක්කම වැඩි වීගෙන එන රටාවක් තමයි.

ප්‍ර : මගේ ප්‍රශ්නය 1999 වගේ පැරණිම මේ අවුරුදු 21 කට ඉස්සරලත් මේ පිළිබඳව මේ සහරාවලින් පළ කරලා තියෙද්දීත් හදිස්සියේ මේ 2005, 2006 වගේ කාලේ වෙනකොට මේක වර්ධනය ශීඝ්‍රයෙන් සිද්ධ වෙන්න හේතුව මොකක්ද?

පි : ජමාතේ ඉස්ලාමිය පැත්තෙන් මම දන්න තරමට මමත් හිටපු කාලයේ ඉඳන් කියනවා නම් ඒගොල්ලන්ගේ Long term plan එකක් තිබ්බා. ආගම විතරක් දේශනා කරන එක විතරක් නෙමෙයි. PR එකක් ඇති කිරීම, පෞද්ගලික Personal reputational relationships. ඒගොල්ලන්ගේ Education side එකෙන් ගොඩාක්ම ගියා. අල්හසනාත් සම සහරාවල බලන්න පුළුවන් Maths, Mathematics, workshops, leadership course for the Prefects. ඒ වගේ ගොඩක් දේවල් ඒගොල්ලන් සංවිධානය කරා. ඒවාවලින් ප්‍රතිඵලයක් වෙන්න පුළුවන් මේ වගේ දේවල්. අනිත් එක තව උස්රා කියලා තව සංවිධානයක් හැදුවා. උස්රා කියන එක පවුල් Family. They started making Jamathe Islamic Families. They call it the Usra system. So they, connected families one another. Jamathe Islami Family. so they become one society and they have, had their own meetings. And their own events. So then they started gathering more families. This is the result of a systematic work and also the support received by the outside may be financial supports received from out side.

ප්‍ර : Other than that do you think whether there was any political background or political description for this?

පි : Sri Lanka I see until the April blast. Most of the time the political politics favoured this kind of moves. There was no restrictions and no control. I did't see any control for any kind of material to be talked preached and all so the governing system never had a strong look in to what going on under the guise of preaching Islam and there are lot of Islamic movements. Lot of Thowheed Jamatha, Thablic Jamathe, E-Islami and they had the full time dedicated workers. I'm not sure any other religion had this much of work force for the religion within this Island. But they kept on working in different forms and they were islamising the woman, school children and hijab and they were creating

FAIR COMMENT BY JEZEEM

the environment where a Muslim cannot survive without expressing himself as a devoted muslim. This was slowly built up from different fronts and with different techniques. So if in case the bomb blast hadn't had happened it would have gone more and more strogly.

ප්‍ර : ඔබ කියන්නේ බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ ඒ කියන්නේ ඒක එකපාරටම කඩාගෙන වැටුණා කියලද?

පි : යම්කිසි මට්ටමකට ඒක නැවතීමක් නැත්නම් Pause එකක්, නැවතීමක් නෙමෙයි. තාවකාලික නැවතීමක් මට දකින්නට පුළුවන් වෙලා තියෙනවා. ඒකේ ඉස්ලාමිය History එක ගත්තොත් ඒ වගේ දේවල් වෙලා තියෙනවා. වාතාවරණය හරි නැත්නම් Islam has to play a low profile. Until the circumstances becomes clear for them. This is the history. I have studied in Jamathe Islami. They have said this one. So if the situation does not favours us, we should not talk about the bigger bargets like we have to keep the people together and more on according to the system. So if you see the recent publications of Jamathe Islamics expressions the were more talking about the patriotism, the country, the cohesion. ජාතීන් අතර තියෙන සම්බන්ධතා හා ඒ වගේ දේවල් ගැන. හැබැයි මේ මේවාවල බැලුවොත් ඒවාට විරුද්ධව ගොඩාක් දේවල් තියෙනවා. මම කලින් ඉදිරිපත් කරපු ලිපියේ තියෙන්නේ පිළිම කැඩීම ගැන. ඒක පටන් ගන්නේ කොළඹ හින්දු පාසලක. කොළඹ දෙමළ ප්‍රභල පාසලක සිද්ධ වෙච්ච සිද්ධියක්. අවුරුදු නමයක් හරි දහතුනක් හරි දරුවෙක් දෙමළ මිනිසුන්ගේ දෙමළ අයගේ එක්තරා festival එකක දීපාවලී ගැන මොනවා හරි දෙයක් පන්තියේ කියවනකොට මේ ළමයා තව ළමයෙක්ගෙන් අහනවා ඔයාගේ දෙවියාට ඇහැ පේන්නෙත් නැහැ, එහේ මෙහේ යන්නත් බැහැ මේ වගේ දෙවියෙක්ද ඔයා විශ්වාස කරන්නේ කියලා ප්‍රශ්නයක් අහනවා. ඒ ළමයා ගිහිල්ලා Teacherට කියනවා මෙන්න මගේ මුස්ලිම් යාළුවා මේ වගේ දෙයක් මගෙන් ප්‍රශ්නයක් අහනවා කියලා. Teacher එදා මේ දරුවට දඩුවමක් දෙනවා පොතේ ලියන්න සිය පාරක් අනෙක් ආගම්වල කිසිම දෙවියෙකුට මම අපහාස කරන්නේ නැහැ කියලා. ඒ ළමයා ඒ සිය පාර ලියනවා. මේ සිද්ධිය අරගෙන තමයි අල්හසනාත් එකේ කර්තෘ That Editorial එකේ ලියන්නේ ඒ ළමයාට කවුරුත් කියලා දෙන්න විදිහක් නැහැ. ඒ ළමයාම ඒක හිතලා තියෙනවා. ඒ ළමයා කරපු දේ හරි. මේ වගේ දේ තමයි නබි ඊබ්‍රාහිම් කියන එක්කෙනාත් කරලා තියෙන්නේ කියලා අර එයා ජීවත් වෙච්ච කාලයේ තිබ්බ්ච්ච පිළිම කැඩීමේ සිද්ධිය, ඒ ගැන ලිපි ලේඛන මම කලිනුත් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ සිද්ධිය එතනින් සඳහන් කරලා, ඒක ප්‍රශංසා කරලා ලියලා අන්තිම

Preview Copy
FAIR COMMENT BY JEZEEM

වාක්‍යය ඉවර කරන්නේ මේ වාගේ මේ රටේ මුස්ලිම් ජනතාවට තමන්ගේ මේවා කරන්න බැරි තත්ත්වයක් තියෙද්දී සංහිඳියාව කියන එක වැඩකුත් නැහැ. මුස්ලිම් අයට මේ දීපාවලී වාගේ Festival එකට මුස්ලිම් අය සහභාගී වෙන්න ඕන කියලා බලාපොරොත්තු වෙන එක විහිළුවක් කියලා ලියලා තිබ්බේ. දැන් ඒකම ඇහුවොත් ඒකේ අනිත් පැත්ත කථා කරයි. ඒ ලිපිය මම ඉදිරිපත් කරලා තියෙනවා. ඒක හොඳ Translation එකක් ලැබුණොත් ඒක දැන ගන්න පුළුවන් ඒකේ අඩංගු කරුණු මොකද කියලා 1999.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු, තමන් කිව්වා දැන් පකිස්ථානයේ නායකයයි කියලා ජමාත් ඉස්ලාමයිල් උඩ ඉන්නේ?

පි : අහමත් කාසිම් හුසේන්.

ප්‍ර : පහළින් එක්කෙනා මේ කොනේ. දැන් පකිස්ථාන් ඔය ලංකාවේ ආගම ප්‍රචාරය කිරීම සඳහා කොළ තොප්පි පැළඳගත් කණ්ඩායමක් උතුරු නැගෙනහිර සැරිසරන ආගම පැතිරීමේ කටයුතුවල මද්‍රසා පාසල්වල හිටියා. ඒ කොහේ කට්ටියද? පකිස්ථානයෙන් ආපු කට්ටියද කොළ පාට තොප්පි දාන්නේ?

පි : කොළ පාට තොප්පිද ටර්බන්ද.

ප්‍ර : ටර්බන්?

පි : ටර්බන් උතුරු නැගෙනහිර මම දන්නේ නැහැ. කොළඹ ඉන්නවා ඒ කට්ටිය. කලින් බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා හැටියට හිටපු අලෙවි මවුලානලාගේ නෑදෑයෝ පිරිසත් ඒකට සම්බන්ධ වෙලා ඉන්නවා. ඒගොල්ලන් සාමාන්‍යයෙන් පාරම්පරික මුස්ලිම්වරු නැත්නම් සූෆි මුස්ලිම්වරු හැටියට ඒකෙන් එක නිකායක්.

ප්‍ර : සූෆි මුස්ලිම්වරු?

පි : සූෆි එකේ එක නිකායක නක්ෂබන්දියා කියන තරීකා නිකාය තමයි. ඒ නිකායට අයිති අය තමයි මම දන්න තරමට ඒ වගේ දෙයක් පළඳ ගන්නේ.

ප්‍ර : ඒත් ආගමික ප්‍රචාරක කටයුතුවලට යෙදෙන්නේ?

පි : ආගම ප්‍රචාරක කටයුතුවලට වඩා ආගම දේවල් ඒගොල්ලන් Celebrate කරන්න. මම නම් ගොඩාක්ම දැකලා නැහැ සූෆි කෙනෙක් තව කෙනෙකුට ගිහිල්ලා අපේ ආගමට එන්න කියලා ආරාධනා කරපු වාගේ දෙයක් මම එච්චර නම් දැකලා නැහැ. මොකද සූෆිවරු එක්තරා කාලයක ලංකාවේ ගොඩාක් බලවත් විදියට හිටියා මුස්ලිම් සමාජය ඇතුළට. ඊට පස්සේ ඉස්ලාම් ආගම ගැන දැනුම කුරාන් හා හදීස් ගැන දැනුම මුස්ලිම් මිනිස්සු අතර වැඩි වෙනකොට ඒගොල්ලන් Back Seat එකට ගියා.

ප්‍ර : දැන් ලංකාවේ වැඩියෙන් ඉන්නේ සුන්නි මුස්ලිම්වරු?

පි : සූෆිලත් අඩංගු වෙන්නේ සුන්නි කියන මේකට තමයි. ඒ වුණාට ඒගොල්ලන්ගේ ගොඩාක් දේවල් කුරාන් හදීස්වලට එකඟ වෙන්නේ නැහැ කියන මතය තමයි ....,

ප්‍ර : සුන්නි මුස්ලිම්වරුන් සූෆි මුස්ලිම්වරුන්ට විරුද්ධයි?

පි : සූෆි මුස්ලිම්ලත් කියන්නේ තමා සුන්නි මුස්ලිම් කියලා තමයි. ඒ වුණාට මේගොල්ලන්ගේ definition එකක් අනුව මොහොමඩ් නබිතුමා කරපු දේ කියලා බලනකොට සූෆි මුස්ලිම්ලා කරන දේ ඉස්ලාම් ආගමට පටහැනියි කියලා සමහර කරුණු ඒගොල්ලන් අයින් කරනවා ඒ කට්ටියව. දැන් සූෆි මුස්ලිම්ලාගේ ප්‍රමාණය ගණන් කරලා බැලුවොත් දැන් අවුරුදු විස්සකට තිහකට කලින් හිටියට වඩා ගොඩාක් අඩුයි දැන්.

ප්‍ර : අලෙවි මවුලානාගේ සම්බන්ධය මොකක්ද ඒ ගැන කිව්වේ?

පි : එයත් ඒ නිකායට ඒ කියන්නේ සූෆි නිකායට අයිති එක්කෙනෙක්.

ප්‍ර : ඒ කියන්නේ දේශපාලන වශයෙන් ඒගොල්ලෝ ඒ නිකායට උදව් කිරීමක් කරලා තියෙනවාද?

පි : වෙන්න පුළුවන්. ඒ කට්ටියගේ සූෆි මුස්ලිම්ලාගේ නැත්නම් අර කොළ අඳින කට්ටියගේ ජාතික ආරක්ෂාවට හෝ අන්‍යාගාමිකයන්ට හෝ තර්ජනයක් තියෙන තත්ත්වයක් මම දැක්කේ නැහැ. සමහර ඒගොල්ලන්ගේ තියෙන සමහර Backward Ideas තියෙන්න පුළුවන්. තිබුණාට ජාතික ආරක්ෂාවට හෝ අන්‍යාගමික නැත්නම් සමඟියට කිසිම හානියක් තියෙන තත්ත්වයක් තිබුණේ නැහැ.

ප්‍ර : සාක්ෂිකරු තමනුත් හදීස් අනුමත කරනවා නේද සහරාන්ගේ. හදීස් කියලා ඔබ අන්තිම සාක්ෂියෙන් ඔබ කිව්වේ හදීස් කියන්නේ මොකද්ද?

පි : නබිතුමා කියපු දේ, කරපු දේ හා අනුමත කරපු දේ.

ප්‍ර : ඒ කියන්නේ සහරානුත් ඒක තමයි අනුගමනය කළේ?

පි : හදීස් හා කුරාන් එක.

ප්‍ර : තමනුත් ඒක අනුමත කරනවද?

පි : අනුමත කරනවා කියන එක.....,

ප්‍ර : ඒ කියන්නේ සහරාන් තමන් ජමාතේ ඉස්ලාමිය සංවිධානයෙන් අයින් වුණේ ජමාතේ ඉස්ලාම් සංවිධානයේ පිළිවෙත් පිළිගන්නේ නැති නිසා?

පි : ආ... ඔව්. මම මුස්ලිම් වෙලා හිටපු කාලයේ කුරාන් හදීස් තමයි අපේ මඟ පෙන්වීම. ඒ අනුව තමයි අපි යන්න ඕන කියන එක, ඒ ජීවිතයේ කුරාන් හදීස් අනුව තමයි ගත කරන්න ඕන කියන මතයේ තමයි මමත් හිටියේ. ජමාතේ ඉස්ලාමිය එකෙත් මම මත ගැටුම් ඇති කර ගන්නෙත් හදීස් එක අනුව තමයි.

ප්‍ර : සහරාන් හෂීමුත් හදීස් එක අනුව කටයුතු කිරීම අනුමත කළ එක්කෙනෙක්?

පි : ඔව්. සහරාන් හෂීම් විතරක් නෙමෙයි. ජමාතේ ඉස්ලාමිය පවා කියන්නේ කුරාන් හදීස්ව තමයි අපි Follow කරන්න ඕන කියලා.

FAIR COMMENT — BY JEZEEM

එතන ජමාතේ ඉස්ලාම් එකයි, අනිත් තවුහිද් සංවිධානය අතර තියෙන ප්‍රශ්නය තමයි සාමාන්‍යයෙන් පොඩි ප්‍රශ්නවලට ජමාතේ ඉස්ලාමය කියන්නේ අපි මේක දැන් අත ගහන්න ඕන නැහැ. සමාජය ඇතුළේ ප්‍රශ්නයක් ඇති වෙනවා. අපි Long term plan එකකට යන්න ඕන කියන එක තමයි ජමාතේ ඉස්ලාම් එකේ තිබ්බේ. තවුහිද් ජමාතේ එකේ තිබ්බේ නැහැ. මේක වැරදි නම් මෙතනින්ම අපි අයින් කරමු කියන එක.

****

ගරු සභාපතිතුමා :

කොමිෂන් සභාවේ කටයුතු දිවා ආහාරය සඳහා ප.ව. 2.15 වනතෙක් නවත්වනවා.

****

දිවා ආහාරයෙන් පසු නැවතත් ප.ව. 2.30 ට කොමිෂන් සභාව රැස්වේ.

සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : සාක්ෂිකරු, ඔබ අද දිවා විවේකයට පෙර මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා ප්‍රහාරයට පෙර සහරාන් හෂීම් සහ ඒ ප්‍රහාරයට සම්බන්ධ වුණ අය ගන්නා ලද දිවුරුමක සඳහන් කරනු ලැබුවාය කියලා එවකට ISIS සංවිධානයේ නායකයා විදියට පිළි අරගෙන හිටපු අල්බග්ඩාඩිගේ නම. ඔබට දැන් අපි මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ තියෙන පුළුල් තිරයේ ඒ අදාළ Video දර්ශනය දැනට එය C-149 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙනවා. එය දැන් වාදනය කරලා පෙන්වනවා. එහිදී ඔබ මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්නට ඕන ඔබේ සාක්ෂියේ සඳහන් වුණ ආකාරයට නබි නායකතුමාගේ පරම්පරාව ගැනත්, ඒ වගේම අල්බග්ඩාඩි ගැනත් කොයි වෙලාවෙද සඳහන් වෙන්නේ, කුමන ආකාරයකටද සඳහන් වෙන්නේ කියලා. ඒ වෙලාවල් මේ පරිගණකයේ දක්වන වෙලාවල් සඳහන් කරමින් ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න. Thank you.

(Video එක වාදනය කරනු ලබයි)

ප්‍ර : කුමන භාෂාවෙන්ද ඒ දිවුරුම ඔවුන් ප්‍රකාශ කරන්නේ සාක්ෂිකරු?

පි : අරාබි භාෂාවෙන්.

ප්‍ර : ඔබ අරාබි භාෂාව දන්නවද?

පි : යම්කිසි වචන ස්වල්පයක් දන්නවා.

ප්‍ර : එම වචන ඔබේ ඒ දැනුම ප්‍රමාණවත්ද දැන් වාදනය කරන ලද ඒ හඬ පටයේ තිබෙන කරුණු අරාබි භාෂාවෙන් තිබෙන කරුණු පිළිබඳව ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්නට?

FAIR COMMENT BY JEZEEM

පි : මම කලින් ප්‍රකාශ කරපු කාරණා සම්බන්ධයෙන් එතන තිබිච්ච වචනය පැහැදිලි කිරීම සඳහා මගේ අරාබි දැනුම ප්‍රමාණවත්.

ප්‍ර : එහෙම නම් අල්බග්ඩාඩි ගැන මොනවද කියන්නේ? මොන අවස්ථාවේදීද මේ හඩ පටයේ ඒ පිළිබඳව සඳහන් වෙන්නේ?

පි : 12 ඉඳලා 15 වෙනි තත්ත්පරය මැද වාගේ කාලය තුළ ඒ ගැන සඳහන් වෙනවා. සඳහන් වෙනකොට අල්බගාඩාඩිගේ නමත් එක්ක අල් කුරේෂි කියන නම කුරේෂි කියන එක පැහැදිලිව සඳහන් කරනවා සහරාන් විසින්.

ප්‍ර : ඔබ කිව්වා අල්කුරේෂි කියන්නේ නබි නායකතුමාගේ පරම්පරාව කියලා?

පි : පරම්පරාව කියලා.

ප්‍ර : ඒ කොයි වෙලාවටද ඒක සඳහන් වෙන්නේ?

පි : 14 වෙනි තත්ත්පරයේ වගේ ඒක සඳහන් වෙනවා.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ඒ Video එකේ සහරාන් විතරක් මුහුණ ආවරණය කරන්නේ නැතුව ඉන්නේ ඇයි? මුහුණ පෙන්වගෙන අනිත් කට්ටිය සේරම කවර් කරලා තියෙනනේ මොකද?

පි : මම හිතන විදියට එතන හිටපු අනිත් කට්ටිය ගැන බොහෝ සාමාන්‍ය වැසියෝ දැනගෙන හිටියේ නැහැ මෙයාලත් ISIS මතයේ ඉන්න අය නැත්නම් සම්බන්ධයි කියන එක ගැන ලොකු දැනුමක් තිබුණේ නැහැ. මට වුණත් මේ ප්‍රහාරයට පස්සේ තමයි එයාලා ගැන දැන ගත්තේ. ඒ වුණාට ඊට කලින්ම සහරාන් ගැන දන්නවා. මම හිතන විදියට සහරාන් ඊට කලින්ම ISIS එකට Support කරලා. ඒ මතය ප්‍රචාරය කරලා Video සෑහෙන්න ඉදිරිපත් කරලා තිබුණා. ඒ නිසා සහරාන්ට මම හිතුවේ නැහැ එයාට වුවමනාව තිබුණා කියලා මුහුණ වහගන්න ඕන කියලා. මොකද He was already exposed as one who preaching and supporting ISIS ideology.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඔබේ සාක්ෂියේදී ඔබ අද දින සඳහන් කරනු ලැබුවා ජමාතේ ඉස්ලාමිහි නායකයාව එක් වරක්, යම් අවස්ථාවකදී නායකයාව සිටි හජ්බුල් අක්බර් පිළිබඳව?

පි : ඔව්.

ප්‍ර : ඔහු ජමාතේ ඉස්ලාමි සංවිධානයේ නායකයානේ?

පි : ඔව්.

ප්‍ර : ඔබ පැහැදිලි කරපු ආකාරයට ඔහු ඔබලාට කියලා දුන්නේ පැළයක් හදලා දවස් දෙකකින් ඒක ගහක් වෙයි කියලා, ලොකු වෙයි කියලා බලාපොරොත්තු වෙන්න බැහැ. ඒකට කාලය ඕන.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඒ අනුව ජමාතේ ඉස්ලාම් ඔවුන්ගේ පාලනයක් ඇති කරන්න බලාපොරොත්තු වෙන්නේ කාලය අරගෙන කියලා නේද?

පි : ඔව්. හදිස්සියේ එහෙම කරන්න බැහැ කියලා තමාගේ පුතා කරපු දෙයක් උදාහරණයකට කියලා තමයි අපිට ඒක පැහැදිලි කළේ.

ප්‍ර : එතකොට නමුත් තවුහිද් ජමාත් ඊට වැඩිය වෙනස්?

පි : ඔව්. තවුහිද් ජමාත් ඊට වැඩිය වෙනස්.

ප්‍ර : ඔබ කියන ආකාරයට ක්ෂණිකව ප්‍රතිඵල ලබා දෙන්න තමයි ඔවුන් බලාපොරොත්තු වෙන්නේ?

පි : ඔව්. යම්කිසි විදියකට.

ප්‍ර : එතකොට ඔබ දන්නවද ඔය සහරාන් සහ හජ්බුල් අක්බර් අතර යම් සම්බන්ධයක් තිබුණද කියලා?

පි : මම දන්න තරමට කෙළින්ම සම්බන්ධයක් තිබුණේ නැහැ.

ප්‍ර : තිබුණේ නැහැ?

පි : තිබුණේ නැහැ. දෙන්නා අතර මත ගැටුමක් තමයි තිබුණේ. මම දන්න තරමට දැනට අත් අඩංගුවට පත්වෙලා ඉන්න මාවනැල්ලේ ගණේතැන්න ප්‍රදේශයේ රිස්වි කියන එක්කෙනාගේ මැදිහත්වීමෙන් සහරාන් එක සැරේ හජ්ජුල් අක්බර්ටත් දුරකථනයෙන් කථා කරලා තිබුණා විවාදයකට එන්න කියලා. ඕගොල්ලන් ආගම කරගෙන යන විදිය වැරදියි කියලා. ඒත් හජ්ජුල් අක්බර් මම දන්න තරමට, මම අහපු විදියට ඒකට එකඟ වුණේ නැහැ.

ප්‍ර : අපි හජ්බුල් අක්බර් ගැන කථා කරනවා නම් ඔහු ජමාතේ ඉස්ලාම් සංවිධානයේ සභාපතිවරයා විදියට කොපමණ කාලයක් කටයුතු කරලා තියෙනවද?

පි : 1994 ඉඳලා 2018 බෝම්බ, බුදු පිළිම කැඩීමේ සිද්ධියට මාස කිහිපයකට කලින් වෙනකම් මේ කටයුතු කරා. ඒගොල්ලන්ගේ වාර්ෂික මහා සමුළුව පැවැත්වුණේ නුවර පොල්ගොල්ලේ.

ප්‍ර : කොපමණ කාලයකට සැරයක්ද ඒ වාර්ෂික සමුළුව පවත්වන්නේ?

පි : අවුරුදු හතරකට සැරයක් වාගේ තමයි ඒගොල්ලන්ගේ වාර්ෂික සමුළුව පවත්වන්නේ කියලා මම හිතන්නේ. මම කවදාවත් සහභාගී වෙලා.....,

ප්‍ර : ඒ කියන්නේ 1990 ඉඳලද?

පි : 94 ඉඳලා 2018 වෙනකම් සභාපති වෙලා හිටියා. සැප්තැම්බර් 23 වෙනිදා 2018 පොල්ගොල්ලෙදී තමයි ඒගොල්ලන්ගේ මහා සමුළුව පැවැත්වුණේ. ඒ සමුළුවේ ඒගොල්ලෝ ව්‍යවස්ථාවේ යම්කිසි වෙනසක් ඇති කරා කියලා පෙන්වලා තමයි එයාව නායකත්වයෙන් එයා වෙන කෙනෙකුට භාර දෙන්නේ ඒ නායකත්වය.

ප්‍ර : ඒ කියන්නේ අවුරුදු 24 ක් දරන ලද නායකත්වයෙන් ඔහු 2018 සැප්තැම්බර් මාසයේ තිබ්බ මේ මහා සමුළුවේදී ව්‍යවස්ථාව වෙනස් කරගෙන එයින් ඉවත් වෙනවා ඔබ කියන්නේ?

FAIR COMMENT — BY JEZEEM

පි : ඔව්. 1953 පටන් ගත්ත සංවිධානයේ, එවැනි ව්‍යවස්ථාවේ නායකයෙකුට ඒ තනතුර දරන්න පුළුවන් උපරිම කාලයක් සඳහන් වෙලා තිබුණේ නැහැ. ඉස්ලාම් ආගමේ මතය අනුව කෙනෙකුට නායකත්වයට පත් වුණොත් එයාට ජීවිත කාලයේම නායකත්වයේ ඉන්න පුළුවන්. ඒක තමයි නබිතුමා පෙන්වලා තියෙන මඟපෙන්වීම. නබිතුමාගේ පිටි පස්සේ ආපු හැම නායකයෙක්ම තමන්ගේ මරණය වෙනකම් නායකත්වයේ සිටියා. මරණයෙන් පස්සේ තමයි අනෙක් නායකයා තෝරා ගන්නේ. ජමාතේ ඉස්ලාමිය එකෙත් ඒ Example තමයි ඒක තමයි පිළිපැදගෙන හිටියේ. හැබැයි 1953 ලංකාවේ පටන් ගත්ත සංවිධානය එක පාරම 2018 දී ව්‍යවස්ථාව වෙනස් කරලා සාර්ථකව නායකත්වය, ඒ සංවිධානය පැත්ත බලනකොට සාර්ථකව නායකත්වය දීපු නායකයාව එතනින් අයින් කරන්න නැත්නම් එතන වෙන කෙනෙකුට නායකත්වය දෙන්න ව්‍යවස්ථාවේ වෙනසක් ඇති කරා කියලා දෙයක් ගෙනාවා මාධ්‍යයට.

ප්‍ර : නමුත් ඔබ දන්නේ නැහැ ඇයි මොන හේතුවක් නිසාද එහෙම නායකත්වය වෙනස් වීමක් සිද්ධ වුණේ කියලා?

පි : මට වෙච්ච සිද්ධි හා මට ඒ වෙලාවේ දැනගෙන තිබුණ තොරතුරුත් එක්ක බලනකොට මට යම්කිසි විදියට හිතන්න පුළුවන් මේක එක්තරා Tactical Move එකක් හැටියට.

ප්‍ර : උපක්‍රමශීලී ඉවත්වීමක් හැටියට?

පි : උපක්‍රමශීලී ඉවත්වීමක් හැටියට.

ප්‍ර : ඇයි ඔබ එහෙම කියන්නේ?

පි : ඊට මාස කිහිපයකට නැත්නම් ඊට අවුරුද්දකට කලින් වාගේ කලින් එතුමාගේ සහෝදරයා වන ඊබ්‍රාහිම් මවුලවී රෂීඩ් මොහොමඩ් ඊබ්‍රාහිම් කියන එක්කෙනා .....,

ප්‍ර : මාවනැල්ලේ?

පි : මාවනැල්ලේ. ISIS මතවාදයට කෙළින්ම සම්බන්ධ වුණා. ඒ මතවාදය ප්‍රචාරය කරන්න පටන් ගත්තා. ඉතිං දෙපැත්තෙම ප්‍රකාශ තියෙනවා. ජමාතේ ඉස්ලාමිය සංවිධානය සම්බන්ධ කට්ටිය කියනවා එයාව අයින් කරා කියලා. ඒගොල්ලන්ගේ පැත්තෙන් කථාවක් තියෙනවා ඒගොල්ලන් අයින් වෙලා වෙන සංවිධානයක් හැදුවා කියලා. මම දන්නේ නැහැ ඇතුළේ මොකද වුණේ කියන එක. එතකොට ජමාතේ ඉස්ලාමිය දැනගෙන හිටියා යම්කිසි දෙයක් වෙන්න යනවා කියන එක. අනතුරක් වෙන්න යනවා කියන එක ඒගොල්ලන් දැනගෙන හිටියා. ඒක එහෙම දෙයක් වුණොත් සංවිධානය බේරා ගැනීමේ අරමුණින් තමයි එයාගේ වැඩිමහල් සහෝදරයක් වන හජ්ජුල් අක්බර් නායකත්වයෙන් අයින් වෙලා වෙන කෙනෙකුට නායකත්වය භාර දෙනවා. මේ සිද්ධිය සිද්ධ වෙලා මාස තුනක් යනකොට බුදු පිළිම කැඩීමේ සිද්ධිය මාවනැල්ලෙන් වාර්තා වෙන්න පටන් ගන්නවා.

ප්‍ර : වනාතවිල්ලුව?

පි : ඔව්. ඊට පස්සේ වනාතවිල්ලුව අවි ගබඩාව ඒත් එක්කම ....,

ප්‍ර : තස්ලිම්?

පි : තස්ලිම්ගේ වෙඩි ප්‍රහාරය. ඊට කලින් සිද්ධ වෙනවා පොලිස් නිලධාරී දෙන්නගේ ඝාතනය වවුනතිව්වල ඒ ඝාතනය. ඒ ඔක්කොම ඒ මාස කිහිපය ඇතුළත සිද්ධ වෙලා අන්තිමට බෝම්බ ප්‍රාහාරය දැක්වුවා. මරාගෙන මැරෙන ඉස්සරලා දවසේ ප්‍රහාරය දැක්වුවා. ඒ සිද්ධි ඔක්කොම Chain of events.

ප්‍ර : ඔය ජමාතේ ඉස්ලාම් සංවිධානයේ කලක් සාමාජිකයෙක් විදියට කටයුතු කිරීමේදී ඔබ ලැබූ ආභාෂය සහ පළපුරුද්දත්, ඒ ඔබට හැදෑරීම සඳහා යම් යම් අවස්ථාවල්වලදී ඉදිරිපත් වෙලා තියෙන කරුණුත් අනුසාරයෙන්ද ඔබ ඔය කියන උපකල්පනයට එන්නේ?

පි : ඔව්.

ප්‍ර : මම ඔබේ අවධානය දැන් යොමු කරනවා අර ඊබ්‍රාහිම් මවුලවී පිළිබඳව. ඊට ඉස්සරලා ඔබ හජ්ජුල් අක්බර්ව දැක්කහම අඳුරන්න පුළුවන්නේ ඔබට උගන්වලා තියෙනවා කියලා කිව්වනේ?

පි : ඔව්. පුළුවන්.

ප්‍ර : ඔහුගේ ඡායාරූපයක් දැක්කොත් ඔබට අඳුරන්න පුළුවන්ද?

පි : අනිවාර්යයෙන්ම පුළුවන් කියලා මම විශ්වාස කරනවා.

ප්‍ර : (ඡායාරූප දෙකක් පෙන්වා සිටිනවා ස්වාමීනි) මේ පෙන්වන ඡායාරූපයේ, පළවෙනියට පෙන්වන ඡායාරූපයේ ඉන්නේ කවුද?

පි : හජ්ජුල් අක්බර්.

ප්‍ර : මා දෙවනියට පෙන්වන ඡායාරූපයේ ඉන්නේ කවුද?

පි : එතුමාමයි. හජ්ජුල් අක්බර්.

ප්‍ර : ඔබ ඔහුව හොඳින් දන්න හින්දද ඒ හඳුනා ගැනීම කරන්නේ?

පි : ඔව්. පුද්ගලිකව ආශ්‍රය කරලා, දේශනාවලටත් සහභාගී වෙලා.

ස්වාමීනි සුදු පැහැති කමිසයක් ඇඳගෙන හජ්ජුල් අක්බර් සිටින බව දැක්වෙන ඡායාරූපය විදියට සාක්ෂිකරු හඳුනා ගත් ඒ ඡායාරූපය C-352(a) වශයෙනුත්, හජ්ජුල් අක්බර් සිටින බවට ඔහු විසින් හඳුනා ගනු ලැබූ පුටුවක අසුන් ගෙන කළු පැහැති උඩු කය ඇඳුමක් ඇඳගෙන සිටින ඒ ඡායාරූපය C-352(b) වශයෙනුත් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා

ප්‍ර : මා ඔබේ අවධානය යොමු කරනවා සාක්ෂිකරු ඊබ්‍රාහිම් මවුලවී කෙරෙහි. ඔබ කිව්වා ඔහු හජ්ජුල් අක්බර් මවුලවීගේ සහෝදරයා කියලා. එහෙම නම් ඒ දෙන්නාම ජමාතේ ඉස්ලාම් සංවිධානයේ සාමාජිකයෝ නෙමෙයිද?

පි : සාමාජිකයෝ.

ප්‍ර : එතකොට ඊබ්‍රාහිම් මවුලවීගේ ජමාතේ ඉස්ලාමයේ ඔහුට තිබුණු සාමාජිකත්වය යම් අවස්ථාවකදී අහෝසි වෙනවද, වුණාද කියලා ඔබ දන්නවාද?

පි : ස්ථිරව දන්නේ නැහැ. ඒ ගැන විවිධ මත පළ වෙලා තිබුණා. අභ්‍යන්තරව මොකද වුණේ කියන එක මම හරියට දන්නේ නැහැ.

ප්‍ර : ඔබ දන්නේ නැහැ?

FAIR COMMENT — BY JEZEEM —

පි : දන්නේ නැහැ.

ප්‍ර : නමුත් ඔබ කොයි වෙලාවක හරි දැන ගත්තද ජමාතේ ඉස්ලාමී සංවිධානයෙන් ඔහු බැහැර වෙලා වෙනත් සංවිධානයකට සම්බන්ධව කටයුතු කරන්න ගත්තා කියලා?

පි : ජමාතේ ඉස්ලාමීය සංවිධානයෙන් බැහැර වෙලා වෙනත් මතයක හිටියා කියන එකයි, ISIS එකට සම්බන්ධව නැත්නම් ISIS මතයේ ඉන්නවා කියන එක මම දැන ගත්තා. ඒ හැර .....,

ප්‍ර : ඒ කොයි කාලයේද?

පි : 2018 මුලදී හෝ 2017 අන්තිම කාලයේ වාගේ තමයි.

ප්‍ර : කොහොමද ඔබ දැන ගත්තේ?

පි : මගේ මාවනැල්ලේ යාළුවෝ සහ Face book වල ඒ වෙලාවේ තිබ්බ Post හරහා මම දැන ගත්තා.

ප්‍ර : එහෙම දැන ගත්තා?

පි : දැන ගත්තා.

ප්‍ර : එතකොට ඔහුට ඉන්න දරුවෝ ඔබ දන්නවද ඊබ්‍රාහිම් මවුලවීට ඉන්න?

පි : ලොකු පුතා මම පොඩි කාලේ දැකලා තියෙනවා. ඊට පස්සේ මේ බුදු පිළිම කැඩීමේ සිද්ධියට පස්සේ ඒ පුතාලා දෙන්නා ගැන මාධ්‍ය හරහා දැන ගත්තා.

ප්‍ර : ඒ අය සහරාන් හෂීම් සමඟ ළඟ සම්බන්ධකමක් තිබුණද නැද්ද කියන කරුණ පිළිබඳව ඔබට දැන ගන්න ලැබුණද?

පි : ඔව්. ඒ ගැනත් මාධ්‍ය හරහා මම දැන ගත්තා. ඒ කට්ටියව ...,

ප්‍ර : කාගෙන්ද?

පි : ඒකට සම්බන්ධ වෙලා වැඩ කරා කියන එකත් ඊට පස්සේ ඒ තොරතුර ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ නිලධාරීන් මගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ලබා දුන් තොරතුරු හරහාත් තහවුරු කරගන්න පුළුවන් වුණා.

ප්‍ර : ඔබ කිව්වා පසුගිය අවස්ථාවේ සාක්ෂි දෙන ගමන් ඉස්ලාම් ධර්මය අනුගමනය කරන්නේ නැති අයව ඝාතනය කිරීම සම්බන්ධයෙන් කුරානයේ සඳහන් වෙනවාය කියලා. එහෙම කිව්වද?

පි : මම පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සාක්ෂි දෙනකොට එහෙම දෙයක් කුරානයේ නැහැ කියලා තමයි කිව්වේ. මොකද කෙළින්ම එහෙම දෙයක් මම දැකලා තිබුණේ නැහැ. ඒ වුණාට ඊට පස්සේ මේ ගැන වැඩිපුර අධ්‍යයනය කරනකොට යූසුෆ් අල් කල්රාවි කියන ජාත්‍යන්තර දේශකයා නැත්නම් schotar Video එකක කියලා තිබුණා කුරානයේ වැකියක් උපුටා දක්වලා මේ වැකියේ පවසන්නේ ඉස්ලාම් ආගම අතහැරලා යන අයව මරලා දාන්න කියලා කියන එක බව එයා Video එකක කියවලා තිබුණා. ඒ Video එකත් මම මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා.

ප්‍ර : පසුගිය අවස්ථාවේදී?

පි : පසුගිය අවස්ථාවේදී.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට මා ඔබේ අවධානය යොමු කරන්න කැමතියි ඔබ මේ වනවිට විමර්ශන අංශය වෙත ඉදිරිපත් කොට තිබෙන ලේඛනයක් කෙරෙහි.

ප්‍ර : මොකක්ද ඒකෙන් කියන්නේ. ඔබ ඒ කියවන ලද පාඨයෙන් මොකද්ද එහි සඳහන් වෙන්නේ. ඔය හදීස් එක මොකේද තියෙන්නේ?

පි : සහීද් මුස්ලිම් හදීස් ග්‍රන්ථයේ 22 වන හදීස් හැටියටත්, පළවෙනි පොතේ 36 වෙනි හදීස් හැටියටත් මේක සඳහන් වෙලා තියෙනවා.

ස්වාමීනි එය C-353 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා

පි : අබ්දුල්ලා අබ්නෝමර් කියන නබිතුමාගේ සහායක Companion ඒ හදීස් එක කියනවා නබිතුමා පවසනවා තමා අල්ලාහ් දෙවියන් හැර වෙන දෙවියෙක් නැහැ කියලත්, ඒ අල්ලාහ් දෙවියාගේ දේවදූතයා තමා බවත් ප්‍රකාශ කර වන්දනාව හා සකාත් තමන්ගේ දේපලවලින් 2.5% එක දෙන එක අවුරුද්ද පුරා Tax එකක් ....,

ප්‍ර : ඒ කියන්නේ ඒක Tax එකක්ද? සකාත් කියන්නේ Tax එකක්?

පි : Tax එකක්. දෙනකම් දුන්නොත් හැර එයාලාගේ ලේ හා දේපල මගෙන් ආරක්ෂා කර ගන්න බැරි වෙයි. එහෙම කරොත් මගෙන් ආරක්ෂා කර ගන්නවා. Except when justified by the law, justified by the law mean ඒගොල්ලෝ වෙන අපරාධවලට සම්බන්ධ වුණොත්, මිනී මැරීමක් සිද්ධ කළොත් නැත්නම් හොරකමක් කළොත් ඒකට දඩුවමක් ලැබෙනවා. හැබැයි මේවා කළොත් මගෙන් වෙන හානියක් නැහැ කියන එක තමයි මෙතනින් ප්‍රකාශ කරන්නේ. I have been commanded to fight කියන එක මෙයා කියන්නේ Passive වලින් by the අල්ලාහ් කියන එක තමයි අල්ලාහ් දෙවියෝ මට මේ අණ කරලා තියෙනවා මට මේ දේ කරන්න කියන එක තමයි මේ හදීස් එකේ තේරුම වෙලා තියෙන්නේ.

ප්‍ර : ඔබට ගරු කොමිෂන් සභාවට වහාබ්වාදය කියන්නේ මොකද්ද කියන එක පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : ඉස්ලාම් ආගම නබිතුමා, මොහොමඩ් නබිතුමා නිර්මාණය කරලා, ඒකට මූලාශ්‍ර දෙකක් හඳුන්වලා දුන්නා කුරාන් හා හදීස්. හදීස් කියන එක මම කලින් පැහැදිලි කරා. නබිතුමාගේ කියවීම, කරපු දේවල් හා අනුමත කරපු දේවල්. මේ දෙක මත තමයි ඉස්ලාම් ආගම පිහිටවෙන්න ඕන. මේ දෙක උඩ තමයි ඉස්ලාම් ආගමේ Foundation එක තියෙන්න ඕන කියලා. හැබැයි කාලයත් එක්කම ඉස්ලාම ලෝකයේ අනෙක් රටවල්වල් අල්ලාගෙන ඒ රටවල්වල ව්‍යාප්ත වෙනකොට අරාබි භාෂාවේ තිබිච්ච දේවල්, පරිවර්තනය කිරීමේ තිබිච්ච අඩුපාඩු හින්දා ඉස්ලාම් ආගමේ යම්කිසි වෙනසක් වෙන්න පටන් ගත්තා. වෙන රටවල් අල්ලනකොට ඒ රටේ ඉන්න මිනිස්සුන්ගේ සංස්කෘතිය, ඒගොල්ලන්ගේ ආගම්වල තියෙන යම්කිසි කොටසක් ඉස්ලාම්

ආගම ඇතුළේ ඉස්ලාම් හැටියට ඒ ප්‍රාදේශීයවල හිටපු ජනතාව පිළිගන්න පටන් ගත්තා. එහෙම තියෙද්දී තමයි සෞදි අරාබියාවල දැනට අවුරුදු දෙසීයකට කලින් වාගේ එක්තරා දේශකයෙක් එනවා මොහොමඩ් ඉබ්නා අබ්දුල් වහාබ් කියලා. එයා තමයි ආයේ ඉස්ලාම් ආගම පුනර් නිර්මාණය කරන්න ඕන. නබිතුමා කරපු විදියටම අපි කරන්න ඕන. වෙන වෙන ආගම්වලින් ආපු අපිම හදාගත්ත දේවල් ආගමෙන් අයින් කරන්න ඕන කියන මතය ගේනවා ශුද්ධ වූ විදියට. එතකොට ඒ මතය අරන් යන කට්ටිය තමයි වහාබ්, වහාබිස්ට් ඒ මතයට තමයි වහාබ්වාදය කියලා කියන්නේ. ඇත්තටම වහාබ්වාදය කියන එක නබිතුමා කරපු දේ පොඩ්ඩක් It was polluted kind of pollution was there some mextures was there. He was purify it back to the way that it was during the time of prophet.

ප්‍ර : මේ සහරානුත් කියලා තිබ්බෙත් ඔය දේම නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒකෙන් අදහස් වෙනවද සහරාන් වහාබ්වාදියෙක් කියලා?

පි : ඔව්. මේ Definition එක අනුව සහරාන් වහාබ්වාදියෙක්.

ප්‍ර : සලෆිසම් කියන්නේ මොකක්ද?

පි : Salafismis also king of wahabis. The only difference is here I said Quaran and Hadees. මම කුරාන හා හදීස් විතරක් පිළිපදින්න ඕනෙයි කියලා සලෆිසම්වල තියෙන පොඩි වෙනස තමයි නබිතුමාගේ අනුගාමිකයෝ the companions ඒගොල්ලන්ගේ මතයත් අපි ගන්න පුළුවන්. එගොල්ලන්ගේ මතයෙන් පිටට අපිට යන්න බැහැ. ඒගොල්ලන්ගේ මතයත් එක්කම තමයි මේක අපි තේරුම් ගන්න ඕන කියන අදහසින් ඉන්න කට්ටිය තමයි සලෆිෂ්ලා. There is a very small difference between Salabis and the Thowheeds.

ප්‍ර : මොකක්ද ඒ දෙකේ තියෙන වෙනස?

පි : The understanding of the Salaba ඒ කියන්නේ නබිතුමාගේ අනුගාමිකයෝ ඒවා තේරුම් ගත්ත විදිය, ඒගොල්ලන් ආගමක් හැටියට බලනවා. වහාබ්වාදය තවුහිද් කට්ටිය ඒක පිළිගන්නේ නැහැ.

ප්‍ර : ඒක පිළිගන්නේ නැහැ?

පි : පිළිගන්නේ නැහැ.

ප්‍ර : ඒක තමයි දෙකේ තියෙන ගැටුම?

පි : ගැටුම.

ස්වාමීනි මීට ස්වල්ප වෙලාවකට පෙර ඉල්ලීමක් කරනු ලැබුවා C-353 ලෙසට ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා fight against the people till they accept Islam කියන ශීර්ෂය යටතේ තියෙන ලේඛනයක්. එය හදීස් 36 පළවෙනි පොතේ තියෙන බව තමයි සාක්ෂිකරු කිව්වේ. එම ලේඛනය දැනට

FAIR COMMENT BY JEZEEM

මා C-333 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කොට තිබෙන නිසා එම අවශ්‍යතාවය පැන නොනගින බව ඉතා ගෞරවයෙන් දන්වා සිටිනවා.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබ කියපු හැටියට වහාබිසම් කියන්නේ නබිතුමා ප්‍රකාශ කරපු දේවල් කාලයාගේ ඇවෑමෙන් Due to the fraction of time it has got polluted by the addition of other ideas of people and the Wahabisam is a process where that polluted parties taken out and Islam is explained as it was explained by Nabi at that pointof time?

පි : Yes.

ප්‍ර : එතකොට ඒ වගේ ක්‍රියාදාමයක වලංගුභාවය The validity of such a process under what circumstances is it accepted by people who are of that teaching? Why do they say that? Why do they accept that? It has got polluted and now wahabism is a process by where it is cleansed to what it was at that time.

පි : Even though the practices got polluted some other particles and some other mextures come into the practices. The holy scriptures according to the Islamic belief are protected. All the Muslims believe. Even not a single letter is changed in Quaran from the time phrophet until now. It is totally protected without a small change ever. Even a dot is not even change. It is same as it is revealed to prophet Mohomed. So every Muslim is believing this one. So that wahabism can be buill up on that one and again the Hadees books. Thare are various number of Hadees books. All this books are written within the first 300 years of the death of prohept Mohomed and all the books are proteded with a shine of narration and it is protected. Then this guy Mohomed Ib Abdul wahab, they call him Imam wahab brought his arguments from these books and he preached his ideology.

ප්‍ර : ඒ කියන්නේ ඔබ ප්‍රකාශ කරන හැටියට ඉස්ලාම් දහම අදහන තැනැත්තන් තවමත් විශ්වාස කරනවා කුරානයේ සහ හදීස් යන ග්‍රන්ථවල තියෙන්නේ නබිතුමා ප්‍රකාශ කරපු දේ ඒ අයුරින්ම සඳහන් කරලා තියෙනවා කියලා තවමත් පිළිගන්නවා?

පි : කුරානයේ එක අකුරක්වත්, ඩොට් එකක්වත් වෙනස් වෙලා නැහැ කියලා විශ්වාස කරන අතර, හදීස් කියන එක නබිතුමාගේ පස්සේ කාලයක ආපු අය විසින් ලියපු දේවල්. ඒගොල්ලන් නබිතුමාත්

FAIR COMMENT — BY JEZEEM

එක්ක ජීවත් වෙච්ච කට්ටියගෙන් අහලා ලියපු දේවල්. ඒවා ඒ කාලයේ ලියපු විදියටම අද වෙනකම් තියෙනවා ඒ පොත් ටික.

ප්‍ර : ඒ අනුව ඔය ඔබ කියන විදියට ඉස්ලාම් ආගම යම්කිසි අපිරිසිදුභාවයකට නැත්නම් pollution විදියකට පත්වෙලා තියෙන්නේ ලේඛනවල අඩංගු ඒ කියන්නේ කුරානයේ නැත්නම් හදීස් යන ග්‍රන්ථවල අඩංගු කරුණු නිසා නොවේ. එම කරුණුවලට කාලයක් තිස්සේ තැනැත්තන් විසින් දෙන ලද අර්ථකථන හේතුවෙන් කියලා කිව්වොත් ඒක නිවැරදිද?

පි : නැහැ. අර්ථකථන හේතු හින්දත් නෙවෙයි. ඒ අඩංගු තිබිච්ච කරුණු ගැන නොදැනුවත්කම හින්දා වෙනත් Cultures වෙනත් ආගම්වලින් යම්කිසි දේවල් එකතු කිරීම සඳහා. ඒකට මට උදාහරණයක් කියන්න පුළුවන්. 1990 ට කලින් ලංකාවේ මුස්ලිම් වෙඩින් එකකට ගියොත් ඒක සාමාන්‍යයෙන් හින්දු වෙඩින් එකකට සමානතාවයකින් තමයි තිබ්බේ. තාලි කියන සංකල්පය. Muslim wedding houses had this on. Even my parents married with a thali and I have seen a lot of weddings during my childhood they had the thali and the dowry was there. Every muslim marriage the dowry was one of the main things. But according to Islam it says otherwise. Bride have to pay to the groom. Sorry the groom have to pay to the bride. මනමාලයා තමයි මනමාලියට යම්කිසි මුදලක් හෝ යම්කිසි දේපලක් පරිත්‍යාග කරන්න ඕන. මනමාලියගෙන් කිසි දෙයක් ගන්න හොඳ නැහැ. එතකොට මේක තමයි හදීස් එකේ තියෙන්නේ. මේක හදීස් එකේ තියෙනවා කියන එක කියවුණාට පස්සේ දැන් මේ දවස්වල සිදුවෙන සියයට අනූවක් නැත්නම් අනූ නවයක් සොරි සියයට අනූවකට වැඩි වෙඩින්වල ඩව්රි කියන දේ දෑවැද්ද ගැන කථාවක් නැහැ. මහර් තමයි දෙන්නේ. මහර් කියන්නේ අරාබි වචනය. ඒකට වෙන වචනයකුත් නැහැ. මොකද ඉස්ලාම් ආගමේ හදුන්වලා දීපු වචනයක් ස්වාමි පුරුෂයා ගැන. මනමාලය විසින් මනමාලියට දෙන දේ. දැන් ඒ වගේම දැන් තාලි කියන දේ මුස්ලිම් විවාහවල නැහැ. ගොඩාක් විවාහවල ගැහැණු සහ පිරිමි වෙන වෙනම තමයි ආහාර හා අනිත් දේවල් ඔක්කොම සිද්ධ වෙන්නේ වෙනම Partitions. මේක උදාහරණයක්. ඒක අර්ථකථනයේ ඇති වෙච්ච වෙනසක් නෙමෙයි.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : සාක්ෂිකරු ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද දැන් ලංකාවේ සුෆි මුස්ලිම්වරුන් සහ ඔය තවුහිද් ජමාත් කියන මුස්ලිම්වරුන් අතරේ තියෙන ඔය වෙනස. ඒ කියන්නේ නබිතුමාගේ ජීවත් වෙච්ච

FAIR COMMENT BY JEZEEM

ක්‍රමය සහ ශුද්ධ වූ කුරානය අනුව ජීවත් නොවීම තමයිනේ මේ වෙනස?

පි : ඔව්.

ප්‍ර : ලංකාවේ සූෆි මුස්ලිම් සහ ඔය තවුහිද් ජමාත් කියන මුස්ලිම් කණ්ඩායම අතර?

පි : ඔව්.

ප්‍ර : එතකොට මැද පෙරදිග රටවල්වල දැන් ඉස්ලාම් ධර්මය උපත ලැබුව රටේත් ෂියා සහ සුන්නි මුස්ලිම්වරුන් අතර තියෙන්නෙත් ඔය හා සමානම භේදයක්ද?

පි : ෂියා සුන්නි භේදය කියන්නේ ඒක මීට වඩා ගොඩාක් වෙනස් එකක්. ඒක පිටිපස්සේ දේශපාලන පසුබිමත් තියෙනවා. ඒක History එක අපි බැලුවොත් ගොඩක් පැරණි එකක්. නබිතුමා මරණයට පත් වෙලා අවුරුදු කිහිපය ඇතුළත මේ ප්‍රශ්නය ඇති වෙනවා. ඒක නබිතුමාගේ පවුලේ දෙපිරිසක් අතර ඇති වෙච්ච ප්‍රශ්නයේ ප්‍රතිඵලයක් හැටියට ඇති වෙච්ච කණ්ඩායමක් තමයි දෙකට බෙදෙන්නේ.

ප්‍ර : නමුත් ෂියා මුස්ලිම්වරුනුත් ඔය පිළිම වන්දනා කිරීම සහ එවැනි දේවල් කරනවා කියන අදහසක් තිබෙනවද දැන්?

පි : ෂියා මුස්ලිම්වරුන් පිළිම වන්දනා කරන්නේ නැහැ. සොහොන වන්දනාවක්, වඳිනවා නෙමෙයි ඒක Visiting the graves, Builded graves. ඒ විතරයි තියෙන්නේ ෂියා අතර. ෂියා ගැන එතරම් ලොකු ගැඹුරු දැනීමක් මට නැහැ. මොකද ලංකාවෙනුත් අපිට ෂියාලා මුණ ගැහීමේ අවස්ථාවක් ඉතා අඩුයි.

ප්‍ර : එතකොට ඔය බුර්කාව අඳින එක පිළිබඳව ඔය අබුමුසාබ් අල්සර්කාවි ඔහුගේ බිරිඳට පවා මෙම බුර්කාව ඇන්දවීමට උත්සාහ ගත්ත වෙලාවේදී ඇයත් මෙය ප්‍රතික්ෂේප කරා කියන එක පිළිබඳව ඔබ අසා තිබෙනවද?

පි : ඒ ගැන මම අහලා නැහැ. නමුත් අරාබි ජනතාව අතරත් බුර්කාවට විරුද්ධත්වයක් තියෙනවා. ඒ කියන්නේ නිදහස් මතය දරන සෑහෙන පිරිසක් ඉන්නවා. හොඳ උදාහරණයක් තමයි, හිටපු ඊජිප්තු ජනාධිපතියෙක් හැටියට හිටපු කමල් අබ්දුල්නාසර්. එතුමාට ගිහිල්ලා මේ Ikhwanul Muslim, Muslim Brotherhood එකේ කට්ටිය ගිහිල්ලා කියනවා රටේ නීතියක් ගේන්න මුස්ලිම් ගැහැණු ළමයි බුර්කාව නැත්නම් ඔළුව වහන්න ඕන කියලා. එතකොට Video එකෙත් මම You tube එකෙත් දැක්කා එයා ඒක හෑල්ලුවට ලක් කරනවා. මට මේ හිනහ ගියා මේ වගේ කථාවක් කිව්වා කියලා කමල් අබ්දුල්නාසර්. එතකොට එතුමත් මුස්ලිම්. ඒ වුණාට භාර ගත්තේ නැහැ ඒ වගේ අදහසක්.

ප්‍ර : එතකොට ශ්‍රී ලංකාවේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයත් බුර්කාව අඳින එකට විරුද්ධයිද?

පි : සහරාන්ලාගේ මතය කොහොමද තිබ්බේ කියලා මට දන්නේ නැහැ. මම කමල් අබ්දුල්නාසර් ගැන කිව්වේ බුර්කාව ගැන

Provisional Copy
FAIR COMMENT BY JEZEEM

නෙමෙයි. ඔළුව වහන එක ගැන. ඒකටවත් එයා කැමති වුණේ නැහැ. මුහුණ වහන්න ඕනද නැද්ද කියන එක විතරයි මත භේදය තියෙන්නේ. ඒ හැර ඇගේ අනිත් සේරම වහන්න ඕන කියන එකෙන් කිසිම මත භේදයක් නැහැ. මුහුණ විතරයි මෙතන මුස්ලිම් අය අතර තියෙන මත දෙකක් තියෙන්නේ. ඔළුව වහන්න ඕන කියන එකවත්, අත වහන්න ඕන නැත්නම් දිග ඇඳුමක් අඳින්න ඕන කියන එකෙන් කිසිම මත භේදයක් නැහැ.

ප්‍ර : ශුද්ධ වූ කුරානයේ තියෙන්නෙත් මුහුණ ගැන නෙමෙයි. නමුත් හිස සහ දෙපතුල දක්වා වැසිය යුතුයි කියලද?

පි : හිසේ තියෙන දේ පල්ලෙහාට අඳින්න කියලා තියෙනවා. ඒකෙන් අදහස් කරන්නේ මොකක්ද කියන එක හදීස්වලින් තමයි තේරුම් ගන්න වෙන්නේ. ඒත් හදීස්වලට ගියත් සමහර හදීස්වල බලන්න පුළුවන් මුහුණ ඇරගත්ත ගැහැණු අය නබිතුමත් එක්ක කථා කරපු දේවලුත් තියෙනවා. මුහුණ වහ ගත්ත අය ගැනත් තියෙනවා. එතකොට එතනින් එක ස්ථීර මතයට එන්න පොඩි අපහසුතාවයක් තියෙනවා. ඉතිං ඒ වගේ තැන් ආගමෙත් තියෙනවා. ඉස්ලාම් ආගමේ තියෙනවා. ස්ථීරම අදහසට එන්න පුළුවන්ද, එන්න බැරි තැන් තියෙනවා.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : දැන් මැලේසියාව වගේ රටවල්වල සම්පූර්ණයෙන්ම මුහුණ ආවරණය කරන්නේ නැතුව හිජාබ්වලින් පමණක් යොදා ගන්නේ. ඒ ගැන මොකද කියන්නේ?

පි : ඒගොල්ලන් ඒගොල්ලන්ගේ සංස්කෘතික ඇඳුමත් එක්ක මේක පොඩ්ඩක් කලවම් කරලා ඒ වගේ දෙයක් හදාගෙන තියෙනවා කියලා තමයි මම හිතන්නේ. ඒගොල්ලන්ගේ ආගමික දැනුම කොයි පසුබිමක ඉඳලද ඒගොල්ලන් ලබා ගන්නේ කියන එක මම දන්නේ නැහැ.

ප්‍ර : ඒ කියන්නේ මුස්ලිම්වරු මම අහන්නේ. මුස්ලිම් ලබ්දිකයන් හිජාබ් එක පාවිච්චි කරනවද? මුස්ලිම් ආගමේ කට්ටිය හිජාබ් පළඳිනවා නේද?

පි : ඔව්. මැලේසියාවල හිජාබ් පළඳිනවා.

ප්‍ර : ඒ මොකද නිකාබ් අඳින්නේ නැතුව වැඩිපුර හිජාබ් අඳින්නේ?

පි : ඒ රටවල්වල මුස්ලිම් ආණ්ඩුව තියෙන හින්දා ආගම කටයුතු කොහොමද සිද්ධ වෙන්න ඕන කියන එක ගැන සමහර විට රජයෙන් නීතිරීති තියෙන්න පුළුවන්. කොයි වගේ දේවල්ද දේශනා කරන්න පුළුවන්, කොයි වගේ දේවල්ද දේශනා කරන්න බැහැ කියන නීති සමහර විට තියෙන්න පුළුවන්. මමත් සෞදි අරාබියාවේ රැකියාවට ගිහිල්ලා හිටපු කාලයේ මට මේ දැන ගන්න ලැබිච්ච එක තමයි සිකුරාදා දේශනය ගැන ඒ රජයෙන්ම Circular එකක් දෙනවා මේ මේ කරුණු තමයි මේ සිකුරාදා දේශනයේ කියන්නේ කියලා. එතකොට ඒකට පිටට කාටවත් යන්න

FAIR COMMENT BY JEZEEM

බැරිකමක් තියෙනවා කියලා මම අහලා තියෙනවා. එතකොට මැලේසියාවල ඒ වගේ දෙයක් තියෙනවා නම් එහෙත් මේ ලංකාව වගේ, ඉන්දියාව වගේ ඉස්ලාමිය සංවිධානවල් ක්‍රියාත්මක වන්නේ නැත්නම් ඒ ඔක්කොම එක විදියට වෙන්න ඉඩ තියෙනවා.

ප්‍ර : දැන් ලංකාවේ උලමාවරුන්ගේ සංගමය විසින් මේ බුර්කා කළු පාට අඳින්න තහනම් කරාද මෑතදී?

පි : තහනම් කරා කියලා නම් මම දන්නේ නැහැ. ඒත් කළු පාටම අඳින්න ඕන කියලා ආගමෙත් කියලා නැහැ.

ප්‍ර : වෙනත් පාටක් අඳින්න පුළුවන්?

පි : පුළුවන්. පිරිමි අයගේ අවධානය තමා හරහා ආකර්ෂණය කරන්නේ නැති විදියට අඳින්න පුළුවන් කියන එක තමයි තියෙන්නේ.

ප්‍ර : දැන් ඒ මොකක්ද අඳින්න ඕන කියලා ලංකාවේ මුස්ලිම් කාන්තාවන් ඇඳුම ගැන තීරණයක් කරන්නේ ලංකාවේ උලමාවරුන් විසින්ද?

පි : උලමාවරුන් සංගමය කියන්නේ ඇත්තටම The council of the clarities but with the time they have taken the control. ඒගොල්ලන් ඒ ගැන යම්කිසි වෙලාවල්වල කියලා තිබුණා. ඒ වුණාට ඒගොල්ලන් කියන්න කලින්ම ගම්වල ඉන්න මවුලවීලා ඒ ඉස්ලාමිය සංවිධානය ඒ මතය මුස්ලිම් අය අතරට පැතිරිලා ඉවරයි.

ප්‍ර : ඒගොල්ලන් තීරණයක් දුන්නොත් එය පිළිපැදිය යුතුද?

පි : නැහැ. අනිවාර්යය නැහැ.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඒ කියන්නේ ෆත්වා එකක් නිකුත් කරන්න පුළුවන් කෙනෙක් කියන එකක් විතරද පිළිපදින්න අවශ්‍ය වෙන්නේ?

පි : ෆත්වා එක නිකුත් කරත් ඒක හැමෝම පිළිපදින්න ඕන කියලා කිසිම බල කිරීමක් නැහැ.

ප්‍ර : පල්ලිවල ඉන්න ඕනම මවුලවී කෙනෙක්ට ෆත්වා එකක් නිකුත් කරන්න බැහැනේ?

පි : සාමාන්‍ය පොඩි පොඩි දේවල් ගැන සාමාන්‍ය මවුලවී කෙනෙක්ට ෆත්වා එකක් දෙන්න පුළුවන්. ලොකු දේවල් නම් ගොඩක් ඒ ආගම ගැන ඉගෙන ගත්ත අය තමයි ඒ වගේ දේවල් කථා කරන්නේ.

ප්‍ර : එතකොට ලංකාවේ නම් උලමාවරුන්ට ඒ සම්බන්ධයෙන් පුළුවන් නේද ෆත්වා නිකුත් කරන්න?

පි : ඔව්. ජමෙයිතු උලමා එකේ කට්ටිය ෆත්වා ගෘප් කියලා ඒගොල්ලන්ගේ වෙනම මණ්ඩලයකුත් තියෙනවා. ඒගොල්ලන් ඒ වගේ දේවල්වල ෆත්වා නිකුත් කරනවා.

ප්‍ර : සාක්ෂිකරු ඔබ දන්නවා ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයක්. ඒ වගේම ඔබ දන්නවා නේද ලංකාවේ අපරාධයක් සිදු කෙරුවොත්

ඒ අපරාධය කරන ලද පුද්ගලයාව නිසි අධිකරණ බලය තියෙන අධිකරණයක් ඉදිරියට ඉදිරිපත් කරලා අදාළ පනත යටතේ නඩු පැවරීමේ හැකියාව තියෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : දැන් ලංකාවේ තියෙන මේ ක්‍රමයට, සංවිධානාත්මක මේ නෛතික ක්‍රමය සමඟ ඉස්ලාම් ධර්මයේ යම් ඉගැන්වීම්වල ගැටීමක් ඇතිවන අවස්ථාවල් තියෙනවද? එකක් ප්‍රජාතන්ත්‍රවාදය. අනිත් එක අපරාධයක් කරන ලද පුද්ගලයින්ට දඬුවම් කරන එක?

පි : ක්‍රියාවෙන් නොතිබුණාට මතය හැටියට ගොඩාක් තැන් තියෙනවා. උදාහරණයක් ගත්තොත් ඉස්ලාම් ෂරියා නීතිය අනුව හැම වරදකටම වෙනම දඬුවම්, The Criminal Law එකක් තියෙනවා.

ප්‍ර : දැන් ශ්‍රී ලංකාව ගත්තොත් ශ්‍රී ලංකාවේ ෂරියා නීතිය ක්‍රියාත්මක වෙනවද?

පි : මුස්ලිම් විවාහ හා දික්කසාද නීති යටතේ ඒකේ කොටසක් අයිති වෙනවා. එහෙම නැතුව Criminal Law එකේ එහෙම දෙයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. හැබැයි ඒක උගන්වනවා. ඉස්ලාම් ආගම් පොත්වල හා පාසල් පොත්වල ඒක තියෙනවා.

ප්‍ර : මොනවද තියෙන්නේ?

පි : ඉස්ලාම් The Criminal Law එක ගැන. දෙන්න ඕන දඬුවම මොකක්ද කියන එක ගැන සඳහන් කරලා තියෙනවා.

ප්‍ර : එතකොට ෂරියා නීතිය නෛතිකව බල ගැන්වෙන රටවල් තියෙනවා නේද?

පි : නෛතිකව කියන වචනය.

ප්‍ර : ඒ කියන්නේ Legally that is enforced?

පි : ඔව්.

ප්‍ර : ඒකට උදාහරණ දෙන්න පුළුවන්ද ඔබට?

පි : සියයට සීයක් එහෙම වෙන රටවල් හොයන්න අමාරුයි. ඒක තමයි ඒ වගේ රාජ්‍යයක් තමයි අබුබක්කර් අල්බක්තාදී පිහිටවුවේ. ඒ හින්දා තමයි ඒකට ගොඩක් ඉල්ලුම තිබුණේ. දැන් ඒක අයින් කරලා බැලුවොත් අපිට බලන්න පුළුවන් එකම රට හැටියට ඉස්සරලාම Number One එකට එන්නේ සෞදි අරාබියා. ඒ වුණාට සෞදි අරාබියාව ගත්තොත් එතන පොඩි ප්‍රශ්නයක් එනවා. එහි තියෙන්නේ The Kingdom. කැලිෆට් නෙමෙයි.

ප්‍ර : රාජධානියක්?

පි : රාජධානියක්. එතකොට ඒක ඉස්ලාම් ආගමේ ෂරියා පාලන ක්‍රමයට එතන පටහැනිවීමක් ඇති වෙනවා. දැන් මක්දීසි ගත්තොත් මක්දීසියෙක් යම්කිසි කාලයක හදුන්වලා තිබුණා සෞදි රාජ පවුල ආගම් ද්‍රෝහියෙක් හරි ඒ වගේ වචනයකින් හඳුන්වලා තිබුණා. මේකට්ටිය රාජ්‍ය Kingdom එකක් හැටියට තියාගෙන ඉන්නවට. Ikhwanul Muslim in සංවිධානයත් මේකට දැඩි ලෙස විරුද්ධ වුණා. ඒ හින්දා සියයට සීයක් තියෙනවා කියලා රටක් හොයා ගන්න දැනට අමාරුයි.

Proof Copy
LAW COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මම ඔබෙන් ප්‍රශ්න කෙරුවේ ඉස්ලාම් ධර්මයේ සඳහන් කරනු ලබන අපරාධ සම්බන්ධයෙන් වූ යම් විධිවිධාන නැත්නම් ප්‍රතිපාදන නැත්නම් මඟපෙන්වීම් ලංකාවේ පැවැත්වෙන නෛතික රාමුව සමඟ ගැටීමක් තියෙනවද කියලා. Is there any conflict between the teaching, the principles, the guidance that's given in the religion of Islam with the well settled legal system in Sri Lanka?

පි : Off course. Yes.

ප්‍ර : එය එසේ නම් ඔබට ඒ සම්බන්ධයෙන් උදාහරණ දෙන්නට පුළුවන්ද ඒ මොන අවස්ථාවලදීද කියලා. ඔබ මේ පිළිබඳව කිසියම් මණ්ඩලයක හෝ යම් ස්ථානයකදී කරුණු දක්වලා තියෙනවාද?

පි : ඔව්. පාර්ලිමේන්තු තේරීම් කාරක කොමිසම ඉස්සරහා මම මේ ගැන සඳහන් කරලා තිබුණා මට සිද්ධ වෙච්ච සිද්ධියත් එක්ක සම්බන්ධ කරලා.

ප්‍ර : මොකද්ද ඔබට සිද්ධ වෙච්ච සිද්ධිය?

පි : සහරාන්ගේ ආධාරකරුවන් හතර දෙනා විසින් මම ආගම අතහැරපු හින්දා මාව මරා දමන්න ඕන කියලා ....,

ප්‍ර : ඒ පිළිබඳව ඔබ සඳහන් කෙරුවා. අපේ මේ කරුණු පැහැදිලි කරාට පස්සේ ඒ ස්ථානයට එමු?

පි : පැහැදිලියි.

ප්‍ර : දැන් ඒ අර ගැටීම් ඇතිවන ස්ථාන ඔබට පෙන්වලා දෙන්න පුළුවන්ද? ඉස්ලාම් ආගමේ උගන්වන දේවල්, එකිනෙකා ඉදිරියේ තියෙන නෛතික රාමුවත් එක්ක....?

පි : ඔව්. සෑහෙන්න තියෙනවා. ප්‍රජාතන්ත්‍රවාදයත් එක්ක අනිත් එක රටේ පවතින නීතියත් එක්ක එකට එක ගැටීම ස්ථාන ගොඩාක් ගැන අල්හසනාත් එකේ සඳහන් වෙච්ච ඒවා මම අරන් ඇවිල්ලා තියෙනවා. ඒවා තියෙනවා. ඒත් එක්කම දැන් පාසල් පොතේ, ඉස්ලාම් ආගම පාසල් පොතේ සඳහන් වෙච්ච ඒවා තියෙනවා. ඒ වගේම මම ඉස්ලාම් Criminal Law එක යටතේ දෙන දඬුවම ගැන හදීස්වල තියෙන දේ මේ කොමිසමටත් ඉදිරිපත් කරලා තිබුණා.

ප්‍ර : අපි එකින් එකක් ගැන දැන් පැහැදිලි කිරීම කරමුද?

පි : හරි.

ප්‍ර : එතකොට ශ්‍රී ලංකාවේ තියෙන මේ ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යය, Democracy. එය ඉස්ලාම් ධර්මය අනුව අනුමත කිරීමක් වෙනවද ඔබ දන්න ආකාරයට, ඔබ ඉගෙන ගෙන තියෙන ආකාරයට?

පි : නැහැ.

ප්‍ර : ඇයි ඔබ නැහැ කියලා කියන්නේ?

පි : ඉස්ලාම් ආගමේ හැටියට ආණ්ඩු ක්‍රමය නැත්නම් පාලන ක්‍රමය වෙන්න ඕන කිලෝත්, කැලිෆට්. ප්‍රජාතන්ත්‍රවාදය කියන එක ඉස්ලාම් ආගමේ අනුමත කරපු එකක් නෙමෙයි. සමහර

FAIR COMMENT — BY JEZEEM —

දේශකයෝ පවා කියලා තිබුණා ඡන්දය දාන එක ලොකු පවක් කියලා.

ප්‍ර : ලොකු පවක් කියලා?

පි : පවක් කියලා.

ප්‍ර : ඒ කියන්නේ දේශන පවත්වනවාද ඉස්ලාම් භක්තිකයින්ට ප්‍රජාතන්ත්‍රවාදී රජයක් වූ ශ්‍රී ලංකාවේ ඡන්දය මුස්ලිම් ජාතිකයින් විසින් භාවිතා නොකළ යුතුයි කියලා?

පි : ඔව්. එක්කෝ ගිහිල්ලා අවලංගු කරලා එන්න. නැත්නම් යන්නම එපා කියන එක මතය මේවා කරලා තිබුණා. තවුහිද් ජමාත් එකේ පිරිසක් ඒ මතයේ ඉන්නවා. ඒ වගේම මම කලින් සඳහන් කරා එහියාස් ඉල්මි කියන පුද්ගලයා ගැන. එයත් ඒ මතයේමයි ඉන්නේ. ඡන්දය භාවිතා කරන්න හොඳ නැහැ කියන එක විතරක් නෙමෙයි පාසල්වලට පවා රජයේ පාසල්වලට පවා ඇතුල් වෙන්න හොඳ නැහැ කියන මතයේ ඉන්න අයත් ඉන්නවා. එහියාස් ඉල්මි කියන කෙනා එක්කෙනෙක්.

ප්‍ර : එතකොට ජනතාව විසින් ජනතාව වෙනුවෙන් තෝරා ගනු ලබන රජයක් යටතේ ජීවත්වීම සම්බන්ධයෙන් මොකක්ද ඉස්ලාම් භක්තිකයින් විසින් දරනු ලබන මතය කියලා ඔබට කියන්නට පුළුවන්ද? සුළුතරයක් හෝ බහුතරයක් විසින්?

පි : ගොඩාක් අය ඒ කියන්නේ බහුතරය ඒ ගැන ගැඹුරට හිතන්නේ නැතුව ඉන්න පුළුවන්. සුළුතරයක් ඒ ගැන හිතනවා. ඉස්ලාම් ආගම හඳුන්වන්නේ ඉස්ලාම් පාලනය හා ඉස්ලාම් නොවන පාලනය කියන එක විතරයි. ඉස්ලාම් නොවන පාලනය ....,

ප්‍ර : පැහැදිලි වෙන් කිරීමක් තිබෙනවා?

පි : තිබෙනවා.

ප්‍ර : ඉස්ලාම් පාලනය එක පැත්තක තිබෙනවා. ඊට ප්‍රති විරුද්ධ පැත්තේ තියෙන්නේ ඉස්ලාම් නොවන පාලනය?

පි : නොවන පාලනය. ඒක ....,

ප්‍ර : එතකොට ඉස්ලාම් නොවන පාලනය කියලා මොකක්ද අදහස් කරන්නේ?

පි : ඒක ප්‍රජාතන්ත්‍රවාදී වෙන්න පුළුවන්. Dictator කෙනෙක්ගේ පාලනයක් වෙන්න පුළුවන්. හමුදා පාලන ක්‍රමයක් වෙන්න පුළුවන්. Kingdom එකක් වෙන්න පුළුවන්. ඒ හැම එකම අඩංගු වෙන්නේ ඉස්ලාම් නොවන පාලන ක්‍රමයට.

ප්‍ර : එතකොට දැන් ශ්‍රී ලංකාවේ ඉන්නවා මේක බහුවාර්ගික සහ බහු ආගමික රටක් නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් ඒ වගේ රටක ජීවත්වන ඉස්ලාම් ජාතිකයින් කොහොමද ඔය ඉස්ලාම් ආගමේ ඒ කරන මහපෙන්වීම අනුව ඉස්ලාම් නොවන රාජ්‍යයක ජීවත්වීම සම්බන්ධව ඔය කියන සංකල්පයත් එක්ක ගැටෙනකොට ඒ සම්බන්ධයෙන් ප්‍රතික්‍රියා කරන්නේ නැත්නම් ප්‍රතිචාර දක්වන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : දැනට මොකුත් කර ගන්න විදියක් නැහැ කියන එක තමයි ඒගොල්ලන්ගේ මතය. ඉස්ලාමිය රාජ්‍යයක් පිහිටු ....,

ප්‍ර : ඒ කියන්නේ ඒගොල්ලෝ කැමැත්තෙන් නෙමෙයිද මේ වගේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජීවත් වෙන්නේ. ඔවුන් හිතන්නේ ඉස්ලාම් රාජ්‍යයක් පමණක් තිබිය යුතුයි කියලද. එහෙම හිතනවා නම් ඒ ඉස්ලාම් මුස්ලිම් ජාතිකයින්ගෙන් කොපමණ ප්‍රමාණයක් ප්‍රතිශතයක්ද ඒ මතය දරන්නේ කියලා ඔබ කියන්න දන්නවද?

පි : හැම මුස්ලිම් එක්කෙනාම හිතන විදිය නැත්නම් හිතන දේ මේක තමයි කියලා මට ඉදිරිපත් කරන්න අමාරුයි. මොකද පුද්ගලයෝ හැටියට එක එක්කෙනා වෙනස්. මත්පැන් භාවිතා කරන මුස්ලිම් අය පවා ඉන්නවා. ඒ හින්දා ඒක හැබැයි ඉස්ලාම් ආගමේ මතය නම් මේක යටතේ ජීවත් වෙන්න හොඳ නැහැ කියන එක තමයි ඉස්ලාම් පාලනයක් ඇති වෙච්ච ගමන්ම ඒකට යන්න ඕන හිජ්රත්. ඒ කියන්නේ තමා තියෙන ප්‍රදේශ අත ඇරලා යන්න ඕන කියන එක තමයි ඉස්ලාම් ආගමේ මතය.

ප්‍ර : හිජ්රත් කරනවා කියලා කියන්නේ ඉස්ලාම් නොවන දේශයක ඉඳලා ඉස්ලාම් දේශයකට යාමද?

පි : යාම. තමාගේ හැමදේම අත ඇරලා ඉස්ලාම් තියෙන දේශයකට යාම.

ප්‍ර : එතකොට අර ISIS සංවිධානයට සම්බන්ධ වෙලා මිය ගිය නිලාම්ලා හිජරත් කරපු අයද?

පි : නිලාම් ගැන මම පෞද්ගලිකව දන්නේ නැහැ. හැබැයි ....,

ප්‍ර : I'm based on the explanation you gave on the coord Hijrat.

පි : හිජ්රත් Yes.

ප්‍ර : Because Sri Lanka is not a Muslim Contry.

පි : Not a Muslim country yes.

ප්‍ර : ශ්‍රී ලංකාව මුස්ලිම් රටක් නොවේ නම් එහෙම නම් මුස්ලිම් නොවන රටක් වූ ශ්‍රී ලංකාවේ ඉඳලා නිලාම් ISIS සංවිධානය පිහිටවලා තිබෙන සිරියාවට යනකොට ඒක මුස්ලිම් රාජ්‍යයක් විදියට නේද පිළිගන්නේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒක ඔය හිජ්රත් කියන ඒ ක්‍රියාවට අදාළ වෙනවද? ඒකත් එක්ක ගැළපෙනවද?

පි : ගැළපෙනවා. මොකද එයා සටන් කිරීමට විතරක් ගියේ නැහැ. සටන් කිරීමට යනවා නම් එයා විතරක් යන්නේ. තමාගේ දරුවෝ, පවුල ඔක්කොම එක්කන් ගියා කියන්නේ, අම්මා තාත්තා, ඒ කියන්නේ පවුලේ හැම උදවියම එක්කන් ගියා කියන්නේ ඒ මතය හින්දා තමයි එක්කන් ගියේ. ඒ කියන්නේ හිජ්රත් කියන මතය හින්දා.

ප්‍ර : එතකොට ඒ දැන් ඔබෙන් මම ප්‍රශ්න කෙරුවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ඇතැම් අය දරන මතය පිළිබඳව. එහෙම නම් අපරාධ නීතිය යටතේ පනවනු ලබන දඩුවම්වලට ඔවුන් යටත් විය යුතුද

FAIR COMMENT BY JEZEEM

නැද්ද? නැත්නම් මීට වඩා වෙනස් මතයක් ඔවුන් විසින් දරනවාද කියන කරුණ පිළිබඳව ඔබට යම් පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට?

පි : ඉස්ලාම් නොවන රාජ්‍යයක පළවන ....,

ප්‍ර : දැන් අපට මෙතන ප්‍රශ්නය තියෙන්නේ ශ්‍රී ලංකාවෙනේ?

පි : ඔව්. ශ්‍රී ලංකාවේ.

ප්‍ර : ශ්‍රී ලංකාවේ තියෙන අපරාධ නීතියට අනුගත වෙලා ඒ දෙනු ලබන දඩුවමක් පිළිගැනීම එම අන්තවාදීන් විසින් පිළිගනු ලබනවද?

පි : It is දෙමළෙන් කියනවා නම් නිර්පන්දම්. There is no other option.

ප්‍ර : වෙනත් විකල්පයක් නැහැ?

පි : විකල්පයක් නැති හින්දා ඒකට යටත් වෙලා ඉන්න වෙනවා කියන එක තමයි ඒගොල්ලන් කියන්නේ. දැන් ඒකට අපි හදවතින් යටත් වෙන්න හොඳ නැහැ. දැන් අපිට දැනට වෙන විකල්පයක් නැහැ. Until the something we get the අපිට මේ අපේ රාජ්‍යයක් පිහිටු වෙනකම් මෙහෙම ඉන්න වෙනවා ඒ කාලයට. Temporary එහෙම ඉන්න වෙනවා කියන එක තමයි ඒ මතය.

ප්‍ර : එතකොට දැන් මේ ළමයින්ට ලබාදෙනු ලබන අධ්‍යාපනයේදී ඔය යම් යම් අපරාධ සම්බන්ධයෙන් දෙනු ලබන දඩුවම් පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමක් ඉස්ලාම් ධර්මය උගන්වන අවස්ථාවේදී සිද්ධ වෙනවද?

පි : ඔව්. අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා. අපිට වෙනම නීතියක් තියෙනවා. අපි මේකේ නෙමෙයි. අපි එකක් කියන එක නිතරම මතක් කිරීමක් හැටියට ඒක සිද්ධ වෙනවා. එතකොට ඒ දරුවා පවා දන්නවා අපිට වෙන විකල්පයක් නැති හින්දා තමයි අපි ඉන්නේ. අපි යටත් වෙලා ඉන්න ඕන මේකට නෙමෙයි. මේක නෙමෙයි අපේ දෙවියෝ. අපිට පනවපු නීතිය කියන මතය.

ප්‍ර : ඒකෙන් ඉවත් වෙන්න ඕන කියන මතය එතකොට ළමයාගේ හිතේ ඇති වෙනවා?

පි : හිතේ ඇති වෙනවා ඔව්.

ප්‍ර : ඉතිං කොහොමද ළමයින්ට ඔය පිළිබඳව දැනුවත් කරන්නේ. මොන මාධ්‍යයෙන්ද? මොන වයසේ ඉඳලද?

පි : විවිධ ආකාරයෙන් ඒක සිද්ධ වෙනවා. පොඩි කාලයේ ඉඳලම පොඩි පොඩි දේවල් දෙනවා. ඊට පස්සේ මද්‍රසාවල. මද්‍රසා කියන්නේ නේවාසිකව තියෙන මද්‍රසා නෙමෙයි. හැම පාසලට යන, දහම් පාසල් වාගේම තියෙන මද්‍රසා තියෙනවනේ. පාසල් ගිහිල්ලා ඇවිල්ලා හවසට ඒවා වල පොඩි පොඩි නීති කියලා දෙනවා. දැන් මගේ සහෝදරීගේ පුතා. එයාට වයස හතක් විතර ඇති. එයාට ඒ මද්‍රසා එකේ කියලා දීලා තියෙනවා අපි කන්න ඕන හලාල් කෑම විතරයි කියලා. එතකොට මම ගිහිල්ලා චොක්ලට් එක දෙනකොට ඒ ළමයා මගෙන් අහනවා මාමේ මේක හලාල්ද කියලා. ඉතිං ඒ වගේ අර ....,

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : හලාල් කියන්නේ මොකද්ද?

පි : ඉස්ලාම් ආගමේ පෝෂණයට සුදුසුයි කියලා තීරණය කරපු දේ ඒක. හරාම් කියලා එකයි, හලාල් කියලා දෙකක් තියෙනවා.

ප්‍ර : හරාම් කියන්නේ මොකක්ද?

පි : හරාම් කියන්නේ පෝෂණය කරන්න තහනම් කරපු දේ.

ප්‍ර : ඔය දෙකටම උදාහරණ දෙන්න පුළුවන්ද?

පි : දෙවිදියකට උදාහරණ දෙන්න පුළුවන්. එක උදාහරණයක් දෙනවා නම් ඌරු මස්. ඒක කොහොම වුණත් හරාම්.

ප්‍ර : ඇයි ඒ?

පි : ආගමේම ඒක හරාම් කරලා තියෙනවා.

ප්‍ර : Why? So you don't question? ඔබ ප්‍රශ්න කරන්නේ නැහැ. ආගමෙන් එපා කියලා තියෙනවා නම් ඔබ ප්‍රශ්න කරන්නේ නැහැ. ඒකද ඔබ කියන්නේ?

පි : That is the ඒක තමයි හරි Understanding එක. හැබැයි to justify it ඒක සාධාරණීකරණය කිරීම සඳහා එක එක්කෙනා එක එක හේතු ඉදිරිපත් කරනවා. මේකේ පණුවෝ තියෙනවා, අපිරිසිදුයි කියන තර්කය. ඒ වුණාට ඒ තර්කය කොහේවත් ආගමේ සඳහන් වෙලා නැහැ. ආගමේ එපා කිව්වොත් එපා කියලා තමයි කියලා තියෙන්නේ. ඒකට මේ තර්කය හරි යන්නේ නැහැ කියන එකට තමයි මම දෙවනි උදාහරණයට එන්නේ. දැන් හරක් මස් නැත්නම් කුකුල් මස් තියෙනවා. කුකුලෝ තියෙනවා. දැන් කුකුල් මස් හරාම් වෙන්නත් පුළුවන්, හලාල් වෙන්නත් පුළුවන්. ඒකේ තියෙන්නේ පොඩි වෙනසක් විතරයි.

ප්‍ර : ඒ කොහොමද?

පි : මොකද මුස්ලිම් නොවන එක්කෙනෙක් මරපු කුකුල් මස් හරාම්. ඒ කුකුළාම මුස්ලිම් එක්කෙනෙක් බිස් මිල්ලාහි අල්ලාහු අක්බර් කියන අරාබි වාක්‍යය හතර කියලා කැපුවොත් ඒක හලාල්. ඒ වාක්‍යය කියන්නේ නැතුව මුස්ලිම් එක්කෙනෙක් වෙන මොනවා හරි දෙයක්, සිංදුවක් කියාගෙන කැපුවොත් ඒකත් හරාම්. ඒ කියන්නේ අරාබි වාක්‍යය හතරෙන් ඒ කුකුළා නැත්නම් කිලෝ දෙසීයක් තියෙන ගවයාගේ හලාල් හරාම් වෙනස් වෙනවා. ඒක ඌරෙක් වෙන්න ඕන නැහැ.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : සාක්ෂිකරු, ඔබ දැන් සඳහන් කරානේ හිජ්රත් කරන්නේ මුස්ලිම් රාජ්‍යයකට සංක්‍රමණය වීම සහ ඔය ශ්‍රී ලංකාවේ නිලාම්ලා ඒ සඳහා තමයි ගියේ කියලා?

පි : ප්‍රශ්නයේ මුල් කොටස.

ප්‍ර : හිජරත් කියන්නේ මුස්ලිම් නොවන ප්‍රදේශයක හෝ රාජ්‍යයක සිට මුස්ලිම් ප්‍රදේශයකට හෝ රාජ්‍යයකට සංක්‍රමණය වීම කියලා?

පි : ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : එතකොට සිරියාවට ගියේ ඔහු මුස්ලිම් රාජ්‍යයේ පදිංචිය සඳහාද?

පි : ඔව්. ඒකට උදාහරණයක් තමයි අර අපි හැමෝම දන්නවා ඇති එංගලන්තයේ ඉඳලා තරුණ ගැහැණු ළමයි තුන් දෙනෙක් ගිහිල්ලා ඒ සිරියාවල ඒගොල්ලන් සටන් කරන්න ගියේ නැහැ. දැන් ඒකේ එක්කෙනෙක් බේරිලා තියෙනවා. එයාට පුරවැසිභාවය දෙනවද නැද්ද කියන එක තවම ඒගොල්ලන් Englandවල කථා බහට ලක් වෙලා තියෙන මාතෘකාවක්. මොනවා හරි බේගම් කියලා එක්කෙනෙක්. ඒ තුන් දෙනාම ගියේත් එහේ ගිහිල්ලා එහේ ඉන්න සටන්කරුවන්ව කසාද බැඳලා එහේ ජීවත් වෙන්න.

ප්‍ර : එතකොට ශුද්ධ වූ කුරානයේ අර Holy war ගැන සඳහන් වෙනකොට හිජ්රත් කියලා කියන්නේ යුද්ධය සඳහා ප්‍රදේශයකට සංක්‍රමණය වීමද?

පි : යුද්ධය හින්දා නෙමෙයි ජීවත්වීම සඳහා.

ප්‍ර : එතකොට දැන් ඔය 2014 ජූනි මාසේ කැලිෆට් එක Declare කරාට පස්සේ ඇමෙරිකාව හා තවත් රටවල් එකතු වෙලා ප්‍රහාරයක් කරලා ඒ වෙලාවේදීද මේ මිනිස්සුන්ට ආරාධනය ලැබුණේ ඇවිල්ලා හිජ්රත් කරන්න, යුද්ධයට ජිහාද්වරුන් හැටියට සංවිධානයට බැඳෙන්න කියලා. එහෙමද මේගොල්ලෝ හිජ්රත් කළේ?

පි : ඒ Sequence එක මට හරියට මතක නැහැ. කොයි වෙලාවෙද, කොයි පසුබිමකද ඒ Call එකක් ආවේ කියලා. ඒ වුණාට නබිතුමා කියලා තියෙනවා ඉස්ලාමිය රාජ්‍යයක් පිහිටවුණොත් ඒක හැම මුස්ලිම් එක්කෙනාටම විවෘතයි කියලා. ඕනම මුස්ලිම් එක්කෙනෙක් ආවොත් එයාගේ Visa තත්ත්වය ඒවා මොකුත් බලන්නේ නැතුව එයාව බාර ගන්නවා.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු දැන් ඔය සටන්කාමීන් සිරියාවට ගියහම ඔවුන්ගේ පවුල් සමඟ යන්නේ යම් සටන්කාමියෙක් යුද්ධ කරලා, සටන් කරලා මිය ගියොත් ඔහුගේ පවුලේ අයටයි, ඥාතීන්ට සේරටම යම් යම් දීමනාත්, යම් යම් පහසුකම් ලබාදෙන බවට ISIS පොරොන්දු වෙලා තියෙනවද?

පි : මම දන්න තරමට එහෙම පොරොන්දුවක් වෙලා නැහැ. ඒක නැහැ කියලා කියන්නත් අපිට පුළුවන්. මොකද ISIS පාලන ප්‍රදේශය වෙලා තිබුණු සිරියාව හා ඉරාක්වලට වඩා ඉතා සුඛෝපභෝගී ජීවිතයක් තියෙන රටවල්වල ඉඳලා පවා මිනිස්සු ගිහිල්ලා තියෙනවා. එතකොට ඒ තර්කය Weak.

ප්‍ර : එතකොට තව ප්‍රශ්නයක් තියෙනවා මගේ අපරාධ නීතිය ගැන කථා කළ නිසා අහන්නේ. දැන් තමන්ට බුර්කාව සහ නිකාබ් පළඳගත් එක්කෙනෙක් යම් පුද්ගලයෙකුට පහර දුන්නොත් හරි යම් අපරාධයක් කළොත් තමන්ලා හඳුන ගන්නේ කොහොමද?

පි : ඉස්ලාම් ආගමේ හැටියටද?

ප්‍ර : නැහැ නැහැ. සාමාන්‍යයෙන් හඳුන ගන්නේ කොහොමද? ඉස්ලාම් ආගම හැටියට එක පැත්තකින්. අනිත් පැත්තෙන් සාමාන්‍ය පුද්ගලයෙක් වශයෙන් හඳුන ගන්නේ කොහොමද?

පි : ඒ අපහසුතාවය තියෙනවා.

ප්‍ර : පිළිගන්නවද?

පි : ඔව්. පිළිගන්නවා. ආරක්ෂාවට ඒක තර්ජනයක් වෙලා තියෙනවා.

ප්‍ර : ලංකාවේ අපරාධ නීතිය අනුව නඩුවකදී යම් පහරදීමක් හෝ වරදක් කළොත් ඒ පුද්ගලයා හඳුනා ගැනීම පිළිබඳ සාක්ෂි අධිකරණයේදී වැදගත් සාක්ෂියක් වෙන බව තමන් පිළිගන්නවද?

පි : ඔව්.

ප්‍ර : දැන් අර සම්පූර්ණයෙන්ම ආවරණය කරගත් පුද්ගලයෙකු යම් අපරාධයක් කළහොත් එම සාක්ෂිය ඒ අපරාධයට ලක් වූ පුද්ගලයාට යම් අවාසියක් සිදු විය හැකිද?

පි : ඔව්.

ප්‍ර : තමන්ලා කොහොමද හඳුනා ගන්නේ වෙන රටකට යනකොට Pass port එක බලලා මෙයාද යන්නේ කියලා?

පි : ඒකෙත් මේ මුහුණ වහගෙන ඉන්නවා නම් ඒකත් අපහසු කාරණයක්.

ප්‍ර : හඳුනා ගැනීමේ ක්‍රමයක් තියෙනවද ලංකාවේ මුහුණ එහෙම බලනවද එතකොට මුහුණ පෙන්වන්න කියනවද?

පි : ඉස්ලාම් ආගමේ එහෙම ක්‍රමයක් නැහැ.

ප්‍ර : නැහැ?

පි : නැහැ.

ප්‍ර : ප්‍රායෝගිකව එහෙම ලංකාවෙන් යනකොට මුස්ලිම් කාන්තාවන්ට හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුට එහෙම ආවරණය කරගෙන ගියොත් නිලධාරීන් විසින් කියනවද ඔබගේ මේ ඡායාරූපයේ යන පුද්ගලයාද යන්නේ කියලා බලන්න මුහුණ ආවරණය ඉවත් කර පෙන්වන්න කියලා?

පි : මම ඒ ගැන හරියට දන්නේ නැහැ. කොයි විදියටද ඒක ආගමන හා විගමන දෙපාර්තමේන්තුව කොයි විදියටද ඒක ....,

ප්‍ර : CCTV කැමරාවලත් වැටෙන්නේ මුහුණ ආවරණය කරගෙනයි වැටෙන්නේ?

පි : ඔව්.

ප්‍ර : ඕනෑම පුද්ගලයෙකුට, පිරිමියෙකුට හෝ කාන්තාවකට මෙම ආවරණය කළ ඇඳුම් ඇඳගෙන පිටරට යාමට හැකියාවක් ලැබෙන්න පුළුවන්ද?

පි : ඒක ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අන්තිම Checking එක කොහොමද කරන්නේ කියලා තමයි තියෙන්නේ. ඒ වුණාට රට ඇතුළේ එවැනි දේවල් කරන්න පුළුවන්.

ප්‍ර : නැහැ. පිටවෙනකොටත් පුළුවන්නේ. හඳුනා ගැනීමේ අපහසුතාවයක් ප්‍රශ්නයක් ඇති වෙනවනේ?

Project Sekeriya Copy

FAIR COMMENT — BY JEZEEM —

පි : ඇති වුණා නම් .....,

ප්‍ර : ඒක තමන්ට විස්තර කරන්න බැහැ කොහොමද කියලා ඒක ඒ අවස්ථාවකදී තමන්ට අත්දැකීම් නැද්ද ....?

පි : නැහැ මට අත්දැකීම් නැහැ. අපේ ගෙදර වුණත් කවුරුත් මුහුණ වහන කවුරුත් නැති හින්දා මට ඒ වගේ අත්දැකීමක් නැහැ.

ප්‍ර : බුර්කා, නිකාබ් ඇඳලා කාන්තාවන් රිය පැදවීමත් කරනවද?

පි : ඉස්ලාමිය රාජ්‍යයක කාන්තා ....,

ප්‍ර : අරාබියේ දැන් දීලා තියෙනවා කාන්තාවන්ට?

පි : ඔව්. ඒ රටවල්වල කරනවා මම හිතන විදියට.

ප්‍ර : ලංකාවේ?

පි : ලංකාවේ මම දැකලා නැහැ.

ප්‍ර : එහෙම තත්ත්වයක් ඇති වුවොත් යම් අනතුරක් සිදු වූ අවස්ථාවකදී අනතුර සිදු කළ පුද්ගලයා හඳුනා ගැනීම පිළිබඳව ගැටළුවක් ඇති වෙනවා නේද?

පි : අනිවාර්යයෙන්ම ඇති වෙනවා.

ප්‍ර : අනිවාර්යයෙන්ම ඇති වෙනවා?

පි : ඔව්.

ප්‍ර : දැන් ඒ හැරුණුවිට දැන් තමන්ට ඔය සාමාන්‍ය ජීවිතයේදී මාස්ක් එකක් කට වහගෙන නහය වහගෙන පැළඳ ගත්තහම පහසුද?

පි : අපහසුයි.

ප්‍ර : ඒ වගේ යම් අයෙකු ඇස් දෙක වහ ගත්තොත් ඇස්වලට අපහසුවක් ඇති වෙන්නේ නැද්ද?

පි : වෙන්න පුළුවන්. වෙන්න ඕන.

ප්‍ර : රෙදිපිළිවල තියෙන ඒ එක එක රෙදිවලින් මහනවා වෙන්න පුළුවන්?

පි : ඔව්.

ප්‍ර : එතකොට යම් ඒ විදියට ඇස් වහගෙන යන අවස්ථාවක ඒ වහගෙන යන පුද්ගලයාට හෝ පුද්ගලයා කාට හරි තමන්ටම අනතුරුදායක විය හැකිද පාර හරහා යනකොට?

පි : ඒ වගේ අවස්ථා තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ ඔවුන්ගේ බැලීමේ ප්‍රමාණය දෙපැත්තෙන් බලන ප්‍රමාණය අඩු වෙනවා දෘෂ්ටිය?

පි : විශේෂයෙන්ම රාත්‍රී කාලයේදී ඒක ගොඩක් බලපාන්න ඉඩ තියෙනවා.

ප්‍ර : එය තමන්ටම අනතුරුදායකත් විය හැකියි?

පි : ඔව්.

ප්‍ර : තව ප්‍රශ්නයක් අහනවා මම මේ අවස්ථාවේදී එය අහන්න ඕන. තමන්ගේ මාධ්‍යයවල එක් අවස්ථාවක ප්‍රචාරය වුණාද මාළිගාකන්ද, තමා මාළිගාකන්දෙන් මරදානෙන්.

පි : ඔව්.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඒ කෙසෙල්වත්ත ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය සම්බන්ධ පාතාල නායකයෙකු බුර්කාවක් ඇඳ මිදී ගියා කියලා ආරක්ෂක අංශවලින්?

පි : ඔව්. මම ඒක මාළිගාවත්ත ප්‍රදේශයේ. ඔව්. මමත් දැක්කා.

ප්‍ර : දැක්කා නේ?

පි : දැක්කා.

ප්‍ර : ඒ වගේම ප්‍රහාරයෙන් පසු වත්තල ප්‍රදේශයේ එවැනි දෙයක් සිදු වුණ බවට මාධ්‍යවල පළ වුණාද? ඒ කියන්නේ වෙන පුද්ගලයෙකු ....?

පි : ගම්පහ දුම්රිය ස්ථානයේ ඒ වගේ සිද්ධියක් වුණා කියලා මාධ්‍යවල මම දැක්කා. ඒ පුද්ගලයාගේ උස, සාමාන්‍යයෙන් ගැහැණු කෙනෙකුට වඩා උස පුද්ගලයෙක් හින්දා සැක ඇති වෙලා හොයලා බලනකොට ඒක පිරිමි කෙනෙක් ඇඳන් හිටියා කියන එක.

ප්‍ර : එතකොට තමන්ට කියන්න පුළුවන්ද තමන් කියපු ඒවා තමන් බොහොමයක් පිළිගත්ත නිසා මේ සියල්ලන්ගෙන්ම තමන්ගේ ආරක්ෂාවටත්, වෙනත් පුද්ගලයින්ගේ ආරක්ෂාවටත් යම් පුද්ගලයෙකු ඇස් හෝ මුහුණ ආවරණය කරගෙන යාමෙන් තර්ජනයක් විය හැකි බව?

පි : ඔව්. තමන්ගේ අනන්‍යතාවය අනෙක් පුද්ගලයන්ට හා ආරක්ෂක පද්ධතිවලට හෙළි නොවන විදියට කෙනෙක් යනවා නම් ඒක අනෙක් අයට හා රටේ නීතියට හානියක් නැත්නම් ආරක්ෂාවට හානියක්. ඒ වගේම ඒකෙන් තමාගේ ඇස් පෙනීමට යම්කිසි විදියකට බාධාවක් වෙනවා නම් තමාටත් ඒකෙන් හානියක් සිද්ධ වෙනවා.

ප්‍ර : ඒ වගේම ලංකාවේ රජය විසින් එක් අවස්ථාවක සම්පූර්ණයෙන්ම මුහුණ වසා හෙල්මට් දමාගෙන යාම තහනම් කිරීමක් කළා. තමන් කියන්නේ එය නිවැරදියි කියලද? මම කියන්නේ තමන්ගේ මතය අනුව ඒ කියන්නේ වසා දමාගෙන යාමෙනුත් ඒ ආරක්ෂාවට තර්ජනයක් නිසා තමයි ඒක මුහුණ වසාගෙන යාම තහනම් කළේ?

පි : ඔව්. මට මතක හැටියට ඒ වකවානුවල සිද්ධ වෙච්ච අපරාධ ක්‍රියාවත් එක්ක මුහුණ වහගත් හෙල්මට් භාවිතය වැඩි ලෙස මේවා වෙලා තිබ්බ හින්දා රජයෙන් ඒ වගේ නීතියක් පැනෙව්වා.

ප්‍ර : ඒ කියන්නේ කොයි අවස්ථාවක වුණත් රජයකට කුමන අවස්ථාවක වුණත් ආරක්ෂාවට තර්ජනයක් වෙනවා නම් ඒ ගැන සළකා බලන්න හැකියාවක් තියෙනවා?

පි : තියෙනවා. ඔව්.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ගරු ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඔබ සඳහන් කරනු ලැබුවා ළමයින්ට, ඒ කියන්නේ මුස්ලිම් ළමයින්ට ලබාදෙන අධ්‍යාපනයේදී ඔවුන්ට උගන්වනු ලබන ඇතැම් කරුණු නිසා ඔවුන් හිතන්නට පෙළඹෙනවාය කියලා අපි

FAIR COMMENT BY JEZEEM

වෙනත් පාලනයක් යටතේ සිටින නිසා අපිට මේ නීතිය අනුගමනය කරන්නට සිද්ධ වෙනවා. නමුත් මේ ඉස්ලාම් ආගමේ දක්වා තිබෙන මේ ප්‍රතිපාදන අනුව ඒ නීති ක්‍රම අනුගමනය කරන්නට අපට අපේම දේශයක් තිබෙනවා නම් කටයුතු කරන්නට පුළුවන් කියලා?

පි : මුස්ලිම් ළමයින්ට විතරක් නෙවෙයි. පොඩි කාලේ මටත් එහෙම හිතිලා තියෙනවා.

ප්‍ර : දැන් ඔබට එසේ හිතන්නට පෙළඹෙන්නට මුල් වුණේ මොන කරුණද නැත්නම් මොන කරුණුද?

පි : එක කරුණක් කියලා එක කරුණක් කියන්න අමාරුයි. මොකද මේක හැම පැත්තෙන්ම වාගේ මේ වාගේ දේවල් අපිට ලැබෙනවා. සිකුරාදා පල්ලියේ තියෙන දේශනා, පාසලේ තියෙන ඉස්ලාම් Subject එක අපිට උගන්වන ගුරුවරයාගෙන්, ගුවන් විදුලියේ යන දේශනාවලින් ඒ වගේ දේවල්වලින්, සමහර අපේ යාළුවෝ ඒ ගැන කථා කරනවා. ඉතිං ඒ වගේ දේවල්වලින් අපිට මේක ලැබෙනවා.

ප්‍ර : මොනවද කියන්නේ ඒවගේ? එම දේශනාවලදී ඒ ඉදිරිපත් කිරීම්වලදී මොන වගේ අදහස්ද ලබා දෙන්නේ ඒ ශ්‍රවණය කරන අයට?

පි : මොහොමඩ් නබිතුමා කරපු දේවල් ගැන කියනවා. කියනකොට මේක තමයි හරි නීතිය කියලා කියනවා. ඊට පස්සේ මොනවා හරි අපරාධයක් ලෝකයේ සිද්ධ වෙනකොට සාමාන්‍යයෙන් ගොඩාක් දුරට අතට ගන්නේ ස්ත්‍රී දූෂණය වාගේ දේවල් සිද්ධ වෙනකොට අපිට තියෙන, ලංකාව වගේ රටක තියෙන නීති පද්ධතිය අනුව ඒ නඩු විභාගය ඇවිල්ලා තීන්දු දෙනකොට අවුරුදු කිහිපයක් යනවා. එතකොට ඉස්ලාම් මේක අනුව සාක්ෂි හතර දෙනෙක් ඉන්නවා නම් ඒ වෙලාවෙම ඒ පුද්ගලයාට මරණ දඩුවම බෙල්ල ගැසීමෙන් සිද්ධ කරනවා. එතකොට ඒවා උදාහරණයට ගන්නවා. එතකොට අර මිනිස්සු තරහින් ඉන්න වෙලාව, මෙන්න මේ වගේ අපරාධයක් වුණා. අහිංසක ගැහැණු ළමයෙක් දූෂණයට ලක් වුණා කියලා ඉන්න වෙලාවේ ඒ වගේ දේවල් පෙන්වනවා. පෙන්නනකොට ෂරියා නීතිය කොතරම් හොඳද කියන වගේ දේවල් ඔළුවට දානවා. අර හලාල් කෑම ගැන. මුස්ලිම් අයට ඒක පොඩි කාලයේ දෙනකොට කොහේ හරි සාදයකට ගියොත්, Match එකකට ගියොත් එතනින් ලැබෙන කෑම ගැන අපට අප්‍රසන්න තත්ත්වයක් ඇති වෙනවා මේක හලාල්ද නැද්ද කියලා. එතකොට අපිට හිතෙනවා මේක අපේ මුස්ලිම් රාජ්‍යයක් වුණොත් අපිට මේ ප්‍රශ්නයක් නැහැ කියලා. ඒ වගේ අර හැම පැත්තෙන්ම වාගේ ඒ මතය ගොඩ වෙනවා එක තැනකට. මනසට එනවා හැම පැත්තෙන්ම වාගේ ඒක එනවා.

ප්‍ර : නබිතුමා විසින් ඔහුගේ පාලන කාලය තුළදී යම් යම් වැරදි සිදු කරන ලද අයට පමුණුවන දඩුවම් පිළිබඳව හදීස්වල සඳහන් කරලා තියෙනවද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. හදීස්වල සඳහන් කරලා තියෙනවා.

ප්‍ර : උදාහරණයක් ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : මම ඒ ගැන ලේඛනයක් ඉදිරිපත් කරා මේ සභාවට ඒ ගැන ලේඛනයක් ඉදිරිපත් කරා. 40, MIR 40 කියන එක හිතාබල් හුදුත් කියන ලේඛනයක් මම ඉදිරිපත් කරලා තියෙනවා. හුදුත් කියන්නේ දඩුවම කියන එක. හිතාබ් කියන්නේ පොත. එක හදීස් ග්‍රන්ථයේ තිබිච්ච ...,

ප්‍ර : පොඩ්ඩක් හෙමිහිට නැවතිල්ලේ කියනවද? එතකොට පැහැදිලියි ඒ කියන වචන?

පි : හිතාබල් හුදුත්.

ප්‍ර : ඒක හදීස් පොතක්?

පි : හදීස් පොතක පොඩි කොටසක්.

ප්‍ර : පොඩි කොටසක්?

පි : ඔව්.

ප්‍ර : මොනවද ඒකේ කියලා තියෙන්නේ හා මොන මොන ස්ථානවලද තියෙන්නේ ඒ පොතේ ඒවා?

පි : ඒකේ තිබුණේ මට මතක හැටියට හොරකම් වාගේ දඩුවම්වලට වාගේ....,හොරකමකට අත කැපීම, For adultery lashes 100 ක්, කස පහරවල් 100 ක් ගහන එක ගැන අනාචාරයට. ඒ වගේ දේවල් සඳහන් වෙලා තියෙනවා මේ හදීස්වල. ගල් ගසා මැරීම ගැන මේකේ සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර : 40එකේද ඔය ඔක්කොම එන්නේ?

පි : ඔව්. 40 එකේ එන්නේ ඔක්කොම. ගල් ගසා මැරීම සම්බන්ධයෙනුත් මේකේ සඳහන් වෙලා තියෙනවා. මත්ද්‍රව්‍ය භාවිතා කරන අයට පහර දීම ගැන, දඩුවම් දෙන එක ගැන සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර : ඒ ඔක්කොම තියෙන්නේ හදීස්වල ඔය 17 වෙනි පොතේද? Book Seventeen?

පි : සහීහල් මුස්ලිම් Book Seventeen. Chapter 1 එකේ ඉඳලා මම එතන දීලා තියෙනවා Chapter Nine වෙනකම්.

ප්‍ර : 4175, 4183, 4185 කියන පිටුව?

පි : 4183, 85, 4191, 92, 93, 96, 4201, 4211, 4212, 4226, 4228, 4234 යන හදීස්.

ප්‍ර : ඔබ කියන ලද ඒ අංක මොනවද? Now what are the numbers that you gave?

පි : හදීස් Numbers from book seventeen. 17 වෙනි පරිච්ඡේදයේ Sorry. Chapter one එකේ, 17 වෙනි පොතේ හදීස් අංකය.

ප්‍ර : How many pages do you have in the particular document allogether please?

පි : පහයි. පිටු පහයි.

ප්‍ර : පිටු පහක් තියෙනවා?

FAIR COMMENT BY JEZEEM

පි : පිටු පහක් තියෙනවා.

ස්වාමීනි සහීඅල් මුස්ලිම් හදීස් පොතේ අංක 17 දරන පොතේ මෙම අදාළ කොටස් පිටු පහකින් යුතුව එම ලේඛනගත කරලා සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනවා. එය C-353 වශයෙන් ලකුණු කිරීම සඳහා අවසර ඉල්ලා සිටිනවා

ප්‍ර : ඔබ පාසල් යන කාලයේදී ඉස්ලාම් ධර්මය හැදෑරුවාය කියලා මගේ උගත් මිත්‍රයා ජයසිංහ මහතා ප්‍රශ්න අහනකොට ඔබ කිව්වා?

පි : ඔව්.

ප්‍ර : ඔබට එම ධර්මය උගන්වන අවස්ථාවේදී ඒ සඳහා, ඉස්ලාම් ධර්මය ඉගැන්වීමේදී ඔබලාට විෂය නිර්දේශයක් තිබුණද?

පි : රජයෙන් නිකුත් කරපු පෙළ පොත තිබුණා.

ප්‍ර : පෙළ පොත තිබුණා?

පි : තිබුණා.

ප්‍ර : ඒ පෙළ පොත් ඔබ ළඟ තිබෙනවද දැන්?

පි : ඔව්. මම ගාව ඒකේ පිටපතක් තියෙනවා.

ප්‍ර : මොන වසරට අදාළ පෙළ පොත්ද ඒ?

පි : 10 හා 11 වසරට අදාළ පෙළ පොත්. 1992 නිකුත් කරපු එක.

ප්‍ර : නිකුත් කරන ලද?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔය පෙළ පොත්වල සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ පැවැත්වෙන නීතිය අනුව කටයුතු කිරීමේදී තිබෙන කරුණු සමඟ ඒ ප්‍රතිපාදන සහ ප්‍රතිපත්ති සමඟ ගැටීමක් ඔය ඔබ ළඟ තිබෙන 10 සහ 11 පෙළ පොත්වල අඩංගු ග්‍රන්ථ කරුණුවල දක්නට තියෙනවද?

පි : ඔව් තියෙනවා.

ප්‍ර : මොනවද ඒ? කොහේද තියෙන්නේ?

පි : ඒකේ 47 වෙනි පාඩම ....,

ප්‍ර : දැන් කිව්වනේ 10, 11 දෙකක් තියෙනවා කියලා. මොන පොතේද?

පි : 10, 11 ට එක පොත තමයි තියෙන්නේ. මේ පොත 1980 ඉඳලා මුල් වර ප්‍රකාශයට පත් කරලා තියෙනවා. ඒක 2015 වෙනකම් මේ පොත භාවිතා කරලා තියෙනවා ලංකාවේ. මම ඉගෙන ගත්තේ 1993, 94 දී.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔය පොතේ තියෙනවද කොහෙද Print කරලා තියෙන්නේ කියලා?

පි : ඔව් තියෙනවා. (දෙමළ බසින් කියවයි). මේක Education Publication Department. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් දෙහිවල තියෙන තිසර Printers එකේ Print කරලා තියෙනවා.

****

FAIR COMMENT BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඕකේ සංස්කරණ මණ්ඩලයක් ඉන්නවද?

පි : ඔව්. සංස්කරණ මණ්ඩලයක් ඉන්නවා.

ප්‍ර : ඒ අය ඔක්කෝමලා මුස්ලිම් ජාතිකයෝද?

පි : ඔව්. මේ පොතේ නම් සඳහන් කරලා තියෙන ඔක්කොමලා මුස්ලිම් ජාතිකයෝ.

ප්‍ර : එතකොට ඒ අයගේ තනතුරු මොනවද කියලා දාලා තියෙනවද?

පි : මේ පොතේ දාලා තියෙන්නේ තනතුරු හැටියට දාලා තියෙන්නේ මවුලවීලා කියන එක විතරයි දාලා තියෙන්නේ. ඒකේ මවුලවීලා කිහිප දෙනෙක් ඉන්නවා. එයාලගේ නම්වලට විතරයි මවුලවී කියලා දාලා තියෙන්නේ.

ප්‍ර : ඒ අය එකතු වෙලා තමයි මේ පොත ....?

පි : මවුලවී නොවන අය කිහිප දෙනෙකුත් තියෙනවා. මවුලවීලාගේ නමකුත් තියෙනවා.

ප්‍ර : ඒ සංස්කරණ මණ්ඩලය එකතු වෙලා තමයි එහෙම නම් මේ පොත පිළියෙල කරලා තියෙන්නේ?

පි : ඔව්.

ප්‍ර : එහි අන්තර්ගත කරුණු පිළියෙල කරලා තියෙන්නේ?

පි : ඔව්.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඒ සංස්කරණ මණ්ඩලයේ බේරුවල අර නලීමා විද්‍යාලයේ විදුහල්පතිත් ඉන්නවද?

පි : මේ මම ගාව තියෙන පොතේ නම් එයාගේ නම නැහැ.

ප්‍ර : ඔහු සංස්කරණ මණ්ඩලයේ ඉන්න එක්කෙනෙක් නේද?

පි : ඔව්. ඉන්න එක්කෙනෙක්. මෙතන මම ගාව තියෙන පොතේ නැහැ.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔබ දැන් බලපු පොතේ ඉන්න සංස්කරණ මණ්ඩලය, ඔබ දන්නවද ඒ නම්වලින් කවුරු හරි ඔබ දැනගෙන ඉන්නවද?

පි : මෙතන මවුලවී කියලා නම විතරයි දාලා තියෙන්නේ. සාමාන්‍යයෙන් අපි මවුලවීලා හඳුන්වනකොට ඒගොල්ලන් ඉගෙන ගත්ත පාසලක මද්‍රසා එකේ නම පිටිපස්සට එනවා. දැන් නලීමියා එකේ ඉගෙන ගත්ත එක්කෙනෙක් නම් වරහන් ඇතුළට නලීමි කියන සඳහනක් එනවා. ඒක දැක්ක ගමන් අපිට මෙයා කියලා අඳුනගන්න පුළුවන්. මේ පොතේ එවැනි සඳහනක් නැහැ කිසිම මවුලවී කෙනෙකුට. ඒ නිසා මට අපහසුතාවය තියෙනවා මේ අයව නිශ්චිතව ස්ථිරව හඳුනා ගන්න. මෙයා තමයි ඒ පුද්ගලයා කියලා හඳුනා ගැනීමේ අපහසුතාවය තියෙනවා.

****

FAIR COMMENT — BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : සංස්කරණ මණ්ඩලය ගැන කිව්වනේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ ඔක්කොමලා ඉන්නේ මුස්ලිම් .....?

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : මේ සංස්කරණ මණ්ඩලයේ ඉන්නවද ඉනාමුල්ලා මස්සුජීන් කියලා?

පි : නැහැ. ඉනාමුල්ලා මස්සුජීන් කියන නම නැහැ.

ප්‍ර : අගාර් මොහොමඩ්?

පි : අගාර් මොහොමඩ් නැහැ.

ප්‍ර : ඒ නම් දන්නවා ඇති තමන් නේ?

පි : මුක්තාරී මොහොමඩ් කියලා එකක් තියෙනවා. ඒක මුක්තාර් අගාර් මොහොමඩ්ද නැත්නම් වෙන එක්කෙනෙක්ද කියලා කියන්න ....,

ප්‍ර : මොහොමඩ් සුක්රි?

පි : මොහොමඩ් සුක්රිගේ නමත් මෙතන නැහැ.

ප්‍ර : එයා නලීමියා ....?

පි : නලීමියා එකේ Director. A.M.L.M. ෆලීල් කියලා නමක් තියෙනවා. නලීමියා එකෙත් ඒ නමින් කෙනෙක් ඉන්නවා. එයාද මේ කියලා මට ස්ථිරව කියන්න බැහැ.

ප්‍ර : එයා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ඒ ග්‍රන්ථ මේකේ ඉන්නවද?

පි : ඒක නම් මට කියන්න අමාරුයි.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඉස්ලාම් ආගමට අදාළව ළමයින්ට අධ්‍යාපනය ලබාදීම සඳහා පිළියෙල කරලා තියෙන ඔබ ළඟ සන්තකයේ දැන් තියෙන 1980 සිට 2015 දක්වා පාවිච්චි කරන ලද මේ පොත් ඔබ දන්න ආකාරයට මොන මොන භාෂාවලින්ද මුද්‍රණය කරලා තියෙන්නේ?

පි : දෙමළ හා සිංහල.

ප්‍ර : ඇයි දෙමළ භාෂාවෙන් ඒක මුද්‍රණය වෙන්නේ?

පි : දෙමළ භාෂාවෙන් මුද්‍රණය වෙන්න විශේෂම හේතුව ඇවිල්ලා ලංකාවේ ඉන්න මුස්ලිම් දරුවන්ගෙන් රජයේ පාසල්වලට යන මුස්ලිම් දරුවන්ගෙන් වැඩි පිරිසක් බහුතරයක් ඉගෙන ගන්නේ දෙමළ භාෂාවෙන්.

ප්‍ර : එත්කොට එහෙම නම් ඒවායේ තියෙන කරුණු නිවැරදිව ඉදිරිපත් වීම සිදු වන්නට ඕන නේද?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. ලංකාවේ තියෙන රාජ්‍ය පාසල්වලින් මුස්ලිම් පාසල් කියලා වෙනම වෙන් කරලා තියෙනවා. ඒ පාසල්වලින් වැඩිපුරම ඉගෙනීමේ කටයුතු සිද්ධ කරන්නේ දෙමළ මාධ්‍යයෙන් තමයි.

ප්‍ර : දැන් ඔබ මේ අවස්ථාවේදී සාක්ෂි දෙනකොට පරිහරණය කරන්නෙත් ද්‍රවිඩ භාෂාවෙන් තියෙන පිටපතක් නේද?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබට එහෙනම් මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද ලංකාවේ පවත්නා නීතිය සමඟ ගැටීමක් කොයි ආකාරයටද ඔබ ළඟ දැන් ඔය තියෙන 1980 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී ළමයින්ට ලබාදෙන ලද අධ්‍යාපනය, ආගමික අධ්‍යාපනයේදී ඉදිරිපත් වන කරුණු සමඟ ගැටීමක් ඇති වෙන්නේ කියලා? ඒ ගැටීම් ඇති වෙන්නේ කියලා?

පි : උදාහරණයක් හැටියට මට දෙන්න පුළුවන් පිටු අංක 324 පටන් ගන්නවා 47 වෙනි පාඩම. ඒකේ ශීර්ෂ පාඨය තියෙන්නේ කුට්ටමම් දණ්ඩනය, වරද හා දඩුවම. මේක ඇතුළේ කියලා තියෙනවා ඉස්ලාමිය දණ්ඩ නීතිය නැත්නම් The criminal law of Islam ගොඩාක් උතුම් හොඳය කියලා මෙතන හඳුන්වලා දීලා තියෙනවා. දීලා තියෙනවත් එක්කම සටහනක් Chart එකක් තියෙනවා ඉස්ලාමිය නීතිය අනුව වරද මොනවද? ඒකට තියෙන දඩුවම මොකක්ද? ඒකට තියෙන Notes සටහන මොකක්ද කියලා වෙනම Chart එකකුත් 328 වෙනි පිටුවේ පළ කරලා තියෙනවා. ලංකාවේ නීතිය තියෙන කොට මේ වාගේ දෙයක් ඒකට පටහැනි ඒකට කෙළින්ම අනිත් පැත්තේ තියෙන නීතිය පාසල් ළමයින්ට උගන්වන එක අර මම කලින් කිව්වා වාගේ මේ මුස්ලිම් වන අපට වෙනම නීතියක් තියෙනවා කියන එක නිතරම මතක් කරලා දෙන වැඩක් කියලා තමයි මම දකින්නේ.

ප්‍ර : ඔබට තව ටිකක් ඒ දෙන ලද පිළිතුර පැහැදිලි කරන්න පුළුවන්ද? දැන් ඔබ කිව්වනේ යම් ආකාරයකට වෙනස් ආකාරයකට දරුවන්ට ඒ ගැන අවබෝධයක් ලබා දෙනවා කියලා ඒ දඩුවම් සම්බන්ධව. එතකොට ඒ Page එක ගැන කියලා, ඒකේ තියෙන කරුණු ගැන කියලා පැහැදිලි කරන්න.

පි : හරි. 328 වෙනි පිටුවේ කියලා තියෙන දේවල් ගැන මම කියන්නම්. ලංකාවේ නීතිය අනුව යම්කිසි දේවල් අපට නීත්‍යානුකූලව අනුමත කරලා තියෙනවා. සමහර දේවල් අපිට කරන්න නිදහස තියෙනවා. ඉතිං ඒ වගේ දේවල් පවා මෙතන වැරදියි කියලා පෙන්නලා ඒකට දැඩි Inhuman violent Punishments දඩුවම් මෙතන සඳහන් කරලා තියෙනවා. මම ඉස්සරලාම පළවෙනි එකෙන් පටන් ගත්තොත් රිද්දන් කියන වරද සඳහන් කරලා තියෙනවා.

ප්‍ර : මොකද්ද රිද්දන් කියන්නේ?

පි : රිද්දන් කියන්නේ මුස්ලිම්වරයෙක් ඉස්ලාම් ආගම අතහැරලා එළියට යන එක. වෙන ආගමකට හෝ ආගමක් අදහන්නේ

FAIR COMMENT — BY JEZEEM

නැතුව ඉන්න එකට කියන්නේ, ඉස්ලාම් ආගමෙන් එළියට යන එකට කියන්නේ රිද්දත්. හැබැයි ලංකාවේ නීතිය ....,

ප්‍ර : ඒක වැරැද්දක්ද?

පි : ඉස්ලාම් ආගමේ ඒක වරදක් හැටියට දකිනවා. ඒක වරදක් හැටියට දකින එක ලංකාවේ පැවැත්වෙන නීතියට කෙළින්ම පටහැනියි. තමන්ට කැමති ආගම අදහන නිදහස ලංකාවේ ව්‍යවස්ථාව හා නීතිය අනුව හැම පුරවැසියෙකුටම ලබා දීලා තියෙනවා. එතකොට මේක වරදක් කියලා හඳුන්වලා, එතන දීලා තියෙන දඩුවම කොළෙයි කියන දෙමළ වචනය භාවිතා කරලා තියෙනවා.

ප්‍ර : මොකද්ද කොළෙයි කියන්නේ?

පි : කොළෙයි කියන්නේ ඝාතනය කියන වචනය. මේ කොළෙයි කියන එක දෙමළ වචනය කොහේවත් කිසිම අධිකරණයකින් කොළෙයි දණ්ඩනය, ඒ කියන්නේ කොළෙයි දඩුවමක් දුන්නා කියලා භාවිතා වෙන්නේ නැහැ. කොළෙයි කියන එක ඝාතනය.

ප්‍ර : Assasination?

පි : Assasination or murder. Because we always say that capital punishment or the death penalty. But this is murder. We don't say that murder penalty or the assassination penalty issued by the court. That is done by some body taking the things in their own hand. මෙතන මේ දීලා තියෙන්නේ කොළෙයි කියන වචනය. ඝාතනය කියන වචනය මෙතන සඳහන් කරලා තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ ඔබ එයින් අදහස් කරනවද කොළෙයි කියන ද්‍රවිඩ වචනය මේ Chart එකේ සඳහන් කිරීමෙන් රිද්දත් කියන වැරැද්ද සිදු කරහම නීත්‍යානුකූලව පමුණුවනු ලබන දඩුවමක් නෙමෙයි. ඕනෑම
කෙනෙක්ට නීතිය අතට අරගෙන ඒ ඝාතනය කිරීම සිදු කරන්න පුළුවන් කියන අදහස ඉන් දෙනවයි කියලා?

පි : ඔව්. අනිවාර්යයෙන්ම ඒ අදහස තමයි මෙතනින් සිද්ධ වෙන්නේ කොළෙයි කියන වචනයෙන්. දෙමළ වචනයෙන් කෙළින්ම ඒක තමයි සිද්ධ වෙන්නේ.

ප්‍ර : ඒ වගේම ඔබ ගරු කොමිෂන් සභාවට කිව්වා බහුතරයක් දරුවන් ද්‍රවිඩ භාෂාවෙන් තමයි ඉගෙන ගන්නේ කියලා ඔබේ ආගම හා අධ්‍යාපන කටයුතු කරන්නේ?

පි : ඔව්. මේ පොත 1980 මුල් වතාවට පළ කරලා තියෙනවා. මේක 2015 වෙනකම් මේ රටේ උගන්වලා තියෙනවා. එතකොට 1980 දී මේක 10 වෙනි හෝ 11 වෙනි පන්තියේ ඉන්න ළමයෙක් මේක ඉගෙන ගන්න පටන් ගත්තා නම් ඒ වෙනකොට ඒ ළමයාගේ වයස 15 හා 16. එතකොට ඒක ඉගෙන ගත්ත ඒ ළමයාගේ අද වයස 56 ක් නැත්නම් 55 ක්. අන්තිමට ඉගෙන ගත්ත ළමයා 2015 දී ඉගෙන ගත්ත ළමයා මේක 16 දී ඉගෙන ගත්තා නම් අද ඒ

ළමයාගේ වයස 20 යි. එතකොට 20 ඉඳලා මුස්ලිම් රජයේ පාසලකට ගිහිල්ලා දෙමළ මාධ්‍යයෙන් ඉගෙන ගත්ත මුස්ලිම් දරුවන්ගෙන් අවුරුදු 20 ඉඳලා 56 වෙනකම් වයස් ප්‍රමාණය ඇතුළේ ඉන්න හැම කෙනාම මේක ඉගෙන ගෙන තියෙනවා. ඒකට පොඩි උදාහරණයක් කියන්න පුළුවන් මට විරුද්ධව මාව මරන්න ඕනේ කියලා සහරාන්ලා දියත් කරපු ඒ දේ පළ වුණාට පස්සේ මම දැක්කේ නැහැ කිසිම මුස්ලිම් එක්කෙනෙක් ඒ ගැන පුදුම වෙච්ච එක ගැන. මොකද ඒගොල්ලොන්ට ඒක තිබුණා ඒ තියෙන දේ තමයි මෙයාලා කරන්න හදලා තියෙන එක කියන වගෙ අදහසක් තමයි තිබුණේ.

The second one ….., the crime දෙවනි වරද ඇවිල්ලා මෙතන පෙන්නලා දීලා තියෙනවා කොළෙයි. ඒ කියන්නේ ඝාතනය.

දැන් වේලාව : ප.ව. 4.00 යි.
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රානි මිය විසින්ය.
වේලාව ප.ව.4.00 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : මොකක්ද මේ දෙවෙනි වැරැද්ද?

පි : ඝාතනය.

ප්‍ර : ඒ කියන්නේ කවුරු හරි මරලා තියෙන එකක් ගැන, එහෙම කරලා තිබෙනවා නම් මොකක්ද දෙන්න පුළුවන් දඩුවම?

පි : ඔව් දඩුවම කියලා එතකොට ඒකට දියත් කියන වචනය තියෙනවා. තව තියෙන්නේ කොලෙයි කියන වචනය දීලා තියෙනවා. මේ නෝට් එක දාලා තියෙනවා .....(සාක්ෂිකරු දෙමළ භාෂාවෙන් වැකියක් කියවයි) ඒ කියන්නේ දියත් කියන වචනයෙන් තේරුම් එන්නේ කවුරු හරි එක්කෙනෙක් මරලා දැම්මාට පස්සේ ඒ මැරිච්ච පුද්ගලයාගේ ලඟම ඥාති The next in heir නැත්නම් එයාගේ පුතා හරි නෝනා හරි යම්කිසි මුදලක් ඒ පුද්ගලයාගෙන් අරගෙන එයාට සමාව දෙන්න පුළුවන් ඉස්ලාම් ආගමේ හැටියට.

ප්‍ර : ඒ ආකාරයට තමයිනේද ලංකාවෙන් රිසානාට ඒ මුදල Blood money ලබා දීම සඳහා යෝජනාවක් තිබුණා?

පි : යෝජනාවක් තිබුණා.

ප්‍ර : අපේ ආණ්ඩුව ඒකට එකඟ වුනේ නැහැ, ඒ කියන්නේ ඔය වගේ අවස්ථාවක්?

පි : ඔය වගේ අවස්ථාවක්. ඕනම එක්කෙනෙකුට ඒක කරන්න පුළුවන්. මේක අපේ ලංකාවේ නීතිය අනුව නීතිය හැමෝටම සමානයි කියන තත්ත්වය යටතේ මේ වගේ දෙයක් ලංකාවේ සිද්ධ වෙන්නේ නැහැ. මේ වගේ දෙයක් තිබුනොත් පොහොසත් මිනිහෙකුට දුප්පත් මිනිහෙක් මරලා දාලා සල්ලි දීලා එයාට නිදහස් වෙන්න පුළුවන්. මේ සල්ලි දීලා එළියට ආවට පස්සේ එයා සාමාන්‍ය නිදහස් පුද්ගලයෙක්. එයා මිනී මැරුම් කරපු කෙනෙක් හැටියට හඳුන්වා ගන්නේ නැහැ. එතකොට මේ වගේ දෙයක් මේ පොතේ දෙවෙනියට හඳුන්වා දීලා තිබෙනවා.

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ළමයින්ට ලබා දෙන්නේ Chart එක මෙතන ඇතුලත් කිරීමෙන්?

පි : තුන්වෙනි එකට දාලා තියෙනවා විපර්චාරම්, විපර්චාරම් කියන්නේ

ප්‍ර : දුරාචාරය කියලා කිව්වොත්?

පි : දුරාචාරය කියන වචනය. ඒකේම දීලා තියෙනවා කස පහර 100 ක් දඩුවම. ඊට පස්සේ Note එක දීලා තියෙනවා (දෙමලෙන් වැකියක් කියවයි) කසාද බැඳලා නැත්නම් තමයි මේ කස පාර 100 කුයි ඒ ගමේ ඉදලා එයාව අවුරුද්දක් පිටත් කරලා තියෙනවා. අයින් කරලා. (දෙමලෙන් වචනයක් කියයි) කසාද බැඳපු කෙනෙක් නම් ගල් ගසා මරා දැමිය යුතුයි කියලා සඳහන් කරලා තියෙනවා. මේක මේ පාසැල් පොතේ මේක සඳහන් කරලා තියෙනවා. ඊට පස්සේ හොරකම ගැන, 4 වෙනියට තියෙන්නේ හොරකම ගැන ඒකට දීලා තියෙන්නේ අත කැපීම. අත කපන එක ගැන මෙතන සඳහන් කරලා තියෙනවා දඩුවම හැටියට. Noteඑකක් දාලා තියෙනවා ඒකට මේ තියෙන Conditionsඔක්කොම meet වුනොත් under the strict condition if it is met he should be amputed . 5 වෙනි එක පඩදූර්. පඩදූර් කියන්නේ නින්දා කිරීම. ඒකට කස පාර 80 ක්. සුරා පානයට කස පහර 40 ක්.

ප්‍ර : දැන් ඔබ මගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් සඳහන් කරනු ලැබුවා

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සුරාපානයට කිව්වා දැන් ඔබ කිව්වා මුස්ලිම්වරුනුත් සමහර උත්සව වලදි බොනවද මොකක් හරි දෙයක් හදලා, සාමාන්‍යයෙන් නිවෙස්වල හදලා බොන ජාතියක් මොනවා හරි තියෙනවද?

පි : මම දන්න තරමට එහෙම දෙයක් කරන්නේ නැහැ.

ප්‍ර : Weddings වල එහෙම තියෙන, උත්සව වලදි සමහර මුස්ලිම් කට්ටිය යම් පානයක් දෙනවානේ මොකක්ද ?

පි : සර්වත් වාගේ

ප්‍ර : සබ්දිද?

පි : සර්වත්.

ප්‍ර : සමහර කලවම් කරලා එහෙම නැද්ද?

පි : නැහැ ආගමේ හැටියටයි මුස්ලිම් සමාජයේ ඇතුලේ එහෙම දෙයක් නැහැ. සමහර පිරිස

ප්‍ර : එහෙම කරනවා නේද?

පි : එහෙම කරන්න පුළුවන්. කරනවා ඇති. ඒ වුණාට ආගමේ හැටියට එහෙම දෙයක් කරන්න බැහැ නබිතුමාගෙන් කෙලින්ම ඒක ගැන තහනම්.

ප්‍ර : ආගමේ හැටියට බැහැ ඒ වුනාට සමහර අවස්ථාවලසමහර පුද්ගලයෝ කරන අවස්ථා තියෙනවා?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් තියෙනවා.

: (මත් පැන් නිෂ්පාදන සඳහා මිදි මිළදී ගන්නන්ට එය විකිණිම්ද හරාම් වේ. සොලිසිටර් ජනරාල් මහත්මිය එම වාක්‍යය පොත බලා කියවයි.)

පි : ඔව්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔබ සඳහන් කරනු ලැබුවා මුස්ලිම් දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේදි රජයේ පාසැල්වල ද්‍රවිඩ භාෂාවෙන් වගේම සමහර අවස්ථාවන් වලදි සිංහල භාෂාවෙනුත් අධ්‍යාපනය ලබා දෙනවාය කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔය ඔබේ සාක්ෂිය සඳහා පදනම් කර ගත්තේ ද්‍රවිඩ භාෂාවෙන් 1980 සිට 2015 වසර දක්වා වූ වසර වලදී ළමයින්ට අධ්‍යාපනය ලබාදීම සඳහා පාවිච්චි කරන ලද ඉස්ලාම් ධර්මයට අදාල 10, 11 ශ්‍රේණිවලට අදාල පොත නේද?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබේ අවධානය යොමු කරන්න කැමතියි එම වසර සඳහාම සිංහලෙන් මුද්‍රණය කරන ලද ඉස්ලාම් ධර්මයට අදාල පොත කෙරෙහි?

කරුණාකරලා සිංහල පරිවර්ථනය ද්‍රවිඩ භාෂාවෙන් තිබෙන ඒ ග්‍රන්ථයේ තිබෙන ඔය වගුවෙහි සඳහන් කරුණු සමඟ සැසඳෙනවද නැත්නම් ඒවා අතර යම් පරස්පරතාවයක් දකින්නට තියෙනවාද කියන කරුණ පිළිබඳව මේ ගරු කොමිෂන් සභාවට දැනුවත් කරන්න පුළුවන්ද?

පි : එක වචනය ගැන විතරයි පරස්පරතාවයක් තියෙන්නේ.

ප්‍ර : එය කුමකට සම්බන්ධයෙන්ද?

පි : තැන් දෙකක සඳහන් වෙලා තියෙන වචනයක්. අපරාධය රිත්වත්, ආගම අතහැරීම, සිංහල පොතේ දාලා තියෙනවා මරණය කියන වචනය.

ප්‍ර : ඝාතනය කියලා කියන්නේ නැහැ?

පි : ඝාතනය කියන වචනය සිංහල පොතේ සඳහන් වෙලා නැහැ.

ප්‍ර : නමුත් ද්‍රවිඩ පරිවර්ථනයේ තිබෙන්නේ කොලෙයි?

පි : කොලෙයි.

ප්‍ර : ඒ කියන්නේ ඝාතනය?

පි : ඝාතනය.

ප්‍ර :: සිංහල එකේ තියෙන්නේ මරණය?

පි : මරණය. මම දන්නා තරමට සිංහලෙන් මරණය කියන එක කෙනෙක් වයසට ගිහිල්ලා අභාවයට පත්වන එක මරණය කියලා කියන්න පුළුවන්.

ප්‍ර : හැබැයි දඬුවම කියන ශීර්ෂය යටතේ නේද ඒක තියෙන්නේ?

පි : දඬුවම කියන ශීර්ෂය යටතේ. දෙමලෙන් කොලෙයි කියන එක අනිවාර්යයෙන් තව කෙනෙක් විසින්ම නීතියට පිටින්ම කරන

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

දෙයක් තමයි කොලෙයි කියන එක. ඒක සාමාන්‍යයෙන් සිද්ධ වෙන දෙයක් නෙමෙයි Under any circumstance කොලෙයි cannot happen naturally. It should be done by someone else by force, to end somebody life. ඒක සඳහන් වෙලා තියෙන්නේ දඩුවම කියන Heading එක යටතේ. එතකොට රිද්වත් කියනඑකටත් මරණය කියන දඩුවම හැටියට ඒක සඳහන් කරලා තියෙනවා. ඒ වගේම ඇස් සිඳලීම කියන එකත් දඩුවමක් හැටියට සිංහල පොතෙත් සඳහන් කරලා තියෙනවා. නින්දා කිරීම හා සුරාපානය. කස පාර 80 ක් හා කස පාර 40 ක් සිංහල පොතේ සඳහන් කරලා තියෙනවා.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : මරණයට කියන දෙමළ වචනය මොකක්ද?

පි : මරණම්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලද පිටුව C354A වශයෙනුත්, සාක්ෂිකරු විසින් සාක්ෂියට පදනම් කර ගන්නා ලද වගුව

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදි උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනවිය විසින් සාක්ෂිකරු විසින් සාක්ෂි ලබා දෙමින් නම් කිරීමට යෙදුනු පොතේ මුල් කවරය ඊට ඇතුලතින් ඇති පලවෙනි පිටුව ඉන් පසුව පිටුව යට රෝමානු ඉලක්කම්වලින් දක්වා ඇති රෝමානු අංක ii,iii, iv සහ v වෙනි පිටු සහ 324 සහ 325 වන පිටු C354 වශයෙන් ලකුණු කරන අතර,

මුල් පිටුවට අමතරව ඇතුලතින් ඇති පිටු පිළිවෙලින් C354A, C354B (ii), C354C (iii), C354D(iv), C354E(v), 324 සහ 325 දරන පිටු අංක 354Eසහ F වශයෙන් පිළිවෙලින් ලකුණු කිරීමට අවසර දෙමි.

සහ 326 වන පිටුව 354G වශයෙන් ලකුණු කිරීමට අවසර දෙමි.

ඊට අමතරව උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනවිය විසින් එම පොතේ සිංහල පරිවර්තනය ඒ අනුක්‍රමික අංක සහිතව C355 න් පටන් අරන් ඒ අනුපිළිවෙලට ලකුණු කිරීමට අවසර දෙමි.

****

ගරු කොමිෂන් සභාව ප.ව. 4.30 නැවත කැඳවන බව දන්වයි.

****

FAIR COMMENT — BY JEZEEM

වේලාව ප.ව.4.50 යි.
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

කෙටි විවේක කාලයකින් පසු නැවත විමසීම ආරම්භ කරයි.
පෙර සාක්ෂි දුන් සාක්ෂිකරු නැවත කැඳවා ප්‍රතිඥා දෙයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : කෙටි විවේක කාලය ලැබීමට පෙර ඔබ විසින් මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබුවා C354 සහ C355 කියලා ලකුණු කරන ලද 10 සහ 11 කියන ශ්‍රේණිවලට ඉස්ලාම් ධර්මය 1980 සිට 2015 දක්වා ඉගැන්වීමට පාවිච්චි කරන ලද ධර්ම ග්‍රන්ථ නේද?

පි : ඔව්.

ප්‍ර : දැන් මේ අවස්ථාවේදී මම කැමතියි ඔබේ අවධානය යොමු කරන්න මේ පොත් දෙක අතර සංසන්දනයක් කිරීම සඳහා?

පි : ඔව්.

ප්‍ර : ප්‍රථමයෙන්ම බලන්න C354 කියලා ලකුණු කරපු ද්‍රවිඩ භාෂාවෙන් මුද්‍රණය කරලා තියෙන විෂය නිර්දේශය අඩංගු පොත.

පි : හරි.

ප්‍ර : ඒ 354 පලමුවන පිටුවේ මොකක් ද තියෙන්නේ?

පි : ඉස්ලාම් 10 හා 11 ශ්‍රේණිය අධ්‍යාපන ප්‍රකාශක දෙපාර්තමේන්තුව

ප්‍ර : කියලා ද්‍රවිඩ භාෂාවෙන් මුද්‍රණය වෙලා තියෙනවා?

පි : මුද්‍රණය වෙලා තියෙනවා.

ප්‍ර : එතකොට 354A කියන පිටුව ඒකට යම්කිසි පිටු අංකයක් තියෙනවද?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද පිටු අංකය?

පි : රෝමානු ඉලක්කම ii.

ප්‍ර : එතකොට ඒක ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන්නේ ඔබ 354A (ii) කියලා.

පි : රෝමානු ii කියලා.

ප්‍ර : අර 354A (ii) පිටුවේ මොනවද අඩංගු වෙන්නේ?

පි : ඒ පොත කා විසින්ද නිකුත් කරලා තියෙන්නේ, කොයි මුද්‍රණ කාලයේද මුද්‍රණය කරලා තියෙන්නේ කියන එකයි, ඒකේ Serial Number එකයි, පිටපත් කීයක් නිකුත් කරලා තියෙනවා කියන එකයි, කොයි කොයි අවුරුදු වලද මේ පොත නිකුත් කරලා තියෙනවා කියන එකයි එහි සඳහන් වෙලා තියෙනවා. Publish කරලා.

Proof Copy
FAIR COMMENT BY JEZEEM

ප : 354B (iii) වශයෙන් ඔබ යම් පිටුවක් ලකුණු කර ඉදිරිපත් කලානේ?

පි : ඔව්.

ප : එහි මොනවද සඳහන් වෙන්නේ?

පි : ඒකේ අධ්‍යාපන සේවා අමාත්‍යවරයාගේ පණිවිඩයක් සඳහන් වෙලා තියෙනවා. හිටපු අධ්‍යාපන සේවා අමාත්‍යවරයාගේ.

ප : එතකොට 354C(iv) වශයෙන් ලකුණු කරලා ඔබ ඉදිරිපත් කරලා තියෙනවා පිටුවක්?

පි : ඔව්.

ප : මොකක් ද ඒකේ සඳහන් වෙන්නේ ?

පි : පොතේ කතෘ මණ්ඩලය. සංස්කාරක මණ්ඩලය.

ප : කවුද මේ පොත සංස්කරණය කරලා තියෙන්නේ කියලා?

පි : ඔව්.

ප : 354D (v) වශයෙන් ලකුණු කර ඔබ ඉදිරිපත් කරලා තියෙන ඒ පිටුවේ මොකක්ද සඳහන් වෙන්නේ, මොන කරුණුද?

පි : අධ්‍යාපන ප්‍රකාශක දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමාගේ පණිවිඩය. ඒ වෙන කොට හිටපු කොමසාරිස්තුමාගේ පණිවිඩය සඳහන් වෙලා තියෙනවා. කොමසාරිස්තුමාලා දෙන්නෙක්ගේ පණිවිඩය සඳහන් වෙලා තියෙනවා. දෙන්නෙක් ඉන්නවා 88 කොමසාරිස්තුමාගේ පණිවිඩය හා 86 තව කොමසාරිස්තුමාගේ පණිවිඩය.

ප : එතකොට 354D (v) ගැනනේ ඔබ කිව්වේ. මම දැන් ඔබේ අවධානය යොමු කරනවා 354E කියලා ලකුණු කරලා ඉදිරිපත් කරපු පිටුව කෙරෙහි?

පි : හරි.

ප : 354E අක්ෂරයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන පිටුවේ අංකය කීයද?

පි : 324.

ප : මොනවද ඒ පිටුවේ සඳහන් වෙන්නේ, මොනවා ගැනද?

පි : ඒ පාඩම 47 වන පාඩම වරද හා දඬුවම කියන පාඩම ඒ පිටුවෙන් තමා පටන් ගන්නේ. ආරම්භ වෙන්නේ.

ප : එතකොට 354F කියලා ඔබ ලකුණු කර තිබෙනවානේ පිටුවක්?

පි : ඔව්.

ප : ඒ පිටු අංකය කීයද?

පි : 325.

ප : එහි සඳහන් වන්නේ මොකක්ද?

පි : ඒ පාඩමේ 2 වන පිටුව.

ප : අපරාධය හා දඬුවම කියන පාඩමේ 2 වන පිටුව?

පි : දෙවන පිටුව.

ප : එතකොට 354G කියන පිටු අංකය කීයද?

පි : 354G කියලා සඳහන් කරලා තියෙන පිටු අංකය 326.

ප : එයත් අපරාධය හා දඬුවම කියන ඒ පාඩමේ ඉතිරි කොටස සඳහන් වන පිටුවක්ද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : 354H කියලා ලකුණු කරලා තියෙන්නේ කුමන පිටුවක්ද?

පි : 327

ප්‍ර : මේ පොතේ 327 වන

පි : 327 වන පිටුව.

ප්‍ර : අපරාධය සහ දඬුවමේ තවත් කොටසක්ද සඳහන් වෙන්නේ ඒ පිටුවේ?

පි : ඔව්.

ප්‍ර : 354 I (අයි) කියන්නේ මොන පිටුවද? පිටු අංකය මොකක්ද?

පි : 328

ප්‍ර : එයත් අපරාධය හා දඬුවමේ සඳහන් ඒ පාඩමේ කරුණු සඳහන් වන පිටුවක්ද?

පි : ඔව්.

ප්‍ර : ඒ පිටුවේ යම් වගුවක් එහෙම තියෙනවද?

පි : ඔව් වගුවක් තියෙනවා.

ප්‍ර : මොකක්ද ඒ වගුව?

පි : වරද, දඬුවම හා සටහන කියන Chart එකක්. වගුව තියෙන්නේ.

ප්‍ර : එය පැහැදිලි කරමින් තමයි ඔබ විවේක කාලයට පෙර ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවේ උදාහරණයක් විදියට රිද්වත් කියන වරද සිදු කරනු ලබන පුද්ගලයෙකුට සාතනය කියන ආකාරයෙන් දඬුවම් කරන්න පුළුවන් කියලා සඳහන් වෙනවා කියලා ද්‍රවිඩ භාෂාවෙන් මුද්‍රිත C354 ලෙස ලකුණු කරපු පොතේ?

පි : ඔව්.

ප්‍ර : එහෙම නම් ඔයිට සමගාමීව අපි බලමු ඔබ විසින් ලකුණු කරලා ඉදිරිපත් කරන C355 කියලා තියෙන සිංහල භාෂාවෙන් මුද්‍රිත පොත, එහි 355 කියන පිටුවේ මොකක්ද දැක්වෙන්නේ?

පි : ඉස්ලාම් 9 වෙනි හා 10 වෙනි ශ්‍රේණි සඳහා.

ප්‍ර : එය සැසඳෙනවද 354 හි පිට කවරය කෙරෙහි?

පි : මේ පොත සිංහල පොත මේ මං ගාව තියෙන පොත පලවෙලා තියෙන්නේ 1984. ඒ කාලයේ පාසැල්වල අධ්‍යාපන ක්‍රමයේදි තිබ්බේ පන්ති කියන වචනය. 85 ට පස්සේ Class and year කියන එක පටන් ගන්න කොට Old Syllabus එක අනුව 9 වෙනි පන්තිය නම් 9 වෙනි Class නම් year 10 හැටියට ගනන් ගත්තා. එතන ඉදලා මෙතන 9 වෙනි හා 10 වෙනි ශ්‍රේණි කියන්නේ year කියන මේක යටතේ 10 වෙනි හා 11 වෙනි ශ්‍රේණිය ලෙස වෙනස් වෙනවා. වෙනස් වීමක් වෙනවා. ඉස්ලාම් 9 වෙනි සහ 10 වෙනි ශ්‍රේණි සඳහා අධ්‍යාපන ප්‍රකාශක දෙපාර්තමේන්තුව.

ප්‍ර : එතකොට ඔබ ද්‍රවිඩ පිටපතේ තියෙනවා කියලා කිව්වේ 10, 11 ශ්‍රේණි?

පි : ශ්‍රේණි. කියන එක There's a complication because class, year,grade. There are 3 things Nowadays they use the word grade. Grade 6, Grade 7, when I was studying they

Presidential Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

said year 7, Year 8. Before I started studying I can remember the older people studied class, Class 9, Class 8 and at the 10th class they sat for the SSC. But when we studied we sat for GCE O/L at Year 11.

ප්‍ර : ඔබ කියන්නේ මේ 354 සහ 355 කියන පිටකවර බැලුවාම ඒවායේ ඒ අදාල වසරවල් පිළිබඳව මුද්‍රණයේ යම් වෙනස්කම් තියෙනවා කියල; 354 ඔබ කියනවා 10, 11 ශ්‍රේණි සඳහා කියලා. එතකොට 355 ඔබ කියනවා සඳහන් වෙලා තියෙන්නේ 9 වෙනි සහ 10 වෙනි ශ්‍රේණි සඳහා කියලා සිංහලෙන්.

පි : ඔව්. Year maybe පන්ති. Because I can remember when I was in small change happened. Before I started the school it's the change happened

ප්‍ර : එතකොට 355A බලන්න, A වශයෙන් ලකුණු කරලා තියෙන්නේ පිටු අංක කීයද?

පි : A වශයෙන් ලකුණු කරලා තියෙන්නේ පිටු අංකයක් සඳහන් වෙන්නේ නැත.

ප්‍ර : එහි පිටු අංකයක් සඳහන් වෙන්නේ නැහැ, නමුත් මොන වසරවල්වලදී ද මෙම 355 කියලා කියන පොත මුද්‍රණය කරලා තියෙන්නේ කියන එක එහි සඳහන් වෙනවද?

පි : ඔව් සඳහන් වෙනවා.

ප්‍ර : අවස්ථා කීයකදී එය මුද්‍රණය කරලා තියෙනවද?

පි : 3 කදී,

ප්‍ර : මොන මොන අවුරුදුවලදී ද?

පි : 1981, 1982, 1984

ප්‍ර : එතකොට කවුරුද ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ මේ පොත?

පි : අධ්‍යාපන ප්‍රකාශක දෙපාර්තමේන්තුව විසින් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ මුද්‍රණය කරවා පළ කරන ලද.

ප්‍ර : එතකොට 355B කියලා ඔබ ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන්නේ මොකක්ද?

පි : ඒකේ අධ්‍යාපන සේවා ඇමතිගේ පණිවිඩයක් සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර : 1 වෙනි පොතේ තිබුනේ කතෘ මණ්ඩලය තමයි 354C (iv) කියලා, නමුත් ඔබ කියන්නේ 355 කතෘ මණ්ඩලයක් ගැන සඳහන් වෙන්නේ නැහැ කියලා?

පි : සඳහන් වෙන්නේ නැහැ.

ප්‍ර : සංස්කාරක මණ්ඩලය නේද?

පි : සංස්කාරක මණ්ඩලය.

ප්‍ර : එහෙනම් පෙර වදන තියෙන්නේ මොන පිටුවේද?

පි : පිටු අංකය සඳහන් වෙලා නැහැ.

ප්‍ර : නමුත් ඔබ එය 355C වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරලා තියෙනවා?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප : එතකොට 355D කියලා මොකක්ද ඔබ ලකුණු කරලා ඉදිරිපත් කර තියෙන්නේ?

පි : 280 වෙනි පිටුව.

ප : මොකක්ද ඒ පිටුවේ සඳහන් වෙන්නේ මොකක් හරි පාඩමක් සඳහන් වෙනවද?

පි : 47 වෙනි පාඩම අපරාධය හා දඬුවම කියන පාඩමේ 1 වෙනි පිටුව.

ප : එතකොට 355 E කියලා ඔබ ලකුණු කර ඉදිරිපත් කරලා තියෙන්නේ මොකක්ද?

පි : 281 වෙනි පිටුව එම පාඩමේම.

ප : 355F කියලා ලකුණු කර ඉදිරිපත් කර තියෙන්නේ ?

පි : එම පාඩමේම 282 වෙනි පිටුව.

ප : එතකොට එහෙම නම් 355G වශයෙන් ඔබ ලකුණු කරලා ඉදිරිපත් කර තියෙන්නෙත් ඒ පාඩමේම කොටසක් කියලා මා කිව්වොත් හරිද?

පි : ඔව් හරි.

ප : එතකොට 355G කියන පිටුවේ තමයි ඔය අපරාධය හා දඬුවමට අදාලව අර ද්‍රවිඩ භාෂාවෙන් මුද්‍රණය කරලා තිබු පොතේ දකින්නට තිබු ආකාරයටම වගුවක් සටහන් කරලා අපරාධය මොකක්ද දඬුවම මොකක්ද, සටහන මොකක්ද කියන එක සඳහන් වෙලා තිබුණා?

පි : ඔව්.

ප : C354 හි C355 හි නොගැලපීම් තියෙනවා කියලා ඔබ කිව්වා මේ වගුවට අදාලව?

පි : ඔව්.

ප : ඒ නොගැලපීම් සඳහන් වගු සඳහන් වෙන්නේ නැවත කිව්වොත් මොන පිටුවලද?

පි : 355 කියලා මම ඉදිරිපත් කරපු පොතේ 283 වෙනි පිටුවේ 354 කියලා සඳහන් කරලා ඉදිරිපත් කරන ලද පොතේ 328 වෙනි පිටුවේ.

ප : දැන් ඔබ කිව්වා ඔය යම් යම් වැරදි සම්බන්ධයෙන් දෙන්න පුළුවන් දඬුවම පිළිබඳව මේ වගුවේ සඳහන් වෙනවා කියලා මේ පොත්වල?

පි : ඔව්.

ප : එතකොට කවුරු හරි දුරාචාරයෙහි යෙදුනහොත් තියෙන දඬුවම තමයි කස පාර 100 ක් දෙන්න පුළුවන් මරණීය දඬුවම දෙන්න පුළුවන්.නේද?

පි : ඔව්.

ප : ඔබ දන්නවද ලංකාවේ කස පහර ලබාදීමේ ඒ හැකියාව අපේ නීති පොතෙන් අයින් කරලා තියෙනවා කියලා?

පි : ඔව්.

ප : ශ්‍රී ලංකාවේ ඒ සදහා දැන් නීතිමය ප්‍රතිපාදන නැහැ?

පි : ඔව්.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නමුත් ඔය පොතේ සඳහන් වන ආකාරයට 2015 වෙන කල් එහෙම හැකියාවක් තිබුණාය කියලා තමයි සඳහන් වෙන්නේ. දෙන්න පුළුවන් එක ආකාරයක දඬුවමක් තමයි කස පහර?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ හැරෙන්න මරණීය දඬුවම තව එකක් මේ දුරාචාරයට දෙන්න පුළුවන්?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබ දන්නවද ප්‍රායෝගිකව ලංකාවේ කොහේ හරි ඔවැනි දඬුවම් මුස්ලිම් ජාතිකයින්ට පනවනු ලැබූ අවස්ථා තිබුණද කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ ගැන ඔබට විස්තරයක් කරන්න පුළුවන්ද?

පි : මාවනැල්ල වැනි ප්‍රදේශවල ඒ වගේ දඬුවම් ලබා දුන්නා කියලා මම අහලා තියෙනවා. ඒත් මට ඒක ඇහෙන් දැක ගැනීමට හම්බ වුනේ නැහැ, හැබැයි 2016 දී ඔක්තෝබර් මාසේ පුත්තලම ප්‍රදේශයේ පල්ලියක දුරාචාරයේ යෙදුනාය කියන චෝදනාව මත මුස්ලිම් කාන්තාවකට එවැනි දඬුවමක් කස පහර 100 ක් ලබා දුන් සිද්ධියක්, lashes 100 ක් කලා කියන එක මාධ්‍යවල සඳහන් වෙලා තිබුණා.

ප්‍ර : මොන මාධ්‍යයේද ඔබ දැක්කේ ඔය කරුණු?

පි : Daily News, Asian Mirror, Daily Mirror

ප්‍ර : ඒ එකම කරුණ පිළිබඳවද ඔය අවස්ථා තුනේදී ම ඔබට කියවන්නට ලැබුනේ?

පි : ඔව එකම කරුණ පිළිබඳව.

ප්‍ර : කොහේදී ද ඔය සිද්ධිය සිද්ධ වෙලා තියෙන්නේ?

පි : පුත්තලම දිස්ත්‍රික්කයේ නල්ලන්දළුව කියන ප්‍රදේශයේ තියෙන පල්ලියක.

ප්‍ර : ඔය බාගත කර ගන්නා ලද Downloaded ඒ ලේඛන තුනම එකම සිද්ධියට අදාල ලේඛන කියලා ඔබ කිව්වා?

පි : ඔව්.

ප්‍ර : ඒවා මොන මොන දවස්වල ප්‍රකාශයට පත් කරලා තිබුණ ලේඛනද?

පි : එම වසරේදීම 2016 ඔක්තෝබර් මාසේ 24 වෙනිදා දෙකක් ප්‍රකාශයට පත් කරලා තියෙනවා, Daily News වෙබ් අඩවියේ 2016 ඔක්තෝබර් 24 වෙනිදායි, Asian Mirror වෙබ් සයිඩ් එකෙත්, ඔක්තෝබර් 29 වෙනිදා එම අවුරුද්දේම. Daily Mirror වෙබ් අඩවියේ ඔක්තෝබර් 24 වෙනිදා එම අවුරුද්දේම පලවෙලා තිබුණා.

ප්‍ර : එතකොට පුත්තලමේ කිව්වානේ ඔය සිද්ධිය සිද්ධ වෙලා තියෙන්නේ?

පි : ඔව්.

ප්‍ර : ඔබ කිව්වා යම් කෙනෙක් දුරාචාරයේ යෙදීමක් සම්බන්ධයෙන් කියලා?

පි : ඔව් චෝදනාව මත.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඒ දුරාචාරයේ යෙදිලා තියෙන්නේ කාන්තාවක්ද පුරුෂයෙක්ද ඔය කියන විදියට?

පි : කාන්තාවක්.

ප්‍ර : ඔබ කිව්වානේ 100 සැරයක් පහර කෑමකට ලක් වෙලා තියෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : කවුද ඒ කාන්තාවට පහර දුන්නාය කියලා ඔබ බාගත කර ගන්නා ලද ලේඛන අනුව අනාවරණය වෙන්නේ?

පි : ඒ ප්‍රදේශයේ පල්ලියේ සම්බන්ධ පිරිසක් කියලා තමයි Administrative panel of the Jumma Mosque කියලා තමයි සඳහන් වෙලා තියෙන්නේ ඉංග්‍රීසියෙන්. පල්ලියේ පාලකයෝ.

ප්‍ර : කුමන හේතුවක් නිසාද ඇය පහර කෑමකට ලක් වෙලා තියෙන්නේ?

පි : මේ ප්‍රවෘත්ති තුනේම බලන කොට එයා දුෂණයට ලක් වෙලා She made a complain to the Police'. පොලිසියට එයා පැමිණිල්ලක් කරලා තියෙනවා එයා ලිංගික දුෂණයට ලක් වුණා කියලා. ඊට පස්සේ තමයි පල්ලියෙන් පහර දීම කරලා තියෙන්නේ.

ප්‍ර : ඉතින් ඇයනේ වින්දිත තැනැත්තිය, ඇයි ඇය පහර කෑමකට ලක් වෙන්නේ?

පි : ඉස්ලාම් ආගමට අනුව කාන්තා කෙනෙකුට ලිංගික සම්බන්ධතාවයේදී එයාගේ කැමැත්ත පල කිරීමට කිසිම අවස්ථාවක් නැහැ. There's no way a woman should give the consent for a sexual relationship at any level either can be a wife or a slove. So Islam only says whether the relationship is according to its own terms and conditions legal or illegal. ඉස්ලාම් ආගමට අනුව වැරදි කිහිපයක් සඳහන් කරලා තියෙනවා. හොරකම, දුරාචාරය, මරණය, ආගම අතහැර යාම වැනි දේවල්. කොයි තැනකවත් දුෂණය කියන වරදක් සඳහන් වෙලා නැහැ Rape කියන එක ඉස්ලාම් ආගමේ වරදක් හැටියට දකින්නේ නැහැ.

ප්‍ර : So the consent of the partner is not a must in Islam?

පි : It is not only that. If a woman rejected the call of a husband there's a Hades saying until if the husband goes to bed with on anger when the wife rejects until the next morning she will be cursed till the next morning by the angels of the God.

ප්‍ර : දැන් ඔය පහර කෑමට ඔය පුත්තලම පල්ලියේ ඒ පාලක මණ්ඩලය වෙතින් ඇය ලක් වුණ අවස්ථාව වන විට පොලිසිය ඇය විසින් පොලිසියට ඉදිරිපත් කරන ලද ඒ දුෂණයට අදාල චෝදනාව සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කරලා තිබුණද ඔය ලේඛණ අනුව Daily Mirror ?

පි : Yes, While Police investigation to apprehend the suspect were in progress.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොකක්ද ඒ ගැන සඳහන් වෙලා තියෙන්නේ?

පි : පොලිසිය ඒ ගැන කටයුතු කිරීමේදී සැකකරුවාව හොයා ගැනීමට කටයුතු කරමින් සිටියදී මේ සිදුවීම වෙලා තියෙනවා.

ප්‍ර : ඒ පිළිබඳව සඳහන් වෙන්නේ ඔබ කිව්වානේ දැන් ලේඛන 3 ක් බාගත කර ගත්තාය කියලා,?

පි : ඔව්.

ප්‍ර : Daily News එකේ සඳහන් වූ එකේද, Asian Mirror කියන එකේද, නැත්නම් Daily Mirror එකේ තිබිච්ච එකේද?

පි : මම දැන් සඳහන් කරපු කරුණු Daily Mirror වෙබ් අඩවියේ සඳහන් වෙලා තියෙන ප්‍රවෘත්තිය.

(ස්වාමිණි අවසර අයැද සිටිනවා 2016 ඔක්තෝබර් මාසේ 24 වෙනිදා Daily News පුවත් පතෙහි සටහන් වී තිබූ මෙම සිද්ධියට අදාල වාර්තා කිරීම C356 ලෙස ලකුණු කිරීමටත්,

2016 ඔක්තෝබර් මාසයේ 29 වන දින, Asian Mirror පත්‍රයෙහි වාර්තා වී ඇති මෙම පුවත බාගත කර ගන්නා ලද ලේඛනය C356A වශයෙන් ලකුණු කිරීමටත්,

2016 ඔක්තෝබර් 24 වෙනි දින Daily Mirror පත්‍රයෙහි ප්‍රකාශයට පත් කොට එයින් බාගත කර ගන්නා ලද ලේඛනය C356B වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කර සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ සහිරා විද්‍යාලයේ මාවනැල්ලේ ඉගෙනීමට පැමිණෙන්නේ 1990 වර්ෂයේදී?

පි : ඔව්.

ප්‍ර : ඒ එන විට ඔබ කීවෙනි පන්තියටද ගියේ ඉස්සෙල්ලාම?

පි : 8 වන පන්තියට Year eight

ප්‍ර : දැන් මාවනැල්ල සහිරා විද්‍යාලය සම්පූර්ණයෙන්ම මුස්ලිම් පාසලක්?

පි : ඔව්.

ප්‍ර : දැන් එහෙම සම්පූර්ණයෙන්ම මුස්ලිම් ළමයින් ඉන්න පාසැල්වල සාමාන්‍යයෙන් ඉගැන්වීම සඳහා භාවිතා කරන්නේ සිංහල පොතක්ද, දෙමළ පොතක්ද?

පි : දෙමළ පොතක්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔබ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ඉදිරියේ සාක්ෂි දුන්නා කියලා මේ ගරු කොමිෂන් සභාවට අද දින ප්‍රකාශ කරනු ලැබුවා නේද?

පි : ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : එම අවස්ථාවේදි ඔබෙන් ප්‍රශ්න කරන ලද මණ්ඩලයට ඒ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ මණ්ඩලයට විවිධ ජාතිවල පුද්ගලයින් ඇතුලත් වුණාද?

පි : ඔව්.

ප්‍ර : මුස්ලිම් ජන කොටියාශය නියෝජනය කරමින් එහි නියෝජනයක් තිබුණද?

පි : ඔව්.

ප්‍ර : එක්කෙනෙක්ද කිහිප දෙනෙක්ද?

පි : එක්කෙනෙක්.

ප්‍ර : ඒ කවුද?

පි : මුස්ලිම් කොංග්‍රස් පක්ෂයේ නායක හිටපු අමාත්‍ය රවුෆ් හකීම් මහතා.

ප්‍ර : පසුගිය අවස්ථාවේ දී ඔබ මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා ඔබෙන් ප්‍රශ්න කරනු ලැබූ අවස්ථාවලදී එවකට ගරු අමාත්‍ය රවුෆ් හකීම් මහතා විසින් ඔබගේ පෞද්ගලික තොරතුරු දැන ගැනීමට තමයි වඩා වැඩි උනන්දුවක් දක්වනු ලැබුවේය කියලා?

පි : ඔව්.

ප්‍ර : ඔබ මේ අධ්‍යාපනය සඳහා ළමයින්ට පාවිච්චි කරන අද දින මේ ගරු විනිශ්චය සභාවට ඉදිරිපත් කරපු C354, C355 කියන පොත් එම පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ඉදිරියේත් ඉදිරිපත් කලා කිව්වොත් මා නිවැරදි ද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබෙන් ප්‍රශ්න කිරීමක් එවකට ගරු අමාත්‍ය රවුෆ් හකීම් මහතා ඔබෙන් සිදු කෙරුවද මේ උගන්වන දේවල්, මේ Syllabus බස් එකට C354 සහ C355 ට අදාලව?

පි : නැහැ.

ප්‍ර : අනෙකුත් කමිටු සාමාජිකයෝ ඔබෙන් ඒ පිළිබඳව ප්‍රශ්න කෙරුවද?

පි : ඔව්.

ප්‍ර : ඔවුන් දීර්ඝ ලෙස ඔබෙන් ප්‍රශ්න කලාද?

පි : ඔව්.

ප්‍ර : ඔබ කියන්නේ නමුත් මුස්ලිම් නියෝජනයක් තිබුණු එවකට ගරු අමාත්‍ය රවුෆ් හකීම් මහතා එවැනි ප්‍රශ්න කිරීමක් ඔබෙන් මේ විෂය වස්තුව පිළිබඳව ඇහුවේ නැහැ කියලා?

පි : ඔව්.

ප්‍ර : ඔබට යම් අවස්ථාවකදි ඔබ පාර්ලිමේන්තු කාරක සභාවේ ලබා දෙනු ලැබූ සාක්ෂිය කියවන්නට ලැබුණද?

පි : ඔව්.

ප්‍ර : එහි පිටපතක් ඔබ මේ ගරු කොමිෂන් සභාවට විමර්ශන අවස්ථාවේදී ලබා දෙනු ලැබුවද?

පි : පිටු කිහිපයක් ලබා දෙනු ලැබුවා.

President's Secretariat's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : එය MIR47 වශයෙන් ඔබ ලකුණු කරලා ඉදිරිපත් කෙරුවායි කියලා කිව්වොත් විමර්ශන අංශයට ඒක නිවැරදි ද?

පි : ඔව්. ඒ වාර්තාවේ පිටු අංකය මට කියන්න පුළුවන්ද?

ප්‍ර : ඔව් කියන්න බලන්න

පි : 748 අඩංගු වෙලා තියෙන්නේ මගේ ප්‍රකාශය නෙමෙයි. 748 අඩංගු වෙලා තියෙන්නේ වෙන දවසක රවුල් හකීම් ඇමතිතුමා

ප්‍ර : ඔබ ඉදිරිපත් කරලා තියෙන්නේ MIR46/2020 ?

පි : 46 දි මම ඉදිරිපත් කරලා තියෙන්නේ මගේ ප්‍රකාශයේ කොටසක්. පිටු කිහිපයක්.

ප්‍ර : ඔබේ සාක්ෂිය අඩංගු වෙන්නේ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාවේ 1 වන වෙළුමේ...

පි : 586 වන පිටුවේ ඉදලා 601 වෙනි පිටුව දක්වා.

ප්‍ර : 586 වන පිටුවේ ඉදලා 601 වන පිටුව දක්වා නේ?

පි : ඔව්.

ස්වාමිණි අවසර අයැද සිටිනවා 2019.අප්‍රේල් මස 21 වන දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාවේ සාක්ෂි සටහන්වල පලමුවන වෙළුම C357 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමටත්,

(මේ අවස්ථාවේදි ගරු සභාපතිතුමා සහ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය එම ලේඛනය සම්බන්ධයෙන් යම් සාකච්ජා කරයි)

එසේ නම් ස්වාමිණි මා කරන ලද ඉල්ලීම නැවත කිරීමට කැමතියි. ඒ තමයි සංශෝධනය කොට, මෙම සාක්ෂිකරු විසින් පාර්ලිමේන්තු විශේෂ කාරක සභා වාර්තවේ ලබා දී තිබෙන බවට 2019. ජුනි මස 20 වන බ්‍රහස්පතින්දා ලබා දී තිබෙන සාක්ෂිය C357 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කර සිටිනවා. ඔහුගේ සාක්ෂියේ ස්වාමිණි පිටු අංක 586 සිට 601 දක්වා දිවෙනවා.

ප්‍ර : ළමයින්ට ලබාදෙන අධ්‍යාපනය සම්බන්ධයෙන් මේ ඉස්ලාම් ධර්මයට අදාලව ගැන සාකච්ජා කරන කොට ගුරු අත්පොත් ඒ සඳහා තියෙනවද?

පි : ඔව්.

ප්‍ර : ඒ තියෙන අත්පොත් සම්බන්ධයෙන් ඒවායේ කරලා තියෙන යම් නිර්දේශ සම්බන්ධව යම් අවස්ථාවකදි ගැටළු සහගත තත්ත්වයක් පිළිබඳව ඔබේ අවධානයට යොමු වුණාද?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද ඒ අවස්ථාව?

පි : නෙත් FM බැලුම්ගල වැඩ සටහනක සූෆි නිකායට අයිති පුද්ගලයින් දෙන්නෙක් ඒකෙන් එක්කෙනෙක් මවුලවි කෙනෙකු ඒකට සහභාගි වෙලා ගුරු උපදේශ අත්පොත්වල තියෙන ගැලපෙන්නේ නැති නැත්නම් රටේ නීතියට ගැලපෙන්නේ නැති දේවල් පිළිබඳ පැහැදිලි කිරීමක් කරලා තිබුණා. ඒක මම නෙත්

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

FM ආයතනයේ YouTube Channel එකෙන් ඒ Video එක අරන් මේ සභාවට ඉදිරිපත් කලා.

ප : ඒ කියන්නේ නෙත් FM එකේ තියෙන YouTube එක මාර්ගයෙන් ලබා ගැනීමේ හැකියාව තියෙනවා මේ බැලුම්ගල වැඩ සටහන ඔබ කියන්නේ ඒකයි?

පි : ඔව්.

ප : ඒ ආකාරයට තමයි ඔබ මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන සංයුක්ත තැටියට අදාල ඒ ලේඛනය ලබා ගත්තේ?

පි : ඔව්.

ස්වාමිණි අවසර අයැද සිටිනවා එය දර්ශනය කිරීම සඳහා.
(මේ අවස්ථාවේ එම වීඩියෝ දර්ශනය තිරයේ දිස්වේ)

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

ප : සාක්ෂිකරු C358 වශයෙන් ලකුණු කරන ලද මෙම CD පටියේ නෙත් FM බැලුම්ගල වැඩ සටහනට සහභාගී වන පුද්ගලයින් දෙදෙනාගේ නම් ඔබ දන්නවද?

පි : ඔව් නම් දන්නවා.

ප : කරුණාකර කියන්න පුළුවන්ද?

පි : නිල් පාට ඉරි ඉරි තියෙන කමිසයක් ඇඳන් හිටපු ඒ සාකච්ඡාව ඉස්සෙල්ලාම පටන් ගන්න එක්කෙනාගේ නම ඉන්තිකාවේ අහමඩ් සූෆර් ආචාර්ය.

ප : අනෙක් එක්කෙනා?

පි : ඊෂාන් කාදී එයා මව්ලවි කෙනෙක්. මේ දෙන්නම කලින් මෙතන ප්‍රශ්නයක් මට ඉදිරිපත් වුණා කොළපාට ටර්බන් අදින පිරිසක් ගැන ඒ නිකායට අයිති දෙන්නෙක්.

මේ අවස්ථාවේදී C358 වශයෙන් ලකුණු කරන ලද CD පටයේ සටහන් වී ඇති වැඩ සටහන නරඹා එහි පටිගත වී ඇති කොටසේ සිංහල Transcript එකක් කොමිෂන් සභාවට ලබා දෙන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරනවා සිංහල ලඝු ලේඛිකාවක් මාර්ගයෙන්. එසේ ලබා දුන් පසු එම Transcript එක C358A වශයෙන් ලකුණු කරන ලෙසටද නියෝග කරනවා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>:

ප : මා ඔබේ අවධානයට යොමු කරනවා 11 වෙනි ශ්‍රේණියට මුද්‍රණය කරලා තියෙන සිංහල භාෂාවෙන් ඉස්ලාම් ධර්මයට අදාල අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරලා තියෙන පෙළ පොතක්?

පි : හරි.

ප : ඒ පෙළ පොත මොන වසරේද මුද්‍රණය කරලා තියෙන්නේ?

පි : 2015, 2016, 2017

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඒ කියන්නේ C354 සහ C355 කියන පොත්පත්වල කාලය අවසන් වුණාට පස්සේ ළමයි අතරට ගියපු පොතක්ද මේ 2015, 2016, 2017 වසරවලදී මුද්‍රණය කරලා ඔබ ලඟ දැන් තියෙන්නේ?

පි : ඔව්.

ප : එහි සංස්කරණ මණ්ඩලයක් ඉදලා තියෙනවද?

පි : ඔව්.

ප : ඒ අය කුමන තානාන්තර දරන අයද? ඒ අය මුස්ලිම් ජාතිකයින්ද ඉස්සෙල්ලාම?

පි : මුස්ලිම් හා මුස්ලිම් නොවන අයගේ නම සඳහන් වෙලා තියෙනවා.

ප : ලේඛක මණ්ඩලයේ?

පි : නැහැ ලේඛක මණ්ඩලයේ මුස්ලිම් අයගේ නම සඳහන් වෙනවා. ගුරු උපදේශක, නියෝජ්‍ය විදුහල්පති, Resource person ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජ්‍යෙෂ්ඨ උපගුරු, උපගුරු වැනි තනතුරු දරන අයගේ නම් ලැයිස්තුවක් සඳහන් කරලා තියෙනවා.

ප : දැන් ඔබ රිද්වත් කියන වරද පිළිබඳව C354 සහ C355 ඒ වගුවේ තියෙන කරුණු ගැන කිව්වානේ?

පි : ඔව්.

ප : රිද්වත් කියන වරද පිළිබඳව මේ 2015 මුද්‍රණය කරන ලද පොතෙහි තියෙනවද?

පි : කෙලින්ම ඒක වරද හා දඬුවම කියන විදියට නැතුව,

ප : ඒ කියන්නේ එම වරද හා දඬුවම කියන පරිච්ඡේදය මේ 2015 මුද්‍රණය කරන ලද පොතෙන් ඉවත් කරලා තියෙනවද?

පි : ඔව් පොතෙන් ඉවත් කරලා තියෙනවා. ඒ විතරක් නෙමෙයි ගොඩක් දේවල් වෙනස් පොත් දෙකකම අතර.

ප : මොනවද තියෙන වෙනස්කම් කියලා ඔබට කෙටියෙන් කියන්න පුළුවන්ද?

පි : දෙකේම content එක subject wise tolally different. පොත් දෙකම වෙනස් කරලා තියෙනවා 11 වෙනි 10 වන ශ්‍රේණිවලට අනුව පොත් දෙකම වෙනස් කරලා තියෙනවා. පොතේ අඩංගු කරුණුත් වෙනස් වීමක් සිදුවෙලා තියෙනවා යම්කිසි විදියකට.

ස්වාමිණි 2015 සිට 2018 දක්වා වූ වර්ෂවල මුද්‍රණය වූ බවට සඳහන් වන 11 වන ශ්‍රේණිය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ඉස්ලාම් ධර්මයට අදාල පොත C359 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා.

එසේම එහි ලේඛක මණ්ඩලය පිළිබඳව සඳහන් වෙන්නේ (vii) වශයෙන් සඳහන් වන පිටුවේ එම පිටුව C359A අක්ෂරයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප : රිද්වත් කියන වරද පිළිබඳව මේ C359 පොතේ සඳහන් වෙනවද?

පි : ඔව් 14 වෙනි පිටුවේ රිද්වත් ගැන සඳහන් වෙනවා.

ප : මොනවද ඒකේ සඳහන් වෙන්නේ?

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : රිද්වත් කියන්නේ මොකක්ද, ඒ රිද්වත් එක කරන පුද්ගලයාව කොහොමද සලකන්න ඕනේ කියන දේ එතන සැලකීමට ලබන විදිය එතන සඳහන් කරලා තියෙනවා.

ප්‍ර : අර C354 සහ C355 ඔබ කිව්වා සඳහන් කරලා තියෙනවයි කියලා රිද්වත් කියන වරද සිදු කරන ලද පුද්ගලයාට කොයි ආකාරයටද දඬුවම් කරන්න ඕනේ කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔය C359 කියලා ඔබ දැන් ලකුණු කරලා ඉදිරිපත් කරන පොතේ රිද්වත් කියන වරදට පමුණුවන්න පුළුවන් දඬුවම මොකක්ද කියන එක කියලා ඒවයේ සඳහන් වෙනවාද?

පි : නැහැ දඬුවමක් සඳහන් වෙලා නැහැ, ඒ වුණාට ධර්ම ද්‍රෝහී කියන වචනය එතන සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර : ඒකේ වැරැද්දක් තියෙනවද?

පි : දෙමළ පොතේ ඒකට භාවිතා කරලා තියෙන වචනය තමයි සමයත්‍රෝහි කියන එක.

ප්‍ර : සමය කියන්නේ ආගම නේද?

පි : ආගම. ආගමට ද්‍රෝහි කරන කෙනා හැටියට මේකත්....

ස්වාමිණි රිද්වත් කියන වරද පිළිබඳව සඳහන් වන අංක 14 දරන පිටුව C359B අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර : දැන් මීලඟට මා ඔබෙන් ප්‍රශ්න කරන්නට යන්නේ ඔබ යම් අවස්ථාවල් කිහිපයකදී ශ්‍රී ලංකා පොලිසියට ඔබට තිබෙන තර්ජන පිළිබඳව පැමිණිලි කරනු ලැබුවා නේද?

පි : ඔව්.

ප්‍ර : අවස්ථා කීයකදී ඔබ ප්‍රධාන වශයෙන් එසේ පැමිණිලි කරලා තියෙනවද?

පි : හතරක්.

ප්‍ර : 1 වන අවස්ථාව කවදද?

පි : 2016 ජූලි 20 වෙනිදා

ප්‍ර : කාටද පැමිණිලි කළේ?

පි : ත්‍රස්ත විමර්ශන ඒකකයට TID

ප්‍ර : මොනවා ගැනද ඔබ පැමිණිලි කළේ?

පි : ඒ වන විට මට ලැබිලා තිබෙනව මුහුණු පොත හරහා මරණ තර්ජන. ඒ ගැන පැමිනිලි කරන්න තමයි මම ගියේ. ඒ දවස මම දීර්ඝ වාර්තාවක් Statement දුන්නා මේ රටේ ඒ වෙලාවේ මගේ දැනුමේ හැටියට සිදුවෙමින් පැවතිච්ච ISIS මතවාදයට සම්බන්ධ ත්‍රස්ත ක්‍රියාවට යොමු වීමට පුළුවන් කියලා හිතන පුද්ගලයෝ ගැනත් ඒගොල්ලන්ගේ ක්‍රියාකලාපය ගැනත් මම ඒ දවස්වල විස්තර ලබා දුන්නා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

Provisional Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ විස්තර ලබා දුන්න අයගේ නම් අතර පාස්කු දින ප්‍රහාරයෙන් මියගිය කාගේ හරි නමක් තිබුණද?

පි : ඔව්.

ප්‍ර : කාගේ නම්ද තිබුනේ?

පි : සහරාන්ගේ නම තිබුණා.

ප්‍ර : සහරාන්ගේ නම පමණයිද?

පි : සහරාන්ගේ නම තිබුණා. ඊට පස්සේ අත්අඩංගුවට පත් වෙලා ඉන්න කිහිප දෙනෙක්ගේ නමකුත් තිබුණා.

ප්‍ර : කවුද ඒ?

පි : නවුෆර් මොහොමඩ්. නවුෆර් මවුලවි අපි දැන් එයා ගැන කතා වුණා. රෑමි අබ්දුල් අසීස්, නැත්නම් රෑමි නිසාර් කියන පුද්ගලයා. එයත් දැන් අත්අඩංගුවේ ඉන්නේ. රිස්වි මාවනැල්ලේ අත්අඩංගුවට පත් වෙච්ච මරාගෙන මැරෙන බෝම්බය සදහා පුහුණුව ලැබූ එක්කෙනෙක් හැටියට තමයි මාධ්‍යය හරහා දැන ගන්න ලැබුනේ. එයාගේ නම තිබුණා සෞදි අරාබියාවෙන් අත්අඩංගුවට අරන් ලංකාවට ගෙනාපු රිලාම් මර්සුක්. එයාගේ රිලා මර්සුක්ගේ නම තිබුණා. රිලා මර්සුක් අන්වරල් අවුලාකී කියන Fundamentalist Preacher ගේ පොත් පවා දෙමළට පරිවර්ථනය කරලා PDF හරහා ඊමේල් හරහා PDF format එකෙන් ගොඩක් අයට ලබා දුන්නා. ඒ රිලා මර්සුක්ගේ නම තිබ්බා. තව හුස්නි මුබාරක් කියලා අට්ටාලවේනේදි අත්අඩංගුවට පත් වුනා. එයාගේ නමත් තිබුනා.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : රිලා මර්සුක්ට තව නමක් කියනවද මිල්හාන්ද?

පි : මිල්හාන් කියන්නේ වෙන එක්කෙනෙක්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : කවද්ද මේ complain එක කලේ?

පි : 2016 ජුලි 20 වෙනිදා.

ප්‍ර : ඔබගේ ප්‍රකාශය සටහන් කර ගත්තද?

පි : සටහන් කර ගත්තා. ASP ජගත් නිශාන්ත මහත්තයගේ යටතේ පැවැත්වෙච්ච Unit එකේ ඒ මහත්තයාගේ අනුමැතිය මතයි මම මේක කලේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔබ 2016 ජුලි මාසේ 20 වෙනිදා ඒ පැමිණිල්ල කරන්න හේතු වුනේ ඔබේ මුහුණු පොතට එකතු කරන ලද එහි තබන ලද යම් සටහන් කියලා මා කිව්වොතින් නිවැරදිද?

පි : ඒක පොඩ්ඩක් අමාරුයි ඒකට එක වචනයෙන් පිළිතුරක් දෙන්න. මොකද ඒ වෙලාවේ තමයි ISIS ක්‍රියාකාරිත්වය අන්තර් ජාලය හරහා ලංකාව තුල ශක්තිමත් වෙමින් පවතින තත්ත්වයක් මම

Translation Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දැක්කා. ඒත් එක්කම තමයි මට මේ මරණ තර්ජනත් මට එන්න පටන් ගත්තේ. මට විරුද්ධව මරණ තර්ජන එල්ල කරපු Set එක මෙහෙව්වේ රින්සාන් අමානුල්ලා කියන පුද්ගලයා තමයි ඒ කට්ටිය පෙළඹෙව්වේ.

ප්‍ර : කොහොමද ඒක ඔබ දන්නේ?

පි : එයා මම ගැන ගොඩක් Facebook එකේ ලිව්වා. අනික් කට්ටිය

ප්‍ර : ඔබටත් මුහුණු පොත් ගිණුමක් තිබෙනවා නේ?

පි : ඔව් මටත් තියෙනවා.

ප්‍ර : ඒ ගිණුමේ තමයි ගරු සභාපතිතුමා ප්‍රශ්න කරපු අවස්ථාවේ යම් යම් පුද්ගලයින් ගැන සඳහන් කරලා යම් යම් ප්‍රකාශයන් ඔබ විසින් ලියනු ලැබුවේ?

පි : ඔව්.

ප්‍ර : දැන් ඒවා සම්බන්ධයෙන් තමයි ඔබ කියන්නේ මේ මරණ තර්ජන ඔබට එල්ල වුණාය කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ ඒ පවතින අදහස්වලට විරුද්ධව ද ලිව්වේ?

පි : මම ඉස්ලාම් ආගම ගැන ධනාත්මක විවේචන ඉදිරිපත් කලා. ඒ වෙන කොට මම මේ ඉස්ලාම් ආගම අතහැරපු කෙනෙක් හැටියටවත් මම මාව හඳුන්වලා හිටියේ නැහැ. ඒ වුනාට ඒ කට්ටිය කොහොම හරි ඒක හඳුනා ගත්තා.

ප්‍ර : ඔබ ආගම අතහරින ලද කෙනෙක් කියලා?

පි : ආගම අතහැරලා කියලා. මොකද අපේ පාසල් මම ඉදිරිපත් කරපු C355 න් ඉදිරිපත් කරපු පාසැල් පොතෙත් මුල් පිටුවල සඳහන් වෙලා තියෙනවා කෙනෙක් රිද්වත් කරන්න, කුමන කුමන විදියටද රිද්වත් සිද්ධ වෙන්නේ කියලා. ක්‍රියාවෙන්, වචනයෙන් ඒ වගේ Subject 3 යටතේ කරුණු කිහිපයක්ම සඳහන් කරලා තියෙනවා. එතකොට ඒක ඉගෙන ගත්තු අයෙකුට මගේ Post ටික බලන කොට මම පිලි නොගත්තාට මම ගියා කියන මතයට ඒගොල්ලන්ට එන්න පුළුවන්. උගන්වලා තියෙන හින්දා. එතකොට මට විරුද්ධව මරණ තර්ජන එන්න පටන් ගත්තා.

ප්‍ර : ඒ පිලිබඳව තමයි ඔබ ගිහිල්ලා පොලිසියට 2016 ජූලි මාසේ 20 වෙනිදා පැමිණිලි කරනු ලැබුවේ.

පි : ඔව් පොලිසිය කියන්නේ TID එකට.

ප්‍ර : ඒ කියන්නේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට?

පි : කොට්ඨාශයට.

ප්‍ර : ඔබට ඒ සම්බන්ධයෙන් කිසියම් ප්‍රතිචාරයක් ලැබුණද?

පි : ඊට පස්සේ රාජ්‍ය බුද්ධි අංශයෙන් කියාගෙන නිලධාරීන් දෙන්නෙක් ගෙදරට ඇවිල්ලා ආපහු මගෙන් ප්‍රකාශ ලියාගෙන ගියා. හැබැයි ඒ ගැන කිසිම Action එකක් ගත්තා කියලා අද වනතුරු මම දන්නේ නැහැ. ඒකට සම්බන්ධ පුද්ගලයා තාම නිදහසේ රාජ්‍ය සේවයේ තනතුරුවල තාම ඉන්නවා මම දන්න තරමට.

FAIR COMMENT BY JEZEEM

ප : ඔබ දන්නවද ඔබ විසින් කරන ලද එම පැමිණිල්ල සම්බන්ධයෙන් ඒ කියන්නේ TID එකට

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

පි : ඔබ දැන් කිව්වා තවමත් ඒ පුද්ගලයෝ රාජ්‍ය සේවයේ ඉන්නවා කියලා, ඔබ අදහස් කලේ මොකක්ද?

ප : රජයේ සේවකයෝ හැටියට තාම ඒගොල්ලෝ කටයුතු කරගෙන තාම අද වෙන කල් ඉන්නවා. ඒගොල්ලන්ට විරුද්ධව කිසිම පරික්ෂණයක්වත් පැමිණිල්ලක් කලා කියන එක ගැන මම දන්නේ නැහැ. ඒකේ මම රින්සාන් අමානුල්ලා කියන අයගේ නම කිව්වා. එයා තමා ඒ පෙළඹවීම් ඔක්කොම කලේ.

පි : ඔහු රාජ්‍ය සේවකයෙක්ද?

ප : එයා රාජ්‍ය සේවකයෙක්, ඔහු විභාග දෙපාර්තමේන්තුවේ දැනට නිලධාරියෙක් හැටියට ඉන්නවා. ඒ දවස්වල උප විදුහල්පති හැටියට හිටියේ 2016 දී.

ප : දැන් තනතුර මොකක්ද කියලා දන්නවද?

පි : දන්නේ නැහැ Examination Department එකේ ඉන්නවා. තව පුද්ගලයෙක් තමයි Airport and Aviation Authority එකේ ඉන්නවා සෆර් අහමඩ් කියන පුද්ගලයා. එයා තමා කෙලින්ම ඉස්සෙල්ලාම මම දන්න තරමට මට විරුද්ධව මෙයා මරා දැමිය යුතුයි කියලා ලිව්වේ එයා තමයි. ඉස්ලාම් ආගම අනුව මෙයා මරා දැමිය යුතුයි කියලා ලියපු එක්කෙනා එයා තමයි ඉස්සෙල්ලම. First time මම දැක්කේ මට විරුද්ධව ඒ වගේ දෙයක්. එයත් තාම ඒ තනතුරේ ඉන්නවා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අජේෂා ජිනසේන මෙනවිය:</u>

ප : ඒ මුහුණු පොතෙහි ඔබ සම්බන්ධයෙන් ඔවුන් විසින් යොදන ලද සටහන් දැනට හැකියාවක් තියෙනවද මේ ගරු කොමිෂන් සභාවට විවෘත කොමිෂන් සභාවේ බලන්නට?

පි : 2016 යොමු කරපු ඒවා සමහර විට නැති වෙන්න පුළුවන්. ඒ කට්ටිය මාව block කරලා ඇති නැත්නම් ඒ Post එක හොයා ගැනීමේ අපහසුතාවයක් ඇති. Recent times වල මට විරුද්ධව කරපු දේවල් හොයා ගන්න පුළුවන් කමක් තියෙනවා.

ප : ඔබ කිව්වා මගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් ඔබට මේ වනතුරු දැන ගන්න ලැබුනේ නැහැයි කියලා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් ඔබ ඔවුනට 2016 ජුලි මාසේ 20 වෙනිදා කරන ලද පැමිණිල්ල සම්බන්ධව කිසියම් පියවරක් අරගෙන තියෙනවාද කියන කරුණ පිළිබඳව?

පි : ඔව්.

ප : ඔබ දන්නවද ඔබේ පැමිණිල්ල ලැබුනට පස්සේ 2016. ජුලි මාසේ 30 වෙනිදා ත්‍රස්තවාදී විමර්ශන දිසාව භාරව සිටි වැඩබලන

FAIR COMMENT — BY JEZEEM

නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා විසින් පොලිස්පතිතුමාට ඒ පිළිබඳව වාර්තා කර තිබුණයි කියලා?

පි : නැහැ මම දන්නේ නැහැ.

ප්‍ර : ඔබගේ නම මොහොමඩ් ඉස්මත් රිස්වින්?

පි : ඔව්.

ප්‍ර : ඔබ ඒ පැමිණිල්ල කරන අවස්ථාව වන විට පදිංචි වෙලා හිටියේ අංක 72, මාළිගාකන්ද පටුමඟ, මරදාන කොළඹ 10 කියන ස්ථානයේද?

පි : 2 වන මාළිගාකන්ද පටුමඟ. මරදාන.

ප්‍ර : දෙවෙනි එක නැති වුණාට ඉතුරු ටික හරිද?

පි : හරි.

ප්‍ර : ඔබට මුස්ලිම් අන්තවාදය පැතිරවීමට උත්සාහ දරනු ලබන පිරිසක් විසින්ද ඒ මරණීය තර්ජනය එල්ල කරනු ලැබුවේ?

පි : ඔව්.

ස්වාමිණි අවසර අයැද සිටිනවා පිටු 2 කින් යුත් වැඩ බලන නියෝජ්‍ය පොලිස්පති ත්‍රස්තවාදී විමර්ශන දිසාව වශයෙන් තනතුර සඳහන් නාලක ද සිල්වා මහතා විසින් පොලිස්පතිතුමා වෙත 2016.07.30 වන දින මෙම සාක්ෂිකරුගේ පැමිණිල්ලට අදාලව යවා ඇති ලිපිය X11 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර : ඊට පස්සේ ඔබ 2 වන අවස්ථාවේදි කාටද පැමිණිල්ලක් කලේ?

පි : 2 වන අවස්ථාවේදී 28 වෙනිදා 7 වන මාසේ 2017 දී CID එකේ තිබෙන Cyber Crime Branch එකට පරිසණක අපරාධ අංශයට මම පැමිණිල්ලක් කලා.

ප්‍ර : ඇයි ඔබ එසේ පැමිණිල්ලක් කරන්න හේතු වුනේ?

පි : ඒ වෙලාවෙත් මට මරණ තර්ජන සෑහෙන ආවා. එතකොට මම ඒ ගැන පැමිණිල්ලක් කලා.

ප්‍ර : එතකොට Cyber Crime Unite එකට අපි සාමාන්‍යයෙන් දැනුම් දෙන්නේ ඔය Social media සමාජ ජාලා හරහා යම් සිදුවන දේවල් සම්බන්ධයෙන් නේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබගේ ඒ පැමිනිල්ලට පාදක වුනේ මොන ක්‍රියාවක්ද?

පි : Facebook හරහා මට එල්ල වෙච්ච මරණ තර්ජන.

ප්‍ර : කාගෙන්ද එල්ල වෙලා තිබ්බේ මරණ තර්ජන?

පි : එතන එක පුද්ගලයෙක් කියලා නැහැ. කණ්ඩායමක් වගේ 4,5 දෙනෙක් හිටියා. මම ඔක්කොම Photo Copies, url ඒ Links ඔක්කොම අරගෙන Print outs එක්ක තමයි බාර දුන්නේ. ඒත් එක්කම ඊලඟ මාසෙත් 28 වෙනිදා තව පැමිණිල්ලක් කලා.

ප්‍ර : එතකොට නිකම්ම complain කරන්නේ නෑ නේද ඉස්මත් මහත්මයා නිකම්ම මිනිස්සු මුහුණු පොත හරහා ඔබට පහරදීමක් කරන්නේ නැහැනේ වාචිකව හෝ?

පි : ඔව්.

Presidential Secretary's copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙම කරන්න මොකක්ද හේතුව වුනේ?

පි : Same Reason ආගම ගැන විවේචන හා ප්‍රශ්න කිරීම් ඉදිරිපත් කිරීම. ධනාත්මක විවේචන හා ප්‍රශ්න කිරීම් ඉදිරිපත් කිරීම තමයි ඒකට හේතු වුනේ.

ප්‍ර : එතකොට ඔබ ආගම පිළිබඳව මොකක්ද ඉදිරිපත් කරපු විවේචනය ඔය 2017.07.28 වෙනිදා පැමිණිල්ල සිදු කරන්න තුඩු දුන්න මරණ තර්ජන ඔබට ලැබෙන්න?

පි : සාමාන්‍යයෙන් මම විවේචන ඉදිරිපත් කලේ ඉස්ලාම් ආගමේ තියෙන කාන්තා අයිතිවාසිකම නැහැ කියන කාරණාව ගැන, ත්‍රස්තවාදය ගැන, කුඩා ළමුන් කසාද බැඳීම ගැන නබිතුමාගේ කරපු ඒ වාගේ දේවල් ගැන තමයි මම ප්‍රශ්න කිරීම ඉදිරිපත් කලේ.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් තමයි ඒ සමඟ එකඟ වුණේ නැති අය ඔබ වෙත මුහුණු පොත හරහාම මරණීය තර්ජන එල්ල කලේ ඔබට?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ ඒ පිළිබඳව සවිස්තරාත්මක පැමිණිල්ලක් ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ **Cyber** අපරාධ අංශයට සිදු කෙරුවේ? Was it a detailed statement you made?

පි : ඒකේ පිටපත් දෙකක් තියෙනවා, ඒකේ මම

ප්‍ර : ඔබ එය ලිඛිතවද ඉදිරිපත් කලේ?

පි : ලිඛිතව ඉදිරිපත් කරනවත් එක්කම ඒකට අදාල ඡායාරූප Screenshot Link ඔක්කොම Print out කරලා තමයි මම භාර දුන්නේ.

ප්‍ර : ඒවා දැන් නැද්ද?

පි : තියෙනවා. ඒ වුණාට Mix වෙලා තියෙන්නේ.

ප්‍ර : ඔබ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරපු ලේඛන අත්සන් කරලා බාර දුන්නේ?

පි : ඔව් අත්සන් කරලා බාර දුන්නා.

IR14 වශයෙන් **ලකුණු කොට මෙය ඉදිරිපත් කිරීම සඳහා. ඒ කියන්නේ ස්වාමිණි 2017.ජූලි මාසේ 28 වෙනිදා සාක්ෂිකරු විසින් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ Cyber අපරාධ අංශයට කරන ලද පැමිණිල්ල ඉදිරිපත් කිරීමට අවසර අයැදිමි.**

ප්‍ර : IR14 වශයෙන් ඔබ ලකුණු කරලා ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරපු මේ පැමිණිල්ලට කිසියම් හෝ ප්‍රතිචාරයක් ඔබට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලැබුනද?

පි : නැහැ.

ප්‍ර : ඔබ ඒ පිළිබඳව ඔවුන් වෙතින් විමසුවද මොකක්ද මගේ පැමිණිල්ලට සිද්ධ වෙන්නේ කියලා?

පි : ඊලඟ මාසේ තව පැමිණිල්ලක් කරපු හින්දා ඒ ගැන විමසුවේ නැහැ.

ප්‍ර : ඔබ ඊලඟ මාසේ ඒ පැමිණිල්ල කෙරුවේ නැවතත් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ **Cyber** අපරාධ අංශයටමද?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. එම අංශයටමයි.
ප්‍ර : ඒ කවදද?
පි : 28 වෙනිදා 08 වන මාසේ 2017.
ප්‍ර : එහි පිටපතක් ඔබ ලඟ තිබෙනවද?
පි : ඔව්.
ප්‍ර : එය ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට?
පි : ඔව්.

2017 අගෝස්තු මස 28 වන දින සාක්ෂිකරු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ Cyber අපරාධ අංශය වෙත ඉදිරිපත් කොට ඇති ලිඛිත පැමිණිල්ලේ පිටපතක් ඔහු විසින් මේ අවස්ථාවේදී කොමිෂන් සභාවට ඉදිරිපත් කරනවා. ඒය IR15 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ප්‍ර : එම පැමිණිල්ලට ලැබුණු ප්‍රතිචාරය මොකක්ද?
පි : මුකුත් ලැබුණේ නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : ඔබ දැන් ඉදිරිපත් කරපු IR14 සහ IR15 දරන පැමිණිලි ඔබ විසින් පුද්ගලිකව ගිහිල්ලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ **Cyber** අපරාධ අංශයට භාර දුන්නද?
පි : ඔව්.
ප්‍ර : කාගේ අතටද භාර දුන්නේ?
පි : ඒක භාර ගත් නිලධාරියාගේ නමත් මම ගාව තියෙන රිසිට් පතක ඇති.
ප්‍ර : රිසිට් පතක් තියෙනවද?
පි : තියෙනවා. 07 වෙනි මාසේ 28 වෙනිදා 2017. බාර අරන් තියෙන්නේ PC 87235 කියන ඉලක්කම දරන කේ.ඩී. චාමර කියන නිලධාරියා.
2017.08 මාසේ 28 වෙනිදා මම ඉදිරිපත් කරපු පැමිණිල්ල භාර අරන් තියෙන්නේ PC 12456 අංකය දරන කුමාරසිංහ කියන නිලධාරියා.

එම රිසිට් පත් ස්වාමිණි IR16 සහ IR17 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:

ප්‍ර : එතකොට දැන් ඔය දෙවනි පැමිණිල්ලට ඒ කියන්නේ 2017.08.28 වෙනි දින කරන ලද පැමිණිල්ලට යම් ප්‍රතිචාරයක් ලැබුණද?
පි : නැහැ.
ප්‍ර : ඒ කියන්නේ මේ වනතුරුම ඔබට ඔය පැමිණිලි දෙකටම කිසිම ප්‍රතිචාරයක් ලැබිලා නැද්ද?

Proof Copy
FAIR COMMENT BY JEZEEM

පි : නැහැ.
ප්‍ර : ඔබ කිව්වානේ 4 වෙනි පැමිණිල්ලකුත් කලා කියලා?
පි : ඔව්.
ප්‍ර : ඒ පැමිණිල්ල කලේ කවදාද?
පි : ඒක මාර්තු මාසේ 13 වෙනිදා.
ප්‍ර : මොන අවුරුද්දේ ද?
පි : මේ අවුරුද්දේ. මුල්වරට මේ කොමිෂමට සාක්ෂි ලබා දුන්නට පස්සේ.
ප්‍ර : ඒ කුමන හේතුවකටද?
පි : Covid – 19 වසංගතය හේතුවෙන් ආගමික සිද්ධස්ථාන ලෝකේ පුරාම වසා දැම්මා. ඒ වෙලාවේ මක්කමේ තියෙන පල්ලියත් වසා දැම්මා. ඒ වෙලාවේ මම Post එකක් දැම්මා කිසිම දෙවියෙකුට මෙහි කිසිම බලයක් නැහැ, මේක අපේ action වලින් scienfically තමයි මේක මේවා කරන්න ඕන කියන එක මෙතනදීම පැහැදිලි වෙනවා කියලා අල්ලාහ් දෙවියන්ට කිසිම බලයක් නැහැ, එහෙම එකක් නෑ. මේක අපි We have to face it according to that. වෙන දේ ඒ විදියට තමයි අපි මුහුණ දෙන්න ඕනේ කිසිම භක්තියකින් හෝ මේක කරන්න බැහැ කියලා post එකක් දාලා ඒත් එක්කම සෞදි රජයෙන් ගත්ත තීරණයත් මම ප්‍රසංශා කරලා තිබුණා. මේක ආගම, භක්තිය කියලා බලන්නේ නැතුව මිනිස්සු ගැන හිතලා හොඳ තීරණයක් අරන් තියනවා කියලත් දාලා තිබුනා. ඒක දාපු ගමන්ම වෙන වෙන නම්වලින් මුස්ලිම් අය විසින් Run කරන පිටුවල ඒ කියන්නේ ආගම ගැන කිසිම සම්බන්ධයක් නැතුව වෙන දේවල් වලට යොමු වෙලා තිබ්බ පිටුවලින් මගේ පින්තූරත් එක්ක මෙයා මේ වගේ ආගමට විරුද්ධව post එකක් දාලා තියෙනවා, මේක දිගටම ඕගොල්ලන් මෙයාගේ Account එක block වෙන කල් report කරන්න කියලා complain එකක් අරන් ගියා. Qtv Network කියන පිටුව ඒකට likes තියෙනවා 43765 ක් ඒකේ දාලා තිබ්බා. ඒකේ මට දාලා තිබ්බා මෙයා මුස්ලිම් නමින් ඉන්න මුනාෆික් ඒ කියන්නේ ද්‍රෝහියෙක්. මේ ඉස්ලාමයයි, අල්ලාහ් ගැනයි මෙයා විවේචන කරලා මෙයා post දානවා මෙයාගේ Account එක block කරන්න කියලා දාලා තිබ්බා. ඒක ගොඩක් අය share කරලා තිබ්බා. ඒ වගේම තව පිටුවක 2065 ක් Follow කරන පිටුවක් තිබ්බා. තව පිටුවක් තිබ්බා 86464 දෙනෙක් follow කරන පිටුවක්, තව පිටුවක් තිබ්බා 19011 දෙනෙක් follow කරන පිටුවක්, තව පිටුවක් තිබ්බා 31315 ක් follow කරන පිටුවක් ඒ එක්කම තව පිටු 3 කුත් මට ලැබුණා මට විරුද්ධව මේක දාලා තියෙනවා කියලා. ඒත් එක්කම මගේ ගිණුමත් මාසයකුත් දවස් 7 කුත් block වුණා ඒ පෝස්ට් එකත් Facebook එකෙන් අයින් කලා. East First කියන Group එකක්, FM TV කියන Group එකත්, කොළඹ පසංග 2.0 කියන Group එකක්,ඉන්වමඩයන්මාරි කදෙක්කපබා කියලා තව ගෲප්

Fair Comment by Jezeem
Presidential Commission of Inquiry Copy

එකක්. මේ කිසිම ගෲප් එකක් ආගම සම්බන්ධ යම්කිසි දෙයක් කරන Groups නෙමෙයි.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : ඒ වුනත් ඒවායේ තර්ජන කිරීමක් කරලා නැහැනේ ඒ එකකවත්?

පි : ඊට පස්සේ මට දිගටම තර්ජන එන්න පටන් ගත්තා. මගේ Inbox වලට එන්න පටන් ගත්තා. මට අසභ්‍ය වචනවලින් බැන බැදිම් සිද්ධ වුණා. ඒවා ගොඩාක් සිද්ධ වුණා. ඒ ගැනත් මම පැමිණිල්ලේ දී කලා. මගේ comments වලට මාව මරන්න ඕනේ මෙයාව සමහර වචන භාවිතා කරලා තිබුණා. මට මේ ගරු සභාවේ ඒ වචන යොමු කිරීමට අපහසුතාවය තිබෙනවා. මට ඉතා නින්දිත විදියට බැන වැදලා මටත් පුරුෂභාවය ගැන ප්‍රශ්න කරලා ඒ වගේ ගොඩක් දේවල් යොමු කරලා වචන තිබුණා. ඒ වගේම මාව මරන්න ඕනේ උඹ කොහේද ඉන්නේ කියලා කියපන් අපි ඇවිත් ඔයාව මරනවා කියන වගේ comments තිබුණා. Voice Records ත් දාලා තිබුනා මට. ඒවගේ දේවල් තිබුණා. ඒත් එක්කම මම පැමිනිලි කලේ 2019.ජුනි 20 වෙනිදා මම පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ඉදිරියේ මේ වගේ ප්‍රකාශය කලාට පස්සේ මට ඇවිත් තිබුණ මරණ තර්ජන තිබ්බා. ඒ ගැන මම පැමිණිලි කරලා තිබුනේ නැහැ. මොකද ඒ සභාවට ගිහිල්ලා ආවට පස්සේ මට හැංගිලා ඉන්න සිද්ධ වුණා. ඒ නිසා පොලිසියටවත් යන්න මට ඉඩක් තිබුනේත් නැහැ, කලින් පැමිණිලි වලට පොලිසියෙන් කිසිම Action එකක් ගත්තේ නැති නිසාත් මට එක්තරා කලකිරීමක් තිබුණා. ඒ හින්දා මම ගියේ නැහැ. ඊට පස්සේ මාර්තු මාසේ 13 වෙනිදා ගිය වෙලාවේ එකත් ඉදිරිපත් කලා CID එකට Cyber Crime එකට.

ප්‍ර : තමා මේ ලඟදි රූපවාහිනි නාලිකාවක සාකච්ඡාවකට සහභාගි වුණාද?

පි : නැහැ ලඟදී මම මොනවටවත් සහභාගී වුනේ නැහැ.

ප්‍ර : කලින් සාකච්ඡාවකට සහභාගි වුනාද?

පි : රූපවාහිනි නාලිකාවක සාකච්ඡාවකට සහභාගී වුනේ නැහැ.

ප්‍ර : කිසියම් රූපවාහිනියක ප්‍රචාරයක්?

පි : නැහැ මගේ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ ප්‍රකාශය තමයි රූපවාහිනී නාලිකාවල ප්‍රවෘත්ති වල පෙන්නුවා, ඒ දවස්වල. මට ලඟදීත් ඒ කියන්නේ කොරෝනා සම්බන්ධව covid -19 සම්බන්ධව මම දැම්මට පස්සේ මට තර්ජන එල්ල කරපු කට්ටියගෙන් ගොඩක් තරුණ කට්ටිය හිටියා. අවුරුදු 20, 21 වාගේ තරුණ පිරිස පවා හිටියා. මරන්න ඕන කියන අදහස තමයි ඒගොල්ලන් ඉදිරිපත් කලේ. ඒකත් මම මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා ඒ කරුණ.

****

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප : ඒ covid -19 අවස්ථාව ප්‍රකාශයට පත් වුණාට පස්සේ සෞදි රජයෙන් මක්කම වැහුවාට පස්සේ ඔබ විසින් මුහුණු පොතෙහි යොදන ලද එම ප්‍රකාශයන් සහ සටහන්වලට ප්‍රතිචාර ලෙස විවිධ පාර්ශවයන් එව්වාය කියන ඒ පණිවිඩවල පිටපත් ඔබ ලබාගෙන තිබෙනවා නේද?

පි : ඔව් තියෙනවා.

ප : ඒවා ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට?

පි : ඒවා Soft Copy කොපි හැටියට ඉදිරිපත් කරන්න පුළුවන්.

****

<u>ගරු බන්දුල අතපත්තු මැතිතුමා</u>:

ප : දැන් ඔබ කියාපු ඔය Facebook message එකට ඒක praise කරලා කවුරු හරි message එකක් එව්වේ නැද්ද? ඒ කියන්නේ ප්‍රසාදය පලකර?

පි : ඒවත් ලැබිලා තිබුණා.

ප : කොච්චර විතර ලැබිලා තිබ්බද?

පි : Numbers නම් මට මතක නැහැ ඒ දවස්වල මට දිගටම ආවේ මේ වගේ තර්ජන තමයි ගොඩක් ආවේ. සාමාන්‍යයෙන් මාව follow කරන praise කරන කට්ටියක් ඉන්නවා. මුස්ලිම් ආගම තාම පිලිපදින කට්ටියත් ඉන්නවා. ඒ කියන්නේ එලියේ කියන්න බැරිකම හින්දා ඒ වුනාට ඒගොල්ලෝ ඒක follow කරනවා. ඉන්දියාවේ ඉන්න පිරිසක් ඉන්නවා.

(රූපවාහිනී තිරයේ එම පණිවිඩ දර්ශනය කරයි)

ඒකේ කටහඬ තියෙනවා. මට එවපු Voice messages attachments වල තියෙන්නේ මට ආපු තර්ජන ගැන. ඊට පස්සේ අන්තිම එකට කලින් තියෙන්නේ ජුනි 20 මම පාර්ලිමේන්තු කාරක සභාවට සාක්ෂි දුන්නට පස්සේ ඉදිරිපත් කරපු threats වල තමයි දැන් අර Mouse එක hold කරලා තියෙන්නේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප : එතකොට අපි ඉස්සෙල්ලා බලන්න ඕනේ covid -19 ඔකට අදාලව ඔබට ලැබුණු තර්ජන?

පි : ඔව්.

ප : එතකොට අපි විවෘත කරන්න ඕන හොඳම එක මොකක්ද?

පි : Atfachment 5 එකෙන් පටන් ගන්න පුළුවන් අපිට. නැත්නම් අර Voice records ත් තියෙනවා. මට Inbox එකට එවපු ඒවා. දෙමලෙන් තියෙන්නේ.

(රූපවාහිනී තිරයේ එම දර්ශන දිස්වේ)

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : මොකක්ද ඒ පණිවිඩය?

පි : අසභ්‍ය වචනයකින් පටන් ගෙන උඹ එක අම්මා කෙනෙකුට එක තාත්තා කෙනෙකුට ඉපදිලා තිබ්බොත් මේ number එකට call ගනින් කියලා තමයි එයා කියන්නේ. ඒ number එකත් Inbox එකේ දාලා තිබ්බා. මම හිතන්නේ Attachment 5 එකේ ඒ number එක ඇති. ආර්. එෆ්. ඉස්මයිල් කියන කෙනා තමයි ඒක කියන්නේ.

ප්‍ර : එයාගේ නම තමයි ඔබ ලියලා තියෙන්නේ?

පි : ඔව්. ඊට පස්සේ දෙවෙනි එකත් එයා එවලා තියෙනවා.

ප්‍ර : දෙවෙනි එකත් එයාගේම එකක්?

පි : එයාගේම.

ප්‍ර : දෙවෙනි එකේ එයා මොනවද කියන්නේ?

පි : ඒකත් ඒකට සමාන මොනවා හරි එකක් තමයි තිබ්බේ, මට මතක හැටියට.

(එයත් රූපවාහිනී තිරයේ දිස්වේ)

ඒකත් අසභ්‍ය වචනවලින්මයි බැනලා තියෙන්නේ අම්මටයි මටයි ඉපදීම ගැන ඒවගේ දේවල් තියෙනවා.

ප්‍ර : ඊළඟට අපි Attachment එකට යමු,

පි : මේක තමයි අරයගේ number එක තියෙනවා. ඒ number එකට තමයි call ගන්න කියලා Voice recording දෙකම තියෙන්නේ. ආර්. එෆ්. ඉස්මයිල් කියන එක්කෙනා. මේ මගේ photo එකත් දාලා අස්මින් අන්වර් කියන කෙනා බැනලා තියෙනවා. අම්මටත් බැනලා මට බැනලා තියෙනවා. මෙයා දාලා තියෙනවා ඔයා මම මාවනැල්ලේ දැක්කොත් ඔයාගේ මරණය තමයි, මාව මරලා දානවා කියලා දාලා තියෙන්නේ. මගේ අම්මටත් බැනලා තියෙනවා.

ප්‍ර : කොහොමද ඔබ මාවනැල්ල ගැන කොහොමද සඳහන් වෙන්නේ?

පි : මම දන්නේ නැහැ මේ පුද්ගලයා කවුද කියලා. මට මේ දාලා තියෙනවා ඉස්ලාම් කිව්වොත් ඔයා මොනවද කියලා දන්නවද, ඔයා මාවනැල්ලේ දැක්කොත් ඔයාට මරණය තමයි කියලා.

ප්‍ර : එතකොට ඒ පුද්ගලයා අස්මින් අන්වර් කියන එක්කෙනා මාවනැල්ලේද?

පි : වෙන්න ඕනේ මාවනැල්ලේ එක්කෙනෙක් වෙන්න ඕනේ. මම දන්නේ නැහැ මේ පුද්ගලයා කවුද කියලා.

ප්‍ර නෆීස් මොකක්ද කියලා තියෙන්නේ?

පි : අම්මට බැනලා තියෙනවා මට බැනලා තියෙනවා කුණුහරුපයෙන්. ඉස්ලාම් ආගම ගැන කතා කරන්න එපා කියලා මට තර්ජනය කරලා තියෙනවා.

ප්‍ර : ඊළඟට අන්ෆස් ලැමී මොනවද කියලා තියෙන්නේ?

පි : ඒකත් අම්මට බැනලා අම්මා කරන දේවල් ගැන එයාට කියන්න කියලා තියෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඔහුට විවිධ පාර්ශවයන් වෙතින් මුහුණු පොත හරහා ලැබුණු කටහඬ මාර්ගයෙන් සහ ලිඛිතව ලැබුණු මරණීය තර්ජන අඩංගු CD තැටිය IR18 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදි IR18 වශයෙන් ලකුණු කරන ලද CD තැටියේ පිටපතක් අධ්‍යක්ෂක, අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරන අතර, එහි අඩංගු මෙම සාක්ෂිකරුට විරුද්ධව ඇති මරණීය තර්ජන සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කොට කොමිෂන් සභාවට වාර්තා කරන ලෙසට නියෝග කරමි.

****

<u>**අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය**</u>

ප්‍ර : මුහුණු පොතෙහි ඔබ කිව්වා යම් යම් අවස්ථාවන්වලදි මේ අන්තවාදීන් විසින් ප්‍රකාශ කරන දේවල්වලට එරෙහිව ඒ වගේම ඉස්ලාම් ආගමේ තිබෙන වැරදියි කියලා ඔබ විසින් දකින දේවල් සම්බන්ධයෙන් විවිධ මත ප්‍රකාශ කෙරුවා කියලා කිව්වානේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට එහෙම ඔබේ අදහස් ප්‍රකාශ කිරීම මුහුණු පොත හරහා ඔබ යම් අවස්ථාවකදී නැවැත්වීමක් එහෙම කලාද?

පි : ඔව්.

ප්‍ර : ඒ කොයි වෙලාවේද? මොකක්ද හේතුව?

පි : මාවනැල්ලේ හිටපු අමාත්‍ය කබීර් හෂීම් මහතාගේ සම්බන්ධීකරණ ලේකම් හැටියට කටයුතු කරපු තස්ලින් නැමැත්තාට වෙඩි ප්‍රහාර එල්ල වුනාට පස්සේ මම ඒක නැවැත්තුවා.

ප්‍ර : කොපමණ කාලයක් නවත්තලා තිබුණද?

පි : මාස 2 ට පමණ කාලයකට වගේ මම නවත්තලා තිබුණා. බෝම්බ ප්‍රහාරයට ටික දවසකට පස්සේ තමයි ආපහු ලියන්න පටන් ගත්තේ, ඒ වුණාට අද වෙනකල් මට කලින් ලිව්ව විදියට ලියන්න බැරි වෙලා තියෙනවා. එකක් මානසිකව මට ඒකට මුහුණ දෙන්න තරම් සුදානමක් නැති තත්ත්වයක් තියෙනවා, බයක් තාම තියෙනවා. තාම ඊට පස්සේ ගිය අවුරුද්දේ මාර්තු මාසේ 14 වෙනිදා ඒ වෙඩි ප්‍රහාරය සිද්ධ වෙන්නේ 16 වෙනිදා වාගේ මම නවත්වනවා ලියන එක. අන්තිමටත් ලිව්වේ එදා. ඊට පස්සේ මගේ post එකත් අතර පරතර තියෙනවා. ඊට කලින් එහෙම නෙමෙයි සාමාන්‍යයෙන් මම විනෝදාංශ දේවළුත් එක්ක තමයි මගේ Facebook එක කරගෙන ගියේ. යාළුවන් ගැන, sports ගැන අනිත් දේවල් ගැනත් එක්කම මේවත් ලියාගෙන ගියා. දැනට මම ඒ විදියට කටයුතු කරන්න බැරි වෙලා කියලා මට තේරිලා තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ කියන්නේ දැන් මාස 2 ක් තිස්සේ තස්ලින්ගේ වෙඩි තැබීමත් එක්ක ඔබ මුහුණු පොත හරහා කරනු ලබන කිසියම් හෝ ක්‍රියාකාරකමක් කරන්නේ නැතුව ඒක අතහැරියා කියලද?

පි : අතහැරියා ඔව්.

ප්‍ර : එහෙම නම් ඒ මාස දෙක ඉවර වුණාට පසු ඔබ නැවත පටන් ගත්තද මුහුණු පොතේ යම් යම් දේවල් ලියන්න?

පි : ඔව් මට මරණ තර්ජන ඇවිල්ලා තිබුණට මම විශ්වාස කලේ නැහැ අවියක් අරගෙන නැත්නම් තුවක්කුවක් අරගෙන මගේ පස්සෙන් ඇවිල්ලා මට වෙඩි තියන්න තරමට ත්‍රස්තවාදය දරුණු වෙලා ඇතියි කියලා එතකල් මට ලොකු විශ්වාසයක් තිබුනේ නැහැ.

ප්‍ර : ඔබ ඒ විශ්වාසය යම් අවස්ථාවකදි වෙනස් කර ගන්න යම් කරුණු යෙදුනද? ඔබ කිව්වානේ කවුරුත් ඇවිල්ලා තුවක්කුවකින් ඔබට වෙඩි තියන්නේ නැතිවෙයි කියලා ඔබ හිතුවේ නැහැ?

පි : මම එච්චර ලොකු බලාපොරොත්තුවක් තිබුනේ නැහැ එහෙම මාව මරන්නම තුවක්කුවක්, මගේ බය තිබුනේ කවුරු හරි පිහියකින් ඇනලා හරි නැත්නම් පුද්ගලයෝ 3,4 දෙනෙක් එකතු වෙලා පහරදීමක් වගේ දේවල් සිද්ධ කරයි කියලා තමයි මගේ බලාපොරොත්තුවක් තිබුණේ.

ප්‍ර : නමුත් ඔබ ඒ වෙන කොට දැනගෙන හිටියා නේද ඉන්දියාවේ ඔබේ මුහුණු පොත් යාළුවා ෆාරුක්ව ඝාතනය කරලා තිබුණා කියලා?

පි : ඔව්. ෆාරුක්වත් ඝාතනය කරලා තිබ්බේ පිහියෙන් ඇනලා කොටලා තමයි. එතකොට මම තස්ලින්ගේ වෙඩි ප්‍රහාරයට කලින් මුහුණු පොතේ මම ලිව්වට මගේ පෞද්ගලික ආරක්ෂාව ගැන මම පොඩ්ඩක් විමසිල්ලේ හිටියා. ඒ කියන්නේ කවුරු හරි එක්කෙනෙක් ලේසියෙන් ඇවිල්ලා මාව පිහියෙන් ඇනලා හරි පැහැරගෙන ගිහිල්ලා හරි පහර දෙන්න බැරි විදියට තමයි මට පුළුවන් විදියට මම මගේ එදිනෙදා කටයුතු කරගෙන ගියා. තස්ලින්ට වෙඩි තිබ්බා කියන එක දැන ගත්ත ගමන්ම මට ලොකු බයක් හිතුනා මේක හිතුවට වඩා ගැඹුරට ගිහිල්ලා තියෙනවා, තුවක්කු තියෙනවා මේගොල්ලන්ට වෙඩි තියන්න පුළුවන් කියලා. තුවක්කුවකින් වෙඩි තියනවා නම් ලඟට එන්න ඕනේ නැහැ පුද්ගලයෙකුට. එතනින් තමයි මම නැවැත්තුවේ. එතනින් ලියන එක නැවැත්තුවා පමණක් නෙමෙයි ගෙදරින් එළියට යන එකත් මම නැවැත්තුවා. මගේ මතකය හරි නම් එදාට පස්සේ පාර්ලිමේන්තු කාරක සභාවට ජුනි 20 යන දවස වෙනතුරු මම නම් හිතන්නේ නැහැ මම පහලොස් වතාවක් වත් ගෙදරින් එළියට ඇවිල්ලා ඇතියි කියලා. මාර්තු 14 ඉදලා 10 වතාවක් වගේ තමයි ඉතා සීමිත ප්‍රමාණයක් තමයි මම එළියට ආවේ. ඒත් බෝම්බ ප්‍රහාරය සිද්ධ වුණාට පස්සේ මම හිතන්නේ, මම ගෙදරින් එළියට බැස්ස 2 වන හෝ 3 වන අවස්ථාව වෙන්න ඕනේ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ඉස්සරහාට සාක්ෂි දෙන්න මම ගිය එක.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප : දැන් තමන් මරණීය තර්ජන පිළිබඳව පොලිසියට පැමිණිල්ලක් කලාද කලින්?

පි : 2016, 2017 පැමිණිලි කලා.

ප : ඒ වගේ එක සොයා ගැනීමක් පරීක්ෂණවල සාර්ථකත්වය

පි : බුද්ධි අංශයේ නිලධාරීන් දෙන්නෙක් ගෙදර ඇවිල්ලා ආපහු මගේ ප්‍රකාශ සටහන් කරගෙන ගිය එක හැර වෙන මට කිසිම දෙයක් දැන ගැනීමට ලැබුනේ නැහැ.

ප : එතකොට ඉන්දියාවේ ෆාරුක් නැමැත්තා ජමාතේ ඉස්ලාම් සාමාජිකයෙක්ද?

පි : නැහැ එයා ඉස්ලාම් ආගම අතහැරපු මම වාගේම කෙනෙක්. එයා ආගම අත්හැරියා කියන වරදට පුද්ගලයෝ 5 ක් විතර වාගේ එකතු වෙලා තමයි එයාව කපා කොටා මරලා දැම්මේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප : ඔබ යම් අවස්ථාවක දී 2019 මැයි මාසේ 21 වෙනිදා පැමිණිල්ලක් කලාද කාට හරි, ප්‍රකාශයක් ලබා දුන්නද?

පි : නැහැ 2019 මැයි මාසේ 21 වෙනිදා තමයි බෝම්බ ප්‍රහාරයට පස්සේ මුල් වතාවටTID එකේ නිලධාරීන් දෙන්නෙක් මගේ ගෙදරට එන්නේ.

ප : ඇයි ඒ?

පි : මට ඒ වෙලාවේ මට හේතු කිව්වේ නැහැ. 21 වෙනිදා ආපු වෙලාවේ මට හේතු කිව්වේ නැහැ. ඇවිල්ලා මට කිව්වා ඔයා පැමිනිල්ලක් කරලා තියෙනවා ඒ ගැනත් ලොකුවට කිව්වේ නැහැ ඇවිල්ලා

ප : 2016 ජුලි මාසේ 20 වෙනිදා කරපු පැමිණිල්ල ගැනද ඒ කියන්නේ?

පි : පැමිණිල්ල ගැනත් පැහැදිලිව මට කිව්වේ නැහැ.

ප : TID එකට පැමිණිල්ලක් කලේ එක අවස්ථාවකයි ඒ තමයි 2016 ජුලි 20?

පි : ජුලි 20.

ප : මේ ආපු නිලධාරීන් ඔබ කියන්නේ TID නිලධාරීන්?

පි : නිලධාරීන් දෙන්නෙක් ආවා.

ප : මොනවද ඔවුන් ඇවිල්ලා කිව්වේ?

පි : ඒ ආපු නිලධාරීන් මාත් එක්ක පොඩ්ඩක් සුහඳව කතා කලා. කතා කරලා මගෙන් ඇහුවා ඔයා හොඳින් ඉන්නවද, ඔයාගේ ආරක්ෂාව ගැන බලන්න තමයි අපි ආවේ, මරදාන පොලිසියටත් අපි කියලා තියෙනවා මොනවා හරි දෙයක් තිබ්බොත් කතා කරන්න කියලා කිව්වා. කියලා දැනට ඔයාට එච්චර ලොකු ප්‍රශ්නයක් නැහැ, ඒවගේ දේවල් තමයි පොදුවේ කතා කරලා

ප : ඒ කියන්නේ ඔබව බය ගැන්වීමක්, තැති ගැන්වීමක් ඔවුන් විසින් සිදු කලේ නැහැ?

FAIR COMMENT BY JEZEEM

පි : නැහැ. ඒ වගේ දෙයක් සිදු කලේ නැහැ. අපි සරල භාෂාවෙන් කියනවා නම් අපි හොඳින් ඉන්නවාද කියන එක බලලා යන්න වගේ තමයි ඒගොල්ලන් පෙන්නුම් කලේ මට. ඊට වැඩි දෙයක් පෙන්නුම් කලේ නැහැ.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු තමන් කිව්වා දැන් පාස්කු ප්‍රහාරයෙන් පස්සේ දවස් දෙක තුනයි තමුන් එළියට බැස්සේ කියලා?

පි : බැස්සේ නැහැ. බැස්සේ දෙතුන් වතාවක් විතරයි.

ප්‍ර : ඒ කියන්නේ පාස්කු ඉරිදායින් පස්සේ කොච්චර දවසක්ද?

පි : ඒක මට හරියට මතක නැහැ, ගෙදරට වෙලාමයි මම හිටියේ.

ප්‍ර : ගොඩක් කල් මාස 2 ක් මාසයක් විතර?

පි : ඒ වගේ වෙන්න පුළුවන්. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සිද්ධ වෙච්ච දවසේම ගෙදරින් ගිහිල්ලා වෙන තැනක නවතින්න හැදුවා. ඊට පස්සේ තැනක් හොයා ගන්න ප්‍රශ්නයක් තිබුණා මොකද මම ජාතිකයෙක් හැටියට මුස්ලිම්. ප්‍රහාරය එල්ල කරලා තියෙන කට්ටිය මුස්ලිම්. මට මුස්ලිම් ප්‍රදේශයකට ගිහිල්ලා නවත්තන්නත් බැහැ. සිංහල ප්‍රදේශයකට ගිහිල්ලා නවත්තන්න ගියාම එතනින් ඉන්න මිනිස්සු මාව අදුරන්නේ නැත්නම් එතනින් මම දිහා වෙන විදියකට බලන්න පුළුවන්, මොකද හදුරන්නේ නැති මුස්ලිම් පුද්ගලයෙක් ඇයි අපේ ගමට ආවේ කියලා. එතකොට ඒ වගේ දෙයක් හොයාගෙන ඉන්න කොට තමයි 4 වෙන කොට ඇදිරිනීතිය පල කලා. ඒත් එක්කම මගේ යාළුවෝ කිව්වා දැන් කොහේවත් යන්න හදන්න එපා ගෙදරට වෙලාම ඉන්න කියලා ගේට්ටුව වහගෙන ගෙදරට වෙලා ඇතුලට වෙලාම ඉන්න කියලා.

ප්‍ර : තමුන්ගේ කටයුතු මොනවද මැණික් ව්‍යාපාරික කටයුතු තමන් කලා කියන්නේ මොකක්ද තමුන්ගේ රැකියාව?

පි : මැණික් ව්‍යාපාරය තමයි කරගෙන හිටියේ.

ප්‍ර : තමන්ට ආදායම් ලැබුනේ කොහොමද?

පි : මැණික් ව්‍යාපාරය හා විනෝදාංශයක් හැටියට මම රග්බි විනිසුරුවරයෙක් හැටියටත් කටයුතු කලා. ඒකෙනුත් යම්කිසි මුදලක් ලැබෙනවා.

ප්‍ර : ස්ථීර රැකියාවක් වශයෙන් කලේ නැහැ?

පි : ස්ථීර රැකියාවක් හැටියට මැණික් ව්‍යාපාරය තමයි කලේ. ඒකටත් ගොඩක් බාධා තිබුණා. සාමාන්‍යයෙන් මැණික් ව්‍යාපාරයේ ස්වරූපය තමයි දිනපතාම ඒ ව්‍යාපාරයේ යෙදී සිටින්න අවශ්‍යතාවයක් නැත

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර : 2019 මැයි මාසේ 21 වෙනිදා ඔබව බලන්නට ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයෙන් නිලධාරීන් ආවට පස්සේ ඔබට යම් අවස්ථාවක

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

දී ඔබ කෙරෙහි පැවතිලා තිබුණු යම් මරණිය තර්ජන පිලිබඳව දැනුවත් වීමක් සිද්ධ වුණාද?

පි : නැහැ. 21 වෙනිදා සිද්ධ වුනේ නැහැ. ඊට පස්සේ දවස් 3 ට පස්සේ 24 වෙනිදා ආයේ තව නිලධාරීන් දෙදෙනෙක් ඇවිල්ලා හිටියා ගෙදරට. ඒ ආපු නිලධාරීන් තමයි.

ප්‍ර : ඔය පලවෙනියට ආපු නිලධාරීන් දෙන්නා කවුද කියලා ඔබට මතකයිද?

පි : ඔව්. දෙන්නගේම මුහුණවල් මට මතකයි. එක්කෙනෙක්ගේ නම ශශික අතපත්තු කියන නිලධාරියා. ඒ නිලධාරියා තව පාරක් මම හිතන විදියට සැප්තැම්බර් 11 වෙනිදා වගේ මගේ තව ප්‍රකාශයකුත් TID එකේ වාර්තා කලා. ඒ ප්‍රකාශය මම ලබා දුන්නේ මම පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ඉස්සරහා මගේ වාර්තාව ලබා දෙන කොට පාසැල් පොතේ අඩංගු කරුණු ගැනත් මම කියලා තිබුණා. එතකොට මාව උපුටා දක්වලා බෞද්ධ මධ්‍යස්ථානයක නායක හාමුදුරු කෙනෙක් ජිනානන්ද හාමුදුරු වගේ නමක් තියෙන හාමුදුරු කෙනෙකුයි සිංහල ජාතික සංවිධානයකුයි ජුනි 26 වෙනිදා වගේ දවසක් පැමිණිල්ලක් කරලා තිබ්බා පාසැල් පොතේ යම්කිසි කරුණු තියෙනවා ඒ ගැන විමර්ශනය කරන්න කියලා පොලිස් මූලස්ථානයට. ඒ ගැන මගේ වාර්තාවක් ලබා ගැනීම සඳහා මට දවසක් කතා කරලා කිව්වා TID එකට එන්න කියලා. ඒ නිලධාරියා තමයි මගේ වාර්තාව පාසැල් පොත් සම්බන්ධයෙන් විතරයි වාර්තා කර ගත්තේ.

ප්‍ර : නම?

පි : ශශික අතපත්තු කියන එක්කෙනා. ඊට පස්සේ 24 වෙනිදා තමයි තව නිලධාරී දෙන්නෙක් ආවා ගෙදරට. ආපු වෙලාවේ දි තමයි මට කිව්වේ ඔබට මේ මරණ තර්ජන තිබිලා තිබෙනවා, මේක 27 වෙනිදා ඒක Monday දවසක් මේක ආවේ සිකුරාදා දවසක්. සදුදා දවසේ මට එන්න කියලා පොඩි නෝට් එකකුත් ලියලා දීලා ගියා Head Office එකට ඒගොල්ලන්ගේ කාර්යාලයට එන්න කියලා. ගියාට පස්සේ තමයි මට සම්පූර්ණ විස්තරය කිව්වේ.

ප්‍ර : ඒ කියන්නේ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයට එන්න කියලා කිව්වා?

පි : එන්න කියලා කිව්වා.

ප්‍ර : එතකොට ත්‍රස්තවාදි විමර්ශන කොට්ඨාශයෙන් ආපු මොන නිලධාරීන්ද ඔබට ඔය පණිවිඩය දුන්නේ?

පි : දෙවෙනි වරට ආවේ සරත් නන්දසිරි කියන නිලධාරියා. 27 වෙනිදා මගේ ප්‍රකාශය සටහන් කර ගත්තෙත් ඒ නිලධාරියාමයි. ඒ නිලධාරියා තමයි කිව්වේ ඊට පස්සේ ඒගොල්ලන් ඒ නිලධාරියා මට කරුණු කිව්වා 21 වෙනිදා ආවේ ඇයි කියන එක ගැන මට කරුණු කිව්වා. දෙවෙනි මාළිගාකන්ද පටුමඟ කියන්නේ dead and road එකක්. ඉවර වෙන පාරක්. එතකොට මම පදිංචි වී සිටි ගෙදර තිබ්බේ දකුණු අත පැත්තේ. අපේ නංගිගේ ගෙදර තියෙනවා ඒකට ගෙවල් 20 ට 25 ට කලින් වම් අත පැත්තේ.

FAIR COMMENT BY JEZEEM

එතකොට මාව මරන්න මේ කට්ටිය follow කරපු දවසේ මම ගිහිල්ලා තියෙන්නේ නංගිගේ ගෙදර. එතකොට ඒගොල්ලන් නංගිගේ ගෙදර මාක් කරලා ගිහිල්ලා. බෝම්බ ප්‍රහාරයට පස්සේ අත්අඩංගුවට පත් වෙච්ච පුද්ගලයෙක් පාපොච්චාරණය කරන කොට කියලා තියෙන්නේ වම් අත පැත්තේ තිබ්බ ගෙදරට තමයි අපි ගියේ එයා ගියා එහේ තමයි මරන්න ගියේ කියලා එතකොට. 21 වෙනිදා ආපු නිලධාරින් මට කාරණාව කිව්වේ නැත්තේ මම හිටපු ගෙදර තිබ්බේ දකුණු අත පැත්තේ. එතකොට ඒගොල්ලන්ට ඒ ගැන පැටලැවීමක් තිබ්බා. ඒ හින්දා තමයි ඒගොල්ලන් කියන්නේ නැතුව මේක කියන කාරණාව හරිද කියලා බැලුවා. එතකොට මගෙන් ඇහුවා යම්කිසි දවසක ඔයා මේ උද්ඝෝෂණයකට සහභාගි වුණාද, මොනවා සම්බන්ධයෙන්ද, ඔයාට මතකද කොහොමද ගියේ කියලා පොඩ්ඩක් normal කතා කරන විදියටම ඇහුවා. ඊට පස්සේ ඒගොල්ලන් කාර්යාලයට ගිහිල්ලා බලලා තමයි ආපහු 24 වෙනිදා වෙන නිලධාරීන් ඇවිල්ලා මට මේක දැනුම් දුන්නේ.

ප : ඇත්තටම ඒ ඔබෙන් ප්‍රශ්න කරපු විදියට යම් උද්ඝෝෂණයකට ඔබ යම් අවස්ථාවක සහභාගී වුණාද?

පි : ඔව් සහභාගී වුණා.

ප : ඒ කවදද?

පි : ඒක 2018.අගෝස්තු 06 වෙනිදා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය ඉදිරිපිට අපි උද්ඝෝෂණයක් පැවැත්තුවා.

ප : මොනවා සම්බන්ධයෙන් ද ?

පි : විත්ති මත චෝදනාව පටලන්න එපා කියන එක සම්බන්ධයෙන්, ඒ කියන්නේ දෙහිවල ප්‍රදේශයේ තියෙනවා අල්මුස්ලිමාත් කියන සංවිධානයක්. Doctor මරීනා රිෆයි කියන කෙනෙක්ගේ සංවිධානය. ඒ සංවිධානය විසින් අනාත ළමයින් සඳහා ළමා නිවාසයක් පවත්වාගෙන ගියා. ඒ ළමා නිවාසයේ හිටපු ළමයින් 18 දෙනෙක් විතර ලිංගික අතවරයට හා දූෂණයට ලක් වුණා කියන ප්‍රවෘත්තිය අපිට ලැබුනා. ඒ වෙන කොට මාත් එක්ක හිටපු යාළුවෝ එක්ක අපි ඒ ළමයින්ට සාධාරණයක් ඉටු වෙන්න ඕනේ කියලා ඉදිරිපත් වෙලා Lawyers ලා පවා අපි Arrange කලා ඒ ළමයින් සඳහා. ඊට පස්සේ ඒ නඩු තියෙන දවස්වල නුගේගොඩ ගංගොඩවිල උසාවිය ඉදිරිපිටත් අපි උද්ඝෝෂණය කියන්නේ silent protest එකක් කලා මේකට මේකක් කරන්න කියලා. ඊට පස්සේ ඒවා දිගටම යන කොට ජාතික ළමා රක්ෂක අධිකාරියට ඒකට යොමු වීමට පොඩි පොඩි අපහසුතාවය තිබුණා. මේකේ පිටිපස්සේ තියෙන දේශපාලන බලපෑම් ගැන මම හරියට දන්නේ නැහැ, ඒ වුනාට අපි යාළුවෝ තීරණයක් ගත්තා අපි මේ ගැන උද්ඝෝෂණය කරමු කියලා කාන්තා දිනයක. ඒ කියන්නේ මාර්තු මාසේ 8 වෙනිදා තමයි අපි ප්ලෑන් කලේ. 2018 මාර්තු මාසේ. ඒ දවසට ලං වෙන කොට තමයි නුවර දිගන ප්‍රදේශයේ මුස්ලිම් සිංහල අර ප්‍රශ්නයක් ඇති වුණා. ඊට පස්සේ ඒකට අපිට කල්

Fair Comment by Jezeem

දාන්න වුණා. ඒ උද්ඝෝෂණය තමයි 2018 අගෝස්තු 6 වෙනිදා අපි කලේ. සදුදා දවසක්.

ප්‍ර : එම උද්ඝෝෂණය පැවැත්වීම පිළිබඳ යම් ප්‍රචාරයක් ලබා දුන්නද ? ඒ වගේම එම උද්ඝෝෂණයට ඔබේ සම්බන්ධතාවයක් තිබෙන බවට යම් ප්‍රචාරයක් ලැබිලා තිබුණද?

පි : මම අර දාරුනුස්රා කියන අනාථ නිවාසය සම්බන්ධයෙන් මම ගොඩක් ලිව්වා. ඒ ළමයින්ට සාධාරණයක් වෙන්න ඕනේ.

ප්‍ර : කොහේද ලිව්වේ?

පි : මගේ Facebook හරහා ලිව්වා. තව සමහර මාධ්‍යවල වාර්තා කරන කොට මගේ නමත් එක්කම වාර්තා කරලා තිබ්බා. Ceylon Today මාධ්‍යය ඒ ගැන පත්තරේ ලියන කොටත් මගේ නමත් සඳහන් කරලා තිබ්බා. යම්කිසි මාධ්‍යවේදීන් මගෙනුත් කරුණු අහලා තිබුණා. මොනවද වෙන්නේ කියලා ඒ වගේ හින්දා මගේ නම සම්බන්ධයි කියලා හැමෝම දන්නවා. ඒ වුනාට කිසිම උද්ඝෝෂණය ගැනවත් මොනවා ගැනවත් ඒ කියන්නේ සිද්ධ වෙන්න කලින් Facebook එකේ ලිව්වේ නැහැ. මොකද මට හැඟීම තිබුණා මම ලිව්වොත් මට මොනවා හරි හානි කරන්න පුළුවන් මම එනවා කියලා. ඒ නිසා මම ගමන් බිමන් ගැන කිසි දෙයක් තොරතුරු ලියන්නේ නැහැ සිදු වුණාට පස්සේ සතියකට දවස් 10 ට පස්සේ තමයි මම මොනවා හරි දෙයක් ලියන්නේ. එහෙම නැතුව මම කරන්න ඉන්න දේ ගැන Future things ගැන මොනවත් ලිව්වේ නැහැ. හැබැයි මේ උද්ඝෝෂණය අමාත්‍යාංශය ඉස්සරහා කරන හින්දා මේකට කවුරු හරි දැකලා මේකට සහභාගි වෙයි කියන විශ්වාසයෙන් ජුලි 29 වෙනිදා වගේ මම මගේ Facebook එකේ cover page එකට ඒ photo එක දැම්මා උද්ඝෝෂණය තියෙනවා කියන එක. ඒක TID එකෙන් මට කියපු හැටියට සහරාන් ඒක දැකලා තියෙනවා. දැකලා තමයි සහරාන් කියලා තියෙන්නේ ඌරා කියන වචනය තමයි මට භාවිතා කරලා තියෙන්නේ, අර ඌරව මරපන් කියලා.

ප්‍ර : දැන් ඔබ ඔය කරුණු දැන ගත්තේ අර ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ නිලධාරීන් හරහා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔය ඔබව ඝාතනය කරන්නට, ඔබව මරන්නට කවුරු හරි එවලා තිබුණද සහරාන් ඔබ කියන විදියට?

පි : ඔව්. TID එකෙන් මට දැනුම් දුන්න විදියට හතර දෙනෙක්ව එවලා තිබුණා. හුසෙයිනුල් රිස්වි කාලිප් සමීර් කියන පුද්ගලයා මට්ටක්කුලි ප්‍රදේශයේ පදිංචි තරුණයෙක්. එයාට තමයි මාව හොයන්න කලින් ම සහරාන් බාර දීලා තිබුනේ. මම කොහේද ඉන්නේ, මොනවද කරන්නේ කියලා හොයන්න කියලා. ඒත් මේ පුද්ගලයා උත්සාහ කරලා තිබුණට එයාට සාර්ථක වෙන්න බැරි වෙලා තියෙනවා මාව හරියට locate කර ගන්න මේ පුද්ගලයාට බැරි වෙලා තියෙනවා. ඊට පස්සේ

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඉස්මත් මහත්මයා දැන් ඔබ සාක්ෂි දුන්න ආකාරයට 2006,2007 වසරවල් වලදි ඔබ සහරාන්ව ඉතා ලඟින් ආශ්‍රය කෙරුවා?

පි : ඔව්.

ප්‍ර : ඔබ ඔහු සමඟ දුරකතන සංවාදවල පවා යෙදිලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : ඉතින් ඒ ආකාරයට කිට්ටු ඇසුරක් තිබුණ ඔබ සමඟ ඇයි ඔය වගේ මතයක් සහරාන් දරලා තියෙන්නේ ඔබව ඝාතනය කරන්නට ඕනේ කියලා?

පි : මම ආගම විවේචනය කලා කියන එක එකම හේතුව තමයි. ආගම කියන දේ ආවොත් තමන්ගේ පියා වුණත්, පුතා වුණත් මරලා දාන්න පුළුවන් තත්ත්වයක් තියෙනවා. මම ඒ ගැන ලේඛනයක් මම හිතන්නේ ඉදිරිපත් කලා කියලා. හදිෂ් එකක්. ඒකේ අබුබක්කර් කියන ආණ්ඩුකාරවරයා මොහොමඩ් නබිතුමාගේ පස්සේ බලයට ගත්ත එයාගේ හොඳම මිත්‍රයා ඉස්ලාම් ආගම වැළඳගන්නවා. එයාගේ පුත්‍රයා ඉස්ලාම් ආගම වැළඳගන්නේ නැහැ. ඊට පස්සේ ඉස්සඉස්සෙල්ලාම මදීනාවලට ගියාට පස්සේ සිද්ධ වෙන යුද්ධය තමා බදුර් යුද්ධය. ඒ යුද්ධයේදි පුතා එන්නේ අනිත් පැත්තෙන්. එයා කාෆීර් හැටියට. මුස්ලිම් නොවන අය හැටියට මොහොමඩ් නබිතුමාගේ මුස්ලිම් කට්ටියත් එක්ක යුද්ධ කරන්න එයා එනවා. ඇවිල්ලා ඒ යුද්ධය ඉවර වුණාට පස්සේ අවුරුදු කිහිපයකට පස්සේ පුතා ඉස්ලාම් ආගම කොහොම හරි වැළඳගන්නවා. වැළඳගෙන ඇවිල්ලා තාත්තත් එක්ක ටික දවසකට පසු සුහදව කතා කරගෙන ඉන්න ගමන් පුතා කියනවා තාත්තට, තාත්තා ඒ යුද්දේදී ඔයාගේ බෙල්ල මගේ sword එක ඉස්සරහා ආවා තාත්තා නිසා මම කැපුවේ නැහැ කියලා. තාත්තා කියනවා මම ඔයාගේ බෙල්ල හොය හොයා හිටියා මට අහුවෙලා තිබ්බා නම් මම කපනවා කියලා. This is a two different story. One was a Muslim. Son was not Muslim. When son was not Muslim එයා මුස්ලිම් නොවන හින්දා තාත්තාව මැරුවේ නැහැ. තාත්තා පුතා හොයාගෙන තියෙනවා මරන්න. This is the thing that Islam has done. So Saharan also was same. That I'm not even his son. So its from his point of view killing me was nothing.

ප්‍ර : So who were the people who had come to or sent to kill you?

පි : According to the TID report this Hussainal Rizwi Kalith Zameer, then the person known as ගුරු මාමා his name is Mohamad Sharif Aathan Lebbe, Hayatha Mohomadu Ahamad Milhan, the person who was arrested and brought down to Sri Lanka from Saudi Arabia and Sadik Abdulla Hak Ibrahim. These are the people who had come in 2 motor

FAIR COMMENT BY JEZEEM

cycles. They followed me and I had gone to my sister's house.

ප්‍ර : And then what happened?

පි : ඊට පස්සේ ඒගොල්ලන් නංගිගේ ගෙදර තමයි මගේ ගෙදර කියලා mark කරගෙන ගිහිල්ලා තියෙන්නේ. TID වාර්තාවේ නම් ඊට පස්සේ මොකද සිද්ධ වුනේ කියන එක TID මට කිව්වේ නැහැ. ඒගොල්ලන්ට මාව මරන්න බැරි වෙලා තියෙනවා හේතුව මම ගිය හැම තැනම මිනිස්සු හිටියා. එතකොට ඒගොල්ලන්ට මාව තනියම හම්බ වුනේ නැහැළු. ඒ හින්දා මාව මරලා තිබුනේ නැහැ. ඊට පස්සේ මම මේ ගැන දන්නෙත් නැහැ, මේ බෝම්බ ප්‍රහාරයට පස්සේ මම TID එකට ගිහිල්ලා 27 වෙනිදා මේකට ගිහිල්ලා ආවට පස්සේ මම නංගීත් එක්ක කතා කර කර ඉන්න ගමන් නංගිට කිව්වා මෙහෙම දෙයක් සිද්ධ වෙලා තියෙනවා, අපිවත් දන්නේ නැහැ කියලා. ඊට පස්සේ නංගී ඒ වෙලාවේ කිව්වා මට දැන් තමයි මතක් වෙන්නේ පුද්ගලයෙක් අපේ ගෙදර කඩාගෙන ඇතුලට ආවා කියලා.

ප්‍ර : ඒ කොයි කාලෙද?

පි : ඒකත් නංගීට දිනය මතක නැහැ. කිව්වා ගිය අවුරුද්දේ කියලා.

ප්‍ර : ඒ කියන්නේ ඔබව ඝාතනය කරන්නට නැත්නම් ඔබව මරා දමන්නට කණ්ඩායමක් එවන්න ඉස්සර වෙලාද ඊට පස්සෙද?

පි : ඊට පස්සේ වෙලාවක. ඊට පස්සේ වෙලාවක වෙන්න ඕන කියන එක මම පස්සේ කියන තොරතුරුවලින් මට දැම්ම මේවා කරන්න පුළුවන්. ඊට පස්සේ නංගී කිව්වා පුද්ගලයෙක් ආවා. මම Office එකෙන් ගිහිල්ලා ඉන්න කොට ගේට්ටුවත් ඇරගෙන, දොරත් ඇරගෙන ඇතුලට පුද්ගලයෙක් ආවා. සාමාන්‍යයෙන් කවුරුත් එහෙම අපේ නංගිගේ ගෙදරට එන්නේ නැහැ. ගේට්ටුවෙන් bell එක තට්ටු කරලා තමයි එන්නේ. එතකොට මේ දෙකම ඇරෙන කොට නංගි හිතලා තියෙන්නේ මස්සිනා එනවා කියලා. බලන කොට මස්සිනාට වඩා කොට පුද්ගලයෙක්. එතකොට මස්සිනා නැත්නම් නංගී හිතාගෙන මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච කෙනෙක් මොනවා හරි හොරකමක් කරන්න එනවා කියලා ඒවගේ පුද්ගලයෙකුට face කරන්න ඕන විදියට තරහෙන් ඇවිල්ලා තියෙන්නේ. ඇවිල්ලා කෝපයට පත් වෙන විදියට බයත් එක්කම අහලා තියෙනවා ඇයි ඔයා ඇතුලට ආවේ කියලා. ඊට පස්සේ එයා කියලා තියෙනවා එයා එහෙම දෙයක් බලාපොරොත්තු වෙලා නැහැ, ආපු පුද්ගලයා පොඩ්ඩක් කලබල වෙලා කියලා තියෙනවා මම කැනඩාවල ඉදලා පාර්සල් එකක් ගෙනාවා කියලා. ඒත් නංගි මොකද කියලා අහන්නේ නැතුව එයාගේ හිතේ තිබිලා තියෙන්නේ කොහොම හරි මේ පුද්ගලයාව ගෙදරින් එළියට දාන්න ඕන කියලා. එයා කෑ ගහලම කියලා තියෙනවා එහෙම කවුරුත් මෙහේ නැහැ ගිහිල්ලා වෙන කොහේ හරි බලන්න. යන්න කියලා කෑ ගහලා තියෙනවා.

ප්‍ර : කාටද ඒ පාර්සල් එක දෙන්න උත්සාහ කර තියෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : නංගී ඒවා මුකුත් අහලා නැහැ. නංගිට හිතේ තිබිලා තියෙන්නේ ඇයි ගේ ඇතුලට ආවේ පුද්ගලයෙක්. කැනඩාවලින් හරි මොනවා හරි පාර්සලයක් තිබ්බොත් ගේට්ටුවේ ඉන්න තිබ්බා. ඇයි ඇතුලට ආවේ කියලා තමයි අතේ පාර්සල් එක තිබුණා නංගී කෑ ගහලා එළියට දාපුවාම පුද්ගලයා එළියට ගිහිල්ලා. ගියාම මම කිව්වා අපේ පාර dead and road ඉවර වෙන පාරක්. සාමාන්‍යයෙන් එන කට්ටිය වාහනේ Inside looking එකට තමයි park කරන්නේ. මේ පුද්ගලයා එළියට ගිය ගමන් බයික් එක ready වෙලා තියෙන්නේ පාර දිහා බලාගෙන. Main road එකට. නැග්ග ගමන් ගිහිල්ලා, එතකොට නංගිට සැකයක් හිතිලා තියෙනවා කැනඩාවලින් පාර්සලයක් ගෙනාවොත් එක්කෝ මට කතා කරනවා ගෙදර වැරදි නම්, අල්ලපු ගෙදර හරි බලනවානේ මේ number එක කාටද කියලා. එහෙම දෙයක් කලේ නැහැ නංගී ඒ ගැන ඊට වැඩිය එයාට හිතන්න දෙයක් තිබුනේ නැහැ දොරයි ගේට්ටුවයි දෙකම lock කර ගෙන ඇතුලට ඇවිල්ලා. ඊට පස්සේ මම මේ සිද්ධිය කිව්වාට පස්සේ තමයි නංගී මේ ගැන මට කිව්වේ. ඒත් ඒ පුද්ගලයා කවුද කියලා අපි දැනගෙන හිටියේ නැහැ. ජුනි 20 වෙනිදා website එකේ පලවෙලා තිබුණා මිල්හාන්ව ශ්‍රී ලංකාවට ගෙනාවේ හයාතු මොහොමද් අහමඩ් මිල්හාන් කියන එක්කෙනාව ලංකාවට ගෙනාවේ ජුනි 12 වෙනිදා. ජුනි 19 වෙනිදා හරි 20 වෙනිදා හරි website එකේ පල වෙලා තිබුනා මිල්හාන් ගැන මොනවා හරි ප්‍රවෘත්තියක් එයාගේ photo එක තිබුණා. මම ඊට පස්සේ නංගීට photo එකක් යැව්වා. මම එක එක පුද්ගලයාගේ photos යැව්වා. සාදික්ගේ photos,සහරාන්ගේ photos ඒ වගේ යවලා යවලා වගේ ඇහුවා.

ප්‍ර : මොන පරමාර්ථයෙන්ද ඒ පින්තූරය යැව්වේ ඔබ?

පි : ඒ ආපු පුද්ගලයා කවුද කියලා නංගීගෙන් දැන ගැනීම සඳහා.

ප්‍ර : හඳුනා ගැනීම සඳහා?

පි : හඳුනා ගැනීම සඳහා. ඊට පස්සේ මිල්හාන්ගේ photo එක යවපු ගමන්ම කිව්වා මෙයා තමයි ආවේ කියලා. නංගී ඒක තහවුරු කලා මිල්හාන් තමයි ගෙදරට ආවේ කියලා.

****

<u>**ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා**</u>:

ප්‍ර : TID එකෙන් මේ කරුණු සොයා ගත්තේ පාස්කු ප්‍රහාරයෙන් පස්සෙද?

පි : පස්සේ.

ප්‍ර : ඔය නම් ටික සොයා ගත්තෙත් පාස්කු ප්‍රහාරයෙන් පස්සෙද?

පි : පස්සේ.

ප්‍ර : ඊට කලින් දැන ගෙන හිටියේ නැහැ TID එක?

පි : මේ ගැන TID එක දැන ගෙන හිටියේ නැහැ කියලා තමයි මම හිතන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප : නැහැ කියන්නේ මේ විස්තර දැනගෙන හිටියා, පුද්ගලයින් දැන හිටියේ නැහැ?

පි : මාව මරන්න හැදුවා කියන විස්තර TID එක දැනගෙන හිටියේ TID එක කියපු ආකාරය නම් මේ හුසෙනුල් රිස්වි කාලිප් සමීර් කියන එක්කෙනා දිපු පාපොච්චාරණයෙන් පස්සේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප : ඔබට කියන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට තක්යා පල්ලියක් කියන්නේ මොකක්ද?

පි : තක්යා පල්ලිය කියන්නේ සිකුරාදා ජුම්මා පවත්වන්නේ නැති පල්ලි. පොඩි පල්ලිවලට තමයි ඒ නම හදුන්වන්නේ.

ප : එතකොට ජුම්මා පල්ලියක් කියන්නේ?

පි : ජුම්මා පල්ලිය කියන්නේ ලොකු පල්ලියක්. සිකුරාදා දේශනාව හා දේව මෙහෙය පවත්වන පල්ලිවලට.

ප : මර්කස් එකක් කියන්නේ?

පි : මර්කස් එකක් කියන්නේ The head office කියන අර්ථය තමයි ඒකට භාවිතා වෙන්නේ. නැත්නම් Main office කියන එක මර්කස්. Main මධ්‍යස්ථානය කියලා කියන්න පුළුවන්.

ප : මහල්ලක් කියන්නේ?

පි : මහල්ලක් කියන්නේ එක පල්ලියක් යටතේ පදිංචි වෙලා තියෙන පවුල් අඩංගු ගම්මානයට තමයි මහල්ලක් කියන්නේ. සාමාන්‍යයෙන් ග්‍රාම සේවක වසම කියලා අපි හදුනනවා වාගේ පල්ලිවලට පදිංචි මුස්ලිම් අය කොළඹ නම් ඒ ක්‍රමය ගොඩාක් අඩුයි, අනික් ගම්වල පල්ලිවල යටතේ තමයි මුස්ලිම් අය පදිංචි වෙලා ඉන්නේ. එතකොට තමයි කියන්නේ ඒ පල්ලිවලට අයිති මහල්ලාවක් කියලා.

ප : එතකොට මහල්ලවාසී කියන්නේ?

පි : ඒකේ වාසය කරන පිරිසට කියන්නේ මහල්ලාවාසී කියලා. ඒ ප්‍රදේශය ඇතුලත.

ප : එතකොට මහල්ලාවේල්ල කියන්නේ?

පි : මහල්ලාවේල්ල කියන්නේ මහල්ලා වැඩක්. ඒ කියන්නේ තබ්ලික් ජමාත් සංවිධානය සතියකට දවසක් වෙන් කරනවා එක් එක් මහල්ලාවලට ඉන්න මිනිස්සුගෙන් මුස්ලිම් අය හොගෙන ගිහිල්ලා ඒ අයට ආගම දේශනා කරන්න, පල්ලියට එන්නේ නැති මිනිස්සු පල්ලියට ගේන්න වගේ වැඩ වලට ඒගොල්ලන් දවසක් වෙන් කරනවා තබ්ලික් ජමාත් සංවිධානයෙන්. ඒකට තමයි මහල්ලාවේල්ල කියන්නේ. සතියකට දවසක් ඒකට යොමු කරනවා.

ප : ජමාත් එකක් කියන්නේ මොකක්ද?

පි : ජමාත් කියන්නේ අර්ථ ගොඩාක් තියෙනවා. සාමාන්‍යයෙන් අපි දන්න අර්ථය තමයි එකමුතුව නැත්නම් ඔක්කොම එකතුවෙලා හදන, මුස්ලිම්වරු ඔක්කොම එකතු වෙන එකට තමයි ජමාත්

FAIR COMMENT BY JEZEEM

කියන්නේ. එක එක සංවිධානවලටත් ජමාත් කියලා තමයි හඳුන්වන්නේ. ඒක අරාබි වචනයක්. ජමාත් කියන්නේ ජුම්මා කියන එකතු වීම වගේ තමා. ජුම්මා, ජමාත් කියන්නේ එක වචනයෙන් එන ඒවා.

ප්‍ර : එතකොට බයන් එකක් කියන්නේ මොකක්ද?

පි : බයන් එකක් කියන්නේ ආගම දේශනාව. Preaching

ප්‍ර : චිල්ලා කියන්නේ?

පි : චිල්ලා කියන්නේ ඒක තබ්ලික් ජමාත් එකට අයිති වචනයක්. ඒගොල්ලන් දවස් 3 ක්, දවස් 40 ක් මාස 4 ක් වාගේ ගෙදරින් පිටත් වෙලා එක එක පල්ලිවල නැවතිලා නැවතිලා ඒ ඒ මහල්ලාවලට ඉන්න මිනිස්සුන්ට ආගම උගන්වනවා පල්ලියට ගෙන්වා ගෙන ඒ වැඩ කරන්න ඒගොල්ලන් ගෙදරින් පිටත් වෙලා යනවා.

ප්‍ර : දවස් කීයේ වගේ ඒවා තියෙනවද චිල්ලා?

පි : දවස් 3, දවස් 40, මාස 4 ඒවගේ ඒගොල්ලන්ගේ වෙනම නම්බර් ක්‍රමයක් තියෙනවා.

ප්‍ර : ඒ ගිහිල්ලා ධර්මය තමයි ඒගොල්ලන් කියලා දෙන්නේ?

පි : ධර්මය තමයි කියලා දෙන්නේ. පල්ලිවල තමයි නැවතිලා ඉන්නේ.

ප්‍ර : මෂුරා කියන්නේ?

පි : මෂුරා කියන්නේ Discussion එකක්. යම්කිසි මොනවා හරි තීරණයක් ගන්න Discus කරලා කරන Discussion එකට තමයි මෂුරා කියන්නේ.

ප්‍ර : දුවා ප්‍රාර්ථනය කියන්නේ මොකක්ද?

පි : දුවා කියන්නේ praying from the God to ask something. Facilitations කියලා කියන්න පුළුවන්.

ප්‍ර : ඔළු කරනවා කියන්නේ?

පි : ඔළු කරනවා කියන්නේ prayer එකක්.

ප්‍ර : Before you enter the Mosque?

පි : Mosque for the five time prayers or any prayer, compulsory prayer or any prayer have to wash hands, face, foot and welling some part of the hair and ears.

ප්‍ර : Why some part?

පි : පොඩ්ඩක් මෙහෙම කරානම් ඇති කියලා තමයි ආගමේ කියලා තියෙන්නේ. Don' t ask me for the explanation, for the reason but it is now the Mohammad have introduced. Take some water and make wet of your hair. That is also part of this one.

ප්‍ර : ඒක දුවිලි වලිනුත් කරන්න පුළුවන්ද?

පි : පුළුවන්. අසනීපයක් තියෙනවා නම් දුවිලි අතගාලා දුවිලිවලින්ම ඒ දේ කරන්න පුළුවන් කියලා. දුවිලි වලිනුත් කරන්න පුළුවන්. මෙතන අදාල නොවුනට මුස්ලිම් අය කියනවා පස් වේලක් අපි

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ශුද්ධයෙන් ඉන්නවා, .We are healthy ඒ තර්කය එතනින් කැඩෙනවා දුවිලිවලින් ඒක කරන්න ගියාම.

ප්‍ර : එතකොට බාංගු කියනවා?

පි : බාංගු කියනවා කියන්නේ පස්වේල පල්ලියට එන්න කියලා ආරාධනා කිරීම සඳහා කියන එක තමයි බාංගු කියලා කියන්නේ. Speaker වල පල්ලිවලින් ඇහෙන්න ලැබෙනවා ඒක. අදාන් කියලත් කියනවා බාංගු කියලත් කියනවා.

ප්‍ර : ඔබ දන්නවද හමුදාව, ත්‍රිවිධ හමුදාව, යුධ හමුදාව, නාවික හමුදාව ගුවන් හමුදාව යන ත්‍රිවිධ හමුදා, පොලිසියෙත් ඔය අන්තවාදී අදහස් දරන යම් සාමාජිකයෝ ඉන්නවද කියලා? ඔබට ඒ අයව ආශ්‍රය කරන්නට යම් අවස්ථාවක ඉඩ ලැබිලා තියෙනවාද?

පි : ඒක ඉස්ලාමිය සංවිධානත් එක්ක සම්බන්ධ වෙලා ඉන්න යම්කිසි පුද්ගලයෝ ගැන දන්නවා. ඒක සමහර අය විශ්‍රාම ගිය අය. සමහර අය තාම සේවයේ ඉන්න අය.

ප්‍ර : විශ්‍රාම ගිය අයගෙන් ඔබ කවුද දන්නේ?

පි : Air force එකට අයිති මුනාස් නානා, මුනාස් කියලා එක්කෙනෙක් ඉන්නවා මාවනැල්ලේ තවුහිද් ජමාත් එක්ක ඉතා දැඩි මත දරන තවුහිද් කෙනෙක් ඉන්නවා. මුනාස් කියලා Air force එකේ හිටපු. තවත් තාමත් Air force එකේ ඉන්නවා ඇතියි කියලා මම හිතන්නේ නමුත් මම එයාව දන්නේ 2009 වෙන කල්. ඊට පස්සේ එයා තමා Pension ගියාද නැද්ද දන්නේ නැහැ යාසින් කියලා කෙනෙක් එයා ජමාතේ ඉස්ලාමිය සංවිධානයත් එක්ක ඉන්නවා. තව අපි හඳුනනවා මහදුන් රාලහාමි කියලා,

ප්‍ර : පොලිසියේ?

පි : පොලිසියේ.

ප්‍ර : එයා කොහේද?

පි : එයා මාවනැල්ලේ තක්යා පාරේ. ජමාත් ඉස්ලාමිය සංවිධානයේ විශ්‍රාම ගිය එක්කෙනෙක්. එයා ජමාත් ඉස්ලාමිය සංවිධානයේ Founder member කෙනෙක් First batch of the people who joined Jamathe - e – Islani.

ප්‍ර : ඔහු දැන් විශ්‍රාමිකයි ඔබ කියන ආකාරයට?

පි : දැන් විශ්‍රාමිකයි.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : ඕනම මුස්ලිම් ජාතිකයෙක් ඕනෑම සංවිධානයක සාමාජිකයෙක්ද සාමාන්‍යයෙන් ?

පි : නැහැ එහෙම අවශ්‍යතාවයක් නැහැ, ඕනම එක්කෙනෙකුට ඕනම සංවිධානයකට එකතු වෙන්න පුළුවන්. නමුත් ඒගොල්ලන්ගේ තනතරු, උසස්වීම් ඒවගේ අර එක එක Circles තියෙනවා. දැන් අපි ඕනම Administration section එකක් ගත්තොත්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාමාන්‍යයෙන් සේවකයෝ Management Staff, CEO අර ඒවගේ තියෙනවා වගේ ඒකත් යම්කිසි Circles තියෙනවා.

ප්‍ර : නමුත් තමන් මුස්ලිම් ලබ්දිකයෙක් නම් මේ කුමන සංවිධානයකට හෝ එකතු වී සිටිය යුතුයි කියලා තියෙනවද, එහෙම නැතුව මුස්ලිම් ආගම අදහන වෙනමම කට්ටියක් ඉන්නවද?

පි : එහෙම කිසිම ආගම් සංවිධානයකට නැතුව නිකම් ඉස්ලාම් ආගම අදහන කට්ටිය ඉන්නවා. ගොඩක් ඉන්නවා. 90 දශකයේදි වාගේ ජමාතේ ඉස්ලාමීය ගෙනාවා ප්‍රචාරයක් ඕගොල්ලන් තනියෙන් ඉන්න එපා අපිත් එක්ක ආවේ නැති වුනත් කමක් නැහැ, කුමන හෝ ඉස්ලාමීය සංවිධානයකට එකතු වෙන්න. කුමන හෝ ජමාත් එකකට එකතු වෙන්න තනියම ඉන්න එපා කියන ප්‍රචාරය ජමාතේ ඉස්ලාමීය අරන් ගියා.

ප්‍ර : ලංකාවේ ඉන්න මුස්ලිම් ජනතාවගෙන් මුස්ලිම් ලබ්ධිකයන්ගෙන් වැඩි ප්‍රමාණයක් සංවිධානවලට එකතු වෙලාද ඉන්නේ නැද්ද?

පි : සංවිධානයකට එකතු වෙලා හෝ නැත්නම් අනුගාමිකයන් හැටියට හරි ඉන්න ප්‍රමාණය වැඩියි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : එතකොට දැන් ඔබ මට කිව්වේ ගුවන් හමුදාවේ, පොලිසියේ නේ එතකොට නාවික හමුදාවේ, යුධ හමුදාවේ?

පි : මේ මොහොතේ නම් මට මතක හැටියට කියන්න මුකුත් මතක් වෙන්නේ නැහැ. මොකද මමත් සම්බන්ධ වෙලා හිටියේ 2009 ට කලින්. ඒත් මට එකක් කියන්න පුළුවන් මම දන්න තරමට ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ. අනෙක් සංවිධානවල ඒ වගේ වැඩ පිළිවෙලක් නැහැ ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ වැඩපිළිවෙලක් තියෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ හා රාජ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න මුස්ලිම් අයව ඒගොල්ලන්ගේ පැත්තට ගන්න ඕන කියන එකයි ඒගොල්ලන්ට තියෙන්නේ. ඒගොල්ලන්ට Society එකකට ඇතුලත් කරලා Circle එකක් හදලා දීලා ඒ හරහා ඇතුලට ගන්න ඕන කියන එක. Doctor ලා ඉදලා ඒගොල්ලන් ඒවගේ target එකක් කරනවා පොලිසිවලින් විශ්‍රාම ගිය නිලධාරීන් ඒ වගේ කට්ටිය ඒගොල්ලන් target කරනවා. ඒගොල්ලෝ ඒ කට්ටියත් එක්ක ගිහිල්ලා කතා කරලා සාමාන්‍ය පොලිස් නිලධාරියෙක් ගත්තොත් මුස්ලිම් සමාජයේ ඒ පොලිස් නිලධාරීන් සමාජයේ අනිත් මිනිස්සුත් එක්ක ආශ්‍රය කරනවා අඩුයි. Doctor ස්ලා ගත්තොත් සමාජය අඩු කරන එක අඩුයි. ඒගොල්ලන්ගේ status එක, ඒගොල්ලන්ගේ වැඩ එක්ක අඩුයි. ඒත් ජමාතේ ඉස්ලාමීය ඒ බැරියර් එක කඩාගෙන ගිහිල්ලා ජමාතේ ඉස්ලාමිය පැත්තට ගන්න වැඩ පිළිවෙලක් ඒගොල්ලන් ගාව තියෙනවා.

ප්‍ර : එතකොට ඔබ දැන් මෙතෙක් දෙන ලද සාක්ෂි අනුව පැහැදිලිව සඳහන් කර තියෙනවා මේ ගරු කොමිෂන් සභාවට ඉස්ලාම්

Presidential Secretariat's Copy
FAIR COMMENT — BY JEZEEM —

ධර්මයේ යම් යම් අපැහැදිලි තැන් සහ සාමාන්‍ය ජන ජීවිතය සලකලා බලන කොට බහුවාර්ගික, බහු ආගමික රටක අනිත් අයගේ හැසිරීම්වලට කෙලින්ම බලපෑම් ඇති කරන යම් යම් අංශ, ප්‍රතිපත්ති සහ මූලධර්ම තියෙනවා කියලා?

පි : ඔව්. අනෙක් අයට පමණක් නොව මුස්ලිම් අයට පවා බලපෑම් ඇති කරන දේවල් තියෙනවා.

ප්‍ර : එතකොට දැන් ඒ පිළිබඳව මුස්ලිම් ප්‍රජාව ප්‍රශ්න කරන්නේ නැද්ද මේ ආගමේ කියලා තියෙනවා අපේ ආගම අනුගමනය කරන් නැති, මම කියන්නේ ආගම ඉස්ලාම් වෙලා ඉදලා එයින් අතහැරපු අය නෙමෙයි, නමුත් වෙනත් ආගම් තමන්ගේ ජීවිතයේ ඉපදුන දවසේ ඉදලා අදහන අය, වෙනත් දර්ශන ගැන විශ්වාසය තියෙන අය, දැන් ඒ වගේ අය මුස්ලිම් වුනේ නැත්නම් ඒ අයව ඝාතනය කරන්න ඕනේ ඔබ කිව්වා හදීෂ්වල එහෙම තියෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට එහි යම් ඝට්ටනයක් තියෙනවානේ සාමාන්‍ය ජන ජීවිතයත් එක්ක, එතකොට ඔය වගේ දේවල් බැලුබැල්මටම සාමාන්‍යයෙන් තර්ක කරන්නටම අවශ්‍ය නැහැ, නමුත් ඕනෑම සාමාන්‍ය බුද්ධිත පුද්ගලයෙක්ට මේකේ ප්‍රශ්නයක් තියෙන බව පේනවානේ නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ පිළිබඳව මුස්ලිම් ප්‍රජාව ප්‍රශ්න කරන්නේ නැද්ද, තරුණයන් ප්‍රශ්න කරන්නේ නැද්ද තමන්ගේ වැඩිහිටියන්ගෙන්? වැඩිහිටියෝ වැඩිහිටියෝ ඒ ගැන සාකච්ඡා කරන්නේ නැද්ද? මොකක්ද තත්ත්වය?

පි : ඒක ඉතාම අමාරු ප්‍රශ්නයක් සමහර කට්ටිය එහෙම හිතන්න පුළුවන්. මාව ගත්තොත් මම ඉස්ලාම් ආගම ඉගෙන ගන්න නැත්නම් ඒවට සම්බන්ධ වෙන්න පටන් ගත්තේ 1993 වගේ කාලයේ. මේ වගේ දේවල් මම ආගමෙන් එළියට එන්නේ 2013 . එතකොට මේ වෙන කල් කාලය තුල මේ වගේ දේවල් සෑහෙන ප්‍රමාණයක් මට හම්බ වෙලා නැත්නම් මුණගැහිලා තියෙනවා. නිබුණට මම පවා එක පාරටම එහෙම හිතුනේ නැහැ, මටත් ඒ ලොකු කාලයක් ගියා. ගිහිල්ලා එළියට එනවා කියන එක ඉතාම ලේසියෙන් සිද්ධ වුනේ නැහැ It's like amother giving birth වගේ ගොඩක් mental stress එක ඒ වගේ ගොඩක් ප්‍රශ්න ගොඩක් හිතලා තමයි එළියට ආවේ. ආවට පස්සෙත් මට සාමාන්‍ය ජීවිතයේ ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තියෙනවා ශ්‍රී ලංකාව වගේ මුස්ලිම් නොවන රටක. එතකොට මුස්ලිම් අය ඒ ගැන හිතන්න තියෙන chances ගොඩාක් අඩුයි කියන එක තමයි මගේ experience එක උඩ මට කියන්න පුළුවන්. මොකද ආගමේ ඒ විදියට පොඩි කාලේ ඉදලම හදලා තියෙනවා. For example if you get the tortoise ඉබ්බා ගත්තොත් ඒ ඉබි කටුවෙන් එළියට ඇවිල්ලා එයාට ජීවත් වෙන්න පුළුවන් කියලා ඒ සතා කවදාවත් හිතන්නේ නැහැ. කටුත් එක්ක තමයි යන්නේ, එන්නේ ඔක්කොම

FAIR COMMENT — BY JEZEEM

කරන්නේ. ඒ වගේ තමයි මුස්ලිම් මිනිස්සුත් සාමාන්‍යයෙන් මෙන්ටලි ඒවගේ මානසික තත්ත්වයේ තමයි ඉන්නේ. It is very difficult for a Muslim to think easily that she can leave the religion. ඒක තමයි දැන් ලෝකේ ගත්තොත් නිරාගමික Atheist කියන කට්ටිය ඉන්නවා. හැබැයි තව පිරිසක් ඉන්නවා. ex-Muslims කියලා. මේ ex-Muslims 80% ක්ම Atheist නැත්නම් Agnostheist . හැබැයි මේ ex-Muslims සමහර රටවල ඉන්නවා සංවිධාන හදාගෙන ඉන්නවා. මේ කට්ටිය විතරයි තමාගේ ආගමට එක්ස් එකක් දාලා හිටපු මුස්ලිම්වරු කියලා නමක් දාගෙන සංවිධානයක් හදාගෙන ඉන්නේ. කොහේවත් බෞද්ධාගම අදහාලා ඊට පස්සේ ඒකෙන් එළියට ගිය හින්දු ආගම ක්‍රිස්ත්‍රියානි ආගම අදහාලා ආගමක් මට එපා කියලා එළියට ගිය ගොඩාක් පිරිසක් ඉන්නවා. ගොඩාක් කියන්නේ scientists ලා ඒ වගේ Doctors ලා වගේ පිරිසක් ඉන්නවා. ඒගොල්ලෝ කවදාවත් ex-christian, ex-Buddhist, ex-Hindu කියලා සංවිධාන හදලාවත් තමාව identification එකක් කරලා නැහැ. Atheist කියන විදියට විතරයි තමාව හඳුන්වා දුන්නේ. හැබැයි මුස්ලිම් අයට විතරයි, ඉස්ලාම් ආගමෙන් එළියට ගිය අයට විතරයි මේ නම අවශ්‍ය වෙන්නේ. ඒකට ප්‍රධානම හේතුව තමයි අපිට තියෙනවා ලොකු වගකීමක් මුස්ලිම් ජනතාවට දෙන්න ඕන පණිවිඩයක් ආගමෙන් එළියට ගිය කට්ටියක් ඉන්නවාය කියන පණිවිඩය. ඒක පවා ඒගොල්ලන්ට හිතන්න ගොඩක් අමාරුයි. මම Facebook වල ලියපු කාලේ ගොඩක් අය කිව්වා මේක fake profile කාගේ හරි පොටෝ එකක් අරගෙන මෙයා දාගෙන ඉන්නේ. නැත්නම් මෙයා මුස්ලිම් වෙන්නම බැහැ. වෙන ආගමේ කවුරු හරි කෙනෙක් කොහේ හරි එක්කෙනෙක් එක එක දේවල් හොයාගෙන මුස්ලිම් ආගම නිකන් මේවා කරන්න යනවා කියන එක තමයි ගොඩක් අය කියපු දේ.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු දැන් මේ කලින් අහපු ප්‍රශ්නෙට අදාලව අහන්නේ, ඊට කලින් කිව්වා පොලිසියේ සහ Air force එකේ නම් දෙකක් කිව්වා, ඒ වගේ මම අහන ප්‍රශ්නය, ජමාතේ ඉස්ලාම් හා වෙනත් සංවිධාන වල ලංකාවේ දේශපාලඥයෝ කවුද ඉන්නේ? නම් මොනවද?

පි : දේශපාලඥයෝ නම් අර

ප්‍ර : දන්නවා ඇති නේ?

FAIR COMMENT
BY JEZEEM

පි : මම කලින් සඳහන් කරපු පක්ෂය තමයි NFGG කියන පක්ෂය. ඒක සම්පූර්ණයෙන්ම ජමාතේ ඉස්ලාමිය එකට සම්බන්ධ පක්ෂයක්.

ප්‍ර : යහපාලන ?

පි : යහපාලනය වූ ජාතික ව්‍යාපාරය. NFGG National Front for the Good Governance කියන්නේ ජමාතේ ඉස්ලාමිය හා ජමෙයිතුල් සලමා කියන ඉස්ලාම් සංවිධානයට

ප්‍ර : ඒක මුස්ලිම් කොංග්‍රස් එකට සම්බන්ධ පක්ෂයක්?

පි : එක්තරා කාලයක Parliament Election 2015 වෙන කොට ඒගොල්ලෝ ගිවිසුමක් අත්සන් කරලා තිබුණා.

ප්‍ර : අර එහි සභාපති තමයි අර අබ්දුල් රහුමාන්

පි : අබ්දුල් රහුමාන් ඉංජිනියර්.

ප්‍ර : දැන් ඒ වගේ තව කවුද ඉන්නේ?

පි : තව මට කියන්න තියෙන තොරතුරු තමයි මේක තහවුරු කරන්න බැහැ, ජමාතේ ඉස්ලාමිය ඉන්න කාලේ මට මාවනැල්ල ජමාතේ ඉස්ලාමිය එකෙන් කිව්වේ M.H.M. අෂ්රොප් පවා අපිත් එක්ක ඉදලා තමයි දේශපාලන පක්ෂයක් හදන්න ගියේ කියලා. ඒක කිව්වා.

ප්‍ර : තව නැගෙනහිර ප්‍රාදේශිය මන්ත්‍රිවරයෙක් සහරාන් එක්ක සම්බන්ධව හිටියා නේද ඔහුට සැඟවී සිටින්නත් උදව් කලා කියලා ප්‍රාදේශිය සභාවක දේශපාලඥයෙක්?

පි : ඊයේ පෙරේදාත් අත්අඩංගුවට ගෙන තිබුණා. ඒ ප්‍රවෘත්තිවල දැන ගත්ත ඒවාට හැර මම කෙලින්ම

ප්‍ර තමා දන්නේ නැහැ.

පි : දන්නේ නැහැ, හැබැයි ඉස්ලාමිය සංවිධාන හා දේශපාලනය අතර කිසිම මත ගැටුමක්වත් මේකක් නැහැ හොඳ සම්බන්ධතාවයක් තියෙනවා මට මතක හැටියට 2006 වගේ කාලයේදි පුත්තලමේ පැවතිච්ච ජමාතේ ඉස්ලාමිය ශිෂ්‍ය ඒකකයේ වාර්ෂික මහ සමුළුවට විශේෂ ආරාධිත අමුත්තා හැටියට ඒවන කොට හිටපු මුස්ලිම් දේශපාලඥයෙක් ඒක හරියට නම මතක නැහැ මට, එක්කෝ හිටපු ඇමති රවුෆ් හකීම් මැතිතුමා වෙන්න ඕනේ නැත්නම් රිෂාඩ් බදුර්දීන් වෙන්න ඕනේ. දෙන්නගෙන් එක්කෙනෙක් ගිය බව මට මතකයි.

ප්‍ර : තමන්ට ආරංචි වෙලා තියෙන, ගොඩක් අධ්‍යයනය කරනවානේ මුස්ලිම් අය, ආගම් Facebook වල, අධ්‍යයනය කරන කොට ඒක අධ්‍යයනය කලේ නැද්ද මේකට සම්බන්ධ දේශපාලඥයෝ ඉන්නේ කවුද කියන එක? එය වැදගත් දෙයක් වෙනවානේ?

පි : එතන මට තව දෙයක් කියන්න පුළුවන් ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ Head office කොළඹ 2 එකේ තියෙනවා වොක්ෂෝල් පාරේ වෙන්න ඕනේ දාරු සලාම් කියන එක. ඒකේ හැම බ්‍රහස්පතින්දා දවසකම හවස කුරාන් පන්ති පැවැත්තුවා. ඒක නලීමියාගේ කට්ටිය කලා. ඒකට භාර වෙලා හිටියේ සාහිර් කියන නලීමියා එකේ ඉගෙන ගත්ත එක්කෙනෙක්. ඒක මම දන්නවා.

FAIR COMMENT — BY JEZEEM

ඒගොල්ලන් ඒක පැවැත්තුවා. එහෙම නැතුව මම දන්න තරමට ඉස්ලාමිය සංවිධානයත් එක්ක දේශපාලකයෝ සාමාජිකයෝ දන්න තරමට සහභාගි වුනේ නැහැ මොකද විවිධ ආගම් කණ්ඩායම් ඉන්න නිසා ඒගොල්ලන්ට ජන්දයට අවාසි වෙන්න පුළුවන් කියලා ඒගොල්ලෝ කෙලින්ම කවදාවත් මේවා කරන්නේ නැහැ, මොනවා හරි ආගමික සංවිධානයකට මේ දේශපාලඥයා අයිතියි කියලා එයාට ලේබල් එකක් ආවොත් සමහරවිට අනෙක් ජමාත්වල ඉන්න කට්ටිය එයාට ජන්දය නොදී ඉන්න පුළුවන්. ඒ හින්දා මම හිතන්නේ නැහැ ඒගොල්ලන් එහෙම කරයි කියලා.

ප : නමුත් නැගෙනහිර ප්‍රදේශයේදි යම් අවස්ථාවක සහරාන් එක්ක සම්බන්ධ වුණා?

පි : ඔව් ඒවත් මම ප්‍රවෘත්තිවල තමයි ඒවා දැක්කේ. එක එක දේශපාලඥයෝ. දැන් ඊයේ පෙරේදාත් මුතුර් හරි කින්නියා ප්‍රදේශයේ ප්‍රාදේශිය දේශපාලඥයෙක් අත් අඩංගුවට ගත්තා කියලා බැලුවා. ඒ ගැන විස්තර මම දන්නේ නැහැ.

ප : ජමාතේ ඉස්ලාමිය සංවිධානයට දේශපාලන ආධාර මුදල් ආධාර එහෙම ලැබුණද?

පි : දේශපාලකයින්.

ප්‍ර : ඒ වගේ කට්ටියගෙන්?

පි : මම දන්න තරමට නැහැ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප : ඔබ මගේ කලින් අසපු ප්‍රශ්නය ගැන ඔබේ අවධානය යොමු කරමින් ඒකට දුන්න පිළිතුර ගරු කොමසාරිස් තුමා අහන ප්‍රශ්නවලට පෙර මම යොමු කලේ ප්‍රශ්නයක්?

පි : ඔව්.

ප : ඔබ ඒ දුන්න පිළිතුර අනුව ඔබ අදහස් කරනවද මුස්ලිම් ජාතිකයින් ඒ කියන්නේ ඉස්ලාම් භක්තිකයින් විසින් තමන්ගේ ආගම කොයිම වෙලාවකවත් ප්‍රශ්න කිරීමට සුදානම් නැහැ කියලා, 99.9% ක්ම?

පි : ඔව් 99.9% ක් ප්‍රශ්න කිරිම්වලට සුදානම් නැහැ.

ප : ඔවුන්ට කියන්නේ මොනවද ඒ අනුව ඔවුන් ජීවත් වෙනවා මිසක් ඊට එරෙහිව තර්ක කරන්නවත්, විවාද කරන්නවත් ඔබ කියන ආකාරයට එහෙම ඔවුන් පෙළඹෙන්නේ නැහැ?

පි : තර්ක විවාද කරන්නේ සංවිධානයේ ඇතුලේ තියෙන මත ගැටුම් ගැන විතරයි තර්ක කරන්නේ. එහෙම නැතුව ඉස්ලාම් එකේ Principles ගැන ඒගොල්ලෝ කවදාවත් තර්ක කරන්නේ නැහැ.

ප : දැන් ඔබ පසුගිය අවස්ථාවෙත් අද දිනත් මේ දෙන ලද සාක්ෂිය අනුව ඉතා පැහැදිලිව පේනවා ඉස්මත් මහත්මයා මුස්ලිම් ප්‍රජාවගේ සමහර අයගේ මනසේ ඇති වෙලා තියෙන මේ මුස්ලිම් රාජ්‍ය සංකල්පය සලකලා බලන කොට ඒක අනිත් ශ්‍රී ලංකාව ගත්තාම එහි ජන ජීවිතයට ඉතා දැඩි ලෙස බලපෑම් ඇති කරන්නට පුළුවන් කියලා නේද?

පි : ඔව්.

ප්‍ර : ඒ වගේම එහි ප්‍රතිඵල යම්තාක් ආකාරයට අපි අත්දුටුවා ජීවිත අහිමි වීමෙන් 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා සිදු කරන ලද ඒ මිලේච්ඡ සංහාරය, ඒ වගේම ඔබ අද දින ගරු කොමිෂන් සභාවට කිව්වා ISIS ත්‍රස්තවාදී සංවිධානයේ තියෙන මතවලටත් නැඹුරුතාවයක් සහරාන් වගේ අය ඒ කියන්නේ මුස්ලිම් ප්‍රජාවගේ ඇතැම් අයට නායක්වය දෙන සහරාන් වගේ අය දක්වලා තිබුනාය කියලා. එතකොට අපි දන්න විදියට අහලා තියෙන විදියට මා කිව්වොතින් හරිද ISIS සංවිධානය ඒ කියන්නේ ඝාතන පෙරදැරි කරගෙන කටයුතු කරනු ලබන සංවිධානයක් කියලා?

පි : පෙරදැරි කරගෙන කියන්නේ

ප්‍ර : That's in the fore front? The elimination, the killing is in the fore front?

පි : Yes

ප්‍ර : ඒ වගේම එවැනි ඝාතන කිරීම් කෆීර්වරුන් වන මුස්ලිම් ජාතිකයින් නොවන අයට විතරක් සීමා වෙන්නේ නැහැ මුස්ලිම් ජාතිකයින්ගෙත් ආගම හරියට අදහන්නේ නැහැ, ආගමෙන් ඔවුන් වෙන් වෙලා තියෙනවා කියලා යම් ආකාරයේ අවබෝධයක් තියෙනවා නම් ඔවුන් පවා ඝාතනය කරන්නට පසුබට වෙන්නේ නැහැ නේද ඒ අය?

පි : නැහැ. ඒකට History එකේම උදාහරණ කිහිපයක්ම තියෙනවා.

ප්‍ර : ඔබ මේ වනකොටත් ඒ පිලිබඳව මේ ගරු කොමිෂන් සභාව දැනුවත් කරලා තියෙනවා?

පි : දැනුවත් කරලා තියෙනවා.

ප්‍ර : එතකොට එහෙම නම් ඔබට පේනවා නේද මේක ලංකාවේ වගේම මුළු ලෝකයේම, මුළු පෘතුවියටම බලපානු ලබන ඉතා බැරෑරුම් ප්‍රශ්නයක් කියලා, මේ තියෙන මානසික තත්ත්වය ඇතැම් මුස්ලිම් ප්‍රජාවගේ?

පි : ඔව්.

ප්‍ර : එහෙම නම් ඉස්ලාම් භක්තිකයෙක් ලෙස ඒ ආගම හදාරනු ලැබූ ඔබ තරුණයෙක් විදියට ජමාතේ ඉස්ලාම් සංවිධානයට බැඳිලා එහි යම් යම් අධ්‍යාපන කටයුතු කරපු එහි ක්‍රියාකාරකම් කරනු ලැබූ ඔබ ඇතැම් අවස්ථාවකදී තවුහිද් අදහස් දරන ලද ඔබ කොයි ආකාරයටද මේ රටේ එවැනි එක් ආකාරයකට කොටු වූ මානසික රාමුවකින් ඉන්න ඇතැම් මුස්ලිම් ප්‍රජාව ඒ අන්තගාමී අදහස්වලින් මුදා ගන්නට පුළුවන් කියලා ඔබට යෝජනා කරන්නට පුළුවන් කියලා?

පි : ඔව්. මට ඒ ගැන යෝජනා කරනවා නම් ඒ ගැන දිගුකාලීන වැඩ පිලිවෙලක් ඕන වෙනවා. මිශ්‍ර නොවන තනිකර මුස්ලිම් මිනිස්සු විතරක් ජීවත් වෙන සමාජයක් ඒකට නොසුදුසුයි. ඒ ඇතුලේ මුස්ලිම් අය මුස්ලිම් අයත් එක්ක විතරක් ආශ්‍රය කරන කොට ඒගොල්ලන්ට ගොඩක් අනිත් මිනිස්සුන් ගැන කිසිම දෙයක් දැන ගැනීමට ලැබෙනවා අඩුයි. තමන්ගේ ආගම ගැන ගොඩක් කතා

FAIR COMMENT BY JEZEEM

කරන්න කතා කරන්න ඒක තව තව ශක්තිමත් වෙනවා. එතකොට ඒවා වෙනත් ජාතීන් සමඟ මිශ්‍ර වෙන්න ඕන. අනිත් එක මා කලිනුත් සඳහන් කලා අනිත් ආගම්වල, අනික් සමාජවල නැති තරමට මුස්ලිම් සමාජය ඇතුලේ ඉස්ලාම් ආගම උගන්වන ජමාත් සංවිධාන වැඩ කරන පිරිස සෑහෙන්න ඉන්නවා. ඒ අය ඉන්න කල් මුස්ලිම් අය මේ තත්ත්වයෙන් එළියට ගන්න එක අපහසුයි. තමාගේ ආගම හැමවෙලේම මතක් කරන කොට. 1980 ට කලින් ඒ වගේ තත්ත්වයක් ලංකාව තුල තිබ්බේ නැහැ ලෝකේ ගොඩක් රටවල ඇතුලේ ඒවගේ භයානක තත්ත්වයක් ඒතරම් තිබ්බේ නැහැ. මොකද ඒ කාලය වෙන කොට අරාබි වලින් විතරයි තිබුනේ ගොඩක් හදිෂ් ග්‍රන්ථ. 90 ට පස්සේ තමයි මේවා translate කරන්න පටන් ගත්තේ. මේ හදීෂ් ග්‍රන්ථ ලංකාව ඇතුලෙත් තිබුණා පල්ලි ඇතුලෙත් තිබුණා. සූෆි මුස්ලිම් අතරත් අතේ තිබුණා. ඒ වුනාට සූෆි මුස්ලිම්වරු ඒක translate කරලා බැලුවේ නැහැ මේකේ මොනවද කියලා තියෙන්නේ කියලා. කුර්ආනයේ පවා ඒ ගොල්ලන් translation කලේ නැහැ. දැන් සිංහල කුර්ආන් පරිවර්තනය ගත්තොත් ඒක දැන් තමයි එළියට එන්න පටන් ගන්නේ. දැන් ඒ වගේ translation ආවට පස්සේ තමයි මුස්ලිම්වරු දැන ගත්තේ අපේ නබී කියන්නේ මෙහෙම තමයි. අපේ ආගම මෙහෙමයි. අපි ඒ විදියට තමයි යන්න ඕන කියන එක. දැන් ඒක ආපහු Reverse කරනවා කියන එක වෙන්න බැරි දෙයක්. මොකද translation දැන් ඇවිල්ලා ඉවරයි. ඒක හැමෝගෙම අතට යන්නේ නැතුව වළක්වන එකයි, වගේ දේවල් තමයි කරන්න පුළුවන්. මේක ලංකාවට විතරක් නෙමෙයි ලෝකෙටම මුහුණ දෙන්න සිද්ධ වෙලා තියෙන ප්‍රශ්නයක්, මොකද මේ මිනිස්සු මරණයට පස්සේ තියෙන ජීවිතය ගැන තමයි සිහින දකින්නේ. අපි කවුරුත් මනුෂ්‍යයෝ හැටියට අපිට මේ මේ ජීවිතේ අඩුපාඩු තියෙනවා. එතකොට කිසිම අඩුපාඩුවක් නැති ජීවිතයක් ඒ weak point එක අරගෙන කවුරුනුත් එක්කෝ මුදල් අඩු පාඩුවක් වෙන්න පුළුවන්, ශාරීරික මොනවා හරි ලෙඩක් තියෙන්න පුළුවන්, ඒ කියන්නේ කවුරුත් ජීවිතේ 100% ක් තෘප්තිමත් ජීවිතයක් ජීවත් වෙන්නේ නැහැ. මනුෂ්‍යයෝ හැටියට අපිට යම්කිසි මොනවා හරි කේස් එකකක් තියෙනවා අපි අකමැති දෙයක්. හැබැයි මේ ඉස්ලාම් ආගම ලොකු සිහින ලෝකයක් පෙන්නනවා. එහි ගියාට පස්සේ අපි සදාකල් තරුණයෝ විදියට ඉන්නවා, හැම දේම තියෙනවා කියලා වගේ. එතකොට ඒකට ආශාවක් ලොකුවට ඇති වුනාට පස්සේ අපි මෙහේ වැඩපිලිවෙල කලත් ඒ target එක තියාගෙන ඉන්නේ. එතකොට එයාලා මැරෙන්න සුදානම්. බයක් නැහැ, ජීවත් වෙන්න ඕනේ කියන මේකක් නැහැ, ඒ හින්දා තමයි මේක Handle කරන්න ගොඩක් අමාරු. එතකොට ආගම් අන්තවාද ඉගැන්වීම ඒ මුස්ලිම්ලාගෙන් ඇත් කලොත් විතරයි ඒගොල්ලන්ට මේ ලෝකේ ජීවත් වෙන්න ඕනේ, මේක තමයි අපේ ජීවිතය, අපි සතුටින් ඉන්න ඕනේ,

තියෙන විදියට අපි ඉන්න ඕනේ කියන මතය ඒගොල්ලන්ට ආවොත් ඒගොල්ලන් ජීවත් වෙයි. නැතුව මේක වැඩක් නැහැ කියලා හිතුනොත් ඒගොල්ලන් අනිත් ජීවිතය ගැන තමයි හිතන්නේ. සමහර අය අපි දකිනවා කොරෝනා ගැන quarantine කරන්න කිව්වත් ගණන් ගත්තේ නැති කට්ටියක් හිටියා. ඒක හැම පැත්තේම හිටියා. සමහර අය ආගම ඉස්සරහට දැම්මා. දෙවියෝ කරන දේ තමයි අපිට වෙන්නේ, මරණය ගැන අපි බය වෙන්න ඕනේ නැහැ කියනවා වගේ කතාන්දරයක් ඒ වගේ දේවල්. ඉතින් මේ මානසික තත්ත්වය ඒගොල්ලන්ට දෙන ආගමික අධ්‍යාපනය ඒක ලැබෙන්න තියෙන වට පිටාව මේවා තමයි මේකට බලපෑමක් ගොඩාක්ම එල්ල කරලා තියෙන්නේ. ඒක නවත්වන්න පුළුවන් නම් මේ වගේ ඉගැන්වීම කුමන හෝ මාර්ගයෙන් පාසැල්වල වෙන්න පුළුවන්, පල්ලිවල වෙන්න පුළුවන් කුමන හෝ වර්ගයකින් ඒක ලැබෙන එක වළක්වලා ආගම වෙනුවෙන්ම තමා පරිත්‍යාග කරපු සංවිධාන ටික වැඩ කරන එක නවත්වන්න පුළුවන් නම් ඒගොල්ලන් සාමාන්‍ය ජීවිතයකට ටික කාලයකින් යම්කිසි මට්ටමකට එන්න පුළුවන් කම තියෙනවා.

ප්‍ර : ඒ සඳහා මූලිකත්වය ගන්න පුළුවන් කාටද ඔබට හිතෙන ආකාරයට?

පි : රාජ්‍ය මට්ටමින් තමයි ඉස්සෙල්ලාම එවැනි දේවල් වලට අධ්‍යාපන හා රාජ්‍ය මට්ටමින්, අධ්‍යාපන අමාත්‍යාංශයට ඒකට ලොකු වගකීමක් තියෙනවා. ඒ වගේම රජයෙනුත් ඒවගේ දේවල් කරන්න වෙනවා. මම දකින්නේ දැන් මම මේ පොත ගත්තොත් මේක ඉස්ලාම් පොත. මේක ඉගෙන ගන්නේ මුස්ලිම් ළමයින් විතරයි. මේකේ මොනවද තියෙන්නේ කියලාවත් අනෙක් ළමයින් දන්නේ නැහැ. ඒවගේම තව පොතක් ඇති බෞද්ධාගමට. හින්දු ආගමට තියෙනවා. ඒවායෙහි ඒ ළමයින් විතරයි ඉගෙන ගන්නේ. අනෙක් අය ඒ ගැන මුකුත් දන්නේ නැහැ. මේ වගේ පාසැල්වලින්ම ආගමක් කියලා වෙන් කරලා එක ආගමක් ඒ අම්මා තාත්තට ඉපදිච්ච ඒ ලමයාට පොවන්න පටන් ගන්න කොට සමහර ආගම්වල මේ වගේ දරුණු මතවාද දෙන කරුණු නැහැ. බෞද්ධාගම ගත්තොත් මම කලිනුත් කියලා තියෙනවා Jesus වහන්සේ ගත්තොත් ඒ ශ්‍රාස්ත්‍රවරු දෙන්නා යුද්ධ කලා කියලාවත්, බහුවාර්ගික විවාහ කලා කියලාවත්, මිනිස්සුන්ගෙන් සල්ලි එකතු කලා කියලාවත්, කාටහරි විරුද්ධව සටනක් කලා කියලවත් නැහැ. හැබැයි ඉස්ලාම් ආගමේ තියෙනවා. එතකොට මේගොල්ලන්ට තනියම මේක කරන කොට දැන් අර වීඩියෝ එක පෙන්නුවා වගේ මෙතන සමහර කරුණු අඩංගු නොවෙන්න පුළුවන්. හැබැයි මේක කොහොමද උගන්වන්න ඕනේ කියලා ගුරුවරයාට දෙන ගුරු අත්පොතේ මේ පාඩම උගන්වන්න අන්න අරයගේ පොත බලන්න කියලා. එතකොට එතන තියෙන ඒවා මෙතනට එනවා. ඒ මහත්වරු දෙන්නා කරපු Video එක ගොඩක් වටිනවා මගේ

FAIR COMMENT — BY JEZEEM

point of view. එතකොට ඒක ගොඩක් මෙතනට එනවා. ඉතින් මේවා වලක්වන්න නම් ඒ එක එක ආගම්වලට එක එක පාඩම් නැතුව එක පොතක් හැම ශිෂ්‍යයන්ටම ඉස්ලාම් ගැන පිටු 15 ක් තියෙනවා නම් බෞද්ධාගම ගැන, හින්දු ආගම ගැන ක්‍රිස්තියානි ආගම ගැන ඒවගේ දේවල් තියෙනවා නම් හැමෝම හැම දෙයක්ම දැන ගන්නවා. එතකොට අර තමන්ගේම විතරක් හරියි කියාගෙන තමන්ගේ එකම repeat කරලා repeat කරලා අන්තවාදියෝ වීමේ අවධානම යම්කිසි මට්ටමකට අඩු වෙන්න පුළුවන් ශිෂ්‍යයන්ට. අනිත් එක හලාල් වගේ දේවල් encourage කරන එක. ඒකත් භයානකයි. එතකොට සමහර මුස්ලිම්ස්ලා ජනතාව පොදු සමාජයෙන් වෙන් වෙලා යන්න තමයි හදන්නේ හැම තැනම. දැන් මොනවා හරි රාජ්‍ය ආයතනයක් ගත්තොත් එතන සේවකයෝ 25 දෙනෙක් ඉන්නවා නම් 25 දෙනාගෙන් 4 දෙනෙකුට වෙනම නීතියක් තියෙනවා නම් ඒ හතර දෙනාම මුස්ලිම් වෙනවා. මමත් එක කාලයක් ඒක ඇතුලේ තමයි හිටියේ. දැන් පොඩි උදාහරණයක් ගත්තොත් ලංකා රජය විසින් ගත්ත තීරණයක් තමයි කොවිඩ් 19 එකේ මරණය පත් වෙන අයගේ මරණය ආදාහනය කරනවා කියන එක. ආදාහනය කරනවා කියන එක ලංකා රජයෙන් ගත්ත තීරණයක්. එතකොට මරණ 9 ක් හරි 10 ක් හරි සිද්ධ වෙලා තියෙනවා. ඒකෙන් මුස්ලිම් මරණ 3 ක් හෝ 4 ක් සිද්ධ වෙලා තියෙනවා. අනෙක් මරණ 6 ගැන බෞද්ධායද, ක්‍රිස්තියානිද, හින්දු අයද කියලා කොහේවත් කතා වුනෙත් නැහැ කවුරුත් දන්නෙත් නැහැ. එතකොට මේ මුළු රටම Curfew දාලා වහලා තියෙන තත්ත්වයට රට ගිහිල්ලා ලෝකෙම ගිහිල්ලා තියෙන තත්ත්වය වුනත් ඒගොල්ලන් එතන වෙනම නීතියක් හැටියට තමයි එතන බැලුවේ. ඒ කියන්නේ එතන ඒගොල්ලන් ට දැන් දොස් කියලා වැඩක් නැහැ පොඩි කාලේ ඉදන්ම ඒක ඒ විදියටම දීලා තියෙනවා. ඒක තමයි එතන තියෙන ප්‍රශ්නේ. මම පොඩි උදාහරනයක් තමයි කිව්වේ අර හලාල්කරණය ගැන. මම යාළුවන්ට කියන කතාවකුත් තියෙනවා ඒක කවුරුහරි එක්කෙනෙක් ඇවිල්ලා invest කරනවා කෝටි 4 ක්. Restaurant එකක අරිනවා. PHI එකෙන් ඇවිල්ලා ඔක්කොම certificate දෙනවා. ඒ Restaurant එක ඕපන් කලාට පස්සේ රු 100 ක් අරගෙන යනවා මුස්ලිම් මිනිහා. ඇවිල්ලා එයා ඒ Restaurant එක ගොන් කරනවා මේක හලාල් ද කියලා අහනවා. එක වචනයකින් ඒ Restaurant එක ගොන් වෙනවා.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු දැන් හලාල් සහතිකය නිකුත් කරන්නේ දැන් කවුද උලමාවරු?

පි : උලමාවරු සභාවෙන් නෙමෙයි වෙන මොනවා හරි ආයතනයකින් ඒක තාමත් සිදු වෙමින් පවතිනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : වෙනත් හලාල් සහතිකය සතුන් ඝාතනය හැරුනු කොට වෙනත් භාණ්ඩ වලටත් හලාල් සහතිකය අවශ්‍යයි කියලා නීතියක් දැන් ක්‍රියාත්මක වෙන්නේ නැද්ද ක්‍රියාත්මක වෙනවද?

පි : සමහර Restaurant වලට සමහර product වලට අපිට තාම දකින්න පුළුවන් හලාල් කියන ලාංඡනය තියෙනවා. ඒක කොයි විදියට ද සිද්ධ වෙන්නේ කියන එක අර කලින් වගේ මතුපිට ඡේන විදියට නැහැ.

ප්‍ර : ඒකට ක්‍රියාමාර්ගයක් නැද්ද හලාල් සහතිකය දෙන්නේ කොහොමද, කවුද දෙන්නේ කුමන අමාත්‍යාංශයකින්ද දෙන්නේ ?

පි වෙනම ආයතනයක් පිහිටුවා කියලා තමයි මට දැන ගන්න ලැබුනේ.

ප්‍ර : ඒකට හලාල් සහතිකය පුද්ගලිකව නිකුත් කරනවාද? ඒ සල්ලි යන්නේ කොහාටද හලාල් සහතිකය නිකුත් කිරීම වෙනුවන්?

පි : ඒ ගැන විස්තර දන්නේ නැහැ. කලින් ජමෙයිතුල් උලමා එකෙන් කලා. ජමෙයිතුල් උලමා එකට තමා සල්ලි ගියේ.

ප්‍ර : ඒ අවස්ථාවේ ජමෙයිතුල් උලමා එකට සල්ලි දුන්නා?

පි : ඔව්.

ප්‍ර : කොච්චර ප්‍රමාණයක් ගියාද ඒකට?

පි : ඒ විස්තර මම දන්නේ නැහැ. ජමෙයිතුල් උලමා එක මම හිතන්නේ Accounts ටික එළියට දැම්මේ නැහැ කියලා.

ප්‍ර : දැම්මේ නැහැ?

පි : දැම්මේ නැහැ කියලා තමයි මට දැන ගන්න ලැබුනේ. එතකොට මේක long term Process එකක්.

****

<u>**ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:**</u>

ප්‍ර : ඔබ කිව්වා හලාල් කරන කොට අරාබි භාෂාවෙන් යම්කිසි වචන කිහිපයක් කියනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ කියන වචනවල තේරුම මොකක්ද?

පි : බිස්මිල්ලාහි අල්ලාහු අක්බර්. බිස්මිල්ලාහි කියන්නේ අල්ලාහ්ගේ නාමයෙන්. මං පටන් ගන්නවා අල්ලාහ්ගේ නාමයෙන්. අල්ලාහු අක්බාර් කියන්නේ අල්ලාහ් ශ්‍රේෂ්ඨයි කියන එක.

ප්‍ර : එච්චරයි?

පි : එච්චරයි. ඒ වචනය මුස්ලිම් කෙනෙක් කිලෝ 200 ක් බර තියෙන ගවයෙක් ඝාතනය කරන කොට ඒ වචනය මුස්ලිම් කෙනෙක් කියන්නේ නැතුව සිංදුවක් කියාගෙන ඒ ගවයා ඝාතනය කලත් ඒ කියන්නේ බෙල්ල කපලා ඉස්ලාම් ආගමේ විදියට මේවා කලොත් ඒක හරාම්. එතකොට එතන logic එකක්වත් Purity, Health ඒවා මුකුත් නැහැ. එතන තියෙන්නේ අර අල්ලාහ්ගේ නම කියන්න ඕනේ කියන එක තමයි. ඒක තමයි මේගොල්ලන්ට බලපාන්නේ මිනිහෙක් මරා දානකොටත් අල්ලාහ් වෙනුවෙන් කියලා හිතාගෙන අල්ලාහු අක්බර් කියලා මරලා දාන කොට ඒක පවක් කියලා හිතන්නේ නැහැ.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : ඒ වචන කියනවද කියලා සනාථ කර ගන්නේ කොහොමද හලාල් සහතිකය නිකුත් කරද්දි? ඒ සාතනය කරන කොට එම ස්ථානවලින් ඒ විදියටම කියලා කරන බව දැන ගන්නේ කොහොමද?

පි : ඒකට තමයි අර මුස්ලිම් අය ඒ තනතුරුවලට පත් කරන්න ඕනෙයි කියන නීතිය තිබුණා.

ප්‍ර : මුස්ලිම් නොවන අයගේ සාතනය කරපු මස්?

පි : කොහොමත් හලාල් වෙන්නේ නැහැ.

ප්‍ර : එතකොට Restaurant එකක තියෙන්නේ හලාල් වෙච්චද නැද්ද කියලා හරියට ස්ථිරවම කියන්න පුළුවන්ද?

පි : ඒගොල්ලන් කොහෙන්ද මස් ගන්නේ කියන එකයි, නැත්නම් මුස්ලිම් Restaurant එකද කියලා බලලා තමයි දැන ගන්න පුළුවන් වෙන්නේ.

ප්‍ර : ඒ සහතිකය නිකුත් කරන කොට ඒකත් බලනවද?

පි : Restaurant එකට නිකුත් කරන කොට අනිවාර්යයෙන් බලනවා.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ සඳහන් කලා 1980 ට පෙර ඔය හදීෂ් හා කුර්ආනය අරාබි භාෂාවෙන් දෙමල භාෂාවට පරිවර්තනය වෙලා තිබුනේ නැහැ, ඒක නිසා පරිවර්තනය වුනාට පස්සේ තමයි ආගම ගැන තිබිච්ච සාම්ප්‍රදායික අදහස්වලට වෙනස් අදහස් ඇති වුනේ මුස්ලිම් භක්තිකයන් තුල. ඔය මද්‍රාසා පාසැල් ලංකාවේ ආරම්භ වුනේ 1980 න් ඉස්සෙල්ලද 80 න් පස්සේද?

පි : 80 න් ඉස්සෙල්ලා.

ප්‍ර : එතකොට ඒ කාලේ මද්‍රාසා පාසැල්වල මොනවද ඉගැන්නුවේ?

පි : ඒ කාලේ ගොඩක්ම ඉගැන්නුවේ අර සූෆි මතය. සූෆි මතය කියන්නේ ඒගොල්ලන්ගෙත් තියෙනවා අරාබි භාෂාවෙන්ම කවි කියන එක, දුවා කිරීම ඒ වගේ දේවල්. දන්සැල් දෙනවා වගේම කන්දුරි කියන එකක් තියෙනවා. ඉතින් ඒවාගේ දේවල් නඩත්තු කරන්නේ කොහොමද මුස්ලිම් කසාදයක් කරලා දෙන්නේ කොහොමද, එතන ගිහිල්ලා කරන ප්‍රාර්ථනාව, දුවා කරන්නේ කොහොමද කියන එක ගැන තමයි ගොඩක්ම ඉගැන්නුවේ. 1980 ට කලින් කුර්ආන් එක දෙමලෙට Translate කරලා තිබුණට ඒක හැමෝගෙම අතේ තිබුනෙත් නැහැ, ඒක හැමෝම කියවලා බැලුවෙත් නැහැ, පොතක් Translate කරන්න ඕනේ කියන උවමනාවෙන් වෙච්ච Translation විතරයි තිබ්බේ. දැන් එහෙම නෙමෙයි හැම ගෙදරකම එකක් දෙකක් ඊට වැඩිය තියෙනවා. අනිත් එක ශ්‍රී ලංකා ගුවන් විදුලියේ ඉස්ලාම්, ජාතික ගුවන් විදුලි දෙමල සේවයේ මුස්ලිම් ෆෝගෑම් එකට කලින් තිබ්බේ පැයයි තිබ්බේ 8 ඉදලා 9 වෙන කල් තමයි තිබ්බේ. දැන් ඒක වැඩි කරලා උදෙන් පැය 3,4 ක් ඒකට ලබා දුන්නා. හවසත් දුන්නා. ඒ වගේ

FAIR COMMENT BY JEZEEM

Presidential Secretariat Copy

අර ගෙදර ඉන්න ගෑණු පවා කුස්සියේ මොනවා හරි වැඩ කරමින් ඉන්න ගමන් රේඩියෝ ගහගෙන ඉන්නවා. ඒකෙත් යනවා අන්තවාදී දේශනාවක්. එක දවසක් මම අහගෙන හිටියා බෝම්බ ප්‍රහාරයට කලින් එක මව්ලවි කෙනෙක් එයාගේ නම , ඒකට අපි පෝස්ට් එකකුත් දාලා තිබ්බා, නම මට මතක් වෙන්නේ නැහැ, ඒ මව්ලවි තුමා කියා ගෙන යනවා අර යුද්ධයේදි මුස්ලිස්ලා මෙච්චර ගානක් මැරුවා. ඒ කියන්නේ නබිතුමාගේ කාලේ පැවති යුද්ධය ගැන එයා කියාගෙන යන්නේ, ගණන් කියන්නේ. ඒ යුද්දෙදී 250 ක් මැරුවා, මේ යුද්දෙදි 25 දෙනෙක්ව මැරුවා, අර යුද්දේදී මුස්ලිම්ලා හොඳට සටන් කරලා මෙච්චර දෙනෙක් මැරුවා. නබිතුමා මේ යුද්දෙට නායකත්වය දීලා මෙච්චර මැරුවා කියලා ඒ ගණන් කියාගෙන යන්නේ රේඩියෝ එකේ. ජාතික ගුවන් විදුලියේ.

ප : දැන් ශ්‍රී ලංකාවේ අරාබි භාෂාවෙන් දෙමල භාෂාවට පරිවර්තනය වෙච්ච කුර්ආන් කීයක් තියෙනවද? ඒ පරිවර්ථනය කරලා තියෙන්නේ කවුද?

පි : අරාබි භාෂාවෙන් දෙමල භාෂාවට

ප්‍ර : ඔව්.

පි : ශ්‍රී ලංකා තවුහිද් ජමාත් එකේ ඉන්දියාවේ පරිවර්තනය වෙච්ච එකක් තියෙනවා. සෞදි අරාබියාවෙන් ආපු එකක් තියෙනවා. ඉන්දියාවෙන් පරිවර්තනය වෙච්ච පරණ එකක් තියෙනවා. මම දන්න තරමට 4 ක් විතර වගේ තියෙනවා. නැහැ ජමෙයතුල් උලමා එකේ එකක් තියෙනවා, ඊට පස්සේ පරගහදෙනියේ එකක් තියෙනවා, 6 ක් විතර වගේ තියෙන්න ඕනේ.

ප්‍ර : අර අබ්දුල් රාසික් කියන එක්කෙනත් කුර්ආනයක්

පි : ඔව් ඒක තමයි ඉන්දියාවෙන් SLTJ හරහා ආපු දෙමල එක. ඒක අබ්දුල් රසික් පරිවර්ථනය කලේ නැහැ, අබ්දුල් රාසික් ඒක සිංහලයට පරිවර්ථනය කලා.

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**</u>:

ප : සාක්ෂිකරු ඔබගේ සාක්ෂියෙන් මේ කොමිෂන් සභාවට ප්‍රකාශ වුණ පරිදි ජමාතේ ඉස්ලාමිය සංගමයේ අරමුණක් තමයි යම්කිසි කාලයක ලංකාව මුස්ලිම් රාජ්‍යයක් බවට පත් කිරීම ඒක හරිද?

පි : ඔව්.

ප : එම ප්‍රධාන අරමුණ කරා යාම සඳහා ජමාතේ ඉස්ලමීය සංවිධානය භාවිතා කරන ක්‍රමවේද මොනවාද?

පි : එතන ඒක විතරක් නෙමෙයි දෙකක් තියෙනවා. එකක් තමයි ලංකාව ඉස්ලාම් රාජ්‍යයක් හැටියට පිහිටුවීම හා ලෝක ව්‍යාප්ත ඉස්ලාමික් කියලනේ. ඒක තමයි එයාලගේ වැඩ සටහන. ඒ හරහා ඒගොල්ලන් විවිධ දේවල් ක්‍රියාත්මක කරනවා, පන්ති, නේවාසික පුහුණු කඳවුරු, නැති බැරි මිනිස්සුන්ට උදව් කිරීම, රැකියා අවස්ථා ලබාදීම, ශිෂ්‍යයන්ට ඒ පුහුණු පන්ති, ඒ විෂය සම්බන්ධයෙන් පුහුණු කිරීම ඒ වගේ දේවල්. සෝෂල් වර්ක්ස් ගොඩක්, ලේ

FAIR COMMENT BY JEZEEM

President Secretary's Office

දන්දීමේ ව්‍යාපාරය, ඒ වගේ ගොඩක් සමාජය ඇතුලට රිංගලා තමාව ශක්තිමත් කර ගන්න පුළුවන් හැම දේම ඒගොල්ලන් කරනවා. Sports club පවා ඒගොල්ලන්ගේ තියෙනවා. ඒ කියන්නේ ඒගොල්ලන්ගේ මතය තියෙනවා කිසිම තරුණයෙක් තනියම ඉන්න හොඳ නැහැ, මුස්ලිම් තරුණයෙක් තනියම ඉන්න හොඳ නැහැ කියන මේකක් ඒගොල්ලන් ගාව තියෙනවා.

ප : දැන් ඒ ජමාතේ ඉස්ලාමිය සංවිධානයේ ප්‍රධාන අරමුණු ඔබ කියපු හැටියට, ප්‍රසිද්ධ කරන්න බැහැනේ ලංකාව වගේ රටක ඒක කරන්න ඕනේ ප්‍රසිද්ධ නොකර?

පි : 90 ගණන්වල ඒගොල්ලන් ලියපු, ඒ කියන්නේ යුද්දේ තිබිච්ච කාලේ ඒගොල්ලන් ලියපු පොත්වල අල්හසනාත් සඟරාවල පලවෙලා තිබුණා.

ප : ඔබ දැනටමත් ඒ සඟරාවල පිටපත් කොමිෂන් සභාවට ඉදිරිපත් කරලා තියෙනවා?

පි : ඉදිරිපත් කරලා තියෙනවා. තව දේවලුත් තියෙනවා.

ප : ඊට පස්සේ නමුත් ඔවුන් ඒක ප්‍රසිද්ධියේ නෙමෙයි නේද කරන්නේ, ඒ කියන්නේ ප්‍රධාන අරමුණ මුස්ලිම් රාජ්‍යයක් බවට පත් කිරීම යන අරමුණ ප්‍රසිද්ධව ද කියන්නේ?

පි : මේ දවස්වල නම් ඒක කොහොමත් ප්‍රසිද්ධව කියන්නේ නැහැ. ඊට මැද තිබිච්ච කාලේදි කොයි විදියට කලාද කියන එක ගැන මට එච්චර මේකක් නැහැ මොකද ඒගොල්ලන්ගේ එක දේශනාවක්වත් මට අහන්න හම්බ වුනේ නැහැ.

ප : නැහැ මම අහන්නේ ඔබ හිටපු කාලේ? 1996 ඉදලා 2009 වෙන කල්?

පි : 2009 වෙන කල් ජමාතේ ඉස්ලාමියේ මම හිටියේ නැහැ. ඒ වුනාට ඒගොල්ලන්ගේ දේශනා මට අහන්න ලැබුණා. ඒ කාලවලත් ඒගොල්ලෝ ප්‍රසිද්ධියේ තමයි කලේ.

ප : ප්‍රසිද්ධියේ කියන්නේ?

පි : ප්‍රසිද්ධියේ කියන්නේ මුස්ලිම් ජනයාට විතරක් ඒගොල්ලන්ගේ බයාන්වල, බයාන් කියන්නේ ඒගොල්ලන්ගේ දේශනාවල, පුහුණු පන්තිවලට එන කට්ටියට ඒගොල්ලන්ට ලැබෙන පොත්පත් වල ඒ වගේ දේවල් ප්‍රකාශ කලා.

ප : ප්‍රසිද්ධියේ කියනවා නම් කිව්වේ ඉස්ලාම් ධර්මය අදහන පුද්ගලයින්ට පමණයි?

පි : පමණයි.

ප : එතකොට බැරිවෙලා වත් ඉස්ලාමීය නොවන පුද්ගලයෙක් ඒ සංවිධානය ගැන හොයන්න පටන් ගත්තා නම් ඒ ප්‍රධාන අරමුණු වසන් කිරීමට ඔවුන් යම්කිසි ක්‍රමවේද අනුගමනය කලාද?

පි : ඔව්.

ප : මොකක්ද ඒ ක්‍රමවේද?

පි : ලේ දන්දීමේ ව්‍යාපාරය, අධ්‍යාපන ව්‍යාපාරය ඒ වගේ ගොඩක් දේවල් ඒගොල්ලන්ගෙන් ගිහිං ඇහුවොත් ඒගොල්ලන්ට කියන්න කාරණා ගොඩක් තියෙනවා. ඒකට වටපිටාව හදාගෙන තමයි මේ

FAIR COMMENT BY JEZEEM

මාර්ගයේ ගියේ. මට මතකයේ හැටියට මම ඉන්න කාලේ 96 දී වත් ඒගොල්ලන් දවසක් කිව්වා CID එකෙන් ඇවිල්ලා ඒගොල්ලන්ගේ Head office එකේ මොනවා හරි ප්‍රශ්න කිරීමක් කලා කියලා. ඒ මොකද කියලා මම දන්නේ නැහැ. 95 නැත්නම් 96 කාලෙදි. ඒකත් කිව්වා මට Head office එකෙන් CID එක ආවා කියලා.

ප : මොකක් හේතුවක් හින්දා ආවද කියලා දන්නවද?

පි : මම දැනගෙන හිටියේ නැහැ මට කිව්වේ නැහැ. ආව කිව්ව එක විතරක් මට, මට නෙමෙයි අපි නිකම් කතා කර කර ඉන්න වෙලාවේ කිව්වා මෙහෙම CID එකෙන් ආවා, මොකද වෙන්නේ කියලා අහලා ගියා කියලා.

ප : ඔබ දන්නා පරිදි ඒ ජමාතේ ඉස්ලාමිය සංවිධානයට ව්‍යවස්ථාවක් තිබ්බද?

පි : ඔව් ව්‍යවස්ථාවක් තිබ්බා.

ප : ඔබ දන්නා පරිදි ඒ ව්‍යවස්ථාවේදි ඔය ප්‍රධාන අරමුණ ඒ කියන්නේ ශ්‍රී ලංකාව මුස්ලිම් රාජ්‍යයක් බවට පත් කිරීම, ලෝක මුස්ලිම් රටක කොටසක් බවට පත්කිරීම තිබ්බද?

පි : එහෙම ව්‍යවස්ථාව මම කියවලා බැලුවේ නැහැ. ව්‍යවස්ථාවේ තිබ්බා කියලා මම දන්නවා. ඒකට මොනවා හරි නමකුත් තිබ්බා මට මතක ඒක ෂූරා හරි, නැහැ ඒකට මොනවා හරි අරාබි නමක් තිබ්බා ව්‍යවස්ථාවට කියන නමක්.

ප : ඔබ මෙම කොමිෂන් සභාව ඉදිරියේදි සාක්ෂි දෙමින් ප්‍රකාශ කෙරුවා හජ්ජුල් අක්බර් ඔබට ඇහෙන පරිදි එක්තරා අවස්ථාවක කිව්වා ලංකාවේ ජනගහනයෙන් බහුතරයක් මුස්ලිම් නොවුනත් ඒ මුස්ලිම් රාජ්‍යයක් බවට පත් කිරීමේ හැකියාව තියෙනවා, උදාහරණයක් වශයෙන් මොන රට ගැනද කිව්වේ?

පි : ඉන්දියාවේ මුස්ලිම් පාලනය ගැන අපිට කිව්වා. ඒක ශිෂ්‍යයෙක් අහපු ප්‍රශ්නයකට උත්තර දෙන කොට තමයි ඒ උත්තරය දුන්නේ.

ප : එතකොට එහෙම උත්තරයක් දුන්නත් ලංකාව මුස්ලිම් රාජ්‍යයක් කරා ගෙන යාමේදි ලංකාවේ මුස්ලිම් ජනගහනය වැඩි කිරීමේ ක්‍රමවේදයක් ප්‍රකාශිතව ජමාතේ ඉස්ලාමිය සංවිධානය අනුගමනය කෙරුවද?

(එම ප්‍රශ්නය ඉංග්‍රීසි භාෂාවෙන් පැහැදිලි කර දෙයි)

පි : ජමාතේ ඉස්ලාමිය සංවිධානය විතරක් නෙමෙයි සාමාන්‍යයෙන් when ever the population control talks ඒ කියන්නේ ජනගහනය අඩු කිරීම සඳහා මම හිතන විදියට 90 ගණන්වල එහෙම කතා වුණා. එතකොට ජමාතේ ඉස්ලාමිය පමණක් නෙමෙයි හැම මුස්ලිම් එක්කෙනාම කිව්වේ කුර්ආනයේ වැකියක් තියෙනවා. ඕගොල්ලන් මේ පෝට්ට්‍රි එකට බය වෙලා ලමයින් ප්‍රමාණය අඩු කරන්නවත්, ළමයින් මරන්නවත් එපා. මම තමයි මේ ඕගොල්ලන්ගේ ලමයින්ට ආහාර දෙන්නේ කියලා කුර්ආනයේ වාක්‍යයක් තියෙනවා. එතකොට ඒගොල්ලන් කතා වුණා. එතකොට මම මේ ගොඩක් තරුණයෙක් ශිෂ්‍යයෙක් හින්දා

FAIR COMMENT — BY JEZEEM

මම ඒ ගැන මේවා කලේ නැහැ, හැබැයි කුර්ආන් වැකියේ සඳහන් වුනා ඒ ගැන කතා වුණා. අපි දෙන්නා අපිට දෙන්නා යන සංකල්පය නිළ නොවන විදියට හරි පොඩ්ඩක් ප්‍රචාරය වුණා නේද. ඒ කාලෙත් ඒගොල්ලන් විරුද්ධ වුනා. ඒක මට මතකයි.

ප්‍ර : දැන් ලංකාවේ මුස්ලිම් ජනගහනය ඉන්නේ යම් කිසි ප්‍රදේශ කිහිපයක විතරයි, ඒ ප්‍රදේශවලින් පිටතට ගිහිල්ලා මුස්ලිම් ජනගහනය වර්ධනය කිරීමේ යම්කිසි ක්‍රියාමාර්ගයක් ඔය ජමාතේ ඉස්ලාමිය සංවිධානය සහ අනෙකුත් සංවිධාන අනුගමනය කරනවද?

පි : මම දන්න සිද්ධියක් තියෙනවා. ජමාතේ ඉස්ලාමිය එකේ හිටියා ප්‍රධානියෙක් යුසුෆ් අලී කියලා. මාවනැල්ලේ එක්කෙනෙක්. එයා දැන් අවුරුදු 3,4 කට වගේ කලින් නැති වුණා. එයා ව්‍යාපාරිකයෙක්. විශ්‍රාමික ගුරුවරයෙක්. එයාගේ සංකල්පයක් තිබ්බා මුස්ලිම් ගම්මානයක් හදන්න ඕන කියලා. මාවනැල්ලේ මුස්ලිම් ගම්මානත් එක්කම තියෙන සිංහල ප්‍රදේශයේ තියෙන ලොකු ඉඩමක් අරන් ඒකට කිව්වේ Ideal Muslim Village එකක් හදන්න ඕනේ කියලා ඉඩමක් ගත්තා කියලත් කතාවක් තිබ්බා. එයාගේ එහෙම එකක් තිබ්බා යුසුෆ් අලී මාස්ටර් කියලා මාවනැල්ලේ ව්‍යාපාරිකයෙක්.

ප්‍ර : ඒ කියන්නේ ඔහුගේ විතරද නැත්නම් පොදුවේ මුස්ලිම් ජන සමාජය තුල තියෙන දෙයක්ද?

පි : මුස්ලිම් ජන සමාජය ඇතුලේ තියෙනවා කියලා මම දන්නේ නැහැ.

ප්‍ර : නමුත් ඔබ දන්න පරිදි යුසුෆ් අලී ඔහු ජමාතේ ඉස්ලාමිය සංවිධානයේ ප්‍රධානියෙක්ද?

පි : ප්‍රධානියෙක්. මාවනැල්ලේ ප්‍රධානියෙක් හැටියට හිටපු එක්කෙනෙක්. එයා ඒ වගේ දේවල් කියලා තිබුණා. හැබැයි ජනගහනය පාලනය කිරීමේ කිසිම උවමනාවක් මුස්ලිම් සමාජය ඇතුලේ නැහැ ඒක ආගමට විරෝධී දෙයක් හැටියට තමයි මුස්ලිම් ජනතාව දකින්නේ.

ප්‍ර : දැන් ඊට අමතරව රටේ විවිධ ස්ථාවලින් ඉඩම් ලබාගෙන එම ඉඩම්වල අයිතිය මුස්ලිම් ජන කොටියාශයට ලබා ගැනීමේ යම් ක්‍රමවේදයක් ජමාතේ ඉස්ලාමිය සංවිධානයේ නැත්නම් වෙනත් සංවිධානවලින් උනන්දු කරනවාද?

පි : නැහැ මට එහෙම කියන්න කරුණු මුකුත් මං ලඟ නැහැ. හැබැයි මෙහෙම දෙයක් තිබෙනවා මුස්ලිම් අය කැමති නැහැ තමන් සතුව තියෙන ඉඩමක් අන්‍යාගමික කෙනෙකුට විකුණන්න කැමති නැහැ.

ප්‍ර : ඇයි ඒ?

පි : මුස්ලිම් ගම්මාන ඇතුලට අන්‍යාගමිකයන් පදිංචියට එනවට නැත්නම් අන්‍යාගමිකයන්ට ඉඩම් විකුණනවට මුස්ලිම් අය සාමාන්‍යයෙන් කැමති නැහැ. ඒකට විරුද්ධතාවය තියෙනවා.

ප්‍ර : එම විරුද්ධ වෙන්න කුර්ආනයේ නැත්නම් හදීෂ්වල යම්කිසි දෙයක් තියෙනවද?

FAIR COMMENT
BY JEZEEM

පි : මතක හැටියට මට connect කරන්න දෙයක් නැහැ. මම කියපු එකට උදාහරණයක් හැටියට මට කියන්න පුළුවන් යාපනය ගැන. මමත් යාපනේ කෙනෙක්. මමත් යාපනේ. යාපනේ පැත්තේ මුස්ලිම් මිනිස්සු 1990 දි කොටි සංවිධානය විසින් පලවා හැරියා. ඊට පස්සේ 2009 යුද්දේ ඉවර වුනාට පස්සේ තමයි මිනිස්සු යන්න පටන් ගත්තේ. ඒ වුනාට 2009 වෙන කොට ගොඩක් අය කොළඹ, පුත්තලම, මීගමුව වගේ අනෙත් ප්‍රදේශවල ගෙවල් හදලා ස්ථිර කර ගත්තා ව්‍යාපාර එහෙම වර්ධනය කරගෙන. එතකොට ගොඩක් අය යන්න කැමති වුනේ නැහැ. එතකොට සමහර අය තමන්ගේ ගෙවල් දෙමල අයට විකුණන්න පටන් ගත්තා. ඒකට ලොකු විරෝධතාවයක් තිබුණා ඒකට ජාතික ව්‍යාපාරයක් ගෙනියන්න ඕනේ මුස්ලිම් අයගේ ගෙදර අපි සල්ලි එකතු කරලා වෙන අයට දෙන්නේ නැතුව ආපහු ගන්න ඕනේ දීපු ඉඩම් ටික වත් අපි ආපහු ගන්න ඕනේ කියන Proposal පවා කතා පවා මොනවා හරි website එකක එක්කෙනෙක් ලියලා තිබ්බා. හැම පල්ලියකම ලක්ෂ 5 ක් එකතු කරලා ලොකු වැඩක් නෙමෙයි ඒ ගම්වල එකතු කරලා ඒවගේ විකුණපු ඉඩම් ටික ආපහු ගන්න ඕනේ කියන ඒ වගේ වැඩ සටහන් ගැන Proposal එකක් ගියා. ඒක සිද්ධ වුනේ නැහැ.

ප්‍ර : ඒ සංකල්පය යම්කිසි සංවිධානයකින්ද ආවේ නැත්නම්

පි : තනි පුද්ගලයෙක් හැටියට තමයි මට මතක. තනි පුද්ගලයෙක් කවුරු හරි තමයි ඒක ලියලා තිබ්බේ සංවිධානයක නමක් මොනවත් මට මතක නැහැ.

ප්‍ර : ඔබ කියන පරිදි කුර්ආනයේ නැත්නම් හදීෂ්වල වෙනත් අන්‍යාගමිකයෙකුට ඉඩම් විකිණීම තහනම් කරලා නැත්නම් හරාම් කරලා නැත්නම් එහෙම අදහසක් ලංකාවේ ඉන්න මුස්ලිම් ජනතාව අතර ඇති වෙන්න හේතුව මොකක්ද?

පි : මම දන්න තරමට කුර්ආන් හදීෂ් එකේ ඒ වගේ දෙයක් කියලා නැහැ. ඇති වෙන්න හේතුවක් මුස්ලිම් සමාජය, මුස්ලිම් සමාජය ඇතුලේම, මුස්ලිම්වරු මුස්ලිම් සමාජය ඇතුලේම ඉන්න ඕන කියන එකට ඒගොල්ලන් ගොඩක් ආසයි. ඒකේ ඇතුලේ වෙන ආගම් මතය දරන කෙනෙක් එනවට ඒගොල්ලෝ කැමති නැහැ. ඒ වගේ දෙයක් වෙන්නත් පුළුවන්. සමහර විට මම නොදන්නා කාරණා මොනවා හරි තියෙනවද කියලා මම දන්නේ නැහැ.

ප්‍ර : වෙනත් වචනවලින් කියනවා නම් ඒ කියන්නේ මුස්ලිම් ජන සමාජය වෙනත් ජන කොටස් සමඟ සම්බන්ධ වීමට අකමැත්තක් තියෙන බවද එයින් පේන්නේ?

පි : ඔව් අකමැත්තක් තියෙනවා. ගොඩක් කොළඹ වාගේ නගරාසන්න ප්‍රදේශවල ජීවත් වෙන මිනිස්සු හැර අනිත් අය තමන්ගේ අසල්වැසියෙක් හැටියට මුස්ලිම් නොවන කෙනෙක් ඉන්නවට එච්චර සතුටක් නැහැ.

ප්‍ර : දැන් ආගමික අන්තවාදය, මම විශේෂයෙන්ම අහන්නේ ඉස්ලාම් ආගමික අන්තවාදය කෙරෙහි තරුණයන් නැඹුරුවීමට ඇති

FAIR COMMENT BY JEZEEM

හැකියාවක් තියෙනවා ද? තියෙනවා නම් හේතු මොකක්ද? මම අහන්නේ මේ ලංකාව සම්බන්ධයෙන්

පි : ඔව් තියෙනවා.

ප්‍ර : මොනවද හේතු?

පි : හැම පැත්තෙන්ම ඒගොල්ලන්ට ඒ ගැන materials හම්බ වෙනවා දැන් Facebook එක ගත්තොත් හැමදේටම ආගම ගැවිලා තියෙන්නේ. පොඩි ජයග්‍රහනයක් ගත්තොත් කවුරුත් congratulation කියලාවත් well done කියලා වත් සුභ පතනවාට වැඩියි මාෂා අල්ලාහ් අල්ලාහු අක්බර් කියලා තමයි සුභ පතන්නේ. දැන් මුස්ලිම්වරු දෙන්නෙක් හම්බ වුනොත් Good morning කියලාවත් කොහොම හායි කියලාවත් නොවෙයි අස්සලාම් මලෙයික්කුම් කියන එක තමයි. ඒ කියන්නේ ඒගොල්ලන්ගේ ජීවිතවල හැම පැත්තෙන්ම ජීවිතය තුලට ආගම rooted. පොඩි කාලේ ඉදලම ඒක තමයි කරන්නේ. කෑම කනකොටවත් පටන් ගන්න කොටවත් බිස්මිල්ලා කියන්න ඕනේ. හැමතැනම ආගම විසින් ඒගොල්ලන්ව ආක්‍රමණය කරලා ඉවරයි. පොඩි පොඩි දේවල්වලින් පවා. වාහනයකට නැග්ගොත් ඒවට දුවා එකක් තියෙනවා. ස්කූල් වල සහ මද්‍රාසා හවස තියෙන මද්‍රසා දහම් පාසල් වගේ ඒවාවලත් ඒවම කියලා දෙනවා ලමයින්ට. එතකොට ඒගොල්ලන්ට ආගමෙන් පිටට හිතන්නවත් චාන්ස් එකක් තිබිලාවත් නැහැ. හැම පැත්තෙම වහලා තියෙන්නේ හැම දේම ඒගොල්ලන්ට සලස්සලා තියෙනවා. එතකොට ඒක අමාරුයි Facebook වගේ social media එක ගත්තොත් ඒකත් මුස්ලිම් අය ගොඩක් අය භාවිතා කරන්නේ ආගම ගැන කතා කරන්න. නැත්නම් ආගම ගැන මොනවා හරි දෙයක් දක්වපු ගමන්ම ගොඩක් share වෙනවා. ඒක ඇත්තද බොරුද කියලාවත් බලන්නේ නැහැ ඒක ගොඩක් share වෙනවා. අනිත් එක ඒගොල්ලන් අන්ධ විශ්වාසයක් යොමු කරලා තියෙනවා අපි කුර්ආනය හරි scientific ඒකේ තියෙන හැමදේම හරි, අන්‍යාගමික මිනිස්සු ඊර්ෂ්‍යාවට තමයි ඕක වහගෙන ඉන්නේ. ඒ වගේම තව දවසක් දීලා තියෙනවා ගොඩක් scientific inventions හුඟක් ඔක්කොම කුර්ආනයේ කියලා තියෙනවා කියන එක. ඉතින් ඒ වගේ දේවල් ගොඩක් දෙන හින්දා මේක අහපු ප්‍රශ්නයට ඔව් කියලා තමයි උත්තරය දෙන්න තියෙන්නේ. ඒගොල්ලන්ට ඒකෙන් එළියට එන්න තියෙන chances ගොඩක් අඩුයි.

ප්‍ර : මේ මම ප්‍රශ්නය ඔබගෙන් අහන්නේ අද සාක්ෂි දෙමින් ප්‍රකාශ කලා ඔබ යම්කිසි අවස්ථාවක රගර් ක්‍රීඩාවේ විනිශ්චයකරුවෙක් වශයෙන් ක්‍රියා කලා කියලා, මට එයින් අදහසක් ආවා ඔබ යම්කිසි අන්දමක ක්‍රීඩාව සම්බන්ධයෙන් යම්කිසි උනන්දුවක් දක්වන හින්දා ඒ හින්දයි මම මේ ප්‍රශ්නය අහන්නේ, යම්කිසි මතයක් තියෙනවා උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාව සහ පාකිස්ථානය ක්‍රිකට් match එකක් ගහන කොට ලංකාවේ ඉන්න මුස්ලිම් ජනතාවෙන්

FAIR COMMENT BY JEZEEM

කොටසක් ලංකාවට නෙමෙයි සහයෝගය දෙන්නේ පාකිස්ථානයට කියලා. එහි යම් සත්‍යතාවයක් තියෙනවද?

පි : තියෙනවා. ඒක පහුගිය කාලේ දැනට අවුරුදු 10 ට 15 ට කලින් මුස්ලිම් අය ගොඩක් support කලේ පාකිස්ථානයට.

ප්‍ර : ඇයි හේතුව?

පි : මුස්ලිම් කියන එකම හේතුව තමයි ඒකට මූලික වෙලා තිබුනේ. ඒකට තව හේතුවක් තිබ්බා 80 ගණන්වල ශ්‍රී ලංකා කණ්ඩායම හරියට සෙල්ලම් කලේ නැහැ. එතකොට ඒගොල්ලන්ට second choice එකක් ඕන වුනා. දැන් අරජුන රණතුංගලා නායකත්වයට යන්න කලින් තිබුණ ශ්‍රී ලංකා කණ්ඩායම එච්චර දක්ෂ කණ්ඩායමක් වෙලා තිබුනේ නැහැ. එතකොට ක්‍රීඩාවට සපෝට් කරන්න කණ්ඩායම් ඕන වුනා එතකොට මුස්ලිම් කණ්ඩායමක් එවේලේ ටෙස්ට් වරම් ලබා ගත් එකම එක මුස්ලිම් කණ්ඩායමක් හැටියට පකිස්ථානය විතරයි ඒගොල්ලන් දැක්කේ ඒකේ හිටපු ක්‍රීඩකයෝ ඒ නම් ටික මෙයාලට ගොඩක් හුරුයි, ඒගොල්ලන්ගේ ක්‍රීඩා විලාසය, දැන් ඉම්රාන් ඛාන් .. විලාසය කට්ටියක් ඒ පැත්තට ගියා. ඒක continue වුනා ආගම ඉස්ලාම් කියන එක මුස්ලිම් අයට සපෝට් කරන්න ඕන කියන එක්කම ඒක continue වුනා. ඊට පසු ලංකාව හොඳට සෙල්ලම් කරන්න පටන් ගත්තාට පසු සෑහෙන මුස්ලිම් පිරිස ඒකෙන් ඈත් වුනා. ඊට පස්සේ තව දෙයක් වුනා මැදපෙරදිග රටවලට සේවය කරන්න යන්න ගිය කට්ටිය පකිස්ථාන් අයත් එක්ක ආශ්‍රය කලාට පස්සේ ඒගොල්ලන් තමාගේ මතය වෙනස් කර ගත්තා. මොකද පකිස්තානයේ සාමාන්‍ය මිනිස්සු මුස්ලිම් හින්දා ඔයාලා අපේ රටට සපෝට් කරන්නේ කියලා පිලි ගත්තේ නැහැ. එතකොට ඒක ඒගොල්ලන්ට කටුක අත්දැකීමක් වුණා. එතකොට ඒක පොඩ්ඩක් වෙනස් වුණා. ඊට පස්සේ දැන් බංගලාදේශ් වගේ රටවල් ආවට පස්සේ ඒ තත්ත්වය දැන් කලින් තිබ්බ තත්ත්වයට නැහැ.

ප්‍ර : නමුත් යම්කිසි තත්ත්වයක් තියෙනවද ඒ විදියට තාම?

පි : 90 ගණන් වල නැත්නම් 80 ගණන්වල තිබිච්ච තත්ත්වය දැන් නැහැ. ඒත් දැන් ගොඩක් අඩුයි. සාමාන්‍යයෙන් දැන් වුනත් මුස්ලිම් සමාජය ඇතුලේ කවුරු හරි පකිස්ථානයට support කරනවා කිව්වොත් මුස්ලිම් මිනිස්සුන්ම විහිළුවට බලන්න පුළුවන් තත්ත්වයකුත් තියෙනවා. අර කලින් මුස්ලිම් අයට ඉස්ලාම් ආගම ගැන එච්චර ලොකු ගැඹුරක් මේකක් තිබුනේ නැහැ. එතකොට ඒගොල්ලන් දැක්කේ පකිස්ථාන් කට්ටිය ඉස්ලාම් ආගමේ නියෝජනය කරන කණ්ඩායමක් හැටියට. දැන් ඉස්ලාම් ආගම ඉගෙන ගත්තට පස්සේ මෙයාලා දන්නවා දැන් පකිස්ථාන් ක්‍රීඩකයෝ ගැන ජීවිතය ගැන ඒගොල්ලන් කරන දේවල් ගැන පත්තරවල, මාධ්‍යවල match fixing ඔක්කොම ආවට පස්සේ ඒ මතය ගොඩක් වෙනස් වුනා. දැන් ඒගොල්ලන් මුස්ලිම් නම තමයි

FAIR COMMENT
BY JEZEEM

තියෙන්නේ ඉස්ලාම් නෙමෙයි ඒගොල්ලෝ නියෝජනය කරන්නේ හින්දා කලින් වගේ සපෝට් කරන මේකක් නැහැ.

ප්‍ර : මගේ අවසාන ප්‍රශ්නය මුස්ලිම් ජනතාව ලංකාවේ ශ්‍රී ලංකික කොටසක් කියලා හිතනවද නැද්ද ?

පි : පොඩ්ඩක් ඒ ප්‍රශ්නය explain කරලා ඇහුවොත් මට උත්තර දෙන්න.

ප්‍ර : Do the Muslim Community consider them to be part of the Sri Lankan identity ? And I want you to give reasons for your answer.

පි : Sri Lankan identity …….. It is very difficult to define an answer. There are people who think they are Sri Lankan and they have the Sri Lankan identify. But when it comes to religion they give priority to the religion, not to the Sri Lankan identify. Their main focus, main concern is religion. The country and all comes after that. But they give the second priority to the country because they think the religion is the important thing not the country. Even there was preachings about the දේශභක්තිය කියන එක pariotism කියන එක. ආගමට විරුද්ධයි කියන මතය පවා තිබුනා.

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:</u>

ප්‍ර : මගේ ප්‍රශ්න දෙකක් තියෙනවා, ඉස්මත් පලවෙනි ප්‍රශ්නය මම දැකපු දෙයක්, මම නිරීක්ෂණය කරලා තියෙන දෙයක් තමයි මුස්ලිම් අය කවදාවත් ආචාර කරන්න ඒගොල්ලන්ගේ අත් දෙක එකතු කරලා ආචාර කරන්න කැමති නැහැ. දැන් මේ කොරෝනා වසංගතය පැතිරිච්ච කාලේ අපි දැක්ක විදියට එංගලන්තයේ රජ පවුලේ සාමාජිකයෝ පවා අත් දෙක එකතු කර ආචාර කලා මොකද අතට අතට දෙන්න හොඳ නැතැයි කියලා මතයක් තිබුණ නිසා. ඇයි මුස්ලිම් අය මේ අත් දෙක එකතු කර ආචාර කිරීමෙන් සම්පුර්ණයෙන්ම වලකින්නේ? ඒකට හේතුවක් තියෙනවද?

පි : ඔව් තියෙනවා. ඒකට ආගමේ එකක් කියලා තියෙනවා අනෙක් මිනිස්සුන්ගේ සංස්කෘතික දේවල්, අනෙක් ආගමික මිනිස්සු කරන දේවල් කරන්න හොඳ නැහැ කියලා කෙලින්ම තහනම් කරලා තියෙනවා. ඒ කියන්නේ ඒ වගේ දෙයක් කවුරු හරි කලොත් ඒ අය ඒ කොටසට අයිතියි කියලා නබිතුමා warning එකක් කරලා තියෙනවා. දැන් හින්දු අය කරන දේවල් හරි නැත්නම් බෞද්ධ අය කරන දේවල් හරි ඒගොල්ලොන්ගේ ආගමට සම්බන්ධ දෙයක් කරන්න ගියොත් ඒක වැරදියි කියලා. කෙතරම්ද කිව්වොත් සටන් කලාව කරාටේ, කුෆු වගේ දේවල් තියෙනවා. ඒවා පටන් ගන්න කලින් ක්ලාස් වල පොඩි අත මෙහෙම තියලා ඒගොල්ලෝ පොඩි Bow- down system එකක් කරනවා. මුස්ලිම්

Presidential Copy
FAIR COMMENT BY JEZEEM

කරාටේ class වල ඒක පවා නැති කලා. ඉගෙන ගෙන ඇවිල්ලා මුස්ලිම් අයට විතරක් මුස්ලිම් මාස්ටර්ස්ලා කරාටේ class කරන කොට කරන්න හොඳ නැහැ කියලා. අනෙක් එක පන්තිවල ගුරුවරයෙක් එන කොට ළමයි නැගිටලා තමයි teachers ලට welcome එකක් දෙන්නේ Good morning Sri කියලා හරි ආයුබෝවන් හරි මොනවා හරි දෙයක් කියනවා. ඉස්ලාම් එක අනුව ඒක වෙනස් කරා. එන ගුරුවරයා තමයි ලමයින්ට අස්සලාම් අලෙයිකුම් කියාගෙන පන්තියට එන්න ඕන කියන එක. ඉතින් ඒ වගේ දේවල් තියෙනවා. එතකොට අත් දෙක නමලා ආචාර කරනවා කියන එක හින්දු අය කෝවිල්වලට ගිහිල්ලා ඒ විදියට කරන හින්දා ඒක කරන්න හොඳ නැහැ ඒක පවක් කියලා තමයි මුස්ලිම් අයගේ මතය තියෙන්නේ. ඒක සාමාන්‍යයෙන් මුස්ලිම් හැමෝම වගේ ඒකට කැමති නැහැ.

ප : මගේ දෙවෙනි ප්‍රශ්නය අහන්නේ ඔබගෙන් අද දැන් ඔබ සාක්ෂි දෙන අවස්ථාවේ මාධ්‍යය කවුරුවත් නැති නිසා, මේක වාර්තා වෙන්නෙත් නැති නිසා පහුගිය කොරෝනා වසංගතය කාලේ TV එකේ නිවුස් බලන් හිටිය මිනිස්සු පුදුමයට පත් වුනා හැම තැනින්ම මේ කොරෝනා වසංගතය බෝවෙන්න පටන් ගත්තේ මුස්ලිම් අයගෙන් කියලා වැඩිපුර, බලන බලන තැන්වල මුස්ලිම් අයගෙන් කියලා. එතකොට සමහර අයගේ හැඟීමක් ආවා 2019 අප්‍රේල් අපේ අවුරුද්දත් නැති කලා මුස්ලිම් අය, 2020 අපේ අවුරුද්දත් මේගොල්ලෝ නැති කරනවා වගේ කියලා හැඟීමක් තිබුණා. මේ කතාව ඔබ දකින්නේ කොයි විදියටද?

පි : මම එහෙම දකින්නේ නැහැ. මොකද එක පුද්ගලයෙක් නැත්නම් දෙන්නෙක් හැර අනෙක් අය ගැන අපි පොඩ්ඩක් බැලුවොත් මේකට සම්බන්ධ වෙච්ච අය බැලුවොත් එකක් ඒගොල්ලන්ගේ අධ්‍යාපන මට්ටමේ අඩුපාඩුවක් තිබුණා. අනිත් එක ඒගොල්ලෝ ආගමට එච්චර ගැඹුරෙන් සම්බන්ධ වෙච්ච පිරිසක් වෙලා හිටියේ නැහැ. ඉතින් ඒක මං හිතන්නේ එකක් රටේ රජය විසින් දෙන නීති රීති පිළිගැනීමේදී තියෙන අත්තනෝමතික ක්‍රියාව ඒ කියන්නේ ගණන් ගන්නේ නැතිකමයි, තමාගේ ජීවිතයේ තමාට ඕන විදියට සුඛෝපභෝගි විදියට ගත කරන්න ඕනේ කියලා try කරපු එකේ ප්‍රතිඵලයක් හැටියට තමයි මම දකින්නේ. එහෙම නැතුව මිනිස්සුන්ට පැතිරෙන්න ඕනේ උවමනාවෙන් ඒක කරලා නැතුව ඇති. සමහර විට මේ වගේ මතයක් තිබිලා ඇති දෙවියන් වහන්සේගේ අල්ලාහ් දෙවියන්ගේ දැනුම නැතුව අණක් නැතුව කිසි දෙයක් අපිට සිද්ධ වෙන්නේ නැහැ කියලා ඒක කුර්ආන් එකෙත් කියලා තියෙනවා. ලෝකේ හැමෝම එකතු වෙලා දෙයක් නතර කරන්න හැදුවත් අල්ලාහ් දෙයක් වෙන්න හිතුවොත් ඒක වෙනවාමයි කියලා. ඒ හින්දා ඒ වගේම ලෝකේ හැමෝම එකතු වෙලා මොනවා හරි දෙයක් වෙන්න ඕනේ කියලා හිතුවත් අල්ලාහ් දෙවියෝ මේක වෙන්න හොඳ නැහැ කියලා හිතුවොත් මේක වෙන්නේ නැහැ කියලා. එතකොට කුර්ආනයේ කියලා තියෙනවා

FAIR COMMENT — BY JEZEEM

අල්ලාහ්ගේ අනුමැතිය නැතුව කිසිම හානියක් ඕගොල්ලන්ට වෙන්නේ නැහැ කියලා. ඉතින් ඔය වගේ මතයක් තිබුණ හින්දා සමහර එක් එක් පුද්ගලයෝ සංවිධානයක් විදියට නෙමෙයි එක එක පුද්ගලයෝ ඒක ගණන් ගන්නේ නැතුව ඉන්නත් ඉඩ තිබුණා. හැබැයි ඒ දෙකම compare කරන එකට නම් මම හිතන්නේ නැහැ සාධක තියෙනවා කියලා.

ප : ඔබ කියන්නේ මුස්ලිම් අය රටක තියෙන නීතිය එහෙම නැත්නම් රටේ පොලිසිය විසින් පනවන රෙගුලාසි ගණන් ගන්නේ නැතුව තමන්ගේ ආගමේ තියෙන දේවල් මතයට පමණක් වහල් වෙලා වැඩ කරන ගතියක් තියෙනවද?

පි : ඔව් තියෙනවා. මොකද ලංකාවේ මේ ප්‍රහාරය එල්ල වෙලා තිබුනේ නැත්නම් මේ කොරෝනා වසංගත කාලෙත් සමහර විට ගොඩක් අය ට්‍රයි කරලා ඇති අපිට පල්ලි අරින්න ඕනේ. ඕන දෙයක් ප්‍රශ්නයක් නැහැ පල්ලි විතරක් අපිට ඕනේ කියන මතයට ඇවිල්ලා ඇති. Already they have got a black mark because of Zaharan. ඒකට ඒගොල්ලන්ට ඩැමේජ් වෙලා තියෙන හින්දා ඒගොල්ලන්ගේ reputation එක ඩැමේජ් වෙලා තියෙන හින්දා ගොඩක් අය ඒ ගැන ලොකුවට කතා කරන්නේ නැහැ. පකිස්ථානය, බංගලාදේශය වැනි රටවල් ගත්තොත් අපි ප්‍රවෘත්තිවලත් දැක්කා මිනිස්සු පල්ලිවලට යන එක නවත්වන්න බැරි වුනා. ඉන්දියාව පවා පොලිසියෙන් බැටන් ප්‍රහාර කකා පල්ලිවලට යනවා. වහල උඩ මේවා කරනවා. එතකොට ආගමට මුල් තැන දෙන තත්ත්වය තමයි ගොඩක්ම තියෙන්නේ. ඒකෙත් සෞදි අරාබියාව වගේ ඉස්ලාම් ආගමට මුල් තැන දෙන ශුද්ධ වූ ස්ථාන තියෙන රටවල් පවා ඒක අයින් කරලා තියෙද්දි ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය වගේ රටවල් සිද්ධ වෙනවා කියලා අපි දකිනවා. ලංකාවත් එහෙම වෙන්න තිබුණා මේ ප්‍රහාරය නැත්නම් මුස්ලිම්වරුන්ට විරුද්ධ වන ජාතිවාදී බලවේග තිබුනේ නැත්නම් ඒ පැත්තට යන්න ඉඩ තිබුනා. දැන් ඒක තියෙන හින්දා ඒගොල්ලන් ඒකට එච්චර මේකක් නැහැ. ඒක අධ්‍යාපනය වැඩි වෙච්ච හින්දා සිද්ධ වෙච්ච එකක් කියලා මම හිතන්නේ නැහැ

****

<u>**ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා**</u>:

ප : සාක්ෂිකරු පාස්කු ප්‍රහාරයට පසුවත් පෙරත් මාවනැල්ල ප්‍රදේශයේ කේන්ද්‍රස්ථානයක් වෙලා තිබ්බා නේද මේ සියළු කටයුතුවලට. එයට යම් හේතුවක් තියෙනවද?

පි : මාවනැල්ල මුස්ලිම් මිනිස්සු ගොඩක් ජීවත් වන ප්‍රදේශයක්. එහේ ගොඩක් සම්පත් ඒ කියන්නේ රාජ්‍ය, අධ්‍යාපන පැත්තෙන් සම්පත් ටික මුස්ලිම් අතට ගොඩක් ලැබිලා තිබුණා. අනික් එක මාවනැල්ලේ මම දන්න තරමට මට යාපනයේ ඉදලා 90 දී එන කොටත් මාවනැල්ලේ යම්කිසි ඉස්ලාම් ආගමට පැත්තෙන් ගැඹුරට යන ගතියක් තිබුණා. ඒක හේතු වෙන්න පුළුවන්.

FAIR COMMENT BY JEZEEM

මාවනැල්ලේ මිනිස්සු ගොඩක් ආගමේ පැත්තට. මාවනැල්ල පමණක් නෙමෙයි, මාවනැල්ල, අකුරණ ඒ වගේ සමහර ගම් තියෙනවා ඒගොල්ලෝ ආගමට පැත්තට වැඩියෙන් යොමු වෙන ගතියක් තියෙනවා. 2000 ගණන්වල මාවනැල්ලේ අවට ප්‍රදේශවලින් හෙම්මාත ගම, දික්පිටිය වැනි ප්‍රදේශවලින් ජමාතේ ඉස්ලාමිය සාමාජිකයෝ ගොඩක් පදිංචියට ආවා මාවනැල්ලට. ඊට පස්සේ හජ්ජුල් අක්බර් පවා ගෙයක් කුලියට අරගෙන මාවනැල්ලට ඇවිත් ඊට පස්සේ මිළට ගෙයක් අරන් මාවනැල්ලේ පදිංචි වුණා.

ප : හජ්ජුල් අක්බර් ගේ ඥාති පුත්‍රයෙක් හෝ කල්එළියේ මද්‍රසා පාසලක විදුහල්පති වෙලා ඉන්නවද? දන්නවද?

පි : දන්නේ නැහැ.

ප : තමන් දන්නවද ජමාතේ ඉස්ලාමිය සංවිධානයේ දෙහිවල බෝම්බ පිපිරීමෙන් මියගිය ජමිල් සාමාජිකයෙක් වෙලා හිටියද?

පි : නැහැ මම ජමිල් ගැන දැන ගෙන හිටියේ නැහැ. ජමිල්ගේ අයියා හකීම් කියන එක්කෙනා ගැන මම දැනගෙන හිටියා.

ප : එයා ජමාතේ ඉස්ලාමිය?

පි : ජමාතේ ඉස්ලාමිය සංවිධානයත් එක්ක සම්බන්ධ කෙනෙක් හැටියට මම කලින්ම දැනගෙන හිටියා හකීම්ව.

ප : පසුව විදේශ ගත වුණාද ලංකාවේද?

පි : එයා මම හිතන්නේ ඒ වෙලාවේ අත්අඩංගුවට පත් වුනා කියලා මට ආරංචියක් ආවා. ඊට පස්සේ මට ඒ ගැන Follow up එකක් දන්නේ නැහැ නම්බර් ඒකක් මුකුත් තිබ්බේ නැහැ එයාගේ එයා ජමාතේ ඉස්ලාමිය සාමාජිකයෙක් හැටියටත්, ජමාතේ ඉස්ලාමිය වෙනුවෙන් එක එක වෙන වෙන නම් වලින් තියෙන සංවිධානවලට සම්බන්ධ එක්කෙනෙක් කියලා මම දැනගෙන හිටියා.

ප : ඊලඟ ප්‍රශ්නය තමන් නිකාබ් ගැන කිව්වා මක්කම වන්දනාවේ යන කොට මදීනාවලට මුස්ලිම් කාන්තාවන්ට නිකාබ් අදින්න ඉඩ දෙනවද?

පි : ඒක පොඩ්ඩක් වෙන විදියට බලන්න ඕන ප්‍රශ්නයක්. මොකද සාමාන්‍යයෙන් මුස්ලිම් අය තොප්පි දානවා. පල්ලියට යන කොට ඔළුව වහගෙන තමයි මුස්ලිම් පිරිමි අයත් ඉන්නේ. හැබැයි මක්කම වන්දනා කරනකොට ඒ කියන්නේ අර කව්බා කියන කළුපාට පෙට්ටියක් වගේ තියෙන එක වටේ යන කොට එතන තියෙන නීතිය වෙනයි. හජ්ජි කාලේ නම් උම්රා එකට යනවා නම් මහපු කිසිම ඇදුමක් අදින්න බැහැ පිරිමි අයට. ටවල් වගේ ලොකු රෙදි කෑලි දෙකක් තමයි අදින්නේ. කිසිම මැහුමක් නැති එකක් තමයි අදින්න ඕනේ. ඒ වගේම ඒකේ තහනම් කරලා තියෙනවා ඔළුව වහන එක තහනම් කර ලා තියෙනවා. පිරිමි අයට. ඒ වගේ ම ගෑනු අයට මුහුණ වහන එක තහනම් කරලා තියෙනවා. එතකොට අපිට Reverse Idea එකක් ගන්න පුළුවන් සාමාන්‍ය

FAIR COMMENT — BY JEZEEM

වෙලාවේ ඒක කරන නිසා තමයි මෙතන තහනමක් පල වෙලා කියලා ගන්නත් පුළුවන්.

ප : තමන් පිලි ගන්නවා නිකම් අදින්න බැහැ කියලා තහනමක් තියෙනවා?

පි : ඔව් හජ්ජි හරි උම්රා හරි ඒ ප්‍රදේශයේ perform කරන කොට ඒක තහනම් කරලා තියෙනවා. පිරිමි අයට ඔළුව වහන එකයි, ගෑණු අයට මුහුණ වහන එකයි තහනම් කරලා තියෙනවා. මදීනාවල එහෙම ප්‍රශ්නයක් නැහැ. මදීනා කියන්නේ නගරය. නබිතුමාගේ පල්ලිය තියෙනවා ඒ වුනාට ඒකේ ඒ වගේ නීතියක් නැහැ.

ප : තමන් කිව්වා බුර්කා ගැන තමන් කිව්වා බුර්කාවලින් කරන්නේ මුළු ඇඟම ආවරණය වෙන්න ලෝගුවක් වගේ අදිනවා?

පි : අදිනවා.

ප : තමන්ගේ ඔය මුස්ලිම් ජාතිකයන් අදින බුර්කා හැරුනු විට වෙනත් ආගම්වල ඒ සමාන ලෝගු අදින අවස්ථා තියෙනවද?

පි : යුදෙව් ජාතිකයින්ගේ සුළු පිරිසක් ඒ වගේ දෙයක් අදිනවා කියලා මම ෆොටෝ එකක් දැක්කා Facebook කවුරු හරි දාලා තිබුණා. ඒ හැර මම දන්න තරමට නැහැ.

ප : ඒ කියන්නේ ඇඟ වැහෙන්න ලෝගුවක් අදින,

පි : මුහුණත් එක්ක

ප : මුහුණ නැතුව ලෝගු අදින පිරිමි කට්ටිය වගේ?

පි : ලෝගුව කියන්නේ long robe එකක්. ක්‍රිස්තියානි father ස්ලා අදිනවා. ඒ වගේ එකක් අදිනවා. ලෝගුව කියන වචනය ඒකට ගැලපෙනවා නම්.

ප : ලංකාවේ හෝ වෙනත් රටවල මෙම බුර්කා ඇදගෙන suicide attack කරපු අවස්ථා තමන් දන්නවාද?

පි : ලංකාවේ දෙවෙනි ප්‍රහාරයට සුදානම් වෙච්ච වෙලාවේ ඒකට සම්බන්ධ කට්ටියක් බුර්කා ඇදන් හිටියා කියලා නම් ...බුර්කා ඇඳන් ගිහිල්ලා ප්‍රහාර එල්ල කරපු එක ගැන නම් මට මතක නැහැ. සමහර විට පලස්තිනය වැනි රටවල සිද්ධ වෙලා තියෙනවද දන්නේ නැහැ. පලස්තින්වල නම් සෑහෙන මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර සිද්ධ වෙලා තියෙනවා. ඒත් බුර්කා භාවිතා කලාද කියන එක දන්නේ නැහැ.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප : සාක්ෂිකරු The Caliphate Movement of Sri Lanka කියලා සංසදයක් තියෙනවද ලංකාවේ ?

පි : Caliphate Movement of Sri Lanka මම දන්න තරමට නැහැ. ඒ ගැන මම දන්නේ නැහැ.

ප : ඒක ජාමියා නලීමියා සහ මාදම්පේ තියෙන ඉස්ලාහියා එකත් සමඟ සම්බන්ධ ආයතනයක්ද ඒක?

පි : මාදම්පේ තියෙන ඉස්ලාහියා අරාබි පාසැල. මදුසා එක ජමාතේ ඉස්ලාමිය එකට අයිති එකක්. එතකොට නලීමියා කියන එක

FAIR COMMENT BY JEZEEM

ජමාතේ ඉස්ලාමිස් මතය ප්‍රචාරය කිරීම සඳහා ආරම්භ කරපු එකක්. ජමාතේ ඉස්ලාමිය එකට කෙලින්ම අයිති නැහැ. ඒ වුනාට ඒ මතය තමයි ඒගොල්ලන් අරන් යන්නේ. එතකොට ඒ දෙකම එකතු වෙලා වෙන සංවිධානයක් හදන්න විදියක් නැහැ එහෙම දෙයක් තියෙනවා නම් ඒක ජමාතේ ඉස්ලාමිය දැනුවත්ව ජමාතේ ඉස්ලාමිය යටතේ පවත්වන මොනවා හරි අනුශාඛාවක් එහෙම නැත්නම් ඒක ඇතුලේ තියෙන internal branch එකක් වෙන්න පුළුවන්.

ප්‍ර : එතකොට ජමාතේ ඉස්ලාමිය සංවිධානයට මුළු ලංකාව පුරාම තියෙන ජාමියා සහ මද්‍රාසා පාසල් කොච්චර සංඛ්‍යාවක් තියෙනවද ඔබට අදහසක් තියෙනවද ලංකාවේ තියෙන එක එක ප්‍රදේශ. උදාහරනයක් කිව්වොත් මාදම්පේ ඉස්ලාහියා එක, ජාමියා නලීමියා බේරුවල ඒ වගේ කීයක් තියෙනවද ඒ වගේම කාන්තාවන් සඳහා ඒ වගේ ජාමියා හෝ මද්‍රාසා පාසැල් කීයක් ජමාතේ ඉස්ලාමිය සංවිධානයට අයත්ව තිබෙනවද?

පි : මම ලඟ complete detail එකක් නැහැ. යම්කිසි මද්‍රසා ඒ කියන්නේ leading තියෙන ඒවා වලින් කැපී පෙනෙන විදියට තියෙන ඒවා විතරයි මම දන්නේ. ජමියා නලීමියා, මාදම්පේ ඉස්ලාහියා අර පුත්තලමේ තියෙන ඉස්ලාහියා බාලිකා මද්‍රසාවක, මාවනැල්ලේ තියෙන ආයිෂා සිද්දිකා බාලිකා මද්‍රාසා පාසල හෙම්මාත ගම තියෙනවා අල්හසනාත් කියන මද්‍රසා එක, ඉතින් ඒ වගේ කිපයක් මම දන්නවා.

ප්‍ර : මහරගම?

පි : මහරගම ගෆූරියා එක ඒගොල්ලන්ට අයිති නැහැ. ඒක ඊට කලින්ම වෙන කෙනෙක් හදපු එකක්. ඒකෙත් වහබ් වාදයට වගේ මතය තමයි ඒකේ තිබුනේ දැන් මේ දවස්වල කොහොමද දන්නේ නැහැ. ඒක ඉස්ලාමිය සංවිධානයකට ම අයිති එකක් නෙමෙයි. ඒක වෙන Trust එකක් මා හිතන විදියට.

ප්‍ර : දැන් මද්‍රාසා පාසල් වල ඉස්ලාම් ආගමික අන්තවාදය වැනි දේවල් උගන්වනවද?

පි : ඉස්ලාම් අන්තවාදි දේවල් කියන්නේ කුර්ආන් හදීෂ් එක උගන්වන කොට . දැන් හදීෂ්වල තියෙනවා සෑහෙන්න අන්තවාදයට යන්න පුළුවන් දේවල්. මම මෙතන සභාවටත් ඉදිරිපත් කරපු ලේඛනවල තියෙනවා. ඒවා උගන්වනවා. බුහාරි මුස්ලිම් ඒවා උගන්වනවා. ඒක library වල තියෙනවා ඒක ශිෂ්‍යයන්ට බලන්න කියනවා. ඒක ඉගැන්නුවේ නැතත් ඒගොල්ලන්ට ඒක බලන්න වෙනවා , ඊට පස්සේ ඒගොල්ලන් ගොඩක්ම මව්ලවිලා හැටියට එළියට ඇවිල්ලා දේශනා තමයි කරන්න වෙන්නේ. දේශනා කරන කොට ඒගොල්ලන්ට මේක ඕන වෙනවා. ඒගොල්ලන් ඒක ඉගෙන ගන්නවා. අනිත් එක නබිතුමාගේ ජීවිතය ගැන ඉගෙන ගන්න කොට ඒක අනිවාර්යයෙන්ම හැම මද්‍රාසා එකේම නබිතුමාගේ ජීවිතය ගැන ඉගෙන ගන්නවා. ඉගෙන ගන්න කොට ඒ ඒ අදාල තැන්වලට ඒ අදාල හදීෂ් එකක් දෙකක් හරි ඉගෙන ගන්නම

FAIR COMMENT BY JEZEEM

වෙනවා. එතකොට ඒවා සාමාන්‍යයෙන් ඒගොල්ලන්ට ඉගෙන ගන්නටම වෙනවා.

ප්‍ර : එතකොට හදීෂ් ගැන විතරයි සහ කුර්ආනය සහ හදිෂ් ගැන විතරයි නිතරම අසන්නට ලැබෙන්නේ, ඔබත් ඒ ගැන විතරයි කිව්වේ. සුරා කියලත් තියෙනවානේ එකක්? සුන්නා?

පි : සුන්නා කියන්නේ හදිෂ් තමයි. නබිතුමා ගේ මහ පෙන්වීම. නබිතුමා කරපු දේ තමයි සුන්නා කියන්නේ. ඒකත් හදිෂ්වල.

ප්‍ර : සූරා තියෙනවද Biography of Prophet Mohamad කියලා ?

පි : සීරා.

ප්‍ර : සීරා හරි?

පි : සීරා තියෙනවා. සීරා කියන්නේ Biography of Prophet Mohamad කියන එකක් ඒකත් ගන්නේ හදීෂ්වලින් තමයි. හදීෂ්වලින් හදපු එකක් තමයි සීරා. ඒ වචනේ දැන් ජමාතේ ඉස්ලාමිය භාවිතා කරනවා. මොකද හදීෂ් කිව්වාම තවුහිද් ජමාත් කට්ටිය හදිෂ් ඔක්කොම අරන් මිනිස්සුන්ට පෙන්නලා දැන් පොඩ්ඩක් ඉගෙන ගත්ත මිනිස්සු දන්න මිනිස්සු දන්නවා හදිෂ්වල වැරදි දේවල් කියනවා කියලා. දැන් මේගොල්ලන්ට අර වචනය පොඩ්ඩක් වෙනස් කරන්න වෙලා තියෙනවා. එතකොට සූරා එක බලන්න ඕන කියනවා. ඒ කියන්නේ නබිතුමාගේ ජීවිතය ගැන බලන්න ඕන කියන එක ඉතින් සූරා කොහේ තියෙනවද කියා හොයලා බැලුවොත් හදීෂ්වලින් තමයි සූරා ඒක ගන්න වෙන්නේ. ඒක පොඩි වචනයේ තියෙන පොඩි වෙනස්කමක් තමයි. සූරා කියා තනියම එකක් නැහැ.

ප්‍ර : එතකොට පුම්මා, මස්ජිත් පල්ලිවල සිකුරාදා දේව මෙහෙය ඉස්ලාම් භක්තිකයන්ට අනිවාර්යයිද?

පි : අනිවාර්යයි.

ප්‍ර : එතකොට ඔබ මෙම කොමිෂම හමුවේ ප්‍රකාශ කලා දේව මෙහෙය සහ දේශනාවක් පවත්වනවා කියලා, ඒ දේශනාවේදි ආගමික අන්තවාදි මතවාදි දේවල් ඇතුලත්ව දේශනා පවත්වනවද?

පි : ඒක දේශනාව පවත්වන මව්ලවිගෙනුයි පල්ලිය භාරව ඉන්න කට්ටියගේ අතේ තමයි තියෙන්නේ. සමහර පල්ලිවල එනම් මව්ලවිතුමාට ඒක බාර දෙනවා. එතකොට එයා තමා කැමති විදියට කරගෙන යනවා. සමහර පල්ලිවල කියනවා Trustee Board එකෙන් අපි මේ වගේ දෙයක් කතා කරමු, මේවගේ දෙයක් කරමු කියලා. බොහෝ දුරට අපිට අහන්න ලැබෙන එකක් තමයි හැම ප්‍රශ්නෙටම හේතුව කාන්තාවෝ කියලා ඒගොල්ලන් කාන්තාවෝ කියන එක අහන්නේ නැහැ කියලා gender discrimination එකක් යනවා. හැම ප්‍රශ්නයටම. ඒ වගේ දේවල් වෙනවා. අන්තවාදි අදහස් දෙනවා. ජිහාඩ් ගැන, නබිතුමා කරපු සටන ගැන ඒවගේ කතා කරනවා. ඒ වගේ සෑහෙන දේවල් වෙනවා. ඒකනේ සිකුරාදා දේශනාව කියන්නේ හැම මුස්ලිම් එක්කෙනාටම ඒ පණිවිඩය අරන් යන්න පුළුවන් . ඒකම විතරක් නෙමෙයි හොඳ දේවලුත් වෙනවා. පල්ලියට එන්න කියනවා,

Fair Comment — BY JEZEEM

නැති බැරි මිනිස්සුන්ට දාන පරිත්‍යාග කරන දාන ඒවගේ දේවලුත් කරනවා. ඒ වගේ හොඳ දේවලුත් කරනවා ඒත් එක්කම මේවගේ දේවලුත් වෙනවා.

ප : ලංකාවේ ජුම්මා මස්ජිත් පල්ලි කීයක් තියෙනවද ඔබ දන්නා හැටියට? ඔබ තොරතුරු දන්නවද ජුම්මා මස්ජිත් පල්ලි?

පි : නැහැ.

ප : සාමාන්‍යයෙන් අදහසක් ඔබට කියන්න පුළුවන්ද ජුම්මා මස්ජිත් පල්ලිවලින් ජමාතේ ඉස්ලාමිය සංවිධානය සහ තවුහිද් ජමාත් කියන ඒ සංවිධාන දෙකට අයිති පල්ලිද වැඩි ජුම්මා මස්ජිත් පල්ලිවලින්?

පි : තවුහිද් සංවිධාන ඇවිල්ලා ගම්වල පැවතිච්ච පල්ලිවල පාලනය අතට ගත්තේ නැහැ. ඒගොල්ලන් ගම්වල තියෙන පල්ලිවල ගිහිල්ලා තිබෙන විදිය වෙනස් කරන්න කියලා ට්‍රයි කලා. හරි ගියේ නැති වුනාට ඒගොල්ලන් කලේ බොහෝ දුරට පිටරට සෞදි රටවල් වලින් ආධාර අරගෙන වෙනම පල්ලි හදපු එක. ජමාතේ ඉස්ලාමිය එහෙම දෙයක් කලේ නැහැ. ක්‍රමක්‍රමයෙන් long term plan එකෙන් පල්ලිවල පාලනය තමන් අතට ගත්තා. numbers ගාන ගැන මම දන්නේ නැහැ.

ප : නිලා ෆවුන්ඩේෂන් කියලා ඉස්ලාම් ආගමික අන්තවාදය ප්‍රවර්ධනය කරන සහ එයට මුල්‍යාධාර සපයන නේවාසික පහසුකම් එහෙම ලබා දෙන සංවිධානයක් තියෙනවද ?

පි : නිදා ෆවුන්ඩේෂන් කියලා එකක් තියෙනවා, අල්නිදා කියන එකත් තියෙනවා. නිදා කියන්නේ ඒක රාජගිරිය පැත්තේ

ප : ඒ සංවිධානය අයිති මොන නිකායටද?

පි : රාජගිරිය පැත්තේ තියෙන එකද. හසන් ෆරීඩ් මව්ලවි

ප : මොකක්ද ඒ නිකාය ජමාතේ ඉස්ලාමියද?

පි : හසන් ෆරීඩ් මව්ලවි කියන එක්කෙනා තබ්ලික් ජමාත් එකට අයිති එක්කෙනෙක්. සිංහල එයා ගොඩක්ම අවධානය යොමු කලේ බෞද්ධ අයව, සිංහල මිනිස්සුන්ව ඉස්ලාම් ආගමට හරවන වැඩ සටහනක් තමයි නිදා ෆවුන්ඩේෂන් හරහා ගියේ.

ප : ඒකට කවුද මුදල් ආධාර ලබා දෙන්නේ, මොකක් හරි විදේශ රටකින් ලැබෙනවද, එහෙම නැති නම් ලංකාවේ

පි : තනි පුද්ගලයෙකුගෙන් ලැබෙනවද කියලා මම දන්නේ නැහැ. ඒක කරගෙන ගියේ නැත්නම් තාම ඒක තියෙනවා නම් කර ගෙන යන්නේ හසන් මව්ලවි කියන මව්ලවි කෙනෙක් තමයි. එයාගේ කඩේකුත් තියෙනවා දෙවෙනි හරස් විදියේ රතුපල්ලිය ඉස්සරහා.

ප : දැන් ඔබ මෙම කොමිෂන් සභාව හමුවේදි ප්‍රකාශ කලා විධියෝ එකකුත් සමඟ මැලේසියාවේ සහ තවත් රටවල තහනම් කරපු ඉබ්නුතායි යුසුෆ් කර්දාවි, ඉබ්නු අබ්දුල් වහබ් වැනි අයගේ නම් රජය විසින් නිකුත් කරන ලද පාසැල් ඉස්ලාම් ධර්මය පොත්වලට ඇතුල් කර තියෙනවා කියලා, ඔබට අසන්නට ලැබිලා තියෙනවාද තුර්කියේ හිටපු ඉමාම් වරයෙක් සෙයිඩ්නුර්සි කියලා?

පි : නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ශ්‍රී ලංකාවේ යුධ සමයේදි නැගෙනහිර පලාතේ ජිහාඩ් නමින් ඉස්ලාම් ආගමික අන්තවාදි කණ්ඩායමක් ක්‍රියාත්මක වුනාද ඒ පිළිබඳව ඔබ තුල කිසියම් අදහස් තියෙනවද? ඔබ ඒ පිලිබඳව තොරතුරු දන්නවද?

පි : මාධ්‍ය හරහා මම ඒ ගැන ගොඩක් දැනගෙන හිටියා. ඒකේ එක් එක් මත තිබ්බා සමහර අය කිව්වා මේකේ පිටිපස්සේ හමුදාව ඉන්නේ කියලා. හමුදාව දැනගෙන තමයි ඕක කරන්නේ. කොටි සංවිධානයට පහර දීම සඳහා කියලා, සමහර අය කිව්වා මේ මුස්ලිම් ගම්මානවලට කොටි ප්‍රහාර එල්ල වෙන හින්දා ඒ වගේ සංවිධාන මුස්ලිම් අයටත් පටන් ගන්න උවමනා වුනා කියලා. එහෙම නැතුව ඒකේ හිටපු පුද්ගලයෝ ගැනවත් ඒක පිටිපස්සේ කවුද හිටියේ කියලාවත් මම දන්නේ නැහැ.

ප්‍ර : ඔබ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ දි ප්‍රකාශ කරලා තිබුණා මාවනැල්ල තවුහිද් ජමාත් කියලා සංවිධානයක් තියෙනවා කියල. ඒ සංවිධානයේ කවුද ආරම්භ කලේ?

පි : නවුෆර් මව්ලවි කියලා. මම කලින් කතා කල නවුෆර් මව්ලවි නෙමෙයි. මෙයාත් නවුෆර් මව්ලවි තමයි. ඒ නවුෆර් මව්ලවි කියන කෙනා තමයි ඒක ආරම්භ කලේ. ඊට කලිනුත් තවුහිද් සංවිධානයේ මතයට සම්බන්ධ පුද්ගලයෝ හිටියා. ඒ වුනාට සංවිධානයක් හැටියට සාර්ථකව පටන් ගත්තේ නවුෆර් මවුලවි කියන කෙනා.

ප්‍ර : ඒ කොයි කාලෙද?

පි : 2001 නැත්නම් 2002 වගේ කාලේ වෙන්න ඕනේ.

ප්‍ර : ඒ සංවිධානය දැනුත් තියෙනවද? එහෙම නැත්නම් ඒ සංවිධානයද පසුකාලීනව වෙනත් නමකින්

පි : එයා පටන් ගන්න කොට තිබුණ නමක් තමයි JDA ජමියතු දව්වතුල් ඉස්ලාමියා කියන නමින්. ඊට පසු මාවනැල්ල තවුහිද් ජමාත් කියලා නම වෙනස් කලා. ඒ මම ඉන්න කාලේ. ඊට පස්සේ ආයෙත් නම වෙනස්වීමක් වුණා. දෙතුන්පාරක් වගේ නම වෙනස් වීමක් වුනා. දැන් මට ආරංචි වෙන විදියට තවුහිද් ජමාත් එකට අයිති වෙන පල්ලි 4 ක් 5 ක් තියෙනවා මාවනැල්ල ප්‍රදේශයේ, වටේ. ඒ එක එක පල්ලි වල මධ්‍යස්ථානයක් අරගෙන එක එක නම්වලින් ක්‍රියාත්මක වනවා කියන එක තමයි මට දැන ගන්න ලැබුනේ.

ප්‍ර : ජමාතේ ඉස්ලාමිය සංවිධානයට අයිති පල්ලි කීයක් ඔය මාවනැල්ල ප්‍රදේශයේ තියෙනවද?

පි : මාවනැල්ල ප්‍රදේශයේ ඒගොල්ලන්ගේ කාර්යාලය තිබුනා වලව්වත්ත ප්‍රදේශයේ. ඒකේ පල්ලියක් හදා ගත්තා. ඒක ජමාතේ ඉස්ලාමිය එකට අයිති. ඒ හැර ජමාතේ ඉස්ලාමිය කවදාවත් පල්ලි හදන්නේ නැහැ අළුතින් තියෙන පල්ලියේ පාලන බලය තමා ඒගොල්ලෝ අතට ගන්නේ. මම හිතන්නේ මාවනැල්ල හිඟුලව පල්ලිය. මස්ජිතිව්හුදා කියන පල්ලියේ පාලන බලය දැන් ජමාතේ ඉස්ලාමිය අතේ තියෙනවා කියලා තමයි.

Presidential Secretariat
FAIR COMMENT BY JEZEEM

මහවත්ත පල්ලිය රඹුක්කන පාරේ තියෙන මහවත්ත පල්ලියේ ඒගොල්ලන්ගේ සැලැස්මක් තිබුණා පාලන බලය ගන්න ඕන කියලා. ඒකත් අරන් ඉවරයි කියලා තමයි කියන්නේ.

ප : 2019 අප්‍රේල් 21 දින සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයේ කේන්ද්‍රස්ථානය Epi-center එක කාත්තන්කුඩියෙද මාවනැල්ලේද?

පි : Difficult to answer .

ප : Then my last question දැන් ඔබ සඳහන් කලානේ ආගම පිළිබඳව කුඩා කාලයේ සිටම ඉස්ලාම් කුඩා ලමයා තරුණයෙක් දක්වා ගිහිල්ලා ඔහුගේ ජීවිත කාලය පුරාම ආගමට ඇති කර තිබෙන බැදීම නිසා ඔවුන්ව වෙනත් දේකට යොමු කරන්න අපහසුයි කියලා?

පි : ඔව්.

ප : එතකොට ඔබ දැන් ඉස්ලාම් ආගම් භක්තිකයෙක් හැටියට ඉදලා ජමාතේ ඉස්ලාමිය ශිෂ්‍ය සංවිධානය වගේ සංවිධානයකත් ඉදලා ඔබට කියන්න පුළුවන්ද ශ්‍රී ලංකාව වැනි බහු ආගමික බහුවාර්ගික රටක ජාතීන් අතර සමගිය ඇති කිරීමට මේ ඉස්ලාම් ආගමික ඉගැන්වීම් හො ආගම කෙරෙහි ඉස්ලාම් ජනතාව තදින් බැදීම් ඇති කිරීම තුලින් අපේ රටේ ආගමික සංහිදියාව සමගිය සහ ඒවා ඇති කරන්න පුළුවන්ද ජාතින් අතර සමගිය?

පි : බැහැ.

ප : ඒවා ඇති කිරීම සඳහා ඔබ මොකක්ද කරන යෝජනාව?

පි : ඉස්ලාම් ආගමත් එක්ක මුස්ලිම් අය තදින් බැඳෙන කොට ආගම සංහිදියාව ඇති කරන්න බැහැ, මොකද ඉස්ලාම් ආගම කියලා තියෙන්නේ අනිත් ආගමත් එක්ක කිසිම negotiation එකක් නැහැයි කියන එක. ඒක තමයි කුර්ආනයේ කියලා තියෙනවා ලකුම් දිනකුම් වලි අදීන් වැකිය. ඕගොල්ලන්ට ඕගොල්ලන්ගේ ආගම, අපිට අපේ ආගම කියන එක. කිසිම negotiation between the religion ඒක නැහැ කියන එක තමයි ඉස්ලාම් ආගමේ තද මතය. ඉතින් ඒ වගේ මතයක් තියෙන කොට ඒක අමාරුයි ඉතින්. ඒකට තමයි මම අර කලින් කිව්වේ ආගම ඉගැන්වීම ආගම සංවිධානවල් මේවා කරන එක ඉස්ලාම් කියලා එකම subject එකක් මුස්ලම්යින්ට විතරක් ඒක උගන්වලා මුස්ලිම් පාසල් කියලා වෙන් කරලා ඒ ලමයින්ට ඒ මතයම පැතිරෙන්න නතර කරොත් විතරයි මේක කර ගන්න පුළුවන්.

ප : මද්‍රාසා පාසැල් වලට අධ්‍යාපනය සඳහා මුස්ලිම් පාසල් ලමුන් ඇතුල් වෙලා ඊට පස්සේ නලීමියා වැනි පාසැල්වලට යාම තිබිය යුතුයිද එහෙම නැත්නම් එබදු අධ්‍යාපන ක්‍රමයක් නැතුව සියළුම මුස්ලිම් දරුවන් මුස්ලිම් පාසල්වල හෝ තමන් අධ්‍යාපනය කලයුතුයි කියන මතයේද ඔබ ඉන්නේ?

පි : මගේ මතය මද්‍රසා පාසල් කියන ක්‍රමය මේ රටට අවශ්‍ය නැහැ කියන එක තමයි මගේ මතය.

ප : අවසාන ප්‍රශ්නය ඔබගේ අදහස දැන ගන්නට කැමතියි මේ කොමිෂන් සභාව මුස්ලිම් විවාහ දික්කසාද පනත සම්බන්ධයෙන්

FAIR COMMENT BY JEZEEM

විශේෂයෙන්ම එහි මුස්ලිම් ගැහැණු දරුවකු වයස අවුරුදු 12 දී විවාහ කරදීම එය රටේ පවත්නා සාමාන්‍ය නීතිය පරිදි වයස 18 දක්වා වැඩි කිරීම පිළිබඳ ඔබගේ අදහස කුමක්ද කියලා?

පි : එහෙම යෝජනාවක් තියෙනවා නම් ඒක හොඳයි. ඊට වඩා හොඳයි එක් එක් ආගම්වලට එක එක කණ්ඩායම්වලට එක එක කල්ලිවලට වෙන වෙනම නීති තියන්නේ නැතුව හැමෝටම පොදු නීති තියෙන්න ඕනේ. මම වීඩියෝ එකක් නිකුත් කරලා තිබ්බා මම ඒකෙත් කියලා තිබුණා මුස්ලිම් අය හිතනවා නම් ඒගොල්ලන්ගේ විවාහ දික්කසාද නීතියේ රටේ පොදු නීතිය නැති හොඳ දෙයක් තියෙනවා නම් ඒක ඒගොල්ලන් විතරක් තියාගෙන ඉන්නේ නැතුව මේ රටේ ජනතාවට ඉදිරිපත් කරලා අපේ නීතියට එකතු කරලා එහෙම දෙයක් තියෙනවා නම් ඒගොල්ලන් කියනවා නම් මේකේ හොඳ දෙයක් තියෙනවා ඒකයි අපි තියාගෙන ඉන්නේ කිව්වොත් ඒ හොඳ දේ හැමෝටම භුක්ති විඳින්නට ඉදිරිපත් කරලා පොදු නීතිය ඒකයි එකතු කරලා ඕගොල්ලන් පොදු නීතිය යටතේ එන්න කියන එක තමයි මම කියන්නේ. පෞද්ගලික නීති තියාගෙන ඉන්න එක එතන සුදුසු නැහැ එතනින් තමයි බෙදිම පටන් ගන්නේ. සාමාන්‍යයෙන් පොදු ජීවිතයේ ඉදලා ඒගොල්ලන් වෙන් කරන්න අපි හැම තැනම මුස්ලිම් මිනිස්සුන්ට වෙනම යන්න කියන මාර්ගය ව්‍යවස්ථාවෙන්ම රජයෙන්ම අධ්‍යාපනයෙන් හැම තැනින්ම පාසල් පොත්වලින් පවා හදලා දිලා තියෙනවා. ඊට පස්සේ වෙන් වෙලා ගිහිල්ලා කවුරු හරි තැනකට ගිහිල්ලා ඒක පුපුරන්න ගියාම තමයි ප්‍රශ්නය දරුණු තත්ත්වයට තේරුම් අරගෙන මේවගේ කොමිෂන් පත්කර ගෙන පරික්ෂණ පවත්වාගෙන යන තත්ත්වයක් ඇති වෙන්නේ. ඒක මුලදිම ඒවගේ වලක්වගෙන අපි හැමෝම එකයි, අපි හැමෝම මනුස්සයෝ අපිට තියෙන්නේ එකම නීතිය කියන එක තිබ්බොත් මතය, ආගම විශ්වාසය වෙනස් වෙන්න පුළුවන් හැබැයි අපි හැමෝම එකයි මට හොඳ දේ තමයි ඔයාටත් හොඳයි කියලා. මට මේක පිරිසිදු නම් ඔයාටත් ඒක කන්න පිරිසිදුයි කියන මතය තියෙනවා නම් ඒ වගේ අන්තවාදී තැන්වලට යන එක වලක්වන්න පුළුවන්.

****

<u>**ගරු බන්දුල අතපත්තු මැතිතුමා:**</u>

ප්‍ර : ඔබ උදේ වරුවේ සාක්ෂි දෙන කොට කිව්වා මේ තුර්කියට යනවා කියලා ශිෂ්‍යත්ව ඉගෙන ගන්න මොනවා ඉගෙන ගන්නද තුර්කියට සාමාන්‍යයෙන් යන්නේ?

පි : Computer, Economic, Medicine ඒවගේ විෂය ඉගෙන ගන්න තමයි Scholarship කියලා මීඩියා

ප්‍ර : Scholarship කවුද දෙන්නේ?

පි : කවුද දෙන්නේ කියලා මම දන්නේ නැහැ ඒක තමයි මට ඒකට උත්තර දෙන්න බැරි වුනා තුර්කි රජයෙන් දෙනවද තුර්කිවල ඉන්න පෞද්ගලික සංවිධාන දෙනවද කියලා. ඒ ගිය කට්ටිය

FAIR COMMENT BY JEZEEM

තමන්ගේ මුදල්වලින් වියදම් කරගෙන ගියේ නැහැ Scholarship හරහා තමයි ගියේ.

ප්‍ර : කොයි කාලේ වගේද පටන් ගත්තේ ඒ යන්න?

පි : 2010 වගේ දැනට ඉන්න ජනාධිපතිතුමා බලයට පත්වුනාට පස්සේ තමයි අර්දුවාන් කියන ජනාධිපතිතුමා ඇවිල්ලා ටික කාලෙකට පස්සේ තමයි ඒක පටන් ගත්තේ. ඒකෙන් ගොඩක්ම ප්‍රයෝජනය ගත්තේ ජමාතේ ඉස්ලාමිය සංවිධානය. ඒ හරහා තමයි ඒක ගොඩක් ම move වුනේ. ශිෂ්‍යයන් තුර්කිවලට යන්න පටන් ගත්තේ.

ප්‍ර : තවමත් මේ කොරෝනා එකට කලිනුත් යන්න පටන් ගත්තද?

පි : ඔව්.

ප්‍ර : සාමාන්‍යයෙන් කොච්චර විතර ප්‍රමාණයක් ඔබ දන්න පරිදි ඉන්නවද තුර්කියේ ශිෂ්‍යයන්?

පි : මම පෞද්ගලිකව දන්න තරමට ඉගෙන ගත්ත අය 4,5 දෙනෙක් වගේ තමයි මම හඳුනන්නේ. ඒත් ඒගොල්ලන්ගෙන් ලැබිච්ච තොරතුරු අනුව මම දන්නවා තුර්කිවල Sri Lanka Muslim Student Community එකක් තියෙනවා කියලා. කවුද කවුද ඉන්නේ කියන එක මම දන්නේ නැහැ ඒක ජමාතේ ඉස්ලාමියට සම්බන්ධ එකක් කියලා මම දන්නවා. මම ඒවායේ ගිහිල්ලා ආපු පුද්ගලයෝ දෙන්නෙක් හම්බ වෙච්ච එක ගැනත් මේ සභාවට ඉදිරිපත් කරලා තිබුනා. මගේ සාක්ෂිවල එකක් හජ්ජුල් අක්බර්ගේ රිසාම් කියන පුතා. එතකොට එයත් කිව්වා තව අයියා කෙනෙකුත් තුර්කිවල ඉගෙන ගත්තා කියලා. ඒ වගේම සුහදව කතා කරන කොට කතාවලින් දැන ගත්ත දේවලින් මට දැනුනා ජමාතේ ඉස්ලාමිය එකට සම්බන්ධ පිරිසක් එහේ ඉන්නවා කියන එක.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : මගේ එක ප්‍රශ්නයක් තියෙනවා ඔබ කිව්වා ඔබ 1990 LTTE ත්‍රස්තවාදීන් විසින් ඔබගේ පවුල පැන්නුවාට පස්සේ තමයි මාවනැල්ලට ආවේ කියලා.

පි : ඔව්.

ප්‍ර : මාවනැල්ලේ ඔබගේ නෑදෑයෝ කවුරු හරි හිටියද?

පි : නැහැ හිටියේ නැහැ.

ප්‍ර : යාපනයේ ඉදලා මාවනැල්ලට එහෙම නම් කොහොමද ආවේ?

පි : අපි ඉස්සෙල්ලාම හිටියේ අනුරාධපුර කෝවිල්පත්තුව කියන ගම්මානයට. ඊට පස්සේ අපේ තාත්තා teaching කරලා තිබුනා නුවර පලාතේ අකුරන ගලගෙදර වාගේ පලාත්වල. එතකොට තාත්තගේ Training College එකේ හිටියා මාවනැල්ලේ යාළුවෙක්. හාෂිම් කියලා. සාලි කියන එක තමයි එයාගේ නම. ඊට පස්සේ ගලගෙදර තමයි අපි ඉස්සේලාම ගියේ අනුරාධපුරේ ඉඳලා ඇවිත්. ගලගෙදර අපිට කුලියට පොඩි ගෙයක්වත් හොයා ගන්න බැරි වුනා. ඊට පස්සේ එතන ඉඳලා තමයි අපි මාවනැල්ලට

FAIR COMMENT — BY JEZEEM —

ආවේ. ඒ යාළුවා තමයි තාත්තාගේ යාළුවාගේ ගෙදර තමයි අපි සති දෙකක් ඉදලා තමයි ඊට පස්සේ තමයි අපිට කුලියට ගෙයක් ගන්න ලැබුනේ.

මේ අවස්ථාවේදි අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාට සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාව ලබා දෙමි.

****

<u>ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා:</u>

ප්‍ර : සාක්ෂිකරු තුර්කියේ තියෙන්නේ ෂරියා නීතිය නේද?

පි : නැහැ. තුර්කියේ නීතිය වෙනස් වුනේ නැහැ තුර්කිය, ඕට්ටමාන් ඉස්ලාමිය සාම් රාජ්‍යයේ අවසන් අගනුවර හැටියට තමයි, අවසන් මේකක් හැටියට තමයි තිබුනේ 1927 දි කමාල්අතාතුර් විසින් මේක බිඳ වැටීමකට ලක් කලා. ඊට පස්සේ කමාල්අතාතුර් secular රාජ්‍යයක් තමයි පත් කලේ. එතකොට එයා නීතිය අනුව ගෑණු ඔළුව වහන එක පවා තහනම් කරලා තිබුනා. තුර්කිවල ආගම් කටයුතුවලට, ආගම්වලට කිසිම තැනක් තිබුනේ නැහැ තුර්කි වල. ඊට පස්සේ දැනට ඉන්න ජනාධිපති බලයට ආවට පස්සේ එක එක නීති ක්‍රමක්‍රමයෙන් step by step මාරු කිරීම සිදුවීමෙන් පැවතෙනවා. තාම ඒක ඉස්ලාම් නීතිය තියෙන රටක් නෙමෙයි.

ප්‍ර : එතකොට යෙමාන්,ඉරාක් ඒ ෂරියා නීතිය තිබෙනවද?

පි : යෙමන්වල කාලෙන් කාලෙට පාලනය වෙනස් වෙනවා. ඒක ඒ රටේ ස්ථීර පාලනය තිබුනේ නැහැ. එක්තරා කාලයක ඒ රට දෙකට බෙදිලා තිබුණා 90 ගණන්වල.

ප්‍ර : මගේ ප්‍රශ්නය එහේ ෂරියා නීතිය තිබෙනවද කියලා?

පි : ෂරියා නීතිය කාලෙන් කාලෙට ආව, ගියා ඒ වගේ ඒවා තමයි තිබ්බේ. දැනටත් මේ ෂියාවරුනුයි සුන්නිවරුන් අතර යුද්ධයක් යනවා දැන් තියෙන පාලනය මොකද කියලා දන්නේ නැහැ, ඉරාන් වල තියෙන්නේ ෂියාවරුන්ගේ රටක්.

ප්‍ර : ඉරාක්?

පි : ඉරාක් වල තිබුනේ නැහැ. සදාම් හුසේන්ගේ තිබුනේ බාත් සොෂලිස් කියන යම්කිසි Socialist ප්‍රතිපත්තියක් තමයි තිබුනේ.

ප්‍ර : දැන් සාක්ෂිකරු තමා කිව්වා තමා මේ 1995 ජමාතේ ඉස්ලාමිය සංවිධානයේ රැස්වීම්වලට සහභාගි වුනා කියලා?

පි : ඔව් 95.

ප්‍ර : එතකොට එම රැස්වීම්වලදි කතෝලික පල්ලියට විරුද්ධව දේශනා පැවැත්තුවද තමා දන්න තරමින්?

පි : අපිට එක කතෝලික පල්ලියක් ගැන විශේෂයෙන්ම කියලා දුන්නා Free Mason's කියන

ප්‍ර : ඒක කතෝලික පල්ලියක් නෙමෙයි,

Proof Reading Copy

FAIR COMMENT BY JEZEEM

පි : සමාවෙන්න මට ඒක. එතකොට ඒක ක්‍රිස්තියානි කියලා කියන්න පුළුවන්ද

ප්‍ර : ඔව්.

පි : ඔව් ක්‍රිස්තියානි පල්ලිය ගැන තමයි අපිට කියලා දුන්නේ. ඒක කොටුවෙත් තියෙනවා ඒගොල්ලන් ඊශ්‍රායල් එක්ක සම්බන්ධයි භයානකයි කියන මතය අපිට දුන්නා. කතෝලික පල්ලි ගැන අපිට කිව්වේ නැහැ.

ප්‍ර : දැන් තමාට කියන්න පුළුවන්ද මේ පාස්කු ප්‍රහාරයේ ඇයි කතෝලික පල්ලි ඉලක්ක කරගෙන මේ සිද්ධිය සිදු කලේ කියලා? යම් හේතුවක් කියන්න පුළුවන්ද?

පි : හේතුවක් ඔව්, මට හිතන දේ මට කියන්න පුළුවන්. මම මෙතන සඳහන් කලා සහරාන් මාව මරන්න අර හතර දෙනාව යවන කොට මට භාවිතා කරපු වචනයක් තියෙනවා, අර උෟරාව මරන්න කියලා. හදිෂ් එකක් තියෙනවා ක්‍රිස්තියානි අය Son of God Jesus කියලා පිලි ගත්තාට ඉස්ලාම් ආගම අනුව ඊෂා නබිතුමා එයත් මොහොමඩ් නබිතුමාට ඉස්සෙල්ලා ආපු ශාස්තෘවරයෙක් කියලා හැටියට එයාව කුරුසයේ ගහලා මැරීම සිද්ධ කරන කොට කලින් අල්ලාහ් දෙවියන් එයාව අහසට ගත්තා. එතන හිටපු වෙන පුද්ගලයෙක් තමයි ඒ විදියට ඒ කට්ටියට පෙනුනේ. එයාව තමයි එයාලා කුරුසේ ගැහුවේ. ඊෂා නබිතුමා තාම අහසේ ඉන්නවා කියන මතය තමයි ඉස්ලාම් ආගමේ තියෙන්නේ. එතකොට ලෝක අවසානය ලංවන කොට Ants Christ කියලා ඕගොල්ලෝ හඳුන්වන එක්කෙනා ලෝකෙට එනවා. ආවට පස්සේ එයාව මැරීම සඳහා ඊෂා නබී ආපහු ලෝකෙට එනවා මුස්ලිම්වරයෙක් හැටියට. ඒ ගැන සඳහන් කරන කොට කරුනු දෙකක් සඳහන් වෙනවා. එකක් තමයි කුරුසේ කඩනවා. උෟරෝ මරලා දානවා කියන එක. ඒ අදහස ඒ හදීෂ්වල තියෙනවා. එතකොට සහරාන් මට උෟරා කියලා කියලා තියෙන්නේ මගේ ex-Muslim ඉස්ලාම් ආගම දන්න යාළුවොත් මට කිව්වේ මට දැනිච්ච එකක් තමයි උෟරාව මරලා දාන්න කියන එක ඉස්ලාම් ආගමේ ඊෂා නබී කරනවා කිව්වාම ඊෂා නබිතුමා ඒක කරනවා කිව්වාම ඒක උතුම් කාර්යයක්. එතකොට මාව මරලා දානවා කියන එක පවක් නෙමෙයි කියන එකයි. අනිත් එක කුරුසේ කඩනවා කියන එක පදනම් කරගෙන ඒ ප්‍රහාරය එල්ල කලාද කියලා මම දන්නේ නැහැ. තවත් කාරණයක් මට පේනවා ඉස්ලාම් ආගම ගත්තොත් නබිතුමා ඉස්ලාම් ආගමේ Enemies වර්ගීකරනය කරලා තියෙනවා කුර්ආන් එක අනුව. ඒකේ යහුදු වන් නසාරා අරාබි වලින් යකූත් කියන්නේ යූත් යුදෙව් ජාතිකයෝ තමයි First place enemies of Islam. ඒකට හේතුව තමයි මේ යුදෙව් ජාතිකයෝ දැනගෙන හිටියා මෙයා ගොඩක් දේවල් ඒගොල්ලන්ගේ තල්මූත් තෝරාවලින් කොපි කලා කියන එක. එතකොට එයා එක එක ප්‍රශ්න අහලා මෙයාට ගොඩක් වද දුන්නා. එතකොට එයා ගොඩක් හීට් කලා යුදෙව් ජාතිකයන්ට. මෙයාගේ start එක

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : යුදෙව් කියන්නේ Jews?

පි : Jews. මෙයාගේ start එකත් පටන් ගන්නේ Jewsලගෙන්. වරකාබි නවුෆර් කියන මෙයාගේ First wife ගේ cousin එයත් Ebinoid Christianity එක follow Jews ලගේ පොත් හොයලා ඉගෙන ගත්ත එක්කෙනෙක්. ඒ වුනාට ඒකෙන් කොපි කලාට පස්සේ ඒගොල්ලන්ගෙන් ගොඩක් ප්‍රශ්න මේ අයට එන්න පටන් ගත්තා. එතකොට ඉස්ලාම් වර්ගීකරන්නේ First level of enemies Jews කියලා. Second එකට ඉන්නේ වන්නසාරා. නසාරා කියන්නේ Christians . Because the Jesus of Nasarath you call it. This is where that word comes Nasara means Christian. So Christians are the second one. And gthe ideal worshippers fall into third category. And the ex-Muslims. The Murdaths are a special category because there's no community like ex-Muslims or Murdath. Whenever one person leaves that's it.

පි : දැන් ඌරා සහ ක්‍රිස්තියානි ආගම අතරේ සම්බන්ධයක් නැහැ?

පි : ඌරා සහ ක්‍රිස්තියානි ආගම අතර සම්බන්ධය මොකක්ද කියාල මට තේරෙන්නේ නැහැ. හදිෂ් එක කියන්නේ ඒ විදියට තමයි. ජීසස් වහන්සේ ආවට පස්සේ ඒ දෙක කරනවා කියලා තමයි ඒ හදීෂ් එක කියන්නේ.

ප්‍ර : දැන් තමා පිලිගන්නවද ශුද්ධ වු කුර්ආනයේ ක්‍රිස්තියානි කියන වචනය 600 වතාවක් විතර පාවිච්චි වෙනවා තමා දන්නවද ඒක?

පි : ක්‍රිස්තියානි

ප්‍ර : ක්‍රිස්ටියන් The word christian is used 600 times.

පි : Not the teno Nasara?

ප්‍ර : No Christian, according to this Quaran.

පි : මොනවද අරාබිවලින් භාවිතා වෙලා තියෙන වචනය

ප්‍ර : අරාබිවලින් කියන්නේ ක්‍රිස්තියානි. I'll come back to that.

පි : මා දන්නේ නෑ.

ප්‍ර : එතකොට තමා දන්නවද දැන් තමා කිව්වා අන්‍යාගමිකයින් මරන්න කියා ශුද්ධ වු කුර්ආනයේ නැහැ කියලා. ඒක හරිද?

පි : ශුද්ධ වු කුර්ආනයේ අන්‍යාගමිකයන්ට පහරදීම ගැන කියලා තියෙනවා. හදීෂ්වල තමයි අර මොහොමඩ් නබිතුමා කියලා තියෙන්නේ ආගමට එන්න කියලා. ඒ ගැන සහරානුත් එක තැනක කියනවා Non Muslims There are only two kinds of people. One is the one, one is the community that has ඒගොල්ලෝ මුස්ලිම් පාලනයට කප්පම් ජසියා ගෙවා ගෙන ලැජ්ජාවට පත්වෙලා, ඒ වචනෙන් එහෙම්මම එනවා ජීවත්වන අය අනිත් අය අපේ පහර දීමට ලක් වෙන්න ඉන්න අය.

ප්‍ර : මරන්න කියලා තියෙනවා නේද?

පි : ඇටෑක් කරලා Option එකක් දෙනවා. ඒක තමයි එතන තියෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප : You have the Quaran? සිංහල මේක තියෙනවද?

(C138 දරන සිංහල කුර්ආනය පෙන්වයි)

මේකේ බලන්න පිටු අංක 857 බලන්න . 857 - 3361 තිබෙනවද තමා ලඟ?
857 – 61 ඒකේ තියෙනවා පසුව ශාප කරනු ලැබුවන් ලෙස ඔවුන් පිට කරනු ලබන්නෝය. කොතනක ඔවුන්ව දකිනු ලැබුවාද ග්‍රහණය කරනු ලැබ මුලුමනින්ම ඔවුන්ව ඝාතනය කරනු ලැබේ කියලා තිබෙනවා?

පි : ඔව්.

ප : එතකොට ඊට අමතරව බලන්න පිටු අංක 1293. ඒකේ තිබෙනවා 986 සැබැවින්ම ධර්ම පුස්තකය ලත් ජනයින් හා ආදේශකයින් අතුරන් වූ ප්‍රතික්ෂේපකයෝ නිරාවින්නෙහිය. ඔවුහු එහි සාධනිකයෝ වෙති. ඔවුන් මැරීම අතුරින් දුෂ්ඨයන් වන්නේය.
ඒකේ තිබෙනවා Those who don't profess Islam ඉස්ලාම් භක්තිකයන් නැති අය දුෂ්ඨකයොන් කියලා. ඒක හරිද?

පි : ඔව්. ඒ වගේ තැන් හැමතැනම වගේ තිබෙනවා. මං ලඟ වාට් එකත් තිබුනා. 50, 60 ක් වගේ තැන්වල ඒ අන්දමට සාප කරලා බැන වැදිලා ඩොංගීස් කියලා Donkeys, cursed ones ඒ වගේ කියලා වචන භාවිතා කරලා තියෙනවා. කුර්ආන් එකේ ඒවා තිබෙනවා.

ප : තවදුරටත් තියෙනවා ක්‍රිස්තියානි බැතිමතුන් සහ යුදෙව්වන් මිත්‍රයින් ලෙස සැලකිය නොකරන්න කියලත් ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් වෙලා තියෙනවා?

පි : තියෙනවා, තියෙනවා නිතරම ඒක අපිට ඇහෙන්න ලැබෙන කුර්ආන් වැකියක්.

ප : දැන් තමාගෙන් ගරු සභාපතිතුමා අහපු ප්‍රශ්නයට අනුකූලව තමා දන්නවද ඉන්දුනිසියාව ඇතැම් කාලයක බෞද්ධ රටක් කියලා?

පි : මම අහලා තියෙනවා. ඉන්දුනීසියා, මැලේෂියාව, මැලේදිව්, ඇෆ්ගනිස්ථාන පකිස්ථානය,

ප : මාලදිවයින

පි : මාලදිවයින, පකිස්ථානය වගේ රටවල් බෞද්ධ රටවල් වෙලා හිටියා.

ප : දැන් ඇත්තටම ඉන්දුනිසියාවේ තියෙනවා බොරබොදුර් වල විශාලම බෞද්ධ පන්සල ඒක තමා දන්නේ නැහැ?

පි : දන්නේ නැහැ.

ප : නමුත් දැන් මේ සියළු රටවල් ඉන්දුනිසියා, මැලේෂියා, මාලදිවයින ඒ රටවල් තුනම දැන් සම්පූර්ණයෙන් මුස්ලිම් රටවල් කියලා තමා පිළිගන්නවද?

පි : ඔව්.

ප : එතකොට ඒ අන්දමටම තමන් දන්නවද ලංකාවේ මන්නාරමේ කතෝලික ඉඩම් ලබාගෙන මේ ඉඩම් මුස්ලිම් බැතිමතුන්ට දී තිබෙන බව තමා දන්නවද?

FAIR COMMENT BY JEZEEM

පි : නැහැ හරියට දන්නේ නැහැ ඒ වුනාට මන්නාරම් පදනම් කරගෙන ඉඩම් සම්බන්ධයෙන් මාධ්‍යවල චෝදනා ගොඩක් ගිහිල්ලා තිබුනා ඒත් මම ඒතරම් ගැඹුරට අවධානය යොමු කලේ නැහැ. කැලේ සුද්ධ කරපු

ප්‍ර : ඒ හිටපු අමාත්‍යවරයෙක් සම්බන්ධයෙන් මේ චෝදනා තිබෙනවා කියලා තමා දන්නවද?

පි : මන්නාරමේ ඉඩම් සම්බන්ධයෙන් මුස්ලිම් සම්බන්ධව ඒවගේ චෝදනාවක් තියෙනවා නම් දේශපාලන බලයත් එක්ක එතන තියෙන එකම පුද්ගලයා කවුරුත් දන්න

ප්‍ර : කවුද?

උ : හිටපු අමාත්‍ය රිෂාඩ් බදුර්දීන්. ඒ වුනාට කතෝලික ඉඩම් නැත්නම් ක්‍රිස්තියානි ඉඩම් සම්බන්ධයෙන් මම විස්තරාත්මකව දන්නේ නැහැ ඒත් ඉඩම් සම්බන්ධයෙන් ගොඩාක් චෝදනා තියෙනවා කියලා මම දන්නවා.

ප්‍ර : අල්තකියා කියන්නේ මොකක්ද?

පි : අල්තකියා කියන්නේ, අල්තකියා කියන පදයෙන් අපි හඳුන්වන්නේ මුස්ලිම් කෙනෙක්. ඉස්ලාම් ආගම අදහන එක්කෙනෙක් ආගම බේරා ගැනීම සඳහා කරන්නාවූ රහපෑමක්. නැත්නම් බොරුවක්. නැත්නම් pretending කියලා කියන්න පුළුවන්. ඒගැනත් මම ලේඛන දෙකක් හරි එකක් හරි සභාවට ඉදිරිපත් කලා.

ප්‍ර : ඒක ටිකක් තව ටිකක් ඒ සම්බන්ධයෙන් ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද අල්ටකියාව ගැන?

පි : බොරු කීමත් ඉස්ලාම් ආගමේ යම්කිසි අවස්ථාවල අනුමත කරලා තියෙනවා. ඒ වගේම අල්තකියා එකට හොඳම උදාහරණයක් තියෙනවා නබිතුමා මදීනාවල ඉන්න කාලේ ඒ කියන්නේ එයා පාලන බලය අරගෙන හිටපු කාලේ හිටියා මුස්ලිම් නොවන පුද්ගලයෙක්. එයා තවත් ගෝත්‍රික නායකයෙක් ලස්සන බලවත් ශක්තිමත් කෙනෙක්. එයාගේ නම කහඟ්ඉබුනු අෂ්රොෆ් කියන එක්කෙනෙක්. එතකොට කුර්ආනයේ නබිතුමා කිව්වේ කවියක් විදියට. එතකොට එයත් කවි ලියන්න පුළුවන් Poet කෙනෙක් එයා. එතකොට එයා නබිතුමාට විරුද්ධව නබිතුමාව හෑල්ලුවට ලක්වන විදියට කවි ලියාගෙන හිටියා. එතකොට නබිතුමාට කිසිම ක්‍රමයක් තිබ්බේ නැහැ එයාට විරුද්ධව දෙයක් කරන්න ඒ වෙලාවේ. එතකොට නබිතුමා කරන වැඩේ එයාගේ අනුගාමිකයින් ඉන්න වෙලාවේ කියනවා කහඟ්ඉබුනු අෂ්රොෆ් ගැන මට තියෙන දුකෙන් මාව බේරා ගන්නේ කවුද කියලා අහනවා. එතකොට එතන ඉන්නවා අබුමසලමා..මොහොමඩ් ඉබුනු කියන එයාගේ companion සහාබා companion කෙනෙක්. එයා කියනවා මම ඒක කරන්නම් කියලා හිතාගෙන යනවා කහඟ්ඉබුනු අෂ්රොෆ් ගාවට. ගියාම කහඟ්ඉබුනු අෂ්රොෆ් අහනවා ඇයි ඔයා ආවේ කියලා. එයා කියනවා මේ මොහොමඩ් හින්දා අපි ගොඩක් අමාරුවේ වැටිලා ඉන්නවා. එයා හැම

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

වෙලේම ටැක්ස් ඉල්ලනවා. එක එක දේවල් ඉල්ලනවා දැන් අපිට කන්න බොන්නත් නැහැ ඔයාගෙන් දෙයක් ඉල්ලන්න තමයි ආවේ අපිට මොනවා හරි කන්න ධාන්‍ය වර්ග දෙන්න කියලා. එතකොට කහඳ්ඉබ්බුනු අෂ්රොප් අහනවා ඔයා mortgage මොනවද දෙන්නේ කියලා. මෙයා කියනවා මාස දෙකෙන් ආපහු දෙන්නම් කියලා දෙන දේ. එතකොට එයා අහනවා mortgage එකට මොනවද තියෙන්නේ කියලා. අර කහඳ්ඉබ්බුනු අෂ්රොඳ් mortgage එකට මොනවද ලබා දෙන්නේ කියලා අහපුවාම ගිය නබිතුමාගේ අනුගාමිකයා මොහොමඩ් ඉබ්බුනු මස්ලමා කියනවා ඔයාට මොනවද ඕනේ කියලා අහන්න කියලා. ඔයාලට මොනවද තියෙන්නේ කියලා අහලා ඊට පස්සේ එයා එක උත්තරයක් කියනවා එහෙනම් ඔයාලගේ ගෑණු ටික මෙහේ තියලා ඒගොල්ලන්ගේ ගෝත්‍රයේ තියලා අරන් යන්න. ආපහු දෙන්න එන කොට ගෙනියන්න කියලා. එතකොට මොහොමඩ් ඉබ්බුනු මස්ලමා කියනවා කොහොමද ඔයාගේ ගෝත්‍රයට දෙන්නේ ඔයා තමයි මේ පලාතේම ඉන්න හරි කඩවසම් ලස්සන එක්කෙනෙක්. එතකොට කොහොමද අපේ ගෑණු ටික දෙන්නේ කියලා. එතකොට එයා කියනවා එහෙම නම් කමක් නැහැ ඔයාලගේ දරුවෝ ටික දීලා අරන් යන්න කියලා. එතකොට එයා කියනවා ඒක කරන්න පුළුවන් ඒ වුණාට ඒ ලමයා ලොකු වුනාට පස්සේ සමාජය ඒ ලමයාව හෑල්ලුවට ලක් කරයි. මේ හාල් කිලෝ ටිකට මෙයාව නේද මේකට තිබ්බේ කියලා හෑල්ලුවට ලක් කරයි කියලා. එතකොට එයා අහනවා එහෙනම් මොනවද තියෙන්නේ ඕගොල්ලන් ගාව කියලා. මෙයා කියනවා අපි ගාව කඩු ඒ කියන්නේ weapons කඩු වාගේ දේවල් තියෙනවා. හරි කමක් නැහැ ඒවා දීලා අරන් යන්න කියලා. හරි මම හෙට එන්නම් කියලා මෙයා යනවා. ගිහිල්ලා තව මොහොමඩ් නබිතුමාගේ ආධාරකරුවන් සහබා කෙනෙක් එක්කගෙන ආපහු යනවා කහඳ්ඉබ්බුනු අෂ්රොඳ් ගාවට. කඩු ටිකයි පිහි ඔක්කොම අරන් යන්නේ. එතකොට මෙයා කහන්ඉබ්බුනු අෂ්රොප් කියන්නේ තමාගේ බොඩිගාඩ්ලා වගේ ඉන්න කට්ටියට කියනවා මෙයා මම අදුරන කට්ටියක් ඔයාලා යන්න මම මෙයාලත් එක්ක කතා කරන්නම් කියලා. ප්‍රශ්නයක් නැහැ එයාලට එන්න දෙන්න කියලා ඇතුලට. ඇතුලට ගියාට පස්සේ වාඩි වෙලා ගෙනාවද කියලා අහනවා ඔව් මේ තියෙන්නේ කියලා කියපුවාම කියනවා ඔයාගේ කොන්ඩේ හරි ලස්සනයි. කහඳ්ඉබ්බුනු අෂ්රොප්ට කියන්නේ මාර සුවඳයි කියලා මම පොඩ්ඩක් සුවඳ බලන්නද කියලා කහඳ්ඉබ්බුනු අෂ්රොඳ්ගෙන් අහන්නේ මොහොමඩ් නබිතුමාගේ කහඳ්ඉබ්බුනු මස්ලමා කියන කෙනා. කහඳ්ඉබ්බුනු අෂ්රොඳ් කියනවා හා කියලා. ලහටම ගිහිල්ලා බෙල්ලත් එක්ක ඔළුවත් එක්ක අල්ලා ගන්නවා. අනික් පුද්ගලයා මෙයාට පිහිහෙන් හරි කටුවෙන් ඇනලා එතනම මරලා දානවා අෂ්රොඳ්ව. ඊට පස්සේ දෙන්නම මොහොමඩ් නබිතුමා ලගට ආවම මොහොමඩ් නබිතුමා මොහොමඩ් ඉබ්බුනු

FAIR COMMENT BY JEZEEM

මස්ලමාව සාතනය කරපු කෙනාව ප්‍රසංශා කරනවා. ඒක හදීෂ් එකෙත් තියෙනවා මම සභාවට ඉදිරිපත් කර තිබෙනවා.

ප්‍ර : දැන් සරල විදියට කිව්වොත් ශුද්ධ වූ කුර්ආනයේ තිබෙනවා අවශ්‍ය වුනොත් බොරු කියන්නත් මුස්ලිම් ජාතිකයන්ට අවකාශයක් තිබෙනවා කියලා?

පි : කුර්ආනයේ තිබෙන එකක් තමයි ඊබ්‍රාහිම් නබිතුමා එක්තරා අවස්ථාවක එයාගේ වයිෆ්ව නංගී කියලා බොරුවක් කියනවා. ඒක කුර්ආනයේ සඳහන් වෙලා තියෙනවා. ඒ වුනාට මම දැන් කියපු කාරණාම බොරුවක් කියලා එක්කෙකෙන් ගාවට ගිහිල්ලා මම මොහොමඩ් නබිගෙන් කරදර නිසා, තමා ගියා ලගට ආවේ කියලා එයාව අන්දලා එයාට ලංවෙලා එයාට පිහියෙන් ඇනලා මරපු සිද්ධිය තියෙන්නේ හදීෂ් එකේ.

ප්‍ර : ඒ කියන්නේ දැන් මෙහෙම කිව්වොත් හරිද අන්‍යාගමිකයන්ව මුස්ලිම් ආගමට ගෙන්න ගන්න බොරු කියන්න අවකාශයක් තිබෙනවා කිව්වොත් හරිද කුර්ආනයේ?

පි : එහෙම specily කරලා මට කියන්න අමාරුයි. ඒ වුනාට According to the situation ඒ අවස්ථාවේ හැටියට ඒක භාවිතා කරන්න අනුමැතිය තියෙනවා. දැන් අපි බටහිර රටවල බැලුවොත් a diluted version of Islam ඒ කියන්නේ ඉස්ලාම් ගැන ගොඩාක් වෙනස් version එකක් පෙන්නලා තමයි ඒ බටහිර රටවල්වල ඉන්න අය ඉස්ලාම් ආගමට ගන්නේ. අපි මෙතන කතා කරන කිසිම දෙයක් පෙන්නන්නේ නැහැ. සහරාන් දේශනා කරපු කිසිම දෙයක් පෙන්නන්නේ නැහැ. ඒකේ තියෙන හොඳ පැත්ත විතරක් මක්කමේ ඉන්න කලේ මොහොමඩ් නබිතුමා කියපු දේවල් විතරක් අරගෙන selected cherry picking එකක් කරලා තමයි මේක තමයි ඉස්ලාම් කියලා full picture එකක් දීලා තමයි ඒ conversion එක මේක සිද්ධ වෙන්නේ.

ප්‍ර : අන්තිම ප්‍රශ්නය මුළු ලෝකයම එකම ඉස්ලාම් දහම යටතේ තිබිය යුතු බවට මතයක් තිබෙනවද?

පි : ඔව්. ඒකට පොඩි උදාහරනයක් කියන්නම් අල්ලාහ් දෙවියන් මනුෂ්‍යායව මේ ලෝකේ create කරන්න කලින් ඒන්ජස්ලට කතා කරලා කියනවා මගේ කලීෆා කෙනෙක්ව ලෝකේ මේවා කරන්න යනවා කියලා. එතකොට අල්ලාහ් පාවිච්චි කරපු වචනයත් ඇවිල්ලා කලීෆා. එතකොට මේකට අර්ථකථනය දෙන්නේ. අපි අල්ලාගේ කලීෆා. අල්ලාහ්ගේ පාලනය තමයි මේ ලෝකේ ඇති කරන්න ඕන කියන එක එතනින් ගන්නවා. ඒ හැර වෙන වෙන තැන්වල ඒක සඳහන් වෙලා තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

මේ අවස්ථාවේදි වෙනත් ප්‍රශ්න නොමැති බව උගත් ජනාධිපති නීතිඥවරයා දන්වයි. මෙම කොමිෂන් සභාව ඉදිරියට පැමිණ තමන්ගේ ජීවිතයට තිබෙන අවදානමද නොතකා සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කටයුතු

FAIR COMMENT BY JEZEEM

සම්බන්ධයෙන් දැක්වූ සහයෝගය සඳහා කොමිෂන් සභාවේ ස්තුතිය සාක්ෂිකරුට පල කරනවා. මීට පෙර දිනයේදි කොමිෂන් සභාව නියෝගයක් කරනු ලැබුවා ඔබට අවශ්‍ය නම් ආරක්ෂාව සම්බන්ධයෙන් වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත ඉල්ලීමක් කිරීමෙන් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට හැකියාවක් ඇති බවත් ඒ සම්බන්ධයෙන් නියෝගයක් මෙම කොමිෂන් සභාව දැනටමත් කර තිබෙනවා. අවශ්‍ය වූ විටෙක ඒ නියෝගය භාවිතා කරන ලෙසට සාක්ෂිකරුට උපදෙස් ලබා දෙනවා.

නැවත කොමිෂමේ සභාවේ කටයුතු හෙට උදෑසන 9.30 ආරම්භ වෙන බව දන්වා සිටී.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM